විගණකාධිපතිවරයාගේ ත්‍රෛවාර්ෂික වාර්තාව

2021-2023

සංස්ථා-මණ්ඩල-කාර්යාංශ

පටුන

			පිටු අංක.
1.	විධායක සාරාංශය		10
2.	මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගේ මතය		11
3.	ස්වාධීන කොමිෂන් සභා වල නිරීක්ෂණ		
	3.1	ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය	23
	3.2	හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය	28
	3.3	ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව	30
	3.4	ඉඩම් මැනුම් සභාව	35
	3.5	කලා මණ්ඩලය	37
	3.6	ජේ.ආර්.ජයවර්ධන මධ්‍යස්ථානය	40
	3.7	ටවර් හෝල් රඟහල පදනම	42
	3.8	ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව	45
	3.9	ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය	51
	3.10	ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලය	59
	3.11	ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය	63
	3.12	ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව	73
	3.13	ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය	80
	3.14	ශ්‍රී ලංකා ජලජීවී වගා සංවර්ධන අධිකාරිය	82
	3.15	වැව්ලි කලාපය සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරිය	85
	3.16	ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව	89
	3.17	ලංකා ධීවර සංස්ථාව	93
	3.18	රාජ්‍ය දැව සංස්ථාව	97

	3.19	මධ්‍යම පරිසර අධිකාරිය	110
	3.20	ශ්‍රී ලංකා පරිසර වෘත්තීයවේදීන්ගේ ආයතනය	118
	3.21	සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය	119
	3.22	සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය	129
	3.23	නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය	134
	3.24	ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ආයතනය	140
	3.25	ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය	144
	3.26	ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලය	153
	3.27	ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය	155
	3.28	ජාතික සමාජ සංවර්ධන ආයතනය	167
	3.29	ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය	172
	3.3	ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය	176
	3.31	සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය	177
	3.32	1990 සුවසැරිය පදනම	188
	3.33	පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන සභාව	193
	3.34	ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව	200
	3.35	රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව - රත්මලාන	265
	3.36	කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය	273
	3.37	තේ පර්යේෂණ මණ්ඩලය	278
	3.38	ශ්‍රී ලංකා තේ මණ්ඩලය	287
	3.39	කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදන අලෙවි මණ්ඩලය	298
	3.40	ශ්‍රී ලංකා රබර් පර්යේෂණ මණ්ඩලය	300
	3.41	ජාතික වැවිලි කළමනාකරණ ආයතනය	304
	3.42	පොල් වගාකිරීමේ මණ්ඩලය	306

	3.43	පොල් සංවර්ධන අධිකාරිය	313
	3.44	ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව	323
	3.45	සංවර්ධන ලොතරැයි මණ්ඩලය	334
	3.46	ජාතික ලොතරැයි මණ්ඩලය	362
	3.47	ශ්‍රී ලංකා ක්‍රිකට්	377
	3.48	ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල	387
	3.49	ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය	394
	3.50	ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය	403
	3.51	ශ්‍රී ලංකා සංචාරක හෝටල් කළමනාකරණ ආයතනය	423
	3.52	ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය	429
	3.53	ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය	432
	3.54	රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව	446
	3.55	කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය	449
	3.56	ශ්‍රී ලංකා කජු සංස්ථාව	467
	3.57	ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව	476
	3.58	ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව	497
	3.59	ජල සම්පත් මණ්ඩලය	501
	3.6	ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාව	516
	3.61	ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය	525
	3.62	රණවිරු සේවා අධිකාරිය	527
	3.63	ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය	534
	3.64	ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය	566
	3.65	ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය	570
	3.66	භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය	573

	3.67	නීති ආධාර කොමිෂන් සභාව	581
	3.68	ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය	593
	3.69	හානිපූරණය සඳහා වන කාර්යාලය	595
	3.70	අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය	603
	3.71	අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය	610
	3.72	මාර්ග සංවර්ධන අධිකාරිය	616
	3.73	උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලය	646
	3.74	ජාතික නිවාස සංවර්ධන අධිකාරිය	656
	3.75	ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනය	678
	3.76	ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය	682
	3.77	පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය	684
	3.78	ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව	687
	3.79	ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය	689
	3.80	සීමාසහිත ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව	692
	3.81	නාගරික සංවර්ධන අධිකාරිය	695
	3.82	ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව	714
	3.83	ලක්ෂ්මන් කදිර්ගාමර් ජාත්‍යන්තර සම්බන්ධතා හා ක්‍රමෝපාය අධ්‍යයන ආයතනය	731
	3.84	ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය	734
	3.85	ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනය	738
	3.86	රාජ්‍ය භාෂා කොමිෂන් සභාව	741
	3.87	දේශීය ණය සහ සංවර්ධන අරමුදල	744
	3.88	පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය	749
	3.89	රාජ්‍ය මුද්‍රණ සංස්ථාව	759

	3.9	ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය	766
	3.91	ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය	772
	3.92	පොල් පර්යේෂණ මණ්ඩලය	784
	3.93	ජාතික ගමනාගමන කොමිෂන් සභාව	791
	3.94	ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය	796
	3.95	ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව	800
	3.96	ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලය	818
	3.97	ආයුර්වේද වෛද්‍ය සභාව	820
	3.98	ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව	830
	3.99	ජාතික ඖෂධ නියාමන අධිකාරිය	862
	3.100	විජය කුමාරතුංග අනුස්මරණ රෝහල	872
	3.101	දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය	876
	3.102	ජාතික යොවුන් සේනාංකය	893
	3.103	ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය	898
	3.104	සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය	900
	3.105	ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය	907
	3.106	රක්ෂණ නියාමන කොමිෂන් සභාව	954
	3.107	ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය	961
	3.108	ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව	963
	3.109	ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව	968
	3.110	උක් පර්යේෂණ ආයතනය	970
	3.111	ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනය	979
	3.112	මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව	983
	3.113	ශ්‍රී ලංකා හදබිම අධිකාරිය	990

	3.114	හෝමියෝපති වෛද්‍ය සභාව	994
	3.115	ශ්‍රී ලංකා පදනම	997
	3.116	ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය	1001
	3.117	ජාතික ශිල්ප සභාව	1018
	3.118	කාර්මික තාක්ෂණ ආයතනය	1020
	3.119	ජාතික පර්යේෂණ සභාව	1028
	3.120	නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී. ක්ලාක් ආයතනය	1034
	3.121	ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය	1038
	3.122	ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනය	1042
	3.123	ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව	1044
	3.124	මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය	1047
	3.125	ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය	1051
	3.126	ජාතික විද්‍යා පදනම	1056
	3.127	ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම	1058
	3.128	ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය	1061
	3.129	ජාතික මෝස්තර මධ්‍යස්ථානය	1067
	3.130	අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය	1069
	3.131	ජාතික සමූපකාර සංවර්ධන ආයතනය	1070
	3.132	ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය	1073
	3.133	ලංකා පිඟන් සංස්ථාව	1080
	3.134	ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය	1083
	3.135	ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව	1087
	3.136	මහජන උපයෝගිතා කොමිෂන් සභාව	1093
	3.137	ගාලු උරුමය පදනම	1103

	3.138	අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය	1105
	3.139	තත්ත්වාගණනය කළ	1126
	3.140	ශ්‍රී ලංකා භූ විද්‍යා ආයතනය	1145
	3.141	ජාතික ව්‍යාපාර කලමනාකාරීත්ව ආයතනය	1147
	3.142	ජාතික අධ්‍යාපන ආයතනය	1150
	3.143	ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය	1152
	3.144	ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය	1160
	3.145	ජාතික මූලික අධ්‍යයන ආයතනය	1162
	3.146	ජාතික ළමා ආරක්ෂක අධිකාරිය	1167
	3.147	තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව	1170
	3.148	බටංගල විශ්වවිද්‍යාල විද්‍යායතනය	1174
	3.149	මාතර විශ්වවිද්‍යාල විද්‍යායතනය	1176
	3.150	මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව	1178
	3.151	රත්මලාන විශ්වවිද්‍යාල විද්‍යායතනය	1181
	3.152	විශ්වවිද්‍යාල විද්‍යායතනය - කුලියාපිටිය	1186
	3.153	වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය	1188
	3.154	ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය	1193
	3.155	ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය	1196
	3.156	ශ්‍රී ලංකා සාගර විශ්ව විද්‍යාලය	1204
	3.157	ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය	1206
	3.158	ශ්‍රී ලංකා වරාය අධිකාරිය	1241
	3.159	සී/ස ලංකා නැව් සංස්ථාව	1267
	3.160	අනුරාධපුර විශ්වවිද්‍යාල විද්‍යායතනය	1281
	3.161	යාපනය විශ්වවිද්‍යාල විද්‍යායතනය	1282

	3.162	ශ්‍රී ලංකා විදේශ සේවානියුක්ති කාර්යාංශය	1283
	3.163	ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය	1291
	3.164	ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය	1300
	3.165	ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව	1305
	3.166	තල් සංවර්ධන මණ්ඩලය	1314
	3.167	ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය	1316
	3.168	ලංකා විදුලිබල මණ්ඩලය	1339
	3.169	ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය	1359

1. විධායක සාරාංශය

2023 වර්ෂය අවසානයට රාජ්‍ය සංස්ථා මණ්ඩල සහ කාර්යංශ 169ක් සම්බන්ධයෙන් වූ 2021, 2022 සහ 2023 වර්ෂවලට අදාල පාර්ලිමේන්තුවේ අවධානයට ලක්කල යුතු බවට විගණකාධිපතිවරයා විසින් තීරණය කල ආයතන වල තවදුරටත් නිවැරදි නොකරන ලද නිරීක්ෂණයන් පමණක් මෙම වාර්තාවට ඇතුලත් කර ඇත.

අදාල ව්‍යවස්ථාපිත ආයතන අතරින් ප්‍රමාණවත් තරම් නිරීක්ෂණ නොමැති වීම, මූල්‍ය වාර්තා නියමිත කාලය තුල ඉදිරිපත් කර නොතිබීම යන හේතු නිසා මෙම වාර්තාවට ඇතුලත් නොවූ ආයතනද වේ. මෙම ආයතන බොහෝමයක්ම මහාභාණ්ඩාගාරය මඟින් දෙන ප්‍රාග්ධන හා පුනරාවර්ථන වියදම් සහ ප්‍රතිපාදන ලබාදී තිබූ අතර සමහරක් ආයතන ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම් ස්වයං මූල්‍යානය මඟින් සලසා ගෙන තිබුණි.

මෙම ආයතන වල එහි මූල්‍ය මෙහෙයුම් ප්‍රතිඵලයන් සැලකීමේදී අතිරික්තයන් මෙන්ම ඌණතාවයන් වාර්තා වී තිබුණු අතර අදාල ආයතන සම්බන්ධයෙන් විගණකාධිපති විසින් මූල්‍ය ප්‍රකාශන සහතික කිරීමේදී තත්ත්වාගණනය නොකල, තත්ත්වාගණනය කල, ව්‍යාචනය හා අහිතකර මතයන් ලබාදී තිබුණි..

2. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගේ මතය

සංස්ථා-මණ්ඩල-කාර්යාංශ විසින් වර්ෂය අවසානයට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත වාර්ෂිකව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරනු ලැබේ. ආයතනවල ක්‍රියාකාරිත්වය පිළිබඳ සත්‍ය හා සාධාරණ තත්ත්වයක් මූල්‍ය ප්‍රකාශනවලින් පිළිබිඹු කරන්නේද යන බවට ස්වාධීන සහතිකයක් විගණකාධිපති විසින් ලබාදෙනු ලැබේ. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම මගින් මෙම සහතිකය ලබාදෙනු ලැබේ. සංස්ථා-මණ්ඩල-කාර්යාංශයන්හි මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනවලින් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු වන්නේද හෝ නොවන්නේද යන්න සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට හෝ දැනට ජාත්‍යන්තර රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල වන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට සහ මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට එම මූල්‍ය ප්‍රකාශන අනුකූල වන්නේද හෝ නොවන්නේද යන්න පිළිබඳ විගණකාධිපතිවරයාගේ නිගමනය විගණන මතයෙන් ප්‍රකාශ කෙරේ.

මූල්‍ය ප්‍රකාශන අනුව ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් හෝ නොඑකඟතාවයන් හා විෂය පථය සීමාවීම් හා කළමණාකරණය හා විගණනය අතර මතුවන නොඑකඟතාවයන් සලකාබැලීමෙන් අනතුරුව සිව් ආකාරයක මතයන් ප්‍රකාශයට පත්කරනු ලබයි. ඒවා නම්.

තත්ත්වාගණනය නොකළ මතය

මූල්‍ය ප්‍රකාශනවල ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් හෝ අනුකූල නොවීම වාර්තා වී නොමැති විට මෙම මතය ප්‍රකාශ කෙරේ.

තත්ත්වාගණනය කළ මතය

මූල්‍ය ප්‍රකාශනවල ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශන හෝ නොගැලපීම් වාර්තා කර ඇති නමුත් ආයතනයේ මූල්‍ය ප්‍රකාශන වලට පැතිරී නොමැති විට මෙම මතය ප්‍රකාශ කෙරේ.

අහිතකර මතය

මූල්‍ය ප්‍රකාශන වල වාර්තා කර ඇති ප්‍රමාණාත්මක / සාවද්‍ය ප්‍රකාශයන් මූල්‍ය ප්‍රකාශන වලට ව්‍යාප්ත වී ඇති විට, අහිතකර විගණන මතය ප්‍රකාශ කෙරේ.

මතය ව්‍යාචනය කිරීම

විෂය පථය සීමා වීම හේතුවෙන් විගණකට විගණන මතය සඳහා ප්‍රමාණවත් සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීමට නොහැකි වීම හා විගණක විසින් මූල්‍ය ප්‍රකාශන වල හෙළි නොවූ සාවද්‍ය ප්‍රකාශ තිබිය හැකි යැයි තීරණය කරන විට මෙම මතය ප්‍රකාශ කෙරේ.

සංස්ථා-මණ්ඩල-කාර්යාංශ වල මතය පිළිබඳ විස්තර

2021, 2022 සහ 2023 වසර සඳහා සංස්ථා-මණ්ඩල-කාර්යාංශ 169කට අදාළව ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් නිකුත් කරන ලද විගණන මතයන් පිළිබඳ තොරතුරු පහත වගුවේ දැක්වේ.

	2021	2022	2023
තත්ත්වාගණනය නොකල	26	26	25
තත්ත්වාගණනය කල	129	126	120
අහිතකර	02	03	01
වියාචනය	07	05	02
මතය තවමත් තීරණය කර නොමැති ගණන	05	09	21
මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැති ගණන	-	-	-

	නම	2021	2022	2023
1.	ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
2.	හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
3.	ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
4.	ඉඩම් මැනුම් සභාව	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය නොකළ
5.	කලා මණ්ඩලය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය නොකළ
6.	ජේ.ආර්.ජයවර්ධන මධ්‍යස්ථානය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	-
7.	ටවර් හෝල් රඟහල පදනම	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
8.	ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	-

9.	ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
10.	ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
11.	ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
12.	ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
13.	ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
14.	ශ්‍රී ලංකා ජලජීවී වගා සංවර්ධන අධිකාරිය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	-
15.	වැව්ලි කලාපය සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරිය	-	-	-
16.	ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව	ව්‍යාවනය කළ	ව්‍යාවනය කළ	-
17.	ලංකා ධීවර සංස්ථාව	-	-	-
18.	රාජ්‍ය දැව සංස්ථාව	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
19.	මධ්‍යම පරිසර අධිකාරිය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
20.	ශ්‍රී ලංකා පරිසර වෘත්තීයවේදීන්ගේ ආයතනය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
21.	සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
22.	සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
23.	නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
24.	ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ආයතනය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
25.	ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය නොකළ
26.	ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලය	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය කළ

27.	ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය නොකළ
28.	ජාතික සමාජ සංවර්ධන ආයතනය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය කළ
29.	ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය නොකළ
30.	ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ
31.	සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
32.	1990 සුවසැරිය පදනම	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ
33.	පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන සභාව	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
34.	ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
35.	රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව - රත්මලාන	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ
36.	කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
37.	තේ පර්යේෂණ මණ්ඩලය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
38.	ශ්‍රී ලංකා තේ මණ්ඩලය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
39.	කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදන අලෙවි මණ්ඩලය	තත්ත්වාගණනය කළ	-	-
40.	ශ්‍රී ලංකා රබර් පර්යේෂණ මණ්ඩලය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
41.	ජාතික වැව්ලි කළමනාකරණ ආයතනය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
42.	පොල් වගාකිරීමේ මණ්ඩලය	ව්‍යාවනය කළ	තත්ත්වාගණනය කළ	-
43.	පොල් සංවර්ධන අධිකාරිය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
44.	ශ්‍රී ලංකා රාජ්‍ය වැව්ලි සංස්ථාව	අහිතකර	තත්ත්වාගණනය	තත්ත්වාගණනය

			කළ	කළ
45.	සංවර්ධන ලොතරැයි මණ්ඩලය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
46.	ජාතික ලොතරැයි මණ්ඩලය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
47.	ශ්‍රී ලංකා ක්‍රිකට්	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ
48.	ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
49.	ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
50.	ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය	ව්‍යාචනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
51.	ශ්‍රී ලංකා සංචාරක හෝටල් කළමනාකරණ ආයතනය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
52.	ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ
53.	ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය නොකළ	-
54.	රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව	තත්ත්වාගණනය කළ	ව්‍යාචනය කළ	-
55.	කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
56.	ශ්‍රී ලංකා කජු සංස්ථාව	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
57.	ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව	ව්‍යාචනය කළ	ව්‍යාචනය කළ	ව්‍යාචනය කළ
58.	ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව	-	-	-
59.	ජල සම්පත් මණ්ඩලය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
60.	ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාව	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
61.	ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ

62.	රණවිරු සේවා අධිකාරිය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
63.	ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
64.	ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
65.	ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
66.	භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
67.	නීති ආධාර කොමිෂන් සභාව	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
68.	ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
69.	හානිපූරණය සඳහා වන කාර්යාලය	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
70.	අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
71.	අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය කළ
72.	මාර්ග සංවර්ධන අධිකාරිය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
73.	උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
74.	ජාතික නිවාස සංවර්ධන අධිකාරිය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
75.	ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
76.	ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය	තත්ත්වාගණනය කළ	-	-
77.	පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
78.	ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ

79.	ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය කළ
80.	සීමාසහිත ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	-
81.	නාගරික සංවර්ධන අධිකාරිය	තත්ත්වාගණනය කළ	-	-
82.	ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
83.	ලක්ෂ්මන් කදිර්ගාමර් ජාත්‍යන්තර සම්බන්ධතා හා ක්‍රමෝපාය අධ්‍යයන ආයතනය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	-
84.	ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
85.	ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
86.	රාජ්‍ය භාෂා කොමිෂන් සභාව	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
87.	දේශීය ණය සහ සංවර්ධන අරමුදල	තත්ත්වාගණනය කළ	වියාවනය කළ	වියාවනය කළ
88.	පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
89.	රාජ්‍ය මුද්‍රණ සංස්ථාව	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
90.	ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
91.	ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය	තත්ත්වාගණනය කළ	-	-
92.	පොල් පර්යේෂණ මණ්ඩලය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
93.	ජාතික ගමනාගමන කොමිෂන් සභාව	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
94.	ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
95.	ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ

96.	ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලය	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය කළ
97.	ආයුර්වේද වෛද්‍ය සභාව	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය නොකළ
98.	ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
99.	ජාතික ඖෂධ නියාමන අධිකාරිය	තත්ත්වාගණනය කළ	අහිතකර	තත්ත්වාගණනය කළ
100.	විජය කුමාරතුංග අනුස්මරණ රෝහල	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
101.	දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය නොකළ
102.	ජාතික යොවුන් සේනාංකය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
103.	ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය නොකළ
104.	සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
105.	ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
106.	රක්ෂණ නියාමන කොමිෂන් සභාව	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ
107.	ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
108.	ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
109.	ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ
110.	උක් පර්යේෂණ ආයතනය	තත්ත්වාගණනය කළ	අහිතකර	තත්ත්වාගණනය කළ
111.	ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
112.	මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
113.	ශ්‍රී ලංකා හඳබිම අධිකාරිය	තත්ත්වාගණනය	තත්ත්වාගණනය	තත්ත්වාගණනය

		කළ	කළ	කළ
114.	හෝමියෝපති වෛද්‍ය සභාව	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	-
115.	ශ්‍රී ලංකා පදනම	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
116.	ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
117.	ජාතික ශිල්ප සභාව	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
118.	කාර්මික තාක්ෂණ ආයතනය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
119.	ජාතික පර්යේෂණ සභාව	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
120.	නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී. ක්ලාක් ආයතනය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
121.	ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය කළ
122.	ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනය	-	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ
123.	ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
124.	මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
125.	ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
126.	ජාතික විද්‍යා පදනම	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
127.	ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
128.	ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
129.	ජාතික මෝස්තර මධ්‍යස්ථානය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්වාගණනය නොකළ

130.	අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
131.	ජාතික සමූපකාර සංවර්ධන ආයතනය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
132.	ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
133.	ලංකා පිඟන් සංස්ථාව	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
134.	ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
135.	ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
136.	මහජන උපයෝගිතා කොමිෂන් සභාව	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
137.	ගාලු උරුමය පදනම	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ
138.	අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
139.	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
140.	ශ්‍රී ලංකා භූ විද්‍යා ආයතනය	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ
141.	ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ
142.	ජාතික අධ්‍යාපන ආයතනය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
143.	ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
144.	ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය	අහිතකර	-	-
145.	ජාතික මූලික අධ්‍යයන ආයතනය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
146.	ජාතික ළමා ආරක්ෂක අධිකාරිය	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
147.	තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන	තත්ත්වාගණනය	තත්ත්වාගණනය	තත්ත්වාගණනය

	කොමිෂන් සභාව	කළ	කළ	කළ
148.	බටංගල විශ්වවිද්‍යාල විද්‍යායතනය	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ
149.	මාතර විශ්වවිද්‍යාල විද්‍යායතනය	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ
150.	මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
151.	රත්මලාන විශ්වවිද්‍යාල විද්‍යායතනය	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ
152.	විශ්වවිද්‍යාල විද්‍යායතනය - කුලියාපිටිය	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය කළ
153.	වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය කළ
154.	ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය නොකළ
155.	ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
156.	ශ්‍රී ලංකා සාගර විශ්ව විද්‍යාලය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
157.	ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය	ව්‍යාවනය කළ	ව්‍යාවනය කළ	අහිතකර
158.	ශ්‍රී ලංකා වරාය අධිකාරිය	ව්‍යාවනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
159.	සී/ස ලංකා නැව් සංස්ථාව	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	-
160.	අනුරාධපුර විශ්වවිද්‍යාල විද්‍යායතනය	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය කළ
161.	යාපනය විශ්වවිද්‍යාල විද්‍යායතනය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය නොකළ
162.	ශ්‍රී ලංකා විදේශ සේවානියුක්ති කාර්යාංශය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
163.	ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
164.	ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	-

165.	ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
166.	තල් සංවර්ධන මණ්ඩලය	ව්‍යාවනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
167.	ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය	තත්ත්වාගණනය කළ	අහිතකර	තත්ත්වාගණනය කළ
168.	ලංකා විදුලිබල මණ්ඩලය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
169.	ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය කළ

3. සංස්ථා - මණ්ඩල - කාර්යාංශ වල ස්වාධීන නිරීක්ෂණ

3.1 ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	569,190,977	92,517,567	476,673,410	(3,828,645)	තත්ත්වාගණනය කළ
2022	597,974,835	114,503,919	483,470,916	16,020,225	තත්ත්වාගණනය කළ
2023	660,409,859	119,532,990	540,876,869	59,970,689	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	මුදල් රෙගුලාසි අංක 104(4) ප්‍රකාරව 2018 වර්ෂයේ අනුරාධපුර උපුල්දෙණිය ගබඩාවේ රු.4,094,596 ක් වටිනා සෝයා බෝංචි අස්ථානගත වීම සම්බන්ධයෙන් හිටපු සභාපති, අධ්‍යක්ෂ, සහකාර අධ්‍යක්ෂ,(වර්තමානයේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා) ව්‍යාපෘති නිලධාරි වෙත සාමූහිකව වගකීම් පැවරෙන බව විමර්ශන වාර්තාවේ දන්වා තිබියදීත් නියෝජ්‍ය අධ්‍යක්ෂවරයාට වැටුප් රහිතව විදේශගත වීමට අවසර ලබා දී තිබුණි.	2021 2022 2023	වගකිව යුතු පාර්ශවවලින් අලාභය අය කරගත යුතුය.	කමිටුවේ තීරණයන් අනුව කටයුතු කරමි.	මු.රෙ.104(4) පරීක්ෂණය කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් පත්කරන ලද කමිටුවක් විසින් සිදුකරනු ලබයි.
2	පනතේ දක්වා ඇති අරමුණක් නොවූ වැව්වල පස් ඉවත් කර අධිවේගී මාර්ගවලට පස් විකිණීමෙන් රු.81,134,631 ක	2021 2022 2023	නිසි ප්‍රමිතියට අනුව කුඩා වැව් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන් තුවේ	එම වැව් ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු රාජ්‍ය ප්‍රතිපාදන මත ගොවිජන සේවා දෙපාර්තමේන්තුව	එම වැව් ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු මේ දක්වා සිදු කර නොමැත.

	ආදායමක් ලබා තිබුණු අතර වැව් ව්‍යාපෘති වාර්තාවට අනුව සපයන ලද පස් සඳහා අදාළ ගොවි සංවිධානවලින් මණ්ඩලයට මුදල් ලබාගෙන එම මුදල් රජයේ ප්‍රතිපාදනද සමග යොදා කුඩා වැව් නිසි ප්‍රමිතියට ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු උපදේශකත්වය යටතේ සංවර්ධනය කළ යුතු බව දක්වා තිබුණත් එසේ නොකර ලැබූ මුදලින් රු.76,085,636 ක් ස්ථාවර තැන්පතුවක ආයෝජනය කර තිබුණි.		ඉංජිනේරු උපදේශකත්වය යටතේ සංවර්ධනය කළ යුතුය.	සිදුකරන ලද අතර අප හට ගෙවන ලද මුදල් මණ්ඩලය සතුව පවතී. මෙම මුදල් පිළිබඳ ගොවිජන සේවා දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර ඉදිරි කටයුතු සිදුකරනු ලැබේ.	
3	හම්බන්තොට දිස්ත්‍රික්කයේ අළුත් කරමැටිය වැව ප්‍රතිසංස්කරණයට 2017 සැප්තැම්බර් 25 දින ශ්‍රම ශක්තිය ගොවි සංවිධානය විසින් රු.1,693,200 ක තැන්පත් මුදලක් මණ්ඩලය වෙත ගෙවා තිබුණු අතර මුළු පස් කියුබ් ප්‍රමාණයම ඉවත් කර නොගැනීම නිසා රු.1,594,480 ක මුදලක් කිසිඳු ප්‍රමාණවත් සාක්ෂියක් නොමැතිව අදාළ ගොවි සංවිධානයට නොගෙවා 2023 මාර්තු 13 දින ඒ.ආර්.සී.ප්‍රදීප් නැමති පුද්ගලයෙකුට ගෙවා තිබුණි.	2023	තැන්පත් මුදල් අදාල පාර්ශවයන්ට පමණක් ගෙවීම් කළ යුතුය.	තැන්පත් මුදල් අදාළ පාර්ශවයන්ට පමණක් ගෙවීම් කිරීමට නිලධාරීන් දැනුවත් කර ඇත.	ගොවි සංවිධානය මගින් කරන ලද ඉල්ලීමට අනුව මුදල් නිදහස් කර ඇත.
4	කලංකුට්ටිය සහල් සැකසුම් මධ්‍යස්ථානයේ පවතින යන්ත්‍ර ධාරිතාවය	2023	සම්පත් උපරීම ලෙස ප්‍රයෝජන	ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනය වෙත	මෙම වාර්තාවේ දින වන විටත් අදාළ යන්ත්‍ර නවීකරණය කිරීමක්

	පැයට වී කිලෝ 1,000 - 1,200 ක් පමණ සහල් බවට පත් කළ හැකි වුවත් සමාලෝචිත වර්ෂයේ දී වී කි.ග්‍රෑම් 28,580 ක් පමණක් සහල් බවට පත්කර තිබුණි. මෙම ඒකකයේ ක්‍රියාකාරී තත්ත්වයේ පවතින යන්ත්‍ර 06 ක් සහ සහල් පිටි නිෂ්පාදන අංශයේ ක්‍රියාකාරී තත්ත්වයේ පවතින යන්ත්‍ර 05 ක් 2022 වර්ෂයේ සිට නිෂ්කාර්යයව පැවති අතර යන්ත්‍ර නවීකරණය කිරීමක් මේ දක්වා සිදු වී නොතිබුණි.		ලැබෙන පරිදි සැලසුම් කළ යුතුය.	දන්වා මෙම යන්ත්‍ර පිළිබඳ විශ්ලේෂණය කර ලැබෙන වාර්තාව අනුව ඉදිරි කටයුතු සිදුකරනු ලැබේ.	සිදුකර නොමැත.
5	සමාලෝචිත වර්ෂයේ සිදුකරන ලද ව්‍යාපෘති 13 කින් ව්‍යාපෘති 08 ක රු. 9,095,302 ක ශුද්ධ අලාභයක් ලබා තිබුණි.	2021 හා 2023	අලාභය අවම වන ලෙස කටයුතු කළ යුතුය.	දැනට දිගින් දිගටම අලාභ ලබන ව්‍යාපෘති ලෙස හඳුනාගත් RTS බීම ව්‍යාපෘතිය,තෝසේ පිටි ව්‍යාපෘතිය හා පාරම්පරික සහල් ව්‍යාපෘතිය තාවකාලිකව නවතා ඇත. අධ්‍යක්ෂ මණ්ඩල උපදෙස් පරිදි දෙහිවල අලෙවිසැල පුද්ගලික අංශය සමඟ සංවර්ධනය සලකා බැලීම සඳහා කමිටුවක් පත්කර එහි වාර්තාව මත ඉදිරි කටයුතු සිදුකරනු ලැබේ. තණමල්විල ගොම ව්‍යාපෘතියද බුත්තල බදුන් මිශ්‍රණ ව්‍යාපෘතියද සිදු කරමින් පවතී. පුද්ගලික අංශයේ	නාරාහේන්පිට පැල අලෙවිසැල, කලංකුට්ටිය සහල් සබලකරන ව්‍යාපෘතිය, ගන්නෝරුව ඉදිආප්ප පිටි ව්‍යාපෘතිය හා බඩ ඉරිඟු ව්‍යාපෘතිය ලාභ සහිතව ද , දෙහිවල පැල තවාන, දෙහිවල අලෙවිසැල, තණමල්විල ගොම ව්‍යාපෘතිය හා බුත්තල බදුන් මිශ්‍රණ ව්‍යාපෘතිය අලාභ තත්ත්වයන් යටතේ ද දැනට ක්‍රියාත්මක තත්වයේ පවතී. RTS බීම ව්‍යාපෘතිය,තෝසේ පිටි ව්‍යාපෘතිය, මිරිස් ව්‍යාපෘතිය, වත්තල ඇග්‍රොෆ්‍රෙෂ් ව්‍යාපෘතිය හා පාරම්පරික සහල් ව්‍යාපෘතිය යන ව්‍යාපෘති නවතා ඇත.

				සහයෝගය ඇතිව කරනු ලබන ඉඳිආප්ප පිටි නිෂ්පාදන ව්‍යාපෘතිය දැනට සාර්ථකව සිදු කරනු ලබයි.	
6	මණ්ඩලය විසින් බීජ කහ ඉල්ලුම සපුරාලීම සඳහා දායකත්වය දැක්වීම අරමුණු කරගෙන බුත්තල ගොවිපොළෙහි අක්කර 2.5 ක බීජ කහ කිලෝ ග්‍රෑම් 2,500 ක් වගා කර ඒ සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.1,345,544 ක් සහ පසුගිය වර්ෂයේදී රු.2,104,383 ක් ලෙස එකතුව රු.3,449,927 ක් වැයකර තිබුණි. නිෂ්පාදනයෙන් අපේක්ෂිත කහ අස්වැන්න කි.ග්‍රෑම් 15,167 වූවත් සත්‍ය අස්වැන්න කි.ග්‍රෑම්1,710 ක් ලෙස අපේක්ෂිත ඵලදාව සියයට 89 කින් අඩුවී තිබුණි. 2023 මාර්තු 24 දින දක්වා එම කහ තොගය අලෙවි කිරීමට පියවර ගෙන නොතිබුණි. ඒ සඳහා දරන ලද සම්පූර්ණ මුදල අනාර්ථික වියදමක් බවට පත්ව තිබුණි.	2022	ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට පෙර ආයතනයේ ශක්‍යතාවය සලකා බලා නිසිපරිදි සැලසුම් සකස් කර ඒ අනුව ව්‍යාපෘති ඵලදායීව ඉටු කළ යුතුය.	ඵලදායීව සැලසුම් සකස් කර ඒ අනුව ව්‍යාපෘති ඉටු කිරීමට කටයුතු කරමි.	ව්‍යාපෘතිය අසාර්ථක වූ අතර කහ අලෙවියෙන් රු.3,560 ක ආදායමක් පමණක් ලබාගෙන ඇත.
7	2019 සිට 2021 වර්ෂ 03 කාල සීමාව තුළදී මණ්ඩලය විසින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ගන්නොරුව ආහාර තාක්ෂණ ඒකකය මගින් සිදුකළ මව්පෝෂ ව්‍යාපෘතිය, සුවපෝෂ ව්‍යාපෘතිය, තෝසේ පිටි	2021	අක්‍රීය ව්‍යාපෘති සක්‍රීයව පවත්වාගෙන යාමට ක්‍රියා කළ යුතුය.	සුවපෝෂ/මව්පෝෂ ව්‍යාපෘතිය ලක්මී සමාගම සමඟ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.	සුවපෝෂ/ මව්පෝෂ ව්‍යාපෘතිය ලක්මී සමාගම සමඟ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. සෝයා ආශ්‍රිත ආහාර නිෂ්පාදන ව්‍යාපෘතිය පේටන්ට් බලපත්‍රය ලබාගත් පසු ඉදිරි කටයුතු සිදුකිරීමට

නිෂ්පාදන ව්‍යාපෘතිය, සෝයා ආශ්‍රිත ආහාර නිෂ්පාදන ව්‍යාපෘතිය, පලතුරු බීම නිෂ්පාදන ව්‍යාපෘතිය ඇතුළු ව්‍යාපෘති සියල්ලම යන්ත්‍ර අක්‍රීය වීම හා අමුද්‍රව්‍ය සපයා ගැනීමේ ගැටළු නිසා නතර කර තිබුණි.

යෝජිතය.

පලතුරු බීම නිෂ්පාදන ව්‍යාපෘතිය තෝසේ ව්‍යාපෘතිය ප්‍රවර්ධනය කිරීම සඳහා කටයුතු සැලසුම් කල නමුත් එම පරිශ්‍රය අළුත්වැඩියා කිරීම සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව කටයුතු කරන හෙයින් 2025 වර්ෂයේ සිට එම ස්ථානයෙන් ඉවත් වන ලෙස දන්වා ඇත. ඒ අනුව සැලසුම් කල පරිදි මෙම ව්‍යාපෘති සිදුකිරීමේ ප්‍රයෝගික ගැටළුවක් පවති.

3.2 හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	110,829,277	80,877,774	29,951,503	12,133,601	තත්ත්වාගණනය නොකළ
2022	115,599,243	82,433,470	33,165,773	5,391,622	තත්ත්වාගණනය කළ
2023	135,486,222	83,967,571	51,518,651	16,128,359	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	2021 අගෝස්තු මස ආයතනයෙන් ඉවත්ව ගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු. 5,272,016 ක මුදල අයකර ගෙන නොතිබුණි.	2022 හා 2023	අදාළ නිලධාරියාගෙන් ආයතනයට අයවිය යුතු මුදල් කඩිනමින් අයකර ගත යුතුය.	මෙම මුදල අයකර ගැනීම වෙනුවෙන් නඩු කටයුත්ත සඳහා නීතිපති දෙපාර්තමේන්තුව සමග කටයුතු කරගෙන යමි.	නීතිපති දෙපාර්තමේන්තුව විසින් ප්‍රධාන ණයකරු හා ඇප බැඳුම්කරුවන් වෙත මේ සම්බන්ධව ලිපි යොමු කොට ඇත.
2	රු. 17,965,464 ක් වූ විදේශ ශිෂ්‍යත්ව ණයගැති ශේෂයෙන් රු.12,693,448 ක මුදලක් හා රු.24,387,625 ක් වූ අනෙකුත් ණයගැති ශේෂයෙන් රු.2,192,602 ක ශේෂයක් වර්ෂ 05 කට වැඩි කාලයක සිට අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද රු.28,959,096 ක් වූ ගෙවිය යුතු ගිණුම් ශේෂයෙන් රු.2,365,048 ක ශේෂයක් වර්ෂ 05 කට	2021 2022 2023	නඩු තීන්දු අනුව ණය මුදල් අයකර ගත යුතු අතර ඉතිරි ණය ශේෂද කඩිනමින් නිරවුල් කර ගත යුතුය.	විදේශ ශිෂ්‍යත්ව ණයගැති ශේෂයක් වූ රු.12,693,448 ක මුදල අයකර ගත වූ නිලධාරි තුන්දෙනෙකුගේ සමඨයන් හා නඩු තීන්දු ලබා දී ඇති බැවින් අයකර ගැනීමට ක්‍රියාමාර්ග සිදු කරමින් පවතී. ඉතිරි තිදෙනාගේ වර්තමාන ලිපිනයන් නොමැති වීම තුළ ඔවුන්ගේ නඩු ඉදිරියට ගෙන යාමට නොහැකි වී ඇත.	විදේශ ශිෂ්‍යත්ව ණයගැතියන් 6 දෙනෙකුගෙන් නඩු තීන්දු ලැබූ එක් නිලධාරියෙකුගේ ඇපකරුවෙකු විසින් රු.83,218 ක් මුදල් ලබා දීම සිදු කර ඇත. රු. 166,866 ක ඉතිරි මුදල ලබා දීමට අනෙක් ඇපකරු වාචිකව එකඟ වී ඇත. තවත් ණයගැතියන් දෙදෙනෙකු ගෙන් රු.4,692,878 ක මුදල් අයකර ගැනීමට නිතිපති සමග කටයුතු සිදු කරමින් පවතී.

	වැඩි කාලයක සිට නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.				වර්තමාන ලිපිනයන් නොමැති වීම මත ඉතිරි ණයගැතියන් තිදෙනාගේ රු.7,345,385 ක් අයකර ගැනීම් සඳහා ඔවුන්ගේ හිතවතුන් මාර්ගයෙන් පණිවුඩ ලබා දී ඇත. ඒ අනුව ණයගැතියන් හයදෙනෙකු ගෙන් තව දුරටත් රු.12,205,130 ක් අය වීමට පවතී.
3	අමාත්‍යවරයාගේ ආරක්ෂක නිලධාරීන් සඳහා නේවාසිකාගාරයේ කාමර කුලියට දීම වෙනුවෙන් 2015 මැයි සිට 2018 ජූලි මස දක්වා කාලයට අයවිය යුතු රු. 8,895,470 ක මුදල අයකර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.	2021 2022	අයවිය යුතු ශේෂ නොපමාව අයකර ගත යුතුය. නේවාසිකාගාරය විසින් පවත්වනු ලබන රෙජිස්ටරයේ නවාතැන් ගන්නා නිලධාරීන්ගේ හෝ සේවකයින්ගේ සවිස්තර තොරතුරු ඇතුළත් කොට පවත්වාගෙන යාම සිදුකළ යුතුය.	ප්‍රමාණවත් ලියකියවිලි හා තොරතුරු නොමැතිවීම මත මෙම මුදල අයකර ගැනීමට දැක්වූ ප්‍රයත්නයන් අසාර්ථකවී ඇති අතර නීති කටයුතු මගින් අයකර ගැනීමට නොහැකි තත්වයට පත්වී ඇත.	ප්‍රමාණවත් ලියකියවිලි හා තොරතුරු නොමැතිවීම මත මෙම මුදල අයකර ගැනීමට දැක්වූ ප්‍රයත්නයන් අසාර්ථකවී ඇති අතර නීති කටයුතු මගින් අයකර ගැනීමට නොහැකි තත්වයට පත්වී ඇත.

3.3 ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	83,974,317	10,624,331	73,349,986	6,931,190	තත්ත්වාගණනය කළ
2022	83,875,747	9,856,833	74,018,914	13,108,798	තත්ත්වාගණනය කළ
2023	65,641,811	33,700,446	31,941,365	(19,919,221)	සත්‍ය හා සාධාරණ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	1987 අංක 47 දරන ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභා පනතේ 10 වගන්තිය ප්‍රකාරව කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සකස් කිරීමත් ඒ හා සම්බන්ධ අනෙකුත් කටයුතු පිළිබඳවත් පර්යේෂණ ආයතන හා ආණ්ඩුව අතර සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීමත් ප්‍රතිපත්ති සභාවේ කර්තව්‍යයක් වන නමුත් පනත ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	2023	පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය.	2023 වසරේ සභාවේ කර්තව්‍යයන් වන ආණ්ඩුව හා පර්යේෂණ ආයතන අතර අදහස් හුවමාරු කර ගැනීමේ මාර්ගයක් වශයෙන් වැඩමුළු හා සම්මන්ත්‍රණ පවත්වන ලදී. එහිදී පර්යේෂණ ආයතන හා ප්‍රතිපත්ති සකස්කරන්නන් අතර සම්බන්ධීකරණ කටයුතු සිදුකරන ලදී. තවද, පර්යේෂණ ප්‍රමුඛතා සැකසීමේදී ආණ්ඩුවේ පුද්ගලික පර්යේෂණ ආයතන සම්බන්ධ කරගෙන රජයේ ප්‍රතිපත්ති සකස් කිරීම හා සම්බන්ධවන අදහස් හුවමාරු කිරීම සිදු කරන බව කළමනාකරණය විසින් දක්වා ඇත.	කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සකස් කර නොතිබුණි.

2	කෘෂිකාර්මික පර්යේෂණ කළමනාකරුවන් සඳහා වන තොරතුරු පද්ධතිය(INFORM) සඳහා පර්යේෂණ ආයතන 30 කින් තොරතුරු කැඳවීම සඳහා සැලසුම් කර තිබුණු නමුත් 2023 වර්ෂයේදී තොරතුරු කැඳවා තිබුණේ ආයතන 24 කින් පමණක් වූ අතර පර්යේෂණ පිළිබඳව රැස් කරන ලද තොරතුරු ඇතුළත් කර වාර්ෂිකව නිකුත් කළ යුතු වාර්තා පොත් 2019 වර්ෂයෙන් පසුව නිකුත් කර නොතිබුණි.	2023	වාර්ෂිකව නිකුත් කළ යුතු වාර්තා පොත් නිකුත් කළ යුතුය.	2023 වර්ෂයේ ආයතන 27 කින් මේ වන විට තොරතුරු ලබා ගෙන ඇති අතර, ඉතිරි ආයතන 03 සඳහා තොරතුරු ලබා ගැනීමට සිහි කැඳවීම් යවා ඇත. 2019 වසරට අදාළ පොත 2023 වසරේ නිකුත් කර ඇති අතර, 2020 සහ 2021 වසරට අදාළව දත්ත ඇතුළත් වාර්ථා පොත් මේ වන විට සකසමින් පවතින බව කළමනාකරණය විසින් දක්වා ඇත.	වාර්තා පොත් 2019 වර්ෂයෙන් පසුව නිකුත් කර නොතිබුණි.
3	ප්‍රතිපත්ති සභාව පිහිටි ගොඩනැගිල්ලට කොටසක් එකතු කරගැනීම සඳහා වූ කොන්ත්‍රාත්තුව 2019 වර්ෂයේදී රු.12,300,000 ක ගොඩනැගිලි දෙපාර්තමේන්තුව සමග ඇතිකරගත් අවබෝධතා ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව පවරා ඇතත් වැඩ නිම කළ යුතු දිනය වූ 2020 අප්‍රේල් 30 දිනට වැඩ අවසන් කර නොතිබුණි. 2022 ඔක්තෝබර් 10 දින වන විට සහතික කළ වැඩවල වටිනාකම රු.5,516,590 ක් වුවත් ඔවුන් වෙත රු.12,217,303 ක	2023 2022	ගොඩනැගිල්ලේ වැඩ නිමකර ගැනීමට කටයුතු කළ යුතුය.	2020 වර්ෂයේ සහ 2021 වර්ෂයේ දී සභාවට මුදල් නොලැබීම මෙන්ම Covid 19 වසංගතය සහ රටේ පැවති දැඩි ආර්ථික අර්බුදය හේතුවෙන් ද මෙම ඉදිකිරීම් කටයුතු නියමිත කාලයට අවසන් කිරිමට නොහැකි විය. ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ නිම කිරිම සඳහා රු.11,088,000 ක ඇස්තමේන්තුවක් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කර ඇත. ගොඩනැගිල්ලේ වැඩ නිමකර නොමැති වීම හේතුවෙන් වායුසමීකරණ යන්ත්‍ර	ගොඩනැගිල්ලේ වැඩ නිමකර නොතිබුණි.

	මුදලක් ගෙවා තිබුණු හෙයින් සහතික නොකළ වැඩ සඳහා රු.6,700,713 ක් වැඩිපුර ගෙවා තිබුණද සැලසුමට අනුව මෙම ව්‍යාපෘතිය නිමකරවා ගැනීමට නම් රු.11,088,000 ක මුදලක් අමතරව දැරිය යුතු බව මැතකදී සිදුකළ ඉංජිනේරු ඇස්තමේන්තුවක් මගින් ඉදිරිපත් කර තිබූ අතර එසේ නොවුනහොත් මෙතෙක් වැය කළ මුදලින් ද අදාළ ප්‍රයෝජනය ගත නොහැකි වී ඇති බව නිරීක්ෂණය විය.			සවිකර නොමැති වුවද නව ජල ටැංකිය හරහා ආයතනයට ජල සැපයුම ලබාදී ඇති බව කළමනාකරණය විසින් දක්වා ඇත.	
4	ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව නමින් පවත්වාගෙන ගිය විදේශීය අරමුදල් මත ක්‍රියාත්මක වූ ව්‍යාපෘතියේ නමින් ලියාපදිංචි කළ Hillux ඩබල් කැබ් රථය ව්‍යාපෘතිය නිම කිරීමෙන් පසුව ප්‍රතිපත්ති සභාවට පවරාගෙන නොතිබුණු නිසා වසර 20 ක් පුරා එම වාහනය අයථා පරිහරණයට ලක්ව ඇත.	2023 2022	වාහනය සභාව වෙත පවරා ගත යුතුය.	JW 3904 දරන මෙම වාහනය සභාවට පවරා ගැනීමේ නීත්‍යානුකූල හැකියාව පිළිබඳව පැහැදිලි කර ගැනීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත මෙම ව්‍යාපෘතියට අදාළ ගිවිසුමේ පිටපතක් ද ඇමුණුමක් සහිතව යොමුකර ඇත. තවද, මහාචාර්ය ඩී.කේ.එන්.ජී පුෂ්පකුමාර මහතා විසින් 2023.08.23 දිනැතිව සභාවට යොමු කර ඇති ලිපිය මගින් ප්‍රකාශ කරනු ලබන්නේ මෙම කැබ් රථය 2023.08.03 වන දී ICRAF ආයතනය හා වාරිමාර්ග හා පරිසර, වන සම්පත් වැව්ලි	ප්‍රතිපත්ති සභාවට වාහනය පවරාගෙන නොතිබුණි.

				බෝග හා කෘෂිකර්ම අමාත්‍යාංශය එක්ව ක්‍රියාත්මක කරන ව්‍යාපෘතියක් සඳහා භාර දී ඇති බවය.	
5	2017 ඔක්තෝබර් 04 දිනැති අංක අමප/17/1992/728/34 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව මැලේසියාව, තායිලන්තය හා පිලිපීනය වැනි රටවලදී වසරකට 30 දෙනා බැගින් වසර 5 ක් තුළ පර්යේෂකයින් 150 ක් දර්ශනපති උපාධිය (Ph.D) හැදෑරීම සඳහා යොමු කළ යුතු අතර ඔවුන් විසින් ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ක්ෂේත්‍රය දැනට මුහුණ දෙන හෝ ඉදිරියේදී මුහුණ දීමට සිදුවිය හැකි ගැටලු හා ප්‍රශ්න පිළිබඳව අවධානය යොමු කරමින් තම පර්යේෂණ මාතෘකාව තෝරා ගත යුතුය. සමාලෝචිත වර්ෂය වන විට එම තීරණයට වසර 5 ක් ගතවී තිබුණද, කොවිඩ් වසංගත තත්ත්වය සහ මූල්‍ය දුෂ්කරතා නිසා ඒ සඳහා යොමුකළ පර්යේෂකයින් සංඛ්‍යාව 79 දෙනෙකු පමණක් වූ අතර එම පර්යේෂකයින් අතරින්ද ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්ත ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය සඳහා වැඩි දියුණු කළ	2022 2021	නිර්දේශිත පර්යේෂණ මාතෘකා තෝරා ගැනීම සඳහා පර්යේෂකයින් ධෛර්යමත් කළ යුතුය.	කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් මේ සඳහා යොමු කරවීමට හැකි වූයේ පර්යේෂකයන් 79 දෙනෙක් වූ අතර එම පර්යේෂකයන් ගේ පර්යේෂණ මාතෘකා ඔවුන්ගේ ආයතනවලට අත්‍යාවශ්‍යව තිබූ ක්ෂේත්‍රයන් අනුව තෝරාගෙන ඇති බව කළමනාකරණය විසින් දක්වා ඇත.	නිර්දේශිත පර්යේෂණ මාතෘකා තෝරා ගැනීම සඳහා පර්යේෂකයින් ධෛර්යමත්වී නොතිබුණි.

	යුතු යැයි හඳුනාගෙන ඇති කෘෂිකාර්මික යාන්ත්‍රීකරණය හා කාබනික කෘෂිකාර්මික ක්ෂේත්‍රයෙන් පර්යේෂණ මාතෘකාව තෝරාගෙන තිබෙනුයේ නිලධාරීන් 8 දෙනෙකු පමණක් බව නිරීක්ෂණය විය.				
6	ප්‍රතිපත්ති සභාව විසින් කාබනික කෘෂිකර්මාන්තය සඳහා අවධානය යොමු කිරීමේ වැදගත්කම හඳුනාගෙන එම ක්ෂේත්‍රයන්හි පර්යේෂණ වැඩි කළ යුතු ප්‍රමුඛතා ක්ෂේත්‍ර 07 ක් ශ්‍රී ලංකාවේ පවතින පර්යේෂණ ආයතන වෙත හඳුන්වාදී තිබුණද, කාබනික කෘෂිකාර්මික ප්‍රතිපත්තිය සහ වර්තමානයේ වෙළඳපලේ පවතින කාබනික ආහාරවල ගුණාත්මක තත්ත්වය සම්බන්ධයෙන් පර්යේෂණ සිදු කිරීම සඳහා 2017 වර්ෂයේ සිට පර්යේෂණ ආයතන උනන්දු කර නොතිබුණි.	2022 2021	සැලසුම් ප්‍රකාරව කටයුතු කිරීම සඳහා පර්යේෂණ ආයතන ධෛර්යමත් කළ යුතුය.	කාබනික කෘෂිකර්මාන්තය සඳහා කමිටුවක් පිහිටුවා 2019 මේ පිළිබඳව වැඩමුළු 02 ක් පවත්වා ඇත. තවද 2020 වසරේ සිට NARP සඳහා ව්‍යාපෘති කැඳවීමේ දී කාබනික කෘෂිකර්මාන්තය පිළිබඳ පර්යේෂණ යෝජනාවලට ප්‍රමුඛතාවය දීමට කටයුතු සිදු කර ඇත. එමඟින් ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතිය තුළ පර්යේෂකවරුන්ගේ උනන්දුව ඇති කිරීමට කටයුතු සිදු කර ඇති බව කළමනාකරණය විසින් දක්වා ඇත.	වර්තමානයේ වෙළඳපලේ පවතින කාබනික ආහාරවල ගුණාත්මක තත්ත්වය සම්බන්ධයෙන් පර්යේෂණ සිදු කිරීම සඳහා පර්යේෂකවරුන්ගේ උනන්දුව ප්‍රමාණවත්ව නොමැත.

3.4 ඉඩම් මැනුම් සභාව

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	93,544,878	7,654,622	85,890,256	958,915	තත්ත්වාගණනය කළ
2022	96,113,667	9,869,531	86,244,136	367,510	තත්ත්වාගණනය කළ
2023	98,621,027	9,288,924	89,332,103	3,130,667	තත්ත්වාගණනය නොකළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්වය
1	2002 ඔක්තෝම්බර් 04 දිනැති 2002 අංක 17 දරන මැනුම් පනතේ 32(1) වගන්තිය අනුව සභාව විසින් පත්කරනු ලබන ලේකම්වරයෙකු සිටිය යුතු වුවත් 2002 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා ලේකම්වරයෙකු පත් කර නොතිබුණි.	2023	ලේකම්වරයෙකු නොපමාව පත් කළ යුතුය.	පුවත්පත් හා ගැසට් නිවේදන සඳහා ලැබුණු අයදුම්පත්‍ර 19 අතුරින් දෙදෙනෙකු පමණක් සම්මුඛ පරීක්ෂණයට සහභාගි විය. ඔවුන් මූලික සුදුසුකම් සපුරා නොතිබීම මත බඳවා ගැනීමක් සිදු නොකරන ලදි.මේ සම්බන්ධයෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කොට බඳවා ගැනීමේ සුදුසුකම්වල පවතින, “රාජ්‍ය අංශයේ වසරක ප්‍රායෝගික පලපුරුද්ද හෝ පුද්ගලික අංශයේ ද වසරක පළපුරුද්ද ද” ලෙසට අදාළ සුදුසුකම් සංශෝධනය කොට ඇතුළත් කර බඳවා ගැනීමේ පරිපාටිය නැවත සංශෝධනයට කටයුතු සූදානම් කර ඇත.	බඳවා ගැනීමේ පටිපාටිය සංශෝධනය සඳහා ක්‍රියා කරමින් පවතී.

2	2002 ඔක්තෝම්බර් 04 දිනැති 2002 අංක 17 දරන මැනුම් පනතේ 38(උ) වගන්තිය අනුව සභාවේ කටයුතු පරිපාලනය සම්බන්ධයෙන් රීති සකස් කර නොතිබුණි.	2023	පරිපාලනය සම්බන්ධයෙන් රීති සකස් කළ යුතුය.	සභාවේ ලියාපදිංචිය සහ වාර්ෂික මැනුම් බලපත්‍රය ලබා දීම යන කරුණු සම්බන්ධයෙන් වන රීති මේ වන විට නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කොට එහි පළමු සංශෝධන සහ නිරීක්ෂණ ලැබී ඇත. එකී නිරීක්ෂණ හා සංශෝධන නැවත සකස් කොට අවසන් අතර අවසාන වරට එය නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවට යැවීමට කටයුතු කර ඇත. ඒ අනුව අදාළ අනුමැතිය ලද විගස සභාවේ ප්‍රධාන කර්තව්‍යයක් වන ලියාපදිංචිය සහ වාර්ෂික මැනුම් බලපත්‍රය සම්බන්ධයෙන් රීති ගැසට් පත්‍රයේ පළ කිරීමට කටයුතු කරනු ඇත.	නීති කෙටුම්පත් දෙපාර්තමේන්තු වෙන් පිළිතුරක් බලාපොරොත්තු වෙන් සිටී.

3.5 කලා මණ්ඩලය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	4,323,043	1,131,546	3,191,497	(3,176,242)	තත්ත්වාගණනය කළ
2022	3,759,776	1,301,362	2,458,414	(523,304)	තත්ත්වාගණනය කළ
2023	5,530,710	1,457,312	4,073,398	259,079	තත්ත්වාගණනය නොකළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්වය
1	ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 135 ප්‍රකාරව මණ්ඩලය විසින් 2021 වර්ෂය සඳහා මූල්‍ය බලතල පවරා නොතිබුණි.	2021	මුදල් රෙගුලාසි ප්‍රකාරව මූල්‍ය බලතල පැවරිය යුතුය.	ශ්‍රී ලංකා කලා මණ්ඩල පනත මගින් ශ්‍රී ලංකා කලා මණ්ඩලයේ විධායක සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මේ දක්වා ක්‍රියාත්මක වී ඇත. වර්තමානයේ රාජ්‍ය අමාත්‍යාංශයෙන් උපදෙස් ලබාගෙන මු.රෙ.135 ප්‍රකාරව මූල්‍ය බලතල පැවරීමට ඉදිරියේදී පියවර ගනු ලැබේ.	2024 වර්ෂයට ද මුදල් රෙගුලාසි 135 ප්‍රකාරව මූල්‍ය බලතල පැවරීමක් සිදු කර නොතිබුණි.
2	1952 අංක 18 දරන ශ්‍රී ලංකා කලා මණ්ඩල පනත කාලානුරූපව ක්ෂේත්‍රයෙහි සිදුවී ඇති වෙනස්කම් හා අවශ්‍යතාවයන් සලකා සංශෝධනය කිරීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.	2021	පනත සංශෝධනය කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය.	ශ්‍රී ලංකා කලා මණ්ඩල පනතේ පවතින ගැටළු නිරාකරණය කර ගැනීමට සංශෝධනය විය යුතු කරුණු ඇතුලත් කරමින් කෙටුම්පත් වාර්තාවක් සකස් කර අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත.	වර්තමාන සභාපතිතුමා ඇතුළු වර්තමාන විධායක කමිටු සාමාජිකභවතුන්ගේ නාමයෝජනා 2024.07.02 දිනැතිව අතිරේක ලේකම්(සංස්

					කෘතික ප්‍රවර්ධන) වෙත ඉදිරිපත් කර ඇත.
3	1952 අංක 18 දරන ශ්‍රී ලංකා කලා මණ්ඩල පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව උපදේශක සභා රැස්වීම්වලදී ගනු ලබන තීරණවල ප්‍රගතිය මණ්ඩලය වෙත ඉදිරිපත් කර නොතිබුණු අතර මණ්ඩලය ද ඒ සම්බන්ධයෙන් පසුවිපරම් කටයුතු සිදුකර නොතිබුණි. එසේම, උපදේශක සභාවල ක්‍රියාකාරීත්වය, කාර්යභාරයන් හා වගකීම සම්බන්ධයෙන්ද පනතේ පැහැදිලිව සඳහන්ව නොතිබුණි	2022	පනතේ නියමයන්ට අනුව කටයුතු කළ යුතුය.	උපදේශක සභා රැස්වීම්වල ප්‍රගතිය හා පසුවිපරම් කටයුතු සිදුකිරීමට අවශ්‍ය කටයුතු විධිමත්ව පාලනය කිරීමට විධායක සභාවේ එකඟතාව ඇතිවිය.	උපදේශක සභා වලින් ක්‍රියාත්මක කරන වැඩසටහන් අදාල කාල රාමුව ඇතුළත ඒ අයුරින්ම සිදුවිය යුතු බව ශ්‍රී ලංකා කලා මණ්ඩලයේ ලේකම් විසින් 2024.06.18 වන දින පැවති ශ්‍රී ලංකා කලා මණ්ඩල රැස්වීමේ දී සියලු උපදේශක සභා සභාපතිවරුන් වෙත උපදෙස් ලබා දී ඇත. උපදේශක සභාවලින් ගන්නා ලද තීරණ ත්‍රෛමාසික රැස්වීම වන විට සම්පූර්ණ කර ඉදිරිපත් කිරීම සුදුසු බවට ද වැඩිදුරටත් ඔවුන් වෙත උපදෙස් ලබා දී ඇත. මේ පිළිබඳ 2024.09.09 දින පැවති ශ්‍රී

					ලංකා කලා මණ්ඩල රැස්වීමේදී ද උපදෙස් ලබා දී ඇත.
4	2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009,2009 ජුනි 17 දිනැති අංක 09/2009 (i) හා 2017 අප්‍රේල් 19 දිනැති අංක 03/2017 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ප්‍රකාරව සේවා ස්ථානයක සිටින සේවක සංඛ්‍යාව ගැන නොසලකා සියළුම රාජ්‍ය ආයතනවල නිලධාරීන් කාර්යාලයට පැමිණීම හා පිටවීම සනාථ කිරීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කළ යුතු වුවත්, මණ්ඩලය විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි.	2023	චක්‍රලේඛයන් ප්‍රකාරව ඇඟිලි සලකුණු යන්ත්‍රයක් භාවිතා කිරීමට කටයුතු කළ යුතුය.	ශ්‍රී ලංකා කලා මණ්ඩලය විසින් විධිමත් ව පැමිණීමේ හා පිටවීමේ ලේඛනයක් හා නිවාඩු ලේඛනයක් විධායක සභාවේ අනුමැතියෙන් හා ශ්‍රී ලංකා කලා මණ්ඩලයේ ලේකම්ගේ අධීක්ෂණය යටතේ පවත්වාගෙන යනු ලබයි.	වර්තමානය වන විටද විගණකාධිපති නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.

3.6 ජේ.ආර්.ජයවර්ධන මධ්‍යස්ථානය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	187,764,082	20,915,944	166,848,138	(7,884,169)	තත්ත්වාගණනය කළ
2022	193,523,268	21,428,020	172,095,248	5,491,805	තත්ත්වාගණනය කළ
2023	-	-	-	-	-

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 1.6 උප වගන්තිය ප්‍රකාරව මධ්‍යස්ථානයේ තනතුරු සඳහා බඳවා ගැනීමේ පරිපාටියක් සකස් කර අනුමත කරගෙන නොතිබුණි.	2022 2021	ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව බඳවා ගැනීමේ පරිපාටියක් සකස් කර අනුමත කර ගත යුතුය.	මේ වන විට බඳවා ගැනීමේ පටිපාටිය කෙටුම්පත් කර තිබෙන අතර අමාත්‍යාංශ ලේකම් මගින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට යොමු කිරීම සඳහා අවශ්‍ය කටයුතු කරමින් පවතී.	2024 සැප්තැම්බර් 30 දින වන විටද අනුමත කර නොතිබුණි.
2	මධ්‍යස්ථානය පිහිටි කොළඹ 07, ධර්මපාල මාවත අංක 191 ස්ථානයේ පවතින රූඩ් 3 පර්චස් 4.47ක් වූ ඉඩම, 1988 වසරේ මධ්‍යස්ථානය ආරම්භයේ සිටම පරිහරණය කර තිබුණද ඉඩමේ අයිතිය මධ්‍යස්ථානයට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.	2022 2021	ඉඩමේ අයිතිය සම්බන්ධ ගැටළු නිරාකරණය කර ගෙන ඉඩමේ අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය.	ඉදිරියේ දී ඉඩමේ අයිතිය සම්බන්ධයෙන් තොරතුරු අදාළ ආයතනයන් වෙත ඉදිරිපත් කර ඉඩමේ අයිතිය පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.	මෙතෙක් ඉඩමේ අයිතිය පවරා ගෙන නොතිබුණි.

3	2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2021 හි මෙහෙයුම් අත්පොතේ 6.6 ඡේදය අනුව කෙටුම්පත් වාර්ෂික වාර්තාව සහ ගිණුම්, ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද මධ්‍යස්ථානය විසින් 2022 වර්ෂයට අදාල ගිණුම් 2023 මැයි 19 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි.	2022	චක්‍රලේඛ ප්‍රකාරව නියමිත දිනට වාර්ෂික වාර්තාව සහ ගිණුම් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට පියවර ගත යුතුය.	පාලක මණ්ඩල අනුමැතිය ලබා ගැනීම ප්‍රමාද වූ අතර ඉදිරියේදී රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ ප්‍රකාරව විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට සටහන් කර ගන්නා ලද බව.	2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2024 ඔක්තෝබර් 07 දින වන විටත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

3.7 ටවර් හෝල් රඟහල පදනම

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	බදු පෙර ලාභය (අලාභය) රු.	මතය
2021	1,776,216,480	33,953,733	1,742,262,747	(77,244,494)	තත්ත්වාගණනය කළ
2022	1,757,393,834	41,161,620	1,716,232,214	(80,792,883)	තත්ත්වාගණනය කළ
2023	1,644,778,157	50,270,270	1,594,507,887	(4,844,240)	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	**වාර්තාවේ වර්ෂය**	**විගණකාධිපති නිර්දේශය**	**විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග**	**වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය**
1	2023 දෙසැම්බර් 31 දිනට පැවති වසර 05 කට අධික කාලයක සිට පැවත එන රු.1,203,583 ක ණයගැති ශේෂ අයකර ගැනීමට නිසි ක්‍රියාමාර්ග අනුගමනය කර නොතිබුණි.	2023	දිර්ඝ කාලයක සිට පැවත එන ණයගැති ශේෂ අයකර ගැනීමට නිසි ක්‍රියාමාර්ග ගත යුතුය.	විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදි සාකච්ඡා වු අතර ඉදිරි කමිටු රැස්වීමට එම ශේෂයන්හි විස්තර ඉදිරිපත් කරන ලෙස ලබා දුන් උපදෙස් අනුව කටයුතු කිරිමට සටහන් කර ගන්නා ලද බව.	වසර 05ට වඩා වැඩි ශේෂයන් පිළිබඳව 2024 වර්ෂයේ අවසන් වරට පැවැත්වු විගණන හා කලමනාකරණ කමිටු රැස්වීමේදි සාකච්ඡා වු අතර ඉදිරි විගණන හා කලමණාකරන කමිටු රැස්වීමේදි එම ශේෂයන්හි වෙන් වෙන් වශයෙන් සවිස්තරාත්මක වාර්තාවක්

					ඉදිරිපත් කරන ලෙස උපදෙස් ලබා දී ඇත.
2	2023 දෙසැම්බර් 31 දිනට වසර 05 කට වැඩි කාලයක් ඉක්මවා ඇති කොන්ත්‍රාත් රැඳවුම් මුදල් රු.1,786,008 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.	2023	ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කළ යුතුය.	ඉදිරි විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදි ඉදිරිපත් කර එම උපදෙස් අනුව කටයුතු කරනු ඇත.	2024 සැප්තැම්බර් 30 දින වන විටද නිරවුල් කිරිමට කටයුතු කර නොතිබුණි.
3	සච්සිරිපාය ගොඩනැගිල්ල සහ එය පිහිටි භූමිභාගය පදනම වෙත පවරාදීමට අදාළ 1980 ඔක්තෝබර් 08 දිනැති විශේෂ දීමනා පත්‍රයේ නියමයන් අනුව මෙම ඉඩම හා එහි පිහිටි ගොඩනැගිලි ජාතික න්‍යාය කටයුතු දිරිගැන්වීම සහ ප්‍රවර්ධනය කිරීමට අවශ්‍ය කාර්යයන් සඳහා මිස වෙනත් කාර්යයන් සඳහා නොයෙදවිය යුතු බවත්, එම කාර්යයන් සඳහා යොදවා නොගන්නේ නම් නැවත රජය වෙත පැවරෙනු ඇති බවත් සඳහන් වී තිබුණ ද, පදනම සතු සච්සිරිපාය ගොඩනැගිල්ල හා එය පිහිටි භූමිභාගය 1986 මැයි 15 දින සිට ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියට අවස්ථා 02 කදී වසර 30 බැගින් බදු දී තිබුණු අතර විධිමත් අනුමැතියකින් තොරව දෙවන ගිවිසුමට එළඹ තිබුණි. 2016 මැයි 14 දින බදු කාල සීමාව අවසන් වීමෙන් පසුවද කුලී ගෙවීමකින් තොරව සහ 2023 ජනවාරි 04 දින	2021 2022 2023	2024 මැයි 27 දිනැති අංක: අමප/24/1286//620/022 දරන ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 2024 ජූලි 09 දින ලබාදී ඇති තීරණය ප්‍රකාරව ගොඩනැගිල්ල නැවත පදනම වෙත පවරා ගැනීමට හා හිඟ කුලී අයකර ගැනීමට කඩිනම් පියවරගත යුතුයි.	2024 මැයි 27 දිනැති අංක: අමප/24/1286//620/022 දරන ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුව ගොඩනැගිල්ල නැවත පදනම වෙත පවරා ගැනීමට හා හිඟ කුලී අයකර ගැනීමට 2024 ජූලි 09 දින කැබිනට් මණ්ඩල අනුමැතිය ලබා දී ඇත.	මේවන විට එම කැබිනට් තීරණය අනුව ගෙවිය යුතු හිඟ මුදලින් ආරම්භක ගෙවීමක් ලෙස රු. මි. 25 ක මුදලක් ලබා දී ඇති අතර ගොඩනැගිල්ල නැවත පදනම වෙත පවරා ගෙන නොතිබුණි.

	අග්‍රාමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් පැවති රැස්වීමේදී හා 2024 ජනවාරි 30 දින අග්‍රාමාත්‍ය ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පැවති රැස්වීමේදී ගන්නා ලද තීරණ අනුව ගාස්තු ගෙවීමට, නව බදු ගිවිසුමකට එළඹීමට හෝ එම කාර්යාලය අධිකාරිය සතු ගොඩනැඟිල්ලක වහාම ස්ථාපිත කිරීමට කටයුතු නොකර, ගොඩනැඟිල්ලේ රැඳී තිබුණි.					
4	1978 අංක 01 දරන ටවර් හෝල් රඟහල පදනම පනත කාලානුරූපීව සංශෝධනය කර ගැනීමට පියවර ගෙන නොතිබුණි.	2021 2022 2023		කඩිනමින් පනත සංශෝධනය කර ගැනීමට කටයුතු කළ යුතුය.	ටවර් හෝල් රඟහල පදනම පනත සංශෝධනය කිරීම සඳහා කැබිනට් අනුමැතිය ලබාගෙන ඒ සඳහා කමිටුවක් පත්කර වර්තමානයට ගැලපෙන පරිදි සංශෝධන ඇතුලත් කරන ලදී. දැනට සංශෝධන ඇතුලත් පනත් කෙටුම්පත නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත. එම දෙපාර්තමේන්තුව විසින් අනුමැතිය ලැබුණු පසු කැබිනට් මණ්ඩලයට සහ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත.	වර්තමානයට ගැලපෙන පරිදි සංශෝධන ඇතුළත් කරන ලද පනත් කෙටුම්පත නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව විසින් අනුමත කර නිතිපති වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත.

3.8 ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	බදු පෙර ලාභය (අලාභය) රු.	මතය
2021	1,041,333,428	455,880,422	585,453,006	9,417,553	තත්ත්වාගණනය කළ
2022	1,247,881,012	601,239,707	646,641,305	30,688,601	තත්ත්වාගණනය කළ
2023	1,500,693,679	737,525,866	763,167,813	130,355,521	pending

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	1971 අංක 47 දරන ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා පනතේ 4 (ඌ) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකාව තුළ සහ ශ්‍රී ලංකාවෙන් පිටත චිත්‍රපට සම්බන්ධයෙන් වෙළඳපොල පර්යේෂණ පැවැත්වීමට කටයුතු කර නොතිබුණි.	2021 2022 2023	වෙළඳපොල පර්යේෂණ කටයුතු සිදු කිරීමට කඩිනම් පියවරගත යුතුය.	මේ වනවිට චිත්‍රපට සම්බන්ධයෙන් සිදුකල හැකි පර්යේෂණ 4ක් යෝජනා වී ඇති අතර විද්වත් කමිටුවක උපදෙස් ලබාගැනීමෙන් පසුව පර්යේෂණ මාතෘකාවක් තෝරාගෙන කොළඹ විශ්ව විද්‍යාලයේ පර්යේෂණ අංශය වෙත භාර දී ඇත. මෙම වසරේදී විශ්ව විද්‍යාල සිසුන් සමඟ එක්ව එම පර්යේෂණ සිදුකිරීමට නියමිතය.	2024 සැප්තැම්බර් 30 දින විටත් වෙළඳපොල පර්යේෂණ පැවැත්වීමට කටයුතු කර නොතිබුණි.
2	2023 දෙසැම්බර් 31 දිනට චිත්‍රපට නිෂ්පාදනයට සහ සිනමාශාලා සඳහා ලබාදී ඇති ණය මුදල් වලින් එකතුව රු.	2021 2022 2023	ණය වාරික හා පොළී අයකර ගැනීම පිළිබඳ වූ ක්‍රියාවලිය ඉහළ කළමනාකරණය විසින් විධිමත් හා	චිත්‍රපට නිෂ්පාදනය සඳහා ලබාදී ඇති ණය ගෙවන ලෙස දැන්වූ අතර ඉන් එක් පුද්ගලයක් පමණක් රු. 75,000/= ක මුදලක්	අයකරගත හැකි ශුද්ධ ණය ශේෂය වූ රු.මිලියන 122න් රු.මිලියන 27 ක්

	88,503,920 ක් සහ සිනමාශාලා වලින් සංස්ථාවට ලැබිය යුතු හිඟ මුදල් එකතුව රු. 389,961,318 ක් ඇතුළුව එකතුව රු. 478,465,238 ක මුදලක් සංස්ථාව වෙත ලැබිය යුතුව තිබුණි. එම මුළු ලැබිය යුතු මුදලින් එකතුව රු.356,646,954 ක් අධිභාර සහ හානිකරණ ගැලපීම නිසා 2023 දෙසැම්බර් 31 දිනට අයකරගත හැකි ශුද්ධ ණය ශේෂය රු.121,818,284 ක් එනම් මුළු ණයගැතියන්ගෙන් සියයට 25.46 ක් විය. කළමනාකරණය විසින් ණය අයකර ගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග නොගැනීම මත මෙම ණය අයකරගත නොහැකිවී තිබුණි.		කාර්යක්ෂමව ක්‍රියාත්මක කළ යුතු අතර, හිඟ හිටි පැරණි ශේෂ අයකර ගැනීමට සහ ඒවා නිරවුල් කිරීමටත් දැඩි පාලන උපක්‍රම අනුගමනය කිරීමටත් ඉදිරියේදී ණයගැති ශේෂ බොල් ණය නොවී අයකර ගැනීමටත් කටයුතු කළ යුතුය.	ගෙවා ඇත. සිනමාශාලාවලින් දැනට ක්‍රියාත්මක වනුයේ සිනමාශාලා 142 ක් පමණි. එම හිඟ මුදල් අයකරගැනීමට කටයුතු කරන අතර වසාදමා ඇති හා පැරණි හිඟ සිනමාශාලාවලින් මේ වනවිට රු. මිලියන 27ක් පමණ අයකරගෙන ඇත. ඊට අමතරව මෙම හිඟ මුදල් අයකරගැනීමට නොහැකි සිනමාශාලාවලට නඩු පැවරීමට අවශ්‍ය කටයුතු සිදුවෙමින් පවතී.	පමණක් අයකරගෙන තිබුණි.
3	සංස්ථාවේ ප්‍රධාන කාර්යාලය, තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් කුරුඳුවත්ත ග්‍රාම නිලධාරී වසමේ පිහිටි මු.ති.කො. 9848 දරන පිඹුරේ කැබලි අංක 01 දරන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 1.1235 ක ඉඩමෙහි පිහිටා තිබුණි. මෙම ඉඩමේ නීත්‍යානුකූල අයිතිය සංස්ථාව වෙත පවරා ගැනීමකින් තොරව සංස්ථාවේ ප්‍රධාන කාර්යාලය ඇතුළු	2022 2023	ඉඩමේ නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට ක්‍රියා කළ යුතුය.	නීත්‍යානුකූල අයිතිය සංස්ථාවට පවරාගැනීමට අදාලව කටයුතු සිදු කරමින් පවතී.	2024 සැප්තැම්බර් 30 දින වනවිටත් අයිතිය පවරාගෙන නොතිබුණි.

	ගොඩනැගිලි කිහිපයක් ඉදිකර එහි සංස්ථාවේ ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන ගොස් තිබුණි.				
4	2023 දෙසැම්බර් 31 දිනට එකතුව රු. 870,659 ක් වූ දළ සේයාපට සහ රසායනාගාර ද්‍රව්‍ය තොගය 2014 වර්ෂයේ සිට කාලය ඉකුත්වීම සහ වර්තමානයේ භාවිතා නොකිරීම නිසා ප්‍රයෝජනයට ගත නොහැකි තත්ත්වයක පැවති අතර පූර්ව වර්ෂ විගණකාධිපති වාර්තාව මඟින්ද පෙන්වා දී තිබුණද, මෙම නිෂ්කාර්යය වත්කම් අපහරණය කිරීමට කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.	2022 2023	ප්‍රයෝජනයට ගත නොහැකි මෙම තොගය සමීක්ෂණ මණ්ඩල තිරණ හා පවත්නා නිති රීති අනුව අපහරණය කිරීමට කටයුතු කළ යුතුය.	මෙම වත්කම් හඳුනාගෙන ඇති අතර නිසි ක්‍රමවේදයකට අපහරණය කිරීමට නියමිතය.	2024 සැප්තැම්බර් 30 දින විටත් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.
5	ආචාර්ය “ලෙස්ටර් ජේම්ස් පීරිස්” මහතා නමින් සංස්ථා පරිශ්‍රය තුළ කෞතුකාගාරයක් සහ පුස්තකාලයක් ඉදිකිරීම සඳහා ඉදිකිරීම් සහ උපදේශනාත්මක කටයුතු වෙනුවෙන් එකතුව රු. 99,965,061 ක ඇස්තමේන්තුගත වටිනාකමට රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට පවරා දීමට ද්විපාර්ශවික ගිවිසුමකට එළඹ 2019 අප්‍රේල් 05 දින එහි ඉදිකිරීම් ආරම්භ කර	2021 2022 2023	විමර්ශන කටයුතු කඩිනමින් අවසන් කර 2021 ජූලි 19 දින පැවති පොදු ව්‍යාපාර කාරක සභා රැස්වීමේදී ලබාදුන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.	මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් විමර්ශනයක් සිදුකර එහි වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර අධ්‍යක්ෂ මණ්ඩල තීරණය පරිදි වූදිත නිලධාරීන් සම්බන්ධ විනය බලධාරීත්වය මෙම සංස්ථාව සතුව නොමැති බැවින් එම විමර්ශන වාර්තාව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.	මූලික විමර්ශන වාර්තාව හා චෝදනාපත්‍ර කෙටුම්පත් වාර්තා ගොනු ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත.

	තිබුණි. නාගරික සංවර්ධන අධිකාරියේ සහ අමාත්‍ය මණ්ඩල අනුමැතියක් රහිතව ආරම්භ කළ මෙම ඉදිකිරීම වෙනුවෙන් 2023 දෙසැම්බර් 31 දින වන විට එකතුව රු.3,134,107 ක් ගෙවීම් කර තිබුණි. පූර්ව වර්ෂ විගණකාධිපති වාර්තාව මඟින්ද පෙන්වා දුන් මෙම ඉදිකිරීමේ කටයුතු වසර 04 කට වැඩි කාලයක සිට අතහැර දමා තිබූ අතර, ඉදිකිරීම් ආරම්භ කළ මෙම ගොඩනැගිල්ලේ ඇති යකඩ කුරු දැඩි ලෙස භායනයට ලක්වීම නිසා ගොඩනැගිල්ල විනාශ වෙමින් පැවතුණි.				
6	2021 වර්ෂයේ මාර්තු මස ආරම්භ කර ඔක්තෝබර් වන විට නිම කිරීමට සැලසුම් කරමින් රු.මිලියන 15 ක ප්‍රතිපාදනයක් යටතේ 2021 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර තිබූ විත්‍රපට ආනයනය, බෙදාහැරීම හා ලියාපදිංචිය විධිමත් කිරීමට අදාළ පරිගණක පද්ධතිය ස්ථාපිත කිරීමේ කාර්යය සඳහා දෙපාර්ශවය අතර එළඹී අංක 4820 දරන 2022 අප්‍රේල් 28 දිනැති මුල් ගිවිසුමේ කාලය අවස්ථා 03 කදී දීර්ඝ කර තිබුණද එම	2023	ප්‍රසම්පාදන කටයුතු කඩිනමින් සිදුකර පරිගණක පද්ධතිය ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතුය.	මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී ඇති වූ ප්‍රායෝගික ගැටළු මත ව්‍යාපෘතිය අවසන් කිරීමට කාලය ගත වී ඇති බැවින් ගිවිසුම් දීර්ඝ කිරීම සිදු කර ඇත. තවද නව ගිවිසුමකට ඇතුලත් වීමට අදාළව අනුමැතිය අපේක්ෂාවෙන් අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් යොමු කර ඇත.	2024 සැප්තැම්බර් 30 දින වන විටත් ව්‍යාපෘතියේ වැඩ අවසන් කර නොතිබුණි.

	කාර්යය 2024 අගෝස්තු 05 දින වන විටත් අවසන් කර නොතිබුණු අතර 2023 හා 2024 වර්ෂවල ක්‍රියාකාරී සැලසුම් තුළ මෙම ක්‍රියාකාරකම ඇතුළත් කර නොතිබුණි. තවද දෙපාර්ශවය අතර එළඹී අංක 4867 දරන අවසාන ගිවිසුමද 2023 ජූලි 23 දින අවසන්ව තිබුණද නව ගිවිසුමකට එළඹීමට ද කටයුතු කර නොතිබුණි.				
7	සංස්ථාවට අයත් "තරංගනී" සිනමා ශාලාවේ කටයුතු සඳහා රු.11,460,155 ක් ගෙවා 4K DCP ප්‍රොජෙක්ටරයක් මිලදීගෙන තිබුණි. නමුත්, මෙම යන්ත්‍රය ක්‍රියාකාරී තත්ත්වයට පත්කර ගැනීම සඳහා අවශ්‍ය අමතර කොටස් 2022 වර්ෂය දක්වාම මිලදී ගැනීමට සංස්ථාවට නොහැකි වී තිබුණි.මෙම ප්‍රොජෙක්ටරය ක්‍රියාකාරී තත්ත්වයට පත් කර ගැනීමට නොහැකි වීම නිසා එය මිලදී ගැනීමට වැය කළ මුදල් සහ "තරංගනී" සිනමා ශාලාව නිශ්කාර්ය වත්කම් බවට පත් වී තිබුණි.	2021	මෙම ප්‍රොජෙක්ටරය ක්‍රියාකාරී තත්ත්වයට පත්කර "තරංගනී" සිනමා ශාලාව ආදායම් ඉපයීම සඳහා භාවිතා කළ යුතුය.	නැවත තාක්ෂණික කමිටුවට ඉදිරිපත් කර එම කමිටුවේ නිර්දේශය ප්‍රසම්පාදන කමිටුවට ඉදිරිපත් කර සෘජු මිලදී ගැනීමක් සිදුකර යන්ත්‍රය ක්‍රියාත්මක කිරීමට නියමිත බව.	2024 සැප්තැම්බර් 30 දින වන විටත් විගණන නිර්දේශ ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
8	2020 ඔක්තෝබර් 02 දිනැති අංක 05/2020 දරන වත්කම්	2021 2022	චක්‍රලේඛය ප්‍රකාරව ධාවනය නොකරන වාහන	මේ වන විට මෝටර් රථ කිහිපයක් අලුත්වැඩියා කර	2024 සැප්තැම්බර් 30 දින වන විටත්

කළමනාකරණ චක්‍රලේඛයේ 2 (අ) සහ (ආ) ඡේද ප්‍රකාරව 2023 වර්ෂය වන විට සංස්ථාව සතුව මෝටර් රථ 14 ක් පැවති අතර, 2020 වර්ෂයේ සිටම වාහන 06 ක් ධාවනයෙන් ඉවත් කර තිබුණි. 2022 වර්ෂය වන විට මොටර් රථ 05 ක් පමණක් ධාවනයේ යොදවා තිබූ අතර, මෙම චක්‍රලේඛය ප්‍රකාරව අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ ධාවනය නොකරන වාහන අපහරණය කිරීමට ක්‍රියාකර නොතිබුණි.	අපහරණය කිරීමට පියවරගත යුතුය.	ධාවනයට යොදා ඇත.ඉතිරි වාහන ඉදිරියේදී අපහරණය කිරීමට නියමිතය.	විගණන නිර්දේශ ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

3.9 ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	බදු පෙර ලාභය (අලාභය) රු.	මතය
2021	17,805,525,486	11,278,365,221	6,527,160,264	48,502,732	තත්ත්වාගණනය කළ
2022	17,496,536,781	10,990,473,724	6,506,063,057	69,394,967	තත්ත්වාගණනය කළ
2023	17,827,587,307	10,841,466,718	6,986,120,590	747,545,907	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපතිගේ නිර්දේශය	ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01.	**මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය**				
	වත්කම් වාර්ෂිකව සත්‍යාපනය කිරීමට හැකි වන පරිදි කාර්යාංශයේ ස්ථාවර වත්කම් නිසියාකාරව කේත කිරීමේ ක්‍රියාවලිය 2023 දෙසැම්බර් 31 වන විටත් සම්පූර්ණ කර ඒ අනුව මධ්‍යගත ස්ථාවර වත්කම් ලේඛණයක් සකස් කර නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති රු.මිලියන 4,308.58 ක් වටිනා දේපළ, පිරියත සහ උපකරණවල භෞතික පැවැත්ම පිළිබඳ විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය.	2022 2023	කාර්යාංශයේ සියලුම වත්කම් නිසියාකාරව කේත කර ස්ථාවර වත්කම් ලේඛණවලට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය.	ස්ථාවර වත්කම් කේත කිරීමේ ක්‍රියාවලිය 2024 වර්ෂය තුළදී අවසන් කර ගිණුම්වලට ඇතුළත් කිරීමට අදහස් කෙරේ.	කාර්යාංශයේ ස්ථාවර වත්කම් කේත කිරීමේ ක්‍රියාවලිය මේ දක්වා අවසන් කර නොමැත.
02.	**ලැබිය යුතු මුදල්**				
(අ)	2023 දෙසැම්බර් 31 දිනට කාර්යාංශයට පරිපාලිත සමාගමෙන් රු.මිලියන	2022 2023	මෙම ශේෂය කඩිනමින් නිරවුල් කිරීමට	CECB අධ්‍යක්ෂ මණ්ඩලයේ උපදෙස් මත, අන්තර් සමාගම්	පරිපාලිත සමාගමෙන් කාර්යාංශය

	1,545.96 ක් ලැබිය යුතු වන අතර මෙම වටිනාකම තුළ වාහන කුලියට දීමේ ගාස්තු, ස්ථාවර වත්කම් කුලියට දීමේ ගාස්තු සහ තොග හුවමාරු කිරීම් සහ තාවකාලික ණය ආදිය ඇතුළත් විය. කෙසේ වෙතත්, මෙම ගනුදෙනු සම්බන්ධයෙන් කාර්යාංශය සහ පරිපාලිත සමාගම අතර නිසි සහ යාවත්කාලීන ගිවිසුම් පවත්වාගෙන ගොස් නොතිබුණු අතර මෙම ශේෂය නිරවුල් කිරීමට කිසිදු ඵලදායී ක්‍රියාමාර්ගයක් නොගැනීම නිසා 2017 වර්ෂයේ සිට මෙම ශේෂය අඛණ්ඩව ඉහළ ගොස් ඇති බව නිරීක්ෂණය විය.		අවශ්‍ය කටයුතු කළ යුතුය.	ශේෂය සඳහා කොපමණ කාලයක් සලකා බැලිය යුතුද යන්න පිළිබඳව මතයක් ලබා දීම සඳහා උපදේශන සමාගමකට පවරා තිබුණු අතර එම උපදේශන සමාගම විසින් ලබා දුන් කෙටුම්පත් වාර්තාව සමාලෝචනය කරමින් සිටින අතර ඒ අනුව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ඇතිව අවශ්‍ය ගැලපීම් සිදු කිරීමට නියමිතය.	වෙත මේ දක්වා ලැබිය යුතු ශේෂය අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොමැත.
(ආ)	2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව කාර්යාංශයේ මුළු ණයගැති ශේෂය රු.මිලියන 4,549.28 ක් වූ අතර එම ණයගැතියන්ගේ කාල විශ්ලේෂණයට අනුව දිගුකාලීනව අය නොවූ ණයගැතියන් පැවතුනි. ඉංජිනේරු ප්‍රසම්පාදන ඉදිකිරීම් (EPC) අංශයේ වර්ෂ 3 – 5 අතර ණයගැති ශේෂයන් සහ වර්ෂ 5 ඉක්මවූ ණයගැති ශේෂයන් පිළිවෙලින් රු.මිලියන 246.90 ක් සහ රු.මිලියන 1,280.46 ක් වූ අතර එය ඉංජිනේරු ප්‍රසම්පාදන ඉදිකිරීම් (EPC) අංශයේ මුළු ණයගැති ශේෂය වූ රු.මිලියන 2,425.99 ක වටිනාකම හා සැසඳීමේදී	2021 2022 2023	කාර්යාංශයේ මූල්‍ය ක්‍රියාපටිපාටි අත්පොතට අනුව ණයගැති මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.	පසුගිය වසර හා සසඳන විට ණයගැති ශේෂය රු.මිලියන 5,300 සිට රු.මිලියන 4,500 දක්වා අඩු වී ඇත. එමෙන්ම ආයතනය විසින් දිගින් දිගටම ණය ශේෂ පිළිබඳ සාකච්ඡා අදාල ආයතන සමග කරගෙන යනු ලැබේ. තවදුරටත් ණයගැති පාලන කමිටුව (Debtor Control Committee) මඟින් කාලීනව අභ්‍යන්තර අංශ වල පසු විපරම් කරනු ලැබේ.	වර්ෂ 3-5 ත් අතර සහ වර්ෂ 05 ට වැඩි ණය ශේෂ අයවීම ඉතා දුර්වල තත්ත්වයක පවතින අතර 2024 ජූනි 30 දිනට මුළු ණයගැති ශේෂය රු.මිලියන 4,712.42 ක් දක්වා වැඩි වී ඇත.

	සියයට 63ක් නියෝජනය විය. තවද, උපදේශන අංශයේ වර්ෂ 3 – 5 ත් අතර ණයගැති ශේෂයන් සහ වර්ෂ 5 ඉක්මවූ ණයගැති ශේෂයන් පිළිවෙලින් රු.මිලියන 270.48 ක් සහ රු.මිලියන 356.54 ක් වූ අතර එය උපදේශන අංශයේ මුළු ණයගැති ශේෂය වූ රු.මිලියන 2,116.54 ක වටිනාකම හා සැසඳීමේදී සියයට 30ක් නියෝජනය විය. කාර්යාංශයේ මූල්‍ය ක්‍රියාපටිපාටි අත්පොතට අනුව ලැබිය යුතු ණයගැතියන් කළමනාකරණය කිරීමේ ක්‍රියාදාමයන් මඟින් කාර්යාංශයේ මුදල් ප්‍රවාහයන් පවත්වා ගැනීමට සහ "බොල්ණය" අවම කිරීම සඳහා කාර්යාංශයට ලැබිය යුතු මුදල් නියමිත වේලාවට සහ ව්‍යවස්ථාපිත අවශ්‍යතාවලට අනුකූලව එකතු කර ගැනීමට කටයුතු කර නොතිබීම මීට හේතු වී ඇත.				
03.	**බදු රෙගුලාසිවලට අනුකූල නොවීම** 2010 අංක 16 දරන ගෙවීම් පැහැර හරිනු ලැබූ බදු පියවීමේ (විශේෂ විධිවිධාන) පනතේ 7 (2) වගන්තිය අනුව කාර්යාංශය විසින් 1996 සිට 2007 කාලපරිච්ඡේදයන්ට අදාළව නොගෙවූ ආදායම් බදු, වැට් බදු, උපයන විට ගෙවීම් බදු සහ අනෙකුත් බදු වර්ග සඳහා එකතුව රු.මිලියන	2022 2023	නොගෙවූ බදු දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.	දැනටමත් රු.මිලියන 20 ක් ගෙවා නිම කර ඇති අතර ඉතිරි බදු ප්‍රමාණය කාලීනව IRD සමග අවබෝධයෙන් ගෙවීම් කරගෙන යනු ලැබේ.	ගෙවිය යුතු බදු රු.මිලියන 29.59 ප්‍රමාණයක් ගෙවීම් කර නොමැත.

	49.59 ක බදු සහ දඩ මුදල් දේශිය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ගෙවීම පැහැර හැර තිබුණි.				
04.	**කළමනාකරණ අකාර්යක්ෂමතා**				
(අ)	කාර්යාංශය සතුව කොළඹ 07, සරණ පාරේ පිහිටි නිල නිවාස 15 න් නිල නිවාස 05ක් එනම් අංක සී, අංක ඩී - 7, අංක එම්, අංක ඒ - 1, අංක ඒ - 4 බාහිර පාර්ශවයන් විසින් භාවිතා කරන අතර එලෙස බාහිර පාර්ශවයන් වෙත නිවාස ලබා දීම සඳහා කාර්යාංශය සතුව අනුමත ක්‍රමවේදයක්ද නොමැති අතර එම නිල නිවාස ලබා දීමේදි කාර්යාංශය විසින් අදාළ පාර්ශව සමඟ ගිවිසුම්ගත වීමක්ද සිදු කර නොතිබුණි.	2021 2022 2023	කාර්යාංශයේ නිලධාරීන්ගේ පදිංචිය සඳහා පමණක් නිල නිවාස වෙන් කර දීමට කටයුතු කළ යුතුය.	මෙම නිල නිවාස බාහිර පාර්ශවයන්ට ලබාදීම සිදුකරනු ලබන්නේ රේඛීය අමාත්‍යාංශයේ උපදෙස් මතය.	අංක ඩී - 7 සහ අංක එම් නිවාස මේ දක්වා ආපසු භාර දී නැත.
(ආ)	ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DL/10/02/07 - x දරන හා 2020 අගෝස්තු 21 දිනැති ලිපිය මඟින් සහ ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ නේවාසික කළමණාකරුගේ අංක RPM/RO/L/CLO/PB/38 දරන හා 2020 නොවැම්බර් 19 දිනැති ලිපිය මඟින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් අම්පාර දිස්ත්‍රික්කයේ රඹකැන්ඔය මහවැලි කලාපයේ පිහිටි පොල්ලේ බැද්ද මහවැලි කොට්ඨාශයේ ඉඩම් අක්කර 150 ක් මිශ්‍ර කෘෂිකාර්මික	2022 2023	දීර්ඝ කාලීන බදු ගිවිසුමකට එළැඹීමට කටයුතු කළ යුතුය.	ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ලිපියට අනුව දීර්ඝ කාලීන බදු ගිවිසුමට එළැඹීම තවම අවසන් කර නැත.	මේ දක්වාම දීර්ඝ කාලීන බදු ගිවිසුමකට එළැඹී නැත.

	ව්‍යාපෘතියක් සඳහා කාර්යාංශය වෙත ලබා දී ඇති අතර කාර්යාංශය විසින් 2024 අප්‍රේල් 30 දින වන විටත් එම ඉඩම දිගුකාලීනව බදු පදනම මත ලබා ගැනීම සඳහා විධිමත් බදු ගිවිසුමකට එළඹීමට කටයුතු කර නොතිබුණි.				
(ඇ)	කාර්යාංශයට අයත් පරිපාලිත සමාගමේ (CESL) අනුරාධපුර මෙහෙයුම් කාර්යාලයේ 2016 ජනවාරි 01 සිට 2020 ජුනි 22 දක්වා සිදුව ඇතැයි සැලකෙන විෂමාචාරයන් සැලකිල්ලට ගෙන එවකට ප්‍රධාන මෙහෙයුම් ඉංජිනේරුවරයා ලෙස රාජකාරි කටයුතු කළ නිලධාරියා 2021 ජනවාරි 11 දින සිට වැඩ තහනමකට ලක් කර තිබුණු අතර, 2021 මැයි 24 දිනැති ලිපියෙන් අදාළ නිලධාරියා කාර්යාංශයේ සේවකයෙකු ලෙස නැවත පත්කර තිබුණු නමුත් ඔහුට අදාළ විමර්ශනය කටයුතු 2024 අප්‍රේල් 30 වන විටත් අවසන් කර විමර්ශන වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි.	2022 2023	විමර්ශනය කඩිනමින් අවසන් කිරීමෙන් පසුව සුදුසු පරිදි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය.	මෙහෙයුම් ඉංජිනේරුවරයා ලෙස රාජකාරි කටයුතු කළ නිලධාරියා නැවතත් CESL ආයතනය වෙත අනුයුක්ත කර ඇති බැවින් අදාල විමර්ශනය CESL ආයතනය විසින් කරගෙන යනු ලැබේ.	මේ දක්වා විමර්ශණය අවසන් කර වාර්තා ඉදිරිපත් කර නොමැත.
05.	**මෙහෙයුම් අකාර්යක්ෂමතා**				
(අ)	2021, 2022 සහ 2023 වර්ෂ 03 ට අදාලව කාර්යාංශයේ මෙහෙයුම් කටයුතුවලින් රු.මිලියන 654.52 ක මුළු අලාභයක් වාර්තා කර තිබුණි. ඒ අනුව ඉංජිනේරු ප්‍රසම්පාදන ඉදිකිරීම් (EPC) අංශය සහ	2023	කාර්යාංශයේ සියලුම අංශවල මෙහෙයුම් කටයුතුවලින් උපරිම ලාභ ලබා ගැනීමට කළමනාකරණය කටයුතු කළ යුතුයි.	ආයතනයේ පාලනයෙන් ඔබ්බට ගිය රටේ ආර්ථික පසුබෑම කාර්යංශයෙහි ක්‍රියාකාරිත්වයට අහිතකර ලෙස බලපා ඇත.	වර්තමානයේදී ද ඉදිකිරීම් ව්‍යාපෘතිවල ප්‍රගතියක් නොමැති අතර අත්හිටවූ ව්‍යාපෘතිවල ක්‍රියාකාරීත්වය යථා

	උපදේශන අංශය යන කාර්යාංශයේ ප්‍රධාන අංශ දෙකෙහි 2023 දෙසැම්බර් 31 දිනට මෙහෙයුම් කටයුතුවලින් ලද සමුච්චිත ප්‍රතිඵලයන්ද පිළිවෙලින් රු.මිලියන 222.14 ක් සහ රු.මිලියන 456.40 ක් වූ අලාභයන් වාර්තා කර තිබුණි.				තත්ත්වයට පත් වී නොමැත.
(ආ)	2023 වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද ඉංජිනේරු ප්‍රසම්පාදන ඉදිකිරීම් (EPC) අංශයේ මූල්‍ය ප්‍රකාශනයට අනුව ඒ යටතේ ඇති අංශ 14 කින් 07 ක් 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා රු.මිලියන 54.85 ක සමස්ත මෙහෙයුම් අලාභයක් වාර්තා කර තිබුණි.	2021 2022 2023	ඉංජිනේරු ප්‍රසම්පාදන ඉදිකිරීම් (EPC) අංශයේ මෙහෙයුම් අලාභ ලබන අංශයන් ලාභ ලබන තත්ත්වයට පත්කර ගැනීමට කටයුතු කළ යුතුය.	ප්‍රත්‍යාගණනය කරන ලද මෝටර් රථ සහ පිරියත සහ යන්ත්‍ර සූත්‍ර වලින් පරිපාලන පිරිවැයට ඇතුළත් වූ අධික ක්ෂයවීම් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් මෙහෙයුම් අලාභයක් සිදුව ඇත. කෙසේ වෙතත් මෙම අලාභය අවම කිරීම සඳහා අනාගතයේ දී වත්කම් තත්ත්වය හඳුනා ගැනීමෙන් වත්කම් මාරු කිරීම, බැහැර කිරීම හෝ කුලියට දීමට තීරණ ගෙන ඇත.	ඉංජිනේරු ප්‍රසම්පාදන ඉදිකිරීම් (EPC) අංශයේ මෙහෙයුම් කටයුතු අලාභදායීව තවදුරටත් පවත්වාගෙන යනු ලබයි.
(ඇ)	2023 වර්ෂයේ අන්තර්ජාතික අංශය මෙහෙයුම් කිසිවක් ක්‍රියාත්මක කර නොතිබුණු අතර 2021 සිට 2023 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා කාලය තුළ මෙම අන්තර්ජාතික අංශය මඟින් කිසිදු ආදායමක් ජනනය කර නොතිබුණි.	2023	අන්තර් ජාතික අංශයේ මෙහෙයුම් කටයුතු සිදු කිරීමට කටයුතු කළ යුතුය.	අන්තර් ජාතික අංශයේ මෙහෙයුම් කටයුතු සිදු කරමින් යනු ලැබේ.	ජාත්‍යන්තර ව්‍යාපෘති ක්‍රියාත්මක කර නොමැත.
06.	**වෙනත් සංවිධානවලට මුදාහළ සම්පත්**				
	රජය සතු ව්‍යාපාර සඳහා වන මෙහෙයුම් අත්පොතේ 6.8 ඡේදය අනුව අමාත්‍යාංශ සහ අනෙකුත් ආයතන තම	2022 2023	මෙම ඉඩම ඵලදායි ආර්ථික කටයුත්තක් සඳහා භාවිතා කිරීමට අවධානය	දැනට මෙම ඉඩම ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ රථ ගාල පරිශ්‍රය ලෙස භාවිතා	මේ දක්වා ඵලදායී ආර්ථික කටයුත්තක යොදා

	කාර්යයන් ඉටු කිරීම සඳහා රාජ්‍ය ව්‍යාපාරවල සම්පත් භාවිතා නොකළ යුතු වුවත් කාර්යාංශය විසින් 1990 ජනවාරි 22 වන දින රු.මිලියන 3ක වටිනාකමකට මිලදී ගෙන තිබූ කොළඹ ටී.බී. ජයා මාවතේ (ඩාලි පාරේ) පිහිටි රූඩ් 02 පර්චස් 24.5 ක්වූ කාර්යාංශය සතු (රු.මිලියන 575 ක් වටිනා) ඉඩම 2023 වර්ෂය අවසාන වන විටත් කිසිදු ඵලදායි ආර්ථික කටයුත්තක් සඳහා භාවිතා කර ආදායම් ඉපයීමකින් තොරව වාරිමාර්ග අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යාලයේ රථ ගාල ලෙස භාවිතය සඳහා යොදා ගෙන තිබුණි.		යොමු කළ යුතුය.	කරන බැවින්, මේ පිළිබඳව අමාත්‍යාංශ AMC හිදී නැවත නැවතත් සාකච්ඡා කර ඇති අතර ඉදිරියේදී තීරණයක් ගැනීමට නියමිතය.	නොගෙන ඌණ උපයෝජිතව පවතී.
07.	**මානව සම්පත් කළමනාකරණය**				
(අ)	රජය සතු ව්‍යාපාර සඳහා වන මෙහෙයුම් අත්පොතේ 3.2 (i) ඡේදය අනුව කාර්යාංශයේ සේවය කරනු ලබන සියලුම මට්ටම්වල තනතුරු සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද බඳවා ගැනීමේ සහ උසස් කිරීමේ යෝජනා ක්‍රමයක් තිබිය යුතු වුවද, කාර්යාංශයේ මධ්‍යම කළමනාකරණ මට්ටම හා ලෝෂ්ඨ කළමනාකරණ මට්ටම් සඳහා 2016 වර්ෂයේ සිට 2024 අප්‍රේල් 30 විගණිත දිනය දක්වා කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 අනුව	2021 2022 2023	කාර්යාංශයේ සියලු මට්ටම්වල තනතුරු සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද බඳවා ගැනීමේ සහ උසස් කිරීමේ යෝජනා ක්‍රමයක් අනුමත කර ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතුය.	මේ සම්බන්ධයෙන් 2024.08.26 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සමග පැවති සාකච්ඡාවට අනුව කාර්යංශයේ සේවක සංඛ්‍යා දර්ශකය නැවත වරක් සංශෝධනය කර අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට කටයුතු කරමින් පවතී.	මේ දක්වා කාර්යාංශයේ මධ්‍යම හා ඉහළ කළමනාකරණ මට්ටම් සඳහා බඳවා ගැනීමේ හා උසස් කිරීමේ යෝජනා ක්‍රමයක් සකස් කර අනුමත කරවාගෙන නොමැත.

	සකස්කර ලද බඳවා ගැනීමේ සහ උසස් කිරීමේ යෝජනා ක්‍රමයක් අනුමත කර ගැනීමට කාර්යාංශය විසින් කටයුතු කර නොතිබුණි.				
(ආ)	නිලධාරීන් 13 දෙනෙකු 2007 වර්ෂයේ සිට 2022 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ කාර්යාංශය සමඟ රු.මිලියන 18.15 ක බැඳුම්කර ගිවිසුම් ඇති කරගෙන තිබුණු අතර බැඳුම්කර කඩ කළ නිළධාරින් විසින් 2024 අප්‍රේල් 30 දින වන විට රු.මිලියන 8.30 ක මුදලක් කාර්යාංශයට නැවත නොගෙවා හිඟව පැවතුනි.	2022 2023	බැඳුම්කර කඩකළ නිලධාරීන්ගෙන් හෝ ඇපකරුවන්ගෙන් හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.	ගිවිසුම් කඩ කර ඇති සේවකයින් 06 දෙනෙකුගේ ලිපිනයන් ලබා ගැනීම සඳහා තානාපති කාර්යාලය වෙත දැනටමත් සිහිකැඳවීම් යොමු කර ඇත. මෙයට අමතරව මුදල් පියවන ලෙස ඇතැම් නිලධාරීන්ට නොතීසි යවා ඇති අතර ඇතැම් නිලධාරීන්ගේ ලිපිගොනු නීතිමය කටයුතු සඳහා නීති අංශයට භාර දී ඇත.	2024.09.26 වන දිනට අයවිය යුතු ශේෂය රු.මිලියන 7.05 ක් වන අතර, මෙම මුදල් අයකර ගැනීම ඉතා දුර්වල බැවින් නිතීමය කටයුතු සිදුකරමින් පවතී.

3.10 ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	65,594,543	25,250,657	40,343,886	5,939,945	තත්ත්වාගණනය කළ
2022	78,103,453	16,823,806	61,279,647	26,051,222	තත්ත්වාගණනය කළ
2023	91,644,420	18,698,950	72,945,471	16,107,425	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපතිගේ නිර්දේශය	ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01.	**නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**				
	2007 අංක 07 දරන සමාගම් පනත ඡේදය 319 ආයතනය සංස්ථාගත කිරීමට පෙර, මණ්ඩලය 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ඇපයෙන් සීමිත සමාගමක් ලෙස ක්‍රියාත්මක විය. එසේ වුවද දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් බදු නිෂ්කාශන සහතිකය ලබා ගැනීමට නොහැකි වීම හේතුවෙන් සමාගමේ ඇවර කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කිරීමට මණ්ඩලය 2024 මැයි 20 දින දක්වා අපොහොසත් වී තිබුණි.	2021, 2022, 2023	සමාගම් පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය.	සමාගමේ ඇවර කිරීමේ ක්‍රියාවලිය මණ්ඩලයෙන් ඔබ්බට ගොස් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට සහ සමාගම් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවට පැවරී ඇත. මෙම ලියාපදිංචිය අවලංගු කිරීමට අපි හැකි සෑම උත්සාහයක්ම ගෙන ඇත්තෙමු.	සමාගම ඇවර කිරීමේ ක්‍රියාවලිය මේ දක්වා අවසන් කර නොතිබුණි.
02.	**කළමනාකරණ අකාර්යක්ෂමතා**				
	මණ්ඩලයේ සුමට හා ඵලදායි පරිපාලනය සඳහා මානව සම්පත් සහ මූල්‍ය සම්පත් කළමනාකරණයට	2021, 2022, 2023	යහපාලනය පිළිබඳව මාර්ගෝපදේශ අනුව කටයුතු	ක්‍රියාපටිපාටි අත්පොතක් සහ මූල්‍ය අත්පොතක් සම්පාදනය කිරීම ආරම්භ කර ඇත.	මේ දක්වා ක්‍රියාපටිපාටි අත්පොත සහ මූල්‍ය

	අදාළ සියලු කාරණා සම්බන්ධයෙන් නීති රීති සපයන ක්‍රියා පටිපාටි අත්පොතක් සහ මූල්‍ය අත්පොතක් පිළියෙළ කර නොතිබුණි.		කළ යුතුය.		අත්පොත සකස් කර නොමැත.
03.	**මානව සම්පත් කළමනාකරණය** යෙදවිය යුතු සේවක සංඛ්‍යාව තීරණය කිරීම, සේවකයන් පත්කිරීම, උසස් කිරීම සේවයෙන් ඉවත්කිරීම සහ විනය ක්‍රියාමාර්ග ගැනීම මෙන්ම වැටුප්, දීමනා සහ පාරිතෝෂික ලබා දීම මණ්ඩලයේ වගකීමක් වුවද මණ්ඩලයේ සුමට ක්‍රියාකාරීත්වය සඳහා දක්ෂ හා ස්ථිර කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීම සඳහා අනුමත කාර්ය මණ්ඩලයක් හෝ බඳවා ගැනීමේ සහ උසස්වීම් යෝජනා ක්‍රමයක් සකස් කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස සියලුම නිලධාරීන් සහ සේවකයන් කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන ඇති අතර ඉන් නිලධාරීන් 16 දෙනෙකු 2023 දෙසැම්බර් 31 දිනට වසර 01 සිට 18 දක්වා කාලසීමාවක් සඳහා කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවා තිබුණි. මීට අමතරව දැනට සේවයේ නියුතු සේවකයන් දෙදෙනෙකුගේ කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීමට කටයුතු කර නොමැති බව ද පුද්ගලික ලිපිගොනු පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.	2021, 2022, 2023	වගකිව යුතු සුදුසුකම් සහිත පලපුරුදු කාර්ය මණ්ඩලයක් අනුමත කර ඒ අනුව බඳවා ගැනීම් සිදු කළ යුතුය.	2001 වර්ෂය ආරම්භයේ සිටම මණ්ඩලයට අනුමත කාර්ය මණ්ඩලයක් නොතිබුණි. කළමනාකරණ කමිටුවේ සහ කළමනාකරණ මණ්ඩලයේ සාකච්ඡා කිරීමෙන් පසු අවශ්‍යතා පදනම මත සියලුම බඳවා ගැනීම් සිදු කරන ලදී. ප්‍රතිපත්තියට අනුව සියලුම කාර්ය මණ්ඩලය කොන්ත්‍රාත් පදනම මත සිටී.	අනුමත කාර්යය මණ්ඩලයක් අනුමත බඳවා ගැනීමේ පටිපාටියකට අනුව බඳවා ගෙන නොමැත.

04.	**සංයුක්ත සැලැස්ම**				
	2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2021 රාජ්‍ය ආයතන යහපාලනය පිළිබඳ මාර්ගෝපදේශය ඡේදය 2.3 අනුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මණ්ඩලයේ නියම කරන ලද අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා එහි උපායමාර්ගික සැලැස්ම සකස් කලයුතු අතර අවසන් කරන ලද උපායමාර්ගික සැලැස්ම සමඟ ක්‍රියාකාරී සැලැස්ම සහ වාර්ෂික අයවැය ඉදිරිපත් කළ යුතු වේ. නමුත් මණ්ඩලය විසින් පනතේ සඳහන් කාර්යභාරයන් ඉටු කරන ආකාරය දැක්වෙන උපායමාර්ගික සැලැස්මක් හා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ කාර්යයන් වල ප්‍රගතිය සමාලෝචනය කිරීමට නොහැකි විය.	2021, 2022, 2023	යහපාලනය පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළ යුතුය.	2024 වසරට අදාල උපායමාර්ගික සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර ඇත.	2023 වර්ෂය සඳහා පිළියෙල කර නොතිබුණි.
05.	**වාර්ෂික වාර්තාව**				
	2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර මෙහෙයුම් අත්පොතේ 6.6 වගන්තිය අනුව සමාලෝචිත වර්ෂය සඳහා වූ මණ්ඩලයේ කෙටුම්පත් වාර්ෂික වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමඟ විගණනය වෙත ඉදිරිපත් නොවූ අතර පසුගිය වර්ෂයේ වාර්ෂික වාර්තාව 2024 මැයි 20 දින දක්වා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.	2021, 2022, 2023	රාජ්‍ය ව්‍යාපාර මෙහෙයුම් අත්පොතේ මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතුය.	ඉදිරියේදී වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කරනු ඇත.	2024 ඔක්තෝබර් 08 දක්වා වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

06. විගණන කමිටුව

2018 අංක 19 දරන ජාතික විගණන පනත 41(1) වගන්තිය අනුව පාලක මණ්ඩලය විසින් තමාට සහායදීම පිණිස පත් කරනු ලබන විගණන සහ කලමනාකරන කමිටුවක් තිබිය යුතු අතර එම කමිටුව එක් එක් අස්ථිත්වයෙහි ක්‍රියාකාරීත්වයන් අඛණ්ඩ පදනමක් මත සමාලෝචනය කර පාලක මණ්ඩලය වෙත වාර්තා කළ යුතු වේ. කෙසේ වෙතත් මණ්ඩලය කිසිඳු දිනක විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමක් පවත්වා නොතිබුණි.	2021, 2022, 2023	විගණන පනත ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්විය යුතුයි.	මණ්ඩලයේ කළමනාකරණ කමිටුව මඟින් මූල්‍ය හා මාසික ක්‍රියාකාරකම් සමාලෝචනය කරනු ලැබේ.	2024 ඔක්තෝබර් 08 දක්වා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි.

3.11 ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	බදු පෙර අතිරික්තය (ඌනතාවය) රු.	මතය
2021	1,541,884,759	431,307,018	1,110,574,741	38,129,480	තත්ත්වාගණනය කළ
2022	1,362,885,340	328,545,586	1,034,339,754	(43,145,508)	තත්ත්වාගණනය කළ
2023	1,292,536,957	276,317,641	1,016,219,317	26,879,563	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපතිගේ නිර්දේශය	ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01.	**ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම** 2023 වාර්ෂික මූල්‍ය ප්‍රකාශනය අනුව තොග වටිනාකම රු.මිලියන 164.90 ක් වූ අතර එහි ඇතුලත් පුහුණු උපකරණ, ප්‍රධාන තොග වලින් වෙන් කර හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි. තවද තොග ලැබීම් හා නිකුත් කිරීම් කළමනාකරණය සඳහා විධිමත්තොග කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කර නොමැති හෙයින් යල් පැනගිය සෙමින් චලනය වන හා චලනය නොවන තොග හඳුනාගැනීමට ද නොහැකි වූ බැවින් මෙම තොග වටිනාකමෙහි නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමට නොහැකි විය.	2021, 2022, 2023	විධිමත් තොග කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතුය.	ඉදිරියේදි නව පරිගණකගත ගිණුම්කරන පද්ධතියක් මිලදි ගැනිමට බලාපොරොත්තු වේ.	මේ දක්වා විධිමත් පරිගණකගත තොග කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කර නොමැත.

02	**මුදල් කළමනාකරණය**				
	අධිකාරියේ ප්‍රධාන කාර්යාලය විසින් ලංකා බැංකු ටොරින්ටන් ශාඛාවේ පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුමෙහි සාමාන්‍ය වශයෙන්රු.මිලියන 242.70 ක මුදල් ශේෂයක් පසුගිය වර්ෂ 05 කට අධික කාලයක් තුල පවත්වාගෙන ගොස් තිබුණු අතර අධිකාරියේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා ඉක්මවා ඇති අතිරික්ත මුදල් උපාය මාර්ගිකව කෙටිකාලීන ආයෝජනවල යෙදීමෙන් ලබා ගත හැකිව තිබූ පොලී ආදායම මේ හේතුවෙන් අහිමි වී තිබුණු බව නිරීක්ෂණය විය.	2021, 2022, 2023	අතිරික්ත මුදල් උපාය මාර්ගිකව කළමනාකරණය කර කෙටිකාලීන ආයෝජන ක්‍රමවල යොදවා ආදායම් ලබාගැනීමට කටයුතු කළ යුතුය.	රජය සතු ව්‍යවසාය (SOE) මාර්ගෝපදේශ වලට අනුකූලව, අතිරික්ත අරමුදල් ආයෝජනය කිරීමේ අධිකාරියේ සැලැස්මට මුදල් අමාත්‍යාංශයේ එකඟතාව බලාපොරොත්තු වේ.	අතිරික්ත මුදල් කෙටිකාලීන ආයෝජන ක්‍රමවල යොදවා ආදායම් ඉපයීම සම්බන්ධයෙන් මේ දක්වා කටයුතු කර නොමැත.
03	**කළමනාකරණ අකාර්යක්ෂමතා**				
(අ)	අධිකාරියේ ප්‍රධාන කාර්යාලය පිහිටි ඉඩම සහ ගොඩනැගිල්ල ටවර්හෝල් රඟහල පදනමට අයත් වූ අතර රු.මිලියන 6.00ක බදු කුලියකට 30 අවුරුදු බදු ගිවිසුමකට 1986 වර්ෂයේදී එළඹ තිබුණි. එම බදු ගිවිසුම් කාලය අවසන් වීමෙන් පසු 2016 වසරේ සිට නැවත අවුරුදු 30ක කාලයක් සඳහා ඉඩම භාවිතා කිරීමට බදු කුලිය නැවත තක්සේරු කිරීමකින් තොරව 2019 වර්ෂයේදී නව බදු ගිවිසුමකට එළඹ තිබුණි. අග්‍රාමාත්‍ය ලේකම් විසින් 2023 දෙසැම්බර් 07 දිනැති ලිපියක් මඟින් පැවති කුලී වටිනාකමටම ඇති කරගත් මෙම අවිධිමත් හා පාලක මණ්ඩල අනුමැතිය නොලද බදු ගිවිසුම අවලංගුකර රජයේ තක්සේරුකරුගේ	2022, 2023	ඉදිකිරීම් උපකරණ පුහුණු මධ්‍යස්ථානය සඳහා විධිමත් බදු ගිවිසුමකට එළඹීමට කටයුතු කළ යුතුය.	මේ සම්බන්ධයෙන් ජේඛිය අමාත්‍යාංශ ලේකම් විසින් 2023.12.19 වන දින සිදු කර ඇති දැනුම් දීම අනුව CIDA ආයතනය CETRAC හෝ CHPB කාර්යාල ගොඩනැගිල්ලේ ස්ථාපනය කිරීම සඳහා පවතින අපහසුතා හේතුවෙන් නාගරික සංවර්ධන අධිකාරියෙන් සුදුසු කාර්යාල ඉඩ ප්‍රමාණයක් ලබා දෙන ලෙස 1/4/214 දරණ 2023.10.19 දිනැති ලිපියෙන් ද, සෙත්සිරිපාය අදියර III කාර්යාල සංකීර්ණයෙන් CIDA ආයතනයට වර්ග අඩි 15,000 ක ප්‍රමාණයක් ලබා දෙන ලෙස නැවත	සච්සිරිපාය ගොඩනැගිල්ලේ හිඟ බදු කුලිය ලෙස රු. මිලියන 145 ක් ගෙවා වහාම මෙම ගොඩනැගිල්ලෙන් ඉවත් වන ලෙසට ලැබී ඇති 2024.07.16 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අංක අමප/24/1286/620/022 අනුව කළමනාකරණ මණ්ඩලයේ උපදෙස් හා තීරණ පරිදි රු. මිලියන 25 ක මුදලක් ටවර්

	තක්සේරු කුලී වටිනාකමට අනුව නව ගිවිසුමකට එළඹීමට හෝ සව්සිරිපාය පරිශ්‍රයෙන් ඉවත්ව අධිකාරියට අයත් බත්තරමුල්ල ප්‍රදේශයේ පවත්නා ගොඩනැගිලි සංකීර්ණයේ කාර්යාල පරිශ්‍රය ප්‍රතිස්ථාපනය කිරීමට පියවරගන්නා ලෙස නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශ ලේකම්වරයා වෙත දන්වා තිබුණි. ඒ අනුව අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත 2023 දෙසැම්බර් 19 දිනැති අංක MUDH/HC/AD/178/7 දරණ ලිපිය මඟින් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශ ලේකම්වරයා විසින් බත්තරමුල්ල අධිකාරියට අයත් ඉදිකිරීම් උපකරණ පුහුණු මධ්‍යස්ථානය පිහිටි ගොඩනැගිල්ල වෙත අධිකාරිය ස්ථානගත කිරීමට අවශ්‍ය කටයුතු කරන ලෙස දන්වා තිබුණි. ඉදිකිරීම් උපකරණ පුහුණු මධ්‍යස්ථානය පිහිටි ගොඩනැගිල්ල සහිත ඉඩම සම්බන්ධයෙන් ද විධිමත් බදු ගිවිසුමක් නොමැති බැවින් ගිවිසුමකට එළඹීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ද නොමැති බැවින් මෙම තත්ත්වය නිරවුල් කරනොගෙන මෙම ස්ථානයේ අධිකාරිය ස්ථාපිත කිරීම මතභේදාත්මක තත්ත්වයක් බව නිරීක්ෂණය විය.			අංක 1/4/214 දරණ 2023.11.23 දිනැති ලිපියෙන් ද ඉල්ලීම් කරන ලදි.	හෝල් රඟහල පදනම වෙත ගිවිසුම්ගත වීමකින් තොරව ගෙවා ඇත. CETRAC ආයතනය සඳහා ද විධිමත් බදු ගිවිසුමකට එළඹීමට කටයුතු කර නොතිබුණි.
(ආ)	ගල්කුලම මෙහෙයුම් ශිල්පී පුහුණු පාසලෙහි යටිතල පහසුකම් සංවර්ධනය සඳහා	2021, 2022, 2023	අරමුණුගත කාර්යයන් ඉටුකිරීමට හෝ	මෙයට අදාල ප්‍රසම්පාදන කටයුතු සිදුකර අවසන් අදියරේ	මේ දක්වා අදාළ කාර්යයන්

	2019, 2020 සහ 2021 වර්ෂවලදී ලබාදී තිබුණු මුදලින් පිළිවෙළින් රු.මිලියන 2.84, රු.මිලියන 4.91 හා රු.මිලියන 0.30 ක මුදල් ද මෘදුකාංග සංවර්ධනය සඳහා 2022 වර්ෂයේදී ලබා දී තිබුණු රු.මිලියන 1.33 ක්, ශිල්පීය හැදුනුම්පත් ලබාදීම සඳහා 2020 වර්ෂයේදී ලබා දී තිබුණු මුදලින් රු.මිලියන 13.82 ක මුදලක් 2024 අප්‍රේල් 30 දින වන විටත් අරමුණුගත කාර්යය වෙනුවෙන් යොදා නොගෙන ඉතිරිව පැවතුනි.		ඉතිරි මුදල් භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කිරීමට කටයුතු කළ යුතුය.	පවතී.	සම්පූර්ණ කර නොමැත.
(ඇ)	ශිල්පීය පුහුණු වැඩසටහන සඳහා මහභාණ්ඩාගාරය විසින් ලබා දී තිබුණු මුදල් වලින් 2023 ගිණුම් වර්ෂය ආරම්භ වන විට රු.මිලියන 48.29 ක ශේෂයක් පැවතුණි. ගිණුම් වර්ෂය අවසානයේදී රු.මිලියන 13.15 ක ශේෂයක් ඉතිරිව පැවතුණි. ඒ අනුව ගිණුම් වර්ෂය තුළදී රු.මිලියන 35.15 ක් වැයකර තිබුණු අතර ඉන් රු.මිලියන 13.25 ක් ගෙවිය යුතු පුහුණු පාඨමාලා දීමනා ලෙස ගෙවීම් සිදුකර තිබුණි. මේ අනුව සමාලෝචිත වර්ෂය තුළදී මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණු අතර පුහුණු අංශයේ පරිපාලන වියදම් සඳහා රු.මිලියන 21.89ක් දරා තිබුණි.	2021, 2022, 2023	අරමුණු ගත කාර්යයන් ඉටු කිරීමට හෝ ඉතිරි මුදල් භාණ්ඩාගාරයට ප්‍රේෂණය කිරීමට කටයුතු කළ යුතුය.	මේ සඳහා මහා භාණ්ඩාගාරය විසින් ලබා දී තිබූ මුදල් වලින් ඉතිරි වූ රු.මිලියන 5.1 ක් භාණ්ඩාගාරයට ප්‍රේෂණය කිරීමට කටයුතු කරමින් පවතී.	ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමට හෝ ඉතිරි මුදල් භාණ්ඩාගාරය ට ප්‍රේෂණය කිරීම කටයුතු කර නොමැත.
(ඈ)	ඉදිකිරීම් ක්ෂේත්‍රයේ යෙදී සිටින ශිල්පීන් සඳහා ශිල්පීය හැදුනුම්පත් ලබා දීම සඳහා 2019 සහ 2020 වසර තුළ මහාභාණ්ඩාගාරයෙන්	2021, 2022, 2023	නිපුණ ශිල්පීන් සඳහා හැදුනුම්පත් නිකුත් කිරීම සඳහා අදාළ රීති හා ගාස්තු ගැසට් පත්‍රයේ	මෙම කටයුත්ත සඳහා වන රෙගුලාසි(Regulations) මේ වන විටත් ගැසට් කොට ඇති අතර අදාල නීති රීති (Rules) සඳහා	නීති රීති ගැසට් කිරීම මේ දක්වා සිදුකර නොතිබුණි.

	රු.මිලියන 35.7 ක මුදලක් ලබා දී තිබුණි. මීට අදාළ තොරතුරු තාක්ෂණ පද්ධතියක් ස්ථාපනය සඳහා 2022 මාර්තු 11 වන දින ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය වෙත රු. මිලියන 3.35ක කොන්ත්‍රාත්තුවක් පවරා තිබුණි. මීට අදාළ පද්ධති සංවර්ධන කටයුතු දින 21ක් තුළ සම්පූර්ණ කළ යුතු වුවද 2024 අප්‍රේල් 30 දින දක්වා අවසන් කර නොතිබුණු අතර ව්‍යාපෘතිය පවත්වාගෙන යාම සඳහා මහා භාණ්ඩාගාරයෙන් විධිමත් අනුමැතියක් ලබාගෙන නොතිබුණි. තවද නිපුණ ශිල්පීන් සඳහා හැඳුනුම්පත් නිකුත් කිරීමට පෙර ඊට අදාළ රීති හා ගාස්තු ගැසට් පත්‍රයේ පළකර ඉන්පසුව අදාළ ගාස්තු අයකර ගැනීම නෛතික තත්ත්වය වුවද අධිකාරිය විසින් මේ දක්වා ඊට අදාළ රීති හා ගාස්තු ගැසට් කිරීමකින් තොරව මේ සඳහා අයදුම්පත් කැඳවා ඔවුන්ගෙන් ගාස්තු අය කර තිබුණි. මෙසේ ගාස්තු අයකර 2023 ජූලි 31 දින වනවිට හැඳුනුම්පත් 228 ක් නිකුත් කර තිබුණි. **2014 අංක 33 දරණ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ දක්වා ඇති කාර්යයන් ඉටුකිරීම සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.**		පළකිරීමට කටයුතු කළයුතුය.	නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා දී ඇත. නීති රීති ගැසට් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතියි.	
(ඉ)	පනතේ Vවන කොටසෙහි 33 (i) වගන්තියට අනුව කිසියම් හඳුනාගත් ඉදිකිරීම් වැඩක සුදුසුකම් ලත් පුද්ගලයකු ලෙස විදේශීය උපදේශකයකු සම්බන්ධ කරගැනීමට අවශ්‍ය යම්	2023	ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ දක්වා ඇති කාර්යයන් කඩිනමින් ඉටුකිරීමට	මේ සම්බන්ධයෙන් සාහාධිපත්‍ය කමිටුව මගින් අනුමත කරන ලද ක්‍රියාපටිපාටිය අධ්‍යක්ෂ මණ්ඩලය මගින් අනුමත කිරීමෙන් පසුව 2023	මේ වන තුරු නීති කෙටුම්පත් සම්පාදනය කර නැත.

	තැනැත්තකු තාවකාලික ලියාපදිංචිය සඳහා අධිකාරිය වෙත අයදුම් කළ යුතු අතර එහි දෙවන වගන්තිය පරිදි සෑම විදේශීය උපදේශකවරයෙකුම ශ්‍රී ලංකාවේ හඳුනාගත් ඉදිකිරීම් වැඩක නියුතු වීමට පෙර අධිකාරියේ ලියාපදිංචි විය යුතු අතර ලියාපදිංචිවීමේ ක්‍රියා පටිපාටි නියම කරනු ලබන පරිදි විය යුතුය. තවද 3 වන වගන්තිය පරිදි එසේ ලියාපදිංචි නොවී වැඩකටයුතු සිදුකරන තැනැත්තකු මෙම පනත යටතේ වරදකරුවකු වන්නේය. මේ අනුව මේ සම්බන්ධයෙන් අධිකාරිය විසින් මෙතෙක් ක්‍රියාකර නොතිබුණි.		කටයුතු කළ යුතුය.	මැයි මසදී නීති කෙටුම්පත් සම්පාදකට යොමුකර ඇත.	
(ඊ)	පනතේ 43 වන වගන්තිය පරිදි අධිකාරිය විසින් සාදනු ලබන රීති මගින් නිශ්චය කරනු ලැබිය හැකි ආකාරයට ඉදිකිරීම් ද්‍රව්‍ය ආනයනකරුවන්, නිෂ්පාදකයන් හා උපාංග සපයන්නන්ගේ නාමාවලියක් අධිකාරිය විසින් පවත්වාගෙන යායුතුය. පනතේ 44 වන වගන්තිය පරිදි අධිකාරිය විසින් සාදනු ලබන රීති මගින් නිශ්චය කරනු ලැබිය හැකි ආකාරයට දැනට තිබෙන බර ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ සහ උපකරණ වල නාමාවලියක් පවත්වාගෙන යා යුතුය. ඉහත නාමාවලීන් කාර්යාල වේලාවන්හිදී ගෙවීමකින් තොරව යම් තැනැත්තකු විසින් පරීක්ෂා කිරීම සඳහා ලබාගතහැකි විය යුතුය.	2023	ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ දක්වා ඇති කාර්යයන් කඩිනමින් ඉටුකිරීමට කටයුතු කළ යුතුය.	පනතේ 43 වන වගන්තිය පරිදි අදාල ගැසට් පත්‍රය 2336/46 දරණ අංකය යටතේ 2023.06.14 දින පළ කරන ලද අතර, 2023.10.05 දින පළ කරන ලද පුවත්පත් දැන්වීමක් මඟින් සැපයුම්කරුවන් ලියාපදිංචිවීමේ ප්‍රතිලාභ පිළිබඳව දැනුවත් කරන ලදී. අමුද්‍රව්‍ය සැපයුම්කරුවන්ගේ ලියාපදිංචිය සම්බන්ධ මාර්ගෝපදේශකය මුද්‍රණය කරන ලදී.	43 වන වගන්තිය ප්‍රකාර නාමාවලිවක් හා බර යන්ත්‍රෝපකරණවල නාමාවලියක් මේ දක්වා පිළියෙල කර පරීක්ෂණ සඳහා යොමු කර නොතිබුණි. ඉදිකිරීම් ද්‍රව්‍ය ආනයනකරුවන්, නිශ්පාදකයින් ලියාපදිංචි කිරීමේ කාර්යයන් සිදු කරමින් පවතී.

	මීට අදාළ කටයුතු සිදුකිරීම සඳහා අධිකාරිය විසින් මෙතෙක් ක්‍රියාකර නොතිබුණි.				
(උ)	පනතේ 51(2) වගන්තිය පරිදි කාර්මික ආරවුල් තීරනකරණ ක්‍රියාපටිපාටිය නියම කළ යුතු වුවද අධිකාරිය විසින් මේ දක්වා ආරවුල් තීරනකරණයට අදාල ක්‍රියාපටිපාටි සකස්කර නොතිබුණි.	2023	ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ දක්වා ඇති කාර්යයන් කඩිනමින් ඉටුකිරීමට කටයුතු කළ යුතුය.	තීරනකරණය (Adjudication) පිළිබඳ ක්‍රියාපටිපාටිය සකස් කර ඇති අතර 28/11/2017 දින අමාත්‍යාංශයට හා නීති කෙටුම්පත් සම්පාදක වෙත ප්‍රථමවරට ඉදිරිපත් කර ඇත.දැනට වරින් වර සංශෝධන ඉදිරිපත් කරමින් පවතී.	කාර්මික ආරවුල් තීරණකරන ක්‍රියාපටිපාටි මේ දක්වා සකස් කර නොමැත.
(ඌ)	පනතේ XI වන කොටසෙහි 55 වන වගන්තියට අනුව පනතේ දක්වා ඇති තොරතුරු අවශ්‍ය පාර්ශවයන් වෙනුවෙන් තොරතුරු ලබාදීම සඳහා තොරතුරු ලේකම් කාර්යාලයක් ස්ථාපිත කර එහි කර්තව්‍ය හා කාර්යය පටිපාටි සහ කාර්යය සාධන ප්‍රමිති නියම කරනු ලැබිය යුතුය. එසේ වුවද අධිකාරිය විසින් තොරතුරු පද්ධතියක් මෙතෙක් සංවර්ධනය කර නොතිබුණි.	2023	ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ දක්වා ඇති කාර්යයන් කඩිනමින් ඉටුකිරීමට කටයුතු කළ යුතුය.	තොරතුරු ලේකම් කාර්යාලයක් ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය සඳහා 2023.07.26 ආරම්භ කරන ලදී. එමෙන්ම එයට අදාලව ඉදිකිරීම් වැඩ සම්බන්ධ වාර්තා හා ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් නියාමනය කිරීම සඳහා අදාල වන වාර්තා ද සකසාගෙන යමින් පවතී.	මේ දක්වා තොරතුරු ලේකම් කාර්යාලයක් ස්ථාපිත කර කාර්යය පටිපාටි සහ කාර්යය සාධන ප්‍රමිති නියම කර නොමැත.
(එ)	පනතේ VIII වන කොටසේ 46 වගන්තිය පරිදි අධිකාරිය විසින් සම්මත ලංසු ලේඛණ (Standard Biding Documents) පිළියෙල කළ යුතුය. තවද, 2014 වර්ෂයේ දී ඉදිකිරීම් අභ්‍යාස හා සංවර්ධන ආයතනය 2014 අංක 33 දරණ පනත මගින් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය බවට පත්ව තිබුණි. නමුත් පෙර පිළියෙළ කර තිබුණු ලංසු ලේඛන ප්‍රසම්පාදන වැඩ	2023	ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ දක්වා ඇති කාර්යයන් කඩිනමින් ඉටුකිරීමට කටයුතු කළ යුතුය.	2024 උක්ත ලේඛන අදාල සංශෝධනයන් සිදු කොට නිසි ක්‍රියාපටිපාටියක් තුලින් කර්මාන්තයට නිදහස් කිරීමට බලාපොරොත්තු වේ.	සම්මත ලංසු ලේඛන කාලීනව සංශෝධනය කර යාවත්කාලීන කර නොමැත.

	(SBD – 01) හා ප්‍රසම්පාදන වැඩ සුළු (SBD – 03) කාලීනව අධිකාරියක් බවට පත්වීමත් සමඟ මෙතෙක් සංශෝධනය කර නොතිබුණි. තවද සම්මත ලංසු ලේඛණ 02 (ප්‍රසම්පාදන - වැඩ - Major – SBD-02) හා SBD-04 (Design and Build) යාවත්කාලීන කිරීමට අදාළ වැඩ කටයුතු සිදුකර තිබුණද ඒ අනුව මෙම සම්මත ලංසු ලේඛන 2021 ජූලි 27 දින භාණ්ඩාගාරයේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් අනුමත කර තිබුණි. පසුව 2023 ඔක්තෝබර් 03 දින ප්‍රසිද්ධ දැන්වීමක් මගින් පරීක්ෂණ මට්ටමින් වසරක කාලයක් ක්‍රියාත්මක කිරීම සදහා අනුමැතිය ලබා දී තිබුණි. ඒ අනුව වසර 2 කට අධික කාලයක් මෙම ප්‍රමිත ලේඛන ක්‍රියාත්මක වීම නිශ්චිත හේතුවකින් තොරව ප්‍රමාද වී පැවතුණි. උපදේශණ සේවා සම්බන්ධ ප්‍රමිති ලේඛන (Standard Biding Documents for Consultancy) අවසන් වරට පිළියෙල කර තිබුණේ 2002 අගෝස්තු මස වන අතර එම දින සිට විගණිත දින දක්වා මෙම ලේඛන යාවත්කාලීන කිරීමට අධිකාරිය කටයුතු කර නොතිබුණි.				
04	**මානව සම්පත් කළමනාකරණය** 2021 හා 2022 වර්ෂවල අධිකාරියේ මානව සම්පත් කළමනාකරණයේ කැපී පෙනෙන ගැටළුකාරී තත්ත්වයන් පැවතීම හේතුවෙන් නිලධාරීන්	2022, 2023	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.	ආයතනයේ සේවකයන් සම්බන්ධයෙන් වූ විනය ක්‍රියාමාර්ග ආයතන සංග්‍රහයේ විධිවිධාන හා කම්කරු නීතිරීතිවලට අනුකූලව කටයුතු	වග උත්තරකාර හිටපු සභාපතිවරයා 2024 ජනවාරි මාසයේ

	සේවයෙන් ඉවත්කිරීම්, අනිවාර්ය නිවාඩු යැවීම්, ඉල්ලා අස්වීම්, අධිකාරියට විරුද්ධව නඩු පැවරීම්, වන්දි ගෙවීම් හේතුවෙන් නීති වියදම රු.මිලියන 7.78 ක් දක්වා 2023 වර්ෂය අවසන් වනවිට වර්ධනය වී තිබුණි. තවද හිටපු මුදල් අධ්‍යක්ෂ විසින් හිටපු සභාපතිට විරුද්ධව පෞද්ගලිකව ගොනුකර තිබුණු අපහාස නඩුව (DMR/3067/2022දරණ නඩුව) සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහිතව රු.මිලියන 0.33 ක නිතීඥ ගාස්තු මේ වනවිට ගෙවා තිබුණි. මෙම නඩුව අධිකාරියට සම්බන්ධයක් නොමැති පුද්ගලික නඩු කටයුත්තක් බැවින් මු.රෙ 156(i) (අ), (ආ) හා (7) වගන්තිය ප්‍රකාරව මෙම මුදල් අදාළ වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.			කරමින් මේ ආකාරයට නීති වියදම් හා සේවක වන්දි ගෙවීමට ඉඩ ප්‍රස්තා නැවත ඇති නොවන ආකාරයට කටයුතු සිදු කෙරේ.	අභාවප්‍රාප්ත වීමත් සමඟ එම නඩුව පැමිණිලි පාර්ශවය විසින් ඉල්ලා අස්කර ගෙන ඇත. මෙම නඩුව වෙනුවෙන් ගෙවා ඇති රු. 330,000/- නිතීඥ ගාස්තු වගකිව යුතු පාර්ශවයෙන් අයකර ගැනීමට මෙතෙක් කටයුතු කර නොමැත.
05	**වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම** 2023 වර්ෂයේ ක්‍රියාකාරී සැළැස්මට අදාළ ප්‍රගතිය පරීක්ෂාවේදී පහත එක් එක් කාර්යයන්හි කාර්යසාධනය පහළ මට්ටමක පැවතුනි. එනම්, දේපළ සංවර්ධන කරුවන් ලියාපදිංචිය, ගොඩනැගිලි ද්‍රව්‍ය සපයන්නන් ලියාපදිංචිය, සුදුසුකම් ලත් පුද්ගලයින් ලියාපදිංචිය, ආරවුල් තීරකකරණය පිළිබඳ පුහුණු පාඨමාලා පැවැත්වීම, හරිත ගොඩනැගිලි සපයන්නන් ලියාපදිංචිය, වැඩබිම් සුපරීක්ෂකවරුන් හා මධ්‍යම මට්ටමේ තාක්ෂණික නිලධාරීන් ලියාපදිංචිය	2021, 2022, 2023	ක්‍රියාකාරී සැළැස්මට අනුව කාර්යයන් ඉටුකිරීමට කටයුතු කළයුතුය.	දේපළ සංවර්ධනකරුවන් ලියාපදිංචිය සඳහා පුවත්පත් දැන්වීමක් පළ කිරීම, විදේශ උපදේශන සේවා ආයතන ලියාපදිංචියට අදාළ නීති සැකසීම ආරවුල් තීරකකරණය වෙනුවට සමථකරණය හඳුන්වා දීම වැනි ක්‍රියාමාර්ග සිදු කර ඇත.	2024 වර්ෂයේ මෙවන විට දේපළ සංවර්ධනකරුවන් 07 ක් ගොඩනැගිලි ද්‍රව්‍ය සපයන්නන් 14 ක් ලියාපදිංචි වී ඇත. සුදුසුකම්ලත් උපදේශකයින් සහ හරිත ගොඩනැගිලි සපයන්නන් ලියාපදිංචිය සඳහා

යනාදිය වේ. තවද, විදේශ කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචිය, තාක්ෂණික විගණනයන් සිදු කිරීම, සියලු දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරීන් මඟින් දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම, ඩිජිටල්කරණය කරන ලද දත්ත පද්ධතියේ නිපුණ ශිල්පීන් ලියාපදිංචි කිරීම, සුපරීක්ෂණ මට්ටමේ කළමනාකරුවන් සහ වෘත්තීය මට්ටමේ වෙනත් නිලධාරීන් පුහුණු කිරීම, ඉදිකිරීම් උපකරණ නඩත්තු සහ මෙහෙයුම් තාක්ෂණය පිළිබඳ නිපුණතා සංවර්ධන වැඩසටහන්, ඉදිකිරීම් උපකරණ පිළිබඳව තරුණයින් පුහුණු කිරීම යන කාර්යයන්හි කාර්යය සාධනය සියයට 50 කට වඩා අඩු මට්ටමක පැවතුණි.

අයදුම්පත් ලැබී නැත. රජයේ මුදලින් කරන කොන්ත්‍රාත් විදේශ කොන්ත්‍රාත්කරුවන්ට ප්‍රදානය කිරීමට පෙර ඔවුන් ලියාපදිංචි කරගත යුතු වුවත් 2024 මේ වන විට 03 දෙනෙකු පමණක් ලියාපදිංචි වී ඇත. තවද ආරවුල් නිරාකරණ පාඨමාලාවන් ද පවත්වා නොතිබුණි. මේ අනුව කාර්යය සාධනය සියයට 50 ට වඩා අඩු මට්ටමක විය.

3.12 ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	2,357,422,349	2,166,627,605	190,894,744	11,487,241	තත්ත්වාගණනය කළ
2022	2,121,114,723	1,990,386,028	130,728,695	(235,145,875)	තත්ත්වාගණනය කළ
2023	2,844,969,113	1,743,044,581	1,101,924,532	(532,408,562)	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපතිගේ නිර්දේශය	ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	අංක. PED 01/2021(i) චක්‍රලේඛයේ 6.9 වගන්තියේ සඳහන් උපදෙස් වලට පටහැනිව 2022 දෙසැම්බර් 31 දිනට පැවති රු.281,690,050 ක්වූ ගුවන් කාල ණයගැති ශේෂයෙන් රු. 67,454,707 ක් 2023 වර්ෂයේදී කපා හැර තිබුණි. සමාලෝචිත වර්ෂයේ අවසානයට ලැබිය යුතු අනෙකුත් ආදායම් ශේෂය වූ රු.1,050,911,287 කින් වර්ෂ 2ත් 11ත් දක්වා වූ පැරණි එකතු වට්නාකම රු.14,521,534 ක් වූ ණයගැති ශේෂය හා විවිධ ණයගැති ශේෂය වූ රු.4,829,121කින් වර්ෂ 2ත් 22ත් අතර වූ රු. 2,592,225 ක් වූ	2023 2022 2021	චක්‍රලේඛයේ විධිවිධාන වලට අනුකූලව කටයුතු කළ යුතු අතර හිඟ මුදල් අයකර ගැනීමටද කටයුතු කළ යුතුය.	අයකර ගැනීම සඳහා කටයුතු කර ඇත.	රු.203,616,392 ක් වූ ශේෂයෙන් 2024 සැප්තැම්බර් 30 වන විට රු.112,261,818 ක මුදලක් අයකර ගෙන ඇත.

	ණයගැති ශේෂය අය කිරීමට සංස්ථාව කටයුතු කර නොතිබුණි. තවද 2023 දෙසැම්බර් 31 දිනට රු. 203,616,393 ණයගැති ශේෂය 2024 මාර්තු 31 වන විට සංස්ථාව විසින් රු. 85,552,843 ක් අයකර තිබු අතර රු. 118,063,550 ක් එනම් සියයට 42 ක් අයකර ගැනීමට සංස්ථාව අපොහොසත් වී තිබුණි.				
2	සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් 1981 සිට 2016 වර්ෂය දක්වා කාලයට අදාළ විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට ගෙවිය යුතු එකතුව රු.145,162,769 ක ශේෂයද ඇතුළත්ව උපචිත වියදම් තුළ වසර ගණනාවක සිට පැවතෙන රු.172,114,277 ක ශේෂයක් පැවත එන අතර එය සමාලෝචිත වර්ෂය වන විටද නිරවුල් කර නොතිබුණි.	2023 2022 2021	වියදම හඳුනා ගෙන පියවීමට කටයුතු කළ යුතුය.	වැලැක්වීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	2024 සැප්තැම්බර් 30 දින වන විටත් නිරවුල් කර නොතිබුණි .
3	2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුගමනය නොකර සංස්ථාවේ 6 හා 10 වන මැදිරිවල තිබුණු පියානෝ 03 ක් අලුත්වැඩියා කර තිබූ අතර 2020 වර්ෂය සඳහා පිළියෙල කර තිබූ ප්‍රසම්පාදන සැලැස්ම තුළ ද මෙම කාර්යය ඇතුළත් කර නොතිබුණි. මැදිරි අංක 06 හි පැවති	2021	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කළයුතු අතර රාජ්‍ය දේපලවල ආරක්ෂාව තහවුරු වන පරිදි කටයුතු කළයුතුය.	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කරමින් රාජ්‍ය දේපළ ආරක්ෂා කිරීම සඳහා ආයතන පරිපාලන කටයුතු පරිපාලනය කටයුතු කළ යුතු බවට සියලු අංශ ප්‍රධානීන් දැනුවත් කර ඇත.	මෙම පියානෝ තුන අළුත්වැඩියාවට සංස්ථා භූමියෙන් පිටතට රැගෙන යාම සහ එහිදී යම් අක්‍රමිකතාවයක් සිදුවී තිබේද යන්න සොයා බැලීමට අපරාධ පරීක්ෂණ

	පියානෝව අලුත්වැඩියාව සඳහා රු.460,000 ක් ගෙවා තිබුණු අතර මැදිරි අංක 10 හි පියානෝ 02 අලුත්වැඩියා කිරීම සඳහා බැහැරට රැගෙන ගොස් 2021 මැයි 21 දින සංස්ථා පරිශ්‍රයට ගෙනවිත් තිබුණ ද 2022 අගෝස්තු 16 වන දින විටත් ගෙවීම් සඳහා ඉල්ලීම් ඉදිරිපත් වී නොතිබුණි. පෞරාණික වටිනාකම සහ විශ්වාසනීයත්වය රැකගැනීම සඳහා පියානෝ අලුත්වැඩියා කිරීමේදී එම කටයුතු සංස්ථා භූමිය තුළදීම සිදුකිරීම මින් පෙර අනුගමනය කරන ලද ක්‍රමවේදය වුවද මෙම පියානෝ 03 සභාපතිගේ ඍජු මැදිහත්වීම මත ආයතනයෙන් පිටතට රැගෙන ගොස් අලුත්වැඩියාවන් සිදුකර තිබුණි. එසේම පියානෝ ඉන්වෙන්ට්‍රිගත කිරීමේදී හඳුනාගැනීමට විශේෂ අංක හා සලකුණු යොදා නොතිබීම හේතුවෙන් සංස්ථාවෙන් පිටතට රැගෙන ගිය පියානෝ 3 නිවැරදිව ආපසු ලැබුනේද යන්න තහවුරු කර ගැනීම සඳහා කිසිදු සාක්ෂියක් සංස්ථාව සතුව නොතිබුණි.				දෙපාර්තමේන්තුවට පැමිණිලි කර ඇත.
4	සංස්ථාව ආරම්භයේ සිට ඒකල විකාශනාගාරය පැවති අක්කර 15 ක විශාල ඉඩම තුළ ගොඩනැගිලි 06 කට අධික ප්‍රමාණයක් 2024	2023	හානිය සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන ඒ අනුව නිසි	මෙවැනි දෑ වැලැක්වීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	ඒකල විකාශනාගාරයේ ආරක්ෂාව සඳහා යොදවා තිබු ආරක්ෂක නියාමකවරයා

	වර්ෂයේදී ජනවාරි මාසය වනවිට විනාශ වීමට ඉඩ හැර තිබුණු අතර ගොඩනැගිලි විනාශකර යකඩ සොරකම් කර තිබුණි. මෙම ගොඩනැගිලි වල තිබූ යකඩ සහ ඇස්බැස්ටෝස් තහඩු වලට සිදුවී තිබූ හානිය රු.13,620,020 ක් ලෙස තක්සේරුවක් කර තිබුණද අනිකුත් දේපල වලට සිදුවී තිබූ හානිය තක්සේරු කර නොතිබුණි. තවද වත්කම් අගය කර මූල්‍ය ප්‍රකාශන වල නිශ්චිතව දක්වා නොතිබුණි.		ක්‍රියාමාර්ග ගත යුතුය.		මේ වන විට වැඩ තහනමකට ලක්කර ඇති අතර, මේ පිළිබඳ මූලික විමර්ශනයක් ආරම්භ කර ඇත.
5	සංස්ථාව විසින් 2023 වර්ෂය තුළ ස්වේච්ඡාවෙන් විශ්‍රාම යාමේ වන්දි ක්‍රමය ක්‍රියාත්මක කර තිබූ අතර රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ 2016 මාර්තු 8 දිනැති අංක 2/2016 දරණ ප්‍රකාරව සේවක මණ්ඩල විමර්ශනයක් සිදුකර අතිරික්ත සේවකයින් හඳුනාගත යුතුව තිබුණි. ඒ පිළිබඳව අමාත්‍යාංශ ලේකම් විසින්ද අවධාරණය කර තිබුණද එසේ කටයුතු කර නොතිබුණි. සේවක වන්දි ගෙවීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියෙන් ලද රු.මිලියන 325ට අමතරව ,මහා භාණ්ඩාගාරයෙන් රු.මිලියන 300ක් ලැබී තිබූ අතර වන්දි ගෙවීම සඳහා රු.මිලියන 502ක් වියදම් කර තිබුණි. ඉන්	2023	යම් නිශ්චිත කාර්යයක් සඳහා ලබා දුන් මුදල් එම කාර්යය සඳහා පමණක්ම යෙදවිය යුතුය.	මෙවැනි දෑ වැලැක්වීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	වැටුප් ගෙවීම සඳහා තවදුරටත් ස්වේච්ඡා වන්දිය සඳහා වෙන්කළ මුදල් භාවිතා කරනු ලබයි.

	පසුව රු.මිලියන 122ක් ඉතිරි විය යුතු වුවද ගිණුමේ ඉතිරියව තිබුනේ රු.මිලියන 10ක් පමණි. ඒ අනුව මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයාගේ නිරීක්ෂණයන්ට හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ නියෝගය අනුව ලබා ගත් මුදල් උපරිම ඵලදායීව භාවිත කළ යුතු බවත් ඉතිරිය භාණ්ඩාගාරයට යැවිය යුතු බවත් දක්වා තිබුණද ඊට පටහැනිව කම්කරු වන්දි සඳහා රු.මිලියන 56.7ක් හා වැටුප් ගෙවීමට රු.මිලියන 55.3ක් වැය කර තිබුණි.				
6	2012 පැවති කෝප් කමිටු නියෝග වල සඳහන් අස්ථානගත ලිපිගොණු සම්බන්ධයෙන් කරන ලද පරික්ෂාවේදී 2012 ඔක්තෝබර් 31 දින වන විට 1998 සිට 2004 දක්වා රු. 19,658,489 ක සහ 2004 සිට 2007 දක්වා රු. 3,817,027 ක ලිපිගොණු පවතින බව දක්වා තිබුණි. මෙම ලිපිගොණු අස්ථාන ගත වීම සංස්ථා නිලධාරීන් අතින් සිදුවූ වරදක් බැවින් ඒ පිළිබද පරීක්ෂා කිරීමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත භාරදුන් බව පරිපාලන නිළධාරිවරයා දක්වා තිබුණද එවැනි පරික්ෂාවකින් හෙළිවූ	2023	අස්ථාන ගත ලිපි ගොණු පිළිබද පරික්ෂා කර විගණනයට වාර්තා කළ යුතුය.	වැලැක්වීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	විස්තරාත්මක වාර්තාවක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

	කරුණු පිළිබඳ කිසිවක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. ලිපිගොණු අස්ථාන ගතවීම හෝ වංචාවන් ඉදිරියට සිදු නොවීමට කටයුතු කරන ලෙසත්, අස්ථානගත ලිපිගොණු පිළිබඳ විස්තරාත්මක වාර්තාවක් ඉදිරිපත් කරන ලෙසත් දන්වා තිබූ අතර 2000 සිට 2007 දක්වා රු.11,141,793 කට අදාල අස්ථාන ගත ලිපිගොණු 100 ක් පිළිබඳ සාරාංශගත වාර්තාවක් පමණක් ඉදිරිපත් කර තිබුණි.				
7	වර්ග අඩි 20,000 ක් වූ පර්චස් 10 ක ගොඩනැගිල්ලක් බදු දීමට අදාළව පුවත්පත් දැන්වීම පලකළද විගණනය විසින් සිදු කල පරික්ෂාවේදී පර්චස් 123.6 ඒ තුළ අන්තර්ගත විය. මෙම ගොඩනැගිල්ල පමණක් තක්සේරු දෙපාර්තමේන්තුව විසින් රු. 2,000,000 කට තක්සේරු කර තිබුණි. ඒ අනුව පුද්ගලික සමාගමකට වසරකට මාසික බදු කුලිය රු.මිලියන 3 ක සිට වසර 02 කට වරක් කුලිය ඉහළ නංවා 2042 වනවිට කුලිය රු. 5,751,716 ක් ලෙස වසර 20 කට බදු දී තිබුණි. එහිදී රු.මිලියන 72 ක අත්තිකාරමක් ලබාගෙන තිබුණු අතර මෙහි ගිවිසුම පුද්ගලික සමාගම විසින්	2023 2022	ගැටළු විසදා නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය.	වැලැක්වීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	2022 සැප්තැම්බර් 30 දින වන විටත් නිරාකරණය කර නොතිබුණි.

	ඒකපාර්ශවිකව සකස්කර තිබුණි. තවද, එකතුකළ බදු වටිනාකම සංස්ථාවට දැරීමට සිදුව තිබීමෙන් 2023 වර්ෂය තුල රු. 3,756,516 ක් සංස්ථාවට පාඩු වී තිබුණි.				
8	බලපත්‍ර අංශයේ සිදු වූ මූල්‍ය අක්‍රමිකතාවයක් හේතුවෙන් සංස්ථාවට සිදු වූ රු. 9,815,799 මූල්‍ය පාඩුව සඳහා වගකිව යුතු නිළධාරීන් සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් 2023 දෙසැම්බර් 31 දින දක්වා ගෙන නොතිබුණි.	2023	වගකිව යුතු නිළධාරීන් සම්බන්ධව නොපමාව ක්‍රියාමාර්ග ගත යුතුය.	මූලික පරීක්ෂණයක් මේවන විට ආරම්භ කර ඇත.	මූලික පරීක්ෂණයක් මේවන විට ආරම්භ කර ඇත.
9	සංස්ථාවේ හිටපු අධ්‍යක්ෂ ජනරාල්වරයෙකුගේ 2021 ජුනි 26 දිනට පැවති මාසික වැටුප රු. 93,020 ක් වුවද, විධිමත් අනුමැතියකින් තොරව රු. 120,020 ක මාසික වැටුපක් 2021 ජුනි මස සිට ගෙවා තිබුණි. ඒ අනුව වැටුප් ලෙස රු. 189,000 ක් වැඩියෙන් ද, හිඟ වැටුප් ලෙස රු. 414,900 ක්ද ගෙවීමට සංස්ථාව කටයුතු කර තිබුණි.	2023 2021	වැඩිපුර ගෙවූ මුදල් අයකර ගැනීමට කටයුතු කල යුතුය.අනුමැතිය කින් තොරව ගෙවන ලද මුදල් සඳහා වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.	මූලික පරීක්ෂණයක් මේවන විට ආරම්භ කර ඇත.	මූලික පරීක්ෂණයක් මේවන විට ආරම්භ කර ඇත.

3.13 ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	බදු පෙර ලාභය (අලාභය) රු.	මතය
2021	4,090,385,625	334,720,035	3,755,665,590	(3,457,925)	තත්ත්වාගණනය කළ
2022	3,979,681,367	290,488,619	3,689,192,747	38,087,808	තත්ත්වාගණනය කළ
2023	3,911,788,952	255,981,681	3,655,807,271	50,541,096	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	2018 වර්ෂයේ සිට පැවත එන මධ්‍යම විද්‍යාගාර සංකීර්ණ ව්‍යාපෘතියට ගෙවන ලද රු.3,900,673 ක මුදල හා 2020 වර්ෂයේ සිට පැවත එන කල්පිටිය අභිජනනාගාර සංකීර්ණයක් ඉදිකිරීම වෙනුවෙන් ගෙවන ලද රු.1,631,963ක මුදල නිශ්කාර්ය වියදමක් බවට පත්වී තිබුණි.	2022 2023	ප්‍රතිපාදන සහිතව ඉදිකිරීමේ කටයුතු සිදු කිරීමට ආයතනය කටයුතු කළ යුතුය.	මහා භාණ්ඩාගාරය පවතින ආර්ථික අස්ථායිකරණය මත තාවකාලිකව මුදල් ලබාදීම ප්‍රමාද කර ඇත.විදෙස් ප්‍රදාන ලබාගැනීම උස්සහ ගනිමින් සිටී.	මෙම ව්‍යාපෘති සැප්තැම්බර් 06 දින වන විටත් ක්‍රියාත්මකව නැත.
2	රු.16,868,610ක තක්සේරු වටිනාකමක් සහිත මත්ස්‍ය ආහාර නිපදවීමේ යන්ත්‍රය 2016 මාර්තු 15 දින පෞද්ගලික ආයතනයක් වෙත බදු දී 2021 වර්ෂයේදී යන්ත්‍රය නැවත නියෝජිතායතනය වෙත පවරාගෙන තිබුණි.	2023 2022	වත්කම්වල අයිතිය හා පැවැත්ම ගිණුම් තුළින් හෙළිදරව් කළ යුතුය.	වර්තමාන බදුකරු වන KMN Aquar Services Pvt Ltd. විසින් යන්ත්‍රය දෝෂ සහිත බව වාර්තා කර ඇති බැවින් විගණන හා කළමනාකරණ කමිටු නිර්දේශ මත පත්කල කමිටුව විසින් ලබාදුන් වාර්තාවට අනුව යන්ත්‍රය දෝෂ සහිත බව වාර්තාකර ඇත. ඒ අනුව වාරික	මේ වනතෙක් ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත.

	2020 ජුනි 05 දින සිට මාස 31 ක් දක්වා කාල සීමාවට අදාළ රු.4,650,000 ක්වූ හිඟ බදු මුදල් එම ආයතනය වෙතින් අයකරගෙන නොතිබුණි. නැවත 2023 මැයි මාසයේ වෙනත් පෞද්ගලික ආයතනයක් වෙත මෙම යන්ත්‍රය බදු දී තිබුණු අතර එම බදු ගිවිසුම විගණනයට ඉදිරිපත් නොවූ අතර එම බදු ගැනුම්කරු විසින්ද යන්ත්‍රයේ දෝෂ වර්තා කර එහි මාසික බදු මුදල් නොගවා තිබුණි. එසේ වූවද කළමනාකරණය විසින් මෙම යන්ත්‍රයට අදාළ ගිවිසුම අවසන් කිරීම හෝ ගිවිසුම් ප්‍රකාරව වාරික මුදල් අයකර ගැනීම පිළිබඳ, කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.			අයකිරීම නවතා ඇත. මෙම කාරණය විගණන හා කලමනාකරණ කමිටුවේදි අවධානයට යොමු වූ අතර මෙහිදී නිර්දේශ කරන ලද්දේ මෙම යන්ත්‍රය තවදුරටත් පවත්වාගෙන යාම ප්‍රායෝගික නොවේ නම් සුදුසු ක්‍රමවේදයක් භාවිතා කර ඉවත් කිරීමටය.	
3	රු. 7,512,800 ක වටිනාකමක් සහිත බෙල්ලන් ආකෘති 9391ක තොගයක් වසර ගණනාවක සිට ප්‍රයෝජනයට නොගෙන නිශ්කාර්යව පැවතුණි.	2022 2023	ප්‍රයෝජනයට නොගන්නා තොග සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගත යුතුය.	මෙම බෙල්ලන් ආකෘති තොගය විදේශ පරීක්ෂණ කණ්ඩායමක් විසින් ලබාදෙන ලද්දකි. ඔවුන් නාරා ආයතනය සමග කරන ලද පරීක්ෂණ කටයුතු අසාර්ථක වීම මත මෙම ආකෘති තොගය භාවිතයෙන් ඉවත්ව මෙසේ ගබඩාවේ රඳවා ඇත. මේ සම්බන්ධයෙන් 2023 වර්ෂයේ ආයතනයේ පවත්වන ලද 129 හා 130 වන විගණන හා කළමණාකරණ කමිටු වලදී ගන්නා ලද තීරණ ප්‍රකාරව ඉදිරි කටයුතු සැලසුම් කරමින් පවතී.	මේ වනතෙක් ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත.

3.14 ශ්‍රී ලංකා ජලජීවී වගා සංවර්ධන අධිකාරිය

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	බදු පෙර ලාභය (අලාභය) රු.	මතය
2021	4,488,429,228	4,074,902,908	413,526,320	32,567,704	තත්ත්වාගණනය කළ
2022	4,536,685,561	4,560,108,057	(23,422,496)	103,989,075	තත්ත්වාගණනය කළ
2023	4,295,013,829	4,251,164,162	43,849,667	(119,724,959)	-

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	දිවි නැගුම ව්‍යාපෘතිය සඳහා අධිකාරිය විසින් 2011 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා ප්‍රතිලාභීන් 6450 කට රු.229,035,250 ක මුදලක් ලබාදී තිබුණද ලබාදුන් එම මුදල ගිණුම් ගතකර නොතිබුණි. ප්‍රතිලාභින්ගෙන් අයවිය යුතු මුදල් අයකර ගැනීමට නිසි ක්‍රමවේදයන් හඳුන්වාදී නොතිබුණු අතර යාවත්කාලීන කරන ලද ණයගැති ලේඛනයක්ද අධිකාරිය සතුව නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රතිලාභින්ගෙන් එකතු කළ රු.66,326,302 ක් මුදල චක්‍රිය අරමුදලක් ලෙස නොව ණයහිමියන් ලෙස ගිණුම්ගත කර තිබුණු අතර එම මුදල් කුමන ප්‍රතිලාභියාගෙන් ලැබී	2021 2022	ප්‍රතිලාභින්ගෙන් අයවිය යුතු මුදල් අයකර ගැනීමට නිසි ක්‍රමවේදයන් හඳුන්වාදීය යුතුය.	දිවිනැගුම ප්‍රතිලාභින් සම්බන්ධ ලේඛණයක් සැලසුම් හා අධික්ෂණ ඒකකයේ පවත්වාගෙන යනු ලබන අතර ප්‍රතිලාභීන් උසාවියෙන් නියම කල මුදල් උසාවියට ගෙවීම් කල අවස්ථා මෙන්ම වාරික වශයෙන් උසාවියට ගෙවීම් කල අවස්ථා පැවතීම, උසාවිය විසින් අධිකාරිය වෙනුවෙන් අය කල සියලුම වර්ගයේ මුදල් මාසිකව චෙක්පතකින් යොමුකල ද එම අයකරගත් මුදල් පිළිබඳ විස්තර වාර්තා නිවැරදිව ඉදිරිපත් නොකිරිම ආදී කරුණු හේතුවෙන් මෙම ලේඛණය යාවත්කාලින කිරිම	මුදල් අයකර ගෙන නොමැත.

	තිබුණේද යන්න තහවුරු කරගත හැකි ලිඛිත සාක්ෂි අධිකාරිය සතුව නොතිබුණි. මුදල් අය නොවීම සම්බන්ධයෙන් නඩු 193ක් පවරා තිබූ අතර මූල්‍ය ප්‍රකාශන තුළ පෙන්නුම් කරන රු. 3,572,500 ක්වූ ණය අයකර ගැනීමද අවිනිශ්චිත තත්ත්වයක පැවතුණි.			ගැටලු සහගතවී ඇත.	
2	තිලාපියා මත්ස්‍යයන් සඳහා අවශ්‍ය ආහාර නිපදවීමට 2019 ඔක්තෝබර් 08 දින රු.11,802,000 ක් වටිනා උඩවලව මත්ස්‍ය ආහාර සැකසුම් මධ්‍යස්ථානයේ ස්ථාපිත කරතිබූ මත්ස්‍ය ආහාර නිෂ්පාදන යන්ත්‍රය මඟින් වාර්ෂිකව තිලාපියා මත්ස්‍ය ආහාර කිලෝග්‍රෑම් 127,000 ක් නිෂ්පාදනය කිරීමට අපේක්ෂා කළද, 2021 හා 2022 වර්ෂයේ කිලෝ ග්‍රෑම් 36,612 ක් හා කිලෝ ග්‍රෑම් 38,361 ක් එනම් සියයට 28 ක් හා සියයට 30ක ප්‍රතිශතයක් පමණක් නිෂ්පාදනය කර තිබුණි. මේ වනවිට මෙම යන්ත්‍රය ප්‍රයෝජනයට නොගෙන තිබුණි.	2021 2022	තිලාපියා මත්ස්‍යයන් සඳහා අවශ්‍ය ආහාර නිපදවීමේ යන්ත්‍රය ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතු වේ.	මෙම යන්ත්‍රය රාජ්‍ය හා පුද්ගලික හවුල් ව්‍යාපාරයක් ලෙස ඉදිරියට කරගෙන යාමට සඳහා දැනට අභිලාශයන් කැඳවා ඇති අතර මේ වන විට වටිනාකම තක්සේරු කිරීම සඳහා 2023.03.15 වන දින තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් කර ඇත.	මෙතෙක් ඉටුවී නොමැත.

3	රකව අක්කර 42 ක ඉඩම් වපසරියක මඩ කකුළුවන් වගා කිරීමේ ව්‍යාපෘතියක් සඳහා අමාත්‍යාංශ අරමුදල් රු.මිලියන 221 ක් වැයකර ඉදිකිරීම් නිම කරන ලද පොකුණු හා ඒ ආශ්‍රිත ඉදිකිරීම්, ව්‍යාපෘතිය අසාර්ථක වීම මත කිවුල් දිය ඉස්සන් වගාව සඳහා පෞද්ගලික ආයෝජකයෙක් වෙත 2021 දෙසැම්බර් 02 දින 30 අවුරුදු කාලයකට බදුදී තිබුණි. 1998 අංක 53 දරන ජලජීවී වගා සංවර්ධන පනත අනුව රජයේ මුදල් වැය කරමින් ජලජීවී වගා මධ්‍යස්ථාන ඉදිකිරීමෙන් අනතුරුව පෞද්ගලික පාර්ශවයන් වෙත බදුදීම අධිකාරියේ මූලික කාර්යයක් නොවන අතර පනතින් ජලජීවී වගා ප්‍රවර්ධනය හා සුළු හා මධ්‍ය පරිමාණ ආයෝජන දිරි ගැන්වීම සඳහා පමණක් ප්‍රතිපාදන සලසා දී තිබුණි.	2021 2022	පනතේ කාර්තව්‍යාන් ඉටුවන අයුරින් අධිකාරිය ව්‍යාපෘති සැලසුම් ඉදිරිපත් කළ යුතු වේ.	මෙම ව්‍යාපෘතියේ මූලික අරමුුණු වූ දකුණු පළාතේ ආයෝජකයින් ජලජීවී වගාවට යොමුකර ගැනීම හා සෘජු හා වක්‍ර රකියා රසක් බිහි කිරිම, තාක්ෂණය ප්‍රචලිත කිරිම, ඉස්සන් වගාව පිළිබද පර්යේෂණ සඳහා යොදා ගැනිම ආදි අරමුණු මෙම ව්‍යාපෘතිය මගින් බලාපොරොත්තු වේ. තවද, රාජ්‍ය ප්‍රතිපාදන මත මෙම ගොවිපල ඉදිකර ඇතත් මෙම ගොවිපල සූක්ෂම ගොවිපළක් බවට පත් කිරිම සඳහා තවත් විශාල මුදලක් ආයෝජනය කල යුතු විය. මෙවැනි කාර්යයන් සඳහා වැඩි ආයෝජනයක් කිරිමට සිදු වන අතර එය ආයෝජක විසින් දැරිය යුතුය.	රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යවසායකත්ව ව්‍යාපෘතියක් ලෙස අභිලාෂ කැඳවා තිබුණි.

3.15 වැව්ලි කලාපය සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරිය

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	බදු පෙර ලාභය (අලාභය) රු.	මතය
2021	-	-	-	-	-
2022	-	-	-	-	-
2023	-	-	-	-	-

	විගණන නිරීක්ෂණය	**වාර්තාවේ වර්ෂය**	**විගණකාධිපතිගේ නිර්දේශය**	**ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග**	**ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය**
1	2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව හා 2021 නොවැම්බර් 16 දිනැති 01/2021 චක්‍රලේඛය සමග ඉදිරිපත් කළ මෙහෙයුම් අත්පොතේ ඡේද අංක 6.6 පරිදි ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2019, 2020, 2021 හා 2022 යන වර්ෂයන් වල මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව 2023ජනවාරි 15 දින වන විටත් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි.	2019/2020/2021/2022 ගනුදෙනු වාර්තාව	චක්‍රලේඛය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.	කාර්ය මණ්ඩලය නොමැති වීම මත අදාළ කාර්ය ඉටු කිරිමට හැකියාවක් ලැබී නොමැත. 2019, 2020, 2021 වාර්තා මේ වන විට අධ්‍යක්ෂ මණ්ඩල උපදෙස් පරිදි අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක වෙත යොමු කර නිර්දේශ ලබා ගෙන ඇත. ඒ අනුව විගණකාධිපති වෙත කඩිනමින් ඉදිරිපත් කිරිමට කටයුතු කරනු ලැබේ.	2019 මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් වී ඇති අතර එහි විගණකාධිපති වාර්තා නිකුත් කර අවසන් කර ඇත. 2020වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2024 සැප්තැම්බර්10 දින විගණන අංශය වෙත භාර දී ඇත.2021, 2022 හා 2023 වර්ෂවල මූල්‍ය ප්‍රකාශන 2024 වර්ෂය තුලදී ඉදිරිපත් කළ හැකි බව දන්වා ඇත.
2	2014 පෙබරවාරි 17 දිනැති 01/2014 දරන මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශ	2019/2020/2021/2022	චක්‍රලේඛය ප්‍රකාරව අවම වශයෙන්	ඒ අනුව ආයතනයේ ප්‍රතිපාදන වෙන්වීම සැලකිල්ලට ගෙන	සේවා අවශ්‍යතාවය මත පමණක්

	ලේකම්ගේ චක්‍රලේඛය ප්‍රකාරව අධිකාරියේ කළමනාකරණ තීරණ ගැනීම් සම්බන්ධයෙන් අවම වශයෙන් මාසයකට එක් වරක් හෝ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්විය යුතු වුවත් , 2019 වර්ෂය තුළදී රැස්වීම් 10ක් ද, 2020 වර්ෂයේදී එක් රැස්වීමක් ද 2021 වර්ෂයේදී රැස්වීම් දෙකක් ද හා 2022 නොවැම්බර් 30 දින දක්වා රැස්වීම් 05 පමණක් පවත්වා තිබුණි.	ගනුදෙනු වාර්තාව	මාසයකට එක් වරක් හෝ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්විය යුතුය.	අත්‍යවශ්‍ය අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ලබා ගැනීම සඳහා අත්‍යවශ්‍ය රැස්වීම් පමණක් තබා ඇත.	අධ්‍යක්ෂ මණ්ඩලය කැඳවා රැස්වීම් පැවැත්වීමට කටයුතු කරන නමුත් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර නොමැත.
3	අංක DMS/1849 දරන 2019.08.15 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර ඇති, බඳවා ගැනීමේ කාර්ය පටිපාටියකට අනුව බඳවාගැනීම සිදුකළ යුතු වුවත් එසේ කටයුතු කිරීමකින් තොරව ආයතනයේ ස්ථිර තනතුරු සඳහා කොන්ත්‍රාත් පදනම යටතේ නිලධාරීන් බඳවා ගැනීම සිදුකර 2022 නොවැම්බර් 30 දින වන විටත් කොන්ත්‍රාත් කාලය දීර්ඝ කරමින් ආයතනය තුළ රඳවාගෙන තිබුණි. ප්‍රාදේශීය අධ්‍යක්ෂ ,සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ, පරිපාලන නිලධාරි, කාර්යාල කාර්ය සහායක සහ රියදුරු යන තනතුරු සඳහා ස්ථිර නිලධාරීන් වෙනුවට කොන්ත්‍රාත් පදනම යටතේ නිලධාරීන් 7 දෙනෙකු බඳවාගෙන මාස 6න් 6ට කාලය දීර්ඝ කරමින්	2019/2020/2021/2022 ගනුදෙනු වාර්තාව	අනුමත කර ඇති තනතුරු සඳහා ස්ථිර නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කළ යුතුය.	අධිකාරිය විසින් කොන්ත්‍රාත් පදනම මත කාර්යය මණ්ඩලය බඳවා ගැනිම සිදු කර ඇත්තේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් යටතේ ස්ථිර කාර්යය මණ්ඩලයක් බඳවා ගැනිමේ ක්‍රියාකාරකම් ඉටු කිරිම සඳහා කාර්යය මණ්ඩලයක් පැවතීමේ අවශ්‍යතාවය මත හා එතෙක් අධිකාරියේ මෙහෙයුම් කාර්යභාරය ඉටු කිරිම සඳහාය. කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් දිගින් දිගටම පවත්වා ගැනීමට සිදුවී ඇත්තේ ස්ථිර නිලධාරීන් බඳවා ගැනීමට හැකියාවක් නොලැබීම හේතුවෙනි.	ප්‍රාදේශීය අධ්‍යක්ෂ, ගණකාධිකාරි සහ රියදුරු යන තනතුරු සඳහා ස්ථිර පදනමින් නිලධාරීන් බඳවාගෙන තිබූ නමුත් අනෙකුත් කිසිදු තනතුරක් සඳහා බඳවාගැනීමට කටයුතු කර නොමැත. රේඛීය අමාත්‍යාංශයේ නිළධාරීන්ට ඉතා දීර්ඝ කාලයක සිට වැඩ බැලීමේ පත්වීම් ලබාදී දීමනා හා අනෙකුත් වරප්‍රසාද ලබා දෙමින් කටයුතු කරනු

	ආයතනය තුළ රඳවාගෙන තිබුණි.				ලබයි.
4	2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.3 වගන්තිය ප්‍රකාරව මුදල් වර්ෂය ආරම්භ වීමට දින 15 කට කලින් පිළියෙල කරන ලද සංයුක්ත සැලැස්මේ පිටපත් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කිරීමෙන් පසු යාවත්කාලීන කරන ලද අයවැය ලේඛන සමඟ රේඛීය අමාත්‍යාංශය, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය සහ විගණකාධිපති දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ යුතු නමුත් 2020 - 2024 සංයුක්ත සැලැස්ම පිළියෙල කර නොතිබුණි. 2021 නොවැම්බර් 16 දිනැති 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට අනුව 2021-2025 උපාය මාර්ගික සංයුක්ත සැලැස්ම සමග ක්‍රියාකාරී සැලැස්ම සහ අයවැය ලේඛනය රේඛීය අමාත්‍යාංශය ලේකම් මගින් ලේකම්, මහා භාණ්ඩාගාරය සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ සහ රාජ්‍ය අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ,මහා භාණ්ඩාගාරය වෙත 2022 දෙසැම්බර් 31 දින වන විටත් ඉදිරිපත්කර නොතිබුණි.	2019/2020/2021/ 2022 ගනුදෙනු වාර්තාව	චක්‍රලේඛය ප්‍රකාරව මෙම සැලැසුම් ගිණුම් වර්ෂය ආරම්භ වීමට දින 15 කට පෙර ඉදිරිපත් කළ යුතුය.	අධිකාරියේ කාර්ය මණ්ඩලය බඳවා ගැනිම් පටිපාටියට අනුමැතිය ලැබී ඇත්තේ 2020.11.17 වන දින වේ. එබැවින් ආයතනය සඳහා සංයුක්ත සැලැස්ම සකස් කිරිම 2021 වර්ෂයේ ආරම්භ කර ඇත. ඒ අනුව 2021-2025 වර්ෂයන් සඳහා සංයුක්ත සැලැස්ම පිළියෙල කර තිබූ අතර 2021.04.08 වන දින ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී ඇත.	2020-2024 සංයුක්ත සැලැස්ම හා 2021-2025 උපාය මාර්ගික සංයුත්ක සැලැස්ම සමඟ ක්‍රියාකාරී සැලැස්ම හා අයවැය ලේඛනද වාර්තාවේ දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොමැත.

5	2014 පෙබරවාරි 17 දිනැති අංක 1/2014 දරන මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත්කරන ලද රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2019 හා 2020 වර්ෂයන් වෙනුවෙන් අධිකාරිය විසින් ආයතනයේ අරමුණු හා කාර්යයන් ආවරණය වන පරිදි ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණු අතර 2021 වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්ම තුළ නව ගම්මාන සංවර්ධනය කිරීම සඳහා ආණ්ඩුවේ සැලසුම්, වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ වතුවල ඇති නිවාස වල නීත්‍යානුකූල පදිංචිකරුවන්ට එම නිවාසවල අයිතිය ප්‍රදානය කිරීම සඳහා, එම පදිංචිකරුවන්ට හිමිකම් ඔප්පු නිකුත්කිරීම පහසු කරලීම යන කාර්යයන් හැර වෙනත් කිසිදු කාර්යයක් ආවරණය වන පරිදි 2021 වර්ෂයට ඉදිරිපත් කළ ක්‍රියාකාරී සැලැස්ම තුළ, හඳුනාගෙන සැලසුම් කර නොතිබුණි.	2019/2020/2021/2022 ගනුදෙනු වාර්තාව	චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම සකස් කළ යුතුය.	2019 වර්ෂයේ සහ 2021 වර්ෂයේ නොවැම්බර් මස දක්වා අධිකාරියේ කාර්ය මණ්ඩල බඳවා ගැනීමේ පටිපාටිය අනුමතව නොතිබූ අතර කාර්ය මණ්ඩලයක් නොමැති වීම නිසා 2019 සහ 2020 වර්ෂයන් සඳහා අධිකාරියේ මෙහෙයුම් කටයුතු සිදුවී නොමැත. 2021 වර්ෂයේ අධිකාරියේ සංවර්ධන කටයුතු සඳහා ප්‍රතිපාදන නොතිබීම මත අමාත්‍යාංශය විසින් වෙන් කරන ලද ප්‍රතිපාදන හා මූලික ප්‍රතිපාදන අවශ්‍ය නොවන කාර්යයන් පමණක් ඉලක්ක කර 2021 වර්ෂය සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ඇත.	2023 හා 2024 වර්ෂ වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්ම ඉදිරිපත් කර නොමැත.

3.16 ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	බදු පෙර ලාභය (අලාභය) රු.	මතය
2021	5,322,771,111	814,845,780	4,507,925,331	(136,222,182)	ව්‍යාවනය කළ
2022	5,572,859,684	792,260,061	4,780,599,624	363,998,388	ව්‍යාවනය කළ
2023	8,316,987,615	712,044,087	7,604,943,527	640,377,110	-

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	2021 දෙසැම්බර් 31 දිනට පැවති රු.193,072,652 ක්වූ ලැබියයුතු ගොඩනැගිලි කුලී ණයගැති ශේෂය තුළ, වරායන් 10ක වර්ෂ 5 ඉක්මවා රු.11,630,954ක හිඟහිටි ගොඩනැගිලි කුලී ණයගැති ශේෂ 20ක් පැවති අතර ඒවා අයකර ගැනීම අවිනිශ්චිත තත්ත්වයේ විය.	2021	ලැබිය යුතු මුදල් කඩිනමින් අය කර සංස්ථාවේ කාරක ප්‍රාග්ධනය ඉහල නංවා ගැනීමට කටයුතු කල යුතුය.	කුලි ණයගැති ශේෂය තුළ වසර 05ක් ඉක්මවා ඇති හිග හිටි ශේෂයන් අයකර ගැනීම සඳහා අවශ්‍ය නිතීමය ක්‍රියාමාර්ග ගැනීමට නීතිමය අංශය වෙත යොමු කර ඇති අතර, නිතී අංශය විසින් මේ වන විට එම ශේෂයන් අයකර ගැනීම සඳහා නඩු පවරා කොටස් වශයෙන් අයකර ගැනීමට කටයුතු කර ඇත.	2024.10.11 දින වන විටත් අය කරගෙන නොතිබුණි.
2	ආරක්ෂක සේවා සැපයීම වෙනුවෙන් ජාතික ජලජසම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය වෙතින් ලැබියයුතු රු.5,404,346 ක මුදලක් ද ධීවර අමාත්‍යාංශය	2021	ලැබිය යුතු මුදල් කඩිනමින් අය කර සංස්ථාවේ කාරක ප්‍රාග්ධනය ඉහල නංවා ගැනීමට කටයුතු කල යුතුය.	ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනයද ධීවර අමාත්‍යාංශය යටතේ පවතින ආයතනයක් වන	2024.10.11 දින වන විටත් අය කරගෙන නොතිබුණි.

	වෙතින් ලැබියයුතු රු.76,499,142ක මුදලක් ද වසර 5 ඉක්මවා තිබුණු අතර එම ශේෂයන් අයකර ගැනීම අවිනිශ්චිත තත්ත්වයේ විය.			බැවින් ධීවර අමාත්‍යාංශය හා ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනයයන ආයතන දෙකෙන්ම අය විය යුතු මෙම ශේෂ සම්බන්ධයෙන්, නිරවුල් කර ගැනීම සඳහා දැනට සාකච්ඡා කරමින් පවති.	
3	මුදල් රෙගුලාසි 187 (3) ප්‍රකාරව ලැබෙන මුදල් දිනපතා හෝ අප්‍රමාදව බැංකු ගත කිරීමට කටයුතු කළයුතු වුව ද 2021 දෙසැම්බර් 31 දිනට සියළුම වරායන්හි ඉන්ධන විකුණුම් හා අනෙකුත් ආදායම් වශයෙන් F1 වාර්තාව අනුව රු.22,590,054 ක් බැංකුගත නොකර පැවති අතර 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව එම ශේෂය රු.13,488,337 ක් විය. 2023 මාර්තු 14 හා 24 යන දිනවලදී අම්බලන්ගොඩ හා බේරුවල යන වරායන්හි සිදුකළ භෞතික මුදල් පරීක්ෂාවේදී පිළිවෙලින් රු.4,112,000 හා රු.6,786,180 ක මුදලක් එලෙස බැංකුගත නොකර පැවතුණි.	2021	මුදල් රෙගුලාසි ප්‍රකාර ලැබෙන සියළුම මුදල් අප්‍රමාදව බැංකුගත කල යුතුය.	සියලු වරායන්හි දෛනික ආදායම් එදිනම හෝ පසුදින බැංකුගත කිරීමට උපදෙස් ලබා දෙමින් අභ්‍යන්තර චක්‍රලේඛ නිකුත් කර ඇති අතර, දෛනික මුදල් බැංකුගත කිරීමට යාමේදි ප්‍රවාහන වියදම් අධික වන බැවින් ලබා දී ඇති රක්ෂණාවරණයට යටත්ව ආදායම් මුදල් බැංකුගත කරනු ඇත.	2024.10.11 දින දක්වාම නිවැරදි වී නොතිබුණි.
4	සංස්ථාව සතු ධීවර වරායන්හි ඉඩම්,අයිස් යන්ත්‍රාගාර, ගුදම් වැනි දේපළ පෞද්ගලික ව්‍යාපාරිකයන්ට බදු පදනම මත ලබා දී තිබුණු අතර 2021 දෙසැම්බර් 31 දිනට එලෙස ලබා දී තිබුණු බදු	2021	වාර්ෂික බදු මුදල් නිවැරදිව අයකර ගැන්මට කටයුතු කළ යුතු බව.	බදු දී ඇති දේපල වෙනුවෙන් අයවිය යුතු බදු මුදල් අයකර ගැනීම සඳහා මේ වන විට අවශ්‍ය නිතීමය ක්‍රියාමාර්ග ගෙන ඇත.	2024.10.11 දින දක්වාම අය කරගෙන නොමැත.

	දේපළ වෙනුවෙන් සංස්ථාවට ලැබිය යුතු හිඟ බදුකුලිය වූ රු.24,547,822 ක මුදල අයකර ගැනීම සඳහා නඩු 06 ක් සහ රු.5,675,373 ක හිඟ නැංගුරම් ගාස්තු අයකර ගැනීම සඳහා එක් නඩුවක් ද පවරා තිබුණු නමුත් නොවෙනස්ව ඉදිරියට ගෙන එමින් පවතින රු.59,251,453 ක හිඟ නැංගුරම් ගාස්තුව හා ඉකුත් වසරට සාපේක්ෂව සියයට 8.25 කින් වර්ධනය වී තිබුණු රු. 193,072,652 ක් වූ හිඟ ගොඩනැගිලි කුලියද අයකර ගැනීමට කළමනාකාරීත්වය නිසි අවධානය යොමු කර නොතිබුණි.				
5	යාත්‍රාවක් වරායෙන් පිටත්වීමේදී සියලු ගාස්තු නිරවුල් වූ පසු නිදහස් කළ යුතු වුවත් සියළු ගාස්තු නිරවුල් කිරීමට පෙර නිදහස් කළ යාත්‍රා වෙනුවෙන් දික්ඕවිට වරායේ රු.146,047,698 ක් වූ හිඟ නැංගුරම් ගාස්තු අයකර ගැනීම අවිනිශ්චිත වන අතර ඒ සඳහා හානිකරණ වෙන් කිරීමක්ද සිදුකර නොතිබුණි.	2022	සියලු ගාස්තු නිරවුල් වූ පසු යන්ත්‍ර නිදහස් කලයුතු අතර අයකර ගැනීම අවිනිශ්චිත නැංගුරම් ගාස්තු සම්බන්ධයෙන් හානිකරණ වෙන් කිරීම් සිදු කළ යුතු වේ.	දික්ඕවිට ධීවර වරායෙහි පවතින හිඟ ශේෂයන් අයකරගැනීම සඳහා දැනටමත් ආයතන කිහිපයක් වෙනුවෙන් නඩු පවරා ඇත.	2024.10.11 දින දක්වාම අය කරගෙන නොමැත.
6	අමාත්‍යාංශ ප්‍රදාන යටතේ ධීවර ප්‍රජාවගේ සුභසාධනය වෙනුවෙන් " දිරිසවිය" නමින් පිහිටුවන ලද රු.8,610,910 ක ශේෂයක් මූලා‍ය ප්‍රකාශන තුල ජංගම වගකීම් යටතේ ඉදිරියට ගෙන එනු ලබන අතර ඒ සඳහා කිසිදු මූලික ලියවිලි	2022	ශේෂ වල නිවැරදිතාවය තහවුරු කර ගැනීම සඳහා අවශ්‍ය මූලික ලියවිලි විගණනය වෙත ඉදිරිපත් කළ යුතු වේ.	මේ පිළිබඳ අවශ්‍ය ලියවිලි අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත්කර 2024 වර්ෂයේ ගිණුම් වලින් ගැලපීමට අවශ්‍ය කටයුතු සිදුකරනු ඇත.	2024.10.11 දින දක්වාම එම මූලික ලියවිලි විගණනය වෙත ඉදිරිපත් වී නොමැත.

	ඉදිරිපත් නොවූ බැවින් එහි නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමට නොහැකි විය.				
7	මූලාශ්‍ර ලියවිලි මගින් තහවුරු නොවූ රු.36,659,356 ක්වූ ඉදිරියට කල ගෙවීම් ශේෂ 2004 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා වූ ශේෂ වූ අතර මෙම ශේෂයන් සම්බන්ධයෙන් හඳුනා ගැනීම් සිදු කර මූල්‍ය ප්‍රකාශන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.	2022	ඉදිරියට කළ ගෙවීම් ශේෂ හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ.	2004 වර්ෂයේ සිට වර්ෂය 2016 දක්වා වූ පෙරගෙවුම් ශේෂයට අදාලව තොරතුරු රැස්කිරීම කමිටුවක් මගින් සිදුකලද ප්‍රමාණවත් සාක්ෂි රැස්කරගත හැකි නොවූනි.	2024.10.11 දින දක්වාම එම පෙරගෙවුම් ශේෂයට අදාලව ප්‍රමාණවත් සාක්ෂි රැස්කර ගෙන නොතිබුණි.

3.17 ලංකා ධීවර සංස්ථාව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	බදු පෙර ලාභය (අලාභය) රු.	මතය
2021	-	-	-	-	-
2022	-	-	-	-	-
2023	-	-	-	-	-

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	2003 ඔක්තෝබර් 07 දිනැති CFC/GM/CIR/51දරණ සංස්ථාවේ අභ්‍යන්තර චක්‍රලේඛය මගින් ණයට අලෙවිය වහාම අත්හිටුවීමට උපදෙස් ලබා දී තිබුණද 2021.12.31 දිනට අයවිය යුතු මුළු මසුන් විකුණුම් වටිනාකම රු.261,549,254ක් වූ අතර මෙයින් වසර 5කට වැඩි බාහිර ණයගැති ශේෂය රු.28,831,013ක්ද සේවකයින්ට මාළු විකිණීමෙන් වූ නොපියවූ ණයගැති ශේෂය සහ රෝහලේ ණයගැති ශේෂය රු.17,497,325 ක් විය.කෙසේ වුවද චක්‍රලේඛයට පටහැනිව ණයට මසුන් විකුණු නිලධාරීන්ට එරෙහිව මේ වන විට කිසිදු ක්‍රියාමාර්ගයක්ද ගෙන නොතිබුණි.	2020/2021 ගනුදෙනු වාර්තාව	අභ්‍යන්තර චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකල යුතු අතර එයට අනුගත නොවූ නිලධාරීන් සම්බන්ධව විනය ක්‍රියාමාර්ග ගත යුතුය.	ආයතනයේ අලෙවිය වැඩි කිරීම සඳහා බාහිර පාර්ශවයන් වෙත ණය පදනම මත අලෙවි සිදුකර ඇති අතර ආයතනයේ සම්බන්ධ පරීක්ෂණය සිදු කොට අභ්‍යන්තර නිලධාරීන් සම්බන්ධව විනය ක්‍රියාමාර්ග සිදු කොට ඇති අතර අභ්‍යන්තර චක්‍රලේඛ සංශෝධනය කිරීමට කටයුතු කර ඇත.	වාර්තාවේ නිර්දේශ ප්‍රකාර කටයුතු කර නොතිබුණු අතර මේ සම්බන්ධයෙන් 2024.07.12 දිනැති CFC/CH/DGMM/CIRCULAR/2024-01 අංක දරන නව චක්‍රලේඛයක් නිකුත් කර ඇත.

2	2022 ඔක්තෝබර් 31 දිනට ගෙවිය යුතු භාණ්ඩාගාර ඇපකර මත බැංකු ණය ශේෂය රු.158,623,208ක් වන අතර එදිනට ගෙවිය යුතු පොලී මුදල රු.34,531,894 ක් හා අංක 1257 දරණ බැංකු ගිණුමේ 2021 දෙසැම්බර් 31 දිනට බැංකු ප්‍රකාශය අනුව බැංකු අයිරාව රු.25,491,592ක් වූ අතර සංස්ථාව දිගින් දිගටම පාඩු ලබන බැවින් මෙම අයහපත් මූල්‍ය තත්ත්වය කළමනාකරණය කර ගැනීමට නොහැකි වී තිබුණි.	2020/2021 ගනුදෙනු වාර්තාව	සංස්ථාවේ අනාගත පැවැත්ම පිළිබඳ අවධානම් සහගත බැවින් කළමනාකරණය ඒ පිළිබඳව අවධානය යොමු කළ යුතුය.	අදාල භාණ්ඩාගාර ඇපකර මත ලබා ගෙන ඇති බැංකු ණය ගෙවීම සඳහා ලංකා බැංකුව හා මහා භාණ්ඩාගාරය සමග ඉහල කළමණාකරනය සාකච්ජා කොට ඇති අතර අදාල ක්‍රියාදාමයන් සිදුවෙමින් පවතී.	2024 ජූලි මස 19 විගණිත දින වන විට භාණ්ඩාගාර ඇපකර මත බැංකු ශේෂය රු.මිලියන 158.6ක් වන අතර එදිනට ගෙවිය යුතු පොලී මුදල රු.මිලියන 90.5ක් දක්වා වැඩි වී තිබුණි. ගිණුම් අංක 1257හි බැංකු අයිරාව 2024 පෙබරවාරි මස සිට අගෝස්තු 31 දින වන විට රු.29,807,261 ලෙස නොවෙනස්ව පවතී.
3	මුදල් රෙගුලාසි 103 (ඇ) ප්‍රකාරව නැතිවීම්,හානිවීම් සම්බන්ධව පරීක්ෂණ පවත්වා වගකිව යුත්තන් නිශ්චය කල යුතු වුවත් ගාල්ල අයිස් යන්ත්‍රාගාරයේ 2021.10.08 දින තොග භෞතික සමීක්ෂණයේදී හෙළිදරව් වූ සම්පීඩක යන්ත්‍ර අමතර කොටස් අස්ථාන ගතවීම සම්බන්ධව පරීක්ෂණ පවත්වා වගකිව යුත්තන් නිශ්චය කිරීම මේ දක්වා කර නොතිබුණු අතර මෙම සම්පීඩක යන්ත්‍ර වල වටිනාකමද විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	2020/2021 ගනුදෙනු වාර්තාව	මෙම පාඩුවට වගකිව යුත්තන් නිශ්චය කිරීම සඳහා පරීක්ෂණ ආරම්භ කළ යුතුය.	මේ සම්බන්ධව ආයතන මට්ටමින් විධිමත් හා මූල්‍ය පරීක්ෂණයක් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇති අතර අස්ථාන ගත වූ අමතර කොටස් වලට අදාලව වර්තමාන වෙළඳපොල වටිනාකමෙහි තක්සේරුව ලබා ගෙන ඇති අතර එම අස්ථාන ගතවීම සම්බන්ධව පොලිස් පැමිණිල්ලක් දමා එයට අදාල පරීක්ෂණයක් පවත්වා ගෙන යනු ලබයි.	2024.07,24 දින දක්වාම මු.රෙ.103(ඇ) ප්‍රකාර පරීක්ෂණ පවත්වා වගකිව යුත්තන් නිශ්චය කිරීමට කටයුතු කර නොතිබුණි.

4	2022 අංක 14 දරණ එකතු කළ අගය මත බදු පනතේ 26 වගන්තිය ප්‍රකාරව එකතු කළ අගය මත බදු මුදල් සෑම මසකම 20 වන දිනට පෙර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කළ යුතු වුවත් 2021 දෙසැම්බර් 31 දිනට රු.19,696,372ක මුදලක් ප්‍රේෂණය නොකර රඳවාගෙන පැවතුණි.	2020/2021 ගනුදෙනු වාර්තාව	මෙම බදු මුදල වහාම දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කළ යුතුය.	එකතු කළ අගය මත බදු මුදල දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මත ගෙවීමට කටයුතු කර නොමැත.	2024.06.30 දිනට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කළ යුතු ශේෂය රු.19,696,372ක මුදලක් ලෙස නොවෙනස්ව පවතී.
5	2009 අංක 09 දරණ ජාතිය ගොඩනැගීමේ බදු පනතේ 04 වගන්තිය ප්‍රකාරව ජාතිය ගොඩනැගීමේ බදු මුදල් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කළ යුතු වුවත් 2021 දෙසැම්බර් 31 දිනට රු.94,316,489ක මුදලක් රඳවාගෙන පැවතුණි.	2020/2021 ගනුදෙනු වාර්තාව	ජාතිය ගොඩනැගීමේ බදු මුදල් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කළ යුතුය.	දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් අධිකරණයේ පවරන ලද නඩුවෙන් හිඟ මුදල මාසකට රු.500,000 බැගින් ගෙවීමට තීරණය වී ඇත.	2024.06.30 දිනට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කළ යුතු ශේෂය රු.87,295,794 ක් විය.
6	2013 සැප්තැම්බර් 11 දිනැති අංක 2013/02 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මගින් හිඟ සේවක අර්ථසාධක දායක මුදල් හා සේවක භාරකාර අරමුදල් දායක මුදල් නිරවුල් කිරීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග හඳුන්වා දී තිබුණු අතර චක්‍රලේඛයේ 3.7 අනුව තවදුරටත් නිරවුල් නොවන හිඟ දායක මුදල් පිළිබඳව අදාළ අමාත්‍යාංශ ලේකම්වරයාට දැනුම් දී භාණ්ඩාගාර ලේකම්වරයාට දැනුම් දී භාණ්ඩාගාර ලේකම්ට පිටපතක් ඉදිරිපත් කළ යුතු අතර භාණ්ඩාගාර ලේකම් සමඟ සාකච්ඡා කර විසඳුමකට එළඹීම	2020/2021 ගනුදෙනු වාර්තාව	සේවක අර්ථසාධක දායක මුදල් හා සේවක භාරකාර අරමුදල් නිසි පරිදි කලට වේලාවට ප්‍රේෂණය කළ යුතුය.	සේවක අර්ථසාධක දායක මුදල හා අධිභාරය ගෙවා නොමැති අතර සේවක භාරකාර අරමුදලට අදාලව වර්තමාන ශේෂ ගෙවාගෙන යන නමුත් ඉකුත් වර්ෂයන්ගෙන් ඉදිරියට එනු ලබන රු.17,753,613 ක ශේෂය තවදුරටත් ගෙවිය යුතුව ඇත.මෙම හිඟ ශේෂ ගෙවීම සඳහා රේඛීය අමාත්‍යාංශය හරහා මහා භාණ්ඩාගාරයෙන් අරමුදල් ලබා ගැනීමට සාකච්ඡා කරමින් පවතී.	2024 ජුනි 30 දිනට නිරවුල් නොකරන ලද සේවක අර්ථසාධක අරමුදල සඳහා දායක මුදල් රු.432,881,852 ක්ද අධිභාර වශයෙන් රු.207,768,540 ක් ද, සේවක භාරකාර අරමුදල සඳහා දායකය වශයෙන් රු.15,420,275 ක්ද, අධිභාර වශයෙන්

අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ වගකීමක් විය. එසේම චක්‍රලේඛයේ 3.9 වගන්තිය අනුව තවදුරටත් හිඟ දායක මුදල් වර්ධනය නොවන බවටත් සභාපති, අධ්‍යක්ෂ මණ්ඩලය, ප්‍රධාන විධායක නිලධාරීන් හා විෂයභාර නිලධාරීන් සාමූහිකව හා තනි තනිව වගකීමට බැඳී සිටින බව දක්වා තිබුණි.එසේ වුවද 2021 දෙසැම්බර් 31 දිනට නිරවුල් නොකරන ලද සේවක අර්ථසාධක අරමුදල සඳහා දායක මුදල් රු.321,171,209 ක්ද අධිභාර වශයෙන් රු.165,835,868ක් ද, සේවක භාරකාර අරමුදල සඳහා දායකය වශයෙන් රු.15,420,275 ක්ද, අධිභාර වශයෙන් රු.7,710,137 ක්ද විය.	රු.7,710,137 ක්ද ගෙවීමට පැවතුණි.

3.18 රාජ්‍ය දැව සංස්ථාව

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	9,207,818,718	2,450,611,500	6,757,207,218	1,496,155,864	තත්ත්වාගණනය කළ
2022	9,588,286,776	1,923,131,250	7,665,155,526	1,015,986,328	තත්ත්වාගණනය කළ
2023	9,562,930,913	1,556,142,801	8,006,788,112	1,273,734,838	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනය නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	සංස්ථාවේ 2023 දෙසැම්බර් 31 දිනට වෙළඳ ලැබිය යුතු දැ ගිණුමේ පැවති රු.966,058,091 ක ශේෂය තුළ පැවති වසරක සිට වසර 04 කට වැඩි කාලයක් ඉක්ම වූ රු.240,299,687 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	2023 2022	ලැබිය යුතු මුදල් නොපමාව අයකර ගැනීමට කටයුතු කළ යුතුය.	රු.මිලියන 966 ක් වූ වෙළඳ ණයගැතියන් තුළ රු.මිලියන 603 ක් ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවෙන් සිල්පර සැපයීම සඳහා ලැබිය යුතු මුදලක් වේ. රුහුණු විශ්ව විද්‍යාලය, ව.ස.දෙ.,කි.මී.දෙ. අයවිය යුතු ශේෂයන් ලියාහැරීමට අනුමැතිය ලබාදී ඇත.	2024 සැප්තැම්බර් 30 දින වනවිටත් රු.240,299,687 ක මුදල අය කර ගැනීමට හෝ ලියා හැරීමට කටයුතු කර නොතිබුණි.
(ආ)	උමාඔය පහළ නිම්න සංවර්ධන වැඩබිම්වල කුඹුක් කඳන් අළෙවියේ දී සිදු වී ඇති බවට අනාවරණය කරගෙන තිබුණු රු.2,952,271 ක අලාභයක් හා බණ්ඩාරවෙල ප්‍රාදේශීකයේ ඇප මුදල් නිදහස් කිරීමේ දී සිදු වූ අක්‍රමිකතා හේතුවෙන් ඇති වී තිබුණු රු.685,109 ක අලාභයක් පිළිවෙලින් වාර 10 කදී හා 07 කදී	2023	සංස්ථාවට සිදු වී ඇති අලාභ ඊට සම්බන්ධ පාර්ශ්වයන් ගෙන් නොපමාව අය කර ගැනීමට කටයුතු කළ යුතුය.	2024 සැප්තැම්බර් 03 දින පරීක්ෂණ මණ්ඩලයක් පත්කිරීම සඳහා නිර්දේශීත කම්ටු සාමාජික නම් අමාත්‍යාංශය වෙත යොමු කර ඇත.	පරීක්ෂණ මණ්ඩලයක් පත් කිරීමට කටයුතු කරමින් පවතී.

	විගණන හා කළමනාකරණ කමිටුවේ සාකච්ඡා කර තිබුණ ද පරීක්ෂණ කටයුතු අවසන් කර අලාභයන් අයකර ගැනීමට නොහැකි වී තිබුණි.				
(ඇ)	2018 ඔක්තෝබර් 10 දිනැති අංක 422 දරන අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති චක්‍රලේඛයේ මඟ පෙන්වීම් ප්‍රකාරව වන අපරාධ දැව සම්බන්ධයෙන් කටයුතු නොකිරීම හේතුවෙන්, වන අපරාධ දැව විනාශ වීම, දැව කළමණාකරණය හා ගබඩා පහසුකම් කළමනාකරණය කර ගැනීම අපහසු වීම වැනි අසීරුතාවලට සංස්ථාව මුහුණ පා සිටින අතර මහනුවර ප්‍රාදේශීකයට අදාළව පමණක් කඳන් දැව ඝන ඩෙසිමීටර් 159.904 ක් සහ ඉරූ දැව ඝන ඩෙසිමීටර් 30.933 ක් දිරාපත් වෙමින් ද, ගබඩා ඉඩ පහසුකම් ඇහිරී ගොස් ද තිබුණු බවට නිරීක්ෂණය විය.	2023	චක්‍රලේඛයේ මඟ පෙන්වීම් ප්‍රකාරව කටයුතු කර සිදුවන දැව හානි වළක්වා ගැනීමට කටයුතු කළ යුතුය.	අංක 422 දරණ අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති චක්‍රලේඛය සියලුම අධිකරණයන් වෙත අප විසින් ඉදිරිපත් කර ඇත. ඒ අනුව මෙම දැව රඳවා තබා ගන්නා ලෙස පමණක් අධිකරණ තීන්දුවක් ලැබී ඇත. එම නීති උපදෙස් මත රාජ්‍ය දැව සංස්ථාව එම දැව මෙතෙක් රඳවා ගෙන පවතී.	වන අපරාධ දැව වලට සිදු විය හැකි හානි පිළිබඳව අධිකරණයට කරුණු දක්වමින් වන අපරාධ දැව සම්බන්ධයෙන් 2018 ඔක්තෝබර් 10 දිනැති අංක 422 දරන අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කිරීම සඳහා නිලධාරීන් දැනුවත්කර ඇත.
(ඈ)	පරිත්‍යාග වශයෙන් ලැබෙන දැව ඉවත් කිරීම සඳහා නිසි ක්‍රමවේදයක් ස්ථාපිත නොකිරීම හේතුවෙන් 2023 වර්ෂයේදී ඉවත් කිරීම් 1,157 ක් සඳහා රු.41,854,672 ක් පෞද්ගලික	2023	පරිත්‍යාග දැව ඉවත් කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් ස්ථාපිත කළ යුතුය.	පරිත්‍යාග දැව ඉවත් කිරීම පිළිබඳව සිද්ධි 1200 ක් පමණ වසරකට ඉවත් කිරීමට ලැබෙන බැවින් එය නවීන යන්ත්‍ර සූත්‍ර යොදා සිදු කිරීමට ඇති හැකියාව සීමිත නිසා පුද්ගලික	පරිත්‍යාග දැව ඉවත් කිරීම කොන්ත්‍රාත්කරුවන් ලවා කරවා ගැනීම සිදු නොකර සංස්ථා සේවකයින්, යන්ත්‍ර සූත්‍ර භාවිතයෙන් සිදු

	කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීමට සිදුවී තිබුණි.			කොන්ත්‍රාත්කරුවන්ගේ සහය ලබා ගැනීම සිදු කරයි. නමුත් 2024 අයවැය සඳහා නවීන යන්ත්‍ර සූත්‍ර ලබා ගැනීමට ප්‍රතිපාදන වෙන් කර ඇති අතරම ඒ සඳහා අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතියද ලැබී ඇත. ඒ අනුව ඉදිරියේදී මෙම දැව කඩිනමින් ඉවත් කිරීමේ කටයුතු සිදුකරනු ඇත.	කිරීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.
(ඉ)	පල්ලේකැලේ නිෂ්පාදනාගාරයේ Dust collector යන්ත්‍රයක් හා වන අපරාධවලට සම්බන්ධ උසාවියෙන් නිදහස් කර තිබූ ජංගම ලී ඉරුම්හල් 03 ක්, වසර ගණනාවක සිට භාවිතයෙන් තොරව නිෂ්කාර්යව දිරාපත්වීමට ඉඩහැර තිබුණි.	2023	වත්කම් කාර්යක්ෂමව පරිහරණය කිරීම හා නඩත්තු කිරීම කෙරෙහි මනා අවධානය යොමු කළ යුතුය.	මෙම යන්ත්‍ර භාවිතයට ගත නොහැකි යල් පැනගිය කාර්යක්ෂමතාව ඉතා අඩු කාර්මික දෝෂ වලට ලක්ව ඇති ඒවා වන අතර, මේවා භාවිතයෙන් ඉවත් කොට අපහරණය කිරීමට කටයුතු කරමි. ඉරුම්හල් 01 ක් ටෙන්ඩර් කර ඉවත් කර ඇති අතර ඉතිරි භාණ්ඩ ඉවත් කිරීමට ටෙන්ඩරය ඉදිරි ටෙන්ඩරයට යොමු කර ඇත.	2024 සැප්තැම්බර් 30 දින වන විටත් ඉරුම් හල් 02 ක් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.
(ඊ)	අවශ්‍යතාවය නිශ්චිතව හඳුනාගැනීමෙන් තොරව 2023 වර්ෂයේ දී සංස්ථාව විසින් මිලදීගෙන ප්‍රාදේශීය කාර්යාල 13 ක් වෙත බෙදා හැර තිබුණු රු.35,800,075 ක් වටිනා දම්වැල් කියත් (chain saw) 100 කින් සියයට 75 ට වැඩි ප්‍රමාණයක්	2023	අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගෙන මිලදී ගැනීමේ ක්‍රියාවලිය විධිමත් කර ආයතනයට සිදුවිය හැකි හානි අවම කර ගත යුතුය.	සැලසුම් කළ පරිදි හෙළීම් කිරීම සඳහා ප්‍රමාණවත් වන වගා ප්‍රමාණයක් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් නොලැබීම නිසා මේ වන විට දම්වැල් කියත් කිහිපයක් කුලී පදනම මත නගරසභා වෙත ලබාදීමෙන් වන අපරාධ/ පරිත්‍යාග දැව	2024 සැප්තැම්බර් 30 දින වන විටත් මෙම දම්වැල් කියත් ඌන උපයෝජිතව පවතී.

	කාර්යක්ෂමව භාවිතයට ගැනීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් සකස් නොකිරීම හේතුවෙන් ඌණ උපයෝජිතව පැවතුණි.			ලබා ගැනීම සඳහා ලබා දී ඇත. මීට අමතරව තේක්ක අමතර වන වගා හෙක්ටයාර් 165 ක් ලබා ගැනීමට සැලසුම් කර ඇති අතර, එම වන වගා වලින් යම් ප්‍රමාණයක් සංස්ථා යෝජනා ක්‍රම මඟින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. එමඟින් ද මෙම දම්වැල් කියත් භාවිතය වැඩි කරගෙන ඇත. කොන්ත්‍රාත්කරුවන් සඳහා සංස්ථා දම්වැල් කියත් කුලී පදනමට ලබා දීමට අවශ්‍ය කටයුතු සංවිධානය කර ඇති අතර, ඒ වෙනුවෙන් ගිවිසුමක් ද සකස් කර ඇති අතර, ඉදිරියේදී ඔවුන් වෙත මෙම දම්වැල් කියත් ලබාදීමටද තීරණය කර ඇත. අවශ්‍ය දම්වැල් කියත්කරුවන් බඳවා ගැනීම ප්‍රමාද වීම නිසා මැන් පවර් ආයතනය හරහා අවශ්‍ය සේවකයින් ලබා ගැනීමට කටයුතු කරගෙන යන අතර, ඉන් අනතුරුව මෙම දම්වැල් කියත් භාවිතය උපරිම මට්ටමට රැගෙන එන බවට දන්වා තිබුණි.	
(උ)	සංස්ථාවට 2021 ඔක්තෝබර් 25 දින ලැබී තිබුණු හපුතලේ ජයමිණිපුර 01/003 පයිනස් වැඩබිමේ සහ 2022 වර්ෂයේ ලබා දී	2023	ප්‍රසම්පාදන ක්‍රියාවලිය කාර්යක්ෂම කර මෙහෙයුම් කටයුතු විධිමත්ව හා	පැල්ලපිටිය පයිනස් වන වගාවේ දැව සැපයීම සඳහා ප්‍රසම්පාදන ලංසු කැඳවා මිල ගණන් අනුමැතියට අමාත්‍යාංශය	ප්‍රසම්පාදන ක්‍රියාවලිය කාර්යක්ෂම කර මෙහෙයුම් කටයුතු විධිමත්ව හා

	තිබුණු පැල්ලපිටිය පයිනස් වන වගාවේ පූර්ණ හෙළීම් කටයුතු සඳහා ලංසු කැඳවීම් අනුමත කිරීමට අසාමාන්‍ය කාලයක් ගත කර තිබීම, යටිතල පහසුකම් සැපයීම ප්‍රමාද වීම සහ ස්වාභාවික සාධක කෙරෙහි අවධානය යොමුකර සුදුසු කාලවකවානු අනුව හෙළීම් කටයුතු සිදු නොකිරීම හේතුවෙන් 2024 මාර්තු අවසන් වන තුරු හෙළීම් කටයුතු අවසන් කිරීමටත් දෙවන වැඩබිමෙහි 2024 පෙබරවාරි තෙක් හෙළීම් කටයුතු ආරම්භ කිරීමටත් නොහැකිවී තිබුණි.		කාර්යක්ෂමව කිරීම සඳහා නිසි සැලසුම්ගත වැඩ පිළිවෙලක් ඔස්සේ කටයුතු කළ යුතුය.	වෙත යොමු කර ඇත. මාර්ග ඉදිකිරීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවේ අනුමැතිය ලැබෙන තෙක් එම කටයුතු තාවකාලිකව නතර කර ඇත. ප්‍රාදේශීය සභාව මඟින් කටයුතු කළ යුතු ආකාරය පිළිබඳව අප දැනුවත් කර ඇති අතර, ඒ අනුව ඉදිරි කටයුතු සිදු කරමින් පවතී.	කාර්යක්ෂමව කිරීම සඳහා නිසි සැලසුම්ගත වැඩ පිළිවෙලක් ඔස්සේ කටයුතු කර නොතිබුණි.
(ඌ)	1982 පෙබරවාරි 05 දිනැති අංක 178/10 දරන අති විශේෂ ගැසට් නිවේදනය ප්‍රකාරව සංස්ථාවේ අරමුණක් වූ දැව ආශ්‍රිත නිමි හා අර්ධ නිමි භාණ්ඩ අපනයනය කිරීමේ කාර්යය ඉටු කර ගැනීම සඳහා ප්‍රමාණවත් පද්ධති හා පාලන ක්‍රමයක් ස්ථාපිත කිරීමට අපොහොසත් වී තිබුණි.	2022	සංස්ථාව පිහිටුවා ඇති අරමුණු කරා ළඟාවීමට අවශ්‍ය උපාය මාර්ගික සැලසුම් සකස් කර ප්‍රමාණවත් පද්ධති හා පාලන ක්‍රමයක් ස්ථාපිත කළ යුතුය.	**01. නිමි හා අර්ධ නිමි භාණ්ඩ අපනයනය කිරීම.** රාජ්‍ය දැව සංස්ථාවේ නිෂ්පාදන අපනයනය කිරීම සඳහා හඳුනා ගෙන ඇති රටවල් චීනය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, දකුණු කොරියාව, ජපානය, ජර්මනිය, ඉන්දියාව, ඕස්ට්‍රේලියාව, ඇමරිකා එක්සත් ජනපදය, එංගලන්තය, කැනඩාව මේ වන විට සියෙරාලියෝන්,	අපනයනය කිරීමේ කාර්යය ඉටු කර ගැනීම සඳහා ප්‍රමාණවත් පද්ධති හා පාලන ක්‍රමයක් ස්ථාපිත කර නොතිබුණි.

				ඕස්ට්‍රේලියා, සිංගප්පූරුව, ඉන්දියාව, නෝර්වේ, ඇමරිකා එකසත් ජනපදය වැනි රටවල් වලට රාජ්‍ය දැව සංස්ථාවේ ගෘහ භාණ්ඩ 76 කට වඩා වැඩි ප්‍රමාණයක් (ආසන්න වශයෙන් රු.4,357,311.50) ක පමණ වටිනාකමට 2020 සිට මේ දක්වා ගෘහ භාණ්ඩ අපනයනයට දායකත්වය ලබාදී ඇත. **02.විදෙස් ආයතන සමඟ ඇති කරගත් ගිවිසුමක් යටතේ භාණ්ඩ අපනයනය කිරීම** මේ සම්බන්ධයෙන් ක්‍රමවේදයක් සකස් කර අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබූ අතර එය තවදුරටත් සවිස්තරාත්මකව සැලසුම් කර ඉදිරිපත් කල යුතුව ඇති බව අධ්‍යක්ෂ මණ්ඩල තීරණය විය.	
(එ)	ගොමදියගාල 01/22 තේක්ක වැඩබිමෙහි 2017 වර්ෂයේදී සිදු වී තිබුණු අක්‍රමිකතාවක් සම්බන්ධ චෝදනාවට ලක් වූ සේවකයන්	2022	අක්‍රමිකතා සිදු කිරීම වැලැක් වීම සඳහා ශක්තිමත් අභ්‍යන්තර පාලන	අධ්‍යක්ෂක මණ්ඩල උපදෙස් පරිදි මේ සම්බන්ධව දැනට විධිමත් විනය පරීක්ෂණයක් සිදු වෙමින් පවතී.	විධිමත් විනය පරීක්ෂණයක් සිදු කර නොතිබුණි.

	සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු නොකිරීම නිසා එම නිලධාරීන්ට උසස්වීම් ලබා දීමට ද කළමනාකාරිත්වය කටයුතු කර තිබුණි.		පද්ධතියක් ස්ථාපිත කිරීමටත්, චෝදනාවට ලක් වූ සේවකයන් සම්බන්ධයෙන් විධිමත් විනය ක්‍රියාමාර්ග ගැනීමටත්, උසස්වීම් ලබා දීම විධිමත් කිරීමටත් කටයුතු කළ යුතුය.		
(ඒ)	2020 ජනවාරි 09 දින සිට 2022 මාර්තු 10 දින දක්වා සංස්ථාවේ හිටපු සභාපතිවරයා විසින් භාවිතා කරන ලද Dell Laptop 01 ක්, Samsung Tab 01 ක් සහ Samsung Mobile Phone 01 ක් නැවත භාර නොදීම හේතුවෙන් ඔහුගෙන් අයකළ යුතු බවට ගණනය කළ රු.529,199 ක වෙළඳපොල වටිනාකම හා නැවත අත්පත් කර ගැනීමට දැරියයුතු වියදම සියයට 25 ක් ඇතුලුව මුළු මුදල රු.532,949 ක් අයකරගෙන නොතිබුණි.	2022	අදාළ වත්කම් අත්පත් කර ගැනීමට හෝ වෙළඳපළ වටිනාකම අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.	මෙතෙක් රු.532,949/- ක මුදල සංස්ථාව වෙත ගෙවීම් කර නොමැති බව දන්වන අතර ඒ සම්බන්ධව නඩු පැවරීමට අවශ්‍ය ලේඛන තලංගම පොලීසිය වෙත භාරදී ඇත. කෙසේ වෙතත් නඩු පැවරීමට මෙතෙක් කටයුතු කර නොතිබූ බැවින් 2024.09.03 දින නැවත සිහිකැඳවීමක් නුගේගොඩ භාර නියෝජ්‍ය පොලිස්පති වෙත දන්වා යවා ඇත.	2024 සැප්තැම්බර් 30 දින දක්වා අදාළ වත්කම් අත්පත් කර ගැනීමට හෝ වෙළඳපළ වටිනාකම අයකර නොතිබුණි.
(ඔ)	බුස්ස නිෂ්පාදනාගාරයෙහි හැකියාව සහිත සුදුසු කොන්ත්‍රාත්කරුවන්ට කොන්ත්‍රාත් භාර නොදීම හා නිෂ්පාදනාගාරයේ අවිධිමත්	2022	කෙරීගෙන යන වැඩ කඩිනමින් අවසන් කර අලෙවි කිරීමටත්, අවශ්‍යතාවය හඳුනාගෙන නිෂ්පාදන	දැනට අර්ධ වශයෙන් නිෂ්පාදනය කර ඇති ගෘහ භාණ්ඩ කඩිනමින් නිෂ්පාදනය කර අවසන් කිරීමට කටයුතු කරමින් පවතින අතර, ඉදිරියේදී මෙවැනි තත්වයත් ඇති නොවීමට	අර්ධ වශයෙන් නිම කර ඇති ගෘහ භාණ්ඩවල නිෂ්පාදන කටයුතු අවසන් කර නොතිබුණු අතර ප්‍රමාණවත් අලෙවි

	සැලසුම්කරණය හේතුවෙන් වසර 01 ත් වසර 10 කට වැඩි කාලයකත් සිට පවතින කෙරීගෙන යන වැඩවල වටිනාකම රු.21,689,756 ක් වූ අතර කාලීන අවශ්‍යතාවය හඳුනා නොගැනීම හා අලෙවි කටයුතු ප්‍රවර්ධනය නොකිරීම හේතුවෙන් 2022 ජූලි 31 දිනට භාවිතයෙන් තොරව පවතින දැව තොගයෙහි වටිනාකම රු.මිලියන 65.5 ක් විය.		කටයුතු සැලසුම් කර හැකියාව සහිත සුදුසු කොන්ත්‍රාත්ක රුවන්ට කොන්ත්‍රාත් භාර දීමටත්, අලෙවි කටයුතු ප්‍රවර්ධනය කර නිෂ්පාදන කාර්යක්ෂම කිරීමටත් කටයුතු කළ යුතුය.	නිෂ්පාදනාගාර කටයුතු ද සිදුකරනු ලැබේ. 2024 සැප්තැම්බර් 30 දිනට කෙරීගෙන යන වැඩවල වටිනාකම රු.21,509,128.42 ක් ද ඉරූ දැව තොග ප්‍රමාණය ස.ඩෙ.මී. 139,425 ක් ද වේ.	ප්‍රවර්ධනයක් ද සිදු කර නොතිබුණි.
(ඔ)	වාර්ෂික විකුණුම් අවශ්‍යතාවය මත නිෂ්පාදන අවශ්‍යතාවය පුරෝකථනය කිරීම, යහපත් තොග පාලන ශිල්ප ක්‍රම අනුගමනය කර විධිමත් හා ප්‍රමාණවත් ගබඩා පවත්වා ගැනීම, කාර්යක්ෂම නිෂ්පාදන ක්‍රියාවලියක් ස්ථාපිත කිරීම යන කරුණු සම්බන්ධයෙන් ඉහළ කළමනාකාරිත්වයේ අවධානය යොමු නොවීම හේතුවෙන් 2012 වර්ෂයේ සිට 2022 ජූලි 31 දින දක්වා නිෂ්පාදනය කරන ලද පිරිවැය රු.68,239,793 ක් වූ අතිරික්ත ගෘහ භාණ්ඩ තොගයක් ද, 2022 වර්ෂය තුළ කිසිදු අළෙවියක් කර නොතිබුණු රු.7,152,896 ක් වටිනා ගෘහ භාණ්ඩ අයිතම 32	2022	වාර්ෂික විකුණුම් අවශ්‍යතාවය මත නිෂ්පාදන පුරෝකථනය න් කිරීම, විධිමත් හා ප්‍රමාණවත් ගබඩා පවත්වා ගැනීම, කාර්යක්ෂම නිෂ්පාදන ක්‍රියාවලියක් ස්ථාපිත කිරීම යන කරුණු සම්බන්ධයෙන් ඉහළ කළමනාකාරීත් වයේ අවධානය යොමු කළ යුතුය.	ඉහළ ඉල්ලුමක් ඇති අලෙවි සැලැස්මට අදාළ ගෘහ භාණ්ඩ පමණක් නිෂ්පාදනය කිරීම වර්තමානයේ සිදුකරන නිසා ඉදිරියේදී මෙම තත්ත්වය ඇති නොවේ. මේ වන විට ඔප නොදමා තිබූ ගෘහ භාණ්ඩ ප්‍රමාණය අලෙවි අංශයෙන් ලැබෙන ඇණවුම් මත ඔපදමමින් ප්‍රදර්ශණාගාරය වෙත නිකුත් කිරීම සිදු කරමින් පවතී.	වාර්ෂික විකුණුම් අවශ්‍යතාවය මත නිෂ්පාදන පුරෝකථනයන් කිරීම, විධිමත් හා ප්‍රමාණවත් ගබඩා පවත්වා ගැනීම, කාර්යක්ෂම නිෂ්පාදන ක්‍රියාවලියක් ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් ඉහළ කළමනාකාරීත් වයේ අවධානය යොමු වීම මන්දගාමී වූ අතර 2024.09.30 දිනට බුස්ස ප්‍රදර්ශනාගාර ගබඩාවේ ඇති ගෘහ භාණ්ඩ තොගයේ වටිනාකම රු.99,966,756.

	ක් සහ ඉතා සෙමින් අලෙවි වන රු.3,132,000 ක් වටිනා ගෘහභාණ්ඩ අයිතම 12 ක් ද, 2012 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා නිෂ්පාදනය කරන ලද නමුත් ඔප නොදමන ලද වටිනාකම රු.20,474,207 ක් වූ ගෘහ භාණ්ඩ තොගයක් ද බූස්ස ප්‍රදර්ශනාගාර ගබඩාවේ හා යන්ත්‍රාගාරයේ පැවතුණි.				60 ක් විය.
(ක)	සංස්ථාව විසින් ගෘහ භාණ්ඩ නිෂ්පාදනය සඳහා ගත වන ශ්‍රම පැය ඇස්තමේන්තු කර තිබුණ ද, සත්‍ය වශයෙන් වැය වන ශ්‍රම පැය සමඟ සසඳා ශ්‍රමිකයන්ගේ කාර්යක්ෂමතාව හා ඵලදායීතාව මැනීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබීමෙන් ශ්‍රමිකයන් කාර්යක්ෂමව හා ඵලදායිව යොදාගෙන ඇති බවට සනාථ කළ නොහැකි විය.	2022	සේවක කාර්යක්ෂමතාව හා ඵලදායීතාව මැනීමට ක්‍රමවේදයක් සකස් කර ගෘහ භාණ්ඩ නිෂ්පාදනය සඳහා ගත වන සත්‍ය ශ්‍රම පැය මත ගෘහ භාණ්ඩ පිරිවැය ගණනය කිරීමට කටයුතු කළ යුතුය.	පිරිවැය ඇස්තමේන්තු සකස් කරන විට දිනකට පැය 08 ක් සේවය කිරීම සලකා ශ්‍රම පිරිවැය සකස් කර ඇත. ගෘහ භාණ්ඩ අයිතමයෙන් අයිතමයට ශ්‍රම පිරිවැය ගණනය කර ඇති අතර, එක් අයිතමයක් නිෂ්පාදනය අවසන් කරන විට ඔහුගේ දෛනික වැටුපට ගැලපෙන ප්‍රමාණයෙන් එය ආවරණය වී ඇත්ද යන්න සලකා බැලීමේ හැකියාව ඇත. නිෂ්පාදන පෙළක් (production line) සිදුකරගෙන යන අවස්ථාවේදී එක් එක් සේවකයා විසින් කරනු ලබන කාර්යන් මැන සටහන් කිරීම සඳහා උපදෙස් ලබා දී ඇත. මීට අමතරව කර්මාන්ත ශාලා ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා කෝප් කමිටුව මගින් ලබා දී ඇති උපදෙස්	සේවක කාර්යක්ෂමතාව හා ඵලදායීතාව මැනීමටත්, ගෘහ භාණ්ඩ නිෂ්පාදනය සඳහා ගත වන සත්‍ය ශ්‍රම පැය මත ගෘහ භාණ්ඩ පිරිවැය ගණනය කිරීමටත් පසු විපරම් ක්‍රියාවලිය සඳහාත් සුදුසු ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.

				ක්‍රියාත්මක කිරීම ආරම්භ කර ඇති අතර එහිදී කර්මාන්ත ශාලා මානව සම්පත් විගණනයක් හා යන්ත්‍ර සූත්‍ර වැඩ කාලය පිළිබඳ කමිටුවක් මගින් වාර්තා ලැබීමට නියමිතව ඇත. අදාල වාර්තා ලැබීමෙන් පසු ISO තත්ව කළමණාකරණ පද්ධතියට ද අනුකූල ලෙස පසු විමපරම් කිරීම සඳහා ක්‍රම වේදයක් ඉදිරිපත් කිරීම සඳහා කටයුතු කරනු ලැබේ.	
(ග)	අම්පාර දැව ඉරුම්හලේ 2019 සිට 2022 වර්ෂය දක්වා කාලය තුළ පරිවර්තනය කිරීම සඳහා භාවිතයට ගෙන තිබුණු දැව ප්‍රමාණය සන ඩෙසිමීටර් 3,512,926 ක් වූ අතර නිමවුම ලෙස ලබා ගත් දැව ප්‍රමාණය සන ඩෙසිමීටර් 1,806,397 ක් වුයෙන් දැව පරිවර්තනය කිරීමේ දී සිදු වී ඇති අපතය සන ඩෙසිමීටර් 1,706,529 ක් හෙවත් සියයට 49 ක් විය. එම කාලය තුළ ඇතැම් කාර්යයන් සඳහා අවශ්‍යතාව ඉක්මවා සියයට 32 ක් වැඩියෙන් සන ඩෙසිමීටර් 454,496 ක දැව ප්‍රමාණයක් නිකුත් කර ඇති බවට ද, ඉරන ලද රු.295,712,614 ක් වටිනා සන ඩෙසිමීටර් 3,718,422 ක විශාල	2022	දැව පරිවර්තනයේ දී උපරීම දැව ඵලදාවක් ලබා ගත හැකි ශිල්පීය ක්‍රම හා සුදුසු දැව භාවිතා කර දැව අපතය වලක්වා ගැනීමට සහ නිෂ්පාදන කාර්යක්ෂමතා ව වැඩි කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය.	2023 සහ 2024.01.01 සිට 2024.09.30 දක්වා කාලය තුළ පිළිවෙලින් භාවිතයට ගත් දැව ප්‍රමාණය සන ඩෙසිමීටර් 531.01 ක් හා සන ඩෙසිමීටර් 177.21 ක් වූ අතර එහි නිමවුම සන ඩෙසිමීටර් 265.68 ක් හා සන ඩෙසිමීටර් 84.03 ක් විය. 2024.09.30 දිනට ඉරූ දැව තොගය සන ඩෙසිමීටර් 940.38 ක් වූ අතර එහි වටිනාකම රු.82,634,655 කි.	2023 හා 2024 වර්ෂ වලද දැව අපතය සියයට 50 ක් ඉක්මවා ගොස් ඇති බැවින් දැව පරිවර්තනයේ දී උපරීම දැව ඵලදාවක් ලබා ගත හැකි ශිල්පීය ක්‍රම හා සුදුසු දැව භාවිතා කර දැව අපතය වලක්වා ගැනීමට සහ නිෂ්පාදන කාර්යක්ෂමතාව වැඩි කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

	දැව තොගයක් කාර්යක්ෂමව භාවිතයට ගැනීමට සුදුසු වැඩපිළිවෙලක් නොතිබීමෙන් ගොඩගැසී ඇති බවට ද නිරීක්ෂණය විය.				
(ච)	2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2.2 මාර්ගෝපදේශය ප්‍රකාරව සීමිත ජාතික මිල කැඳවීමේ දී අවම වශයෙන් දින 21 ක ලංසු කාලයක් ලබා දිය යුතු වුවත්, කුරුණෑගල පොල්පිතිගම බීට්ටුවේ හෙක්ටයාර් 6 ක්වූ 01/008 C වැඩබිමෙහි තේක්ක ගස් 1720 ක් හෙළීම සම්බන්ධයෙන් අවස්ථා 03 කදී ලංසු කැඳවා අවස්ථා 02 දී නියමිත කාලයට වඩා අඩු ලංසුකාලයක් ලබා දී තිබුණු අතර පළමු ලංසු කැඳවීමේදී තෝරාගත් නමුත් ගිවිසුම්ගත නොවූ ලංසුකරුටම තෙවන ලංසු කැඳවීමේ දී ඒ වන විට ඉවත් කර තිබූ ගස් 290 ක් ද සමඟ සම්පූර්ණ ගස් ප්‍රමාණයම ඉවත් කිරීමට කොන්ත්‍රාත්තුව පිරිනැමීම මතභේදාත්මක කරුණක් බවට නිරීක්ෂණය කෙරේ.	2022	2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර ඇතිවිය හැකි අක්‍රමිකතා වලක්වා ගැනීමට ශක්තිමත් පාලන ක්‍රමයක් ස්ථාපිත කළ යුතුය.	මේ වන විටත් විමර්ශන කටයුතු වලට අදාළ ලිපිගොනු අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවේ රඳවාගෙන ඇත.	අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ විමර්ෂණයක් පැවතෙමින් තිබුණි.
(ජ)	අම්පාර ගෘහ භාණ්ඩ ප්‍රදර්ශනාගාරයේ ණයට විකුණුම් වලින් අයවිමට ඇති මුදල	2021	ණය යාවත්කාලීනව අයකර ගැනිමට	රාජ්‍ය දැව සංස්ථාව විසින් අම්පාර ගෘහභාණ්ඩ සංකීරණයෙන් සහ	2024 සැප්තැම්බර් 30 දිනට කහටගස්දිගිලිය

	රු.13,091,111 ක් වු අතර, ඉන් රු.7,767,938 ක් වර්ෂ 02 ක් ඉක්මවා තිබුණි. මෙම ණය මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.		කටයුතු කළ යුතු අතර, අය නොවන ණය අයකර ගැනිමට නිතීමය ක්‍රියාමාර්ග ගත යුතුය.	අනුරාධපුරය, මැදවච්චිය යන ගබඩාවලින් කහටගස්දිගිලිය අධිකරණ සංකීර්ණය සඳහා ණය පදනම මත සපයන ලද දැව සඳහා අයවිය යුතු රු.7,767,938 ක් වූ හිඟ මුදල, එම ආයතනය විසින් ඉරු දැව මිළදී ගැනීමට තැන්පත්කරන ලද රු. මි. 3.5 ක අත්තිකාරම් මුදලින් පියවාගැනීමට එකගතාවය පල කර ඇත. පහත ආයතන මගින් අයවිය යුතු මුදල් සියල්ල මේවන විට අයකරගෙන ඇත. Base Hospital – Batticaloa – Rs.1,250,782.00 Base Hospital – Badulla – Rs.1,335,319.00 High Court – Ampara – Rs.115,344.00	අධිකරණ සංකීර්ණයෙන් කපා හල යුතු රු.මි.3.5 ක මුදල කපා හැර නොතිබු බැවින් රු.10,389,666 ක් තවදුරටත් අය වීමට පැවතුණි.
(ට)	2018 වර්ෂයේ රොබ්ගිල් වැඩබිමේ යුකලිප්ටස් වර්ගයේ ගස් 2172 ක් පූර්ණ හෙලිමේදී සිදුව තිබු අක්‍රමිකතාව සම්බන්ධයෙන් විමර්ශනයක් සිදුකොට තිබුණ ද, එයට සම්බන්ධ නිලධාරීන්ට එරෙහිව විනය පරික්ෂණයක් සිදු කිරීමට කටයුතු කර නොතිබුණි.	2021	සංස්ථා විනය සංග්‍රහයේ “4 වන පරිච්ඡේදයේ” සඳහන් විනයානුකූල ක්‍රියා පරිපාටිය අනුව කටයුතු කළ යුතුය.	- විධිමත් විනය පරීක්ෂණ ක්‍රියාත්මක වෙමින් පවතී. (නව පරීක්ෂණ නිළධාරීන් දෙදෙනෙකුද පත්කර ඇත.) - එක් නිළධාරියෙකුට විරුද්ධව පැවති පරීක්ෂණ කටයුතු අවසන් කර ඇත. - අලාභ අයකිරීම්	විධිමත් විනය පරීක්ෂණයක් සිදු කරමින් පවතී.

සම්බන්ධව නීත්පති දෙපාර්තමේන්තුවේ උපදෙස් ප්‍රකාරව කොන්ත්‍රාත් කරුවන් සම්බන්ධයෙන් වෙන් වෙන් වශයෙන් ගොණු සකසා ඉදිරිපත් කර ඇත. මේ සම්බන්ධව පූර්ව නීති සාකච්චාවක් පවත්වා ඇත.

- මු.රෙ.104 යටතේ සංස්ථාවට සිදුවී ඇති අලාභ මුදල ගණනය කිරීම සඳහා අමාත්‍යාංශ නිළධාරියෙකුගෙන් සමන්විත මු.රෙ. කමිටුවක් පත් කර ඇත.

3.19 මධ්‍යම පරිසර අධිකාරිය

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	බදු පෙර ලාභය (අලාභය) රු.	මතය
2021	1,493,493,106	803,344,361	690,148,745	(22,121,759)	තත්ත්වාගණනය කළ
2022	1,406,894,206	793,054,950	613,839,256	(48,482,055)	තත්ත්වාගණනය කළ
2023	1,539,491,382	849,496,593	689,994,789	100,819,908	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	2016 අප්‍රේල් 25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 යටතේ හිමිකම් නොතිබුණු සහන දීමනාවක් අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් අනුව අධිකාරියේ විධායක නොවන නිලධාරීන් සඳහා 2019 අගෝස්තු සිට ගෙවමින් තිබෙන අතර 2023 වර්ෂය සඳහා පමණක් ගෙවන ලද එම දීමනාව රු.27,849,400 ක් විය.	2023	චක්‍රලේඛ මඟින් අනුමත වැටුප් හා දීමනාවලට අමතරව වෙනත් දීමනාවන් නොගෙවිය යුතුය.	අධිකාරියේ ඉපැයීම මඟින් මෙම දීමනාව ගෙවීම සිදු කිරීමත් මහා භාණ්ඩාගාරයෙන් මේ සඳහා ප්‍රතිපාදන ඉල්ලුම් නොකිරීමත් මත පදනම්ව ගමන් වියදම් යටතේ මේ සඳහා වාර්ෂිකව ප්‍රතිපාදන වෙන් කරනු ලබයි.	මෙම ගෙවීම අත්හිටුවීමකින් තොරව තවදුරටත් ගෙවනු ලබයි.
(ආ)	2023 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ගෙවිය යුතු දෑ රු.422,794,332 ක් තුළ නිරවුල් කිරීමට කටයුතු නොකළ වසර 05 ඉක්ම වූ රු.208,486,003 ක් ද, වසර 03 - 05 දක්වා වූ	2023	ගෙවිය යුතු ශේෂ කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.	මෙම ශේෂ තුළ ඇතුළත් EIA ව්‍යාපෘති යෝජකයින් විසින් ව්‍යාපෘති වාර්තා ලබාගැනීම සඳහා වූ තැන්පතු මුදලින් තවදුරටත් ක්‍රියාත්මක ව්‍යාපෘති සළකා බලා 2024 වර්ෂයේදී ගිණුම්වලට ගැලපීමට ද, විවිධ	2023 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් තුළ ඇතුළත් ශේෂ 2024 සැප්තැම්බර් 26 දක්වා නිරවුල් කර නොතිබුණි.

	රු.49,488,942 ක් ද, වසර 02 – 03 දක්වා වූ රු.33,518,659 ක් ද විය.			පාර්ශවයන්ගෙන් රඳවා ගත් ටෙන්ඩර් තැන්පතු, කාර්යසාධන බැඳුම්කර සහ විවිධ තැන්පතු පරිපාලන අංශය මගින් විමසීම් කර ගිණුම්වලින් ගැලපීමට ද නියමිතය.	
(ඇ)	ජාතික පාරිසරික පනත සහ 2008 පෙබරවාරි 01 දිනැති අංක 1534/18 දරන ගැසට් පත්‍රයට අනුව පාරිසරික ආරක්ෂණ බලපත්‍රය ලබා ගත යුතු වුවත් 2024 මැයි 21 දිනට උතුරුමැද, බස්නාහිර පළාත් කාර්යාලයන්හි හා මහනුවර හා මොණරාගල දිස්ත්‍රික් කාර්යාලයන්හි අධීක්ෂණයේ පවතින ව්‍යාපාර 272 ක් එලෙස බලපත්‍රයක් ලබා නොගෙන ව්‍යාපාර කටයුතු පවත්වා ගෙන යන බවට නිරීක්ෂණය වූ අතර ඒ තුළ ව්‍යාපාර කටයුතු ආරම්භ කර වසර 1 ½ ක සිට වසර 28 ක කාලයක් ඉක්ම වූ ව්‍යාපාරත්, ව්‍යාපාර කටයුතු ආරම්භ කළ වර්ෂය හඳුනා නොගත් ව්‍යාපාරත් පැවතීමෙන් අධිකාරිය විසින් අවශ්‍ය පියවරයන් කාලීනව ගෙන නොතිබීම නිරීක්ෂණය විය.	2023	පරිසර ආරක්ෂණ බලපත්‍ර නොලබා ව්‍යාපාර කටයුතු සිදුකරන ව්‍යාපාර සම්බන්ධයෙන් නීති ප්‍රකාරව කටයුතු කළ යුතුය.	මෙයින් බොහෝමයක් ව්‍යාපාර කටයුතු පරිසර ආරක්ෂණ ක්‍රියාවලියට ඇතුළත් කර පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා දීමේ ඉදිරි කටයුතු සිදුකරමින් පවතී.	බස්නාහිර පළාත් කාර්යාලයෙහි අධීක්ෂණයේ පවතින ව්‍යාපාර 11 න් 6 ක් මේ වන විට පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගෙන ඇත. 01 ක නඩු විභාග වෙමින් පවතී. 02කට බලපත්‍ර නිකුත් කිරීම ප්‍රතික්ෂේප කර ඇති අතර 02ක ක්ෂේත්‍ර පරීක්ෂණ කටයුතු සිදු කිරීමට නියමිතය. උතුරුමැද පළාත් කාර්යාලයන්හි සහ මහනුවර හා මොණරාගල දිස්ත්‍රික් කාර්යාලයන්හි අධීක්ෂණයේ පවතින ව්‍යාපාර වල බලපත්‍ර ලබා ගැනීමේ ප්‍රගතිය ලබා ගනිමින් පවතී.

(ඈ)	වලංගු කාලසීමාව ඉක්මවීමට මාස 03 කට පෙර ඉල්ලුම් කර පාරිසරික ආරක්ෂණ බලපත්‍රය අලුත් කර ගත යුතු නමුත්, මාතලේ, දඹුල්ල, කොළඹ, මහනුවර, මොණරාගල සහ අනුරාධපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වලට අයත් ව්‍යාපාර 396 ක් 2024 මැයි 20 වන විටත් බලපත්‍ර අලුත්කර නොතිබුණි. තවද, ව්‍යාපාර 10 ක් බලපත්‍ර අලුත්කර නොගෙන මාස 03 ක සිට අවුරුදු 02 ක් දක්වා දිගු කාලයක් ව්‍යාපාර කටයුතු ඉටු කර පසුව බලපත්‍ර අලුත්කර තිබුණි.	2023	පාරිසරික ආරක්ෂණ බලපත්‍ර අඛණ්ඩව අළුත් කර ගැනීමට අවශ්‍ය නියාමනය සිදු කළ යුතුය.	කාර්යාලීය දත්ත පද්ධතිය භාරව සිටින නිළධාරියාට, සෑම මසකම අවසාන සතියේ ඉදිරි මාස 03 ක් ඇතුළත කල් ඉකුත්වන කර්මාන්ත ලේඛනය සියළුම නිළධාරින් වෙත යොමු කිරීම සඳහා උපදෙස් ලබා දී ඇත. ඒ අනුව, EPL දත්ත පද්ධතිය හරහා තොරතුරු යාවත්කාලීන කර නියමිත කාල සීමාව තුළදී අදාළ සිහිකැඳවීම් සිදු කරන අතරම දුරකථන මාර්ගය ඔස්සේ ද කර්මාන්තකරුවන් දැනුවත් කිරීමට කටයුතු කරනු ලබයි.	2024 සැප්තැම්බර් 26 දින වන විටත් මේ සම්බන්ධයෙන් පරීක්ෂාකර නොතිබුණි.
(ඉ)	පාරිසරික ආරක්ෂණ බලපත්‍රයේ සඳහන් කොන්දේසි හා නියමයන්ට අනුකූලව කටයුතු කර නොතිබූ මාතලේ සහ දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ දෙකට අයත් කළුගල් ඩොලමයිට් කැනීම් කර්මාන්ත 10 ක්, අප ජලය ජල මූලාශ්‍ර වෙත මුදාහරිනු ලබන කර්මාන්ත 03 ක්, අපද්‍රව්‍ය ප්‍රතිකර්මයකින් තොරව බාහිර පරිසරයට මුදාහැර තිබූ කර්මාන්ත 02 ක්, නියමිත ප්‍රමිති හා උපමානවලට	2023	බලපත්‍රයේ සඳහන් කොන්දේසි හා නියමයන්ට අනුකූලව කටයුතු සිදු නොකරන කර්මාන්ත සම්බන්ධයෙන් නීති ප්‍රකාරව අවශ්‍ය ක්‍රියාමාර්ග කාලීනව ගත යුතුය.	පරිසර දූෂකාරක පාලනයට ප්‍රමාණවත් කාලසීමාවන් තුළ කටයුතු නොකරන ලද අවස්ථාවලදී ක්‍රියාත්මක විය යුතු ආකාරය හා පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ක්‍රමවේදය කාර්යක්ෂමව පවත්වාගෙන යාම සඳහා නිලධාරීන් දැනුවත් කරන ලද අතර අවශ්‍ය පරිදි සිහිකැඳවීම් කර කර්මාන්තකරුවන්ගේ ප්‍රතිචාර මත නීතිමය ක්‍රියාමාර්ග ගත යුතු කර්මාන්ත සම්බන්ධයෙන් කඩිනමින් කටයුතු	2024 සැප්තැම්බර් 26 දිනට මෙම කර්මාන්ත සම්බන්ධයෙන් පරීක්ෂාකර නොතිබුණි.

	අනුකූලව කටයුතු කර නොතිබුණු කොළඹ දිස්ත්‍රික්කයේ කර්මාන්ත 07 ක් සහ විශ්ලේෂණ වාර්තා, කැණීම් බලපත්‍ර වැනි පූර්වයෙන් ඉදිරිපත් කළ යුතු වාර්තා නියමිත පරිදි ඉදිරිපත් කර නොතිබූ කර්මාන්ත 25 ක් කොන්දේසි හා නියමයන් කඩකිරීම සම්බන්ධව අධිකාරිය විසින් අවශ්‍ය පියවරයන් ගෙන නොතිබුණි.			කරනු ලැබේ.	
(ඊ)	මුදල් රෙගුලාසි 756 (6) ප්‍රකාරව 2022 සහ 2023 වර්ෂයන්ට අදාළව ඉදිරිපත් කළ යුතු භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2023 සැප්තැම්බර් 30 වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	2023 2022	මුදල් රෙගුලාසි ප්‍රකාරව නියමිත දිනයට භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කර ඉන්වෙන්ට්‍රි භාණ්ඩ සම්බන්ධ නිසි අභ්‍යන්තර පාලනයක් ඇති කළ යුතුය.	භාණ්ඩ සමීක්ෂණ කටයුතු නියමිත දිනයට අවසන් කිරීමට සේවක සංඛ්‍යාවෙහි පවතින ඌණතාවය සෘජුව බලපා ඇත.	2024 ඔක්තෝබර් 03 දිනට 2022 වර්ෂයට අදාළව භාණ්ඩ සමීක්ෂණ වාර්තාව විගණනයට ඉදිරිපත් කර නොතිබුණු අතර 2023 වර්ෂයට අදාළව භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කර නොතිබුණි.
(උ)	අධිකාරිය විසින් භාණ්ඩාගාර ප්‍රතිපාදන ලබාගෙන තිබිය දී 2022 දෙසැම්බර් 21 දිනැති අංක PED 08/2022 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ විධි විධානවලට පටහැනිව 2022 සහ 2023 වර්ෂයන් හි ඉතිරි	2023	චක්‍රලේඛ ප්‍රතිපාදන අනුව හිමිකම් නොමැති ගෙවීම් නැවත අයකළ යුතුය.	නිලධාරීන්ට ඉතිරි වෛද්‍ය නිවාඩු සඳහා ගෙවීම් කර ඇත්තේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2013 ජනවාරි 16 දිනැතිව ලබාදී ඇති විශේෂ අනුමැතිය මතවේ. අධිකාරියේ ඉපයීම් වලින්, ඉතිරි	විගණන විමසුම් නිකුත් කර තිබියදී PED 08/2022 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ ප්‍රතිපාදන අනුව හිමිකම් නොමැති මෙම ගෙවීම්

	කරගත් නිවාඩු සඳහා රු.65,290,690 ක දීමනා ගෙවා තිබුණි.			වෛද්‍ය නිවාඩු උපරිම දින 21 කට යටත්ව මෙය ගෙවා ඇත.	අඛණ්ඩව සිදු කර තිබුණි.
(ඍ)	අධිකාරිය විසින් 2016 දෙසැම්බර් 21 දිනැතිව පෞද්ගලික සමාගමක් සමඟ එළඹී තිබූ අවබෝධතා ගිවිසුම ප්‍රකාරව පාරිසරික සහ සමාජ ව්‍යාපෘති සඳහා වසර 03 ක කාලයකට රු.මිලියන 150 ක ප්‍රාග්ධන ප්‍රදානයක් අදියර 03 ක ව්‍යාපෘතියක් ලෙස ලබා දීමට ඇතිකර ගත් එකඟතාවය අනුව පළමු අදියරේ ව්‍යාපෘතිය වෙනුවෙන් 2018 වර්ෂයේදී වත්කම් හා නඩත්තු වැය ලෙස රු.මිලියන 50 ක් ලබාදී තිබුණු අතර 2019 දෙසැම්බර් 20 දිනෙන් අවසන් වූ ගිවිසුම් කාලය දීර්ඝ කර ගැනීමට අධිකාරිය කටයුතු නොකිරීම හේතුවෙන් ලබාගත හැකිව තිබූ ඉතිරි රු.මිලියන 100 ක මුදල අහිමි වී තිබුණි.	2023	නව ගිවිසුම අත්සන් කර එකඟ වූ පරිදි සියලු ප්‍රතිපාදන ලබාගෙන අදාළ ව්‍යාපෘති සාර්ථකව ක්‍රියාත්මක කළ යුතුය.	මෙම අවබෝධතා ගිවිසුම දීර්ඝ කර ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහිතව, 2023 ජූනි 13 දිනැතිව අධිකාරිය වෙත එවා ඇත. කෙසේ වුවද, රුපියල් මිලියන 100 ක ඉතිරි ප්‍රතිපාදනයෙන් ජල තත්ත්ව කළමනාකරණය සහ පසුවිපරම් ක්‍රියාවලීන් යටතේ වන වෙනත් අත්‍යාවශ්‍ය ව්‍යාපෘති සඳහා යෙදවීමේ අවශ්‍යතාවයක් යෝජනා වීමෙන් අදාළ අවබෝධතා ගිවිසුම නැවත සකස් කර අවශ්‍ය ව්‍යාපෘති ඇතුළත් නව ගිවිසුම සඳහා ඉදිරි කටයුතු ක්‍රියාත්මක වීම් සිදුවේ.	2024 සැප්තැම්බර් 26 දින දක්වා නව ගිවිසුම අත්සන් කිරීමට කටයුතු කර නොතිබුණි.
(එ)	මානව සම්පත් තොරතුරු පද්ධතියක් මාස 03 ක් තුළදී ස්ථාපිත කිරීම සඳහා 2018 දෙසැම්බර් 27 දින රු.1,845,000 කට පෞද්ගලික ආයතනයක් සමඟ ඇතිකර ගත් ගිවිසුම අනුව රු.369,000 ක අත්තිකාරම් මුදලක්	2023	බැංකු ඇපකරය හා කාර්ය සාධන සුරක්ෂණය අළුත් කර අවශ්‍යතාවය පරිදි පද්ධතිය ස්ථාපිත කිරීමට අවශ්‍ය කටයුතු කළ යුතුය.	මධ්‍යම පරිසර අධිකාරියට ගැලපෙන අයුරින් මොඩියුල සකසා ගැනීමට හා පසුගිය වසංගත කාලය තුළ දත්ත ඇතුළත් කිරීමේ යම් ප්‍රමාදයන් හේතුවෙන් සැපයුම්කරු හා අධිකාරිය අතර ඇති වූ එකඟතාවය මත අදාළ	බැංකු ඇපකරය හා කාර්ය සාධන සුරක්ෂණය අළුත් කර හෝ පද්ධතිය ස්ථාපිත කර හෝ නොතිබුණි.

	ලබාදී 2023 වර්ෂය වන විට වසර 05 ක් ඉක්මවා ගොස් තිබුණ ද, අදාළ පද්ධතිය ස්ථාපිත කර නොතිබුණු අතර ඊට අදාළ බැංකු ඇපකරය හා කාර්ය සාධන සුරක්ෂණය ද කල් ඉකුත් වී තිබුණි. ඊට අදාළ රු.184,500 ක ප්‍රමාද ගාස්තුව අය කර ගැනීමට ද කටයුතු කර නොතිබුණි.			කටයුතු සිදු වූ නිසා ප්‍රමාද ගාස්තු අය කර නොමැත. මෙම පද්ධතියේ පවතින ගැටළු සහගත තත්වයන් හේතුවෙන් සැපයුම්කරු වෙත ගිවිසුමේ ප්‍රකාරව කටයුතු කර මෙම පද්ධතිය තවදුරටත් ඉදිරියට පවත්වාගෙන යන්නේද යන්න තීරණය කිරීමට නියමිතය.	
(ඒ)	පරිසර ආරක්ෂණ බලපත්‍ර සම්බන්ධ ක්‍රියාවලි හා ක්ෂේත්‍ර පරීක්ෂණ කටයුතු සඳහා ජනාධිපති ලේකම් කාර්යාලය විසින් ලබා දී තිබූ වාහනයක් එම අරමුණුවලින් බැහැරව සභාපති කාර්යාලයට අනුයුක්ත කර 2021 හා 2022 වර්ෂයන්හි රු.105,165 ක් වැය කර ඉන්ධන ලීටර් 533.80 ක් යොදා කිලෝ මීටර් 2,669 ක දුරක් ධාවනය කර තිබුණු අතර තවත් රු.719,321 ක් වැය කර ඉන්ධන ලීටර් 4004.38 ක් මිලදී ගෙන සිදු කළ ධාවන කටයුතු රාජකාරී කටයුතු සඳහා බවට සනාථ නොකරන ලදී.	2022	එම වාහනය ලබාදුන් අරමුණු සඳහා භාවිතා කිරීමට හැකිවන ආකාරයට අදාළ නිලධාරීන් වෙත අනුයුක්ත කළ යුතුය.	ඉන්ධන ලීටර් 4538 ක් සඳහා ගෙවා තිබූ රු.824,486 ක මුදල ගෙවන ලෙස දන්වමින් 2024 මාර්තු 06 දිනැති ව අදාළ සභාපතිවරයාට ලිපියක් නිකුත් කර ඇත.	2024 සැප්තැම්බර් 30 වන විටත් සභාපතිවරයා විසින් ගෙවීම් සිදුකර නැත.
(ඔ)	සුරකිමු ගංගා වැඩසටහනේ අරමුණුවලට අනුකූල නොවන ආකාරයට	2022 2021	වැඩසටහන් අරමුණුවලට අනුකූල ලෙස අරමුදල්	මෙම කටයුත්ත සුරකිමු ගංගා වැඩසටහනෙහි අරමුණු සමග බැඳී	වැඩසටහනේ අරමුණුවලට අනුකූල ලෙස අරමුදල්

	එම ප්‍රතිපාදනවලින් රු.2,030,000 ක් වැය කර Electric cart රථයක් මිලදී ගෙන කතරගම පූජා භූමියේ පරිහරණය සඳහා යොදවා තිබුණි.		උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය.	ඇති බවට නිවැරදි නොවන අදහස් දැක්වීමක් සිදුකර ඇත.	උපයෝජනය කර නොතිබුණි.
(ඕ)	කසළ මගින් විදුලිය නිපදවීමේ ව්‍යාපෘතියකට අදාළ කොන්ත්‍රාත්තුව සඳහා කාර්යසාධන සුරක්ෂණයක් ද ලබා නොගෙන 2014 අගෝස්තු 08 දින ගිවිසුමකට එළැඹ තිබුණු නමුත් ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබුණු අතර ඒ සඳහා වැය කළ රු.64,356,400 ක මුදල ද, 2009 වර්ෂයේදී පිළිසරු ව්‍යාපෘතිය මගින් කොම්පෝස්ට් අංගනය ඉදිකිරීම සඳහා වැය කළ රු. 13,071,372 ක මුදල ද, කසළ භාවිතා කරමින් විදුලිය නිපදවීම සඳහා මිලදී ගත් යන්ත්‍ර සූත්‍ර ද නිෂ්කාර්ය වී තිබිණි.	2022	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූලව කටයුතු කර නිසි අධිකාරී බලය සහිත අනුමැතිය මත ගෙවීම් සිදු කළ යුතු අතර පූර්ව අනුමැතිය ලබා නොගෙන කටයුතු කළ නිලධාරින් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.	මේ සඳහා ගත යුතු නීතිමය ක්‍රියාමාර්ගය සම්බන්ධයෙන් නීතිපති උපදෙස් ඉල්ලා ඇත.	මේ දක්වා ව්‍යාපෘතිය ක්‍රියාත්මක තත්ත්වයට පත්ව නැත.
(ක)	සුරකිමු ගංගා ජාතික පාරිසරික වැඩසටහන සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියෙන් පත්කර තිබු වැඩසටහන් කළමනාකරුවෙකු වෙත 2021 අප්‍රේල් මස සිට දෙසැම්බර් දක්වා මාසික වැටුප හා	2021	ගෙවීම් සිදුකිරීමට ප්‍රථම අනුමැතිය ලබාගත යුතුය.	මෙම දීමනාව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත ගෙවන ලද අතර ඒ සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශයක් 2021 සැප්තැම්බර් 27 දින යොමු කර ඇත. එම සංදේශයේ සංශෝධන කිහිපයක් අමාත්‍යාංශයෙන් දැනුම්	අනුමැතියෙන් තොරව ගෙවා ඇති දීමනාව 2024 සැප්තැම්බර් 30 වන විටත් අය කර නොතිබුණි.

ඉන්ධන දීමනාව වශයෙන් මසකට රු.170,000 බැගින් ගෙවීම් කර තිබුණු අතර මේ සඳහා අනුමැතියක් ලබාගෙන නොතිබුණි.		දුන් අතර සංශෝධිත අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව 2021 දෙසැම්බර් 20 අමාත්‍යාංශය වෙත යොමු කර ඇත.

3.20 ශ්‍රී ලංකා පරිසර වෘත්තීයවේදීන්ගේ ආයතනය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	6,370,577	231,759	6,138,818	1,868,944	තත්ත්වාගණනය කළ
2022	7,005,768	514,128	6,491,640	352,822	තත්ත්වාගණනය කළ
2023	7,774,757	214,196	7,560,561	1,068,921	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	2021, 2022 සහ 2023 වර්ෂයන් සඳහා ආදායම් බදු වගකීම ගණනය කර ගෙවීමට කටයුතු කර නොතිබුණි.	2023 2021	බදු ලියාපදිංචිය ලබාගෙන වාර්ෂිකව ආදායම් බදු ගෙවීමට කටයුතු කළ යුතුය.	ගෙවිය යුතු බදු 2020 වර්ෂයේදී හඳුනාගෙන ඇත. නමුත් ආයතනය විසින් බදු ලියාපදිංචි කිරීමක් ලබාගෙන නොමැත.	ආයතනය බදු ලියාපදිංචි කිරීමක් මේ දක්වා ලබාගෙන නොමැත.
(ආ)	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41 (1) වගන්තිය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටුවක් පිහිටුවා නොතිබුණි.	2022	විගණන හා කළමනාකරණ කමිටුව පිහිටුවීමට කටයුතු කළ යුතුය.	විගණන හා කළමනාකරණ කමිටුවක් පිහිටුවා ක්‍රියාත්මක කිරීම පිළිබඳව 2024 වර්ෂයේදී කටයුතු කෙරේ.	විගණන හා කළමනාකරණ කමිටුව පිහිටුවීමට මේ දක්වා කටයුතු කර නොමැත.
(ඇ)	PE/COP/POLI/Circular හා 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2021 මගින් හඳුන්වාදුන් දී ඇති මෙහෙයුම් අත්පොතෙහි 6.6 වගන්තිය අනුව මූල්‍ය වර්ෂය අවසාන වී මාස 05ක් ඇතුළත පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වාර්ෂික වාර්තාවන් සභාගත කර නොතිබුණි.	2023 2022	වාර්ෂික වාර්තාව නියමිත දිනට පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කළ යුතුය.	මේ පිළිබඳව ආයතනයේ අවධානය යොමුකර අදාළ පියවර ගැනීමට කටයුතු කරමි.	වාර්ෂික වාර්තාවන් පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට මේ දක්වා කටයුතු කර නොමැත.

3.21 සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	345,072,686	201,845,713	143,226,973	(98,304,624)	තත්ත්වාගණනය කළ
2022	551,038,483	175,570,922	375,467,561	209,250,751	තත්ත්වාගණනය කළ
2023	602,874,134	144,548,041	458,326,093	87,501,471	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණ	වාර්තා වේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාව දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්වය
1.	අපද්‍රව්‍ය සේවා ප්‍රතිග්‍රහන පහසුකම් සඳහා වරායන් තුළ සේවා නියුක්ත කර ඇති නිලධාරීන් සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා නොගෙන දිනකට රු.750 ක් බැගින් 2017 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා එකතුව රු.1,951,550 ක දීමනාවක් ගෙවා තිබුණි. මෙම ගෙවීමට අදාළව මූලික විමර්ෂණයක් සිදු කරන ලෙස 2021 දෙසැම්බර් 28 දින පැවති විගණන හා කළමනාකරණ කමිටුව විසින් නිර්දේශ කර තිබුණ ද 2023 පෙබරවාරි 14 දින දක්වාම එවැනි විමර්ෂණයක් සිදුකර වගකිවයුතු පුද්ගලයින්ගෙන් අයකර ගැනීමට කටයුතු කර	2021 & 2022	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීමටත්, අනුමැතිය නොමැති ගෙවීම සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමටත් කටයුතු කළ යුතුය.	මේ පිළිබඳව විමර්ශනයක් සිදු කිරීම සඳහා අමාත්‍යාංශයේ ලේකම්ගෙන් ඉල්ලා ඇත. ඒ අනුව විමර්ශන කමිටුවක් පත් කර විමර්ශනය සිදු කර ඇත. එහෙත් මේ දක්වා අදාල විමර්ශන කමිටු තීරණය මෙම අධිකාරිය වෙත ලැබී නොමැත.	මේ සම්බන්ධයෙන් සිදුකර ඇති විමර්ෂණයේ තීරණ ලැබී නොමැති අතර ගෙවීම් සඳහා අනුමැතිය ලබා ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි.

	නොතිබුණි.				
2.	MV X Press Perl නෞකා අනතුරට අදාළව රැස් කරන ලද අපද්‍රව්‍ය ගබඩා කිරීම සඳහා වත්තල තාවකාලික අංගනයේ සිට පමුණුගම ගබඩා අංගනය වෙත ප්‍රවාහනය කිරීමට ප්‍රමාද වීම හේතුවෙන් කන්ටේනර් 40 ක් සඳහා රැඳවුම් ගාස්තු ලෙස රු.17,934,000 ක මුදලක් වැඩිපුර ගෙවීමට සිදු වී තිබුණි.	2021 & 2022	ප්‍රමාදයන් අවම වන පරිදි කටයුතු කළ යුතු අතර රක්ෂණ සමාගමෙන් සියළුම මුදල් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කළ යුතුය.	X Press Pearl නෞකාවේ අනතුරු හේතුවෙන් එකතු කරන ලද අපද්‍රව්‍ය කන්ටේනර් වල ගබඩා කර තබා පමුණුගම අපද්‍රව්‍ය අංගනය වෙත රැගෙන යාම ප්‍රමාද වූයේ අධිකාරියේ වරදින් නොවන අතර ඒ සඳහා ITOPF ආයතනයේ අනුමැතිය ලැබුනු වහාම ප්‍රවාහනය කිරීම සිදු කර ඇත. ඒ සඳහා වැය වූ සියලු මුදල් අයකර ගැනීමට කටයුතු කරගෙන යනු ලැබේ.	දැනට ගෙවා ඇති මුදල අය කර ගැනීම සඳහා රක්ෂණ ආයතනය සමඟ අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.
3.	ආහාර පාර්සල් වශයෙන් ලබාගැනීම සඳහා මිල ගණන් ලබාගත් නමුත් ආහාර වර්ග වෙන වෙනම මිලදී ගෙන තිබීමෙන් එම වියදම අරපිරිමැසුම්දායී බවට සනාථ කළ නොහැකි විය. තවද, ගෙවීම් වවුචර් 61 කින් ආහාර පාන මිලදී ගැනීම හා නවාතැන් ගාස්තු සඳහා රු.23,154,710 ක් ගෙවීමට අදාළව නිකුත් කර තිබූ බිල්පත්වල අනුක්‍රමික අංක නොවෙනස්ව අනුපිළිවෙලටම තිබීම හා අධිකාරියේ නම සඳහන් කර නොතිබීමත්, බිල්පත්වල සඳහන් සැපයුම්කරුගේ	2022	මිල ගණන් ලබාගත් ආකාරයට මිලදී ගැනීම් සිදුවිය යුතු අතර අධිකාරියේ නමට නිකුත් කර ඇති බිල්පත් සඳහා තෝරාගත් සැපයුම්කරුට විනිවිදභාවයකින් යුක්තව ගෙවීම් කිරීම් සම්බන්ධයෙන් නිලධාරින් වගකීමට බැඳී සිටිය යුතුය.	සියලුම නිලධාරින්ට ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුව පමණක් කටයුතු කරන ලෙසට දැනුම් දී ඇත.	ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්පූර්ණ ලෙස ක්‍රියාවේ යෙදවීමට උපදෙස් ලබාදී ඇත.

	නම වෙනුවට වෙනත් නම්වලින් චෙක්පත් ලියා තිබීමත් හේතුවෙන් මෙම ගෙවීම්වල නිවැරදිතාවය සනාථ කළ නොහැකි විය. මෙම මතභේදාත්මක කරුණු කෙරෙහි වගකිව යුතු නිලධාරීන්ගේ අවධානය ද යොමු වී නොතිබුණි.				
4.	MV X Press Pearl නෞකා අනතුරින් එකතුකළ අපද්‍රව්‍ය ගබඩා කිරීම සඳහා 2021 වර්ෂයේ අවස්ථා දෙකක දී ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූල නොවන ලෙස සැපයුම්කරු තෝරාගෙන පැයකට රු.1400 ක් හා 1500 ක් බැගින් ගෙවමින් කුලියටගත් forklift යන්ත්‍රයේ ගිවිසුම් කාලය මාස 07 ක් ඉතිරිව තිබිය දී නැවත 2022 මැයි මාසයේ දී මිල ගණන් කැඳවා එම සැපයුම්කරුගෙන්ම පැයකට රු.2900 ක් බැගින් වන මිල ගණන් එම යන්ත්‍රය ස්ථාපිත කර ඇති වත්තල ගබඩාව හරහා ලබාගෙන ලංසු වසා දින 03 කට පසුව විවෘත කර කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම මතභේදයට තුඩු දෙන කරුණක් බවට නිරීක්ෂණය විය. මෙම යන්ත්‍රය සඳහා 2022 වර්ෂයට අදාළව ගෙවා තිබුණු කුලිය රු.2,433,800 ක් වූ අතර	2022	අවශ්‍යතාවය හඳුනාගනිමින් ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමට කටයුතු කළ යුතුය.	අවශ්‍යතාව අනුව ප්‍රසම්පාදනය සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.	ප්‍රසම්පාදන ක්‍රියාවලිය නිවැරදිව සිදු කිරීමටත් අවශ්‍යතාවය හඳුනාගෙන වත්කම් මිලදී ගැනීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

	අධිකාරියට දීර්ඝකාලීනව එම යන්ත්‍රයක අවශ්‍යතාවය සලකා බලා නව යන්ත්‍රයක් මිලදී ගැනීම කෙරෙහි අවධානය යොමු වී නොතිබීමෙන් වාර්ෂිකව විශාල පිරිවැයක් දැරීමට සිදු වී තිබුණි.				
5.	MV X Press Pearl නෞකා අනතුර හේතුවෙන් රැස්කළ අපද්‍රව්‍ය ගබඩා කිරීම සඳහා ඇස්තමේන්තු සකස් නොකර වෙළඳපොළ මිල සැදහුම් ක්‍රමය අනුගමනය කර තාක්ෂණික ඇගයීමකින් ද තොරව වර්ග අඩි 25,000 ක අවශ්‍යතාවය වෙනුවට වර්ග අඩි 48,765 ක විශාලත්වයෙන් යුතු ගබඩාවක් තෝරාගෙන 2021 ජූනි මාසයේ සිට මුල් මාස 06 ට මාසයකට රු.1,706,775 ක් ද, දෙවන මාස 06 ට ඊට වඩා සියයට 40 ක් වැඩියෙන් මාසයකට රු.2,400,000 ක් ද වශයෙන් ගාස්තු වැඩිකර ගෙවීම් සිදු කර තිබුණි. මෙම ගබඩාව සඳහා රජයේ මාසික තක්සේරුව රු.1,800,000 ක් වීමෙන් දෙවන මාස 06 ක කාලය සඳහා රු.3,600,000 ක් වැඩිපුර ගෙවා තිබුණු අතර වර්ග අඩි 30,000 ක් සඳහා මාසිකව රු.1,755,000	2022	අවශ්‍යතාවය අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමට කටයුතු කළ යුතුය.	අදාල නෞකා අනතුර සිදු වූ කාල සීමාව කොවිඩ් ව්‍යාප්තිය පැවැති කාලයක් වූ අතර සාමාන්‍ය පරිදි කටයුතු සිදු කල නොහැකි කාලසීමාවක් හා ඉක්මනින් කටයුතු කල යුතු නිසා වෙළඳපොල සැපයුම් ක්‍රමය අනුව අපද්‍රව්‍ය ගබඩා අංගනයන් ලබා ගන්නා ලදී. එයට පසු මේ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතියක් ලබා ගෙන ඇත.	අපද්‍රව්‍ය අංගනයන් සඳහා වන සියලු ගෙවීම් නෞකා හිමියන්ගෙන් ලබා ගැනීමට කටයුතු කරමින් පවතී.

	ක් වූ ලංසුව ප්‍රතික්ෂේප කිරීමෙන් රු.3,580,650 ක පාඩුවක් සිදුව ඇති බවට ද නිරීක්ෂණය විය. තවද, මෙම කාර්යය සඳහා ගබඩාවක් වසරක කාලයකට කුලියට ගැනීමට ලබාදී තිබූ අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2022 දෙසැම්බර් 14 දිනෙන් අවසන්ව තිබුණ ද, මෙම ගබඩාවේ ඉදිරි අවශ්‍යතාවය, 2022 සැප්තැම්බර් 06 දිනෙන් පසුව කුලිය ප්‍රතිපූර්ණය නොකිරීමට නෞකා සමාගම තීරණය කර තිබීම යනාදී කරුණු කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි.				
6.	අධිකාරිය සතු මෝටර් රථයක් 2021 ජූනි 23 දින ජපානයේ භාවිතා කරන ලද ගියර් පෙට්ටියක් යොදා රු.381,450 ක වියදමකින් අලුත්වැඩියා කළ නමුත් ගියර් පෙට්ටියේ දෝෂයක් මත ධාවනය කිරීමට නොහැකි වී තිබුණි. මෙම අලුත්වැඩියාව තාක්ෂණික නිලධාරියකු විසින් සහතික කර නොතිබුණු අතර පැරණි ගියර් පෙට්ටිය ද ගබඩාව වෙත භාර දී නොතිබුණි. මෙම අලුත්වැඩියාවෙන් පසු මෝටර් රථය සඳහා කි.මී 30,000 ක වගකීම් කාලයක් ලබා දී තිබුණ ද, මෝටර් රථය එම ආයතනය වෙත භාර දී	2022	මෙම අලුත්වැඩියාව සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදුකර වාහනය යථා තත්ත්වයට පත්කිරීමටත්, වාහනය කුලියට ගැනීමේ අවශ්‍යතාවය සලකා බැලීමටත් කටයුතු කළ යුතු අතර බැහැරවීම් වලදී වගකිවයුතු නිලධාරීන්ට සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගත යුතුය.	විමර්ශන වාර්තාව ලද පසු වරදක් සිදු කර ඇත්නම් ඒ අනුව වරද නිවරදි කිරීම හා අදාල අයගෙන් එම මුදල අය කර ගැනීමට කටයුතු කරනු ඇත	එක් විමර්ශනයක් සිදු කර ඇති අතර AMC නිර්දේශය අනුව තවත් විමර්ශන කමිටුවක් පත් කර විමර්ශනයක් සිදු කරමින් පවතී.

	නිසි පරිදි අලුත්වැඩියා කර ගැනීමට කටයුතු නොකර 2021 ජූනි 21 දින සිට කුලී පදනම මත මෝටර් රථයක් ලබාගෙන ඒ සඳහා 2023 මාර්තු 12 දින දක්වා රු.3,741,685 ක මුදලක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන ඔවුන්ට එරෙහි කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි.				
7.	2023 පෙබරවාරි 27 දිනැති අංක අමප/23/0386/605/ 012-1 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව අධිකාරියේ සාමාන්‍යාධිකාරී තනතුර බාහිර පදනමින් ද, අනෙකුත් අංශවල කළමනාකරණ තනතුරු 05 ක් සඳහා අභ්‍යන්තර පදනමින් ද පුරප්පාඩු පිරවීමටත්, එසේ නොහැකි වන්නේ නම් අමාත්‍ය මණ්ඩල සටහනක් මඟින් අපේක්ෂිත සංශෝධන සිදුකර ගැනීමටත් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් දන්වා එවා තිබුණු නමුත් එලෙස කටයුතු නොකර නීති කළමනාකරු ඇතුළු කළමනාකරණ තනතුරු 04 ක් බාහිර පදනම මතත්, සාමාන්‍යාධිකාරී තනතුර වසර 2 1/2 ක කාලයක් වැඩ බැලීමේ	2023	අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව කටයුතු කළ යුතුය.	සාමාන්‍යාධිකාරි හා අනෙකුත් තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කර ඇත්තේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව තනතුරු 44 ක් බඳවා ගැනීම සඳහා 2024.02.12 වන දින ලබා දී ඇති අනුමැතිය අනුව වේ. බඳවා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය අවශ්‍ය වී ඇත්තේ වෙනම කමිටුවක් පත් කර ඇති කාලය සඳහා පමණක් වේ.	අංක DMS/1627/Vol-iv දරන හා 2023.11.01 දින හා 2024.02.12 දිනැති කළමණාකරන සේවා දෙපාර්තමේන්තු වේ ලිපි ප්‍රකාරව බාහිර පදනමෙන් බඳවා නොගෙන අභ්‍යන්තර පදනමෙන් පත්වූ සාමාන්‍යාධිකාරීව රයා තවදුරටත් සේවයේ යොදවා තිබුණි.

	පත්වීමක් දැරූ නිලධාරියා වෙත අභ්‍යන්තර පදනම මතත් 2024 අප්‍රේල් 03 දින සිට ස්ථිර පත්වීම් ලබාදී තිබුණි.				
8.	2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනතේ 17 (7) වගන්තිය ප්‍රකාරව සමුද්‍ර දූෂණ වැළැක්වීම සහ කළමනාකරණය කිරීම සම්බන්ධව අධිකාරිය අවශය යයි සලකනු ලබන විශේෂඥ දැනුම ඇති බාහිර පාර්ශවයකගේ දැනුම ලබා ගත හැකි වුවද, එසේ විශේෂඥ සහය ලබාගෙන නොතිබීමෙන් අන්තර්ජාතික වශයෙන් පවතින නිර්ණායක පරිදි මෙම කාර්ය දීර්ඝ කාලීනව කිරීමේ ඇති පාරිසරික වැදගත්කම, වෙරළ තීරයේ ස්ථායීතාවයට වන බලපෑම හා තවදුරටත් මෙම කාර්ය කොපමණ කාලයක් කළ යුතුද යන්න පිළිබදව තීරණයක් ගැනීමෙන් තොරව, රක්ෂණ සමාගමේ අභිමතය ද ලබා නොගෙන වෙරළේ ප්ලාස්ටික් පබලු ඇහිදීම අඛණ්ඩව සිදුකරගෙන යමින් තිබුණි. තවද, 2021 ඔක්තෝබර් සිට 2023 දෙසැම්බර් 31 දක්වා ප්‍රජා දායකත්වයෙන් දිස්ත්‍රික්ක 4 ක වෙරළ කලාප වල ප්ලාස්ටික්	2023	අධිකාරිය අවශය යයි සලකනු ලබන විශේෂඥ දැනුම ඇති බාහිර පාර්ශවයකගේ දැනුම ලබා ගෙන මෙම කාර්ය දීර්ඝ කාලීනව කිරීමේ ඇති පරිසරික වැදගත්කම, වෙරළ තීරයේ ස්ථායීතාවයට වන බලපෑම හා තවදුරටත් මෙම කාර්ය කොපමණ කාලයක් කළ යුතුද යන්න පිළිබදව තීරණයක් ගැනීමටත් වර්ෂ 2 කට වැඩි කාලයක් අඛණ්ඩව සේවයේ යොදා ගෙන තිබුණු ප්‍රජාවෙන් සේවා ලබාගැනීමේදී එම ප්‍රජාවගේ සේවා අවශ්‍යතාවය කාර්ය සාධනය පදනමින් ලබා ගැනීමට කටයුතු කළ යුතුය.	මේ සඳහා අධිකාරියට විශේෂඥ දැනුම අවශ්‍ය වුවද ඒ සඳහා ගෙවීම් කිරීමට ක්‍රමවේදයක් නොමැත. එම නිසා නෞකාවේ කටයුතු පිළිබඳ වෙරළ පිරිසිදු කිරීම සඳහා යොදාගෙන ඇති ITOPF ආයතනයේ නිර්දේශ අනුව අන්තර්ජාතික ක්‍රමවේදයකට අනුව කටයුතු සිදු කරයි. සිදු කරන කටයුතු සඳහා මුදල් රක්ෂණ සමාගම මඟින් ගෙවීම සිදු කරන්නේ ITOPF ආයතනයේ නිර්දේශ අනුව කටයුතු සිදු කළහොත් පමණි. අධිකාරිය ITOPF සමඟ සාකච්ඡා කොට කටයුතු සිදු කර ඇත. නෞකාවෙන් වෙරළ කලාපයට එකතු වූ අපද්‍රව්‍ය පරිසරයෙන් ඉවත් කරන තෙක් වෙරළ පිරිසිදු කිරීම සිදු කරගෙන යා යුතුය.	ITOPF ආයතනයේ නිර්දේශ අනුව කටයුතු සිදු කලද වෙරළ පිරිසිදු කරන ප්‍රජාවගේ කාර්යක්ෂමතාවය මත ගෙවීම් කරන බව හෝ මෙම කාර්යභාරය කොපමණ කාලයක් කළයුතුද යන්න හඳුනාගෙන නොතිබුණි.

	පබලු එකතු කිරීම සිදු කරන 158 දෙනෙකු සඳහා රු.20,116,500 ක දීමනා ගෙවා තිබුණි.				
9.	MV-X Press Pearl නෞකා අනතුර සම්බන්ධයෙන් වූ හානිය තක්සේරු කිරීම සඳහා පත් කල විද්වත් කමිටුවට ගෙවිය යුතු දීමනා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 2023 ජනවාරි 30 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුව 5 දෙනෙකුගෙන් සමන්විතව පත්කළ කමිටුව මඟින් දිනකට පැය 8 ක් සඳහා ඇ.ඩො.350 ක් බැගින් ඇමරිකානු ඩොලර් 584,500 ක් විද්වත් කමිටුවට ගෙවීමට, එම කමිටුවට නම්කර තිබුණු ජාතික වැටුප් කොමිෂන් සභාවේ නිලධාරියාගේ නිර්දේශය ලබා නොගෙන තීරණය කර තිබුණි. එසේම විද්වත් කමිටුවේ සාමාජිකයින් රාජකාරියේ යෙදුණු කාලය මැනීමටත්, නිර්දේශ කළ එම රේටය ජාත්‍යන්තර රේටයක් ලෙස සනාථ කිරීම සඳහාත් කිසිදු සාක්ෂියක් ඉදිරිපත් නොවුණු අතර 2023 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ විද්වත් කමිටුවට ගෙවා තිබුණු රු.6,475,000 ක දීමනාව ගණනය කළ ආකාරය පිළිබඳව ද විගණනය වෙත සනාථ	2023	විද්වත් කමිටුවේ සාමාජිකයින් රාජකාරියේ යෙදුණු කාලය මැනීමටත්, නිර්දේශ කළ රේටය ජාත්‍යන්තර රේටයක් ලෙස සනාථ කිරීම සඳහාත් කටයුතු කළ යුතුය.	අමාත්‍ය මණ්ඩල තීරණය අනුව අමාත්‍යාංශ ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පත් කල කමිටුවේ තීරණය අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කර ඒ අනුව කටයුතු කර ඇත.	වැටුප් කොමිෂන් සභාවේ නිලධාරියාගේ නිර්දේශය ලබා නොතිබූ අතර නිර්දේශ කළ රේටය ජාත්‍යන්තර රේටයක් බවටත් විද්වත් කමිටුවට ගෙවා තිබුණු රු.6,475,000 ක දීමනාව ගණනය කළ ආකාරය පිළිබඳවත් විගණනයට පැහැදිලි කර නොමැත.

	නොකරන ලදී.				
10.	ප්‍රජා සහාභාගීත්වයෙන් MV - X Press Pearl නෞකාවෙන් විසිරුණු පබලු ඇහිදීම සඳහා 2021 ඔක්තෝබර් සිට 2023 දෙසැම්බර් දක්වා දීමනා ලෙස රු.248,192,250 ක් හා උපකරණ, ප්‍රවාහන, ආහාර හා වෙනත් වියදම් සඳහා රු.553,824,237ක් වශයෙන් වියදම් දරා තිබුණි. දෛනිකව එකතු කරන ලබන මුළු පබළු ප්‍රමාණයෙහි සාමාන්‍ය අගය 2022 ට සාපේක්ෂව කි.ග්‍රෑම් 44 සිට 2023 වනවිට කිලෝ ග්‍රෑම් 20 කට ආසන්න අගයක් දක්වා අඩුවී තිබුණු නමුත් 2023 වර්ෂයේ ප්‍රජා සහභාගීත්වය සඳහා දරන ලද පිරිවැයෙහි අඩුවීම රු.මිලියන 124 ක සිට රු.මිලියන 106 ක් දක්වා රු.මිලියන 18 ක් පමණක් විය.	2023	ප්‍රජාවගෙන් සේවා ලබාගැනීමේදී එම ප්‍රජාවගේ සේවා අවශ්‍යතාවය කාර්ය සාධනය පදනමින් විධිමත් ක්‍රමවේදයකින් අධීක්ෂණය කර සේවයේ යොදා ගැනීමට කටයුතු කළ යුතුය.	ප්‍රජාවගේ සේවාව ලබා ගැනීම, වැඩ සිදු කරන ආකාරය තුන්වන පාර්ශවයක් මඟින් නිරීක්ෂණය කරන බැවින් එම ක්‍රමවේදයට ගැලපෙන ලෙස දැනට කාර්යයන් කරගෙන යනු ලබයි.	දෛනිකව එකතු කරන පබලු ප්‍රමාණය කිලෝග්‍රෑම් 44 සිට 20 දක්වා අඩුවී තිබුණද ප්‍රජා සහභාගීත්වය අඩු නොවී දරන ලද පිරිවැය රු.මිලියන 18 පමණක් අඩු වීම විගණනයට සෑහීමට පත්විය නොහැක.
11.	අධිකාරියේ බැංකු ජංගම ගිණුම් වල සමාලෝචිත වර්ෂයේ ආරම්භයේ පැවති මුදල් ශේෂය රු. මිලියන 290 ක් ද, වර්ෂය අවසානයේ පැවති මුදල් ශේෂය රු. මිලියන 364 ක් ද විය. අධිකාරියේ සාමාන්‍ය මාසික ගෙවීම් අවශ්‍යතාවය සලකා අතිරික්ත මුදල වඩා වාසිදායක ආකාරයට	2023	අධිකාරියේ සාමාන්‍ය මාසික ගෙවීම් අවශතාවය සලකා අතිරික්ත මුදල වඩා වාසිදායක ආකාරයට ආයෝජනය කිරීමට කටයුතු කළ යුතුය.	ඉදිරියේදී එසේ කටයුතු කරනු ඇත.	ඉදිරියේදී වඩා වාසි දායක ආයෝජනයන්හි මුදල් යෙදවීම ට කටයුතු කරන බව දන්වා ඇත.

	ආයෝජනය කිරීමට කටයුතු නොකර ඉතා කෙටි කාලීන ආයෝජනයන්හි යෙදවීමෙන් ලබාගත හැකිව තිබූ පොලී ආදායම් අහිමි වී තිබුණි.				
12.	2011 වර්ෂයේදී අනතුරට පත්වූ නැවකින් ලැබුණු රු.මිලියන 10 ක වන්දියක් හා 2022 වර්ෂයේදී රඳවාගත් ඉපැයීම් වලින් රු.මිලියන 100 ක් සමුද්‍රීය පරිසර ආරක්ෂණ අරමුදල නමින් ගිණුමකට බැර කර එම මුදල භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කරමින් තිබුණු අතර ආයෝජන පොලී එකතුවීමෙන් සමාලෝචිත වර්ෂය අවසානයට එම අරමුදලේ ශේෂය රු.119,486,831 ක් වී තිබුණි. එසේ වුවද, සමුද්‍රීය පරිසර දූෂණය වැළැක්වීම සම්බන්ධ කළයුතු කාර්යයන් හඳුනා නොගෙන මෙම අරමුදල නිෂ්කාර්යව පැවතුණි.	2023	2008 අංක 35 දරණ සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනතේ 18 (2) වන වගන්තිය අනුව අධිකාරියේ බලතල ක්‍රියාත්මක කිරීමේදී, කර්තව්‍ය ඉටු කිරීමේ දී හා කාර්යකිරීමේ දී අධිකාරිය විසින් කරනු ලබන යම් වියදමක් දැරීම සඳහා අවශ්‍ය වන සියලු මුදල් ප්‍රමාණයන් මෙම අරමුදලින් ගෙවනු ලැබිය යුතුය.	මෙම මුදල විශේෂ සමුද්‍ර දූෂණ අවස්ථාවලදී, එහිදී නැව් අනතුරු වලට ප්‍රතිචාර දැක්වීම සඳහා යොදා ගැනීමට තබා ගෙන ඇත.	සමුද්‍ර දූෂණ වැළැක්වීම සඳහා මෙම අරමුදල යොදවා නොතිබුණි.

3.22 සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	බදු පෙර ලාභය (අලාභය) රු.	මතය
2021	692,164,748	111,703,480	580,459,268	206,261,703	තත්ත්වාගණනය කළ
2022	720,669,659	93,851,893	626,817,766	131,059,472	තත්ත්වාගණනය කළ
2023	636,032,380	100,674,362	535,358,018	154,721,745	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	**වාර්තාවේ වර්ෂය**	**විගණකාධිපති නිර්දේශය**	**විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග**	**වාර්තාවේ දිනට නිර්ද්ශයේ ක්‍රියාත්මක තත්ත්වය**
1	අධිකාරියෙහි 2023 දෙසැම්බර් 31 දිනට එකතුවක් ලෙස රු. 13,132,807 වන ණයගැති ශේෂයක් පැවතුණි. ඉන් රු. 9,473,681ක් වර්ෂ 05 ඉක්මවූ ණයගැති ශේෂ විය.	2021, 2022, 2023	ලැබිය යුතු ශේෂයන් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.	ගම්පහ රෝහලෙන් හිඟ මුදල ගෙවන බවට එකඟ වී ඇති අතර රේඛීය අමාත්‍යාංශ ලේකම් විසින් සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් දැනුවත් කර ඇත.	අයකරගෙන නොතිබුණි.
2	**2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ රාජ්‍ය ව්‍යාපාර මාර්ගෝපදේශ 6.2 (ඇ) ඡේදය** රාජ්‍ය සංස්ථාවක අතිරේක අරමුදල්, ඇමතුම් තැන්පතු, කෙටි කාලීන තැන්පතු, භාණ්ඩාගාර බිල්පත්, ස්ථාවර තැන්පතු හෝ වෙනත් ඕනෑම තැන්පතුවක් ආයෝජනය	2021. 2022, 2023	චක්‍රලේඛයට අනුකූල විය යුතු වීම.	රේඛීය අමාත්‍යාංශ ලේකම් මගින් මුදල් අමාත්‍යාංශ ලේකම් වෙත අනුමැතියක් ඉල්ලා ලිපියක් යොමු කර ඇත.	මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන නොමැත.

	කිරීම සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය යටතේ ආයෝජනය කළයුතු වුවත්, අධිකාරිය විසින් 2023 වර්ෂය තුල දී ආයෝජනය කරන ලද රු. 506,686,028 වූ ස්ථාවර තැන්පතු 05 සම්බන්ධයෙන් අදාල අනුමැතිය ලබාගෙන නොතිබුණි				
3	**2003 අංක 24 දරන පොදු පහසුකම් මණ්ඩල(සංශෝධන) පනතේ 05 වන ඡේදයේ (ඌ) වගන්තිය** සහාධිපත්‍ය දේපල වල ප්‍රවේශ මාර්ග, වතු, උද්‍යාන, ක්‍රීඩාංගන හා එළිමහන් ස්ථාන නඩත්තු කිරීම සඳහා පළාත් පාලන ආයතන වෙත පැවරීම අධිකාරියේ අරමුණක් වුවද මාළිගාවත්ත සහ ජල්තර නිවාස ක්‍රමවල එම නඩත්තු කිරීම් පළාත් පාලන ආයතන වෙත පවරා නොතිබුණි.	2023	පනතේ විධිවිධාන වලට අනුකූල විය යුතුය.	පැවරීමට කටයුතු කරනු ලැබේ.	පවරා දී නොමැත.
4	1982 අංක 45 දරණ බද්ධ නිවාස (සංශෝධිත) පනතේ වූ ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛන එකතු කිරීම් යටතේ එහි 3(2) වගන්තිය ප්‍රකාරව හා 2003 අංක 39 දරණ බද්ධ නිවාස අයිතිකම් (සංශෝධිත) පනතේ 27(3) වගන්තිය ප්‍රකාරව කළමනාකරණ සංස්ථාවල මහ සභා රැස්වීම් පැවැත්විය යුතු අතර එහි 8(4) (අ) අනුව	2021 2022 2023	පනතේ විධි විධාන අනුව වාර්ෂික මහා සභා රැස්වීම් පැවැත්විය යුතු අතර සංස්ථා කටයුතු කාලීනව අධික්ෂණය කළයුතුය.	වාර්ෂික මහා සභා රැස්වීම් පවත්වා නැත.	වාර්ෂික මහා සභා රැස්වීම් කළමනාකර ණ සංස්ථා විසින් පවත්වා නොතිබුණි.

	කළමනාකරණ සංස්ථාවේ විගණනය කළ වාර්ෂික ගිණුම්වල පිටපත් අධිකාරියට ඉදිරිපත් කළ යුතුය. එසේ වුවත් අධිකාරියේ පවතින කළමනාකරණ සංස්ථා 1014න් 586ක් ලියාපදිංචි කරන ලද දින සිටම වාර්ෂික ගිණුම් ඉදිරිපත් කර නොමැති අතර ඉතිරි සංස්ථා 428න් 403ක 2023 වසරේ විගණිත වාර්ෂික ගිණුම් අධිකාරිය වෙත ඉදිරිපත් කර නොතිබුණි. තවද සභාධිපත්‍ය පිඹුර ලියාපදිංචි කර මාස 3ක් ඇතුලත කළමනාකරණ සංස්ථා පිහිටවිය යුතු වුවත් 2022 – 2023 කාලය තුල ලියාපදිංචි කළ දේපල 39ක් සම්බන්ධයෙන් කළමනාකරණ සංස්ථා පිහිටුවා නොතිබුණි.				
5	2013 – 2018 කාලය තුල මුලික නිශ්කාශන ලිපි ලබාගෙන තිබු දේපල 400ක් සඳහා අවසන් සහතිකය ලබාගෙන නොතිබු අතර එම දේපල වල වලංගු කාලය නැවත අළුත් කිරීමට කටයුතු කර නොතිබුණි. තවද තාවකාලික සභාධිපත්‍ය සහතික ලබාගෙන තිබු දේපල 50ක් ද අර්ධ සභාධිපත්‍ය සහතික ලබාගත් 15ක් ද අවසන් සහතික ලබාගෙන නොතිබුණි. දේපල 65න් දේපල 20ක්ම පලාත් පාලන ආයතන වලින් අනුකූල හා සහතික ලබා	2021, 2022, 2023	වලංගු කාලය තුල සහතික පත්‍ර නිකුත් කිරීමට නිසි ක්‍රමවේදනයක් සකස් කරගත යුතුය.	මුලික නිශ්කාෂණ ලිපිය අළුත් කර අවසාන සහතිකය නිකුත් කිරීමට 2023 සිට කටයුතු කෙරේ.	මූලික/ අර්ධ/ තාවකාලික සහතික ගත් සංවර්ධකයන්ට අවශ්‍ය සහතික ලබාගැනීමට දැනුවත් කර උපදෙස් ලබාදෙමින් පවතී.

	නොගැනීම ඊට හේතු වී තිබුණි.				
6	අධිකාරිය වෙත ලැබී තිබූ පැමිණිලි 1387කින් 67ක් 2023 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කර නොතිබුණි. මෙම පැමිණිලි අතර, අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් පැමිණිලි 25 ක් වූ අතර, ජල කාන්දු වීම් සම්බන්ධ පැමිණිලි 13 ක් විය. ඉන් 06 ක් ලැබී වසර 2 - 5 ත් අතර කාලයක් ගත වී තිබීම හේතුවෙන් දේපල හා ජීවිතවලට අනතුරුදායක තත්වයක පැවතුණි.	2021, 2022, 2023	ලැබෙන පැමිණිලි සම්බන්ධයෙන් පනතේ විධි විධාන අනුව කටයුතු කළයුතුය.	පැමිණිලි ලැබීමෙන් පසු පාරිභෝගික අංශයෙන් විසඳීමට හැකි තාක් උත්සහ කරන අතර එසේ කළ නොහැකි ඒවා නීති අංශයට යොමු කර පරීක්ෂණ සාධාරණ කාලයක් තුල අවසන් කිරීමට කටයුතු සිදු කෙරේ.	පැමිණිලි සම්බන්ධයෙන් මන්දගාමීව කටයුතු සිදු කෙරේ.
7	1973 අංක 11 දරණ බද්ධනිවාස අයිතිවාසිකම් පනතේ 5(2) වගන්තිය අනුව අනුකූලතා සහතික ලබා නොගත් දේපල වල තැනැත්තෙකු පදිංචි නොකළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසන් වන විට නාගරික සංවර්ධන අධිකාරිය විසින් ඉදිකර තිබූ සහාධිපත්‍ය දේපල 21 සඳහා අවසන් සහතික ලබාගෙන නොතිබූ අතර පවුල් 12,734 ක් එම මහල් නිවාස වල පදිංචි කර තිබුණි. සහාධිපත්‍ය සහතිකය ලබා නොගැනීම හේතුවෙන් මෙම නිවාස සංකීර්ණවල කළමනාකරණ සංස්ථා පිහිටුවීමට නොහැකි වී ඇති අතර නඩත්තු කටයුතු නිසි පරිදි සිදු නොවීම සහ නිවාස හිමියන්ට ඔප්පු	2023	පනතේ විධිවිධාන අනුව කඩිනමින් කටයුතු කළයුතුය.	පිළිතුරු ලබා දී නොමැත.	නාගරික සංවර්ධන අධිකාරියෙන් සහාධිපත්‍ය සහතිකය ලබාගැනීම සඳහා අයදුම් කර නොමැත.

ලබා දීමට නොහැකි වී තිබුණි. තවද මෙම සහාධිපත්‍ය දේපල වල පැවතිය යුතු පොදු පහසුකම් පවතිද සහ බද්ධ නිවාස අයිතිවාසිකම් පනත ප්‍රකාරව දේපල හිමි අය විසින් කටයුතු නොකිරීම සම්බන්ධයෙන් අධිකාරිය කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. ඒ අනුව අධිකාරිය සිය වගකීම් පැහැර හැර ඇති බව තවදුරටත් නිරීක්ෂණය විය.

3.23 නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	3,002,005,992	1,201,018,549	1,800,989,443	784,619,371	තත්ත්වාගණනය කළ
2022	3,453,241,801	157,531,964	3,295,709,837	364,721,747	තත්ත්වාගණනය කළ
2023	3,791,675,600	101,556,356	3,690,119,244	210,588,736	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව දේපළ සංවර්ධනය කරන්නන්ගෙන් අයකරන සේවා ගාස්තු නාගරික සංවර්ධන අධිකාරිය විසින් අයකිරීම නවතා තිබුණු බැවින් නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියට එම ආදායම් මාර්ගය අහිමි වී තිබුණි. සේවා ගාස්තු අයකිරීම නවතන අවස්ථාව වන විටත් නාගරික සංවර්ධන අධිකාරිය විසින් අය කර ගෙන තිබූ රු. මිලියන 207.33 ක සේවා ගාස්තු මුදල 2023 වර්ෂය අවසාන වන විටත් නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය වෙත ලබා ගැනීමට	2023 2022 2021	පනතේ අරමුණු වලට අනුගත විය යුතුය	මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ අතිරේක ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පත් කරන ලද කමිටුව මගින් පරීක්ෂා කර බලා අමාත්‍යාංශයේ ලේකම්තුමා වෙත වාර්තාවක් ඉදිරිපත් කර ඇත.	මෙම සේවා ගාස්තුව අධිකාරිය වෙත ගෙවිය යුතු බවට නාගරික සංවර්ධන අධිකාරිය පිළිගෙන ඇති අතර මේ වන විට නාගරික සංවර්ධන අධිකාරිය විසින් උක්ත හිඟ මුදල වෙනුවට දේපළ හුවමාරුවක් සිදුකිරීමට යෝජනා කර ඇති අතර එම යෝජනාව අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත ලිඛිතව යවා ඇත.

අපොහොසත්ව තිබුණි.

2	(i) 2008 අංක 36 දරන නාගරික ජනාවාස සංවර්ධන අධිකාරි පනත අනුව නාගරික ජනාවාස සංවර්ධනයට අදාල ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා සහ එම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන බවට සහතික වීම සඳහා අධිකාරිය ස්ථාපනය කර තිබුණද, අධිකාරිය පිහිටුවා වර්ෂ 15 ක් ගතවුවද ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීමට හා ක්‍රියාත්මක කිරීමට අධිකාරිය අපොහොසත්වී තිබුණි.	2023 2022 2021	පනතේ අරමුණු ඉටුකරලීමට කටයුතු කළ යුතුය.	මොරටුව විශ්ව විද්‍යාලයේ නගර හා ග්‍රාම නිර්මාණ අංශය විසින් මෙම කාර්යය ඉටු කර ගැනිම සඳහා අධිකාරිය විසින් අමාත්‍යාංශය වෙත ලිපියක් යොමු කරන ලදී.	නාගරික ජනාවාස සංවර්ධනයට අදාළ වන ජාතික ප්‍රතිපත්තියක් සැකසීම සඳහා රීති හා කර්තව්‍යන් (TOR) හි කෙටුම්පත ඉදිරි උපදෙස් ලබා ගැනීම සඳහා අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. ඒ අනුව අමාත්‍යාංශයෙන් ලැබෙන ප්‍රතිචාර අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නියමිතය.
	(ii) 2008 අංක 36 දරන නාගරික ජනාවාස සංවර්ධන අධිකාරි පනත 10 වන වගන්තිය අනුව අධිකාරිය විසින් සභාපතිවරයකුද ඇතුළත් සාමාජිකයන් 14 දෙනෙකුට වැඩි නොවන උපදේශක කමිටුවක් 2017 අප්‍රේල් මාසයේදි පත් කර තිබුණද 2023 වර්ෂය අවසාන වන විටත් අධිකාරියේ යෝජනා, සැලසුම්, ව්‍යාපෘති සහ ක්‍රියාකාරී සැලසුම් යනාදී අධිකාරියේ අරමුණුවලට අදාල කාර්යයන් හඳුනාගෙන නොතිබුණි.	2023 2022 2021	පනතේ අරමුණු ඉටුකරලීමට කටයුතු කළ යුතුය.	අරමුණු මෙන්ම අධිකාරියේ ඉදිරි යෝජනා, සැලසුම්, ව්‍යාපෘති සහ ක්‍රියාකාරි සැලසුම් යනාදී ක්‍රියාත්මක කිරිම සඳහා මේ වන විට නව කළමනාකාරීත්වය යටතේ නව උපදේශක මණ්ඩලයක් පත්කර ඇත.	පිහිටුවන ලද නව උපදේශක කමිටුව වෙත, නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය මගින් ක්‍රියාත්මක කිරීමට යෝජිත ව්‍යාපෘති ඇතුළත් කොට පිළියෙල කර ඇති ව්‍යාපාර සැලැස්ම (Business Plan) ඉදිරිපත් කර ඇති අතර එය ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව වෙතද ඉදිරිපත් කර ඇත.
3	2023 වර්ෂය අවසාන වන විට අධිකාරිය විසින් ක්‍රියාත්මක කර තිබූ	2023 2022 2021	තාක්ෂණික ගැටලු නිරාකරණය	තාක්ෂණික ගැටලු නිරාකරණය කර කඩිනමින්	මේ වන විට පවරා ගැනීම අවසන්ව නොමැති නිවාස

	පුනස්ථාපන පදනම සහ විකුණුම් පදනම මත ඉදිකරන ලද නිවාස ඒකක 1714 කින් නිවාස යෝජනා ක්‍රම 09 කට අදාළ නිවාස ණය ඒකක 588 ට අදාළ ඔප්පු ලබාදීම සිදුකර තිබූ නමුත් නිවාස ඒකක 1126 ක් සඳහා නිවාස හිමියන් වෙත ඔප්පු ලබාදීම සිදුකර නොතිබුණි. මේ සඳහා ඉඩම් පවරාගැනීමේ කටයුතු අවසන් නොවීම, සහාධිපත්‍ය සහතික ලබාගැනීම ප්‍රමාදවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.		කර කඩිනමින් දේපළ විධිමත්ව බැහැර කිරීමට කටයුතු කළ යුතුය.	සහාධිපත්‍ය දේපළ විධිමත්ව බැහැර කිරීම වෙනුවෙන් වන නිර්දේශයන් රේඛීය අමාත්‍යාංශයන් වෙත යොමු කර ඇත.	ව්‍යාපෘති අධිකාරිය වෙත පවරා ගැනීමට කටයුතු සිදු කරමින් පවතී.
4	ධීවර ජනතාව වෙනුවෙන් ඉදිකළ අඟුලාන මහල් නිවාස ක්‍රමයෙන් සිනමා ශිල්පීන්ට හා ක්‍රීඩකයන්ට මුදල් අයකිරීමකින් තොරව නිදහස් දීමනා පත්‍රයක් මගින් රු.මිලියන 62.87 ක් වටිනා නිවාස ඒකක 53 ක භුක්තිය ලබාදී තිබුණද අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව සාධාරණ මුදලක් එම ප්‍රතිලාභීන්ගෙන් අයකර ගැනීමට නියම කර තිබුණි. ඒ අනුව තවදුරටත් නිවාස ඒකක 38 කින් රු. මිලියන 55.48 ක් ලැබිය යුතුව පැවතුණි. නීතිපතිවරයාගේ උපදෙස්වලට අනුව මුදල් නොගෙවූ පුද්ගලයින්ගේ නිදහස්	2023 2022 2021	අමාත්‍ය මණ්ඩල තීරණ ප්‍රකාරව කටයුතුකළ යුතුය	නිදහස් දීමනා මත ලබාදී තිබූ නිවාස ඒකක 53 පිළිබඳව අමාත්‍ය මණ්ඩල තීරණය ලබා දී තිබුණද, කොරෝනා වසංගත තත්වය හා ඉන්ධන අර්බුදය හමුවේ රාජකාරි කටයුතු ඉතාමත් අවම වශයෙන් සිදු කෙරුනු අතර, නිසි පරිදි රාජකාරි කටයුතු ආරම්භ කරනු ලැබූ වහාම මෙම ගිවිසුම් අත්සන් කිරීමේ කටයුතු ආරම්භ කරන ලදී	නිදහස් දීමනාවක් ලෙස නිවාස ලබා ගත් ප්‍රතිලාභීන් 27 දෙනෙකු විකුණුම් පදනම මත ගිවිසුම්ගත වී ණය වාරික ගෙවීම ආරම්භ කර ඇති අතර නිවාස ඒකක 12 ක් ණය පදනම මත නව ප්‍රතිලාභීන් වෙත ලබා දීමට ගිවිසුම්ගත වී ඇත. නිවාස ලබා ගත් ප්‍රතිලාභීන් 11 දෙනෙකුට එරෙහිව නීති කටයුතු ආරම්භ කර ඇති අතර ඉතිරි නිවාස ඒකක 03 හි ප්‍රතිලාභීන්ගේ අභියාචනා විභාග වෙමින් පවතී.

	දීමනා අවලංගු කිරීමට කටයුතු කර තිබූ අතර නිවාස 15 ක් බැහැර කිරීමට අධිකාරිය විසින් කටයුතු කරමින් පැවතුණි.					
5	අමාත්‍ය මණ්ඩල තීරණය අනුව රජයේ තක්සේරු වටිනාකමට සියයට 20 ක අගයක් එකතු කර විකුණුම් මිල තීරණය කර නිවාස ඒකක බැහැර කළ යුතු වුවද, ඊට පටහැනිව අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් මගින් නිවසක විකුණුම් මිල ලෙස රජයේ තක්සේරුව පමණක් අයකර අධිකාරියේ නිලධාරීන් 24 දෙනෙකු සඳහා නිවාස ලබාදීම හේතුවෙන් රජයට රු. මිලියන 20.68 ක මුදලක් අහිමි වී තිබුණි. තවද 2023 වර්ෂය අවසානයට අධිකාරියේ කාර්ය මණ්ඩලයට විකුණන ලද නිවාස ඒකක වලින් රු. මිලියන 95.34 ක් අධිකාරියට ලැබිය යුතුව තිබුණි.	2023 2022		අමාත්‍ය මණ්ඩල තීරණ ප්‍රකාරව කටයුතු කළ යුතුය.	විධිමත් ක්‍රමවේදයක් මත 2008 අංක 36 දරන නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පනතේ අංක 3 යටතේ පැවරී ඇති කළමනාකරණ බලතල ප්‍රකාරව සුදුසුකම් සහිත සේවක මහත්ම මහත්මීන් 24 දෙනෙකු වෙත නිවාස ලබා දීම සිදු කර ඇත.	අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 01/2021/15 මඟින් සාමාන්‍ය විකුණුම් මිල තීරණය කිරීමේ දී එකතු කරන ලද 20% ක සේවා ගාස්තුව අය නොකර උපරිම කාලය වසර 25 කට සීමා වන පරිදි 2% ක වාර්ෂික පොලී අනුපාතිකයක් යටතේ සුදුසුකම් සහිත සේවක මහත්ම මහත්මීන් 22 ක් වෙත නිවාස බැහැර කිරීමට අනුමැතිය ලබා ගන්නා ලදී.
6	අධිකාරිය සතුව පැවති රියල් එස්ටේට් එක්ස්චේන්ජ් ප්‍රයිවට් ලිමිටඩ් සමාගම විසින් ඉදිකරනු ලැබූ රු. මිලියන 44.78 ක් වටිනා සහස්පුර වාණිජ ඒකක 67 ක් හා වටිනාකම හඳුනාගෙන නොතිබූ සේවා ඒකක 57 ක් බදු දීමෙන් අධිකාරිය වෙත	2023 2022		වාණිජ ඒකක වලින් බදු ආදායම් උපයාගත යුතුය.	මෙම නිවාස යෝජනා ක්‍රමය ආරම්භ කරනු ලැබූ රීල් සමාගම විසින් අදාළ ව්‍යාපාරික ස්ථාන වල ආදායම සම්පූර්ණයෙන්ම කළමණාකරන සංස්ථාවේ අරමුදලට ලබාදී තිබූ අතර, නාගරික	අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 05/2022/06 ට ලත් අනුමැති අනුව මෙම නිවාස යෝජනා ක්‍රමයේ කළමනාකරණ හා නඩත්තු වගකීම්වලින් නාගරික ජනාවාස සංවර්ධන

	බදු ආදායම් උපයාගත හැකිව තිබුණද, නිදහස් දීමනාවක් මත සභාධිපත්‍ය කළමණාකරන අධිකාරිය යටතේ ඇති කළමණාකරන සංස්ථාවට බැහැර කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය මඟින් තිරණය කිරීම හේතුවෙන් එම බදු ආදායම අහිමි වී තිබුණි.			ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් සිදු කරනු ලැබුවේ එම ක්‍රියාවලිය නීත්‍යානුකූල කිරීම පමණි.	අධිකාරිය සම්පූර්ණයෙන්ම නිදහස් වීම අරමුණු කරගනිමින් මෙම වාණිජ ඒකකයන්හි ආදායම කළමනාකරණ සංස්ථාව වෙත ලබාගැනීමට අවස්ථාව සලසා දී තිබුණ ද, මෙම වාණිජ හා සේවා ඒකකයන්හි අයිතිය මෙම අධිකාරිය සතුය.
7	අනුරාධපුර සුධාරක තාක්ෂණය යටතේ රු. මිලියන 4.9 ක් වැය කර ඉදි කළ නිවාස 06 මිනිස් වාසයට නුසුදුසු බව ජාතික ඉංජිනේරු පර්යේෂණ සංවර්ධන මධ්‍යස්ථානය (NERDC) සහ අධිකාරියේ ඉංජිනේරුවරයෙකු විසින් සහතික කර තිබුණි. මෙම නිවාස ඉදිකළ නමුත් කිසිදු නඩත්තු කටයුත්තක් සිදුකර නොතිබු අතර 2013 සිට 2024 අප්‍රේල් මස වන තෙක් වසර 11 ක් පුරා නිෂ්කාර්යව පැවතුණි. කෙසේ නමුත් 2018 වර්ෂයේ සිට මුරකරුවකු බඳවා ගෙන තිබූ අතර ඔහුගේ වැටුප් හා අනෙකුත් දීමනා සඳහා එකතුව රු. මිලියන 2.75 ක වියදමක් දරා තිබුණි.	2023 2022	ව්‍යාපෘති ආරම්භ කිරීමට ප්‍රථම ශක්‍යතා අධ්‍යනයක් සිදු කළ යුතුය.	ආයතනයේ පවතිනා වත්මන් මූල්‍ය තත්වය හා මූල්‍ය ශක්‍යතාවය සැලකිල්ලට ගෙන මෙම කාර්යය තාවකාලිකව නවතා දැමීමට ආයතනයේ ඉහළ කළමනාකාරීත්වය තීරණය කරන ලදී.	අනුරාධපුර කටුකැලියාව නිවාස ව්‍යාපෘතියේ සුදාරක තාක්ෂණයෙන් ඉදිකරන ලද නිවාස 6 දීර්ඝ කාලීනව බදු පදනම මත නිදහස් කිරීම සඳහා ලංසු කැඳවීම සම්බන්ධයෙන් අධිකාරියේ ඉහළ කළමනාකාරීත්වය විසින් සාකච්ඡාවක් පවත්වන ලද අතර එහිදී මෙම නිවාස තක්සේරු වටිනාකම යටතේ එකවර මුදල් ලබාගෙන බැහැර කිරිමට හා ඉතිරි නිවාස ආයතනයේ තානායම් ලෙස පවත්වාගෙන යාමටත් තීරණය කර ඇත.

8	සීමාසහිත රියල් එස්ටේට් එක්ස්චේන්ජ් (පුද්ගලික) සමාගම අධිකාරියට පවරා ගැනීමේදී සිදුව තිබූ මූල්‍ය වංචාවට අදාළව නීතිපති විසින් 2021 ඔක්තෝබර් 28 දින ලබා දුන් උපදෙස් අනුව අලාභය සම්බන්ධව අදාළ පුද්ගලයින්ට එරෙහිව නඩු පැවරිය හැකිද යන්න සලකා බැලීම සඳහා මුදල් රෙගුලාසි 103 (පරිච්ඡේද II) යටතේ අදාළ රේඛීය අමාත්‍යාංශය විසින් පියවර ගෙන ඒ සම්බන්ධව වගකිව යුතු පුද්ගලයින් හා රජයට සිදුවී ඇති අලාභය නිවැරදිව ගණනය කළ යුතුව ඇති බව සඳහන් වුවද රේඛීය අමාත්‍යාංශය ඒ පිළිබඳ ඉදිරිකටයුතු 2024 අප්‍රේල් වන විටත් සිදු කර නොතිබුණි.	2023 2022 2021		කඩිනමින් රජයට සිදුවී ඇති අලාභය අයකර ගැනීමට කටයුතු කළයුතුය.	ඒ පිළිබඳව විධිමත් නීතිමය අධ්‍යානයකින් පසුව මෙම මුදල සම්බන්ධව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට නියමිතය.	මුදල් රෙගුලාසි 104 (4) අනුව ප්‍රාරම්භක පරීක්ෂණයක් පැවැත්වීම සඳහා කමිටුවක් පත් කර ඇත.

3.24 ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ආයතනය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	238,709,080	3,552,398	235,156,682	25,122,253	තත්ත්වාගණනය කළ
2022	299,144,927	4,384,599	294,760,327	48,116,618	තත්ත්වාගණනය කළ
2023	359,925,383	8,722,039	351,203,344	47,203,829	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	යොමු අංකය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	2009 අංක 38 දරන ජාතික වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ ආයතන පනතේ 3 (1) (ග) උප වගන්තිය ප්‍රකාරව වෘත්තීය ආරක්ෂණය සහ සෞඛ්‍ය ක්ෂේත්‍රය පිළිබඳ ජාතික ප්‍රමිති පිහිටුවීමට ආයතනය කටයුතු කල යුතු වුවත් 2022 අප්‍රේල් 30 දින වන විටත් එම ප්‍රමිති පිහිටුවා නොතිබුණි.	2021 – 154(6) 1.6 (ඉ)	පනත ප්‍රකාරව කටයුතු කල යුතුය.	ජාතික ප්‍රමිතින් පිහිටුවිමේ බලධාරියා වනුයේ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයයි. එම නිසා එම ආයතනය සමඟ එක්ව ප්‍රමිත පිහිටුවිමට කටයුතු කර ඇත. ඒ සඳහා උදාහරණ ලෙස Standard practice Reparative Protection ප්‍රමිතයන් මේ වන විටත් ප්‍රකාශයට පත්කර ඇත.	නිවැරදි කිරීමට කටයුතු කරමින් පවතී. මෙතෙක් නිවැරදි කර නැත.
2	2009 අංක 38 දරන ජාතික වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ ආයතන පනත 20 (1) උපවගන්තිය ප්‍රකාරව අමාත්‍යවරයා විසින් පනතේ විධිවිධාන යටතේ ආයතනයේ කර්තව්‍ය කිසිවක් හෝ ඒ සියල්ල	2022 – 154(6) 1.6 (අ) (i)	පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.	අමාත්‍ය නියෝග සැදිම සඳහා මෙම පනතේ වෙනස්කම් සිදු කළ යුතු හෙයින් මේ වන විට ආයතනය විසින් කම්කරු අමාත්‍යාංශය මගින් නව සංශෝධන සහිතව කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත්	අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතී. මෙතෙක් නියෝග සාදා නැත.

	කරගෙනයාමේ කාර්යය සඳහා සහ පනතේ මූලධර්මවලට බලාත්මකභාවයක් ලබාදීමේ කාර්යය සඳහා නියෝග සාදනු ලැබිය හැකි වුවත් එම නියෝග සාදා නොතිබුණි.			කර ගරු නීතිපති වෙත ඉදිරිපත් කර ඇති බව.	
3	11 වන වගන්තිය ප්‍රකාරව ආයතනයේ කාර්යක්ෂම පරිපාලනය සඳහා අවශ්‍ය වියයුතු පරිදි ආයතනයේ අධ්‍යක්ෂවරු වශයෙන් යම් තැනැත්තන් සංඛ්‍යාවක් සභාව විසින් පත්කරනු ලැබිය යුතු වුවත් එසේ පත්කර නොතිබුණි.	2022 – 154(6) 1.6 (අ) (ii)	පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.	අදාළ විගණන නිරීක්ෂණය සම්බන්ධයෙන් ඉදිරියෙදි පැවැත්විමට නියමිත අධ්‍යක්ෂ මණ්ඩල රැස්විමේ දි අවධානය යොමු කර ඒ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩල නිර්දේශ ලබා ගැනිමට කටයුතු කිරිමට සටහන් කර ගත් බව.	නිවැරදි කිරීමට පියවර ගනිමින් සිටී. මෙතෙක් අදාල කාර්යය නිමකර නැත.
4	ආයතනයෙහි අනුමත කාර්යය මණ්ඩලය 25 ක් වූ අතර තත්‍ය කාර්යය මණ්ඩලය 16 ක් විය. ආයතනයේ කාර්යය හා කර්තව්‍ය මෙහෙයවීමේදී අණපණත් මගින් පැවරෙන කාර්යයන් සඳහන් ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවරාදෙන කළමණාකරණ කාර්යයන් ඉටුකිරීමේ කාර්යයෙහි නිරතවන ප්‍රධාන විධායක නිලධාරී තනතුර වන අධ්‍යක්ෂ ජනරාල් තනතුර කොන්ත්‍රාත් පදනම මත සේවය	2022 – 154(6) 3.1 2023 – 154(6) 2.1	ආයතනයේ කාර්යභාර්යය ඉටුකර ගත හැකි වන පරිදි කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට කටයුතු කල යුතුය.	විගණනයේ සඳහන් පුරප්පාඩු අතරින් අධ්‍යක්ෂකවරයෙකු හා සහකාර අධ්‍යක්ෂවරයෙකු බඳවා ගැනිමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා කටයුතු සුදානම් කර ඇති බව සඳහන් කරමි. එමෙන්ම විගණනයේ සඳහන් අධ්‍යක්ෂ (සෞඛ්‍ය හා ස්වස්ථා) තනතුර සඳහා ද කොන්ත්‍රාත් පදනම යටතේ අධ්‍යක්ෂ ජනරාල් තනතුර	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අනුමැතිය විමසා ඇත.

	ලබාගන්නා බව නිරීක්ෂණය විය. ආයතනයේ පැවැත්ම උදෙසා වැදගත් කාර්යයභාරයක් පැවරෙන අධ්‍යක්ෂ (සෞඛ්‍ය හා ස්වස්ථතා) තනතුර සඳහාද ස්ථිර නිලධාරියෙකුගේ සේවය අවශ්‍ය වුවද, අවශ්‍ය අවස්ථාවන්හිදී සම්පත්දායකයෙකුගේ සේවය ලබාගනිමින් පැවතුණි.			මෙන් සේවාවක් ලබා නොගන්නා බව තහවුරු කරමි.	
5	2009 අංක 38 දරන ජාතික වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ ආයතන පනත 20 (1) උපවගන්තිය ප්‍රකාරව අමාත්‍යවරයා විසින් පනතේ විධිවිධාන යටතේ ආයතනයේ කර්තව්‍ය කිසිවක් හෝ ඒ සියල්ල කරගෙනයාමේ කාර්යය සඳහා සහ පනතේ මූලධර්මවලට බලාත්මකභාවයක් ලබාදීමේ කාර්යය සඳහා නියෝග සාදනු ලැබිය හැකි වුවත් එම නියෝග සාදා නොතිබුණි.	2023 – 154(6) 1.6 (අ) (i)	පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.	ඒ සම්බන්ධ කටයුතු කිරීමට නියමිත බව	මෙතෙක් නියෝග සාදා නැත.
6	27. 2009 අංක 38 දරන ජාතික වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ ආයතන පනත 11 වන වගන්තිය ප්‍රකාරව ආයතනයේ කාර්යක්ෂම	2023 – 154(6) 1.6 (අ) (ii)	පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.	පනත ප්‍රකාරව කටයුතු කරන බව	දැනටත් නම් කර නැත.

	පරිපාලනය සඳහා අවශ්‍ය වියයුතු පරිදි ආයතනයේ අධ්‍යක්ෂවරු වශයෙන් යම් තැනැත්තන් සංඛ්‍යාවක් සභාව විසින් පත්කරනු ලැබිය යුතු වුවත් එසේ නම් කර නොතිබුණි.				
7	2017 අංක 24 දරණ දේශීය ආදායම් පනත 83 ඒ පරිච්ඡේදය 2022 අංක 45 දරණ දේශීය ආදායම් (සංශෝධන) පනත හා අංක PED 01/ 2023 චක්‍රලේඛය ප්‍රකාරව අත්තිකාරම් පුද්ගල ආදායම් බදු ගණනයේ දී තනතුරට හිමි වැටුප් සහ දීමනා හැර එම තනතුරෙහි රාජකාරී ඉටු කිරීමේදී ලබාගත් සියලු දීමනා ද ඇතුළත්ව අත්තිකාරම් පුද්ගල ආදායම් බදු ගණනය කළ යුතු වුවද දේශන ගාස්තු, සම්පත් දායක ගාස්තු හා වාර්ෂික ප්‍රසාද දීමනා යනාදිය සැලකීමෙන් තොරව අත්තිකාරම් පුද්ගල ආදායම් බදු ගණනය සිදුකර තිබුණි.	2023 – 154(6) 1.6 (ආ)	දේශීය ආදායම් පනත ප්‍රකාරව කටයුතු කල යුතුය.	ඒ සම්බන්ධයෙන් මෙම කරුණු ගොනු කොට එකී ලේකම් කාර්යාලයෙන් විමසා උපදෙස් ඉල්ලා ඇති අතර ලැබෙන නිර්දේශ පදනම් කරගෙන ඉදිරියේ දි කටයුතු කිරිමට ගිණුම් අංශයට උපදෙස් ලබා දුන් බව.	ගෙවා ඇති මුදල් සඳහා පනත ප්‍රකාරව කටයුතු කර නැත.

3.25 ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	80,659,692	4,477,908	76,181,784	13,109,428	තත්ත්වාගණනය නොකළ
2022	113,904,593	4,480,706	109,423,887	18,874,140	තත්ත්වාගණනය කළ
2023	130,413,193	9,784,239	120,628,953	11,095,652	තත්ත්වාගණනය නොකළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	2010 අංක 12 දරන ජාතික ශ්‍රම අධ්‍යයන ආයතන පනත 3 (අ) උපවගන්තිය ප්‍රකාරව සේවකයන් සංවර්ධන ක්‍රියාවලියෙහි ක්‍රියාකාරී කොටස්කරුවන් කර ගැනීම සඳහා ඔවුන්ගේ සුබසාධනය සහතික කරණු පිණිස ගනු ලැබූ විධිමත් පියවරයන් නිරීක්ෂණය නොවීය.	2021 – 154(6) 1.6 (අ)(i)	පනතේ සඳහන් අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කල යුතුය.	සේවකයන් සංවර්ධන ක්‍රියාවලියේ ක්‍රියාකාරී කොටස්කරුවන් කර ගැනීම සඳහා කම්කරු නීතිය, කාර්මික සබඳතා, මානව සම්පත් සංවර්ධනය, ප්‍රසම්පාදනය, ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි පිළිබඳ අවබෝධය ලබා දීම තුළින් තම රාජකාරී කටයුතුවලට සෘජුව සම්බන්ධවන විෂයන් පිළිබඳව ධාරිතා වර්ධනය කිරීමේ අරමුණින් කෙටි කාලීන හා දීර්ඝ කාලීන පාඨමාලා පවත්වනු ලැබූ අතර සංවර්ධන ක්‍රියාවලිය සඳහා ඔවුන්ගේ දායකත්වය ලබා දිය	දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වයි. විධිමත් වැඩපිළිවෙලක් සකස්කර නොමැත.

				හැකි ආකාරය පිළිබඳව දැනුවත් කර ඇති අතර කම්කරු නීතිය හා කාර්මික සබඳතා පිළිබඳව සේවා හා සේවක දෙපාර්ශවයේම දැනුවත්භාවය වර්ධනය කිරීම සඳහාද කටයුතු කර ඇත.	
2	2010 අංක 12 දරන ජාතික ශ්‍රම අධ්‍යයන ආයතන පනත 3 (ඇ) උපවගන්තිය ප්‍රකාරව පුස්තකාල සහ තොරතුරු සැපයීමේ සේවා පිහිටුවීම හා ඒවා නඩත්තු කිරීම ආයතනයේ එක් ප්‍රධාන අරමුණක් වුවත් 2021 මාර්තු 31 දින දක්වා එවැනි පුස්තකාල සහ තොරතුරු සැපයීමේ සේවාවක් ආයතනය විසින් ක්‍රියාත්මක කර නොතිබුණි.	2021 – 154(6) 1.6 (අ)(iii) 2022 – 154(6) 1.6 (අ) (i) 2023 – 154(6) 1.5 (ඇ)	පනතේ සඳහන් අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කල යුතුය.	2007 වර්ෂයේ සිට 2019 නොවැම්බර් දක්වා කාලය තුල පුස්තකාලයක් ස්ථාපනය කර තිබූ අතර නාරාහේන්පිට කම්කරු මහලේකම් කාර්යාල පරිශ්‍රයේ කාර්යාලය ස්ථාපනය කර නවීකරණ කිරීමෙන් පසුව 2022 වර්ෂයේ දෙවන කාර්තුවේ සිට පුස්තකාලය ස්ථාපනය කිරීමට කටයුතු සම්පාදනය කර ඇත. මාර්ග ගත ක්‍රමයෙන් පිවිසිය හැකි ඉලෙක්ට්‍රොනික පුස්තකාලයක් නිර්මාණය කිරීමට කටයුතු ආරම්භ කර ඇත.	විද්‍යුත් ප්‍රකාශන ඇතුලත් වෙබ් පිටු වේ සැකසීම් ආරම්භ කර ඇත.
3	2010 අංක 12 දරන ජාතික ශ්‍රම අධ්‍යයන ආයතන පනත 3 (ඉ) උපවගන්තිය ප්‍රකාරව සමාන අරමුණු සහිත ජාතික හා විදේශීය ආයතන සංවිධාන සංගම්	2021 – 154(6) 1.6 (අ)(iv) 2022 – 154(6)	පනතේ සඳහන් අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කල යුතුය.	ඉන්දියාවේ විවිගිරි ජාතික කම්කරු ආයතනය සමඟ පැවති අවබෝධතා ගිවිසුම යාවත්කාලීන කිරීම	VV Giri National Labour Institute සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීමට නීතිපති දෙපාර්තමේන්තුව

	සහ සමිති සමඟ සමීප සහයෝගීතාවයෙන් කටයුතු කිරීම සිදු කලයුතු වුවද එවැනි වැඩසටහන් විධිමත් ලෙස ක්‍රියාත්මක කර නොතිබුණි.	1.6 (අ) (ii) 2023 – 154(6) 1.5(ඇ)		සඳහා සාකච්ඡා කර ඇති අතර ඉදිරියේදී නීතිපති දෙපාර්තමේන්තුවෙන් නිරීක්ෂණ ලබා ගැනීමෙන් අනතුරුව අවශ්‍ය අමාත්‍ය මණ්ඩල අනුමැතියට යොමු කර ගිවිසුමට එළඹීමට කටයුතු කරනු ඇත. ජාත්‍යන්තර කම්කරු සංවිධානයට අනුබද්ධ ජාත්‍යන්තර පුහුණු මධ්‍යස්ථානය සමඟ සහයෝගීතාවයකට එළඹීමට අවශ්‍ය සාකච්ඡා වාර 03ක් දැනටමත් පවත්වා ඇති අතර දැනට පවත්වාගෙන යන කම්කරු නීති හා කාර්මික සබඳතා පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව සඳහා එම ආයතනයේ සම්පත් දායකත්වය ලබා ගැනීමට ඇති හැකියාව පිළිබඳ සාකච්ඡා පවත්වා අවසන් කර ඇත.	වෙත යොමුකර ඇත.
4	2010 අංක 12 දරන ජාතික ශ්‍රම අධ්‍යයන ආයතන පනත 3 (ඊ) උපවගන්තිය ප්‍රකාරව ආයතනය විසින් සහය ලබාගන්නා විශ්ව විද්‍යාල හා ඒ සමාන ආයතන සමඟ සාකච්ඡා සිදුකර තිබුණද (තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව හැර) පාඨමාලා පැවැත්වීම සහ සහතික සහ ඩිප්ලෝමා	2021 – 154(6) 1.6 (අ)(v)	පනතේ සඳහන් අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කල යුතුය.	මිනිස් බල රැකියා නියෝජිත ආයතන හා රැකියා නියුක්තිකයන් හා සම්බන්ධ නීති රෙගුලාසි පිළිබඳ අධ්‍යයනය හා ඒවායේ පවත්නා හිඩැස් හඳුනා ගැනීම හා එහි සංවර්ධනය උදෙසා පවතින අවස්ථා හඳුනා	NVQ ලබාදීම සඳහා සකච්ඡා පවත්වා අවශ්‍ය කටයුතු සිදුකර ඇතත් මෙතෙක් එකී කාර්යය ඉටු වී නොමැත.

ප්‍රදානය කර නොතිබුණි.

ගැනීම අරමුණු කර ගනිමින් කොළඹ විශ්ව විද්‍යාලයේ මානව සම්පත් අභිවර්ධන ආයතනය සමඟ පර්යේෂණයක් සඳහා මූලික සාකච්ඡා පවත්වා ඇත.
ශ්‍රී ලංකා ඇගයීම් සංගමය සමඟ අධීක්ෂණය හා පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් ඇරඹීමට ඇති ශක්‍යතාව පරීක්ෂා කර බැලීමේ අරමුණින් මූලික සාකච්ඡා පවත්වා ඇති අතර රාජ්‍ය නිලධාරීන්ගේ දෙමළ භාෂා ප්‍රවීනතාවය ලබා ගැනීම සඳහා වූ සහතික පත්‍ර පාඨමාලාවක් ආරම්භ කිරීමට ඇති හැකියාව සම්බන්ධයෙන් රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා පවත්වා ඇත.
ජාතික වෘත්තීය සුදුසුකම ලබා ගැනීම සඳහා (NVQ) අයදුම් කිරීම පිළිබඳව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව සමඟ සාකච්ඡා කර අවශ්‍ය ක්‍රියාමාර්ග දැනටමත් ගෙන

				ඇත.	
5	2010 අංක 12 දරන ජාතික ශ්‍රම අධ්‍යයන ආයතන පනත 4 (උ) උපවගන්තිය ප්‍රකාරව ආයතනයේ අරමුණුවලට සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් සමාන අරමුණු සහිත, ශ්‍රී ලංකාවේ හෝ විදේශයක පිහිටි වෙනත් ආයතන සමඟ පුද්ගලයන් හුවමාරු කර ගැනීම හා පුහුණු කිරීම, පර්යේෂණ හා උපදේශක සේවා පිළිබඳ සහ සාමාන්‍යයෙන් ඔවුනොවුන්ගේ පොදු අරමුණු ඉදිරියට ගෙන යාම පිණිස විය හැකි යම් කාර්ය සඳහා ගිවිසුම්වලට ඇතුලත් වීම සිදුකල යුතු වුවත් එසේ සිදුකර නොතිබුණි.	2021 – 154(6) 1.6 (අ)(vi)	පනතේ සඳහන් අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කල යුතුය.	ඉන්දියාවේ විවිගිරි ජාතික කම්කරු ආයතනය සමඟ පැවති අවබෝධතා ගිවිසුම යාවත්කාලීන කිරීම සඳහා සාකච්ඡා කර ඇති අතර ඉදිරියේදී ඒ සඳහා අවශ්‍ය අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව ගිවිසුමට එළඹීමට කටයුතු කරනු ඇත.	අවබෝධතා ගිවිසුමක් සකස්කර නිරීක්ෂණ සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇත.
6	2010 අංක 12 දරන ජාතික ශ්‍රම අධ්‍යයන ආයතන පනත 16 (1) උපවගන්තිය ප්‍රකාරව මේ පනත යටතේ කර්තව්‍ය ඉටු කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය තාක්ෂණික කමිටු යම් සංඛ්‍යාවක් මණ්ඩලය විසින් පත්කරනු ලැබිය හැකි වුවද ඊට අනකූලව එවැනි කමිටු පත්කර නොතිබුණි.	2021 – 154(6) 1.6 (අ)(vii) 2022 – 154(6) 1.6 (අ) (iii) 2023 – 154(6) 1.5 (ආ)	පනතේ සඳහන් අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කල යුතුය.	පනතේ ඉදිරි අනාගත අවස්ථා හා ආයතනයේ ඉදිරි පුළුල් වීමත් සමඟ සිදු කළ යුතු කරුණු සම්බන්ධයෙන් මෙවන් ප්‍රතිපාදන සලසා දී තිබුණ ද මේ දක්වා එවැන් අවශ්‍යතාවයක් පැන නොනැගී ඇති බැවින් මණ්ඩලය විසින් තාක්ෂණික කමිටු පත් කර නොමැත. ඉදිරි කාලයේ දී ආයතනයේ කටයුතු පුළුල් කිරීමට තරම් වූ මූල්‍ය හැකියාවක් ලද විට හා අවශ්‍යතාවය මත	මූල්‍ය හැකියාව සහ පාලක මණ්ඩල උපදෙස් මත ඉදිරියේදී සිදු කිරීමට අපේක්ෂිතයි.

				පාලක මණ්ඩලය විසින් ලබා දෙන උපදෙස් මත පනතේ මෙම වගන්ති ප්‍රකාරව තාක්ෂණික කමිටු පත් කිරීම ඉදිරියේ දී සිදු කරනු ඇත.	
7	2010 අංක 12 දරණ ජාතික ශ්‍රම අධ්‍යයන පනතේ 5 (1) හා (2) වගන්ති ප්‍රකාරව පනතේ විධිවිධාන ප්‍රකාරව ආයතනයේ කටයුතු පරිපාලනය, කළමණාකරණය හා පාලනය ආයතනයේ පාලක සභාව වෙත පැවරී ඇත. ආයතනයේ කටයුතු පරිපාලනය කිරීම සඳහා පනත මගින් පාලක සභාව වෙත පැවරී ඇති, නියම වී ඇති හෝ භාරවී ඇති බලතල කාර්යය සහ කර්තව්‍ය ක්‍රියාවේ යෙදවීමට අදාලව, 2022 හා 2023 වර්ෂවල ආයතනයේ පාලක මණ්ඩලය රැස්වී තිබුණේ පිළිවෙලින් එක් වරක් හා දෙවරක් පමණි.	2023 – 154(6) 1.5 (අ)	පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.	ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ 2022 වර්ෂය සඳහා පත් කර තිබූ පාලක මණ්ඩල සාමාජිකයන් ඉල්ලා අස් වී ඇති බැවින් 2022.06.02 දිනට නව පාලක මණ්ඩලයක් පත් කරදෙන ලෙස හා පාලක මණ්ඩලය සඳහා නිල බලයෙන් පත්වන උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ සාමාජිකයා පත්කර දෙන ලෙස ආයතනය විසින් කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය වෙත දන්වා යවා ඇත. කරුණු එසේ වුවත් ආයතනයේ පනතෙහි මණ්ඩලයේ රැස්වීමක් සඳහා ගණපූර්ණය සාමාජිකයන් පස්දෙනෙකු විය යුතු බව දක්වා ඇති බැවින් පාලක මණ්ඩල සභාපතිතුමන් හා අනෙකුත් නිල බලයෙන් යුතු	2024 වර්ෂයේදී රැස්වීම් වාර 02 ක් පමණක් පවත්වා ඇත.

				සාමාජිකයන් පස්දෙනෙකුගේ ගණ පූර්ණයෙන් යුතුව 2023 වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩල රුස්වීම් 02ක් පවත්වා ඇති බව.	
8	2023 දෙසැම්බර් 11 දිනැති අංක 04/2023 දරන පොදු ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව 2023 වර්ෂයේදී කාර්ය මණ්ඩලය සඳහා ප්‍රසාද දීමනා / දිරිදීමනා ගෙවීමට පෙර 2022 වර්ෂයේ ලාභයෙන් සියයට 30 ක මුදලක් භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කල යුතු වුවද, එසේ සිදුකිරීමෙන් තොරව ප්‍රසාද දීමනා වශයෙන් රු.325,000 ක් ගෙවා තිබූ අතර භාණ්ඩාගාරය වෙත ගෙවිය යුතු රු.2,315,712 ක මුදල ගෙවිය යුතු ශේෂයක් ලෙස දක්වා තිබුණි.	2023 – 154(6) 1.5 (ඉ)	පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.	2023 වර්ෂය සඳහා භාණ්ඩාගාරය වෙත ගෙවිය යුතු රු.2,315,712.00 මුදල ගෙවීමට අවශ්‍යය කටයුතු සූදානම් කර ඇති අතර අදාල ගෙවීම් කළ යුතු බැංකු ගිණුම් පිළිබඳ සනාථ කර ගැනීම සඳහා මහා භාන්ඩාගාරය වෙත දැණුම් දී ඇති අතර කඩිනමින් ගෙවීම් කිරීමට කටයුතු කරනු ඇත. 2023 වාර්ෂික ගිණුම් යටතේ ඒ බව දක්වා ඇති බව.	භාණ්ඩාගාරය වෙත ගෙවීම් සිදුකර නොමැත.
9	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාගෝපදේශ සංග්‍රහය -2006 ප්‍රකාරව විධිමත් ඇස්තමේන්තු සකස් කර පරීක්ෂාවන් සිදුකිරීමකින් තොරව, අලුත්වැඩියාවන් සිදුකරන ලද වායුසමීකරණ යන්ත්‍රවලට අදාල විස්තර පවත්වා ගැනීමකින් තොරව හා අලුත්වැඩියාව නිසි පරිදි ඉටුවී තිබේද යන්න සහතික වීමකින් තොරව 2023 වර්ෂයේ අවස්ථා 07 කදී	2023 – 154(6) 1.5 (ඉ)	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කල යුතුය.	අලුත්වැඩියාව නිවැරදි බව සහතික කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි. එය NILS/AD/03/21/03 (PRO) ගොනුවේ ගොනු ගත කර ඇත. ඉදිරියේදි ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඇරඹීමට පෙර නිසි පරිදි ප්‍රසම්පාදන ලියවිලි සකසමින් කටයුතු නිසි පරිදි සිදු කරන බව දන්වා සිටින අතර මෙම වායු	අලුත්වැඩියා කරන ලද නමුත් අක්‍රීය තත්ත්වයේ පවතින යන්ත්‍ර නැවත අලුත්වැඩියා සිදුකරගෙන නොමැත.

	වායුසමීකරණ යන්ත්‍ර අලුත්වැඩියාව සඳහා රු.1,096,250 ක් වැයකර තිබුණි. නව වායුසමීකරණ අලුත්වැඩියාව සඳහා තෝරාගත් සැපයුම්කරු හැර ඉතිරි අයවලුන්ගේ මිල ගණන් ව්‍යාජ ලෙස සකසා ඉදිරිපත් කර තිබූ බව විගණනයේදී අනාවරණය වූ අතර සියලු උපාංග යොදා රු.481,825 ක් වැය කර අලුත්වැඩියා කරන ලද වායුසමීකරණ යන්ත්‍ර දෙකක් නැවත රු.91,075 ක් වැයකර අලුත්වැඩියා කර තිබුණද අදාල යන්ත්‍ර අක්‍රීය තත්ත්වයේ පැවතුණි.			සමීකරණ යන්ත්‍ර නඩත්තු කිරීම ආයතනයේ හදිසි අවශ්‍යතාවය මත සිදු කිරීමට සිදු වූ බවද එම වර්ෂය තුළ ආයතනය වෙත විශාල වැය බරක් දරමින් නව යන්ත්‍ර මිලදී ගැනීමට හැකියාවක් නොවූ බව.	
10	ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ 2021/2022 වර්ෂයන්හි වාර්ෂික වාර්තා පිටපත් 25 ක් මුද්‍රණයට හා මෘදු පිටපත් 6 ක් සඳහා රු.522,930 ක් වැය කර තිබූ අතර, මුද්‍රණ කාර්යය සිදු කිරීමේදී Offset ක්‍රමයට සිදුකිරීමේ එකඟතාවය මත ඇනවුම් භාරදී තිබුණද, එකී ක්‍රමවේදයෙන් බැහැරව Digital ක්‍රමයට මුද්‍රණය කරන ලද මුද්‍රිත පිටපත් සඳහා ගෙවා තිබූ අතර, 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාවේ පිටකවරයද නිසි ප්‍රමිතියෙන් තොර බව නිරීක්ෂණය විය.	2023 – 154(6) 3.1 (ආ)	ප්‍රසම්පාදනයන් කාර්යක්ෂම ලෙස සිදුකල යුතුය.	ඉදිරියේදී සියලුම මුද්‍රණ කටයුතු නියමිත ප්‍රමිතියට සිදු කර ඇත්ද යන්න තහවුරු කර ගැනීමෙන් පසු ගෙවීම් කිරීමට කටයුතු කරන බව.	වැඩිපුර ගෙවීම් කරන ලද මුදල් අයකිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොමැත.
11	ආයතනය ස්ථාපිත කිරීමේ අරමුණ ඉටුකර ගැනීම සඳහා 2020 ජූලි මාසයේදී පර්යේෂණ ප්‍රකාශන හා	2023 – 154(6) 3.2	අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කල	ව්‍යාපාර ප්‍රවර්ධන නිලධාරි තනතුරට බඳවා ගැනීම් කටයුතු සඳහා	පර්යේෂණ ප්‍රකාශන හා ව්‍යාපෘති අංශයේ කටයුතු මෙතෙක් ඉටුවී නොමැත.

ව්‍යාපෘති අංශයක් ස්ථාපිත කර තිබුණද, විගණිත දින දක්වා අදාල අංශයට විධිමත් ලෙස නිලධාරියකු අනුයුක්ත කර නොතිබීම හේතුවෙන් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට එය අහිතකර ලෙස බලපා තිබුණි.	යුතුය.	ඇබෑර්තු නිවේදනය සකස් කර අමාත්‍යාංශ ලේකම්තුමාගෙන් අනුමැතිය ලබාගෙන ඇති අතර කඩිනමින් එය කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ, කම්කරු දෙපාර්තමේන්තුවේ හා ජාතික ශ්‍රම අධ්‍යයන ආයතන වෙබ් අඩවි වල පළ කිරීමට නියමිත අතර ඉන් අනතුරුව සුදුසු නිලධාරියෙක් තෝරාගෙන එම තනතුර සඳහා බඳවා ගැනීමට නියමිත බව.

3.26 ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	14,873,178	339,579	14,533,599	183,179	තත්ත්වාගණනය නොකළ
2022	96,488,346	156,000	96,332,347	81,537,169	තත්ත්වාගණනය නොකළ
2023	244,076,766	158,700	243,918,066	147,747,119	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	1996 අංක 28 දරන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ **I** වන කොටසේ 2 වන වගන්තිය ප්‍රකාරව ආබාධ සහිත තැනැත්තන් සඳහා ජාතික සභාවක් පිහිටුවා තිබුණි. 2023 වර්ෂයේදී ජාතික සභාව විසින් ආබාධ සහිත භාවය පිළිබඳ ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රියාකාරි සැලැස්ම සැකසීම, ආබාධිතත්වකළමනාකරණ තොරතුරු පද්ධතිය **(DMIS)** සැකසීම, ආබාධ සහිත තැනැත්තන් සඳහා සුදුසු රක්ෂණ ක්‍රමවේදයක් සකස් කිරීම ඇතුලුව ගනු ලැබූ වැදගත් තීරණ ක්‍රියාත්මක කිරිමට මේ දක්වා නොහැකි වී තිබුණි.	2021 2022 2023	අබාධිත ප්‍රජාවගේ තොරතුරු ඇතුලත් දත්ත පද්ධතියක් පිළියෙල කිරීමට කටයුතු කල යුතුය.	2024 වර්ෂය තුළ ආබාධ සහිතභාවය පිළිබඳ ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර අවසන් කිරීමට නියමිත බව හා සමාජ සේවා දෙපාර්තමේන්තුව සමඟ සිදුකරන සමීක්ෂණ හරහා ලබා ගන්නා දත්ත හා එකී තොරතුරු ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලය සමඟ බෙදා ගැනීමට නියමිත බවත් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව හා ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික සභාව අතර ආබාධ සහිත තැනැත්තන් උදෙසා රක්ෂණයක් ලබා දීම සම්බන්ධව සාකච්ඡාවක්	මේ දක්වා ක්‍රියාත්මක කර නොමැත.

				පැවැත්වූ බව.	
2	2022 දෙසැම්බර් 31 දිනට සුපිරි වාසනා සම්පත ලොතරැයි ආදායමෙන් ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික අරමුදලට ලැබිය යුතු මුදල රු. 82,597,195 ක් වුවත්, සමාලෝචිත වර්ෂයේදී ඉන් රු. 24,050,000 ක් පමණක් ලබාදී තිබුණි. තවද සමාලෝචිත වර්ෂයට අදාලව සුපිරි වාසනා සම්පත ලොතරැයි ආදායමෙන් කිසිදු මුදලක් ජාතික මහලේකම් කාර්යාලයට ලැබී නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුදල රු.225,104,617 ක් විය. මේ හේතුවෙන් අබාධ සහිත තැනැත්තන් සඳහා නිවාස ආධාර වැඩසටහනේ අරමුණ නිසියාකාරව සාක්ෂාත් කර ගැනීමට නොහැකි වී තිබුණි.	2021 2022 2023	අරමුදලේ අරමුණු ඉටුවන ආකාරයට උපරිම කාර්යක්ෂමතා වයෙන් කටයුතු කළ යුතු අතර මුදල් ලබා ගැනීම් නිසි පරිදි කල යුතුය	මිය යාම, පදිංචිය හැර යාම, පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව, නිවාස සංවර්ධන අධිකාරිය හා ස්වෙච්ඡා ආයතන ආදී ආයතන මගින් නිවාස තනා දීම නිවාස ආධාර ප්‍රතික්ෂේප කිරීම ආදී හේතූන් මත නිවාස ආධාර ප්‍රතික්ෂේප වී නැවත ලැබුණු මුදල් වලින්ද නැවත නිවාස ආධාර ලබා දීම ඉදිරියේ දී සිදු කරනු ලබන බව.	මේ දක්වා ලොතරැයි ආදායම් නියමිත පරිදි අරමුදලට ලැබී නොතිබුණි.

3.27 ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	බදු පෙර ලාභය (අලාභය) රු.	මතය
2021	3,017,103,138	2,927,066,208	90,036,930	(841,077)	තත්ත්වාගණනය කළ
2022	3,703,509,028	3,595,647,837	107,861,191	(213,698)	තත්ත්වාගණනය කළ
2023	168,321,665	40,467,635	127,854,030	(16,039,452)	තත්ත්වාගණනය නොකළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපතිගේ නිරිදේශය	විගණිත ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ගය	වාර්තාවේ දිනට නිරිදේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	අධ්‍යක්ෂවරයාගේ නිල රථය ලෙස භාවිතා කළ ගත්මිල වටිනාකම රු.5,795,000ක් වූ කාර් රථය , අධ්‍යක්ෂවරයා විසින්ම පැදවීම සිදුකර තිබියදී අනතුරට පත් වී ඉන් රථයේ ඉදිරිපසට සම්පූර්ණ වශයෙන් අලාභ හානි සිදුවී තිබුණි. අනතුර සිදු වී වසරකට ආසන්න කාලයක් ගතවී තිබුණ ද , ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික	2021	අනතුරෙන් සිදුවූ අලාභය පූර්ණය කර ගැනීමට හා අනතුරට වගකිව යුතු පාර්ශවයන් සඳහා විනය කටයුතු ක්‍රියාත්මක කළ යුතු වීම.	රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය පරිදි අධ්‍යක්ෂ සඳහා නිල රථයක් වෙන් කර ඇති අතර එම රථය ධාවනය කිරීමේදී අනතුරට පත් විය. අමාත්‍යාංශය විසින් පත්කරන ලද කමිටුවක් මඟින් මු.රෙ 104 පරීක්ෂණයක් සිදු කරමින් පවතී.පැවති අයහපත් ආර්ථික තත්වය මත අමතර කොටස් සපයා ගැනීම දුෂ්කර වීම නිසා අලුත්වැඩියාව සඳහා ඇස්තමේන්තු සකස් කර ගැනීම ගැටළුකාරී වූ අතර	මු.රෙ 104(4) ප්‍රකාරව විධිමත් පරීක්ෂණයක් සිදු කර අලාභ අය කර ගැනීමට මේ දක්වා කටයුතු කර නොමැති අතර මෝටර් රථය අළුත්වැඩියා කටයුතු අවසන් නොකර 2024 සැප්තැම්බර් 30 දින වන විටත් එක්තරා ගරාජයක ගාල් කර තිබුණි.

	සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ.104(3) පරිදි අනතුර පිළිබඳ විස්තර ඇතුලත් ප්‍රාරම්භක වාර්තාව හෝ ලබා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර අලාභයේ වටිනාකම නිශ්චිත ලෙස ගණනය කිරීම හා ඊට වගකිව යුතු පාර්ශවයන් සඳහා විනය කටයුතු ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන නොතිබුණි.			මේ වන විට ඒ සඳහා වන ඇස්තමේන්තුවක් ශ්‍රී ලංකා රක්ෂණ සමාගම වෙත යොමු කර රක්ෂණ සමාගමේ අනුමැතිය ලැබීමෙන් පසු කඩිනමින් අලුත්වැඩියා කටයුතු සිදු කර රථය ධාවනයට යෙදවීමට හැකි බව දැනුම් දෙමි	
2	කාන්තා, ළමා කටයුතු හා සමාජ ආරක්ෂණ අමාත්‍යාංශයට අයත් ජීප් රථය එම අමාත්‍යාංශයේ ධාවන කාලයේදී සිදුකළ අලුත්වැඩියා වෙනුවෙන් මහ ලේකම් කාර්යාලය විසින් අවිධිමත් ලෙස රු.1,585,521 ක් දරා තිබුණද ප්‍රමාණවත් ලෙස ධාවනයට යෙදවීම වෙනුවෙන් ජීප් රථය රඳවාගැනීමට හෝ වැයකළ අලුත්වැඩියා වියදම අයකර ගැනීමට හෝ කටයුතු	2021, 2022	වියදම් ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කලයුතුය.	මෙම මොන්ටේරෝ රථය ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ සංචිත වාහන වලට ගනු ලැබු අතර, පසුව කාන්තා ළමා කටයුතු හා සමාජ ආරක්ෂණ අමාත්‍යාංශ ලේකම්ගේ උපදෙස් පරිදි එම අමාත්‍යාංශයට වාහනය නැවත බාර දුනි. 2021 ජනවාරි 27 දින වැයවූ මුදල් කඩිනමින් ප්‍රතිපූර්ණය කරන ලෙස දන්වා අමාත්‍යාංශය වෙත ලිපියක්ද යොමු කර	වියදම් ප්‍රතිපූර්ණය කර ගැනීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි.

	නොකර, ජීප් රථය ආපසු භාරදීම තුලින් මහලේකම් කාර්යාලයට රු.1,585,521 ක පාඩුවක් සිදු වී තිබුණි. වර්ෂ 03 කට ආසන්න කාලයක් ඉකුත් වී තිබුණ ද , මහලේකම් කාර්යාලය විසින් දැරූ වියදම් ප්‍රතිපූර්ණය කර ගැනීමට අපොහොසත් වී තිබුණි.			ඇති අතර, මේ වනතෙක් ඒ සඳහා ප්‍රතිචාර නොදක්වා ඇති බව දන්වා සිටිමි.	
3	13 වන (ඊ) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව සභාවේ කාර්යයක් වූ වැඩිහිටියන්ගේ නිදහස, රැකවරණය, ආත්ම පරිපූර්ණත්වය, සහභාගීත්වය, අභිමානය සහතික කිරීම, අයිතිවාසිකම් ආරක්ෂා කිරීම උදෙසා වැඩසටහන් හා ව්‍යාපෘති ජාතික මට්ටමින් විනිවිදභාවයකින් හා විධිමත් ලෙස ප්‍රතිලාභ සමානාත්මනතාවය කින් යුතුව ලබාදීමට පහසුවන පරිදි ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් වැඩිහිටියන්ගේ සංඛ්‍යාව හා දිස්ත්‍රික්ක වශයෙන් ව්‍යාප්තිය, වයස් ව්‍යුහය, සෞඛ්‍ය	2021 ,2022 ,2023	පනතේ විධිවිධාන ප්‍රකාරව වැඩිහිටි ප්‍රජාවගේ තොරතුරු ඇතුලත් දත්ත පද්ධතියක් පිළියෙල කිරීමට කටයුතු කල යුතුය.	2023 ඔක්තෝබර් 01 සිට දත්ත පද්ධතියේ මූලික කටයුතු සිදුවෙමින් පවතින බව	2024 ඔක්තෝබර් 02 දින වන විට වැඩිහිටි තැනැත්තන්ගේ දත්ත පද්ධතිය වෙත වැඩිහිටි තැනැත්තන් 28,541 ගේ දත්ත ඇතුලත් කර තිබුණි.

	තත්ත්වය, ආර්ථික තත්ත්වය හඳුනාගැනීම හා නිශ්චිත, නිවැරදි හා ඵලදායී තීරණ ගැනීම සඳහා වැඩිහිටි ප්‍රජාවගේ තොරතුරු ඇතුලත් නිසි ලෙස සකසන ලද යාවත් කාලීන වූ දත්ත පද්ධතියක් පිළියෙල කර නොතිබුණි.				
4	වැඩිහිටි සමාජ ආරක්ෂණ අරමුදල සඳහා වැඩිහිටි දීමනාවෙන් අයකරගත් මුදල් ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් නැවත අරමුදල වෙත ලබාදිය යුතු වුවත් පසුගිය වර්ෂයට අදාලව ලැබිය යුතු රු.1,682,400 ක මුදල සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් අරමුදල වෙත ලබාදී නොතිබුණි.	2021, 2022 ,2023	ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් අයකල මුදල් කඩිනමින් අරමුදලට බැර කරවා කටයුතු කල යුතුය.	හිඟ මුදල් ගෙන්වා ගැනීමට තවදුරටත් ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බව.	මේ දක්වා මුදල් අරමුදලට බැර කර නොතිබුණි.
5	2017 අංක 24 දරන දේශීය ආදායම් පනතට හඳුන්වා දුන් 2021 අංක 10 දරන දේශීය ආදායම් සංශෝධන පනතේ III වන උපලේඛනය අනුව 2021 අප්‍රේල් 01 දිනෙන් පසුව සමිතියකට උපචිත වන ඒ සමිතිය විසින්	2023	පනත ප්‍රකාරව කටයුතු කර හිමිකම ලබාගැනීමට කඩිනමින් කටයුතු කල යුතුයි	මේ සම්බන්ධයෙන් අදාල නීතිමය තත්ත්වය පිළිබඳ තොරතුරු සොයා බලා කඩිනමින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව	හිමිකම් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

	උපයන ලද පොලිය ආදායම් බද්දෙන් නිදහස්වේ. ඒ අනුව වැඩිහිටි සමාජ ආරක්ෂණ අරමුදලේ ස්ථාවර තැන්පත් සඳහා වන පොලියෙන් බැංකු විසින් රඳවාගෙන ඇති සියයට 5 ක බදු මුදල නිදහස් කර ගැනීමට හැකි වුවත්, එම හිමිකම ලබාගැනීමට අරමුදලේ කළමනාකාරිත්වය කටයුතු කර නොතිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී කල්පිරුණු රු 2,941,701,428 ක් වූ ස්ථාවර තැන්පත් මත ලද පොලියෙන් රු 39,053,431 ක මුදලක් අරමුදලට බැර වී නොතිබුණි.				
6	අඩු ආදායම්ලාභී වැඩිහිටි ප්‍රජාවගේ විශේෂ හා හදිසි අවස්ථාවලදී සෞඛ්‍යය, පෝෂණය හා ආරක්ෂණ වැය දැරීම හා වැඩිහිටියන්ගේ සුභසාධනය අරමුණු කර වැඩිහිටි දීමනාව ලබන ප්‍රතිලාභීන්ගේ, එක් ප්‍රතිලාභියෙකුගෙන් එක් මාසයක් සඳහා රු. 100 බැගින් වැඩිහිටි දීමනාවෙන්	2023	අරමුදල ස්ථාපිත කිරීමේ අරමුණු ඉටුකර ගැනීමට කඩිනමින් කටයුතු කල යුතුය.	රට තුළ පැවැති සමාජ, ආර්ථික දේශපාලනික කාරණා හේතුවෙන් අපේක්ෂිත ප්‍රතිඵල ළඟා කර ගත නොහැකි වූ බව	මෙතෙක් අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කර නොමැත.

අයකර වැඩිහිටි සමාජ ආරක්ෂණ අරමුදල පිහිටුවීමට 2016 සැප්තැම්බර් 07 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණි. ඒ අනුව අරමුදල පිහිටුවූ 2016 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා එක් වැඩිහිටියකුගෙන් රු 100 බැගින් වැඩිහිටි දීමනාවෙන් අයකර රු. මිලියන 3,870.2 ක් අරමුදල් සම්පාදනය කරගෙන තිබුණි. අරමුදලේ කාර්යයන් 10 ක් මුල්කර ගෙන රැස්කරනු ලැබූ මෙම අරමුදලෙන් 2016 සිට 2018 වර්ෂය දක්වා කිසිඳු වැඩසටහනක් ක්‍රියාත්මක කර නොතිබුණි. ඒ අනුව වර්ෂ 7 ක් සඳහා මුළු දායකය රු මිලියන 3,870.2 ක් වන අතර එම කාලය සඳහා සුභසාධන වියදම රු මිලියන 1468.6කි. නමුත් ආයෝජනය රු. මිලියන 3546.9 කි එය ප්‍රතිශතයක් ලෙස සියයට 91.6 කි. මේ අනුව මෙම අරමුදලේ අරමුණ වැඩිහිටියන්ගේ සුභ සාධනය වෙනුවෙන් අරමුදල යොදා

	ගැනීම ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය විය.				
7	2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 5.4.4 (i) වගන්තිය පරිදි පිළිගත හැකි අත්තිකාරම් ගෙවීමේ සුරක්ෂණයක් ඉදිරිපත් කිරීම මත, කොන්ත්‍රාත් මුදලින් සියයට විස්සක (20%) උපරිමයක් අත්තිකාරම් ලෙස 2022 මාර්තු 28 හා 2022 මැයි 18 දිනයන්හි රු. 58, 806, 933 ක මුදලක් අත්තිකාරම් ලෙස මුදාහැර තිබුණි. නමුත් ඊට අමතරව උක්ත අත්තිකාරම් මුදලෙන් 2022 දෙසැම්බර් 28 දිනට රු. 41, 600, 046 ක් නොපියවා තිබියදී නැවත 2022 දෙසැම්බර් 28 දින රු. 35,949,264 ක මුදලක් ද්‍රව්‍ය අත්තිකාරමක් ලෙස මුදාහැර තිබුණි. 2024 ජනවාරි 29 දින එනම් විගණිත අවස්ථාව වන විටත් උක්ත මුදල් මුදාහැර වසරකට වැඩි කාලයක් ගත වී තිබුණද එම අත්තිකාරම් මුදල් භාවිතා කර ඊට	2023	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කල යුතුය.	අත්තිකාරම් මුදල කොන්ත්‍රාත්කරු වෙත සපයනු ලැබුවේ එවකට රටේ පැවති ආර්ථික අස්ථාවරත්වය මත ව්‍යාපෘතිය අතරමග නතරවීම වලක්වා ගැනීමේ අරමුණින් ටයිල්, වැසිකිලි සනීපාරක්ෂක උපකරණ හා සවිකිරීම සහ විදුලි සෝපානය යන අයිතම මිලදී ගැනීම සඳහා අවශ්‍ය මූල්‍ය පහසුකම් ලබා දීමට පමණක් වන බව.	තවදුරටත් රු.4.8 ක් පියවීමට ඇත.

	අදාල වැඩ විෂයයන් වල අදාල වැඩ නිමකර නොතිබුණි. අත්තිකාරම් මුදල් ලබා දීමෙන් මාස 05 කට පසු එම මුදලින් කොටසක් උපයෝගී කර ගනිමින් පළමු ටයිල් තොගය 2023 ජුනි 02 දින මිලදී ගෙන තිබුණි. පසුව වරින් වර ටයිල් මිලදී ගෙන තිබූ අතර අවසන් ටයිල් තොගය 2024 ජනවාරි 05 වන දින මිලදී ගෙන තිබුණි. විගණිත දිනය වන 2024 ජනවාරි 29 දින වන විටත් ටයිල් වලින් වැඩි ප්‍රමාණයක් භාවිතයට නොගෙන ගොඩ ගසා ඇති බව නිරීක්ෂණය විය. ඒ අනුව කොන්ත්‍රාත්කරු විසින් ඉතිරි වූ රු.18,369,827 ක අත්තිකාරම් මුදලක් වසරකටත් වැඩි කාලයක් තිස්සේ රඳවාගෙන තිබුණි				
8	වැඩිහිටි සමාජ ආරක්ෂණ අරමුදලේ ප්‍රතිපාදන මත කතරගම වැඩිහිටි නිවාසය ඉදිකිරීම පුද්ගලික ආයතනයට රු. 298,684,667 ක බදු රහිත මුදලකට පවරා තිබුණි. ගිවිසුම් ප්‍රකාරව	2023	ව්‍යාපෘති නියමිත කාලය තුල ගිවිසුම ප්‍රකාරව කඩිනමින් ඉටුකර ගැනීමට කටයුතු කල යුතුය.	මෙම ව්‍යාපෘතිය පශ්චාත් කොවිඩ් සමයේ බලපෑම්, ඉන්ධන හිඟකම, ,දීර්ඝ විදුලිය කප්පාදුව, වරින් වර පනවන ලද සංචරන සීමා සහ ජනතා අරගල වැනි අතිවිශේෂ තත්වයන් ඇතිවූ කාල	2024 අගෝස්තු 15 වන දින දක්වා කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර තිබුණද ඉදිකිරීම් අවසන් කර භාර දී නොතිබුණි.

	මෙම කර්මාන්තය 2022 මාර්තු 15 දින ආරම්භවී 2023 සැප්තැම්බර් 12 දින නිම කළ යුතුව තිබුණි. පළමු කාලය දීර්ඝ කිරීම 2023 සැප්තැම්බර් 12 සිට 2023 නොවැම්බර් 27 දක්වා ඉල්ලා තිබූ අතර එය දින 76 කින් අවසන් කිරීමට නියමිත විය. නමුත් එදිනට වැඩ අවසන් නොවීම හේතුවෙන් දෙවන කාලය දීර්ඝ කිරීම 2024 මාර්තු 31 දක්වා දින 125 ක් කොන්ත්‍රාත්කරු විසින් ඉල්ලා තිබුණද වැඩිහිටි මහලේකම් කාර්යාලය විසින් 2024 ජනවාරි 31 දක්වා දින 65 ක කාලය දීර්ඝ කිරීමක් ලබා දී තිබුණි. ඒ අනුව කොන්ත්‍රාත් කාලය නිම වී තිබුණත් කර්මාන්තයෙන් අඩක්වත් එදිනට නිම කර නොතිබුණි.			පරාසයක ක්‍රියාත්මක වූවක් බැවින් ව්‍යාපෘතිය සඳහා එය සැලකිය යුතු බාධාවක් වුවත් ඒවා ගණනය කිරීමට සම්මත ක්‍රමවේදයක් නොමැති බැවින් එමගින් ඇතිවූ ප්‍රමාදයන් නොසලකා හැරීමට සිදුවූ බව	
9	රු. 51,713,000 ක් වූ ඉඩම් හා ගොඩනැඟිලි, රු. 15,381,188 ක් වූ වත්කම් (ඉන්වෙන්ට්‍රි) වලින් සමන්විත වායු සමීකරණය කරන ලද කාමර 6 කින් යුත් සංචාරක	2023	ලැබෙන අරමුදල් වැඩිහිටි සුභ සාධනය සඳහා යොදා ගත යුතු අතර නිලධාරියන්ට නිවාසය ලබා දීම ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව සිදු කළ යුතුය.	කොවිඩ් වසංගත තත්වය පවතින කාල සීමාවේදී සංචාරකයන් හට මෙම සංචාරක නිකේතනය ලබා නොදීම නිසා හා නිල නිවාසය සම්පූර්ණයෙන් කඩා ඉවත් කල නිසාත්	අදාල අය කිරීම් මේ දක්වා සිදු කර නොමැති අතර තවදුරටත් නිලධාරීන් විසින් සංචාරක බංගලාව පරිහරණය කරනු ලබයි

බංගලාව කතරගම පූජා නගරයට ආසන්නයේ මැණික් ගඟ අසල ඉතාමත් සුන්දර ස්ථානයක පිහිටා ඇත අතර සංචාරකයින්ගේ ආකර්ෂණය නොඅඩුව ලබා ගත හැකි මෙම ස්ථානය වසර 2 ක පමණ කාලයක සිට කිසිදු ආදායමක් උපයා ගෙන නොතිබුණි. වැඩිහිටි නිවාසයට අනුයුක්ත කර ඇති වැඩිහිටි මහ ලේකම් කාර්යාලයේ නිලධාරින් විසින් උඩුමහල සම්පූර්ණයෙන්ම හා පහත මහලේ කාමරයක සිය පවුලේ සාමාජිකයින්ද සමඟ වාසය කිරීම ආදායම අහිමි වීමට ප්‍රධාන හේතු වී තිබුණි. නියැදි පරීක්ෂාවට ලක් වූ 2023 වර්ෂයේ ජූලි ,අගෝස්තු හා සැප්තැම්බර් යන මාස 03 ක සංචාරක නිවාසයේ විදුලිය හා ජලය පරිහරණය වෙනුවෙන් වියදම රු 143,799 ක් වුවද සංචාරක නිවාසයේ දැනට පදිංචි නිලධාරීන්ගෙන් කිසිදු මුදල් අයකිරීමකින් තොරව සංචාරක බංගලාව සිය නිල නිවාසයේ සිය පවුලේ සාමාජිකයන් සමඟ ජීවත්ව සිටි බැවින් සිය පවුලේ සාමාජිකයන් ද සමඟ වාසය කිරිමට ලබා දී ඇත.

එම නිවාසයේ නිලධාරින්ගේ භාවිතය සඳහා ලබා දුන් දින සිටම සමාජ ආරක්ෂණ අරමුදලින් හෝ රාජ්‍ය අරමුදල් යොදා ගෙන ජල හෝ විදුලි බිල්පත් කිසිවක් ගෙවීම හෝ ප්‍රතිපූර්ණය කර නොමැති බව.

	පරිහරණය සඳහා ලබා දී තිබුණි.				
10	පනතේ 1 කොටසේ 2 වගන්තිය ප්‍රකාරව වැඩිහිටි තැනැත්තන් සඳහා ජාතික සභාව පිහිටුවා තිබුණි. නියැදි පරීක්ෂාවට ලක් වූ පසුගිය හා සමාලෝචිත වර්ෂ වලදී ජාතික සභාව විසින් වැඩිහිටි තැනැත්තන් සඳහා වන ජාතික ප්‍රතිපත්තියක් සැකසීම, වැඩිහිටි සෞඛ්‍ය රක්ෂණ වැඩසටහනක් සකස් කිරීම, සියළුම වැඩිහිටි නිවාස සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලියාපදිංචි කර අවසන් කිරීම, වැඩිහිටි සත්කාරක සේවා පුහුණු වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම, මානසික රෝගී වැඩිහිටියන් සඳහා උපදේශ සේවාවන් සැපයීම ආදී වශයෙන් ගනු ලැබූ වැදගත් තීරණ මෙම වාර්තාවේ දිනය දක්වා ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි.	2023	ජාතික සභාව ගත් තීරණ කඩිනමින් ක්‍රියා මාර්ග ගෙන ක්‍රියාත්මක කළ යුතුය.	ජාතික වැඩිහිටි ප්‍රතිපත්තියෙහි කෙටුම්පත සකස් කරමින් පවතින බවත්, රක්ෂණාවරන වැඩසටහනේ මූලික කටයුතු සිදුකරමින් පවතින බවත්,2024 සැප්තැම්බර් 30 දිනට පෙර සියළුම වැඩිහිටි නිවාස ලියාපදිංචි කල යුතු බවට තීරණය කිරීම, වැඩිහිටි සත්කාරක පුහුණු වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සඳහා අදාල ආයතන වල සහතික ලබාදීම හා පිළිගැනීම සම්බන්ධ ගැටළු ඇති වූ බව හා මානසික රෝගී වැඩිහිටියන් සඳහා උපදේශන සේවාවන් සැපයීම සඳහා අමාත්‍යාංශයෙන් ද විමසීම් සිදුකරන ලෙස අංගොඩ මානසික රෝහලෙන් දන්වා ඇති බව.	වැඩිහිටි ජාතික ප්‍රතිපත්ති කෙටුම්පත සකස් කිරීමින් පවතී. වැඩිහිටි සෞඛ්‍ය රකෂණය සඳහා රක්ෂණ සමාගම් ගිවිසුම සකස් කරමින් පවතින බව. වැඩිහිටි නිවාස 118 ක් ලියාපදිංචි කර ඇති බව. අනෙකුත් කටයුතු ක්‍රියාත්මක කර නොමැත.

11	පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව සභාවේ ප්‍රධාන කර්තව්‍යය විය යුත්තේ ශ්‍රී ලංකාවේ සිටින වැඩිහිටි තැනැත්තන්ගේ සුභසාධනය හා අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම හා ආරක්ෂා කිරීම සහ වැඩිහිටි තැනැත්තන්ට ආත්ම ගෞරවයත්, ස්වාධීනත්වයත් හා ගරුත්වයක් ඇතිව ජීවත්වීම සඳහා ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය විසින් වැඩිහිටි තැනැත්තන් සඳහා වන ජාතික ප්‍රතිපත්තියක් සැකසීමට 2016 වර්ෂයේදී ලද ප්‍රදාන රජයේ වාර්ෂික රු.2,438.715ක් වැයකර ඇතත් ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීමේ කටයුතු සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වාම ක්‍රියාත්මක කර නොතිබුණි. ඉතිරි රු.1,807,092 ක්වූ මුදල පොදු තැන්පත් ගිණුමේ වර්ෂ 07 ක පමණ කාලයක සිට නිශ්කාර්යව රඳවාගෙන තිබුණි.	2023	පනතේ විධිවිධාන ප්‍රකාරව වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම කඩිනම් කිරීමට කටයුතු කලයුතුය	ජාතික ප්‍රතිපත්තිය නැවත සංශෝධනය කිරීම සිදු කරන අතර අවසන් කෙටුම්පත මාස 03ක් ඇතුලත සකස් කර ලබා දීමට නියමිත බව .	ජාතික ප්‍රතිපත්තිය මේ දක්වා ක්‍රියාත්මක කර නොමැත.

3.28 ජාතික සමාජ සංවර්ධන ආයතනය

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	බදු පෙර ලාභය (අලාභය) රු.	මතය
2021	204,760,879	55,085,124	149,675,755	14,190,332	තත්ත්වාගණනය කළ
2022	228,424,388	35,714,258	192,710,130	21,762,788	තත්ත්වාගණනය නොකළ
2023	321,841,068	37,783,974	284,057,094	12,241,680	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපතිගේ නිර්දේශය	විගණිත ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ගය	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	පුහුණු අංශය විසින් ගාස්තු අයකිරීමේ ඩිප්ලෝමා වැඩසටහන් පැවැත්වීම සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය. (අ) ආයතනය විසින් අධ්‍යයන වර්ෂ 04 ක් තුලදී ගාස්තු අය කල ඩිප්ලෝමා පාඨමාලා සඳහා ලියාපදිංචි සිසුන් සංඛ්‍යාවෙන් සියයට 10 සිට සියයට 21 අතර ප්‍රමාණයක් පාඨමාලාව අතහැර ගොස් තිබුණි.	2022	පාඨමාලා හැරයාමට පෙර සිසුන් රඳවාගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.	2019 වර්ෂයේ යාපනය, තලාව, නුවර සහ අම්පාර යන දිස්ත්‍රික්කයන්හි ආරම්භ කරන ලද පාඨමාලාවන්හි නියමිත කාලවකවානුව තුළ පංති කාමර දේශන අවසන් කළ නමුදු ක්ෂේත්‍ර පුහුණුව නියමිත කාල සීමාව තුළ අවසන් කිරීමට නොහැකි විය. නමුත් 2022 වර්ෂයේ පාඨමාලා අවසන් කරන අවස්ථාවේ එම	මේ සඳහා දැනට ක්‍රියාමාර්ග දෙකක් ගෙන තිබුණද පාඨමාලා හැර යන සංඛ්‍යාව වැඩි වී තිබුණි.

(ආ) වසර 02 සිට 05 දක්වා වූ කාල පරාසයකට අයත් ලැබිය යුතු පාඨමාලා ගාස්තු වශයෙන් රු.5,450,650 ක මුදලක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	ලැබිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කල යුතුය.	වර්ෂයට අදාළ සහතික ප්‍රදානොත්සවය පවත්වා අවසන් බැවින් 2023 වර්ෂයේ පැවති සහතිකපත්‍ර ප්‍රධානෝත්සවයේ දී සහතිකපත්‍ර ප්‍රධානය කරන ලදී. පාඨමාලාවන්හි අධ්‍යයන කැලැන්ඩර් වලට අනුව දේශන පැවැත්වීම හා ක්ෂේත්‍ර පුහුණුව කල්පමා කිරීමට සිදුවිය. නමුත් එසේ ප්‍රමාදවූ පාඨමාලාවල සියළු කටයුතු අවසන් කර සිසුන් සහතික පත්‍ර ප්‍රදානය ද පවත්වා අවසන් කර ඇත. ශිෂ්‍ය ලියාපදිංචියෙන් අධ්‍යයන වර්ෂ 02 ක් දක්වා පාඨමාලාව සම්පූර්ණ කරගැනීමට නොහැකි වූ සිසුන් සඳහා නැවත වතාවක් පාඨමාලාව සම්පූර්ණ කිරීමට මෙම පාඨමාලාවේ අතුරු ව්‍යවස්ථාව අනුව අවකාශ සලසා දී ඇත. දැනට පාඨමාලාව හැර ගිය සිසුන්ගේ	ලැබිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කර නොමැත.

				මුදල් ලැබී නොමැති බැවින් තත්‍ය තත්ත්වය සඳහා වැය ලේඛණ සකස් කිරීමට කටයුතු සිදු කර ඇත.	
2	1992 අංක 41 දරන ජාතික සමාජ සංවර්ධන පනතේ 2 වන වගන්තිය ප්‍රකාරව පිහිටුවා ඇති ජාතික සමාජ සංවර්ධන අරමුදල සඳහා ආයතනය විසින් මුදල් අය කර පවත්වා ගෙන යනු ලබන පාඨමාලාවලින් සියයට 20 ක් අරමුදලට වාර්ෂිකව එකතුවේ. වර්ෂයේ ගිණුම්ගත කර තිබූ රු. 8,012,324 ක මුදල 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 හි 11 කොටසේ 7 වන පරිච්ඡේදයේ 7.1.4 ඡේදය ප්‍රකාරව ආයතනයේ යටිතල පහසුකම් සංවර්ධන කටයුතු සඳහා යෙදවිය හැකිව තිබුණත් එම මුදලින් රු. 3,452,202 ක් එනම් සියයට 43 ක් පමණක් ඩිජිටල්කරණ වැඩසටහනකට සහ තත්ත්ව සහතික වීමේ වැඩසටහන වෙනුවෙන් වැය කර තිබුණි. 2021 හා පසුගිය වර්ෂයන්හි දී පිළිවෙලින් පාඨමාලා	2023	පනත් හා චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.	ආයතනයේ අරමුදලින් 2023 දෙසැම්බර් 31 වන විට ඉතිරිව ඇති රුපියල් 13,622,201/- ක මුදලින් වියදම් දැරීම සඳහා 2024 ක්‍රියාකාරී සැලැස්ම මගින් තත්ත්වසහතිකකරණය, ඩිජිටල්කරණය හා ජාලගතකරණය සඳහා රුපියල් මිලියන 17.528 ක ප්‍රතිපාදන වෙන්කර ඇත. මෙම වියදම් ආයතන අරමුදලේ ඉතිරිව ඇති මුදලට අමතරව 2021 වර්ෂයේ දී පාලක සහා උපදෙස් මත පාඨමාලාවල අතිරික්ත ආදායමෙන් ස්ථාවර තැම්පතු ලෙස ආරම්භකර ඇති රු. මිලියන 25 ක මුදලින්ද වියදම් දැරීමට නියමිත බව.	සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක වෙමින් පැවතුණද ප්‍රමාණවත් ප්‍රගතියක් ලබා නොතිබුණි.

	ආදායමෙන් රු. 3,767,251 ක් හා රු. 465,529 ක් අරමුදලට මාරු කර තිබුණද ආයතනයේ යටිතල පහසුකම් සංවර්ධන කටයුතු වෙනුවෙන් මුදල් වැය කර නොතිබුණි. මේ නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31දිනට අරමුදල් ශේෂය රු.13,622,201 ක් දක්වා වර්ධනය වී ඌණ උපයෝජිතව පැවතුණි.				
3	ආයතනයට අයත් තක්සේරු වටිනාකම රු. 10,600,000 ක් වූ කැළණිය සිසු නේවාසිකාගාරය 2020 ජුනි මාසයේ සිට භාවිත කරමින් තිබූ භාණ්ඩ ද සමඟ වාර්තාවේ දිනය දක්වා නිශ්කාර්යව පැවතුණි. මෙම නේවාසිකාගාරය භාවිතයෙන් තොරව පැවති කාලය වසර 03 ක් ඉක්මවා තිබුණු අතර එය නිසි නඩත්තු කිරීමක් සිදු කර නොමැති බැවින් නේවාසිකාගාරය විනාශ වෙමින් පැවතුණද කළමනාකරණය විසින් මෙම දේපල පිළිබඳව කඩිනමින් සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කර නොතිබුණි.	2023	අදාල වත්කම කඩිනමින් ඵලදායි කාර්යයක් සඳහා යොදාගත යුතුය.	2020 වසරේ ආයතනය රාජගිරියේ සිට සීදූවට රැගෙන යාමත් සමග සිසුන් කැලණියේ නේවාසිකාගාරයෙන් ඉවත් වී සීදූව අවට පදිංචි විය. නේවාසිකාගාරයේ නඩත්තු කටයුතු සඳහා ද විශාල වියදමක් දැරීමට සිදුවූ අතර පාලක සභා උපදෙස් පරිදි කැලණිය විශ්ව විද්‍යාලයේ සිසුන් වෙත ලබාදීමට එහි පාලන අංශය වෙත දැනුම් දුන් අතර විදේශීය සිසුන් සඳහා නේවාසිකවීම් වෙනුවෙන් ලබාගැනීමට ඇති හැකියාව සලකා බලන බව පාලන අංශයෙන් දැනුම් දි	ක්‍රියාමාර්ග ගෙන ඵලදායි කටයුතුත්තකට යොදා ගැනිමට මේ දක්වා ක්‍රියාකර නොමැත.

ඇත. නමුත් මේ පිළිබඳව විමසීම සිදුකළද යහපත් ප්‍රතිචාර නොලැබුණි. 2024 අප්‍රේල් මස පැවති ආයතනයේ පාලක සභාව විසින් දැනුම් දෙන ලද්දේ නේවාසිකාගාරය වෙනත් ආයතනයකට බදු පදනම යටතේ ලබාදීමට කටයුතු කරන ලෙසයි. කැලණිය නේවාසිකාගාරයේ තිබූ භාණ්ඩ වලින් කොටසක් මේ වන විට ප්‍රධාන කාර්යාලයේ ප්‍රයෝජනය සඳහා යොදාගෙන ඇති බව.

3.29 ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	2,919,237,548	177,357,665	2,741,879,883	(15,106,709)	තත්ත්වාගණනය කළ
2022	3,149,062,776	164,335,660	2,984,727,116	(419,422)	තත්ත්වාගණනය කළ
2023	3,595,824,555	185,284,140	3,410,540,415	4,575,183	තත්ත්වාගණනය නොකළ

	විගණන නිරීක්ෂණය	**වාර්තාවේ වර්ෂය**	**විගණකාධිපති නිර්දේශය**	**විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග**	**වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය**
1	සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් ක්‍රමයට නව මෘදුකාංග පද්ධතියක් ස්ථාපනය කිරිම සඳහා 2017 වර්ෂයේදී රු. 12,511,000 ක් වූ ප්‍රතිපාදනයක් භාණ්ඩාගාරයෙන් ලබාගෙන 2018 දෙසැම්බර් 06 වන දින අදාල සැපයුම්කරු සමඟ ගිවිසුම් ගත වී තිබුණි. 2019 පෙබරවාරි 14 වන දින පලමු සැපයුම් කට්ටලයට අදාලව රු: 1,009,250 ක් ගෙවීම් සිදුකර තිබුණි. ගිවිසුම් ගත කාලය 2019 අගෝස්තු 06 දිනෙන් අවසන් වුවද, වැඩ ප්‍රමාද වීම හේතුවෙන් සැපයුම්කාර ආයතනය විසින් රු.මි. 12 ක අතිරේක මුදලක් වෙළඳපොළ මිල	2021,2022,2023	සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමවල මෙහෙයුම් කටයුතු විධිමත් ලෙස පවත්වාගෙන යාමට මෘදුකාංග පද්ධතියක් ස්ථාපනය කල යුතුය.	රු.මි. 12ක අතිරේක මුදලක් ඉල්ලා සිටි බැවින් එම ගිවිසුම අවසන් කිරීමට දෙපාර්ශවය එකඟ වූ අතර නව සැපයුම්කරුවකු තෝරා ගැනීම සඳහා පුවත්පත් දැන්වීමක් පළකර ඇත. ස්ථාවර තැන්පතුවල ආයෝජනය කිරීම තුළින් ඒ මුදල මිලියන 17ක් බවට එම මුදල පත් වී ඇති අතර එම මුදල් භාවිතා කර නවීන පරිගණක පද්ධතිය ලබා ගැනීමට කටයුතු කරමින් සිටින බව.	මෙතෙක් මෘදුකාංග පද්ධතිය ස්ථාපනය කිරීමට කටයුතු කර නොමැත.

	වෙනස්වීම් මත ඉල්ලා තිබූ අතර එම මුදල ආයතනයට ලබාදීමට ප්‍රතිපාදන නොමැති බැවින් පනතේ විධිවිධාන ප්‍රකාරව අක්‍රිය වී ප්‍රතිලාභ අහිමි වූ සාමාජිකයන් දැනුවත් කර, විශ්‍රාම පතිලාභ අහිමි වීම වැලැක්වීමට කටයුතු කල යුතුය.සමාලෝචිත වර්ෂයේ ජුනි 16 දින දෙපාර්ශවයේ එකඟතාවයෙන් ගිවිසුම අවසන් කිරීමට තීරණය කර තිබුණද ඒ අනුව කාර්යසාධන ඇපකරය පසුගිය වර්ෂයේ ජුලි 01 දිනෙන් පසු කාලය දීර්ඝ කර ගැනීමට කළමනාකරණය විසින් කටයුතු කර නොතිබීම හේතුවෙන් වැය කරන ලද රු. 1,090,250 ක මුදල අය කර ගත නොහැකිව වසර 4 කාලයක සිට නිශ්ඵල වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ නව පරිගණක පද්ධතියක් මිලදී ගැනීමට අනුමැතිය ලැබී තිබුණද පරිගණක පද්ධතිය ස්ථාපනය කිරීමට අපොහොසත් වි තිබුණි. පද්ධතිය සඳහා භාණ්ඩාගාරයෙන් ලැබී තිබූ ප්‍රතිපාදනය ස්ථාවර තැන්පත් වල ආයෝජනය කරමින් පවතින අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ස්ථාවර තැන්පතු ශේෂය රු. 17,129,263ක් විය.				
2	මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය පවත්වාගෙනයාම සඳහා	2021,2022	වගකිව යුතු පාර්ශවයන්ට එරෙහිව	අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයෙකු	මෙතෙක් අදාළ පාර්ශවයන්ට එරෙහිව කටයුතු කර පාඩුව

	මණ්ඩලයේ අරමුදලින් රු.මිලියන 195 ක් ගෙවා රාජගිරිය පිහිටි ගොඩනැගිල්ල 2013 වර්ෂයේදී මිලදී ගෙන තිබුණි. ප්‍රසම්පාදන ක්‍රමවේදයන් අනුගමනය කිරීමෙන් තොරව රු.මිලියන 165 ක් වූ රජයේ තක්සේරු වටිනාකම ඉක්මවා වැඩි මිලකට දේපල මිලදී ගැනීම හේතුවෙන් මණ්ඩලයට රු.මිලියන 30ක පාඩුවක් සිදුකර තිබුණ අතර වර්ෂ 10 ක කාලයක් ඉකුත් වී තිබුණ ද , ඊට වගකිව යුතු පාර්ශවයන්ට එරෙහිව නෛතික කටයුතු ඉටුකර පාඩුව පූර්ණය කර ගැනීමට නොහැකිවී නොතිබුණි.		නෛතික කටයුතු ඉටුකර පාඩුව පූර්ණය කර ගැනීමට කටයුතු කල යුතුය.	යටතේ විමර්ශනයක් සිදු කිරීම සඳහා කමිටුවක් පත් කරන ලද අතර, එම විමර්ශන වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම සඳහා 2023.මැයි.10 දින ඉදිරිපත් කල අතර, අධ්‍යක්ෂ මණ්ඩලයේ උපදෙස් නීති උපදෙස් ලබාගෙන ඒ අනුව නඩු පැවරීමට නීතිපතිවරයා වෙත භාර දීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර ඇත	ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කර නොමැත.
3	තිළිණ, ඉසුර ,සරණ, ධන ලක්ෂ්මී, සුරුකුම සහ ආරස්සාව යනාදි වශයෙන් විශ්‍රාම වැටුප් හා ප්‍රතිලාභ යෝජනා ක්‍රම 07 ක් මණ්ඩලය විසින් ආරම්භ කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට සුරැකුම හා ආරස්සාව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම 02 පමණක් ක්‍රියාත්මකව පැවතුණි. සහන, සරණ, තිළිණ,ධන ලක්ෂ්මී යෝජනා ක්‍රම සඳහා බඳවාගත් 355,504 ක් වූ සාමාජිකයන් අතරින් සියයට 81 ක් එනම් 289,356 දෙනෙකුගේ සාමාජිකත්වය අක්‍රීය වී තිබුණ අතර ක්‍රියාත්මක වන සුරැකුම, ආරස්සාව හා	2021,2023	විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම සැලසුම් කිරීමේදී අඛණ්ඩව ඉදිරියට පවත්වාගෙන යාම පිළිබඳව අවධානය යොමුකළ යුතු වේ.	අක්‍රිය සාමාජිකයන් එම යෝජනා ක්‍රමවලම සක්‍රිය කිරීමද අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් පදනම්කොටගෙන අත්හිටුවන ලදී. රජයේ දායකත්වය නොලැබීම හේතුවෙන් මෙම යෝජනා ක්‍රම අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමෙන් එම සාමාජිකයන්ට, ආයතනයට සහ රජයට මුහුණපෑමට සිදුවන ගැටළු අවම කරගැනීමට මෙම තීරණය ගෙන ඇති	• දැනට අක්‍රීය සාමාජිකයන් දැනුවත් කිරිමට ලිපි යොමු කිරීම. • අභියාචනා කමිටු ස්ථාපිත කිරිම. • සමාජ ආරක්ෂණ මණ්ඩල පනත සංශෝධණය ආදී වැඩ කටයුතු ආරම්භ කර ඇත. එහෙත් සාමාජිකයින් සක්‍රීය විම තවදුරටත් දුර්වල තත්ත්වයක පවතී.

ඉසුර විශ්‍රාම වැටුප් යොජනා ක්‍රම සඳහා බඳවාගත් 646,289 හි සාමාජිකයන් අතරින් සියයට 66 එනම් 428,572 දෙනෙකුගේ සාමාජිකත්වය අක්‍රීය වී තිබුණි.	බව.

3.30 ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	බදු පෙර ලාභය (අලාභය) රු.	මතය
2021	1,036,056,693	76,410,346	959,646,347	9,225,871	තත්ත්වාගණනය නොකළ
2022	1,176,055,674	165,955,547	1,010,100,127	50,453,780	තත්ත්වාගණනය නොකළ
2023	1,396,087,198	155,994,500	1,240,092,698	229,992,572	තත්ත්වාගණනය නොකළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපතිගේ නිරිදේශය	විගණිත ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ගය	වාර්තාවේ දිනට නිරිදේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	ආයතනය සිදු කරනු ලබන ප්‍රධාන කාර්යයන්ගේ ස්වභාවය හඳුනාගෙන ඊට අනුකූල වන පරිදි භාවිතා කරන ගිණුම්කරණ පද්ධති වැඩිදියුණු කරගත යුතු වුවත් එසේ කටයුතු නොකිරීමෙන් සමාලෝචිත වර්ෂය තුල පර්යේෂණ සඳහා මිලදී ගත් රු.9,509,003 ක් වූ ස්ථාවර වත්කම්, වත්කම් ලෙස ගිණුම්ගත කිරීමට නොහැකිවී තිබුණි.	2023	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතුය	ව්‍යාපෘති සඳහා භාවිතා කරන ලද උපකරණ ව්‍යාපෘති ක්‍රියාකාරකම් සඳහා පමණක් බැවින් ස්ථාවර වත්කම් ලෙස ගණනය කිරීමට බලයක් නොමැති බව.	ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව මෙතෙක් කටයුතු කර නැත.

3.31 සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය

	මුළු වත්කම් රු.මිලියන	මුළු වගකීම් රු.මිලියන	ස්කන්ධය රු.මිලියන	බදු පෙර ලාභය (අලාභය) රු.මිලියන	මතය
2021	419,121	9,846	409,275	33,159	තත්ත්වාගණනය කළ
2022	464,997	4,436	460,561	43,428	තත්ත්වාගණනය කළ
2023	524,511	5,706	518,805	64,959	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණ	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	2024 අප්‍රේල් 01 දින වනවිට ද 1981 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාල පරිච්ඡේදයට අදාලව සේවායෝජක ආයතන 4,526 ක් විසින් මණ්ඩලය වෙත බැර කරන ලද එකතුව රු.මිලියන 516.79 ක දායක මුදල් 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩල පනතේ 16 (3) වගන්තිය ප්‍රකාරව ඒ ඒ සාමාජිකයන්ගේ පෞද්ගලික ගිණුම්වලට බැර කර නොතිබුණි. මේ හේතුවෙන් සාමාජික අරමුදල් ශේෂය හා කේවල ගිණුම් ශේෂ එකතුව අතර නොසැසඳීමක් අනාවරණය විය. ඉහත ශේෂය තුල ඇතුලත් වසර	2021 – 1.5.2, 2022 – 1.5.1 (අ), 2023 – 1.5.1 (අ)	දායක මුදල බැරවිය යුතු සාමාජිකයින් නිවැරදිව හඳුනා ගැනීම, සාමාජික මුදල් අයකිරීමේ නව ක්‍රම වේදය වැඩි දියුණු කිරීම හා හඳුනා නොගත් මුදල් කඩිනමින් හඳුනාගැනීමට වැඩපිළිවෙලක් ක්‍රියාත්මකකිරීම කළ යුතුය.	විභජනය නොකර ඉතිරිව පවතින 2015 සිට 2020 දක්වා රු.මිලියන 366 ක මුදල අදාල සාමාජිකයින්ට විභජනය කිරීම සඳහා එම ගිණුම්වල පවතින අඩුපාඩු නිවැරදි කිරීමට සේවායෝජකයින් වෙත දුරකථන ඇමතුම් ලබාදීම, ලිපියොමු කිරීම, ක්ෂේත්‍ර පරීක්ෂණ කටයුතු ක්‍රියාත්මක කිරීම ආදී ක්‍රියාමාර්ග ගනු ලබයි. එමෙන්ම සේවායෝජකයින්	2015 සිට 2022 දක්වා විභජනය කළයුතු ශේෂය 2024 අගෝස්තු 20 දිනට රු.මිලියන 366 කි.

	09 ත් 42 ත් අතර කාලයක සිට පැවත එන රු.මිලියන 20 ක ශේෂයක් ද විය.			විසින් විද්‍යුත් ක්‍රමවේදය මගින් මුදල් බැරකිරීම ප්‍රවර්ධනය කිරිම හා සේවක අර්ථසාධක අරමුදලේ "සී" වාර්තා පදනම් කරගෙන මුදල් විභජනය කිරීමේ හැකියාව පිළිබඳ සේවක අර්ථසාධක අරමුදල් නිලධාරීන් සමග සාකච්ඡා පැවැත්වීමට කටයුතු කිරීම.	
2	1982 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාල පරිච්ඡේදයට අදාලව සේවායෝජකයින් හඳුනාගත නොහැකිව 2023 දෙසැම්බර් 31 දිනට V 999 අවිනිශ්චිත ගිණුමෙහි පවතින රු.මිලියන 6.52 ක ශේෂ වටිනාකම නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.	2023 – 1.5.1 (ආ)	ශේෂ හඳුනාගෙන සාමාජික ගිණුම්වලට බැර කිරීමට කටයුතු කළ යුතුය.	1982 – 2006 දක්වා කාලය තුල සේවායෝජකයින් විසින් සිදුකර ඇති ගෙවීම් ශේෂය වෙනස් කිරීමට නොහැකි වන පරිදි පරිගණක පද්ධතිය තුල අගුළු දමා තිබේ. නිවැරදි සේවායෝජකයන් හඳුනාගැනීම සඳහා ශාඛා කාර්යාල මට්ටමින් කටයුතු කරනු ලබයි.	එම ශේෂය තවදුරටත් එලෙසම පවතී.
3	මණ්ඩලයට අයත් නවම් මාවතෙහි පිහිටි ඉඩමක පවත්වාගෙන යනු ලබන රථගාලෙහි වාහන නැවතුම් පහසුකම් ලබාගන්නා	2021 – 3.2 (ඇ), 2023 – 1.6.1 (අ)	ලැබිය යුතු මුදල් අයකර ගැනීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කල යුතුය.	නවම් මාවත රථගාල භාවිතා කරන ගනුදෙනුකරුවන් සමග ඉදිරියේදී වලංගු ගිවිසුමක්	2024 ජූලි 09 වනවිට තවදුරටත් අයවිය යුතු මුදල රු.මිලියන 3.73 කි.

	ගනුදෙනුකරුවන් සමඟ ගිවිසුම්වලට එළඹීමට මණ්ඩලය කටයුතු කර නොතිබුණු අතරම එම ගනුදෙනුකරුවන්ගෙන් 2023 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව පැවති රු.මිලියන 8.096 ක මුදලින් 2024 ජුලි 09 දිනවන විට තවදුරටත් අයවිය යුතු මුදල රු.මිලියන 3.73 ක් විය. මේ තුල 2017 සිට 2022 වර්ෂ වලට අදාලව අයවිය යුතු මුදල රු.මිලියන 1.04 කි. 2016 වර්ෂයත් 2023 වර්ෂයත් අතර කාල පරාසයට අදාලව රු. 912,514 ක හිඟහිටි මුදල් පවතින ගනුදෙනුකරුවන් 15 ක් මගින් ආරක්ෂණ තැන්පතු මුදල් අයකරගැනීමට ද කටයුතු කර නොතිබුණු අතර ගනුදෙනුකරුවන් 38 කගෙන් රු.මිලියන 2.4 ක ලැබිය යුතු කුලී මුදල් පැවතුණු අතර එය ලබාගත් ආරක්ෂිත තැන්පතු මුදල ද ඉක්මවා තිබුණි.			සකසා ප්‍රායෝගික භාවිතයට ගැනීමට අපේක්ෂා කිරීම. තවද 2017 ජුලි මස පැවති අධ්‍යක්ෂක මණ්ඩල තීරණ ප්‍රකාරව මාසික ඉන්වොයිස්පත් ගාස්තුව මෙන් තුන් ගුණයක් ආරක්ෂණ තැන්පතු මුදල ලෙස පවත්වාගෙන යාම අනිවාර්ය කිරීම, අලුතින් වාහන ගාල් කිරීම සඳහා ඉල්ලුම් කරන අවස්ථාවේදී ආරක්ෂක තැන්පතු මුදල් අදාල වාහන ප්‍රමාණය අනුව තැන්පත් කිරීම අනිවාර්ය කර ඇති බව.	
4	2023 දෙසැම්බර් 31 දින වන විට මණ්ඩලය විසින් 1994 වර්ෂයේ දී සියයට 14.48 ක ස්ථාවර පොළී අනුපාතයක් යටතේ වැවිලි සමාගමක කරන ලද රු.මිලියන 15 ක ණයකර ආයෝජනය වෙනුවෙන් අයවිය යුතු හිඟ පොලී මුදල රු.මිලියන 26.29 ක් විය. මේ සම්බන්ධයෙන්	2021 – 1.6.1 (ආ), 2022 – 1.6.1 (ආ), 2023 – 1.6.1 (ආ)	පසු විපරම් කටයුතු සිදු කර අයවිය යුතු පොළී ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.	මෙම මුදල් අයකර ගැනීම සඳහා මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව මැදිහත් කර ගනිමින් මුදල් අයකර ගැනීමට ඇති හැකියාව සොයා බැලීමට පියවර ගනු ලැබේ.	2024 සැප්තැම්බර් මස වන විටත් මෙම මුදල් අයකරගැනීමට නොහැකි වී ඇත.

	2023 මාර්තු 27 දින අදාල ආයතන හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව මැදිහත් වීම මත කරන ලද සාකච්ඡා අනුව හිඟ මුදල ගෙවීමට පියවර ගන්නා ලෙස නියම කර තිබුණද 2024 වර්ෂයේ ජූනි මස විගණන අවස්ථාව වන විටත් මෙම මුදල් මණ්ඩලය වෙත අයවී නොතිබුණි.				
5	2002 වර්ෂයේ කල්පිරීමට යටත්ව සමාගමක පොරොන්දු නෝට්ටුවල ආයෝජනය කර තිබූ රු.මිලියන 12.17 ක් සඳහා හා 2007 වර්ෂයේ දී කල්පිරීමට යටත්ව ණයකරවල ආයෝජනය කර තිබූ රු.මිලියන 7.45 ක් සඳහා අයවිය යුතු පොළී මුදල් පිළිවෙලින් රු.මිලියන 15.21 ක් හා රු.මිලියන 0.37 ක් විය. මෙම ආයතනය ඇවර කිරීම සඳහා 2008 ඔක්තෝබර් 03 දින දිසා අධිකරණයේ නියෝග ලබාදී තිබුණ ද 2024 මැයි 04 දින වනවිටත් මෙම මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් නිශ්චිත තහවුරුවක් මණ්ඩලයට නොතිබුණි. මේ නිසා සාමාජිකයන් වෙත ගෙවිය යුතු ප්‍රතිලාභ අඩුවී තිබුණි.	2021 – 1.6.1 (ඇ), 2022 – 1.6.1 (අ), 2023 – 1.6.1 (ඇ)	පසු විපරම් කටයුතු සිදු කර අයවිය යුතු පොළී ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.	මෙම සමාගම ඇවරකිරීම සඳහා 2008 වසරේදී අධිකරණය විසින් නියෝගයක් ලබාදී තිබු මුත් මේ දක්වා ඇවරකරුවකු පත්කොට නොමැත. පසුකාලීනව මෙම සමාගමේ ණයගැති පාර්ශවයක් විසින් අධිකරණ නියෝගයක් මත රු.මිලියන 42.6ක මුදලක් ඇවරකිරීමේ නඩුවේ බැරට තැන්පත් කර තිබේ. එම මුදලින් සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට කිසියම් හිමිකමක් ඇති නම් එම මුදල අයකර ගැනීමට ඇති හැකියාව පිළිබඳව 2024	නීතිපති උපදෙස් ලබා ගැනීමට කටයුතු කර ඇත.

				මාර්තු 12 දිනදී නීතිපති උපදෙස් පතා ලිපියක් යොමුකර ඇත.	
6	2023 දෙසැම්බර් 31 දිනට හිමිකම් නොපාන ලද සාමාන්‍ය ප්‍රතිලාභ ගිණුම්වල පවතින වසර 20 කට වැඩි ශේෂවල එකතුව රු.මිලියන 3.83 ක් වූ අතර අදාල සාමාජිකයින් හඳුනාගෙන මෙම මුදල නිරවුල් කිරීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි.	2023 – 1.6.2 (අ)	අදාල ප්‍රතිලාභීන් හඳුනා ගැනීමට විධිමත් වැඩ පිළිවෙලක් සකස් කර මුදල් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.	මෙම ප්‍රතිලාභ මුදල් නිරවුල් කිරීම සඳහා මණ්ඩලය මගින් දුරකථන ඇමතුම් ලබාදීම, ලිපි යැවීම හා ඡන්ද හිමි නාම ලේඛන ඔස්සේ තොරතුරු ලබාගෙන මුදල් නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ.	2024 අගෝස්තු 20 දිනට අයදුම්පත් 691 කට අදාලව රු.මිලියන 4.6 ක් නිරවුල් කිරීමට ඇත. මින් 2001 වර්ෂයත් 2022 වර්ෂයත් අතර කාලයට අදාල මුදල රු.මිලියන 3.83 කි.
7	සමාලෝචිත වර්ෂය අවසානයට හිමිකම් නොපාන ලද මරණ ප්‍රතිලාභ ලෙස ප්‍රතිලාභීන් 1,253 කට අදාලව රු.මිලියන 23.37 ක මුදලක් ගෙවිය යුතුව පැවති අතර 2024 මාර්තු 31 දිනට ප්‍රතිලාභීන් 1,240 කට අදාලව එම ශේෂය රු.මිලියන 23.043 කි. මෙම ශේෂය තුල වසර 07 ත් 28 ත් අතර කාල පරාසයට අයත් ප්‍රතිලාභීන් 826 කට ගෙවිය යුතු මරණ ප්‍රතිලාභ මුදල රු.මිලියන 9.9 කි. දිගින් දිගටම පවතින මෙම ශේෂය නිරවුල් කිරීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි.	2021 - 3.1 (උ), 2022 - 1.6.2 (ඇ) 2023 – 1.6.2 (ආ)	හිමිකම් නොපාන ලද මරණ ප්‍රතිලාභීන් හඳුනා ගෙන එම මුදල් නිදහස් කිරීමට ක්‍රමවේදයක් දියත් කළ යුතුය.	ප්‍රතිලාභ ගෙවීම් වලට අදාලව උරුමකරුවන් සම්බන්ධ කර ගැනීම සඳහා මණ්ඩලීය වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කර තිබේ.	2024 වර්ෂයේ උරුමකරුවන් 16 කට රු.මිලියන 0.65 ක් නිදහස් කර තිබේ. තවදුරටත් රු.මිලියන 22.72 නිදහස් කිරීමට තිබේ.
8	2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 හි11 ඡේදය	2021 – 3.2 (ඊ),	චක්‍රලේඛ නියමයන් ප්‍රකාරව අදාළ	2023 භාණ්ඩ සමීක්ෂණය පිළිබඳව	මෙතෙක් පියවර ගෙන නොමැත.

	ප්‍රකාරව 2022 වර්ෂයට අදාලව භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ ඌනතා හා අතිරික්තතා සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීම 2023 වර්ෂයේ අප්‍රේල් 30 දිනට පෙර සිදුකල යුතු වුවද 2022 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ ඇතුලත් ඌනතා ඒකක 100ක් සහ අතිරික්තතා ඒකක 60ක් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	2023 – 1.7	ක්‍රියාමාර්ග ගත යුතුය.	අභ්‍යන්තර විගණන කොට්ඨාශය නිරීක්ෂණ ද සැලකිල්ලට ගෙන මේ සම්බන්ධව ඉදිරියේදී කටයුතු කරන බව.	
9	සංස්ථාපිත පනත අනුව මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරියා මණ්ඩලයේ සභාපතිවරයා වන නමුත්, මූල්‍ය කටයුතු සම්බන්ධ ආයතනයක් ලෙස මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරියා එහි සභාපතිවරයා විය යුතු බවට වන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩල පනතේ 5 (2) වගන්තිය සංශෝධනය කල යුතු බවට 2016 අගෝස්තු 26 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේ දී නිර්දේශ කර තිබුණ ද 2023 වර්ෂය අවසාන වන විටත් එම කටයුතු නිමකර නොතිබුණි.	2021 – 3.1 (ඊ) 2022 – 3.1 (ආ), 2023 – 3.1 (ඇ)	පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවෙන් ලබාදුන් නියෝග ක්‍රියාත්මක කිරීමට කළමණාකරන ය කටයුතු කළ යුතුය.	පනත සංශෝධනය කටයුතු සම්බන්ධ ගෙන කෙටුම්පත් සකස් කර ඇති අතර ප්‍රගතිය පිළිබදව පසු විපරම් කරමින් පවතී.	පනත සංශෝධන කටයුතු නිමකර නොමැත.
10	2022 වර්ෂය අවසානය වනවිට ලියාපදිංචි සේවායෝජක සංඛ්‍යාව වූ 189,850 න් සියයට 66 ක්	2023 – 3.2 (ඇ)	අක්‍රීය සේවායෝජකයි න් හදුනාගෙන සක්‍රීය කර	සේවායෝජකයින් සක්‍රීය ප්‍රවාහයට ඇතුලත් කර ගැනීමේ	2022 වර්ෂයේ සිට 2024 ජුලි 31 දක්වා සක්‍රීය තත්ත්වයට පත්

	හෙවත් 125,850 ක් අක්‍රිය සේවායෝජකයින් විය. මණ්ඩලය විසින් ලියාපදිංචි සේවා යෝජක ආයතන යාවත්කාලීන කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය විය.		ගැනීමේ ක්‍රියාත්මක ක්‍රමවේදය වැඩි දියුණු කළ යුතුය.	ක්‍රමවේදය වූ ක්ෂේත්‍ර පරීක්ෂණ කටයුතු සිදුකරමින් පවතී.	කරගත් සේවායෝජකයින් සංඛ්‍යාව 44,001 ක් පමණි. තවදුරටත් සක්‍රීය කරගත යුතු ප්‍රමාණය 81,849 කි.
11	ස්වයංරැකියාලාභීන් හා සංක්‍රමණික සේවකයන් මණ්ඩලයේ ලියාපදිංචි කර ගැනීම වර්ධනය කර ගැනීම සඳහා වෙනම අංශයක් මණ්ඩලය යටතේ පිහිටුවා තිබුනද, 2023 වර්ෂයේ ප්‍රධාන කාර්යාලය හා ප්‍රාදේශීය කාර්යාල 13ක් විසින් බඳවාගෙන තිබූ සාමාජික සංඛ්‍යාව 456ක් පමණක් විය. එමෙන්ම Labour Force Survey – Annual Report – 2019අනුව ශ්‍රී ලංකාවේ වාර්තාගත වී ඇති මුළු ස්වයංරැකියාලාභීන් සංඛ්‍යාව 3,233,290ක් වුවත් අරමුදලේ ලියාපදිංචි ස්වයංරැකියාලාභීන් සංඛ්‍යාව 42,753 ක් වීමෙන් මණ්ඩලයේ අපේක්ෂිත අරමුණු ඉටුවී නොතිබුණි.	2022 – 3.2 (ඊ), 2023 – 3.2 (ඉ)	ස්වයං රැකියාලාභීන් ලියාපදිංචි කිරීම සඳහා විධිමත් වැඩ පිළිවෙලක් සකස් කර ක්‍රියාත්මක කළ යුතුය.	ප්‍රාදේශීය කාර්යාල මට්ටමින් දැන්වත් කිරීමේ වැඩසටහන් සිදුකර බඳවා ගැනීම වර්ධනය කරගැනීමට කටයුතු කරමින් පවතී.	නව ස්වයං රැකියාලාභීන් ලියාපදිංචිය ප්‍රශස්ත මට්ටමකට පැමිණ නැත.
12	2023 වර්ෂයේ දී සංක්‍රමණික සේවකයන් ලෙස බඳවාගත් ප්‍රමාණය 14 ක් වූ අතර 2020, 2021 සහ 2022 වර්ෂවලදී එය පිළිවෙලින් 04,19 ක් හා 16 ක් විය. එමෙන්ම 2024 මාර්තු 02 දින වන විටත්	2022 – 3.2 (ඊ) (iii), 2023 – 3.2 (ඊ)	බඳවා ගැනීම ප්‍රවර්ධනය සඳහා සැලසුම් ගත කාර්යයන් කඩිනමින් ක්‍රියාත්මක කළ යුතු අතරම දත්ත පරිගණක	ආයතනික මට්ටමින් හා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සමග සාකච්ඡාවට කිහිපයක් පවත්වා බඳවා ගැනීම	සංක්‍රමණික සේවකයන්ට අදාල දත්ත සම්පූර්ණයෙන්ම පරිගණක ගතකර ඇති අතර බඳවා ගැනීම වර්ධනය

	2006 වර්ෂයට පෙර මණ්ඩලයේ ලියාපදිංචි වූ සංක්‍රමණික සාමාජිකයන්ට අදාල දත්ත පරිගණකගත කර නොතිබුණි.		ගත කිරීම් කටයුතු කඩිනම් කර යාවත්කාලීන කිරීමට කටයුතු කළ යුතුය.	වර්ධනයට කටයුතු කරමින් පවති. සංක්‍රමණික සේවකයින් බඳවා ගැනීමට හා ප්‍රවර්ධනයට අදාල ව්‍යාපෘති වාර්තාවක් කෙටුම්පත් කරමින් පවතී. දත්ත පරිගණක ගත කර නැත.	කර ගැනීම සඳහා කටයුතු කරමින් පවතී.
13	සේවායෝජක හා සාමාජික ගිණුම් ,සාමාජික අරමුදල වඩාත් නිවැරදිව හා විශ්වාසනීයව පවත්වාගෙන යාම , සාමාජිකයින් හා සේවායෝජකයින් සඳහා මාර්ගගත සන්නිවේදන ක්‍රම මගින් පද්ධතිය හා සම්බන්ධ වීමට සැලැස්වීමේ අරමුණින් මුදල් අමාත්‍යාංශ මූල්‍ය ප්‍රතිපාදන යටතේ ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය හා මණ්ඩලය අතර 2016 වර්ෂයේ දී අවබෝධතා ගිවිසුමකට එළඹ තිබුණි . ව්‍යාපෘති කටයුතු ආරම්භයේ සිට මේ දක්වා මණ්ඩලය විසින් දෘඩාංග මිලදී ගැනීම හා පුහුණු කටයුතු වෙනුවෙන් රු.මිලියන 183.28ක් වැයකර තිබුණද වර්තමානය වනවිටත් පද්ධතිය සජීවී මෙහෙයුම් ක්‍රියාවලියක් බවට පත්කර	2023 – 3.2 (උ)	පද්ධතිය සජීවි මෙහෙයුම් ක්‍රියාවලියක් බවට පත්කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය.	ඉදිරියේදී පද්ධතියේ මෙහෙයුම් පිළිගැනීමේ පරීක්ෂණය හා අනෙකුත් ක්‍රියාවලීන් අවසන් කිරීමට කටයුතු කරමින් පවතී.	ව්‍යාපෘති කටයුතු නිමකර සජීවී මෙහෙයුම් ක්‍රියාවලියක් බවට පත්කර නොමැත.

	ගැනීමට නොහැකි වී තිබුණි.				
14	සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකත්වය ලබානොගෙන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ පමණක් ලියාපදිංචි වන සේවායෝජකයින් වෙනුවෙන් මණ්ඩලය විසින් AX සිට XX දක්වා තාවකාලික ගිණුම් (Dummy Accounts) පවත්වාගෙන යන අතර, 2023 දෙසැම්බර් 31 දිනට එවැනි සේවායෝජකයින් 28,994 ක් විසින් එවන ලද දායක මුදල් එකතුව රු.මිලියන 309.97 ක් විය. මේ තුල වසර 8 ත් වසර 41 ත් අතර කාලයට අදාල ශේෂ එකතුව රු.මිලියන 209.95 ක් විය. මෙම තාවකාලික ගිණුම්වල (Dummy Accounts) පවතින දායක මුදල් නිවැරදි සේවායෝජක ගිණුම්වලට බැරකිරීම සඳහා සුදුසු ක්‍රමවේදයක් මෙතෙක් හඳුන්වා දී නොතිබුණි.	2023 – 3.2 (එ)	තොරතුරු ලබාගෙන නිවැරදි සේවායෝජක ගිණුම්වලට බැරකිරීමට කටයුතු කළ යුතුය.	මෙම මුදල්වලට අදාල සේවක අර්ථසාධක අරමුදල් අංක හඳුනාගැනීම නිරන්තරයෙන්ම සිදුවන අතර ඒ සඳහා ප්‍රාදේශීය කාර්යාල මට්ටමින් හා අදාල කම්කරු කාර්යාල මගින් තොරතුරු ලබාගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලබයි.	ගිණුම් ශේෂය එලෙසම පවතින අතර සේවක අර්ථසාධක අංක යටතේ සේවායෝජකයන්ගේ ගිණුම්වලට බැරකර නැත.
15	සාමාජික නම හා වලංගු හැඳුනුම්පත් අංකය රහිතව පවත්වාගෙන යන ගිණුම් 7,566 කට අදාලව රු.මිලියන 41.22 ක මුදලක් 2023 දෙසැම්බර් 31 දිනට පවතින අතර, 2015 වර්ෂය දක්වා හඳුනාගත නොහැකි එම සාමාජික ගිණුම් පරිගණක	2023 – 3.2 (ඒ)	අගුළු දමා තිබෙන ගිණුම් පිළිබඳ කටයුතු කිරීමට ක්‍රමවේදයක් දියත් කළ යුතුය.	මෙම සාමාජික ගිණුම් දැනට පරිගණක පද්ධතියේ අගුළු දැමීම සිදු කර ඇත. ප්‍රාදේශීය කාර්යාල මට්ටමින් අදාල තොරතුරු ලබා ගැනීමට කටයුතු	මෙතෙක් සාමාජිකයා හඳුනා ගෙන මුදල් සාමාජිකයන්ට බැර කර නොමැත.

	පද්ධතියේ අගුළු දැමීමට ක්‍රියාකර ඇති බව 2024 අප්‍රේල් 29 දිනැතිව විගණනය වෙත ලබාදුන් තොරතුරු අනුව අනාවරණය විය. 2024 මැයි 04 දින වනවිටත් මෙම මුදල් හඳුනාගෙන සාමාජිකයින්ට බැර කර නොතිබුණි.			කරමින් පවතී.	
16	2016 අගෝස්තු 26 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ දී මණ්ඩලයේ සාමාජික අරමුදලේ ආයෝජන කළමනාකරණ කටයුතු සඳහා වරලත් මූල්‍ය විශ්ලේෂක තනතුර සඳහා ස්ථිර නිලධාරියෙකු කඩිනමින් පත්කරන ලෙස මණ්ඩලයට උපදෙස් ලබාදී තිබුණද, 2022 මැයි විගණිත දින වන විටත් එම තනතුර සඳහා නිලධාරියෙකු බඳවාගෙන නොතිබුණි.	2021 – 3.4, 2022 – 3.4	පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවෙහි ලබා දුන් උපදෙස් සම්බන්ධයෙන් කටයුතු කිරීමට අවධානය යොමු කිරීම.	ආයෝජන අංශයේ ඉතා පළපුරුදු හා දක්ෂ සේවක මණ්ඩලයකින් සමන්විත බැවින් ස්වාධීනව එම කටයුතු කරගෙන යාමට අවශ්‍ය දැනුම හා ශක්තිය ඔවුන් සතුව පවතී.	මෙතෙක් පුරප්පාඩුව සම්පූර්ණ කර නොමැත.
17	මණ්ඩලය රජයේ සුරැකුම්පත්වල අරමුදල් ආයෝජනය කරන ප්‍රධාන පෙලේ ආයතනයක් වුවද, සුරැකුම්පත් වෙන්දේසි වලදී ඍජුවම මිල ගණන් ඉදිරිපත් කිරීමේ පහසුකම (Direct Bidding Facility) ශ්‍රී ලංකා මහ බැංකුව වෙතින් ලබාගෙන නොතිබුණි. 2016 අගෝස්තු 26 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවෙහි දී ශ්‍රී ලංකා මහ බැංකුවේ	2021 – 3.2 (ඉ), 2022 – 3.1 (ඇ)	පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවෙන් ලබාදුන් නියෝග ක්‍රියාත්මක කිරීම කළමනාකරණයේ වගකීම වේ.	වර්තමානයේ දී රාජ්‍ය බැංකුවක් වන මහජන බැංකුව මගින් කිසිදු වියදමකින් සහ අමතර සේවකයන් යෙදවීමකින් තොරව මෙම සේවාව ගනු ලබයි.	ඍජුව මිල ගණන් ඉදිරිපත් කිරීමේ පහසුකම් මෙතෙක් ලබාගෙන නොමැත.

ප්‍රාථමික ගනුදෙනුකරුවකු (Primary dealer) ලෙස ලියාපදිංචි වන ලෙසට නියෝග කර තිබුණ ද 2021 දෙසැම්බර් 31 වන විටත් එසේ සිදුකර නොතිබුණි.

3.32 1990 සුවසැරිය පදනම

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	1,488,017,475	164,360,592	1,323,656,883	(51,365,905)	තත්ත්වාගණනය නොකළ
2022	2,296,833,189	342,661,872	1,954,171,317	293,067,249	තත්ත්වාගණනය නොකළ
2023	2,381,790,857	294,889,872	2,086,900,985	269,930,094	තත්ත්වාගණනය නොකළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	2018 අප්‍රේල් 24 දින සෞඛ්‍ය අමාත්‍යාංශය හා GVK EMRI Lanka (Private) Ltd ආයතනය සමඟ අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම හා 2018 අංක 18 දරන 1990 සුවසැරිය පදනම පනතේ 26 (ඇ) වගන්තිය ප්‍රකාරව, සුවසැරිය පදනමේ මෙහෙයුම් කටයුතු සඳහා වැය වන පුනරාවර්තන වියදම් රජය විසින් ප්‍රතිපූරණය කළ යුතු වුවද, 2023 ජනවාරි 01 දින වන විට පැවති රු. 330,091,526 ක මුදල සමාලෝචිත වර්ෂයේදී ද භාණ්ඩාගාරය විසින් ප්‍රතිපූර්ණය කර	2023, 2022 හා 2021	භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කර මෙම මුදල සම්බන්ධයෙන් නිශ්චිත තීරණයක් ගෙන ඒ අනුව මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය ගැලපීම් සිදුකළ යුතුය.	මෙම මුදල ලබා ගැනීමට පසුගිය වසර කීපයේම සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් භාණ්ඩාගාරය වෙත ඉල්ලීම් ඉදිරිපත් කර ඇති අතර ඒ සඳහා අවශ්‍ය සියළු ලිපි ලේඛන භාණ්ඩාගාරයට ඉදිරිපත් කර තිබුණි. නමුත් මේ සඳහා භාණ්ඩාගාරය කිසිදු ප්‍රතිචාරයක් දක්වා නොතිබුණු අතර එක් අවස්ථාවකදී පමණක් සාකච්ඡාවකට පැමිණෙන ලෙස වාචිකව දන්වා එම සාකච්ඡාවද පසුව අවලංගුකර තිබුණි. මේ සම්බන්ධයෙන්	2024.08.08 දින අධ්‍යක්ෂක මණ්ඩලයේ උපදෙස් මත මෙම අගය පොත් වලින් ඉවත් කිරීම සඳහා මහා භාණ්ඩාගාරයේ එකඟතාවය දැනගැනීමට හා ඒ සඳහා මහා භාණ්ඩාගාරයෙන් අනුමැතිය ලැබුණු විගස එය නැවත අධ්‍යක්ෂක මණ්ඩලය වෙත යොමු කර එම අගය පොත් වලින් ඉවත් කිරීමට පියවර ගැනීමට අපේක්ෂා කරන බව.

	නොතිබුණි.			2024 දෙවන කාර්තුවේ පැවති විගණන හා කළමනාකරණ කමිටුවේදී සාකච්ඡා කර තිබුණු අතර නැවතත් භාණ්ඩාගාරය වෙත ලිපියක් යවා තිබුණි.	
2	2023 දෙසැම්බර් 31 දිනට පදනමේ අනුමත කාර්ය මණ්ඩලය 1,992 ක් වූ අතර එදිනට තත්‍ය කාර්ය මණ්ඩලය 1189 ක් විය. ඒ අනුව කාර්ය මණ්ඩල ඌනතාවය 803 ක් වූ බවත් ඒ අතරින් 363 දෙනෙකු ගිලන් රථ රියදුරන් විය.	2023, 2022 හා 2021	අත්‍යාවශ්‍ය සේවකයින් බඳවා ගැනීමටත්, අත්‍යාවශ්‍ය නොවන තනතුරු යටපත් කර අනුමත කාර්යමණ්ඩලය සංශෝධනය කිරීමටත් කටයුතු කළ යුතුය.	2021 ජනවාරි 29 වන දින පුරප්පාඩුවලින් 602 ක් බඳවා ගැනීමට අනුමැතිය හිමි වූ නමුත් එවකට පැවති කොවිඩ් 19 තත්වය නිසා මේ බඳවා ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට නොහැකි තත්වයක් ඇති වූ බව, හදිසි වෛද්‍ය තාක්ෂණික නිලධාරීන් බඳවා ගැනීමේදී අදියර 03 ක් යටතේ එක් අයෙක් සම්මුඛ පරීක්ෂණ 03 කට භාජනය කරනු ලබන බව, එම තුන්වන පරීක්ෂණය සමත් වූ පසු පමණක් ඒ අය බඳවා ගන්නා බැවින් කෙටි කාලයක් තුළ මෙම බඳවා ගැනීම් සිදු කිරීම අපහසු බව හා සම්මුඛ පරීක්ෂණ තුනම සමත් වූ හදිසි වෛද්‍ය තාක්ෂණික නිලධාරීන් හා ගිලන් රථ නියාමකවරුන් 50 ක් පමණ 2023	2023.10.04 වන දින කළමනාකරණ දෙපාර්තමේන්තුවේ ලිපියක් මඟින් හදිසි වෛද්‍ය තාක්ෂණික නිලධාරීන් 283 ක් සහ ගිලන් රථ නියාමකවරුන් 174 දෙනෙක් පමණක් බඳවා ගැනීමට අනුමැතිය ලැබීමෙන් පසු මෙම සම්මුඛ පරීක්ෂණ කටයුතු සිදු කරමින් පැවතියද, 2024 මැතිවරණ නීතීන්ට යටත්ව එම බඳවා ගැනීම් තාවකාලිකව නවත්වා ඇති බව.

				වර්ෂය අවසානයේ බඳවා ගෙන ඔවුන්ව පුහුණු කිරීමේ කටයුතු වලට යොමු කර ඇති බව.	
3	සුවසැරිය පදනමේ කාර්ය මණ්ඩලයට අදාළ වැටුප් ව්‍යුහය 2019 අගෝස්තු 01 දින සිට අනුමත කර තිබූ නමුත් වාර්ෂික වැටුප් වර්ධක ව්‍යුහයක් අනුමත කර නොතිබුණි.	2023	කාර්යමණ්ඩය රඳවා ගැනීම සඳහා සුදුසු වැටුප් වර්ධක ව්‍යුහයක් අනුමත කරවාගෙන ක්‍රියාත්මක කළ යුතුය.	අවස්ථා කීපයකදීම භාණ්ඩාගාරයෙන් වැටුප් වැඩිවීමක් හෝ වැටුප් වර්ධකයක් ඉල්ලුම්කර තිබුණද මෙතෙක් භාණ්ඩාගාරය විසින් එය අනුමත කර නොතිබුණු බව සහ සෑම නිළධාරියෙකුටම කාලයක් තිස්සේ ලැබෙනුයේ එකම වැටුප් ප්‍රමාණයක් බැවින් බඳවා ගන්නා සේවක මණ්ඩලය කෙටි කලකින් ඉන් ඉවත් වන බව.	1990 සුව සැරිය පදනමේ කාර්ය මණ්ඩලයට අදාළ වැටුප් ව්‍යුහය සකස් කිරීම පිළිබඳව මේ වන විටත් මහා භාණ්ඩාගාරය සහ සෞඛ්‍ය අමාත්‍යාංශය සමඟ සාකච්ඡා ආරම්භ කර ඇති අතර එයට අදාළ ක්‍රියාමාර්ග ගනිමින් සිටින බව.
4	ඉහල කළමනාකරණ තනතුරක් වූ මූල්‍ය ප්‍රධානි (Head of Finance) තනතුරට නිලධාරියෙකු බඳවා ගැනීම සඳහා සම්මුඛ පරික්ෂණයක් පවත්වා තිබුණි. එම සම්මුඛ පරික්ෂණ මණ්ඩලයේ නිර්දේශයන් මත අනුමත කාර්යමණ්ඩලයට ඇතුළත් නොවූ මූල්‍ය උපදේශකයෙකු ලෙස නිලධාරියෙකු මාස 06 ක කාලයක් සඳහා 2021 සැප්තැම්බර් 02 දින කොන්ත්‍රාත් පදනම	2023, 2022 හා 2021	සියළුම පත් කිරීම් විධිමත් අනුමැතීන් යටතේ පමණක් කිරීමට වගබලා ගත යුතුය.	අදාළ මුදල් උපදේශක තනතුරට බඳවා ගැනීමට සිදු වූයේ එම අවස්ථාවේදී ප්‍රධාන මූල්‍ය නිළධාරී තනතුර සඳහා සුදුසුකම් ලත් පුද්ගලයෙක් බඳවා ගැනීමට නොහැකි වීම මත බව, අදාළ මූල්‍ය උපදේශක තනතුර සඳහා බඳවාගත් නිලධාරියාගේ කොන්ත්‍රාත් කාලය 2024 වර්ෂයේ අප්‍රේල් මාසයේදී අවසන්	මුදල් රෙගුලාසි සංග්‍රහය 2024.08.08 දින පැවති අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කර අනුමත කර ඇති අතර එහිදී පෙන්වා දුන් වෙනස්කම් සිදු කර මෙය රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර එහි එකගතාවය ලබා ගැනීමට අපේක්ෂා කරන බව.

මත බඳවාගෙන තිබුණු අතර ඒ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. පත්කිරීම් කොන්දේසි ප්‍රකාරව තවත් මාස 06 කට පමණක් කොන්ත්‍රාත් කාලය දීර්ඝ කළ හැකි වුවද 2024 අප්‍රේල් 19 දින දක්වා මොහුගේ කොන්ත්‍රාත් කාලය තවත් මාස 25 කින් දීර්ඝ කර තිබුණි. නමුත් මොහුගේ ප්‍රධාන රාජකාරියක් ලෙස සැලකෙන පදනමට අනන්‍ය වූ මුදල් රෙගුලාසි සංග්‍රහයක් සැකසීමේ කටයුතු විගණිත දිනය වන විටත් සිදුකර නොතිබුණි. එබැවින් අනුමත කාර්ය මණ්ඩලයෙන් බැහැරව මූල්‍ය උපදේශක තනතුරක් සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමත්, ගිවිසුම් ප්‍රකාරව ඔහුගේ සේවය අවසන් නොකිරීමත් වසර තුනකට වඩා කාලයක් පුරප්පාඩුවී තිබුණු මූල්‍ය ප්‍රධානී තනතුර සඳහා ස්ථිර නිලධාරියෙකු පත්කර ගැනීමට 2024 මාර්තු 15 දින වන විටත් කටයුතු නොකිරිමත් ගැටළුකාරි විය.

වීමට නියමිත අතර එකී නිළධාරියා විසින් තම සේවාව අවසන් කිරීම සඳහා පදනමෙන් ඉල්ලා ඇත. එසේම මෙම බඳවා ගැනීම හේතු කොට ගෙන අනුමත කාර්ය මණ්ඩලය හෝ අනුමත කාර්ය මණ්ඩලය සඳහා වන පිරිවැය ඉක්මවීමක් සිදු නොවුණි. මුදල් රෙගුලාසි සංග්‍රහයේ කටයුතු නිම කර පදනමට භාර දී ඇති අතර එහි ඉදිරි කටයුතු රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ එකඟතාවය මත සිදු කළ යුතුය. එසේ කිරීමට පෙර ආයතනයේ ඉහළ නිලධාරීන් විසින් මෙහි කරුණු සමාලෝචනයක් සිදු කළ යුතුය.

5	ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 133 සහ 2019 ජනවාරි 12 දිනැති අංක ඩීඑම්ඒ/1-2019 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව සුවසැරිය පදනම සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි.	2022 හා 2021	නීතිරීති ප්‍රකාරව අභ්‍යන්තර විගණනයක් සිදුකිරීමට කටයුතු කළ යුතුය.	මේ සඳහා කාර්ය මණ්ඩලය අනුමත කරන ලෙස භාණ්ඩාගාරයට දැන්වුවද අදාළ අනුමැතිය ලබා නොදුන් බව සහ තනතුරු අනුමත කර නොගෙන මෙසේ අභ්‍යන්තර විගණන ඒකකයක් පත් කළ නොහැකි බව.	අභ්‍යන්තර විගණන ඒකකයක් සඳහා කාර්ය මණ්ඩලය අනුමත කර දෙන මෙන් භාණ්ඩාගාරයෙන් ඉල්ලුම් කර ඇති බව.

3.33 පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන සභාව

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	62,976,977	48,645,322	14,331,655	(692,194)	තත්ත්වාගණනය කළ
2022	66,154,343	57,287,144	8,867,199	(5,372,457)	තත්ත්වාගණනය කළ
2023	68,412,988	58,041,105	10,371,883	1,504,683	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	**වාර්තාවේ වර්ෂය**	**විගණකාධිපති නිර්දේශය**	**විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග**	**වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය**
1	ගිණුම් තුළනය නොවීම මත පැන නැගී තිබුණු රු.232,400 ක අවිනිශ්චිත ශේෂය හඳුනාගෙන අවශ්‍ය ගැලපීම් සිදු කරනු වෙනුවට අරමුදල් මාරු ගිණුමේ ශේෂයක් ලෙස දක්වා තිබුණි.	2021 2022 2023	අවිනිශ්චිත ගිණුම් ශේෂය හඳුනාගෙන අවශ්‍ය ගැලපීම් සිදුකළ යුතුය.	එම ගැටලුව නිවැරැදි කිරීමට පියවර ගෙන ඇති බව.	අවශ්‍ය ගැලපීම් සිදුකර නොතිබුණි.
2	2023 දෙසැම්බර් 31 දිනට ශුද්ධ ජංගම වත්කම්වල රු48,438,734 ක ඍණ ශේෂයක් පැවති බැවින් නියාමන සභාවේ කෙටිකාලීන ද්‍රවශීලතාවයක් පවතින බව නිරීක්ෂණය විය. එසේම 2017 වර්ෂයේ සිට නියාමන සභාව	2021 2022 2023	රට තුළ ක්‍රියාත්මක සියලුම පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචි කර ආදායම වැඩි කර ගැනීමටත් ආයතනයේ වියදම් අවම කර ගැනීමටත් කටයුතු කරමින්	මෙම තත්ත්වය අවම කිරීමට සහ ජය ගැනීමට කඩිනම් පියවර ගැනීමට තීරණය කර ඇති බව, ලියාපදිංචි ගාස්තු 2024 සිට සියයට 50 කින් වැඩි කිරීමට, දඩ සහ දඩ ගාස්තු ක්‍රියාත්මක කිරීමට, ලියාපදිංචිය වැඩි කර ගැනීමට, පනත යටතේ බලයලත්	ලියාපදිංචි ආයතන සංඛ්‍යාවේ ප්‍රමාණවත් වර්ධනයක් අත්කරගෙන නොතිබුණි.

	අඛණ්ඩව අලාභ ලැබීම හේතුවෙන් 2016 දෙසැම්බර් 31 දිනට පැවැති රු.33,719,154 ක සමුච්චිත අරමුදල 2023 දෙසැම්බර් 31 දින වන විට රු.10,371,883 ක් දක්වා සියයට 68 කින් ක්‍රමයෙන් අඩුවී තිබුණි.		කෙටිකාලීන බුන්වත්භාවයෙන් මිදීමටත් අඛණ්ඩව අලාභ ලැබීම අවම කර ගැනීමටත් කටයුතු කළ යුතුය.	නිලධාරියාගේ විෂය පථය පුළුල් කිරීමට, පළාත් අධ්‍යක්ෂවරුන් විසින් ලියාපදිංචි නොකළ ආයතනවලට එරෙහිව නීතිමය පියවර ගැනීමට, විද්‍යුත් ලියාපදිංචි කිරීමේ පද්ධති හඳුන්වා දීමට සහ පිරිවැය අඩු කිරීම සඳහා පියවර ගැනිමට කටයුතු කරන බව.	
3	රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ ප්‍රකාරව ඉකුත් මූල්‍ය වර්ෂය තුළදී අලාභ තත්ත්වයන් වාර්තා කර ඇති ආයතනයක සේවකයන්ට ප්‍රසාද දීමනාවන් ගෙවිය නොහැකි වුවද, ඊට අනුකූල නොවන පරිදි නියාමන සභාව 2022 වර්ෂයේදි රු.5,372,457 ක අලාභයක් ලබා තිබියදී 2023 වර්ෂය තුළදී රු.525,000 ක් ප්‍රසාද දීමනා ලෙස ගෙවා තිබුණි.	2021 2022 2023	චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය.	නියාමන සභාව අවම සේවක සංඛ්‍යාවකින් ක්‍රියාත්මක කිරීම, සේවක අභිප්‍රේරණය, හා නිවාඩු අඩු කිරීම සඳහා ප්‍රසාද දීමනාව අනුමත කළ බව.	ඉදිරියේදි චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කරන බව.
4	2021 නොවැම්බර් 16 දින රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ සංග්‍රහය 2.3 ඡේදය ප්‍රකාරව උපාය මාර්ගික සැලැස්මක්, ක්‍රියාකාරි සැලැස්මක් හා වාර්ෂික අයවැය ලේඛනයක් සකස් කර	2021 2022 2023	මාර්ගෝපදේශ සංග්‍රහයේ දක්වා ඇති විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.	2024 සිට නිවැරදි ක්‍රියාමාර්ග ගනු ලබන බව, භාණ්ඩාගාරයේ ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් මූලික සාකච්ඡාවක් පවත්වන ලද බව.	2024 සිට අවශ්‍ය නිවැරදි ක්‍රියාමාර්ග අනුගමනය කරන බව.

	පාලක මණ්ඩලය විසින් අනුමත කළ යුතු අතර ඒවා රේඛීය අමාත්‍යාංශ ලේකම්වරයා මාර්ගයෙන් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට ඉදිරිපත් කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.				
5	2021 නොවැම්බර් 16 දින රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මෙහෙයුම් අත්පොතේ 3.1 ඡේදය ප්‍රකාරව කාර්යමණ්ඩලය සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගත යුතු වුවත් නියාමන සභාව ඒ අනුව කටයුතු කර නොතිබුණි.	2021 2022 2023	මෙහෙයුම් අත්පොතේ දක්වා ඇති විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.	මෙය මහා භාණ්ඩාගාරයේ ලියාපදිංචි නොකිරීමට සභාව ගත් ප්‍රතිපත්තිමය තීරණයක් බව.	2024 වර්ෂයේ සිට භාණ්ඩාගාරයේ ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව සමඟ මූලික සාකච්ඡාවක් පවත්වා ඇති බව.
6	2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන (ලියාපදිංචි කිරීමේ) පනතේ 18(2)(උ) වගන්තිය අනුව “සම්බන්ධතාවක් දක්වන හෝ අතෘප්තියට පත් තැනැත්තකු විසින් යම් පෞද්ගලික වෛද්‍ය ආයතනයකට හෝ එයට සම්බන්ධ තැනැත්තකුට විරුද්ධව ඉදිරිපත්	2021 2022 2023	එම පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය	නියාමන සභාව විසින් පැමිණිලි හැසිරවීමේ ක්‍රියා පටිපාටි සඳහා මාර්ගෝපදේශයක් සකස් කර ගරු සෞඛ්‍ය ඇමැති තුමා වෙත ඉදිරිපත් කර ඇති බව.	සභාව විසින් මාර්ගෝපදේශය ක් සකස් කර ගරු සෞඛ්‍ය ඇමැති තුමා වෙත ඉදිරිපත් කර ඇති බව.

	කරනු ලබන යම් පැමිණිල්ලක් භාරගැනීමේදී හා එම පැමිණිල්ල අවසාන වශයෙන් බැහැර කිරීමේදී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය හෝ පරිචය” සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි වුවත්, අමාත්‍යවරයා විසින් මෙම කරුණ සම්බන්ධයෙන් නියෝග සකස් කර නොතිබුණි.				
7	2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචි කිරීමේ පනතේ 2(1) උප වගන්තියේ විධිවිධාන ප්‍රකාරව, සියළුම පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචි විය යුතු අතර ලියාපදිංචි විය යුතු පෞද්ගලික වෛද්‍ය ආයතන හඳුනාගැනීමට, ලියාපදිංචි කරවීමට හා ලියාපදිංචි නොවන ආයතන සම්බන්ධයෙන් පනතේ 4 වන වගන්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමට විධිමත් ක්‍රමවේදයක් නියාමන සභාව විසින් පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි.	2021 2022 2023	සභාවේ ලියාපදිංචි විය යුතු වෛද්‍ය ආයතන හඳුනාගැනීමටත් , ලියාපදිංචි නොවන ආයතන සම්බන්ධයෙන් පනතේ 4 වන වගන්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමටත් විධිමත් ක්‍රමවේදයක් පිළියෙල කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය.	දත්ත සමුදාය සහ සමීක්ෂණය මත පදනම්ව ලියාපදිංචි නොකළ පෞද්ගලික වෛද්‍ය ආයතන හඳුනාගෙන ඇති බව, ලියාපදිංචි නොකරන ලද ආයතන වෙත දැනුම්දීම් ලිපි යැවීම, භාෂා තුනකින් පුවත්පත් දැන්වීම් පළ කිරීම, ලියාපදිංචි නොකළ ආයතනවලට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට නීති උපදේශකවරයා සමඟ සාකච්ඡා කිරීම, බලයලත් නිලධාරියා සහ නඩු පවරන නිලධාරීන් පත් කිරීම හා ලියාපදිංචි නොකළ ආයතන හඳුනා ගැනීම සම්බන්ධයෙන් පොලිස්පතිවරයා සමඟ සාකච්ඡා කිරීම සිදුකළ	ලියාපදිංචි ආයතන සංඛ්‍යාවේ ප්‍රමාණවත් වර්ධනයක් අත්කරගෙන නොතිබුණි.

					බව.	
8	පනතේ 13(1) වන වගන්තිය අනුව සභාවේ උපදෙස් මත ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින්, පෞද්ගලික වෛද්‍ය ආයතන සඳහා ප්‍රතීතනය කිරීමේ යෝජනා ක්‍රමයක් ක්‍රමවත්ව දක්වා ක්‍රියාවේ යොදනු ලැබිය යුතු බවත්, ප්‍රතීතනය සඳහා වූ නිර්ණායක, සංයුක්ත වන පහසුකම්, සේවා සහ වෙනත් යම් සාධක නිශ්චිතව දැක්වෙන සියලු විස්තර ඒ නියමයෙහි ඇතුළත් විය යුතු බවත් දක්වා තිබුණද, 2023 දෙසැම්බර් 31 දින වන විටත් මෙම ප්‍රතීතන කටයුතු සම්බන්ධව නියෝග සකස් කර නීතියක් බවට පත් කර නොතිබුණි.	2021 2022 2023		එම පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය	අනාගතයේදී සලකා බලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලබන බව.	නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ දුර්වල ප්‍රගතියක් නිරීක්ෂණය විය.
9	2021 නොවැම්බර් 16 දින රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.4 ඡේදය අනුව අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කළ යුතු වුවද නියාමන සභාව ඒ අනුව කටයුතු කර	2021 2022 2023		චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.	මීළඟ සභා රැස්වීමේදී මෙම ගැටළුව සම්බන්ධයෙන් සාකච්ඡා කරන බව.	නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ දුර්වල ප්‍රගතියක් නිරීක්ෂණය විය.

	නොතිබුණි.				
10	2019 ජනවාරි 12 දිනැති අංක ඩීඑම්ජ්/1-2019 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව, කාර්තුවකට 01 බැගින් වර්ෂයකට විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04 ක් පැවැත්විය යුතු වුවද, නියාමන සභාව විසින් සමාලෝචිත වර්ෂයේදී විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 02 ක් පමණක් පවත්වා තිබුණි.	2021 2021 2021	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.	මාර්ගෝපදේශයට අනුව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 2024 දී පැවැත්වීමට කටයුතු කරන බව.	2024 වර්ෂයේදි නියමිත පරිදි රැස්වීම් පවත්වන බව.
11	2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කර තිබුණු චක්‍රලේඛය හා තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර “2030 න්‍යාය පත්‍රය” පිළිබඳව නියාමන සභාව විසින් දැනුවත් වී නොතිබීම හේතුවෙන් තම විෂය පථය යටතට වැටෙන කාර්යයන් සම්බන්ධයෙන් තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟාවිය යුතු	2021 2022 2023	අදාළ චක්‍රලේඛය හා තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර “2030 න්‍යාය පත්‍රය” පිළිබඳව නියාමන සභාව දැනුවත්වී තම විෂය පථය යටතට වැටෙන කාර්යයන් සම්බන්ධයෙන් තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟාවිය යුතු සන්ධිස්ථානයන් ද ඉලක්ක මත ළඟාවීම මැන	මේ අනුව ඉදිරියේදී කටයුතු කරන බව.	නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ දුර්වල ප්‍රගතියක් නිරීක්ෂණය විය.

සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළඟාවීම මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි. මෙම තත්ත්වය පසුගිය වර්ෂ ගණනාවකදී පෙන්වා දුන්නද වගකිව යුතු පාර්ශවයන් ඒ සම්බන්ධයෙන් අවධානය යොමුකර නොතිබුණි

බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනාගැනීමට කටයුතු කළ යුතුය.

3.34 ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	58,936,924,589	44,161,126,175	14,775,798,414	3,156,736,063	තත්ත්වාගණනය කළ
2022	66,276,467,238	51,691,442,258	14,585,024,980	854,433,076	තත්ත්වාගණනය කළ
2023	56,706,998,908	43,843,010,902	12,863,988,006	1,267,716,682	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	2023 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 1,175.41 ක් වූ ණය ශේෂය තුල පුද්ගලික, රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන වලින් ලැබිය යුතු වර්ෂ 5 කට වැඩි හා වර්ෂ 1-5 ත් අතර කාලයක සිට ලැබිය යුතු පිළිවෙලින් රු.මිලියන 32.13 ක් හා රු.මිලියන 29.93 ක් හිඟව පැවතුණි. වර්ෂ 5ට වඩා වැඩි ණයගැති ශේෂයෙන් රු.මිලියන 28.54 ක් අක්‍රීය ණයගැති ශේෂ වූ අතර ප්‍රතිශතයක් ලෙස සියයට 89 ක් වි තිබුණි.	2023	ගිවිසුම් ප්‍රකාරව හා අයකර ගත යුතු කාලසීමාව තුල ණය අයකර ගැනීම කඩිනම් කළ යුතුය.	වර්ෂ 05 කට වැඩි පුද්ගලික, රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතනවලින් ලැබිය යුතු රු.මිලියන 28.47 ක් එලෙස පවතී. පාර්ලිමේන්තු සංකීර්ණයෙන් අයවිය යුතු ණයගැති වටිනාකම වූ රු.මිලියන 14.62 ද අනිකුත් රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතනවලින් ලැබිය යුතු රු.මිලියන 2.37 ද නීතිමය පියවරගත් රු.මිලියන 10.44 ක ණය ශේෂයද ඇතුලත් බව.	හිග ණය ශේෂ අයකර ගෙන නොතිබුණි.

(ආ)	1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය හා 2022 අප්‍රේල් 26 දිනැති 3/2022 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ උපදෙස් වලින් බැහැරව සංස්ථාවේ 51 වන සංවත්සරය වෙනුවෙන් විදුලි පන්දම් 932ක් සේවකයන් වෙත බෙදාදීම සඳහා රු.මිලියන 1.77 ක් වැය කර තිබුණි.	2023	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.	සේවකයන් දිරිගැන්වීම සඳහා ලබා දුන් ත්‍යාග හා සහතික සඳහා වූ වටිනාකම බව.	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
(ඇ)	2005 මැයි 06 දිනැති අංක 415 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛණය				
	(i) 02 ඡේදයට පටහැනිව ඖෂධ හා වෛද්‍ය උපකරණ ප්‍රසම්පාදනයට අදාල ලංසු කැඳවීමේදී ලංසු ප්‍රදානයට පෙර ලංකා නැව් සංස්ථාව සමඟ සාකච්චා කර වඩා වාසිදායක වන කොන්දේසිය අනුව FOB හෝ C & F වටිනාකම මත තෝරාගත් ලංසුකරු වෙත ලංසු ප්‍රධානය කිරීමට තීරණය කල යුතු වුවද ඉන් බැහැරව	2023	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.	අනුමත ලංසු ලියකියවිලි අනුව ලංසු කැඳවා ඇති බව.	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

ඖෂධ හා වෛද්‍ය උපකරණ ප්‍රසම්පාදනයට අදාල සියළු ලංසු කැඳවීම් වලදී C & F වටිනාකම මත තෝරාගත් ලංසුකරු වෙත ලංසු ප්‍රදානය කර තිබුණි.				
(ii) 03 ඡේදය ප්‍රකාරව ඖෂධ වෛද්‍ය උපකරණ ආනයනයේ දී සැපයුම්කරුවන් ගෙන් ගෙන්වා ගන්නා ලද නාමමාත්‍ර ඉන්වොයිස් වල නැව් ගාස්තු වටිනාකම සඳහන් කර ලබා ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් වඩා වාසිදායක විකල්පය තෝරා ගැනිමට කටයුතු කර නොතිබුණි.	2023	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.	අදහස් ඉදිරිපත් කර නැත.	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
(iii) 07 ඡේදය ප්‍රකාරව ණයවරලිපි විවෘත කිරීමේදී සැපයුම්කරු විසින් ඉටුකල යුතු එක් කොන්දේසියක් ලෙස ශ්‍රී ලංකා නැව් සංස්ථාවට අයත් යාත්‍රාවකින්	2023	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.	අදහස් ඉදිරිපත් කර නැත.	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

	හෝ ඔවුන් විසින් නම් කරන ලද යාත්‍රාවකින් භාණ්ඩ නැව් ගත කරන ලෙස දන්වා තිබූ ව්‍යතිරේඛයක් උපයෝගී කර ගනිමින් වාණිජ බැංකු හරහා ණයවර ලිපි විවෘත කර තිබුණි. අනාගතයේදී FOB පදනම මත නැව්ගත කිරීම සිදු කිරීමට ලංසුකරුවන්ට උපදෙස් ලබා දිය යුතු බව සඳහන් කර නැව් සංස්ථාව අත්හැරීමේ නිවේදනය නිකුත් කලද සංස්ථාව විසින් පෙර පරිදිම ලංසු ආරාධනයේ සිට C & F වටිනාකම පදනම්ව ලංසු ආරාධනා සිදු කර තිබුණි.				
(ඇ)	2015 අංක 05 දරණ ජාතික ඖෂධ නියාමන අධිකාරි පනතේ IV හි 58 (2) ඡේදය , 1985 දෙසැම්බර් 02 දිනැති අංක 378/3 දරණ අති විශේෂ ගැසට් පත්‍රයෙහි VI කොටසෙහි 68 (1)	2023	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.	මිල ගණන් ඉදිරිපත් කළ පාර්ශවයන් දෙකම ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි වී නොමැත.ඒ අනුව ටෙන්ඩරය පිරිනැමීම මෙම	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

	ඡේදය හා 2019 ඔක්තෝම්බර් 14 දිනැති අංක 2145/1 දරණ ගැසට් නිවේදනයේ XIII කොටසෙහි 122 ඡේදය ප්‍රකාරව සාමාන්‍ය නැව් බඩු, ශීතකරණය කරන ලද නැව් බඩු නිශ්කාෂණය කිරීම, ප්‍රවාහනය කිරීම සහ අවශ්‍ය වූ විට ගබඩා කිරීම සඳහා තෝරා ගත් වෛද්‍ය සැපයුම් අංශයේ තොග සඳහා එක් ආයතනයක් වෙත හා සංස්ථාවේ තොග ප්‍රවාහනය සඳහා වසර 05 ක සේවා පළපුරුද්ද නොමැති තවත් ආයතනයක් වෙත ලබා දීමට ගිවිසුම් ගත වී තිබූ නමුත් යොමුගත චක්‍රලේඛ ප්‍රකාරව ඖෂධ ප්‍රවාහනයට අදාල වාහන සඳහා ඖෂධ නියාමන අධිකාරියෙන් බලපත්‍රයක් ලබා ගත යුතු වුවත් තෝරාගත් සැපයුම්කරුවන් එම අවශ්‍යතාවය සම්පූර්ණ කර නොතිබුණි.			කරුණ මත බලපෑමක් සිදුවී නැත බව.	
(ඉ)	2022 දෙසැම්බර් 21 දිනැති අංක පීඊඩී 08/22 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය	2023	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.	ඉතිරි අසනීප හා වාර්ෂික නිවාඩු සඳහා ගෙවීම් කර ඇත්තේ සේවා	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

	ප්‍රකාරව ඉතිරි නිවාඩු මත දීමනා ගෙවීමේදී සේවකයන්ට හිමි නිවාඩු 1954 අංක 19 දරන සාප්පු හා කාර්යාල සේවක පනතේ විධිවිධානයන්ට අනුකූලව ගණනය කල යුතු වුවද ඉන් බැහැරව රු.මිලියන 54.48 ක් ඉතිරි අසනීප නිවාඩු වෙනුවෙන් ගෙවා තිබුණි.			සේවක දෙපාර්ශවය අතර ඇති කර ගෙන ඇති සාමූහික ගිවිසුමේ එකඟතාව මත අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගන්නා ලද තීරණයන්ට අනුව බව.	
(ඊ)	2023 දෙසැම්බර් 11 දිනැති අංක පීඊඩී 04/2023 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 01 හි 3 වන ඡේදය හා 3.2 ඡේදය ප්‍රකාරව සාමූහික ගිවිසුම් හෝ ඒ හා සමාන අවබෝධතා ගිවිසුම් මගින් හෝ වැටුප් හා දීමනා ක්‍රියාත්මක කරන රාජ්‍ය සංස්ථා සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම් වල සේවකයන් හට හා 2022 වර්ෂයේ අලාභ ලැබූ සංස්ථා සඳහා ප්‍රසාද දීමනා ගෙවීමට නොහැකි බව දක්වා තිබුණ ද ඉන් බැහැරව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත එක් සේවකයකුට රු.20,000 බැගින්	2023	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.	අදහස් ඉදිරිපත් කර නැත.	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

	රු.මිලියන 16.64 ක් ප්‍රසාද දීමනා ගෙවා තිබුණි.				
(උ)	2012 ජුනි 13 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණය පරිදි රක්ෂණ අරමුදලක් පිහිටුවීමට රු. මිලියන 3ක් වාර්ෂික අයවැයෙන් වෙන් කිරිමටත් සේවකයින්ට රු.500,000ක් දක්වා ප්‍රතිපූරණය ඇතුළු සේවකයින් හා පවුලේ සමාජිකයින්ගේ වෛද්‍ය බිල්පත් ප්‍රතිපූරණයට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතින් වරින් වර ලබා දී තිබුණ ද එලෙස රක්ෂණ අරමුදලක් නොපිහිටුවා සංස්ථා අරමුදල් වලින්ම ප්‍රතිපූරණයන් සිදු කර තිබුණි. මේ සඳහා භාණ්ඩාගාර අනුමැතිය ද ලබා ගෙන නොතිබුණි.	2023	අධ්‍යක්ෂ මණ්ඩල තීරණය ප්‍රකාරව කටයුතු කළ යුතුය.	වර්තමාන තත්ත්වය අධ්‍යක්ෂක මණ්ඩලයට ඉදිරිපත් කර රක්ෂණ අරමුදලක් පිහිටු විමට කටයුතු කරන බව.	අධ්‍යක්ෂ මණ්ඩල තීරණය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
(ඌ)	වෛද්‍ය සැපයීම් අංශයෙන් ප්‍රතික්ෂේපිත ඖෂධ හා වෛද්‍ය උපකරණ තොග පෞද්ගලික ගබඩාවක තබා තිබූ අතර එම ඖෂධ හා වෛද්‍ය උපකරණ අතරින් 2021 වර්ෂය	2023	තත්ත්වයෙන් අසමත් ඖෂධවල වටිනාකම් සැපයුම්කරුවන්ගෙන් අයකර ගැනිමට හා ගබඩා පිරිවැය අවම වන ලෙස ප්‍රතික්ෂේපිත අයිතම විනාශ කිරිමට කටයුතු	වෛද්‍ය සැපයිම් අංශය මගින් ප්‍රතික්ෂේප කරන තත්වයෙන් බාල පළුදු වූ විවිධ හේතු මත හානි වන භාණ්ඩ තොග නියමිත පටිපාටියට අනුව විනාශ කරන තුරු තබා ගැනීමට	ප්‍රතික්ෂේපිත අයිතම විනාශ කිරිමට මෙතෙක් කටයුතු කර නොතිබුණි.

අවසාන වන විට වටිනාකම රු.මිලියන 98.34 ක් වූ අයිතම 17 ක් , වටිනාකම හඳුනාගත නොහැකි අයිතම 74 ක් හා 2022 වර්ෂය තුලදී ප්‍රතික්ෂේපිත ඖෂධ හා වෛද්‍ය උපකරණ වටිනාකම රු.මිලියන 4.88 ක් වූ අයිතම 28 ක් හා වටිනාකම හඳුනාගත නොහැකි අයිතම 5 කට අදාළව ඖෂධ හා වෛද්‍ය උපකරණ තොග විනාශ කිරිම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී නොතිබුණි. 2005 වර්ෂයේ සිට වෛද්‍ය සැපයීම් අංශයේ අවශ්‍යතා වෙනුවෙන් මිලදී ගත් ප්‍රතික්ෂේපිත ඉන්ඩෙන්ටු 54 කට අයත් තොග අයිතම විනාශ කිරිම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී තිබුණද එම ඉන්ඩෙන්ටු 54 ට අයත් තොග අයිතම විනාශ කිරීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. ඒ අනුව පසුගිය වසර 05 ක කාලසීමාව තුල රඳවා ගත් අයිතම ගබඩා කර තබා	කළ යුතුය.	ගබඩා පහසුකම් අවශ්‍ය වේ.මේ සඳහා අප පෞද්ගලික ගබඩා පහසුකම් ලබා ගෙන ඇත. ඒ වෙනුවෙන් පසුගිය කාල සිමාව ට අදාළ ගාස්තු ගෙවා ඇත බව.

	ගැනිම වෙනුවෙන් පුද්ගලික ආයතනයක් වෙත රු.මිලියන 15.52 ක් ගෙවා තිබුණි.				
(එ)	වෛද්‍ය සැපයීම් අංශයේ අවශ්‍යතා වෙනුවෙන් මිලදී ගෙන ප්‍රතික්ෂේපිත වූ අයිතම, වායු සමනය කල පෞද්ගලික ගබඩාවක තබා කල්ඉකුත් විමෙන් පසු රත්මලාන අපහරණ ගබඩාව වෙත මාරු කල යුතු ඉන්ඩෙන්ටු 09 කට අදාල අයිතම කල් ඉකුත් විමෙන් පසු මාරු නොකර වසරකට අධික කාලයක් වායුසමනය කල ගබඩාවේ රඳවා තබා ගැනිම හේතුවෙන් රු.මිලියන 1.03 ක ගබඩා ගාස්තු ගෙවා තිබුණි. එමෙන්ම තවත් අයිතම දෙකක් කල්ඉකුත් වී අවුරුද්දකට වැඩි හා මාස 04 ක් ගත වී ඇතත් එම අයිතම තවදුරටත් වැඩි පිරිවැයක් යටතේ ගබඩා පරිශ්‍රයේ ගබඩා කර තිබුණි.	2023	ගබඩා පිරිවැය අවම වන පරිදි ප්‍රතික්ෂේපිත භාණ්ඩ වලට අදාලව නීතිමය කටයුතු තිබේ නම් එම කටයුතු සිදු කිරිම කඩිනම් කළ යුතු අතර කල් ඉකුත් වූ ඖෂධ වැඩි කාලයක් වායුසමනය කල ගබඩාවේ රඳවා තබා ගැනිම හේතුවෙන් දැරිමට සිදු වූ අතිරේක පිරිවැය වගකිව යුතු පාර්ශවයන්ගෙන් අය කළ යුතුය.	රත්මලාන ගබඩාවේ ඇති අයිතම තොග අපහරණ සඳහාම භාවිත කරන බැවින් එම ගබඩාවේ දූවිලි හා අධික රස්නය පවතී.එබැවින් වෛද්‍ය සැපයුම් අංශය ප්‍රතික්ෂේපිත භාණ්ඩ කල් ඉකුත් වූවත් යම් නීතිමය හෝ වෙනත් කරුණක් මත සැපයුම්කරුවන්ට හෝ ඔහුගේ දේශීය නියෝජිතයින්ට එය පරික්ෂා කල නොහැකි මට්ටමක පවතියි.තවද මේ සඳහා අදාළ වන ගබඩා ගාස්තු තොග විනාශ කිරීමේදී සැපයුම්කරුගෙන් අයකර ගැනීම පිළිබඳව ද කටයුතු කරනු ලබන බව.	දැරිමට සිදු වූ අතිරේක පිරිවැය වගකිව යුතු පාර්ශවයන්ගෙන් අය කර ගැනිමට කටයුතු කර නොතිබුණි.
(ඒ)	2023 දෙසැම්බර් 31 දිනට වෛද්‍ය සැපයුම් අංශයෙන්	2023	වෙනස්කම් පිළිබඳව සැසඳිම් සිදු කර අවශ්‍ය	ගිණුම් අනුව පෙන්වා ඇති වෛද්‍ය සැපයීම්	ශේෂ සැසඳිම් සිදු කරමින් පවති.

	ලැබිය යුතුව තිබූ ශේෂය රු.මිලියන 38,855.58 ක් වුවද වෛද්‍ය සැපයීම් අංශය මඟින් ඉදිරිපත් කරන ලද තොරතුරු වලට අනුව එදිනට එම ශේෂය රු.මිලියන 54,364.84 ක් වූයෙන් රු.මිලියන 15,509.27 ක වෙනසක් නිරීක්ෂණය විය.	ගැලපීම් සිදු කළ යුතුය.	මුළු ණයගැති ශේෂය හා එකඟ වන අතර සෞඛ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන අනුව දී ඇති ශේෂය හා එකඟ විය නොහැක.	
(ඔ)	මිලදී ගෙන තිබූ 2023 තත්ත්වයෙන් අසමත්,කල් ඉකුත් වූ හා හානි වූ ඖෂධ වල මුළු පිරිවැය 2023 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 485.05 ක් වූ අතර තත්ත්වයෙන් අසමත්,කල් ඉකුත් වූ හා හානි වූ ඖෂධ වල මුළු පිරිවැය රු.මිලියන 291.74 ක් විය. තත්ත්වයෙන් අසමත් ඖෂධ වල මුළු පිරිවැය රු.මිලියන 265.77කින් රු.මිලියන 70.81 ක් අය කර ගෙන නොතිබුණි. ඖෂධ කල්ඉකුත් වීම හා හානිවීම නිසා සංස්ථාවට දැරීමට සිදු වූ මුළු අලාභය රු.මිලියන 86.37 ක් විය.	අයකර නොගත් මුදල් සැපයුම්කරුවන්ගෙන් අයකර ගැනීම කඩිනම් කළ යුතුය.	2023 වර්ෂයට අදාල තත්ත්වයෙන් අසමත් ඖෂධ සඳහා මුළු හරපත් වටිනාකම රු.මිලියන 401.07 ක් වේ. එම සංඛ්‍යාවට තත්ත්වයෙන් අසමත්වූ කාණ්ඩයේ ගොඩබෑමේ පිරිවැය , සියයට 25 ක දඩ මුදල හා වෙනත් ප්‍රමාද ගාස්තු ආදියද ඇතුලත් වේ. තව දුරටත් අයකර ගැනීමට ඇති වටිනාකම රු.මිලියන 54.33 ක් වන අතර ඒ සඳහා කටයුතු කරමින් පවතින බව.	තව දුරටත් අයවිමට ශේෂයන් පවති.

(ඕ)	Enoxaparin Injection 60mg in 0.6ml in prefilled Syringe එන්නත් කුප්පි 1,000,000 ක් මිලදී ගැනීමේ ප්‍රසම්පාදනයේදී වරායෙන් තොග නිදහස් කරගැනිමට ප්‍රමාද විම මත වරාය විසින් අයකරන ලද ප්‍රමාද ගාස්තු රු.මිලියන 2.01 ක් නැව් ගත කල භාණ්ඩ සම්බන්ධව අදාල ලියවිලි වල පිටපත් එවීමේ කාල පමාව මත සලකමින් සංස්ථාව විසින් අදාළ සැපයුම්කරුගෙන් අයකර ගැනීමට තීරණය කර තිබුණ ද සැපයුම්කරු අදාල නැව ශ්‍රී ලංකා වරායට පැමිණීමට නියමිතව තිබූ දිනට දින 04 කට පෙර අදාල ලියවිලි වල පිටපත් සංස්ථාවේ ප්‍රසම්පාදන අංශය වෙත එවා තිබුණි. ඒ අනුව සංස්ථාව විසින් දරණ ලද ප්‍රමාද ගාස්තුව වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	2023	සිදූ වු හානි හෝ පාඩු වගකිව යුතු පාර්ශ වයන්ගෙන් අයකර ගැනිමට කටයුතු කළ යුතුය.	අදහස් ඉදිරිපත් කර නැත.	වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි.

(ඖ)	ඔසුසල් මගින් අලෙවිකරනු ලබන ඖෂධවල මිල තීරණය කිරීමට අදාලව අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක BP/209/07 අනුව බල පැවැත්වෙන මිල සූත්‍රයට අනුව ගැනුම් මිලත් තොග මිලත් අතර සියයට 57.57ක හා ගැනුම් මිලත් සිල්ලර මිලත් අතර සියයට 81.20 ක ලාභ ප්‍රතිශතයක් විය යුතු වුවද ඉන් බැහැරව සිල්ලර මිල තීරණය කිරිමේදි සියයට 82ත් 205 අතර මිලක් හා තොග මිල තිරණය කිරිමේ දි සියයට 58 ත් 165 ක් අතර ලාභ ප්‍රතිශතයන් නියම වු අවස්ථා නියැදි විගණන පරික්ෂාවේ දී නිරික්ෂණය විය. ඒ අනුව මෙම මිල සූත්‍රයට පටහැනිව තිරණය වි ඇති මිලෙන් සංස්ථාවේ මූලික අරමුණ වූ අවම පිරිවැයට ගුණාත්මක ඖෂධ සැපයීමේ අරමුණින් බැහැර වි තිබුණි.	2023	ඖෂධ වල මිල තීරණය කිරිමට නිෂ්චිත ප්‍රතිපත්තියක් පැවතිය යුතු අතර එය සංස්ථාවේ අරමුණ ඉටුවන ආකාරයෙන් සකස්විය යුතුය.	සංස්ථාවේ ඖෂධ මිල තීරණය කිරීමේදී යොදා ගනු ලබන මිල සූත්‍රය මාර්ගෝපදේශයක් ලෙස භාවිතා කරනු ලබන අතර, ඇතැම් අවස්ථාවලදී වෙළඳපල මිල පිළිබඳ අවධානය යොමු කොට මිලකරණය සිදු කරනු ලබයි.කෙසේ වුවද තවදුරටත් පාරිභෝගිකයාට සහනදායි ලෙස මිල තීරණය කිරීමට දැනටමත් අවශ්‍ය කටයුතු කරමින් පවතින බව.	ඖෂධ වල මිල තීරණය කිරිමට නිෂ්චිත ප්‍රතිපත්තියක් නොතිබුණි.
(ක)	ඖෂධ බෙදාහැරීම සඳහා ඔසුසැල් 52 ක් පවත්වාගෙන යමින් සිය මෙහෙයුම් කටයුතු සිදුකරනු ලබන	2023	අලාභ ලබන ඔසුසල් පිළිබඳව නිරන්තර අධික්ෂණයක් සිදු කරමින් අලාභ ලැබිමට බලපෑ	එකඟ වන බව.	වර්තමානය වන විටත් අලාභ ලබන ඔසුසලවල් පවතී.

	අතර එයින් ඔසුසැල් 11 ක් 2022 වර්ෂයේදී අලාභ ලබා තිබුණි. 2023 වර්ෂයේදී එම තත්ත්වය 18 ක් දක්වා වර්ධනය වී තිබු අතර රු.මිලියන 45.22 ක අලාභයක් වාර්තා වී තිබුණි. ඒ අතරින් ඔසුසැල් 8ක් 2021,2022 හා 2023 යන ආසන්න වර්ෂ 3 දීම අලාභ ලබා තිබුණි. රත්නපුර, නින්දවූර් , අක්කරේපත්තු හා නාරාහේන්පිට යන ඔසුසැල්වල සේවක වියදම් පියවීමට ප්‍රමාණවත් දළ ලාභයක් උපයා ගැනීමට නොහැකි වී තිබුණි.		හේතු සොයා බලා පිළියම් යෙදිම තුලින් අලාභ අවම කර ගැනිමට හෝ ලාභ ලබන තත්ත්වයට පත්කර ගැනිමට කටයුතු කළ යුතුය.		
(බ)	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා පරිපාලන) තනතුර සඳහා බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණයට අදාලව තෝරාගත් අයදුම්කාරියට බඳවා ගැනීමේ පටිපාටියට අනුව තිබිය යුතු සේවා පලපුරුද්ද නොමැති අවස්ථාවක දී හා තෝරා නොගත් අයදුම්කරුට සේවා පලපුරුද්ද තිබියදී දෙදෙනාටම සම	2023	බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණයට අදාලව සහ නිලධාරිනිය විසින් ඉදිරිපත් කරන ලද සේවා සහතිකය සම්බන්ධව විධිමත් ස්වාධින පරීක්ෂාවක් සිදුකර අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගැනිමට කටයුතු කළ යුතුය.	වංචා විමර්ශන අංශය වෙත පැමිණිල්ලක් ගොනුකර ඇත. එම පරීක්ෂණයේ ප්‍රතිඵල අනුව අවශ්‍ය ඉදිරි පියවර ගනු ලබන බව.	සංස්ථාව විසින් අභ්‍යන්තර පරීක්ෂණයක් සිදු කර නොතිබුණි.

	ලකුණු ලබා දීම හා තෝරා ගත් අයදුම්කාරියට අතිරේක වෘත්තීය සුදුසුකම් ලෙස පශ්චාත් උපාධියට ලකුණු ලබා දීම තුල තෝරා නොගත් අයදුම්කරුට අතිරේක වෘත්තිය සුදුසුකම් තිබියදීත් එය නොසලකා තිබුණි. තෝරා ගත් අයදුම්කාරිය විසින් 2016 මාර්තු 08 සිට 2018 ජූලි 31 දින දක්වා මානව සම්පත් අංශයේ ප්‍රධානියා ලෙස සේවය කල බවට ඉදිරිපත් කරන ලද සේවා සහතිකය කූඨ ලේඛනයක් බව එම සහතිකය නිකුත් කල ආයතනය මඟින් දන්වා තිබුණ ද එම නිලධාරිනිය සම්බන්ධව අභ්‍යන්තර පරික්ෂණයක් සිදු කර අදාල ඉදිරි ක්‍රියාමාර්ග කඩිනම් කිරිමට කටයුතු කර නොතිබුණි.				
(ග)	පිරිවැය රු.මිලියන 85.76 ක් වූ Bevacizumab Injection 100mg/4ml ඖෂධයෙන් එන්නත් කුප්පි 1,729 ක් මිලදී	2023	විධිමත් ස්වාධීන පරීක්ෂණයක් පවත්වා ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය.	අදහස් ඉදිරිපත් කර නැත.	මූලික විමර්ශණයක් පැවැත්වීමට නිලධාරියකු පත් කර තිබුණි.

	ගැනීමේ ප්‍රසම්පාදනයේ දී ඒකකයක මිල රු. 35,000 ක පාලන මිලක් නියම කර තිබිය දී ඒකකයක් සඳහා රු. 49,600 ක් බැගින් මිලක් ඉදිරිපත් කල දෙවන අවම සැපයුම්කරු වෙත ලංසුව ප්‍රදානය කිරීම හේතුවෙන් රු.මිලියන 25.24 ක අලාභයක් දැරීමට සිදු වී තිබුණි.				
(ස)	Amisulpride Tablets 100mg ඖෂධයෙන් ඒකක 440,000 ක් මිලදී ගැනීමේ ප්‍රසම්පාදනයට අදාලව සුළු දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු තීරණය වූයේ 2021 වර්ෂයේ ඇණවුමෙහි තත්ත්වය ප්‍රසම්පාදන කමිටුව වෙත ඉදිරිපත් කරන ලෙසය. නමුත් 2023 ජූනි 15 දිනට අවුරුදු 01 මාස 10 ක් ගත කල ද මේ පිළිබඳ තොරතුරු ප්‍රසම්පාදන කමිටුව වෙත ඉදිරිපත් කර නොතිබුණි. එමෙන්ම 2023 වර්ෂය වෙනුවෙන් ඖෂධ ඒකක 120,000 ක් සැපයිම සඳහා තෝරාගත්	2023	ප්‍රසම්පාදන කමිටුව වෙත තොරතුරු ඉදිරිපත් කිරීම ප්‍රමාද කිරිමට අදාල වගකිව යුතු නිලධාරින් සම්බන්ධව සොයා බලා ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය. තොග තත්වය සලකා බලා කඩිනමින් ප්‍රසම්පාදන කටයුතු කළ යුතුය.	එකඟ වන බව.	මේ සම්බන්ධව ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.

	ලංසුකරුට ලංසුව ප්‍රදානය කල ද ලංසුකරු ලියාපදිංචියෙන් නිදහස් වීම සහතිකය ලබා ගෙන නොතිබුණි. අධ්‍යක්ෂ ජනරාල් සෞඛ්‍ය සේවා මඟින් 2023 අප්‍රේල් 04 දින නිකුත් කල අංක 01-14/2023 දරන චක්‍රලේඛය මඟින් මෙම ඇණවුම ක්‍රියාත්මක කිරීම තාවකාලිකව නවතා තිබුණි.මෙම ඖෂධයේ මාසික අවශ්‍යතාවය ඒකක 45,730 ක් වුවද 2021, 2022 හා 2023 වර්ෂවල සංස්ථාවට ලද ඇණවුම් සම්පූර්ණ නොකිරීම හේතුවෙන් 2023 ජනවාරි 26 දිනට තොග මට්ටම ශූන්‍ය වී තිබුණි.				
(ඞ)	Prednisolone Acetate Eye drop 1%, 5ml ඖෂධයෙන් පිරිවැය රු.මිලියන 3.35 ක් වූ එන්නත් කුප්පි 50,000 ක් මිලදී ගැනීමේ ප්‍රසම්පාදනයට අදාලව ඖෂධ සැපයීමට පෙර සාම්පල් සඳහා ස්වාධීන	2023	සිදුකරන ලද පරික්ෂාවන් ස්වාධින විය යුතුය. සිදුව ඇති අලාභය සම්බන්ධව වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය.	දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු නිර්දේශය අනුව සැපයුම්කරුට උපදෙස් ලබාදී ඇති ආකාරයට සැපයුම්කරු විසින් NABL ප්‍රමිතිගත රසායනාගාර ලැයිස්තුවේ සඳහන් Bee Pharma යන ආයතනය තෝරාගෙන ඇති	සිදුව ඇති අලාභය සම්බන්ධව වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

රසායනාගාර වාර්තාවක් ලබා ගැනීමට යටත්ව අවම මිල ඉදිරිපත් කල සැපයුම්කරු දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් තෝරා ගෙන තිබුණ ද එසේ ස්වාධීන පරික්ෂාවක් නොමැතිව ඇණවුම් කර තිබුණි. මෙම ඖෂධය සම්බන්ධව ජාතික ඇස් රෝහලේ අධ්‍යක්ෂකගේ පැමිණිල්ලකට අනුව ජාතික තත්ත්ව සහතික රසායනාගාරය මඟින් සාම්පල් පරීක්ෂා කර නිකුත් කල වාර්තාව මඟින් රසායනාගාරය තුල සිදු කල Sterility පරීක්ෂණයට අනුව සාම්පල් BP ප්‍රමිත වලට අනුකූල නොවන බව තහවුරු වීම මත වෛද්‍ය සැපයුම් අංශයේ අධ්‍යක්ෂකගේ 2023 අප්‍රේල් 25 දිනැති අංක MSD/SCU(S)/CIR /2023 දරන චක්‍රලේඛය මඟින් එන්නත වහාම භාවිතයෙන් ඉවත් කරන ලෙස රජයේ සියලුම රෝහල් හා ආයතන වෙත දැනුම් දී තිබුණ ද ඖෂධ

අතර ඒ අනුව අදාල පරීක්ෂණ වාර්තා ලබාදී ඇත.

	තොගය බෙදාහැරීමෙන් දින 21 කට පසු භාවිතයෙන් ඉවත් කර තිබුණි.			
(ඝ)	හදිසි මිල දී ගැනීමක් 2023 ලෙස වෛද්‍ය සැපයුම් අංශය විසින් ඉදිරිපත් කර තිබු Cardiac Troponin I Qualitative Strips ඖෂධයෙන් ඒකක 7,600 ක් මිල දී ගැනීමේ ප්‍රසම්පාදනයට අවම මිල ඉදිරිපත් කල ලංසුකරු වෙත රු.මිලියන 3.72 ක වටිනාකමකට ලංසුව ප්‍රදානය කලද තෝරාගත් සැපයුම්කරු ලංසු ලියවිලි වලට අනුව සාම්පල් ඉදිරිපත් කර නොතිබුණි. ලංසු ලියවිලි වලට අනුව ජාතික ඖෂධ නියාමන අධිකාරි සහතිකය හෝ විලවුන් උපාංග ඖෂධ අධිකාරි සහතිකය අනිවාර්ය කර තිබුණ ද ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචිය තාවකාලික අත්හැරීමේ ලිපියක් නිකුත් කිරීම මඟින් ලබා ගත් මෙම ඖෂධ තොගය වෛද්‍ය සැපයීම්	තත්ත්වයෙන් අසමත් ඖෂධ සැපයිමට අදාළව දැරිමට සිදු වූ පිරිවැය සැපයුම්කරුගෙන් අය කළ යුතුය. ප්‍රසම්පාදන ක්‍රියාවලියේදි අදාළ වන ලංසු ලියවිලි ප්‍රකාරව කටයුතු කළ යුතුය. මෙම ප්‍රසම්පාදනය සම්බන්ධව විධිමත් ස්වාධීන පරික්ෂාවක් පවත්වා ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය.	නිරික්ෂණය සමඟ එකඟ වෙමි.අදාල ප්‍රදානය සිදු කර ඇත්තේ සෞඛ්‍ය අමාත්‍යාංශ හදිසි ප්‍රසම්පාදන කමිටුව විසිනි. සියයට 25 පරිපාලන ගාස්තුව ඉදිරියේදී අය කර ගැනිමට කටයුතු කරන බව.	ප්‍රසම්පාදනය සම්බන්ධව විධිමත් ස්වාධීන පරික්ෂාවක් සිදු කර නොතිබුණි.

අංශයට භාර දී තිබූ අතර සැපයූ ඖෂධවල දෝෂ ඇති බැවින් භාවිතයෙන් ඉවත් කර ගන්නා ලෙසත් ඒ සඳහා නව කාණ්ඩයේ තොග කිසිදු පිරිවැයක් නොදරා ලබා දෙන බව සැපයුම්කරු දන්වා තිබුණි. ඒ අනුව ඉන්ඩෙන්ටුවේ සැපයුම් කොන්දේසි 7 (a), (c) ඡේදය අනුව ඖෂධ තත්ත්වයෙන් අසමත් වීම හේතුවෙන් මුළු වටිනාකම මත සියයට 25ක අධිභාර මුදලක් සැපයුම්කරුගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. ජාතික ඖෂධ තත්ත්ව සහතික රසායනාගාර වාර්තාව අනුව බාණ්ඩය හැකි ඉක්මනින් ඉවත් කර ගත යුතු බව තහවුරු කර ඇත. ඒ අනුව අදාල ඖෂධ තොගය තත්ත්වයෙන් අසමත් බව වෛද්‍ය සැපයුම් අංශයට තොග සැපයූ දිනට පසු දිනම සැපයුම්කරු හඳුනාගත්තද

	සංස්ථාවට එම ලිපිය ලිඛිතව ලැබුණු දිනට පසු වෛද්‍ය සැපයුම් අංශයට දැනුවත් කර තිබීම හේතුවෙන් වෛද්‍ය සැපයුම් අංශය විසින් තත්ත්වයෙන් අසමත් ඖෂධ ඒකක 1,800 ක් ප්‍රාදේශීය සැපයුම් අංශය වෙත හා දිස්ත්‍රික් මහ රෝහල් වෙත නිකුත් කර තිබුණි.				
(ච)	රාජ්‍ය ඔසුසල් තුල අලෙවි කිරීම සඳහා පිරිවැය රු.මිලියන 3.9 ක් වූ Bisoprolol Fumarate Tablets 5mg ඖෂධයෙන් ඒකක 30 ඇසුරුම් ඒකක 20,000 ක් මිලදී ගැනීමේ ප්‍රසම්පාදනයට සැපයුම්කරු විසින් ඒකක 250 බෝතල් ඇසුරුම් වලින් ලංසු ඉදිරිපත් කර තිබුණි. දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව ඒ පිළිබඳ අවධානයක් යොමු නොකර ප්‍රසම්පාදනය ප්‍රදානය කර තිබුණි. ලංසු ඉදිරිපත් කල එකම ලංසුකරු ලංසුව විවෘත කරන අවස්ථාවේ දී ලංසු සුරක්ෂණයක් හා සාම්පල් ඉදිරිපත්	2023	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය සහ වරින්වර යාවත්කාලීන කරනු ලැබ ඇති එහි සංශෝධනයන්ට අනුකූලව ප්‍රසම්පාදන කළමනාකරණය සිදු කළ යුතුය. එපරිදි කටයුතු නොකිරීම හේතුවෙන් සිදුවන හානි හෝ පාඩු වගකිව යුතු නිලධාරීන්ගෙන් අධිහාර කිරිමට කටයුතු කළ යුතුය.	පැවති තොග ශුන්‍ය තත්වය සලකා බලා එකම ලංසුකරුට ලංසු ප්‍රධාන කිරිමට තිරණය කර ඇත. .ප්‍රසම්පාදන කමිටු තීරණය ලබා දී ඇත්තේ කාර්ය සාධන සුරක්ෂණයක් ලබා ගැනීම යන කොන්දේසිය යටතේ බව පිළිගන්නා අතර මෙම ඇණවුමට අදාලව ප්‍රතිග්‍රහන ලිපියක් නිකුත් කිරීමකින් තොරවම ඇණවුම ලබාදීමේදී එම ඇණවුමේ සිට දින 14ක් ඇතුලත අදාල සුරක්ෂණය ලබා දෙන ලෙස දක්වා ඇති බව.	මේ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

	කර නොතිබුණි. මෙම ප්‍රසම්පාදනයට අදාලව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.4 ඡේදය ප්‍රකාරව තාක්ෂණික ඇගයීම් කමිටු පත් කර නොතිබුණි. එමෙන්ම ප්‍රසම්පාදන කමිටු තීරණය ප්‍රකාරව කාර්යසාධන සුරක්ෂණයක් ලබා ගැනීමෙන් පසුව ලංසුව ප්‍රදානය කල යුතු වුව ද කමිටු තීරණය නොසලකා කාර්යසාධන සුරක්ෂණය ලබා දීමට දින 11 කට පෙර ගැනුම් ඇණවුම නිකුත් කර තිබුණ ද මාස 02 ක් ප්‍රමාදව සමස්ත ඇණවුම සපයා තිබුණි.			
(ඡ)	රාජ්‍ය ඔසුසල් වල 2023 අලෙවි කිරීම සඳහා පිරිවැය රු.මිලියන 15.26 ක් වූ Bisoprolol Fumarate Tablets 2.5mg ඖෂධයෙන් ඒකක 30 ඇසුරුම් 30,000 ක් මිලදී ගැනීමේ ලංසු ලේඛන පරිදි සාම්පල් ඉදිරිපත්	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව ප්‍රසම්පාදන කළමනාකරණය සිදු නොකිරීම හේතුවෙන් සිදුවන හානි හෝ පාඩු වගකිව යුතු නිලධාරීන්ගෙන් අයිහාර කිරීමට කටයුතු කළ	අයිතම සැපයිය හැකි ලංසුකරු සහ අයිතම සපයනු ලබන ඒකකයක ප්‍රමාණය සලකා බලා SPC හි තොග ශූන්‍ය තත්වය යටතේ දෙවන අවම මිල ඉදිරිපත් කල ලංසුකරුට ලංසුව ප්‍රධාන කර ඇති බව.	මේ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

	කල යුතු වුවත් තෝරාගත් සැපයුම්කරු සාම්පල් ඉදිරිපත් කර නොතිබුණි. සංස්ථාව විසින් තෝරා ගත් සැපයුම්කරු වෙත ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.7.1 වගන්තිය අනුව ප්‍රතිග්‍රහන ලිපියක් නිකුත් කර නොතිබුණි. එමෙන්ම ගැනුම් ඇණවුම ප්‍රකාරව ඇණවුම ලැබී දින 14 ක් ඇතුලත කාර්යසාධන බැඳුම්කරයක් අදාල සැපයුම්කරුවන් විසින් ලබා දිය යුතු වුවත් ගැනුම් ඇණවුම සැපයුම්කරු වෙත ලැබී දින 40 ක ප්‍රමාදයකින් පසුව කාර්යසාධන බැඳුම්කරයක් සංස්ථාව වෙත දී තිබුණි.		යුතුය.අවශ්‍ය සංශෝධන සැපයුම්කරු සිදු නොකිරිම සම්බන්ධව සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය.		
(ජ)	Triamcinolone acetonide (presentive free) inj ඖෂධයෙන් ඒකක 1,500ක් මිලදී ගැනීමේ ප්‍රසම්පාදනයට අදාලව ලංසු ඉදිරිපත් කල එකම සැපයුම්කරු වෙත	2023	ප්‍රමාද වී තොග සැපයීම සම්බන්ධවත්, තොගය ප්‍රතික්ෂේප කිරීම මත දරන්නට සිදුවූ සියලු පිරිවැය වගකිව යුතු පාර්ශවයන්ගෙන් අය කර ගැනිමට කටයුතු කළ යුතුය.	පිරිවිතරයට අනුකූල නොවීම පමණක් ප්‍රතික්ෂේප වීමට හේතු වී ඇති බව.	මේ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

එ.ජ. ඩොලර් 27,645 ක වටිනාකමකට ඇණවුම ප්‍රදානය කලද සැපයුම්කරු විසින් වෛද්‍ය සැපයුම් අංශයට පලමු තොගය වූ ඒකක 750 මාස 4 ක් හා දෙවන තොගය වූ ඒකක 750 මාස 3 ක් ප්‍රමාදයකින් සපයා තිබුණද ඉන්ඩෙන්ටුවේ සදහන් ආකාරයට අයිතම ලබාදී නොතිබීම, ජීව කාලය ලංකාවට ලැබීමෙන් පසු සියයට 85 කට වඩා අඩුවීම, විශේෂ දවටන ක්‍රමයට අනුගත නොවීම හා නිෂ්පාදනය තුල කල් තබා ගැනීමේ ද්‍රව්‍ය අඩංගු වීම මත වෛද්‍ය සැපයුම් අංශය තොගය ප්‍රතික්ෂේප කර තිබුණි.ඒ අනුව රු.මිලියන 9.29 ක් වටිනා මෙම තොගය කුලි ගෙවන ලද ගබඩාවක ගබඩා කර තිබුණි.මෙම ඖෂධයේ මාසික අවශ්‍යතාවය ඒකක 336 ක් වුවද 2023 මැයි 23 දින වන විට වෛද්‍ය සැපයුම් අංශයේ තොග සහ ජාතික තොග මට්ටම ශුන්‍ය

	තත්ත්වයක පැවතුණි.			
(ට)	Lora Pam Tab 2023 1mg ඖෂධයෙන් ඒකක 1,500,000ක් මිලදී ගැනීමේ ප්‍රසම්පාදනයට අදාලව ලංසු ඉදිරිපත්කල එකම සැපයුම්කරු වෙත වටිනාකම එ.ජ. ඩොලර් 315,000 කට ඒකක 700,000 ක් ප්‍රදානය කර තිබුණද ඊට අදාල ඉන්ඩෙන්ටුව සැපයුම්කරු වෙත ප්‍රදානය කිරීමට සති 5 කට වඩා කාලයක් ගත කර තිබුණි. ඉතිරි තොග ඒකක 800,000 සැපයීමට අදාලව 2022 ඔක්තෝබර් 19 වන දිනැති ප්‍රසම්පාදන කමිටුව විසින් ඒකක 500,000 ක් හා 250,000 ක් සැපයුම්කරු වෙත ප්‍රදානය කර ඉන්ඩෙන්ටු අංක 02ක් නිකුත් කර තිබුණි. ඒ අනුව ඒකක 750,000ක් 2022 දෙසැම්බර් 31 දින වන විට සැපයිය යුතු වුවද ඒකක 500,000 ක් මාස 2.5 ක් හා ඒකක 250,000 මාස 10ක ප්‍රමාදයක් සහිතව සපයා තිබුණි.	වගකිව යුතු පාර්ශවයන්ගෙන් ප්‍රමාද ගාස්තු අය කර ගැනීමට කටයුතු කළ යුතුය.	එකඟ වේ.	වගකිව යුතු පාර්ශවයන්ගෙන් ප්‍රමාද ගාස්තු අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ය)	Cefotaxime Injection 1g Vial ඖෂධයෙන් එන්නත් කුප්පි 367,656 ක් මිල දී ගැනීමට අදාලව තරඟකාරී ලංසු මිලක් ලබා ගැනීමට කටයුතු නොකර ඉදිරිපත් වූ එකම ලංසුකරු වෙත ඒකකයක් රු. 301 බැගින් ඒකක 367,656 ක් සඳහා රු.මිලියන 110.66 කට ලංසුව ප්‍රදානය කිරීමට දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමැතිය ලබා දී තිබුණ ද එම මිල සාමාන්‍ය සැපයුම් මිලට වඩා 7 ගුණයක වැඩිවීමක් විය. මෙය හදිසි ප්‍රසම්පාදනයක් වුවද සැපයුම්කරු එම ඖෂධ ආනයනය කර ලබා දිම හේතුවෙන් වරින් වර සිදුකල දැනුම් දීම් මත ලංසු කැඳවූ දින සිට වසර 02ක් ගත වූ පසුව වෛද්‍ය සැපයුම් අංශයේ සාමාන්‍ය සැපයුම් මිල වූ එන්නත් කුප්පියක් රු. 42.43 බැගින් එන්නත් කුප්පි 367,656 ක් සඳහා ඉන්ඩෙන්ටු නිකුත්කර තිබුණ ද	2023	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය සහ වරින්වර යාවත්කාලීන කරනු ලැබ ඇති එහි සංශෝධනයන්ට අනුකූලව ප්‍රසම්පාදන කළමනාකරණය සිදු කළ යුතුය. එපරිදි කටයුතු නොකිරීම හේතුවෙන් සිදුවන හානි හෝ පාඩු වගකිව යුතු නිලධාරීන්ගෙන් අයිහාර කිරිමට කටයුතු කළ යුතුය. විධිමත් ස්වාධින පරික්ෂණයක් පවත්වා ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය.	අදහස් ඉදිරිපත් කර නැත.	විධිමත් ස්වාධින පරික්ෂණයක් පවත්වා නොතිබුණි.

මෙම තොග වෛද්‍ය සැපයුම් අංශය භාර ගන්නා අවස්ථාව වන විට දි කල් ඉකුත් වීමට ආසන්න මට්ටමේ තිබුණි. එනම් 2022 අප්‍රේල් 20 , ජුනි 03 හා ජුලි 08 භාරදුන් ඖෂධ 2022 ජුලි සහ අගෝස්තු කල් ඉකුත් විමට නියමිතව තිබුණි. සැපයුම්කරු විසින් සංස්ථාව වෙත දන්වා තිබු 2020 ජුලි නිෂ්පාදිත කාණ්ඩ අංක VIH032 හි එන්නත් කුප්පි 37,156 ක් 2022 ජුලි කල් ඉකුත්වන බවය. නමුත් වෛද්‍ය සැපයුම් අංශයට සැපයුම් කිරිමේ දී කාණ්ඩ අංක VIH032 හි නිෂ්පාදිත දිනය 2020 අගෝස්තු හා කල් ඉකුත්වීම් දිනය 2022 අගෝස්තු ලෙස දක්වා තිබුණි. ඒ අනුව ඖෂධ වෛද්‍ය සැපයුම් අංශය වෙත භාර දෙන විටත් කල් ඉකුත් වූ තොග ද යන්න ගැටළු සහගත විය. මෙම ඇනවුමෙන් ඒකක 4,700ක් විගණිත දින වන විටත් වෛද්‍ය සැපයුම්

	අංශයට සපයා නොතිබුණි.				
(ඩ)	Cefotaxime Injection 1g Vial ඖෂධයෙන් එන්නත් කුප්පි 250,000 ක් මිලදී ගැනීමේ ප්‍රසම්පාදනය සඳහා ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි එකම ලංසුකරු හෙවත් පස්වන අවම ලංසුකරු වෙතින් ඒකකයක් එ.ජ. ඩොලර් 0.95 බැගින් මුළු වටිනාකම වූ එ.ජ. ඩොලර් 237,500 කට මිලදී ගැනිමේ ඉන්ඩෙන්ටුව අනුව කුප්පි 250,000 ක් 2022 දෙසැම්බර් 12 දින සැපයිය යුතු වුවද සංස්ථාව විසින් මෙම ඇණවුම සඳහා ණයවර ලිපි 2023 පෙබරවාරි 14 දින විවෘත කර තිබුණි. ඒ අනුව 2023 මැයි 23 දින මෙම සැපයුම් වෛද්‍ය සැපයුම් අංශයට සපයා තිබුණි. ඉන්ඩෙන්ටුව අනුව තොග සැපයිය යුතු දින සිට ණයවර ලිපි නිකුත් කිරිම දක්වා මාස 02ක් ද තොග වෛද්‍ය සැපයුම් අංශයට සැපයු දින දක්වා	2023	වගකිව යුතු පාර්ශවයන්ගෙන් ප්‍රමාද ගාස්තු අය කර ගැනිමට කටයුතු කළ යුතුය.	අදහස් ඉදිරිපත් කර නැත.	වගකිව යුතු පාර්ශවයන්ගෙන් ප්‍රමාද ගස්තු අය කර ගැනිමට කටයුතු කර නොතිබුණි.

	මාස 5 දින 12 ක් ප්‍රමාද වී තිබුණි. තවද වෛද්‍ය සැපයුම් අංශයේ සැපයිම් කාලරාමුව වූ 2022 සැප්තැම්බර් 26 දින සිට තොග සැපයූ දින දක්වා මාස 07 දින 27ක් ප්‍රමාදවී තිබුණි.				
(ඍ)	Furosemind injection 20mg/2ml ඖෂධයෙන් එන්නත් කුප්පි 1,800,000 ක් මිලදී ගැනීමේ ප්‍රසම්පාදනයට අදාලව අවම ලංසු මිල වූ ඒකකයක් එ.ජ.ඩොලර් 0.032 බැගින් ඉදිරිපත් කල සැපයුම්කරු වෙත ලංසුව ප්‍රදානය කලද ලංසු ඇරයුම් කිරීමේදී වරදක් සිදු වූ බව දක්වමින් ඒකකයක් එ.ජ.ඩොලර් 0.034 ක් බව සැපයුම්කරු විසින් දන්වා තිබුණි. ඒ හේතුවෙන් ප්‍රසම්පාදන ක්‍රියාවලිය දින 126 ක් ප්‍රමාද වී තිබුණි. මෙම කාරණය පදනම් කර ගනිමින් තෙවන අවම මිල ඉදිරිපත් කල ලංසු කරු වෙත ඒකකයක් එ.ජ.ඩොලර් 0.064	2023	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය සහ වරින්වර යාවත්කාලීන කරනු ලැබ ඇති එහි සංශෝධනයන්ට අනුකූලව ප්‍රසම්පාදන කළමනාකරණය සිදු කළ යුතුය. ලංසු ඇරයුම් ලේඛණයන්හි සඳහන් කොන්දේසිවලට අනුකූලව කටයුතු කළ යුතුය. ප්‍රසම්පාදනය තුළදී සිදුවන ප්‍රමාදයන් පිළිබඳව වගකිව යුතු පාර්ශවයන් සම්බන්ධව අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය.	අදහස් ඉදිරිපත් කර නැත.	මේ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

බැගින් ඒකක 1,800,000 ක් සඳහා එ.ජ.ඩොලර් 115,200 ක වටිනාකමකට ලංසුව පිරිනැමීමට තීරණය කර තිබුණි. ලංසු ඇරයුම් ලේඛණ අනුව ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් නිකුත් කරන ලද සහතිකය නීතිඥවරයෙකු, දිවුරුම්දුන් කොමසාරිස්වරයෙකු හෝ සාම විනිසුරුවරයෙකු විසින් සහතික කල යුතු වුවත් ලංසුකරුවන් විසින් ඉදිරිපත් කරන ලද සහතිකයේ පිටපත් සඳහා එවැනි සහතික කිරීමක් සිදුකර නොතිබුණි.තෝරා ගත් සැපයුම්කරු විසින් බාහිර ස්වාධීන රසායනාගාර වාර්තාවක් ලබා ගැනීමකින් තොරව නිෂ්පාදනාගාරයේ ලබා ගන්නා ලද තත්ත්ව වාර්තාව මත ඉදිරියට මෙම ප්‍රසම්පාදනය කර ගෙන යාමට කරන ලද ඉල්ලීම පදනම් කර ගෙන 2023 ජූනි 14 දින උපදෙස් ලබා ගැනීම සඳහා ප්‍රසම්පාදන කමිටුව

	වෙත ලිපිගොනුව ඉදිරිපත් කර තිබුණ ද එම කමිටුව විසින් 2023 සැප්තැම්බර් 04 දින තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත යොමු කර නැවත ඇගයීමක් කරන ලෙස දන්වා තිබුණි. තාක්ෂණික ඇගයීම් කමිටුවේ කිසිදු නිර්දේශයක් නොමැතිව නැවතත් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවෙන් උපදෙස් ලබා ගැනීමට 2023 සැප්තැම්බර් 26 දින ප්‍රසම්පාදන අංශයට ලිපිගොනුව ලබා දී තිබුණි. මෙම ක්‍රියාවලිය සඳහා මාස 06 ක් ගත කල ද අවසන් තීරණයක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.				
(ත)	හදිසි මිල දී ගැනිමක් ලෙස Furosemind injection 20mg/2ml ඖෂධයෙන් එන්නත් ඒකක 209,000 ක් රු.මිලියන 14.63 කට මිලදී ගැනීමේ ප්‍රසම්පාදනයේ තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාවට අනුව කිසිඳු ලංසුකරුවෙක්	2023	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය සහ වරින්වර යාවත්කාලීන කරනු ලැබ ඇති එහි සංශෝධනයන්ට අනුකූලව ප්‍රසම්පාදන කළමනාකරණය සිදු නොකිරීම හේතුවෙන් සිදුවන හානි හෝ පාඩු	අදහස් ඉදිරිපත් කර නැත.	මේ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

	සාම්පල් ඉදිරිපත් කර නොතිබුණි. තෝරා ගත් සැපයුම්කරු දින 47 ක ප්‍රමාද කාලයකින් පසු එන්නත් ඒකක 209,000 ක් භාර දී තිබුණ ද ඊට පෙර එන්නත් තොග ලංකාවට ලැබී තිබුණි. සැපයුම්කරු විසින් එන්නත් තොග ලංකාවට ලැබීමෙන් පසුවද දින 11 ක් ගත කිරීමෙන් පසුව තොග බාර දී තිබුණි.		වගකිව යුතු පාර්ශවයන්ගෙන් අධිභාර කිරීමට කටයුතු කළ යුතුය.		
(ඵ)	Furosemind injection 20mg ඖෂධයෙන් හදිසි ඇණවුමක් ලෙස එන්නත් කුප්පි 625,000 ක් මිලදී ගැනීමේ ප්‍රසම්පාදනය සදහා අවම මිල වූ ඒකකයක් රු. 16.50 බැගින් ඉදිරිපත් කල සැපයුම්කරුට තොග සැපයීම සති 02 ක කාලයක් ගත වන බැවින් තොග කඩිනමින් ලබා ගැනීමේ අරමුණින් අවම දෙවන ලංසු මිල වූ ඒකකයක් රු. 69 බැගින් ඒකක 625,000 ක් සඳහා රු.මිලියන 43.12 ක් වූ වටිනාකම ඉදිරිපත් කල	2023	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය සහ වරින්වර යාවත්කාලීන කරනු ලැබ ඇති එහි සංශෝධනයන්ට අනුකූලව ප්‍රසම්පාදන කළමනාකරණය සිදු කළ යුතුය.	අදහස් ඉදිරිපත් කර නැත.	මේ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

ලංසුකරු වෙත ලංසුව ප්‍රදානය කිරීමට සෞඛ්‍ය අමාත්‍යාංශ හදිසි ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමැතිය ලබා දී තිබුණ ද මෙම සැපයුම්කරුවන් දෙදෙනාටම වලංගු ලියාපදිංචි සහතිකයක් නොතිබුණි. ලංසු ඇරයුම් ලේඛන අනුව ඖෂධ ගබඩා කල හැකි උෂ්ණත්වය 28 ^{0}C - 32^{0}C අතර පැවතිය යුතුව වුවත් තෝරාගත් සැපයුම්කරු විසින් ඉදිරිපත් කර තිබූ සාම්පලයේ ඇසුරුමෙහි ගබඩා කල හැකි උෂ්ණත්වය 25^{0}C අඩු බව දක්වා තිබුණි. එන්නත් කුප්පි 625,000 ක් වෛද්‍ය සැපයුම් අංශයට සැපයිය යුතු බව සංස්ථාවට දැනුම් දී තිබූ නමුත් අමාත්‍යාංශ ප්‍රසම්පාදන B කමිටුව මෙම ඇණවුමට අදාළ ප්‍රසම්පාදනය යථෝක්ත ඉන්දියානු ණය යෝජනා ක්‍රමය යටතේ ඇනවුම් කර ඇති ඇණවුම් පිළිබඳ

	සලකා බලා ඇණවුම අවලංගු කර තිබුණද ඒ බව වෛද්‍ය සැපයුම් අංශය වෙත දැනුම්දීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් මෙම ඇණවුම පොරොත්තු ඇණවුමක් ලෙස ස්වස්ථා පද්ධතියේ නිරීක්ෂණය විය. මෙම ඖෂධයේ මාසික අවශ්‍යතාවය ඒකක 272,063 වුවද 2022 ජුනි 23 දින සිට ප්‍රසම්පාදන තිරණ දින වූ 2022 නොවැම්බර් 21 දින දක්වා වෛද්‍ය සැපයුම් අංශයේ තොග ශුන්‍ය තත්ත්වයක හා ජාතික මට්ටමේ තොගය මාසික අවශ්‍යතාවය සපුරා ගැනිමට නොහැකි තත්ත්වයක පැවතුණි.				
(ද)	Furosemind injection 20mg/2ml ඖෂධයෙන් එන්නත් කුප්පි 1,250,000 ක් මිලදී ගැනීමේ ප්‍රසම්පාදනයේ තෝරා ගත් සැපයුම්කරුවන් 25 ක් වෙත යැවූ ලංසු ඇරයුම් අතුරින්	2023	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය සහ වරින්වර යාවත්කාලීන කරනු ලැබ ඇති එහි සංශෝධනයන්ට අනුකූලව ප්‍රසම්පාදන කළමනාකරණය සිදු කළ යුතුය.	අදහස් ඉදිරිපත් කර නැත.	මේ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

විදේශ සමාගම් 21ක් වෙත යවන ලද කිසිඳු ෆැක්ස් පණිවිඩයක් ඉදිරිපත් වී (Send) නොතිබුණි. ලංසුකරුවන් අට දෙනෙකු ඉදිරිපත් කරන ලද ලංසු ඇගයීමට අනුව අවම දෙවන මිල ඉදිරිපත් කල සැපයුම්කරු වෙත එක් එන්නත් කුප්පියක් සඳහා එ.ජ.ඩොලර් 0.065 මිලකට හා ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් නිකුත් කරන ලියාපදිංචිය නිදහස් කිරීමේ සහතිකය ලබා දීමට යටත්ව ප්‍රසම්පාදන ප්‍රදානය කර තිබුණද ලිපිගොනුව ප්‍රසම්පාදන අධීක්ෂණ අංශය වෙත ලැබීමට දින 21 කාලයක් ගත කර තිබුණි.තෝරාගත් ලංසුකරු විසින් ඉදිරිපත් කර තිබුණු ජාතික ඖෂධ නියාමන අධිකාරියේ බලපත්‍රය කල්ඉකුත් වී තිබුණි.එමෙන්ම ලංසු ඇරයුම් ලේඛන අනුව තෝරාගත් ලංසුකරු විසින් සාම්පල් ඉදිරිපත් කර	එපරිදි කටයුතු නොකිරීම හේතුවෙන් සිදුවන හානි හෝ පාඩු වගකිව යුතු පාර්ශවයන්ගෙන් අධිභාර කිරීමට කටයුතු කළ යුතුය.

	නොතිබුණි.තෝරාගත් සැපයුම්කරු තම ලිපිනය වෙනස් කර ඇති බව එම සැපයුම්කරුගේ දේශිය නියෝජිතයා විසින් සංස්ථාවට දන්වා තිබූ අතර සංස්ථාව විසින් නව ලිපිනය සඳහා වන වලංගු ලියාපදිංචි සහතිකයක් ලබා දෙන ලෙස ඉල්ලීම් කර තිබුණ ද එම සහතිකය සංස්ථාව වෙත ලැබී නොතිබුණි. මේ හේතුවෙන් ප්‍රසම්පාදනයට අදාළ ඉදිරි ක්‍රියාවලිය සම්පූර්ණ කිරිමට නොහැකි වී තිබුණි. මෙම ඖෂධයේ මාසික අවශ්‍යතාවය ඒකක 299,415 වුවද 2023 ජුනි 02 වන විට වෛද්‍ය සැපයුම් අංශයේ තොග මට්ටම 135,601 ක් වු බැවින් එය මාසික අවශ්‍යතාවය සපුරා ගැනිමට නොහැකි තත්ත්වයක පැවතුණි.				
(ධ)	වෛද්‍ය සැපයුම් අංශයේ අවශ්‍යතාවය සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 26.225 ක් වටිනා Trastuzumab (440 mg) එන්නත් ඒකක 500 ක් මිලදී	2022	ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි සහතිකය සහිත සැපයුම්කරු වෙත ලංසුව පිරිනැමීමට කටයුතු කල යුතු බව.	මිලදී ගනු ලබන ආයතනයට බලය පවරනු ලබන ලේඛනයක් ලංසුව සමඟ ඉදිරිපත් කර ඇති බවත්, ඖෂධ නියාමන අධිකාරිය ප්‍රකාශයට පත් කල	මේ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

ගැනිමට අදාලව තෝරාගත් ලංසුකරු විසින් ලංසුව සමග ඉදිරිපත් කර තිබුණු ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි සහතිකය ඖෂධ නියාමන අධිකාරිය විසින් එම ආයතනය සඳහා නිකුත් කල සහතිකයක් නොවූ අතර ඖෂධ නිෂ්පාදන , සැපයීම් හා නියාමන රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් මඟින් සියලු මිලදී ගැනීම් නැවත දැනුම් දෙන තුරු තාවකාලිකව නතර කරන ලෙස දැනුම් දුන් ආයතනයක් වෙත නිකුත් කර තිබූ සහතිකයක් විය. එමෙන්ම ඉදිරිපත් කර තිබූ ලියාපදිංචි සහතිකයද කල් ඉකුත් වී තිබුණි. ලංසු මිල ගනන් ඇගයූ තාක්ෂණික ඇගයීම් කමිටුව නිර්දේශ කර තිබුනේ ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් නිකුත් කරනු ලැබූ වලංගු ලියාපදිංචි සහතිකයක් ඉදිරිපත් කිරීමට යටත්ව පමණක් අවම මිල ඉදිරිපත් කල ලංසු කරු වෙත ලංසුව පිරිනැමීමට වුවද, නිවේදනයක් මඟින් ලංසුවේ වලංගු කාලය දීර්ඝ වී ඇති බවත්, තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශ සමඟ එකඟ වීම හා නොවීම සඳහා ප්‍රසම්පාදන කමිටුවේ බලයක් ඇති බව

	තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශය නොසලකා ජාතික ඖෂධ නියාමන අධිකාරියේ වලංගු ලියාපදිංචි සහතිකයක් ඉදිරිපත් නොකල ලංසු කරු වෙත අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව විසින් ලංසුව පිරිනැමීමට තීරණය කර තිබුණි.				
(න)	වෛද්‍ය සැපයුම් අංශයේ අවශ්‍යතාවය සඳහා පිරිවැය රු.35,761,504 ක් වූ Furosemide Injection BP 20 mg/2 ml එන්නත් මාත්‍රා ඒකක 5,845,000 ක් මිලදී ප්‍රසම්පාදනයේ දී වෛද්‍ය සැපයුම් අංශය වෙත සපයා තිබූ එන්නත් මාත්‍රා 99,000 ක තොගය භාරගැනිමේදි නිරික්ෂණය වූ අඩුපාඩු හේතුවෙන් මෙම තොගය පිළිගත නොහැකි බවත් ඒ සඳහා නිෂ්පාදන ස්ථායිතා වාර්තාව (Product Stability Report) සපයන ලෙස සැපයුම්කරු වෙත කරන ලද දැනුම් දීම මත සැපයුම්කරු විසින් Accelerate	2022	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව ප්‍රසම්පාදන කළමනාකරණය සිදු කළ යුතුය.එපරිදි කටයුතු නොකිරිමෙන් සිදුවන හානි හෝ පාඩු වගකිව යුතු පාර්ශවයන්ට එරෙහිව අධිභාර කළ යුතුය. විධිමත් ස්වාධීන පරික්ෂණයක් පවත්වා ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය.	අදහස් ඉදිරිපත් කර නැත.	විධිමත් ස්වාධීන පරික්ෂණයක් සිදු කර නොතිබුණි.

Stability Report සපයා තිබූ අතර එහි සඳහන් ආකාරයට අදාල ඖෂධ අවශ්‍ය ප්‍රමිත සහ පිරිවිතර වලට අනුකූල බවට නිෂ්පාදක සමාගමෙන් දැනුම් දී තිබුණි. එහෙත් එසේ දැනුම් දුන් ලිපි ශීර්ෂ නිෂ්පාදන සමාගම භාවිතා කරනු ලබන ලිපි ශිර්ෂ වලට වඩා සකස් කරන ලද ලිපි ශිර්ෂයක් බව විගණනයේදී නිරීක්ෂණය විය. ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ ලියවිලි දත්තවලට අනුව සැපයුම්කරු විසින් ලංසු ලේඛන වල සඳහන් ජාතික ඖෂධ නියාමන අධිකාරීයේ ලියාපදිංචි නිෂ්පාදකයාගෙන් නොවන වෙනත් ආනයන සමාගම් දෙකක් මගින් එන්නත් මාත්‍රා 3,898,900 ක් ආනයනය කර තිබුණු අතර එම සමාගම් දෙකම ඖෂධ නියාමන අධිකාරීයේ ලියාපදිංචි සමාගම් නොවන බව නිරීක්ෂණය විය. සැපයුම්කරු විසින් සපයා තිබූ මෙම එන්නත

සම්බන්ධයෙන් පරීක්ෂණ සිදු කළ ජාතික ඖෂධ තත්ත්ව සහතික රසායනාගාරයේ (NMQAL) පරීක්ෂණ වාර්ථාවට අනුව පරීක්ෂා කල එන්නත් Sterility පරීක්ෂණයේ දී බ්‍රිතාන්‍ය ඖෂධීය පිරිවිතර වලට අනුකූල නොවන බවට හා පරීක්ෂාව සඳහා ලැබී තිබූ එන්නත් සාම්පල්වල හා ලියාපදිංචිය සඳහා ජාතික ඖෂධ තත්ත්ව සහතික රසායනාගාර (NMQAL) වෙත ඉදිරිපත් කරනු ලැබූ ලිපි ගොනු තුල අන්තර්ගත වූ නිෂ්පාදිතයේ ආදර්ශ ඇසුරුම්වල එකිනෙකට වෙනස් විෂමතාවයක් නිරීක්ෂණය විය.ඒ වන විටත් 2018 හා 2019 වර්ෂවලට අදාල තොගවල කල් ඉකුත්වීමේ දින ඉක්මවා තිබුණි. ඉහත කරුණු හේතුවෙන් සැපයුම්කාර සමාගම අසාදු ලේඛණ ගත කිරීමට නීති අංශය වෙත යොමු කර තිබුණද අවශ්‍ය කටයුතු මේ දක්වාම ඉටු වී නොතිබුණි.

(ඳ)	පිරිවැය රු.මිලියන 1.49 ක් වූ Ceftriaxone Sodium for Injection BP 500mg ඒකක 79,500 ක් ජාතික ඖෂධ නියාමන අධිකාරියේ වලංගු ලියාපදිංචි සහතිකයක් නොමැති සැපයුම්කරුවෙකු මඟින් මිලදී ගෙන තිබුණු අතර සැපයුම්කරු විසින් ඉදිරිපත් කර තිබූ ප්‍රසම්පාදන ලියවිලි වලට අනුව සහ ආනයනයේදී රේගු දෙපාර්තමේන්තු වෙත ඉදිරිපත් කර තිබූ ලියවිලිවලට අනුව එන්නතෙහි නිෂ්පාදක වශයෙන් සඳහන් කර තිබූ සමාගමෙන් තොරව ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි වී නොතිබුණු සමාගමක් මඟින් ඖෂධ ආනයනය කර තිබුණි.සැපයුම්කරු විසින් වෛද්‍ය සැපයීම් අංශයට සපයන ලද තොගය සම්බන්ධයෙන් ජාතික ඖෂධ ආරක්ෂණ පරීක්ෂණාගාරයේ සිදු කරණු ලැබූ	2022	විධිමත් ස්වාධීන පරීක්ෂණයක් පවත්වා ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය.	අදහස් ඉදිරිපත් කර නැත.	විධිමත් ස්වාධීන පරීක්ෂණයක් සිදු කර නොතිබුණි.

තත්ත්ව පරීක්ෂණයේ දී USP ලේබල් අවශ්‍යතාවය සහ දැනට පවත්නා ලේබල් වල දක්නට ලැබුණු ලක්ෂණ අතර පැවති වෙනස්කම් හේතුවෙන් අදාල බාණ්ඩ වල තොග භාවිතයෙන් ඉවත් කරන ලෙස දැනුම් දී තිබුණි. අවශ්‍ය පිරිවිතර නොගැලපීම නිසා භාවිතයෙන් ඉවත් කල තොග වෙනුවෙන් වැය වූ පිරිවැය ආපසු ගෙවන ලෙස සංස්ථාව විසින් සැපයුම්කරු වෙත දැනුම් දී තිබුණ ද ඒ බව පිළිනොගත් සැපයුම්කරුව අසාදු ලේඛන ගත කිරීමට කටයුතු නොකර සැපයුම්කරුගේ අත්හිටුවා තිබූ ගෙවීම් වලින් ගුණත්වයෙන් තොර ඖෂධ සැපයීම හේතුවෙන් දැරූ රු.මිලියන 1.86ක පිරිවැය අඩුකර 2022 අගෝස්තු, නොවැම්බර් හා දෙසැම්බර් මාස වලදී රු.මිලියන 273.6 ක් සැපයුම්කරුට ගෙවා තිබුණි.

(ප)	රාජ්‍ය ඔසුසැල් වල 2022 අලෙවිය සඳහා Diclofenac Potassium Tablates (50mg) ඖෂධයෙන් (5x10) ප්‍රමාණයේ ඇසුරුම් ඒකක 48,000 ක් මිලදී ගැනීම සඳහා ලබා දී තිබූ ඇනවුමට අදාලව තෝරාගත් සැපයුම්කරුට ඇසුරුම් ඒකකයක් එක්සත් ජනපද ඩොලර් 0.248 බැගින් එක්සත් ජනපද ඩොලර් 11,904 කට ඇනවුම ප්‍රදානය කර තිබුණි. මෙම ප්‍රසම්පාදනය සඳහා තාක්ෂණික ඇගයීම හා ප්‍රසම්පාදන තීරණ ගැනීම සඳහා දින 167 ක කාලයක් ගතවී තිබුණි.එමෙන්ම සැපයුම්කරු තෝරා ගන්නා අවස්ථාව වන විටත් ජාතික ඖෂධ නියාමන අධිකාරියේ එම සැපයුම්කරුගේ ලියාපදිංචිය අවසන් ව තිබුණද එය දීර්ඝ කර ගැනීම සඳහා දින 258 ක කාලයක් ගත වීම ඇනවුමේ ප්‍රමාදයට ප්‍රධාන හේතුව වී තිබුණි. 2021 වර්ෂයේ මුල් මාස 5 හි මෙම	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය සහ වරින්වර යාවත්කාලීන කරනු ලැබ ඇති එහි සංශෝධනයන්ට අනුකූලව ප්‍රසම්පාදන කළමනාකරණය සිදු කළ යුතුය. එපරිදි කටයුතු නොකිරීම හේතුවෙන් සිදු වන හානි හෝ පාඩු වගකිව යුතු නිලධාරීන්ගෙන් අධිභාර කළ යුතුය.	ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා දිගු කාලයක් ගත වී ඇත්තේ සැපයුම්කරු තෝරා ගැනීමට ප්‍රසම්පාදන කමිටුවට දිගු කාලයක් ගත වීම හා සැපයුම්කරු විසින් අදාල ලිපි ලේඛණ සැපයීමට දිගු කාලයක් ගත කිරීම බව.	මේ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

	ඖෂධයේ මාසික සාමාන්‍ය අලෙවිය ඒකක 5000 ක් වූ අතර 2021 ජූනි මස සිට රාජ්‍ය ඔසුසැල් තුල මෙම ඖෂධය හිග වී පැවතුණි. ඒ හේතුවෙන් 2021 ජූනි සිට 2022 අගෝස්තු මස දක්වා සංස්ථාවට අහිමි වූ මුළු අලෙවිය දළ වශයෙන් රු.මිලියන 9.75 ක් විය.				
(එ)	රාජ්‍ය ඔසුසල්වල අලෙවිය සදහා Etoricoxilo Tablats 60(mg) ඖෂධයේ ඇසුරුම් ඒකක 30,000 ක් මිලදී ගැනීම සඳහා ලබාදී තිබූ ඇනවුමකට අදාලව අවම දෙවන හා අවම පස්වන ලංසු කරුවන් වෙත පිළිවෙලින් ඇනවුමෙන් සියයට 25 හා සියයට 75 ක් වශයෙන් ලංසුව පිරිනමා තිබුණි. කෙසේ නමුදු දෙවන අවම මිලට වඩා සියයට 153 ක මිල වැඩිවීමක් සහිත පස්වන ලංසු කරුට මෙම ප්‍රසම්පාදනයෙන් සියයට 75 ක් ප්‍රධානය කිරීමට සාධාරණ හේතුවක් විගණනයට නිරීක්ෂණය	2022	විධිමත් ස්වාධීන පරීක්ෂණයක් පවත්වා ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය.	සැපයුම්කරුවන් කිහිපදෙනකුට ප්‍රදානය කිරීම ප්‍රසම්පාදන කමිටුවේ තිරණයකි.ඖෂධ ආනයනය කල පසු මිල තිරණය කිරිම මිල කමිටුව විසින් සිදු කරන බව.	විධිමත් ස්වාධීන පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු කර නොතිබුණි.

	නොවීය.එමෙන්ම මෙම අයිතමයේ අවම මිල හා උපරිම මිල අතර ඒකකයක රු. 345 ක මිල වැඩිවීමක් නිරීක්ෂණය වූ අතර එය ප්‍රතිශතයක් ලෙස සියයට 128 කි.මෙම ප්‍රසම්පාදනයෙන් සියයට 75 ක් දෙවන අවම ලංසුකරු ගෙන් බැහැරව පස්වන අවම ලංසුකරුට ප්‍රධානය කිරීම හේතුවෙන් සංස්ථාවට අතිරේක පිරිවැයක් ලෙස රු.මිලියන 6.2 ක් දැරීමට සිදුවීමෙන් අවම මිලට ඖෂධ සැපයීම වූ සංස්ථාවේ අරමුණින් ද බැහැර වී තිබුණි.				
(ඛ)	රාජ්‍ය ඔසුසැල්වල අලෙවි කිරීම සඳහා Cetrize Syrup 5mg/5ml Bottle වලින් ඇසුරුම් ඒකක 150,000 ක් මිලදී ගැනීම සඳහා 2020 ජූනි 26 දින ලබාදී තිබූ ඇනවුමකට අදාලව අවම මිල ලෙස ඒකකයක් රු. 29.25 ඉදිරිපත් කල ලංසුකරුට ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි සහතිකය	2022	විධිමත් ස්වාධීන පරීක්ෂණයක් පවත්වා ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය.	සැපයුම්කරු තෝරා ගැනිමේ මූලික කරුණ වන්නේ වෙළඳපොළ තුල හොද ඉල්ලුමක් පැවතිම බව.	විධිමත් ස්වාධීන පරීක්ෂණයක් පැවැත්විමට කටයුතු කර නොතිබුණි.

නොමැති බව සදහන් කරමින් ඒකකයක් රු. 71.30 ක මිලක් ඉදිරිපත් කල දෙවන අවම ලංසුකරුට ඒකකයක් රු. 69.93 කට ඇනවුම ප්‍රදානය කර තිබුණ ද අවම ලංසුකරුගේ ලංසු ලේඛන තුල ලියාපදිංචි සහතිකය ඉදිරිපත්කර තිබුණි.අවම ලංසුකරුට ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචිය අලුත් කරවාගෙන හෝ අවම ලංසුකරුට මෙම ප්‍රසම්පාදනය පිරිනැමීමට කටයුතු නොකිරීමෙන් සංස්ථාවට රු. මිලියන 6.06 ක අතිරේක පිරිවැයක් දැරීමට සිදුවී ඇති අතර ඒ හේතුවෙන් මෙම ඖෂධයේ ගැනුම් පිරිවැය අවම ලංසු වටිනාකමට වඩා සියයට 138 ක ප්‍රතිශතයකින් ඉහල ගොස් තිබුණු අතර අවම මිලට ඖෂධ සැපයීමේ අරමුණින් ද බැහැර වී තිබුණි. සැපයුම්කරු ඖෂධ ඒකක 99,000 ක් සැපයීමට කටයුතු නොකිරීම හේතුවෙන් රාජ්‍ය ඔසුසැල් තුල තොග

	නොමැති තත්ත්වයක් ඇති වී තිබුණි.				
(හ)	සංස්ථාවේ තොග හා පාලන කළමණාකරුගේ ගැණුම් අධියාචනාවකට අනුව Clonazepam Tablets (0.5mg) යන ඖෂධයෙන් ඇසුරුම් ඒකක 48,000 (25x10)ක් රු.මිලියන 20.07ක පිරිවැයකට මිලදී ගැනීමට අදාලව අවම මිල ඉදිරිපත් කල සැපයුම්කරු වෙත 2020 සැප්තැම්බර් 04 දින නිකුත් කල ඉන්ඩෙන්ඩුවට අදාලව පළමු ඖෂධ තොගය 2021 පෙබරවාරි 08 දින හා අවසන් තොගය 2022 ජනවාරි 12 දින ගබඩාව වෙත ලැබී තිබුණි. ගැණුම් ඇණවුම පිළියෙල කරන අවස්ථාව වන විටත් මෙම ඖෂධයේ මාස 4 කට පෙර තොග අවසන් වී තිබුණු අතර මෙම ඖෂධයේ යලි ඇනවුම් තොග මට්ටම පිළිබඳ අවධානයක් යොමු නොකර ඇනවුම් කිරීම හේතුවෙන්	2022	යළි ඇණවුම් තොග මට්ටම පිළිබඳ අවධානය යොමු කරමින් ගබඩාවට අවශ්‍ය ඖෂධ තොග ඇණවුම් කළ යුතුය.	තොග මාස කිහිපයකට ප්‍රමාණවත් පරිදි ඔසුසැල ගබඩා තුල තොග මට්ටම පවත්වා ගත් අතර මාස කිහිපයක් ප්‍රධාන ගබඩාවේ තොග ශූන්‍ය වුවත් ඔසුසැල් වල මෙම ඖෂධය ප්‍රමාණවත් පරිදි පවතී. කොරෝනා වසංගත තත්ත්වය හමුවේ එම ඖෂධ ප්‍රමාණයද ගබඩා වෙත ලැබීම ප්‍රමාද විය. අහඹු ලෙස තෝරා ගත් ඔසුසැල් කිහිපයක තොග වාර්තා අනුව ඖෂධයේ හිඟයක් වාර්තා වන්නේ නැති බව.	මෙම තත්ත්වය වැලැක්වීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි.

අඛන්ඩව මාස 3,4 ක් රත්මලාන ගබඩාවේ තොග නොමැති තත්ත්වයකට පත් වී තිබුණි. ඖෂධයේ විකුණුම් පුරෝකතනය අනුව වාර්ෂික අවශ්‍යතාවට අනුකූල පරිදි හා තොග ශූන්‍යව පවතින බැවින් ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටියට අනුකූලව හැකි ඉක්මනින් ඖෂධ මිලදීගත යුතු වුවත් ගැනුම් ඇනවුම ඉදිරිපත් කල දින සිට මුළු ඖෂධ ප්‍රමාණය ගබඩාව වෙත ලැබීම සඳහා වර්ෂ 2 කට ආසන්න කාලයක් ගත කර තිබුණි. 2018 සිට 2022 වර්ෂය දක්වාම එක සැපයුම්කරුවෙකු ගෙන් මෙම ඖෂධය මිලදී ගෙන තිබුණු අතර ඉන්ඩෙන්ටුවේ සඳහන් දිනයන්ටම ඖෂධ සපයා ගැනීමට සංස්ථාව අපොහොසත් වීම තුලින් 2019 මාර්තු සිට 2022 අගෝස්තු දක්වා අවස්ථා 6 කදී අඛන්ඩව මාස දෙකකට වැඩි කාලයක් ඖෂධයේ අලෙවිය ශූන්‍ය වී

	තිබුණු බැවින් එම කාලපරිච්ඡේදය තුල සංස්ථාවට අලෙවි ආදායමක්ද ලැබී නොතිබුණි.				
(ම)	වෛද්‍ය සැපයුම් අංශයේ අවශ්‍යතාවය මත Cefotaxime Injection USP 1g එන්නත් කුප්පි 250,000 ක් දේශීයව මිලදී ගැනීම සඳහා රු. 70.70 ලෙස අවම මිල ඉදිරිපත් කල ලංසුකරුට ඇනවුම සැපයිය හැකි කාලසීමාව දීර්ඝ බව සඳහන් කරමින් මෙම ඇනවුම අවලංගු කර නැවත ලංසු කැඳවීමට ප්‍රසම්පාදන කමිටුව තීරණය කර තිබුණි. ඒ අනුව ඒකකයක මිල රු. 540 ක් ලෙස ඉදිරිපත් කර තිබූ ලංසු කරු සමඟ මිල සාකච්ඡා කර (එන්නත් 65,000 නොමිලේ සැපයීම මත) එන්නතක එලදායී මිල ලෙස රු. 399.60 කට මිලදී ගැනීමට එකඟ වී තිබුණි. එන්නත් කුප්පියක ඇස්තමේන්තු ගත මිල රු. 45.71 ක් ද පළමුව තෝරාගත් සැපයුම්කරුගේ ඒකකයක මිල රු.	2022	විධිමත් ස්වාධීන පරීක්ෂණයක් පවත්වා ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය.	ප්‍රසම්පාදන කමිටු තීරණයක් බව.	විධිමත් ස්වාධීන පරීක්ෂණයක් සිදු කර නොතිබුණි.

70.70 ක් ද වූයෙන් තෝරාගත් සැපයුම්කරුගේ මිලේ පිළිවෙලින් සියයට 774 හා සියයට 465 ක වැඩිවීමක් විය. දෙවන අවස්ථාවේ තෝරාගත් ලංසුකරු පළමු අවස්ථාවේදීද මිල ගනන් ඉදිරිපත් කර තිබූ අතර එහි මිල රු.235 ක් වුවද මාස 2 කට වඩා අඩු කාලයකදී දෙවන වර කැඳවීමේදී ලංසුකරු විසින් මිල රු. 540 ක් ලෙස තීරණය කර තිබීම කෙරහි ප්‍රසම්පාදන කමිටුව ඒ පිළිබද අවධානය යොමු නොකර ඇනවුම ප්‍රධානය කර තිබුණි.දෙවන ලංසු කැදවීමේදී තෝරාගත් සැපයුම්කරු වෙත 2019 දෙසැම්බර් 13 දින වන විට ඖෂධ සැපයීමට අපොහොසත් වී තිබුණ නමුත් පළමු ලංසු කැදවීමේදී තෝරාගත් අවම මිල ඉදිරිපත් කල ලංසුකරු විසින් දින 45 ක් ඇතුලත එන්නත් ඒකක 250,000 සපයන බව ප්‍රකාශ කර තිබූ නමුත් එය ප්‍රතික්ෂේප කර

	නැවත වරක් ලංසු කැඳවා තිබුණ ද තෝරාගත් සැපයුම්කරු දින 30 ක් ඇතුලත ඖෂධ සැපයීමට අපොහොසත් වී තිබුණි.				
(ය)	වෛද්‍ය සැපයුම් අංශය විසින් Ipratropium Pressurized Inhalation BP 20 Mcg/Puff ඖෂධයෙන් ඒකක 130,000 ක් ප්‍රසම්පාදනයට අදාලව අවස්ථා තුනකදී ලංසු කැඳවීම් සිදුකර තිබුණු අතර පළමු අවස්ථාවේදී සැපයුම්කරු වෙත ණයවර ලිපි විවෘත කර තිබියදී වෛද්‍ය සැපයුම් අංශයේ අධ්‍යක්ෂකගේ දැනුම් දීමකට අනුව සැපයුම මාස 09 ක් ප්‍රමාද කර ලබාගත යුතු බව දන්වා සිටීම තුලින් මෙම සැපයුම හදිසි අවශ්‍යතාවයක් නොවන බව නිරීක්ෂණය විය. ප්‍රසම්පාදනයට අදාළව තුන්වන ලංසු කැඳවූ අවස්ථාවේ ඉදිරිපත් කර තිබුණු සැපයුම්කරුගේ ජාතික ඖෂධ	2022	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය සහ වරින්වර යාවත්කාලීන කරනු ලැබ ඇති එහි සංශෝධනයන්ට අනුකූලව ප්‍රසම්පාදන කළමනාකරණය සිදු කළ යුතුය. එපරිදි කටයුතු නොකිරීම හේතුවෙන් සිදු වන හානි හෝ පාඩු වගකිව යුතු පාර්ශවයන්ට එරෙහිව අධිභාර කළ යුතුය. විධිමත් ස්වාධීන පරීක්ෂණයක් පවත්වා ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය.	කාලසීමාව සංශෝධනය වෛද්‍ය සැපයුම් අංශය විසින් සිදු කරන ලදී.ආනයනය කරන භාණ්ඩ පරීක්ෂාකර භාර ගැනීම වෛද්‍ය සැපයුම් අංශය මඟින් සිදු කරයි. ලංසුවල සඳහන් මිල ගනන් ලංසු කරුගේ නිෂ්පාදකයාගේ මිල සමඟ තහවරු කර ගැනීමක් සිදු කර නොමැති බව.	විධිමත් ස්වාධීන පරීක්ෂණයක් සිදු කර නොතිබුණි.

නියාමන අධිකාරියේ ලියාපදිංචි සහතිකය කල් ඉකුත් වී තිබූ නමුත් ලියාපදිංචි සහතිකය නැවත ලබාගැනීම මත හා 1987 අංක 03 දරණ පොදු ගිවිසුම් පනත යටතේ ලියාපදිංචි සහතිකය ලබාගැනීමේ කොන්දේසි වලට යටත්ව ප්‍රසම්පාදන කමිටුව විසින් 2017 සැප්තැම්බර් 29 දින ඒකකයක් රු.705.40 ක් බැගින් ඒකක 130,000 ක් සඳහා රු.මිලියන 91.7 ක් වූ වටිනාකමට ඇනවුම ප්‍රධානය කර තිබුණද ශ්‍රී ලංකා රේගුව වෙත ඉදිරිපත් කර තිබුණු ඉන්වොයිසිවලට අනුව සැපයුම්කරු විසින් ඖෂධ ඒකකයක් රු.14.13 බැගින් ඒකක 130,000 ක් රු.මිලියන 1.84 ට ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි නොවුනු සමාගමකින් මෙරටට ආනයනය කර සියයට 4892 ක වැඩි මිලකට වෛද්‍ය සැපයුම් අංශය වෙත සපයා තිබුණි. වෛද්‍ය සැපයුම් අංශයට ඖෂධ

සැපයීමට පෙර එම ඖෂධ වල ඇසුරුම, ලේබලය හා රාජ්‍ය ලාංඡනය සඳහා වෛද්‍ය සැපයුම් අංශයේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. එමෙන්ම ඇණවුමට අදාල පළමු තොගය (ඒකක 6500) ආනයනය කළ දින සිට වෛද්‍ය සැපයීම් අංශය වෙත සැපයීම සඳහා මසකට වඩා වැඩි කාලයක් ගත කර තිබුණි. 2015 අංක 05 දරණ ජාතික ඖෂධ නියාමන අධිකාරී පනතේ 106(1) වගන්තියට පටහැනිව සැපයුම්කරු විසින් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත ආනයනය කරන ලද මෙම ඖෂධය ලංසු ලේඛණවල සඳහන් නිෂ්පාදකයාගෙන් තොරව වෙනත් නිෂ්පාදකයෙකු මඟින් මෙරටට ආනයනය කර ඖෂධ ඇසුරුම් වල ලංසු ලේඛණවල සඳහන් නිෂ්පාදකයාගේ විස්තර මුද්‍රණය කර තිබුණි. සැපයුම්කරුවන් විසින් ආනයනය කරන ලද ඖෂධය

	ලියාපදිංචි කිරිම සඳහා ජාතික ඖෂධ නියාමන අධිකාරිය වෙත ඉදිරිපත් කරන ලද ලිපිගොණුවේ ඇතුලත් ඖෂධයේ ආදර්ශ ඇසුරුම් සහ වෛද්‍ය සැපයුම් අංශය වෙත ලබා දී තිබුණු ඖෂධයේ ඇසුරුම් තුල රෝගී උපදෙස් පත්‍රිකාවේ ඇතුලත් තොරතුරු හා ඖෂධ ලේබලයේ ඇතුලත් තොරතුරු අතර හා සැපයුම්කරු විසින් ලංසු ලියවිලි ඉදිරිපත් කිරීමේදී ඉදිරිපත් කරන ලද තොරතුරු වල නොසැසඳීම් නිරීක්ෂණය විය. ගිවිසුම් ප්‍රකාරව සැපයුම්කරු විසින් මෙම තොග සැපයීම සඳහා මාස 5 ත් 8 ක් දක්වා වූ ප්‍රමාද කාලයක් ගත කර තිබුණි.				
(ර)	වෛද්‍ය සැපයීම් කළමනාකරණය සඳහා 2015 වර්ෂයේ සිට හඳුන්වාදී තිබුණු වෛද්‍ය සැපයීම් කළමනාකරණ තොරතුරු පද්ධතිය (MSMIS) නිසි පරිදි උපයෝගී කර ගෙන නොතිබුණු බවත්,	2021	සෞඛ්‍ය අමාත්‍යංශයේ හා වෛද්‍ය සැපයීම් අංශයේ උපදෙස් හා සම්බන්ධීකරණය තුළින් සංස්ථාවද pronto පරිගණක පද්ධතිය තුළ යාවත්කාලීන විය	පරිගණක පද්ධතිය හරහා ඇණවුම් ඉදිරිපත් කළද එම ඇණවුම්වල නෛතික වලංගු භාවය සනාථ කිරිමට වෛද්‍ය සැපයුම් අංශයේ නිළධාරින්ගේ අත්සන නොමැත.	මේ දක්වා නිවැරදි වී නැත.

ඖෂධ ඇණවුම් කිරීමේ සිට තොග ලැබෙන අවස්ථාව දක්වා එක් එක් පියවර පද්ධතියට ඇතුළත් කර (Status) අදාළ ඇණවුම සම්බන්ධ ප්‍රගතිය යාවත්කාලීන කිරීමේ පහසුකම එම පරිගණක පද්ධතිය මඟින් ලබාදී තිබුණු නමුත් සංස්ථාවේ නිලධාරීන් ඇණවුමට අදාළ තොරතුරු වසර 07 ක් තිස්සේ පැවති තාක්ෂණික ගැටළුවක් හේතුවෙන් පද්ධතියට ඇතුළත් නොකරන බවත් නිරීක්ෂණය විය. එසේම සංස්ථාව විසින් ඇණවුමට අදාළ තොරතුරු වෙනත් පරිගණක පැවරුම්පත් (Excel) හරහා ගබඩා කර තිබුණු බැවින් ප්රසම්පාදනයේ ප්‍රමාදයට වගකිව යුතු වන්නේ කවුරුන්දැයි පරීක්ෂා කිරීමට හා තීරණ ගැනීමට මෙන්ම ඇණවුමේ වර්තමාන ප්‍රගතිය පිළබඳව තොරතුරු දැනගැනීමට වැඩි කාලයක් ගතවන

යුතුය. ඒ සඳහා ඇති බාධාවන් ඉවත් කර ගැනිමට කටයුතු කළ යුතුය.

වෛද්‍ය සැපයුම් අංශය හට අවශ්‍ය ඕනැම මොහතක ඇණවුම වෙනස් කිරිමේ හෝ පද්ධතියෙන් ඉවත් කිරිමේ හැකියාව ඇත.එබැවින් ලැබෙන දෘඩ පිටපත් පදනම් කරගෙන ප්‍රසම්පාදනය ආරම්භ කරන බව.

බව නිරීක්ෂණය විය.වෛද්‍ය සැපයීම් අංශය විසින් ඒ ඒ වර්ෂයට අදාළ ඇණවුම් ලැයිස්තු මාස 11 ක සැපයුම් කාලයක් සහිතව (Lead Time) සංස්ථාව වෙත මෙම පරිගණක පද්ධතිය හරහා ඉදිරිපත් කරන නමුත්, සංස්ථාව විසින් වහාම එම ඇණවුම්වලට අදාළ ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර නොතිබුණු බවත්, ඇණවුම් ලැයිස්තුවේ ලිඛිත පිටපත් සංස්ථාව වෙත ලැබෙන තෙක් ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කිරීම ප්‍රමාද කර තිබුණු බවත්, පරිගණක පද්ධතිය හරහා සංස්ථාව වෙත නිකුත් කරන ඇණවුම්වල ලිඛිත පිටපත් සංස්ථාවේ ආනයන අංශයට එවීමට දින 18 කට වඩා වැඩි කාලයක් ගතකර තිබුණු අතර ඉන් පසුව පමණක් ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර තිබුණු බැවින් මාස 11 ක් වූ සැපයුම් කාල සීමාවෙන් සැලකිය යුතු කාලයක් ඇණවුම් නිකුත් කිරීමේ හා ඇණවුම්

	ලබා ගැනීමේ ක්‍රියාවලිය සඳහා ගත කර තිබුණු බවත් නිරීක්ෂණය විය.				
(ල)	සංස්ථාව සිය මෙහෙයුම් හා පරිපාලන කාර්යයන් සඳහා කළමනාකරණ තොරතුරු පද්ධති (MIS) 14ක් භාවිතා කරන අතර ඉන් පද්ධති 12කින් ඉටුවන කාර්යයන් එක් පද්ධතියක් මගින් ඉටුකර ගැනීම සඳහා නව ව්‍යාවසාය සම්පත් සැලසුම් පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරමින් කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ තිබුණු නමුත් සුදුසු කොන්ත්‍රාත්තුකරුවකු තෝරා ගැනීමට අපොහොසත්වීම මතඇතිවූ දුර්වල කාර්යසාධනය හේතුවෙන් 2020 පෙබරවාරි 20 දින කොන්ත්‍රාත්තුව අවසන් කර තිබුණි. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා 2018 සහ 2019 වර්ෂයන් හිදී පිරිවැය රු.මිලියන 32.36 ක්වූ පරිගණක උපාංග අයිතම 09 කින්	2021	නව ව්‍යවසාය සම්පත් සැලසුම් පද්ධතින් ගොඩනැගීම හා ක්‍රියාත්මක කිරීම කඩිනම් කළ යුතුය.	වඩාත් ඵලදායි නව පද්ධතියක් හඳුන්වා දීමට බලාපොරොත්තු වන බව.	මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි.

	ඒකක 497 ක් මිලදී ගෙන තිබුණු අතර ඉන් ව්‍යාපෘති කටයුතු සඳහා භාවිතා නොකළ පිරිවැය රු.මිලියන 26.11 ක්වූ අයිතම 09 ක ඒකක 375 ක් සංස්ථාවේ වෙනත් කාර්යයන් සඳහා භාවිතයට නිකුත් කර තිබුණි. වර්තමානයේ භාවිතා කරන පද්ධති 12 පාවිච්චි කරන පරිශීලකයින් ගණන 324 ක් වුවද නව පද්ධතිය භාවිතා කිරීමට අපේක්ෂිත පරිශීලකයින් ගණන 1,399 ක් වූ බැවින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නොහැකිවීම සංස්ථාවේ සියලුම අංශවල කටයුතුවලට දැඩි ලෙස බලපා තිබුණි.				
(ව)	සාමාන්‍ය මාසික විකුණුම් ප්‍රමාණය ඇසුරුම් ඒකක 1,159 ක් වූ බැවින් වාර්ෂික විකුණුම් අවශ්‍යතාවය ඇසුරුම් ඒකක 13,908 ක් වුවද ඒ බව නොසලකා හා පෙර ඇණවුමකින් ඇසුරුම් ඒකක 40,000 ක් සංස්ථාව වෙත ලැබීමට නියමිතව තිබුණු	2021	විධිමත් පරීක්ෂණයක් සිදුකර වගකිව යුතු පාර්ශවයන් හඳුනාගැනිමට හා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනිමට කටයුතු කළ යුතුය.	වගකිව යුතු නිළධාරින් වෙත චෝදනා පත්‍ර නිකුත් කර ඇති බව.	විධිමත් විනය පරීක්ෂණය සඳහා පරීක්ෂණ නිළධාරියකු පත්කර ඇත.

	නමුත් ඒ බවද නොසලකා, සංස්ථාවේ අලෙවිය සඳහා 2019 වර්ෂයේදී Levofloxacin Tablets (500 mg) ඖෂධයේ (3*10) ප්‍රමාණයේ ඇසුරුම් ඒකක 72,000 ක් ඇණවුම් කර ඉන් ඇසුරුම් ඒකක 36,000 ක් රු.මිලියන 5.52 කට මිලදී ගෙන තිබුණි. පෙර ඇණවුමකින් සපයා ගෙන තිබුණු ඇසුරුම් ඒකක 9,092 ක් හා ඇසුරුම් ඒකක 36,000 න් ඇසුරුම් ඒකක 22,357 ක් 2022 පෙබරවාරි 28 දින වන විටත් අලෙවිකර ගැනීමට අපොහොසත්වී තිබුණු අතර ඒ වන විට එම ඇසුරුම් ඒකක 45,092 ම කල් ඉකුත්වී තිබීම හේතුවෙන් රු.මිලියන 5.24 ක අලාභයක් සිදුවී තිබුණි. නමුත් ඊට වගකිව යුතු පාර්ශව හඳුනා ගැනීමට හා අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කර නොතිබුණි.				
(ශ)	කොවිඩ් 19 වසංගතය සමඟ ඇති වූ හදිසි	2021	විධිමත් පරික්ෂණයක් සිදු කර ඉදිරි	කොවිඩ් තත්ත්වය මත පුරෝකතනය කළ හදිසි	විධිමත් පරික්ෂණයක් සිදු කර ඉදිරි ක්‍රියාමාර්ග

ප්‍රසම්පාදනයක් ලෙස හඳුනාගෙන සෘජු මිලදී ගැනීමේ ක්‍රමය අනුගමනය කරමින්, කිසිදු තාක්ෂණික ඇගයීමක් සිදු නොකර, එක් සැපයුම්කරුවෙකු විසින් ඉදිරිපත් කර තිබුණු මිල කියුම මත පදනම්ව ප්‍රසම්පාදනය සිදුකර, සංස්ථාවේ අලෙවිය සඳහා 2020 වර්ෂයේදී රු.මිලියන14.27 ක් වැයකර එකක් රු.1,400 බැගින් Safety Goggles10,000 ක් හා එකක් රු.1,350 බැගින් Safety Goggles 200ක් මිලදී ගෙන තිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 මාර්ගෝපදේශය ප්‍රකාරව කොන්ත්‍රාත්තුවේ මුළු වටිනාකමින් සියයට 20 ක අත්තිකාරමක් ගෙවිය හැකි නමුත් ඊට පටහැනිව සියයට 50 ක අත්තිකාරමක් ලෙස රු.මිලියන 7 ක් සැපයුම්කරු වෙත ගෙවා තිබුණි.සැපයුම්කරු විසින් ඉදිරිපත් කර	ක්‍රියාමාර්ග ගත යුතුය.	අවශ්‍යතාවය අනුව වෛද්‍ය සැපයුම් අංශයට අත්‍යවශය වූ අයිතමයන් වශයෙන් හඳුනාගෙන මෙම මිලදී ගැනිම සිදු කර ඇති බව.	ගෙන නොතිබුණි.

තිබුණු මිලකියුමට, ගැණුම් ඇණවුමට හා භාණ්ඩ ලැබීම් පත්‍රයට අනුව Seals Safety Goggles සපයා තිබිය යුතු වුවද, ඒ වෙනුවට Swimming Goggles10,200 ක් සපයා තිබුණු බව සිදුකළ භෞතික විගණන පරීක්ෂණයකදී අනාවරණය විය. අවශ්‍යතාවය නිසි ලෙස හඳුනා ගැනීමකින් තොරව හා නිසි අලෙවි පුරෝකථනයකින් තොරව මිලදී ගෙන තිබීම හේතුවෙන් Swimming Goggles10,200 න් 54 ක් පමණක් එකක් රු.1,610 බැගින් අලෙවිකර තිබුණු අතර මුළු පිරිවැය රු.මිලියන 13.92 ක් වූ Swimming Goggles 9,945 ක් ඉතිරිව පැවති බවත් මුළු පිරිවැය රු.281,400ක් වූ Goggles 201 ක ඌනතාවයක් පැවති බවත් 2021නොවැම්බර් 09 හා 24 යන දිනවලදී සිදුකළ භෞතික පරීක්ෂණවලදී අනාවරණය විය.

(ෂ)	වෛද්‍ය සැපයුම් අංශයේ අවශ්‍යතාවය සඳහා 2020 වර්ෂයේදී පිරිවැය රු.මිලියන 21.49 ක් වූ පුද්ගල ආරක්ෂක උපකරණ (Personal protective equipment-(PPE))කට්ටල 5,000 ක් මිලදී ගෙන තිබුණි. වෛද්‍ය සැපයීම් අංශය විසින් හෝ සංස්ථාව විසින් PPE කට්ටල සඳහා අවශ්‍යතා පිරිවිතර පිළියෙල කර නොතිබුණු අතර කිසිඳු ආකාරයක මිල කැඳවීමක් හා තාක්ෂණික ඇගයීමක් සිදු නොකර එක් සැපයුම්කරුවෙකු විසින් ඉදිරිපත් කර තිබුණු Profoma Invoice මත මිලදී ගැනීම සිදු කර තිබුණි.ඇනවුම් කර තිබුණු PPE කට්ටල 5,000 න් කට්ටල 2,000 ක තොගයක් සංස්ථාව වෙත ලැබී වෛද්‍ය සැපයීම් අංශය වෙත යවා තිබුණු නමුත්, සපයා ඇත්තේ "Isolation Gown"පමණක් බවත් වෛද්‍ය සැපයීම් අංශය ඉදිරිපත් කළ ඇණවුමේ සඳහන්ව	2021	විධිමත් පරික්ෂණයක් සිදු කර ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය.	සෞඛ්‍ය අධ්‍යක්ෂක ජනරාල්ගේ උපදෙස් පරිදි තොගය වෛද්‍ය සැපයුම් අංශයට භාර ගැනීමට උපදෙස් දුන් නමුත් මේ දක්වා භාර ගෙන නැති බව.	විධිමත් පරික්ෂණයක් සිදු කර ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

ඇත්තේ "PPE Set"වශයෙන් බවත් සඳහන් කරමින් අදාළ තොගය භාරගැනීම ප්‍රතික්ෂේප කර තිබුණි. එසේ තිබියදී PPE කට්ටල 3,000 කින් සමන්විත දෙවන තොගයද සැපයුම්කරු වෙතින් භාර ගෙන වෛද්‍ය සැපයීම් අංශය වෙත යවා තිබුණු නමුත් පෙර දැක්වූ හේතුවම දක්වමින් එම තොගයද ප්රතික්ෂේප කර තිබුණි. සැපයුම්කරු වෙත ගෙවා තිබුණු රු.මිලියන 21.49ක් හා සේවා ගාස්තු රු.මිලියන 8.13 ක් වෛද්‍ය සැපයීම් අංශයෙන් ප්‍රතිපූර්ණය කර ගැනීමට නොහැකිවීම නිසා සංස්ථාවට රු.මිලියන 29.62 ක අලාභයක් සිදුවී තිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී සිදු කළ භෞතික පරීක්ෂාවකදී PPE කට්ටල 4,997ක් ගබඩාවේ පැවති බවත්, කට්ටල 03 ක ඌනතාවයක් පැවති බවත් නිරීක්ෂණය විය.

(ස)	වෛද්‍ය සැපයුම් අංශය විසින් 2021 වර්ෂයෙහි අවශ්‍යතාවයලෙස හඳුනාගෙන තිබුණු Papaverine HCL injection 60mg/2ml එන්නතින් ඒකක 1,560 ක් රු.මිලියන 68.59 ක් වැය කර මිලදී ගෙන තිබුණි. මෙම ප්‍රසම්පාදනය සඳහා සංස්ථාව විසින් සිදු කර තිබුණු අන්තර්ජාතික විවෘත තරහකාරී ලංසු කැඳවීමට අනුව එක් ලංසුකරුවෙකු පමණක් ලංසු ඉදිරිපත් කර තිබුණු බැවින්ද හා එන්නත් ඒකකයක ඇස්තමේන්තු මිල රු.255.07 ක් වුවද ඒකකයක් සඳහා ලංසුව රු.40,868.98 ක්වූ බැවින්ද, නැවත මිල ගණන් කැඳවිය යුතුව තිබුණු නමුත් එපරිදි කටයුතු නොකර දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් මෙම එන්නත් ඒකකයක් රු.40,868.98ක් බැගින් එන්නත් ඒකක 3,125ක් රු.මිලියන127.71 කට මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබාදී තිබුණි.	2021	විධිමත් පරීක්ෂණයක් සිදු කර ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය.	ප්‍රසම්පාදන කමිටු තීරණය නිවැරදිව වටහා ගැනීමකින් තොරව ණයවර ලිපි නිකුත් කිරීම හේතුවෙන් එම ලිපි ගොනුව භාර නිළධාරිනියගේ වැටුප් වර්ධකය වසරකින් විලම්භනය කිරීමක් සිදු කර ඇති බව.	විධිමත් පරීක්ෂණයක් සිදු කර ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

තාක්ෂණික ඇගයීම් කමිටු පත්කිරීම පිළිබඳව සංස්ථාව අනුගමනය කරන ක්‍රියාපිළිවෙත අනුව රු.මිලියන 50 ඉක්මවන ප්‍රසම්පාදනයන් ඇගයීම සඳහා 05 දෙනෙකුගෙන් යුත් තාක්ෂණික ඇගයීම් කමිටුවක් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් පත්කළ යුතු වුවද,03 දෙනෙකුගෙන් පමණක් සමන්විත සංස්ථාව විසින් පත්කළ තාක්ෂණික ඇගයීම් කමිටුවක් විසින් ලංසු ඇගයීම සිදුකර තිබුණි.ණයවර ලිපි විවෘත කිරීමට පෙර පවතින තොග මට්ටම සලකා බැලීමෙන් පසුව හෝ ඒ පිළිබඳ වෛද්‍ය සැපයීම් අංශයේ අනුමැතිය ලබා ගැනීමෙන් පසුව හෝ ඇණවුම් කළ යුතු බව වෛද්‍ය සැපයීම් අංශය විසින් දන්වා තිබුණු නමුත් සංස්ථාව එපරිදි කටයුතු කර නොතිබුණි. එසේම දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු තීරණයට අනුව වාර්ෂික භාවිතය එන්නත් ඒකක 650

ක් බැවින් මුළු එන්නත් ඒකක ප්‍රමාණයෙන් සියයට 40ක් හෙවත් එන්නත් ඒකක 1,250 ක් සඳහා පමණක් ණයවර ලිපි විවෘත කළ යුතුව තිබුණු නමුත් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු අනුමැතිය අභිබවා එන්නත් ඒකක 1,563 ක් වෙනුවෙන් රු.මිලියන 68.72 ක ණයවර ලිපි විවෘත කර තිබුණි. 2021 ජූලි 18 දින මිලදී ගෙන තිබුණු එන්නත් ඒකක 1,560 න් එන්නත් ඒකක 1,421 ක් 2022 අගෝස්තු 20 දින වන විට ඉතිරිවී තිබුණු අතර ඒවා 2023 පෙබරවාරි මාසයේදී කල් ඉකුත්වන බව නිරීක්ෂණය විය.කොන්ත්‍රාත් ගිවිසුම 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් ගිවිසුම් පනත යටතේ ලියාපදිංචි කර ලියාපදිංචි සහතිකය සංස්ථාව වෙත ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.35 රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව - රත්මලාන

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	බදු පෙර ලාභය (අලාභය) රු.	මතය
2021	8,680,301,991	3,400,224,795	5,280,077,196	1,235,327,457	තත්ත්වාගණනය නොකළ
2022	14,700,781,968	7,307,335,839	7,393,446,129	2,391,594,478	තත්ත්වාගණනය නොකළ
2023	16,517,179,749	5,038,205,788	11,478,973,961	2,173,308,106	තත්ත්වාගණනය නොකළ

	විගණන නිරීක්ෂණ	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ගය	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්වය
1)	පොදු පරීක්ෂණ රසායනාගාරයක් සහ පුහුණු පාසලක් ස්ථාපිත කිරීමේ අරමුණින් බුලත්සිංහල ප්‍රදේශයෙහි පිහිටි සිව්මහල් ගොඩනැගිල්ලක් 2017 වර්ෂයේ මිලදීගෙන තිබුණු අතර සමාලෝචිත වර්ෂය වන විටත් එම අරමුණු සඳහා භාවිතා කර නොතිබුණි. උක්ත අරමුණු වෙනුවෙන් ලබාගත් ශ්‍රවනාගාර පුටු 30 ක්, ආලින්ද පුටු 10 ක් වසර 04 ක කාලයක සිට උපයෝජනය කර නොතිබුණු අතර මෙම භාණ්ඩ විනාශ වෙමින් පැවතුණි.	2021 2023	ගොඩනැගිල්ල කඩිනමින් අපේක්ෂිත කාර්යයන් සඳහා භාවිත කල යුතුය.	ගොඩනැගිල්ලේ ඇති ස්ථාවර වත්කම් තක්සේරු කිරීම සඳහා ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය වෙත භාර දී ඇති අතර ශ්‍රවණාගාර පුටු 30 හා ආලින්ද පුටු 10 පිළිබඳ තක්සේරු වාර්තාව ලැබීමෙන් අනතුරුව තක්සේරු කමිටුවේ තීරණ අනුව ක්‍රියා කිරීමට නියමිත වේ.	මේ වන විට ගබඩා අංශයක් වශයෙන් පවත්වා ගෙන යනු ලැබේ. දැනට භාවිතයේ නොමැති යන්ත්‍ර සහ අනෙකුත් ද්‍රව්‍යයන් එහි ගබඩා කර ඇත. නැතිනම් විශාල කුලී මුදලක් ගෙවා වෙනම ස්ථානයක් ලබා ගැනීමට සිදුවේ.

2)	1997 පෙබරවාරි 03 දිනැති අංක 6/97 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ දෙවන ඡේදය ප්‍රකාරව වැඩ බැලීමේ කාලය මාස 3 ක උපරිමයකට යටත් විය යුතු වුවද, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි වට්ටෝරු හා පර්යේෂණ තනතුර සඳහා අඛණ්ඩව වර්ෂ 05 කට අධික වැඩ බැලීමේ පදනම මත නිලධාරියෙකු බඳවා ගෙන තිබුණි.	2021 2022 2023	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.	අයදුම්පත් කැඳවා ඇති සාමාන්‍යාධිකාරී තනතුර සඳහා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට කටයුතු සිදු කරමින් පවතින අතර සාමාන්‍යාධිකාරී තනතුර සඳහා බඳවා ගත් වහාම තනතුරු සඳහා අයදුම්පත් කැඳවීම සුදුසු බවට කළමනාකරණ කමිටු රැස්වීමේදී තීරණය කරන ලදී.	ඉදිරියේදී බඳවා ගැනීම් සිදුකිරීම සඳහා පුවත්පත් දැන්වීම් පල කිරීමට නියමිතය.
3)	2015 ජුනි 04 දිනැති අංක BP/30/15 හා 2022 සැප්තැම්බර් 22 දිනැති අංක BP/62/22 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජෙනරාල්ගේ අනුමැතියකින් තොරව සේවකයින් සඳහා ගෙවනු ලබන පා පැදි ණය රු. 20,000 සිට 75,000 දක්වා වැඩි කර තිබුණි	2021 2022 2023	චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.	දීමනා සම්බන්ධයෙන් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ලිපියක් යොමු කොට සංශෝධනය කරන ලද සියලු ගෙවීම් සඳහා අනුමැතිය ඉල්ලා ඇත.	මහා භාණ්ඩාගාරයේ අනුමැති ලබා ගැනීම සඳහා කටයුතු කර ඇත.
4)	සංස්ථාවේ නිෂ්පාදිත නිමි ඖෂධ තොග ගබඩා කිරීම වෙනුවෙන් 2018 වර්ෂයේ කඳවල පාරේ දෙමහල් ගබඩා ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ කටයුතු	2021 2022 2023	ගොඩනැගිල්ල ඉක්මණින් ඉදිකර අපේක්ෂිත අරමුණ ඉටුකර ගැනීම සඳහා කටයුතු කළ යුතුය.	අමාත්‍යාංශ තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් දක්වන ලද සංශෝධන උපදේශන ආයතනය නිවැරදි කිරීමෙන් අනතුරුව	සුදුසු ලංසුකරුවෙකු තෝරාගෙන ඇති අතර ඉදිරියේදී කොන්ත්‍රාත්තුව පිරිනැමීමට බලාපොරොත්තු වේ.

	ආරම්භ කර, එහි ඉදිකිරීම් අතරමග නතර කර තිබුණු අතර 2023 දෙසැම්බර් 31 දිනට ගොඩනැගිල්ල ඉදිකිරීම වෙනුවෙන් රු.46,032,361ක් වැය කර තිබුණි. විගණිත දින වන විට ව්‍යාපෘතිය නැවත ආරම්භ කර තිබූ අතර, එය ලංසු ඇගයීම් අදියරේ පැවතුණි. දෙමහල් ගබඩා ගොඩනැගිල්ල ඉදිකිරීම් කටයුතු 2018 සිට වසර 06කින් ප්‍රමාද වීම නිසා ඉන් අපේක්ෂිත අරමුණු ඉටු නොවී තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් සංස්ථාවේ ගබඩා පහසුකම් වෙනුවෙන් කුලී පදනම මත ගබඩා පහසුකම් ලබා ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.41,796,482 ක වියදමක් දරා තිබුණි.			02-02-2024 දින පවත්වන ලද ස්ථාවර කැබිනට් ප්‍රසම්පාදන කමිටුව SCAPC වෙත ඉදිරිපත් කරන ලද අතර ඒ අනුව ලංසු පත්‍රිකා අනුමත කර පුවත් පත් දැන්වීම් පලකරන ලෙස අතිරේක ලේකම්-ප්‍රසම්පාදන විසින් සංස්ථාවේ ප්‍රසම්පාදන දෙපාර්තමේන්තුව වෙත දැනුම් දෙන ලදී. ඉදිකිරීම අවසන් කර භාවිතයට ගන්නා තෙක් අපගේ නිෂ්පාදන සහ හවුල් සමාගම් (joint venture companies) විසින් නිෂ්පාදනය කරනු ලබන නිමි ඖෂධ ගබඩා කර ගැනීම සඳහා පිටතින් ගබඩා කුලියට ගැනීම අනිවාර්යයෙන් සිදු කළ යුතු මෙන්ම, අපගේ නිෂ්පාදන ධාරිතාවය ඉහල යාම නිසා ගබඩා සඳහා ගෙවිය යුතු මිල ගණන්ද ඉහල ගොස් තිබේ.	
5)	දේශීයව ඖෂධ නිෂ්පාදනය කිරීමේ ක්‍රියාවලිය පුළුල් කිරීම	2021	ඉතිරි ආයෝජකයින්ගෙන්ද ඖෂධ මිලදී	2023 වර්ෂයේදී බද්ධ ව්‍යාපාර ගිවිසුම් ඇති කර	හවුල් ව්‍යාපාර ආරම්භ කර ඇති ආයෝජකයින්ගේ

	සඳහා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව හා යෝග්‍ය පෞද්ගලික ආයෝජකයන් අතර බද්ධ ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා වූ යෝජනාව යටතේ සංස්ථාව විසින් විභව ආයෝජකයන් 15 දෙනෙකු සමඟ ඖෂධ සැපයීම සඳහා 2018, 2019 හා 2021 වර්ෂයන්හිදී ගිවිසුම් ගතවී තිබුණද, 2023 දෙසැම්බර් 31 වන විට ආයෝජකයන් 05 දෙනෙකුගෙන් පමණක් සංස්ථාව ඖෂධ මිලදී ගෙන තිබුණි.	2022 2023	ගැනීමට කටයුතු කළ යුතුය.	ගත් අයෝජකයින් පස්දෙනෙකු විසින් වෛද්‍ය සැපයුම් අංශයට ඖෂධ සැපයීම සිදු කොට ඇත.	කර්මාන්ත ශාලා ඉදිකිරීම සම්බන්ධයෙන් සංස්ථාව අධීක්ෂණය කරමින් සිටින අතර ඔවුන්ගේ කර්මාන්තශාලා ඉදිකිරීම් නැරඹීමට පැමිණෙන ලෙස Greenthrough ආයතන දැනටමත් සංස්ථාවට දන්වා ඇත.
6)	2020 වර්ෂයේදී Covid – 19 වසංගත රෝගී තත්ත්වය සඳහා පිළියම් ලෙස භාවිතා කිරීමේ අපේක්ෂාවෙන් මිලදීගෙන තිබුණ 2025 මාර්තු 31 දිනට ජීව කාලය අවසන් වීමට නියමිත රු.6,698,610 ක් වටිනා Chloroquine Phosphate BP අමුද්‍රව්‍ය 600kg නිෂ්කාර්යව ගබඩා පරිශ්‍රය තුළ පැවතුණි.	2023	අමුද්‍රව්‍යයේ ජීවකාලය ඉකුත් වීමට පෙර අපනයනය කිරීමට කටයුතු කළ යුතුය.	මෙම නිෂ්පාදිත ඖෂධ හෝ අමුද්‍රව්‍ය තොගය දේශීය හෝ විදේශීය පාර්ශවයකට අවශ්‍ය නම් එය සම්බන්ධීකරණය කර දෙන ලෙස සෞඛ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (සෞඛ්‍ය සේවා) වෙත ඉල්ලීම් කර ඇති අතර ෆීජි දූපත් රටක් සඳහා ප්‍රදානයක් ලෙස ලබාදීමේ ඇති හැකියාව සොයාබලමින් පවතින බව අප හට දන්වා ඇත. දැනට	වර්තමානය වන විට ද ප්‍රති අපනයනය කිරීමේ හැකියාව සොයා බලමින් පවතී.

				එම සම්බන්ධීකරණ කටයුතු සිදුවෙමින් පවතී.	
7)	Clopidogrel Tablet USP 75 mg (500 Pack Size) ඖෂධය 2020 වර්ෂයේ නව ඖෂධයක් ලෙස සංස්ථාව තුළ නිපදවීම හඳුන්වා දී තිබුණද, එහි නිෂ්පාදන සූත්‍රයෙහි (Formula) පවතින දුර්වලතාවයන් හේතුවෙන් එම ඖෂධයේ විසිරීම (Dissolution) නිසි අවශ්‍යතාවට නොගැලපීම මත සංස්ථාව තුළ නිපදවීම අසාර්ථක වී තිබුණි. නිෂ්පාදන සූත්‍රය සංවර්ධනය කර මෙම ඖෂධය සංස්ථාව තුළ නිපදවා වෛද්‍ය සැපයීම් අංශයේ අවශ්‍යතා වෙනුවෙන් සපයන්නේ නම් සියයට 10ක ලාභයක් ළඟා කර ගැනීමට අවස්ථාව තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි.	2021 2023	වෛද්‍ය සැපයීම් අංශය තුළ ඉල්ලුමක් පවතින ඖෂධයක් බැවින් නිෂ්පාදන සූත්‍රයේ පවතින දුර්වලතා හැකි ඉක්මණින් නිවැරදි කර ඖෂධය නිෂ්පාදනය කිරීමට කටයුතු කළ යුතුය.	නිෂ්පාදන සූත්‍රයෙහි පවතින දුර්වලතාවයන් නිවැරදි කිරීම සඳහා පර්යේෂණ කටයුතු සිදු කරමින් පවතී. සංවර්ධන කටයුතු හැකි ඉක්මණින් නිම කොට මෙම ඖෂධය නිෂ්පාදනය කිරීමට බලාපොරොත්තු වේ.	නිෂ්පාදන සූත්‍රයේ පවතින දුර්වලතා මගහරවා ගැනීම සඳහා පර්යේෂණ සිදු කරමින් පවතී.
8)	ලෝටස් ෆාමා නව නිෂ්පාදනාගාරය තුළ රටේ මූලික ඖෂධ අවශ්‍යතාව ආවරණය කෙරෙන නිෂ්පාදන කර්මාන්ත ශාලා 05ක් පිහිටුවීමට සැලසුම්	2022 2023	ව්‍යාපෘතිය ආයතනයට මෙන්ම රටට අත්‍යවශ්‍යම අංගයක් වන බැවින් එය කඩිනම්	ඉඩම සම්පූර්ණ අක්කර 800කින් යුතු ඉඩම් කොටසකින් ලබාගත් ඉතාම කුඩා කොටසකි. එය නාගරික	ප්‍රසම්පාදන මාර්ගෝපදේශණ අනුව (ශක්‍යතා අධ්‍යයනය සඳහා) ලංසු කැඳවීමට අදාළ ලේඛනය සකස් කිරීමේ

කළද වසර 03කට පසුව ඉන් ප්‍රථම අදියර ලෙස මුඛ මාර්ගයෙන් ලබා දෙන සාමාන්‍ය ඖෂධ නිපදවීම සඳහා වන කර්මාන්ත ශාලාවක් පිහිටුවීම වෙනුවෙන් එක්සත් ජනපද ඩොලර් මිලියන 13.1කට සමාන රු. මිලියන 4,349.2ක වටිනාකමක් ඇස්තමේන්තු කර තිබුණි. 2022 ඔක්තෝම්බර් 20 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව වන BP/44/22 හා ඔක්තෝම්බර් 07 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව මෙම ව්‍යාපෘතිය යටතේ අපේක්ෂිත නිෂ්පාදනාගාර 03 නිපදවීමට අක්කර 20ක වපසරිය ප්‍රමාණවත් බව දක්වා තිබුණද රු. මිලියන 322.4ක් වැයකර අක්කර 65ක් මිලදී ගැනීමට හේතු පැහැදිලි නොවුණි. තවද, 2024 පෙබරවාරි 02 දින රැස් වූ අමාත්‍ය මණ්ඩලය පත් කළ ප්‍රසම්පාදන කමිටුව විසින් ව්‍යාපෘතියට අදාල සෑම ක්ෂේත්‍රයක්ම ආවරණය වන පරිදි ශක්‍යතා අධ්‍යනයක් (Comprehensive Feasibility Study)	කරගැනීමට කටයුතු කල යුතුය.	සංවර්ධන අධිකාරිය මගින් කැබිනට් පත්‍රිකාවක් හරහා ලබාගත් එකකි. එය රජයේ තක්සේරු වටිනාකමට වඩා ඉතා අඩු වටිනාකමකට ලබා ගන්නා ලදී. ව්‍යාපෘතියේදී ඉදිරි අනාගතයේ සැලසුම් සඳහා ඉඩකඩ ඉතිරි කර ගැනීම අත්‍යවශ්‍ය වී තිබුණි. ශක්‍යතා අධ්‍යනය සඳහා ප්‍රසම්පාදන කමිටුවක් පත්කර තිබෙන අතර වර්තමානය වන විට ලංසු කැඳවීම හා සම්බන්ධ ලේඛන සකස් කිරීම අවසාන අදියරේ ඇත.	අවසන් අදියරේ කමිටුව මේ වන විට සිටී.

	එදිනෙන් මාස 03ක කාලයක් තුළ සිදුකළ යුතු බව දන්වා තිබුණද, විගණිත දිනය වූ 2024 මැයි 06 වන විටද ඒ සඳහා ලබා දී තිබූ කාලය ඉකුත් වී තිබුණි. 2022 සිට 2026 දක්වා වූ පස් අවුරුදු සැලැස්මට අනුව මෙම ව්‍යාපෘතිය වසර 03කදී නිම කිරීමට බලාපොරොත්තු වුවද විගණිත දිනය වූ 2024 මැයි 15 දින වන විටද ව්‍යාපෘතිය නිම කිරීමට බලාපොරොත්තු වූ කාලයෙන් වසර 02කුත් මාස 05ක් ඉකුත් වී භෞතික ප්‍රගතිය ශුන්‍ය වී තිබුණි.				
9)	2018 සිට 2023 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ නව ඖෂධ වර්ග 25ක් පමණ හඳුන්වා දී තිබුණද (Omeprazole Gr Capsules IP 20mg, Levothyroxine (Thyroxine), Atorvastatin, Flucloxacillin, Cetirizine BP 10mg , Diltiazem Hydrochloride Tablets USP 30mg ඖෂධ හැර) අළුතින් හඳුන්වා දී තිබූ ඖෂධ අඛණ්ඩව නිෂ්පාදනයට සහ ප්‍රවර්ධනයට ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබීම	2021 2023	නව නිපැයුම් සඳහා වෛද්‍ය සැපයීම් අංශයෙන් ඉල්ලුමක් නොතිබුණද විවෘත වෙළඳ පොළ තුළින් ඇණවුම් ලබා ගැනීමට කටයුතු කරගැනීම මගින් නව නිෂ්පාදන තුළින් ප්‍රයෝජන ලබා ගැනීමට කටයුතු කළ යුතුය.	අළුතින් හඳුන්වා දුන් ඖෂධ අඛණ්ඩ නිෂ්පාදනය සඳහා ප්‍රමාණවත් ඇණවුම් ලැබීම අත්‍යවශ්‍ය වේ. ඇණවුම් නොලැබීම නිසා අඛණ්ඩව නිෂ්පාදනය සිදු කළ නොහැකි විය. ඉදිරියේදී ඇණවුම් ලැබුණු පසු නිෂ්පාදන ධාරිතාව වැඩි කර ගත හැක.	නව ඖෂධ හඳුන්වාදීම සඳහා ප්‍රමාණවත් ඇණවුම් ලැබී නොමැති බැවින් එම ඖෂධ සඳහා අඛණ්ඩව ඖෂධ නිෂ්පාදනය කිරීමට අවස්ථාව නොලැබී ඇත.

හේතුවෙන් සංස්ථාවේ නිෂ්පාදන මිශ්‍රණය සඳහා නව හඳුන්වාදීම් වලින් ප්‍රමාණවත් දායකත්වයක් සිදු වී නොතිබුණි.

3.36 කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	1,544,569,133	704,669,118	839,900,015	171,795,953	තත්ත්වාගණනය කළ
2022	1,262,753,692	584,570,526	678,183,166	(283,198,552)	තත්ත්වාගණනය කළ
2023	1,201,828,307	474,684,494	727,143,813	179,224,388	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වර්ෂය	විගණකාධිපතිගේ නිර්දේශය	ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	1998 වර්ෂයේ පොහොර ණය යෝජනා ක්‍රමය යටතේ පොහොර, දියර ඉසින යන්ත්‍ර හා තරාදි මිලදී ගැනීම සඳහා කුඩා තේ වතු සමිතිවලට ලබා දී තිබුණු ණය මුදලින් සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු ණය ශේෂය වූ රු.4,276,531 ක් වූ අතර වර්ෂ 25 ක් ගත වී තිබුණද අයකර ගැනීමට ඵලදායි පියවරක් නොගෙන ජංගම වත්කම් යටතේ ගිණුම් ගත කර තිබුණි.	2023	වගකිව යුතු පාර්ශවයන් වෙතින් ලැබිය යුතු ණය ශේෂයන් අයකර ගැනීමට ප්‍රමාණවත් හා විධිමත් ක්‍රියාමාර්ග ගතයුතුය.	කමිටුවක් පත්කර වාර්තාවක් ලබා දෙන ලෙස විගණන හා කළමනාකරණ කමිටුව උපදෙස් ලබා දී ඇත.	වගකිව යුතු පාර්ශවයන් වෙතින් ලැබිය යුතු ණය ශේෂයන් අයකර ගෙන නොතිබුණි.
2	1998 වර්ෂයේදී වර්ණ විභේදන යන්ත්‍ර ලබාදීමේ වැඩසටහන යටතේ පෞද්ගලික තේ	2023	පෞද්ගලික තේ කම්හල් වලින් ණය මුදල් අයකර ගැනීම සඳහා අවශ්‍ය පියවර	ඊරියගොල්ල කම්හලෙන් ලැබිය යුතු මුදල් සඳහා පවරා	නඩු පවරා නොමැති තේ කම්හල් වලින් ණය මුදල්

	කම්හල් හතරකට රු. 5,916,589 ක ණය මුදලක් ලබාදී තිබූ අතර එම මුදලින් ඊරියගොල්ල කම්හලෙන් ලැබිය යුතු රු.2,436,449 ක් සඳහා පමණක් නෛතික ක්‍රියාමාර්ග ගෙන තිබුණි. ගිවිසුමෙහි පවත්නා අඩුපාඩු හේතුවෙන් ඉතිරි රු.3,480,140ක මුදල සඳහා නෛතික ක්‍රියාමාර්ග ගැනීමට නොහැකි වී තිබුණි.		කඩිනමින් ගතයුතු අතර ගිවිසුම් වල අඩුපාඩු හා ඒ සඳහා වගකිවයුතු නිළධාරීන් හඳුනාගෙන එම අඩුපාඩු නැවත නොවීමට අවශ්‍ය පියවර ගත යුතුය.	තිබුණු නඩුව සඳහා ආයතනය විසින් වරින්වර පෙනී සිටින අතර මේ දක්වා නඩු කටයුතු අවසන්වී නැත.	අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි.
3	අධිකාරිය සතු නොවන ඉඩමක රු.44,484,405 ක් වියදම් කර අධිකාරියේ කෑගල්ල ප්‍රාදේශීය කාර්යාල ගොඩනැගිල්ල ඉදිකර තිබුණු නමුත් 2023 දෙසැම්බර් 31 දින වන විටත් එහි අයිතිය අධිකාරියට පවරාගෙන නොතිබුණි.	2023	මෙම ඉඩම අධිකාරිය වෙත පවරා ගැනීමට හෝ නීත්‍යානුකූල ගිවිසුමකට එළඹීමට අවශ්‍ය කටයුතු කඩිනමින් සිදුකළ යුතුය.	ඉඩම් අයිතිය පවරා ගැනීම සඳහා අමාත්‍යාංශය වෙත ලිපි යොමුකර ඇත.	ඉඩම අධිකාරිය වෙත පවරා ගැනීම හෝ නීත්‍යානුකූල ගිවිසුමකට එළඹීම මේ දක්වා සිදුවී නොතිබුණි.
4	1998 වර්ෂයේදී කුඩා තේ වතු සංවර්ධන සමිති වෙත ලබාදී තිබුණු වාහන 23 ක් විකිණීමෙන් ලැබී තිබුණු රු. 9,155,483 ක මුදල හා 2020 වර්ෂයේ දී ගොවීන්ට සහනාධාර දීමනාවක් ගෙවීමට භාණ්ඩාගාරයෙන් ලබාදී තිබුණු මුදලින් ඉතිරි වූ රු. 13,716,586 ක් වර්ෂ 3 සිට 25 දක්වා කාලයක් අධිකාරිය විසින් අරමුණුගත ඵලදායී	2023	රජයේ මුදල් කාර්යක්ෂමව, හා අරපිරිමැස්මෙන් යුතුව අරමුණුගත කාර්යයන්හී යෙදවීමට කටයුතු කළ යුතුය.	වාහන විකිණීමෙන් ලද රු.9,155,483 මුදලින් කුඩා තේවතු හිමියන්ගේ ක්ෂේත්‍ර චාරිකා සහ පුහුණු වැඩසටහන්හිදී යොදා ගැනිමට බස් රථයක් මිල දි ගැනිමට භාණ්ඩාගාර අනුමැතිය ඉල්ලුම් කර ඇත.	මෙම මුදල් අදාළ අනුමැතීන් ලබාගෙන අරමුණුගත කාර්යයන්හී යෙදවීමට කටයුතු කර නොතිබුණි.

	කාර්යයක යෙදවීමට හෝ භාණ්ඩාගාරයට ප්‍රේෂණය කිරීමට හෝ කටයුතු නොකර ජංගම වගකීම් යටතේ ගිණුම් ගත කර තිබුණි.		මෙම මුදල පිළිබඳ කොම්ප්ට්‍රෝලර් ජනරාල්ව දැනුවත් කර ඇති අතර මුදල් ස්ථිර තැන්පතුවක ආයෝජනය කර ඇත. රු.13,716,586 ක මුදල 2024 සහනාධාර වෙනුවෙන් ලැබිය යුතු මුදලින් අඩුකිරීමේ හැකියාව පිළිබඳව භාණ්ඩාගාරයෙන් විමසීම සිදුකර ඇත.	
5	2021 වර්ෂයේදී ආරම්භ 2023 කර තිබුණු කොම්පොස්ට් පොහොර නිෂ්පාදනය කිරීමේ ව්‍යාපෘතිය මඟින් ප්‍රාදේශීය කාර්යාල 08 වෙතින් මාසිකව මෙට්‍රික් ටොන් 05 ක් බැගින් මෙට්‍රික් ටොන් 40 ක නිෂ්පාදනයක් ඉලක්ක කර ගනිමින් කොම්පෝස්ට් අමුද්‍රව්‍ය කැබලි කිරීමේ යන්ත්‍ර 08 ක් ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව වෙතින් සෘජු කොන්ත්‍රාත් ක්‍රමය භාවිතා කර රු.2,300,000 කට 2021 වර්ෂයේදී මිලදී ගෙන තිබුණද මෙම යන්ත්‍රවල	අරමුණු හා අවශ්‍යතාවයන් ප්‍රශස්ථ මට්ටමින් ඉටු කරගත හැකිවන පරිදි ව්‍යාපෘති මෙහෙයවීමට කටයුතු කළ යුතුය.	කොම්පෝස්ට් අමුද්‍රව්‍ය කැබිලි කිරීමේ යන්ත්‍ර 8න් 2ක් ජාතික වැව්ලි කළමනාකරණ ආයතනයට ලබාදීමට විගණන හා කළමනාකරණ කමිටුව මඟින් සාකච්ඡා කර ඇත.	අරමුණු හා අවශ්‍යතාවයන් ප්‍රශස්ථ මට්ටමින් ඉටු කරගත හැකිවන පරිදි කොම්පෝස්ට් යන්ත්‍ර භාවිතා කර නොතිබුණු අතර ජාතික වැව්ලි කළමනාකරණ ආයතනයට යන්ත්‍ර 2ක් මේ දක්වා භාර දී නොබුණි .

	අවශ්‍යතාවයට සරිලන ප්‍රමාණවත් ධාරිතාවයක් නොමැති වීම හේතුවෙන් මිලදීගත් දින සිට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා මෙ.ටොන් 47.75 ක තොගයක් පමණක් නිෂ්පාදනය කර තිබුණි.				
6	මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිගේ 2019 සැප්තැම්බර් 18 දිනැති අංක EC/EDR/PRE – 2019 චක්‍රලේඛයේ 7 (i) ඡේදය ප්‍රකාරව ජනාධිපතිවරයා තෝරා පත්කිරීමට ඡන්ද විමසීම ප්‍රකාශ කිරීමෙන් පසු එනම් 2019 සැප්තැම්බර් 18 දිනයට පෙර දින යොදා පෙරදාතම්කොට පත්වීම් ලිපි / උසස්කිරීම් සහ බඳවා ගැනීම් සඳහා වන අයදුම්පත් කැඳවීම් ආකාරයේ කාර්යයන් සිදු කිරීම කිසිසේත්ම නොකළ යුතු බව දැඩි ලෙස අවධාරණය කර තිබුණද, අධිකාරිය විසින් පෙරදාතම්කොට සේවකයින් 44 දෙනෙකුට ස්ථිර පත්වීම් ලබා දීමේ කාර්යය සිදු කර තිබූ අතර 2019 සැප්තැම්බර් 01 දින සිට 2020 පෙබරවාරි 28 දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය නොමැති	2023	මෙම සේවකයින් බඳවා ගැනීමට හා ගෙවීම් කිරීමට වගකිව යුතු නිළධාරීන්ට එරෙහිව වහාම පියවර ගත යුතුය.	මෙම පත්වීම් අවසන් කර ඇත.	බඳවා ගැනීමට හා ගෙවීම් කිරීමට වගකිව යුතු නිළධාරීන්ට එරෙහිව විධිමත් පියවර ගෙන නොතිබුණි. එමෙන්ම ඉවත් කරන ලද සේවකයින් සිය ඉවත් කිරීමට විරුද්ධව අධිකාරියට එරෙහිව නඩු පැවරීම් සිදුකර ඇති අතර සේවකයින් 08ක් වෙත රු. 370,407 වන්දි මුදල් ලබාදී තිබුණි.

	නිලධාරීන් 44 දෙනෙකුට වැටුප් වශයෙන් රු.5,376,161ක් අධිකාරිය වෙත ලැබුණු ප්‍රතිපාදන මුදල් භාවිතා කරමින් ගෙවා තිබුණි.				
7	මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ 2018 ජූලි 18 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 3/2018 හි I හා II ඡේද ප්‍රකාරව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ණ අනුමැතියකින් තොරව කාර්ය මණ්ඩල බඳවා ගැනීම සිදු නොකළ යුතු වුවද, 2018 ජූලි 18 දිනෙන් පසුව කළමනාකරණ සහකාර නිලධාරීන් 09ක් කාර්යාල හා ආරක්ෂක සහයකයකු හා රියදුරකු බඳවා ගෙන තිබුණද එම බඳවා ගැනීම් සඳහා චක්‍රලේඛ ප්‍රකාරව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.	2023	මෙම සේවකයින් බඳවා ගැනීමට හා ගෙවීම් කිරීමට වගකිව යුතු නිළධාරීන්ට එරෙහිව වහාම පියවර ගත යුතුය.	මෙම පත්වීම් අවසන් කර ඇත.	බඳවා ගැනීමට හා ගෙවීම් කිරීමට වගකිව යුතු නිළධාරීන්ට එරෙහිව විධිමත් පියවර ගෙන නොතිබුණි.

3.37 තේ පර්යේෂණ මණ්ඩලය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	2,463,703	479,508	1,984,195	(77,477)	තත්ත්වාගණනය කළ
2022	2,681,514	446,139	2,235,375	77,886	තත්ත්වාගණනය කළ
2023	2,622,493	390,192	2,232,301	17,151	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වර්ෂය	විගණකාධිපතිගේ නිර්දේශය	ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	මණ්ඩලය පිහිටි භූමියේ සහ වතුයායන්වල සිටුවා ඇති මහෝගනී, කොස් සහ යුකැලිප්ටස් යනාදී වටිනා උස් සෙවන ශාක 10,629 ක් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 18 හි 13 හා 16 ඡේද ප්‍රකාරව පාරිභෝජ්‍ය ජෛව විද්‍යාත්මක වත්කම් ලෙස හඳුනාගෙන එහි වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.	2023	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව ජෛව විද්‍යාත්මක වත්කම් වල වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය.	ජෛව විද්‍යාත්මක වත්කම් ලෙස හඳුනාගෙන ඇති ගස්වල වටිනාකම තක්සේරු කිරීම සඳහා රාජ්‍ය දැව සංස්ථාව සමඟ මූලික කටයුතු සිදු කර ඇත.	ජෛව විද්‍යාත්මක වත්කම් යටතට ගැනෙන ගස් මණ්ඩලය විසින් හඳුනාගෙන ඇති නමුත් වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.
2	තේ පර්යේෂණ මණ්ඩලයට හිමිකමක් නොමැති, ශ්‍රී ලංකා තේ මණ්ඩලය යටතේ ලියාපදිංචි වාහන 03 ක් රු.3,750,000 කට ප්‍රත්‍යාගණනය කර	2023	මණ්ඩලයට අයිති වත්කම් පමණක් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කළ යුතුය.	අංක 32-1809 දරන වාහනය අළුත්වැඩියා කටයුතු අවසන් කර ලිපිලේඛන මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට භාර දී තිබූ අතර, අංක	හිමිකම් නොමැති වාහන වල අයිතිය මණ්ඩලය වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

	මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර තිබුණු බැවින් දේපළ පිරියත හා උපකරණ සහ ප්‍රත්‍යාගණන සංචිතය එම අගයෙන් අධිප්‍රමාණය වී තිබුණි.			90-6217 දරන වාහනය රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 ට අනුව අපහරණය කිරීමට කටයුතු සිදු කරමින් ඇත .32-1806 අංක දරන වාහනය අලුත්වැඩියා කිරීම සඳහා එන්ජිමක් මිලදී ගැනීමට අයවැය ප්‍රතිපාදන නොමැතිකම නිසා වාහනය සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කර නැත.	
3	මණ්ඩලයේ විශේෂ ව්‍යාපෘති යටතේ දේශගුණික විපර්යාස සඳහා තේ ශාකයේ අනුවර්තීය ප්‍රතිචාර අධ්‍යයනය කිරීම සඳහා 2017 නොවැම්බර් 24 දින රු.12,554,583 ක් වැය කර ඉන්දියාවෙන් මිලදීගත් උපකරණය, (Walk in Type Environmental Controlled Facility) අපේක්ෂිත පිරිවිතරයන්ට නොගැලපීම හා එහි ක්‍රියාකාරීත්වය අපේක්ෂිත මට්ටමින් නොපැවතීම මත වසර 5 ක් ගතවී තිබුණද පර්යේෂණ සඳහා භාවිතා කළ නොහැකිව නිෂ්කාර්යව පැවතුණු අතර එම	2023	වගකිවයුතු පාර්ශවයන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග කඩිනම් කර අලාභ අයකර ගත යුතුය.	සැපයුම්කරු විසින් ගිවිසුමේ කොන්දේසි කඩ කිරීමේ ගැටළුව සම්බන්ධයෙන් දේශීය හා විදේශ සැපයුම්කරුවන් යහපත් ප්‍රතිචාර නොදක්වා ඇති බැවින්, රු .12,554,583 ක මුදල හා එකී මුදල ගෙවා නිමවන තුරු ඒ මත නෛතික පොළියක්ද ලබා ගැනීම සඳහා පළමු සහ දෙවන විත්තිකරුවන්ට එරෙහිව නියෝගයක් ලබා දෙන ලෙසට කොළඹ වාණිජ මහාධිකරණයෙහි නඩු පැවරීමට කටයුතු කර ඇත.	වගකිවයුතු පාර්ශවයන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග අවසන්ව නොමැති අතර අලාභ අයකර ගැනීමටද කටයුතු කර නොතිබුණි.

	ප්‍රසම්පාදනයට වගකිව යුතු පාර්ශව හඳුනාගෙන ඒ සම්බන්ධයෙන් විධිමත් පියවරක් ගැනීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි				
4	පිළිවෙලින් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට, තලවකැලේ වැවිලි සමාගමට හා රජයට අයිති ඉඩම් වල මණ්ඩලය විසින් රු.73,933,378 ක් වැයකර වලහන්දූව,දෙණියාය සහ කොට්ටව ප්‍රාදේශීය කාර්යාල ගොඩනැගිලි ඉදිකර මණ්ඩලයේ වත්කම් ලෙස ගිණුම්ගතකර තිබුණද එම ඉඩම් මණ්ඩලයේ නමට පවරා ගෙන නොතිබුණි.	2023	කඩිනමින් ඉඩම්වල බදු ඔප්පු හෝ නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය.	<u>වලහන්දූව වත්ත</u> මෙම වත්ත සම්බන්ධයෙන් රාජ්‍ය වැවිලි සංස්ථාව විසින් අභියාචනාධිකරණයේ ගොනුකර ඇති පෙත්සමේ නියෝගය ලැබෙන තෙක් මණ්ඩලය විසින් භුක්ති විඳින භූමි කොටසේ නීත්‍යානුකූල අයිතිය සම්බන්ධයෙන් තීරණයක් ගැනීමට නොහැකි වී ඇත. <u>දෙනියාය</u> ඉඩමේ නිත්‍යානුකූල අයිතිය මණ්ඩලය වෙත ලබාගැනීම සඳහා තලවකැලේ වැවිලි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇති අතර ඉඩම් කොටස නිදහස් කරගැනීම සඳහා තවදුරටත් ස්වර්ණමය කොටස් හිමිකරුගේ අනුමැතියද ලබාගත යුතු බැවින් ඒ සඳහා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය දැනුවත් කර තිබුණි. <u>කොට්ටව</u> රජයට අයත් අක්කර 50ට වැඩි ඉඩමක් වන	ඉඩම්වල බදු ඔප්පු හෝ නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

				බැවින් මණ්ඩලයට පවරා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට අදාළ ලියකියවිලි වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය වෙත යවා ඇත.	
5	සම්පූර්ණ වැටුප් සහිත අධ්‍යයන නිවාඩු ලබා විදේශගත වූ, නැවත සේවයට නොපැමිණි සහ සේවයට පැමිණීමෙන් පසු අනිවාර්යය සේවාකාලය අවසන් වීමට පෙර සේවය අතහැර ගිය නිලධාරීන් 04 දෙනෙකු විසින් 2005 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා මණ්ඩලය සමඟ එළඹී තිබුණු ගිවිසුම් කඩකිරීම හේතුවෙන් අදාළ බැඳුම්කර වටිනාකම වූ රු.15,054,891 ක් 2023 වර්ෂය අවසානය වන විටත් ආපසු අයකර ගෙන නොතිබුණි.	2023	ගිවිසුම් කඩකිරීම සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග කඩිනම් කළ යුතුය.	නිලධාරීන්ගෙන් අයවිය යුතු බැඳුම්කර වටිනාකම අයකර ගැනීම සඳහා මණ්ඩලය විසින් නඩු පැවරීමට කටයුතු කර ඇත.	ගිවිසුම් කඩකිරීම සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග අවසන්ව නොමැති අතර අදාළ බැඳුම්කර වටිනාකම ආපසු අයකර ගෙන නොතිබුණි.
6	ශ්‍රී ලංකා තේ පර්යේෂණ මණ්ඩලය සඳහා කළමනාකරණ තොරතුරු පද්ධතියක් නිර්මාණය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම සඳහා රාජ්‍ය සමාගමක් වෙත	2023	කළමනාකරණ තොරතුරු පද්ධතියෙහි කටයුතු කඩිනමින් සම්පූර්ණ කරගැනීමට කටයුතු කළ	සැපයුම්කාර ආයතනය සමඟ එකඟතාවයට අනුව කාර්යයන් 200ක් නිමකල යුතු වන අතර දැනට 191 ක් අවසන් කර පද්ධතිය තුළ අඩංගු කර තිබුණු අතර නිමකර දී ඇති	සම්පූර්ණ වශයෙන් පද්ධතිය භාවිතයට ගැනීමේ කටයුතු අවසන් කර නොතිබුණි.

	2020 අප්‍රේල් 22 දින රු.4,228,700ක මුදලකට කොන්ත්‍රාත්තුව භාර දී 2020 අගෝස්තු 20 දින රු.1,141,749ක අත්තිකාරම් මුදලක් එම ආයතනයට ගෙවා තිබුණි. සේවා සැපයුම්කරු විසින් ඉදිරිපත් කර තිබුණු ලංසු ලේඛන අනුව ඇණවුම් නිකුත් කළ දිනයේ සිට දින 120 තුළ වැඩ අවසන් කළ යුතු වුවද, 2024 ජුනි වන විට වසර 4ක් ඉක්මවා ගිය ද එහි කටයුතු අවසන් කර නොතිබුණි.		යුතුය.	සංවර්ධිත කාර්යයන් වලින් 144 ක් භාවිතයේ යෙදවීම සඳහා අදාළ අංශ වෙත බාර දී ඇත. තොරතුරු තාක්ෂණ නිපුණතාවයෙන් හෙබි වෙනත් අංශ වලට අයත් නිලධාරීන් 4 දෙනෙකු ද මේ සඳහා තවදුරටත් අනුයුක්ත කර තිබුණි.	
7	තේ පර්යේෂණ මණ්ඩලයට අයත් තලවකැලේ ලැමිලියර් වතුයායේ හෙක්ටයාර 1.367ක භූමි ප්‍රමාණය, කර්මාන්තශාලාව හා සියලුම ගොඩනැඟිලි 2003 වර්ෂයේ දි පෞද්ගලික සමාගමකට වසර 50ක කාලපරිච්ඡේදයක් සඳහා බදු දී තිබුණද ගිවිසුම් ප්‍රකාරව බදු කුලී නොගෙවීම මත 2016 වර්ෂයේදි අදාළ දේපළ නැවත අත්පත් කරගෙන තිබුණු නමුත් අත්පත්කරගත් දින සිට 2024 ජුලි දක්වා එනම් වසර 08ක් ඉකුත් වී ඇතත්	2023	මණ්ඩලයට අයත් දේපළ ඵලදායීව උපයෝජනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග නොපමාව ගත යුතුය.	රාජ්‍ය ඉඩම් බැහැර කිරීමේ සීමාවන් පනවා ඇති බැවින් ඒ වෙනුවෙන් ගත යුතු ඉදිරි ක්‍රියාමාර්ගයන් පිළිබඳ අමාත්‍යාංශයේ උපදෙස් ලබා ගැනීමට කටයුතු කර ඇති අතර ලැමිලියර් වතුයාය ඇතුළු තේ පර්යේෂණ ආයතනයට අයත් වතුවල ඉඩම්, ගොඩනැගිලි හා අනෙකුත් වත්කම් භාවිතය හා නඩත්තුව සම්බන්ධයෙන් කමිටුවක් පත් කර ඇත.	ලැමිලියර් වතුයාය ඇතුළු වත්කම් ප්‍රයෝජනයට ගැනීමකින් තොරව නිශ්කාර්යව පවතී.

	එම වත්කම් ප්‍රයෝජනයට ගැනීමකින් තොරව නිශ්කාර්යව පැවතුණි.				
8	තේ පර්යේෂණ මණ්ඩලයේ කාර්ය මණ්ඩල අර්ථසාධක අරමුදල 1959 ජුනි 01 දින සිට අනුමත අර්ථසාධක අරමුදලක් බවට 2014 ඔක්තෝම්බර් 30 දින කම්කරු කොමසාරිස් විසින් සහතික කර තිබුණි. මෙම අර්ථසාධක අරමුදලේ කළමණාකරණ රීති සංග්‍රහයේ 4(i) වගන්තිය ප්‍රකාරව අරමුදලේ භාරකාර මණ්ඩලය , තේ පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂවරයා (භාරකාර මණ්ඩලයේ සභාපති), අරමුදලේ සභාපති විසින් අධ්‍යක්ෂවරු අතරින් නම් කළ සාමාජිකයින් දෙදෙනෙකු, අරමුදලේ සාමාජිකයින් අතරින් මහා සභාවේදී පත්කරනු ලබන සාමාජිකයින් දෙදෙනෙකු ද හා ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් නම් කළ අරමුදලේ සාමාජිකත්වය නොදරන තේ මණ්ඩලයේ	2023	අර්ථසාධක අරමුදලේ කළමනාකරණ රීති සංග්‍රහය ප්‍රකාරව භාරකාර මණ්ඩලය පත්කිරීමට හා සංශෝධනය කිරීමට කටයුතු කිරීම තුළින් තේ පර්යේෂණ ආයතනයේ නිළධාරීන්ගේ අරමුදල් කායීක්ෂමව හා එලදායීව පවත්වාගත යුතුය.	භාරකාර මණ්ඩලයේ සංයුතිය වෙනස් කිරීම සම්බන්ධව පුද්ගලික සේවක අර්ථසාධක අරමුදල් අංශය වෙත ඉල්ලීම් ලිපි යවා ඇත.	අර්ථසාධක අරමුදලේ කළමනාකරණ රීති සංග්‍රහය ප්‍රකාරව භාරකාර මණ්ඩලය පත්කිරීමට හා සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

	නිලධාරින් දෙදෙනෙකු ද ඇතුළුව සාමාජිකයින් හත් දෙනෙකුගෙන් සමන්විත විය යුතු වුවද සභාපති විසින් තේ මණ්ඩලයේ සාමාජිකයින් දෙදෙනා 2024 ජුලි 01 දින වන විටත් භාරකාර මණ්ඩලයට පත්කර නොතිබුණි.				
9	මණ්ඩලයට අයිති ශාන්ත කුම්බිස් වතුයායේ 2017 සහ 2018 වර්ෂයන්හිදි සිදු වූ මූල්‍ය වංචාවන් හේතුවෙන් රු.10,321,858ක ශේෂයක් වර්ෂ 05කට වැඩිකාලයක සිට ණයගැතියන් ලෙස පවතින නමුත් අදාළ පරීක්ෂණ කටයුතු අවසන් කර වගකිවයුතු පාර්ශවයන්ගෙන් එම මුදල් අයකර ගැනීමට මණ්ඩලය විසින් කටයුතු කර නොතිබුණි.	2023	මූල්‍ය වංචාව සම්බන්ධයෙන් පරීක්ෂණ කටයුතු නොපමාව අවසන්කර නඩු තීන්දු අනුව අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය.	සිද්ධියට සම්බන්ධවූ ශාන්ත කුම්බිස් වතුයායේ නිලධාරීන් තිදෙනාට එරෙහිව චෝදනා පත්‍රයන් ගොනු කොට වෙන වෙනව විධිමත් විනය පරීක්ෂණයන් පවත්වා මණ්ඩලයේ නිර්දේශ ප්‍රකාරව ඔවුන්ගේ වැඩ තහනම් කිරීමට කටයුතු කර ඇත. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් අදාළ පාර්ශවයන්ගෙන් මුදල් අය කර ගැනීම සඳහා නුවරඑළිය මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරීම සිදුකර තිබුණි.	නඩු කටයුතු අවසන්ව නොමැති අතර ඒ අනුව වගකිවයුතු පාර්ශවයන්ගෙන් එම මුදල් අයකර කරගෙන නොතිබිණි.
10	මණ්ඩලයේ අනුමත කාර්යය මණ්ඩලය තුළ ජ්‍යේෂ්ඨ කළමනාකරණ තනතුරු 36ක් පැවතිය ද සමාලෝචිත වර්ෂයේ දි ඉන් තනතුරු 27ක් පුරප්පාඩුව පැවතුණි.	2023	පුරප්පාඩුව පවතින අනුමත කාර්යය මණ්ඩලයේ අත්‍යාවශ්‍ය තනතුරු සඳහා කඩිනමින් බඳවාගැනීම් කළ යුතු අතර	ජ්‍යේෂ්ඨ කළමනාකරණ තනතුරු 03 ක් බඳවා ගැනීමට අදාළ පත්වීම් ලිපි නිකුත් කර ඇත. අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරී තනතුර සඳහා 2024 සැප්තැම්බර් මස සම්මුඛ පරීක්ෂණ	පුරප්පාඩුව පවතින අනුමත කාර්යය මණ්ඩලයේ අත්‍යාවශ්‍ය තනතුරු සඳහා බඳවාගැනීම සහ අවශ්‍යතාවය මත බඳවා ගැනීමේ

	එම පුරප්පාඩු තනතුරු අතර අංශ ප්‍රධානි තනතුරු 03ක් ද ප්‍රධාන පර්යේෂණ නිලධාරි තනතුරු 14ක් ද ප්‍රධාන උපදේශන තනතුරු 05ක් ද ඇතුළු තනතුරු 22ක් අභ්‍යන්තර උසස්වීම් මගින් පිරවිය යුතු වුවද වර්ෂ 4කට වැඩි කාලයක සිට මෙම තනතුරු පුරප්පාඩුව පැවතුණි.		මණ්ඩලයේ අවශ්‍යතාවය මත බඳවා ගැනීමේ පටිපාටියේ සංශෝධනයන්ද අනුමත කරවා ගත යුතුය.	පවත්වා ඇති අතර නියෝජ්‍ය අධ්‍යක්ෂ පර්යේෂණ (නිෂ්පාදන) තනතුර සඳහා බඳවා ගැනීමට අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමට 2024 සැප්තැම්බර් මස අමාත්‍යාංශය හරහා රාජ්‍ය සේවයේ බඳවා ගැනීමේ ක්‍රියාවලියේ සමාලෝචන කමිටුවට ලිපියක් යොමු කර ඇත.	පටිපාටියේ සංශෝධනයන්ද අනුමත කරගෙන නොතිබුණි.
11	මානව සම්පත් කළමනාකරණය සඳහා නීති රීති සම්පාදනය කිරීමට අදාළ කාර්ය පරිපාටි අත්පොතක් සකස්කර භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීමේ කටයුතු සමාලෝචිත වර්ෂයේදීද අවසන් කර නොතිබුණි.	2023	මානව සම්පත් කළමනාකරණ ය සඳහා නීති රීති සම්පාදනය කිරීමට අදාළ කාර්ය පරිපාටි අත්පොත සකස් කිරීම කාර්යක්ෂමව අවසන්කර නිසි අනුමැතීන් මත අවශ්‍ය කටයුතු කළ යුතුය.	මණ්ඩලයේ කාර්යාල ක්‍රියා පටිපාටි අත්පොතෙහි කෙටුම්පත සමාලෝචනය කරගැනීම සඳහා රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව වෙත ලිපියක් යොමු කර ඇත.	කාර්ය පටිපාටි අත්පොත සකස් කිරීම අවසන්කර නිසි අනුමැතීන් ලබා ගෙන නොතිබුණි.
12	2014 නොවැම්බර් 12 දිනැති අංක 25/ 2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව තාවකාලික හෝ අනියම් පදනම මත බඳවාගෙන තිබුණු දින 180 ඉක්මවූ සේවකයින් 93 කට 2014 ඔක්තෝබර් 24 දින සිට ක්‍රියාත්මක වන පරිදි ස්ථිර පත්වීම් ලබාදී තිබුණද ඒ සඳහා කළමනාකරණ	2023	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු වේ අනුමැතිය මත පත්වීම් ලබාදීමට හා ස්ථිර කිරීමට කටයුතු කළ යුතුය.	රාජ්‍ය සේවයේ බඳවා ගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත්කල නිලධාරී කමිටුව වෙත යොමුකර අවශ්‍ය අනුමැතීන් ලබා ගැනීමට කටයුතු කරමින් පවතී.	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු වේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

සේවා
දෙපාර්තමේන්තුවේ
අනුමැතිය ලබාගෙන
නොතිබුණි.

3.38 ශ්‍රී ලංකා තේ මණ්ඩලය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	11,303,898,919	791,526,029	10,512,372,890	13,155,091	තත්ත්වාගණනය කළ
2022	13,540,693,874	1,682,435,951	11,858,257,923	222,538,495	තත්ත්වාගණනය කළ
2023	16,950,231,236	4,700,943,258	12,249,287,978	233,065,389	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	**වර්ෂය**	**විගණකාධිපතිගේ නිර්දේශය**	**ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග**	**වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය**
1	එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ ස්ථාපිත කර ඇති ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ තේ ප්‍රවර්ධන ඒකකයේ කටයුතු 2022 අප්‍රේල් 30 දින සිට නවතා දැමීමට 2022 පෙබරවාරි 28 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අංක 2022/513/10 න් තීරණය කර තිබුණද 2023 දෙසැම්බර් 31 දින වන විට ඒකකයේ ස්ථාවර වත්කම් හා ජංගම ගිණුමේ ශේෂයන් පිළිවෙලින් රු.1,849,494 ක් සහ රු.8,237,377 ක් නිරවුල් කරගෙන නොතිබුණි.	2023	ස්ථාවර වත්කම් හා ජංගම ගිණුම් ශේෂයන් නිරවුල් කරගැනීමට නොපමාව පියවර ගත යුතුය.	ජංගම ගිණුමේ ශේෂය නිරවුල් කිරීම සම්බන්ධයෙන් තනාපති කාර්යාලයට දන්වා යවා තිබූ අතර, තේ ප්‍රවර්ධන ඒකකය භාරයේ පැවති ස්ථාවර වත්කම් කොන්සියුලර් කාර්යාලය වෙත මාරු කිරීම සම්බන්ධයෙන් ලිපි මඟින් දැනුවත් කිරීමට කටයුතු කර තිබුණි.	ස්ථාවර වත්කම් හා ජංගම ගිණුම් ශේෂයන් නිරවුල් කරගෙන නොතිබුණි.

2	තේ දළු හිමියන් වෙත නියමිත මිල නොගෙවීම නිසා කරන ලද පැමිණිලි වෙනුවෙන් ගෙවීමට සහ තේ කර්මාන්තශාලාවල අයිතිය වෙනස්වීමේදී දළු හිමියන් වෙත ගෙවීම සඳහා තේ කම්හල්හිමියන් විසින් මණ්ඩලයේ තැන්පත් කර ඇති නමුත් සමාලෝචිත වර්ෂය අවසානය තෙක් නිසි පරිදි නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණු රු.90,304,143 ක තැන්පතු පැවති අතර ඒ තුළ වසර 5 ඉක්මවූ තැන්පතු ප්‍රමාණය රු . 4,759,784 ක් විය.	2023	ගෙවිය යුතු පාර්ශවයන් නිවැරදිව හඳුනාගෙන ඔවුන්ට හිමි මුදල් කඩිනමින් නිරවුල් කළ යුතුය.	තේ කම්හල් හිමියන් විසින් තේ දළු සපයන්නන් වෙත ගෙවීම් කිරීමට ඇති මුදල් ගෙවීම් කටයුතු කිරීම සඳහා අවශ්‍ය අනුමැතිය ප්‍රාදේශීය කාර්යාල වෙත දැන්වීම සිදුකර තිබුණි.	ගෙවිය යුතු පාර්ශවයන් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.
3	2010 ඔක්තෝබර් 27 දිනැති අංක 1677/14 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි 02 හා 03 වන නියෝග ප්‍රකාරව තේ අපනයනය කිරීම සඳහා ඉඩ දෙමින් ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් රේගු බදු ප්‍රකාශයේ (CUSDEC) අවසරය ලබාදෙන වේලාවේදී සෑම තේ	2023	නියෝග සෑදීමේදී එහි නෛතික ප්‍රතිපාදන පිළිබඳ සැළකිලිමත් වෙමින් විධිමත්ව හා කාලානුරූපීව නියෝග පැනවීම හා ක්‍රියාත්මක කිරීම සිදු කළ යුතුය.	නෛතික ප්‍රතිපාදනයන්ට අදාලව නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවෙන් උපදෙස් ඉල්ලීම් කර තිබුණි.	නීති උපදෙස් ලැබී නොතිබුණු අතර කිසිදු විධිමත් ක්‍රියාමර්ගයක් ගෙන නොතිබුණි.

	කිලෝග්‍රෑමයක් සඳහා සෑම ලියාපදිංචි තේ අපනයනකරුවකුගෙන්ම රුපියල් 3.50 ක බද්දක් අයකිරීමේ ගැසට් පත්‍රය 2021 දෙසැම්බර් 14 දිනැති, අංක 2258/15 දරන ගැසට් පත්‍රය මගින් අහෝසි කර තිබියදී 2021 දෙසැම්බර් 15 සිට 2023 අගෝස්තු 04 දක්වා මණ්ඩලය විසින් තේ අපනයන කරුවන්ගෙන් රු.1,003,428,373 ක් අයකර ගෙන තිබුණි.				
4	නුවරඑළිය ප්‍රාදේශීය කාර්යාලය පවත්වාගෙන යනු ලබන ඉඩමේ අයිතිය කැලණි වැලි සමාගමෙන් හා නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් මගින් නීත්‍යානුකූලව මණ්ඩලය වෙත පවරා ගෙන නොතිබුණි.	2023	නීත්‍යානුකූල හිමිකමක් නොමැති ඉඩමක ගොඩනැගිලි ඉදිකිරීම සිදුකර ඇති බැවින් ඉඩමේ නීත්‍යානුකූල අයිතිය මණ්ඩලයට ලබාගැනීමට නොපමාව කටයුතු කළ යුතුය .	ඉඩම නිරවුල් කරගැනීම සඳහා වන්දි මුදල දිසා අධිකරණයේ තැන්පත් කිරීම සිදුකර තිබුණි.	ඉඩමේ නීත්‍යානුකූල අයිතිය මණ්ඩලයට පවරා ගැනීමේ කටයුතු මේ දක්වා අවසන් වී නොතිබුණි.
5	2014 වර්ෂයේදී ආරම්භ කරන ලද "ටී මෝමන්ට්ස් " නම් වූ කොළඹ තේ අලෙවි මධ්‍යස්ථානයෙන් මණ්ඩලයට රු.62,603,006 ක අලාභයක් සිදු වී තිබූ අතර වැවිලි කර්මාන්ත අමාත්‍යාංශ ලේකම්ගේ 2016	2023	මෙම අලාභය සඳහා වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන අලාභ අයකරගැනීමට විධිමත් පියවරක් ගත යුතුය.	මෙම අලාභ අදාළ වර්ෂයන්හිදී ගිණුම් වලින් ලියාහැරීම හැර මේ සම්බන්ධයෙන් නිශ්චිත ක්‍රියාමාර්ග මණ්ඩලය විසින් ගෙන නොතිබිණි.	විමර්ශන කටයුතු පවත්වා අපරික්ෂාකාරී ලෙස කටයුතු කල නිලධාරීන් හඳුනාගෙන අලාභ අයකරගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

	දෙසැම්බර් 06 දිනැති ලිපිය මඟින් අපරික්ෂාකාරී ලෙස කටයුතුකළ නිලධාරීන්ට විරුද්ධව සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතු බව සභාපති වෙත දන්වා තිබුණද, මේ වන විටත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.				
6	2009 වර්ෂයේදී රු.32,132,088 කට මිලදී ගන්නා ලද පළිබෝධනාශක රසායනික සංඝටක විශ්ලේෂණ යන්ත්‍රය (Liquid Chromatography Mass Spectrometer) අපේක්ෂිත පිරිවිතරයන්ට අනුකූල නොවීම හේතුවෙන් මේ දක්වා භාවිතයට ගෙන නොතිබුණු අතර , මිලදී ගැනීමේදී සිදුව ඇති අක්‍රමිකතා පිළිබඳ එවකට රසායනාගාරයට අනුයුක්තව සේවය කළ සහකාර අධ්‍යක්ෂකවරයාට එරෙහිව චෝදනා පත්‍රයක් නිකුත් කර සිදුකළ විනය පරීක්ෂණයේ තීරණ නිෂ්ප්‍රභා කර නැවත විනය පරීක්ෂණයක් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය	2023	පිරිවිතරයන්ට අනුකූල නොවූ ප්‍රසම්පාදනය හේතුවෙන් මණ්ඩලයට සිදුවී ඇති අලාභය වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට නොපමාව කටයුතු කළ යුතුය.	අදාල කාරණා සඳහා සිදුකරන ලද විමර්ශන වාර්තාව 2024 මැයි 03 අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කර තිබුණු අතර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය පරිදි නීතිපතිගේ උපදෙස් ලබා ගැනීමට යොමුකර ඇත.	මෙම අලාභය වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකරගෙන නොමැත.

	කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අවශ්‍ය විනය ක්‍රියාමාර්ග ගැනීමට මණ්ඩලයට නොහැකි වී තිබුණි. චෝදනා ලත් සහකාර අධ්‍යක්ෂවරයා 2022 වර්ෂය අවසානයේ විශ්‍රාම ගොස් තිබුණු අතර මණ්ඩලය විසින් රු.1,559,775 ක පරිතෝෂික මුදල ද නිලධාරියා වෙත ගෙවීම් කර තිබුණු අතර විනය පරීක්ෂණ සඳහා රු. 205,454 ක මුදලක්ද මණ්ඩලය විසින් වියදම් කර තිබුණි.				
7	2012 ජුනි 19 දින පැවති ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නියෝග අංක 11 ප්‍රකාරව මණ්ඩලය විසින් 2003 වර්ෂයේදී ජනතා වතු සංවර්ධන මණ්ඩලයට ලබාදුන් රු.25,000,000 ක ණය මුදලක් වෙනුවෙන් ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් හන්තාන පිහිටි “Ceylon Tea Museum” හි අයිතිය තේ මණ්ඩලයට පැවරීමට තීරණය වී තිබුණු නමුත්, වර්ෂ	2023	මණ්ඩලය විසින් බාහිර පාර්ශවයක් වෙත ලබා දී ඇති ණය මුදල අයකර ගැනීමට හෝ විධිමත් පරිදි නිරවුල් කර ගැනීමට නොපමාව කටයුතු කළ යුතුය.	ණය මුදල හා වත්කම් පවරා ගැනීම පිළිබඳ ජනතා වතු සංවර්ධන මණ්ඩලය සමග සාකච්ජා කර තිබුණි.	ණය මුදල අයකර ගැනීම හෝ විධිමත් පරිදි වත්කම් පවරා ගැනීම සිදුකර නොමැත.

	10 කට වැඩි කාලයක් ගත වුවද මේ දක්වා වත්කම් හි අයිතිය පවරා ගැනීමට හෝ, ණය මුදල් ආපසු අයකර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. එසේම 2020 වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියෙන් තේ මණ්ඩලය විසින් ජනතා වතු සංවර්ධන මණ්ඩලයට රු.10,000,000 ක ණය මුදලක් ලබාදී තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානයට ඉන් රු.1,000,000 ක් පමණක් අයකරගෙන තිබුණි.				
8	“සිලෝන් ටී” සඳහා ගෝලීය ප්‍රවර්ධන සහ අලෙවි වැඩසටහන යටතේ සාම්ප්‍රදායික ඉහල මට්ටමේ ප්‍රචාරණය සඳහා රූපවාහිනි මාධ්‍යය යොදාගැනීමට ඉංග්‍රීසි භාෂාවෙන් රූපවාහිනි වෙළෙඳ දැන්වීම නිර්මාණයට හා එය චීන, ජපන් ,අරාබි,යුක්රේන්, ජර්මන් සහ තුර්කි භාෂා මාධ්‍යයන් වලට සිදුකරන ලද පරිවර්තන සඳහාද 2016 සිට 2020 වර්ෂය දක්වා රු.174,332,138 ක	2023	මෙම නිර්මාණාත්මක කාර්යයන්හි වර්තමාන සහ ඉදිරි භාවිතයට ඇති හැකියාව පිළිබඳ නිසි ඇගයීමක් සිදුකර ඒ මත පදනම්ව ගෝලීය ප්‍රවර්ධන සහ අලෙවිකරණ වැඩසටහන් සඳහා උපයෝජනය කළ යුතුය.	ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ක්‍රියාත්මක කරන ගෝලීය තේ ප්‍රචාරණ වැඩසටහනෙහි මෙතෙක් සිදු කරන ලද සමස්ථ කටයුතු හා ක්‍රියාවලිය සම්බන්ධව මූලික විමර්ශනයක් සිදු කර තිබුණි. ඒ කරුණු මත අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණිලි කර තිබුණි.	නිර්මාණාත්මක කාර්යයන් 31 සමාලෝචිත දින වන විටත් ගෝලීය තේ ප්‍රචාරණ වැඩසටහන වෙනුවෙන් උපයෝජනය කර කර නොතිබුණි.

	වියදමක් දරා තිබුණද එම වෙළෙඳ දැන්වීම නිර්මාණය කිරීමේ මූලික අරමුණ වූ රූපවාහිනි මාධ්‍ය තුළ ප්‍රචාරණය සිදුකර ගැනීමට අවශ්‍යය මාධ්‍ය මිලදී ගැනීම හා ඒ සම්බන්ධ සැලසුම් සකස්කර නොතිබුණු බැවින් රූපවාහිනි මාධ්‍ය තුළ ප්‍රචාරණයක් සිදුකර නොතිබුණි. එසේම රු. 39,832,808 ක වියදමින් නිර්මාණය කරන ලද නිර්මාණාත්මක කාර්යයන් 31 ක්ද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අදාළ කාර්යයන් වෙනුවෙන් උපයෝජනය කර නොමැති බව නිරීක්ෂණය විය.				
9	ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලබන “සිලෝන් ටී” සඳහා ගෝලීය ප්‍රවර්ධන සහ අලෙවි වැඩසටහනේ නිර්මාණාත්මක කටයුතු යටතේ www.pureceylontea.com ප්‍රධාන වෙබ් අඩවිය සහ අනෙකුත් භාෂා පරිවර්තිත වෙබ් අඩවිවල ප්‍රධාන මූලිකාංග හා වෙබ් අඩවිය තුළින් ඍජුවම	2023	අන්තර් ජාතික වශයෙන් පාරිභෝගික/පරිශීලක ආකර්ෂණය වෙබ් අඩවිය වෙත ලගා කර ගැනීම තුළින් ගෝලීය ප්‍රවර්ධන වැඩසටහන යටතේ අපේක්ෂිත අරමුණු ලඟාකර ගැනීම සඳහා වෙබ් අඩවිය ඵලදායී ලෙස උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය.	ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ක්‍රියාත්මක කරන ගෝලීය තේ ප්‍රචාරණ වැඩසටහනෙහි මෙතෙක් සිදු කරන ලද සමස්ථ කටයුතු හා ක්‍රියාවලිය සම්බන්ධව මූලික විමර්ශනයක් සිදු කර තිබුණි. ඒ කරුණු මත අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට	පාරිභෝගික සම්බන්ධතා වෙබ් අඩවිය පිළිබඳ දත්ත විශ්ලේෂණයේදී විදේශීය පරිශීලක ප්‍රවේශවීම් අඩු මට්ටමක පැවතුණි.

අපනයන හා විකුණුම්කරුවන් වෙතින් සිලෝන් ටී ඇණවුම් කිරීමට හැකි පරිදි අන්තර්ජාල මිලදී ගැනීම් සඳහා වන මාර්ගගත පහසුකම් සපයාදීම සිදුවන Where to buy හි URL වෙත විදේශීය පරිශීලක ප්‍රවේශවීම් වැනි කාර්යඵල පිළිබඳව ලබා ගන්නා ලද දත්ත පරිදි එම ප්‍රවේශවීම් ඉතා අඩු මට්ටමක පවතින බව පාරිභෝගික සම්බන්ධතා වෙබ් අඩවිය පිළිබඳ දත්ත විශ්ලේෂණයේදී නිරීක්ෂණය වූ අතර, අන්තර්ජාතික වශයෙන් පාරිභෝගික/පරිශීලක ආකර්ෂණය වෙබ් අඩවිය වෙත ලැබී නොමැති බව සහ ඒ අනුව රු.172,939,768 ක පිරිවැයක් යටතේ නිර්මාණය කරන ලද වෙබ් අඩවිය තුළින් ගෝලීය ප්‍රවර්ධන වැඩසටහන යටතේ අපේක්ෂිත අරමුණු ලඟාකර ගැනීම සඳහා ඵලදායී කාර්යභාරයක් සිදු නොවන බවද වෙබ් අඩවිය පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.	පැමිණිලි කර තිබුණි.

10	ශ්‍රී ලංකා තේ ගෝලීය වශයෙන් ප්‍රවර්ධනය කිරීම සඳහා මාධ්‍ය සමීක්ෂණ හා මාධ්‍ය සැලසුම් සකස් කිරීම වෙනුවෙන් 2019 සිට 2023 කාලපරිච්ඡේදය තුළ රු.107,088,740 ක මුදලක් වියදම් කර තිබූ නමුත් සකස් කර තිබූ මාධ්‍ය සැළසුම් අතුරින් චිලී රාජ්‍ය සඳහා ඉදිරිපත් කර තිබූ මාධ්‍ය සැලසුම හැරුණු කොට අනෙක් සියලුම රටවල් සඳහා ඉදිරිපත් කර තිබුණු මාධ්‍ය සැළසුම්වල කාලය ඉකුත් වී තිබුණු නමුත් එම කාර්‍යයන් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ක්‍රියාත්මක කර නොතිබුණි.	2023	මාධ්‍ය සැලසුම්වල වර්තමාන සහ ඉදිරි භාවිතයට ඇති හැකියාව පිළිබඳ නිසි ඇගයීමක් සිදුකර එම සැලසුම් ගෝලීය ප්‍රවර්ධන සහ අලෙවිකරණ වැඩසටහන් සඳහා උපයෝජනය කරගත යුතුය.	ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ක්‍රියාත්මක කරන ගෝලීය තේ ප්‍රචාරණ වැඩසටහනෙහි මෙතෙක් සිදු කරන ලද සමස්ථ කටයුතු හා ක්‍රියාවලිය සම්බන්ධව මූලික විමර්ශනයක් සිදු කර තිබුණි. මූලික විමර්ශන වාර්තාවෙන් අනාවරණය වී ඇති කරුණු මත අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණිලි කර තිබුණි.	මාධ්‍ය සැලසුම්වල වර්තමාන සහ ඉදිරි භාවිතයට ඇති හැකියාව පිළිබඳ නිසි ඇගයීමක් සිදුකර එම සැලසුම් ගෝලීය ප්‍රවර්ධන සහ අලෙවිකරණ වැඩසටහන් සඳහා උපයෝජනය කරගැනීමේ කටයුතු සිදුකරගෙන නොතිබුණි.
11	ශ්‍රී ලංකා තේ ප්‍රවර්ධනය සඳහා 2018 මාර්තු 21 දින ශ්‍රී ලංකා තේ මණ්ඩලය හා ගිවිසුම්ගත සමාගම අතර අත්සන් කර තිබුණු ගිවිසුමේ 3.2 ඡේදය ප්‍රකාරව ගිවිසුම් කාලය දීර්ඝ කරන්නා වූ සෑම අවස්ථාවකදීම දෙපාර්ශවය විසින් ලිඛිතව අත්සන් කරන ලද ගිවිසුමකට	2023	ගිවිසුම ප්‍රකාරව කාලය දීර්ඝ කරන්නා වූ සෑම අවස්ථාවකදීම සමාගම හා මණ්ඩලය අතර ගිවිසුමකට එළඹිය යුතුය.	සංශෝධනය කිරීමට නියමිත ගිවිසුමේ කෙටුම්පතක් වැවිලි අමාත්‍යාංශ ලේකම් වෙත ඉදිරිපත් කර තිබුණි.	ගිවිසුම් කාලය දීර්ඝ කිරීමේදි සමාගම හා මණ්ඩලය අතර ගිවිසුමකට එළඹ නොතිබුණි.

	එළඹිය යුතු වුවත් 2021 මාර්තු 21 දින සිට 2023 මාර්තු 20 දක්වා වූ කාලයට අදාළව ගිවිසුම් කාලය දීර්ඝ කර ගැනීම සඳහා සමාගම හා මණ්ඩලය අතර අත්සන් කරන ලද ගිවිසුමක් නොතිබුණු අතර එම කාල සීමාව තුළ සමාගමට මාධ්‍ය සැළසුම් වෙනුවෙන් රු. 58,066,874 ක්ද ගෙවා තිබුණි.				
12	ශ්‍රී ලංකාවේ මුළු තේ නිෂ්පාදනය හා අපනයනය ක්‍රමිකව වර්ධනය නොවීම හේතුවෙන් 2011 වර්ෂයේදී සියයට 18 ක් වූ ශ්‍රී ලංකාවේ තේ සඳහා වන ගෝලීය තේ වෙළඳපොළ කොටස (World Prod Share) සමාලෝචිත වර්ෂය වන විට සියයට 3.88 ක් දක්වා පහළ ගොස් තිබුණු බව තේ කම්ටු ප්‍රවෘත්ති අතිරේකය (Supplement to Annual Bulletin of Statistics 2023) අනුව නිරීක්ෂණය වුවද වෙළඳපල කොටස වර්ධනය කර ගැනීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	2023	තේ නිෂ්පාදනය වර්ධනය කරගැනීමට සහ ගෝලීය වෙළෙඳපළ තුළ ශ්‍රී ලංකාවේ තේ සඳහා වන කොටස වර්ධනය කරගැනීමට ගුණත්වයෙන් ඉහළ අන්තර්ජාතික ප්‍රමිතීන් වලට අනුකූල සුදුසු තේ වෙනුවෙන් ආයෝජන පුළුල් කිරීම සඳහා අවශ්‍ය දිරිගැන්වීම් මණ්ඩලය විසින් සිදුකළ යුතුය.	දේශීය තේ නිශ්පාදනය වර්ධනය කරගැනීම සඳහා සංවර්ධන හා සහනාධාර ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කර තිබුණි.	වෙළඳපොළ කොටස (World Prod Share) වර්ධනය සඳහා සහනාධාර ක්‍රම ක්‍රියාත්මක කිරීම හැර නව ක්‍රියාමාර්ග ගෙන නොමැත.

13	තේ කර්මාන්තය සඳහා තොරතුරු තාක්ෂණ පද්ධතියක් සකස් කිරීම සඳහා රු.53,964,995 ක කොන්ත්‍රාත් වටිනාකමක් මත මණ්ඩලයේ සහකාර අධ්‍යක්ෂකගේ (තොරතුරු තාක්ෂණ) තහවුරුවකින් එකතුව රු.15,716,148 ක් 2023 දෙසැම්බර් 31 වනවිට පුද්ගලික ආයතනයකට ගෙවීම් කර තිබුණි. ගිවිසුම් ප්‍රකාරව මාස 18 කදී කාර්යය නිම කල යුතු වුවද වසර 03 කට ආසන්න කාලයක් ගත වුවද පද්ධතිය සකස් කර නොතිබුණි.මෙම පුද්ගලික ආයතනය විසින් ලබා දුන් රු.26,982,497 ක කාර්යසාධන සුරක්ෂණය 2022 අප්‍රේල් 30 දින අවසන් වී තිබුණද විගණිත දින වන විටත් එය දීර්ඝ කිරීමට කටයුතු කර නොතිබුණි.	2023	කාර්යසාධන සුරක්ෂණය දීර්ඝ කර ගැනීමේ කටයුතු සහ තොරතුරු තාක්ෂණ පද්ධතිය ස්ථාපිත කිරීමේ ක්‍රියාවලිය කඩිනමින් අවසන් කිරීමට කටයුතු කළ යුතුය.	ප්‍රසම්පාදනයට අදාල කාර්යසාධන සුරක්ෂණය දීර්ඝ කිරීම සඳහා සැපයුම්කාර පුද්ගලික ආයතනය සමග සාකච්ඡා සිදුකර තිබුණු අතර මොරටුව විශ්වවිද්‍යාලය මගින් පත් කරන ලද තොරතුරු තාක්ෂණ උපදේශකයකුගේ උපදේශනය හා අධීක්ෂණය මත තේ කර්මාන්තය සඳහා තොරතුරු තාක්ෂණ පද්ධතිය අවසන් කිරීමට වැඩ පිළිවෙලක් ස්ථාපිත කිරීම සිදුකර තිබුණි.	කාර්යසාධන සුරක්ෂණය දීර්ඝ කිරීමට කටයුතු කර නොතිබුණු අතර ගිවිසුම් ප්‍රකාරව පද්ධතියෙහි වැඩ කටයුතු ද අවසන්කර නොතිබුණි.

3.39 කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදන අලෙවි මණ්ඩලය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	266,515,843	23,633,440	242,882,403	15,882,403	තත්ත්වාගණනය කළ
2022	-	-	-	-	-
2023	-	-	-	-	-

	විගණන නිරීක්ෂණ	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදන අලෙවි මණ්ඩලය නැවත ස්ථාපිත කිරීම සඳහා වූ අමාත්‍ය මණ්ඩල තීරණ හා වැවිලි අමාත්‍යතුමා විසින් ගැසට් කරන ලද නියමයන් පරිදි, මණ්ඩලයට පැවරී ඇති ප්‍රධානතම කාර්යභාරය වනුයේ කුළුබඩු ක්ෂේත්‍රය සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම හා එම වෙළඳාම නියාමනය කිරීම වුවද මණ්ඩලය මේ වන විට කුළුබඩු විකිණීම හා සැකසීම සඳහා පමණක් යොමු වී ඇති අතර මණ්ඩලය ස්ථාපිත කර මේ වන විට වසර 02කට අධික කාලයක් ගත වී ඇතත් එය පිහිටුවීමේ පරමාර්ථ කරා ළඟා කර ගැනීම සඳහා	2021	කුළුබඩු හා ඒ ආශ්‍රිත අලෙවි මණ්ඩලය පිහිටුවීමේ පරමාර්ථ ඉටුකරගැනීම සඳහා කටයුතු කළ යුතුය	මෙම අරමුණු ක්‍රමාණුකූලව සම්පූර්ණ කර ගැනීම සඳහා කටයුතු සැලසුම් කර ඇත. අපනයන කටයුතු ,විදේශ ප්‍රදර්ශන පැවැත්වීම,ගොවි නිෂ්පාදන මිලදී ගැනීම හා අගය එකතු කල නිෂ්පාදන වෙළඳපොළට එක් කිරීම සිදුකර ඇත.	කුළුබඩු නිෂ්පාදන නියාමන කාර්යය ඉටුකිරීමට කටයුතු කර නොතිබුණි.

	සංයුක්ත සැලැස්මක් සකස් කර ඒ සඳහා අවශ්‍ය වන කාර්ය මණ්ඩලය හඳුනා ගැනීම, බඳවා ගැනීම හා අවශ්‍ය රෙගුලාසීන් සකසා ගැනීමට ද මණ්ඩලය විසින් කටයුතු කර නොතිබුණි.				
2	මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 07ම සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම පුරප්පාඩු වී තිබුණු අතර ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන් නොමැති වීම හේතුවෙන් සභාපති හා ප්‍රධාන විධායක නිලධාරී විසින් ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීම කළමනාකරණ මට්ටමට පහලින් සිටින නිලධාරීන් මගින් සිදු වන බවත් , මණ්ඩලයේ නිලධාරීන්ගේ කටයුතු ප්‍රමාණවත් පරිදි අධීක්ෂණයට ලක් නොවන බවත් නිරීක්ෂණය විය .මේ අනුව මණ්ඩලයේ ක්‍රමවත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් ක්‍රියාත්මක නොවන බව විගණනයේදී නිරීක්ෂණය විය.	2021	ජ්‍යෙෂ්ඨ මට්ටමේ අත්‍යාවශ්‍ය තනතුරු වල පුරප්පාඩු පිරවීම සඳහා නොපමාව කටයුතු කළ යුතුය.	මණ්ඩලයේ පුරප්පාඩු පවතින තනතුරු සඳහා බඳවා ගැනීමට අනුමැතිය ඉල්ලා ඇත.	ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 06ක් සඳහා බඳවා ගැනීම මේ දක්වා සිදුකර නොමැත.

3.40 ශ්‍රී ලංකා රබර් පර්යේෂණ මණ්ඩලය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	1,057,300,205	214,579,619	842,720,586	15,873,555	තත්ත්වාගණනය කළ
2022	5,203,810,817	196,003,328	5,007,807,489	6,367,158	තත්ත්වාගණනය කළ
2023	5,093,101,227	160,610,257	4,932,490,970	(70,609,994)	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XV පරිච්ඡේදයේ 4:7 වගන්තිය ප්‍රකාරව අධ්‍යයන කටයුතු සඳහා වැටුප් සහිත නිවාඩු ලබා විදේශගත වී බැඳුම්කර කොන්දේසි කඩකළ නිලධාරීන් 05 දෙනෙකුගෙන් වර්ෂ 01 සිට වර්ෂ 33 දක්වා කාලයක් තුළ මණ්ඩලයට අයවිය යුතු එකතුව රු.4,256,552ක් 2024 ජූලි 31 දින දක්වා අයකර ගෙන නොතිබුණි.	2023	ආයතන සංග්‍රහයේ විධිවිධානවලට අනුකූලව බැඳුම්කර කොන්දේසි කඩකළ නිලධාරීන්ගෙන් හෝ ඇපකරුවන්ගෙන් අදාළ මුදල් අයකර ගත යුතුය.	එක් නිලධාරායෙකුගේ ශේෂය නිරවුල් කර ඇත. නිලධාරීන් දෙදෙනෙකු විසින් ගෙවිය යුතු මුදල් වාරිකව ගෙවමින් පවතී. අනෙක් දෙදෙනාගේ ශේෂ පිළිබඳ ගැටළු සහගත තත්වයක් ඇති බැවින් එම කරුණු ආයතනික විගණන කළමණාකරණ කමිටුවට මඟින් පරීක්ෂා කරනු ඇත.	2024 ඔක්තෝබර් 18 දිනට බැඳුම්කර කොන්දේසි කඩකළ නිලධාරීන් 04 දෙනෙකුගෙන් රු.4,166,552ක් අයවීමට තිබුණි.

2	2023 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ පැවති රු.5,285,109,496ක ස්ථාවර වත්කම් සඳහා ස්ථාවර වත්කම් ලේඛණයක් සකස් කර නොතිබුණි.	2023	ස්ථාවර වත්කම් ලේඛණයක් යාවත්කාලීනව පවත්වාගෙන යා යුතුය.	ආයතනයේ ස්ථාවර වත්කම් ලේඛනය සකස් කිරීමට කටයුතු කරනු ඇත.	සම්පූර්ණ හා යාවත්කාලීන කළ ස්ථාවර වත්කම් ලේඛණයක් මේ දක්වා සකස් කර නැත.
3	රාජ්‍ය පුද්ගලික හවුල්කාරිත්වය හරහා ව්‍යාපාරික ආකෘතියක් ලෙස රබර් නිෂ්පාදන සැලසුම් කිරීම සහ කාර්යසාධනය ඇගයීම සඳහා රු.මිලියන 49.7ක් වැය කර ආරම්භ කර තිබුණු අංශුමාත්‍ර පරිමිත සේවාකරණ මධ්‍යස්ථානයේ (FEAS CENTER) කාර්යයන් 2023 ඔක්තෝම්බර් මාසයේ සිට සම්පූර්ණයෙන්ම නවත්වා තිබුණු බැවින් අදාල ගොඩනැගිල්ල හා රු.38,918.694ක් පිරිවැය වූ පරිගණක හා මෘදුකාංග, යන්ත්‍ර, ලිබඩු හා කාර්යාල උපකරණ සියල්ල නිශ්කාර්යව පැවතිණි. ඒ අනුව එම මධ්‍යස්ථානය ස්ථාපිත කිරීමේ අරමුණු වූ ගෝලීය වෙළඳපල තුළ ඵලදායී ලෙස තරඟ කිරීමට ශ්‍රී ලංකාවේ ස්වභාවික හා කෘතිම රබර්වලට අගය එකතුකිරීම සඳහා, රබර්	2023	රාජ්‍ය හා පෞද්ගලික හවුල්කරුවන් අතර ඇති කරගත් ගිවිසුම් ප්‍රකාරව ආයතනයේ කාර්යයන් නිසි අධ්‍යනයකින් යුතුව විධිමත් ලෙස සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම කළ යුතුය.	2023 ඔක්තෝම්බර් මස මෘදුකාංග වල ඇති වූ ගැටළුවක් මත මෙම මධ්‍යස්ථානයේ කාර්යන් ඇන හිටි ඇති අතර මෘදුකාංග සැපයුම්කරුවන් වෙත ඒ බව දැන්වීමෙන් පසු 2024 ජනවාරි මස සිට එය යථා තත්වයට පත් කර ඇතත් ප්ලාස්ටික් හා රබර් ආයතනය 2024 අගෝස්තු.10 දින සිට මෙම මධ්‍යස්ථානයේ පරිපාලනයෙන් බැහැර වන බව දන්වා ඇති බැවින් මේ සම්බන්ධයෙන් සාකච්ඡා කිරිම සඳහා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය ප්‍රමුඛ කමිටුවක් රැස් වී ඇත. ඒ අනුව මෙම මධ්‍යස්ථානය නැවත සක්‍රිය කිරීමක් සඳහා එකාබද්ධ යෝජනාවක් ලෙස විවෘත (Expression of Interest) අභිලාශ	මෙම අංශුමාත්‍ර පරිමිත සේවා කරන මධ්‍යස්ථානයේ මෙහෙයුම් කටයුතු මේ වන විට ද ක්‍රියාත්මකවී නොමැත.

	නිෂ්පාදනවල නිර්මාණය හා අනුකරණ (simulation) සඳහා FEAS භාවිතා කිරීමට අවශ්‍ය කුසලතා සංවර්ධනය සහ කළාපයට FEAS සේවා සැපයීමේ විශිෂ්ඨත්වයේ මධ්‍යස්ථානයක් බවට පත්වීම යන අරමුණු ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි.			ප්‍රකාශ කිරීමේ ආරාධනා නිකුත් කරමින් වෙනත් වෘත්තීය ආයතනයක් සමඟ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට යොජනා කර ඇත.	
4	2024 ජූලි 03 දින වන විටත් මොනරාගල කුමාරවත්ත හා අලව්ව නාරම්පොලවත්ත වතුයායන් රබර් පර්යේෂණ මණ්ඩලය වෙත පවරා ගෙන නොතිබුණි.	2023 2022	ඉඩම්වල පවරා ගැනීමේ කටයුතු කඩිනම් කළ යුතුය.	මොනරාගල කුමාරවත්ත හා අලව්ව නාරම්පොලවත්ත යන වතුයායන් පවරා ගැනීමට කටයුතු කරමින් පවතී.	මෙතෙක් ඉඩම්වල පවරා ගැනීමේ කටයුතු අවසන් කර නොමැත.
5	එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය සමඟ 2017 වර්ෂයේදී ගිවිසුම්ගතව 2022 වර්ෂයේදී අවසන් කිරීමට නියමිතව තිබුණු කුඩා රබර් ඉඩම් හිමියන් සඳහා ජීව ඉන්ධන දැව වර්ග හඳුන්වා දීමේ නියමු ව්‍යාපෘතියෙහි කාර්යයන් සාර්ථකව නිම නොකිරීම හේතුවෙන් ඒ සඳහා ලැබී තිබුණු රු.10,457,200ක මුදලින් 2023 දෙසැම්බර් 31 දින වන	2023	ගිවිසුම්ගත කාර්යයන් අදාල කාලය තුලදී සාක්ෂාත් කර ගැනීමට කටයුතු කළ යුතුය.	මෙම ව්‍යාපෘතියේ ගෙවීමට නියමිත ශේෂය සම්බන්ධව දැනට අමාත්‍යාංශ මට්ටමින් අභ්‍යන්තර විගණනයක් සිදු කරමින් පවතී.	මෙතෙක් ව්‍යාපෘති කාර්යයන් අවසන් කර නොමැති අතර එම මුදල් කිසිදු ඵලදායී ආයෝජනයක හෝ යොදවා නොමැත.

	විටත් රු.4,283,644ක් එනම් සියයට 40ක මුදලක් ඉතිරිව තිබුණි.				
6	වර්ෂ 04කට වැඩි කාලයක සිට ශ්‍රී ලංකා රබර් පර්යේෂණ මණ්ඩලයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (පරිපාලන) තනතුර පුරප්පාඩුව පැවති අතර අනුමත කාර්ය මණ්ඩලයේ නොමැති කණිෂ්ඨ සහකාර ක්ෂේත්‍ර නිලධාරි හා සාමාන්‍ය වැඩකරු තනතුරු සඳහා 26 දෙනෙකු බඳවා ගෙන තිබුණි.	2023 2022 2021	විධිමත් අනුමැතීන් මත පමණක් බඳවා ගැනීම් සිදු කළ යුතුය.	නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන) තනතුර සඳහා වැඩබැලීමේ නිලධාරියෙකු පත්කර ඇත. වැටුප් ගෙවීම සඳහා උපයා ගන්නා මුදල් භාවිතා කරමින් චෙක්රෝල් පදනම මත වතු දෙපාර්තමේන්තුවට සේවකයන් බඳවා ගනු ඇත. ආයතනයේ අවශ්‍යතාවය සඳහා වතු දෙපාර්තමේන්තුව මගින් ලබා ගන්නා සේවකයින්ගේ සේවය ලබා ගැනීමද කරනු ඇත.	නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන) තනතුර සඳහා වෙනත් ආයතනයක නිලධාරියෙකු විධිමත් නොවන ලෙස වැඩබැලීමට පත්කර ඇත. ඒ අනුව නිර්දේශය ක්‍රියාත්මක කිරීමට මෙතෙක් කටයුතු කර නැත.
7	රබර් පර්යේෂණ ආයතනයේ පර්යේෂණ සඳහා සෘජුව කටයුතු කරනු ලබන දෙපාර්තමේන්තු 12න් දෙපාර්තමේන්තු 05ක ප්‍රධානී තනතුරු මාස 04 සිට වසර 33ක් දක්වා පුරප්පාඩු වී තිබුණු අතර ඒ සඳහා වැඩබැලීමේ නිලධාරීන් පත් කර තිබුණි.	2023	මණ්ඩලයේ අත්‍යාවශ්‍ය තනතුරු සඳහා බඳවා ගැනීම් කඩිනම් කළ යුතුය.	මෙම බඳවා ගැනීම් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් 2024.02.28 දින අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම වෙත යොමු කර ඇත. මේ සඳහා විධිමත් අනුමැතියක් ලැබෙන තුරු දෛනික කටයුතු කර ගෙන යාම සඳහා වැඩ බැලීමේ පදනම මත නිලධාරින් පත් කර ඇත.	මෙතෙක් නිර්දේශය ක්‍රියාත්මක කර නැත. අත්‍යාවශ්‍ය තනතුරු සඳහා මෙතෙක් බඳවා ගෙන නොමැත.

3.41 ජාතික වැවිලි කළමනාකරණ ආයතනය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	1,085,474,337	39,942,649	1,045,531,688	19,202,306	තත්ත්වාගණනය කළ
2022	1,130,567,268	33,082,073	1,097,485,196	8,548,607	තත්ත්වාගණනය කළ
2023	1,613,362,696	85,451,825	1,527,910,871	399,851	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණ	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	ආයතනයේ පුස්තකාල කළමනාකරණය ස්වයංක්‍රියකරණය සඳහා රු.248,000 ක් වැය කර 2020 වර්ෂයේදී මෘදුකාංග පද්ධතියක් (KOHA) ස්ථාපිත කර තිබූ නමුත් මෘදුකාංග පද්ධතිය සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය දෘඩාංග නොමැතිවීම හා විදුලිය කප්පාදු අවස්ථාවේ දී මෘදුකාංග පද්ධතිය ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම ආදී කරුණු මත 2020 ජුනි 19 දින සිට විගණිත දිනය වූ 2024 මැයි 27 වන විට මෘදුකාංග පද්ධතිය අක්‍රිය වී	2023	පුස්තකාල කළමනාකරණ තොරතුරු පද්ධතියට අවශ්‍ය අනෙකුත් දෘඩාංග මිලදීගෙන හා අවශ්‍ය මානව සම්පත් යොදාගෙන අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය.	විදුලිය විසන්ධි වන අවස්ථාවලදී මෘදුකාංග පද්ධතිය ක්‍රියාත්මක කළ නොහැකි වීම, මෙම පද්ධතියේ වගකීම් කාලය ඉක්මවා තිබීම ආර්ථික අර්බුදය හමුවේ ආයතනයට මහා භාණ්ඩාගාරය විසින් ලබාදෙන මුදල් ප්‍රමාණය සීමිත වීම නිසා මෘදුකාංග පද්ධතිය සංවර්ධනය කිරීමට යොදාගන්නා තාක්ෂණික උපකරණ මිලට ගැනීමට අපහසු වීම හා ආයතනය තුළ තොරතුරු තාක්ෂණය සඳහා සේවය	පුස්තකාල කළමනාකරණ තොරතුරු පද්ධතියට අවශ්‍ය අනෙකුත් දෘඩාංග මිලදීගෙන හා අවශ්‍ය මානව සම්පත් යොදාගෙන අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කර නොමැත.

	තිබුණි.			ලබාගැනීමට ස්ථිර නිලධාරියෙක් ද බඳවා ගැනීමට නොහැකි වී ඇත.	
2	ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මත කාර්ය මණ්ඩල සාමාජිකයන් විශ්‍රාම යන විට ලබාදීම සඳහා කැරට් 22 රන් පවුම් 13.5 g ක රන් කාසි 10 ක් 2019 මැයි 30 දින පෞද්ගලික ආයතනයකින් රු.851,800 කට මිලදීගෙන එම වර්ෂයේදීම වියදම් ලෙස ලියාහැර තිබුණි. ආයතනික හා මූල්‍ය හේතු මත මෙම රන්කාසි බෙදා නොහැර වසර 3ක කාලයක් ආයතනයේ සේප්පුවේ රඳවා තිබුණු අතර 2022 වර්ෂයේ වත්කම් ලෙස ගිණුම් ගත කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයේදී ද රන් පැහැති කාසි 10 ක් තිබුණු නමුත් එම රන් පැහැති කාසි කැරට් 22 රත්‍රං ද යන්න තහවුරු කරනොගෙන වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ගැලපීමට කටයුතු කර නොතිබුණි.	2023	ආයතනයේ අරමුණු වලට අදාළ වියදම් පමණක් දැරිය යුතු අතර මෙම රන්කාසිවල නිවැරදි වටිනාකම තක්සේරු ගිණුම් ගත කළ යුතුය. එසේම මෙම තොගය නිසි අනුමැතිය මත අපහරණය කිරීමට කටයුතු කළ යුතුය.	රත්තරං වල වටිනාකම සහ සංයුතිය පරීක්‍ෂා කිරීම සඳහා මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය මඟින් ලබාගැනීමට කටයුතු කරමින් පවතී.	රත්තරං වල වටිනාකම සහ සංයුතිය පිළිබඳ පරීක්ෂණ වාර්තාවක් මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය මඟින් ලබාගෙන නැත.

3.42 පොල් වගාකිරීමේ මණ්ඩලය

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	බදු පෙර ලාභය (අලාභය) රු.	මතය
2021	3,957,522,526	619,657,256	3,337,865,270	611,134,769	ව්‍යාවනය කළ
2022	6,210,764,808	463,966,797	5,746,798,011	389,622,417	තත්ත්වාගණනය කළ
2023	5,767,450,193	486,431,007	5,281,019,186	(62,743,429)	-

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	පොල් වගාකළ හැකි ඉඩම් තෝරා ගෙන ඒවායේ පොල් වගාව අලුතින් ආරම්භ කර එම ඉඩම් වාණිජ පොල් ඉඩම් බවට පත් කිරීම හා දැනට පවතින පොල් ඉඩම් ප්‍රමාණය වැඩි කිරීමටත්, එමගින් පොල් ඵලදාව වැඩිකර ගැනිමේ අරමුණින් පුරන් කුඹුරු අක්කර 2500ක් ඵලදායී වාණිජ ඒකක බවට පත් කිරීම සඳහා 2021 වර්ෂයේදී රාජ්‍ය අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ රු.100,000,000 ක මුදලක් මණ්ඩලයට	2021	නිසි සැලසුම් ගත ඉලක්කයන් සහිතව දැනට පවතින පොල් ඉඩම් ප්‍රමාණය වැඩිකර ගැනීමට ගොවීන් උනන්දු කර ගැනීමට වියීමත් වැඩ පිළිවෙලක් සහිතව ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතුය.	කුඹුරු ඉඩම්වල පොල් වගාව වැනි බහු වාර්ෂික බෝග වගාකිරීම සඳහා ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීම අත්‍යාවශ්‍ය වූ බැවින් ඉල්ලුම්පත් සියල්ල ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදි. 2021 වසර තුළ අක්කර 3.25 ප්‍රමාණයක් සඳහා පමණක් ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබුණි. ඉතිරි ප්‍රමාණය	සැලසුම් ගත ඉලක්කයන් සහිතව දැනට පවතින පොල් ඉඩම් ප්‍රමාණය වැඩිකර ගැනීමට ගොවීන් උනන්දු කර ගැනීමට වියීමත් වැඩ පිළිවෙලක් සහිතව ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු නොලබයි.

	වෙන් කර පසුව අක්කර 380 ක එම කටයුතු කිරීමට අනුමත කරගෙන තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය අවසාන වන විට අක්කර 03 ක රජයේ ඉඩම්ද අක්කර 27.5 ක පෞද්ගලික ඉඩම්ද වශයෙන් අපේක්ෂිත ප්‍රමාණයෙන් සියයට 8ක ප්‍රගතියක් පමණක් මණ්ඩලය විසින් ළඟාකරගෙන තිබුණි. මෙම ව්‍යාපෘතිය මගින් ගොවීන්ට පොල් පැළ හා අක්කරයකට රු.80,000 ක මුදල් සහනාධාර ලබා දීමට අපේක්ෂා කළද මෙම කාර්යය සිදුකිරීමටද මණ්ඩලයට නොහැකි වී තිබුණි.			සඳහා අනුමැතිය නොලැබුණු බැවින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නොහැකි වී ඇත.	
2	තැඹිලි වගාවන් ප්‍රවර්ධනය කිරීම සඳහා පොල් සංවර්ධන අධිකාරිය විසින් පොල් වගාකිරීමේ මණ්ඩලය වෙත 2020 වර්ෂයේ දී ලබාදුන් රු.මිලියන 25 ක් අදාළ කාර්ය වෙනුවෙන් නොයොදා සමාලෝචිත වර්ෂය අවසානය වන විට ද ස්ථාවර තැන්පතුවක ආයෝජනය කර තිබුණි	2021	තැඹිලි වගාව ප්‍රවර්ධනය කිරීමට ලැබූ අරමුදල් එම ව්‍යාපෘති සාර්ථක කර ගැනීමට යෙදවිය යුතුය.	තැඹිලි ප්‍රවර්ධනය කිරීමේ කාර්යය සඳහා වෙන් වී ඇති රු.මි.25ක ප්‍රතිපාදන 2023 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම යටතේ යොදාගැනීමට සැලසුම් කර ඒ අනුව කටයුතු කර ඇත.	මෙම ව්‍යාපෘතිය යටතේ තැඹිලි පැළ බෙදා දීමට 2023 හා 2024 සඳහා ඉලක්කගත ප්‍රමාණයන් වන පැළ 83,787 කින් 2024 ඔක්තෝබර් 05 දිනට තැඹිලි පැළ 25,140 ක් පමණක් බෙදා දී තිබුණි.

3	සමාලෝචිත වර්ෂයේදී ණය ලබාදීම යටතේ පොල් ඉඩම් අක්කර 1,122 ක වාරිමාර්ග පද්ධති ස්ථාපිත කිරීමට රු.59,610,000 ක මුදලක් වෙන් කර තිබුණද අපේක්ෂිත පරිදි සැලසුම්කළ ප්‍රාදේශීය කාර්යාල 15ක අක්කර 508 ක වාරිමාර්ග පද්ධති ස්ථාපිත කර නොතිබුණි.	2021	යෝජිත වාරිමාර්ග පද්ධති නොපමාව සම්පූර්ණ කරවා ගත යුතුය.	2021 වසරේ රට තුළ පැවති කොවිඩ් වසංගත රෝගී තත්ත්වය මෙම වසංගත තත්ත්වය යටතේ රජයේ කාර්යාල බැංකු පද්ධති මෙන්ම වගාකරුවන් ණය ලබා ගැනීමට මැලිකමක් දැක්වීම නිසා ආරම්භයේදී සැලසුම් කළ පරිදි ක්‍රියාත්මක වී නොමැත. දැනට ඉදිකිරීම් ක්‍රියාත්මක කරමින් පවතී.	2021 වර්ෂයේ ජල සම්පාදන පද්ධති ඉදිකිරීම සඳහා අක්කර 1122 ක ඉලක්කයකින් අක්කර 321 ක ප්‍රගතියක් අත්කරගෙන නොමැත.
4	2003 ජුනි 02 දිනැති අංක පී.ඊ.ඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.8.2 ඡේදය ප්‍රකාරව භාණ්ඩාගාර අනුමැතියකින් තොරව මණ්ඩලයේ සභාපති සහ ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරින් ඇතුළුව නිලධාරින් 27 දෙනෙක් සඳහා 2011 නොවැම්බර් මස සිට 2015 ජනවාරි මස දක්වා රු.17,186,549ක කම්කරු දීමනාවක් මුදලින් ගෙවා තිබුණි. මෙමගින් මණ්ඩලයට සිදුවූ අලාභය මේ දක්වා අදාළ නිලධාරින්ගෙන් අයකර ගැනීමට	2021	භාණ්ඩාගාර අනුමැතියකින් තොරව ලබාගත් කම්කරු දීමනාව තවදුරටත් ප්‍රමාද නොකර අදාළ නිලධාරින්ගෙන් අයකර ගත යුතු අතර එම දීමනා ගෙවීමට සහතික කළ හා අනුමත කළ නිලධාරින්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගත යුතුය.	කම්කරු දීමනාව අයකර ගැනීමට විරෝධය දක්වමින් අදාළ නිලධාරින් විසින් රිට් ආඥාවක් ලබා ගැනීම සඳහා අභියාචනාධිකරණයේ පෙත්සමක් ගොනු කර ඇත.	මෙම නඩුකරණයට අදාළව දිවුරුම් ප්‍රකාශ නීතිපති වෙත ඉදිරිපත් කිරීම සඳහා අමාත්‍යාංශ නීතිනිලධාරීන් මඟින් පරීක්ෂාකර නීතිපති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත. අදාළ මුදල් මේ දක්වා අයකර ගෙන නොමැත.

	කටයුතු කර නොතිබුණි.				
5	2012 වර්ෂයේදී අනුරාධපුර කටුකැලියාවේ සංචාරක බංගලාවේ ඉදිකිරීම් පෞද්ගලික කොන්ත්‍රාත් ආයතනයක් මගින් සිදුකර තිබුණු අතර කොන්ත්‍රාත් පිරිවැය රු.11,809,918 ක් විය. ඉදිකිරීම් අවසන් කර වසර 04 ක් වැනි කෙටිකාලයක් ඇතුළත ගොඩනැගිල්ලේ පහත මාලයේ ඉරිතැලීම් 22 ක්, පහත මහලයේ කාමරයක් තුළ ටයිල්ද සමඟ බිත්ති පිපිරීම් හා උඩුමහලේ ඉරිතැලීම් 06 ක් ද ඇති වී හානිදායක මෙන්ම අවධානම් තත්ත්වයකට පත් වී තිබුණු අතර ගොඩනැගිල්ලේ අත්තිවාරම සැලසුම් කිරීමේදී එම භූමියේ පවතින පසෙහි ස්වභාවය හා භූගත ජල මට්ටම ගැන සැළකිලිමත් වී නොමැති වීම ද, ඉදිකිරීම් නිසි ප්‍රමිතියකට සිදු වී නොමැති වීමද මෙම තත්වයට හේතුවී තිබුණු බව විගණනයේදී	2021	නිවැරදි ප්‍රසම්පාදන ක්‍රම අනුගමනය කරමින් ඉදිකිරීම් නිසි පරිදි සිදුකර ගැනීමට කටයුතු කළ යුතු අතර එසේ කටයුතු නොකළ වගකිවයුතු නිලධාරින් හඳුනාගෙන එම නිලධාරින්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගත යුතුය.	ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය මඟින් ලබාදුන් තාක්ෂණික වාර්තාවේ එම ඉරිතැලීම් අවදානම් තත්ත්වයක නොපවතින බව සඳහන් කර ඇත.	අලුත්වැඩියාව සඳහා අනුරාධපුර පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව වෙතින් ඇස්තමේන්තුවක් ලබාගන්නා ලද අතර සුදුසු පරිදි අලුත්වැඩියා කටයුතු සිදුකර භාවිතා කිරීමට තීරණය කර ඇත.

නිරික්ෂණය විය.

7	2020 ජනවාරි 27 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2020 හි 02 වගන්තිය, රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 1/2015 හි 2.3 ඡේදය හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2023මාර්තු 20 දිනැති අංක PED/P/02/15 (i) temp 3 දරන ලිපිය ප්‍රකාරව ක්‍රියාකාරි අධ්‍යක්ෂ ධූරයේ නව පත්වීම් ලබාදීමෙන් වැලකී සිටීමටත් දැනට පත්වීමක් ලබා ඇත්නම්, සංස්ථාපනය කරන ලද පනත යටතේ එම තනතුර ඇති කර ඇත්නම් පනත සංශෝධනය කිරීමටත් උපදෙස් ලබා දී තිබුණද 2022 ඔක්තෝබර් 12 දිනැති ලිපිය මඟින් පොල් වගා කිරීමේ මණ්ඩලය සඳහා අනුමත කාර්යමණ්ඩලයට ඇතුළත් නොවූ ක්‍රියාකාරී අධ්‍යක්ෂකවරයෙකු පත්කර රියදුරෙක් සහිත වෙන්කල වාහනයක් හා මසකට ඉන්ධන ලීටර් 115ක්	2022	රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපි ප්‍රකාරව කටයුතු කළ යුතුය.	පොල් වගාකිරීමේ මණ්ඩලයේ ක්‍රියාකාරී අධ්‍යක්ෂක ධූරය සඳහා ක්‍රියාකාරී අධ්‍යක්ෂකවරයෙකු අමාත්‍යතුමා විසින් පත්කර ඇත. පනත ප්‍රකාරව පොල් වගාකිරීමේ මණ්ඩලයේ මෙම තනතුරු දෙක සඳහා පත්කිරීමට හා ඉවත්කිරීමට ඇති බලය අමාත්‍යවරයා සතුව ඇත.	ක්‍රියාකාරී අධ්‍යක්ෂ ධූරය සඳහා පත්කර සිටි නිළධාරියා 2024.09.11 දින සිට සේවයෙන් ඉල්ලා අස්වී ඇත.එම නිලධාරියාට 2022 ඔක්තෝබර් මස සිට 2024 අගෝස්තු දක්වා එකතුව රු. 1,216,090ක මාසික දීමනාවක්ද, එකතුව රු. 834,295ක ඉන්ධන දීමනාවක්ද ,ඔහුට අනුයුක්ත කළ රියදුරු වෙත ගමන් වියදම් රු. 436,829 ක් ද, අතිකාල වියදම් රු. 494,556 ක් ද ගෙවා තිබුණි.

	ද රු. 60,650 ක මාසික දීමනාවක් ද ගෙවීම් කර තිබුණි .				
8	මණ්ඩලය සතු ආදර්ශ පොල් උයන් 12 හි 2020, 2021 හා 2022 වර්ෂයන්හි පොල් පර්යේෂණ ආයතනය හඳුන්වා දී තිබුණු පොල් ප්‍රභේද වූ CRIC 65 (කොළ), CRIC 65 (කහ), TSR, කප්රුවන, කප්සුවය, කප්සෙත, හා DT දෙමුහුන් පැල හා තැඹිලි පැල කිසිවක් පැල කිරීම සිදුකර නොතිබුණු අතර පොල් පර්යේෂණ ආයතනයේ නිර්දේශිත පැළ අතර නොවූ PP2 වර්ගයේ පැල 2021 වර්ෂයේදී 86,499 ක් ද හා 2022 වර්ෂයේ 195,703 ක් ද මණ්ඩලයේ පොල් උයන්වල සිටුවා තිබුණි.	2022	පොල් පර්යේෂණ ආයතනය විසින් නිර්දේශිත උසස් වර්ගයේ බීජ ලබාගෙන පැළ සකස් කළ යුතුය.	පොල් පර්යේෂණ ආයතනය මඟින් බීජ පොල් ඉතා සුළු ප්‍රමාණයක් නිෂ්පාදනය කරන බැවින් ආදර්ශ පොල් උයන්වල තවාන් කිරීම සඳහා එම බීජ පොල් 2021,2022 වර්ෂවල ලැබී නොමැත.	පොල් පර්යේෂණ ආයතනය හා පොල් වගාකිරීමේ මණ්ඩලය ඒකාබද්දව සහතික කරන ලද උසස් වර්ගයේ පැළවල හිඟය හේතුවෙන් එම පැළ වගාව මේ දක්වා සාර්ථක වී නොමැත.
9	වැවිලි අමාත්‍යාංශය, ක්‍රීඩා අමාත්‍යාංශය, පොල් සංවර්ධන අධිකාරිය, මුදල් අමාත්‍යාංශය හා ද්විතීය කෘෂිකර්ම ව්‍යාපෘතියට අයත්ව තිබුණු රු.30,202,375 ක් වටිනා වාහන 17ක් මණ්ඩලය විසින් භාවිතා කරමින්	2022	මණ්ඩලය විසින් පරිහරණය කරනු ලබන වාහන විධිමත්ව පවරා ගැනීමට කටයුතු කළ යුතුය.	මෙම වාහනවල ලේඛන සොයා මේ වන විට වාහන 09 ක් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය නමට පවරාගෙන ඇත.	මණ්ඩලය විසින් පරිහරණය කරනු ලබන වාහන විධිමත්ව පවරා ගැනීමේ කටයුතු අවසන් කර නැත.

පැවතියද එම වාහන මණ්ඩලය වෙත පවරා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කටයුතු කර නොතිබුණු අතර ඉන් වාහන 7ක් සඳහා රු.3,207,905 ක අළුත්වැඩියා වියදම් සමාලෝචිත වර්ෂයේදී දරා තිබුණි . මින් වාහන 4ක් ධාවන තත්ත්වයේද නොවීය.

3.43 පොල් සංවර්ධන අධිකාරිය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	1,872,467,192	407,846,380	1,464,620,812	(18,945,738)	තත්ත්වාගණනය කළ
2022	2,163,687,015	263,909,505	1,899,777,510	98,651,996	තත්ත්වාගණනය කළ
2023	2,087,672,307	356,348,737	1,731,323,570	170,788,322	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණ	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	ජනපති පදවි ප්‍රාප්තියේ දෙවර්ෂ පූර්ණයට සුභ පැතුම් එක් කිරීමේ පුවත්පත් දැන්වීමක් නිර්මාණය කර ගැනීම සඳහා රු.75,600 ක් වැය කිරීම, රේඛීය රාජ්‍ය අමාත්‍යාංශය මඟින් මුද්‍රණය කළ 'අපේක්ෂා කප්රුක' නම් පොතේ පිටපත් 150,000 ක් මුද්‍රණය කිරීම සඳහා රු.8,181,000ක් ගෙවීම අධිකාරියේ අරමුණුවලට පටහැනි බවට නිරීක්ෂණය විය.	2021	අධිකාරියේ අරමුණුවලට අනුකූල නොවන වියදම් නොදැරිය යුතුය. විෂය භාර අමාත්‍යාංශයේ වියදම් එම අමාත්‍යාංශයට වෙන් කර ඇති ප්‍රතිපාදනවලින් සිදු කළ යුතුය.	විෂය භාර අමාත්‍යාංශය මඟින් පොල් වගාව සහ පොල් කර්මාන්ත ක්ෂේත්‍රය සම්බන්ධ ජනතාව දැනුවත් කිරීම සඳහා "අපේක්ෂා කප්රුක" පොතේ පිටපත් 150,000 මුද්‍රණය සිදු කර ඇත.	රේඛීය අමාත්‍යාංශය මඟින් සිදුකරන ලද කාර්යයන් වෙනුවෙන් මෙම ආයතනය විසින් දැරූ වියදම් හා "සුභ පැතුම්" සඳහා දරන ලද වියදම් පිළිබඳ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.
2	අධිකාරියේ නාරාහේන්පිට ප්‍රධාන කාර්යාලයේ ඉදිරිපසින් සභාපතිවරයා සඳහා කොටසක් එකතු	2021	මෙම කාර්ය සම්පූර්ණ කරවා ගත යුතුය. එය කළ නොහැකි නම් වියදම වගකිව යුත්තන්ගෙන් අය	2023 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මට ඇතුළත් කර අධිකාරියේ අභ්‍යන්තර ඉපැයීම් හෝ අභ්‍යන්තර	ඉදිකිරීම්වලට අදාළ මූලික කටයුතු සිදු කිරීම සඳහා රු.300,000 මුදලක් උපදේශන සමාගමට ගෙවා

	කිරීම හා කොළඹ කොටුවේ පවත්වාගෙන යනු ලබන කාර්යාලයේ අලෙවිසැලක් සකස් කිරීම වෙනුවෙන් ප්‍රතිපාදන නොතිබියදී ඊට අදාළ සැලසුම් සකස් කිරීම සඳහා එකඟ වී තිබුණු රු.1,200,000 ක උපදේශන ගාස්තුවෙන් පළමු වාරිකය වශයෙන් පෞද්ගලික උපදේශන සමාගමකට ගෙවා තිබුණු රු.300,000 ක් එම ව්‍යාපෘතිය සඳහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා නොදීම හේතුවෙන් අදාළ ඉදි කිරීම් සිදු කිරීමට නොහැකි වී තිබුණි.		කර ගත යුතුය.	ඉතුරුම් යොදා ගෙන විශේෂ ආයෝජන ව්‍යාපෘතියක් ලෙස පෞද්ගලික ක්ෂේත්‍රයේද සහාය ඇතිව පවත්වාගෙන යෑමට ඉදිරි කටයුතු සිදු කරමින් පවතී.	ඇති අතර ඉදිකිරීම් කටයුතු වර්තමාන දක්වා සිදුකර නොමැත. වියදම් වූ මුදල ද අයකර ගෙන නොමැත.
3	පොල් නිෂ්පාදන පාරිභෝගික ජනතාව අතර ප්‍රචලිත කිරීමේ වැඩසටහන සඳහා 2014 වර්ෂයේදී ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවට රු.9,344,832 ක් ගෙවා තිබුණ ද, ප්‍රචාරණ කටයුතු සම්පූර්ණ නොකිරීම හේතුවෙන් ආපසු අයවිය යුතු රු.7,060,032 ක මුදල සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම අයකර	2021	සිදු කළ විමර්ශණයන්හි ප්‍රගතිය පිළිබඳව සොයා බලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.	මෙම මුදල අයකර ගැනීමට තව දුරටත් කටයුතු කරමින් පවතී.	පොල් සංවර්ධන අධිකාරිය විසින් ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව සමඟ 2014 වර්ෂයේදී සිදු කළ ඇසුරුම් පොල් කිරි ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහනෙහි හිඟ මුදල් වලට අදාලව දැන්වීම් විකාශනය කිරීම සඳහා ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව සමඟ සාකච්ඡා කළද 2024.09.11 දින දක්වාම මෙම ගුවන්

	ගැනීමට නොහැකි වීම මතභේදාත්මක කරුණක් වූ අතර මෙම ප්‍රචාරණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී මූල්‍ය අක්‍රමිකතාවයක් සිදුවී ඇති බවට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශණ කොමිසන් සභාව හා ජනාධිපති විමර්ෂණ ඒකකය විසින් 2016 වර්ෂයේදී සිදු කළ විමර්ෂණයන්හි ප්‍රගතිය පිළිබඳව ද සොයා බලා නොතිබුණි. වැය කළ රු.2,284,800 ක මුදලින් රු.2,280,000 ක් ප්‍රචාරක පට 06 ක් නිෂ්පාදනය කිරීම සඳහා වුවද, එම ප්‍රචාරක පට විකාශනය කර නොතිබීමෙන් එම මුදල ද අනාර්ථික වියදමක් වී තිබුණි.				කාලය භාවිතා කිරීමට පොල් සංවර්ධන අධිකාරිය වෙත නොහැකී වී ඇත.
4	අධිකාරියේ ලියාපදිංචි වී ඇති පොල් මෝල් හිමියන්ගෙන් කපාපු පොල් පරීක්ෂණ ගාස්තු සහ ජල සාම්පල පරීක්ෂණ ගාස්තු සඳහා 2019 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා රු.5,814,594ක්ද කොහුබත් උපස්ථර පරීක්ෂණ සඳහා රු.211,938ක්ද නිෂ්පාදිත පොල්කිරි	2022	නොපමාව මෙම ශේෂ අයකරගත යුතු අතර සේවා සැපයීමට පෙර මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.	මෙම හිඟ ගාස්තු අතර සමහර ගාස්තු සෘජු තැන්පත් ලෙස ගෙවීම් සිදුකර ඇත. ඒවා හඳුනා ගැනීමට සහාය ලබාගැනීම පිණිස කර්මාන්තකරුවන් වෙත ලිපියොමු කර ඇත. සමහර කර්මාන්තකරුවන් මේ වර්ෂයේ ක්‍රියාකාරිත්වය අඩු මට්ටමකින්	2023 වර්ෂයේ සිට සේවාව සැපයීමට පෙර මුදල් අයකර ගැනීමේ ක්‍රමවේදය භාවිතා කරන අතර 2024 ඔක්තෝබර් 16 වන විට හඳුනානොගත් හා අය වියයුතු ශේෂ ලෙස 2023 වර්ෂය සඳහා රු. 685,118 ක් ද , 2024 වර්ෂය සඳහා රු. 4, 047,153 ක් ද

	පරීක්ෂණ සඳහා 2020 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා රු.1,180,985ක්ද ඇතුළුව එකතුව රු.7,207,517 ක ගාස්තු සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අයකරගෙන නොතිබුණි.			පැවතීම නිසා හිඟ ගාස්තු අයකරගැනීම ප්‍රමාද වී ඇත.	ලෙස රු. 4,732,271 ක වටිනාකමක් පවතී.
5	කොහු කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය දැනුම හා භාවිතා වන යන්ත්‍ර සූත්‍ර හා නිෂ්පාදන විධික්‍රම සම්බන්ධයෙන් කර්මාන්තකරුවන්, නව ව්‍යවසායකයින්, ශිෂ්‍ය ප්‍රජාව ආදීන් සඳහා පුහුණු මධ්‍යස්ථානයක් වශයෙන් 2006 වර්ෂයේදී දුන්කන්නාව කොහු සංවර්ධන හා පුහුණු මධ්‍යස්ථානය ආරම්භකර තිබූ අතර කොහු නිෂ්පාදන ක්ෂේත්‍රයට නව දැනුම හා තාක්ෂණය ලබාදෙමින් තත්ත්වයෙන් උසස් කොහු නිෂ්පාදන හඳුන්වාදීමේ පුරෝගාමියා බවට පත්වීම මෙමගින් අරමුණු කර තිබුණි. එසේ වුවද (2020 අගෝස්තු 26 දිනැති අංක CDA/PD/FM/2020/	2022	දුන්කන්නාව පුහුණු මධ්‍යස්ථානයේ කටයුතු ආරම්භ කිරීම හෝ සුදුසු වෙනත් වැඩපිළිවෙලක් යෙදීම තුළින් එම මධ්‍යස්ථානයේ කටයුතු සක්‍රිය කළ යුතුය.	2022 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ මෙම මධ්‍යස්ථානයේ කොහු මෝල අවම පිරිවැයක් දරමින් ක්‍රියාත්මක කිරීම සඳහා රු.මිලියන 2.48ක් වෙන්කරවා ගෙන අලුත්වැඩියා කටයුතු නැවත සිදුකිරීමට අනුමැතිය ලබාගෙන ඇත.	කොහු සංවර්ධන පුහුණු මධ්‍යස්ථානයේ යන්ත්‍ර කිසිවක් අළුත්වැඩියා කර නොමැති අතර සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය වර්තමානයේදීත් අක්‍රීයව ඇත.

	Program -003 දරන අධ්‍යක්ෂ - සැකසුම් සංවර්ධන වැ.බ.ගේ ලිපිය ප්‍රකාරව) බාහිර පාර්ශවයකට බඳු දීමේ අරමුණින් 2020 සැප්තැම්බර් 01 දින සිට කොහු සංවර්ධනයට අදාළ කර්මාන්තශාලාවේ කටයුතු නවතා දමා තිබුණි. 2023 ජූනි 02 සිදුකරන ලද ස්ථානීය විගණන පරීක්ෂණය අනුව එහි යන්ත්‍ර 18 න් 14 ක්ම අක්‍රීයව පැවැති ක්‍රියාකාරී මට්ටමේ පවතින යන්ත්‍ර ද අළුත්වැඩියා කළ යුතු වීම හේතුවෙන් පුහුණු මධ්‍යස්ථානයේ කටයුතු නැවත ආරම්භ කිරීම හෝ කොහු කර්මාන්ත ශාලාව බාහිර පාර්ශවයකට බඳු දීම හෝ සිදුකර නොතිබුණි.				
6	1971 අංක 46 දරන පොල් සංවර්ධන පනතේ 33 (4) වගන්තිය ප්‍රකාරව පොල් පිළිබඳ සෙස් බද්ද පැනවීම, අය කර ගැනීම, ක්‍රියාත්මක කිරීම හා ගෙවීම් කිරීම සඳහා අවශ්‍ය සියළු කාරණා සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය යුතු වුවද	2023	අයකරගනු ලබන සෙස් බද්දේ ක්‍රියාකාරකම් පිළිබඳ අධිකාරිය විසින් නියෝග සකස් කර නිසි අනුමැතිය මත එම නියෝග ක්‍රියාත්මක කළ යුතුය.	2023 වසරේ මෝල් හිමියන්ගේ ඇප තැම්පත් මුදලින් රු.2,471,259 ක් නිදහස්කර ඇත. ඉතිරි ඇප තැම්පත් ගිනුමහි ඇති ශේෂයන් අනුමත ක්‍රියාකාරකම් සඳහා සක්‍රිය දිසිදි මෝල්හි ඉල්ලීම මත නිදහස්කරනු	පොල් පිළිබඳ සෙස් බද්ද පැනවීම, අය කර ගැනීම, ක්‍රියාත්මක කිරීම හා ගෙවීම් කිරීම සඳහා අවශ්‍ය සියළු කාරණා සම්බන්ධයෙන් අධිකාරිය විසින් කිසිදු නියෝගයක් සකස් කර නොතිබුණි.

	අධිකාරිය විසින් ඒ සම්බන්ධයෙන් කිසිදු නියෝගයක් සකස් කර නොතිබුණි. එසේ වුවද 2007 වර්ෂය දක්වා මෝල් සංවර්ධන අරමුදලට සෙස් ආදායමින් හා ඊට පසු වර්ෂවලදී භාණ්ඩාගාර ප්‍රදානවලින් ලැබූ අපනයනය කරන සෑම කි. ග්‍රෑ 1 කට ශත 20 බැගින් වූ මුදලක් යොදා ගනිමින් අපනයනය කරන මෝල් හිමියන් නමින් ගිණුම් පවත්වාගෙන ගොස් තබූ අතර වර්ෂය අවසානයේ ගිණුම් 58 ක රු.44,000,497 ක ශේෂයක් විය. 2019 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා එම ගිණුම් වලින් රු.11,814,955 ක මුදලක් අදාළ මෝල් හිමියන් වෙත ආපසු ගෙවා තිබුණි.			ඇත.	
7	1975 අංක 24 දරන පනතින් සංශෝධිත 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනතේ 51 වගන්තිය හා 1979 දෙසැම්බර් 31 දිනැති අංක 69/4 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළමු වන උපලේඛනයේ 3 වන ඡේදය ප්‍රකාරව අපනයනය කරනු	2023	අධිකාරිය විසින් අපනයනය කරනු ලබන පොල් නිෂ්පාදනවල ගුණාත්මකභාවය පිළිබඳ ප්‍රමිති සකස් කිරීම, පවත්වාගෙන යාම හා අධීක්ෂණය සිදුකළ යුතුය.	වේගයෙන් දියුණුවෙන තාක්ෂණයික ක්‍රමවේදයන් හා දැනුම හමුවේ නිෂ්පාදනයක ගුණාත්මකභාවය තීරණය කිරීම අදාළ පද්ධතිවල සහතිකකරණය මඟින් සිදුවන බව පිළිගෙන ඇත.	අපනයනය කරනු ලබන පොල් නිෂ්පාදනවල ගුණාත්මක ප්‍රමිති නියම කිරීම හා පවත්වාගෙන යාම අධිකාරිය විසින් කළ යුතු වුවද එසේ කටයුතු කර නොතිබුණි.

	ලබන පොල් නිෂ්පාදනවල ගුණාත්මක ප්‍රමිති නියම කිරීම හා පවත්වාගෙන යාම අධිකාරිය විසින් කළ යුතු වුවද 2023 වර්ෂයේදී ඇ.එ.ජ . ඩොලර් 277,510 ක් වූ පොල් ආශ්‍රිත නිෂ්පාදන (දිසිදි පොල් හැර) මෙ.ටො . 172,685 ක් අපනයනය කර තිබුණද ඒ පිළිබඳ කිසිදු තත්ත්ව පරීක්ෂාවක් සිදුකර නොතිබුණි.			මෙහිදී නිෂ්පාදන නොව. අදාළ නිෂ්පාදන පද්ධතිය සහතිකකරණය කිරීමට ලක් කිරීම සිදු කරයි. මෙම පද්ධති සහතිකකරණය හරහා, නිෂ්පාදන ක්‍රියාවලියේදී නිෂ්පාදනවල ගුණාත්මකභාවයට හානිවිය හැකි සියලු තත්ත්වයන් වැළැක්වීම හෝ පාලනය කිරීම සිදු කරන බැවින් සමස්ථ නිෂ්පාදනයේම ගුණාත්මකභාවය ආරක්ෂා වනු ඇත.	
8	“පොල් නිෂ්පාදන විශාල තොග වශයෙන් මිලදීගෙන මිල අඩු වැඩි වීම අනුව වෙළඳපලට නිකුත් කිරීම මඟින් මිල පාලනය කිරීම” අරමුණ කරගනිමින් ආරම්භ කර තිබූ පොල් තෙල් මිල ස්ථායීකරන අරමුදලෙහි කටයුතු වසර 37ක පමණ කාලයක සිට අරමුණු ඉටුකර ගැනීම සඳහා ක්‍රියාමාර්ග නොගෙන තිබුණි.	2023	අරමුදලේ අරමුණු ඉටුකර ගැනීමට නොපමාව කටයුතු කළ යුතුය.	මෙම අරමුදලේ පවතින මුදල් පොල් කර්මාන්තයේ ප්‍රවර්ධනය සඳහා කර්මාන්තකරුවන්ට මූල්‍ය පහසුකම් සැපයීමට ණය යෝජනා ක්‍රම දෙකකට යෙදවීමට කටයුතු කර ඇත. එම ණය මුදල් අවශ්‍යතාවය පරිදි නිදහස් කරන තෙක් මෙසේ ආයෝජනය කිරීම් සිදුකර ඇත.	පොල් තෙල් මිල පාලනය කිරීම සඳහා ඍජුවම අරමුදල භාවිතා කිරීම සිදුකර නැත.
9	අධිකාරිය විසින් පොල්තෙල් නිෂ්පාදකයන්ගේ	2023	අධිකාරිය විසින් පොල් තෙල් නිෂ්පාදකයින්ට	2022-2023 වර්ෂයේ පැවති ආර්ථික අර්බුදය	පාරිභෝගිකයා අධිත මිලකට තරුපහේ නිෂ්පාදන

	පොල්තෙල් නිෂ්පාදන තුළ ඇෆ්ලටොක්සින් නොමැති බවටත් , කිසිදු රසායනික ද්‍රව්‍යයක් දැමීමෙන් තොරව ස්වභාවික ලෙස නිෂ්පාදනය වන බවත් සමස්ත නිෂ්පාදන ක්‍රියාවලියම ප්‍රමිතියෙන් යුතුව සිදුවන බවටත් පරීක්ෂාවන් සිදුකර ලබාදෙනු ලබන තරු 5 සහතික 25ක් 2022 වර්ෂයේදී පොල් ආශ්‍රිත නිෂ්පාදන ආයතන 11ක් විසින් ලබාගෙන තිබුණ ද 2022 වර්ෂයේ දී තරු 5 සහතික 7ක් ලබාගෙන තිබූ ආයතන 2023 වර්ෂයේ දී තරු 5 සහතික 3ක් පමණක් ලබාගෙන තිබුණි. මේ අනුව උසස් තත්ත්වයේ පොල් තෙල් නිෂ්පාදනකරුවන් ඔවුන්ගේ නිෂ්පාදනවල තත්ත්වය උසස් කරලීමට ඇති උනන්දුව අඩුවෙමින් පවතින බව නිරීක්ෂණය විය.		මූල්‍යමය සහාය, දැනුම හා වෙනත් පහසුකම් ලබාදී ඔවුන්ගේ නිෂ්පාදන පිරිවැය අවම කිරීම තුළින් පාර්භෝගිකයන්ට ගුණාත්මක නිෂ්පාදනයන් දැරිය හැකි මිලකට ලබා දීමට කටයුතු කළ යුතුය.	හමුවේ පාරිභෝගිකයා වෙළදපොලේ මිල අඩු පොල්තෙල් නිෂ්පාදන පමණක් මිලදී ගැනීම හේතුවෙන් තරු පහ ලාංජනය සහිත පොල්තෙල් නිෂ්පාදනය කරන කර්මාන්ත කරුවන් විසින් එම පොල්තෙල් නිෂ්පාදනය තාවකාලිකව නතර කර, තරුපහ රහිත පොල්තෙල් නිෂ්පාදනය කිරීමට පෙළඹී ඇත. එම තත්ත්වය යටතේ පොල්තෙල් සාම්පල පරීක්ෂා කිරීම තාවකාලිකව නවතා ඇත.	මිලදී නොගන්නා බැවින් අධිකාරිය විසින් එම නිෂ්පාදනවල මිල පාලනය සඳහා විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.
10	අධිකාරියේ වර්ග අඩි 1,162සමන්විත බිම් මහල යොදාගෙන	2023	නිසි ශක්‍යතා අධ්‍යනයකින් පසුව පමණක් සැලසුම්	පොල් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තකරුවන්	පොල් සංවර්ධන අධිකාරියෙන් සේවාවන් ලබා

ස්ථාපිත කළ ව්‍යාපාරික සේවා මධ්‍යස්ථානය මගින් දුරකථනය හරහා පාරිභෝගික ගැටළු විසඳීමට ඇමතුම් මධ්‍යස්ථාන ඒකකයක් , පාරිභෝගිකයන්ට වඩා හොඳ සේවාවක් ලබාදීමට දියමන්ති , ප්ලැටිනම් ,රන් ,රිදී සාමාජික කාඩ්පත් හඳුන්වා දීම මගින් විදේශීය පාරිභෝගිකයන් හඳුනාගැනීමට පාරිභෝගික සත්කාර ඒකකයක් ,අධිකාරිය විසින් දේශිය හා ජාත්‍යන්තර පොල් ආශ්‍රිත දත්ත පාරිභෝගිකයන්ට ලබා දීමට අලෙවිකරණ බුද්ධි ඒකකයක් ,තත්ත්ව ආරක්ෂණ ,සැකසුම් සංවර්ධන හා අලෙවිකරණ අංශවල තොරතුරු ලබාදීම හා තොරතුරු රැස් කිරීමට තොරතුරු තාක්ෂණ ඒකකයක් හා මෙම මධ්‍යස්ථානයේ සියළුම ක්‍රියාකාරකම් සැලසුම් කිරීමට සැලසුම් ඒකකයක් ඇතුළුව ඒකක 5කින් මෙම මධ්‍යස්ථානයේ කටයුතු සිදු කිරීමට අධිකාරිය සැලසුම් කළ ද ඉහත කී කිසිදු	සකස් කර එම සැලසුම් ඵලදායී ලෙස ක්‍රියාත්මක කළ යුතුය.	ට සහ අපනයනකරුවන් ට පොල් සංවර්ධන අධිකාරියේ සේවාවන් කඩිනම් සේවාවක් ලෙස ලබාදීමත්, ජාත්‍යන්තර වෙළඳපලේ ශ්‍රී ලංකාවේ පොල් ආශ්‍රිත නිෂ්පාදන සඳහා සුවිශේෂී සන්නාම නාමයක් ජාත්‍යන්තරව ලබාදීමත් මෙමගින් වැඩිදුරටත් බලාපොරොත්තු විය. නමුත් පවතින තත්ත්වය මත බොහෝ කර්මාන්තකරුවන් මාර්ගගත ක්‍රම ඔස්සේ තම සේවාවන් ලබාගැනීමට පෙලඹීම් මත මෙම මධ්‍යස්ථානයට පැමිණ ලබාගැනීමේ අඩුවක් දක්නට ඇත.	ගන්නා සහ ලබා ගැනීමට උනන්දුවක් දක්වන පාරිභෝගිකයන් වෙත පහසුවෙන් පැමිණීමට හැකිවන පරිදි හා අනවශ්‍ය ප්‍රමාදයන් වැලක්වාලීම පිණිස පොල් සංවර්ධන අධිකාරිය කොටුව කාර්යාල ගොඩනැගිල්ලේ බිම් මහලේ මෙම ව්‍යාපාරික සේවා මධ්‍යස්ථානය ස්ථාපනය කිරීමට කටයුතු සම්පාදනය කර ඇතත් කිසිදු කාර්යයක් සිදු කර නැත.

කාර්යයක්
සමාලෝචිත වර්ෂයේ
සිදු කර නොතිබුණි .

3.44 ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	බදු පෙර ලාභය (අලාභය) රු.	මතය
2021	6,288,814,458	2,521,969,686	3,766,844,772	(231,197,596)	අහිතකර
2022	6,654,762,290	2,841,234,612	3,813,527,678	19,671,760	තත්ත්වාගණනය කළ
2023	6,737,098,854	2,955,759,630	3,781,339,224	(92,673,903)	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රධාන කාර්යාලයේ වෙළඳ හා අනිකුත් ගෙවිය යුතු ශේෂය වූ රු. 442,622,983 තුළ වසර 10 ඉක්මවූ රාජ්‍ය ආයතන 05ක් වෙත ගෙවිය යුතු රු. 228,561,009ක ණය ශේෂයන් නිරවුල් කිරීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි.	2023	ගෙවිය යුතු ශේෂ හා පොළිය නිරවුල් කරගැනීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය.	ලංකා මිනරල් සැන්ඩ් සමාගම වෙත ගෙවිය යුතු මුදල සම්බන්ධයෙන් කොළඹ වාණිජ මහාධිකරණයේ ඇති නඩුව සමතයකට පත්කර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරන ලෙස 2024.05.16 දිනැති ලිපිය මගින් ඉල්ලීමක් කර ඇත. ලංකා පොහොර සමාගම සමාගම වෙත 2023.12.31 දිනට ගෙවිය යුතු මුදල වෙනුවෙන් සංස්ථාව සතු ස්ථාවර වත්කමක් පවරා ගැනීමට එම ආයතනය එකඟ දැයි විමසා ඇති අතර එසේ නොමැති නම් එම ණය	මෙම ගැටළුව මේ දක්වා නිරාකරණය කරගෙන නොමැත.

				කපාහරින ලෙස ඉල්ලීමක් 2024.06.10 දිනැති ලිපිය මගින් සිදුකර ඇත. රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාව, හලාවත වැවිලි සමාගම හා ජනතා වතු සංවර්ධන මණ්ඩලය වෙත ගෙවිය යුතු මුදල කපාහරින ලෙස ඉල්ලීමක් සිදුකර ඇත.	
2	2023 දෙසැම්බර් 31 දිනට මහජන බැංකුවේ බැංකු අයිරාව රු. මිලියන 135.391ක් වූ අතර සමාලෝචිත වර්ෂය සඳහා අයිරා පොලිය රු. මිලියන 36.729ක් විය. 2020 වර්ෂයේදී ලබාගත් රු. මිලියන 100ක ණය මුදලින් සමාලෝචිත වර්ෂය අවසන් වනවිට රු. මිලියන 20.69ක් පමණක් ගෙවා තිබුණු අතර සමාලෝචිත වර්ෂය සඳහා පොලිය රු.මිලියන 18.60ක්ද ගෙවිය යුතු පොලිය රු. මිලියන 20.054ක්ද විය.	2023	ගෙවිය යුතු ශේෂ හා පොළිය නිරවුල් කරගැනීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය.	2020 වර්ෂයේදී මහජන බැංකුවෙන් ලබාගත් රු.මි.100ක ණය මුදලින් 2023.12.31 දින වන විට ගෙවීමට ඉතිරිව තිබූ රු.මි.79.31 සහ එදිනට බැංකු අයිරාව වූ රු.මි.135.39 සහ ඒවාට අදාළ ගෙවිය යුතු පොලිය බැංකුව සමඟ සාකච්ඡා කිරීමෙන් පස් අවුරුදු දීර්ඝ කාලීන ණයක් බවට 2024 පෙබරවාරි මාසයේදී පරිවර්තනය කිරීම සිදුකල අතර මේ වනවිට මෙම ණයට අදාල වාරික මුදල් නිසි පරිදි ගෙවා ඇත.	මෙම ගෙවිය යුතු ණය,අයිරා හා පොලිය එක්කර 2024 පෙබරවාරි රු.මි.237ක අවුරුදු 5 ක දිගු කාලීන ණයක් බවට පරිවර්තනය කරගෙන වාරික (පොලී හා වාරිකය) ලෙස රු.මි 35.08 ක් ගෙවා ඇත.
3	1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 15 සහ 16 වන වගන්ති	2023	වර්තමාන දායක මුදල් හා හිඟ දායක මුදල් පිළිබඳ ගැටළුව	දීර්ඝ කාලයක පටන් සංස්ථාවේ පවතින දැඩි මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් සේවක	හිඟ ව්‍යවස්ථාපිත දීමනා නිරවුල් කිරීම සඳහා මහා භාණ්ඩාගාරයෙන්

හා 1980 අංක 46 දරන සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල් පනතේ II කොටසේ 16(i) සහ 27 වගන්ති ප්‍රකාරව 2000 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා රු. 689,241,182 ක සේවක අර්ථසාධක අරමුදල් දායක මුදල්, රු. 49,732,429 ක සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල් සහ ඊට අමතරව වතු කාර්යමණ්ඩල අර්ථසාධක අරමුදල සඳහා රු. 73,313,020 ක්ද ලංකා වැවිලිකරුවන්ගේ අර්ථසාධක සංගමය වෙත රු.18,160,269ක මුදලක්ද සමාලෝචිත වර්ෂය අවසන් දින දක්වා ගෙවීමට කටයුතු කර නොතිබුණි. 2023 දෙසැම්බර් 31 දිනට සේවක අර්ථසාධක හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් සඳහා ගෙවිය යුතු වතු අංශයේ අධිභාර වටිනාකම පිළිවෙලින් රු. 78,378,572 ක් හා	කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.	අර්ථසාධක අරමුදල (EPF), ලංකා වැවිලි කරුවන්ගේ අර්ථසාධක අරමුදල (CPPS) වතු කාර්යමණ්ඩල අර්ථසාධක අරමුදල (ESPS) යන අර්ථසාධක අරමුදල් වලටත් සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලටත් (ETF) ගෙවිය යුතු දායක මුදල් සඳහා නඩු තීන්දු වලට අදාළ මුදල් ගෙවමින් පවතී.	මාසිකව රු. මිලියන 21.3ක් ලැබෙන අතර එම මුදල් වලින් ව්‍යවස්ථාපිත ගෙවීම් වලට අදාළ නඩු සඳහා වාරික ගෙවමින් පවතී.

	රු. 9,295,631 ක් විය.				
4	1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනතේ 02 වන කොටසේ 5(1) වගන්තිය ප්‍රකාරව සේවකයකු විශ්‍රාම ගිය හෝ මරණයට පත් වූ දින සිට දින 30 ක් ඇතුළත පාරිතෝෂික ගෙවීම් කළ යුතු වුවත් සංස්ථාව විසින් පසුගිය වර්ෂ සහ සමාලෝචිත වර්ෂයද ඇතුළුව 2023 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු පාරිතෝෂික වටිනාකම රු.629,252,704 ක්ද අධිභාර රු.25,843,582ක්ද ක්ද ගෙවිය යුතුව තිබුණි. ඉහත අරමුදල් නොගෙවීම නිසා ඒ සම්බන්ධ නඩු වෙනුවෙන් 2023 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා රු. 1,933,000 ක නීතිඥ ගාස්තු ගෙවීමටද සංස්ථාවට සිදුවී තිබුණි.	2023	1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත ප්‍රකාරව පාරිතෝෂික වගකීම් නිසි පරිදි පියවීම තුළින් අනාර්ථික වියදම් වළක්වා ගැනීමට කටයුතු කළ යුතුය.	දීර්ඝ කාලයක පටන් සංස්ථාවේ පවතින දැඩි මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් සේවක පාරිතෝෂික මුදල් නිසි පරිදි ගෙවීමට නොහැකි වී ඇති අතර විශාල අධිභාර මුදලක් ගෙවීමට සිදුව ඇත. මෙම හිඟ දායක මුදල් ගෙවා නිම කිරීම සඳහා මේ වනවිට කැබිනට් අනුමැතිය ලැබී ඇත.	මහා භාණ්ඩාගාරය හරහා රු.මිලියන 1,445.5ක් ලබා දීම සඳහා කැබිනට් අනුමැතිය ලැබී ඇතත් මේ දක්වා මුදල් ලැබී නැත. සේවකයින් 4941 දෙනෙකුට අදාළව ගෙවිය යුතු පාරිතෝෂික මුදල් ප්‍රමාණය ගණනය කර ඇත.
5	2018 මාර්තු 19 දිනැති අංක 01/2018 දරන	2023	චක්‍රලේඛ විධිවිධාන අනුව භාවිතයට ගත	ධාවන තත්වයේ නොමැති වාහන 75න් අලුත්වැඩියා කර	ධාවන තත්ත්වයේ නොතිබූ වාහන 75න් එක් වාහනයක්

	වත්කම් කළමණාකරන චක්‍රලේඛයේ 2 (අ) ඡේදය සහ 2015 ජුලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 02 ඡේදය ප්‍රකාරව සංස්ථාව සතු වාහන 122න් ධාවන තත්ත්වයේ නොපවතින වාහන 75 ක් පැවති අතර මින් අලුත්වැඩියා කර භාවිතයට ගත නොහැකි වාහන 57ක් තිබුණද එම වාහන අපහරණය කිරීමට කටයුතු කර නොතිබුනු අතර අලුත්වැඩියා කර භාවිතයට ගත හැකි වාහන 18ක් ද අලුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි.		නොහැකි වාහන අපහරණය කිරීමට ද අළුත් වැඩියා කළහැකි වාහන නිසි අළුත්වැඩියාවකින් පසුව භාවිතයට ගැනීමට ද කටයුතු කළ යුතුය.	භාවිතා කළ නොහැකි තත්වයේ පවතින වාහන 25 න් 12ක් මේ වන විට ලියාපදිංචිය අවලංගු කර ඇත. ලියාපදිංචිය අවලංගු නොකළ ඉතිරි වාහන 50 න් අලුත්වැඩියා කර භාවිතා කල හැකි වාහන 18 ක් ආයතනයේ පවත්නා මූල්‍ය තත්වය මත ක්‍රමානුකූලව අලුත්වැඩියා කිරීමට කටයුතු කරමින් පවතී.	අලුත්වැඩියාකර භාවිතයට ගෙන ඇති අතර අනෙකුත් වාහන 74 අපහරණය සඳහා සමීක්ෂණ මණ්ඩල 03ක් පත්කර කටයුතු සිදුකරමින් පවතී.
6	වර්තමානය වන විට සංස්ථාවේ තේ කර්මාන්තශාලා 09 ක් පැවතියද ඉන් කර්මාන්තශාලා 03 ක පමණක් නිෂ්පාදන කටයුතු සිදුකරමින් පැවති අතර කර්මාන්තශාලා 05 ක් දීර්ඝ කාලයක සිට වසා දමාද එක් තේ කර්මාන්තශාලාවක් 2022 ඔක්තෝබර්	2023	වසා දමා ඇති කර්මාන්තශාලා විධිමත් අනුමැතියක් මත ප්‍රයෝජනවත් කාර්යයක යොදා ගැනීම තුලින් ආදායම් ඉපැයීමට කටයුතු කළ යුතුය.	දීර්ඝ කාලයක සිට අක්‍රීය තත්වයේ පවතින කර්මාන්තශාලා 05න් වර්තමානයේ වෙළඳපොළට සරිලන ලෙස ගුණාත්මක තේ නිෂ්පාදනය කිරීමට නොහැකි බැවින් දීර්ඝ කාලයක සිට වසා දමා ඇත. රංගල තේ කර්මාන්තශාලාවේ තේ වියලන යන්ත්‍රයේ ලිප කොටස (Furnace) ගලවා නැවත අලුත්වැඩියා කිරිමට	දීර්ඝ කාලයක් වසා දමා ඇති කර්මාන්තශාලා වල යන්ත්‍රසූත්‍ර ලැයිස්තුගත කර තක්සේරු කටයුතු කරමින් පවතින අතර රංගල කර්මාන්තශාලාවේ අළුත්වැඩියා කටයුතු ආරම්භ කර ඇත.

	සිට නඩත්තු කටයුතු වෙනුවෙන් වසා දමා ද තිබුණි. එසේම භාවිතයට නොගන්නා ගෝමර වතු යායේ නකල්ස් බංගලාව නැරඹුම් ස්ථාන කිහිපයකට මැදිව තිබුණද එම බංගලාව අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට සංස්ථාව කටයුතුකර නොතිබුණි.			මූලිකව කටයුතු සිදුකරනු ලැබුවත්, පසුගිය වර්ෂයේ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ මූල්‍යමය තත්වය මත මෙම යන්ත්‍ර මිලදී ගැනිමට නොහැකි වූයෙන් මෙම වර්ෂය දක්වා කල් දමන ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය තිරණය කොට ඇත.	
7	සංස්ථාව සතු වතු 280ක් ප්‍රාදේශීය වතු සමාගම් 20 කට අවුරුදු 53 ක දිගුකාලීන බදු පදනමට පවරා දී තිබු අතර මූල්‍ය ප්‍රකාශන වල එය රු. 1,611,520,641 ක ආයෝජිත දේපළ ලෙස පෙන්නුම් කලද එම ආයෝජිත වත්කම්වලින් ලැබෙන වාර්ෂික ආදායම ගිවිසුම් අනුව මහා භාණ්ඩාගාරය වෙත යවන බැවින් සංස්ථාවට ආදායම අහිමි වී තිබුණි.	2023	සංස්ථාවේ ආයෝජිත දේපළ වල ආදායම මූල්‍ය ප්‍රකාශනවල නිවැරදිව ගිණුම් ගත කළ යුතු අතර ගිවිසුම් ප්‍රකාරව ආදායම් උපයා ගැනීමටද කටයුතු කළ යුතුය.	ගිවිසුමේ කොන්දේසියක් අනුව බදු මුදල් වැවිලි කර්මන්ත අමාත්‍යංශය හරහා මහා භාණ්ඩාගාරයට ලබා දෙන බැවින් එම මුදල් මෙම ගිණුමට බැර නොවේ. සංස්ථාව සතු දේපළක අදායම සංස්ථා ගිණුමකට ඇතුලත් නොවීමේ ගැටළුව මත නැවත වතාවක් මේ සම්බන්ධයෙන් අවධානය යොමු කර ඇත.	වැවිලි අමාත්‍යාංශය හරහා මහා භාණ්ඩාගාරයට බදු මුදල් යවනු ඇත.
8	2023 වර්ෂයේදී සංස්ථාවට අයත් සියලුම වතුයායන්වල තේ	2023	අවම නිෂ්පාදන පිරිවැයක් යටතේ තේ අස්වැන්න හා ගුණත්වය ඉහළ	2021 වර්ෂයේ ආදායම් ලබන තේ ක්ෂේත්‍ර සඳහා ප්‍රමාණවත් පොහොර යෙදීම	නිෂ්පාදන පිරිවැය අවම කිරීමට හා තේ අස්වැන්න හා ගුණත්වය ඉහළ නංවා

අස්වැන්න 2022 වර්ෂයට සාපේක්ෂව සියයට 07 සිට සියයට 41 දක්වා පරාසයකින් අඩුවී තිබුණු අතර 2023 වර්ෂයේ රාජ්‍ය වැවිලි සංස්ථාවේ මුළු තේ අස්වැන්න කිලෝග්‍රෑම් 5,089,282 ක් වූ අතර එය 2022 වර්ෂයට සාපේක්ෂව සියයට 24 කින් පමණ පහළ යාමකි. එසේම 2023 වර්ෂයේදී තේ කිලෝග්‍රෑම් 9,170,548ක අස්වැන්නක් ලබාගැනීමට ඇස්තමේන්තු කර තිබුණද සියයට 55ක ඉලක්කයක් පමණක් ලඟාකරගෙන තිබුණි. බාහිර වැවිලිකරුවන් වෙත ලබාදී තිබූ භූමි ප්‍රමාණයෙන් තේ කිලෝග්‍රෑම් 940,151ක අස්වැන්නක් අපේක්ෂා කර තිබුණද සත්‍ය වශයෙන් ලබාගෙන තිබුණේ තේ කිලෝග්‍රෑම් 364,597 ක් පමණි. එය අපේක්ෂිත තේ අස්වැන්න හා	නංවා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.	හේතුකොට ගෙන 2022 වර්ෂයේ 2023 වර්ෂයට සාපේක්ෂව වැඩි දළු අස්වැන්නක් ලැබී ඇත. නමුත් මෙම තත්වය 2023 වර්ෂයේදි දළු අස්වැන්න ලබන ක්ෂේත්‍ර සඳහා අවශ්‍ය පොහොර ප්‍රමාණයෙන් ලබාදිම 20% ක ආසන්න ප්‍රමාණයකට සීමා වීම හේතුවෙන් සාපේක්ෂව සියළුම වතුයායන් වල තේ අස්වැන්න 7% සිට 41% දක්වා අවප්‍රමාණය වී ඇත. මෙම දළු අස්වැන්න අවප්‍රමාණය වීමට එම වතුයායන්වල පිහිටීම සහ මෝසම් වැසි ලැබෙන ආකාරය සහ වතුවල ඇති සශ්‍රීකත්වය විශේෂයෙන් බලපාන සාධකයක් වී ඇත.	ගැනීමට ගත් ක්‍රියාමාර්ග නිරීක්ෂණය නොවීය.

	සැසඳීමේදී සියයට 61ක අඩුවීමකි. සංස්ථාව සතු වතුයායන් 14න් වතු 13ක 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේදී තේ කිලෝග්‍රෑම් එකක නිෂ්පාදන පිරිවැය සියයට 03 සිට සියයට 444 දක්වා ඉහල ගොස් තිබුණි.				
9	සංස්ථාව සතු වතුයායන් 16න් 8ක්ම සමාලෝචිත වර්ෂයේදී අලාභ තත්ත්වයේ පැවති අතර ගෝමර හා කැලෑබොක්ක වතුයායන් 2022 වර්ෂයේ පිළිවෙලින් රු. 8,974,150ක හා රු. 31,396,561ක ලාභ ලැබුවද 2023 වර්ෂයේදී රු. 46,723,873ක හා රු. 16,805,293ක අලාභ ලබා තිබුණි. සංස්ථාවේ සේවක පිරිවැය මුළු පිරිවැය හා සැසඳීමේදී සියයට 50කට වැඩි අගයක් ගෙන තිබුණු අතර හෙයාපාර්ක් වතුයායේ සේවක පිරිවැය එහි මුළු පිරිවැයෙන් සියයට 98 ක්ද එහි විකුණුම් පිරිවැයට සාපේක්ෂව සියයට	2023	අවම නිෂ්පාදන පිරිවැයක් යටතේ තේ අස්වැන්න හා ගුණත්වය ඉහළ නංවා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.	ගෝමර තේ කර්මාන්තශාලාව නවීකරණය සඳහා වූ ප්‍රාග්ධන වියදම ද ඇතුලත්ව අලාභය ඉහළ ගොස් ඇත. කොටගහ හා විහාරගල යන වතුයායන් සංස්ථාව සතු අඩුම සශ්‍රීකභාවයකින් යුත් වතු වන අතර, තේ නිෂ්පාදනය සඳහා ලැබෙන අමු දළුවල ප්‍රමිතිය අඩුවීම හේතුවෙන්, 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේ විකුණුම් මිල (NSA) අඩුවී ඇත. ඒ අනුව, 2022 වර්ෂයට වඩා 2023 වර්ෂයේ අලාභය ඉහළ ගොස් ඇත.	ගෝමර හා කැලෑබොක්ක 2024 අගෝස්තු වන විට පිළිවෙලින් රු. 28,683,547 ක් හා රු. 34,964,561 ලාභ උපයා ඇත.

	112 ක් ගෙන තිබුණි. හුන්නස්ගිරිය, රංගල, හාගල හා වුඩ්සයිඩ් යන වතු යායන්හි සේවක පිරිවැය එම වතුයායන්වල මුළු පිරිවැයෙන් සියයට 80 කට වැඩි මට්ටමක පැවතීම වතුයායන්වල අලාභයට සෘජුවම බලපා ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය.				
10	කැලෑබොක්ක, මිඩ්ලන්ඩ්, රංගල හා ගෝමර තේ කර්මාන්ත ශාලාවන්හි වාර්ෂික නිමි තේ නිෂ්පාදනය සාමාන්‍ය ධාරිතාවය පිළිවෙලින් කිලෝග්‍රෑම් 706,452, 549,462, 549,462 ක් හා 423,871 ක් වුවද කැලෑබොක්ක තේ කර්මාන්ත ශාලා ධාරිතාවේ ඌන උපයෝජනය 2017 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වාම සියයට 43 කට වැඩි මට්ටමක පැවති අතර 2023 වර්ෂයේදී එය සියයට 94ක ඌන මට්ටමක පැවතුණි. රංගල හා මිඩ්ලන්ඩ්	2023	තේ දලු අස්වැන්න වැඩිකර ගැනීම තුළින් ධාරිතා උපයෝජනය වැඩි කර ගැනීමට කටයුතු කළ යුතුය.	2023 වර්ෂයේ පැවති අයහපත් කාලගුණය හා 2022 වර්ෂයේ රසායනික පොහොර තහනමට ලක්වීමෙන් අනතුරුව, පොහොර මිල සීඝ්‍රයෙන් ඉහළ යෑම හේතුවෙන් කර්මාන්තශාලාවන් වෙත ලැබුණු අමු දළු ප්‍රමාණය සැළකිය යුතු ප්‍රමාණයකින් අඩුවී ඇත.	තේ දලු අස්වැන්න වැඩිකර ධාරිතා උපයෝජනය ඉහළ නංවා ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නැත.

	කර්මාන්ත ශාලාවලද ධාරිතාවය සියයට 73 කට වැඩි ඌන මට්ටමක පැවතුණි.				
11	සංස්ථාව සතු මුළු වතුයායන්හි භූමි ප්‍රමාණය හෙක්ටයාර් 147,559 ක් වූ අතර වෙනත් ආයතන සඳහා නිදහස් කළ සහ සංස්ථාවේ පාලනයේ පවතින ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 141,900ක් පමණක් වූයෙන් ඉඩම් හෙක්ටයාර් 5,659ක් සම්බන්ධයෙන් කිසිදු සාක්ෂියක් ඉදිරිපත් නොවූ බැවින් එම ඉඩම්වල පැවැත්ම විගණනයට තහවුරු කරගත නොහැකි විය.	2023	සංස්ථාව සතු ඉඩම් තොරතුරු ඇතුළත් කර ඉඩම් ලේඛණයක් නඩත්තු කළ යුතුය.	වතු විශාල ප්‍රමාණයක් සංස්ථාව සතු වී ඇත්තේ ඉඩම් ප්‍රතිසංස්කරණ නීතිය යටතේ රජයට අත් පත් කර ගෙන ඉන් අනතුරුව ගැසට් මගින් සංස්ථාව සතු කර දීමෙනි. සංස්ථාව සතුව පවතින ඉඩම් තොරතුරු ඇතුලත් කල ලේඛනයක් (Land Register) නොමැත.	සංස්ථාව සතු ඉඩම් පිළිබඳ ලේඛනයක් මේ දක්වා සකස්කර නොමැත.
12	2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන පොදු ව්‍යාපාර සඳහා මාර්ගෝපදේශයේ 3.2 ඡේදය ප්‍රකාරව බඳවාගැනීම් හා උසස්කිරීමේ කාර්ය පටිපාටිය ප්‍රාථමික තනතුරුවලට හැර 2023 දෙසැම්බර් 31 දින වන විටත්	2023	බඳවා ගැනීම් හා උසස් කිරීමේ කාර්ය පරිපාටිය කඩිනමින් අනුමත කරවා ගැනීමට කටයුතු කළ යුතුය.	සංස්ථාව සඳහා සකස් කරන ලද බඳවා ගැනීම් හා උසස් කිරීමේ පරිපාටිය රේඛීය අමාත්‍යාංශය මගින් 2021 මාර්තු මස කළමනාකරණ සේවා දෙපාර්තුමේන්තුවට අනුමැතිය පිණිස යවා ඇත. එය නැවත සංශෝධනය කර 2022 ජනවාරි සහ 2023 මැයි මස රේඛීය	බඳවා ගැනීමේ හා උසස් කිරීමේ කාර්ය පටිපාටිය මේ දක්වා අනුමත කර නැත.

සංස්ථාව අනුමත කරවාගෙන නොතිබුණි.	අමාත්‍යාංශය මඟින් කළමනාකරණ සේවා දෙපාර්තුමේන්තුව වෙත යොමු කර ඇති අතර තනතුරු කාණ්ඩ වශයෙන් අනුමත කොට සංස්ථාව වෙත ලබාදීමට කටයුතු කරන බව දන්වා ඇත.

3.45 සංවර්ධන ලොතරැයි මණ්ඩලය

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	බදු පෙර ලාභය (අලාභය) රු.	මතය
2021	3,405,627,719	1,771,423,469	1,634,204,250	2,870,088,373	තත්ත්වාගණනය කළ
2022	3,610,533,182	1,931,966,403	1,678,566,779	3,210,687,041	තත්ත්වාගණනය කළ
2023	5,465,675,603	2,364,269,837	3,101,405,767	3,622,506,725	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1.	දැනට භාවිතා කරමින් පවතින කෑම කාමරය, ගබඩා කාමරය හා තාප්පය නැවත සකස් කිරීම සඳහා 2018 වර්ෂයේ දී වැය කරන ලද පිළිවෙලින් රු.1,336,676 ක්, රු.246,918 ක් හා රු.145,290 ක් වශයෙන් එකතුව රු.1,728,884 ක් කෙරීගෙන යන වැඩ ගිණුමේ ඇතුළත්ව තිබුණි. 2021 වර්ෂය අවසන් වන විටත් එම අයිතමයන් ප්‍රාග්ධනිත කර ක්ෂය කිරීමට කටයුතු කර නොතිබුණි.	2021	කාර්ය නිමකර වත්කම් ලෙස හඳුනා ගැනීමට කටයුතු කළ යුතු වීම.	සැලසුම් කරන ලද ඉදිකිරීම් සිදු කිරීමේ මූලික කටයුතු වෙනුවෙන් මෙම මුදල් වැය වී ඇත. නමුත් අවස්ථා කිහිපයකදී එම ඉදිකිරීම් සිදු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කළද විවිධ හේතුන් මත එය ඉටු කිරීමට නොහැකි වී ඇත. කෙසේ වෙතත් මෙම කෙරීගෙන යන වැඩ අවසන් කිරීම සඳහා මෙම වර්ෂයේ අයවැය තුළින්ද මුදල් වෙන් කිරීමක් සිදු කරන ලදී. නමුත් ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද 03/2022 චක්‍රලේඛයේ සඳහන් කර ඇති පරිදි	නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.

				අත්‍යවශ්‍ය නොවන ඉදිකිරීම් තාවකාලිකව අත්හිටුවන ලෙස දන්වා ඇත. ඒ අනුව මෙම වර්ෂයේද මෙම ඉදිකිරීම් සිදු කිරීමට නොහැකි වන අතර ඉහත චක්‍රලේඛය ලිහිල් කිරීමෙන් පසු අදාළ ඉදිකිරීම් කරනු ලැබේ.	
2.	මණ්ඩලය විසින් වොක්ෂෝල් වීදියේ අංක 234 දරන ගොඩනැගිල්ල 2006 ඔක්තෝබර් මාසයේ සිට කුලී පදනම මත ලබා ගැනීම සඳහා එළඹුණු ගිවිසුම ඒක පාර්ශිකව කඩ කර තිබුණි. මේ නිසා තැන්පතු මුදල ලෙස ගෙවූ රු.723,780 ක් හා එම වර්ෂයන් සඳහා ගෙවූ කුලී මුදලින් කොටසක් වන රු.4,976,220 ක යන මුදල්වල එකතුව වන රු.5,700,000 දැනට වර්ෂ 16 ක් මුළුල්ලේ අය කර ගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි.	2021	අදාළ මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතු වීම.	මෙම කරුණ සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමට මුදල් අමාත්‍යාංශය කමිටුවක් පත්කර තිබුණු අතර ඔවුන්ගේ නිර්දේශ ක්‍රියාත්මක කරන ලෙසට උපදෙස් ලබාදී තිබුණි.	අදාළ මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතු වීම.
3.	1990 වර්ෂයේ වෝඩ් පෙදෙසේ පුද්ගලයෙකු සමඟ ඇති කර ගෙන තිබූ කුලී ගිවිසුම ප්‍රකාරව	2021	අදාළ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම.	මෙම මුදල අයකර ගැනීම සඳහා සෘජු පාර්ශවකරු මේ වන විට මිය ගොස් ඇති බැවින් ඔහුගේ පුතා	අදාළ මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතු වීම.

	රු.2,520,000 ක ගොඩනැගිලි කුලී තැන්පතු මුදලක් අය කර දෙන ලෙස ඉල්ලා අවුරුදු 23 කට පෙර ගොනුකර තිබූ නඩුවේ තීන්දුව 2016 ජනවාරි 11 දින ලැබී තිබුණි. අදාළ මුදල අයකර ගන්නා ලෙස නඩු තීන්දුව ප්‍රකාශ වී වර්ෂ 06 කට ආසන්න කාලයක් ගත වී තිබුණත්, 2021 වර්ෂය අවසන් වන විටත් එම මුදල අයකර ගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි.			සහ බිරිඳ මෙම නඩුවට සම්බන්ධ කර ගැනීම සිදුකර ඇති අතර ඔවුන් වෙත මෙම මුදල ගෙවන ලෙස එන්තර වාසියක් නීතිපති දෙපාර්තමේන්තුව මගින් යොමු කර ඇත.	
4.	මණ්ඩලය විසින් 2012 වර්ෂයේ දී චිත්‍රාගාරයක් ඉදිකිරීම සඳහා රු.38,752,448 ක් වැය කර තිබුණි. 2021 වර්ෂය අවසන් වන විටත් චිත්‍රාගාරයක් ඉදිකිරීමෙන් අපේක්ෂා කළ අරමුණු ඉටු නොකර එය නිෂ්ක්‍රියව පැවැතුණි.	2021	අපේක්ෂා කරන අරමුණු ඉටුවන පරිදි පිරිවැය ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම.	දැනට ස්ථාපිත කර ඇති චිත්‍රාගාරය තුළින් එම අරමුණ ඉටු කර ගැනීමට තව දුරටත් විශාල පිරිවැයක් දැරීමට සිදු වන්නේ දැයි තහවුරු කර ගැනීමට පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණයක් සිදු කර ගැනීම සඳහා ජාතික රූපවාහිනී සංස්ථාවෙන් වාර්තාවක් ලබා ගන්නා ලදී .එම වාර්තාවේ සඳහන් නිරීක්ෂණ 2021.01.29 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කළ අතර, ඉදිකර ඇති චිත්‍රාගාරය	මෙම චිත්‍රාගාරය තුළ රූපවාහිනී ලොතරැයි දිනුම් ඇදීමේ වැඩසටහන් පටිගත කිරීම පූර්ණ පහසුකම් නොමැති බැවින් මෙම චිත්‍රාගාරය ශ්‍රවනාගාරයක් ලෙස පවත්වාගෙන යයි.

				ශ්‍රවනාගාරයක් ලෙස පවත්වා ගැනීමට කටයුතු කරනු ලබයි.	
5.	සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ආරම්භයේ සිටම පරිපාලන හා මෙහෙයුම් කටයුතු සම්බන්ධව කාර්ය පරිපාටි සංග්‍රහයක් සකස් කර නොතිබුණු අතර එම කාර්යය සඳහා 2016 වර්ෂයේදී සුදුසුකම්ලත් අයෙකු පත්කර තිබුණි. අදාළ පාර්ශවය විසින් පවත්නා නීති රීති අධ්‍යයනය කර අදාළ කාර්යය පරිපාටි සංග්‍රහය පිළියෙල කර 2019 ඔක්තෝබර් 14 දින සංවර්ධන ලොතරැයි මණ්ඩලයට භාරදී තිබුණි. මෙම කාර්යය වෙනුවෙන් රු.4,500,000 ක් අදාළ පාර්ශවයට ගෙවීමට එකඟ වී තිබුණු අතර ඉන් රු.1,700,000 ක් මේ වන විට ගෙවා තිබුණි. ඔහු විසින් අදාළ කාර්යය පරිපාටි සංග්‍රහය කොටස් දෙකකින් යුතුව මණ්ඩලය වෙත ඉදිරිපත් කර තිබුණද මණ්ඩලයේ දැනට පවතින ක්‍රමවේදයට	2021	පනත අනුව මණ්ඩලයට අවශ්‍ය රෙගුලාසි සකස් කර අනුමත කර ගත යුතු වීම.	මණ්ඩලය දැනට පවතින ක්‍රමවේදයට අනුකූල නොවන ලෙස මෙම කාර්යය පටිපාටි සංග්‍රහය සකස් කර ඇති බවට තීරණය කර අදාළ පාර්ශ්වයට මුදල් ගෙවීම අත්හිටුවා ඇත.	නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.

	අනුකූල නොවන ලෙස මෙම කාර්යය පරිපාටි සංග්‍රහය සකස් කර ඇති බවට හේතු දක්වා ඉතිරි මුදල ගෙවීම අත්හිටුවා තිබුණි. තවද මෙම කාර්යය සඳහා අත්සන් කරන ලද ගිවිසුමේ සඳහන්ව තිබූ “ලොතරැයි හා දිනුම් ඇදීමේ කටයුතු, අභ්‍යන්තර පාලනය සහ විගණන කටයුතු” සඳහා වූ රීතින් සකස් කිරීම යන කාර්යයන් අත්හිටුවන ලෙස මණ්ඩලය විසින් එය සකස් කළ පාර්ශවය වෙත දන්වා තිබුණි. ඒ අනුව අදාළ කාර්යය මේ වන තෙක් නිමවී නොතිබුණු අතර ඒ සඳහා වැයකර තිබූ මුදල සකසුරුවම් නොවූ ගනුදෙනුවක් බව නිරීක්ෂණය විය.				
6.	කොරෝනා වැනි ව්‍යසන කාලපරිච්ඡේදවලදී භෞතිකව ටිකට්පත් අලෙවි කිරීමේ දුෂ්කරතාවයට යම් විසඳුමක් ලෙස E ටිකට්පත් සංකල්පය යොදා ගෙන තිබුණි. නමුත් 2021 වර්ෂයේ දී එක් එක් ලොතරැයියෙන්	2021	E ලොතරැයිපත් වෙළඳපොලට හඳුන්වාදී අලෙවිය වැඩි කිරීමට කටයුතු කළ යුතු වීම.	මෙම App එක අපගේ ඉලක්ක පාරිභෝගික ජනතාවට හුරු කර වීම සඳහා ඔවුන් වෙත ගොස් එම යෙදවුම ජංගම දුරකථනවලට සෘජුවම ඇතුළත් කළ යුතුය. ඒ සඳහා රටේ පැවති සෞඛ්‍ය වාතාවරණය	නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.

	අලෙවි කළ මුළු ලොතරැයිපත් ප්‍රමාණයෙන් සසිරි ලොතරැයිපත් වලින් සියයට 0.2 ක්ද, ලග්න වාසනා ලොතරැයියෙන් සියයට 0.2 ක්ද, සුපර්බෝල් ලොතරැයියෙන් සියයට 0.3 ක්ද, ශනිදා වාසනාව ලොතරැයියෙන් සියයට 0.2 ක් වශයෙන් E ලොතරැයි පත් අලෙවිය අඩු ප්‍රතිශතයක් වාර්තා වී තිබීම නිසා E ටිකට්පත් සංකල්පය අසාර්ථක වී තිබුණි.			තර්ජනයක්ව තිබුණි. එබැවින් මෙම යෙදවුම තවදුරටත් ජනතාව අතර ප්‍රචලිත කිරීමේ ප්‍රායෝගික ගැටලුවක් පැවතුණි.	
7.	2019 දෙසැම්බර් 17 දිනැති අංක 08/2019 දරණ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තු චක්‍රලේඛය ප්‍රකාරව රාජ්‍ය සංස්ථා ඇතුළු රාජ්‍ය ආයතන www.promise.lk වෙබ් අඩවිය යටතේ හඳුන්වා දී ඇති විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රමවේදය (e – GP) යටතේ ලියාපදිංචි විය යුතු වුවත්, සංවර්ධන ලොතරැයි මණ්ඩලය මෙම ක්‍රමවේදය යටතේ ලියාපදිංචි වී නොතිබුණු ඒ අනුව ප්‍රසම්පාදන කටයුතු සිදුකර නොතිබුණි.	2022	අදාළ චක්‍රලේඛ විධිවිධානය අනුව කටයුතු කළ යුතු වීම.	මේ වන විට මෙම ආයතනය විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රමවේදය (e – GP) සඳහා ලියාපදිංචියට ඉල්ලුම් කොට ඇත. එම ලියාපදිංචිය සිදු කිරීමෙන් පසුව මෙම ආයතනයට එකී විද්‍යුත් ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කිරීමේ හැකියාව ඇත.	අදාළ චක්‍රලේඛ විධිවිධානය අනුව කටයුතු කළ යුතු වීම.

8.	හිටපු සභාපතිවරයෙකු විසින් පෞද්ගලික ආයතනයකින් රැගෙන ගොස් තිබුණු කැබ් රථයක් වෙනුවෙන් එම ආයතනය වෙත කැබ් රථයේ වටිනාකම සහ එම මුදලට අදාළ නෛතික පොලිය ලෙස රු.14,923,369 ක් සහ නීතිඥ ගාස්තු ලෙස රු.245,000 ක් වශයෙන් එකතුව රු.15,168,369 ක් මණ්ඩලය විසින් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් මණ්ඩලය විසින් පැවරූ නඩුව 2022 වර්ෂය අවසානය දක්වාම අවසන් වී නොතිබුණු අතර, මේ සම්බන්ධයෙන් මණ්ඩලය වෙනුවෙන් පෙනී සිටින ලද නීතිඥයන් වෙත රු.1,674,185 ක් ද මණ්ඩලය විසින් ගෙවා තිබුණි. ඒ අනුව මෙම සිදුවීම සම්බන්ධයෙන් 2022 වර්ෂය අවසානය දක්වා මණ්ඩලය දරා තිබුණු මුළු වියදම රු.16,842,554 ක් විය.	2022	නීති ක්‍රියාමාර්ග තුළින් මණ්ඩලයට වූ මූල්‍යමය පාඩුව අදාළ පාර්ශ්වයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම.	මණ්ඩලයට මිලදී ගන්නා ලද WP-PB 6024 කැබ් රථයක් හිටපු සභාපතිවරයෙකු රැගෙන ගොස් තිබීම නිසා වාහනය මිලදී ගත් ආයතනයට මණ්ඩලය මුදල් නොගෙවීම නිසා එම පෞද්ගලික ආයතනය විසින් සංවර්ධන ලොතරැයි මණ්ඩලයට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම හේතුවෙන් මණ්ඩලය විසින් එම ආයතනයට රු.15,168,367 මුදලක් ගෙවීමට සිදු විය. එම නිසා කැබ් රථයේ වටිනාකම, නෛතික පොලිය, අදාළ ආයතනයෙන් දැරූ නීතිඥ ගාස්තු හා මණ්ඩලයේ නීතිඥ ගාස්තුව ලෙස රු.1,674,185 අලාභයක් මණ්ඩලයට සිදුව ඇත. මෙම මුදල අය කර ගැනීම සඳහා අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග නීතිපති දෙපාර්තමේන්තුවේ මගපෙන්වීම යටතේ ගෙන ඇති අතර මෙම නඩුවට අදාළ පලමු අධිකරණ දිනය 2022 මැයි 06 දින පැවති අතර, දෙවන අධිකරණ දිනය වශයෙන්	මේ සම්බන්ධයෙන් අධිකරණ ක්‍රියාමාර්ග ගෙන ඇති අතර අදාළ නඩුව 2025 මැයි 20 දින දක්වා කල් තබා ඇත.

				2023 අප්‍රේල් 07 වන දින පැවැත්විණි.	
9.	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 2 අනුව තොගය, පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වුවද 2023 දෙසැම්බර් 31 දින භෞතිකව ගබඩාවේ නොතිබූ පිරිවැය රු.443,609 ක් වූ ශුද්ධ උපලබ්ධි අගයක් නොමැති ක්ෂණික ලොතරැයිපත් 2883 ක තොගයක් ගැණුම් පිරිවැයට අවසන් තොගයේ ඇතුලත් කර තිබීම නිසා රඳවාගත් ඉපයුම් සංචිතය සහ ක්ෂණික ලොතරැයිපත් අවසන් තොගය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.	2023	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අනුව කටයුතු කිරීම.	ලොතරැයි ටිකට්පොත් සඳහා ප්‍රායෝගිකව ශුද්ධ උපලබ්ධි අගයක් නොමැති බැවින් ලොතරැයි ටිකට්පත් මිලට ගැනුම් පිරිවැයට අගය කර ඇත.	නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.
10.	**1997 අංක 20 දරන සංවර්ධන ලොතරැයි මණ්ඩල පනත**				
	i. 17 (5) වගන්තිය ත්‍යාගලාභීන් හිමිකම් නොපෑ, මාස 06 ක කාලසීමාව ඉකුත් වූ ත්‍යාග සඳහා මිලදීගත් භාණ්ඩ විකිණීමෙන් ලැබෙන මුදල	2023	සංවර්ධන ලොතරැයි මණ්ඩල පනත අනුව කටයුතු කළ යුතුය.	2018 හා 2020 යන වර්ෂ වල සුපර්බෝල් සහ කෝටිපති ශනිදා ලොතරැයිපත් වල දිනුම් ඇදීමේ ත්‍යාග වශයෙන් මිලදී ගත් යතුරු පැදි 03 අපහරණය කර එම	සංවර්ධන ලොතරැයි මණ්ඩල පනත අනුව කටයුතු කර නොමැත.

	පළමු කොට අරමුදලටද, ඉන් පසුව ජනාධිපති අරමුදලටද බැරකල යුතු වුවත්, 2018 සහ 2020 වර්ෂයේදී ත්‍යාග වශයෙන් ලබාදීමට මිලදී ගත් එකතු වටිනාකම රු.779,750 ක්වූ යතුරු පැදි තුනක් අලෙවි කර එම පනත ප්‍රකාරව යෙදවීමට 2022 වර්ෂයේ මැයි 31 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබාදී තිබුණද, අදාල කටයුතු වර්තමානය වන විටත් සිදුකර නොතිබුණි.			මුදල් ජනාධිපති අරමුදලට යොමු කිරීමට 2022 මැයි 31 වන දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අනුමැතිය හිමි විය. ඒ අනුව මෙම යතුරුපැදි 03 විධිමත් පරිදි නැවත තක්සේරු කිරීම සඳහා කමිටුවක් පත් කර ඇති අතර තක්සේරු කිරීමෙන් අනතුරුව ඉදිරි මාස 02ක කාලය තුළ විධිමත් අපහරණ ක්‍රියාවලියකට භාජනය කර එම අරමුදල් ජනාධිපති අරමුදලට යොමු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ඇත.	
ii.	19 (1) හා 19 (2) වගන්ති නියමිත යැයි මේ පනතින් ප්‍රකාශිත හෝ බලය දී ඇති සියලු කාරණා සම්බන්ධයෙන් මණ්ඩලය විසින් රීති සෑදිය යුතු වුවද එසේ කටයුතු කර නොතිබුණි.	2023	සංවර්ධන ලොතරැයි මණ්ඩල පනත අනුව කටයුතු කළ යුතුය.	දැනට කෙටුම්පත් කරන ලද රීතීන් ඇතුලත් ලේඛණය අධ්‍යක්ෂ මණ්ඩලයට යොමු කර ඇති අතර එහි පරිගණක පද්ධතියට අදාල රීතීන්, කොළඹ විශ්ව විද්‍යාලයේ පරිගණක අංශය මගින් තහවුරු කර ඇති අතර තවදුරටත් මණ්ඩලයේ අංශ අතර කටයුතු පිළිබඳ ඇතුලත් විය යුතු	සංවර්ධන ලොතරැයි මණ්ඩල පනත අනුව කටයුතු කර නොමැත.

				කරුණු ඇතුලත් කර සංශෝධනය කරන ලද කෙටුම්පත ඉදිරියේදී අධ්‍යක්ෂ මණ්ඩලයට යොමු කිරීමට යෝජිතය.	
11.	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 වගන්තිය ප්‍රකාරව 2023 වර්ෂය සඳහා සවිස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.	2023	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන මත කටයුතු කළ යුතුය.	එක් එක් ප්‍රසම්පාදන අයිතමයට අදාල අදියරයන් නිරන්තරයෙන් සංශෝධනය වන බැවින් සවිස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.
12.	රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 2015 මැයි 25 දිනැති අංක PED/1/2015 දරන චක්‍රලේඛයේ 2.3 ඡේදය ප්‍රකාරව නිල වාහන හිමිකම් නොමැති නිලධාරීන් පස් දෙනෙකු සඳහා නිල වාහන සපයා දී තිබූ අතර ඒ වෙනුවෙන් ඉන්ධන වියදම් ලෙස 2023 වර්ෂයේදී එකතුව රු.2,913,410 ක වියදමක් දරා තිබුණි.	2023	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.	2023 ජූලි 09 දිනැතිව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් යොමු කර ඇති ලිපිය ප්‍රකාරව කටයුතු කිරීම සඳහා ජාතික ලොතරැයි මණ්ඩලය අනුගමනය කරන ක්‍රමවේදයට සමාන ක්‍රමවේදයක් සංවර්ධන ලොතරැයි මණ්ඩලයද අනුගමනය කරමින් සහකාර සාමාන්‍යාධිකාරිවරුන්ට ප්‍රවාහන පහසුකම් ලබා දීමට අවශ්‍ය වන අනුමැතිය ලබා ගැනීම සඳහා 2024 මැයි මාසයේ 20 වන	නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.

				දින පැවැත්වෙන 294 අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් යොමු කරන ලදී. ඒ අනුව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් ලබා දී ඇති උපදෙස් අනුව සකස් කල අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව සඳහා අනුමැතිය හිමි වූ අතර එම නව ක්‍රමවේදය 2024 ජූනි මස සිට ක්‍රියාත්මක කරනු ඇත.	
13.	2016 මැයි 30 දිනැති අංක 04/2016 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය ප්‍රකාරව නිල වාහන හිමිකමක් නොමැති නිලධාරිනියකට මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ මණ්ඩලය විසින් ලබාගත් මෝටර් රථයක් ලබාදී තිබූ අතර එම මෝටර් රථය සඳහා 2023 වර්ෂයේදී මෙහෙයුම් කල්බදු කුලී ලෙස රු.2,028,000 ක් ගෙවා තිබුණි.	2023	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.	මණ්ඩලයේ මෝටර් රථවල පවතින හිඟතාවය හේතුවෙන් මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ මෝටර් රථ 03 ක් ලබාගෙන ඇත. එම මෝටර් රථ අතුරින් මෝටර් රථ 02ක් සාමාන්‍යාධිකාරි හා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවර යෙකුට අනුයුක්ත කර ඇත.	නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.
14.	1997 අංක 20 දරන සංවර්ධන ලොතරැයි මණ්ඩල පනතේ 17 (5) වගන්තිය අනුව සංවර්ධන	2023	දිනුම් අදින ලද දිනයේ සිට මාස 6 ඉක්මවූ ලොතරැයිපත් සඳහා ත්‍යාග	මෙවැනි ආකාරයේ ඉදිරියේදී ගෙවීම් සිදු කිරීමට අවශ්‍යය වුවහොත් සභාපති/ අධ්‍යක්ෂ මණ්ඩල	නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.

ලොතරැයියක ත්‍යාගලාභීන් නිශ්චය කරනු ලැබූ දින සිට ගණන් බලනු ලැබූ මාස 06 කාලසීමාවක් ඉකුත්වීමෙන් පසුව , ඒ ලොතරැයියේ ඒ ත්‍යාගයට හිමිකම් ලබනු තැනැත්තා සොයා ගැනීමට නොහැකි වීමේ හේතුවෙන් ඒ ලොතරැයියේ ප්‍රදානය කර නොමැති යම් ත්‍යාගයක් ,රජය සන්තක විය යුතු අතර ඉන්පසු එය ජනාධිපති අරමුදලට බැර කල යුතු වුවද සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සහකාර සාමාන්‍යාධිකාරීවරය කුට අයත් මාස 06ක කාලසීමාව ඉකුත්වූ වර්ග 05ක ලොතරැයිපත් 27කට හිමි එකතුව රු.11,000 ක් වූ ත්‍යාග මුදල් ගෙවා තිබුණි .තවද මණ්ඩලයේ ලොතරැයි කළමනාකරණ පද්ධතියට දිනුම් අදින ලද දින සිට මාස 06ක වලංගු කාලය ඉක්මවූ ලොතරැයි පරිලෝකණය කිරීමේදී අවලංගුවූ ලොතරැයියක් ලෙස ප්‍රතික්ෂේප කරනු	මුදල් නොගෙවීමට හැකි වනසේ අභ්‍යන්තර පාලන ක්‍රමය ශක්තිමත් කළ යුතු වීම සහ සංවර්ධන ලොතරැයි මණ්ඩල පනත අනුව කටයුතු කිරීම.	විශේෂ අනුමැතියකින් තොරව සිදු කිරීමට නොහැකි වන සේ අභ්‍යන්තර පාලන ක්‍රමවේද ශක්තිමත් කර ඇත.

	ලැබුවද මෙම ලොතරැයිපත් 27 සඳහා ගෙවීම් කිරීමට හැකිවන ලෙස පරිගණක පද්ධතියද වෙනස්කිරීමට කටයුතු කර තිබුණි.				
15.	සංවර්ධන ලොතරැයි මණ්ඩලය තුල ලොතරැයි මෙහෙයුම් හා කළමනාකරණ ක්‍රියාවලිය බාහිර සේවා සැපයුම් ආයතනයක් තුලින් සිදුවන බැවින් ලොතරැයි කළමනාකරණ මෘදුකාංග පද්ධතියක් නිර්මාණය කිරීම හා ස්ථාපනය කිරීම, කාර්ය මණ්ඩලය පුහුණු කිරීම සඳහා සුදුසු සැපයුම්කරුවකු තෝරාගැනීම සඳහා අවශ්‍ය ලංසු ලියවිලි පිළියෙල කිරීමේ කටයුතු 2020 ජූලි මස ආරම්භ කර තිබූ අතර 2023 වර්ෂයේ අවසානය වන විටත් එම කටයුතු අවසන්වී නොතිබුණි. මේ නිසා 2020 වර්ෂයේ සිට 2023 වර්ෂයේ අවසානය දක්වා මාසික සේවා ගාස්තු සියයට 68 ක වැඩිවීම් සහිතව සේවා ගිවිසුම් කාලය දීර්ඝ කරමින් තරඟකාරී ටෙන්ඩර් පරිපාටියෙන් බැහැරව මෘදුකාංග	2023	ලොතරැයි කළමනාකරණ මෘදුකාංග පද්ධතියක් නිර්මාණය කර ස්ථාපනය කර කාර්ය මණ්ඩලය පුහුණු කිරීම සඳහා සැපයුම්කරුවකු තෝරාගැනීමේ ක්‍රියාවලිය වසර 03 කට අධික කාලයක් ගත වුවද අවසන්ව නොමැති බැවින් එය කඩිනමින් කළ යුතුය.	මණ්ඩලයට ලොතරැයි කළමනාකරණ මෘදුකාංග පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා 2019 වර්ෂයේදී සිදු කල ප්‍රසම්පාදනයට අදාල විෂය පථය සංශෝධනය කොට නැවත ලංසු කැඳවීමට 2020 වර්ෂයේදී අධ්‍යක්ෂක මණ්ඩලය තීරණය කර තිබුණි. ඒ අනුව මෙම ආයතනයට , සම්පූර්ණ වශයෙන් මණ්ඩලයට හිමිකාරීත්වය ලැබෙන පරිදි (With Source Cord) ලොතරැයි කළමනාකරණ මෘදුකාංග පද්ධතියක් නිර්මාණය කිරීම හා ඒ සඳහා තෝරාගනු ලබන සැපයුම් ආයතනය විසින් මෘදුකාංග පද්ධතිය ස්ථාපිත කිරීමෙන් පසු දෛනිකව එහි මෙහෙයුම් ක්‍රියාවලිය ඉටු කිරීම	නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.

	සේවා සැපයුම් සමාගමක් තෝරාගෙන ලොතරැයි මෙහෙයුම් හා කළමනාකරණ මෘදුකාංග සේවා ලබාගැනීම නිසා 2020 වර්ෂයේ සිට 2023 වර්ෂයේ අවසානය දක්වා රු.73,221,351 ක් ගෙවා තිබුණි.			මණ්ඩලයේ කාර්යය මණ්ඩලය සමඟ ඒකාබද්ධව සිදු කිරිම මෙම විෂය පථයට ඇතුලත් විය. ඒ අනුව එම මෘදුකාංග පද්ධතිය පිළිබඳව මණ්ඩලයේ කාර්යය මණ්ඩලය, සේවා ආයතනයේ නිලධාරින් සමඟ එක්ව කටයුතු කිරීමේදි එහි සියළුම ක්‍රියාවලීන් පිළිබඳව මණ්ඩලයේ කාර්යය මණ්ඩලයට අවබෝධයක් ලැබෙන බැවින් එලෙස විෂය පථයට නිශ්චය කර තිබුණි. කෙසේ වෙතත් ලොතරැයි කළමනාකරණ මෘදුකාංග පද්ධතිය ස්ථාපිත කිරිම හා මෙහෙයුම් කටයුතු සඳහා භාවිත කිරිම ඊට ගැලපෙන සුදුසුකම්ලත් තොරතුරු තාක්ෂණ වෘත්තීයවේදීන්ගෙන් සමන්විත සිදුකල යුතු කාර්යයක් බැවින් ඉහත විස්තර දක්වා ඇති පරිදි මීට අදාලව ඉදිරි කටයුතු සිදු කිරිමට බලාපොරොත්තුවන බව ද දන්වා සිටිමි.	
16.	සංවර්ධන ලොතරැයි මණ්ඩලය සහ මෘදුකාංග සේවා	2023	මෘදුකාංග සේවා සැපයුම් සමාගම සමඟ ඇති	මේ සම්බන්ධයෙන් ඉදිරියේදී කටයුතු කිරිමට අදහස් කර	නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.

	සැපයුම් සමාගම අතර 2009 අගෝස්තු 18 දින ඇතිකරගත් ගිවිසුම ප්‍රකාරව මෘදුකාංග සේවා සැපයුම් සමාගම ලබාදෙන සේවාවන් සම්බන්ධ පද්ධති විගණනයක් සිදුකිරීමට මණ්ඩලයට බලය ලැබී තිබුණද මණ්ඩලය විසින් ඒ සම්බන්ධව කටයුතු කර නොතිබුණි.		කරගත් ගිවිසුම ප්‍රකාරව කළ යුතුය.	ඇත. දැනට LMS මඟින් ලබාගෙන ක්‍රියාත්මක වන තොරතුරු තාක්ෂණ පද්ධතිය වෙනුවට නව තොරතුරු තාක්ෂණ පද්ධතියක් ලබාගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුලින් තෝරා ගැනීමට මූලික කටයුතු මේ වන විටත් සිදු කර ඇති බැවින් හා තොරතුරු තාක්ෂණ පද්ධතිය විගණනය සඳහා දැරීමට සිදු වන විශාල පිරිවැය පිළිබඳ සලකා බලා ඉදිරියේදී මේ පිළිබඳව තීරණ ගැනීමට යෝජිතය.	
17.	රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරණ මෙහෙයුම් කාර්ය සංග්‍රහය අනුව රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව අනුමත කරන ලද දිරිදීමනා ගෙවීමේ පටිපාටියකින් තොරව සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් 2023 වර්ෂය තුලදී එකතුව රු.105,739,646 ක මුදලක් දිරි දීමනා ලෙස කාර්ය මණ්ඩලයට ගෙවා තිබුණි.	2023	දිරි දීමනා ගෙවීම සඳහා නිසි කාර්ය පටිපාටියක් සකස් කර රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබාගැනීම කළ යුතුය.	මණ්ඩලය විසින් දිරිදීමනාව ගෙවීමේ ක්‍රමවේදය ඇතුලත් නව ක්‍රමවේදයක් සකස් කර 2024 මැයි 20 වන දින පැවති 294 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලද අතර ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය හිමි වූ අතර ඉදිරියේදී ඒ සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරනු	නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.

				ඇත.	
18.	ඒ ඒ කාර්ය මණ්ඩල සාමාජිකයාගේ රාජකාරී ස්වභාවය, පළපුරුද්ද සහ කාර්ය සාධනය වැනි සාධක පිළිබඳ ඇගයීම සඳහා අවශ්‍ය නිර්ණායක ඇතුලත් කර දිරිදීමනා ගෙවීමේ ක්‍රමවේදයක් සකස්කිරීම සුදුසු වුවද මාසයකට රජයේ වැඩකරන දින 18 ක් රාජකාරී කල යුතුවීම යන නිර්ණායකය මත පමණක් පදනම්ව කාර්ය මණ්ඩලයට දිරිදීමනා ගෙවීම් කර තිබුණි.	2023	කාර්යය මණ්ඩල සාමාජිකයන්ගේ කාර්යය සාධනය ඇගයීමට අවශ්‍ය නිර්ණායක ඇතුලත් කර දිරි දීමනා ක්‍රමයක් ස්ථාපිත කළ යුතුය.	2024 මැයි 20 වන දින පැවති 294 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම සඳහා දිරිදීමනාව ගෙවීමේ ක්‍රමවේදය සම්බන්ධව සකස් කල අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කර ඇති අතර ඉදිරියේදී ඒ අනුව කටයුතු කිරීම සිදු කරනු ලැබේ.	නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.
19.	2020 වර්ෂයේදී අස්ථානගතවී ඇති බවට සලකා තිබූ ක්ෂණික ලොතරැයි ටිකට් පොත් 2945 ක් වෙනුවෙන් මණ්ඩලයට ලැබිය යුතු රු.2,673,875 ක මුදල අයකර නොගැනීම සම්බන්ධව 2023 වර්ෂයේදී මූලික විමර්ශනයක් පවත්වා තිබූ අතර ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ, XLVIII වැනි පරිච්ඡේදයේ 13.2	2023	ලැබිය යුතු මුදල් අයකර ගැනීමට අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගත යුතුය.	අස්ථානගත වී ඇති ක්ෂණික ලොතරැයි ටිකට් පොත් 2945 න් ටිකට් පොත් 2471 ක් යම් පාර්ශවයක් ඉල්ලුම කල බවට හෝ යම් පාර්ශවයකට නිකුත් කල බවට හෝ භාර ගත් බවට සඳහන් කිසිදු ලියවිල්ලක් සොයාගැනීමට නොහැකි වී ඇත. එමෙන්ම දැනට අය විය යුතු යැයි හඳුනා ගෙන ඇති පාර්ශවයන්ගෙන් මෙම මුදල් අය කර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග	නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.

වගන්තිය අනුව මූලික විමර්ශනයක් පවත්වා මාස දෙකක් තුල අවසන්කළ යුතුවන අතර අමතර කාලය අවශ්‍ය වන්නේනම් ප්‍රමාණවත් පිළිගත හැකි හේතු ඉදිරිපත්කර කාලය දීර්ඝ කරගත යුතු වුවද මූලික විමර්ශය අවසන් කිරීමට මාස 30 කට අධික කාලයක් ගෙන තිබූ අතර කාල ප්‍රමාදය සඳහා විමර්ශන නිලධාරියා විසින් ප්‍රමාණවත් පිළිගත හැකි හේතු ඉදිරිපත්කර කාලය දීර්ඝ කරගැනීමක්ද සිදුකරගෙන නොතිබුණි. එසේම නිශ්චිත ක්‍රමවේදයක් නොමැතිව එම විමර්ශන නිලධාරියා තෝරාගෙන තිබූ අතර 2014 මැයි 30 දිනැති අංක 14/2014 දරණ මූලික විමර්ශන සඳහා ගෙවීම් කිරීමට අදාළ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ ප්‍රතිපාදන අනුව ගෙවීම් කලයුතු වුවද 2018 ජූලි 31 දිනැති අංක 18/2018 දරණ විනය පරීක්ෂණ සඳහා ගෙවීම් කිරීමට අදාල රාජ්‍ය පරිපාලන

ගැනීමට කටයුතු කර ඇති බැවින් අස්ථානගත වී ඇති ලොතරැයි ටිකට්පොත් වලින් සැලකිය යුතු මුදලක් අය කර ගැනීමට හැකියාව ලැබෙනු ඇත.

	චක්‍රලේඛයේ උපරිම රේටයන් සාවද්‍ය ලෙස යොදාගනිමින් එකතුව රු.683,971 ක් 2023 වර්ෂයේදී ගෙවා තිබුණි. අස්ථානගත වී ඇති බවට සැලකිය හැකි ටිකට් පොත් 2945 න් ටිකට් පොත් 2471 ක් යම් පාර්ශවයක් ඉල්ලුම් කල බවට හෝ යම් පාර්ශවයකට නිකුත් කල බවට හෝ භාරදුන් බවට හෝ ලිඛිත සාක්ෂි සංවර්ධන ලොතරැයි මණ්ඩලය සතුව නොතිබීම නිසා ක්ෂණික ලොතරැයි ටිකට් පොත් සඳහා අයවිය යුතු මුදලින් සියයට 83 ක් වූ රු.2,191,785 ක මුදල අයකර ගැනීමට නොහැකිවී තිබුණි.				
20.	2023 වර්ෂයේ දෙසැම්බර් 01 දින සිට දෙසැම්බර් 10 දින දක්වා දිනුම් අදින ලද කප්රුක ලොතරැයිපත් මුද්‍රණය කිරීමේදී එහි සුපිරි ජයමල්ල වූ රු.මිලියන 470 ක මුදල ලොතරැයිපතේ මුහුණත දකුණුපස ඉහල කෙලවරේ චිත්‍ර සටහනේ "සිහින ජයමල්ල රු.ලක්ෂ 47000 ක් " ලෙස	2023	මුද්‍රණ දෝෂ සහිත ලොතරැයි ටිකට්පත් වෙළඳපලට නිකුත් කිරීමට පෙර ඒවා හඳුනාගැනීමට පත්කල නිලධාරීන් විසින් නිසිලෙස රාජකාරී ඉටුනොකිරීම සම්බන්ධව විනයානුකූලව කටයුතු කළ	මේ සඳහා 2023 දෙසැම්බර් 06 දින පුවත්පත් දැන්වීම් කිහිපයක් මගින් පාරිභෝගික ජනතාව වෙත දැනුවත් කිරීම තුලින් නිවැරදි කිරීමක් සිදු කරන ලදී.ඉදිරියේදි මෙවැනි අතපසුවීම මගහරවා ගැනීමට අභ්‍යන්තර පාලන ක්‍රමය ශක්තිමත් කර ඇත.	නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.

දෝෂ සහිතව මුද්‍රණය කර තිබූ අතර කෙටුම්පත් කලා ආකෘති (Art Work) සහ මුද්‍රිත ලොතරැයිපත් නියැදි පරීක්ෂා කිරීම සඳහා මණ්ඩලය විසින් ස්ථාපනය කර තිබූ අභ්‍යන්තර පාලන ක්‍රමවේදයේ පැවති දුර්වලතාවයන් සහ මුද්‍රණ දෝෂ හඳුනාගැනීම සඳහා පත්කර තිබූ අලෙවිකරණ අංශයේ නිලධාරීන් සහ තත්ව පරීක්ෂණ මණ්ඩලයේ නිලධාරීන් විසින් මෙම දෝෂයන් හඳුනාගැනීමට අපොහොසත් වීම යන කරුණු නිසා මුද්‍රණ දෝෂ සහිත ලොතරැයිපත් 4,392,010 ක් වෙළඳපොලට නිකුත්කර තිබුණි. තවද මෙම මුද්‍රණ දෝෂය සහ එය නිවැරදි විය යුතු ආකාරය පිළිබඳව පාරිභෝගිකයා දැනුවත් කිරීම සඳහා පුවත්පත් දැන්වීම් පලකිරීම වෙනුවෙන් රු.22,873 ක මුදලක් මණ්ඩලයට දැරීමට සිදුවී තිබුණි.	යුතුය.

21.	සුපිරි ධන සම්පත ලොතරැයිය දිනුම් ඇදීමේ කටයුතු පරිගණක මෘදුකාංගයක් භාවිතා කරමින් ජාතික රූපවාහිනී පරිශ්‍රයේ චිත්‍රාගාරයෙන් පිටත ඇති කාමරයක් තුළදී සිදුකරනු ලබන අතර රූපවාහිනිය මඟින් විකාශනය කිරීමේදී දිනුම් අදින ලද සත්‍ය ආකාරය නොපෙන්වා වීඩියෝ සජීවිකරණ මෘදුකාංගයක් (Game Animation Software) උපයෝගී කරගෙන දිනුම් ඇදීමේ යන්ත්‍රයක් මඟින් පන්දු මිශ්‍රකර ඉන් අහඹු ලෙස පන්දුවක් තෝරාගැනීම සිදුකරන ආකාරයට වීඩියෝවක් නිර්මාණය කර විකාශනය කරනු ලැබේ. මෙම වීඩියෝ සජීවිකරණ මෘදුකාංගය නිර්මාණය කරගැනීම සඳහා තෝරාගත් පුද්ගලික ආයතනයට මණ්ඩලය විසින් රු.3,350,000 ක මුදලක් 2023 වර්ෂයේදි ගෙවා තිබූ අතර 2024 වර්ෂයේ සිට සේවා සැපයීම වෙනුවෙන්	2023	පාරිභෝගික විශ්වාසය ඇති වන පරිදි දිනුම් අදින ලද සත්‍ය ආකාරය රූපවාහිනිය මඟින් විකාශනය කිරීම.	සුපිරි ධන සම්පත ලොතරැයිපත් දිනුම් ඇදීමේ ක්‍රියාවලිය සඳහා නව යන්ත්‍රයක් මිලදී ගැනීමට මාස 06ක පමණ කාලයක් ගතවන බැවින් හා 2023 වර්ෂය තුළදී අපේක්ෂිත ආදායම් උත්පාදනය කරගැනීම අරමුණු කරගෙන ඩිජිටල් තාක්ෂණය ඔස්සේ දිනුම් අංක තේරීම කෙරෙහි අවධානය යොමු කරන ලදී. එහිදී නිර්මාණිත මෘදුකාංග 03ක් ඔස්සේ සම්පූර්ණ දිනුම් ඇදීමේ ක්‍රියාවලිය සිදුවන අතර එහි දිනුම් අංක ජනනය වෙනුවෙන් වන මෘදුකාංගය පූර්ණ විගණනයක් සහිතව පිළියෙල කර ඇත. තවද මෙහිදී දිනුම් ඇදීමේ යන්ත්‍රයෙහි සත්‍ය ස්වරූපයට සමාන විඩීයෝ ඇනිමේශන් එකක් මඟින් පාරිභෝගිකයා හට දිනුම් ඇදීමේ යන්ත්‍රයක ස්රවරූපයට සමාන ප්‍රතිරූපයක් ලබාදී ඇති අතර එමඟින් පාරිභෝගික ආකර්ශනය පවත්වා ගැනීමට කටයුතු කර ඇත. මෙලෙස සිදු	2024 මැයි 02 දින සිට යන්ත්‍රානුසාරයෙන් දිනුම් ඇදීමේ කටයුතු සිදුකරනු ලබයි.

	දෛනිකව රු.5,000 බැගින් වාර්ෂිකව රු.1,860,000 ක් ගෙවීමට ගිවිසුම් ගතව තිබුණි. මෙම ලොතරැයියේ දිනුම් ඇදීමේ ක්‍රියාවලිය 2024 මැයි 02 දින සිට දිනුම් ඇදීමේ යන්ත්‍රයක් ඇසුරින් සිදුකරනු ලැබේ.			කර ඇත්තේ නව යන්ත්‍රය මිල දී ගැනීමෙන් පසුවද ලොතරැයි දිනුම් ඇදීමේ ක්‍රියාවලිය වෙනස් නොවන පරිදි එකම ස්වරූපයෙන් පවත්වා ගැනීමට හැකියාව ලැබෙන නිසාවෙනි. එසේ නොමැතිව ලොතරැයි ටිකට්පත හඳුන්වා දුන් ආරම්භක අවස්ථාවේ එක් ක්‍රමයකටත්, දිනුම් ඇදිමේ යන්ත්‍රයක් මිලදි ගැනිමෙන් පසුව තවත් ක්‍රමයකටත් ලොතරැයි දිනුම් ඇදිමේ ක්‍රියාවලිය සිදු වුවහොත් එමගින් පාරිභෝගික විශ්වාසයට බලපෑමක් එල්ල විය හැකිබව නිරීක්ෂණය වු බැවිනි.	
22.	සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් 2020 වර්ෂයේ වෙළඳපොලට හඳුන්වාදුන් සසිරි ලොතරැයියේ දිනුම් ඇදීමේ කටයුතු ජාතික රූපවාහිනී පරිශ්‍රයේ චිත්‍රාගාරයෙන් පිටත ඇති කාමරයක් තුලදී සිදුකරනු ලබන අතර රූපවාහිනිය මඟින්	2023	හඳුනාගත් විවිධ දෝෂ වර්ග 15 කඩිනමින් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වීම සහ පාරිභෝගික විශ්වාසය ඇති වන පරිදි දිනුම් අදින ලද සත්‍ය ආකාරය රූපවාහිනිය මඟින්	දෛනිකව ලොතරැයි පැවැත්වීම වෙනුවෙන් අවශ්‍ය නොවන මෙන්ම මේවනවිට පද්ධතියේ භාවිතා කරනු නොලබන අයිතමයන්ට අදාලව සහ පද්ධතිය පුළුල් කිරීමක් සිදු කිරීමේදී බලපානු ලබන සීමාවන්	නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.

	විකාශනය කිරීමේදී දිනුම් අදින ලද සත්‍ය ආකාරය නොපෙන්වා වීඩියෝ සජීවිකරණ මෘදුකාංගයක් උපයෝගී කරගෙන වීඩියෝවක් නිර්මාණය කර විකාශනය කරනු ලැබේ. තවද මෙම දිනුම් ඇදීමේ ක්‍රියාවලිය සඳහා භාවිතා කරන මෘදුකාංග පද්ධතිය සම්බන්ධව 2021 වර්ෂයේදී පුද්ගලික විගණන ආයතනයක් විසින් පද්ධති විගණයක් සිදුකර හදුනාගන්නා ලද පද්ධති දෝෂ 04 ක්, පද්ධති සීමා දෝෂ 04 ක්, ව්‍යුහාත්මක දූර්වලතා දෝෂ 03 ක්, පරිශීලක අතුරු මුහුනත් දෝෂ 03 ක් සහ පාලන ඌනතා දෝෂ 01ක් වශයෙන් විවිධ දෝෂ වර්ග 15 ක් 2023 වර්ෂය අවසන්වන විටත් නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.		විකාශනය කිරීම.	සම්බන්ධයෙන් මෙහි සඳහන් දෝෂයන් පවතී. එම දෝෂයන් නිවැරදි කිරිම හා පද්ධතිය පුළුල් කිරීම දෙවන අදියරේදි සම්පූර්ණ කිරීමට බලාපොරොත්තුවේ.	
23.	**සුපිරි ධන සම්පත ලොතරැයියේ 49 වන දිනුම් වාරය**				
	(i) සුපිරි ධන සම්පත ලොතරැයිය දිනුම් ඇදීමේ ක්‍රියාවලියේ	2023	පාරිභෝගික විශ්වාසය කඩ නොවන ලෙස අභ්‍යන්තර	සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ලොතරැයි දිනුම් ඇදීමේ ක්‍රියාවලියේ	පාරිභෝගික විශ්වාසය කඩකල නිලධාරීන්

පැවති තාක්ෂණික හා පාලන දුර්වලතාවයන් නිසා 2023 වර්ෂයේ දෙසැම්බර් 27 දින දිනුම් අදින ලද සුපිරි ධන සම්පත හි 49 වන දිනුම් වාරයේදී දිනුම් ඇදීමේ මෘදුකාංගය මඟින් ලබාදුන් ජයග්‍රාහී අංක 06 හා ඉංග්‍රීසි අක්ෂරය වෙනුවට වැරදි අංකයක් සහිතව නිල ප්‍රතිඵල නිකුත් කර එම වැරදි අංකය පදනම් කරගෙන ජයග්‍රාහකයන් සඳහා මුදල් ගෙවීම් කර තිබුණි.

පාලන ක්‍රමවේදය ශක්තිමත් කළ යුතු වීම සහ වැරදි අංකයක් සහිතව නිල ප්‍රතිඵල නිකුත් කිරීමට කටයුතු කළ නිලධාරීන්ගෙන් මණ්ඩලයට සිදුවූ අලාභය අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

සිදුවූ යම් අතපසුවීමක් මත නිවැරදි අංකය වෙනුවට වැරදි අංකයක් නිල ප්‍රතිඵලය ලෙස ප්‍රකාශයට පත්විය. මෙම ප්‍රතිඵලය මත පදනම්ව දිනුම් ඇදීමට අදාළ ජයග්‍රාහකයින් දිනුම් අදින ලද දිනට පසුදින සිට සිය ජයග්‍රාහී ත්‍යාග මුදල් ලබාගැනීමට ඉදිරිපත් වේ. සුපුරුදු පිළිවෙත මත දෛනික දිනුම් ඇදීමේදී LMS පද්ධතියට ඇතුළත් කරනු ලබන ජයග්‍රාහී තොරතුරු ඇතුලත් ගොනුවට අදාලව ගෙවීම සිදුකර ඇත. කෙසේ වෙතත් අදාළ ගැටලුව නිරීක්ෂණය වීමෙන් අනතුරුව මේ සම්බන්ධයෙන් යොමු කළ 2024 ජනවාරි මස 05 දින පැවති 289 වන අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාවට අනුව ඒ වන විටත් ගෙවීම් සිදු කරනු ලැබූ ජයග්‍රාහී දත්ත ගොනුවට තව දුරටත් ගෙවීම් සිදු කිරීම කාලෝචිත බව නිරීක්ෂණය විය. එසේ සිදුකරන ලද්දේ යම්හෙයකින්

සම්බන්ධයෙන් විධිමත් විනය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු අතර මණ්ඩලයට සිදුවූ අලාභය අයකර ගැනීමට කටයුතු කර නොමැත.

ප්‍රසිද්ධ වූ නිල ප්‍රතිඵලය නිවැරදි නොවන බවට ප්‍රකාශ වුවහොත් පාරිභෝගික විශ්වාසය කඩවන අතර, එමඟින් ලොතරැයි ක්ෂේත්‍රයට විශාල බලපෑමක් විය හැකි බැවිනි.

මෙවැනි ආකාරයේ සිදුවීමක් ප්‍රථම වතාවට සිදු වී තිබීම හේතුවෙන් ගත යුතු පියවර පිළිබඳ ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබුණි. එම නිසා අවශ්‍ය උපදෙස් ලබා ගැනීම සඳහා 2024 ජනවාරි මස 05 දින වහාම අධ්‍යක්ෂ මණ්ඩලය රැස් වී අවශ්‍ය තීන්දු, තීරණ හා අවශ්‍ය පියවරයන් ගනු ලැබීය.

කෙසේවෙතත් තවදුරටත් මෙවැනි ගැටලු ඉදිරියට සිදුනොවීමට අභ්‍යන්තර පාලන ක්‍රමවේද තවදුරටත් ශක්තිමත් කර ඇත. තවද මේ වෙනුවෙන් අවශ්‍ය මානව සම්පත් පුහුණුව ද ලබා දීමට කටයුතු කර ඇත.

(ii)	සුපිරි ධන සම්පත 49 වන දිනුම් වාරයේදී දිනුම් ඇදීමේ මෘදුකාංගය මඟින් ලබාදුන් නිවැරදි ජයග්‍රාහී අංක 06 හා ඉංග්‍රීසි අක්ෂරය සඳහාද ගෙවීම් කිරීමට 2024 ජනවාරි 05 දින පැවති 289 වන අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමේදී තීරණය කර ඒ බව 2024 ජනවාරි 10 දින පුවත්පත් දැන්වීමක් මඟින් ප්‍රසිද්ධ කර තිබුණද 2024 අප්‍රේල් 24 දින දක්වාත් එම ගෙවීම් කිරීමට හැකිවන ලෙස මණ්ඩලයේ පරිගණක පද්ධතිය යාවත්කාලීන කර ගෙවීම් කර නොතිබුණි.	2023	පරිගණක පද්ධතිය නිසි වේලාවට යාවත්කාලීන කළ යුතු වීම සහ පාරිභෝගික විශ්වාසය ඇති වන ලෙස කටයුතු කළ යුතුය.	නිවැරදි අංකයට හා ප්‍රසිද්ධ වූ අංකය යන අංක දෙකටම ගෙවීමට සිදු වූ පළමු අවස්ථාව මෙය වන බැවින් ඒ සඳහා ගෙවීම් කිරීමට යෝග්‍ය වන පරිදි පරිගණක පද්ධතියේ සිදුකළ යුතු වෙනස්කම් සිදු කිරීමට යම්කිසි සාධාරණ කාලයක් ගත වේ. එබැවින් මණ්ඩලය විසින් හිතාමතා නිවැරදි අංකයට ගෙවීම් කිරීම ප්‍රමාද කිරීම සිදු නොකළ අතර මණ්ඩලය ලොතරැයි පාරිභෝගිකයින්ට පවතින වගකීම හා වගවීම හේතුවෙන් යම් පාර්ශවයකට අසාධාරණයක් සිදු නොවන පරිදි පද්ධතිය සකස් කිරීමට කටයුතු කල බැවින් ඒ සඳහා සාධාරණ කාලයක් ගතවිය. වර්තමානය වනවිට පද්ධතිය යාවත්කාලීන කිරීම සිදුකර ඇති බැවින් අදාළ ගෙවීම් සිදු කිරීමට මෙන් ම ත්‍යාග මුදල් ලබාගැනීමට ද හැකියාව ඇත.	පරිගණක පද්ධතිය නිසි වේලාවට යාවත්කාලීන සිදු නොකිරීම නිසා නිවැරදි ජයග්‍රාහකයින්ට තෑගි මුදල් අහිමි වී තිබුණි.
(iii)	සුපිරි ධන සම්පත ලොතරැයිපතේ 49 වන දිනුම්	2023	පාරිභෝගික විශ්වාසය ඇති වන ලෙස	සුපිරි ධන සම්පත 49 වන දිනුම් වාරයේ මුල් ප්‍රතිඵල	නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.

වාරයේදී දිනුම් ඇදීමේ මෘදුකාංගය මගින් ලබාදුන් නිවැරදි ජයග්‍රාහී අංක 06 ම පිළිවෙලට ගැලපෙන රු.2,500,000 ක මුදලක් ජයග්‍රහණය කර ඇති ලොතරැයි පතක් අලෙවි කර තිබුණද දිනුම් ඇදීමේ ක්‍රියාවලියේදී සිදුවූ මෙම දෝෂය නිවැරදි කිරීමට මණ්ඩලය අපොහොසත් වීම නිසා එම ලොතරැයිපත මිලදීගත් පාරිභෝගිකයාට රු.2,000 ක මුදලක් පමණක් ලබාගැනීමට සිදුවී තිබුණි.	කටයුතු කළ යුතුය.	ලේඛණය නිකුත් වූ පසු සහ නිවැරදි අංක සහිත ප්‍රතිඵල නිකුත් කිරීමට පෙරාතුව ඉහත කී රු.2,000 කට හිමිකම් ලබාගත් ටිකට් පත ත්‍යාග මුදල් ලබාගැනීම වෙනුවෙන් දිස්ත්‍රික් අලෙවි නියෝජිත දක්වා ඉදිරිපත් වී, එය මණ්ඩලයෙන් ද ප්‍රතිපූරණය කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර තිබුණි. නිවැරදි අංක සහිත ජයග්‍රාහී දත්ත ගොනුවට අනුව එම ටිකට් පතට රු. 2,500,000 ත්‍යාග මුදලක් හිමිව තිබුණද එය දිස්ත්‍රික් අලෙවි නියෝජිත දක්වා ඉදිරිපත් වූ ටිකට් පතක් බැවින් සහ එහි සත්‍යය ජයග්‍රාහකයා සොයා ගැනීම අපහසු හෙයින් මණ්ඩලය ලොතරැයි පාරිභෝගිකයින්ට පවතින වගකීම හා වගවීම මත පදනම්ව එය තවදුරටත් රු.2,000 ගෙවීමක් ලෙස සලකා කටයුතු කර ඇත. කෙසේවෙතත් ඉහත සඳහන් කල වගකීම සහ වගවීම යටතේ අදාළ ජයග්‍රාහකයා ඇතුළු සියළුම

				පාර්ශවයන්ට සාධාරණයක් කිරීම අරමුණු කරගෙන 2024 වර්ෂයේ ජනවාරි මස 10 වන දින භාෂා ත්‍රිත්වයෙන් ම පුවත්පත් මාධ්‍යයෙන් සමස්ථ ජනතාව දැනුවත් කර ඇත.	
24.	අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය මත සංවර්ධන ලොතරැයි මණ්ඩලය සඳහා ව්‍යාවසාය සම්පත් සැලසුම්කරණ (ERP) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට 2019 වර්ෂයේ සැලසුම්කර තිබුණි. මෙම ව්‍යාපෘතියේ පළමු අදියර ලෙස ගිණුම්කරණ මෘදුකාංග පද්ධතියක් ස්ථාපිත කිරීමේ කාර්යය 2020 වර්ෂයේ සිට සෑම වර්ෂයකම ප්‍රසම්පාදන සැලැස්මට ඇතුලත් කර තිබුණද එම ප්‍රසම්පාදන කටයුතු 2023 වර්ෂයේ අවසානය තෙක් ආරම්භ කර නොතිබුණි.	2023	ප්‍රසම්පාදන සැලැස්මට අනුව කටයුතු කළ යුතුය.	මෙම ඡේදයේ දක්වා ඇති පරිදි ආයතනය සඳහා ERP පද්ධතියක් ස්ථාපිත කිරීමට සැලසුම් කර තිබුණි. ඒ අනුව මණ්ඩලයේ සමස්ථ මෙහෙයුම් ක්‍රියාවලියට අදාල අවශ්‍යතාවය නිශ්චය කොට එක් එක් අංශ මට්ටමින් ඉටු කෙරෙන ක්‍රියාවලිය අධ්‍යනය කොට එහි විෂය පථය ඇතුලත් වාර්තාවක්ද පිළියෙල කර ඇත. පසුව මෙම ව්‍යාපෘතියේ පළමු අදියර ලෙස ගිණුම්කරණ මෘදුකාංග පද්ධතියක් ස්ථාපිත කිරීමට තීරණය කර තිබූ අතර එම කාර්යය 2023 වර්ෂයේදී ආතර් සී. ක්ලාක් මධ්‍යස්ථානය වෙත භාර දී තිබුණි. එහෙත් එම ආයතනය පසුව එම	නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.

කාර්යය ඉටුකිරීම ප්‍රතික්ෂේප කර ඇති බැවින් මේ සඳහා නැවතත් තරඟකාරී ලංසු මිල ගණන් කැඳවා සුදුසු සැපයුම්කරුවෙකු තෝරා ගැනීමට කළමනාකාරීත්වය තීරණය කර ඇත.

3.46 ජාතික ලොතරැයි මණ්ඩලය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	8,651,301,582	2,620,059,722	6,031,241,859	960,349,617	තත්ත්වාගණනය කළ
2022	9,231,683,150	3,010,035,640	6,221,647,509	1,085,769,648	තත්ත්වාගණනය කළ
2023	10,278,152,465	3,943,441,389	6,334,711,076	650,877,152	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	2023 දෙසැම්බර් 31 දිනට අලෙවි නියෝජිතයින් 94 ක් වෙත රු.166,615,583 ක පැසිවි ලොතරැයිපත් ණයට අලෙවිකර තිබුණද, ඉන් ණයගැතියන් 48 ක් වෙතින් පමණක් රු.59,525,000 ක බැංකු ඇපකර ලබාගෙන තිබුණි. අලෙවි නියෝජිතයින් 46 ක් වෙතින් බැංකු ඇපකර හෝ වෙනත් ප්‍රමාණවත් සුරක්ෂිතයක් ලබාගැනීමකින් තොරව ලොතරැයිපත් ණයට අලෙවිකර තිබූ අතර 2023 වර්ෂය අවසානයට එම අලෙවි නියෝජිතයින් වෙතින් රු.85,406,299 ක්	2023	මණ්ඩලය විසින් ණයට අලෙවි කරනු ලබන ලොතරැයිපත් අලෙවි වටිනාකම ආවරණය වන පරිදි ආරක්ෂිත ඇපකර ලබාගත යුතු අතර මණ්ඩලයට අයවිය යුතු මුදල් කඩිනමින් අයකර ගැනීමට ක්‍රියා කළ යුතුය.	ජාතික ලොතරැයි මණ්ඩලය විසින් තරඟකාරී වෙළඳපොළ තුළ අලෙවිය ප්‍රර්ධනය කිරීමේ අරමුණින් දිනුම් අදින ලොතරැයිපත් සඳහා විශේෂ දිනුම් වාර ක්‍රියාත්මක කරනු ලබන අතර එහිදී අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත විශේෂ දිනුම් වාර ක්‍රියාත්මක කිරීමේදී දිස්ත්‍රික් අලෙවි නියෝජිතයින් වෙත ණය පදනම මත ලොතරැයිපත් නිකුත් කරනු ලැබේ.	මණ්ඩලය විසින් ණයට අලෙවි කරනු ලබන ලොතරැයිපත්වල අලෙවි වටිනාකම ආවරණය වන පරිදි ආරක්ෂිත ඇපකර ලබා ගැනීමට ක්‍රියාකර නොතිබුණි.

	අයවීමට තිබුණි. තවද, අලෙවි නියෝජිතයින් 05 ක් වෙතින් වසරක් ඉක්ම වූ අයවිය යුතු ශේෂය රු.7,341,195 ක් සහ වසර 05 ක් ඉක්ම වූ ශේෂය රු.1,446,198 ක් වී තිබුණි.				
2	2023 දෙසැම්බර් 31 දින දිස්ත්‍රික් අලෙවි නියෝජිතයින් 75 ක් වෙත රු.59,043,386 ක ක්ෂණික ලොතරැයිපත් ණයට අලෙවිකර තිබූ අතර ඉන් ණයගැතියන් 05 ක් වෙතින් පමණක් රු.4,300,000 ක බැංකු ඇපකර ලබාගෙන තිබුණි. දිස්ත්‍රික් අලෙවි නියෝජිතයින් 70 ක් වෙතින් බැංකු ඇපකර හෝ වෙනත් ප්‍රමාණවත් සුරක්ෂිතයක් ලබාගැනීමකින් තොරව ලොතරැයිපත් ණයට අලෙවිකර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එම අලෙවි නියෝජිතයින් වෙතින් රු.54,875,636 ක් අය වීමට තිබුණි. තවද, අලෙවි නියෝජිතයින් 17 ක් වෙතින් වසරකට වැඩි කාලය ඉක්මවූ අයවිය යුතු ශේෂය රු.7,917,747 ක් වී තිබුණි.	2023	මණ්ඩලය විසින් ණයට අලෙවි කරනු ලබන ලොතරැයිපත් අලෙවි වටිනාකම ආවරණය වන පරිදි ආරක්ෂිත ඇපකර ලබාගත යුතු අතර මණ්ඩලයට අයවිය යුතු මුදල් කඩිනමින් අයකර ගැනීමට ක්‍රියා කළ යුතුය.	2023 දෙසැම්බර් 31 දිනට අයවීමට තිබූ ණය මුදලින් මේ වනවිට රු.39,180,912 ක මුදලක් ගෙවා අවසන්කර ඇත.	මණ්ඩලය විසින් ණයට අලෙවි කරනු ලබන ක්ෂණික ලොතරැයිපත්වල අලෙවි වටිනාකම ආවරණය වන පරිදි ආරක්ෂිත ඇපකර ලබාගැනීමට ක්‍රියාකර නොතිබුණි.

3	මණ්ඩලයේ සේවය කළ නිලධාරීන් 05 ක් වෙත ලබාදී තිබූ ආපදා ණය මුදල් 2012, 2017, 2018 සහ 2019 වර්ෂවල සිට ආපසු ගෙවීම අදාළ නිලධාරීන් විසින් පැහැර හැර තිබුණි. ඒ අනුව එකතුව රු.713,393 ක් වූ අයවිය යුතු ණය ශේෂය 2023 දෙසැම්බර් 31 දක්වා එම නිලධාරීන්ගෙන් අයකර ගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි.	2023	අප්‍රමාදව අයවිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළයුතුය.	ඉදිරියේදී අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ.	අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.
4	මණ්ඩලයේ සේවය කළ නිලධාරීන් දෙදෙනෙකු වෙත ලබාදී තිබූ නිවාස ණය මුදල් වලින් එකතුව රු.1,519,920 ක්වූ ණය ශේෂ 2006 වර්ෂයේ සිට අදාළ නිලධාරීන් විසින් පැහැර හැර තිබුණද, 2023 දෙසැම්බර් 31 දක්වා එම අයවිය යුතු මුදල් අයකර ගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි.	2023	අප්රමාදව අයවිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළයුතුය.	නිලධාරීන් දෙදෙනා වෙත ලබා දී තිබූ නිවාස ණය මුදල් ගෙවීම ඔවුන් විසින් පැහැර හැරීමෙන් පසු මණ්ඩලය වෙත අය විය යුතුව පවතින ශේෂ අය කර ගැනීම සඳහා අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත.	මේ දක්වා අයකර ගැනීමට නොහැකිවී තිබුණි.
5	1963 අංක 11 දරන මුදල් පනතේ 17(2) වගන්තිය ප්‍රකාරව ලොතරැයි ආදායමෙන් පනතේ නිශ්චිතව දක්වා ඇති වියදම්	2023	අදාල පනතේ විධිවිධාන අනුගමනය කළයුතුය.	ඒකාබද්ධ අරමුදලට අරමුදල් සම්පාදනයසඳහා ජාතික ලොතරැයි මණ්ඩලය පිහිටුවා ඇති බැවින්	මණ්ඩලය විසින් මහජන සම්පත ලොතරැයි ආදායමෙන් සියයට 16.5 ක් සහ අනෙකුත්

	අඩුකළ පසු ඉතිරිය ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු වුවද, 2023 වර්ෂය අවසානයට රඳවාගත් ලාභ එකතුව වූ රු.3,603,093,604 ක් එලෙස ඒකාබද්ධ අරමුදලට බැර කිරීමෙන් තොරව, 2023 දෙසැම්බර් 31 දින වන විටත් මණ්ඩලය තුළ රඳවා ගෙන තිබුණි.			භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ නියෝග මත ලොතරැයි අලෙවියෙන් සෘජු දායකත්වයක් ඒකාබද්ධ අරමුදලට ලබාදීම සිදු කරනු ලබයි. 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලොතරැයි අලෙවියෙන් සෘජු දායකත්වය ලෙස ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබූ මුදල රු.3,841,947,982 ක් විය.	ලොතරැයි ආදායමෙන් සියයට 10 ක් ඒකාබද්ධ අරමුදලට ලබාදීමට ක්‍රියාකර තිබුණද, මණ්ඩලයේ වාර්ෂික ශුද්ධ ලාභය ඒකාබද්ධ අරමුදලට බැර කර නොතිබුණි.
6	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 71 සහ 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය මගින් නිකුත් කර ඇති මෙහෙයුම් අත් පොතෙහි (Operational Manual) 3.2 (i) විධිවිධානවලට පටහැනිව මණ්ඩලය විසින් මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් පූර්ව අනුමැතිය ලබා ගැනීමකින් තොරව, අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතීන් මත	2023	චක්‍රලේඛ විධිවිධාන පරිදි කටයුතු කලයුතුය.	2006 වසරේ දී නිකුත් කරන ලද කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 අනුව රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩලවල සහ සම්පූර්ණ රජය සතු සමාගම්වල සේවක වැටුප් සංශෝධනයේ දී ඉහළ කළමනාකාරීත්වයේ වැටුපට වඩා ඊට පහළ වැටුප් කාණ්ඩයන්ගේ (Management Assistant/ Primary Level) වැටුප් පරිමාණ අතර විශාල වෙනසක් පැවති බැවින් එම වෙනස නිරාකරණය කිරීම	චක්‍රලේඛ විධිවිධාන පරිදි අදාල අනුමැතීන් මේ දක්වා ලබාගෙන නොමැත.

	පමණක් මණ්ඩලයේ නිලධාරීන් 341 ක් වෙත 2023 ඔක්තෝබර් මාසයේ සිට ඉදිරියට වැටුප් වර්ධක 06 බැගින් ලබා දී තිබුණි. 2023 මූල්‍ය වර්ෂයට අදාළව පමණක් එම වියදම රු.3,107,820 ක් වී තිබුණි. එමෙන්ම මණ්ඩලයේ සේවයේ නියුතු සියළු නිලධාරීන් වෙත 2023 වර්ෂය තුළදී පමණක් රාජකාරී දීමනා, අවදානම් දීමනා, නිල ඇඳුම් දීමනා, නිෂ්පාදන දීමනා, සානුකම්පිත දීමනා, ඉලක්කගත සේවක අභිප්‍රේරණ ප්‍රතිලාභ, වැන් රථවලින් විකුණුම් මත රාජකාරී දීමනා සහ සේවකයන්ට මූල්‍ය ත්‍යාග වශයෙන් එකතුව රු.205,608,174 ක දීමනා මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව ගෙවා තිබුණි.			සඳහා පහළ වැටුප් කාණ්ඩයේ සේවකයින් හට වැටුප් වර්ධක 06 ක් ලබා දීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත ක්‍රියාකර ඇත. මණ්ඩලයේ සේවයේ නියුතු නිලධාරීන් වෙත දීමනා ගෙවීම අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත සිදුකර ඇත.	
7	2019 දෙසැම්බර් 17 දිනැති අංක 08/2019 දරණ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තු චක්‍රලේඛය ප්‍රකාරව 2019 වසරේ සිට රාජ්‍ය	2023	චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය.	www.promise.lk වෙබ් අඩවිය යටතේ හඳුන්වා දී ඇති විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රමවේදය (e -GP) යටතේ අංක	විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රමවේදය මණ්ඩලය විසින් මේ දක්වා ප්‍රසම්පාදන

	සංස්ථා ඇතුළු රාජ්‍ය ආයතන www.promise.lk වෙබ් අඩවිය යටතේ හඳුන්වා දී ඇති විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රමවේදය (e – GP) යටතේ ලියාපදිංචි විය යුතු වුවත්, ජාතික ලොතරැයි මණ්ඩලය විසින් 2023 වර්ෂය අවසාන වන විටත් එම ක්‍රමවේදය යටතේ ප්‍රසම්පාදන කටයුතු සිදු කර නොතිබුණි.			P000381 ජාතික ලොතරැයි මණ්ඩලය ලියාපදිංචි වී ඇත. විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රමවේදය (e -GP) යටතේ ඉදිරි ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීම සඳහා අවශ්‍ය උපදෙස් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය මඟින් ලබා ගැනීමට කටයුතු සිදු කිරීමෙන් අනතුරුව එමඟින් සිදු කළ හැකි ඉදිරි ප්‍රසම්පාදන කටයුතු විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රමවේදය (E -GP) අනුගමනය කරමින් සිදු කිරීමට බලාපොරොත්තු වේ.	කටයුතුවලට භාවිතා කර නොමැත.
8	2015 මැයි 25 දිනැති අංක PED 1/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 01 ඡේදය ප්‍රකාරව නිල වාහන හිමිකම් නොමැති මධ්‍යම මට්ටමේ කළමනාකරුවන්ට ලබා දිය හැකි වන්නේ කණ්ඩායම් ප්‍රවාහන පහසුකම් පමණක් වුවද, ඊට පටහැනිව මණ්ඩලය විසින් 2024 ජනවාරි සිට මධ්‍යම මට්ටමේ කළමනාකරුවන් 07 දෙනෙකු සඳහා මණ්ඩලයේ වාහනයක්	2023	චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළයුතුය.	රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ 1/2015 ට අනුව යමින් එම චක්‍රලේඛයේ පහළම නිලධාරි මට්ටම වන මධ්‍යම කළමනාකරණ මට්ටමේ සහකාර සාමාන්‍යාධිකාරිවරුන් ඇතුළත් කර එම චක්‍රලේඛ ප්‍රකාරව ඔවුන් වෙත ප්‍රතිපාදන 2024 ජනවාරි 01 දින සිට ලබා දීම සඳහා 2023 දෙසැම්බර් 19 දිනැති අංක 3864 -11 දරණ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව මඟින් අනුමැතිය	2015 මැයි 25 දිනැති අංක PED 1/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 01 ඡේදයට පටහැනිව මණ්ඩලයේ මධ්‍යම මට්ටමේ කළමනාකරුවන්ට ප්‍රවාහන දීමනා සහ ඉන්ධන දීමනා ලබාදීම සිදුකර තිබුණි.

	සහ රියදුරෙකු බැගින් වෙන්කර දී මාසිකව ඉන්ධන ලීටර් 115 ක් බැගින් ඉන්ධන දීමනා ගෙවා තිබුණු අතර, තවත් නිලධාරීන් දෙදෙනෙක් සඳහා තම පෞද්ගලික වාහනය රාජකාරී කටයුතු සඳහා පරිහරණය කිරීමට ඉඩදී ඒ වෙනුවෙන් මාසිකව රු.50,000 ක ප්‍රවාහන දීමනාව සමග ඉන්ධන ලීටර් 115 බැගින් ඉන්ධන දීමනා ගෙවා තිබුණි.			ලැබී ඇත. එමෙන්ම 2024 අප්‍රේල් 18 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක ජනරාල්ගේ ලිපිය මඟින් රාජකාරි කටයුතු සඳහා කණ්ඩායම් ප්‍රවාහන සේවය භාවිතා කිරීම ප්‍රායෝගික නොවන හා වියදම් අධික වන්නේ නම්, වැය වන සත්‍ය ගමන් වියදම ප්‍රතිපූර්ණය කර ගැනීම සම්බන්ධයෙන් එම දෙපාර්තමේන්තුවේ විරුද්ධත්වයක් නොමැති බව දන්වා ඇත.	
9	2022 අගෝස්තු 08 දිනැති අංක PED 04/2022 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 2.8 වන වගන්තිය ප්‍රකාරව රාජ්‍ය ආයතනවල සංවත්සර ක්‍රියාකාරකම්වලට අදාළ සියලු වියදම් අත්හැරිය යුතු වුවත්, 2023 වර්ෂයේදී මණ්ඩලයේ 60 වන සංවත්සරය වෙනුවෙන් මණ්ඩලයේ කාර්ය මණ්ඩලය වෙත එක් අයෙකුට රු.60,000 බැගින් භාණ්ඩ මිලදී ගැනීමේ වවුචර් පත් ලබාදීමට සහ සංගීත සාදයක් පැවැත්වීම	2023	චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කලයුතුය.	2023 වසරේදී ජාතික ලොතරැයි මණ්ඩලයට වසර 60 ක් පිරීම නිමිති කොට ගෙන ආයතනයේ අභිවෘද්ධිය වෙනුවෙන් දායකත්වය ලබා දෙනු ලබන කාර්ය මණ්ඩලය දිරිගැන්වීම උදෙසා නිලධාරීන් සඳහා එක් අයෙකුට රු.60,000 බැගින් සුපිරි වෙළඳසලක වවුචර්පත් සහ මණ්ඩලයේ සේවයේ නියුතු සියළු නිලධාරීන් හට වැටුප් වර්ධක 06 ක් ලබා දෙන ලදී.	චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව ක්‍රියාකර ඇත.

	වෙනුවෙන් එකතුව රු.මිලියන 34.6 ක වියදම් දරා තිබුණි.				
10	මණ්ඩලයේ නිලධාරියකු විසින් 2020 සැප්තැම්බර් 10 දින සිට 2020 දෙසැම්බර් 26 දින දක්වා අවස්ථා 23 දී ලොතරැයි අලෙවි ආදායම් ලෙස ලැබුණු එකතුව රු.4,736,005 ක් බැංකුගත කිරීමකින් තොරව මුදල් පොතේ ලැබීම් ලෙස ව්‍යාජ සටහන් යොදා එම මුදල් වංචාකර තිබුණි. කෙසේවුවද, එම වංචා කළ මුදල් මේ දක්වා මණ්ඩලයට අයකර ගැනීමට නොහැකිවී තිබෙන අතර එම මුදල් වංචාකළ නිලධාරියාට එරෙහිව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණිලි කිරීම හැර වෙනත් ප්‍රගතියක් අත්කර ගෙන නොතිබුණි.	2023	මණ්ඩලයේ අභ්‍යන්තර පාලන ක්‍රම ශක්තිමත් කර මුදල් වංචා කිරීමට ඇති අවස්ථා වළක්වා ගත යුතුය.	මේ පිළිබඳව ආයතනික වශයෙන් මූලික විමර්ශනයක් සිදුකර ඇත. එමෙන්ම මේ සම්බන්ධයෙන් දැනගත් වහාම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පැමිණිලි කර ඇති අතර අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අධිකරණමය නියෝග ලබා ගෙන ජාත්‍යන්තර පොලිසීයද දැනුවත් කර ඇත.	වසර 04 ක කාලයක් ගතවී ඇතත් මෙම ගැටළුව නිරවුල්වී නොමැත.
11	2016 වර්ෂයේ දී මණ්ඩලය විසින් ජංගම දූරකතන හරහා කෙටි පණිවිඩ සේවාව මඟින් ලොතරැයිපත් අලෙවි කිරීම ආරම්භ කර තිබුණි. මෙම සේවාව ආරම්භ කර මේ වන විට වසර 07 ක් ගතවී ඇතත් අලෙවි නියෝජිතයින් 03 ක්	2023	නූතන තාක්ෂණ ක්‍රමවේද මඟින් මණ්ඩලයේ ලොතරැයි අලෙවිය වැඩිකර ගැනීමට ක්‍රියා කළයුතු වීම.	නූතන තාක්ෂණ ප්‍රවණතා ඇති වීමත් සමඟ මණ්ඩලය විසින් SMS සේවාව පමණක් නොව Web අඩවිය, දූරකථනය, Web Optimize mobile app හරහා අලෙවිය සඳහා Digital අලෙවි නියෝජිතධූර ඇති	කෙටි පණිවිඩ සේවාව මඟින් ලොතරැයිපත් අලෙවි කිරීමේ වර්ධනයක් සිදුවී නැත.

	මඟින් මුළු ලොතරැයිපත් අලෙවි ප්‍රමාණයෙන් සියයට 01 කට වඩා අඩු අගයක් අලෙවි කර තිබුණි. වර්තමානයේ කෙටි පණිවිඩ සේවාව හරහා ලොතරැයිපත් අලෙවිය වැඩි කර ගැනීමට වැඩි අවස්ථාව පැවතුණද, එම අවස්ථාවෙන් ප්‍රයෝජන ගැනීම සඳහා කළමනාකරණයේ අවධානය යොමුවී නොතිබුණි.			කිරීමට විධිමත් සාකච්ඡා පවත්වා අලෙවි නියෝජිතධූර ඇති කිරීමට කටයුතු කරමින් පවතී.	
12	මණ්ඩලය විසින් 2023 වර්ෂයේදී සමස්ථයක් ලෙස රු.650,877,152 ක බදු පසු ලාභයක් ලබා තිබුණද, විකුණුම්, අලෙවිකරණ සහ බෙදාහැරීමේ වියදම්, පරිපාලන වියදම් සහ අනෙකුත් වියදම් ගැලපීමට පෙර, ගොවිසෙත, ධන නිධානය, හඳහන, ලකී සෙවන්, මෙගා 60 සහ මෙගා මිලියන් යන ලොතරැයිවලින් රු.699,603,774 ක අලාභයක් ලබා තිබුණි. මණ්ඩලය එක් එක් ලොතරැයිය වෙනුවෙන් වෙන වෙනම ලාභ/අලාභ ගණනය නොකිරීම නිසා පරිශීලකයින්ට එක් එක් ලොතරැයිවල ලාභ/අලාභ තත්ත්වය	2023	එක් එක් ලොතරැයිවල ලාභ අලාභ වෙන වෙනම ගණනය කළ යුතු වීම.	ඉදිරියේදී වර්ෂ අවසාන ගිණුම් තුළ එක් එක් ලොතරැයිපත වෙනුවෙන් වෙන වෙනම ලාභය ගණනය කර ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත.	මණ්ඩලය එක් එක් ලොතරැයිය වෙනුවෙන් වෙන වෙනම ලාභ/අලාභ ගණනය කිරීමට මේ දක්වා පියවර ගෙන නොමැත.

	නිවැරදිව ඉදිරිපත් වී නොතිබුණි.				
13	වර්ෂ 1963 දී ආරම්භ කරන ලද ජාතික ලොතරැයි මණ්ඩලය වර්ෂ 60 කට අධික කාලයක සිට කුලී පදනම මත ලබාගත් ගොඩනැගිලිවල ව්‍යාපාර පරිශ්‍රය පවත්වා ගනිමින් සිටින අතර, 2023 වර්ෂයේදී මණ්ඩලය විසින් ව්‍යාපාර පරිශ්‍රය පවත්වා ගැනීම වෙනුවෙන් රු.87,686,550 ක් ගොඩනැගිලි කුලී ලෙස ගෙවා තිබුණි. කෙසේවුවද, මණ්ඩලය විසින් 2009 වර්ෂයේ මිලදී ගන්නා ලද රු. මිලියන 500 ක් වටිනා පර්චස් 112.05 ක ඉඩමක් කොළඹ වොක්ෂෝල් මාවතේ පවතින අතර, එහි ගබඩාවක්, රියදුරු නේවාසිකාගාරයක් සහ වාහන රථගාලක් පවත්වා ගනිමින් තිබුණි.	2023	ජාතික ලොතරැයි මණ්ඩලය සතු ඉඩම ඵලදායී කටයුතුවලට යෙදවීමට අවධානය යොමුකළ යුතුය.	ජාතික ලොතරැයි මණ්ඩලයට අයත් ඉඩමෙහි ඉදි කිරීමට යෝජිතව තිබූ ගොඩනැගිල්ල ඉදි කිරීමේ කටයුතු ආරම්භ කිරීමට උත්සාහ කළද නැවත දැනුම් දෙන තුරු රාජ්‍ය ආයතන වෙනුවෙන් ගොඩනැගිලි ඉදිකිරීම තාවකාලිකව නවතා දැමීමට රජය විසින් ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණය හමුවේ එම කටයුතු සාර්ථක නොවූ බැවින් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය යටතේ වර්තමානයේ ජාතික ලොතරැයි මණ්ඩලය පවත්වා ගෙන යන ගොඩනැගිල්ලේ බදු ගිවිසුම් කාල සීමාව දීර්ඝ කර ගන්නා ලදී.	කුලී පදනම මත ලබාගත් ගොඩනැගිලිවල ව්‍යාපාර පරිශ්‍රය පවත්වා ගනිමින් සිටී.
14	මණ්ඩලය විසින් 2023 අප්‍රේල් 01 සිට 2024 මාර්තු 31 දින දක්වා වසරක කාල සීමාවක් සඳහා ලොතරැයි වර්ග 08 ක් මුද්‍රණය, සැපයීම සහ ගෙනවිත් භාරදීමට අදාළ ප්‍රසම්පාදන කටයුතු,	2023	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුගමනය කරමින් නියමිත කාලය තුළ ප්‍රසම්පාදන කාර්යයන්	මෙම ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කළ කාලය තුළ කිහිපවරකදී රට තුළ අතිශයින් දරුණු කොවිඩ් - 19 වසංගත රෝගී තත්ත්වයක් පැවති අතර එහි ප්‍රතිඵලයක් ලෙස	2024 අප්‍රේල් 01 සිට ඉදිරියට ලොතරැයිපත් මුද්‍රණය කිරීමට අදාල කොන්ත්‍රාත්තුව මේ දක්වා වසරකට අධික කාලයක් ප්‍රමාද වී

	2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.3 හි සඳහන් සති 38 ක කාල සීමා තුළ නිම කිරීමට නොහැකි වී තිබූ අතර 2021 ජුනි 25 දින ආරම්භ කර තිබූ එම ප්‍රසම්පාදන කටයුතු නිම කිරීම සඳහා 2023 මාර්තු අවසානය දක්වා වසර 01 යි මාස 09 ක් ගතකර තිබුණි.		නිමකිරීමට අවශ්‍ය පියවර ගතයුතු වීම.	බාධාකාරී සිදුවීම් රැසකට මුහුණ දීමට ප්‍රසම්පාදන අස්ථීත්වයට සිදුව තිබිණි.	තිබුණද, කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමට නොහැකිවී ඇත.
15	මණ්ඩලය සඳහා පූර්ණ ව්‍යවසාය සම්පත් සැලසුම් පද්ධතියක් (ERP) සංවර්ධනය කිරීම, සැපයීම, ක්‍රියාත්මක කිරීම, ස්ථාපනය, පුහුණු කිරීම සහ නඩත්තු කිරීම සඳහා වූ ප්‍රසම්පාදනය එක් වසරක නඩත්තු පිරිවැය පමණක් සැලැකිල්ලට ගෙන රු.96,788,864 ක් වූ ලංසු මිලට වර්ෂ 04 ක කාල සීමාවක් සඳහා කොන්ත්‍රාත් ප්‍රදානය කර තිබුණි. කෙසේවුවද, මෙම ප්‍රසම්පාදනයේ වර්ෂ 04 හි රු.මිලියන 394 ක මුළු පිරිවැය සැලකිල්ලට ගත්තේ නම් රජයේ ප්‍රසම්පාදන මාර්ගොපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුවමෙම	2023	ප්‍රසම්පාදන මාර්ගොපදේශ සංග්‍රහයේ විධිවිධාන පරිදි පද්ධතිය ස්ථාපනය කිරීමට යන මුළු පිරිවැය සැලැකිල්ලට ගෙන අදාළ අධිකාරි සීමාව යටතේ ප්‍රසම්පාදන කටයුතු සිදුකළ යුතු වීම.	සුදුසුකම්ලත් සැපයුම්කාර ආයතනය වෙතින් රු.96,788,864 ක් වූ ලංසු මිලට මෙම පද්ධතිය සංවර්ධනය කිරීම සැපයීම ක්‍රියාත්මක කිරීම ස්ථාපනය පුහුණු කිරීම සහ පළමු වසරේ නඩත්තුවද ඇතුළත්ව පූර්ණ සම්පත් ව්‍යවසාය පද්ධතියක් මිළදී ගැනීම දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු අධිකාරී සීමාව යටතේ පවතින බැවින් එම පද්ධතිය මිළදී ගැනීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශ හා දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු අනුමැතිය ලබා දීම සිදු කර ඇත.	මෙම ප්‍රසම්පාදනයේ නිවැරදි මුළු පිරිවැය සැලකිල්ලට නොගැනීම හා ඊට අදාළ ප්‍රසම්පාදන කමිටුව හඳුනා නොගැනීම නිසා පූර්ණ ව්‍යවසාය සම්පත් සැලසුම් පද්ධතියක් (ERP) ස්ථාපිත කිරීමේ කටයුතු දැනට අතර මඟ නතරවී ඇත.

	ප්‍රසම්පාදනය අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු යටතේ සිදු කළ යුතු වුවත්, ඉන් බැහැර වී දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු අධිකාරී මට්ටම යටතේ සිදු කර තිබුණි.				
16	මණ්ඩලයට 2022 මාර්තු 05 දින සිට 2022 මැයි 04 දින දක්වා ගොවිසෙත ලොතරැයිපත් මුද්‍රණය කර සැපයීම සඳහා තෝරාගත් මුද්‍රණ ආයතනය විසින් ලොතරැයිපත් ලබා නොදීම නිසා එම කාල සීමාවේ සැලසුම් කළ ගොවිසෙත ලොතරැයි දිනුම්වාර 55 ක් පැවැත්වීමට නොහැකිවී තිබුණි. පසුගිය වර්ෂයේ ගොවිසෙත ලොතරැයි දිනුම්වාර 280 ක් පවත්වා රු.මිලියන 4,442 ක ආදායමක් උපයාගෙන තිබුණු අතර, එක් දිනුම් වාරයක සාමාන්‍ය ආදායම ආසන්න වශයෙන් රු. මිලියන 15.86 ක් වූයෙන් ඉහත ගොවිසෙත ලොතරැයිපත් නොපැවැත් වූ දිනුම්වාර වෙනුවෙන් ආසන්න වශයෙන් රු. මිලියන 872.3 ක ආදායමක් මණ්ඩලයට අහිමිවී	2022	ගිවිසුම අනුව ලොතරැයිපත් මුද්‍රණය කර සැපයීම සඳහා අදාල සැපයුම්කරුවන් විසින් ප්‍රමාණවත් අමුද්‍රව්‍ය තොග පවත්වාගත යුතුය. සැපයුම්කරුවන් විසින් කොන්දේසි කඩකිරීමකදී ගිවිසුම අනුව ක්‍රියාකළ යුතු වීම.	ඩොලර් ප්‍රේෂණ අර්බුදයත් සමඟ මණ්ඩලයේ මුද්‍රණකරුවන්ට ලොතරැයි මුද්‍රණය කිරීම සඳහා ශ්‍රී ලංකාව තුළ කඩදාසි හිඟවීම හා ආනයන සීමා පැනවීම මත රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව ද ඇතුලත්ව අර්බුදයකට මුහුණදුන් අතර ලොතරැයි දිනුම් 55 කදී ලොතරැයි ද්විත්වයක් පමණක් අත්හිටුවා ලොතරැයිපත් වෙළඳපල තුළ පවත්වා ගනිමින් ඒකාබද්ධ අරමුදලට අරමුදල් සම්පාදනය අඛණ්ඩව සිදු කර ඇත.	දිනුම්වාර නොපැවැත්වීම නිසා මණ්ඩලයට ලැබිය යුතුව තිබූ ආදායමක් අහිමි වී ඇත.

	තිබුණි.				
17	NLB හඳහන ලොතරැයිපත මුද්‍රණය කිරීමට භාරගත් මුද්‍රණ ආයතනය දිනුම්වාර 2 කට පසුව ඩොලර් අර්බුදය සහ කඩදාසි හිඟකම මත එම ලොතරැයිපත මුද්‍රණය කිරීම ප්‍රතික්ෂේප කිරීම නිසා මණ්ඩලය විසින් 2022 මාර්තු 05 දින සිට 2022 අප්‍රේල් 03 දක්වා NLB හඳහන ලොතරැයි දිණුම්වාර 29 ක් පවත්වා නොතිබුණි. මණ්ඩලය විසින් ඊට පෙර පවත්වා තිබූ NLB හඳහන ලොතරැයි දිණුම්වාර 37 හි සාමාන්‍ය ආදායම සැලකීමේදී හඳහන ලොතරැයිය නොපැවැත්වීම මත ආසන්න වශයෙන් රු. මිලියන 263 ක පමණ ආදායමක් අහිමි වී තිබුණි.	2022	ගිවිසුම අනුව ලොතරැයිපත් මුද්‍රණය කර සැපයීම සඳහා අදාල සැපයුම්කරුවන් ප්‍රමාණවත් අමුද්‍රව්‍ය තොග පවත්වාගත යුතුය. සැපයුම්කරුවන් විසින් කොන්දේසි කඩකිරීමකදී ගිවිසුම අනුව ක්‍රියාකළ යුතු වීම.	2022 වර්ෂයේදී රට තුල ඇති වූ ඩොලර් අර්බුදය හේතුවෙන් ලොතරැයිපත් මුද්‍රණය කිරීම සඳහා යොදා ගනු ලබන අමුද්‍රව්‍ය ආනයනය කිරීමට දැඩි බාධාවන් ඇති වීමෙන් ලොතරැයිපත් මුද්‍රණයේ සිටි සියළුම මුද්‍රණ ආයතනයන්ට සහ රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවටද නොහැකි තත්ත්වයක් උදා විය.	සැපයුම්කරුවන් විසින් ගිවිසුම් කොන්දේසි කඩකිරීම සම්බන්ධව කටයුතු කර නොතිබුණි.
18	මණ්ඩලය විසින් ඩොලර් ෆෝචූන් ලොතරැයිපත් 6,869 ක් විකුණූ බවට දක්වා තිබුණද,ලොතරැයිපත් 6,603 කින් පමණක් මුදල් ලැබී තිබුණි. ඒ අනුව ලොතරැයිපත් 266 කින් මුදල් අයවී නොතිබුණි. එම ලොතරැයිපත් 266 ට අදාලව මුදල් අයවිය යුතු පුද්ගලයන් හඳුනාගෙන අයකර	2022	ඩොලර් ෆෝචූන් ලොතරැයිපත් නිකුත් කිරීම් පරීක්ෂා කර වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට ක්‍රියාකළ යුතු වීම.	ඩොලර් ෆොර්චූන් ලොතරැයිපත් 6,869 ක විකුණුම් ප්‍රමාණයෙන් ලොතරැයිපත් 6,603ක පමණක් මුදල් ලැබී තිබුණි. ඉතිරි ලොතරැයිපත් 266 සඳහා දිනුම් ඇදීම සිදු කරන දින දක්වා මුදල් ලැබී නොතිබුණි.	හිඟ මුදල් අයකර ගැනීමට මෙතෙක් පියවර ගෙන නොමැත.

	ගැනීමකින් තොරව 2022 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළ රු.964,678 ක් ප්‍රතිපාදනය කර තිබුණි.				
19	ඉහත ඩොලර් ෆෝචූන් ලොතරැයිපත්වලින් කොටසක් අලෙවි කිරීම සඳහා මණ්ඩලයේ අලෙවි අංශය වෙත ලබාදී තිබූ අතර එලෙස ලබාදුන් ටිකට්පත් වලින් 552 ක් අස්ථානගතවී තිබුණි. එම අස්ථානගත වූ ටිකට්පත්වලට සිදුවූයේ කුමක්ද යන්න මෙතෙක් තහවුරු කර ගෙන නොමැති අතර 2022 දෙසැම්බර් 31 දිනට එම ලොතරැයිපත් 552 හි වටිනාකම ආසන්න වශයෙන් ඇ.ඩොලර් 5,520 ක් හෙවත්රු.2,029,262 පමණ වි තිබුණි.	2022	වගකිවයුතු පාර්ශවයන් ගෙන් අයකර ගැනීමට ක්‍රියාකළ යුතු වීම.	විකිණීම සඳහා ලබා දුන් නමුත් ආපසු භාර නොදුන්, හඳුනා ගැනීමට නොහැකි ලොතරැයිපත් ප්‍රමාණය 552 ක් වේ.	අස්ථානගතවූ ටිකට් 552 කට හේතු මෙතෙක් හඳුනාගෙන නොමැත.
20	ජාතික ලොතරැයි මණ්ඩලයේ මන්නාරම සංචාරක නිවාසය ඉදිකිරීම වෙනුවෙන් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත ගෙවිය යුතු රු.2,335,562 ක මුදලක් සහ අදාළ ඉදිකිරීමේදී රැඳවුම් මුදල් ලෙස රඳවාගත් රු.2,729,526 ක් ලෙස එකතුව රු.5,065,088	2022	රඳවාගත් මුදල් නිරවුල් කිරීමට පෙර අදාල කාර්ය නිවැරදි ලෙස ඉටුකර ඇති බවට ඉංජිනේරුමය සහතිකයක් ලබාගැනීමට ක්‍රියාකළ යුතු වීම.	මේ වන තෙක් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් සිදු කරන ලද අලුත්වැඩියාවන් සඳහා ඉදිරියේදී අදාල බිල්පත් නිදහස් කිරීමට කටයුතු කරනු ලැබේ.	මන්නාරම සංචාරක නිවාසය ඉදිකිරීමේ කටයුතු නිවැරදිව සිදුනොවීම නිසා රැඳවුම් මුදල් මෙතෙක් නිදහස් කර නොමැත.

	ක් නිරවුල් කිරීමකින් හෝ අදාල කාර්යන් නිවැරදිව ඉටුකරවා ගැනීමකින් තොරව 2020 වර්ෂයේ සිට ගෙවිය යුතු ශේෂයක් ලෙසින් වෙළඳ හා අනෙකුත් ණය හිමියන් යටතේ දක්වා තිබුණි.				
21	2021 දෙසැම්බර් 31 දිනට Colombo Airport Super Draw ලොතරැයි අලෙවිය මත වූ ණයගැති ශේෂය රු.5,151,652 ක් විය. මෙම ලොතරැයි දිනුම් ඇදීම අවසන් වරට 2018 ජනවාරි 21 දින සිදු කර තිබුණි. මෙම ණයගැති ශේෂය 2022 අප්‍රේල් 30 දින වන විටත් අයකර ගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණු අතර එම සම්පූර්ණ වටිනාකම සඳහාම අඩමාණ ණය වෙන්කිරීමක් 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශවලින් සිදුකර තිබුණි.	2021	අදාළ අංශ සමඟ සාකච්ඡා කර ණයගැති ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම.	Colombo Airport Super Draw ලොතරැයියෙහි රු.5,151,652 ක ණයගැති ශේෂයක් පවතින අතර එය ප්‍රචාරණ නියෝජිතආයතනය කින් අයවිය යුතු මුදලක් වන අතර මේ පිළිබඳ වංචා හා විමර්ශන අංශයට 2018 ජූනි 22 දින පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇත.	අදාළ මුදල් මෙතෙක් අයකර ගැනීමට අපොහොසත් වී ඇත.

3.47 ශ්‍රී ලංකා ක්‍රිකට්

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	15,195,780,000	3,188,200,000	12,007,580,000	2,138,730,000	තත්ත්වාගණනය කළ
2022	21,799,340,000	3,853,620,000	17,945,720,000	6,336,870,000	තත්ත්වාගණනය නොකළ
2023	21,351,000,000	5,588,210,000	15,762,790,000	(2,111,690,000)	තත්ත්වාගණනය නොකළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	2018 වර්ෂයේ ශ්‍රී ලංකා දකුණු අප්‍රිකානු සංරය වෙනුවෙන් ලැබිය යුතු අනුග්‍රාහකත්ව හිමිකම් ආදායම ඇ.එ.ජ.ඩොලර් 187,085 කට සමාන රු. මිලියන 37.5 ක මුදල අයකර ගැනීමේ නෛතික ක්‍රියාමාර්ග අවසන්ව නොතිබුණි.	2021, 2022, 2023	ලැබිය යුතු මුදල් අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කළ යුතුය.	ප්‍රශ්ණගත මුදල නැවත ලබාගැනීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් කටයුතු කරනු ලැබේ.	නිර්දේශය ක්‍රියාත්මක වෙමින් පවතී. (නෛතික ක්‍රියාමාර්ග අවසන්ව නොතිබුණ බැවින් ලැබිය යුතු මුදල් අයකර ගැනීමට හැකිවී නොතිබුණි.)
2	දේශීයආදායම් දෙපාර්තමේන්තුවෙන් රු. මිලියන 428.4 ක් වූ වැට් බදු ශේෂයෙන් රු. මිලියන 87.6 ක් වර්ෂ 05 කට වැඩි කාලයක සිටද, රු. මිලියන 77ක් වර්ෂ 03 කට වඩා වැඩි කාලයක සිටද, රු.	2021, 2023	ලැබිය යුතු මුදල් නිරවුල් කර ගැනීමට අප්‍රමාදව කටයුතු කළ යුතුය	බදු උපදේශකවරුන්ගේ සහයෝගය ඇතිව අයකර ගැනීමට පියවර ගනු ඇත.	නිර්දේශය ක්‍රියාත්මක වෙමින් පවතී. (සැසඳීම් කර නිරවුල්වී නොතිබුණි.)

	මිලියන 36ක් වර්ෂයකට වඩා වැඩි කාලයක සිටද, රු. මිලියන 104.5 ක් වර්ෂයක කාලයක සිටද රඳවා ගැනීමේ බදු ශේෂයෙන් රු. මිලියන 38.2 ක ශේෂයක් වර්ෂ 04 සිට වර්ෂ 15 ක් අතර කාලයක සිටද ලැබිය යුතුව පැවතුනද එම මුදලින් කිසිදු මුදලක් අයවී නොතිබුණි. එමෙන්ම එම ශේෂ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ පවතින තොරතුරු සමඟ සැසඳීම් කර නිරවුල් කර ගැනීමටද කටයුතු කර නොතිබුණි.				
3	2024 වර්ෂයේ දී පැවැත්වීමට නියමිතව තිබූ 19 න් පහළ ලෝක කුසලාන තරඟාවලියේ සත්කාරකත්වය ශ්‍රී ලංකාවට අහිමිවීම නිසා ICC Business Corporation FZLLC සමඟ ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය එළඹ තිබූ 2023 ඔක්තෝබර් 13 දිනැති ගිවිසුම ප්‍රකාරව ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට ලැබීමට තිබූ ආසන්න වශයෙන් ඇ.ඩො මිලියන 2.46 කට සමාන රු. මිලියන 787 ක් ක්‍රිකට්	2023	ශ්‍රී ලංකාවේ පැවැත්වීමට නියමිත තරඟාවලින්හි සත්කාරකත්වය අහිමිනොවන පරිදි ක්‍රියා කිරීමට අදාල පාර්ශ්වයන් වග බලා ගත යුතුය.	ඉදිරියේදී මෙවැනි පාඩු සිදු නොවීමට වග බලා ගනු ඇත.	තරඟාවලිය අවසන් වී ඇති බැවින් නිර්දේශය ක්‍රියාත්මක කළ නොහැකි තත්ත්වයක් පවතී. (සත්කාරකත්වය අහිමිවී ඇත.)

	ආයතනයට අහිමිවී තිබුණි. එසේම,ලෝක කුසලානය පැවැත්වීමට නියමිත කාලය තුළ සංචාරක නිකේතන වල වෙන්කරවා ගෙන තිබූ කාමර 700 ක් පමණ වෙනුවෙන් ලද හැකිව තිබූ විදේශ විනිමය ආදායම සහ ලද හැකිව තිබූ සංචාරක ප්‍රතිලාභද රටට අහිමිවී තිබුණි.				
4	2024 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ පැවැත්වීමට යෝජිත වී තිබූ 19 න් පහළ ලෝක කුසලානය සඳහා ක්‍රීඩාංගන සංවර්ධනය වෙනුවෙන් ක්‍රිකට් සංගම් 04 ක් වෙත රු.මිලියන 460.73 ක් අත්තිකාරම් වශයෙන් ලබා දී තිබුණි. අදාළ කාර්යයන් 2024 ජනවාරි 19 දිනට පෙර නිමකළ යුතු වුව ද එකී කිසිදු ව්‍යාපෘතියක් අදාළ කාලය තුල දී නිමකර නොතිබුණි. අදාළ කාර්යයන් ඉටු නොකිරීම නිසා උක්ත මුදලින් රු.මිලියන 195.10 ක් අදාළ ක්‍රිකට් සංගම් විසින් අත රඳවා ගැනීමෙන් පසු මුදල් ආපසු ලබාදීම නිසා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට සිදු වූ	2023	ව්‍යාපෘති අදාළ කාලය තුලදී නිමකිරීමට කටයුතු කළ යුතු අතර කාර්යයන් අදාළ කාලය තුලදී ඉටු නොකිරීම නිසා ආයතනයට සිදුවූ මූල්‍ය අලාභයන් අයකර ගැනීමට පියවර ගත යුතුය.	මූල්‍ය අලාභය අයකර ගැනීමට කටයුතු කරන අතර ඉදිරියේදී නිසි යාන්ත්‍රණයක් මගින් යටිතල පහසුකම් හා සංවර්ධන අත්තිකාරම් නිදහස් කිරීමට කටයුතු කරනු ලැබේ.	ක්‍රියාත්මක වෙමින් පවතී. (අදාළ ක්‍රිකට් සංගම් වලින් එක් සංගමයකින් සම්පූර්ණ මූල්‍ය අලාභයද තවත් සංගමයකින් මූල්‍ය අලාභයෙන් කොටසක්ද ලෙස රු.2,221,971ක් අයකර ගැනීමට පියවර ගෙන තිබුණි. ක්‍රිකට් සංගම් 02 ක් කාර්යයන් නිම කර තිබුණු අතර ක්‍රිකට් සංගම් 02 ක් කාර්යයන් නිමකර නොතිබුණි.)

	මූල්‍ය අලාභය ආසන්න වශයෙන් රු.මිලියන 4.8 කි. 2024 මැයි 31 දින වන විටත් රු.මිලියන 79.73 ක මුදලක් අදාල කාර්යයන් සඳහා යොදවා නොගෙන ඉහත ක්‍රිකට් සංගම් 04 විසින් අතරදවාගෙන තිබුණි.				
5	ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් ඉදිකිරීමට යෝජිත මහනුවර උසස් තාක්ෂණ පුහුණු මධ්‍යස්ථාන ව්‍යාපෘතිය සඳහා මහනුවර ප්‍රදේශයේ අක්කර 1 රූඩ් 3 පර්චස් 20.2 ක ඉඩමක් වර්ෂ 30 ක බදු පදනම මත රු.මිලියන 26.5 කට 2017 අප්‍රේල් 20 දින බදු ගෙන තිබුණි.මෙම ඉඩමෙහි පදිංචිව සිටි පුද්ගලයකු ඉවත් කිරීම සඳහා රු.500,000 ක් 2018 ජනවාරි 25 දින ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් බදුකරු වෙත ගෙවා තිබීම තුළින් සහ ඉඩමේ පිඹුරු පත් අතර නොගැලපීමක් පවතින තත්ත්වයක් යටතේ භුක්තිය නිරවුල් නොවූ ඉඩමක් සඳහා බදු ගිවිසුමක් ඇති කර ගැනීමට	2023	ව්‍යාපෘති සඳහා ඉඩම් බදු ගැනීමේදී භුක්තිය නිරවුල් ඉඩම් තෝරා ගත යුතු අතර ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම සඳහා කාර්යක්ෂමව කටයුතු කළ යුතුය.	ඉදිරියේදී ඉඩම් බදු ගැනීම වෙනුවට අත්පිට මුදලට මිලදී **ගැනීමට** කටයුතු කරනු ලැබේ.	නිර්දේශය ක්‍රියාත්මක වෙමින් පවතී. (ඉඩම බදු ගෙන වර්ෂ 06 ක් ගතවෙමින් තිබියදීත් ඉදිකිරීම් මූලික අදියරේ පැවතුණි.)

	නීතිඥවරයෙකු වෙත 2017 සැප්තැම්බර් 06 දින රු.525,000 ක් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් ගෙවා තිබුණි. එමෙන්ම 2021 වර්ෂයෙන් පසුව මෙම ව්‍යාපෘතියේ කිසිදු ඉදිකිරීමක් සිදුකර නොතිබූ අතර ඉඩම බදු ගෙන වර්ෂ 06 ක් ගතවෙමින් තිබියදීත් ඉදිකිරීම් මූලික අදියරේ පැවතුණි.				
6	විධායක මණ්ඩල අනුමැතිය මත ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සඳහා විවිධ මට්ටමේ පුද්ගලයින් 44 දෙනෙකු සම්බන්ධීකාරක තනතුරු වෙනුවෙන් පළාත් මට්ටමින් බඳවාගෙන තිබුණු අතර සමාලෝචිත වර්ෂය තුළදී ඔවුන් වෙත මාසික දීමනා, උත්සව හා දුෂ්කර දීමනා ලෙසත් ප්‍රවාහන වියදම් ප්‍රතිපූර්ණය කිරීමක් ලෙසත් රු.මිලියන 65.98 ක් ගෙවා තිබුණි. එසේ වුවද ඉහත සම්බන්ධීකාරකවරුන් වෙත දෛනිකව ඉටුකල යුතු කාර්යයන් හඳුනාගෙන පැවරීම් කිරීම් වෙනුවට ඔවුන්	2023	දෛනිකව ඉටුකල යුතු කාර්යයන් හඳුනාගෙන එම කාර්යයන් ආයතනයේ කාර්ය මණ්ඩලය යොදවාගෙන ඉටුකර ගතයුතුය.	ඉදිරියේදී මෙම බඳවා ගැනීම්වල දුර්වලතා මගහැර ගැනී මට කටයුතු කරනු ලැබේ.	නිර්දේශය ක්‍රියාත්මක වෙමින් පවතී. (2024 සැප්තැම්බර් 30 දින සිට මෙම තනතුරු නැවැත්වීමට අදාලව 2024 සැප්තැම්බර් 14 දින විධායක කමිටු තීරණයක් ගෙන ඇත.)

	වෙත ඉතා කෙටි කාලයක් තුළ ඉටුකල යුතු එක් කාර්යයක් හෝ කාර්යයන් 02 ක් පමණක් පවරා තිබීමෙන් ද ඔවුන් දරන නිත්‍ය රාජකාරි තනතුරු පිළිබඳව සොයා බැලීමකින් තොරව, ඉහත පුද්ගලයින් පත්කර ගෙන තිබීමෙන්ද ඔවුන් වෙත ගෙවා තිබූ මුදලට සරිලන සේවාවක් ලබා ගත්තේද යන්න විගණනයේදී නිශ්චය කිරීමට නොහැකි විය.				
7	1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 31 වන වගන්තිය සමග කියවිය යුතු 41 වන වගන්තිය යටතේ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යවරයා විසින් 2022 දෙසැම්බර් 14 දිනැති අංක 2310/26 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් පළ කරන ලද 5(6) රීතියට පටහැනිව දැනටමත් පුත්තලම දිස්ත්‍රික් ක්‍රිකට් සංගමයේ සභාපති ලෙස සහ ශ්‍රී ලංකා අත්පන්දු සම්මේලනයේ ලේකම් ලෙසද කටයුතු කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වෙත රු. මිලියන 2.2 ක	2023	-එම -	-එම -	නිර්දේශය ක්‍රියාත්මක කර තිබුණි. (සේවාව ලබා ගැනීම නවත්වා ඇත.)

	දීමනාවක් සමාලෝචිත වර්ෂය තුළදී පමණක් ගෙවා තිබුණි.				
8	අවම ප්‍රේක්ෂක ධාරිතාවය ආසන 40,000 ක් සහිත අංග සම්පූර්ණ ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණයක් රු.බිලියන 08 ක ඇස්තමේන්තුගත වියදමකින් දියගම ඉදිකිරීම සඳහා අක්කර 21 ක භූමි භාගයක් ලබාදීමට ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍යාංශය එකඟ වී තිබුණද, මේවන තෙක් එකී කටයුතු සිදුනොවීම නිසා ව්‍යාපෘති ඉදිකිරිම් ආරම්භ කිරීමට නොහැකි වී තිබුණි. අදාළ භූමි ප්‍රමාණය නීත්‍යානුකූල වශයෙන් ලබාදීමට පෙර හා අදාළ පාර්ශ්ව අතර අවබෝධතා ගිවිසුමක් ඇති කර ගැනීමකින් තොරව ව්‍යාපෘතියේ නිර්මාණ හා මැණුම් ගාස්තු වශයෙන් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් 2020 වර්ෂයේදී රු. මිලියන 3.4 ක මුදලක් වැය කර තිබුණි.	2023	පරිපාලන කටයුතු නිසිපරිදි සිදුකර ව්‍යාපෘති ඉදිකිරිම් ආරම්භ කිරීමටත් කටයුතු කළ යුතුය.	ඉදිරියේදී ඉඩම් බදු ගැනීම වෙනුවට අත්පිට මුදලට මිලදී ගැනීමට කටයුතු කරනු ලැබේ.	නිර්දේශය ක්‍රියාත්මක වෙමින් පවතී. (විගණන නිරීක්ෂණයෙන් පෙන්වා දුන් තත්ත්වයෙන්ම පවතී.)
9	පොළොන්නරුව ජාතික ක්‍රිකට් ක්‍රීඩාංගණය සහ	2022, 2023	පරිපාලන කටයුතු නිසිපරිදි සිදුකර ව්‍යාපෘති ඉදිකිරිම්	ක්‍රීඩාංගණය උපයෝජනයට ගැනීමට හා බදු	නිර්දේශය ක්‍රියාත්මක වෙමින් පවතී.

ප්‍රධාන ප්‍රේක්ෂකාගාර ගොඩනැගිල්ල ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා හෙක්ටයාර 16.898 ක රජයේ ඉඩම අවුරුදු 30 ක බදු පදනම යටතේ වාණිජ කටයුතු සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය වෙත ලබාදීමට අදාළ අමාත්‍යවරයා විසින් 2022 ඔක්තෝම්බර් 28 දිනැති අංක 2304 දරණ ගැසට් පත්‍රය මගින් අනුමැතිය ලබාදී වර්ෂයකට වඩා වැඩි කාලයක් ගත වී තිබුණ ද, අදාළ බදු ගිවිසුම් ගතවීම් සිදුකර නොතිබු අතර ප්‍රේක්ෂකාගාරයේ ඉදිකිරීම් කටයුතු ද මෙතෙක් සිදුකර නොතිබුණි. ඉදිකිරීම් පිරිවැය රු. මිලියන 154 ක් වූ උක්ත ක්‍රිකට් ක්‍රීඩාපිටියේ 2022 හා 2023 වර්ෂවල නඩත්තු කටයුතු සහ අමතර එකතු කිරීම් සඳහා එකතුව රු. මිලියන 27.5 ක් වැය කර තිබුණි. නමුත්, විගණිත දිනය වූ 2024 ජූනි 30 වනවිටත් ක්‍රීඩාංගණය උපයෝජනයට ගෙන නොතිබුණි.	ආරම්භ කිරීමටත් නිමකරඇති ක්‍රීඩාංගණය උපයෝජනයට ගැනීමටත් කටයුතු කළ යුතුය.	ගිවිසුම් ගතවීමට කටයුතු කරනු ලැබේ.	(මෙම ක්‍රීඩාංගනයේ ප්‍රථම තරඟය 2024 ජුලි මස 18 වන දින පවත්වන ලදී. බදු ගිවිසුම් ගතවීමට කටයුතු කරමින් පවතින අතර ප්‍රේක්ෂකාගාර යේ ඉදිකිරීම් කටයුතු සිදුකර නොතිබුණි.

10	2021 අංක 10 සහ 2022 අංක 45 දරණ දේශීය ආදායම් සංශෝධිත පනත් අනුව ස්වාධීන සේවා සපයන්නකු වෙත සේවා ගාස්තු ගෙවීමකදී සියයට 5ක රඳවා ගැනීමේ බදු (WHT) අඩුකිරීමක් සිදු කළ යුතු බව දක්වා තිබුණි. ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් ක්‍රිකට් ක්‍රීඩකයින් වෙත 2023 වර්ෂය තුළදී ගෙවා තිබූ ආසන්න වශයෙන් රු.මිලියන 794.45 ක කොන්ත්‍රාත් මුදල් මත හා ක්‍රිකට් විනිසුරුවරුන්, තේරීම්කාරකවරුන්, විස්තර විචාරකයින් සහ උපදේශකවරුන් වෙත ගෙවූ ගාස්තු මත ඉහත විධිවිධාන ප්‍රකාරව රඳවාගැනීම් බදු අඩුකිරීම් සිදුකර නොතිබුණි. මේ සම්බන්ධයෙන් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විමසා ඔහුගේ නිශ්කාෂණයක් ලබා ගැනීමට හෝ ඉහත මුදල් මත රඳවාගැනීමේ බදු අඩු කිරීමට ආයතනයට පවතින බැඳීම් පිළිබඳ තහවුරුවක් කර ගැනීමට හෝ ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය	2023	දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විමසා ඔහුගේ නිශ්කාෂණයක් ලබා ගැනීමට හෝ ඉහත මුදල් මත රඳවාගැනීමේ බදු අඩු කිරීමට ආයතනයට පවතින බැඳීම් පිළිබඳ තහවුරුවක් කර ගැනීමට කටයුතු කළ යුතුය.	2021 අංක 10 සහ 2022 අංක 45 දරණ දේශීය ආදායම් සංශෝධිත පනත් අනුව කොන්ත්‍රාත් පදනම මත සේවය ලබාගන්නා වෘත්තිකයන් රඳවාගැනීමේ බද්දට යටත් නොවන බව දැන්වූවද ආදායම් කොමසාරිස් ජනරාල් වෙත නිශ්කාෂණයක් ලබා ගැනීමට අදාලව ලිපියක් යැවීමට කටයුතු කරනු ලැබේ.	නිර්දේශය ක්‍රියාත්මක වෙමින් පවතී. (නිශ්කාෂණයක් ලබා ගැනීමට අදාලව ලිපියක් 2024 ජූලි 03 දින දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත යවා තිබුණි. 2024 අගෝස්තු 08 දින දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් ඉල්ලා ඇති තොරතුරු එදිනම ඉදිරිපත් කර තිබුණි.)

කටයුතු කර නොතිබුණි. එසේම, සම්බන්ධීකාරකවරුන් වෙත සමාලෝචිත වර්ෂයේදී ගෙවන ලද රු.මිලියන 65.98 ක ගෙවීම් සඳහාද අදාල පරිදි බදු අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.48 ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	3,252,952,475	1,518,233,070	1,734,719,405	(254,190,804)	තත්ත්වාගණනය කළ
2022	15,090,096,933	1,930,817,895	13,159,279,039	247,234,378	තත්ත්වාගණනය කළ
2023	15,447,093,193	2,163,485,809	13,283,607,384	303,769,922	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය හා යොමුව	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 2.1 හා 2.2 සිට 2.6 දක්වා වූ වගන්ති අනුව කාර්ය මණ්ඩලයේ සෑම සේවයක හා ශ්‍රේණියක තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම්, තනතුරෙහි වැටුප් පරිමාණය, වයස් සීමාව සහ අදාළ අනෙකුත් විස්තර ඇතුළත්කර බඳවා ගැනීමේ පටිපාටි පිළියෙල කර ආයතන සංග්‍රහයේ දක්වා ඇති ක්‍රියා පිළිවෙල අනුගමනය කරමින් එකී පටිපාටි සඳහා අදාළ අනුමැතිය ලබා ගැනීමට කටයුතු	2021-2.2.2(අ) 2022-2.2.2(අ) 2023-2.2.2(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ දක්වා ඇති විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.	බඳවා ගැනීමේ පටිපාටි සකස් කිරීමට පත් කල කමිටුව විසින් මේ වන විට බඳවා ගැනීමේ පටිපාටි කෙටුම්පත් සකසා අවසන් වී ඇති බව.	2024 සැප්තැම්බර් 30 දින වන විටත් බඳවා ගැනීම් පටිපාටි පිළියෙල කර අනුමැතිය ලබාගෙන නොතිබුණි.

	කළයුතු වුවද,මේ දක්වාම බඳවා ගැනීම් පටිපාටි පිළියෙල කර අනුමැතිය ලබාගෙන නොතිබුණි.				
2	රෝහල විසින් 2022 ඔක්තෝබර් සිට ගෙවන වාට්ටුවල කාමර ගාස්තු සඳහා එකතු කල අගය මත බදු ලෙස සියයට 15 ක බදු ප්‍රතිශතයක් රෝගීන්ගේ බිල්පත්වලින් අයකර තිබුණි. එසේ 2022 ඔක්තෝබර් සිට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා එකතු කල අගය මත බදු ලෙස අයකල රු.මිලියන 21.21ක් සම්බන්ධයෙන් 2002 අංක 14 දරන එකතු කල අගය මත බදු පනතේ 3 පරිච්ඡේදයේ 21 වගන්තිය පරිදි කාර්තුමය වාර්තා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබුණු අතර පනතේ විධිවිධානවලට අනුව එම ආදායමෙන් ඊට අදාලව ගෙවන ලද එකතු කල අගය මත බදු පමණක් හිලව් කරගැනීමෙන් තොරව අයකල සම්පූර්ණ බදු මුදලම ගෙවූ බදුවලට හිලව්	2023-2.3(අ)	2002 අංක 14 දරන එකතු කල අගය මත බදු පනතට අනුකූලව කටයුතු කළ යුතුය.	කාර්තුමය වාර්තා දේශිය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස අදාල නිලධාරීන්ට උපදෙස් ලබාදුන් බව හා රෝහලේ කාමරවලට අදාල වියදම් වෙනම හදුනා ගැනීම දුෂ්කර කාර්යයක් බැවින් අය කල සම්පූර්ණ බදු මුදල් ගෙවූ බදුවලට හිලව් කල බව.	2024 සැප්තැම්බර් 30 දින වන විටත් මෙම තත්ත්වය නිවැරදි කර නොතිබුණි.

කරගෙන තිබුණි.

3	රෝහලේ සම්පත් යොදාගෙන රාජකාරී වේලාවෙන් පරිබාහිරව කරන ශල්‍යකර්ම හා පරීක්ෂණ සඳහා සම්මත ප්‍රමිතියකින් හෝ නිශ්චිත ප්‍රතිපත්තියකින් තොරව විශේෂඥ වෛද්‍යවරුන්ගේ අභිමතය පරිදි අයකරන ගාස්තු තීරණය කර තිබුණි. ඒ අනුව 2023 වර්ෂයේ සිදුකරන ලද නියැදි විගණන පරීක්ෂාවට අනුව බිල්පත් වටිනාකමෙන් සියයට 24 සිට සියයට 89 දක්වා වූ පරාසයක වෘත්තීය ගාස්තු අයකර තිබුණි.	2021-2.3(ඇ)(i) 2022-3(ආ)(i) 2023-2.3(ඇ)(i)	රාජකාරී වේලාවෙන් පරිබාහිරව කරන ශල්‍යකර්ම හා පරීක්ෂණ සඳහා සම්මත ප්‍රමිතින් අනුව සකස් කළ අයකිරීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කළ යුතුය.	වෘත්තීය ගාස්තු නියාමනය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කමිටුවක් පත් කර ඇති බව හා ඉදිරියේදී එම කමිටු වාර්තාව අනුව කටයුතු කරන බව.	2024 සැප්තැම්බර් 30 දින වන විටත් මෙම තත්ත්වය නිවැරදි කර නොතිබුණි.
4	2023 ජුනි 08 දිනැති අංක S.B.M 1.4 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් අනුව රෝහල විසින් වෛද්‍ය හා අනෙකුත් කාර්යමණ්ඩලය සඳහා ගෙවනු ලබන වෘත්තිය ගාස්තු මත උපයන විට ගෙවීම් බදු අඩු කිරීමකින් තොරව 2022 දෙසැම්බර් 22 දිනැති අංක SEC/2022/E/03 දරන දේශිය ආදායම් දෙපාර්තමේන්තු චක්‍රලේඛය පදනම්	2023-2.3(ඇ)(vii)	බදු අභියාචනා කොමිසමේ තීරණය අනුව කටයුතු කළ යුතුය.	වෘත්තීය ගාස්තු මත උපයන විට බදු අය කිරීම ක්‍රමවත් කිරීමට කටයුතු කරන බව.	2024 සැප්තැම්බර් 30 දින වන විටත් මෙම තත්ත්වය නිවැරදි කර නොතිබුණි.

	කරගෙන රු.100,000කට වැඩි වෘත්තිය ගාස්තු ගෙවීම් මත 2023 ජනවාරි මාසයේ සිට සියයට 5ක රඳවා ගැනීමේ බද්දක් පමණක් අයකර දේශිය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර තිබුණි. එහෙත් රෝහලේ අභියාචනාවකට අදාලව බදු අභියාචනා කොමිෂන් සභාව විසින් 2024අප්‍රේල් 10 දිනැතිව ලබාදී තිබුණු වාර්තාව අනුව වෘත්තිය ගාස්තු මත උපයන විට බදු ගෙවිය යුතු බවට රෝහල වෙත දැනුම් දී තිබුණි. ඒ අනුව 2013/2014 වර්ෂයේ සිට 2023 දෙසැම්බර් දක්වා වූ කාලපරිච්ඡේදය වෙනුවෙන් රෝහලේ වෛද්‍ය හා අනෙකුත් කාර්ය මණ්ඩලය වෙත ගෙවන ලද වෘත්තිය ගාස්තු මත උපයන විට බදු ගණනය කර දේශිය ආදායම් දෙපාර්තමේන්තුව වෙත කඩිනමින් ප්‍රේෂණය කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි.				
5	1996 ජුලි 17 දිනැති අංක 96/1347/120/143	2022- 3(එ)(i) 2023-	අදාල අධිකාරී අනුමැතිය ලබාගැනීමට	ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල් පනතේ අංක 07	2024 සැප්තැම්බර් 30 දින වන විටත් අනුමැතිය ලබා

දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් ශ්‍රී ජයවර්ධනපුර රෝහලේ විවිධ ශ්‍රේණි සහ සෞඛ්‍ය අමාත්‍යාංශයේ සමාන්තර ශ්‍රේණි හෝ අනෙකුත් දෙපාර්තමේන්තුවල සමාන්තර තනතුරු අතර වැටුප් පරතරය සියයට 35 ක් වන අයුරින් පවත්වා ගැනීම පොදු ප්‍රතිපත්තියක් ලෙස තීරණය කර තිබුණි. මෙම වැටුප් වැඩිවීම පදනම් කරගෙන 2018 මාර්තු 15 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මගින් සෞඛ්‍ය අමාත්‍යාංශ පොදු චක්‍රලේඛ යටතේ වෛද්‍ය, හෙද හා පරිපූරක වෛද්‍ය සේවයේ නිලධාරීන් වෙත ගෙවීම් කරනු ලබන අතිරේක රාජකාරි දීමනා හා අතිකාල දීමනා සඳහා 2018 ජනවාරි 01 දින සිට බලාත්මක වන පරිදි සියයට 35 වැඩිවීම චක්‍රලේඛයේ සඳහන් රේටයට එකතු කර ගෙවීමට තීරණය කර තිබුණි. ඒ අනුව රෝහලේ වෛද්‍ය කාර්යමණ්ඩලය හෙද හා පරිපූරක වෛද්‍ය සේවයේ කාර්යමණ්ඩලය වෙත චක්‍රලේඛයේ සඳහන්	2.3(අ)	කටයුතු කළ යුතුය.	ඡේදයේ 2(C) වගන්තිය යටතේ රෝහල් මණ්ඩලයට ඇති බලතල අනුව මෙම තීරණය ගෙන ඇති බව.	ගැනීමට කටයුතු කර නොතිබුණි.

	අතිරේක රාජකාරි හා අතිකාල දීමනාවට සියයට 35ක් එකතු කර චක්‍රලේඛය මගින් ලබාදෙන දීමනාවට වඩා ඉහළ රේට් අගයක පිහිටුවා පිළිවෙලින් 2021, 2022 හා 2023 වර්ෂවලදී රු.මිලියන 168.43ක්, රු.මිලියන 162.47ක් හා රු.මිලියන 158.07ක් ලෙස ගෙවීම්කර තිබුණි. මේ සම්බන්ධයෙන් කැබිනට් මණ්ඩලයේ හෝ මහා භාණ්ඩාගාරයේ අනුමැතියක් ලබා තිබුණු බවට තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.				
6	මහාරෝග්‍යශාලා මණ්ඩලයේ පවතින රෝහල් ගාස්තු බිල්පත් හා තොග සම්බන්ධ (Systolic) පරිගණක පද්ධතියේ තොරතුරු ගිණුම්කරණ පරිගණක පද්ධතියට (Accpac) ඇතුළත් කිරීමෙන් පසු සිදුවන වෙනස්කම් නැවත ගිණුම්කරණ පද්ධතිය තුළ යාවත්කාලීන නොවීම හේතුවෙන් පද්ධතිය තුළ පවතින ගැණුම් පිරිවැය, ණයහිමියෝ, ණයගැතියෝ සහ	2021-2.3(ඉ)(i) 2023-2.3(ඌ)	පරිගණක පද්ධති අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාවයක් ඇතිකිරීම හා දත්ත ඇතුළත් කිරීම, පරීක්ෂා කිරීම හා අනුමත කිරීමට අදාළ ක්‍රියාපටිපාටි නිසි අධිකාරී බලයක් යටතේ ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය.	තොග සම්බන්ධ (Systolic)පද්ධති යේ පවතින මෙම ගැටළුව සම්බන්ධව හා කාලීන වාර්තා වල එකතුව පසු කාලීනව වෙනස් වීම පිළිබඳව අදාල ආයතනය සමඟ සොයා බැලීමට කටයුතු කරන බව.	2024 සැප්තැම්බර් 30 දින වන විටත් මෙම තත්ත්වය නිවැරදි කර නොතිබුණි.

රෝහල් ගාස්තු ආදායම යන අයිතමයන්හි අගයන් වෙනස්වීම මෙන්ම එකම පද්ධතිය තුළ (Systolic) වෙනස් දිනයන්හි ශේෂ වෙනස්වීම් නිරීක්ෂණය වූයෙන් එම අයිතමයන්හි නිවැරදි අගයන් මූල්‍ය ප්‍රකාශනවලින් නිරූපනය වන්නේද යන්න මතභේදයට තුඩුදෙන කරුණක් විය. රෝහලේ පවතින පරිගණක පද්ධති අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාවයක් (System link) ඇතිකර නොතිබීම, පරිගණක පද්ධතියේ දත්ත ඇතුළත් කිරීම, පරීක්ෂා කිරීම හා අනුමත කිරීමට අදාළ ක්‍රියාපටිපාටි නිසි අධිකාරී බලයක් යටතේ ක්‍රියාත්මක නොවීම මීට හේතු වී තිබුණි.

3.49 ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බද්දු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	4,937,292,276	259,755,599	4,677,536,677	651,179,227	තත්ත්වාගණනය කළ
2022	7,279,096,495	160,989,643	7,118,106,852	2,442,010,989	තත්ත්වාගණනය කළ
2023	11,154,144,728	473,135,490	10,681,009,238	3,492,042,780	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණන ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්වය
1.	2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ VII පරිච්ඡේදයේ 40 වගන්තියේ 09 උපවගන්තිය ප්‍රකාරව සෑම ලිත් වර්ෂයක් අවසාන වී මාස තුනක් ඉකුත්වීමට පෙරාතුව එම වර්ෂය තුළ කාර්යාංශයේ කටයුතු පිළිබඳව ඉදිරිපත් කළ යුතු වාර්තා, ප්‍රකාශනයන් හා සැලසුම් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි.	2021 2022 2023	වාර්තා, ප්‍රකාශනයන් හා සැලසුම් අමාත්‍යවරයා වෙත නිසි කළට ඉදිරිපත් කළ යුතු බව.	ඉදිරියේදී නියමිත පරිදි අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ.	නියමිත පරිදි වාර්තා අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි.
2.	වටිනාකම රු.308,700 ක් වන ලැප්ටොප් පරිගණක තුනක් 2013 දී අස්ථානගත වී තිබුණ ද, ඒ	2021	අස්ථානගත වීම සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතු බව.	මෙම සිද්ධිය පිළිබඳව නැවත සොයා බලා ඉදිරියේදී වාර්තා කිරීමට හා දක්වා ඇති පරිදි මුදල් රෙගුලාසි	2024 සැප්තැම්බර් 30 දින වන විටත් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

	සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 102 හා 104 රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.			ප්‍රකාරව කටයුතු කිරීමට අපේක්ෂා කරන බව	
3.	2006 පෙබරවාරි 21 දිනැති අංක CSA/2/3/4 දරන ජනාධිපති චක්‍රලේඛය ප්‍රකාරව අමාත්‍යවරයා සහ අමාත්‍යාංශ ලේකම්වරයා එකවර විදේශ ගමන්හි නොයෙදිය යුතු බවට දන්වා තිබුණද, 2021 ඔක්තෝබර් 05 සිට 08 දක්වා ප්‍රංශයේ පැවැත් වූ ප්‍රවර්ධන වැඩසටහනක් සඳහා එම දෙදෙනාම එකවර සහභාගී වී තිබුණු අතර ඒ සඳහා යම් විශේෂ හේතුවක් වූයේද යන්න හෙළිදරව් නොවුණි. ගමන සඳහා නවාතැන්, සංයුක්ත දීමනා සහ ගුවන් ප්‍රවේශ පත්‍ර ඇතුලු වියදම් සඳහා ඔවුන් දෙදෙනාට රු.2,535,970 ක වියදමක් කාර්යාංශයේ මුදලින් ගෙවා තිබුණි.	2021	චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු බව.	අදාළ ගෙවීම සංචාරක අමාත්‍යාංශ ලේකම්වරයාගේ නිර්දේශ මත ප්‍රවර්ධන කාර්යාංශයේ අධ්‍යක්ෂක මණ්ඩලයේ පූර්ව අනුමැතිය ලබා ගෙන ජනාධිපති ලේකම්වරයාගේ අනුමැතිය මත ගෙවීම් කරන ලදී.	මේ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.
4.	2006 පෙබරවාරි 21 දිනැති අංක CSA/2/3/4 දරන ජනාධිපති චක්‍රලේඛය අනුව විදේශ ගමන්	2021	විදේශ ගමන් සඳහා අත්‍යවශ්‍ය නිලධාරීන් පමණක් සහභාගී කරවිය යුතු බව	ජනාධිපති ලේකම්වරයාගේ 2021 ඔක්තෝබර් 01 දිනැති ලිපිය මගින් ලබා දුන් අනුමැතිය	මේ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

	සඳහා සහභාගීත්වය අවම විය යුතු බවට දක්වා තිබියදී, ප්‍රංශය, රුසියාව සහ යුක්රේනයේ පැවැත්වූ ප්‍රවර්ධන වැඩසටහන් සඳහා සංචාරක සංවර්ධන අධිකාරියේ උපදේශක කමිටුවේ සම්බන්ධීකාරකවරයා, අමාත්‍යවරයාගේ මාධ්‍ය ඒකක ප්‍රධානී, සිවිල් ගුවන් සේවා අධිකාරියේ නියෝජ්‍ය සභාපති සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්ද සහභාගී වී තිබුණු අතර ඔවුන් සඳහා නවාතැන්, සංයුක්ත දීමනා සහ ගුවන් ප්‍රවේශ පත්‍ර වෙනුවෙන් රු.7,135,173 ක් ගෙවා තිබුණි.			මත ගෙවීම් කරන ලදී.	
5.	2006 පෙබරවාරි 21 දිනැති අංක CSA/2/3/4 දරන ජනාධිපති චක්‍රලේඛයෙහි ගමනට ගතවන කාලය ද ඇතුළත්ව සහභාගි වන කාලය අත්‍යවශයෙන්ම අවම කළ යුතු බව දක්වා තිබියදී 2021 සැප්තැම්බර් 06 සිට 10 දක්වා රුසියාවේ සහ යුක්රේනයේ පැවැත් වූ ප්‍රවර්ධන වැඩසටහන් සඳහා සංචාරක සංවර්ධන අධිකාරියේ උපදේශක කමිටුවේ	2021	ගමනට ගතවන කාලය ද ඇතුළත්ව සහභාගි වන කාලය අත්‍යවශයෙන්ම අවම කළයුතු බව	මෙම ප්‍රවර්ධන වැඩසටහන සඳහා සංචාරක උපදේශන කමිටුවේ සම්බන්ධිකරණ ලේකම්, සංචාරක අමාත්‍යාංශයේ ලේකම්, සම්බන්ධිකරණ ලේකම් හා සංචාරක අමාත්‍යවරයා සහභාගි විය යුතු බවට 2021 සැප්තැම්බර් 22 දින පැවැත් වූ අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමේදී තීරණය විය. තවද 2021 ඔක්තෝබර් 02 පැවති අධ්‍යක්ෂක	මේ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

	සම්බන්ධීකාරකවරයා, අමාත්‍යවරයාගේ මාධ්‍ය ඒකක ප්‍රධානී සහ සිවිල් ගුවන් සේවා අධිකාරියේ නියෝජ්‍ය සභාපතිවරයා දින 07 කට කලින් ගමනට සහභාගි වීම නිසා ඔවුන් සඳහා නවාතැන් සහ සංයුක්ත දීමනා වෙනුවෙන් අමතරව රු.2,363,017 ක් ගෙවා තිබුණි.			මණ්ඩල රැස්වීමේදී පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුද එක් වීමට තීරණය විය. ඒ අනුව සහභාගිවන්නන්ගේ ඇස්මේන්තුගත පිරිවැය රු.3,387,300 ක් එකතු කරමින් පුද්ගලයින් 5 දෙනෙකු සඳහා මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.8,860,500 කි. කෙසේ වෙතත් සැබෑ සහභාගිත්ව පිරිවැය රු. 6,554,910 කි.	
6.	කාර්යාංශයේ වර්තමාන වෙළඳ සන්නාමය “So Sri Lanka” වන අතර 2018 තෙක් පැවති වෙළඳ සන්නාමය “Wonder of Asia” විය. ඒ අනුව Wonder of Asia සන්නාමය සහිත එකක් රු.4,300 ක් බැගින් වූ කොඩි 398 ක් සමාලෝචිත වර්ෂය අවසාන දින වන විට ද ගබඩාවේ භාවිතයට ගත නොහැකිව පැවති අතර ඒවායේ වටිනාකම රු.1,711,400 ක් විය.	2021	ජාතික සංචාරක ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමෙන් නාස්තිය අවම කළ යුතු බව.	“Wonder of Asia” සන්නාමය සහිත කොඩි කාර්යාංශය මඟින් සංචාරක ප්‍රවර්ධන වැඩසටහන් සඳහා භාවිතයට ගෙන ඇත. නමුත් කාර්යාංශයේ කළමනාකාරිත්වයේ තීරණය මත සන්නාමය “So Sri Lanka” නමින් වෙනස් කිරීමත් සමඟ මෙම කොඩි භාවිතයට ගැනීමට නොහැකි වී ඇත.	ජාතික සංචාරක ප්‍රතිපත්තිය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණද මේ දක්වා ගැසට් පත්‍රයේ පළකර ක්‍රියාවට නංවා නොතිබුණි.
7.	ආයතන සංග්‍රහයේ II ඡේදයේ 1.9 වගන්තිය ප්‍රකාරව තනතුරක් ස්ථාපිත කළ දින සිට හෝ ඉන් පසුව හෝ එම තනතුර පුරප්පාඩු	2022 2023	තනතුරක් ස්ථාපිත කළ දින සිට හෝ ඉන් පසුව හෝ තනතුර පුරප්පාඩු වී ඇති දින සිට බලපැවැත්වෙන	උසස්වීම් සඳහා කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය ලැබී තිබුණි. එම තනතුර දැරීමට නියමිත	පෙරදාතම කරන ලද උසස්වීම් අවලංගු කර නියමිත කාලයට පමණක් උසස්වීම් ලබාදීම

	වූ දින සිට බලපැවැත්වෙන පරිදි උසස්වීම් හෝ පත්වීම් ලබා දිය හැකිය. එසේ වුවද ආයතන සංග්‍රහයට පටහැනිව නිසි අනුමැතියකින් සහ විනිවිදභාවයකින් තොරව 2015 වර්ෂය තුළ කාර්යාංශයේ නිලධාරිනියන් දෙ දෙනෙකුට වර්ෂ 09 කට වඩා වැඩි කාලයකට පෙරදාතම කර උසස්වීම් ලබාදී තිබුණි. තවද, උසස්වීම සඳහා වූ අවම වසර 10 ක සේවා කාලය ද මෙම නිලධාරිනියන් විසින් සපුරා නොතිබුණි.		පරිදි උසස්වීම් හෝ පත්වීම් සිදු කළ යුතුය.	කාලය අවසන් වනතුරු උසස්වීම් ලැබූ තනතුර මත නිලධාරීන් වැඩබලන පදනම මත පත් කර තිබුණි.	සම්බන්ධයෙන් සළකා බලා නොතිබුණි.
8.	කාර්යාංශයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2022 මැයි 09 සිට 12 දක්වා අරාබි සංචාරක වෙළඳපොළ (ATM-2022) සඳහා සහභාගී වීමට 2021 දෙසැම්බර් 17 වන දින රු.90,000,000 ක් අනුමත කර තිබූ අතර පසුව මෙම පිරිවැය රුපියලේ අගය අවප්‍රමාණය වීම හේතුවෙන් කාර්යාංශයේ සභාපතිවරයා විසින් 2022 මාර්තු 29 දින රු.120,464,910 දක්වා වැඩි කර තිබුණි. වර්ග මීටර් 250 ක ඉඩ ප්‍රමාණය වෙන්කර	2022	අනාගතයේදී එවැනි පාඩු වළක්වා ගැනීමට පියවර ගත යුතුය.	වෙනත් ලංසුකරුවන් විසින් ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් අඩු කේවල් කිරීමේ හැකියාව, කාලය සීමාසහිත වීම සහ ඒ වන විට ලබා ගත නොහැකි වූ කොන්දේසි සහිතව පිළිගැනීමට සිදු වීම හේතුවෙන්, කාර්යාංශය හට විකල්පයක් නොතිබුණි.	මෙවැනි පාඩු වැළැක්වීමට ගත් ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් තොරතුරු ඉදිරිපත් නොවුණි.

	ගැනීමට ලංසු කැඳවූ නමුත් ආර්ථික තත්ත්වය හේතුවෙන් අධ්‍යක්ෂ මණ්ඩලය එම ඉඩ ප්‍රමාණය වර්ග මීටර් 150 දක්වා අඩු කර තිබුණි. කෙසේ වෙතත්, අවකාශය අඩු වීම පිරිවැය අඩු වීමට බලපා නොතිබූ අතර එහි මූලික පිරිවැය ඇ.ඩොලර් 16,175 කින් වැඩි වී තිබුණි. මීට අමතරව රිබන්, කතුරු, ඉටිපන්දම් සහ බන්දේසි සඳහා ඇ.ඩොලර් 525 ක් සහ ඇ.ඩොලර් 2,444.55 ක් වැට් බදු අය කර තිබුණි. එබැවින් 2021 දෙසැම්බර් මාසයේදී මෙම තීරණය ගනු ලැබුවද කාර්යාංශය විසින් උත්සවය නිසි ලෙස සැලසුම් කර නොතිබූ බව නිරීක්ෂණය විය.				
9.	ලංකා බල බෝට්ටු සංගමය විසින් 2017 වර්ෂයේදී සංවිධානය කරන ලද බෙන්තොට ප්‍රදේශයේ පැවති ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් නොවූ ජාත්‍යන්තර බල බෝට්ටු තරඟයකට ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය සහභාගී වී තිබූ අතර ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ඇතිව රු.7,600,000	2022	සෑම මිලදී ගැනීමකදීම හෝ සේවා ලබා ගැනීමේදීම ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය අනුගමනය කළ යුතු අතර ප්‍රධාන අරමුණු සාක්ෂාත් කර ගැනීමට බැඳීමක් ඇති කර ගැනීම සඳහා ගිවිසුම් අත්සන් කළ යුතුය.	මෙම තරඟය පසුව 2017 සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර ඇති අතර එය එවකට සංචාරක අමාත්‍යවරයා සහ එවකට ක්‍රීඩා අමාත්‍යවරයා විසින් ලබා දුන් උපදෙස් පරිදි පවත්වන ලදී. ප්‍රවර්ධන ක්‍රියාකාරකම්වල ප්‍රධාන අරමුණු සාක්ෂාත් කර ගැනීම	මේ සම්බන්ධයෙන් කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

	ක දායකත්වයක් ලබා දීමට එකඟ වී තිබුණි. කෙසේ වෙතත්, මෙහිදී සමස්ත පිරිවැයෙන් සියයට 20 ක් සඳහා සංගමය විසින් බැංකු ඇපකරයක් සපයා නොතිබීම, බොහෝ ප්‍රවර්ධන කටයුතු සංගමය විසින් ඉටුකර නොතිබීම, එකඟ වූ පිරිවැය රු.3,172,859 කින් හෝ සියයට 42 කින් වැඩිකර තිබීම, එංගලන්තයේ සිට බල බෝට්ටු ප්‍රවාහනය සඳහා නැව් සමාගමක් තෝරා ගැනීමේදී ප්‍රසම්පාදන ක්‍රියාවලියක් අනුගමනය නොකිරීම, බල බෝට්ටු තරඟය පැවැත්වීමේ ප්‍රමාදයක් සිදු වීම සහ බෝට්ටු නැවට යොමු කිරීමේ ප්‍රමාදයක් ද සිදු වී තිබුණි.			සම්බන්ධයෙන් සවිස්තර වාර්තාවක් සංවිධායකවරයාගෙන් ලැබී නොමැත. නැව් සමාගම තෝරාගෙන දැනුම් දෙනු ලැබුවේ ලංකා නැව් සංස්ථාව විසිනි. සංවිධායකවරයා එංගලන්තයේ නැව් සමාගම සහ ශ්‍රී ලංකාවේ නියෝජිත සමාගම යන දෙකෙහිම කළමනාකාර අධ්‍යක්ෂවරයා බව අවසාන ගෙවීම් අදියරේදී හඳුනාගෙන ඇත. කෙසේ වෙතත්, එවකට අමාත්‍යවරයා සහ අමාත්‍යාංශ ලේකම්වරයා ලබාදුන් උපදෙස් අනුව අවසන් ගෙවීම සිදු කරන ලදී.	
10.	2023 වර්ෂය අවසාන දිනට එකතුව රු.45,707,620 ක් වූ විදේශ දූත මණ්ඩල අත්තිකාරම් පිළිබඳ ශේෂ තහවුරු කිරීම් ලැබී නොතිබුණි.	2021 2022 2023	විදේශ කටයුතු අමාත්‍යාංශය සමඟ අත්තිකාරම් සංසන්දනය කර නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.	කාර්යාංශය වෙත විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් 2023 වර්ෂය තුළ සිදු කරන ලද ගෙවීම් සම්බන්ධයෙන් පමණක් තහවුරු කිරීමේ ලිපියක් ලැබී තිබුණි. එම තහවුරු කිරීමේ ලිපියට අනුව රු.3,264,261 ක් පමණක් 2023 වර්ෂය තුළ ප්‍රේෂණ යවා තිබුණි.	විදේශ කටයුතු අමාත්‍යාංශය සමඟ අත්තිකාරම් සංසන්දනය කර නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතී.

11.	රජය සතු ව්‍යවසායයන් සඳහා වන යහපාලනය පිළිබඳ මාර්ගෝපදේශයේ 2.3 ඡේදය අනුව කාර්යාංශය සඳහා උපායමාර්ගික සැලැස්මක් 2020-2023 දක්වා වූ වර්ෂ හතරක කාලය සඳහා සකස් කර තිබූ අතර අද දක්වා එය යාවත්කාලීන කර නොතිබුණි.	2023	උපායමාර්ගික සැලැස්ම වර්ෂ පහක කාලයක් සඳහා සකස් කර භාණ්ඩාගාරයට ඉදිරිපත් කළ යුතු අතර සෑම වර්ෂයකම යාවත්කාලීන කළ යුතුය.	සටහන් කර ගත් අතර ඉදිරියේ දී පියවර ගනු ඇත.	මේ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.
12.	2023 ජූලි මාසයේදී ශ්‍රී ලංකාවේ පැවති TAAI සමුළුව සඳහා ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය හා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය රහිතව සභාපතිවරයාගේ අනුමැතිය යටතේ රු.10,120,000 ක වියදමින් “Visit Sri Lanka” සන්නාමගත කොඩි 500 ක් මුද්‍රණය කර තිබුණි. කෙසේ වෙතත්, මෙහිදී ගුණාත්මකභාවය සහ පිරිවිතරයන් සපුරා නොතිබුණු අතර සතුටුදායක අන්දමින් කාර්යය ඉටු වූ බවට වාර්තාවක් අද දක්වා ඉදිරිපත් කර නොතිබුණි. තවද, ඇස්තමේන්තුවට වඩා පිරිවැය ඉහළ ගොස් තිබූ අතර එය කොඩියකට වැට් බද්ද	2023	නියමිත පරිපාටියෙන් බැහැරවීම් සඳහා පූර්ව අනුමැතිය ලබා ගත යුතු අතර පවතින මාර්ගෝපදේශවලට අනුකූල විය යුතුය.	දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු තීරණයක් මගින් අදාළ කොඩි සැලසීනේ සමාගම වෙතින් මිලදී ගත් බව තහවුරු කරන අතර කොඩිවල ප්‍රමාණයේ වෙනස ගැලපීමෙන් හා මිල සාකච්ඡා කිරීමෙන් පසුව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන ගෙවීම් කර ඇත.	කොඩිවල ප්‍රමාණයේ වෙනස ගැලපීමෙන් හා මිල සාකච්ඡා කිරීමෙන් පසුව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන ගෙවීම් කර ඇත.

	රහිතව රු.17,600 ක් වී තිබූ බව නිරීක්ෂණය විය.				
13.	2023 වසරේ ජර්මනියේ සහ චීනයේ පැවති ප්‍රවර්ධන වැඩසටහන් සඳහා සහභාගිවන්නන් සඳහා ගුවන් ටිකට්පත් මිලදී ගැනීමේදී, ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය නියමිත වේලාවට ආරම්භ කර නොතිබීම, ලංසු සඳහා ආරාධනා කිරීම සඳහා ලබා දී ඇති සීමිත කාලසීමාව, නිසි අනුමැතිය රහිතව ඇස්තමේන්තුවට වැඩියෙන් ගෙවීම් කිරීම සහ සාකච්ඡා කර මිල ගණන් තීරණය නොකිරීම ආදිය නිරීක්ෂණය විය.	2023	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ පිළිපැදීමට පියවර ගත යුතුය .	මෙය ආර්ථික අර්බුදය සහ අනුමැතිය ලබාගැනීමේ ප්‍රමාදය හේතුවෙන් වැඩසටහන් සඳහා තීරණ අවසාන මොහොතේ ගැනීම හේතු විය.	වැඩසටහන් සඳහා අනුමැතිය ලබා ගැනීමේ ප්‍රමාදය වළක්වාගෙන පිරිවැය අවම වන ආකාරයට ගුවන් ටිකට්පත් ඉක්මනින් මිලදී ගැනීමේ ක්‍රමවේදයක් මේ දක්වා ක්‍රියාවට නංවා නොතිබුණි.

3.50 ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	බදු පෙර ලාභය (අලාභය) රු.	මතය
2021	5,265,351,712	866,816,526	4,398,535,186	(88,331,709)	ව්‍යාවනය කළ
2022	5,928,031,453	968,063,847	4,959,967,606	602,476,875	තත්ත්වාගණනය කළ
2023	11,154,144,728	473,135,490	10,681,009,238	786,525,231	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණන ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්වය
1.	විදේශීය සංචාරකයන් හට ප්‍රවාහන පහසුකම් ලබාදෙන ත්‍රී රෝද රථ රියදුරන් පුහුණු කිරීමේ වැඩසටහනක් ආරම්භ කරන ලෙස සංචාරක අමාත්‍යාංශයෙන් සිදුකරන ලද ඉල්ලීමකට අනුව සංචාරක සංවර්ධන අධිකාරිය මගින් ආරම්භ කරන ලද " ටුක් ටුක් වැඩසටහන" වෙනුවෙන් වැයවන මූල්‍යමය දායකත්වය අමාත්‍යාංශය මගින් ප්‍රතිපූර්ණය කිරීමට එකග වී තිබුණු නමුත්, 2018 සහ 2019 වර්ෂයන්හි දරා තිබූ රු.13,227,648ක් සමාලෝචිත වර්ෂය	2021 2022 2023	අදාළ මූල්‍යමය දායකත්වය අමාත්‍යාංශයෙන් ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කළයුතු බව	අමාත්‍යාංශය සමග සාකච්ඡා කර මේ පිළිබඳ අවසන් තීරණයක් ගනු ලැබේ.	2024 සැපතැම්බර් 30 දින වන විටත් අදාළ මුදල් අයකරගෙන නොතිබුණි.

	අවසාන දින වන විටත් අය වී නොතිබුණි.				
2.	2021 නොවැම්බර් 30 සිට දෙසැම්බර් 03 දින තෙක් ස්පාඤ්ඤයේ පැවති එක්සත් ජාතීන්ගේ ලෝක සංචාරක සංවිධානයේ වාර්ෂික රැස්වීම වෙනුවෙන් සංචාරක අමාත්‍යාංශ ලේකම් සහභාගි වී තිබුණු අතර ඒ වෙනුවෙන් අධිකාරිය විසින් දරන ලද පිරිවැය වූ රු.1,398,426 ක් 2022 සැප්තැම්බර් 05 දින වන විටත් අමාත්‍යාංශයෙන් ප්‍රතිපූර්ණය කර ගෙන නොතිබුණි.	2021	සංචාරක අමාත්‍යාංශ ලේකම් වෙනුවෙන් දැරූ මූල්‍යමය දායකත්වය අමාත්‍යාංශයෙන් ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කළයුතු බව.	2021 නොවැම්බර් මස 09 වන දින එක්සත් ජාතීන්ගේ ලෝක සංචාරක සංවිධානය විසින් සංවිධානයේ වාර්ෂික රැස්වීමට සහභාගී වන ලෙස සංචාරක අමාතංශයේ ලේකම්තුමාට හා සංචාරක සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂක ජනරාල්තුමාට ලිඛිතව ආරාධනා කරන ලදී. ඒ අනුව අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය හා ජනාධිපති ලේකම්තුමාගේ අනුමැතියට යටත්ව අවශ්‍ය කටයුතු කරන ලදී. මෙවැනි සංචාරයන් සඳහා මීට පෙර අවස්ථා කිහිපයකදීම අධිකාරිය විසින් පිරිවැය දරා ඇති අතර ඉදිරියේදී මෙවැනි සංචාරයන් සඳහා අමාතංශයේ වැය ශීර්ෂයෙන් පියවා ගැනීමට අමාත්‍යාංශය දැනුවත් කිරීමට කටයුතු කරමි.	2024 සැපතැම්බර් 30 දින වන විටත් අදාළ මුදල් ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණි.
3.	2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 6.1 (අ) සහ (ආ) වගන්ති ප්‍රකාරව සංචාරක සංවර්ධනය සඳහා යෝජිත දිගුකාලීන ඉලක්ක	2021 2022 2023	සංචාරක සංවර්ධනය සඳහා දිගුකාලීන ඉලක්ක සහ සිව් අවුරුදු සැලැස්මක් සකස්කළ යුතු	2020 වසරේ සිට සංචාරක කර්මාන්තය සඳහා ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම අමාත්‍යාංශය මඟින් ආරම්භ කරන ලදි. ඒ අනුව	2024 සැපතැම්බර් 30 දින වන විටත් දිගුකාලීන ඉලක්ක සහ සිව් අවුරුදු සැලැස්මක් සකස් කර නොතිබුණි.

	සහ සිව් අවුරුදු සැලැස්මක් සකස්කර අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි.		බව	ආයතනික සැලසුම් සකස් කරන ලෙස ලේකම්තුමාගේ උපදේශය මෙන්ම අප ආයතනික සූදානම පැවතිණි. යෝජිත ප්‍රතිපත්තිය සකස් කිරීම අවසන් අදියරේ පවතින අතර, අමාත්‍යාංශය සමඟ සැලසුම සකස් කිරීමට අප කටයුතු කරන අතර ඒ අනුව දිගු කාලීන සැලැස්ම සහ ඉලක්ක අමාත්‍යතුමා වෙත ලබා දීමට බලාපොරොත්තු වේ.	
4.	පරිසර හිතකාමී කඩ කාමර 20 ක්, එක් කුටියකට බංකු 02 ක්, ආරක්ෂිත වැටක් සහ නාම පුවරුවක් ඉදිකිරීමේ අරමුණ ඇතිව රු.7,488,133 ක වැඩ වටිනාකමකින් 2017 පෙබරවාරි ආරම්භ කර 2017 දෙසැම්බර් 15 දින වන විට වැඩ අවසන් කිරීමට බලාපොරොත්තු වූ දුන්හිඳ ඇල්ල ව්‍යාපෘතිය 2018 ජනවාරි 22 දින වන විට රු.2,864,289 ක එකතු වියදමකින් කඩකාමර 10 ක් සහ නාම පුවරුව පමණක් ඉදිකර වැඩ නවතා තිබුණි. කෙසේවුවද, 2021 වර්ෂයේ දී, දුන්හිඳ ව්‍යාපෘතිය-	2021 2022 2023	ඇල්ල වැඩි සංචාරක ආකර්ෂණයක් ඇති ප්‍රදේශයක් බැවින් යටිතල පහසුකම් දියුණු කිරීම අධිකාරියේ ද වගකීමක් බව සහ සැලසුම් කළ පරිදි වැඩ අවසන් කිරීමට කටයුතු කළයුතු බව	පළමු අදියරේදී කඩ කාමර 5 ක් සොරණාතොට ප්‍රාදේශීය සභාව මගින් ඉදිකරන ලදී. ඉතිරි කොටස ඉදිකිරීමට එම ප්‍රාදේශීය සභාව සතුව මුදල් නොමැති බව දන්වා සිටින ලදී. 2021 දෙසැම්බර් 02 අධ්‍යක්ෂක මණ්ඩල ප්‍රතිකාවෙන් ලබාගත් තීන්දුව අනුව දෙවන අදියර වශයෙන් පරිසර හිතකාමී කඩකාමර 05 ක් ඉදිකිරීමට කටයුතු කරන ලෙස ඌව පළාත් සංචාරක කාර්යංශයට දන්වා යවන ලදී. එවකට පැවති කොරෝනා වසංගතය සමග සංචරණ සීමා පැනවීම, පළාත්	ව්‍යාපෘතියේ වැඩ බලපොරොත්තු වූ පරිදි නිම කිරීමට 2024 සැපතැම්බර් 30 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

	අදියර II යටතේ තවත් කඩ කාමර 5 ක් රු.2,350,000 ක වියදමකින් නිම කිරීමට අධිකාරිය තීරණය කර තිබුණ ද, මුල් සැලසුමේ වූ කාමර 5 ක් ඉදිකිරීම අත්හැර තිබුණි. තවද, එක් කාමරයකට එවකට රු.272,429 ක් වූ පිරිවැය වසර 4 ක ප්‍රමාදය හේතුවෙන් රු. 470,000 ක් දක්වා සියයට 72 ක් වර්ධනය වී තිබුණි.			හුදකලා කිරීම සහ මිල ගණන් ඉහළයාම නිසා කොන්ත්‍රාත් කරුවන් තෝරාගැනීම දුෂ්කර බව එම කාර්යාංශය දන්වා සිටින ලදී.	
5.	2018 අගෝස්තු සිට 2022 ජූලි දක්වා බලාත්මක ඒකකය මඟින් සිදුකළ විමර්ශනයන්ට අනුව සංචාරක ව්‍යවසායන් හෝ සංචාරක සේවාවන් ලෙස ව්‍යාපාර කරගෙන යන ලියාපදිංචි නොකළ ආයතන 640 ක් හඳුනාගෙන තිබුණු නමුත් ඉන් ආයතන 20 ක් පමණක් 2022 ජූලි 03 දින වන විට ලියාපදිංචි කර තිබුණි. ඒ අනුව, අවිධිමත්ව සංචාරක ක්ෂේත්‍රයේ ව්‍යාපාර කරගෙන යන ආයතන බලාත්මක ඒකකය විසින් නියාමනය කිරීම ඉතා පහළ මට්ටමක පැවති බව පෙනේ. කළමනාකරණය විසින් මෙම ඒකකයේ	2021 2022 2023	නීතිය බලගැන්වීමේ ඒකකය 2018 අගෝස්තු සිට 2022 ජූලි දක්වා ක්‍රියාත්මකව පැවති බැවින් නියාමන කටයුතු ද එයට සමගාමීව ක්‍රියාත්මක විය යුතු බව.	සියයට 15 කට අධික ආයතන ප්‍රමාණයක් මේ වන විටත් ලියාපදිංචිය ලබා ඇති අතර තවත් ආයතන 32 ක ලියාපදිංචිය සිදු වෙමින් පවතී. ආයතනයේ අයිතිය සනාථ කිරීමට නීතිමය ලියවිල්ලක් නොමැති වීම, බලයලත් ආයතනයක් විසින් අනුමත කරන ලද ගොඩනැගිලි සැලැස්මක් නොමැති වීම, ගිනි ආරක්ෂණ සහතිකය ලබා ගැනීමට අවශ්‍ය මූල්‍යමය හැකියාව නොමැති වීම හා අවශ්‍ය පුහුණුව ලබා දීමට ඇති ප්‍රායෝගික අපහසුතා, පරිසර ආරක්ෂණ බලපත්‍ර කඩිනමින් ලබා ගැනීමට නොහැකි වීම	සංචාරක සේවාවන් ලෙස ව්‍යාපාර කරගෙන යන ලියාපදිංචි නොකළ ආයතන ලියාපදිංචි කිරීම කාර්යක්ෂමතාවය කින් සිදු කර නොතිබුණි.

	කාර්යසාධනය පිළිබඳව ද ප්‍රමාණාත්මක ඇගයීමක් සිදුනොකර එම ඒකකයේ උපදේශක, විමර්ශන නිලධාරී සහ නීති උපදේශක වෙනුවෙන් දීමනා වශයෙන් පමණක් 2018 අගෝස්තු සිට 2022 ජූලි දක්වා එකතුව රු.13,397,500 ක් ගෙවීමට කටයුතු කර තිබුණි.			හා අදාළ ක්ෂේත්‍ර පරීක්ෂණ සිදු කිරීමට වර්තමාන තත්ත්වය මත යම් කාලයක් ගත වීම හා ඒ සඳහා මුදල් ගෙවීමට ඇති නොහැකියාව. ආදී හේතූන් නිසා ලියාපදිංචිය සිදු කිරීමට පවතින නොහැකියාව හා රජයට බදු ගෙවීමට පොදුවේ සේවා සපයන්නන් තුළ පවතින ඍණාත්මක ප්‍රතිචාරද මෙයට බලපානු ලබයි.	
6.	2023 අවසානයේ දී මුළු වෙළඳ ණය ගැතියන්ගෙන් සියයට 25 ක් වූ වෙළඳ ණය ගැතියන් රු.70,008,231 ක් වසර 03 කට වැඩි කාලයක් තිස්සේ ආපසු අයකර ගෙන නොතිබුණි.	2021 2022 2023	ණයගැති කාලය තුළ ණය අයකර ගැනීමට කටයුතු කළ යුතු අතර කල් ඉකුත් වූ ණය ගැතියන් සඳහා අධිභාරයක් පැනවිය යුතුය.	අධ්‍යක්ෂ ජනරාල් විසින් හිඟ මුදල් අයකර ගැනීම සඳහා අධ්‍යක්ෂ මූල්‍ය කළමනාකරණ, නීති, සංවර්ධන සහ අනෙකුත් විශේෂ නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් පත් කර ඇත.	ණය මුදල් අයකරමින් පවතී.
7.	2023 වර්ෂය අවසාන දිනට තානායම් 34 කින් අයවිය යුතු හිඟ කුලී ආදායමේ එකතු වටිනාකම රු.29,831,815 ක් වූ අතර ඉන් වසර 4 කට වැඩි හිඟහිටි කුලී ආදායම රු.10,167,445 ක් හෝ සියයට 34 ක් විය. එම මුදල් අයකර ගැනීමට ගෙන ඇති ක්‍රියාමාර්ග සතුටුදායක මට්ටමක නොමැති	2021 2022 2023	හිඟ කුලී ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.	අදහස් දක්වා නොමැත.	හිඟ මුදල් කඩිනමින් අය කරගෙන නොතිබුණි.

	බව නිරීක්ෂණය විය. එමෙන්ම, වර්ෂ 04 කට වැඩි කාලයක් තිස්සේ පුරප්පාඩු වූ තානායම් 07 ක් බදු දීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි.				
8.	නුවරඑළිය ප්‍රදේශයේ සංචාරක හෝටල් සහ ආපනශාලා 106 ක නියැදියකින් සියයට 62 ක් වන ආයතන 66 ක් අධිකාරිය යටතේ ලියාපදිංචි වී නොතිබුණි. සත්‍ය වශයෙන් ලියාපදිංචි වූ සංචාරක ආයතන සංඛ්‍යාව 81 ක් පමණක් වුවද, විදේශීය වෙබ් අඩවිවල ලියාපදිංචි වී ඇති සංචාරක ආයතන දහස් ගණනකට වඩා වැඩි ප්‍රමාණයක් තිබුණි.	2023	සංචාරකයින්ට සේවා සපයන ආයතන ලියාපදිංචි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.	විධිමත් අංශයට අවිධිමත් අංශයේ බලපෑම අවම කිරීම සඳහා වසර තුනක කාලයක් තුළ විශේෂ ඒකකයක් පිහිටුවීම සඳහා අධිකාරිය ආසියානු සංවර්ධන බැංකුවෙන් (ADB) සහාය ඉල්ලා සිටින ලදී. කෙසේ වෙතත්, තාවකාලික ප්‍රතිචාර හැරුණු විට, එම කාර්යය ඵලදායී ලෙස හැසිරවීමට අවශ්‍ය හැකියාව නීති අංශයට පවා නොමැත. තවද, අවිධිමත් අංශය තුළ ක්‍රියාකාරකම් කළමනාකරණය කිරීම සඳහා අධිකාරිය විසින් සංචාරක පොලිසියට ඇතැම් වගකීම් පවරා ඇත.	2024 වර්ෂයේදී මේ සම්බන්ධයෙන් නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේද සහයෝගීතාවයෙන් දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වා තිබුණි.
9.	මුදල් අමාත්‍යාංශය විසින් 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 චක්‍රලේඛය මඟින් සංශෝධනය කරන ලද මුල්‍ය රෙගුලාසි 371(2) (ආ) පටහැනිව අධිකාරිය විසින් 2023 වර්ෂයේදී	2023	රු.100,000 ට වඩා තත්කාර්ය අතුරු අග්‍රිම ලබා නොදිය යුතු අතර මුල් පිටපත් සහ විශ්වාසනීය බිල්පත් සහ ඉන්වොයිසි ඇති විට පමණක්	මුල් බිල්පත්වල විශ්වසනීයත්වයක් නොමැති වුවද, මුදල් අංශය සාකච්ඡා කරමින් පවතින අතර ඉතිරි සියයට 50 තවමත් නිකුත් කර නොමැත.	රු.2,432,000 ක තත්කාර්ය අතුරු අග්‍රිමය 2024 සැපතැම්බර් 30 දින වන විටත් පියවා නොතිබුණි.

	දී මාණ්ඩලික ශ්‍රේණියේ නිළධාරීන්ට තත්කාර්ය අතුරු අග්‍රිම එකතුව රු.7,571,560 ක් 27 වතාවකදී ලබාදී තිබුණු අතර, එය රු.100,000 ක සීමාව ඉක්මවා තිබුණි. තවද, 2023 නොවැම්බර් 06 වන දින සෆාරි ජීප් රියදුරන් 960 දෙනෙකු සඳහා පැවැත්වූ පුහුණු වැඩසටහනක් සඳහා ලබාගත් රු.2,432,000 ක තත්කාර්ය අතුරු අග්‍රිමය ද මෙතෙක් පියවීමට කටයුතු කර නොතිබුණි.		පියවීම් සිදු කළ යුතුය.		
10.	2014 සහ 2019 වර්ෂවලදී යාල සංචාරක සංවර්ධන කලාපයේ අක්කර 35 ක භූමියක් සහ අක්කර 16.8 ක භූමියක් සමාගම් 7 ක් වෙත කල්බදු පදනමට ලබා දී තිබුණද, සමාගම් 7 න් සමාගම් 2 ක් පමණක් සමාලෝචිත වර්ෂය අවසානය වනවිට ක්‍රියාකාරී තත්ත්වයෙන් කටයුතු කරමින් තිබුණි. මෙම තත්ත්වය තුළ අධිකාරිය විසින් ක්‍රියාකාරී නොවූ සමාගම්වලට එරෙහිව ඒවා ක්‍රියාකාරී නොවීම, බදු වාරික ගෙවා නොමැතිකම සහ ලීසි ගිවිසුම අවසන් කිරීම	2021 2022 2023	ව්‍යාපෘතිවල ක්‍රියාකාරීත්වය හොඳින් අධීක්ෂණය කළ යුතු අතර මෙම සියලු නඩු කටයුතු සම්බන්ධයෙන් නීතිපති උපදෙස් ලබාගත යුතුය.	මෙම ආයෝජකයින් තිදෙනෙකු දැනටමත් හෝටල් ව්‍යාපෘති ආරම්භ කර ක්‍රියාත්මක වෙමින් පවතී. එක් සමාගමක් 2024, තුන්වන කාර්තුවෙහි ආරම්භ කිරීමට අපේක්ෂා කරයි. අනෙක් ආයෝජකයින් දෙදෙනාගෙන් එක් අයෙකු පසුගිය වසර 3 තුළ කිසිදු ප්‍රගතියක් නොමැතිව ඉදිකිරීම් කටයුතු වලින් සියයට 30 ක් සම්පූර්ණ කර ඇත. අධිකාරියේ ආයෝජක සබඳතා ඒකකය (IRU) හරහා නව නිර්මාණ සඳහා අනුමැතිය ලබා ගැනීම අධිකාරිය නැවත ආරම්භ කර ඇත.	2024 සැප්තැම්බර් 30 දින වන විටත් නීතිපති උපදෙස් ලබාගෙන නොතිබුණි.

	සම්බන්ධයෙන් නඩු ගොනු කර තිබුණි. එමෙන්ම, බද්දට ගත් සමාගමක්ද ලීසි ගිවිසුම් අවසන් කිරීම සම්බන්ධයෙන් අධිකාරියට එරෙහිව නඩු පවරා තිබුණි. මෙම සියලු නඩු සම්බන්ධයෙන් නීතිපතිවරයාගේ උපදෙස් ලබා ගැනීමකින් තොරව, පෞද්ගලික නීතිඥයින්ගෙන් සේවා ලබාගෙන රු.3,475,000 ක මුදලක් 2021 සහ 2022 වර්ෂවලදී නීති ගාස්තු ලෙස ගෙවා තිබුණි.			අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව අධිකරණ නඩුව සඳහා පෞද්ගලික නීති සේවා ලබා ගන්නා ලදී. එසේම, පත් කරන ලද පෞද්ගලික නීතිඥයින් විසින් ලබා දුන් උපදෙස් මත 2020 ඔක්තෝම්බර් මාසයේදී අධිකාරිය විසින් කැබිනට් අනුමැතිය ලත් ආයෝජකයා සමඟ නව කල්බදු ගිවිසුමක් අත්සන් කර ඇත.	
11.	අධිකාරිය සතු ජාතික නිවාඩු නිකේතන 05 ක් සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා පිළිවෙලින් රු.50,067,245 ක් සහ රු.51,269,048 ක් ලෙස අලාභ ලබා තිබුණද, එම නිවාඩු නිකේතනවල අලාභය අවම කර ගැනීමට අධිකාරිය ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබුණි.	2021 2022 2023	ජාතික නිවාඩු නිකේතන ලාභ ලබන ආකාරයෙන් පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය.	ඵලදායිතාව සහ කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම අරමුණු කරගත් කාර්යමණ්ඩල මාරුවක්, පාරිභෝගික මනාපයන් සපුරාලීම සහ විකුණුම් වැඩි කිරීම සඳහා ආහාර වර්ග වෙනස් කිරීම වැනි ක්‍රියාමාර්ග කිහිපයක් නිවාඩු නිකේතන කළමනාකරණ අංශය විසින් ක්‍රියාවට නංවා ඇති අතර පිරිසිදු හා වඩාත් සංවිධානාත්මක වැඩ පරිසරයක් සහතික කිරීම සඳහා 5S ක්‍රියාත්මක කිරීම ද ආරම්භ කරන ලදී.	2024 සැපතැම්බර් 30 දින වන විටත් එම නිකේතන අලාභ ලබන තත්ත්වයේම පවත්වාගෙන ගොස් තිබුණි.

12.	2020 වර්ෂයේදී ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයෙන් සභාපති කාර්යාලයේ කාර්යාල කාර්ය සහායක විසින් ඉල්ලුම් කර තිබූ රු.1,072,102 ක් වටිනා ටෝනර් ලැබී නොතිබුණ ද සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම ඒ පිළිබඳ අභ්‍යන්තර පරීක්ෂණයක් පවත්වා නොතිබුණි. එසේ තිබියදී 2021 අගෝස්තු 05 වැනි දින අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලයට අනුයුක්තව සේවය කළ කාර්යාල කාර්ය සහායකයා සහ ඉහත කාර්යාල කාර්ය සහායක විසින් රු.1,234,540 ක් වටිනා ඡායා පිටපත් සහ ටෝනර් ගබඩාවලින් සොරකම් කර තිබුණි. අලුතින් මිල දී ගත් රු.198,500 ක් වටිනා ලැප්ටොප් පරිගණකය 2022 අගෝස්තු 24 දින නිවාඩු නිකේතන කළමනාකරණ අංශයේදී අස්ථානගත වී තිබුණි. ඒ අනුව, මූලික පැමිණිලි සහ අභ්‍යන්තර පාලන පද්ධතිවල දුර්වලතා සම්බන්ධයෙන් කළමනාකාරීත්වයේ	2021 2022 2023	සීසීටීවී පද්ධතිය නිරන්තරයෙන් සමාලෝචනය කිරීමට සහ අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීමට නිලධාරියකු පත් කිරීමට කටයුතු කළ යුතුය. තවද විනය පරීක්ෂණය පදනම් කරගෙන ක්‍රියාමාර්ග ගත යුතුය.	අධිකාරියේ සහ ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ, ගබඩාවල සිදුවූ සොරකම් කරන ලද ටෝනර් සහ ඡායා පිටපත් කඩදාසි සිද්ධිය සම්බන්ධයෙන් දැනටමත් අධිකාරියේ විනය පරීක්ෂණයක් ආරම්භ කර අඛණ්ඩව සිදුවෙමින් පවතී. ඊට අමතරව අලුත්කඩේ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුවක් විභාග වෙමින් පවතී . සිද්ධියෙන් පසුව, ප්‍රධාන වශයෙන් වැළැක්වීමේ ක්‍රියාමාර්ග ලෙස සීසීටීවී පද්ධතිය ශක්තිමත් කිරීම, වගකීම් පැවරීම, ආරක්ෂක නිලධාරීන්ට පුළුල් මාර්ගෝපදේශ නිකුත් කිරීම සිදු කරන ලදී. නිවාඩු නිකේතන කළමනාකරණ අංශයේදී ලැප්ටොප් පරිගණකයක් අස්ථානගත වීමේ සිද්ධිය සම්බන්ධයෙන් කොල්ලුපිටිය පොලිසියට පැමිණිල්ලක් ඉදිරිපත් කර අභ්‍යන්තර පරීක්ෂණයක් සිදු කරන ලදී. නොසැලකිලිමත්කම මත වගකිව යුතු	2024 සැපතැම්බර් 30 දින වන විටත් අලාභ අයකරගෙන නොතිබුණි.

	ක්‍රියාකාරී මැදිහත් වීමක් නොමැතිකම හේතුවෙන් වංචාවන් දිගින් දිගටම සිදුවන පරිසරයක් අධිකාරිය තුළ නිර්මාණය වී තිබුණි.			නිලධාරීන් සඳහා චෝදනා පත්‍ර නිකුත් කර විනය පරීක්ෂණයක් ආරම්භ කර ඇත.	
13.	පාසිකුඩා ජාතික නිවාඩු නිකේතන පරිශ්‍රය තුළ ස්ථාපිත හෝටල් හා ඊට සම්බන්ධ ආයතනවල මලද්‍රව්‍ය හා අපවහන ජලය පිරිසිදු කිරීමේ පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා අධිකාරිය 2011 ජුනි 18 දින පුද්ගලික සමාගමක් සමග ගිවිසුමකට එළඹ තිබුණු අතර පද්ධතිය නඩත්තු කර පවත්වා ගෙන යාම, පරිශ්‍රයේ පිහිටි හෝටල් 14 න් ගාස්තු අයකර ගැනීම සහ ඉහත පුද්ගලික සමාගමට එසේ අයකරගත් මුදල් ගෙවීම අධිකාරියේ වගකීමක් විය. ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය පර්චස් 118 ක ඉඩම අධිකාරිය විසින් ලබා දී තිබුණි. කෙසේ වුවද, 2013 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසාන දිනට හෝටල් 14 න් අයවිය යුතු මුදල රු.412,765,334 ක් වූ අතර එම මුදල් අයකර ගැනීමට විධිමත් ක්‍රියාමාර්ග ගෙන	2021 2022 2023	අවසන් නිගමනයකට පැමිණ අධිකාරියට සිදුවන පාඩුව අවම කර ගැනීමට කටයුතු කළ යුතුය.	අවසන් වාර්තාව ලැබුණේ 2023 දීය. යන්ත්‍රාගාරය අධිකාරියට පවරා ගැනීමට වාර්තාවේ සහය නොදැක්වූ බැවින් වාර්තාවේ සොයාගැනීම් අභ්‍යන්තරව දීර්ඝ ලෙස සාකච්ඡා කර පසුව ලක්දියත සමඟ මෙන්ම සියලුම හෝටල් හිමිකරුවන් සමඟ සාකච්ඡා කර ක්‍රියාකාරී විසඳුමකට එළැඹුණි.	ඇති කර ගත් එකඟත්වය මත ක්‍රියාත්මක වෙමින් පවතී.

	නොතිබුණි. තවද ගිවිසුම ප්‍රකාරව ඉහත පෞද්ගලික සමාගමට ගෙවිය යුතු මුළු මුදල හෝටල් වලින් ලැබිය යුතු ප්‍රමාණය ද ඉක්මවමින් රු.421,113,524 ක් වී තිබුණි. 2021 අප්‍රේල් 20 දින, මෙම පද්ධතිය අධිකාරියට පවරා ගැනිමේ හැකියාව පිළිබඳව මූල්‍ය උපදේශනය ලබා ගැනීම සඳහා රු.1,644,750 ක් වූ පිරිවැයකට පෞද්ගලික අංශයේ බද්ධ ව්‍යාපාරයක් තෝරාගෙන එයට ප්‍රදාන ලිපිය නිකුත්කර තිබුණු නමුත් ඒ සම්බන්ධ අවසාන නිගමනයක් ද සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන විටත් ගෙන නොතිබුණි.				
14.	2011 සහ 2014 වර්ෂවලදී අධිකාරිය විසින් කුච්චවෙලි සංචාරක සංවර්ධන ව්‍යාපෘතින් සඳහා පවරා ගත් ඉඩම් අක්කර 510.086 ක් වූ භූමි ප්‍රමාණයෙන් 2020 වර්ෂය වනවිට ඉඩම් අක්කර 35 ක් පමණක් සමාගම් 2 කට බදු දී තිබුණු අතර 2021 මැයි මාසයේදී අක්කර 14 ක් තවත් සමාගමකට බදු දී	2021 2022 2023	බදු ඉඩම් සඳහා දක්ෂ ආයෝජකයින් ගෙන්වා ගෙන මෙහෙයුම් කඩිනමින් ආරම්භ කිරීමට කටයුතු කළ යුතුය. තවද, ආයෝජකයින්ට තම ව්‍යාපෘති කඩිනමින් ආරම්භ කිරීමට අත්‍යවශ්‍ය පහසුකම්	ප්‍රකාශ කළ පරිදි අධිකාරිය සමඟ බදු ගිවිසුම්වලට එළඹී ඇති සමාගම් 3 ට අමතරව නව ආයෝජකයින් 3 දෙනෙකු සමඟ තවත් බදු ගිවිසුම් 3 කටද අධිකාරිය අත්සන් තැබීමෙන් මෙම ආයෝජකයින් හය දෙනා සඳහා අක්කර 79 ක් වෙන් කර ඇතත. ඊට අමතරව නිසි ක්‍රමවේදය	තත්ත්වය එලෙසම පවතින අතර කුච්චවේලි වෙරළ ආශ්‍රිත නිකේතන ප්‍රදේශයට ජල සැපයුමක් 2024 සැපතැම්බර් 30 දින වන විටත් ලැබී නොතිබුණි.

	තිබුණි. කෙසේවුවද, සමාලෝචිත වර්ෂය අවසන් දින වන විටත් බදු දී තිබුණු සමාගම් 3 න් එක් සමාගමක් පමණක් මෙහෙයුම් කටයුතුවල නිරතව තිබුණි.		සැලසිය යුතුය.	අනුගමනය කරමින් තවත් ආයෝජකයින් තිදෙනෙකුට තවත් ඉඩම් අක්කර 36 ක් ලබාදීමට අවශ්‍ය අනුමැතිය ලබාගෙන ඇත. දැනට, එක් ආයෝජකයෙකු හෝටල් මෙහෙයුම්වල නියැලී සිටින අතර, ඔවුන්ගේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ගිවිසුම්ගත අනෙකුත් ආයෝජකයින් 5 දෙනෙකු සමඟ දිගටම සාකච්ඡා කර ඇතත්. මෙහිදී මතුවන ප්‍රධානතම ගැටලුව වන්නේ කුච්චවේලි වෙරළ ආශ්‍රිත නිකේතන ප්‍රදේශයට ජල සැපයුමක් නොමැතිකමයි. ඒ සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙන් (NWSDB) ඉල්ලීමක් කර ඇත.	
15.	සංචාරක කටයුතු සඳහා නිදහස් ප්‍රදාන වශයෙන් කල්පිටියේ දූපත් 12 ක ඉඩම් අක්කර 2057.90 ක භූමි ප්‍රමාණයක් 2010 සහ 2012 වර්ෂයන්වලදී අධිකාරියට ලැබී තිබුණි. එම දූපත් 12 න් දූපත් 05 කට අයත්	2021 2022 2023	කල්බදු ලබාදීමට ඇති දූපත් සඳහා දක්ෂ ආයෝජකයින් ගෙන්වා ගැනීමටත්, අදාළ අනුමැතිය ලබා ගැනීම සඳහා ඔවුන් සමඟ සහයෝගයෙන් ක්‍රියා කිරීමටත්,	ජල බංගලා සඳහා ආයෝජකයින්ට අදාළ අනුමැතිය නොලැබීම, ධීවර ප්‍රජාවගේ ගැටලුව, දූපත් ප්‍රමාණය ප්‍රමාණවත් නොවීම යනාදී හේතු නිසා ව්‍යාපෘති ප්‍රමාද විය. 2023 මැයි මාසයේදී, අධිකාරිය ආයෝජකයින් 4	2024 සැපතැම්බර් 30 දින වන විටත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

	ඉඩම් අක්කර 206.74 ක් පමණක් 2010, 2011 සහ 2020 වර්ෂවලදී සමාගම් 03 ට බදු දීමට කටයුතු කර තිබුණු නමුත් එම කිසිදු සමාගමක් සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටත් මෙහෙයුම් කටයුතු ආරම්භ කර නොතිබුණි. තවද, අධිකාරිය විසින් කල්පිටියේ බදු දී ඇති දූපත් 10 කට අදාළ බදුකරුවන් හත් දෙනෙකුගෙන් 2018 සිට 2024 දක්වා අය විය යුතු බදු මුදල් රු.92,959,827 ක් අය කර ගැනීමට අපොහොසත් වී තිබුණි.		කඩිනමින් මෙහෙයුම් ආරම්භ කිරීමටත් කටයුතු කළ යුතුය.	දෙනෙකු සමඟ තවත් බදු ගිවිසුම් 4 ක් අත්සන් කර ඇත. කෙසේ වෙතත්, යටිතල පහසුකම් සීමා කිරීම් සහ අනුමැතිය ප්‍රමාද වීම හේතුවෙන්, ආරම්භ කරන ලද ව්‍යාපෘතිවල ප්‍රගතිය බලාපොරොත්තු වූවාට වඩා මන්දගාමී වේ.	
16.	2019 වර්ෂයේදී රු.61,000,000 ක මුදලක් අධිකාරිය විසින් ගෙවා තිබුණද, මන්නාරමේ ඉඩමක අයිතිය අද දක්වා පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි .	2021 2022 2023	ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය පසු විපරම් කර ඉක්මනින් ඉඩම පවරා ගත යුතුය.	මන්නාරම තේමා නිකේතනයක් සංවර්ධනය කිරීම සඳහා අධිකාරිය විසින් හඳුනාගෙන ඇති ඉඩම අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීම සඳහා රු.61,000,000 ක් වූ මෙම මුදල මන්නාරම ප්‍රාදේශීය ලේකම් වෙත තැන්පත් කරන ලදී. මේ වන විට 2 වන වගන්තියේ දැන්වීම ප්‍රකාශයට පත් කර ඇති අතර ඉඩමේ නිරවුල් බව සම්බන්ධ තක්සේරුව ද අවසන් කර ඇත. ඉඩම්	2024 සැපතැම්බර් 30 දින වන විටත් පවරා ගැනීමේ කටයුතු අවසන් කර නොතිබුණි.

				අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ඉල්ලීම පරිදි මන්නාරම ප්‍රාදේශීය ලේකම් ඉදිරි කටයුතු පිළිබඳ වැඩිදුර තොරතුරු ලබා දී ඇත. මෙම කාරණය සිදුවෙමින් පවතින අතර, ඒ පිළිබඳව සමීපව පසු විපරම් කරමින් සිටිමු.	
17.	ඉඩම් අත්පත් කර ගැනීම සඳහා රු.39,227,275 ක් සහ ගොඩනැගිලි ඉදිකිරීම සඳහා රු.12,264,582 ක් ලෙස වසර 04 කට පෙර ගෙවා ඇති අත්තිකාරම් පියවීමට කටයුතු කර නොතිබුණි.	2021 2022 2023	කාර්යය නිම වූ වහාම අත්තිකාරම් පියවීමට කටයුතු කළ යුතුය.	මෙම අත්තිකාරම් සංචාරක කලාප සංවර්ධන අත්තිකාරම් ගිණුමේ - 633 යටතේ ලබාගෙන දෙද්දුව ලේක් රිසෝට් ව්‍යාපෘතිය සාර්ථකව අවසන් කර ඇත. කෙසේ වෙතත්, ව්‍යාපෘතිය අවසන් වූ බවට බෙන්තොට ප්‍රාදේශීය ලේකම් සහ මධ්‍යම පරිසර අධිකාරියෙන් තහවුරු කිරීමේ ලිපි තවමත් අපට ලැබී නොමැති බැවින් මෙම ගිණුමේ එකතුව රු.1,109,000 ක ශේෂයක් ඉතිරිව ඇත. ක්‍රියාත්මක වන අනෙකුත් ව්‍යාපෘති ඒවා අවසන් වන තුරු ප්‍රාග්ධනීකරණය කළ නොහැක. අවසන් වූ පසු, ඒවා ඒ අනුව ප්‍රාග්ධනීකරණය කළ හැකිය.	2024 සැප්තැම්බර් 30 දින වන විටත් අත්තිකාරම් පියවීමට කටයුතු කර නොතිබුණි.

18.	කැබිනට් තීරණයකට අනුව මාස 18 ක් ඇතුළත සංචාරක සංවර්ධන කලාප 07 ක ප්‍රධාන සැලසුම් සකස් කිරීම සඳහා අධිකාරිය සහ නාගරික සංවර්ධන අධිකාරිය (UDA) 2019 පෙබරවාරි 13 වැනි දින අවබෝධතා ගිවිසුමකට (MOU) එළැඹ තිබුණි. 2018 ජූනි 06 දින වනවිට දරා තිබූ මුළු වියදම රු.39,151,500 ක් විය. කෙසේ වෙතත්, අද වන විට පිළිවෙලින් 2020-2030 සහ 2021-2030 කාලසීමාවන් ඇල්ල සහ ආරුගම්බේ සඳහා ප්‍රධාන සැලසුම් දෙකක් පමණක් සඳහා සකස් කර තිබුණි. නාගරික සංවර්ධන අධිකාරියට සැලසුම් 05 ක් සකස් කිරීම සඳහා රු.18,400,000 ක මුදලක් ගෙවා තිබුණි. තවද ඉහත සැලසුම් තුළ ක්‍රියාකාරකම් සහ ඉලක්කවලට එරෙහිව නිශ්චිත කාල සීමාවක් ස්ථාපිත කර නොතිබූ අතර මේ සඳහා අන්තර් අමාත්‍යාංශ කමිටුවක් අද දක්වා පත් කර නොතිබුණි. එහිදී එම සංචාරක ප්‍රදේශවල දීර්ඝ කාලයක් තිස්සේ	2023	සංචාරක සංවර්ධන ප්‍රධාන සැලසුම් කඩිනමින් සකස් කර අවසන් කිරීමට කටයුතු කළ යුතුය.	වර්තමානයේ මෙම ගැටළු බොහොමයක් විසඳා ඇති අතර 2025 මැද භාගය වන විට UDA හරහා එම කාර්යය අවසන් කිරීමට බලාපොරොත්තු වේ. එක් එක් සැලසුම් වල ක්‍රියාත්මක කිරීම සඳහා කෙටි කාලීන, මධ්‍ය කාලීන සහ දිගු කාලීන ක්‍රියාමාර්ග පැහැදිලිව හඳුනා ගන්නා ලෙස UDA වෙත දැනුම් දී ඇත. එම සැලසුම්වලට අනුව ඉහත සඳහන් ප්‍රදේශවල යටිතල පහසුකම් සංවර්ධනය නොකිරීමට ප්‍රධාන වශයෙන් රජයේ ප්‍රාග්ධන වියදම් සීමා කිරීම/ රඳවා තබා ගැනීම සහ ක්‍රියාත්මක කරන බොහෝ සංවිධානවල අරමුදල්/ මූල්‍ය හිඟය හේතු විය. UDA වෙත ගෙවීම් කිරීමේදී සිදු කරන ලද කාර්යය මත පමණක් ගෙවීම් කෙරේ.	2024 සැප්තැම්බර් 30 දින වන විටත් කාර්යය නිම කර නොතිබුණි.

	යටිතල පහසුකම් සංවර්ධනය කර පවත්වාගෙන ගොස් නොතිබුණි.				
19.	අනුරාධපුර ජාතික නිවාඩු නිකේතනය මෑතකදී අලුත්වැඩියා කර තිබුණද, බිත්තිවල ජලය කාන්දු වීම, ගුණාත්මක බවින් අඩු නානකාමර උපාංග භාවිතය, හානි වූ දොරවල් සහ සිවිලිම ආදිය හේතුවෙන් එම ගොඩනැගිල්ලේ ප්‍රයෝජනවත් ආයු කාලය විගණනයේදී සහතික කළ නොහැකි විය. 2020 වසරේ සිට බහුකාර්ය තාක්‍ෂණ ශිල්පීන් නොමැතිකම හේතුවෙන් නිවාඩු නිකේතනයේ නඩත්තු කටයුතු නිසියාකාරව සිදු කර නොතිබුණි. තවද, කාමර 52 ක් තිබුණද CCTV පද්ධතියක් සහ විදුලි ජනක යන්ත්‍රයක් මෙම නිවාඩු නිකේතනයේ ස්ථාපිත කර නොතිබුණි. ඒ අනුව, 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා නිවාඩු නිකේතනය ක්‍රියාත්මක කිරීමේදී රු.8,321,156 ක අලාභයක් සිදුවී තිබුණි.	2023	නිවාඩු නිකේතනයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සහ නඩත්තු ගැටළු විසඳීම සඳහා අවශ්‍ය පියවර ගත යුතුය.	අනුරාධපුර නිවාඩු නිකේතනයේ පවතින නඩත්තු හා ගුණාත්මක ගැටළු ක්‍රමානුකූලව විසඳීමට සැලකිය යුතු පියවර ගෙන ඇත. නඩත්තු කටයුතු කාර්යක්‍ෂම ලෙස හැසිරවීම සඳහා බහුකාර්ය කාර්මික ශිල්පියෙකු බඳවා ගැනීමේ අවශ්‍යතාවය පිළිබඳව මානව සම්පත් දෙපාර්තමේන්තුවට කිහිප වතාවක් දැනුම් දීම මෙයට ඇතුළත් වේ. අතිරේකව, නඩත්තු කටයුතු සිදු කිරීම සඳහා බාහිර පාර්ශ්වයක් බඳවා ගැනීමේ ක්‍රියාවලියක නිරතව සිටින අතර සමස්ත නඩත්තු ප්‍රමිතීන් වැඩිදියුණු කිරීමට කැප වී ඇත.	නිවාඩු නිකේතනයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සහ නඩත්තු ගැටළු විසඳීම සඳහා අවශ්‍ය පියවර මේ දක්වා ගෙන නොතිබුණි.

20.	බණ්ඩාරවෙල ජාතික නිවාඩු නිකේතනය අධිකාරිය යටතේ ලියාපදිංචි සහතිකය ලබාගෙන තිබුණද, එය ලියාපදිංචිය සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා නොතිබුණි. තවද මෙම නිවාඩු නිකේතනය නිසි ආකාරයෙන් නඩත්තු කර නොතිබුණි. ලැගුම්කුටි, මුළුතැන්ගෙය, ප්‍රධාන ගොඩනැඟිල්ලේ ලොබිය, ළමා උද්‍යානය සහ උද්‍යානය බොහෝ කාලයකින් අලුත්වැඩියා කර නොතිබුණි. ගෘහ භාණ්ඩ හා උපකරණ ද හානි වී භාවිතයට ගත නොහැකි තත්ත්වයට පත්ව තිබුණි. මෙමඟින් අධිකාරියට අයහපත් ප්‍රතිරූපයක් ඇති කර තිබූ අතර සමාලෝචිත වර්ෂය සඳහා රු.3,198,422 ක අලාභයක් ලැබී තිබුණි.	2023	නිවාඩු නිකේතනයේ ප්‍රමිතිය ඉහළ නංවා ලාභ ලබන ඒකකයක් බවට පත් කිරීමට කටයුතු කළ යුතුය.	මේ වන විට නිවාඩු නිකේතන කළමනාකරණ අංශය (වෙළඳ නිකේතන) සහතිකය ලබා ගැනීමේ ක්‍රියාවලියක යෙදී සිටී. මේ දක්වා නිවාඩු නිකේතන ප්‍රතිසංස්කරණය කිරීමෙන් ප්‍රමිතීන් නංවාලීම සඳහා CECB (මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශය) වෙතින් සේවා ලබාගෙන ඇත.	2024 සැපතැම්බර් 30 දින වන විටත් පියවර ගෙන නොතිබුණි.
21.	ඇල්ල සංචාරක කලාපයේ ප්‍රධාන ස්ථානවල අවශ්‍ය පහසුකම් සංවර්ධනය කිරීම හා නඩත්තු කිරීම පිළිබඳව ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබුණි. රාවණා ඇල්ල	2023	ඇල්ල සංචාරක සංවර්ධන ප්‍රදේශයේ පහසුකම් වැඩිදියුණු කිරීමට කටයුතු කළ යුතුය.	අදහස් දක්වා නොතිබුණි.	2024 සැපතැම්බර් 30 දින වන විටත් පියවර ගෙන නොතිබුණි.

	ප්‍රදේශයේ විදුලි පහන්, සනීපාරක්ෂක පහසුකම් ආදී පහසුකම් සපුරා නොතිබුණි . තවද ඇල්ල දුම්රිය ස්ථානයේ ප්‍රමාණවත් ආසන පහසුකම්, සනීපාරක්ෂක පහසුකම්, සංචාරකයින් සඳහා දුරකථන ආරෝපණය කිරීමේ ඒකකයක් සහ දුම්රිය කාලසටහන් ප්‍රදර්ශනය කර නොතිබුණි.				
22.	අධිකාරිය සතු තානායම් 37 න් 9 ක් වර්ෂ දෙකේ සිට අට දක්වා කාලසීමාවක පරාසයකට බදු දී නොතිබූ බැවින් එම දේපල ඌන උපයෝජිතව පැවතුණි.	2021 2022 2023	ආයෝජන දේපල ඵලදායී ලෙස භාවිතා කිරීමට කටයුතු කළ යුතුය.	අදහස් දක්වා නොතිබුණි.	2024 සැපතැම්බර් 30 දින වන විටත් ඌන උපයෝජිතව පැවතුණි.
23.	ගාල්ල දිස්ත්‍රික් ලේකම්ගේ අංක ඩීපීස්/ එල්එන්ඩී/03/බීජ්එන්/ පොදු සහ 2017 ජූනි 20 දිනැති ලිපිය පරිදි 2017 වර්ෂය වන විට රු.173,159,909 ක් ගෙවා දෙද්දුව සංචාරක සංවර්ධන ව්‍යාපාතිය සඳහා ඉඩම් අත්පත් කර ගැනීම අවසන් කර තිබුණ ද, සමාලෝචිත වර්ෂය අවසන් දින වනවිටත් එහි සංචාරක	2021 2022 2023	ආයෝජන දේපල ඵලදායී ලෙස භාවිතා කිරීමට කටයුතු කළ යුතුය.	අගමැතිවරයා සහ සංචාරක අමාත්‍යාංශයේ රු.500,000,000 ක මුදලක් පළමු පියවරේදී ශ්‍රී ලංකාවට ලබා දිය යුතු බවට වූ කොන්දේසිය සපුරාලීමට නොහැකි වීම නිසා මැලේසියානු ව්‍යාපෘතිය අවලංගු කරන ලදී. එමෙන්ම, ආයෝජකයින් ආකර්ෂණය කර ගැනීම සඳහා වන මායිම් නිරවුල් කර	2024 සැපතැම්බර් 30 දින වන විටත් සංවර්ධන ව්‍යාපෘති ආරම්භ කර නොතිබුණි.

	සංවර්ධන ව්‍යාපෘති ආරම්භ කර නොතිබුණි.			ගැනීම සහ ආක්‍රමණය වැළැක්වීම සඳහා අඛණ්ඩව කටයුතු කරමින් සිටී.	
24.	බිබිල තානායම පරිශ්‍රයේ ආක්‍රමණ සහ ආරක්‍ෂාව සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබීම හේතුවෙන් වසර 17 කට වැඩි කාලයක් තිස්සේ අතහැර දමා තිබුණි. එහිදී, 2016 නොවැම්බර් 02 සිට 2023 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ ආයෝජකයාගෙන් ලැබිය හැකිව තිබූ මුළු කුලී ආදායම රු.10,462,466 ක් සහ රු.40,000,000 ක ආයෝජනයක් අධිකාරියට අහිමි වී තිබුණි.	2023	ආක්‍රමණය ඉවත් කර තානායමේ ආරක්ෂාව තහවුරු කළ යුතු අතර තානායම නිසි ලෙස බදු දීමට හෝ ඵලදායී ලෙස ලාභදායී ආකාරයෙන් භාවිතා කිරීමට පියවර ගත යුතුය.	අදහස් දක්වා නොතිබුණි.	2024 සැපතැම්බර් 30 දින වන විටත් පියවර ගෙන නොතිබුණි.
25.	1993 දී අධිකාරියට පවරන ලද රාගල තානායම 1998 දී පුද්ගලික පාර්ශවයකට මාසික කුලිය රු.5,167 බැගින් බදු දී තිබූ අතර 2001 සිට සමුච්චිත කුලිය බදුකරු විසින් ගෙවා නොතිබුණි. අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියට අනුව රු.697,546 ක් කපා හැර තිබුණි. 2010 වසරේදී මෙම පරිශ්‍රය ආක්‍රමණයකට ලක්ව තිබූ අතර තානායමේ ආරක්ෂාවද අවදානමට	2023	ආක්‍රමණය ඉවත් කර තානායමේ ආරක්ෂාව තහවුරු කළ යුතු අතර තානායම නිසි ලෙස බදු දීමට හෝ ඵලදායී ලෙස ලාභදායී ආකාරයෙන් භාවිතා කිරීමට පියවර ගත යුතුය.	අදහස් දක්වා නොතිබුණි.	2024 සැපතැම්බර් 30 දින වන විටත් පියවර ගෙන නොතිබුණි.

	ලක්ව තිබුණි. මේ අතර 2022 දී ආක්‍රමණිකයින් ඉවත් කිරීමට අධිකරණ නියෝගයක් ලැබී තිබුණද, 2023 නොවැම්බර් 23 දින විගණනය මගින් සිදු කරන ලද භෞතික පරීක්ෂවේදී ඒ දක්වා ආක්‍රමණය ඉවත් කර නොතිබුණු අතර, විගණනයේදී තානායමේ ආරක්ෂාව සහතික කළ නොහැකි බව නිරීක්ෂණය විය.				
26.	නිසි ශක්‍යතා අධ්‍යයනයක් සිදු නොකිරීම සහ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් පූර්ව අනුමැතිය ලබා නොගැනීම හේතුවෙන් යාල පිවිසුම් දොරටුව සහ නිවාඩු නිකේතන කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා 2021 ජනවාරි 01 දින රු.55,000,000 ක මුදලකට ලබා දී ඇති කොන්ත්‍රාත්තුවේ භෞතික ප්‍රගතියක් ලබා ගෙන නොතිබුණි.	2022 2023	ප්‍රාග්ධන ව්‍යාපෘති සමීපව පසු විපරම් කර ඵලදායී ලෙස නිම කිරීමට ක්‍රියා කළ යුතුය.	2022 ආර්ථික අර්බුදයෙන් පසු සියලුම ප්‍රාග්ධන ව්‍යාපෘති රජය විසින් අත්හිටුවන ලද බැවින් මෙම ව්‍යාපෘතිය තාවකාලිකව නවතා දමන ලදී. 2024 දී ව්‍යාපෘතිය නැවත ආරම්භ කිරීමට සැලසුම් කරමින් සිටින අතර පිවිසුම් දොරටුව ප්‍රථමයෙන් ඉදි කිරීමට බලාපොරොත්තු වේ. පිවිසුම් දොරටුවට පසුව කාර්යාල ගොඩනැගිල්ල 2025 දී ඉදිකිරීමට සැලසුම් කර ඇත.	කොන්ත්‍රාත්තුවේ භෞතික ප්‍රගතියක් ලබා ගෙන නොතිබුණි.

3.51 ශ්‍රී ලංකා සංචාරක හෝටල් කළමනාකරණ ආයතනය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	1,113,115,238	105,647,876	1,007,467,362	(176,422,955)	තත්ත්වාගණනය කළ
2022	1,216,711,648	98,155,947	1,118,555,701	125,872,269	තත්ත්වාගණනය කළ
2023	1,534,824,128	85,861,665	1,448,962,463	417,479,936	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණන ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්වය
1.	2018 දෙසැම්බර් 07 දිනැති අංක පීඊඩී03/ 2018 හා 2021 දෙසැම්බර් 15 දිනැති අංක පීඊඩී03/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ ප්‍රකාරව 2021 මූල්‍ය වර්ෂය තුළදී අලාභ තත්වයක් වාර්තා කර ඇති එහෙත් 2020 වර්ෂයට සාපේක්ෂව එම අලාභදායී බව අඩු කරගෙන ඇති ආයතනයක සේවකයන්හට රු.5,000 ක ප්‍රසාද දීමනාවක් පමණක් ගෙවිය හැකි නමුත් සමාලෝචිත වර්ෂය තුළදී එක් සේවකයකුට	2021	චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළයුතු වීම	2021 වර්ෂයේදී සේවකයන්හට තිබූ ආර්ථික අපහසුතා පිළිබඳවත්, සේවක සංගමයේ ඉල්ලීම් හා ආයතනයේ මෙහෙයුම් වර්ධනයත් සලකා අධ්‍යක්ෂක මණ්ඩලය මඟින් එම මුදල දීමට තීරණය කරන ලදී.	වැඩිපුර ගෙවූ ප්‍රමාණය මේ දක්වා අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

	රු.13,500 බැගින් වූ රු.2,493,000 ක මුදලක් ප්‍රසාද දීමනා ලෙස ගෙවා තිබුණි.				
2.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 හි අංක 13 සහ 26 ඡේදවලට අනුව, ආයතනය විසින් මේ දක්වා ප්‍රයෝජනයට ගන්නා කොළඹ සහ අනුරාධපුර ඉඩම් දෙකක සාධාරණ වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. තවද, එම ඉඩම්වල අයිතිය ආයතනය නමින් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර 2023 වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශනවල ඉහත ඉඩම් සම්බන්ධයෙන් හෙළිදරව් කිරීමක් සිදු කර නොතිබුණි.	2022 2023	එම ඉඩම්වල අයිතිය **ශ්‍රී ලංකා සංචාරක හෝටල් කළමනාකරණ ආයතනය (**SLITHM) ආයතනයට පවරාගෙන ඉඩම්වල වටිනාකම ඉක්මනින් ගිණුම් පොත්වල සටහන් කිරීමට කටයුතු කළ යුතුය.	අයිතිය නොමැතිව ඉඩම් වත්කම් ලෙස පිළිගත නොහැක.	ඉඩම්වල අයිතිය මේ දක්වා පවරාගෙන නොතිබුණි.
3.	2023 වර්ෂය සඳහා හෝටල් පාසල යටතේ වූ විවිධ පාඨමාලා සඳහා ලැබී තිබුණු අයදුම්පත් සංඛ්‍යාව 11,788 ක් වූ අතර, එම අයදුම්කරුවන්ගෙන් 5,912 ක් හෝ සියයට 50 ක් පාඨමාලා සඳහා ලියාපදිංචි වී තිබුණි. මෙම තත්ත්වය ප්‍රධාන	2023	නේවාසිකාගාර ඇතුළු ධාරිතා වැඩි දියුණු කිරීම සමඟ පාසලේ පහසුකම් වැඩිදියුණු කිරීමට අවශ්‍ය කටයුතු කළ යුතුය.	සතියේ දින සහ සති අන්ත පාඨමාලා ලෙස විවිධ ආයතන විසින් ඉල්ලා සිටින ඇතැම් පාඨමාලා ආයතනයේ ආචාර්යවරුන් විසින් ආයතනයේ පවතින ඉඩ ප්‍රමාණයෙන් උපරිම ප්‍රයෝජන ගනිමින් ඔවුන්ගේ	පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා මෙතෙක් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

	වශයෙන් පන්තිකාමර සඳහා ඉඩකඩ නොමැතිකම නිසා ඇති වූ බව විගණනයේදී නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, ඉහළ ඉල්ලුමක් සපුරාලීම සඳහා විසඳුමක් හඳුනාගෙන ක්‍රියාත්මක කිරීමට ආයතනයේ කළමනාකාරීත්වය කටයුතු කර නොතිබුණි. තවද, ග්‍රාමීය ප්‍රදේශවල හෝටල් පාසල් ශාඛා සඳහා නවාතැන් ගත හැකි නේවාසිකාගාර පහසුකම් ස්ථාපිත කර එම පන්තිකාමර සම්පූර්ණයෙන්ම යොදා ගැනීමට කටයුතු කර නොතිබුණි.			ආයතන පරිශ්‍රය තුළම පවත්වනු ලැබේ. ආයතනය මඟින් පවත්වනු ලබන ප්‍රධාන පාඨමාලා වලට අමතරව කෙටිකාලීන පාඨමාලා හඳුන්වා දෙමින් ප්‍රාදේශීය පාසල් කෙරෙහි අවධානය යොමු කරමින් එම පාසල්වලට අවශ්‍ය භෞතික සම්පත් ලබාදෙමින් ආයතනයේ අරමුණ ඉටුකර ගැනීමට කටයුතු කරමින් සිටිමු.	
4.	සිසුන්ගේ ප්‍රායෝගික පුහුණුව සඳහා භාවිතා කරනු ලබන සමුද්‍රා පුහුණු හෝටලය සඳහා අලෙවි සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කර නොතිබුණි. එමෙන්ම කාමරවල පහසුකම් සහ සුවපහසුව සතුටුදායක මට්ටමක නොතිබුණි.	2023	සමුද්‍රා හෝටලය සඳහා අලෙවිකරණ සැලැස්මක් සකස් කළ යුතු අතර කාමරවල පහසුකම් සහ සුවපහසුව වැඩිදියුණු කළ යුතුය.	අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ.	අවශ්‍ය ක්‍රියාමාර්ග මේ දක්වා ගෙන නොතිබුණි.
5.	2023 වර්ෂයේදී සමුද්‍රා පුහුණු හෝටලයේ කාමර රාත්‍රී (Room Nights)	2023	හෝටලය ආර්ථිකමය හා ඵලදායී ලෙස ආදායම් උපයා	අලුත්වැඩියා කටයුතු 2023 වර්ෂයේදී නිම කරන ලදී.	මේ දක්වා හෝටලය ආර්ථිකමය හා ඵලදායී ලෙස

	සංඛ්‍යාව 494 ක් එනම්, මුළු කාමර රාත්‍රී (Room Nights) 4,380 න් සියයට 11 ක් පමණක් භාවිතා කර තිබුණි.		ගැනීම සඳහා යෙදවීමට කටයුතු කළ යුතුය.		ආදායම් උපයා ගැනීම සඳහා යොදවාගෙන නොතිබුණි.
6.	සංචාරක පොලිස් ඒකකයෙන් 2014 වර්ෂයේදී ලැබිය යුතු රු.3,192,000 ක කුලී ආදායම, ආදායමක් ලෙස හඳුනාගෙන ණය ගැතියන්ගේ ලැබිය යුතු මුදල් යටතේ දක්වා තිබුණද, මෙම මුදල අයකර ගැනීමේ අවිනිශ්චිතතාවයක් මතු වී තිබුණි. කෙසේ වෙතත්, ඒ සඳහා වූ අගය හායනය වීම ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා නොතිබුණි. තවද, 2015 වර්ෂයේ සිට මේ දක්වා එම ඒකකය විසින් පරිශ්‍රය භාවිතා කරන නමුත් කිසිදු කුලී මුදලක් අය කර නොතිබුණි.	2021 2022 2023	ගිණුම්වල සුදුසු ගැලපීම් සිදු කළ යුතු අතර අදාළ අයිතම ඉවත් කිරීමට කටයුතු කළ යුතුය.	විගණන හා කළමනාකරණ කමිටු නිර්දේශයට අනුව, 2013-2014 සඳහා හිඟ කුලී සහ 2015-2022 සඳහා වියදම් අයකර ගැනීම සඳහා ඉල්ලීම් ලිපිය ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය වෙත යවා ඇත.	මේ දක්වා එම මුදල අය කරගෙන නොතිබුණි.
7.	ලොන්ඩ්‍රි ණය ගැතියන්ගෙන් රු.305,350 ක් සහ සමුද්‍රා හෝටල් ණය ගැතියන්ගෙන් රු.25,678,878 ක ලැබිය යුතු මුදල් 2023 වර්ෂය අවසන් වන විටත් අයකර ගෙන නොතිබුණි. එයින් රු.25,984,228	2021 2022 2023	දිගුකාලීනව ලැබිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.	දැනට අයකිරීම් ක්‍රියාවලිය ක්‍රියාත්මක වෙමින් පවතී. ආයතන අතර දිගු කාලයක් තිස්සේ හිඟ ශේෂයන් නිරවුල් කිරීම සඳහා සාකච්ඡා පවත්වමින් සිටී.	මේ දක්වා අදාළ අයකිරීම් සිදු කර නොතිබුණි.

	ක මුදලක් මාස 24 කට වැඩි කාලයක් හිඟව තිබුණි. මුදල් අමාත්‍යවරයාගේ සම්බන්ධීකරණ ලේකම්වරයාගෙන් රු.4,068,000 ක්, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් රු.5,140,571 ක්, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය වෙතින් රු.3,583,010 ක් සහ ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය වෙතින් රු.5,723,382 ක් ඉහත ලැබිය යුතු මුදල්වල ඇතුළත් වී තිබුණි.				
8.	ස්ථිර නිලධාරියෙකු බඳවා ගැනීමක් සිදු නොකර ලොන්ඩ්‍රිය අධීක්ෂණය සහ දේශන පැවැත්වීම සඳහා බාහිර කථිකාචාර්ය කාණ්ඩය යටතේ බඳවාගත් නිලධාරියාට පැයකට රු.500 බැගින් සහ දිනකට උපරිම පැය 6 බැගින් ගෙවා තිබුණි. කෙසේ වෙතත්, අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය යටතේ මෙම පැයක ගාස්තුව රු.3,100 ක් හා උපරිම මාසික සීමාව රු.300,000 ක් දක්වා වැඩි කර තිබූ අතර,	2023	ස්ථිර නිලධාරියකු බඳවා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.	ස්ථිර නිලධාරියෙකු බඳවා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ.	මේ දක්වා ස්ථිර නිලධාරියෙකු බඳවා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

	එහිදී ඔහුට 2024 පෙබරවාරි සහ මාර්තු මාස සඳහා රු.300,000 බැගින් ගෙවා තිබුණි.				
9.	2014 දී තොරතුරු පද්ධතියක් සංවර්ධනය කිරීම සඳහා රු.3,771,216 ක මුදලක් වැය කර තිබුණු අතර, ආයතනයේ අවශ්‍යතා සමඟ නොගැලපීම හේතුවෙන් එය අත්හැර දමා තිබුණි. 2023 වර්ෂය අවසානයේදී ද එම වටිනාකම නොනිමි වැඩ ගිණුමෙන් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.	2021 2022 2023	ගිණුම්වල සුදුසු ගැලපීම් කළ යුතු අතර අලාභ අය කර ගත යුතුය.	ඒ සඳහා වැය වූ මුදල ලෙස රු.3,771,216 ක් වාර්තා කර ඇතත්, මෙම මුදලින් රු.1,508,486 ක් ගෙවා නැත. (වගකීම් යටතේ සඳහන් කර ඇත) පද්ධතිය සාර්ථක නොවීම සහ සැපයුම්කරුගෙන් ප්‍රතිචාරයක් නොමැති බැවින් එය නැවත ලියා හැරීමට පියවර ගනු ඇත. රු.2,262,730 ක් කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය ඇතිව නොනිමි වැඩ ගිණුමෙන් ඉවත් කර 2023 වර්ෂයේ වාර්ෂික ගිණුම්වල ගැලපීම් කරනු ඇත.	මේ දක්වා ගිණුම්වල අදාළ ගැලපීම් සිදු කිරීමට හා අලාභ අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.52 ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	බදු පෙර ලාභය (අලාභය) රු.	මතය
2021	381,446,163	8,511,991	372,934,172	13,133,911	තත්ත්වාගණනය කළ
2022	487,683,357	19,366,749	468,316,608	95,382,436	තත්ත්වාගණනය නොකළ
2023	524,488,862	9,268,936	515,219,926	36,103,317	තත්ත්වාගණනය නොකළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණන ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්වය
1.	කාර්යාංශය විසින් සංචාරක අමාත්‍යාංශයට අයත් 2019 වසරේ අනතුරට ලක් වූ CAU - 4004 අංක දරන ජීප් රථය අලුත්වැඩියා කිරීමේ පිරිවැය වෙනුවෙන් රක්ෂණ සමාගමෙන් ලැබුණු වන්දි මුදලට අමතරව ගෙවීමට නියමිතව තිබූ රු.11,516,808 ක මුදලක් 2023 නොවැම්බර් 23 වැනි දින ගෙවා තිබුණි. අදාළ වාහනය කාර්යාංශයට ලබා ගැනීමේ පදනම මත මෙම තීරණය ගෙන තිබූ නමුත් මේ සම්බන්ධයෙන් පූර්ව එකඟතාවක් හෝ	2023	වෙනත් ආයතනවල වත්කම් මූල්‍යමය වශයෙන් සුදුසු වුවත් ඒවා පරිහරණය නොකිරීමට කාර්යාංශය කටයුතු කළ යුතුය.	වසර 5 ක කාලයක් සඳහා රු.මිලියන 11.5 කට වාහනය ලබා ගැනීම මූල්‍යමය වශයෙන් යෝග්‍ය වේ.	මේ වනවිටත් එම රථය භාවිතා කරමින් පවතී.

	පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණයක් සිදු කර නොතිබුණි. කෙසේ වෙතත් මේ සම්බන්ධයෙන් දෙපාර්ශවය මෙතෙක් නිසි ගිවිසුමකට එළඹ නොතිබුණු අතර අමාත්‍යාංශ ලේකම්වරයාගේ 2024 පෙබරවාරි 27 දිනැති අංක MT/ADM/01/22/2021/CAU-4004 දරන ලිපිය මගින් අදාළ ජීප් රථය වසර 05 ක කාලයක් භාවිතා කිරීම සඳහා කාර්යාංශය වෙත පවරා තිබුණි.				
2.	2021 නොවැම්බර් 16 දිනැති රජය සතු ව්‍යවසායයන් සඳහා යහපාලනය පිළිබඳ මාර්ගෝපදේශවල 2.3 ඡේදයට අනුව, වසර පහක කාලයක් සඳහා උපායමාර්ගික සැලැස්ම සකස් කර භාණ්ඩාගාරයට ඉදිරිපත් කළ යුතුය. තවද, ව්‍යාපාරික පරිසරයේ වෙනස්වීම්වලට අනුකූලව සෑම වසරකම සැලැස්ම යාවත්කාලීන කළ යුතු අතර, ඊළඟ වර්ෂය ආරම්භ වීමට දින 15 කට පෙර, මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත්, කාර්යාංශය සඳහා උපායමාර්ගික සැලැස්මක් 2020-2023	2022 2023	උපායමාර්ගික සැලැස්ම වර්ෂ පහක කාලයක් සඳහා සකස් කළ යුතු අතර සෑම වර්ෂයකම යාවත්කාලීන කර භාණ්ඩාගාරයට ඉදිරිපත් කළ යුතුය.	ඉදිරි පස් අවුරුදු කාලය සඳහා උපායමාර්ගික සැලැස්ම සකස් කිරීමට සහ ව්‍යාපාරික පරිසරයේ වෙනස්වීම්වලට අනුකූලව වාර්ෂිකව යාවත්කාලීන කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ඇත.	මේ වනතෙක් සැලැස්ම යාවත්කාලින කර නොතිබුණි.

දක්වා වර්ෂ හතරක් සඳහා සකස් කර තිබූ අතර එය අද දක්වා යාවත්කාලීන කර නොතිබුණි.

3.53 ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	64,533,067,276	1,748,208,899	62,784,858,377	1,442,548,920	තත්ත්වාගණනය කළ
2022	68,662,402,758	2,175,087,944	66,487,314,814	3,293,713,748	තත්ත්වාගණනය නොකළ
2023	-	-	-	-	-

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමකින් තොරව 2021 වර්ෂය අවසානය වන විට රු.666,716,143 ක දීමනා වර්ග 10 ක් සහ රු.420,800,245 ක ණය වර්ග හා සුභ සාධන යෝජනාක්‍රම 13 ක් ස්ථාපිත කර තිබුණි.	2021	අවශ්‍ය අනුමැතිය ලබා ගත යුතු බව.	දීමනා, ගෙවීම් සහ සේවක ප්‍රතිලාභ යෝජනා ක්‍රම සඳහා 2023 ඔක්තෝබර් 11 දිනැති ලිපියක් මගින් ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයේ ලේකම් හරහා රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ අනුමැතිය ඉල්ලා ඇත. තවද, 2024 ජූලි 19 දින ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරයා හරහා මේ සම්බන්ධයෙන් සිහි කැඳවීමක් ද යවා ඇත.	අවශ්‍ය අනුමැතිය මෙතෙක් ලබා ගෙන නොතිබුණි.

2	2015 මැයි 25 දිනැති අංක පීඊඩී 01/2015 දරන චක්‍රලේඛයේ 3.1 ඡේදය, 2016 ඔක්තෝබර් 26 දිනැති අංක පීඊඩී/2015 (i) දරන චක්‍රලේඛය සහ 2020 ජනවාරි 27 දිනැති පීඊඩී 01/2020 අංක දරන චක්‍රලේඛ (අ) චක්‍රලේඛයට පටහැනිව පහත ආකාරයට ඉන්ධන සීමාවන් වෙනස් කර තිබුණි. සභාපති - අවශ්‍ය පරිදි අධ්‍යක්ෂ ජනරාල් - ලීටර් 300 විධායක අධ්‍යක්ෂ - ලීටර් 170 අධ්‍යක්ෂ - ලීටර් 140	2021	චක්‍රලේඛ විධිවිධාන අනුගමනය කළ යුතු බව.	අදාළ PED චක්‍රලේඛවල නිර්ණායකයන්ට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉන්ධන සීමාවන් තීරණය කර ඇත.	අවශ්‍ය අනුමැතිය ලබා ගෙන නොතිබුණි.
	(ආ) චක්‍රලේඛයට පටහැනිව නිල වාහනයක් සඳහා හිමිකමක් ඇති නිලධාරීන් 33 දෙනෙක් සඳහා මාසිකව රු.35,000 බැගින් එකතුව රු.11,134,215 ක් වූ රියදුරු දීමනා ගෙවා තිබුණි.	2021	චක්‍රලේඛ විධිවිධාන අනුගමනය කළ යුතු බව.	දීමනා, ගෙවීම් සහ සේවක ප්‍රතිලාභ යෝජනා ක්‍රම සඳහා 2023 ඔක්තෝබර් 11 දිනැති ලිපියක් මඟින් ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයේ ලේකම් හරහා රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ අනුමැතිය ඉල්ලා ඇත. තවද, 2024 ජූලි 19 දින ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරයා හරහා මේ සම්බන්ධයෙන් සිහි කැඳවීමක් ද යවා ඇත.	චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කර නොතිබුණි.

3	2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන චක්‍රලේඛයෙහි 9.3.1 ඡේදය ට පටහැනිව බඳවා ගැනීමේ පරිපාටියේ නියමයන් නොසලකා 2021 වර්ෂය තුළ "විශේෂ ඒකකය" පිහිටුවීම සඳහා නිලධාරීන් 09 දෙනෙකු පත් කර තිබුණු අතර ඔවුන්ගේ වැටුප සම්බන්ධයෙන් "වැටුප සාකච්ඡා කළ හැක" යනුවෙන් පුවත්පත් දැන්වීම පළ කර තිබුණි.	2021	බඳවා ගැනීමේ පටිපාටිය තුළ ඇති කොන්දේසිවලට අනුගත විය යුතු බව.	ආයෝජන මණ්ඩලය (BOI) තුළ විශේෂ ඒකකයක් පිහිටුවීමේ මූලික පරමාර්ථය, ඉහල නිපුණත්වයක් ඇති වෘත්තීයවේදීන් ආකර්ෂණය කර ගැනීම සහ කර්මාන්ත ක්ෂේත්‍රයේ බඳවා ගැනීමේ පරිචයන් සමඟ අනුගත වීමත් නිසා විශේෂ ඒකකය සඳහා කාර්ය මණ්ඩලයට බඳවා ගැනීම සඳහා පළ කළ වෙළඳ දැන්වීම මඟින් ගෙවනු ලබන පාරිශ්‍රමිකය සාකච්ඡා කළ හැකි බව සහ වෙළඳ රේටයන් සමඟ සැසඳිය හැකි බවත් එලෙසම රාජ්‍ය අංශයට වඩා වැඩි වැටුප් සහ අනෙකුත් ප්‍රතිලාභ පැකේජයක් මෙම තනතුරු වල පත්වීම්ලාභියා සඳහා පිරිනමන බවත් දක්වා ඇත.	2022 මැයි 23 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී විශේෂ ඒකකය විසුරුවා හැරීමට සහ එහි නිලධාරීන්ගේ කොන්ත්‍රාත් කාලය අවසන් කිරීමට අනුමැතිය ලබා දී තිබුණ අතර එම ඒකකය විසුරුවා හැර තිබුණි. මෙම ඒකකය පිහිටුවීමේ අරමුණු මෙම ඒකකය පිහිටුවීමට පෙර හා පසු මණ්ඩලයේ කාර්යය මණ්ඩලය විසින් සිදුකරන බැවින් විශේෂ ඒකකය පිහිටුවීමේ අරමුණ ඉටු වී නොතිබුණි.
4	2016 අප්‍රේල් 25 දිනැති අංක 02/2016 දරන චක්‍රලේඛයේ 14.1 ඡේදයට පටහැනිව ගෙවීම සඳහා හිමිකමක් නොමැති තෘතීයික මට්ටමේ තනතුරු 21 ක නිලධාරීන් 242 කට රු.10,704,620 ක් වූ	2021	චක්‍රලේඛ විධිවිධාන අනුගමනය කළ යුතු බව.	දීමනා, ගෙවීම් සහ සේවක ප්‍රතිලාභ යෝජනා ක්‍රම සඳහා 2023 ඔක්තෝබර් 11 දිනැති ලිපියක් මඟින් ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයේ	චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කර නොතිබුණි.

	මුදලක් විශේෂ දිමනාවක් ලෙස ගෙවා තිබුණි.			ලේකම් හරහා රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ අනුමැතිය ඉල්ලා ඇත. තවද, 2024 ජූලි 19 දින ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරයා හරහා මේ සම්බන්ධයෙන් සිහි කැඳවීමක් ද යවා ඇත.	
5	මල්වත්ත කලාපයේ ඉඩම් අක්කර දෙකක ප්‍රමාණයක් හා වර්ග මීටර් 3906 ක ගොඩනැගිල්ල 2012 වර්ෂයේදී සමාගමක් වෙත මුදා හැර තිබුණද, ගිවිසුමකට එළඹ නොතිබුණු අතර එම නිසා 2014 සිට රු.මිලියන 24.1 ක් වූ බිම් කුලී, ඉඩම් වාරික, ජලය සහ අපජලය සඳහා අයකිරීම් සිදු කර ගැනීමට නොහැකි වී තිබුණි.	2021	කරුණු විසඳා ගත යුතු අතර ගිවිසුම්වලට එළඹීම තුළින් ගාස්තු අය කර ගැනීමට පියවර ගත යුතු බව.	ආයෝජන මණ්ඩලය සමඟ ගිවිසුම් ගත වන ලෙස ආයෝජන මණ්ඩලය විසින් ආයෝජකයා දැනුවත් කර තිබුණද එසේ සිදු කර නොතිබුණි.	BOI හි නීති දෙපාර්තමේන්තුව දේපල පවරා ගැනීමේ ක්‍රියාවලියක යෙදී සිටින අතර ඉවත් කිරීමේ නිවේදනය ආයෝජන මණ්ඩලයේ සභාපති වෙත යොමු කර ඇත.
6	පෙර පැවති අමාත්‍යාංශය මඟින් මිල්ලනිය අපනයන සැකසුම් කලාපය ආරම්භ කිරීම සඳහා 2017, 2018 සහ 2019 වර්ෂවලදී මණ්ඩලයට රු.මිලියන 1988 ක් ලබා දී තිබුණද 2021 වර්ෂය අවසන් වන විටත් එය ආරම්භ කර නොතිබුණි.	2021	සංයුක්ත සැලැස්මට අනුව සැලසුම් කළ පරිදි ක්‍රියාත්මක කිරීමට පියවර ගත යුතු බව.	2019 මැයි 24 දින සිට මිල්ලනිය කලාපය සඳහා ලබා දෙන වැඩ බිම් යටිතල පහසුකම් තාවකාලිකව අත්හිටුවා ඇත.	2019 මැයි 24 දින ඉඩම් අත්පත් කර ගැනීම වැළැක්වීම සඳහා හොරණ වැවිලි සමාගම විසින් අමාත්‍යාංශයට (සංවර්ධන උපාය මාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයට) එරෙහිව නඩුවක් පවරා ඇති අතර එය තවමත්

					නොවිසඳී ඇත.
7	ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය හරහා නිසි කලට ජල සැපයුම ලබා ගැනීම සඳහා පියවර ගෙන නොතිබීම හේතුවෙන් ජල බවුසර මඟින් වතුපිටිවල කලාපය වෙත ජල සැපයුම සිදු කිරීම සඳහා 2021 වර්ෂයේදී රු.4,384,440 ක මුදලක් මණ්ඩලය විසින් ගෙවා තිබුණි.	2021	සැලකිය යුතු මුදලක් බවුසර කුලියට ගැනීම වෙනුවෙන් දැරීමට සිදු වන බැවින් ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයෙන් ජලය ලබා ගැනීම සඳහා විධිවිධාන යෙදිය යුතු බව.	ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය හට සැලසුම් කළ පරිදි කරස්නාගල ජල සම්පාදන ව්‍යාපෘතිය නිම කිරීමට නොහැකි විය.	රන්පොකුණගම ජල සම්පාදන යෝජනා ක්‍රමයෙන් වතුපිටිවල අපනයන සැකසුම් කලාපය වෙත දිනකට 400m3 සිට 700-800m3 දක්වා සැපයුම වැඩිකර ඇත.
8	ආරම්භයේ සිට 2021 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ කලාප 14 කට අයත් ගිවිසුම් අත්සන් කර තිබුණු ආයතන සංඛ්‍යාව 740 ක් වූ අතර 2021 වර්ෂය අවසානයේදී වසා දැමුණු, අත්හිටවූ හෝ ගිවිසුම් අවලංගු කරනු ලැබූ ආයතන සංඛ්‍යාව 440 ක් විය. එම නිසා 2021 වර්ෂය අවසානයේදී ආයතන 285 ක් පමණක් ක්‍රියාත්මකව පැවතුණි.	2021	වසා දැමුණු, අත්හිටවූ හෝ ගිවිසුම් අවලංගු කරනු ලැබූ ආයතන සියයට 50 ක් පමණ වන හෙයින් පූර්ව සමාලෝචනය කර එය අවම කර ගැනීමට ප්‍රතිකර්ම පියවර ගත යුතු බව	ඉහත දැක්වූ වසා දැමුණු, අත්හිටවූ හෝ ගිවිසුම් අවලංගු කරනු ලැබූ ව්‍යාපෘති 440, ආරම්භයේ සිට වර්තමානය දක්වා වර්ෂ 43 ක් (1978-2021) සඳහා වූ පරාසයක පවතින බව සටහන් කල යුතුය. එසේම, මෙම ව්‍යාපෘති 440 ලැයිස්තුවට වෙනත් සමාගමක් සමඟ ඒකාබද්ධ වූ හෝ පවරාගත් ව්‍යාපෘති 86 ක් ඇතුළත් වේ, එනම් ඒවා තාක්ෂණික වශයෙන් ක්‍රියාත්මක වේ. ගිවිසුම් අවලංගු කරනු ලැබූ, වසා දැමුණු හෝ මෙහෙයුම් අත්හිටවූ ඉතිරි ව්‍යාපෘති 354 සඳහා ගිවිසුම්වලට අනුකූල නොවීම, ඇණවුම්	දුර්වල සමාගම් කල්තියා හඳුනා ගැනීම සඳහා BOI විසින් සමාගම් පූර්ව කාර්ය සාධන ඇගයීමක් සිදු කර ඇත. BOI ගිවිසුමට අනුකූල නොවීම් තිබේ නම්, සාධාරණ කාල සීමාවක් ලබා දීමෙන් එය නිවැරදි කරන ලෙස සමාගමට දැනුම් දීම කර ගෙන යනු ලබයි.

				නොමැතිවීම, මූල්‍ය අපහසුතා, සමාගම් බංකොලොත්භාවයට පත්වීම යනාදී කරුණු හේතු වී ඇති අතර ඒවායින් බහුතරය ආයෝජන මණ්ඩලයේ පාලන සීමාවෙන් බාහිරව පැවතුණි.	
9	ඒකාබද්ධ ගිණුම්කරණ මෘදුකාංග පද්ධතිය (Integrated Accounting Software System) ස්ථාපනය කිරිම 2019 අප්‍රේල් මාසයේදී අවසන් කිරීමට නියමිතව තිබුණද 2023 දෙසැම්බර් 31 දින වන විට එය සම්පූර්ණ කර නොතිබුණු අතර ඒ සඳහා 2021 දෙසැම්බර් 31 දින වන විට රු.3,750,000 ක අතිරේක වියදමක් දරා තිබුණි.	2021	නියමිත කාලය තුළ ව්‍යාපෘතිය සාර්ථකව නිම කළ යුතු බව.	COVID-19 වසංගතය, කාර්ය මණ්ඩල හිඟය සහ BOI හි ව්‍යාපාර ආකෘතියේ සංකීර්ණත්වය වැනි හේතු කිහිපයක් නිසා ක්‍රියාත්මක කිරීම ප්‍රමාද විය.	ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් 2019 අප්‍රේල් නිම කළ යුතු ගිණුම්කරණ පද්ධතිය 2021 වන විට රු.3,750,000 ක අතිරේක පිරිවැයක් දරා 2024 මාර්තු මාසයේ සිට ක්‍රියාත්මක කරමින් ඇත.
10	ඉදිකිරීම් කාලය මාස 4 ක් ලෙස දක්වමින් බිංගිරිය කලාපයේ බටහිර මායිමට අදාළ ආරක්ෂිත වැට ඉදි කිරීමේ කොන්ත්‍රාත්තුව රු.32,087,075 ක පිරිවැයකට 2019 අප්‍රේල් 29 දින පිරිනමා තිබුණි. රු.31,814,285 ක මුදලක් වැය කර තිබුණු සහ මාස 20 ක ප්‍රමාදයක සහිතව මණ්ඩලය වෙත ව්‍යාපෘතිය භාර දී තිබුණද භෞතික පරීක්ෂාවේදී සමහර ප්‍රදේශවල වැට ඉදිකිරීම සම්පූර්ණ කර නොතිබුණු	2021	සැලසුම් කළ පරිදි වියදම් කළ මුදලට සරිලන පරිදි කාර්යසාධනය ඉටු කර ගැනීමට ව්‍යාපෘතිය සම්පූර්ණ කළ යුතු බව.	පොදු මාර්ග ඉදිකිරීම ආරම්භ කිරීම සඳහා ආයෝජන මණ්ඩලයට ලැබුණු කුඹුරු ඉඩම් භෞතික සන්තකයේ තබා නාගරික සංවර්ධන අධිකාරිය (RDA) වෙත භාරදීම. රේඛීය අමාත්‍යාංශයෙන් වැඩ සඳහා අවශ්‍ය මුදල් ලැබෙන තෙක් RDA බලා සිටී.	කලාපය හරහා පිහිටා ඇති පොදු මාර්ගය වන දුම්මලසූරිය - බිංගිරිය මාර්ගය අවහිර කළ නොහැකි බැවින් එම මාර්ගය වෙනුවට බයිපාස් පොදු මාර්ගය RDA විසින් නිම කරන තෙක් අනෙකුත් කටයුතු සිදු කිරීමට ඇත.

	අතර නිසි පරිදි නඩත්තු කර නොතිබුණු බව නිරීක්ෂණය විය. 2019 වර්ෂයේදී නැගෙනහිර මායිමට අදාළ ආරක්ෂිත වැටෙහි ඉදිකිරීම් සැලසුම් කර තිබුණද ප්‍රසම්පාදන ක්‍රියාවලිය හෝ ආරම්භ කර නොතිබුණු අතර එම නිසා ව්‍යාපෘතියේ අරමුණ වන භූමියේ ආරක්ෂාව සාක්ෂාත් කර ගැනීමට නොහැකි වී තිබුණි.				
11	සීමාසහිත ලංකා සංස්ථා සිමෙන්ට් කෝපරේෂන් පෞද්ගලික සමාගමෙන් 2022 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු හිඟ මුදල රු.152,842,821 ක් වන අතර මෙම අගය 2019 වසරේ සිට පසුගිය වර්ෂ සඳහා ගෙවීම් පැහැර හැරීම නිසා එකතු වී තිබුණි.	2021, 2022	-එම -	මෙම ආයතනය සමඟ සාකච්ඡා පවත්වමින් මෙම මුදල අයකර ගැනීමට නොකඩවා කටයුතු කරමින් සිටී.	මුළු හිඟ මුදලින් රු.30,000,000 ක් පමණක් පියවා තිබුණි.
12	රජය සතු ව්‍යාපාර (SOEs) සඳහා වූ යහපාලනය පිළිබඳ මාර්ගෝපදේශයෙහි 2.6 වගන්තියට පටහැනිව විධායක අධ්‍යක්ෂ - මානව සම්පත් සහ පරිපාලන, අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් ලෙස පත් කර තිබුණි.	2022	පොදු ව්‍යාපාර චක්‍රලේඛවලට අනුකූලව කටයුතු කිරීම සඳහා පියවර ගත යුතුයි.	අදහස් දක්වා නැත.	විධායක අධ්‍යක්ෂ (මානව සම්පත් සහ පරිපාලන) අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් ධූරයේ දිගටම කටයුතු කරමින් සිටී.
13	රජය සතු ව්‍යාපාර සඳහා වූ මෙහෙයුම් අත්පොතෙහි 3.1 සහ 3.2 වගන්තියන්ට පටහැනිව මහා භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය සඳහා	2022	- එම -	දීමනා, ගෙවීම් සහ සේවක ප්‍රතිලාභ යෝජනා ක්‍රම සඳහා 2023 ඔක්තෝබර් 11 දිනැති ලිපියක් මඟින් ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයේ	චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කර නොතිබුණි.

	දීමනා ලෙස රු.544,263,823 ක් සහ ප්‍රසාද දීමනා ලෙස රු.68,039,960 ක් ගෙවා තිබුණි.			ලේකම් හරහා රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ අනුමැතිය ඉල්ලා ඇත. තවද, 2024 ජූලි 19 දින ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරයා හරහා මේ සම්බන්ධයෙන් සිහි කැඳවීමක් ද යවා ඇත.	
14	පරිසර ආරක්ෂණ පනතේ රෙගුලාසිවලට අනුව පරිසර ආරක්ෂණ බලපත්‍රය අලුත් කිරීම සහ පරිසර ආරක්ෂණ බලපත්‍රය කල් ඉකුත් වන දිනට මාස 03 කට පෙර අලුත් කිරීමේ අයදුම්පත ඉදිරිපත් කිරීම සිදු කළ යුතුය. කෙසේ වෙතත්, එම ක්‍රියාමාර්ගය පසු විපරම් කිරීමට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය අපොහොසත් වී තිබුණි. එබැවින් සීතාවක අපනයන සැකසුම් කලාපයේ ආයතන 6 ක් ඉහත අවශ්‍යතාවයට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වී තිබුණි.	2022	පරිසර ආරක්ෂණ බලපත්‍ර අලුත් කිරීමේ ක්‍රියාවලිය පසු විපරම් කළ යුතුය.	පරිසර ආරක්ෂණ බලපත්‍රය අලුත් කිරීමේ ක්‍රියාවලිය දැඩි ලෙස අධීක්ෂණය කිරීමට පියවර ගෙන ඇත.	දැනට සියලුම අපනයන සැකසුම් කලාපවල ව්‍යවසායන් පනතට අනුව අලුත් කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කරමින් පවතී.
15	2022 ජූලි, ඔක්තෝබර්, නොවැම්බර් සහ දෙසැම්බර් මාසවල තෝරාගත් නියැදිය තුළ ආරක්‍ෂක ගිවිසුමේ අංක 03 වගන්තියට අනුව අවශ්‍ය ආරක්‍ෂක නිලධාරීන් යෙදවීමට සීතාවක අපනයන සැකසුම් කලාපයෙහි ආරක්‍ෂක ආයතනය අපොහොසත් වී තිබුණි. තවද, පැය 12 ක	2022	කලාපයේ ආරක්ෂාව තර කළ යුතුයි.	ආරක්‍ෂක රාජකාරි නිලධාරිගේ අධීක්‍ෂණය යටතේ ආයෝජන මණ්ඩල සහ පුද්ගලික ආරක්‍ෂක නිලධාරීන් යොදවා කලාපයේ ආරක්‍ෂාව තර කෙරේ. පැය 24 න් ඔබ්බට ආරක්ෂක භටයන් යෙදවීම	නිසි ආකාරයෙන් ආරක්ෂාව තර කර නොතිබුණි.

	සේවා මුර සැපයිය යුතු වුවත්, ඉන්වොයිසිවලට අනුව පැය 24 කට වඩා වැඩි සේවා මුර ද ඇතුළත් ව තිබුණි. මෙය කලාපයේ ආරක්ෂාවට අහිතකර අයුරින් බලපානු ඇත.			වැනි අවස්ථාවලදී දඩයක් පැනවීමෙන් අධෛර්යමත් කිරීමට පියවර ගෙන ඇත.	
16	2020 වර්ෂයේදී, රු.මිලියන 2,460 ක ඇස්තමේන්තුගත ආයෝජනයකින් අක්කර 400 ක් පුරා පැතිර යන ලෙස ඖෂධ නිෂ්පාදන කලාපයක් ආරබොක්ක ප්‍රදේශයේ ස්ථාපිත කිරීමට මණ්ඩලය සැලසුම් කර තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ විය.	2022			
	(i) මෙම ව්‍යාපෘතිය සඳහා ඉඩම ප්‍රදානයක් ලෙස ලැබීම හේතුවෙන් ශක්‍යතා අධ්‍යානයක් සිදු නොකර උපාය මාර්ගික පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාව පමණක් පවත්වා ගනිමින් මෙම ඉඩම ව්‍යාපෘතිය සඳහා යොදා ගෙන තිබුණි.		ආයෝජන ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට පෙර ශක්‍යතා අධ්‍යානය පැවැත්විය යුතුය.	පාරිසරික බලපෑම් ඇගයීමක් සිදු කිරීම මඟින් සමාජ ආර්ථික අංශ ඇතුළු කලාපයක් සංවර්ධනය කිරීම සඳහා ස්ථානයෙහි යෝග්‍යතාවය ආවරණය වේ.	අමතර පිරිවැයක් දැරීමට සිදු වන බැවින් ශක්‍යතා අධ්‍යයනයක් මෙතෙක් සිදු කර නොතිබුණි.
	(ii) 2021 වර්ෂය අවසන් වන විට, යටිතල පහසුකම් සැපයීම අවසන් කළ යුතු නමුත් 2022 ඔක්තෝබර් වන විට විදුලිය පහසුකම් සැපයීම සියයට 70 ක්, ජල පහසුකම් සැපයීම සියයට 0 ක්, අධිවේගී මාර්ග පහසුකම් සැපයීම ඉතා මන්දගාමී වේ.		ව්‍යාපෘති යෝජනාවට අනුකූලව කටයුතු කිරීම සඳහා පියවර ගත යුතුය.	2021 හා 2022 වර්ෂ තුළ කොවිඩ් – 19 වසංගතය සහ ආර්ථික පසුබෑම සහ රාජ්‍ය වියදම් පාලනය සඳහා වූ රජයේ ප්‍රතිපත්ති හේතුවෙන් සංවර්ධන කටයුතු අත්හිටුවා තිබුණු බව.	විදුලිය සැපයීම සඳහා විදුලි කණු ඉදිකර විදුලි රැහැන් ඉදි කර තිබුණ අතර ට්‍රාන්ස්ෆෝමර් සවි කර නොතිබුණි. තාවකාලික ජල සම්පාදන සම්බන්ධතාවක් පමණක් ඇත. අභ්‍යන්තර බොරළු පාරක පමණක්

					ඉදිකිරීම් අවසන් කර තිබුණි.
(iii)	ආයෝජන මණ්ඩලය විසින් කලාපයට ආයෝජකයින් ගෙන්වා ගැනීම සඳහා ප්‍රවර්ධන වැඩසටහන් දියත් කර තිබුණද, මූලික සාකච්ඡා සඳහා ආයෝජකයින් කිහිප දෙනෙකු සහභාගී වී ඇතත්, තවමත් කිසිදු ආයෝජකයෙකු කලාපයේ ආයෝජනය කිරීමට ඉදිරිපත් වී නොතිබුණි.		ආයෝජකයින් ගෙන්වා ගැනීමට පියවර ගත යුතුයි.	කලාපයේ යටිතල පහසුකම් සංවර්ධනය සමඟ ආයෝජකයින් ආකර්ෂණය කර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම.	ඖෂධ කලාපයට වෙන් කර ඇති අක්කර 100 ක භූමි ප්‍රමාණයක ක්‍රියාකාරී ඖෂධ ද්‍රව්‍ය (API) කලාපයක් පිහිටුවීම සඳහා ආයෝජන මණ්ඩලය විසින් සාකච්ඡා කරමින් පවතී.
17	රු.මිලියන 4,770 ක ඇස්තමේන්තුවක් යටතේ එරාවූර් ප්‍රදේශයේ අක්කර 400 ක භූමි ප්‍රමාණයක රෙදිපිළි සඳහා විශේෂ කර්මාන්ත කලාපයක් පිහිටුවීමට සැලසුම් කර ඇති කර්මාන්ත කලාපය සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ සිදු කෙරිණ.	2022			
(i)	ඉඩම අත්පත් කර ගැනීම සඳහා තීරණ ගැනීම ප්‍රමාද වීම හේතුවෙන් මෙම කලාපය ඉදිකිරීම සඳහා අත්පත් කර ගනු ලැබූ ඉඩම වෙනුවෙන් රු.107,890,674 ක අමතර මුදලක් වැය කිරීමට ආයෝජන මණ්ඩලයට සිදු වී තිබුණි.		ව්‍යාපෘති යෝජනාවට අනුකූලව කටයුතු කිරීමට පියවර ගත යුතුය.	ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය අත්හැර දැමීමට රජය ගත් ප්‍රතිපත්තිමය තීරණය හේතුවෙන් අත්පත් කර ගැනීමේ කටයුතු ප්‍රමාද වූ බව.	ඉඩම් අත්පත් කර ගැනීම ප්‍රමාදව සිදු කර ගෙන ඇත.
(ii)	මුහුදට බැහැර කරන පද්ධතියේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කර ඇතත් අක්කර 100 කට		ඉඩම පවරා ගැනීමේ ක්‍රියාවලිය වේගවත් කළ	මඩකලපුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සම්බන්ධීකරණය ඇතිව මෙම ඉඩම	එම ඉඩම අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය මත නොමිලේ

	ආසන්න භූමි ප්‍රමාණයක අයිතිය 2022 නොවැම්බර් 30 වන විටත් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට පවරා දී නොතිබුණි. එම ඉඩම ශ්‍රී ලංකා රජය සතු වන අතර ඊට අදාළව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය 2022 ඔක්තෝබර් මාසය වන විට මැනුම් කටයුතු සඳහා රු.927,738 ක මුදලක් වැය කර තිබුණි.	යුතුය.	පැවරීමේ කටයුතු මේ වන විට සිදුකෙරෙමින් පවතින බව.	ප්‍රදානයක් ලෙස ආයෝජන මණ්ඩලයට පැවරීමට යෝජනා කර තිබූ අතර ඉඩම් පැවරීමේ කටයුතු සිදු වෙමින් පවතී.
(iii)	කලාපයට ආයෝජන ආකර්ෂණය කර ගැනීම සඳහා ආයෝජන මණ්ඩලය විසින් 2020, 2021 සහ 2022 වර්ෂ සඳහා ප්‍රවර්ධන වැඩසටහන් දියත් කර තිබුණු නමුත් මේ වන විට කලාපයේ ආයෝජනය කිරීමට එක් ආයෝජකයෙකු පමණක් ඉදිරිපත් වී තිබුණි.	ආයෝජකයින් ආකර්ෂණය කර ගැනීමට පියවර ගත යුතුය.	එරාවූර්හි රෙදිපිළි උද්‍යානය සඳහා මූලික උනන්දුව තිබියදීත්, පළමු ආයෝජකයා ආයෝජන දිරිගැන්වීම් සම්බන්ධ ගැටළු කිහිපයකට මුහුණ දුන් අතර ඒවා මෑතකදී විසඳා ඇත.	මෙතෙක් ආයෝජකයින්ගේ ඉදිරිපත් වීමක් නැත.
(iv)	මූලික ජල පහසුකම් සැපයීමේ කටයුතු වෙනුවෙන් 2020, 2021 සහ 2022 වසර සඳහා රු.මිලියන 16.1 ක් ඇස්තමේන්තු කර ඇති අතර, 2022 නොවැම්බර් 30 වන විට ඒ සඳහා රු.මිලියන 24 ක් වැය කර තිබුණි. ඒ අනුව 2022 වසර වන විට රු.මිලියන 7.9 ක් ඇස්තමේන්තුගත මුදලට ඉක්මවා වියදම් කර තිබුණි.	ලබා දී ඇති ඇස්තමේන්තුව තුළ පිරිවැය දැරිය යුතුය.	NWS&DB විසින් 2021 දී රු.18,932,400 ක සංශෝධිත ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර ඇති අතර සම්බන්ධතා ගාස්තු සහ ආරක්ෂිත තැන්පතු ලෙස අතිරේකව රු.5,055,451 ක් ඉල්ලා ඇත.	ඇස්මේන්තු ඉක්මවා වියදම් දැරුවද ජල පහසුකම් සැපයීම් සම්පූර්ණ කර නැත.

18	නව ආයෝජන කලාප දියත් කිරීමේ මෑතකාලීන ව්‍යාපෘති කිසිවක් අපේක්ෂිත ඉලක්ක කරා යාමට මෙතෙක් සමත් වී නොතිබුණි. විස්තර පහත පරිදි වේ.	2022	ආයෝජකයින් වැඩි වශයෙන් ආකර්ෂණය කර ගැනීමට සහ නව ආයෝජන කලාප ශක්‍ය ව්‍යාපෘති බවට හැරවීමට පියවර ගත යුතුයි.	බිංගිරිය EPZ අදියර I හි අක්කර 90.20 ක කර්මාන්ත ප්‍රදේශයෙන් අක්කර 35.24 ක් ආයෝජන ව්‍යාපෘති හතරක් සඳහා වෙන් කර ඇත.	යෝජිත ඉඩම් පවරා ගැනීම සිදු කර නොතිබුණි.

ආයෝජන කලාපය	ඇස්තමේන්තුගත මුදල රු. මිලියන	දරන ලද සැබෑ වියදම රු. මිලියන	මුළු ඉඩම් අක්කර	භාවිතා කරන ඉඩම් අක්කර	ආයෝජන ව්‍යාපෘති සංඛ්‍යාව
මිල්ලෑනිය	13,474	2,300.5	යෝජිත ඉඩම මෙතෙක් පවරාගෙන නැත.		
බිං	2,266	1,052.3	40.58	30.72	3
[illegible]	1,750	361.8	2 2	50	1
[illegible]	2,4 0	275.15	400	කිසිවක් නැත	

19	කටුනායක ලක්ෂ්මි විද්‍යාලයට නුදුරින් පිහිටි අක්කර 2 ක ඉඩම ලක්ෂ්මි විද්‍යාලය විසින් පරිහරණය කර තිබුණි. කෙසේ වෙතත්, ඉහත බාහිර පාර්ශ්වයන්ට අයිතිය පැවරීමකින් හෝ ඉඩම බදු දීමට විධිමත් ගිවිසුමකට එළඹීමකින් තොරව මෙම	2022	අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුයි.	මෙම ප්‍රතිපාදන සඳහා ඔවුන්ගේ රේඛීය අමාත්‍යාංශය හරහා විධිමත් ඉල්ලීමක් ආයෝජන මණ්ඩලය වෙත යොමු කරන ලෙස ආයෝජන මණ්ඩලය ලක්ෂ්මි	ලක්ෂ්මි විද්‍යාලයේ විදුහල්පතිනියගෙන් ඉල්ලීමක් 2024 ජූලි 22 දින ලැබී ඇති අතර, අදාළ ඉඩම මාරු කිරීම සඳහා වූ BOI නිර්දේශය සමඟ 2024 ජූලි 24 දින මීගමුව කලාප

	ඉඩම කටුනායක ආයෝජන සැකසුම් කලාපයේ කාර්මික නොවන ප්‍රදේශය යටතේ පෙන්වා තිබුණි.			විද්‍යාලයට දැනුම් දී ඇත.	අධ්‍යාපන අධ්‍යක්ෂ කාර්යාලය වෙත යොමු කර තිබුණ අතර මෙතෙක් පැවරීමක් සිදු කර නොතිබුණි.
20	2022 දෙසැම්බර් 31 දින වන විට ආයෝජන කලාප 13 ක අක්කර 773.09 ක භූමි ප්‍රමාණයක් හිස්ව පැවති අතර එය ආයෝජකයින් සඳහා පැවති කාර්මික ප්‍රදේශයෙන් සියයට 30 ක් නියෝජනය වේ. තවද, ආරබොක්ක (ඖෂධ) කලාපයේ සහ බිංගිරිය අපනයන සැකසුම් කලාපයේ දෙවන අදියරයෙහි පිළිවෙළින් අක්කර 751.7 ක් සහ අක්කර 282.9 ක භූමි ප්‍රමාණයකින් යුත් ඉඩම් ආරම්භයේ සිටම ප්‍රයෝජනයට නොගෙන 2022 දෙසැම්බර් 31 දිනට නිශ්කාර්යව පැවතුණි. තවද, 2022 දෙසැම්බර් 31 දිනට ආර්ථික කලාපවලින් පිටත අක්කර 777.11 ක ඉඩම් ප්‍රමාණයක් නිශ්කාර්යව පැවතුණි.	2022	හිස් ඉඩම් ප්‍රවර්ධනය කිරීම සඳහා පියවර ගත යුතුයි.	ආයෝජනය සඳහා හිස් ඉඩම් දේශීය හා ගෝලීය ආයෝජකයින් වෙත අඛණ්ඩ පදනමින් ප්‍රවර්ධනය කෙරේ.	2024 සැප්තැම්බර් 30 දින වන විටත් ඉඩම් නිශ්කාර්යව පවතී.
21	මිරිජ්ජවිල අපනයන සැකසුම් කලාපයේ රු.516,964,285 ක වියදමින් ඉදිකරන ලද කිලෝමීටර් 10.8 ක අභ්‍යන්තර මාර්ගයෙන් මීටර් 800 ක් පමණක් භාවිත කර තිබුණි. තවද, මාර්ගයේ පළල මීටර් 26.5 සිට මීටර් 33 දක්වා	2022	කලාපවල අභ්‍යන්තර මාර්ග නිසි ලෙස සැලසුම් කර ඉදිකළ යුතුය.	මිරිජ්ජවිල අපනයන සැකසුම් කලාපය සැකසීම සඳහා ඉඩම BOI වෙත පැවරීමට පෙර UDA විසින් මෙම මාර්ග ඉදිකිරීම ආරම්භ කර ඇත.	කලාපයේ කිලෝමීටර් 10.8 ක අභ්‍යන්තර මාර්ගය 2024 සැප්තැම්බර් 30 දින වන විටත් සම්පූර්ණ කර නොතිබුණි.

	පරාසයක පවතින අතර එය ප්‍රමිතිගත පළල වූ මීටර් 7.4 ක කැරේජ් පළල සමඟ සමස්ත මීටර් 20 ක වෙන් කිරීමකට වඩා වැඩි වී තිබුණි.				
22	ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ (DMC) පුහුණු මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා ශ්‍රී ලංකා රතු කුරුස සමාජයට (SLRCS) වෙන් කරන ලද කටුනායක අපනයන සැකසුම් කලාපය ආසන්නයේ අක්කර 5 රූඩ් 3 පර්චස් 30.1 ක් සහිත ඉඩමක් 2022 ඔක්තෝබර් 12 දින වන විට ඌන උපයෝජනයට පත්ව තිබුණි.	2022	පවතින ඉඩම් ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.	ශ්‍රී ලංකා රතු කුරුස සමාජය හා ආයෝජන මණ්ඩලය යන දෙපාර්ශවයටම අන්‍යොන්‍ය ප්‍රතිලාභ බෙදා ගැනීමට සුදුසු ආයෝජකයකු හඳුනා ගැනීමේ ක්‍රම සහ විධි ගවේශණය කිරීමට දෙපාර්ශවයම එකඟ වූ බව.	වාර්ෂිකව රු.2,047,690 (බදු ඇතුළුව) (2024 වර්ෂයේදී) නාමික ගාස්තුවක් බිම් කුලිය ලෙස අය කරනු ලබන අතර සුදුසු ආයෝජකයකු හඳුනා ගෙන නොතිබුණි.

3.54 රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	6,770,160,573	6,446,434,836	323,725,737	96,124,611	තත්ත්වාගණනය කළ
2022	7,592,792,156	6,754,254,108	838,538,048	26,921,045	ව්‍යාවනය කළ
2023	-	-	-	-	-

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
	ලැබිය යුතු ගිණුම්				
1	කොන්ක්‍රීට් අංගන, ඉදිකිරීම් සහ මාර්ග සංඥා පද්ධති ණයගැතියෝ, ලැබිය යුතු ප්‍රමාද ගාස්තු, ලැබිය යුතු රඳවා ගැනීම් සහ මිලදී ගැනුම් අත්තිකාරම් එකතුව රු.මිලියන 691.23 ක් අයකර ගැනීමෙන් තොරව වර්ෂ 3ක් පුරා පවතී.	2021, 2022	වගකිව යුතු නිලධාරීන් විසින් හිඟ ශේෂයන් අයකර ගැනීමට ඵලදායී ලෙස ක්‍රියාමාර්ග ගත යුතුය.	සැලසුම් සහ නිෂ්පාදන අංශය යටතේ, මුදල් එකතු කිරීමේ අංශයක් පිහිටුවා හිඟ මුදල් අයකර ගැනීම සිදුකරයි.	2023 දෙසැම්බර් 31 දිනට අයකර ගත යුතු ශේෂය රු.මිලියන 582 කි.
	නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදිය සමග අනුගත නොවීම				
2	1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල පනත EPF දායක මුදල් සහ ඒ සම්බන්ධ අධිභාර වූ	2022	මෙම ව්‍යවස්ථාපිත ගෙවීම් නිරවුල් කිරීමට පියවර ගැනීම අවශ්‍ය වේ.	මුදලින් පියවීමට කටයුතු කර ඇත.	මෙම මුදලින් රු.මිලියන 105.21 ක් මේ දක්වා

	රු.මිලියන 143.26 ක මුදලක් 2020 සිට සේවක අර්ථ සාධක අරමුදල වෙත ගෙවා නොතිබුණි.				පියවා නැත.
	මුදල් කළමනාකරණය				
3	2022 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය බැංකු දෙකකින් ලබාගත් කාලීන ණය ශේෂය රු.මිලියන 1,848.24 ක් වූ අතර කල්තැබූ ණය ශේෂවල වටිනාකම රු.මිලියන 1,727.18 කි. මෙම ණය භාණ්ඩාගාර ඇපකරය යටතේ රු.මිලියන 990.61 ක් ලබාදී තිබූ අතර රු.මිලියන 518.60 ක් සඳහා සංස්ථාවේ ඉඩම් ඇපකර ලෙස සංස්ථාව විසින් ලබාදී තිබුණි.	2021, 2022	කල් දැමීමේ නව කොන්දේසි අනුව ණය සහ පොලී ගෙවීම පිළිබඳව සංස්ථාවේ කළමනාකාරීත්වය අවධානය යොමු කළ යුතුය.	සංස්ථාව ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියේදී සියළු ණය නිරවුල් කිරීමට තීරණය කර ඇත.	මේ දක්වා ණය නිරවුල් කර නොමැත.
	බදු රෙගුලාසිවලට අනුකූල නොවීම				
4	2002 අංක 14 එකතු කළ අගය මත බදු පනතට අනුව 2006 වසරේ සිට වැට් බද්ද සහ අධිභාර රු.මිලියන 2,403 ක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර නොතිබුණි.	2021, 2022	එකතු කළ අගය මත බදු පනතේ විධිවිධානවලට සංස්ථාව අනුකූල විය යුතුය.	සංස්ථාව ප්‍රතිව්‍යුහගත කළ යුතු බව රජය තීරණය කර ඇති අතර, එම අවස්ථාවේදී මෙම බදු මුදල් නිරවුල් කිරීමට තීරණය කර ඇත.	මේ දක්වා ගෙවා නොතිබුණි
5	2009 අංක 09 ජාතිය ගොඩනැගීමේ බදු පනතට අනුව 2010 වසරේ සිට ජාතිය ගොඩනැගීමේ බදු	2021, 2022	සංස්ථාව, ජාතිය ගොඩනැගීමේ බදු පනතේ විධිවිධානවලට	-එම-	-එම-

	සහ අධිභාරය රු.මිලියන 7.15ක් ගෙවා නොතිබුණි.		අනුකූල විය යුතුය.		
6	2015 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු සංශෝධන පනතට අනුව ගෙවිය යුතු රු.මිලියන 101.23 ක ගෙවිය යුතු ආර්ථික සේවා ගාස්තුව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවා නොතිබුණි.	2022	සංස්ථාව, ආර්ථික සේවා ගාස්තු සංශෝධන පනතට අනුකූල විය යුතුය.	-එම-	-එම-
	මෙහෙයුම් අකාර්යක්ෂමතාව				
7	සංස්ථාවේ පූර්ණ අයිතිය ඇති පරිපාලිත ආයතනය වන Devcoshowa (Pvt) Ltd කාලයක් තිස්සේ අක්‍රීයව පවතින අතර, සමාගම ඈවර කිරීමට 2006 වර්ෂයේදී මණ්ඩලය තීරණයක් ගෙන තිබුණි. ඈවර කිරීමේ ක්‍රියාවලිය 2023 ඔක්තෝබර් 31 වන විටත් අවසන් වී නොතිබුණි.	2021, 2022	ඈවර කිරීමේ ක්‍රියාවලිය අවසන් කිරීමට සංස්ථාව කටයුතු කළ යුතුය.	ඈවර කිරීමේ ක්‍රියාවලිය සඳහා නීතිපති උපදෙස් ඉල්ලා ඇත.	ඈවර කිරීමේ ක්‍රියාවලිය මේ දක්වා අවසන් කර නොමැත.

3.55 කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	8,315,405,250	1,407,335,240	6,908,070,010	1,575,875,061	තත්ත්වාගණනය කළ
2022	10,005,066,041	460,457,265	9,433,394,222	2,440,680,754	තත්ත්වාගණනය කළ
2023	7,764,191,166	1,572,701,212	6,191,489,954	982,500,036	තත්ත්වාගණනය කළ

සමූහය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	9,234,911,249	88,366,625,483	(79,131,714,234)	1,779,698,660	තත්ත්වාගණනය කළ
2022	11,353,903,138	92,390,416,049	(81,036,512,911)	(2,135,968,851)	තත්ත්වාගණනය කළ
2023	9,790,276,433	95,754,121,756	(85,963,845,323)	(3,884,548,662)	ව්‍යාචනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ගය	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනාක්‍රමයේ මුළු වත්කම් රු.2,202,748,150 ක් සහ මුළු වගකීම් රු.89,457,327,488 ක් වූයෙන් වත්කම් ඉක්මවූ වගකීම් රු.87,254,579,339 ක්	2023	යෝජනා ක්‍රමය සක්‍රිය කර ගැනීමට කටයුතු කළ යුතුය.	විශ්‍රාම වැටුප් වගකීම වාර්ෂිකව වැඩිවන අතර, වාරික මුදල් වැඩිකිරීමකින් තොරව අවස්ථා කිහිපයකදී රාජ්‍ය ප්‍රතිපත්ති මත ප්‍රතිලාභ වැඩිකිරීම හේතුවෙන් රජයේ අයවැය මගින් මුදල් වෙන්කර ගොවි	2021 සහ 2022 වසරවලදී නව දායකයින් බඳවාගෙන ඇතත් ජංගම වත්කම් ඉක්මවූ ජංගම වගකීම් සම්බන්ධයෙන් අවධානය යොමුකර නොතිබුණි.

	ද, මුළු ජංගම වත්කම් රු.1,092,503,529 ක් සහ මුළු ජංගම වගකීම් රු.2,527,354,554 ක් වූයෙන් ජංගම වත්කම් ඉක්මවූ ජංගම වගකීම් රු.1,434,851,025 ක් ද වන අතර භාණ්ඩාගාරයේ දායකත්වයක් නොමැතිව යෝජනා ක්‍රමය පවත්වාගෙන යා නොහැකි තත්ත්වයක පවතින නිසා යෝජනාක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම ගැටළු සහගතවේ.			විශ්‍රාම වැටුප් ගෙවනු ලබයි.	
2	ගොවීන්ගේ නිවැරදි ජීව දත්ත තොරතුරු යාවත්කාලීන කිරීමේ ක්‍රමවේදයක් නොමැති වීම හේතුවෙන් මියගිය සහ වෙනත් හේතූන් මත හිමිකම් නොපාන ගොවීන්ගේ විශ්‍රාම වැටුප දිගින් දිගටම තැපැල් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර තිබුණි. මේ හේතුවෙන් 2023 වර්ෂයේ දී ගොවීන් විසින් භාර නොගැනීම නිසා තැපැල් දෙපාර්තමේන්තුව විසින් ආපසු එවූ විශ්‍රාම වැටුප රු.259,373,191 ක් වූ අතර සමාලෝචිත වසර අවසානයට එම දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු ශේෂය රු.81,000,602 ක් විය. විශ්‍රාම වැටුප් ලබා නොගත් ගොවීන් පිළිබඳ	2023 1.5.3.4	හිමිකම් නොපෑ මුදල් පිළිබඳ තොරතුරු යාවත්කාලීන කර භාණ්ඩාගාරයට ප්‍රේෂණය කළ යුතුය.	ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට අදාළව ප්‍රධාන කාර්යාලය වෙත ලැබෙන සියලු ලේඛන පරික්ෂා කර බලා නිසි පරිදි ප්‍රධාන කාර්යාලයේ යම් ස්ථානයක හෝ ලේඛනාගාරයේ ගබඩා කිරීමටත් එම ලේඛනවල තොරතුරු සහිත පරිසනක දත්ත පද්ධතිය යාවත්කාලින කිරීම සිදු කෙරෙමින් පවතින බවද වැඩිදුරටත් දන්වා සිටිමි. දිසා ගණකාධිවරුන් විසින් නොගෙවූ විශ්‍රාම වැටුප් ලේඛන අන්තර්ජාලය ඔස්සේ අපවෙත	හිමිකම් නොපෑ මුදල් පිළිබඳ තොරතුරු යාවත්කාලීන කර භාණ්ඩාගාරයට ප්‍රේෂණය කර නොතිබුණි.

	විස්තර නඩත්තු කර නොතිබීම නිසා වර්ෂ අවසාන ශේෂයෙහි සහ ලද මුදලෙහි නිරවද්‍යතාව තහවුරු නොවීය.			ලබා දෙනු ලබන අතර එය විධිමත්ව පවත්වා ගැනීමට කටයුතු කරනු ලැබේ.	
3	ධීවර විශ්‍රාම වැටුප් වගකීම රු.5,532,349,026 ක් වුවද එදිනට ආයෝජන වටිනාකම රු.793,308,692 ක් වූයෙන් මෙම බැඳීම් පියවීමට ප්‍රමාණවත් ආයෝජනයක් සිදුකර නොතිබුණි.	2023	විශ්‍රාම වැටුප් වගකීම පියවීමට ප්‍රමාණවත් ආයෝජනයක් සිදුකළ යුතුය.	පිළිතුරු ලබාදී නොමැත	බැඳීම් පියවීමට ප්‍රමාණවත් ආයෝජනයක් සිදුකර නොතිබුණි.
4	ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනාක්‍රමයේ මුළු ශුද්ධ වත්කම් දිගින් දිගටම සෘණ අගයක් වීම මත යෝජනාක්‍රමයේ මුළු වත්කම් උපලබ්ධි කිරීමෙන් මුළු වගකීම් පියවීමට නොහැකි වීමත් මත යෝජනාක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම මතභේදාත්මක වේ.	2023	යෝජනාක්‍රමයේ මුළු ශුද්ධ වත්කම් දිගින් දිගටම සෘණ අගයක් වීම වලක්වා ගැනීමට කටයුතු කළ යුතුය.	මෙම යෝජනා ක්‍රමය ස්වයං මූල්‍ය පදනමකින් ක්‍රියාත්මක නොවන අතර, වාරික තීරණය කිරීමේදී රාජ්‍ය සහනාධාරයට අන්තර්ග්‍රහණය කිරීම නිසා මෙම තත්වය උද්ගත වී ඇත. ඒ අනුව වාර්ෂිකව ගෙවිය යුතු විශ්රාම වැටුප් වගකීම ඉහළ යනු ලබන අතර එම නිසා ශුද්ධ වත්කම් අගයද අඩු වේ. එම හේතු නිසා මෙම යෝජනා ක්‍රමය සඳහා නව බඳවා ගැනීම් සිදු කිරීම ප්‍රවර්ධනය කර නොමැත.	යෝජනාක්‍රමයේ මුළු ශුද්ධ වත්කම් දිගින් දිගටම සෘණ අගයක් වීම වලක්වා ගැනීමට කටයුතු කර නොමැත.

5	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මු.රෙ 381 ට පටහැනිව මණ්ඩලයේ බැංකු ගිණුම් 45 ක්ද ඇතුළු සමූහයේ බැංකු ගිණුම් 57 ක් භාණ්ඩාගාර අනුමැතිය නොමැතිව ආරම්භ කර පවත්වාගෙන යනු ලබයි.	2023	බැංකු ගිණුම් සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගත යුතුය.	මණ්ඩලය විසින් රාජකාරි ගිණුම් ආරම්භ කිරිමේදි අධ්‍යක්ෂ මණ්ඩලය වෙත අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් යොමු කර අදාළ අනුමැතිය ලබා ගනු ලබයි.	බැංකු ගිණුම් විවෘත කිරීමට භාණ්ඩාගාර අනුමැතිය ගෙන නොතිබුණි.
6	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය				
	XII වැනි පරිච්ඡේදයෙහි 7.5 වගන්තිය ප්‍රකාරව විදේශීයව ගත කරන නිවාඩු සමඟ හිලව් නිවාඩු ලබා ගත නොහැකි නමුත් මණ්ඩලයේ හිටපු අධ්‍යක්ෂ ජනරාල් විසින්, 2023 සැප්තැම්බර් 10 දින සිට 2023 ඔක්තෝබර් 10 දින දක්වා දින 31 ක් කාලයක් සඳහා විදේශීයව ගත කිරීමට හිලව් නිවාඩු ලබාගෙන තිබුණි.	2023	ආයතන සංග්‍රහය විධිවිධාන අනුව කටයුතු කළ යුතුය.	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද චක්‍රලේඛ හා උපදෙස් ලිපි අනුව නිවාඩු ගණනය කිරීම සිදුකරනු ලබන අතර ආයතන සංග්‍රහයේ ඇතුළත් සියළුම වගන්ති හා කොන්දේසි ඒ ආකාරයෙන්ම මණ්ඩලයේ නිළධාරීන්ගේ නිවාඩු සඳහා අදාළ කර නොගනී. ඒ අනුව අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාලන II) විසින් අධ්‍යක්ෂ ජනරාල්ගේ මෙරටින් ගත කරන ලද කාලය සඳහා නිවාඩු අනුමත කර ඇත.	විදේශීයව නිවාඩු ගත කිරීමට හිලව් නිවාඩු ලබාගැනීම සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

7	කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩල කළමනාකරණ සේවා ගණයෙහි තනතුරු සඳහා වූ බඳවාගැනීමේ පරිපාටිය				
(i)	4.3.1(අ) උප වගන්තිය ප්‍රකාරව රක්ෂණ අංශයේ සහකාර අධ්‍යක්ෂ තනතුර සඳහා රාජ්‍ය අංශයේ/ සංස්ථා/ මණ්ඩල හෝ පිළිගත් ආයතනයක වසර 03 ක රක්ෂණ කටයුතු පිළිබඳ පළපුරුද්ද ඇති නිලධාරියෙකු බඳවාගත යුතු වුවත්, එයට පටහැනිව වසර 03 ක ක්ෂේත්‍ර හා පරිපාලන කටයුතු පිළිබඳ පළපුරුද්ද ඇති නිලධාරියෙකු බඳවාගෙන තිබුණි.	2023	බඳවාගැනීමේ පරිපාටිය ප්‍රකාරව කටයුතු කළ යුතුය.	සහකාර අධ්‍යක්ෂවරුන් ප්‍රමාණවත් පරිදි බඳවා ගැනීමට අනුමැතිය නොලැබීම හා පුරප්පාඩු වූ තනතුරු සඳහා සුදුසුකම් සහිත අයදුම්කරුවන් ඉදිරිපත් නොවීය. බඳවාගන්නා ලද අයදුම්කරුවන්ගේ සුදුසුකම් හා අදාළ අංශවල සේවය කිරීමට ඔවුන් සතුව පැවති විෂයානුබද්ධ දැනුම පරීක්ෂාකර කෙටි පුහුණුවකින් පසුව අදාළ නිලධාරීන් අදාළ අංශවලට අනුයුක්ත කිරීමට කටයුතු කර ඇත.	බඳවාගැනීමේ පරිපාටිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
(ii)	සැලසුම් අංශයේ සහකාර අධ්‍යක්ෂ තනතුර සඳහා රාජ්‍ය අංශයේ/ සංස්ථා/ මණ්ඩල හෝ පිළිගත් ආයතනයක වසර 03 ක සැලසුම්කරණ හෝ කාර්යඵල මෙහෙයුම් ක්ෂේත්‍රයේ	2023	බඳවාගැනීමේ පරිපාටිය ප්‍රකාරව කටයුතු කළ යුතුය.	-එම-	බඳවාගැනීමේ පරිපාටිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

	පළපුරුද්ද ඇති නිලධාරියෙකු බඳවාගත යුතු වුවත්, එයට පටහැනිව වසර 03 ක ක්ෂේත්‍ර හා පරිපාලන කටයුතු පිළිබඳ පළපුරුද්ද ඇති නිලධාරියෙකු බඳවාගෙන තිබුණි.			
(iii)	5.2.1 (අ) උප 2023 වගන්තිය ප්‍රකාරව බාහිර අයදුම්කරුවන්, සිංහල/ දෙමළ භාෂාව සහ ගණිතය ඇතුළුව තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබිය යුතු වුවත්, සුදුසුකම් සපුරා නොතිබුණු නිලධාරින් 12 දෙනෙකු කළමනාකරණ සහකාර තනතුර සඳහා බඳවාගෙන වර්ෂ 03 ක කාලයක් අනියම් නිලධාරීන් ලෙස රඳවා තබාගෙන තිබුණි.	සුදුසුකම් සපුරා නොමැති නිලධාරින් අනියම් පදනමට තනතුරු සඳහා බඳවා නොගත යුතුය.	බඳවාගැනීම සඳහා අනුමැතිය නොලැබී තිබුණු කාල පරිච්ඡේදයේදී පුහුණු පදනමින් නිලධාරීන් බඳවාගෙන මණ්ඩලීය කටයුතු කාර්යක්ෂමව සිදුකර ගෙන යන ලදී. නිලධාරීන්හට තනතුරට අවශ්‍ය මූලික සුදුසුකම් සපුරාගන්නා ලෙස පෙළඹවීම් කර ඇති අතර සුදුසුකම් සපුරා ගැනීමෙන් පසුව කළමනාකරණ සහකාර තනතුරේ ස්ථිර කරනු ලබයි.	සුදුසුකම් සපුරා නොමැති නිලධාරින් අනියම් පදනමට තනතුරු සඳහා බඳවාගෙන තිබුණි.

8	2022 දෙසැම්බර් 14 දිනැති අංක 2310/29 දරන කාර්ය පටිපාටික රීති සඳහා වන අති විශේෂ ගැසට් පත්‍රයේ IX පරිච්ඡේදයේ 131 වගන්තිය ප්‍රකාරව වැඩ බැලීමේ පත් කිරීමක් කළ යුත්තේ අනුමත කාර්ය මණ්ඩලය තුළ ඇති තනතුරක සේවයේ නියුතු නිත්‍ය රජයේ නිලධරයකු, විධිමත් අනුමැතියක් ලබාගෙන කිසියම් කාලසීමාවක් එම තනතුරෙහි සේවයෙන් බැහැරව සිටින අවස්ථාවක හෝ අනුමත කාර්ය මණ්ඩලය තුළ ඇති තනතුරක පුරප්පාඩුවක් පවත්නා අවස්ථාවක එම තනතුරට ස්ථිර පත් කිරීමක් කරනු ලබන තෙක් තාවකාලික ප්‍රතිකර්මයක් වශයෙන් වන නමුත්, තනතුරු 07 ක් සඳහා නිලධාරින් 26 ක් මාස 08 සිට අවුරුදු 12 දක්වා දීර්ඝ කාලීනව වැඩ බැලීමේ පදනමට සේවයේ යොදවා තිබුණි.	2023	ස්ථිර පත් කිරීමක් කරනු ලබන තෙක් තාවකාලික ප්‍රතිකර්මයක් වශයෙන් නමුත්, දීර්ඝ කාලීනව වැඩ බැලීමේ පදනමට සේවයේ නොයෙදිය යුතුය.	මේ වන විට වැඩ බැලීමේ තනතුරු 02 ක් සඳහා ස්ථිර බඳවා ගැනීම් සිදුකර ඇති අතර අනෙකුත් පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීමට අනුමැතිය සඳහා යොමුකර ඇත. අනුමැතිය ලැබුණු පසු පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කිරීමට කටයුතු කරනු ලැබේ.	වැඩ බැලීමේ පත් කිරීමට ස්ථිර පත් කිරීමක් කර නොතිබුණි.
9	2015 මැයි 25 දිනැති PED අංක 1/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 2 ඡේදයට පටහැනිව MM 1-1 සේවා ගණයට අයත් නිලධාරීන් 19 දෙනෙකු සඳහා 2022 වර්ෂය තුළදී රු.1,380,533 ක් සහ සමාලෝචිත වර්ෂය	2023	චක්‍රලේඛය අනුව ප්‍රවාහන දීමනා හිමි නොවන සේවා ගණයට අයත් නිලධාරීන් සඳහා ප්‍රවාහන දීමනා නොගෙවිය යුතුය.	පනතේ බලතල ප්‍රකාරව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ක්‍රියාත්මක කර ඇති තීරණයකට චක්‍රලේඛයක් මඟින් පෙන්වා ඇති කරුණක් අනුගමනය කළ යුතු බව විගණනය	දීමනා හිමි නොවන සේවා ගණයට අයත් නිලධාරීන් සඳහා ගෙවූ දීමනාව අයකර ගැනීමට හෝ විධිමත් අනුමැතියක් ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

	තුළදී රු.1,837,960 ක් ප්‍රවාහන දීමනා ගෙවා තිබුණි.			මඟින් පෙන්වා දී තිබූ බැවින් අදාළ චක්‍රලේඛය නිකුත් කර ඇති ආයතනයෙන් අනුමැතිය ලබා ගැනීම සඳහා 2019/05/10 දිනැති අංක 3/1/8/1 දරන ලිපිය මඟින් සහ නැවත 2023/03/27 දිනැති අංක 3/1/8/1දරන ලිපිය මගින් රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන් ඉල්ලුම් කර ඇත. තීරණයක් ලබා දෙන තෙක් අධ්‍යක්ෂ මණ්ඩල තීරණය ක්‍රියාත්මක වේ.	
10	2022 ඔක්තෝබර් 06 දිනැති හා අංක 06/2022 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව වයස අවුරුදු 60 ඉක්මවා සේවයේ යෙදී සිටින සහ 2022 දෙසැම්බර් 31 දින හෝ එදිනට පෙර වයස අවුරුදු 60 සම්පූර්ණ වන රජය සතු ව්‍යවසායන් හි සේවකයන් 2022 දෙසැම්බර් 31 දිනට හෝ ඊට ප්‍රථම අනිවාර්යයෙන්ම විශ්‍රාම ගත යුතු වුවත් සහ කොන්ත්‍රාත් පදනම මත බඳවාගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතියක් ලබා ගත යුතු වුවත් එදිනට	2023	වයස අවුරුදු 60 සම්පූර්ණ සේවකයන් සේවයේ යෙදවීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු වේ පූර්ව අනුමැතියක් ලබා ගත යුතය.	දීර්ඝ කාලයක් තිස්සේ පුරප්පාඩු සම්පූර්ණ නොවීම නිසා සේවක හිඟයක් ඇත. නව ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ බඳවා ගැනීම් ආරම්භ කිරීම. ERP පද්ධතිය මණ්ඩලය තුළ ක්‍රියාවට නැංවීම. නව පුහුණු මධ්‍යස්ථානය, AIMS ව්‍යාපෘතිය, රක්ෂණ ප්‍රවර්ධන කටයුතු, සත්ත්ව රක්ෂණය ව්‍යාප්ත කිරීම ආරම්භ කිරීම, නව බඳවා ගැනීමේ පරිපාටිය සහ කාර්යය පරිපාටිය	වයස අවුරුදු 60 සම්පූර්ණ සේවකයන් සේවයේ යොදවා ගැනීම නැවැත්වීමට හෝ විධිමත් අනුමැතියක් ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

	වයස අවුරුදු 60 සම්පූර්ණ කරන සහ වයස අවුරුදු 60 ඉක්ම වූ නිලධාරීන් 5 ක් සේවයේ යොදවා අනුමැතියක් නොමැතිව වැටුප් හා දීමනා ලෙස රු.4,389,535 ක් ගෙවීම් කර තිබුණි.			සැකසීම වැනි ව්‍යාපෘති සකස් කර මේ වන විට ක්‍රියාවට නංවමින් පවතින නිසා අත්දැකීම් බහුල මෙම නිලධාරීන්ගේ සේවය ලබා ගැනීමට කටයුතු කරන ලදී. ඒ අනුව කොන්ත්‍රාත් පදනම මත සංවර්ධන නිළධාරීන් හා කළමනාකරණ නිළධාරීන් බඳවා ගැනීම සඳහා 531/18 අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව මඟින් අනුමැතිය ලබා දී ඇත. අනුමැතිය ලැබුණු පසු අදාළ නිලධාරීන්ගේ සේවය අවසන් කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි.	
11	2017 අංක 24 දරන දේශීය ආදායම් පනත ප්‍රකාරව ආදායම් බදු සඳහා ලියාපදිංචි නොවීම හේතුවෙන් 2018 අප්‍රේල් 01 සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා ගෙවිය යුතු බදු මුදල රු.299,354,489 ක් නියමිත දිනයන්හීදී ගෙවා නොතිබීම හේතුවෙන් ප්‍රමාද පොළිය රු.40,869,072 ක පාඩුවක් මණ්ඩලයට	2023	2024/25 වර්ෂයේ සිට නිවැරදිව බදු බැඳියාව නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.	මණ්ඩලය කෘෂි රක්ෂණ හා සමාජ ආරක්ෂණ කටයුතු සිදු කරන බැවින්, 1979 අංක 28 දරන සහ ඊට පසු ක්‍රියාත්මක වූ 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත් මඟින් මණ්ඩලයේ සියලු ලාභ හා ආදායම්, ආදායම් බද්දෙන් නිදහස් කර තිබුණි.	ගෙවිය යුතු බදු මුදල 2024/25 වර්ෂය සඳහා කාර්තු ලෙස ගෙවීම් කර නොතිබුණි.

	දැරීමට සිදු ව තිබුණි.		නමුත් 2017 අංක 24 දරන පනත මඟින් නිදහස් කර නොතිබූ නිසා මණ්ඩලයට ආදායම් බදු ගෙවීමට සිදු ව ඇත. ආදායම් බදු ගණනයේදී සාමාන්‍ය සමාගම් සඳහා වන සියයට 30 ක බදු අනුපාත අනුව බදු ගෙවීමට මණ්ඩලයට සිදුව තිබූ අතර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ දීර්ඝ වශයෙන් සාකච්ඡා කර මණ්ඩලය විසින් ගෙවිය යුතු බදු ආදායම සියයට 14 ක ප්‍රතිශතය අදාළ කර ගෙවීමට කටයුතු කර ඇත. මේ අනුව මණ්ඩලයට මූල්‍යමය පාඩුවක් සිදු වී නොමැත. මේ අනුව 2024/25 වර්ෂයේ සිට නිවැරදිව බදු බැඳියාව නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ.	
12	1999 අංක 20 දරන 2023 කෘෂිකාර්මික සහ ගොවිජන රක්ෂණ පනතේ 7(අ) උප වගන්තිය ප්‍රකාරව ගොවීන් 8,185 කට 2017 සහ 2018 වර්ෂවල දී ගෙවන ලද රු.70,800,200 ක වන්දි	ඉදිරිපත් නොවූ වන්දි මුදල් භාණ්ඩාගාරයට ප්‍රේෂණය කිරීමට කටයුතු කළ යුතුය.	ගෙවීම් ප්‍රතික්ෂේපිත වූ ගොවීන් සඳහා සංශෝධිත ලේඛන සකස් කර එවන ලෙස ගොවිජන සේවා මධ්‍යස්ථාන හා දිස්ත්‍රික් කාර්යාල දැනුවත් කර ඇති අතර, එසේ ලැබුණු	හිමිකම් ඉදිරිපත් නොවූ වන්දි මුදල් භාණ්ඩාගාරයට ප්‍රේෂණය කර නොතිබුණි.

	මුදල්, ගිණුම් අංක, ගොවීන්ගේ නම් හා හැඳුනුම්පත් අංක නොගැලපීම හේතුවෙන් වාණිජ බැංකු මඟින් ආපසු එවා ඇතත් අදාළ ගොවීන් හඳුනාගෙන එම මුදල නිරවුල් කිරීමට හෝ නැවත භාණ්ඩාගාරයට ප්‍රේෂණය කිරීමට වසර 6 ක් තිස්සේ කටයුතු කර නොතිබුණි.			සංශෝධිත ලේඛන සඳහා ගෙවා ඇත. වන්දි මුදල් නැවත හිමිකම් නොපෑ ගොවීන්ගේ එකී රු.70,800,200 ක මුදල දිගින් දිගටම ගොවියන් විසින් හිමිකම් නොපෑම නිසා කෘෂි රක්ෂණ අරමුදල වෙත මාරු කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ අතර, එම මුදල් කෘෂිකාර්මික දත්ත කළමනාකරණ පද්ධතිය නිර්මාණය කිරීම සඳහා ලබාදීමට අනුමැතිය හිමි වී ඇත. නමුත්, එම මුදල් එකී අරමුණ සඳහා භාවිතා නොකළ බැවින් නැවත අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කර ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නියමිතය.	
13	2019 සැප්තැම්බර් 02 දිනැති අංක 07/2017 (සංශෝධන II) දරන කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශ චක්‍රලේඛය අනුව තොරතුරු වාර්තා කරන ලද කාර්යාල 17 හි 2021/2022 මහ කන්නයට අදාළව හදිසි අනතුරු රක්ෂණ	2023	රක්ෂණ ආවරණය සඳහා බඳවාගත් අවස්ථාවේදීම රක්ෂණ සහතික ලබා දීමට කටයුතු කළ යුතුය	දිස්ත්‍රික් කාර්යාල තුළ පැවති නිලධාරී හිඟය හා නිලධාරීන්ගේ කාර්යබහුලතාවය මේ සඳහා හේතුවී ඇති අතර, ඉදිරියේදී නිකුත් කරනු ලබන වගා රක්ෂණ ඔප්පු සඳහා හදිසි අනතුරු ඔප්පු නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ.	ගොවීන් සඳහා හදිසි අනතුරු ඔප්පු නිකුත් කර නොමැත.

	ආවරණය සඳහා ගොවීන් 23,351 ක ගෙන් රු.9,244,450 ක මුදලක් මණ්ඩලයේ ආදායම ලෙස හඳුනාගෙන තිබුණු නමුත් ඉන් ගොවීන් 15,491 ක් වෙත ඔප්පු ලබාදී නොතිබුණු අතර ගොවීන් 7,851 ක් වෙත ඔප්පු ලබා දී තිබෙනුයේ වසරක රක්ෂිත කාලයෙන් මාස 07 සිට මාස 10 ක කාලයක් ගත වීමෙන් පසුව බව නිරීක්ෂණය විය.				
14	දායකයා වෙත ලබා දී තිබෙන සහතික ඔප්පුවේ 6 වගන්තිය ප්‍රකාරව ගෙවා ඇති අර්ධ වාර්ෂික දායක මුදල් ප්‍රමාණයෙන් සියයට 75 ක් ලැබී තිබේ නම් මණ්ඩලය විසින් තීරණය කරන පරිදි නියමිත විශ්‍රාම වැටුපට වඩා අඩු විශ්‍රාම වැටුපක් ලැබීමට හිමිකම් ඇතත් එසේ සිදු නොකර විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ සම්පූර්ණයෙන් අහිමිකර තිබුණි.	2023	අර්ධ වාර්ෂික දායක මුදලින් සියයට 75 ක් ගෙවා ඇති දායකයින් සඳහා විශ්‍රාම වැටුප් ගෙවිය යුතුය.	ඕනෑම දායකයෙකු අවලංගු නොවී ගෙවිය යුතු වාරික ප්‍රමාණයෙන් සියයට 75 වඩා ගෙවීම් කර ඇත්නම් ඔහුට අඩුකළ විශ්‍රාම වැටුපක් සකසනු ලබයි. එසේ අඩුකළ විශ්‍රාම වැටුප් සැකසීම සඳහා දායකත්වය අවලංගු නොවී සියයට 75 වඩා වාරික ප්‍රමාණයක් ගෙවා තිබිය යුතුවේ.	අර්ධ වාර්ෂික දායක මුදලින් සියයට 75 ක් ගෙවා ඇති දායකයින්ගේ විශ්‍රාම වැටුප් අහිමිකර තිබුණි.
15	1990 අංක 20 දරන කෘෂිකාර්මික සහ ගොවිජන රක්ෂණ පනතෙහි 24 වගන්තියෙහි 4 වගන්තිය ප්‍රකාරව අනපේක්ෂිත සිදුවීම්වලින් පැන නඟින හිමිකම් දැක්වීම්	2023	අරමුදල ආරම්භ කිරීමේ අවශ්‍යතාවය හා භාවිතය පිළිබඳව අවධානය යොමු කළ යුතුය.	පනත ප්‍රකාරව මණ්ඩලය විසින් කෘෂිකාර්මිකයින්ගේ දායකත්වය සහිතව ආරම්භ කිරීමට අපේක්ෂා කරන ජීවිත රක්ෂණ යෝජනා ක්‍රමය ඇතුළු අනෙකුත්	අනපේක්ෂිත සිදුවීම් පිළිබඳව රීති සකස්කරගෙන නොතිබුණි.

	වෙනුවෙන් ගෙවීම් කිරීම සඳහා ස්වකීය අභිමතය පරිදි යොදා ගත යුතු සංචිත අරමුදලක් 2002 වර්ෂයේ සිට ගොඩනගා ගෙන තිබුණු අතර 2023 දෙසැම්බර් 31 දිනට එහි ශේෂය රු.498,536,253 ක් විය. එම අරමුදල භාවිත කළ යුතු අනපේක්ෂිත සිදුවීම් පිලිබඳව නිර්වචනය කර රීති ගොඩනගාගෙන නොතිබුණු නිසා 2002 වර්ෂයේ සිට මේ දක්වා වසර 21 ක කාලය තුළ මෙම අරමුදල භාවීතා කර නොතිබුණි.			රක්ෂණ යෝජනාක්‍රම සඳහා පැන නඟින මූලික ප්‍රාග්ධන හා අතිරේක ප්‍රාග්ධන අවශ්‍යතා (ආයු ගණක තක්සේරු වාර්තා ලබා ගැනීමෙන් පසුව පැන නඟින අවශ්‍යතා) සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් පසුව මෙම අරමුදල භාවිතා කිරීමට අපේක්ෂා කෙරේ.	
16	තුන්වන පාර්ශවයේ රථවාහන රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ එක් එක් නියෝජිතයාට ලබා දී ඇති තාවකාලික ආවරණ පත්‍ර ප්‍රමාණය,අලෙවි කර ඇති ප්‍රමාණය, අවලංගු කරන තාවකාලික ආවරණ පත් ප්‍රමාණය හා මාසික අලෙවි ආදායම තහවුරු කර ගැනීමටත් ,තාවකාලික ආවරණ අංක අනුපිළිවෙලින් ඒ මත උපයා ඇති ආදායම බැංකු ගිණුමට තැන්පත් වී ඇති බවට සහතික කර ගැනීමටත් හා එක් එක් නියෝජිතයා විසින් කර ඇති තැන්පතු බැංකු ප්‍රකාශය මගින් වෙන්කර හඳුනාගැනීමටත් හැකිවන පරිදි නිවැරදිව	2023	ආදායම් හා තොරතුරු සම්පූර්ණ ලෙස පැවැත්විය යුතුය.	තෙවන පාර්ශවීය රක්ෂණ කටයුතු සිදු කරගෙන යාම සඳහා දිස්ත්‍රික් කාර්යාල විසින් මේ වන විට Access යෙදවුම් පද්ධතිය යොදා ගෙන දත්ත පද්ධතිය පවත්වාගෙන යනු ලබයි. මෙම පද්ධතිය තුළ විශ්ලේෂණය කිරීම තුළින් අදාළ තොරතුරු ලබා ගත හැකි අතර, දත්ත පද්ධතිය වෙත අදාළ තොරතුරු නිවැරදිව ඇතුළත් කරන ලෙස දිස්ත්‍රික් කාර්යාල නිලධාරීන් දැනුවත් කර ඇති බව පෙන්වා දෙමි. මණ්ඩලය විසින් දිස්ත්‍රික් කාර්යාල	තුන්වන පාර්ශවයේ රථවාහන රක්ෂණ යෝජනා ක්‍රමය අධීක්ෂණය දුර්වල මට්ටමක පැවතිණි.

	සහ සම්පූර්ණව තොරතුරු පවත්වාගෙන ගොස් නොතිබුණු අතර බැංකු ගතකළ ආදායමේ සම්පූර්ණත්වය ඉහළ නිලධාරියකුගේ අධීක්ෂණයට ලක්නොවන බවත් නිරීක්ෂණය විය.			කිහිපයක තෙවන පාර්ශවීය රක්ෂණ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා ERP පද්ධතිය හඳුන්වා දී ඇති අතර, මෙම දත්ත පද්ධතිය භාවිතයෙන් අදාළ තොරතුරු නිවැරදිව ලබා ගැනීමේ හැකියාව පවතින බව පෙන්වා දෙමි.	
17	ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ සහය ඇතිව වගාහානි සඳහා මාස 2 ක් ඇතුළත වන්දි මුදල් ගෙවිය යුතු වුවත් 2023 මාර්තු මාසයෙන් අවසන් වන 2022/2023 මහ කන්නය සඳහා නිර්දේශ වී ලැබුණු අයදුම්පත් 39,455 ක් වෙනුවෙන් රු.914,574,064 ක් 2023 ජුනි 09 දින ආරම්භ කර 2024 සැප්තැම්බර් 02 දින දක්වා ගෙවීම් කර තිබුණි.	2023	වන්දි ගෙවීමේ ප්‍රමාදයන් අවම කර ගත යුතුය.	පවතින ප්‍රායෝගික තත්ත්වයන් මත හා නිලධාරීන්ගේ කාර්යබහුලතාවය මත මෙවැනි ප්‍රමාදයන් සිදුවන අතර, ගොවිජන සේවා මධ්‍යස්ථාන සංවර්ධන නිලධාරීන් සමඟ සාකච්ඡා කර අදාළ ප්‍රමාදයන් අවම කර ගැනීමට කටයුතු කරන බව පෙන්වා දෙමි.	වගාහානි වන්දි ගෙවීම් ප්‍රමාදයන් පිළිබඳ අමාත්‍යාංශ හෝ දෙපාර්තමේන්තුව දැනුවත් කර නොතිබුණි.
18	1987 අංක 12 දරන ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනාක්‍රම පනතෙහි 6(1) වගන්තිය ප්‍රකාරව, යොජනා ක්‍රමයට දායකව විශ්‍රාම වැටුප් ලැබීමට හිමිකම ඇති වයස අවුරුදු 60 සම්පූර්ණ වූ ගොවීන් හඳුනා ගෙන විශ්‍රාම	2023	වයස අවුරුදු 60 සම්පූර්ණ වන විටම විශ්‍රාම වැටුප් ගෙවීමට කටයුතු කළ යුතු අතර වාරික නිසි පරිදි අය වන බව මණ්ඩලය විසින් මාසිකව තහවුරු කර ගත යුතුය	අවුරුදු 60 සම්පූර්ණ වූ විශ්‍රාම වැටුප්ලාභීන්ගේ අයදුම්පත් ප්‍රධාන කාර්යාලය වෙත කඩිනමින් යොමු කරන මෙන් සියළුම දිස්ත්‍රික් කාර්යාල දැනුවත් කර ඇත. වයස අවුරුදු 60 සම්පූර්ණ වී	විශ්‍රාම වැටුප් අයදුම්පත් ලබා ගැනීමට පහසු ක්‍රමවේදයක් හඳුන්වා දීම හෝ වාරික ප්‍රමාද වී සහතික ඔප්පුවේ සඳහන් ප්‍රතිලාභ අහිමි වීම පිළිබඳව දායකයා දැනුවත් කර නොතිබුණි.

	වැටුප් නොගෙවීම,15(1) වගන්තිය ප්‍රකාරව පිළිවෙලින් වාරික 5 ක් ගෙවීම පැහැර හැර ඇති බව දායකයෙකුට නොදැන්වීම සහ ප්‍රතිලාභි පාර්ශවය විසින් පිළිවෙලින් වාරික 5 ක් ගෙවීම පැහැර හරිනු නොලබන නමුත් කඩින් කඩ හෝ වාරික 5 ක් නොගෙවූ ප්‍රතිලාභින් ද ඔප්පුව කඩකළා සේ සලකා විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අහිමි කිරීම කර තිබුණි.			මෙතෙක් ගොවි විශ්‍රාම වැටුප් ලබා නොගත් ගොවීන් මේ වන විට දැනුවත් කර ඇත. ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම පනතේ 15(1) වගන්තිය ප්‍රකාරව වාරික 5 ක් ගෙවීම පැහැර හැර ඇති ගොවි මහතුන්ගේ ප්‍රතිලාභයන් අහිමි වනු ඇත. වාරික ගෙවීමේදී සලකා බලනු ලබන්නේ ඔහු ගෙවනු ලබන වාරිකය කවදා ගෙවිය යුතු වාරිකයක්ද යන්නයි. ඒ අනුව කිසියම් වාරිකයක් කන්න 5 ට වඩා එනම් වසර 2 ½ කට වඩා ප්‍රමාද වුවහොත් ඔහුගේ සහතික ඔප්පුවේ සඳහන් ප්‍රතිලාභ අහිමි වනු ඇත.	
19	ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය තුළ ලියාපදිංචි 871,425 ක්වූ ගොවීන්ගෙන් 2023 දෙසැම්බර් 31 දිනට අවුරුදු 61 සිට අවුරුදු 93 දක්වා වයස් ගතවූ ගොවීන් 474,803 ක් වුවත් ඉන් 264,227 දෙනෙකුට විශ්‍රාම වැටුප් ගෙවා නොතිබුණි.	2023	වයස අවුරුදු 60 සම්පූර්ණ වන විටම විශ්‍රාම වැටුප් ගෙවීමට කටයුතු කළ යුතුය.	වයස අවුරුදු 60 සම්පූර්ණ වී මෙතෙක් ගොවි විශ්‍රාම වැටුප් ලබා නොගත් ගොවීන් මේ වන විට දැනුවත් කර ඇති අතර, සියළුම දිස්ත්‍රික් කාර්යාල සහකාර අධ්‍යක්ෂවරුන් මෙම කටයුත්ත ප්‍රමුඛ කාර්යයක් සේ සලකා කටයුතු කර	වයස අවුරුදු 60 සම්පූර්ණ කළ විශ්‍රාම වැටුප් ලබාදිය යුතු දායකයින් හඳුනාගැනීම සඳහා වැඩපිළිවෙලක් සකස් කර නොතිබුණි.

			ඇත.	
20	1990 අංක 23 දරන 2023 ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනාක්‍රම පනතේ 5 (1) වගන්තිය ප්‍රකාරව වයස අවුරුදු 18 සහ 59 අතර ධීවරයෙකුට මෙම යෝජනා ක්‍රමයට බැඳීමට හිමිකම් ඇතත් 2018 වර්ෂයෙන් පසු සාමාජිකයන් බඳවා නොගැනීම, පනතේ 7 වන වගන්තිය ප්‍රකාරව යෝජනා ක්‍රමයට දායක වී සිටින ධීවරයින් සඳහා වයස අවුරුදු 60 සම්පූර්ණ වන විටම විශ්‍රාම වැටුප් ප්‍රදානය නොකිරීම නිසා 2007 ජනවාරි සිට 2016 දෙසැම්බර් දක්වා කාලයට අදාළව ධීවරයන් 139 ක් සඳහා රු.4,159,063 ක් සහ 2022 සහ 2023 වර්ෂවලට අදාළව ධීවරයින් 45 ක් සඳහා රු.1,378,518 ක් ලෙස එකතුව රු.5,537,581 ක් හිඟ විශ්‍රාම වැටුප් ලෙස මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදනය කර තිබුණු නමුත් ධීවරයන් වෙත ගෙවීමට කටයුතු කර නොතිබුණි.	වයස අවුරුදු 60 සම්පූර්ණ වන විට විශ්‍රාම වැටුප් ප්‍රදානය කිරීමට අවශ්‍ය කටයුතු කළ යුතුය.	යෝජනා ක්‍රමය මූල්‍ය ශක්‍යතාවයක් සහිතව ක්‍රියාත්මක කිරීමට කටයුතු සම්පාදනය කර ඇත. මෙම යෝජනා ක්‍රමය සඳහා ධීවරයින් ආකර්ශණය කරගැනීමට නව ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් හඳුන්වාදීමට අවශ්‍ය පියවර ගනිමින් පවතී. වයස අවුරුදු 60 සම්පූර්ණ වන දායකයින්ගේ ලැයිස්තු ඒ ඒ දිස්ත්‍රික් කාර්යාල වෙත යවා ඇති අතර, එම ලැයිස්තු පදනම් කරගෙන විශ්‍රාම වැටුප් හිමි ධීවරයින්ව දැනුවත් කිරීමේ වැඩසටහනක් ආරම්භ කර ඇත. ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට අදාළ මෙහෙයුම් කටයුතු ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව මඟින් සිදුකරන බැවින් මෙම තත්ත්වය එම දෙපාර්තමේන්තුව වෙත දැනුම්දීමට කටයුතු කර ඇත. තවද, දිස්ත්‍රික් ධීවර කාර්යාල මඟින්	නව සාමාජිකයින් බඳවා ගැනීමට හෝ වයස අවුරුදු 60 සම්පූර්ණ වන විටම විශ්‍රාම වැටුප් ප්‍රදානය කිරීමේ වැඩ පිළිවෙලක් සකස් කර නොමැත

				සිදුකරන දැනුවත් කිරීම් වලට අමතරව පුවත්පත් දැන්වීමක් මඟින් ධීවර ජනතාව දැනුවත් කිරීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ.	
21	යෝජනා ක්‍රමයට දායක වී සිටින ධීවරයින් සංඛ්‍යාව 64,117 ක් වූ අතර ධීවරයින්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 60 ඉක්මවා විශ්‍රාම වයසට පැමිණ සිටි 31,146 ක් වූ ධීවර දායකයින්ගෙන් 24,187 ක් (එකවර දායක මුදල් ගෙවා දායකත්වය ලබාගත් දායකයින් 5,549 ක් ඇතුළුව) වෙත ධීවර විශ්‍රාම වැටුප් ප්‍රතිලාභය ප්‍රදානය කර නොතිබුණි.			ප්‍රමාද වී ලැබී ඇති අයදුම්පත් සඳහා ප්‍රමාදවීමට හේතුවූ කරුණු දන්වනතුරු හිඟ විශ්‍රාම වැටුප් ගෙවීම සිදුනොකරන ලදී. මේ වන විට හිඟ විශ්‍රාම වැටුප් සහිතව විශ්‍රාම වැටුප් ගෙවීම සිදුකරනු ලබයි.	වයස අවුරුදු 60 සම්පූර්ණ වන විටම විශ්‍රාම වැටුප් ප්‍රදානය කිරීමේ වැඩ පිළිවෙලක් සකස් කර නොමැත
22	ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාව(IFC) සමඟ ඒකාබද්ධව කෘෂිකාර්මික කළමනාකරණ තොරතුරු පද්ධතිය ගොඩනැගීම සඳහා එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානයෙන් 2022 වර්ෂයේදී රු.20,391,089 ක මුදලක් මණ්ඩලය වෙත ලබාදී තිබුණු අතර එම වර්ෂයේදී ඒ සඳහා රු.23,009,698 ක් වැයකර තිබුණද 2024	2023	කෘෂිකාර්මික කළමනාකරණ තොරතුරු පද්ධතිය පිහිටුවීමේ අරමුණු ඉටු කරගත යුතුය.	කෘෂිකාර්මික කළමනාකරණ තොරතුරු පද්ධතිය කෘෂිකර්ම අමාත්‍යාංශයේ මූලිකත්වයෙන් සිදුකරනු ලබන අතර, අදාළ වියදම් කෘෂිකර්ම අමාත්‍යාංශය හරහා ප්‍රතිපූරණය කරනු ලබයි. ඊට අදාළ සියලුම ගනුදෙනු නිවැරදිව ගිණුම්ගත කර ඇති අතර, ගිණුම් සටහන් මඟින්ද අනාවරණය	වන්දි ගණනය කිරීම සහ වන්දි ගෙවීමේ ක්‍රියාවලිය සඳහා තොරතුරු පරිසනක පද්ධතියට ඇතුළත් කර නොතිබුණි.

	වර්ෂය වන විටත් වන්දි ගණනය කිරීම සහ වන්දි ගෙවීමේ ක්‍රියාවලිය සඳහා තොරතුරු පද්ධතිය භාවිතා කර නොතිබුණි.			කර ඇත.	
23	රු.79,000,000 ක වටිනාකමකට ගිවිසුම්ගත වූ, මණ්ඩලයේ කළමනාකරණ තොරතුරු පද්ධතිය සඳහා ව්‍යවසාය සම්පත් සැලසුම් පද්ධති(ERP) System හා දෘඩාංග මිලදී ගැනීමේ කටයුතු 2023 මාර්තු 01 දින ආරම්භ කර 2023 අගෝස්තු 20 දින වන විට අවසන් කළ යුතු වුවත් 2024 ජූලි 31 දින වන විටත් එම කටයුතු අවසන් කර නොතිබුණි.	2023	ගිවිසුම් පරිදි කාර්යයන් ඉටු කර ගත යුතුය.	ගිවිසුම් කාලය දීර්ඝ කර ගැනීමට මේ වන විට කටයුතු සිදු කර ඇත.	තොරතුරු පද්ධතිය සකස් කිරීමේ කටයුතු අවසන් කර නොතිබුණි.

3.56 ශ්‍රී ලංකා කජු සංස්ථාව

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	566,220,121	99,572,294	466,647,827	(16,412,185)	තත්ත්වාගණනය කළ
2022	549,704,058	81,836,718	467,867,340	14,471,411	තත්ත්වාගණනය කළ
2023	564,416,429	116,979,498	447,436,931	(5,020,580)	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්වය
1	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 19 හි 139 වැනි වගන්තිය ප්‍රකාරව විශ්‍රාමික පාරිතෝෂිත වෙන්කිරීම් විධිමත් ආයෝජන සැලැස්මකට අනුව ආයෝජනය කළයුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසාන දිනට විශ්‍රාමික පාරිතෝෂිත වෙන්කිරීම් ගිණුමේ රු.35,789,916 ක ශේෂයට අනුරූපීව කිසිදු ආයෝජනයක් සිදු කර නොතිබුණි.	2021 2022 2023	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව කටයුතු කළ යුතුය.	නිරීක්ෂණය හා එකඟ වෙමි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන විශ්‍රාම පාරිතෝෂික වෙන්කිරීම් ශේෂයට අනුරූපිව මාසිකව රු. 100,000 ක් බැගින් වන සේ ආයෝජනය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලීය අනුමැතිය හා විෂයභාර අමාත්‍යතුමාගේ අනුමැතිය ද සහිතව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත ලිපියක් යොමු කර ඇති අතර, ඒ අනුව අදාල අනුමැතිය ලද වහාම අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකරනු ලැබේ.	විශ්‍රාමික පාරිතෝෂිත වෙන්කිරීම් විධිමත් ආයෝජන සැලැස්මකට අනුව ආයෝජනය කර නොමැත.
2	2018 සිට 2022 දක්වා කාලපරිච්ඡේදයේදී රජයේ ප්‍රදාන නොසලකා පසුගිය	2021 2022 2023	අලාභ,කාර්ය මණ්ඩල පුරප්පාඩු හා වගා නොකිරීම නිසා	සංස්ථාවේ විකුණුම් හා අනෙකුත් ආදායම් තවදුරටත් ඉහළ නංවා ගනිමින් හා වියදම් නිසි	මෙහෙයුම් අලාභ, කාර්යමණ්ඩල පුරප්පාඩු, පවත්නා කජු වතු උපරිම

	වර්ෂ 05 තුළ සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශනවල දෘෂ්‍ය අලාභය රු.134,800,425 සිට රු.102,312,523 දක්වා පරාසයක් ගෙන තිබුණි. මේ අනුව සංස්ථාවේ අඛණ්ඩ මෙහෙයුම් අලාභ, කාර්යමණ්ඩල පුරප්පාඩු, පවත්නා කජු වතු උපරිම ලෙස වගා නොකිරීම නිසා නිෂ්පාදනය අඩුවීම වැනි හේතු මත රජයේ ප්‍රදාන නොමැතිව සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම අභියෝගාත්මක වී ඇති බව නිරීක්ෂණය විය.		නිෂ්පාදනය අඩුවීම කෙරෙහි අවධානයෙන් කටයුතු කර සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම තහවුරු කළ යුතුය.	පරිදි කළමනාකරණය කර ගනිමින් ලාභදායීත්වය වර්ධනය කර ගැනීමට ගතයුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් දැඩි අවධානය යොමු කර ඇති අතර, ඒ අනුව අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගනු ලැබේ.	ලෙස වගා නොකිරීම නිසා නිෂ්පාදනය අඩුවී තිබුණි. 2022 වර්ෂයට වඩා 2023 වර්ෂයේදී අලාභ අඩු වී ඇත.
3	සංස්ථාවේ ණය අයකරගැනීමේ කාලසීමාව දින 60 ක් වුවද දින 90 ඉක්මවූ වෙළඳ ණයගැති ශේෂය රු.2,994,271 කි. එම ශේෂය තුළ ඇතුළත් වසර දෙකකට වඩා වැඩි කාලයක සිට පවතින, කොළඹ ප්‍රදේශයේ පිහිටි පෞද්ගලික ආයතනයකින් අයවිය යුතු රු. 1,499,410 ක ණය ශේෂය අයකර ගැනීමට විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි	2021 2022 2023	ණය ශේෂය අයකර ගැනීමට විධිමත් ක්‍රියාමාර්ග ගත යුතුය.	සහන කාලසීමාව ඉක්මවූ රු.2,994,271 ක වෙළෙඳ ණයගැති ශේෂයෙන් 2023.09.30 දින වනවිට රු.1,296,771 ක් අය කර ඉතිරි ශේෂයන් ද කඩිනමින් අයකරවා ගැනීමට කටයුතු කරනු ලැබේ.රු. 1,499,410 ක ණයගැති ශේෂය (ලිසල එන්ටප්‍රයිසස් ආයතනය) අයකරවා ගැනීමට දීර්ඝ කාලයක් පුරා ගත් උත්සාහය ව්‍යර්ථ වී ඇති බැවින් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට සඳහා අවශ්‍ය උපදෙස් ලබා ගැනීමට යොමු කර ඇත.	කෙටිකාලීන ණය අය කර තිබුණද වසර 02 ට වඩා පැරණි රු.1,499,410 ක් වූ ණය අයකර ගැනීමට ගත් පියවර ඵලදායි වී නොමැත.

4	එවකට පැවති ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයට රු.9,466,200 ක කප්පු පැළ ලබාදී වසර 10 ක් ගත වී තිබුණි. අදාළ අමාත්‍යාංශය වර්තමානයේ අහෝසි කර ඇති හෙයින් එම ණය අයකර ගැනීමේ හැකියාවක් නොමැතිකම නිරීක්ෂණය කෙරේ.	2021 2022 2023	ලැබිය යුතු ගිණුම් ශේෂ සම්බන්ධයෙන් නොපමාව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය.	වර්තමානයේ අහෝසි වී ඇති ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් අයවීමට ඇති රු. 9,466,200 ක ණයගැති ශේෂය හා මෙම සංස්ථාව මඟින් රජයේ වී අලෙවි මණ්ඩලය වෙත ගෙවිය යුතුව පවතින රු. 3,500,000 ක ණය ශේෂයට සම්බන්ධයෙන් උපදෙස් ලබා ගැනීම සඳහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇතත් අදාල හිලව් කිරීම සඳහා ඉඩප්‍රස්ථාවක් නොමැති බවත්, ඉහත අයවිය යුතු ණයගැති ශේෂය සම්බන්ධව සංස්ථාවේ විගණන කමිටුවෙහි නිර්දේශ මත ඉදිරි කටයුතු සිදුකරන ලෙසත් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් ලිඛිත උපදෙස් ලැබී ඇත.	ලැබිය යුතු ශේෂය අය වී නොතිබුණි.
5	2012 ජුලි 24 දිනැති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා තීරණ සංස්ථාවට නීත්‍යානුකූල අයිතිය නොමැති ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතු කරන ලෙස පොදු ව්‍යාපාර කාරක සභාව විසින් දැනුම් දී තිබුණද ,2012 ජුලි 24	2021 2022	කාරක සභා තිරණ පරිදි නීත්‍යානුකුල අයිතිය නොමැති ඉඩම්වල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය.	2012 ජුලි මස 24 වන දිනැති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා තීරණය ලැබෙන අවස්ථාව වනවිට සංස්ථාව වෙත නීතිමය අයිතිය පවරාගෙන නොමැති වතුයායන්/ බීජ උද්‍යානයන් හි ඉඩම් අක්කර ප්‍රමාණය අක්කර 2,370 ක් පමණකි.2012 වර්ෂය	සංස්ථාවට නීත්‍යානුකූල අයිතිය නොමැති ඉඩම්වල අයිතිය පවරා ගැනීම සඳහා ඵලදායි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

	දිනට පෙර සහ 2012 ජුලි 24 දිනට පසු සංස්ථාව භුක්ති විදින ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් ලබාදී ඇති ඉඩම් අක්කර 11,363 ක නීත්‍යානුකූල අයිතිය සංස්ථාවට පවරා ගැනීමට අදාළ කටයුතු 2022 දෙසැම්බර් 31 දින දක්වා නිම කර නොතිබුණි.			වනවිට මෙම සංස්ථාවට අයත්ව නොතිබූ එහෙත් පසුකාලීනව විවිධ පාර්ශව වෙතින් සංස්ථාව වෙත ලැබී ඇති නමුත් මෙතෙක් නීතිමය අයිතිය පවරාගෙන නොමැති ඉඩම් අක්කර ප්‍රමාණය 8993 කි. ඉඩම්වල අයිතිය පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවති.	
6	සංස්ථාව පිහිටුවීම සඳහා නිකුත් කරන ලද අංක 60/07 හා 1973 මැයි 25 දිනැති ගැසට් නිවේදනයේ පලමු උපලේඛනයේ (අ), (ඇ), (ඈ) (ඊ) සහ (ඌ) වගන්තිවල සඳහන් කරුණු ඉටුකර ගැනීම කෙරෙහි 2013 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලය තුළ ඉතා අඩු අවධානයක් යොමුවී තිබු අතර එනම් අමාත්‍යවරයාට උපදෙස් ලබා දීම, කජු නිෂ්පාදන පිරිසැකසුම් කිරීම, අලෙවිය හා අපනයනය දියුණු කිරිම, ප්‍රසිද්ධ කිරිම හා බෙදා හැරීම සම්බන්ධයෙන් බාහිර පාර්ශවයන් සමඟ එක්ව කටයුතු කිරිම සහ විමර්ශන හා	2022	ආයතනය ස්ථාපනය කල අරමුණු ඉටුකිරීමට කටයුතු කල යුතුය	නිරීක්ෂණය හා එකඟ නොවෙමි. අදාල තොරතුරු හා උපදෙස් ලබාදීමේදී විෂයභාර අමාත්‍යාංශය (වර්තමානයේදී කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය) මඟින් අදාල තොරතුරු සංස්ථාව මඟින් ඉල්ලුම් කරනු ලබන අතර, සංස්ථාව මඟින් එම තොරතුරු ලබාදෙනු ලැබේ. ඊට අමතරව පැන නඟිනු ලබන හදිසි, විශේෂ හා අනෙකුත් විෂයානුබද්ධ කරුණුවලදී විෂයභාර අමාත්‍යාංශය මඟින් පවත්වනු ලබන රැස්වීම්වලදී විෂය සම්බන්ධ නිලධාරීන් විසින් ඔවුන්ගේ අදහස්, අදාල තොරතුරු හා	නව නිෂ්පාදන හඳුන්වාදීම, අපනයනය, අලෙවිය වැඩි දියුණු කිරිම සහ කජු පුහුලන් හා කජු ලෙලි වලින් නව නිෂ්පාදන හඳුන්වාදීමට කටයුතු කර නොතිබුණි.

	පර්යේෂණ කටයුතු ඉටු කර ගැනීමට කටයුතු කර නොතිබුණි.			විශේෂඥ මත ඉදිරිපත් කරනු ලැබේ. සංස්ථාව විසින් මැදිහත්විය යුතු එහි මූලික පරමාර්ථවලින් පරිබාහිර කරුණුවලදී ඒ පිළිබඳව ගරු අමාත්‍යතුමාගේ අවධානයට යොමු කිරීම සඳහා විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්තුමා අනුමැතියට අනුව අදාල කටයුතු සිදුකරනු ලැබේ.	
7	සංස්ථාව සතුව /භාරයේ පවතින වතු 13 ක ඉඩම්වල ප්‍රමාණය අක්කර 11,363 ක් වු අතර ඉන් අක්කර 3,449 ක කජු වගා කර තිබු අතර, කජු වගා නොකල ඉඩම්වල ප්‍රතිශතය සියයට 70 ක් වී තිබුණි. එම හිස් ඉඩම් වගාකිරීම සඳහා සංස්ථාව විසින් ඵලදායි පියවර ගෙන නොතිබුණි.	2022	සංස්ථාව විසින් වගා නොකල හිස් ඉඩම් වගාකිරීම සඳහා පියවර ගත යුතුය.	සංස්ථාව ආරම්භ කර වසර 50 ක කාලයක් ඉක්මගොස් තිබුන ද මුළු ඉඩම් අක්කර 11,363 ක ප්‍රමාණයෙන් සියයට 79 ක්ම මෙම සංස්ථාව වෙත හිමිවී ඇත්තේ 2012 වර්ෂයෙන් පසුව වේ.මුළු ඉඩම් ප්‍රමාණයෙන් මන්නාරම කොන්ඩච්චි වතුයාය හා මඩකලපුව මාන්කර්නි වතුයාය සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව වෙත කජු වගාව සඳහා ලබාදී අක්කර 1600 ක භූමි කොටස්වල සාර්ථක ලෙස කජු වගාකර ඇත. එසේම කජු වගාව හෝ වෙනත් වගාවක් සිදුකළ නොහැකි අක්කර 552 ක භූමි ප්‍රමාණයක් ද පවතී.	වගා නොකල හිස් ඉඩම් වගාකිරීම දුර්වල මට්ටමක පැවතුණි.

8	සංස්ථාව කජු වගාකල ඉඩම් අක්කර 3,449 ක බද්ධ කජු පැල අක්කරයකට 70 ක් හා බීජ කජු පැල අක්කරයකට 40 බැගින් වගා කිරීමෙන් 2022 වර්ෂයේදී කජු එලදාව මෙට්‍රික් ටොන් 88.24 ක් වුයෙන් අක්කරයක අස්වැන්න කජු කි.ග්‍රෑම් 25.38 ක අඩු අගයක් ගෙන තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වනවිට එම වතුවල එල දරන කජු ගස් ප්‍රමාණය 51,685 ක් ලෙස දක්වා තිබු අතර ඒ අනුව එක් කජු ගසක සාමාන්‍ය අස්වැන්න කිලෝග්‍රෑම් 1.71 ක් වැනි දුර්වල තත්ත්වයක පැවතුණි.	2022	කජු එලදාව පිළිගත නොහැකි මට්ටමේ අඩුවීමක් වාර්තා වී ඇති අතර කජු අස්වැන්න වර්ධනයට පියවර ගත යුතුය. කජු වතු පාලනය හා අස්වනු නෙලීම පිළිබද මනා අභ්‍යන්තර පාලනයක් ක්‍රියාත්මක කළ යුතුය.	සංස්ථා වතුයායන් බොහොමයක ඉතා පැරණි කජු වගා පවතින අතර, එම පවතින කජු ගස් ප්‍රමාණය සම්මත කජු ගස් ගණනට වඩා බෙහෙවින් පහළ අගයක් ගනී. එමෙන්ම වන අලි හානිය, කඳ හා මුල් විදින කුරුම්ණි හානිය වැනි හේතුන් නිසා ද කජු ගස් ප්‍රමාණය විශාල වශයෙන් අඩුවීමකට ලක්වී ඇත. 2022 වර්ෂයේදී පැවති කජු වගාවට අහිතකර කාලගුණික හා දේශගුණික තත්ත්වයන් හේතුකොටගෙන සමස්ත දිවයිනෙහිම ලෙලි කජු අස්වනු පහළ මට්ටමක පැවති අතර, 2020 වර්ෂය තුළදී මෙම සංස්ථාවේ වතුයායන් මඟින් එක්රැස් කරගත් ලෙලි කජු අස්වැන්න කි.ග්‍රෑම් 5.043කට ආසන්න අගයක පැවතීණි.	කජු ගසක එලදාවේ සාමාන්‍ය වැඩි දියුණු කර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.
9	සංස්ථාව සතු පුත්තලම කමන්දළුව හා අම්පාර හාඩි වතුවල පොල්ගස් සංඛ්‍යාව පිළිවෙලින් 3,358 ක් හා 826 ක් වු අතර, නොමේරු 1,147 , එලදා ලබන 2,391 ක් හා කනාටු 646 ක් ලෙස	2022	පොල් එලදාව වර්ධනය කරගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය.	රටෙහි පැවති අර්බුදකාරී තත්ත්වය හා සංස්ථාවේ අයහපත් මූල්‍ය තත්ත්වයට අනුව පසුගිය ආසන්න වර්ෂ 05 ක පමණ කාලයක් පුරා පොල් වගාවට අවශ්‍ය රසායනික පොහොර නොයෙදීම නිසා අස්වනු සැලකිය	පොල් එලදාව වර්ධනය කර ගැනීම සහ කනාටු ගස් ඉවත් කිරිම සිදුකර නොතිබුණි.

	සමන්විත වී තිබුණි. 2022 වර්ෂයේ පොල් ඵලදාව ගෙඩි 90,304 ක් වූ අතර එහි විකුණුම් ආදායම රු. 4,427,439 ක් වී තිබුණි. ඒ අනුව ගසක වාර්ෂික පොල් ඵලදාව ගෙඩි 38 ක් වූ අතර විකුණුම් ආදායම රු. 1,863 ක් දක්වා අඩු වීමට පොල් ගස් නඩත්තු කිරීම, පොහොර යෙදීම දුර්වල මට්ටමක පැවතිණි.			යුතු ප්‍රමාණයකින් අඩුවී ඇත.ප්‍රවර්තන වර්ෂයේදී පොල් වගාව සඳහා පොහොර මිලදී ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින හෙයින් ඉදිරි වර්ෂවලදී පොල් අස්වනුවල සැලකිය යුතු වර්ධනයක් අපේක්ෂා කළ හැකිය.	
10	සමාලෝචිත වර්ෂය අවසාන වන විට කජු වගා කර තිබෙන බිම් ප්‍රමාණය දල වශයෙන් අක්කර 3,449 ක් වී තිබුණි. එම ගස් වල ලියා හළ ශුද්ධ අගය රු. 24,159,359 ක් ලෙස මූල්‍ය ප්‍රකාශවල දක්වා තිබුණ ද එම කජු ගස් සංගණනයක් සිදුකිරීම, ගස් අංකනය කිරීම හා ගස් පිළිබඳ රෙජිස්ටරයක් පිළියෙළ කිරීම සිදුකර නොතිබුණි.	2021 2022	වත්කම් කළමනාකරණය කෙරෙහි අවධානය යොමු කළ යුතුය.	මෙම කජු ගස් සංගණනය කිරීමේ මූලික කටයුතු මේවනවිට ආරම්භ කර ඇති අතර, ඵළඹෙන වර්ෂයේ අස්වනු සමයට පෙර එම කටයුතු නිම කිරීමට සැලසුම් කර ඇත. අදාල සංගණන කටයුතු නිම කිරීමෙන් පසුව ඒ මත පදනම්ව කජු ගස් රෙජිස්තරය පිළියෙල කිරීමේ කටයුතු ද සම්පූර්ණ කරනු ලැබේ.	කජු ගස් සංගණනය,ගස් අංකනය කිරීම හා ගස් පිළිබඳ රෙජිස්ටරයක් පිළියෙළ කිරීම සිදුකර නොතිබුණි.
11	පුත්තලම පිරිසැකසුම් මධ්‍යස්ථානයේ භෞතික තත්වය පරික්ෂාවේදී රු. මිලියන 7.092 ක් වැය කර ස්වයංක්‍රීයව පිරිසැකසුම් කිරීම සඳහා 2021 වර්ෂයේ මිලදීගත් යන්ත්‍රය	2022	අවශ්‍ය අලුත්වැඩියාවන් සිදු කර එම යන්ත්‍ර භාවිතයට ගත යුතු අතර අලාභ අය කරගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය.	රු.මිලියන 7.092 ක අගය තුළ මූලික වශයෙන් කජු බොයිලේරුවක්, කජු පිරිසැකසුම් යන්ත්‍රයක් හා කජු විජලන යන්ත්‍ර 02 ක් පැවති අතර, ඉන් සංස්ථාව මඟින් ඇණවුම් කරන ලද්දේ	අවශ්‍ය අලුත්වැඩියාවන් සිදු කර එම යන්ත්‍ර භාවිතයට ගැනීමට හෝ අලාභ අය කරගැනීමට කටයුතු කර නොතිබුණි.

	නිශ්කාර්ය වී තිබුණි.			කප්පු පිරිසැකසුම් යන්ත්‍රය හා කප්පු විජලන යන්ත්‍ර දෙක පමණකි. පිරිසැකසුම් යන්ත්‍රය ක්‍රියාත්මක කිරීම පිළිබඳව පැවති ගැටළුසහගත තත්ත්වය හේතුවෙන් භාවිතයට ගැනීම ප්‍රමාද විය. පිරිසැකසුම් යන්ත්‍රයේ අත්‍යාවශ්‍ය වන බවට හඳුනාගෙන ඇති අතර කප්පු කැපීම සිදුකරන යන්ත්‍ර කොටස මූලික වශයෙන් අලුත්වැඩියා කර ගැනීමට මෙම සංස්ථාව අපේක්ෂා කරයි. කප්පු පිරිසැකසුම් යන්ත්‍රයේ සැපයුම්කරුට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමේ කටයුතු සිදුකරගෙන යනු ලැබේ.	
12	නැදගමුව කප්පු පිරිසැකසුම් මධ්‍යස්ථානයේ ශ්‍රේණිගත කිරීම් හා ඇසුරුම් කිරීමේ අංශයට 2021 වර්ෂයේ රු.8,100,000 ක් වැයකර විනාඩියකට පැකට් 60 ක් ඇසුරුම් කළ හැකි ස්වයංක්‍රීය ඇසුරුම් කිරීමේ යන්ත්‍රයක් මිලදීගෙන තිබුණි. 2022 වර්ෂය තුල ඇසුරුම් කරන ලද පැකට් ගණන 62,265ක් වී තිබුණු අතර මෙම	2021 2022	ප්‍රසම්පාදන කටයුතු ඵලදායීව හා අරපිරිමැසුම් දායක ලෙස කළ යුතුය.	මෙම ඇසුරුම් යන්ත්‍රය මිලදී ගැනීමේදී පවත්නා පිරිසැකසුම් මධ්‍යස්ථාන වර්තමාන නිෂ්පාදන ධාරිතාවය සලකා නොමැත. අනාගතයේදී සංස්ථාවේ පිරිසැකසුම් මධ්‍යස්ථානවල නිෂ්පාදන ධාරිතාවයන් ඉහළ යාමේදී නිර්මාණය වන අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් ද මෙහිදී අවධානය යොමු කර ඇත. මෙම යන්ත්‍රයේ භාවිතය සම්බන්ධයෙන්	වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය විසින් ස්වයංක්‍රිය ඇසුරුම් කිරීමේ යන්ත්‍රය මිලදී ගැනීම සම්බන්ධව පරීක්ෂණයක් පවත්වා තිබුණද ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

	යන්ත්‍රයෙන් උපරිම ධාරිතාවය ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කර නොතිබුණි.			විෂයභාර අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය මඟින් මූලික විමර්ශනයක් සිදුකරමින් පවතින අතර, ඒ අනුව ඉදිරියේදී විෂයභාර අමාත්‍යාංශයේ උපදෙස් මත මෙම යන්ත්‍රයේ භාවිතය සම්බන්ධයෙන් අදාල තීරණ ගැනීමට කටයුතු කරනු ලැබේ.	
13	ස්ථාන භාර නිලධාරීන් සඳහා නිල නිවාස ඉදිකිරීමට උක්, බඩඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය විසින් රු.15,653,000 ක මුදලක් වෙන් කර නිල නිවාස 07 ක් ඉදිකිරීමට සැලසුම් කර තිබුණි. 2022 දෙසැම්බර් 31 දින වන විට මෙම නිල නිවාස භාවිතයට ගත හැකි ලෙස සම්පූර්ණයෙන් ඉදි කර අවසන්කොට නොතිබුණි.	2022 2023	ඉදිකිරීම් සිදුකර භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුය.	මෙම නිල නිවාස සඳහා අනුමත ඇස්තමේන්තුවට සාපේක්ෂව වෙළෙඳපොලේ ඉදිකිරීම් ද්‍රව්‍ය මිල හා වැඩකුලී ඉහළ ගිය බැවින් අදාල ඉදිකිරීම් කටයුතු නිසි පරිදි සම්පූර්ණ කර ගැනීමට නොහැකි විය.විෂයභාර අමාත්‍යාංශයේ අනුමැතිය ලද වහාම මෙහි සඳහන් ඉදිකිරීම් කටයුතු නිම කිරීමේ හැකියාව පවතී.	2024 සැප්තැම්බර් දක්වා නිල නිවාස භාවිතයට ගත හැකි වන පරිදි නිම කර නොතිබුණි.

3.57 ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	බදු පෙර ලාභය (අලාභය) රු.	මතය
2021	5,269,742,301	517,526,474	4,752,215,827	310,284,854	ව්‍යාවනය කළ
2022	6,130,363,231	593,893,236	5,536,469,995	518,199,960	ව්‍යාවනය කළ
2023	6,864,730,584	1,732,580,768	5,132,149,816	636,050,744	ව්‍යාවනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ගය	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්වය
1	ඉඩම් ලේඛණයට අනුව බදුදී ඇති ඉඩම් හෙක්ටයාර් 4,833 ක් ඇතුළත්ව මුළු ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 156,838 ක් වුවත් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල හෙක්ටයාර් 2,144 ක් (අක්කර 868 පර්චස් 6.9 ක් වූ ඉඩම් කැබලි 29) පමණක් තක්සේරු කර එහි වටිනාකම ලෙස රු.905,285,000 ක් මූල්‍ය ප්‍රකාශන මගින් අනාවරණය කර තිබුණි.එය ප්‍රතිශතයක් ලෙස සියයට 1.37 ක් විය. මේ අනුව ඉඩම්වල සාධාරණ අගය ගිණුම් මගින් පිළිඹිබු නොවන අතර නිවැරදිතාවය සහ එම ඉඩම් වල සමස්ත වටිනාකම පිළිබඳ විගණනයට තහවුරු කර ගත නොහැකි විය.	2023 2022 2021	පනත අනුව අත්පත් කර ගත් ඉඩම් ඇතුළත් කර සකස් කල ඉඩම් ලේඛනයේ සඳහන් ඉඩම්වල සාධාරණ අගය ගිණුම් මඟින් පිළිඹිබු විය යුතුය.	තක්සේරු කිරීම සඳහා ඉඩම් මැණුම් කර පිඹුරු ලබාදිය යුතු වුවත් සියලු ඉඩම් එසේ මැණුම් කර නැත. මැණුම් කරන ලද බදු ඉඩම් තක්සේරු කිරීම සඳහා යොමුකර ලැබී ඇති තක්සේරු වටිනාකම් පමණක් ගිණුම් මඟින් ඉදිරිපත් කර ඇත. ඉඩම් ලේඛණය තුල ප්‍රකාශ කරන ලද ඉඩම් සහ එහි ප්‍රමාණය, බැහැර කරන ලද ඉඩම් ප්‍රමාණය සහ ඉතිරි ඉඩම් පිළිබඳ තොරතුරු ඇතුලත් කොට ඇත. එම ඉතිරි ඉඩම් පිහිටි ප්‍රදේශ පිළිබඳ තොරතුරු දැනගැනීම සඳහා ගූගල් ඛණ්ඩාංක තොරතුරු ද එම ලේඛණයේ ඇතුලත්	ඉඩම් ලේඛණයට අනුව බදුදී ඇති ඉඩම් තක්සේරු කිරීමට පියවර ගෙන නොමැත.

				කර ඇත.	
2	ඉඩම් ප්‍රතිසංස්කරණ පනත ප්‍රකාරව,වතු සමාගම්වලින් සහ පුද්ගලයන්ගෙන් පවරාගත් ඉඩම් ලිපිගොනු 1,010 ක් සඳහා ගෙවිය යුතු වන්දි මුදලේ රු.215,622,362 ක් වූ ශේෂය (අදියර - I සහ II) අවිනිශ්චිත ගිණුමකට බැර කර තිබූ අතර ඒ පිළිබඳ විස්තර නොවූ අතර එය අධි හෝ ඌණ වෙන් කිරීමක් විය හැකි බව නිරීක්ෂණය විය.	2023 2022 2021	පුද්ගලයන්ගෙන් පවරාගත් ඉඩම් සඳහා ගෙවිය යුතු වන්දි නිවැරදිව ගිණුම්ගත කර නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.	වන්දි අවිනිශ්චිත ගිණුම් තුල ඇති ශේෂයන් නිරවුල් කල හැකි වන්නේ අදාල සමාගම් හා පුද්ගලයින් විසින් එම ඉඩම්වලට අදාල ඔවුන්ගේ හිමිකම තහවුරු කරගැනීමෙන් අනතුරුව පමණක් බැවින් එසේ හිමිකම තහවුරු කරන ලද පුද්ගලයිනේග් පමණක් සමාලෝචිත වර්ෂය තුලදී හිමිකම් නිරවුල් කිරීමට කටයුතු කර ඇත.	පවරාගත් ඉඩම් සඳහා වන්දි ගණනය කර නොමැත.
3	කොමිෂන් සභාව විසින් පොල් වගා කිරීමේ මණ්ඩලය වෙත ගිවිසුම් නොමැතිව බදු පදනම මත ලබා දුන් ඉඩම් අක්කර 1,539 රූඩ් 02 පර්චස් 38.81 ක් වෙනුවෙන් අයවිය යුතු හිඟ බදු ආදායම ලෙස රු.354,658,614 ක් හඳුනාගෙන ඇතත් ඉතිරි ඉඩම් ප්‍රමාණය වන අක්කර 1,588 පර්චස් 11 කට අදාළව අයකර ගත යුතු බදු මුදල කොපමණද යන්න හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කර නොතිබුණි.	2023	හඳුනා නොගත් බදු කුලී ආදායම හඳුනා ගෙන ගිණුම්ගත කිරීමටත් හිඟ බදු අයකර ගැනීමටත් කටයුතු කළ යුතුය.	දිවයිනේ දිස්ත්‍රික්ක 10ක් ආවරණය වන පරිදි අක්කර 3,139 රූඩ් 1 පර්චස් 16.11 ක් බදු පදනම මත ද,විකිණීමේ පදනමෙන් අක්කර 21 රූඩ් 3 පර්චස් 39.23 ක්ද, ගැසට් මඟින් අක්කර 32 ක්ද සහ අත්පත් මඟින් අක්කර 936 රූඩ් 0 පර්චස් 11.45 ක ප්‍රමාණයක්ද ලබාදී ඇත.මේ ඉඩම් මැණුමකින් තොරව 1979 – 1980 වර්ෂවල පොල් වගා කිරීමේ මණ්ඩලය වෙත භාර දී ඇත. බදු අයනොවීම සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය තීරණයක් ගතයුතු අතර හිඟ බදු මුදල්	වැවිලි කාර්මාන්ත අමාත්‍යාංශ ලේකම් විසින් එම මුදල් ගෙවන ලෙසට නියම කළද මෙතෙක් ගෙවා නොමැත.

				ගෙවීමට හා ඉදිරියේදී බදු නියමානුකූල කරගැනීමට අවශ්‍ය කටයුතු කරන ලෙස දැනුම් දී ඇත.	
4	පොල් වගා කිරීමේ මණ්ඩලය වෙත බදු දීම වෙනුවෙන් අයවිය යුතු පරිහරණ ගාස්තු ලෙස රු.31,688,608 ක් හඳුනාගෙන තිබුණද ලැබිය යුතු ශේෂයක් ලෙස මූල්‍ය ප්‍රකාශන වල හඳුනාගෙන නොතිබුණි.	2023	පරිහරණ ගාස්තු නිවැරදිව හඳුනා ගෙන ගිණුම්ගත කළයුතුය.	2024 වර්ෂයේ ගිණුම් ප්‍රකාශන පිළියෙළ කිරීමේදී නිවැරදි කිරීමට අදාළ අංශ වෙත උපදෙස් ලබා දී ඇත.	පරිහරණ ගාස්තු අයකර නොතිබුණි.
5	බදුල්ල දිස්ත්‍රික්කයේ කන්දකැටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි තල්පිටිය වත්ත නමැති ඉඩමේ අක්කර 04 ක තිරුවානා ගල, සහිත ඉඩමට අදාළ හිඟ බදු මුදල වූ රු.5,250,480 ක මුදල අය වී නොතිබියදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වලින් ඉවත් කර තිබුණි.	2023	බදු ලෙජර් නිවැරදිව පිළියෙල කිරීම හා හිඟ බදු විධිමත් අනුමැතියකින් තොරව මූල්‍ය ප්‍රකාශන වලින් ඉවත් නොකල යුතුය.	ඛනිජ ඉඩම් බදු පදනම මත බැහැර කිරීමේදි විශේෂයෙන් මිනිරන් සහ තිරුවානා ඛනිජයන්ට අදාලව ඛනිජ පමණක් නොව ඉඩමට අදාලවද බදු මුදල් අයකර ගත යුතුව ඇත. ඒ අනුව 2012 වසරට අදාලව ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත වාර්ෂික බදු මුදල රු.453,600.00 ක් වන අතර එම මුදල වසර 5න් 5ට සංශෝධනයට යටත්ව 2023.09.13 දක්වා ලැබිය යුතු මුදල රු. 5,250,480.00 ක් වේ. මෙම බදුකරු මියගොස් ඔහුගේ පුතා වෙත පවරා දීමට බදු මුදලෙන් සියයට 50 ක් එකවර ගෙවීමටත් ඉතිරිය වාරික වශයෙන් ගෙවීමටත්	එම බදු මුදලින් රු.500.000 ක් පමණක් අයකර ඇත.

				එකඟ වී අයකරගැනීමට අදාල කටයුතු සිදුකරන බව දන්වා සිටිමි.	
6	ලැබිය යුතු බදු ශේෂ 36 ක් සඳහා රු.777,136,104 ක් සහ වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු ශේෂ 15 කට අදාළ රු.6,305,291ක ශේෂ සඳහා සනාථන ලිපි වලින් තහවුරු නොවූ බැවින් නිවැරදිතාවය විගණනයට තහවුරු නොවිය.	2023 2022 2021	වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම් වලට අදාළ ශේෂ සනාථන ලබා ගත යුතුය.	මුදල් අංශයට අදාල ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම් වලට අදාල ශේෂ සනාථන ලිපි 24 ක් යවා ඇති අතර ඉන් ලිපි 07කට අදාල ශේෂ සනාථන ලිපි ලැබී ඇති බව වාර්තා කර ඇත.	එම ශේෂ තවදුරටත් අයනොවී පැවතිණි.
7	එකතුව රු.4,002,737,774 ක් වූ වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු ශේෂයෙහි ඇතුළත් රාජ්‍ය ආයතන 03 කින් ලැබිය යුතු වර්ෂ 30 ඉක්ම වූ රු.2,126,952,139 ක් සහ වර්ෂ 10 ඉක්ම වූ රු.381,076,216 ක් සඳහා කිසිදු වෙන්කිරීමක්ද කර නොතිබුණු අතර අයවීම අවිනිශ්චිත තත්වයේ විය.	2023 2022 2021	රාජ්‍ය ආයතන සඳහා ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන්ට දන්වා මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.	ජනතා වතු සංවර්ධන මණ්ඩලයෙන් හා ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවෙන් ලැබිය යුතු රු.2,068,913,697 ක් විගණන හා කළමනාකරණ කමිටුවට යොමු කර සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමටත්, හදබිම අධිකාරියෙන් ලැබිය යුතු රු.54,911,756 ක ශේෂය මේ ආකාරයට ඉදිරියට කරගෙන යන ලෙස දැනුම් දෙන ලදී.	2024.08.28 දින පැවති සභා තිරණය අනුව එම ශේෂය තවදුරටත් ඒ අකාරයෙන්ම ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ගිණුම්වල පැවතිය යුතු බවට තීරණය කර ඇත.
8	මුල්‍ය ප්‍රකාශන වල විවිධ ණයගැතියන් යටතේ කළුතර සහ ගම්පහ දිස්ත්‍රික්ක දෙකෙහි පිහිටි ඉඩම් කැබලි 08 ක් බදුගත් පුද්ගලයින්ගෙන් අයවිය යුතු රු.2,311,017 ක් වර්ෂ 24 කට වැඩි කාලයක සිට හිඟව පැවතුණද,අදාළ බදු මුදල් අයකරගැනීමට	2023 2022 2021	හිඟ බදු මුදල් අයකරගැනීමට කටයුතු කළ යුතුය	මෙම ශේෂය පිළිබඳව කොමිෂන් සභාවට 2024.07.02 දිනැතිව පත්‍රිකා අංක 12788 දරණ පත්‍රිකාව ඉදිරිපත් කරන ලද අතර එහිදී තීරණය වූයේ ආයතනික විගණන හා කළමනාකරණ	මුදල් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

	කටයුතු කර නොතිබුණි.			කමිටුව වෙත ඉදිරිපත් කොට එහි නිරීක්ෂණ සමඟ නැවත කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලෙසයි.	
9	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු.11,322,992 ක් වූ ඉඩම් විකුණුම් අත්තිකාරම් ශේෂයෙහි වර්ෂ 10 කට වැඩි කාලයක සිට පවත්වාගෙන එන එකතුව රු.11,202,992 ක ශේෂ හා එකතුව රු.14,080,850 ක් වූ ඉඩම් බදුකුලී අත්තිකාරම් ගිණුම් ශේෂයේ ඇතුළත් පුද්ගලයින් 269 දෙනෙකුගෙන් ලබාගත් රු.11,215,850 ක අත්තිකාරම් මුදල් වර්ෂ 18 කට වැඩි කාලයක සිට රඳවාගෙන තිබුණ ද, අදාළ ඉඩම් නීත්‍යානුකූලව විකිණීමට, බදු දීමට හෝ අත්තිකාරම් නැවත පියවීමට කොමිෂන් සභාව කටයුතු කර නොතිබුණි.	2023 2022 2021	විකුණුම් අත්තිකාරම් හා ඉඩම් බදු අත්තිකාරම් පියවීම පිළිබඳ අවධානය යොමු කල යුතුය.	ගිණුම්ගත වී ඇති මෙම ඉඩම් විකුණුම් අත්තිකාරම් වැඩි වශයෙන් 2002-2004 කාලය තුළ සිදුකරන ලද ඉඩම් ගණුදෙනු සම්බන්ධයෙනි..එම කාලය තුළ පවරන ලද ඉඩම් 219 ක අක්. 11,942 කට අදාළ ඉඩම් ප්‍රමාණයකින් දැනට සරුසාරව වගා කර ඇති ඉඩම් අක්. 1,156 ක් පරික්ෂා කර කරුණු තහවුරු කරගෙන 2022.02.17 දිනැති අංක 11738 කොමිෂන් තීරණය මඟින් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීම සඳහා කෙටුම්පත් කරන ලද කැබිනට් පත්‍රිකාව 2022.04.20 දින ඉඩම් අමාත්‍යාංශය වෙත යොමුකර ඇත.	විකුණුම් අත්තිකාරම් හා ඉඩම් බදු අත්තිකාරම් පියවීමට කටයුතු කර නොතිබුණි
10	1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 44(ඕ) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් සේවයෙහි යොදවා ගෙන සිටින තැනැත්තන් සඳහා අර්ථ සාධක අරමුදලක් පිහිටුවීම හා සුභසාධන හා විනෝද ක්‍රීඩා පහසුකම්	2023 2022	පනතේ අර්ථ නියමානුකූලව අර්ථකතනය කර ගනිමින් ක්‍රියාකළ යුතුය.	ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 44 (ඕ) වගන්තිය ප්‍රකාරව 1982-1984 කාල වකාවානු වලදී ද සේවක පදනම මත ඉඩම් කොටස් ලබාදීම සිදුකර ඇත. 2005 වර්ෂයෙන් පසුව	පනත අනුව ඉඩම් ප්‍රදානයට අනුමැතියක් නොමැත.

	සහ නිවාස හා නේවාසිකාගාර හා වෙනත් ඉඩකඩ සැපයීම සිදුකල යුතුය යන්න පදනම්ව කොමිෂන් සභාවේ වසර 5 ක අඛණ්ඩ සේවයක් හිමි සේවකයෙකු හට පර්චස් එකක් රු.1,000 ක වටිනාකමට පර්.20 බැගින් ලබා දීම කර තිබුණි.ඒ අනුව 2009 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා නිලධාරින් 396 ක් වෙත ඉඩම් අක්කර 49 පර්චස් 35.64 ක් ලබා දී තිබුණි.			ප්‍රතිපත්තිමය තිරණය පරිදි ප්‍රදේශය කුමක් වුවත් ලබාදෙනුයේ සමාන ඉඩම් ප්‍රමාණයකි. ඉඩම් කොටස් ලබා ගැනිම සඳහා මූලික සුදුසුකම ලෙස සැලකෙනුයේ කොමිෂන් සභාවේ අඛණ්ඩව සේවා කාලය වසර 05 ක සතුටුදායක සේවා කාලයක් හා විනය විරෝධි කටයුත්තකට භාජනය නොවූ අයකු විම වේ. 2020.09.16 පැවති කොමිෂන් සභා වාර අවස්ථාවේදි සේවා කාලය වසර 05 ක් සම්පූර්ණ කරනු ලබන කාර්ය මණ්ඩලය ඉඩම් කොටස් ලබා ගැනිමට අදාලව පොරොත්තු ලේඛනයක් මත සිදු කරන ලෙසට උපදෙස් ලබාදි ඇත.	
11	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ V වැනි පරිච්ඡේදයේ 1.1 ඡේදය ප්‍රකාරව ආයතන සංග්‍රහට පටහැනිව 2020 ඔක්තෝම්බර් 23 දින සිට 2022 මාර්තු 31 දින දක්වා කොමිෂන් සභාවේ ව්‍යාපෘති අධ්‍යක්ෂ තනතුරේ සේවය කරමින් සිටියදී, 2021 ජනවාරි 01 දින සිට මග නැගුම මාර්ග ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ සමාගමේ නියෝජ්‍ය	2023 2022 2021	වැඩිපුර ගෙවා ඇති වැටුප් සහ දීමනා ආපසු අයකර ගැනීමට කටයුතු කළ යුතුය.	2023.06.23 වන දිනැතිව නීතිපතිතුමා වෙත සියලු තොරතුරු ඇතුළත් ලිපියක් යොමු කරන ලදී. නැවත 2024.01.10 හා 2024.04.22 දිනැතිව ද ලිපි යොමු කරන ලදී. තවද, මේ පිළිබඳව ශ්‍රී ලංකා නීතිඥ සංගමය 2024.05.08 දිනැතිව ලිපියක් යොමු කරමින් රාජ්‍ය ආයතන දෙකක් හා සම්බන්ධ ගැටළුවක් වන බැවින්	මෙතෙක් නිරවුල් කර නොමැත.

	සාමාන්‍යාධිකාරී (පාලන) තනතුර සඳහා වසරක පරිවාස කාලයකට යටත්ව ස්ථිර පදනම මත සේවයට බැඳී එකම කාලය තුළ ආයතන 02 න්ම වැටුප් හා දීමනා ලබාගෙන තිබුණි. ඒ අනුව කොමිෂන් සභාව විසින් අදාළ නිලධාරියාගේ පැමිණීම සහ ලබාදෙන සේවය පිළිබඳව සැලකිලිමත් නොවී වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණු රු.2,038,979 ක මුදල සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වන විටත් අයකර ගෙන නොතිබුණි.			රාජ්‍ය ආයතනන්හි පවතින විනය ක්‍රියාමාර්ග ඔස්සේ සුදුසු පියවර ගැනීම යෝග්‍ය බව දන්වා ඇත.	
12	භාණ්ඩාගාර ලේකම්ගේ 2022 අප්‍රේල් 26 දිනැති අංක 03/2022 දරන රාජ්‍ය වියදම් පාලන චක්‍රලේඛයේ 2 වන වගන්තිය ප්‍රකාරව ගොඩනැගිලි කුලියට ගැනීම නතර කළ යුතු බව දන්වා තිබුණද කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලය හා දිස්ත්‍රික් කාර්යාල 07 ක් කුලී පදනම මත පවත්වා ගෙන යාම වෙනුවෙන් 2022 හා 2023 වර්ෂ වලට අදාළව බදු කුලීය ලෙස රු.49,571,072 ක් දරා තිබුණි. එසේම කොමිෂන් සභාව ආරම්භකර දැනට වසර 50 කට ආසන්න වූවත් කොමිෂන් සභාවට අයත් ගොඩනැගිලි වල කාර්යාල පිහිටුවීමට කටයුතු කිරීමට කළමනාකරණය අපොහොසත්වී ඇති බව ද	2023	රාජ්‍ය වියදම් පාලන චක්‍රලේඛ අනුව කටයුතු කළ යුතුය.	දිස්ත්‍රික් අධ්‍යක්ෂවරුන් විසින් රජයේ ගොඩනැඟිලිවල ඉඩ පහසුකම් සොයාගත නොහැකි බව වාර්තා කිරීමෙන් අනතුරුව කුලී පදනම මත පවත්වා ගෙන යාමට කටයුතු කර ඇත. කෙසේ වෙතත් දිස්ත්‍රික් කාර්යාල 03 ක් කොමිෂන් සභාව සතු ගොඩනැඟිලිවල පවතින අතර තවත් දිස්ත්‍රික් කාර්යාල 10 ක් රජයේ ගොඩනැඟිලිවල පවත්වාගෙන යනු ලබයි.	රජයේ ගොඩනැඟිලිවල කර්යාල පවත්වාගෙනයාම සිදුකරනු ලබයි.

	තවදුරටත් නිරීක්ෂණය විය.				
13	කොමිෂන් සභාව සතුව ගාල්ල කුරුදුගහ හැතැප්මේ පර්.31.5 ක ඉඩම සහිත ගොඩනැගිල්ලේ කොමිෂන් සභා ගාල්ල දිස්ත්‍රික් කාර්යාලය එහි පවත්වා ගෙන යාමට කටයුතු නොකර ගාල්ල නගරාසන්නයේ පිහිටි පර් 9.79 ක් වූ ගොඩනැගිල්ලක රු.65,000 ක් වූ මාසික බදු කුලියට ලබා ගෙන පවත්වා ගෙන යාම හේතුවෙන් 2018 වර්යේ සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා දරා තිබුණු ගොඩනැගිලි කුලීය වූ රු.4,870,000 ක් නිශ්කාර්ය වියදමක් බව නිරීක්ෂණය විය.	2023	පිරිවැය අවම වන ආකාරයට කටයුතු කළ යුතුය.	2018 වර්ෂයේ උප කාර්යාලයක් ලෙස මෙම ස්ථානය පවත්වාගෙන ගොස් ඇති අතර, ගාල්ල නගරයේ සිට ආසන්න වශයෙන් කි. මීටර් 39 ක දුරකින් පිහිටිම හේතුවෙන් අනෙකුත් රාජකාරි කටයුතු වලද දුෂ්කරතාවයන්ට මුහුණ දීමට සිදුවන බවත් නිරීක්ෂණය විය.	මෙම වර්තා දින වන විටත් ගාල්ල කාර්යාලය කුලී ගොඩනැගිල්ලේ පවති.
14	2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු හිඟ ඉඩම් බදු වටිනාකම රු. 1,180,434,743 කට අදාළ බදුකරුවන් සංඛ්‍යාව 401 ක් වන අතර ඉන් බදුකරුවන් 116 කට පමණක් බදු ගිවිසුම් ලබාදී තිබූ අතර හිඟ බදු මුදල වූ රු.904,486,633 කට අදාළ බදුකරුවන් 285 කට නීත්‍යානුකූලව ගිවිසුමකට එළඹීමකින් තොරව ඉඩම් බදු දී තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ හිඟ බදු මුදලින් අයකර ගත් වටිනාකම සියයට 13 ක් හා සමාලෝචිත වර්ෂයේ	2023 2022	බදු දී ඇති ඉඩම් සඳහා නීත්‍යානුකූල ගිවිසුම් වලට එළඹීමට කටයුතු කළ යුතුය.	2023.12.31 දිනට ලැබිය යුතු බදු මුදලට අදාළව බදුකරුවන් 403 දෙනෙක් හඳුනාගෙන ඇති අතර එම ප්‍රමාණයෙන් බදු නොගෙවා අයකර ගැනීමට නීතිමය පියවර ගත යුතු බදුකරුවන් 246 ක් වන අතර වාර්ෂික හා වාරික පදනමින් බදු අයකර ගත හැකි බදුකරුවන් ගණන 157 කි. බදු අයනොවන නීතිමය ක්‍රියාදාමය තුලින් කඩිනමින් අයකර ගත	සියලුම බදුකරුවන් සඳහා බදු ගිවිසුම් ලබාදීම සිදුකර නොමැත.

	ආදායමින් අයකරගත් වටිනාකම සියයට 30 ක් වී තිබුණි. ඒ අනුව නීත්‍යානුකූල ගිවිසුම් නොමැතිව බදු දී ඇති නිසා හිඟ බදු මුදල් අයකර ගැනීම සඳහා නඩු මාර්ගයකට හෝ යාමට නොහැකිවී තිබුණි.			යුතු වශයෙන් තවදුරටත් වර්ගීකරණය කර ඒ අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගනිමින් පවතී.	
15	ඉඩම් ප්‍රතිසංස්කරණ පනත ප්‍රකාරව පුද්ගලික සමාගමක් සතු ටෙම්පල්ස්ටෝ වත්ත ඉඩම 1974 ජුලි 09 දින පවරාගෙන ඇතත් එම සමාගම විසින් පැවරු නඩුවේ තීන්දුව අනුව අක්කර 439 රූඩ් 02 පර්.03 ක ප්‍රමාණයක භුක්තිය 1993 නොවැම්බර් 23 දින නැවත සමාගම වෙත භාරදී තිබුණි. සමාගමට 1974 සිට 1993 දක්වා කාලය සඳහා ඔවුන්ගේ අහිමිවූ ආදායම් සහ අහිමි වූ අලාභය සඳහා පොලිය සම්බන්ධව ගොනුකළ නඩුවට අදාළව ලබාදුන් නියෝගය ඉටු නොකිරීම නිසා 2001 වර්ෂයේදී ගෙවිය යුතු මුදල වූ මුදල රු.මිලියන 100 ක් එකී කාලයේදී නොගෙවීම හේතුවෙන් එම මුදලට වාර්ෂික පොළියද එකතුවීම නිසාවෙන් රු.මිලියන 500ක් ගෙවීමට එකඟ වී තිබුණි. ඒ අනුව රු.මිලියන 400 ක් වැඩිපුර ගෙවීමට සිදුවී තිබුණු බව නිරීක්ෂණය විය.	2023	විධිමත් ක්‍රමවේදයකට අනුව නිරවුල් අයිතිය පවරා ගැනිමට කටයුතු කළ යුතුය.	පුද්ගලික සමාගම විසින් පවරන ලද නඩුව සහ තවත් ඒ හා සම්බන්ධිත නඩු 5 ක් සඳහා අලාභ වශයෙන් අලාභ මුදල් ගෙවන ලෙසට (means and profits) එකී දිසා අධිකරණය විසින් 2001.02.23 වන දින තීන්දුවක් ලබා දෙන ලදී. එහෙත් පොළිය ලබා දීමට එමඟින් තීන්දු කර නොතිබුණි. කොමිෂන් සභාව විසින් අභියාචනයක් සහ ප්‍රතිශෝධන ඉල්ලීමක් ඉදිරිපත් කලද අලාභයට සියයට 100 ක පොළියක්ද, ඒ මත නෛතික පොළියක්ද, ගෙවීමට නියම කරන ලදී. නීතිපතිතුමාගෙන් වාර්තාවක් කැඳවීමට යටත්ව මෙම සමථය ඇතිකර ගැනීමට සුදුසු ප්‍රතිපත්තිමය තීරණයක් ගැනීම සඳහා කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලබාදෙන ලදී.ඒ අනුව 2024.04.24 වන දින	හිමිකමක් නොමැති ඉඩම් සොයා නොබලා පවරාගැනීමට නිර්දේශ ලබාදුන් පාර්ශවයන් සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත.

				රුපියල් මිලියන 500 ක් පැමිණිලිකරුවන්ට ගෙවන ලදී.	
16	කොමිෂන් සභාවේ ඒකාබද්ධ ගිණුම්කරණ මෘදුකාංග පද්ධතියක් 2019 මැයි 22 දින පුද්ගලික ආයතනයකින් රු.8,500,000 කට මිලදී ගෙන තිබුණ ද, එම තොරතුරු පද්ධතිය මගින් ලැබිය යුතු ඉඩම් බදු මුදල් පිළිබඳ තොරතුරු ලබාගැනීමට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් නොහැකි වී තිබුණි	2023 2022 2021	ඒකාබද්ධ ගිණුම්කරණ මෘදුකාංග පද්ධතිය ස්ථාපිත කිරීමට පියවර ගත යුතුය.	MIS තොරතුරු පද්ධතියේ ප්‍රගතිය පිළිබඳ සාකච්ඡා කිරීමට Science Land Information Technology (Pvt) Ltd ආයතනය සහ තාක්ෂණික ඇගයීම් කමිටුව රැස් වූ අතර, එහිදී සාකච්ඡා වූ කරුණු සහ TOR එක අනුව හැකි ඉක්මනින් තොරතුරු පද්ධතිය මඟින් ලැබිය යුතු ඉඩම් බදු මුදල් ලබා ගැනීමට හැකි ආකාරයෙන් MIS තොරතුරු පද්ධතිය සකසන බව එකඟ වී ඇත.ඒ අනුව මේ වන විට ණයගැති ශේෂ සම්බන්ධයෙන් පද්ධතිය සකස් කරමින් පවතී. මීට අමතරව මේ සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමින් පවතී.	මෘදුකාංග පද්ධතිය භාවිතයට ගෙන නොමැත.
17	සභාව සඳහා, පූර්ණ ඒකාබද්ධ පරිගණක පද්ධතියක් නිර්මාණය කිරීම, සංවර්ධනය කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා 2002 වර්ෂයේ දී පෞද්ගලික සමාගමක් වෙත ගෙවා තිබුණු රු.17,000,000 ක මුදල	2023 2022 2021	මුදල නැවත අයකර ගැනීමට කටයුතු කළ යුතුය.	මෙම අක්‍රමිකතාවය පිළිබඳව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව හා අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව විසින් සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු කිරීමට තරම්	මුදල නැවත අයකර නොමැත.

	නැවත ලබා ගැනීම සඳහා නෛතික ක්‍රියාමාර්ග ගන්නා ලෙස 2022 පැවති පොදු ව්‍යාපාර කාරක සභාවට දන්වා ඇතත් ඒ අනුව කටයුතු කිරීමට මෙම වාර්තාවේ දින වන විටත් කටයුතු කර නොතිබුණි.			ප්‍රමාණවත් කරුණු නොමැති බව දන්වා ඇත. විගණන හා කළමනාකරණ කමිටුව වෙත ද ඉදිරිපත් කර නිර්දේශ ලබා ගැනීම සඳහා ඉඩම් අමාත්‍යාංශය මඟින් මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කර ඇති අතර, මේ වන තෙක් මහා භාණ්ඩාගාරය වෙතින් පිළිතුරු ලැබී නැත. පූර්ණ වාර්තාවක් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව වෙත සියළු තොරතුරු ඉදිරිපත් කර ඇත. නීතිපති දෙපාර්තමේන්තුව වෙතින් උපදෙස් ඉල්ලා 2023.08.24 දිනැතිව ලිපියක් යොමුකර ඇති අතර, මේ වන තෙක් පිළිතුරක් ලැබී නොමැත.	
18	කොමිෂන් සභාවේ ඉඩම් මැනුම් කර නියමානුකූල කරන අවස්ථාවේ කට්ටි කරුවන්ගෙන් ප්‍රතිපූර්ණය කර ගැනීමට යටත්ව මිනින්දෝරුවන් හට 2019,2020 හා 2021 යන වර්ෂ වලදී ගෙවා තිබුණු එකතුව රු.33,229,487 ක මුදලින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වන විට රු.7,616,274 ක් පමණක් ප්‍රතිපූර්ණය කරගෙන තිබුණු අතර	2023 2022 2021	ඉඩම් කට්ටිකරුවන්ට ලබාදෙන අවස්ථාවේදී මැනුම් කර ගාස්තු අය කිරීමට කටයුතු කළ යුතුය.	ගාල්ල දිස්ත්‍රික්කයේ විශේෂ ව්‍යාපෘතියක් ලෙස කොමිෂන් සභාවේ ලියාපදිංචිගත බලයලත් මිනින්දෝරුවන් වෙත 2019, 2020 හා 2021 යන වර්ෂවලදී කොමිෂන් සභාව විසින් මිනින්දෝරු ගාස්තු වශයෙන් ගෙවන ලද රු. 33,229,487 ක් වූ මුදලින් 2023.12.31	මෙම හිග මුදල් අයකරගැනීම සම්බන්ධයෙන් නීතිපති උපදෙස් විමසා ඇත.

	එදිනට තවදුරටත් ලැබිය යුතු ශේෂය රු.25,613,213 වේ.			දින වන විට රු. 25,613,211 ක මුදලක් අයවීමට තිබුණි. එයින් රු. 1,081,472 ක මුදලක් 2024.06.30 දින වන විට ප්‍රතිපූර්ණය කර ඇත. ඒ අනුව 2024.06.30 දින වන විට රු. 24,531,739 ක මුදලක් ප්‍රතිපූර්ණය කරගැනීමට ඇත. කෙසේ වෙතත් කට්ටිලාභීන් වෙත මුදල් ගෙවන ලෙස දැනුම් දී මෙම මුදල් අයකරගැනීමට අධ්‍යක්ෂ ඉඩම් වෙත උපදෙස් ලබා දී ඇත.	
19	කොමිෂන් සභාවට අයත් නාවලපිටිය ටිල්ටන් වත්ත ඉඩමේ තේ කර්මාන්ත ශාලාව සහිත අක්කර 02 රූඩ් 01 පර්චස් 05 ක ප්‍රමාණය තිස් අවුරුදු බදු පදනම මත 1997 අගෝස්තු 30 දින සිට වාර්ෂික බදු කුලිය රු.270,000 බැගින් පුද්ගලික සමාගම වෙත බදු දී තිබුණි. 2008 වර්ෂයේදී පුද්ගලික පාර්ශවයක් විසින් ඉහත ආයතනයේ වෙළඳනාමය සමඟ ඉඩම පවරා ගෙන ඇතත් මේ සම්බන්ධයෙන් අනුමැතියක් හා ගිවිසුමකට එළඹීමකින් තොරව හෝ කිසිදු අය කිරීමකින් තොරව අවිධිමත් ලෙස	2023 2022	හිඟ බදු අය කර ගැනීමට කටයුතු කළ යුතුය.	මහනුවර දිස්ත්‍රික්කයේ නාවලපිටිය පිහිටි ටිල්ටන් වත්ත වසර 30 ක් සඳහා සී/ස සුපර් ඉන්ඩස්ට්‍රීස් ඇන්ඩ් එක්ස්පෝර්ට් පුද්ගලික සමාගම වෙත පවරා දී බදු නොගෙවීම හේතුවෙන් නාවලපිටිය මහේස්ත්‍රාත් අධිකරණයේ අංක 79899/18 හා 2021.03.26 දිනැති නඩු තීන්දුව ප්‍රකාරව තිලක් කුමාර උඩුගම මහතා මෙම දේපළින් නෙරපීම සඳහා නියෝගයක් නිකුත්කර ඇත. හිඟ බදු මුදල අයකරගැනීම සම්බන්ධයෙන්	හිඟ බදු මුදල් අයකරගෙන නොමැත.

	භුක්තිවිදීමට කොමිෂන් සභාව විසින් ඉඩදී තිබූ අතර 2023 දෙසැම්බර් 31 දින දක්වා වසර 26 ක කාලයක සිට අයවිය යුතු බදු මුදල රු.18,403,926 ක් ලෙස ගිණුම් ගත කර තිබුණි.			2024.01.10 දිනැතිව නීතිපතිතුමා වෙත ලිපියක් යොමු කර ඇත.	
20	ගාල්ල අක්මීමන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි ලෙව්වමී බී වත්ත නැමැති ඉඩමෙන් අක්කර 08 ක් අවුරුදු 30 ක කාලයක් සඳහා "පදනමකට" බදු පදනම මත ලබා දී ඉඩමේ භුක්තිය ඒකපාර්ශිකව කොමිෂන් සභාව වෙත 2021 වර්ෂයේදී පවරාගෙන තිබුණද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වන දින වන විට හිඟව පැවති රු.6,998,800 ක මුදල අයකර ගැනීමට කොමිෂන් සභාව මේ දක්වා කටයුතු කර නොතිබුණි.	2023 2022 2021	පවරාගත් ඉඩම පනතේ අරමුණු වෙනුවෙන් යොදාගත යුතු අතර හිඟ බදු අය කර ගැනීමට ද පියවර ගත යුතුය.	ගාල්ල දිස්ත්‍රික්කයේ අක්මීමන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ පිහිටි ලෙව්වමි බී වත්ත ඉඩමෙන් සහන ළමා සංවර්ධන පදනම වෙත අක්කර 08 ක ප්‍රමාණයක් 2005.01.01 දිනැතිව බදු පදනම මත ලබා දී ඇත. 2022.12.31 දක්වා අයවිය යුතු බදු මුදල රු.6,998,800 කි. 2005 සිට මේ දක්වා කිසිදු බදු මුදලක් ගෙවා නොමැත. ස්වාමීන් වහන්සේ අපවත් වීමට පෙර මෙම ඉඩමෙන් අක්. 03 ක ප්‍රමාණයක් වික්‍රමසිංහ නැමැති පුද්ගලයෙකුට පවරා ඇති අතර එම අය විසින් මෙම අක්. 03 ක ප්‍රමාණයේ අගාවුඩ් වගා කර භුක්ති විඳිමින් සිටින කොටස බදු පදනම මත එම අය වෙත ලබාදීමටත් ඉතිරි අක්. 05 ක ප්‍රමාණයේ පිහිටි ගොඩනැගිලි සහිත ඉඩම කොමිෂන්	මෙම හිඟ මුදල් අයකරගැනීම සම්බන්ධයෙන් නීතිපති වෙතින් උපදෙස් විමසා ඇත.

				සභාවට පවරා හිඟ බදු මුදලට හිලව් කර ගොඩනැගිලි සමගම වෙනත් සුදුසු බදුකරුවෙකුට ලබාදීමට කොමිෂන් සභාවේ උපදෙස් ලබාගැනීමට කටයුතු කරනු ලැබේ	
21	ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු කළුතර දිස්ත්‍රික්කයේ හොරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මාහේන උතුර 615 බී ග්‍රාම නිලධාරී වසමට අයත් ඉඩමෙහි නොබෙදූ අක්කර 14 රූඩ් 1 පර්චස් 9.9 ක ඉඩම තුළ අනවසර ලෙස ස්වාමීන් වහන්සේ නමක් අක්කර 5 කට ආසන්න ප්‍රමාණයක්ද, තවත් පෞද්ගලික ඉඩම් හිමිකාරියක් පර්චස් 66 ඉක්මවූ ප්‍රමාණයක්ද භුක්ති විඳින අතර 1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 16 වගන්තිය ප්‍රකාරව අනවසර භුක්තිකරුවන් නෙරපා හැරීමට නීතිමය කටයුතු කර නොතිබුණි.	2023 2022	අනවසර භුක්තිකරුවන් වෙනුවෙන් නීතිමය ක්‍රියාමාර්ග ගත යුතුය	හැගල්ල වත්ත ඉඩම හඳුනා ගැනීම සඳහා අංක 15/6/3626 හා 2021.05.21 දිනැති මැනුම් නියෝගයට අනුව මැනුම් කර අංක 1581 හා 2021.07.22 දිනැති පිඹුර ඉදිරිපත් කර ඇත. එම මැනුමේදී වර්තමානයේ සුජාතා වීරකෝන් යන අය හිමිකාරිත්වය දරණ බංගලාව සහිත පර්චස් 66 ක කොටසට අමතරව ඉඩමෙන් කොටසක් අනවසරයෙන් භුක්ති විඳින බව හෙළි වූ අතර එම කොටස 1581 පිඹුරේ කැබලි අංක 08 ලෙස පෙන්වා ඇත.නමුත් සුජාතා වීරකෝන් යන අය විසින් මේ වන විට CA(W)576/2021 දරණ නඩුව කොමිෂන් සභාවට විරුද්ධව ගොනු කිරීම නිසා එම අනවසර ක්‍රියාව සම්බන්ධයෙන් මෙතෙක් ක්‍රියාමාර්ගයක්	මේ සම්බන්ධයෙන් නඩුවක් පවතින අතර එම කටයුතු අවසන් වී නොමැත. භික්ෂූන් වහන්සේගේ අනවසර ක්‍රියාවන් නැවැත්වීමට 2024.10.14 දිනැති ලිපියේ තොරතුරු කැඳවා ඇත.

				ගැනීමට නොහැකි වී ඇත.ගිහිපැවිදි ප්‍රජානායක පුහුණු මධ්‍යස්ථානයක් සඳහා ඉසිපතනාරාමාධිපති පූජ්‍ය ගරු තත්ජම්තැන්නේ ධම්මරංසි හිමියන් විසින් බදු පදනම මත ලබා ගැනීමට ඉල්ලීමක් කර ඇති අතර එම ඉල්ලීමට අනුව 1581 පිඹුරෙන් අක්කර 4 රූඩ් 2 පර්චස් 00 ක නිරවුල් බිම් ප්‍රමාණයක් කොමිෂන් සභාව නමින් මැනුම් කිරීමට අංක 15/6/3626 හා 2021.11.08 දිනැති මැනුම් නියෝගය නිකුත් කරන ලදි. නමුත් සුජාතා වීරකෝන් යන අය අභියාචනා අධිකරණයේ අංක CA(W)576/2021 දරණ නඩුව කොමිෂන් සභාවට විරුද්ධව ගොනු කිරීම නිසා මැනුම් කිරීමට නොහැකිවූ බැවින් බදු දීමට අදාල ඉදිරි කටයුතු සිදුවී නොමැත.	
22	කොළඹ දිස්ත්‍රික්කයේ කොළොන්නාව වැල්ලම්පිටිය ප්‍රදේශයේ පිහිටි ජා කොටුව වත්ත ඉඩමෙන් රූඩ් 01 පර්චස් 9.79 ප්‍රමාණය වාර්ෂික බදු	2023 2022	රජයේ තක්සේරුව මත බදු අයකල යුතුය.	2021 ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව අනුව බදු මුදල රු.1,590,000 කි. මෙම ව්‍යාපාරය තුලින් උපයන ආදායමෙන්	නියමිත බදු අයකර ගැනීමට හෝ බදුකරු ඉවත්කිරීම සිදුකර නොමැත.

	කුලිය රු.1,590,000 ක් බැගින් පුද්ගලයෙකු වෙත පවරා ඉඩමේ වෙළඳපල වටිනාකම මත එය රු.26,500,000 කට තක්සේරු කර ඇතත් බදු කුලිය ඉතා ඉහළ අගයක් බැවින් එය ගෙවිය නොහැකි බව දන්වා තිබූ අතර මේ දක්වා කිසිදු බදු මුදලක් අය වී නොතිබුණි.			මෙම බදු මුදල ගෙවීම නොහැකි බැවින් නැවත බදු සංශෝධනය කර දෙන ලෙසට ඉල්ලීම් කර ඇත. තක්සේරු දෙපාර්තමේන්තුව වෙත දැනුම් දී තිබුනද එය වෙනස් කිරීමට නොහැකි බව තක්සේරු දෙපාර්තමේන්තුව විසින් මෙම ආයතනය දැනුවත් කර ඇත. මේ දක්වා රජයේ තක්සේරුව ලැබී නොමැති බැවින් බදු ගිවිසුම ද ලබා දීමට නොහැකි වී ඇත.	
23	ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි රාගෙදර වත්ත ඉඩමෙන් අක්කර 70 ක් මිනිරන් කැනීම සඳහා රජයේ තක්සේරු වටිනාකම මත වර්ෂ 05 ක කාලයක් සඳහා පුද්ගලික සමාගමක් වෙත 2011 වර්ෂයේදී බදු දී තිබුණි. මෙම මිනිරන් සහිත ඉඩම සඳහා 2023 දෙසැම්බර් 31 දින දක්වා ගෙවූ මුදල රු.8,110,356 ක් රජයේ තක්සේරුව ලබාගෙන නොතිබීම මත ලැබුණු අත්තිකාරම් ලෙස ගිණුම්ගත කර තිබුණි. මෙම විගනන වාර්තාවේ දින වන විටත් වර්ෂ 12 ක් පමණ ගතවී තිබුණද තක්සේරු කර බදු ගණනය කර අයකර	2023	රජයේ තක්සේරුව මත බදු අයකල යුතුය.	පනතේ 22(1) ආ ආ වගන්තිය යටතේ රජයේ ප්‍රධාන තක්සේරු කරුගේ වර්තමාන තක්සේරුව ලබා දෙන ලෙස ඉල්ලමින් 2012.10.19 දින අධ්‍යක්ෂ/තක්සේරු හා වන්දි වෙත යොමු කර ඇතත් තක්සේරු වාර්තා ලබා දී නොමැත.2023.12. 25 දිනැතිව අධ්‍යක්ෂ/තක්සේරු හා වන්දි වෙත මෙම තක්සේරු වාර්තාව ලැබීමේ ප්‍රමාදය පිළිබඳව සොයා බලා කටයුතු කරන අතර මෙම ව්‍යාපෘතිය තුලින් මේ වන විට රු.8,937,144 ක මුදල	තක්සේරු වාර්තා කැදවා හිඟ බදු මුදල් අයකර නොමැත.

	ගැනීමට හා දෙපාර්ශවය අතර බදු ගිවිසුමකට එළඹීමට කොමිෂන් සභාව මේ දක්වා අපොහොසත් වී තිබුණි.			අය කරගෙන ඇත.ඒ අනුව තක්සේරු වාර්තා ලැබුනු පසු අදාල ගැලපීම් කර හිඟ බදු මුදල අයකරගෙන විධිමත් බදු ගිවිසුමක් ලබාදීමට කටයුතු කරනු ලැබේ.	
24	මහනුවර දිස්ත්‍රික්කයේ අම්බලන්වත්ත ඉඩමෙන් අක්කර 25 ක් පුද්ගලික සමාගමක් වෙත සිලිකා ව්‍යාපෘතියක් සඳහා 2011 වර්ෂයේ දී බදු දී තිබූ අතර 2012 – 2015 සහ 2017 – 2019 වර්ෂවල කිසිදු බදු මුදලක් අයකරගෙන නොතිබුණි. 2023.12.31 දින වන විටත් රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරු වාර්තා ලබාගෙන හෝ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යංශය මගින් වාර්තා ලබාගෙන සාධාරණ ක්‍රමවේදයකට අයකළ යුතු බදු මුදල තීරණය කිරීමට කටයුතු කර නොතිබුණි.	2023	රජයේ තක්සේරුව හෝ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යංශය මගින් ලබාගත් වාර්තා අනුව බදු මුදල අයකල යුතුය.	ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව ලැබෙන තෙක් වාර්ෂික දල තක්සේරුවක් මත බදු ගෙවන ලෙස 2018.01.21 දිනැතිව ආයතනය වෙත දැනුම් දී තිබුණි.ඒ අනුව 2011.05.03, 2020.09.14 හා 2021.01.27 යන දිනැතිව තක්සේරු දෙපාර්තමේන්තුවට ලිපි යොමු කර ඇත. 2024.04.04 දිනැතිව ලේඛකාධිකාරි භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යංශය වෙත ද ලිපියක් යොමු කර ඇත. 2024.04.03 දිනැතිව රු.2,000,000 ක මුදලක් අප වෙත ගෙවා ඇත. ඒ අනුව ලැබිය යුතු හිඟ මුදලේ ශේෂය වන රු.2,127,500 මුදල කඩිනමින් ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. තව ද 2012/2015 හා 2017/2019 වර්ෂ වල බදු මුදල් නොගෙවීමට හේතුව ලෙස බලුබේ	තක්සේරුව වාර්තා නොලැබීම මත හිඟ බදු හෝ වර්තමාන බදු අයකර නොමැත.

				මිනරල් ආයතනය විසින් සඳහන් කරනුයේ එම කාල පරිච්ඡේදය තුල මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවූ බවයි.	
25	දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි ගලිමුරේ වත්ත කැබලි අංක 01 හි අක්කර 12 රූඩ් 02 පර්චස් 4.48 ක ප්‍රමාණය තුළ පිහිටි කළු ගල 2011 ජූලි මස බදු දී තිබුණි. 2011 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට වර්ෂ 12 ක් පමණ ගතවන තෙක්ම අදාළ බදුකරු නියමිත පරිදි බදු නොගෙවීම සම්බන්ධව ගතයුතු ක්‍රියාමාර්ග කොමිෂන් සභාව විසින් නොගැනීම හේතුවෙන් එමගින් උපයා ගත හැකිව තිබූ ආදායමක් අහිමිවී තිබුණි.	2023	නිවැරදි ගිවිසුමක් මත බදු අයකල යුතුය.	පනතේ 22 (1) අ වගන්තිය ප්‍රකාරව 2011 වසරේ රජයේ ප්‍රධාන තක්සේරු කරුගේ තක්සේරුව මත භුක්ති විදි කාලයට අදාලව පරිහරණ ගාස්තුවක්ද ඇතුලත්ව බදු ගෙවන ලෙසට 2023.01.23 දිනැතිව 15/6/4028 දරණ ලිපිය මඟින්ද 2023.10.24 දිනැතිව 3/5/2/1/ගම්/95 දරණ ලිපිය මඟින්ද දැනුම් දී ඇත. නොගෙවීම හේතුවෙන් නීතිමය පියවර ගැනීමට 2023.10.17 දිනැතිව අධ්‍යක්ෂ නීති දැනුවත් කර ඇති අතර නීතිමය පියවර කඩිනමින් සිදුකරන බව අධ්‍යක්ෂ ආදායම් විසින් දන්වා ඇත.	බදුකරු නියමිත පරිදි බදු ගෙවා නොමැත.
26	2021 වර්ෂයේදී රු. මිලියන 350 ක් වැයකර ආරම්භ කල කාබනික පොහොර ව්‍යාපෘතියේ වියදමට සාපේක්ෂව උපයාගෙන තිබුණු ආදායම රු.මිලියන 22 ක් වීම මත මෙම ව්‍යාපෘතිය අසාර්ථක ව්‍යාපෘතියක් ලෙස 2022 වර්ෂයේදී	2023	විශේෂ විමර්ශන වාර්තාව අනුව කටයුතු කල යුතුය.	කාබනික පොහොර නිෂ්පාදන ව්‍යාපෘතිය උතුරු මැද පළාත මධ්‍යස්ථාන 35ක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 29ක් තුළ පවත්වාගෙන යාම සඳහා පළමුව රු.මිලියන 350ක් වෙන්කර ආරම්භ කර	විශේෂ විමර්ශන කමිටුවේ අවසන් පරීක්ෂන වාර්තාව ලබා දී නොමැත.

අවසන් කර තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා මිලදී ගත් රු.මිලියන 31 කට වඩා අධික යන්ත්‍ර සූත්‍ර සහ කාර්යාල උපාංග ස්ථානගත කර ඇති හා එම වත්කම් වර්ග හා වටිනාකම් පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් නොවීය. 2023 මාර්තු 28 දිනැති අමප/23/383/615/017 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් මෙම ව්‍යාපෘතිය අසාර්ථක වීමට හේතු වී ඇති කරුණු එහි මුදල් භාවිතාකොට ඇති ආකාරය සහ ඒ සඳහා දායක වූ පාර්ශව පිළිබඳ ස්වාධීන පූර්ණ විමර්ශනයක් සිදු කිරීමට සාමාජිකයන් තුන් දෙනෙකුගෙන් යුත් විශේෂ විමර්ශන කමිටුවක් සංචාරක හා ඉඩම් අමාත්‍යාංශ ලේකම් විසින් පත්කර එම වාර්තාව 2023 අප්‍රේල් 29 දිනැති සංචාරක හා ඉඩම් අමාත්‍යාංශ ලේකම්ගේ අංක 9/2/6/17 ලිපිය මගින් සති 02 ක් තුළ ඉදිරිපත් කරන ලෙස දක්වා ඇතත් 2024 ජුනි දක්වා ඉදිරිපත් කර නොතිබුණි.

ඉන් අනතුරුව 2022.01.01 දිනෙන් පසු ඉඩම් අමාත්‍යාංශයේ ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කිරීමට තීරණය කර තිබුණි. නිෂ්පාදිත පොහොර අලෙවි කිරීම සඳහා කොමර්ෂල් පොහොර සමාගම සමඟ ගිවිසුමක් ද අත්සන් කලද එම සමාගම මෙම පොහොර මිලට ගැනීම අත්හිටුවන ලදි. 2022.07.14 වන දින අවසන් කල මෙම ව්‍යාපෘතිය සඳහා මිලදී ගත් යන්ත්‍ර සූත්‍ර සහ කාර්යාල උපකරණ සඳහා රු.මිලියන 81,150,320 ක මුදලක් වැයකර තිබුණි. මිලදී ගන්නා ලද යන්ත්‍ර සූත්‍ර සහ කාර්යාල උපකරණ ශ්‍රී ලංකා ගුවන් හමුදාව, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව, ඇල්ල ප්‍රාදේශීය සභාව යන රාජ්‍ය ආයතන වෙත මෙම යන්ත්‍ර සූත්‍ර හා උපකරණ මේ වනවිට ලබාදී අවසන් කර ඇත.සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත පරීක්ෂණ කමිටුව විසින් කොමිෂන් සභාව වෙතින් කාබනික ව්‍යාපෘතියට අදාළව ආරම්භ කරන ලද ලිපිගොනු හා

				කොමිෂන් සභා තීරණ ආදී ලේඛන ඉල්ලුම් කරන ලද අතර එම ලේඛන සියල්ල එම කමිටුව වෙත භාරදෙන ලදි. කෙසේ නමුත් අවසන් පරීක්ෂණ වාර්තාවක් සම්බන්ධයෙන් කොමිෂන් සභාව දැනුවත් වී නොමැත.	
27	2018 ජුනි 27 දිනැති අංක අමප/18/1126/829/002 දරන කැබිනට් තීරණය මගින් වර්ෂයක කාලයක් සඳහා නිලධාරීන් 214 දෙනෙකු බඳවා ගැනීමට අනුමැතිය ලබා දී තිබුණු අතර කාර්ය සාධනය අනුව වසර 3ක කාලයක් සඳහා එම නිලධාරීන්ගේ සේවය දීර්ඝ කළ හැකි බව එහි දක්වා තිබුණද අදාළ වසර 3 අවසන් වීමෙන් පසුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියෙන් තොරව කළමනාකරණ සහකාර 138 ක්,රියදුරු 10ක් සහ කාර්යාල සහයක 16 ක් සඳහා ස්ථිර පත්වීම් ලබාදී තිබුණි. මීට අමතරව කොමිෂන් සභා පත්‍රිකා මගින් බඳවාගෙන ඇති කළමනාකාර සහකාර තනතුරු 56 ක් හා ප්‍රාථමික තනතුරු 08 ක් සඳහාද කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අනුමැතිය ගෙන නොතිබුණි.	2023 2022 2021	කළමනාකරණ දෙපාර්තමේන්තු වේ අනුමැතිය අනුව සේවක සංඛ්‍යාව සංශෝධනය කිරීමට කටයුතු කළ යුතුය.	සංශෝධිත බඳවා ගැනීමේ පරිපාටිය ද සකස් කර 2022.10.21 දිනැති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමෙන් අනතුරුව කොමිෂන් සභාව ප්‍රතිව්‍යුහගතකරණයට නියමිත ආයතනයක් වන බැවින් මෙම අවස්ථාවේදී තනතුරු ඇතිකිරීම හා කාර්ය මණ්ඩලය බඳවාගැනීම සුදුසු නොවන බැවින් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 25/2014 හා 25/2014 (1) යටතේ ස්ථිර කිරීමට කටයුතු කරන ලදී.2024.06.12 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි, කොමිෂන් සභාවේ පුරප්පාඩුව ඇති කළමනාකරණ සහකාර තනතුරු 77, කාර්යාල සහායක තනතුරු 18 ක් හා රියදුරු තනතුරු 05ක් සඳහා බඳවාගැනීමට	කැබිනට් තීරණය මගින් වර්ෂයක කාලයක් සඳහා බඳවා ගත් කාර්ය මණ්ඩලයසඳහා කළමනාකරණ දෙපාර්තමේන්තු වේ අනුමැතිය ගෙන නොතිබුණි.

ජ්‍යෙෂ්ඨත්වය පදනම් කරමින් අධ්‍යාපන සුදුසුකම් පරීක්ෂා කර තෝරා ගැනීම අනුමත කරන ලදී.එම තීරණය අනුව, සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා කමිටුවක් පත්කර මේ වන විට ලිපිගොනු පරීක්ෂා කිරීමේ කටයුතු සිදුකරමින් පවතී.

3.58 ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	-	-	-	-	-
2022	-	-	-	-	-
2023	-	-	-	-	-

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග	2024.10.02 දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත සහ 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනත				
	(i)සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදලේ දායක මුදල් ගණනය කිරීමේදී 2006 ජනවාරි සිට 2015 ජූලි දක්වා කාලය තුළ සේවකයින්ට ගෙවා ඇති ජීවන වියදම් දීමනා සංස්ථාව විසින් සලකා බලා නොතිබුණි. එමෙන්ම, සංස්ථාව විසින් කරන ලද ගණනය කිරීම් අනුව පිළිවෙළින් රු. මිලියන 349.79ක් සහ රු.මිලියන 174.89ක් සේවක අර්ථසාධක අරමුදලේ සහ සේවා	2021 (ගනුදෙනු වාර්තාව)	සංස්ථාව අදාළ නියාමන අවශ්‍යතාවලට අනුකූල විය යුතු බව.	ජීවන වියදම් දීමනාව මත හිඟ සේවක අර්ථ සාධක මුදල් 2016 වර්ෂයේදී උද්ධෘත කල සී වාර්තා හි ගැටළු නිරවුල් කර නිවැරදි වාර්තා මත ගෙවීම් සිදු කරන ලදි. හිඟ සේවක භාරකාර අරමුදල් 2022 ජූනි මාසයේ ලද අධිකරණ නියෝග මත රු. මිලියන 56.1ක් රු.ලක්ෂ 05 බැගින් මාසික වාරිකවලින් ගෙවීමට එළඹ ඇත.	2024 ඔක්තෝබර් 08 දිනට ගෙවිය යුතු හිඟ සේවක අර්ථසාධක හිඟ මුදල රු. මිලියන 79.1 ක් වන අතර සේවක භාරකාර දායක මුදලේ හිඟ මුදල රු.මිලියන 19.5 ක් වේ.

	නියුක්තයන්ගේ භාර අරමුදල් දායක මුදලේ හිඟ මුදල් සහ එහි අධිභාරය ලෙස සංස්ථාවට ගෙවීමට සිදු වී තිබුණි. කෙසේ වුවද, දායක මුදල් හා අධිභාර ලෙස රු.මිලියන 524.68ක් 2023 අගෝස්තු 31 වන විටත් සංස්ථාව විසින් ගෙවා නොතිබුණි.				
	(ii) 2021 දෙසැම්බර් 31 දිනට සංස්ථාව විසින් සේවක අර්ථසාධක අරමුදලට රු. මිලියන 421.78 ක දායකත්වයක් සහ රු. මිලියන 147.39 ක අධිභාරයක් ප්‍රේෂණය නොකර රඳවාගෙන තිබුණි. තවද, 2022 දෙසැම්බර් 31 දිනට නොගෙවූ මුළු දායක මුදල රු. මිලියන 607.62 ක් වූ අතර, 2023 අගෝස්තු 31 වන විටත් එය ගෙවා නොතිබුණි.	2021 (ගනුදෙනු වාර්තාව)	සේවක අර්ථසාධක අරමුදල් පනතේ නියමයන් ප්‍රකාරව නියමිත වේලාවට දායක මුදල් ප්‍රේෂණය කිරීමට සහ අධිභාර ගෙවීමට කටයුතු කළ යුතු බව.	2023 අගෝස්තු වන විට සංස්ථා සේවයෙන් ඉවත්ව ගිය සියළු කාර්යමණ්ඩල සඳහා වූ හිඟ දායකය හා අධිභාර ගෙවා ඇත. ප්‍රවර්තන කාර්යමණ්ඩල හිඟ දායකය 2021 දෙසැම්බර් දක්වා නියමිත අධිභාර සමඟින් ගෙවා ඇත.	මේ වන විට රු. මිලියන 101.12 ක් වාරිකයක් රු. මිලියන 3.16 බැගින් වාරික 32 කින් ගෙවීමට ඉතිරිව ඇත.
2	2016 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා රාජ්‍ය බැංකුවලින් ලබාගත් රු. මිලියන 2,100 ක ණය පියවා නොතිබූ අතර 2021 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු හිඟ පොලී රු. මිලියන 569 කි.	2021 (ගනුදෙනු වාර්තාව)	කළමනාකරණය විසින් ලාභදායිත්වය සම්පූර්ණ කර ගැනීම සඳහා පාඩු අවම කර ගැනීමටත් ලාභ ඉපැයීමටත් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු බව.	සංස්ථාව ප්‍රතිසංවිධානය කිරීමේ වැඩ පිළිවෙල යටතේ සියළු වගකීම් නිරවුල් කිරීම හා ස්වාධීන ව්‍යාපාරික ආයතනයක් වශයෙන් ක්‍රියාත්මක කිරීම සඳහා විවිධ ආකෘති යටතේ සළකා බලමින් සිටී.	මේ දක්වා ණය මුදල වූ රු.මිලියන 2,099.99 හා 2023.12.31 දිනට හිඟ පොලී මුදල රු.මිලියන 1,547 ක් ගෙවීමට කටයුතු කර නොමැත.

3	2014 වසරේ සිට 2020 දක්වා කාලය තුල ආදායම් බදු, එකතු කළ අගය මත බදු, ආර්ථික සේවා ගාස්තු, ජාතිය ගොඩනැගීමේ බද්ද සහ භාණ්ඩ හා සේවා බදු පිළිවෙලින් රු.මිලියන 10.56, රු.මිලියන 1,158.19, රු.මිලියන 97.75, රු. මිලියන 65.21 සහ රු. මිලියන 2.12 ක් නියමිත වේලාවට ප්‍රේෂණය නොකිරීම හේතුවෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් 2021 වර්ෂය අවසානය වනවිට රු. මිලියන 130.43 ක අධිභාරයක් පනවා තිබුණි.	2021 (ගනුදෙනු වාර්තාව)	සංස්ථාව විසින් නියාමන අවශ්‍යතා සපුරාලිය යුතු බව.	2023 ජුලි මාසයේ සිට ප්‍රවර්තන බදු ගෙවමින් සිටී.	අතීත බදු වගකීම් හි ඇතුළත් ප්‍රධානතම වගකීම වන එකතුකල අගය මත බදු ශේෂයෙන් මේ වන විට රු.මිලියන 5.0ක් පමණක් ගෙවා ඇත. එම නිසා ගෙවිය යුතු මුළු බදු මුදල රු. මිලියන 1,328.83 ක් වන අතර ඒ මත අධිභාරය රු. මිලියන 130.43 ක් ගෙවා නොමැත.
4	ස්ථිර වැඩබිම් සහ වැඩපලවල කාර්යසාධනය පිළිබඳ ආදායම් සහ වියදම් විස්තර විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව, 2021 වර්ෂය තුළ රු. මිලියන 253.70 ක මුළු පාඩුවක් සිදු වී ඇති බව නිරීක්ෂණය වූ අතර එය පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 19.82 ක වර්ධනයකි. තවද, වැඩබිම් දෙකක් පමණක් ලාභ ලබා ඇති අතර අනෙක් ඒවා පාඩු මත මෙහෙයවනු ලැබ තිබුණි.	2021 (ගනුදෙනු වාර්තාව)	පාඩු අවම කර ගැනීමටත් නව ආදායම් උත්පාදන මාර්ග හඳුනා ගැනීමටත් කටයුතු කළ යුතු බව.	මාසික කාර්යසාධනය සමීපව අධීක්ෂණය තුළින් සහ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කිරීම මගින් තත්ත්වය අවම කිරීමට කළමනාකාරීත්වය විසින් කටයුතු කරනු ලැබේ.	2022 දෙසැම්බර් 31 දිනට මුළු අලාභය රු. මිලියන 152.44 ක් වන අතර 2021 වර්ෂයට සාපේක්ෂව සියයට 40න් අලාභය අඩු වී තිබුණි.

5	2003 ජුනි 02 දිනැති චක්‍රලේඛ අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර මාර්ගෝපදේශ 8.3.9 හි දක්වා ඇති උපදෙස් වලට පටහැනිව සංස්ථාවේ සේවකයින් හතලිස්හය දෙනෙකු (46) නාගරික සංවර්ධන හා නිවාස, රජයේ කර්මාන්තශාලා, සංස්කෘතික අරමුදල, නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය සහ නාගරික සංවර්ධන අධිකාරිය වෙත මුදා හැර තිබුණි. කෙසේ වුවද, සංස්ථාව විසින් ගෙවන ලද රු. මිලියන 55.25 ක වැටුප් හා අතිකාල ප්‍රතිපූරණය කරගෙන නොතිබුණි.	2021 (ගනුදෙනු වාර්තාව)	චක්‍රලේඛ උපදෙස් පිළිපැදීමට කටයුතු කළ යුතු අතර අදාළ රාජ්‍ය ආයතනවලින් වැටුප් ප්‍රතිපූරණය කරගත යුතු බව.	චක්‍රලේඛ ප්‍රතිපාදන අනුව කටයුතු කිරීමට අදාළ ආයතන ප්‍රධානීන් වෙත ප්‍රතිපූරණය සඳහා දැනුම්දීම හා සිහිකැඳවීම් මෙන්ම සාකච්ඡා මත ලැබිය යුතු වටිනාකම් තහවුරු කර ගනිමින් සිටී.	මේ දක්වා අයකරගෙන නොමැත.

3.59 ජල සම්පත් මණ්ඩලය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	639,962,000	439,551,000	200,411,000	(16,988,000)	තත්වාගණනය කළ
2022	2,067,247,000	1,886,044,000	181,203,000	(27,506,000)	තත්වාගණනය කළ
2023	1,671,727,000	67,270,000	1,604,457,000	1,386,004,000	තත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	විගණන වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්වය
1	වාරිමාර්ග අමාත්‍යාංශය විසින් භූගත ජල විමංසන තොරතුරු ජාලයක් ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය යටතේ මිලදී ගත් ජංගම නොවන වත්කම් සමාලෝචිත වර්ෂය අවසාන වන විට ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා විසින් මණ්ඩලය වෙත ලබා දී තිබුණ ද රු.336,301,185 ක් වූ එම වත්කම් ගිණුම්ගත කර නොතිබුණි.	2022 2023	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුව ව්‍යාපෘති වත්කම් ගිණුම්ගත කිරීම හා ඒ හා සමාන අගයක් ආදායම් ලෙස ගිණුම්ගත කිරීමටත් කටයුතු කල යුතුය.	ව්‍යාපෘතිය ඉදිරිපත් කල වත්කම්වල පිරිවැය නිවැරදිව අගය කිරීම සම්බන්ධව වාරිමාර්ග අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරන ලද කමිටුව විසින් ලබාදුන් නිර්දේශයන්ට අනුකූලව ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් නිවැරදි වත්කම් අගයන් ඇතුළත් කර වාර්තාවක් ජල සම්පත් මණ්ඩලයට ඉදිරිපත් කර 2024 වර්ෂයේ ගිණුම්වල ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ.	ව්‍යාපෘතිය යටතේ මිලදී ගත් ජංගම නොවන වත්කම් ගිණුම්ගත කර නොතිබුණි.
2	රු.1,738,833,941 ක පිරිවැයකට මණ්ඩලයට පවරන ලද අධි තාක්ෂණික උපකරණ	2022 2023	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුව	ව්‍යාපෘතිය ඉදිරිපත් කල වත්කම්වල පිරිවැය පිළිගත නොහැකි බව දන්වා ඇති අතර	අධිතාක්ෂණික උපකරණ සහිත නළ ළිං හා ඒවායේ නඩත්තු

	සහිත නළ ළිං 190 හා ඒවායේ නඩත්තු උපකරණ සහ රු.1,534,077,024 ක වටිනාකමකට මණ්ඩලයට පවරන ලද පරිභෝජන භාණ්ඩවල වටිනාකම ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 11 හි 83 ඡේදය ප්‍රකාරව අගයකර ගිණුම්ගත කර නොතිබුණි.		ව්‍යාපෘති වත්කම් ගිණුම්ගත කිරීම හා ඒ හා සමාන අගයක් ආදායම් ලෙස ගිණුම්ගත කිරීමටත් කටයුතු කල යුතුය.	ව්‍යාපෘති වත්කම්වල පිරිවැය නිවැරදිව අගය කිරීම සම්බන්ධව වාරිමාර්ග අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරන ලද කමිටුව විසින් ලබාදුන් නිර්දේශයන්ට අනුකූලව ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් නිවැරදි වත්කම් අගයන් ඇතුළත් කර වාර්තාවක් ජල සම්පත් මණ්ඩලයට ඉදිරිපත් කර නොමැත.	උපකරණ අගයකර ගිණුම්ගත කර නොමැත.
3	1964 අංක 29 දරන ජල සම්පත් මණ්ඩල පනතේ 16 වන වගන්තිය ප්‍රකාරව අමාත්‍යවරයා විසින් 2017 මාර්තු 16 දිනැති අංක 2010/23 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කළ නියෝගය.				
	(අ) 02 නියෝගය නළ ළිං ඉදිකිරීමේ නියැලෙන සියලු ආයතන මණ්ඩලයේ ලියාපදිංචි වියයුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසාන වන විට ආයතන 42 ක් පමණක් ලියාපදිංචි වී තිබුණි.ඉකුත් වර්ෂයේ ආයතන 72 ක් ලියාපදිංචි වී තිබුණු අතර ලියාපදිංචි වී නොමැති හා	2021 2022 2023	නළ ළිං ඉදිකිරීමේ නියැලෙන සියලු ආයතන හඳුනා ගැනීමට වැඩ පිළිවෙලක් සකස් කර ක්‍රියාත්මක කල යුතුය.	නල ළිං ඉදිකරනු ලබන ආයතන ලියාපදිංචි කිරීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙලක් සකස් කරමින් පවතී.ජල සම්පත් මණ්ඩල පනතෙහි නල ළිං ඉදිකරනු ලබන ආයතන ලියාපදිංචි නොවීම සම්බන්ධයෙන් ගත හැකි නීතිමය ප්‍රතිපාදන නොමැති බැවින් අදාල පනත සංශෝධනය කරනු ලැබූ අතර අවශ්‍ය අනුමැතීන් සඳහා යොමු	නල ළිං ඉදිකරන ආයතන වාර්ෂිකව ලියාපදිංචිකර නොමැත.

ලියාපදිංචිය අළුත් නොකළ ආයතන නළ ළිං ඉදිකිරීම් නොකරන බව තහවුරු කර ගැනීමට හා මණ්ඩලයේ ලියාපදිංචි වී නොමැති ආයතන මොනවාද යන්න හදුනා ගැනීම සදහා ප්‍රමාණවත් වැඩ පිළිවෙලක් මණ්ඩලය සතුව නොතිබුණි. තවද ඉහත නියෝගය පරිදි ලියාපදිංචි ආයතන විසින් නව ඉදිකිරීම් කරනු ලබන සියළු නළ ළිංවල දත්තයන් ඇතුලත් වාර්තාවක් සෑම මාස 03 කට වරක් මණ්ඩලය වෙත ලබා දිය යුතු වුවත් ලියාපදිංචි ආයතන 42 අතරින් උක්ත වාර්තාව ලබා දී තිබුණේ ආයතන 4 ක් පමණකි.			කර ඇත. දැනට ලියාපදිංචි සියළු නල ළිං විදුම් ආයතන දැනුවත් කර නැවත ජල සම්පත් මණ්ඩලයෙහි ලියාපදිංචිය යාවත්කාලීන කරන මෙන් ලිඛිතව දැනුම් දීමට කටයුතු කර ඇත. අදාල රසායණික වාර්තා ජල සම්පත් මණ්ඩලය වෙත ලබා දෙන ලෙස අදාල ආයතන වෙත ලිඛිතව දැනුම් දීම් සිදු කර ඇත.	
(ආ) 03 නියෝගය ජලය බෝතල්කිරීමේ කර්මාන්තයෙහි හා බීම නිෂ්පාදනයෙහි නියැලෙන ආයතනයක් හෝ පුද්ගලයෙකු ස්වභාවික ජල උල්පතක් හෝ	2021 2022 2023	ස්වභාවික ජල උල්පතක් හෝ භූගත ජල නිෂ්පාදන ආයතන විසින් ජල නියැදියන් පරික්ෂාකර වාර්තා ඉදිරිපත් කල යුතුය.	අදාළ විශ්ලේෂණ වාර්තාව ජල සම්පත් මණ්ඩලයට එවන ලෙසට ලිපි මගින් දැනුවත් කර නීතිය ඇතුලත් ගැසට් පත්‍රය අදාල ආයතන වෙත යවා ඇත. ජල සම්පත් මණ්ඩලයේ ලියාපදිංචි වී අදාල ක්‍රමවේදය	ජල මූලාශ්‍රවල රසායනික විශ්ලේෂණ වාර්තා නියමිත පරිදි ඉදිරිපත් වී නොමැත.

භූගත ජලය සිය නිෂ්පාදන කටයුතු සඳහා උපයෝගී කරගනු ලබන්නේ නම් සෑම මාස 6 කට වරක්ම එකී ජල මූලාශ්‍රයේ ජල නියැදියක් රජයේ පිළිගත් රසායනාගාරයකින් පරීක්ෂා කරවාගෙන අදාළ විශ්ලේෂණ වාර්තාව අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතු වුවත්, මණ්ඩලයේ ලියාපදිංචි වී ඇති ආයතන 42 න් උක්ත වාර්තා මණ්ඩලය වෙත ලබා දී තිබුණේ ආයතන 9 ක් පමණකි.			උල්ලංගනය කරන ආයතන හා පුද්ගලයින් සඳහා ජල සම්පත් මණ්ඩල පනත, ගැසට් පත්‍රය හෝ වෙනත් අනපනත් මගින් ගතහැකි නීතිමය ක්‍රියාමාර්ග පිළිබඳව 2024.09.06 දින උපදෙස් ඉල්ලා නීතිපති වෙත ලිපියක් යොමුකර ඇත.	
(ඇ) 06 නියෝගය ස්වභාවික ජල උල්පත් හෝ ගැඹුරු හෝ නොගැඹුරු භූගත ජලය භාවිතා කරන රාජ්‍ය හෝ රාජ්‍ය නොවන ආයතන විසින් අනුගමනය කළ යුතු නියමයන් ඇතුළත් 1 සිට 5 දක්වා නියෝග ප්‍රකාරව කටයුතු නොකරන ආයතන, සංවිධාන හෝ පුද්ගලයන්ට එරෙහිව 1999 අංක 42 දරන	2021 2022 2023	ස්වභාවික ජල උල්පත් හෝ ගැඹුරු හෝ නොගැඹුරු භූගත ජලය භාවිතා කරන ආයතන සම්බන්ධයෙන් අදාල නියෝග අනුව කටයුතු කල යුතුය.	2010/23 ගැසට් පත්‍රය ප්‍රකාරව කටයුතු නොකරන ආයතන, සංවිධාන හෝ පුද්ගලයන්ට එරෙහිව ජල සම්පත් මණ්ඩල පනත, ගැසට් පත්‍රය හෝ වෙනත් අනපනත් මගින් ගතහැකි නීතිමය ක්‍රියාමාර්ග පිළිබඳව 2024.09.06 දින උපදෙස් ඉල්ලා නීතිපති වෙත ලිපියක් යොමුකර ඇත. තවද, ගැඹුරු නල ළිඳක් ඉදිකිරීමේදී හා එමගින් ජලය ලබාගැනීමේදී, 1999 අංක 42 දරන ජල සම්පත් මණ්ඩල	ස්වභාවික ජල උල්පත් හෝ ගැඹුරු හෝ නොගැඹුරු භූගත ජලය භාවිතා කරන රාජ්‍ය හෝ රාජ්‍ය නොවන ආයතන විසින් අනුගමනය කළ යුතු නියමයන් පිළිබඳ උපදෙස් ලබාදී නොමැත.

	පනතින් සංශෝධිත 1964 අංක 29 දරන ජල සම්පත් මණ්ඩල පනතේ 20 වන වගන්තිය ප්‍රකාරව නීත්‍යානුකූලව කටයුතු කර නොතිබුණි.			(සංශෝධන) පනත හා අංක 2010/23 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව අනුගමනය කල යුතු ක්‍රමවේදය සහිත චක්‍රලේඛයක් සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, දිස්ත්‍රික් ලේකම්වරුන්, පළාත් ප්‍රධාන ලේකම්වරුන් හා පොලිස්පති වෙත යොමු කිරීමට කටයුතු සිදුකරමින් පවතී.	
4	භූගත ජල විමංසන ජාලයක් ස්ථාපිත කිරිමේ නියමු ව්‍යාපෘතියේ කාර්යයක් ලෙස ඩබල්කැබ් රථ 2 ජංගම රසායනාගාර බවට පත්කර 2023 පෙබරවාරි 15 දින මණ්ඩලය වෙත භාරදී තිබුණු අතර පරිවර්තන කටයුතු සඳහා රු.11,841,774 ක් පුද්ගලික සමාගම විසින් අයකර තිබුණි. එසේ වූවද එම වාහන දෙකෙන් ඉවත් කර ඇති පසුපස කොටස් (Rear Tube Tail Body) දෙක මණ්ඩලය වෙත ආපසු භාර දී නොතිබුණි. ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104(1) ප්‍රකාරව පරීක්ෂණයක් සිදුකර ඊට වගකිව යුත්තන් නිශ්චය කර නොතිබුණි.	2023	මුදල් රෙගුලාසි අනුව පරීක්ෂණ සිදුකර වගකිව යුත්තන් නිශ්චය කර ක්‍රියාමාර්ග ගත යුතුය.	ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත.	මුදල් රෙගුලාසි 104(1) ප්‍රකාරව පරීක්ෂණයක් සිදුකර ඊට වගකිව යුත්තන් නිශ්චය කර නොතිබුණි..

5	ජංගම රසායනාගාර රථ 2 ක් 2023 මැයි 02 දින මණ්ඩලයේ සභාපති නමින් කැබ් රථ ලෙස ලියාපදිංචි කර තිබුණද ජංගම රසායනාගාර ලෙස ලියාපදිංචිය සංශෝධනය කර නොතිබුණි.	2023	අදාළ කැබ් රථ දෙක ජංගම රසායනාගාර ලෙස ලියාපදිංචි කල යුතුය.	WP PK-6931 හා WP PK-6932 කැබ් රථ ජංගම රසායනාගාර ලෙස ලියාපදිංචි කිරීමට ඉල්ලා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් වෙත අදාල තොරතුරු සහිතව ලිපියක් යොමුකර ඇත.	කැබ් රථ ජංගම රසායනාගාර ලෙස ලියාපදිංචි කර නොමැත.
6	නාගරික සංවර්ධන අධිකාරියට අයත්, බත්තරමුල්ල ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ පිහිටි පර්චස් 40 කින් යුත් ඉඩමක් 2016 දෙසැම්බර් 06 දිනැති අංක අමප/16/2500/724/099 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් වර්ෂ 30 ක කාල සීමාවක් සඳහා ජල සම්පත් මණ්ඩලය වෙත ලබාදීමට තීරණය කර තිබුණි. නව ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීමට යෝජිත, එකී ඉඩම සඳහා රජයේ ප්‍රධාන තක්සේරු කරු විසින් වාර්ෂිකව රු.2,700,000 ක බදු මුදලක් තීරණය කර තිබුණි.ඉඩම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය සමග බදු ගිවිසුමකට අත්සන් කිරීමකින් තොරව මණ්ඩලය විසින් 2016 වර්ෂයේ සිට 2023 ඔක්තෝබර් දක්වා	2022 2023	විධිමත් අනුමැතියක් මත හිඟ මුදල කපා හැරිය යුතු අතර නාගරික සංවර්ධන අධිකාරිය සමග බදු ගිවිසුමක් අත්සන් කිරීමට අවශ්‍ය එකඟතාවය ලබා ගැනීම කල යුතුය.	භූගත ජල විමංශන ජාල ව්‍යාපෘතිය මඟින් ඉදිකිරීමට නියමිත දත්ත මධ්‍යස්ථානය සහ ජල සම්පත් මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය සමඟ රසායනාගාරය මෙම ඉඩමේ ස්ථාපනයට සැළසුම් කර අවශ්‍ය අනුමැතීන් පවා ලබා ගෙන තිබුණද නාගරික සංවර්ධන අධිකාරිය විසින් ගිවිසුම අත්සන් කිරීම ප්‍රමාදය නිසා ව්‍යාපෘති කාලය අවසන්වීමත් සමඟ එම අවස්ථාව මග හැරුණි. බස්නාහිර පළාත් ඉඩම් කොමසාරිස් වෙත ගෙවිය යුතුව තිබූ හිඟ මුදල වූ රු.56,409,666.00 ගෙවීමෙන් හෝ අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් කපා හැරීමෙන් පසු ගිවිසුම අත්සන් කරන බව නාගරික සංවර්ධන අධිකාරිය දන්වා සිටීම සැලකිල්ලට ගෙන ජල සම්පත් මණ්ඩලය දැනටමත් මෙම හිඟ	හිඟ මුදල කපා හැරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම සඳහා සංදේශයක් ඉදිරිපත් කර හෝ බදු ගිවිසුමක් අත්සන් කිරීමට අවශ්‍ය එකඟතාවය ලබා ගැනීම කර නොමැත

කුලිය වශයෙන් රු.24,906,879 ක් එම අධිකාරියට ගෙවා තිබුණද ඉඩම භාවිත කර නොතිබුණි.එමෙන්ම භූ ගත ජල විමංසන තොරතුරු ජාලයක් ස්ථාපිත කිරීම සඳහා වූ නියමු ව්‍යාපෘතිය යටතේ මෙම ඉඩමේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා 2018 වර්ෂයේ සිට ප්‍රතිපාදන වෙන්වී තිබුණද විධිමත් බදු ගිවිසුමක් නොමැති වීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමට නොහැකි වී තිබුණි.එමෙන්ම රජයේ ඉඩම් ආඥා පනතේ 6(1) වගන්තිය යටතේ කොළඹ 7 හෙක්ටර් කොබ්බෑකඩුව මාවතේ පිහිටි ඉඩම සඳහා ගෙවීමට ඇති රු.56,409,666,000 ක හිඟ බදු මුදල ගෙවීමෙන් හෝ නිසි ක්‍රමවේදයක් යටත් කපා හැරීම සිදු කරන තෙක් ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ පිහිටි මෙම ඉඩම සඳහා දීර්ඝ කාලීන බදු ගිවිසුමකට එළඹීම නාගරික සංවර්ධන අධිකාරිය ප්‍රතික්ෂේප කර තිබුණි.

මුදල කපා හැරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම සඳහා සංදේශයක් ඉදිරිපත් කිරීමට කටයුතු සූදානම් කර ඇත.

7	කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 හි විධිවිධාන පරිදි මණ්ඩලයේ කාර්ය මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කිරීමට පෙර කනිෂ්ඨ කළමනාකරණ මට්ටමේ JM-1 වැටුප් කාණ්ඩයට අයත්ව තිබූ ඇතැම් තනතුරු ප්‍රතිව්‍යුහගතකරණයේ දී MM කාණ්ඩයේ (මධ්‍යම කළමනාකරණ මට්ටම) තනතුරු බවට පරිවර්තනය කර තිබුණි. 2012.10.03 දින සිට බලපැවැත්වෙන පරිදි ප්‍රතිව්‍යුහගතකරණයෙන් පසු එම තනතුරු වලට අන්තර්ග්‍රහණය කරනු ලැබූ නිලධාරීන් 5 දෙනෙකු හට වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ 01/2010 හා 01/2013 හා 01/2018 යටතේ සහනදායි පදනම මත මෝටර් රථ ආනයන බලපත්‍ර නිකුත් කිරීමේදී ප්‍රතිව්‍යුහගත කිරීමට පෙර කාලසීමාවද MM කාණ්ඩයේ තනතුරු දැරූ ලෙස සලකා සාවද්‍ය ලෙස සේවා කාලය ගණනය කර උක්ත මෝටර් රථ ආනයන බලපත්‍ර නිකුත් කිරීමට නිර්දේශ කර තිබුණි.පළමු	2023	පරීක්ෂණ කටයුතු කඩිනමින් අවසන් කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කල යුතුය.	මෙම නිලධාරීන් සම්බන්ධව ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය විසින් මූලික විමර්ෂණයක් සිදුකර වාර්තාවක් ලබා දී ඇති අතර, ඒ අනුව අදාල නිලධාරීන්ට චෝදනා පත්‍ර නිකුත් කර ඇත.මේ සම්බන්ධව ජල සම්පත් මණ්ඩලය විසින් විධිමත් විනය පරීක්ෂණයක් සිදු කර ඇත.	ජල සම්පත් මණ්ඩලය විසින් සිදු කරනු ලැබූ විනය පරීක්ෂණය මඟින් මෙයට අදාළ නිළධාරීන් පස් දෙනා සියළු චෝදනා වලින් නිදහස් කර ඇතත් එම සහනදායී වාහන ආනයන බලපත්‍ර නිර්දේශ කල නිලධාරීන් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

	සහනදායී වාහන ආනයන බලපත්‍ර ලබාගත් මෙම නිලධාරීන්ගෙන් නිලධාරීන් තිදෙනෙකුට 2018 වර්ෂයේ නැවත දෙවන බලපත්‍රය ලබා ගැනීමටද අවශ්‍ය නිර්දේශ ලබා දී තිබුණි. බලපත්‍ර ලබාගෙන වසර 10 ක කාලයක් ගත වී තිබුණද එම නිලධාරීන් සඳහා ආරම්භ කර තිබූ විනය පරීක්ෂණය මේ දක්වා අවසන් කර නොතිබුණි. ඒ සම්බන්ධ අදාල නිර්දේශ ලබා දුන් නිලධාරීන් සම්බන්ධව විනයානුකූලව කටයුතු කිරීමට මණ්ඩලය විසින් මේ දක්වා පියවර ගෙන නොතිබුණි.එම නිලධාරීන් විශ්‍රාම ගැනිමේදී රජයට අයවිය යුතු මෙම අලාභ අයකර නොගෙන පාරිතෝශිත ගෙවා තිබුණි.				
8	ජල සම්පත් මණ්ඩල පනත සංශෝධනය කිරීමට අදාළ කෙටුම්පත පිළියල කිරීම සඳහා පෞද්ගලික නීතිඥයෙකු හා නීතිඥ සමාගමක සේවය ලබා ගෙන විගණිත දිනය	2021 2022 2023	ජල සම්පත් මණ්ඩල පනත සංශෝධනය කිරීමේ කටයුතු කඩිනම් කළ යුතුය.	යෝජිත ජාතික ජල ප්‍රතිපත්තිය ප්‍රකාශ කිරීම සහ ජාතික ජල සම්පත් ලේකම් කාර්යාලය පිහිටුවීම ද ඒ හරහා ජල සම්පත් මණ්ඩලය ප්‍රතිව්‍යුහ ගත කිරීම යන කරුණු හේතුකොට ගෙන ජල	පනත සංශෝධනය කර නොමැත.

	වන විට රු.645,000ක් ගෙවා තිබුණු අතර පනත සංශෝධනය කළ යුතු බව හඳුනා ගෙන වසර 4 ක් ගත වී තිබුණද එම කාර්යය ඉටුකර නොතිබුණි.				සම්පත් මණ්ඩල පනත සංශෝධනයකිරීම ඇණහිට ඇත.	
9	2016 වර්ෂයේදී අවුරුදු 30 ක කාලසීමාවක් සඳහා කුලී පදනම මත මණ්ඩලයට පවරා තිබූ අනුරාධපුර සංචාරක බංගලාව ඉදිකර ඇති ඉඩම සඳහා වසර 7 ක් ඉක්මවා තිබුණද කුලී ගිවිසුමකට එළඹ නොතිබුණු අතර මෙම ඉඩම සඳහා කිසිදු කුලියක් ගෙවීමට මේ දක්වා කටයුතු කර නොමැත.	2023		වැව රක්ෂිතය තුළ පිහිටි ඉඩමක් සඳහා කුලී ගිවිසුමකට එළඹීමට හැකියාව විමසා බලා ඒ අනුව කටයුතු කල යුතුය.	අනුරාධපුර සංචාරක නිවස පිහිටි ඉඩම සම්බන්ධයෙන් බදු ගෙවීම සඳහා ඉඩම මැනුම් කරවා ගැනීමට ප්‍රාදේශීය ලේකම් හරහා බලය ලත් මිනින්දෝරුවරයෙකු සම්බන්ධ කරගෙන කටයුතු සිදු කර ඇත.	ඉඩම වැව රක්ෂිතය තුල පිහිටා ඇති බැවින් මැනීම් කටයුතු සිදු කර නොතිබුණි.
10	මණ්ඩලය විසින් 2018 වර්ෂයේ සිට භූ ජල විද්‍යාඥයින් ලියාපදිංචි කර ඔවුන් වෙත පෞද්ගලිකව වෘත්තීමය සේවාවන් සැපයීමට අවසරය ලබා දී තිබුණි. 1964 අංක 29 අංක දරණ ජල සම්පත් මණ්ඩල පනත යටතේ ඒ සඳහා නෛතික ප්‍රතිපාදන ලැබී නොතිබුණ අතර භූ ජල විද්‍යාඥයින් 12ත් 18ත් අතර සංඛ්‍යාවක් වාර්ෂිකව ලියාපදිංචි කර තිබුණි.	2022 2023		අදාළ විධිවිධාන ඇතුළත්ව ජල සම්පත් මණ්ඩල පනත සංශෝධනය කිරීමට කටයුතු කළ යුතුය.	මෙම කටයුතු විධිමත්ව සිදු කිරීම සඳහා ජල සම්පත් මණ්ඩල පනත සංශෝධනයේදී අදාල කරුණු ඇතුළත්ව අවශ්‍ය අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇති අතර අධ්‍යක්ෂක මණ්ඩලයේ උපදෙස් පරිදි මේ සඳහා වන ඉදිරි වැඩකටයුතු සිදුකරමින් පවතී.	ජල සම්පත් මණ්ඩල පනත යටතේ විධිමත් අධිකාරී බලයක් නොමැතිව භූ ජල විද්‍යාඥයින් ලියාපදිංචි කර තිබුණි.

11	ශ්‍රී ලංකාවේ භූගත ජලයේ පවතින ප්‍රමාණාත්මක හා ගුණාත්මක තත්ත්වයන් කළමනාකරණය කිරීම සඳහා පද්ධතියක් ස්ථාපනය කිරීමට, ශ්‍රී ලංකාව සඳහා භූගත ජල විමංසන ජාලයක් ස්ථාපිත කිරීමේ නියමු ව්‍යාපෘතිය වකුගඩු රෝගය විශාල වශයෙන් ව්‍යාප්ත වී ඇති අනුරාධපුරය,පොළොන්නරුව,මොණරාගල සහ පුත්තලම ලෙස තෝරා ගත් දිස්ත්‍රික්ක 4 ක ක්‍රියාත්මක කිරීම සඳහා 2015 ජූලි 29 දිනැති අංක අමප/15/1087/644/005 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමැතිය ලබා දී තිබුණි.එකී ව්‍යාපෘතිය යුරෝ 20,629,921ක පිරිවැයකට ක්‍රියාත්මක කිරීම සඳහා වාරිමාර්ග අමාත්‍යාංශ ලේකම් විසින් නෙදර්ලන්තයේ රෝයල් අයිකල්කැම්ප් ආයතනය සමඟ 2017 ඔක්තෝබර් 03 දින ගිවිසුමකට එළඹ තිබුණු අතර ව්‍යාපෘතියේ කටයුතු 2022 දෙසැම්බර් 31 දින අවසන් කර තිබුණි. මෙම	2021 2022	ගොඩනැගිල්ල ඉදිකිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.	රත්මලාන වැඩබිම් කාර්යාලයෙහි (Workshop) සියලු අවශ්‍ය විශේෂාංග සහිතව දත්ත මධ්‍යස්ථානය ව්‍යාපෘති අරමුණු සහ අවශ්‍යතාවයන් අනුව මේ වන විට ස්ථාපනය කර කටයුතු කරගෙන යනු ලබයි.	දත්ත මධ්‍යස්ථාන ගොඩනැගිල්ලක් සැලසුමට ඉදි නොකිරීම නිසා ඉතිරි වූ මුදල ව්‍යාපෘතියේ මූලික අරමුණු හා අපේක්ෂිත ප්‍රතිලාභ ඉටුකර ගැනීමට ක්‍රියාත්මක කර නොමැත.

	ව්‍යාපෘතියේ පිරිවැය වූ යුරෝ 20,629,921.18 හෙවත් රු.5,521,329,000 න් සියයට 85 ක් එනම් යුරෝ 17,535,433 ක් නෙදර්ලන්තයේ රේබෝ බැංකුවෙන් (Rabo Bank) වාර්ෂිකව සියයට 1.45 බැගින් වූ සහන පොලී අනුපාතයක් මත වර්ෂ 10ක් තුළ සමාන වාරික 20 කින් ආපසු ගෙවීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් ලබා ගෙන තිබුණි. ඉතිරි සියයට 15 වන යුරෝ 3,094,488.18 ක මුදල ශ්‍රී ලංකාවේ හැටන් නැෂනල් බැංකුව වෙතින්, වසර 3 ක සහන කාලයකින් පසු 2025 දෙවන අර්ධ වර්ෂයේ සිට වසර 15 කින් ගෙවීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් ලබා ගෙන ව්‍යාපෘතිය 2022 වර්ෂයේ නිම කර තිබුණද එහි මූලික අවශ්‍යතාවයක් වූ දත්ත මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ඉදි නොකිරීම නිසා ව්‍යාපෘතියේ මූලික අරමුණු හා අපේක්ෂිත ප්‍රතිලාභ නිසිලෙස ලබාගත නොහැකි වී තිබුණි.			
12	බත්තරමුල්ල නාගරික සංවර්ධන අධිකාරියට අයත් ඉඩමක දත්ත	2022 2023	අත්තිකාරම් නොපමාව අයකරගත යුතු	මණ්ඩලයේ පවතින දත්ත ගොඩනැගිල්ලක් තුළ මධ්‍යස්ථානය ජල ස්ථාපිත කිරීම සම්පත්

	මධ්‍යස්ථාන ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා රු. මිලියන 259.1 ක් හෙවත් යුරෝ 1,473,462 ක් වෙන්කර තිබුණු අතර රු. මිලියන 329.8 ක් හෙවත් යුරෝ 1,875,447 ක අවිනිශ්චිත වෙන් කිරීමද දත්ත මධ්‍යස්ථානය සඳහා භාවිතා කිරීමට තීරණය කර තිබුණි. මෙකී මුළු වටිනාකමින් සියයට 15 ක් වූ රු.මිලියන 544.2 ක් හෙවත් යුරෝ 3,094,488 ක් අත්තිකාරම් ලෙස නෙදර්ලන්ත කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණු නමුත් ඉඩම් හිමිකාරීත්වය ලැබී නොතිබීම හේතුවෙන් දත්ත මධ්‍යස්ථානය ඉදි කර නොතිබුණු අතර ගෙවා තිබූ යුරෝ 3,094,488 ක අත්තිකාරම් මුදල නිශ්කාර්ය වී තිබුණි.		අතර වගකිවයුතු මණ්ඩලයේ නිලධාරීන් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතුය.	හේතුවෙන් ඇති වූනු ව්‍යාපෘති ඉතුරුම් මහා භාණ්ඩාගාරයේ විදේශ සම්පත් දෙපාර්තුමේන්තුව වෙත සහ අධ්‍යක්‍ෂ (විදේශ ණය -1)- භාණ්ඩාගාර දෙපාර්තුමේන්තුව, ප්‍රධාන ගණකාධිකාරී- වාරිමාර්ග අමාත්‍යාංශය වෙතද පිටපත් සහිතව දැනුම් දී ඇති ඇත. ඒ අනුව මෙම ශේෂය පදනම්ව ණය වාරිකයන් ගෙවීමේදී එම අඩුකිරීමද ඇතුලත්ව ණය ගෙවීම් සිදු කරන බව විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් දන්වන ලදී.	මණ්ඩලයේ පවතින ගොඩනැගිල්ලක් තුල ස්ථාපිත කිරීම හේතුවෙන් වෙනමම ඉදිකිරීමක් සිදුකර නොතිබුණි.
13	ජල සම්පත් මණ්ඩලය 1978 වර්ෂයේ සිට පවත්වාගෙන ගොස් තිබූ කොළඹ 07 හෙක්ටර් කොබ්බෑකඩුව මාවතේ ප්‍රධාන කාර්යාලයේ පිහිටි ඉඩම සඳහා 2013	2021 2022 2023	නාගරික සංවර්ධන අධිකාරියට අයත් ඉඩම සඳහා විධිමත් බදු ගිවිසුමක් අත්සන් කර මණ්ඩලයේ ප්‍රධාන	නාගරික සංවර්ධන අධිකාරිය සමඟ එකඟත්වයකට පැමිණීමට කටයුතු කරමින් සිටියි.	ආයතනයට ස්ථිර ගොඩනැගිල්ලක් පවරා ගෙන නොතිබුණි.

වර්ෂයේ සිට වාර්ෂිකව රු.12,772,000 ක බදු මුදලක් ගෙවා වාර්ෂික බදු බලපත්‍රයක් ලබා ගන්නා ලෙස තිඹිරිගස්යාය ප්‍රාදේශිය ලේකම්වරයා මණ්ඩලය වෙත දැනුම් දී තිබුණද ඊට අනුකූලව කටයුතු නොකිරීම හේතුවෙන් තිඹිරිගස්යාය ප්‍රාදේශිය ලේකම් විසින් 2019 වර්ෂයේදී කොළඹ මහාධිකරණයේ නඩුවක් ගොනුකර තිබුණි. පසුව ඉඩමේ භුක්තිය පිළිබඳව සමතයකට පත්වන ලෙස නීතිපතිවරයා විසින් තිඹිරිගස්යාය ප්‍රාදේශිය ලේකම් වෙත උපදෙස් ලබා දී තිබියදී නීතිපතිවරයාගේ උපදෙස් පරිදි කටයුතු නොකර අවුරුදු 45 ක් පමණ ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන ගිය පරිශ්‍රය එවකට අග්‍රාමාත්‍යවරයා භාවිතා කළ නිළ නිවස පුළුල් කිරීමේ කාර්ය සඳහා යොදා ගැනීමට අමාත්‍ය මණ්ඩල අනුමැතියකින්ද තොරව භාරදී තිබුණි. ප්‍රධාන කාර්යාලය 2021 ජූලි 18 දින සිට 2022 ජූලි 15 දක්වා රාජගිරිය ප්‍රදේශයේ පෞද්ගලික කුලී	කාර්යාලය එහි ඉදිකර ගැනීමට කටයුතු කල යුතුය.

	ගොඩනැගිල්ලකද, 2022 අගෝස්තු 01 දින සිට නාවල කොස්වත්ත ප්‍රදේශයේ පෞද්ගලික ගොඩනැගිල්ලකද පවත්වා ගෙන ගොස් තිබුණි. ඒ සඳහා 2021 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා ගොඩනැගිලි කුලී ලෙස රු.30,511,722 ක් ගෙවා තිබුණි.				
14	භූගත ජල විමංසන ජාලයක් ස්ථාපිත කිරිමේ නියමු ව්‍යාපෘතිය යටතේ යුරෝ 2,240,030,328 කට හෙවත් රුපියල් මිලියන 397.98 කට මිලදී ගත් අධි තාක්ෂණික විදුම් යන්ත්‍ර (MS – FT drilling mountel truck) 02 ක් භාවිතයේ යොදවා තිබූ අතර ව්‍යාපෘතිය අවසන් වීමෙන් පසු මෙම යන්ත්‍ර 02 මණ්ඩලයට පවරා දී තිබුණද. විගණිත දිනය වූ 2023 මාර්තු 21 වන විටත් එම යන්ත්‍රවල නඩත්තුව සහ ක්‍රියාකරවීම සම්බන්ධ ගැටලු හේතුවෙන් මණ්ඩලය විසින් කිසිදු කාර්යකට භාවිතා නොකර නිෂ්කාර්යව තබා තිබුණි.	2022	මෙම අධි තාක්ෂණික විදුම් යන්ත්‍ර භාවිතයට ගැනීම සඳහා යෝග්‍ය වැඩපිළිවෙලක් සකස් කර ක්‍රියාත්මක කළ යුතුය.	ලෝක බැංකු ආධාර මත ක්‍රියාත්මක වන ඒකාබද්ධ ජල පෝෂක සහ ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය භූගත ජල සම්පත් කළමනාකරණ සවි බල ගැන්වීම සඳහා ජල සම්පත් මණ්ඩලය විසින් කරනු ලබන ක්‍රියාකාරකම් යටතේ සිදුකරනු ලබන භූ භෞතික පර්යේෂණ, රසායනික විශ්ලේෂණ, විදුම් කටයුතු සහ භූගත ජල සම්පත් නිමානයන් සඳහා වාහන යන්ත්‍රෝපකරණ සහ විද්‍යාත්මක උපකරණයන් යොදා ගැනීමට සැලසුම් කිරීම.	අධි තාක්ෂණික විදුම් යන්ත්‍ර හා උපකරණ නිශ්කාර්යව පැවතිණි.

3.60 ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	බදු පෙර ලාභය (අලාභය) රු.	මතය
2021	36,424,000	3,307,000	33,117,000	12,206,000	තත්ත්වාගණනය කළ
2022	43,505,000	3,503,000	40,002,000	8,970,000	තත්ත්වාගණනය කළ
2023	54,079,640	4,758,029	49,321,611	13,044,518	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණ	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිති 11 හි අතිරේකයට පටහැනිව ඉකුත් වර්ෂ වල භාණ්ඩාගාර ප්‍රදානයන් යටතේ මිලදී ගෙන ක්‍රමක්ෂය කර ඉතිරි වූ රු.523,355 ක මුදල විලම්බිත ආදායමක් ලෙස දක්වා තිබුණු අතර ඉකුත් වර්ෂ ආදායමක් ලෙස හඳුනාගෙන නොතිබුණි.	2023	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව භාණ්ඩාගාර ප්‍රදානයන් පවත්නා වර්ෂයේ ආදායම් ලෙස හඳුනාගැනීමට කටයුතු කළ යුතුය	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි 48 ඡේදය ප්‍රකාරව ප්‍රදාන ලෙස හඳුනාගෙන තිබූ වත්කම්වල ක්‍රමක්ෂය වටිනාකම ආදායමක් ලෙස දැක්වීමට කටයුතු කිරීමට සටහන් කරගෙන තිබුණි.	මූල්‍ය ප්‍රකාශන නිවැරදි කර නොතිබුණි.
2	වාර්ෂික ප්‍රසාද දීමනා ගෙවීම් හා ඉතිරි නිවාඩු සඳහා ගෙවීම් වෙනුවෙන් භාණ්ඩාගාරයෙන් ලබාගත් අනුමැතියක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.	2023	දිරි දීමනා හා ප්‍රසාද දීමනා ගෙවීම සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගැනිමට කටයුතු කළ යුතුය.	වාර්ෂික ප්‍රසාද දීමනා හා ඉතිරි නිවාඩු සඳහා ගෙවීම භාණ්ඩාගාර චක්‍රලේඛයට අනුව සිදු කිරීමට සටහන් කරගෙන තිබුණි.	වාර්ෂික ප්‍රසාද දීමනා ගෙවීම් සඳහා අනුමැතිය ගෙන නොතිබුණි.

3	2017 අංක 04 දරන ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභා පනතේ 12(ඇ) වගන්තිය අනුව ඉංජිනේරු වෘත්තිකයන්ගේ වෘත්තීය වැරදි හැසිරීම්වලට අදාළව යම් කාරණා පිළිබඳව පරීක්ෂණ පැවැත්විය යුතු වුවද ඉංජිනේරු වෘත්තියේ නියැලෙන වෘත්තිකයන් විසින් අනුගමනය කල යුතු බවට හඳුන්වා දී තිබු වෘත්තිය ආචාරධර්ම අනුව ඉංජිනේරුවන් විසින් කටයුතු සිදු කරන්නේද යන්න පිළිබඳ හඳුනාගැනිමට හා පරික්ෂා කිරීමට අදාලව පටිපාටින් හඳුන්වාදි නොතිබූ අතර ඒ පිළිබඳ කිසිදු පරිකෂාවක් කර නොතිබුණි.	2021 2022 2023	පනතේ විධිවිධාන අනුව ඉංජිනේරුවන්ගේ වෘත්තීය ආචාරධර්ම පිළිපැදීම පරීක්ෂා කළ යුතුය.	මෙයට අදාල අභ්‍යන්තර ක්‍රියාදාමය අවසන් කිරීමට කටයුතු කර තිබුණි.	ඉංජිනේරු වෘත්තිකයන්ගේ වෘත්තීය ආචාරධර්ම පිළිපැදීම පරීක්ෂා කර නොතිබුණි.
4	2017 අංක 04 දරන ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභා පනතේ 14(1) වගන්තිය අනුව ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය (IESL) හා ශ්‍රී ලංකා ව්‍යවස්ථාපිත ඉංජිනේරු ආයතනය (IIESL) යන ආයතන දෙකෙහි ලියාපදිංචි සාමාජිකයින් ඉංජිනේරු සභාවේ සාමාජිකයින් ලෙස	2021 2022 2023	ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ ලියාපදිංචි නොවූ සාමාජිකයින් සභාවේ ලියාපදිංචි කිරීමට පියවර ගත යුතුය.	IESL හා IIESL ආයතන දෙකෙහි අදාල සාමාජිකයන් ලියාපදිංචි කරවා ගැනීම සඳහා පියවර කිහිපයක් ගනිමින් තිබුණි.	ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ ලියාපදිංචි නොවූ සාමාජිකයින් සභාවේ ලියාපදිංචි කිරීමට මෙතෙක් පියවර ගෙන නොතිබුණි.

	ලියාපදිංචි කිරීමට යෝජිතව ඇති බැවින් සාමාජිකයින් විසින් ඉංජිනේරු සභාවේ ලියාපදිංචි ගාස්තුව ඉහත ආයතන දෙකෙහි සාමාජික ගාස්තු සමග ගෙවා තිබුණි. ඒ අනුව ඉහත ආයතන දෙකෙහි 2023 වර්ෂයේ පිළිවෙලින් 19,689 ක් හා 8,968 ක් වශයෙන් 28,657 ක් සාමාජිකත්වය ලබාගෙන තිබූ නමුත් ඉන් පිළිවෙලින් 5,643 ක් හා 6,904 ක් වශයෙන් 12,547 ක් හෙවත් සියයට 43.78 ක් ඉංජිනේරු සභාවේ ලියාපදිංචිය ලබාගෙන නොතිබුණි. ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ ලියාපදිංචි නොවූ සාමාජිකයින් ඉංජිනේරු වෘත්තියෙහි නිරත නොවන බවට තහවුරුවක් විගණනයට ඉදිරිපත් නොවීය.				
5	1985 අංක 01 දරන සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධිත) පනතේ 09(2) වගන්තිය කෙරෙහි අවධානය යොමු නොකර සභාව විසින් අරමුදලට දායක මුදල් ගෙවීමේදී ඉපයීම් ගණනය කිරීම සඳහා සේවකයින්ගේ ප්‍රවාහන දීමනා, ඉන්ධන දීමනා,	2022 2023	සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධිත) පනතේ 09(2) වගන්තියෙහි සඳහන් නියමයන්ට අනුකූලව දායක මුදල් ගෙවීමට කටයුතු කළ යුතුය.	අරමුදලට දායක මුදල් ගෙවීමේදී ඉපයීම් ගණනය කිරීම සඳහා තවදුරටත් සේවකයින්ගේ ප්‍රවාහන දීමනා, ඉන්ධන දීමනා, දුරකථන දීමනා, අදාළ කරගෙන තිබීම හේතුවෙන් අදාළ දීමනා වලින් සියයට 15 බැගින් සභාවේ දායක මුදල් ලෙස වැඩිපුර	සේවක අර්ථසාධක අරමුදල් දායක මුදල් ගෙවීමේදී ඉපයීම් ගණනය කිරීම සඳහා සේවකයින්ගේ ප්‍රවාහන දීමනා, ඉන්ධන දීමනා, දුරකථන දීමනා, වෘත්තීය

	දුරකථන දීමනා, වෘත්තීය දීමනා හා විශේෂ දීමනා අදාළ කරගෙන තිබීම හේතුවෙන් අදාළ දීමනා වලින් සියයට 15 බැගින් සභාවේ දායක මුදල් ලෙස වැඩිපුර ගෙවා තිබුණු අතර සියයට10 බැගින් සේවකයාගේ දායකය වැඩිපුර අයකරගෙන ගෙවා තිබුණි.				ගෙවා තිබුණු අතර සියයට10 බැගින් සේවකයාගේ දායකය වැඩිපුර අයකරගෙන ගෙවා තිබුණි	දීමනා හා විශේෂ දීමනා අදාළ කරගෙන තිබීම මෙතෙක් නිවැරදි කර නොතිබුණි.
6	1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ 44 වන වගන්තිය කෙරෙහි අවධානය යොමු නොකර සභාව විසින් අරමුදලට දායක මුදල් ගෙවීමේදී පාරිශ්‍රමිකය ගණනය කිරීම සඳහා ප්‍රවාහන දීමනා, ඉන්ධන දීමනා, දුරකථන දීමනා, වෘත්තීය දීමනා හා විශේෂ දීමනා අදාළ කර ගැනීම හේතුවෙන් අදාළ දීමනා වලින් සියයට 3 බැගින් වැඩිපුර ගෙවා තිබුණි.	2022 2023		1980 අංක 46 දරන සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් පනතේ 44 වගන්තිය සඳහන් නියමයන්ට අනුකූලව දායක මුදල් ගෙවීමට කටයුතු කළ යුතුය	අරමුදලට දායක මුදල් ගෙවීමේදී ඉපයීම් ගණනය කිරීම සඳහා තවදුරටත් සේවකයින්ගේ ප්‍රවාහන දීමනා, ඉන්ධන දීමනා, දුරකථන දීමනා, අදාළ කරගෙන තිබීම හේතුවෙන් අදාළ දීමනා වලින් සියයට 3 බැගින් වැඩිපුර ගෙවා තිබුණි.	සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් ගෙවීම් කිරීමේදි ඉපයීම් ගණනය කිරීම සඳහා සේවකයින්ගේ ප්‍රවාහන දීමනා, ඉන්ධන දීමනා, දුරකථන දීමනා, වෘත්තීය දීමනා හා විශේෂ දීමනා අදාළ කරගෙන තිබීම මෙතෙක් නිවැරදි කර නොතිබුණි.
7	ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ VIII වැනි පරිච්ඡේදයේ 10:1 උප වගන්තිය ප්‍රකාරව නිවසේ සිට රාජකාරි ඉටුකිරීමේදී රාජකාරි කල කාලය හා ඉටුකළ	2021 2022 2023		ආයතන සංග්‍රහයේ නියමයන්ට අනුකූලව කටයුතු කල යුතුය.	ආයතන සංග්‍රහයේ නියමයන්ට අනුකූලව මෙතෙක් කටයුතු කර නොතිබුණි.	නිවසේ සිට රාජකාරි ඉටුකිරීමේදී රාජකාරි කල කාලය හා ඉටුකළ රාජකාරි පිළිබඳව තහවුරු කර

	රාජකාරි පිළිබඳව තහවුරු කර ගත නොහැකි බැවින් අතිකාල හෝ සමාන දීමනා නොගෙවිය යුතු වුවත් 2023 ජනවාරි සිට දෙසැම්බර් දක්වා සති අන්ත හා රජයේ නිවාඩු දින 96 ක් නිවසේ සිට රාජකාරි කටයුතු ඉටු කිරිම වෙනුවෙන් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරිනියට වැටුපෙන් 1/20 ක් බැගින් එකතුව රු. 263,240 ක් නිවාඩු දින වැටුප් ලෙස සහ රු.47,387 ක් සේවක අර්ථ සාධක අරමුදල් දායකය හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් දායකය ලෙස ගෙවා තිබුණි.				ගෙවීම් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.
8	මු.රෙ. 225 (1) හා (2) ප්‍රකාරව ගෙවීම් සඳහා ඉදිරිපත් කරන වවුචර නියමිත ආකෘති පත්‍රවල නිවැරදි ලෙසත් සම්පූර්ණ ලෙසත් පිළියෙලකර ඉදිරිපත්කල යුතු වුවද සභාවේ ගෙවීම්, වැටුප් හා අතිකාල ගෙවීම් සඳහා භාවිතාකර තිබූ වවුචර පත් පිළිවෙලින් පොදු 37, පොදු 33, හා පොදු 35 (අ) ආකෘතියෙන් බැහැරව සකස්කර තිබූ අතර	2022 2023	මුදල් රෙගුලාසි ප්‍රකාරව ගෙවීම් සඳහා නියමිත ආකෘති පත්‍ර භාවිතා කළ යුතුය.	අතිකාල හා දින වැටුප් ගෙවීම් සඳහා භාවිතාකර තිබූ වවුචර පත් සංශෝධනයට ලක් කර තිබුණි.	සභාවේ ගෙවීම් හා වැටුප් ගෙවීම් වවුචර පත් සංශෝධනය කර නොතිබුණි.

	නියමිත ආකෘතියෙන් බැහැරව ගෙවීම් වවුචර් භාවිතය සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගෙන් ලබාගත් අනුමැතියක්ද විගණනයට ඉදිරිපත් නොකෙරුණි.				
9	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කර ඇති බඳවා ගැනීමේ පටිපාටිය අනුව HM 1-3 වැටුප් කේතය යටතේ වන ප්‍රධාන තොරතුරු තාක්ෂණ නිලධාරී තනතුර සඳහා MM මට්ටමේ තනතුරක වසර 5ක පළපුරුද්දක් අවශ්‍ය වුවද එම මට්ටමේ වසරක සුදුසු කම් සපුරා තිබුණු MM 1-1 වැටුප් කේතය යටතේ ප්‍රධාන තොරතුරු තාක්ෂණ නිලධාරී තනතුර දැරූ නිලධාරිණිය HM 1-3 වැටුප් කේතය යටතේ ප්‍රධාන තොරතුරු තාක්ෂණ නිලධාරි තනතුරේ රාජකාරි ඉටුකිරිම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2022 නොවැම්බර් 28 දින පත්කර තිබුණි. ඒ සඳහා රාජකාරි ඉටු කිරිමේ දීමනා, සේවක අර්ථ සාධක අරමුදලේ දායකය හා සේවක භාරකාර අරමුදලේ දායකය ලෙස	2022 2023	කළමණාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ නියෝග අනුව කටයුතු කළ යුතුය. සාවද්‍ය ලෙස සිදුකළ ගෙවීම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.	ප්‍රධාන තොරතුරු තාක්ෂණ නිලධාරි තනතුරේ රාජකාරි ඉටුකිරිම සඳහා පත් කළ නිලධාරීනිය වෙත තව දුරටත් ඉන්දන දීමනා හා ප්‍රවාහන දීමනා ගෙවමින් පැවතුණි.	රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට පටහැනිව සිදුකරන ලද ප්‍රවාහන දීමනා අයකර ගෙන නොතිබුණි.

	පිළිවෙලින් රු.391,184 ක්, රු.58,678 ක් හා රු.11,736 ක් වශයෙන් රු. 461,598 ක් ගෙවා තිබුණි. තවද 2022 ජනවාරි 14 දිනැති අංක 01/2015(ii) දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට පටහැනිව වැටුප් කේත අංක MM 1-1 යටතේ වන තනතුරක් දැරූ ප්‍රධාන තොරතුරු තාක්ෂණ නිලධාරිනියට 2022 ජනවාරි සිට ජුනි දක්වා රු. 40,000 බැගින් හා 2022 ජූලි සිට දෙසැම්බර් දක්වා රු. 50,000 වන පරිදි රු. 540,000 ක ප්‍රවාහන දීමනාවක් හා රු.42,550 බැගින් රු. 263,804 ක් වූ ඉන්ධන දීමනාවක් ගෙවා තිබුණි.				
10	සමාලෝචිත වර්ෂය තුල ඉතිරි කරගත් නිවාඩු වෙනුවෙන් නිලධාරින් දෙදෙනෙකුට ගෙවීම සඳහා 2023 මූල්‍ය ප්‍රකාශන තුල රු.84,135 ක් උපචිත කර තිබුණි. මෙම ගෙවීම් අංක PDF 8/2022 හා 2022 දෙසැම්බර් 21 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය පදනම් කර ගෙන සිදුකර තිබු අතර චක්‍රලේඛයේ iii ඡේදයේ සඳහන් "	2023	රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ නියමයන්ට අනුකූලව කටයුතු කළ යුතුය.	ඉදිරියේදී රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට අනුව කටයුතු කිරීමට සටහන් කර ගෙන තිබුණි.	2023 වර්ෂයේ මහා භාණ්ඩාගාරයට ගෙවිය යුතු ලාභාංශ නොගෙවා ඉතිරි කරගත් නිවාඩු සඳහා 2024 වර්ෂයේදී ගෙවීම් කර තිබුණි.

	ගෙවීම සඳහා සලකා බලන වර්ෂයට පෙර අදාළව මහා භාණ්ඩාගාරයට ගෙවිය යුතු ලාභාංශය/අයබදු ගෙවා තිබිය යුතුය.'' කොන්දේසිය සම්පූර්ණ වී නොතිබියදී ගෙවීම් සඳහා ප්‍රතිපාදන සිදු කර තිබුණි.				
11	කම්කරු කොමසාරිස්ගේ අංක EPF/FROT/22 දරන 2023 අගෝස්තු 26 දිනැති ලිපිය මගින් ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාව විසින් අංක ECSL / EPF /2023 /02 දරන 2023 අගෝස්තු 11 දිනැති ලිපිය මගින් ඉල්ලා ඇති ''ඔ'' ආකෘතියේ සඳහන් සේවක අර්ථසාධක අරමුදල් අංක 1, 3 හා 4 හිමි සේවකයින් හට පමනක් 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 11 (1) වගන්තිය යටතේ 2022 ජනවාරි 01 දින සිට බල පැවැත්වෙන පරිදි සේව්‍ය දායක මුදල් සියයට 12 සිට සියයට 15 ක් දක්වාද සේවක දායක මුදල සියයට 8 සිට සියයට 10 දක්වාද වැඩි කිරීමට අනුමැතිය ලබාදී තිබුණි. එසේ	2023	සේවක අර්ථසාධක අරමුදල් පනතේ සඳහන් නියමයන්ට අනුකූලව හා සෑම සේවකයෙකුටම සමාන ආකාරයෙන් කටයුතු කළ යුතුය.	දැනට සේවයේ යෙදී සිටින අංක 7 හිමි සේවකයාටද සේවක දායක මුදල සියයට 10 ක්ද සේව්‍ය දායක මුදල සියයට 15 ක්ද ලෙස වැඩි කිරීමට අවශය කටයුතු සිදු කරමින් පවතින බව දක්වා තිබුණි.	සේවක අර්ථසාධක අරමුදල් පනතේ සඳහන් නියමයන්ට අනුකූලව නොවන ගෙවීම් සඳහා විධිමත් අනුමැතියක් ලබාගෙන නොතිබුණි.

වුවද සභාවේ සේවක අර්ථසාධක අංක 5, 6 හා 7 හිමි සේවකයින්ටද ඉහත පරිදි ගනන් බලා සේවක අර්ථසාධක අරමුදල් දායක ගෙවීම තුලින් අර්ථසාධක අරමුදල් ලෙස රු. 40,896 ක් වැඩිපුර ගෙවීම් කර තිබුණි.

3.61 ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	1,378,422,976	26,420,228	1,352,002,748	28,959,511	තත්ත්වාගණනය කළ
2022	1,487,351,366	89,459,309	1,397,892,057	86,736,631	තත්ත්වාගණනය කළ
2023	1,550,302,519	74,344,834	1,475,957,685	117,304,421	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්වය
1	1980 අංක 46 දරන සේවා නියුත්තිකයන්ගේ භාර අරමුදල් පනත අනුව විද්‍යාලයේ සිවිල් කාර්ය මණ්ඩලය වෙනුවෙන් 2009 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල වෙත දායක මුදල් ගෙවිය යුතු වුවත් ගෙවා නොතිබුණි. දැනට සේවයේ නියුතු සේවකයන් 64 දෙනෙකු වෙනුවෙන් ගෙවිය යුතු දායක මුදල රු.7,583,786 විය.	2022	සේවා නියුත්තිකයන්ගේ භාර අරමුදල් පනතේ නියමයන් අනුව කටයුතු කල යුතුවීම.	2009 වර්ෂයේ සිට 2022 දක්වා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල වෙත දායක මුදල් බැර කිරීමක් සිදුකර නොමැත. කම්කරු දෙපාර්තමේන්තුවෙන් ලැබෙන උපදෙස් මත ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බව දන්වා සිටිනු ලැබේ.	සේවා නියුක්ත භාරඅරමුදලේ දායකත්වය 2023 වර්ෂය අවසන් වන විටත් ලබාගෙන නොතිබුණි.
2	හෙයියන්තුඩුව තරුණ සේවා සභාවට අයත් අක්කර 11 ක ඉඩම තුල විද්‍යාලය	2022	ඉඩමේ නීත්‍යානුකූල අයිතිය පවරා ගත යුතුවීම.	අක්කර 11 පර්චස් 10 ක භූමි ප්‍රමාණය ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව	ඉඩමේ අයිතිය පවරා ගැනීමේ කටයුතු 2023 වර්ෂය අවසන් වන විටත්

	විසින් ගොඩනැගිලි ඉදිකර ඒවා භාවිතයට ගනිමින් පැවතියද එම ඉඩමෙහි නීත්‍යානුකූල අයිතිය ප්‍රවර්තන වර්ෂයේ දෙසැම්බර් 31 වන විටත් පවරාගෙන නොතිබුණි.			වෙත පවරා ගෙන ඇති අතර, එම භූමි ප්‍රමාණය විද්‍යාලය වෙත පවරා ගැනීමේ කටයුතු සඳහා ගම්පහ තක්සේරු කාර්යාලය වෙතින් තක්සේරු කටයුතු සිදුකර ප්‍රධාන තක්සේරු කාර්යාලය කොළඹ වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇති අතර, එම අනුමැතිය ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමෙන් පසු ඉඩම පැවරීමේ කටයුතු සිදුකරන බව දන්වා ඇත.	අවසන් කර නොතිබුණි.
3	රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අංක PF/FD/04/198 දරණ හා 2016 ජනවාරි 05 දිනැති ලිපිය අනුව මාණ්ඩලික විද්‍යාලයේ සිවිල් කාර්ය මණ්ඩලය සඳහා ලබාදෙන ආපදා ණය යෝජනා ක්‍රමයට අදාල ණය ලබාදීම හා අයකර ගැනීම් වලට අදාල කොන්දේසි ඇතුලත් චක්‍රලේඛයක් නිකුත් කිරීම හෝ ව්‍යවස්ථාවක් සකස් කර නොතිබුණි.	2023	රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ නිශ්චිතව දක්වා ඇති මාර්ගෝපදේශ ආපදා ණය යෝජනා ක්‍රමය සඳහා ක්‍රියාත්මක කල යුතු වීම.	මේ සම්බන්ධව කමිටුවක් පත්කර අදාල චක්‍ර ලේඛණ නිකුත් කිරීම හෝ ව්‍යවස්ථාවන් සකස් කිරීමට සටහන්ෙ කර ගන්නා ලදි.	අදාළ මාර්ගෝපදේශ උපදෙස් මාලාව නිකුත් කර නොතිබුණි.

3.62 රණවිරු සේවා අධිකාරිය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	1,142,552,266	467,772,967	674,779,298	19,846,298	තත්ත්වාගණනය කළ
2022	1,086,119,189	312,035,402	774,083,787	121,972,695	තත්ත්වාගණනය කළ
2023	1,253,039,378	260,882,291	992,157,086	245,654,689	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්වය
1	රණවිරු සේවා අධිකාරියේ නිලධාරීන් දෙදෙනෙකු වෙත 2014 වර්ෂයේදී ලබාදී තිබුණු රු.1,830,450 ක අත්තිකාරම් මුදල් 2021 දෙසැම්බර් 31 දින වන විටත් පියවා නොතිබුණි.	2021	අධිකාරිය වෙත අයවීමට ඇති මුදල් කඩිනමින් අදාල පාර්ශවයන් වෙතින් අයකර ගැනීමට කටයුතු කල යුතුය.	පලමු විනය පරීක්ෂණයෙන් චූදිතයන් නිදහස් කර ඇති බැවින් ඒක පුද්ගල විනිශ්වය සභාවේ තීරණය පිළිබද සෑහීමකට පත්විය නොහැකි බැවින්ද අමාත්‍යාංශ ලේකම්තුමාගේ උපදෙස් පරිදි 2022.2.18 සිට නැවත විනය පරීක්ෂණයක් ආරම්භකර ඇති අතර එහි විමර්ෂණ මේ වන විටත් සිදුකරමින් පවතී.	විමර්ෂණ කටයුතු මේ වන විටත් සිදුකරමින් පවතී.අත්තිකාරම් පියවා නොතිබුණි.
2	රණවිරු මාපිය රැකවරණ දීමනා ක්‍රමය යටතේ 2016 ජූනි මාසයේ සිට 2017 නොවැම්බර් මස දක්වා මාස 18 ක කාලය තුල	2021	අධිකාරිය වෙත අයවීමට ඇති මුදල් කඩිනමින් අදාල පාර්ශවයන් වෙතින් අයකර	මෙම අක්‍රමිකතාවය සදහා සිවිල් පුරවැසියෙකු හා රණවිරු සේවා අධිකාරියේ රාජකාරි කටයුතු	පරීක්ෂණ කටයුතු මේ වන විටත් සිදුකරමින් පවතී

ගිණුම් හිමියන් දෙදෙනෙකු වෙත අවිධිමත් ලෙස රු.5,940,500 ක මුදලක් ගෙවා තිබුණි. මෙම මුදලින් රු.4,978,580 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකරගෙන නොතිබුණි.		ගැනීමට කටයුතු කල යුතුය.	සිදුකල නිලධාරින් 15 දෙනෙකු ඇතුලු 16 දෙනෙකු වගඋත්තරකරුවන් ලෙස නම් කර ඇත. මොවුන්ගෙන් 6 දෙනෙක් ත්‍රිවිධ හමුදාවට අනුයුක්ත කල අය අතර ඔවුන් හා සිවිල් පුරවැසියන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයට අනුව නීත්‍යානුකූලව කටයුතු කල නොහැක. අනෙක් නිලධාරීන් 9 දෙනොගෙන් 7 දෙනෙක් සේවයෙන් ඉවත් වී ඇත. 2 දෙනෙකු පමණක් දැනට සේවයේ නිරත වේ. එම දෙදෙනා හැරුණු විට අනෙකුත් නිලධාරීන් සදහා කටයුතු කිරීමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ අංකබී/11041/2018 යටතේ පැමිණිල්ලක් ගොනුකර අදාල විමර්ෂණය සිදුකරනු ලබන බව දන්වා ඇත.

3	විරුසරු කාඩ්පත් පිළියෙල කිරීම සඳහා ආරත්ෂක අමාත්‍යාංශයෙන් 2016 වර්ෂයේ ලැබී තිබුණු රු.16,607,826 ක මුදලින් රු.3,607,941 ක මුදලක් ඉතිරිවී ඇති අතර එම මුදල් උපයෝජනයකින් තොරව වසර 5 කට අධික කාලයක සිට පවතින බව නිරීක්ෂණය විය.	2021	නිශ්චිත අරමුණක් සඳහා ලැබී ඇති මුදල් කාර්යක්ෂමව එම අරමුණු සඳහා යොදා ගැනීමට කළමනාකාරීත් වය පියවර ගත යුතුය.	විරුසරු කාඩ්පත් නිකුත් කිරීමේ දෙවන අදියර සඳහා එම මුදල උපයෝජනය කරන බව දන්වා බව දන්වා ඇත.	විරුසර කාඩ්පත් දෙවන අදියර සඳහා නිකුත් කිරීම ආරම්භ කර ඇත.එම මුදලින් රු.2,597,121 ක් ඉතිරිව ඇත.
4	2014 වර්ෂයේදී අධිකාරියේ ප්‍රධාන කාර්යාලයෙහි සිදුකරන ලද ක්ලැඩින් සවිකිරීම වෙනුවෙන් ටී.සී.අයි. (T.C.I ENTERPRISES PVT LTD) ආයතනයෙන් රඳවා ගන්නා ලද රු.224,063 ක මුදල ප්‍රවර්ථන වර්ෂය අවසන් වන තුරුත් නිදහස් කර නොතිබුණු අතර 2014 වසරේ රු.4,481,269 ක් වූ එම ගණුදෙනුව මත තිබූ අක්‍රමිකතා පිළිබඳ විමර්ශනයක් සිදුකර නොතිබුණි.	2022	අක්‍රමිකතාවයන් පිළිබඳ නොපමාව විමර්ෂණය කර පාඩු වීම් අවම කර ගැනීමට කටයුතු කල යුතුය.	මේ පිළිබඳව විමර්ශනය කිරීම සඳහා අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිසම වෙත භාර දී ඇත.2022 වර්ෂය අවසන් වන විටද මෙම කොන්ත්‍රාත්තුවට අදාළ විමර්ශන කටයුතු අවසන් නොවීම නිසා අදාළ රඳවා ගැනීමේ මුදල ගෙවිය යුතු මුදලක් ලෙස මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා ඇත.	අදාළ පරීක්ෂණ කටයුතු අවසන් කර ඇතත් ඒ සඳහා වගකිය යුතු පුද්ගලයන් හදුනාගෙන නොමැත.
5	2017 වර්ෂයේ දී ආරම්භ කරන ලද අධිකාරිය සහ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය ඒකාබද්ධව ක්‍රියාත්මක කරන ලද විරුසුමිතුරු නිවාස ව්‍යාපෘතිය යටතේ	2022	ලබාදෙන ලද මතභේදයට තුඩුදෙන ණය ආපසු ලබාගත යුතු වීම.	ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් විරුසුමිතුරු නිවාස ව්‍යාපෘතිය සඳහා වාර්ෂිකව අවශ්‍ය ප්‍රතිපාදනයන් අඩුවෙන්	ගැටළුකාරී මුදල 2023 වර්ෂය අවසන් වන විටත් අයකරගෙන නොමැති අතර අදාළ ව්‍යාපෘතිය නතර කර ඇත.

පූර්ණ නිවාස 1950 ක් සහ අර්ධ නිවාස 1700 ක් වැඩ අවසන් කිරීම වෙනුවෙන් රු.මිලියන 3192 ක් වෙන් කර තිබුණි. 2019 වර්ෂයේ වැඩ අවසන් කිරීමට නියමිත වුවත් 2022 දක්වා දීර්ඝ කර තිබුණු අතර 2022 දෙසැම්බර් 31 වන විට මුළු ව්‍යාපෘති මුදලින් රු.මිලියන 1035.1 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ව්‍යාපෘතියේ එක් වාරිකයක් හෝ ගෙවීම ආරම්භ කර ඇති සම්පූර්ණ නිවාස ගණන 1496 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අපේක්ෂිත නිවාස ඉලක්කයෙන් සියයට 40 කට පමණ අර්ධ වශයෙන් හා සම්පූර්ණ වශයෙන් ආධාර ලබාදී ඇති ප්‍රතිලාභීන් ගණන 550 ක් වූයෙන් එය සම්පූර්ණ ව්‍යාපෘතියෙන් සියයට 15 ක් විය. තවද 2019 වර්ෂයේ ව්‍යාපෘතිය ආරම්භයේදී ආධාරලාභීන් 6 දෙනෙකුට ලබාදුන් රු.865,000 ක මුදලක් විවිධ ගැටළුකාරී තත්ත්වයන් නිසා නැවත එය අය කර ගත යුතු වුවත් 2022 දෙසැම්බර් 31 දින වන

ඇස්තමේන්තු කිරිමත්, ඇස්තමේන්තු කරන ලද මුදල ද එම අධිකාරියේ වෙනත් නිවාස ව්‍යාපෘති සඳහා යෙදවීම නිසාත්, ප්‍රතිලාභින්ගේ නිවාස ඉදිකිරිමට මුදල් නිසි පරිදි නිදහස් නොකිරීම නිසාත්, මූල්‍ය හා භෞතික කාර්යසාධනය අඩු මට්ටමක පැවතීමට හේතු විය. මේ සම්බන්ධයෙන් අවස්ථා ගණනාවකදි නිවාස අධිකාරිය දැනුවත් කළ ද අපේක්ෂා කළ පරිදි අදාළ කාර්යය ඉටුකර ගැනිමට නොහැකි විය.

	විටත් අයකර ගෙන නොතිබුණි.					
6	මුදල් රෙගුලාසි 104 (4) අනුව අලාභ හානිය සිදු වූ දිනයේ සිට තුන් මසක් ඇතුලතදී පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කල යුතු වුවත්, 2023 පෙබරවාරි 03 දින වායුසමීකරණ යන්ත්‍ර දෙකක රු.110,833 ක් වටිනා තඹ බට සොරා ගැනීමට අදාල පරීක්ෂණ කටයුතු අවසන් කර නොතිබුණි.	2023		මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතු වීම.	පොලිසිය මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදු කරගෙන යනු ලබන අතර ආයතනික වශයෙන් මු.රෙ.104 යටතේ පරීක්ෂණයක් සිදු කිරීම සඳහා කමිටුවක් පත්කරන ලදී. එම කමිටු වාර්තාව මේ වන විට අධිකාරිය වෙත ලැබී ඇති අතර, එය කළමනාකරණ මණ්ඩලයේ උපදෙස් අනුව කටයුතු කරනු ලබන බව දන්වා තිබුණි.	පරීක්ෂණ කටයුතු අවසන් කර නොමැත.
7	1999 අංක 54 දරණ රණවිරු සේවා අධිකාරි පනතෙහි 06 වන වගන්තිය අනුව පනත ක්‍රියාත්මක වීම ආරම්භ වූ දින සිට දින 60 ක් ඇතුලත ක්‍රියාත්මකයේදී ආබාධිත මියගිය හෝ සොයාගත නොහැකි සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදවේ සියළු සාමාජිකයින් හා ඔවුන්ගේ යැපෙන්නන් පිළිබඳ නාම ලේඛණයක් සැකසිය යුතු වුවත් අධිකාරිය පිහිටුවා	2023		1999 අංක 54 දරණ රණවිරු සේවා පනත අනුව කටයුතු කළ යුතුය.	ක්‍රියාන්විත හේතුන් මත මියගිය, අතුරුදහන් සහ ආබාධිත රණවිරුවන්ගේ මූලික තොරතුරු ඇතුළත් කරමින් රණවිරුවන්ගේ සේවා අංක මූලික කරගෙන දත්ත පද්ධතියේ තොරතුරු යාවත්කාලින කර ඇත. එම රණවිරුවන්ගේ ළඟම ඥාතීන්ගේ තොරතුරු ද යාවත්කාලීන කිරීම්	යාවත්කාලීන කළ තොරතුරු පද්ධතියක් සකස් කර ගෙන නොමැත.

	අවුරුදු 23 ක්ද යුධමය තත්වය නිමාවී අවුරුදු 14 ක්ද ගතවී තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම නම් ඇතුලත් සම්පූර්ණ තෙරතුරු පද්ධතියක් ස්ථාපිත කර නොතිබුණි.			සිදු කරන අතර, මෙම තොරතුරු වලට අමතර වශයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් ග්‍රාම නිළධාරින් හරහා තොරතුරු මේ වන විට ලබා ගනිමින් පවතී.	
8	2018 නොවැම්බර් 01 දින කෙටිකාලීන ආයෝජනයක් ලෙස දින හතේ ඇමතුම් (Seven Days Call Deposit) තැන්පතුවක් ලෙස රු.1,500,000 ක මුදලක් ලංකා බැංකුවේ තැන්පත් කර සමාලෝචිත වර්ෂය අවසන් වන විට වසර 05 කට අධික කාලයක් ගත වී ඇතත් මෙම තැන්පතුව නැවත අළුත් කිරීමට හා එයට අදාළ පොලිය ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.	2023	මුදල් ආයෝජන ඵලදායී විය යුතුය.	මෙම තැම්පතුවේ පොළී ආදායම තැම්පතුව ඉවත්කරන අවස්ථාවේ දී ලබා දෙන අතර වාර්ෂිකව පොළී ආදායම හඳුනා ගැනීම සිදු කල නොහැක. මෙම තැම්පතුව පිළිබඳ අධිකාරියේ ආයෝජන කමිටුව වෙත වාර්තා කර ලබා දෙනු ලබන නිර්දේශය කළමනාකරණ මණ්ඩලය වෙතද යොමු කර ලබා දෙන තීරණය අනුව කටයුතු කරනු ලබන බව දන්වා තිබුණි.	මෙම තැන්පතුව පිළිබඳව ඉදිරි ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත.
9	අධිකාරියේ ප්‍රධාන ආදායම් ප්‍රභවය ලෙස ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ පවතින ඉතිරි කිරීමේ ගිණුම තුල 2022 සහ 2023 වර්ෂයන් තුලදී ලැබී තිබුණු රු.7,358,875	2023	මුදල් අරමුදලේ උපරිම ඵලදායිව යොදා ගත යුතුය.	ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ අංක 100010885550 දරන ඉතිරි කිරීමේ ගිණුමට සහ මහජන බැංකුවේ අංක	මෙම මුදල් උපයෝජනයකින් තොරව අදාළ ගිණුම තුල පවතී.

ක ස්ථාවර තැන්පතු පොලී ආදායම හා එම පොලිය මත ලද රු.323,865 ක් වූ ඉතුරුම් පොලී ආදායම් උපයෝජනයකින් තොරව රඳවාගෙන තිබුණි.

25920016000784 9 දරණ ඉතිරි කිරීමේ ගිණුමට, එම බැංකුවල පවත්වාගෙන යනු ලබන ස්ථාවර තැන්පතුවල පොළී ආදායම බැර කරනු ලැබේ. භාණ්ඩාගාරය විසින් ලොතරැයි මණ්ඩල පැවරුම් නියමිත පරිදි ලබා නොදෙන බැවින් ද අයවැය ප්‍රතිපාදන නිසි පරිදි ලබා නොදෙන බැවින්ද රණවිරු සුභසාධන වැඩසටහන් අඛණ්ඩව ක්‍රියාත්මක කිරිම සඳහා මෙම මුදල් ඉතිරි කිරිමේ ගිණුම්වලම රදවා ගන්නා ලද බව දන්වා තිබුණි.

3.63 ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	බදු පෙර ලාභය (අලාභය) රු.	මතය
2021	47,814,360,565	39,086,224,627	8,728,135,938	95,630,017	තත්ත්වාගණනය කළ
2022	84,061,838,782	39,715,772,786	44,346,065,996	5,878,823,674	තත්ත්වාගණනය කළ
2023	80,225,791,005	39,166,448,460	41,059,342,545	(5,736,507,885)	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01.	විදේශීය සුදුසුකම් මත බඳවාගත් සිසුන් සඳහා විශ්වවිද්‍යාලය මඟින් ආහාර සහ නේවාසිකාගාර පහසුකම් සැපයීම වෙනුවෙන් ගිවිසුම් ප්‍රකාරව අයවිය යුතු ගාස්තු අදාළ මාසය අවසානයේ ගෙවිය යුතු වුවත්, 2021 දෙසැම්බර් 31 දිනට ආහාර සැපයීම වෙනුවෙන් රු.10,815,115 ක් ද, නේවාසික පහසුකම් සැපයීම වෙනුවෙන් එක්සත් ජනපද ඩොලර් 118,107 අයවිය යුතුව පැවති අතර හිඟව පැවති කාලය වර්ෂ 1-4 අතර පැවතුණි.	2021	විදේශ විනිමය ලෙස ලැබිය යුතු මුදල් අප්‍රමාදව ලබා ගැනීමට කටයුතු කළ යුතුය.	හිඟ මුදලින් අයකර ගත නොහැකි එක්සත් ජනපද ඩොලර් 7,636 ක් කපා හැරීමට කටයුතු කරමින් පවතී. තවදුරටත් අයවිය යුතු මුදලින් සියයට 65 ක් 2022.06.22 දිනට අයකර ගෙන ඇත. ඉතිරි මුදල් අයකර ගැනීමට කටයුතු කෙරේ.	මෙම ක්‍රියාවලිය සම්බන්ධයෙන් අභ්‍යන්තර ක්‍රියාමාර්ග ගෙන පරීක්ෂණ කරගෙන යන අතර අයකර ගැනීමේ කටයුතු දිගටම ක්‍රියාත්මක වන බව පමණක් දක්වා තිබුණි.

02.	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ 1 වන අනු ව්‍යවස්ථාව ප්‍රකාරව 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇති හෝ ලියාපදිංචි වී ඇති බවට සලකනු ලබන සහ ස්වකීය කොටස්වලින් සියයට පනහක් හෝ ඊට වැඩි ප්‍රතිශතයක් රජය හෝ රාජ්‍ය සංස්ථාවක් හෝ පලාත් පාලන ආයතනයක් හෝ විසින් දරනු ලබන සමාගම් විගණකාධිපතිවරයා විසින් විගණනය කළයුතු වුවද, විශ්වවිද්‍යාලය වෙත පූර්ණ හිමිකාරීත්වය සහිත පරිපාලිත සමාගමක 2021 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ගිණුම් විගණනය පෞද්ගලික සමාගමක් වෙත පවරා තිබුණි.	2021	ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන අනුව කටයුතු කළ යුතුය.	සමාගමේ කටයුතු සම්බන්ධයෙන් නිරීක්ෂණ ඉදිරිපත් කිරීමට බාධාවක් නොමැති බව පෙන්වා දෙමි.	සමාගමේ කටයුතු සම්බන්ධයෙන් නිරීක්ෂණ ඉදිරිපත් කිරීමට බාධාවක් නොමැති බව නැවතත් දන්වා ඇතත් විගණකාධිපතිවර යා වෙත ගිණුම් ඉදිරිපත් කිරීමට මේ වන තෙක් කටයුතු කර නොමැත.
03.	සමාලෝචිත වර්ෂයේ අවසානයට රු.125,941,615 ක ගෙවිය යුතු ශේෂ තුල අවුරුදු 03 ත් 04 ත් අතර, පැරණි එකතුව රු.35,639,977 ක් වූ ණයහිමි ශේෂ පියවීමට කටයුතු කර නොතිබුණි.	2022	ණය හිමි ශේෂ පියවීමට කටයුතු කළ යුතු වීම.	ඉදිරියේදී නිරවුල් කර ගැනීමට කටයුතු කරන බව.	විගණන විමසුමෙහි දැක්වෙන රු.125,941,615 ශේෂයෙන් රු.89,375,036 ක් විදේශීය ණය හිමියන් වන අතර ඉතිරි රු.36,566,579 ක ශේෂය දේශීය ණය හිමියන් බවත් විදේශීය ණය

					හිමියන් නිරවුල් වීම ණයවර ලිපි කොන්දේසි වලට භාණ්ඩ ලැබීමෙන් පසුව තත්ත්ව සහතිකය නිකුත් කිරීමෙන් පසුව බැංකුව වෙත අදාල ගෙවීම් කරන ලෙස දැන්වීමෙන් පසු නිරවුල් වන බවත්, ඒ අනුව ඉදිරියේදී මෙම ශේෂය නිරවුල් බවත්, දේශීය ණය හිමියන් මේ වන විට නිරවුල් වී ඇති බවත් දන්වන ලදී.
04.	1971 අංක 38 දරණ මුදල් පනතේ 11 වන වගන්තිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය තුලදී ස්ථාවර තැන්පතු 06 ක ආයෝජනය කල එක්සත් ජනපද ඩොලර් 32,619,412 ක් සඳහා මුදල් අමාත්‍යවරයාගේ එකඟත්වය හා අදාළ අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.	2022	මුදල් පනතේ වගන්ති ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.	කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය පමණක් ලබා ගෙන ඇති බව.	මෙම අරමුදල් වල ප්‍රධාන වශයෙන් රෝහල් උපකරණ ලබා ගැනීමට ලබා ගත් ණය මුදල් සහ විදේශීය සිසුන්ගෙන් ලද පාඨමාලා ගාස්තු ඇතුළත් වේ. රෝහල ස්ථාපිත කිරීමට අදාලව සම්පූර්ණ කාර්ය මණ්ඩලය නිසි කලට නොලැබීම නිසා රෝහලේ සමහර අත්‍යාවශ්‍ය අංග ස්ථාපිත කිරීමට ප්‍රමාද විය. එකී රෝහල් උපකරණ මිලදී ගැනීමට ගෙවීම් කරන තෙක් 1981 අංක 68 දරන ශ්‍රීමත් ජෝන්

					කොතලාවල රාජ්‍ය ආරක්ෂක අභ්‍යාස අයතන පණතේ 4 (ඊ) වගන්තිය සඳහන් බලතල ප්‍රකාරව , කළමණාකරණ මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන මෙම මුදල් කෙටි කාලීනව ස්ථාවර තැන්පත්වල ආයෝජනය කර ඇති බව හා වර්තමානය වන විට උක්ත කෙටි කාලීන තැන්පත් උපයෝගී කර ගනිමින් විශ්වවිද්‍යාල රෝහල සඳහා වෛද්‍ය උපකරණ මිලදී ගෙන ඇති අතර රු.19,492,887 මුදලක් ජාතික ඉතිරි කිරීමේ බැංකුවෙන් ලබා ගත් ණය මුදල් නිරවුල් කිරීම සඳහා ද ගෙවා ඇති බවත් දන්වා තිබුණි.
05.	විශ්වවිද්‍යාලය දේශීය ආදායම් බදු පනත් ප්‍රකාරව බදු බැඳියාවක් සහිත රාජ්‍ය ව්‍යවසායක් ලෙස විගණිත දින තෙක් කටයුතු කර නොතිබුණි.	2022	දේශීය ආදායම් බදු පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.	ඉදිරියේදී නිරවුල් කර ගැනීමට කටයුතු කරන බව.	ලංකාවේ එකම රාජ්‍ය ආරක්ෂක විශ්වවිද්‍යාලය වන අතර එය ආදායම් බදු ගෙවනු ලැබීමෙන් නිදහස් කිරීම සඳහා දේශීය ආදායම් පනතට අවශ්‍ය සංශෝධන

					සිදු කිරීමට උචිත පියවර ගන්නා මෙන් මුදල් අමාත්‍යාංශය වෙත යොමු කිරීම සඳහා උපකුලපතිතුමන් ගේ අත්සනින් යුතු ලිපියක් ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය වෙත 2023 ජූලි 20 දින යොමු කර ඇති බවක් දන්වා තිබුණි.
06.	සමාලෝචිත වර්ෂයේ සිමෙන්ති මළු 1,120 ක් රු.2,982,011 කට මිලදී ගැනීමට අදාළ ප්‍රසම්පාදනයන් කොටස් 03 කට වෙන්කර ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීම නිසා අදාළ සැපයුමේ මුළු වටිනාකම මත, මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 වගන්තියට අනුව ප්‍රධාන ටෙන්ඩර් මණ්ඩලයක් වෙත ඉදිරිපත් කිරීම මඟ හැරී තිබුණි. තවද මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.10, 5.3.11 හා 8.9.1 වගන්තිවලට අනුව මෙම මිලදී ගැනීම් වෙනුවෙන් පිළිවෙලින් කාර්යසාධන සුරක්ෂණයක් ලබා ගැනීම, ලංසු සුරක්ෂණයක් ලබා ගැනීම හා විධිමත්	2022	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.	ලංසු ලබා ගැනීමේ අර්බුධකාරී තත්ත්වය මත කාර්යසාධන සුරක්ෂණය, ලංසු සුරක්ෂණය ලබාදීම හා ගිවිසුම් ගතවීමද සිදු කර ගැනීමට නොහැකි වීම.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් ට පටහැනිව ලංසු ලේඛන වෙනස් කර ලංසු මුදල රු.මිලියන 2 ඉක්මවා යන ලංසු තැබීම් සඳහා සැපයුම්කරුවෙකු විසින් මුළු ලංසු මුදලින් සියයට 1 ක ප්‍රතිශතයක මුදලක් ලංසු බැදුම්කරය වශයෙන් තැබිය යුතු බව සහ කාර්යසාධන බැදුම්කරයන් ලබාදීම මුළු ලංසු මුදල රු.මිලියන 2 ඉක්මවා යන ලංසු තැබීම් සඳහා සැපයුම්කරුවෙකු විසින් මුළු ලංසු මුදලින් සියයට 10 ක ප්‍රතිශතයක මුදලක් කාර්යසාධන බැදුම්කරය

	ගිවිසුමකට එළඹීම යන අවශ්‍යතා ඉටු වී නොතිබුණු බව නිරීක්ෂණය විය.				වශයෙන් තැබිය යුතු බව දක්වා තිබුණි. ඒ අනුව ඉහත කී එම කරුණු වලට අනුගත වෙමින් මේ වන විටත් අදාල බැඳුම්කරයන් ලබාගැනීම සිදුකරන බව දන්වන ලදී. තවද, සැපයුම්කරුවන් සමග ගිවිසුම් ගත වීම මේ වන විටත් සිදු කරමින් පවතින බව දන්වන ලදී.
07.	අංක 01-41/2019 හා 2019.07.22 දිනැති සෞඛ්‍ය අමාත්‍යාංශ චක්‍රලේඛය අනුව හදිසි වෛද්‍ය සැපයුම් මිලදීගැනීම් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ ඔසුසල්වලින් පමණක් සිදුකල යුතු බවද, එහි එම ඖෂධ නොමැතිනම් ඒ බව ලිඛිත තහවුරුකර ගැනීමක් ලබාගැනීමෙන් පසු පමණක් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව මිලදී ගතයුතු බව දක්වා තිබුණද, විගණන නියැදි පරීක්ෂණයට අනුව වටිනාකම රු. 3,053,808 ක් වූ ඖෂධ මිලදී ගැනීමේදී රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ ඔසුසල්වල	2022	සෞඛ්‍ය අමාත්‍යාංශ චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.	ඉදිරියේදී නිරවුල් කර ගැනීමට කටයුතු කරන බව.	මේ වන විට අත්තිකාරම් මගින් ලබා ගන්නා ඖෂධ හා සැරහුම් ද්‍රව්‍ය සඳහා "Quotation" ලබා ගැනීමේදී රාජ්‍ය ඔසුසල මගින් අනිවාර්ය මිල කැඳවුමක් ලබා ගන්නා අතර රාජ්‍ය ඔසුසලෙහි එම අයිතමය නැතිනම් පමණක් වෙනත් සැපයුම්කරුවෙකු ගෙන් ලබා ගැනීමට කටයුතු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇති බව දන්වන ලදී.

	පවතී ද යන්නට ලිඛිත තහවුරු කිරීම් ලබාගෙන නොතිබුණි.				
08.	විශ්වවිද්‍යාලය විසින් රු.2,959,830 ක් වැය කර මිලදී ගෙන තිබූ මුද්‍රණ යන්ත්‍ර භාවිතා කර පවත්වා ගෙන ගොස් තිබූ මුද්‍රණාලය විධිමත් අනුමැතියකින් තොරව ස්වාධීන ව්‍යාපාරයක් ලෙස ක්‍රියාත්මක කිරීමත් ඒ සඳහා රු.5,000,000 ක ණය මුදලක් විශ්වවිද්‍යාලය මඟින් ලබා දීමටත් 2023 මාර්තු 07 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී තීරණය කර තිබුණි. මෙම අවිධිමත් තීරණය මත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හේතුවෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 42,76 හා 99 ඡේදයන්ට පටහැනිව ඉහත සඳහන් කළ දිනට පසු රු. 18,504,114 ක් වූ මුද්‍රණාල ආදායම, රු.8,433,158 ක් වූ මුද්‍රණාල වියදම, සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට එහි රු. 2,196,774 ක් වූ අවසන් තොගය සහ රු.4,497,914 ක් වූ ණයගැතියෝ විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත්	2023	සමාලෝචිත වර්ෂයේ මුද්‍රණාල ආදායම, වියදම, වත්කම් ගිණුම් තුළ ඇතුළත් කළ යුතු වීම.	වැළැක්වීමේ ක්‍රියාමාර්ග සිදු කර නැත.	මුද්‍රණාලය නැවත කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය යටතට පවරා ගැනීමට අපේක්ෂා කරන බැවින් ඉදිරියේ දී මෙය නිරාකරණය කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි.

	නොකිරීමෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම්, වියදම් සහ ජංගම වත්කම් එම වටිනාකම්වලින් අඩුවෙන් දක්වා තිබුණි.				
09.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 127 ඡේදය ප්‍රකාරව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය මුහුණතෙහි ඉදිරිපත් කර නැති ශ්‍රී.ල.රා.අ.ගි. ප්‍රමිතවලින් අවශ්‍ය කෙරෙන තොරතුරු සටහන් මඟින් හෙළිදරව් කළ යුතු වුවත්, රු.9,554,938 ක ලැබිය යුතු ආදායම් බදු හා රු.1,422,624 ක වර්ෂයේ ආදායම් බදු පිළිබඳ සටහනක් මූල්‍ය ප්‍රකාශන තුල ඇතුලත් කර නොතිබුණි.	2023	ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.	වැළැක්වීමේ ක්‍රියාමාර්ග සිදු කර නැත.	සටහන් ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි.
10.	විවිධ මූලාශ්‍ර වලින් ලද පර්යේෂණ ප්‍රදාන පෙර වර්ෂවලදී වැරදි ගිණුම්කරණ ප්‍රතිපත්තියක් අනුගමනය කරමින් ආදායමට හා වියදමට හඳුනාගෙන තිබුණි. මෙම වර්ෂයේ ලද එවැනි ප්‍රදාන ඒවායේ ස්වරූපය අනුව පර්යේෂණ ප්‍රදාන යටතේ වගකීම් ලෙස හඳුනා ගනු ලැබුවද, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 හි 47	2023	ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.	ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කෙරෙනු ඇත.	නිවැරදි කිරීමට කටයුතු කරන බවට දන්වන ලදී.

	වගන්තිය ප්‍රකාරව ආරම්භ ශේෂයන් නැවත ප්‍රකාශ කිරීමෙන් අතීතානුයෝගීව නිවැරදි කර නොතිබීම හේතුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට පර්යේෂණ ප්‍රදාන රු.44,178,343 ක හර ශේෂයක් වත්කම් ලෙස හඳුනා ගෙන තිබුණි. තවද, මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනට පර්යේෂණ ප්‍රදාන රු.38,678,752 ක හර ශේෂයයක් පැවති අතර උපලේඛන අනුව එය රු.25,322,871 ක් වූ බැවින් රු.64,001,623 ක වෙනසක් පැවතුණි.				
11.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 14 හා 69 ඡේදයන්ට පටහැනිව, රු.6,489,177 ක් වැය කරමින් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ කෞතුකාගාරයේ පවතින වහල අළුත්වැඩියා කිරීම 2021 නොවැම්බර් 11 දින අවසන් වී තිබියදී 2023 දෙසැම්බර් 31 දින වන විටත් ප්‍රාග්ධනිත නොකර කෙරීගෙන යන වැඩ තුල ඇතුලත් කර තිබුණි. ඒ අනුව ප්‍රවර්ථන වර්ෂයේ ගොඩනැගිලි එම	2023	ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.	අදාල ගැලපීම් සිදු කිරීමට සටහන් කර ගෙන ඇති බව.	අදාල ගැලපීම් ඉදිරියේදී සිදු කරන බව දන්වන ලදී.

	වටිනාකමින් අඩුවෙන් දක්වා තිබූ අතර, වර්ෂයේ ක්ෂයවීම් රු.162,229 කින් අඩුවෙන් දක්වා තිබීම හේතුවෙන් වර්ෂයේ ඌණතාවය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.				
12.	2021 වර්ෂයේ දී ලබා දී තිබූ රු.162,029 ක් වූ මුදල් අත්තිකාරම් සඳහා විශ්වවිද්‍යාලය සතුව තොරතුරු නොතිබීමෙන් බොල් ණය හා අඩමාණ ණය වෙන්කිරීම් ලෙස ගැලපීමට සිදු වී තිබුණි. තවද, රෝහලේ රු.716,578 ක ගැණුම් අත්තිකාරම් මුදලක් බැර ශේෂයක් ලෙස ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයට ඇතුලත් කිරීමෙන් හා වැටුප් අත්තිකාරම් රු.38,784 ක් බැර ශේෂයක් ලෙස පෙන්නුම් කිරීමෙන් සමාලෝචිත වර්ෂයේ අවසානයට වත්කම් රු. 917,391 ක් අඩුවෙන් දක්වා තිබුණි.	2023	අත්තිකාරම් සම්පූර්ණ වටිනාකම් ගිණුම් වල ඇතුළත් කළ යුතු වීම.	සැසඳුම් කොට අදාල වෙනස්කම් හඳුනා ගැනීමට කටයුතු කරන බවත්, ඒ අනුව අදාල ගැලපුම් නිවැරදි කිරීමට ඉදිරියේදී කටයුතු කරන බවත්, දන්වා ඇත.	අත්තිකාරම් 2023 දෙසැම්බර් 31 දක්වා නොපියවී තිබූ බැවින් අඩමාණ ණය වෙන් කර ඇති අතර සැසඳුම් කොට අදාල වෙනස්කම් හඳුනා ගැනීමට කටයුතු කරන බවත්, ඒ අනුව අදාල ගැලපුම් නිවැරදි කිරීමට ඉදිරියෙදී කටයුතු කරන බවත් දන්වන ලදී.
13.	ශ්‍රවනාගාරය ඉදිකිරීම සඳහා 2010 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා වැය කළ රු.96,953,827 ක මුදලක් කෙරීගෙන යන වැඩ තුළ ඇතුලත් කර නොතිබූ අතර විශ්වවිද්‍යාලීය	2023	කෙරීගෙන යන වැඩ තුළ සියළු වියදම් ඇතුළත් කළ යුතු වීම.	Budget Hotel Hospital නමැති ඒකකය සඳහා සමාලෝචිත වර්ෂයේදි ප්‍රාග්ධන වියදමක් වාර්තා වී නොමැති අතර, ව්‍යාපෘති කාර්යාලය වෙතින් අදාල	නිරවුල් කර නොතිබුණි.

	රෝහලේ Budget Hotel Hospital නමැති ඒකකයේ ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් රු.11,506,604 ක් වැය කර තිබුණ ද, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයන් තුළ කෙරීගෙන යන වැඩ ලෙස රු.10,237,786 ක් පමණක් දක්වා තිබීමෙන් කෙරීගෙන යන වැඩ වල මුළු වටිනාකම රු.98,222,645 කින් අඩුවෙන් දක්වා තිබුණි.			විස්තර ලබා ගැනීමෙන් පසු යම් වෙනසක් ඇතොත් අදාල ගැලපීම් කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.	
14.	පුද්ගලික සැත්කම්වලට අදාළව 2023 ජනවාරි 01 දින පැවති රු.2,187,341 ක ලැබිය යුතු ආදායම සමාලෝචිත වර්ෂය තුළදී අය වී තිබුණ ද, අදාළ ශේෂය තව දුරටත් ලැබිය යුතු ආදායම් ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල ලැබිය යුතු ආදායම් එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.	2023	ලැබිය යුතු ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතු වීම.	මූල්‍ය වාර්තා තුල ඉදිරියේදී නිවැරදි කරනු ලබන බව.	ඉදිරියේදී නිවැරදි කරනු ලබන බව දන්වන ලදී.
15.	2023 දෙසැම්බර් 31 දිනට පැවති රු.70,931,247 ක වෛද්‍ය සැපයුම් තොගය තුල ඇතුලත් රු.11,349,293 ක කල් ඉකුත් වූ තොග වලට අදාලව වෙන් කිරීම්	2023	නිවැරදි තොග වටිනාකම් ගිණුම් වල දැක්විය යුතු වීම.	වැළැක්වීමේ ක්‍රියාමාර්ග සිදු කර නැත.	ඖෂධ ඉවත් කිරීම සම්බන්ධයෙන් උපදෙස් ජාතික ඖෂධ නියාමන අධිකාරිය හා ඖෂධ සැපයුම් අංශය වෙතින් ඉල්ලා ඇති අතර අදාල උපදෙස්

	ගිණුම් වල සලසා නොතිබූ අතර අදාළ ඖෂධ ඉවත් කිරීමට කළමනාකරණය විගණිත දින වන විටත් කටයුතු කර නොතිබුණි. ඒ හේතුවෙන් එම වටිනාකමින් ගිණුම් තුළ තොගය වැඩියෙන් දක්වා තිබූ අතර සමාලෝචිත වර්ෂයේ ඌණතාවය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.				ඉක්මණින් ලබාගැනීම සඳහා ප්‍රධාන ඖෂධවේදී මාර්ගයෙන් අදාල ආයතනයන්හි කාර්යභාර නිලධාරි සම්බන්ධීකරණය කිරීමට ද කටයුතු කොට තිබුණි.
16.	වෙළෙඳ ණයගැතියන් තුල වර්ෂයකට වඩා පැරණි ණයගැති වටිනාකම රු. 359,796,230 ක් වූ අතර එම ශේෂ සඳහා ණයගැති කාල විශ්ලේෂණයක් පිළියෙල කර නොතිබුණි. මෙම ණය ශේෂ සමාලෝචිත වර්ෂය අවසන් වන විටද අයකර ගෙන නොතිබුණි. තවද සිසුන්ගෙන් ලැබී තිබූ රු. 70,650,682 ක මුදලක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටද නිරවුල් කර නොතිබූ අතර එම ශේෂ තුළ වර්ෂයකට වඩා පැරණි ශේෂය රු. 40,275,433 ක් විය.	2023	ණයගැති ශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු අතර ණයගැති ශේෂ සඳහා කාල විශ්ලේෂණ පවත්වා ගැනීමට කටයුතු කළ යුතු වීම.	ණයගැති කාල විශ්ලේෂණයෙහි විස්තරාත්මක වර්තාවෙහි සියලුම ඉන්වොයිසියන් වල ඉන්වොයිසි දිනය ලබා ගත හැකි බව දක්වා ඇත.	අදාල සිසුන්ව නිවැරදිවම හඳුනා ගෙන නැතත් ලැබිය යුතු පාඨමාලා ගාස්තු ගිණුමෙන් අඩු විය යුතු වටිනාකමක් බැවින් ණයගැතිය ශේෂය අඩු කර දක්වා ඇත. අදාල සිසුන් විසින් මුදල් තැන්පතුපත ඉදිරිපත් කර රිසිත්පත ලබා ගැනීමෙන් පසු මෙම ගිණුමේ ශේෂය නිරවුල් කරන බව දන්වන ලදී.
17.	වර්ෂ 1 ත් 25 ත් දක්වා පැරණි රු.99,028,325 ක් වූ අයවිය යුතු	2023	අහිමිව ඇති ආදායම් අයකර ගැනීමට කටයුතු	අය විය යුතු බැඳුම්කර වලින් රු. 43,366,883 ක් අය	සෑම ලැබිය යුතු බැඳුම්කර වටිනාකමක්ම

	බැඳුම්කර, වර්ෂ 6 ක් පැරණි රු.15,439,662 ක් වූ ලැබිය යුතු සලාක දීමනාව සහ වර්ෂ 1 ත් 9 ත් දක්වා පැරණි රු.6,219,490 ක් වූ ලොන්ඩ්‍රි ආදායම සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකර ගැනීමට නොහැකි වී තිබුණි.		කළ යුතු වීම.	කර ගැනීමට පමණක් නඩු පැවරීමට කටයුතු කර ඇත. ලොන්ඩ්‍රි ආදායම් අයකර ගැනීමට කටයුතු කරමින් පවතී.	අයකරගැනීමට අවශ්‍ය නීතිමය කටයුතු සිදුකරමින් පවතින බවත්, ලැබිය යුතු සලාක දීමනාව ඉදිරියේ දී නිරවුල් කිරීමට කටයුතු කරන බවත්, ලොන්ඩ්‍රි ආදායම අයකරගැනීමට අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකරමින් පවතින බවත් දන්වන ලදී.
18.	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ 12.2.5 වගන්තිය ප්‍රකාරව පුරප්පාඩු වී තිබෙන තනතුරක රාජකාරී ආවරණය කිරීමට යොදා ඇති දෙපාර්තමේන්තුමය වැඩ පිළිවෙලක් යටතේ එම රාජකාරී ආවරණය කරන නිලධරයෙකුට වැඩබැලීමේ වැටුපක් නොහොත් කිසිදු අතිරේක පාරිශ්‍රමිකයක් ලබාගැනීමට නොහැකි නමුත් 2022 ජුනි මස පැවැති මෙම විශ්වවිද්‍යාලයේ 644 වන කළමනාකරණ මණ්ඩල රැස්වීමේ දී විශ්වවිද්‍යාලයේ මූල්‍යාධිකාරී, මිලෝදා ආයතනයේ ගණකාධිකාරී තනතුරේ රාජකාරි ආවරණය කිරීම සඳහා 2022 ජුලි මස 01 වන දින	2023	ආයතන සංග්‍රහයට අනුකූල විය යුතු වීම.	වැළැක්වීමේ ක්‍රියාමාර්ග සිදු කර නැත.	මෙට්‍රොපොලිටන් කැම්පස් (ගරන්ටි) ලිමිටඩ් ආයතනය සමාගම් රෙජිස්ටරයෙන් ඉවත් කර කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ පීඨයක් ලෙස ක්‍රියාත්මක වූ දින සිට මෙකී ගෙවීම් සිදු කිරීම නතර කරන ලද බව දන්වා තිබුණි.

	පත්කර, රාජකාරී ආවරණය සඳහා ගණකාධිකාරී මූලික වැටුපෙන් සියයට 25 දීමනාවක් ගෙවීමටද ඉහත කළමනාකරණ මණ්ඩල රැස්වීමේ දී අනුමත කර තිබූ අතර 2022 සැප්තැම්බර් 13 දින සිට මෙට්‍රොපොලිටන් කැම්පස් අධ්‍යයන ආයතනය සඳහා සහකාර මූල්‍යාධිකාරීවරයෙකු පත්කර තිබියදී 2022 ඔක්තෝබර් සිට 2023 ඔක්තෝබර් දක්වා රාජකාරී ආවරණය සඳහා දීමනා ලෙස ගෙවා තිබූ මුදල රු.452,238 ක් විය.				
19.	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රය				
(i)	මුදල් රෙගුලාසි 371(2)(අ) ප්‍රකාරව කිසියම් විශේෂිත කාර්යයක් සඳහා මාණ්ඩලික තත්ත්වයේ නිලධාරීන්ට පමණක් එක් අවස්ථාවකදී රු.100,000 ක උපරිමයක් දක්වා තත්කාර්යය අතුරු අග්‍රිමයක් ලබාදිය හැකි වුවද, විශ්වවිද්‍යාලය විසින් සමාලෝචිත වර්ෂය තුල අවස්ථා 57 කදී එම සීමාව ඉක්මවා එකතුව රු.15,941,748 ක අත්තිකාරම් ලබාදීමට කටයුතු කර	2023	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.	වැළැක්වීමේ ක්‍රියාමාර්ග සිදු කර නැත.	විශ්වවිද්‍යාලීය අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි තත්කාලීන අත්තිකාරම් මුදල වැඩි කිරීමට අවශ්‍ය අනුමැතිය ඉල්ලා ලිපියක් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇති අතර ඒ සම්බන්ධයෙන් ඔවුන්ගේ එකඟතාවය අංක PFD/RED/REG/FR/2024 හා 2024 ජුනි 27 දින දරණ

	තිබුණි.				ලිපිය මගින් ලබා දී ඇති බව දන්වා තිබුණි.
(ii)	මුදල් රෙගුලාසි 371(6) ප්‍රකාරව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදු කර එහි වාර්තාව ජුනි 15ට පෙර විගණකාධිපති වෙත යොමු කල යුතු වුවත් 2023 වර්ෂයේ විශ්වවිද්‍යාලයේ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාව එදිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	2023	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.	කඩිනමින් අදාළ වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කෙරේ.	අයෝග්‍ය කිරීම් මණ්ඩල කටයුතු ද අවසන් අදියරේ සිදුකරමින් පවතින බවත් කඩිනමින් අදාළ වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන බවත් දන්වන ලදී.
(iii)	මුදල් රෙගුලාසි 880 හා 891 ප්‍රකාරව ආයතනයේ ඇප තැන්පතු තැබිය යුතු නිලධාරීන් හඳුනාගෙන ඇප තැන්පතු ලේඛනයක් තබාගත යුතු වුවත් ආයතනය විසින් ඇප තැන්පතු ලේඛනයක් පවත්වාගෙන නොමැති බව විගණනයට නිරීක්ෂණය විය.	2023	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.	වැළැක්වීමේ ක්‍රියාමාර්ග සිදු කර නැත.	සරප්-කොඅවි ගෙන් පමණක් රු.5,000 ක ඇප මුදලක් ලබා ගෙන ඇති බව දන්වා තිබුණි.
20.	1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරී (සංශෝධන) පනතේ 8 එ (1) වගන්තිය ප්‍රකාරව වෙනත් යම් නීතියක විධිවිධාන කෙසේ වුව ද යම් සංවර්ධන ප්‍රදේශයක හෝ එහි කොටසක යම් සංවර්ධන කටයුතු	2023	පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.	වැළැක්වීමේ ක්‍රියාමාර්ග සිදු කර නැත.	අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

	කරගෙන යාම හෝ සංවර්ධන කටයුතුවල නිරතවීම, ආණ්ඩුවේ නියෝජ්‍යායතනයක් ඇතුළු කිසිම තැනැත්තකු විසින්, අධිකාරිය විසින් එහි ලා නිකුත් කරන ලද අවසර පත්‍රයක බලය යටතේ හැර සිදු කරනු නොලැබිය යුතු වුවත්, ආයතනය විසින් ශ්‍රවණාගාර ගොඩනැගිල්ල ඉදිකිරීමට අදාලව අනුමැතිය ලබාගෙන නොතිබුණි.				
21.	සමාලෝචිත වර්ෂයේ දී රෝහලේ විදුලි බිල්පත් නියමිත දිනයේ දී ගෙවීමට කළමනාකරණය කටයුතු නොකිරීම හේතුවෙන් බිල්පත් පියවීමේ ප්‍රමාද ගාස්තු ලෙස රු.12,128,284 ක දඩ මුදල් ගෙවීමට සිදු වී තිබුණි.	2023	විදුලි බිල්පත් අප්‍රමාදව පියවීම මඟින් ආයතනයට සිදු වන පාඩු අවම කර ගත යුතුය.	වැළැක්වීමේ ක්‍රියාමාර්ග සිදු කර නැත.	මහ භාණ්ඩාගාරයෙන් ද්‍රවශීල මුදල් නියමිත වේලාවට නිදහස් කිරීම මත ඉදිරියේදී අධිභාරයක් නොමැතිව විදුලි බිල්පත් නිසි පරිදි නිරවුල් කිරීමට හැකිවනු ඇති බවත් දන්වන ලදී.
22.	දක්ෂිණ මණ්ඩපයේ කැඩෙට් නිලධාරීන් 41 ක් ඇතුලු සම්පූර්ණ සිසුන් 761 ක ගේ සහ පරිපාලන, අධ්‍යනය හා නේවාසික කටයුතු සඳහා විදුලි වියදම් ලෙස රු.56,072,219 ක් සමාලෝචිත වර්ෂය තුලදී දරා තිබූ අතර එය අවම කර ගැනීමට හෝ පාලනයකර ගැනීම	2023	විදුලි වියදම් පාලනය කිරීමට කටයුතු කළ යුතු වීම.	දක්ෂිණ මණ්ඩපයේ ස්ථානීය සූර්ය බලශක්ති ව්‍යාපෘතිය සඳහා ශක්‍යතා අධ්‍යයනයක් ද සිදුකර ඇති අතර, මේ වනවිට සුදුසු ආයෝජකයෙක් සෙවීමට කටයුතු කෙරෙමින් පවතී.	මෙම ව්‍යාපෘතිය 2024 ආයතිනක සැලැස්මට ඇතුලත් කිරීම සහ සූර්ය බලශක්ති ව්‍යාපෘතිය සඳහා ශක්‍යතා අධ්‍යයනයක් ද සිදුකර කර මේ වනවිට සුදුසු ආයෝජකයෙක් සෙවීමට කටයුතු

	සඳහා මෙම ප්‍රදේශයට උචිත විකල්ප බලශක්ති ක්‍රමවේදයකට යොමු වී නොමැති බව නිරීක්ෂණය විය.				කෙරෙමින් පවතින බව දන්වන ලදී.
23.	2023 ජනවාරි මස සිට මෙට්‍රොපොලිටන් කැම්පස් අධ්‍යයන ආයතනයෙහි පළමු මහල ලෝක ආහාර වැඩසටහනෙහි සහයෝගිතා ලේකම් කාර්යාලය සඳහා ලබාදී තිබුණි. මේ සඳහා කිසිදු කුලී ආදායමක් මෙට්‍රොපොලිටන් කැම්පස් වෙත ලැබී නොතිබුණු අතර, එම පරිශ්‍රයට අදාළ විදුලිය, ජලය, වරිපනම්, ආරක්ෂිත, සනීපාරක්ෂක යනාදී පොදු කාර්ය වියදම් ආයතන දෙක අතර අනුපාතිකව බෙදාහැරීමට අදාළව ලෝක ආහාර වැඩසටහනේ සහයෝගීතා ලේකම් කාර්යාලය සමඟ ලිඛිත ගිවිසුමකට ද එළඹී නොතිබුණි.	2023	කඩිනමින් ගිවිසුම් ගත වීමට කටයුතු කළ යුතු වීම.	පළමු මහල භාවිතා කරන ලෝක ආහාර ව්‍යාපෘති කාර්යාලය (ජනාධිපති කාර්යාලය) සමග ගිවිසුම් ගත වීමට අවශ්‍ය ඉදිරිකටයුතු සැලසුම් කරමින් පවතී.	ගිවිසුම් ගත වී නොමැත.

24.	2021 අප්‍රේල් 20 දිනැති අංක අමප/21/0584/303/052 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් මිලෝදා මූල්‍ය අධ්‍යයන ආයතනය විශ්වවිද්‍යාලයට පැවරීමේදී සුදුසු සේවක සංඛ්‍යාව තීරණය කිරීමට හා එකී සේවක සංඛ්‍යාව සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදී තිබූ නමුත් විගණිත දින වූ 2023 ඔක්තෝබර් 10 දින වන විටත් සේවක සංඛ්‍යාව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමතකර ගැනීමට විශ්වවිද්‍යාලය අපොහොසත් වී තිබුණි.	2023	කඩිනමින් සේවක සංඛ්‍යාව සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු වේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම.	ඉල්ලුම්කරන ලද කාර්යය මණ්ඩලය සඳහා ස්ථිර පදනම මත අනුමැතිය ලබා ගැනීමට 2023 ඔක්තෝබර් 23 වන දිනැති ලිපියෙන් නැවත වතාවක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට ඉල්ලීමක් කර ඇත.	අනුමත කර ගෙන නොතිබුණි.
25.	විශ්වවිද්‍යාලයේ අනුමත කාර්ය මණ්ඩලය අනුව 103 දෙනෙකු කළමනාකරණ සහකාර සඳහා බඳවා ගත යුතු වුවත්, වැඩ බලන ලේඛකාධිකාරි විසින් අංක කොආවි/පා/පොදු/36 හා 2024 ජුනි 18 දිනැති ලිපිය මඟින් ලබාදී තිබූ තොරතුරු අනුව කළමනාකරණ සහකාර සඳහා ස්ථිර සේවයේ 101 දෙනෙකු හා කොන්ත්‍රාත් පදනම	2023	සියළු බඳවා ගැනීම් අනුමත කාර්ය මණ්ඩලයට අනුව සිදු කළ යුතු වීම.	වැළැක්වීමේ ක්‍රියාමාර්ග සිදු කර නැත.	විශ්වවිද්‍යාලය මෙතෙක් ඉදිරිපත් කරන ලද කාර්ය මණ්ඩල යෝජනා අතුරින් මේ වන විට ඉතාමත් හදිසි යෝජනා පිළිබඳ දන්වමින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශයට 2024.05.10 දිනද

	මත 38 දෙනෙකු බඳවා ගෙන තිබූ අතර, මෙලෙස 139 දෙනෙකු බඳවා ගැනීම හේතුවෙන් 36 දෙනෙකු අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා බඳවා ගෙන තිබුණි.				නැවතත් ඉල්ලීමක් ඉදිරිපත් කර තිබුණි.
26.	කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් හෙක්ටයාර් 21.5815 ක භූමියේ විශ්වවිද්‍යාලයීය ශික්ෂණ රෝහල ස්ථාපිතකර තිබූ අතර, එම ඉඩමේ නීත්‍යානුකූල අයිතිය සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් විශ්වවිද්‍යාලය වෙත පැවරී නොතිබුණි. එහෙත් එම භූමියෙහි ඉදිකර තිබුණු ශික්ෂණ රෝහලට අයත් ගොඩනැගිලිවල වටිනාකම රු.45,385,484,229 ක් වූ අතර, භූමිය සංවර්ධනය කිරීම වෙනුවෙන් රු.1,216,884,293 ක පිරිවැයක්ද දරා තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන්වන විට ඉදිකිරීම් අවසන්කර වර්ෂ 07 කට අධික කාලයක් ගතවී ඇතත් අදාල ඉඩම අත්පත්කර ගැනීමේ කාර්යයන් අවසන්කර නොතිබුණි.	2023	කඩිනමින් ඉඩම පවරා ගැනිමට කටයුතු කළ යුතු වීම.	මහා භාණ්ඩාගාරය යටතේ පිහිටුවන ලද අක්‍රීය තත්ත්වයේ පවතින සීමාසහිත ප්‍රොවිඩන්ට් ප්‍රොපර්ටි ලංකා සමාගම සතු එම ඉඩම් කොටස් මහා භාණ්ඩාගාරය වෙතින් ලබා දෙනු ලබන තීරණය පරිදි ඉඩම් අමාත්‍යාංශය වෙතින් භුක්තිකරුවන් වෙත පවරාදීමේ ඉදිරි කටයුතු සිදු කිරීමට නියමිතව ඇත.	මහා භාණ්ඩාගාරය යටතේ පිහිටුවන ලද අක්‍රීය තත්ත්වයේ පවතින සීමාසහිත ප්‍රොවිඩන්ට් ප්‍රොපර්ටි ලංකා සමාගම සතු එම ඉඩම් කොටස් රජයේ ඉඩම් සේ සලකා උක්ත ගැටලුව නිරාකරණය කර ගැනීම සඳහා මහා භාණ්ඩාගාරයේ එකගතාවය ලබා දෙන්නේද යන්න අංක 4/10/46926 දරණ ඉඩම් කොමසාරිස් ජෙනරාල් දෙපාර්තමේන්තු ලිපිය මගින් මහා භාණ්ඩාගාර ලේකම්තුමාගෙන් ඉල්ලුම් කර ඇති අතර, මහා භාණ්ඩාගාරය වෙතින් ලබා දෙනු ලබන තීරණය පරිදි ශීර්ෂගත ඉඩම පවරා ගැනීමේ ඉදිරි කටයුතු සිදු කරන ලබන බව දන්වන

					ලදී.
27.	1988 අංක 27 හා 2007 අංක 50 දරන පනත් මගින් සංශෝධිත 1981 අංක 68 දරණ ජෙනරල් ශ්‍රීමත් ජෝන් කොතලාවල රාජ්‍ය ආරක්ෂක අභ්‍යාස ආයතන පනත ප්‍රකාරව 2011 වර්ෂයේ සිට කැඩෙට් නිළධරයන් හෝ රජයේ නිළධරයන් නොවන දේශීය හා විදේශිය සිසුන් වෙත මුදල් ගෙවීමේ පදනම මත උපාධි පිරිනැමීම ආරම්භකර තිබුණි. තවද, 2018 මාර්තු 21 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී ශිෂ්‍යයන් බඳවාගැනිම සහ පාලක මණ්ඩලයේ තීරණ වලංගුතාවය යන කරුණු ආවරණය වන ලෙස විශ්වවිද්‍යාලයට ගැලපෙන ලෙස අදාල පනත සංශෝධනය කරගන්නා ලෙස දැනුම් දී තිබුණද සමාලෝචිත වර්ෂය තුලදී ද පනත සංශෝධන කාර්යය අවසන්කර නොතිබුණි.	2023	කඩිනමින් පනත සංශෝධනය කර ගැනීමට කටයුතු කළ යුතු වීම.	නීති කෙටුම්පත් සම්පාදක විසින් අවසන් කෙටුම්පත 2024.06.25 දින මෙම විශ්වවිද්‍යාලයට පිටපත් සහිතව ආරක්ෂක අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. උක්ත අවසන් කෙටුම්පත සඳහා නීතිපති වෙතින් ව්‍යස්ථානුකූලභාවය පිළිබඳ සහතිකය ලබා ගැනීමට කටයුතු කරන ලෙස ආරක්ෂක අමාත්‍යාංශය වෙතින් 2024.06.27 දින ඉල්ලීම් කරන ලදී.	අමාත්‍ය මණ්ඩල අනුමැතිය ඉල්ලා අමාත්‍ය මණ්ඩල සංදේශයෙහි කෙටුම්පත 2024 ජුලි 23 වන දින ආරක්ෂක අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. නීති කෙටුම්පත් සම්පාදක විසින් 2024 සැප්තැම්බර් 02 වන දින අවසන් පනත් කෙටුම්පත හා නීතිය බලපෑමේ ප්‍රකාශය භාෂා ත්‍රිත්වයෙන් මෙම විශ්වවිද්‍යාලයට පිටපත් සහිතව ආරක්ෂක අමාත්‍යාංශය වෙත යොමු කර ඇත.
28.	2018, 2019 සහ 2020 වර්ෂයන්වලදී Pneumatic Tourniquet Pump System, Traumatology Instrument, PMGS Accessories සහ	2023	කඩිනමින් නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතු වීම.	KDU/PRO/CAP/ 1353/2017 අයිතමයන් විශ්වවිද්‍යාල රෝහල වෙත ලැබී ඇති අතර, ඒවා ලෙජර්ගත කර ඇති නමුත් තත්ත්ව	2024 ඔක්තෝබර් 24 දින වන විටත් නිරවුල් කර නොතිබුණි.

	Endoscopy For Medicine යන මිලදී ගැනීම් වෙනුවෙන් රු.48,834,173 ක් අත්තිකාරම් ලෙස ගෙවා තිබූ අතර ඒ අනුව මිලදී ගත් වත්කම් තත්ත්ව පරීක්ෂා වලින් අසමත් වී තිබීම හේතුවෙන් ගිණුම් තුළ නිරවුල් නොවී පැවති අතර වර්ෂ 3 ත් 5 ත් අතර කාලයක් ගත වී තිබුණ ද එම පාඩුව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.			පරීක්ෂණයෙන් අසමත් වී ඇත. මේ පිළිබඳ සැපයුම්කරු මීට පෙරද දැනුවත් කර ඇති නමුත්, සැපයුම්කරු විසින් මේ සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් මේ වන තෙක් සිදුකර නොමැත. එමනිසා මෙම අයිතම ගෙවීම් කටයුතු කිරීම සඳහා ඉදිරිපත් කිරීමට නොහැකි වී ඇත.	
29.	විශ්වවිද්‍යාලය, රෝහල සහ දක්ෂිණ මණ්ඩපයේ 2015 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා ගැණුම් අත්තිකාරම් හා මුදල් අත්තිකාරම් පිළිවෙලින් රු.361,404,619 ක් හා රු.4,897,892 ක් 2023 දෙසැම්බර් 31 දින වන විට ද පියවීමට කටයුතු කර නොතිබුණි. තවද, දක්ෂිණ මණ්ඩපයේ 2023 වර්ෂයේ ජනවාරි මස සිට සැප්තැම්බර් 22 දක්වා අවස්ථා 22 කදී ලබාදී තිබූ එකතුව රු.895,000 ක් වූ අත්තිකාරම් දින 14 ත් දින 117 ත් අතර ප්‍රමාදයකින් යුක්තව පියවා තිබූ අතර අවස්ථා 07 ක දී ලබා දී තිබූ රු.280,000 ක් වටිනා අත්තිකාරම්,	2023	කඩිනමින් පියවා ගැනීමට කටයුතු කළ යුතු වීම.	තවදුරටත් නිරවුල් කර ගත යුතුව ඇති අත්තිකාරම් ලබාගත් අයවලුන් වෙත නිරවුල් කරන ලෙසට දැනුවත් කර ඇති අතර එසේ නිරවුල් නොකරන අයවලුන් සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ලැබේ.	එසේ ලබා ගත් අයවලුන් වෙත අදාල අත්තිකාරම් මුදල් නිරවුල් කරන ලෙසට දැනුවත් කර ඇති අතර එසේ නිරවුල් නොකරන අයවලුන් සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ලබන බවත්, දක්ෂිණ මණ්ඩපයේ 2023 වර්ෂය සඳහා ලබා දුන් අත්තිකාරම් දෙකක් හැර අනෙකුත් සියළු අත්තිකාරම් නිසි ලෙස නිරවුල් කර ඇති අතර නිරවුල් නොකරන ලද අත්තිකාරම් ලබාගත් අයවලුන් වෙත කඩිනමින්

	වියදම් කිරීමකින් තොරව සම්පූර්ණ අත්තිකාරම් මුදලම, මුදලින් පියවීමට කටයුතු කර තිබුණි. ඒ අනුව එම මුදල් දින 9 ත් දින 66 ත් අතර කාලයක් අදාළ නිලධාරීන්ගේ අතරැඳී තිබුණි.				නිරවුල් කරන ලෙසද දැනුවත් කර ඇති බවත්, නිරවුල් නොකල අත්තිකාරම් ඉදිරියේදී කඩිනමින් නිරවුල් කරනු ලබන බවත් දන්වන ලදී.
30.	මෙට්‍රොපොලිටන් කැම්පස්හි 2023 වර්ෂයේ ජනවාරි සිට සැප්තැම්බර් දක්වා පාඨමාලා 56 ක් සැලසුම් කර තිබූ නමුත් ඉන් පාඨමාලාව 12 ක් පමණක් පවත්වා තිබූ අතර, පාඨමාලා 44 ක් පවත්වා නොතිබුණි. පවත්වා තිබූ පාඨමාලා 12 අතුරින් පාඨමාලා 11 ක් සඳහා සැලසුම් කරන ලද ශිෂ්‍ය සංඛ්‍යාවක් සහභාගි වී නොතිබූ අතර එය සියයට 20 ත් සියයට 50 ත් අතර පරාසයක විය. තවද, මෙහිදී සැලසුම් කරන ලද පාඨමාලා 56 ක් අතුරින් පාඨමාලා 44 ක් සඳහා ඉල්ලුමක් නොතිබුණි.	2023	ඉල්ලුමක් පවතින නව පාඨමාලා ඇතුලත් කළ යුතු වීම.	කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයට අයත් පීඨයක් අප ආයතයේ ස්ථාපිත කිරීමට කටයුතු කර ඇති අතර, පාඨමාලා 3 ක සිසුන් මෙහි අධ්‍යාපනය ලබන අතර, ඉදිරියේදී නව පාඨමාලා සඳහා සිසුන් බඳවා ගැනීම සිදු කරන අතර, ඉදිරියේදී සම්පත් උපරිම කාර්යක්ෂමව උපයෝජනය කිරීමට කටයුතු කරේ.	ප්‍රධාන වශයෙන් රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ ඉල්ලුමක් පවතින පාඨමාලා සිදු කිරීම සඳහා අවධානය යොමු කර ඇති බවත්, කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයට අයත් පීඨයක් එහි ස්ථාපිත කිරීමට කටයුතු සිදු කර මේ වන විට කණ්ඩායම් 03 ක සිසුන් 150 කට ආසන්න සංඛ්‍යාවක් ඉගෙනීම් කටයුතු වල නිරත වන බව දන්වන ලදී.
31.	දක්ෂිණ මණ්ඩපය සහ විශ්වවිද්‍යාල රෝහල විසින් මිලදී ගෙන තිබූ විවිධ අයිතම 57 කට අයත් තොග ඒකක 443,695 ක් 2018 වර්ෂයේ සිට නිශ්කාර්යව පැවති	2023	සපයා ගනු ලබන වෛද්‍ය උපකරණ ඵලදායී ලෙස උපයෝජනය කළ යුතු වීම.	කම්බි තොගය නුදුරේදී ඉදිවීමට නියමිත කුරුණෑගල මණ්ඩපයෙහි ඉදිකිරීම් කටයුතු සඳහා සහ දක්ෂිණ මණ්ඩපයෙහි නව	වෛද්‍ය උපකරණ ඉදිරියේදී රෝහලේ ආරම්භ කිරීමට නියමිත සහ දැනට ක්‍රියාත්මක වන වාට්ටු, අංශ, ආයතන, සායන සඳහා අවශ්‍යතාවය

	අතර ඉන් වටිනාකම රු.79,612,689 වූ තොග අයිතමයන් තුල රෝහල සඳහා මිලදී ගෙන තිබූ වගකීම් කාලය ඉක්ම වූ වෛද්‍ය උපකරණ වටිනාකම රු.76,825,839 ක් විය.			ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා භාවිතා කිරීමට ගබඩාකොට ඇත. කොටින් ෆයිල් ලේස් අතිරික්ත තොගයක්ව පැවතීම හේතුවෙන් කොආවි රත්මලාන වෙතින් උපදෙස් ඉල්ලා සිටින ලදී. මෙතෙක් ඒ සඳහා උපදෙසක් නොලැබුණු අතර මෙම තොගයෙන් අධික ප්‍රමාණයක් කො.ආ.වි. රත්මලානෙහි භාවිතය සඳහා ලබා දී ඇත. වෛද්‍ය උපකරණ රෝගීන්ගේ ප්‍රයෝජනය සඳහා ඉදිරියේදී දැනට ක්‍රියාත්මක වන වාට්ටු, අංශ, ආයතන හා සායනයන් සඳහා අවශ්‍යතාවයන් මත නිකුත් කිරීම සිදු කරයි.	මත නිකුත් කිරීම සිදු කරනු ලබන බව දන්වන ලදී. අනෙකුත් අයිතම නිශ්කාර්යව පවතී.
32.	මෙට්‍රොපොලිටන් කැම්පස් අධ්‍යයන ආයතනයෙහි ගොඩනැගිල්ල වර්ග අඩි 11,074 බැගින් වූ මහල් 05 කින් හා වර්ග අඩි 10,104 වූ 6 වන මහලකින් සමන්විත වූ අතර, මෙම මහල් තුළ ආසන ධාරිතාව 875 ක් වූ දේශන සඳහා භාවිතා	2023	දේශන ශාලා පූර්ණ වශයෙන් උපයෝජනය කිරීමට කටයුතු කළයුතු වීම.	අප ආයතනයේ සියලුම මහල්වල පවත්නා පහසුකම් වෙබ් අඩවිය, මුහුණු පොත, අත් පත්‍රිකා, අත් පොත වැනි අලෙවිකරණ මාර්ග ඔස්සේ ප්‍රවර්ධනය කිරීමට කටයුතු කරනු ලැබේ.	දෛනික පාඨමාලා සඳහා දේශන ශාලා භාවිතා කිරීම සාමාන්‍යය පරිදි සිදු කරන අතර, කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයට අයත් පීඨයක් අප ආයතයේ ස්ථාපිත කිරීමට කටයුතු සිදු

	කළ හැකි ශාලා 7 ක් පැවති නමුත් මෙම ශාලා වැඩි කාලපරිච්ඡේදයක් ඌණ උපයෝජිතව පැවති බව නිරීක්ෂණය විය.				කර දැනට කණ්ඩායම් 03 ක සිසුන් සඳහා දේශන ශාලා භාවිතා කිරීමත්, ආයතනයේ සියලුම මහල්වල පවත්නා පහසුකම් වෙබ් අඩවිය, මුහුණු පොත, අත් පත්‍රිකා, අත් පොත වැනි අලෙවිකරණ මාර්ග ඔස්සේ ප්‍රවර්ධනය කිරීමට කටයුතු කරනු ලබන අතර ආයතනයෙහි අත් පත්‍රිකා, අත් පොත් වැනි දෑ මාසිකව, තෙමාසිකව ආයතන වෙත යැවීමට කටයුතු කිරීමත් කරන බව දන්වන ලදී.
33.	2018 වර්ෂයේදී විශ්වවිද්‍යාල රෝහලේ රසායනාගාර පරීක්ෂණ ද්‍රව්‍යයන් හා වාර්තාවන් ප්‍රවාහනය කිරීමේ අරමුණින් රු.96,846,900 (ඇ.ඩො.530,000) ක් වැය කර අංශ (Stations) 56 ක් සම්බන්ධ කරමින් වායු නල පද්ධතියක් ස්ථාපනය කර තිබූ අතර, ඉන් අංශ 52 ක් සඳහා පමණක් සමාලෝචිත වර්ෂයේ ගමන්වාර සිදු කර තිබුණි. ඉන් ගමන්වාර 100 කට වඩා අඩුවෙන්	2023	වායු නළ පද්ධතිය උපරිම ධාරිතාවයෙන් රෝහල් කටයුතු සඳහා භාවිතයට ගත යුතු වීම.	වැළැක්වීමේ ක්‍රියාමාර්ග සිදු කර නැත.	විශ්වවිද්‍යාල රෝහලෙහි වායුනල පද්ධතියේ අංශ (station) 56ක් ස්ථාපිත කර ඇති අතර රෝහල පූර්ණ ධාරිතාවයකින් ක්‍රියාත්මක නොවීම නිසා ඇතැම් ස්ථාන (ICU 02, ICU 03, ICU 4, ward 07, ward 08) වල ඇති අංශ (station) භාවිතා නොකිරීම වායුනල පද්ධතියේ ඌන උපයෝජනයට හේතු වී ඇති බව

	සිදුකර කර තිබූ අංශ 25 ක් පැවති අතර ඒ අනුව ඌණ උපයෝජිත අංශ ප්‍රමාණය සියයට 44 ක් විය. රෝහල පූර්ණ ධාරිතාවයෙන් ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් රෝහලේ ඇතැම් අංශ භාවිතයට නොගැනීමද මෙම වායු නළ පද්ධතිය ඌණ උපයෝජනයට හේතු වී තිබුණි.				දන්වන ලදී.
34.	සමාලෝචිත වර්ෂය අවසන් වන විටද රෝහලේ වාට්ටු අංක 5A, 7A හා 7B සහ දැඩි සත්කාර ඒකක 02, 03 හා 04 යන අංශ 2022 මැයි මස සිට උපයෝජනයෙන් තොරව පැවති අතර, ඒ තුල පැවති රු.210,190,808 ක් වටිනා වෛද්‍ය උපකරණද නිශ්කාර්යව පැවතුණි.	2023	වාට්ටු පූර්ණ ධාරිතායෙන් භාවිතා කිරීමට උපායමාර්ග සැකසිය යුතු වීම.	වාට්ටු අංක 7-A දෙවන වෛද්‍ය වාට්ටුව ලෙස විවෘත කිරිමට සැලසුම් කර ඇති අතර, වාට්ටු අංක 07- B පෞද්ගලික අංශයේ වාට්ටුවක් වේ. එය වාට්ටු අංක 09-B සහ 09-A පෞද්ගලික ධාරිතාවය ඉක්මවා ගිය විට රෝගීන් ඇතුළත් කිරීම සිදු කරන අතර දැනට පවතින දැඩි කාර්යය මණ්ඩල හිගය මනාව කළමනාකරණය කිරිමට අවශ්‍ය බැවින්, වාට්ටු අංක 08-B සහ 09-B උපරිමයෙන් භාවිතා කරනු ලැබේ. තවද, දැඩිසත්කාර ඒකක 02 දැනට ආරම්භ කිරිමට පවතින හෘද උරස් ඒකකය	වාට්ටු අංක 7-A දෙවන වෛද්‍ය වාට්ටුව ලෙස විවෘත කර ඇති අතර මේ වන විට නේවාසික රෝගීන් 66 කට නේවාසික ප්‍රතිකාර ලබා දෙන බවත්, වාට්ටු අංක 07- B පෞද්ගලික අංශයේ වාට්ටුවක් වන අතර එය වාට්ටු අංක 09-B සහ 08-A පෞද්ගලික ධාරිතාවය ඉක්මවා ගිය විට රෝගීන් ඇතුළත් කිරීම සිදු කරන අතර දැනට පවතින දැඩි කාර්යය මණ්ඩල හිගය මනාව කළමනාකරණය කිරිමට අවශ්‍ය බැවින් වාට්ටු අංක 08-B සහ 09-B උපරිමයෙන් භාවිතා කරනු ලබන බවත්,

සඳහා භාවිතා කිරිමට පවතින අතර, එම ඒකකය ආරම්භ කිරීමට අවශ්‍ය කටයුතු සපුරා ගැනීමෙන් අනතුරුව දැඩිසත්කාර ඒකක 02 සඳහා එම උපකරණයන් ලබා දිමට කටයුතු කරමි. එමෙන්ම, දැඩිසත්කාර ඒකක 03 සහ 04 ආරම්භ කිරිම සඳහා අවශ්‍ය මානව සම්පත් ලබා ගැනිම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය සමග සාකච්ඡා වට කිහිපයක්ම පවත්වා ඇත.

දැඩිසත්කාර ඒකක 02 දැනට ආරම්භ කිරීමට පවතින හෘද උරස් ඒකකය සඳහා භාවිතා කිරිමට පවතින අතර එම ඒකකය ආරම්භ කිරීමට අවශ්‍ය කටයුතු සපුරා ගැනීමෙන් අනතුරුව දැඩිසත්කාර ඒකක 02 සඳහා එම උපකරණයන් ලබා දිමට කටයුතු කරන බවත්, දැඩිසත්කාර ඒකක 03 සහ 04 ආරම්භ කිරිම සඳහා අවශ්‍ය මානව සම්පත් ලබා ගැනිම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය සමග සාකච්ඡා වට කිහිපයක්ම පවත්වා ඇති අතර එම මානව සම්පත් ලබා ගැනිම අවබෝධතා ගිවිසුමක් මගින් ලබා ගැනිම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිතී උපදේශක වෙත ඉදිරිපත් කර ඇති අතර නිතීපති දෙපාර්තමේන්තුවේ උපදෙස් සඳහාද යොමුකොට සාකච්ඡා වටයක් පවත්වා ඇති අතර ඒ අනුව එම ගිවිසුම අත්සන් කිරීමෙන් අනතුරුව ඒ සඳහා

					අවශ්‍ය මානව සම්පත් ලැබෙනු ඇති අතර එවිට එම ඒකකද ආරම්භ කිරීමෙන් පසු එම වෛද්‍ය උපකරණද භාවිතයට ගැනීමේ හැකියාව ඇති බවත් දන්වා සිටින ලදී.
35.	2023 දෙසැම්බර් 31 දිනට රු.215,240,527 ක් වැය කර රෝහලේ ස්ථාපිත කිරීමට සැලසුම් කර තිබූ කළමනාකරණ තොරතුරු පද්ධතිය නිම කිරීම 2023 පෙබරවාරි 24 දිනට නියමිතව තිබූ අතර එය අවස්ථා 2 කදී කාලය දීර්ග කිරීමෙන් පසු මෙම ව්‍යාපෘතිය 2024 මැයි 28 දින වන විට අවසන් කළ යුතුව පැවතිය ද 2024 ජුනි 11 දින වන විටත් මෙම ව්‍යාපෘතියෙහි ප්‍රගතිය සියයට 68.5 ක මට්ටමේ විය.	2023	සැලසුම් කල පරිදි පද්ධතිය ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතු වීම.	වැළැක්වීමේ ක්‍රියාමාර්ග සිදු කර නැත.	2024 ඔක්තෝම්බර් මස 08 වන දින සිට දින 90 ක කාලයක් සඳහා තෙවන වරටත් කාලය දීර්ඝ කිරීමක් ලබාදී තිබූ අතර මේ වන විට ස්ථාපිත කිරීමේ ප්‍රගතිය දෘඩාංග ස්ථාපනය සියයට 70 ක්, මෘදුකාංග ස්ථාපනය සියයට 100 ක්, මෘදුකාංග අභිරුචිකරණය සියයට 80 ක් සහ සමස්ත ප්‍රගතිය සියයට 77 ක් බව දන්වන ලදී.
36.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 වගන්තිය ප්‍රකාරව විධිමත් ප්‍රතිග්‍රහනය ලිපියක් නිකුත් කළ වහාම රු.500,000 ඉක්මවන භාණ්ඩ හෝ සේවා කොන්ත්‍රාත් සඳහා විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක්	2023	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.	මෙය නිවැරදි කර ගනිමින් ප්‍රසම්පාදන මාරගෝපදේශ 8.9.1ට අදාලව, රු.500,000 ඉක්මවන “ භාණ්ඩ හා සේවා” මිලදී ගැනීම් සඳහා, සුදුසුකම් ලද සැපයුම්කරුවන් සමඟ ගිවිසුම් ගත	මෙම නිරික්ෂණ නිවැරදි කර ගනිමින් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 8.9.1 ට අදාලව, රු.500,000 ඉක්මවන “ භාණ්ඩ හා සේවා” (Good and Service) මිලදී ගැනීම් සඳහා, සුදුසුකම් ලද

	ලියා අත්සන් කළ යුතු වුවත්, දක්ෂිණ මණ්ඩපයේ නියැදි විගණනයේදී රු.500,000 ක් ඉක්මවූ එකතු වටිනාකම රු.20,728,998 ක් වූ ප්‍රසම්පාදනයන් 27 ක ප්‍රසම්පාදන ලිපිගොනු තුල කොන්ත්‍රාත් ගිවිසුමක් ඇතුලත් නොවූ අතර ලංසු ලේඛනවලද ඒ සඳහා වගන්තියක් ඇතුලත් කර නොතිබුණි.			වීම් මේ වන විටත් සිදු කරමින් පවතී.	සැපයුම්කරුවන් සමග ගිවිසුම් ගත වීම් මේ වන විටත් සිදු කරමින් පවතී.
37.	දක්ෂිණ මණ්ඩපයේ ඉදිකෙරෙමින් පැවති මණ්ඩපාධිපති නිවස්නය හා කැඩෙට් නිලධාරී නිවස්නය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය අවස්ථා කිහිපයකදී මිලදී ගැනීමට කටයුතු කර තිබුණි. ඒ අනුව මණ්ඩපාධිපති නිවස්නය සඳහා අවශ්‍ය දැව වෙනුවෙන් රු.3,980,725 ක් හා කැඩෙට් නිලධාරී නිවස්නයට දඟර වානේ කම්බි මිලදී ගැනීම වෙනුවෙන් රු.6,222,018 ක් වැය කර තිබූ අතර මෙම මිලදී ගැනීම් පිළිවෙලින් අවස්ථා 07 කදී හා 08 කදී සිදුකර තිබුණි. තවද, කැඩෙට් නිලධාරී නිවස්නය සඳහා වටිනාකම රු.2,124,000 ක් වූ ඇඳන් 24 ක් අවස්ථා 03	2023	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.	වැළැක්වීමේ ක්‍රියාමාර්ග සිදු කර නැත.	ඒ අනුව අවශ්‍යතාවය පැනනගින ආකාරය මත භාණ්ඩ ඉල්ලුම් කිරිම සිදු කර ඇති බව දන්වා තිබුණි.

	කදී එකම සැපයුම්කරුවෙකුගෙන් මිලදී ගැනීම් යන අවස්ථාවලදී සමස්ථ මිලදී ගැනීම වෙනුවෙන් ලබා ගත හැකිව තිබූ මිල වාසිය අහිමි වී තිබුණි.				
38.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.6 වගන්තිය ප්‍රකාරව පැහැදිලි පිරිවිතර පිළියෙල කල යුතු වුවත් එවැනි පිරිවිතර පිළියෙල නොකර මිල ගණන් ලබාගෙන දක්ෂිණ මණ්ඩපයේ කෘමි සතුන් මර්ධනය සඳහා රසායන ද්‍රව්‍ය සහ මෙට්‍රොපොලිටන් කැම්පස් ආයතනය සඳහා ශ්‍රව්‍ය දෘශ්‍ය පද්ධතියක් (Audio Visual System) මිලදී ගැනීමේදී පිළිවෙලින් රු.907,280 ක් හා රු.934,000 ක් වැය වී තිබුණි. තවද, ශ්‍රව්‍ය දෘශ්‍ය පද්ධතිය මිලදී ගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 ප්‍රකාරව විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ නොතිබුණි.	2023	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.	කෘමි සතුන් මර්ධනයට අදාළව ලංසු කැඳවීමේදි වර්ග අඩි මත ලංසු කැඳවූ අතර, ලංසු කරුවන් ස්ථානීය පරීක්ෂාවක් සිදු කිරිමකින් තොරව වරග අඩි මත ලංසු කැඳවීමේ පත සම්පූර්ණ කර ඇත. මෙහිදී සියළුම කෘමීන් ආවරණය වන පරිදි මෙම ලංසු කැඳවීම සිදු කර ඇත. මෙට්‍රොපොලිටන් කැම්පස් (ගරන්ටි) ලිමිටඩ් ආයතන කටයුතු සිදු කරගෙන යන අවධියේ දී සිදු කර ඇති අතර මෙම මිලදී ගැනීමට අදාලව සකසන ලද පිරිවිතරයන් මිලදී ගැනීම් අයදුම්පත අනුමත කිරීමේදී අදාල පිරිවිතරයන් ඉදිරිපත් කර අනුමත කරගෙන ඇති අතර, එම අනුමත කරගත් අයදුම්පත අනුව	මේ වන විට ආයතනයෙහි ප්‍රසම්පාදන කටයුතු නිසි ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු සිදු කිරීමට කටයුතු යොදා ඇති බව දන්වන ලදී.

				ලංසු ලේඛන පිළියෙල කර සැපයුම්කරුවන් වෙත ඉදිරිපත් කර ඇත.	
39.	ශ්‍රවණාගාරය ඉදිකිරීම අදියර තුනකින් 2010, 2011, සහ 2012 වසරවලදී නිම කිරීමට ඇස්තමේන්තු කර තිබුණද, 2015 වසර දක්වාම මෙම ඉදිකිරීමේ කටයුතු නිම කර නොතිබුණි. 2015 වසරේ සිට 2019 වසර දක්වා වසර 04 ක කාලයක් තුල මෙම ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු නවතා දමා තිබූ අතර, ඒ හේතුවෙන් ගොඩනැගිල්ලට වී තිබූ හානිවීම් නැවත සකස් කිරීම සඳහා රු. 8,458,531ක මුදලක් වැය කර තිබුණි. තවද, මාස 14 ක් ඇතුලත එනම් 2021 අගෝස්තු 31 දින වන විට ඉතිරි වැඩ නිම කිරීමට ඇස්තමේන්තු කර තිබුණද, 2024 පෙබරවාරි වන විටත් වැඩ අවසන් කිරීමට විශ්වවිද්‍යාලයට නොහැකි වී තිබුණි. මෙහිදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.11 වගන්තියට පටහැනිව ශ්‍රවනාගාරය සඳහා රු.5,670,000 වටිනා	2023	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.	වර්තමාන උපදේශක ආයතනය විසින් ව්‍යුහාත්මක කොටස් වල ශක්තිය වැඩි කල යුතු බව පෙන්වා දී ඇත. පළමු අදියරේදී උපදේශක ආයතනය විසින් සැලසුම්පත් ලබා දී ඔවුන්ගේ අධීක්ෂණය යටතේ ඉදිකරන ලද කොන්ක්‍රීට් කොටස් වල ශක්තිය ප්‍රමාණවත් නොවන බැවින් ඒවා කඩා ඉවත් කර නැවත ඉදිකිරීම සිදුකර ඇත. රු.8,458,530.58 ක මුදල මුල් අදියරෙහි වැඩබිම තුළ ඉදිකිරීම් කටයුතු සිදුකරන ලද වෘත්තිකයින්ගේ ඉදිකිරීම් අධීක්ෂණය, සුපරීක්ෂණය හා ඉදිකිරීම්හි ගුණාත්මකභාවය දුර්වල මට්ටමක පැවතීම යන හේතූන් නිසාවෙන්	2024 ඔක්තෝබර් 10 දින වන විටත් ශ්‍රවනාගාරයේ ඉදිකිරීම් කටයුතු අවසන් කර නොතිබුණි.

	ටෝර් ස්ටීල් මිලදී ගැනීමේ දී ලංසු සුරක්ෂණයක් ලබාගෙන නොතිබුණි. එමෙන්ම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 වගන්තියට පටහැනිව කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹීමකින් තොරව මෙම ගොඩනැගිල්ල වෙනුවෙන් අවස්ථා 9 කදී රු.25,345,980 ක් වටිනා ප්‍රසම්පාදනයන් සිදුකර තිබූ බව නියැදි විගණනයේ දී අනාවරණය විය.			සිදුව නොමැති බව හා ඒ සඳහා වෙනත් හේතුන්ද බලපා ඇති බව පෙන්වා දෙමි.	
40.	ප්‍රසම්පාදන අත්පොතේ 3 වන පරිච්ඡේදයට පටහැනිව රු.11,036,177ක් වටිනා SAGE ගිණුම්කරණ මෘදුකාංගය මිලදී ගැනීම සඳහා වෙළඳපොල මිල සැඳැහුම් ක්‍රමය භාවිතා කර තිබීමෙන් ජාත්‍යන්තර/ ජාතික තරඟකාරී ලංසුකරුවන්ගේ මිල ගණන් කැඳවීමකින් අත්කර ගතහැකිව තිබූ වාසි අහිමි වී තිබුණි.	2023	ප්‍රසම්පාදන අත්පොත ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.	SAGE ගිණුම්කරණ මෘදුකාංගය මිලදි ගැනිමේදි එවකට පැවති හදිසි අවශ්‍යතාවය මත සහ මෙම විශ්වවිද්‍යාලයේ මූල්‍යාධිකාරී කාර්යාලයේ ගිණුම් අංශයේ වැටුප් සැකසීම සහ අනෙකුත් ගිණුම් කටයුතු වෙනුවෙන් ලංසු කැඳවීම සඳහා වෙළඳපොල මිල සඳැහුම් ක්‍රමය භාවිතා කර ඇත.	ඉදිරියේදී මෘදුකාංග මිලදී ගැනීමේදී එම මාර්ගෝපදේශ, අත්පොත් සහ වගන්ති අනුව කටයුතු කරනු ලබන බව දන්වා තිබුණි.
41.	2022 මැයි 09 දිනැති ප්‍රසම්පාදනය ප්‍රදානය කිරීමේ ලිපිය මඟින් SAGE 300 ERP Solution පරිගණක මෘදුකාංගය 2022 ජුනි	2023	ප්‍රසම්පාදන අත්පොත ප්‍රකාරව කටයුතු කළ යුතු වීම හා මෘදුකාංගයේ සියළු	වැටුප් පිළියෙල කිරීමේ මොඩියුලය (Payroll Module) නිසි පරිදි ස්ථාපිත කර ඇති මුත් අප විසින් සිදු කල යුතු	කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

25 දිනට හෝ ඊට පෙර ස්ථාපිත කල යුතු වුවද, 2024 ජූනි මස 19 වැනිදා වන විට වැටුප් පිළියෙල කිරීමේ මොඩියුලය ස්ථාපිත කර ඇති නමුත් එය ක්‍රියාකාරී මට්ටමේ නොතිබුණි. ප්‍රසම්පාදන අත්පොතේ 2.4 වගන්තිය ප්‍රකාරව 2022 මැයි 06 දින පැවති තාක්ෂණික ඇගයීම් කමිටුවේ වාර්තාවෙහි එක් සාමාජිකයෙකු අත්සන් තබා නොතිබීම හේතුවෙන් එහි වලංගුතාවය පිළිබඳ සෑහීමකට පත්විය නොහැකි විය.	මොඩියුලයන් කඩිනමින් භාවිතයට ගත යුතු වීම.	දත්ත ඇතුළත් කිරීම් සිදු කරමින් පවතින බැවින්, එකී දත්ත ඇතුළත් කිරීම් අවසන් කර පරීක්ෂා කිරීමෙන් පසු සජීවීව ක්‍රියාකාරී තත්ත්වයෙන් මෙම මොඩියුලය භාවිතයට ගත හැක.

3.64 ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බද්දු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	1,799,887,770	708,034,166	1,091,853,604	70,461,437	තත්ත්වාගණනය කළ
2022	1,868,936,790	512,584,148	1,356,352,642	266,985,728	තත්ත්වාගණනය කළ
2023	2,328,149,016	630,465,288	1,697,683,727	235,379,561	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	සංවිධානය සඳහා නීතිමය තත්ත්වය ප්‍රදානය කිරීම වෙනුවෙන් පිළියෙල කල පනත් කෙටුම්පත 2022 සැප්තැම්බර් 26 දින නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව විසින් නීතිපති දෙපාර්තමේන්තුව වෙත යවා තිබුණද, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය පිහිටුවා වසර 31 ක් ගතවී ඇතත්, නීතිමය තත්ත්වය ප්‍රදානය කිරීම වෙනුවෙන් පනතක් සම්මත කර ගැනීමට නොහැකි වී තිබුණි.	2021,2022 සහ 2023 වර්ෂය	කඩිනමින් පනත සම්මත කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.	පසු විපරම් කිරීම සහ ප්‍රගතිය අධීක්ෂණය කිරීම	කැබිනට් තීරණය ප්‍රකාරව ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතන පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ 2024 අගෝස්තු මස 30 දින II කොටස අතිරේකයෙහි පළකර 2024.09.03 දින නිකුත් කරන ලදී. පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.
2	අවධානම් සහිත දිස්ත්‍රික්ක 14ක නායයෑම් පූර්ව අනතුරු හැඟවීම්	2022 සහ 2023 වර්ෂය	ස්වයංක්‍රීය වර්ෂාමාන පද්ධතිය නිසියාකාරව නඩත්තු කල	ස්වයංක්‍රීය වර්ෂාමාන පද්ධතිය නවීකරණය කිරීම සහ ප්‍රගතිය	මෙම වර්ෂාමාන සියල්ල අවුරුදු 05 කට වඩා පැරණි වන අතර විවිධ

	නිකුත් කිරීම සඳහා දත්ත ලබාගැනීමට ස්වයංක්‍රීය වර්ෂාමාන 330 ක් ස්ථාපිත කර තිබූ අතර එයින් වර්ෂාමාන 251 ක් පමණක් නායයෑම් පූර්ව අනතුරු ඇඟවීම් නිකුත් කිරීම සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ හදිසි මෙහෙයුම් මධ්‍යස්ථානයට සම්බන්ධ කර තිබුණි. ඉන් වර්ෂාමාන 198 කින් පමණක් දැනට තොරතුරු ලැබෙන බැවින් ඉතිරි වර්ෂාමාන අක්‍රිය තත්වයක හෝ තොරතුරු නොලැබෙන මට්ටමක පැවතුණි.		යුතුය.	අධීක්ෂණය කිරීම	තාක්ෂණික ගැටලු නිසා වර්ෂාමාන 100කට ආසන්න ප්‍රමාණයක් අක්‍රිය තත්වයක හෝ තොරතුරු නොලැබෙන මට්ටමක පැවතුණි. මෙම වර්ෂාමාණ අලුත්වැඩියා කිරීම ආර්ථික වශයෙන් ඵලදායී නොවන බැවින් CResMPA ව්‍යාපෘතිය යටතේ නව වර්ෂාමාන සවි කිරීමට සැලසුම් කර ඇති අතර මේ වන විට එම ටෙන්ඩරය ප්‍රධානය කර නව වර්ෂාමාන ස්ථාපනය කිරීම ආරම්භ කර ඇත.
3	2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නායයෑම් අවදානම් සහිත දිස්ත්‍රික්ක 11 කින් නායයෑම් පරීක්ෂණ වාර්තා ලබාගැනීම සඳහා ඉල්ලුම්පත් 5,388ක් ලැබී තිබුණු අතර තවදුරටත් නිර්දේශ ලබාදිය යුතු ඉල්ලුම්පත් සංඛ්‍යාව 1,545ක් විය. එසේම පසුගිය වර්ෂයේ ලද ඉල්ලුම්පත්ද ඇතුළුව 2023 දෙසැම්බර් 31 දිනට තවදුරටත්	2021,2022 සහ 2023 වර්ෂය	පරීක්ෂාව සඳහා ලබාදුන් ඉල්ලුම්පත් කඩිනමින් පරීක්ෂාකර වාර්තා ලබාදිය යුතුය.	ප්‍රමුඛතාවය ලබාදිය යුතු ඉල්ලීම් සඳහා වාර්තා නිකුත් කිරීම අධීක්ෂණය කිරීම	ප්‍රමුඛතාවය ලබා දිය යුතු සියලු ඉල්ලීම් සඳහා මේ වනවිට වාර්ථා ලබා දී ඇත.

	නිර්දේශ ලබාදිය යුතු ඉල්ලුම්පත් සංඛ්‍යාව 2,889 ක් වූ අතර එය වර්ෂය තුළ නිර්දේශ ලබාදීමට පැවති ඉල්ලුම්පත් ප්‍රමාණයෙන් සියයට 43 ක ප්‍රතිශතයක් විය.				
4	ජ්‍යෝෂ්ඨ විද්‍යාඥ - AR 2 තනතුරට බඳවාගැනීම සඳහා සකස් කරන ලද මූලික බඳවාගැනීම් පටිපාටියට පරිබාහිරව අනුමත නොවූ පටිපාටියක් සකස්කර සම්මුඛ පරීක්ෂණ 02 ක් පවත්වා බඳවාගැනීමේ පටිපාටියේ ප්‍රතිපාදන උල්ලංඝණය කරමින් එම තනතුර සඳහා බඳවාගැනීම හේතුවෙන් මූලික සම්මුඛ පරීක්ෂණයේදී ඉහළම ලකුණු ලබාගත් නිලධාරීන් තිදෙනෙකුට උක්ත තනතුරට උසස්වීම් ලබාගැනීමට තිබූ අවස්ථාව අහිමි වී තිබුණි.	2023 වර්ෂය	බඳවාගැනීම් පටිපාටිය ප්‍රකාරව කටයුතු කල යුතුය.	බඳවා ගැනීම් පටිපාටියට අනුව බඳවා ගැනීම් සිදුකිරීමට කටයුතු කිරීම	මේ සම්බන්ධව ආරක්ෂක අමාත්‍යාංශයේ ආපදා කළමනාකරණ අංශයේ අභ්‍යන්තර විගණක විසින් වාර්තාවක් ලබා දී ඇති අතර එය අධ්‍යයනය කර ඉදිරි කටයුතු සිදු කිරීමට සැලසුම් කර ඇත.
5	2013 වර්ෂයේ සිට සංවිධානයේ නිලධාරීන් සඳහා ක්‍රියාත්මක වෙමින් පැවති සමූහ ජීවිත රක්ෂණ හා වෛද්‍ය	2023 වර්ෂය	කූඨ ලේඛන සකස්කර රක්ෂණ වන්දි ලබාගත් නිලධාරීන් සම්බන්ධව ආයතන සංග්‍රහයේ	2024 වර්ෂයේ රක්ෂණ යෝජනා ක්‍රමය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනෙහිදී මේ පිළිබඳ දැනුවත්	මේ සම්බන්ධව විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීමට සැලසුම් කර ඇත.

රක්ෂණ යෝජනා ක්‍රමයක් වෙනුවෙන් රු.9,815,793ක මුදලක් රක්ෂණ ආයතනය වෙත ගෙවා තිබුණු අතර සංවිධානයේ සේවකයන් 23 දෙනෙකු විසින් අවස්ථා 29කදී ව්‍යාජ බිල්පත් හා ව්‍යාජ ලෙස නිල මුද්‍රා සකස්කර සමූහ ජීවිත රක්ෂණ හා වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ රු.1,820,000ක වෛද්‍ය බිල්පත් ප්‍රතිපූර්ණය කරගෙන තිබුණි. මෙලෙස ව්‍යාජ ලේඛන සකස්කර රක්ෂණ වන්දි ලබාගත් නිලධාරීන් හයදෙනෙකුගෙන් රු.440,000 ක මුදලක් සංවිධානය විසින් අයකර ගෙන තිබුණද එම නිලධාරීන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.	කිරීමට කටයුතු කරන ලදී.

3.65 ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	663,676,000	52,304,000	611,372,000	7,995,000	තත්ත්වාගණනය කළ
2022	563,196,000	31,596,000	531,600,000	(44,745,000)	තත්ත්වාගණනය කළ
2023	535,090,000	54,341,000	480,749,000	(11,536,000)	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවට අයත් භූමියක 2010 වර්ෂයේදී රු.මිලියන 1,034.39 ක් වැය කර ඉදි කරන ලද ගොඩනැගිල්ලේ වටිනාකම මූල්‍ය ප්‍රකාශන වල හඳුනා නොගැනීම සහ එම ඉඩමේ නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.	2021, 2022,2023	මෙම ගොඩනැගිල්ල හා ඉඩම නීත්‍යානුකූලව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත පවරා ගැනීමටත් ස්ථාවර වත්කම් නිසි පරිදි හඳුනාගෙන ගිණුම් ගත කිරීමත් කල යුතුය.	ගොඩනැගිල්ල පිහිටි භූමිය පවරා ගැනීමේ කටයුතු සිදු කිරීමට නොහැකි වීම හේතුවෙන් ගොඩනැගිල්ලේ වටිනාකමද මූල්‍ය ප්‍රකාශන වල හඳුනා ගැනීම ගැටලු සහගත වී ඇති බවත් ඉදිරියේදී එය නිරවුල් කර ගැනීමේ කටයුතු සිදු කර ගනු ඇති බව	කටයුතු සිදුකරමින් පවතී.
2	2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනත සංශෝධන කිරීමට 2008 වර්ෂයේ සිට සිදු කර තිබුණු නමුත් අදාල සංශෝධන පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා	2021,2022, 2023	පනතෙහි සංශෝධන සිදු කර අනුමැතිය ලබා ගත යුතුය.	පනත සංශෝධනය කිරීමේ කටයුතු ආපදා කළමනාකරණ අංශය මඟින් සිදු කරමින් සිටින අතර මේ වනවිට නීතිපති දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණ සඳහා	කටයුතු සිදුකරමින් පවතී.

	ඉදිරිපත් කර නොතිබුණි.			යොමු කර ඇති බව	
3	2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතේ 04 වගන්තිය අනුව මධ්‍යස්ථානයේ ප්‍රධානම කාර්යයක් වන ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්ම සකස් කර අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන නොතිබුණි.	2021,2022, 2023	ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්ම සකස් කර අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගත යුතුය	ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්මේ අවසන් කෙටුම්පත වශයෙන් සකසා තිබුනද සෝදුපත් බලා එහි දල පිටපත් මුද්‍රණය කර නොමැති වීම හේතුවෙන් අමාත්‍ය මණ්ඩලය සඳහා ඉදිරිපත් කිරීමට නොහැකි වූ බව	කටයුතු සිදුකරමින් පවතී.
4	අවම සුදුසුකම් නොමැතිව හා නිවැරදි නොවන තොරතුරු සහිත ලිපිලේඛන ඉදිරිපත් කර අධ්‍යක්ෂ (අවමකිරීම්) තනතුරට පත්කල හා බඳවා ගැනීමේ පටිපාටියට අනුව අවම වශයෙන් වසර 03ක පරිවාස කාලයක් සේවය කලයුතු වුවත් එක් වර්ෂයක කාලයකින් පසු සේවය ස්ථිර කර තිබු නිලධාරිනිය වෙත වැටුප් හා දීමනා ලෙස රු.14,163,264 ක් ගෙවා තිබුණද මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	2023	මුදල් රෙගුලාසි විධිවිධාන අනුගමනය කල යුතුය	මේ සම්බන්ධයෙන් නිතිපති උපදෙස් අනුව ආරක්ෂක අමාත්‍යාංශයෙන් දෙන උපදෙස් පරිදි ඉදිරි කටයුතු සිදු කරන බව	කටයුතු සිදුකරමින් පවතී.
5	ව්‍යසන කළමනාකරණය සඳහා වූ ජාතික සභාවේ අනුමැතිය ලබා ගැනීමට යටත්ව	2023	නිසි අධිකාරී බලය ඇතිව කටයුතු කල යුතුය	2020 වර්ෂයේ සිට මේ දක්වා ව්‍යසන කළමනාකරණ සභාව රැස්වී නොමැති අතර එම සභාව රැස්	කටයුතු සිදුකරමින් පවතී.

විශ්‍රාමික යුධ හමුදා නිලධාරියකු එක් වසරක කොන්ත්‍රාත් පදනම මත 2020 ජනවාරි 15 දිනැති අංක අමප/19/3498/203/008 දරන අමාත්‍ය මණ්ඩල තීරණයෙන් අධ්‍යක්ෂ ජනරාල් තනතුරට පත්කර තිබුණද අමාත්‍ය මණ්ඩල තීරණය සඳහා පදනම් වූ අනුමැතිය එකී යටත්ව මෙතෙක් ලබා ගෙන නොතිබුණි

කිරීමට අදාළ කටයුතු ආරක්ෂක අමාත්‍යාංශයේ ආපදා කළමනාකරණ අංශය විසින් සිදු කරනු ලබන බව.

3.66 භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	4,016,526,576	1,802,913,313	2,213,613,263	2,061,179,029	තත්ත්වාගණනය කළ
2022	5,058,487,761	1,603,111,389	3,455,376,372	2,557,296,846	තත්ත්වාගණනය කළ
2023	7,457,599,975	1,639,573,875	5,818,026,100	1,506,083,659	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	2017 මැයි 22 දින අමාත්‍ය මණ්ඩලය සිදුකල දැනුම් දීම ප්‍රකාරව ඛනිජ සම්පත් පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කර අනුමැතිය ලබා ගැනිමට 2024 ජුනි 30 දක්වා කටයුතු කර නොතිබුණි.	2021	ඛනිජ සම්පත් පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් කඩිනමින් සකස් කර අනුමැතිය ලබා ගත යුතුය.	ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.	ඛනිජ සම්පත් පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කර නොතිබුණි.
2	කාර්යාංශය විසින් ඉන්ධන ටැංකියක් මිලදී ගෙන කාර්යාංශ පරිශ්‍රයේ ඉන්ධන ගබඩා කරන ස්ථානය සකස් කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු.4,401,262 ක් වැය කර තිබුණු අතර 2023 මැයි 31 දින විටත් මෙම වත්කම් උපයෝජනය කර නොතිබුණි.	2022	වත්කම උපයෝජනය කළ යුතුය. අත්‍යවශ්‍ය නොවන මිල දී ගැනීම්වලින් වැලකී සිටිය යුතුය.	ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.	පරිශ්‍රයේ ඉන්ධන ගබඩා කිරීමට ක්‍රියා කර නොතිබුණි.

3	පොළොන්නරුව ප්‍රාදේශීය කාර්යාලය ඉදිකිරීමේදී උපදේශන සේවා ලබා ගැනීමට සහ ලංසු ලේඛන පිළියෙල කිරීමට වරලත් ඉංජිනේරුවරයකුගේ සේවය ලබා ගෙන 2023 දෙසැම්බර් 31 දින දක්වා රු.2,105,200 ක් ගෙවා තිබුණි. මීට අමතරව උක්ත වරලත් ඉංජිනේරුවරයා ප්‍රාදේශීය කාර්යාලය ඉදිකිරීමට අදාළ තාක්ෂණික ඇගයීම් කමිටුවේ සභාපතිවරයා ලෙස ද පත් කර තිබුණු අතර ඒ තුළින් ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී බැඳියාවන් අතර ගැටුමක් (Conflict of Interest) ඇතිවී තිබුණි. ඉදිකිරීම සඳහා 2022 අප්‍රේල් 01 දින දක්වා අතුරු ගෙවීම් 4 ක් මගින් රු.19,253,840 ක් එනම්, කොන්ත්‍රාත්තුවේ වටිනාකමින් සියයට 23 ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණද සිදුකළ කාර්යයන්ගේ භෞතික ප්‍රගතිය පිළිබඳව ඇගයීමක් සිදුකරද නොතිබුණි. මෙම ඉදිකිරීම වසර 2 කට ආසන්න කාලයක	2023	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු නොකිරීම පිළිබඳ නැවත පරික්ෂා කිරීමත් ,ඉදිකල ගොඩනැගිල්ල පරිහරණයටත් ගත යුතුය.	ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.	ප්‍රාදේශීය කාර්යාලය ඉදිකිරීමේදී කාර්යයන්ගේ භෞතික ප්‍රගතිය පිළිබඳව ඇගයීමක් සිදු කර නිවැරදි ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.

	සිට නවතා තිබීම හේතුවෙන් ගොඩනැගිල්ල පරිහරණය කිරීමට නොහැකි වී තිබුණි.				
4	2018-2021 කාලපරිච්ඡේදය තුළ කාර්යාංශය විසින් වැඩිපුර ගෙවූ විධායක නිලධාරීන්ගේ ජංගම දුරකථන බිල්පත් රු.3,886,701 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් අයකර ගෙන නොතිබුණි.	2023	අදාල නිලධාරීන්ගෙන් අයකර ගත යුතුය.	ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.	වැඩිපුර ගෙවූ ජංගම දුරකථන බිල්පත් අයකර ගෙන නොතිබුණි.
5	ව්‍යවසාය සම්පත් සැලසුම් පද්ධතියක් (ERP) ස්ථාපිත කිරීම සඳහා 2022 වර්ෂයේ වැයකරන ලද රු.1,661,910 ක් සමාලෝචිත වර්ෂය අවසානයේ කෙරීගෙන යන වැඩ ලෙස දක්වා තිබූ අතර 2023 පෙබරවාරි 20 දින උක්ත කාර්ය ක්‍රියාත්මක නොකිරීමට තීරණය කර තිබීමෙන් මෙකී වියදම නිශ්කාර්ය වී තිබුණි.එසේ වුවද කාර්යාංශය විසින් යෝජිත ව්‍යවසාය සම්පත් සැලසුම් පද්ධතිය (ERP) ක්‍රියාත්මක කිරීමේ අරමුණින් රු.20,394,000 කට පරිගණක 60 ක් 2023	2023	වත්කම් නිසි පරිදි උපයෝජනය කළ යුතුය.	ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.	ව්‍යවසාය සම්පත් සැලසුම් පද්ධතිය ක්‍රියාත්මක කිරීමට ක්‍රියා කර නොතිබුණි.

	පෙබරවාරි 21 වන දින මිලදී ගෙන තිබුණි. විගණිත දින වූ 2024 මාර්තු 15 වන විට මින් රු.4,078,800 ක් වටිනා පරිගණක යන්ත්‍ර 12 ක් නිෂ්කාර්යව ගබඩාව තුළ රඳවා තබා තිබුණි.				
6	ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ් සමාගම වෙත ඛණිජ ගවේෂණය සඳහා නිකුත් කර තිබූ අංක EL/406 දරන ගවේෂණ බලපත්‍රයේ වළංගු කාලය 2022 දෙසැම්බර් 30 දිනෙන් අවසන්ව තිබුණු අතර 2023 ජනවාරි 04 දිනැති අංක 2313/37 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ 14(ඉ) වගන්තිය ප්‍රකාරව බලපත්‍රලාභීන් ගවේෂණය අවසන් කළ දින සිට හෝ බලපත්‍ර වළංගු කාලය ඉකුත් වූ දින සිට වසර දෙකක කාලයක් තුළ කැණීම් බලපත්‍රයක් ඉල්ලුම් කිරීමට හෝ අදාල ගාස්තු ගෙවා විභව ප්‍රදේශය තමා වෙත රඳවා ගැනීම සඳහා අවස්ථාව ලබාදී තිබුණි. අදාල ගවේෂණ ප්‍රදේශය තවදුරටත් තහවුරු කර ගැනීම සඳහා වන ක්‍රියා පටිපාටි ක්‍රියාවට නැංවීම සඳහා එම	2023	ගවේෂණ බලපත්‍ර වළංගු කාලය දීර්ඝ කිරීමට ඉඩ සලසා දිය යුතුය.	ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.	ඛණිජ ගවේෂණ කැණීම් බලපත්‍ර නිවැරදිව උපයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි.

	සමාගම වෙත සති 2 ක කාලයක් ලබාදී තිබුණි. එසේ තිබියදී ගවේෂණ බලපත්‍රයෙහි ඇතුළත් ග්‍රිඩ් 07 ක භූමි ප්‍රදේශයක් 2023 ඔක්තෝබර් 09 දින සිට 2025 ඔක්තෝබර් 08 දින දක්වා වූ කාලපරිච්ඡේදය තුළ ගවේෂණ කටයුතු කිරීමට වෙනත් පුද්ගලික සමාගමක් වෙත අංක EL/434 දරන ගවේෂණ බලපත්‍රය නිකුත් කර තිබුණි.				
7	ශ්‍රී ලංකාව තුළ පොස්පේට් ඛනිජය සඳහා කාර්යාංශය විසින් සමීක්ෂණයක්, සිදුකරන තෙක් පොස්පේට් ඛනිජය සඳහා කිසිදු ගිවිසුමකට එළඹීම 2000 ජුනි 02 දිනැති අංක SE(FR)884-99 දරන බුලන්කුලම එදිරිව ලේකම් කර්මාන්ත අමාත්‍යාංශය හා වෙනත් අය යන නඩුව මගින් නීති විරෝධී බව තීරණය වී තිබුණි. මීට අමතරව ජාතික විද්‍යා සභාවේ සහ ජාතික විද්‍යා පදනමේ උපදේශනය මත කාර්යාංශය විසින් ශ්‍රී ලංකාව තුළ ඇපටයිට් සහ අනෙකුත් පොස්පේට් ඛනිජ	2023	අපනයනය බලපත්‍ර ලබාදීම නීතිමය විධිවිධාන වලට අනුකූලව කටයුතු කළ යුතුය.	ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.	කාර්යාංශය විසින් පොස්පේට් ඛනිජය සඳහා අවිධිමත්ව අපනයන බලපත්‍ර ලබාදීමට ක්‍රියා කර තිබුණි.

සම්බන්ධයෙන් පුළුල් පර්යේෂණයක් සිදුකර වාර්තාවක් පලකළ යුතු බවත්, දැනුම් දී තිබුණි. ඒ අනුව වර්ෂ 22 කට පසු කාර්යාංශය විසින් එප්පාවල පොස්පේට් නිධිය සම්බන්ධයෙන් සිදුකරන ලද සමීක්ෂණයේ වාර්තාව ජාතික විද්‍යා පදනමේ හා ජාතික විද්‍යා ඇකඩමියේ නිර්දේශයන් ලබා ගැනීමට පෙර 2023 ජුනි 21 වන දින කාර්යාංශයේ නිල වෙබ් පිටුව හරහා සහ පුවත්පත් මගින් ප්‍රසිද්ධ කර තිබුණි. 2023 අගෝස්තු 25 වන දින ජාතික විද්‍යා පදනම විසින් ඉදිරිපත් කරන ලද නිරීක්ෂණ වාර්තාව මගින් අධිකරණය නියෝග කළ කාර්ය නිසි පරිදි ඉටු කිරීමට කාර්යාංශය අපොහොසත් වී ඇති බව දන්වා තිබු අතර සමීක්ෂණ වාර්තාව සඳහා ජාතික විද්‍යා පදනමේ අනුමැතිය ලබාදී නොතිබුණි. නඩු තීන්දුව අනුව ජාතික විද්‍යා පදනමේ එකඟතාව ලබාදීමෙන් පසු සමීක්ෂණ වාර්තාව ප්‍රසිද්ධියට පත් කිරීම හා අපනයන බලපත්‍ර

	ලබාදීම කාර්යාංශය විසින් සිදුකළයුතු වුවද ඊට පටහැනිව ලංකා පොස්පේට් සමාගම විසින් තෝරා ගත් පොස්පේට් අපනයනකරුවන් වෙත කාර්යාංශය විසින් අපනයන බලපත්‍ර ලබාදී තිබූ අතර පෞද්ගලික අපනයනකරුවන් දෙදෙනෙකු විසින් මෙට්‍රික් ටොන් 7500 ක් හා 2350 ක් අපනයනය කරද තිබුණි.				
8	කාර්යාංශයේ කැණීම් අංශය සහ ගිණුම් අංශය භාවිතා කරන පරිගණක මෘදුකාංග පද්ධතීන් වසර 20 කට වඩා පැරණි වන අතර වාර්ෂිකව රු.1,050,000 ක නඩත්තු වියදමක් පෞද්ගලික සමාගමකට ගෙවමින් භාවිතා කරනු ලැබුවද, කාර්යාංශයේ වර්තමාන මෙහෙයුම් හා මූල්‍ය අවශ්‍යතාවයන්ට ගැලපෙන ආකාරයට කැණීම් අංශයට අදාළ බලපත්‍ර නිකුත් කිරීම, රාජ්‍ය භාග ගණනය කිරීම ඉන්වොයිසි නිකුත් කිරීම , ගාස්තු අයකිරීම ,බැංකු ඇපකර ලබා ගැනීම, කැණීම් භූමි	2023	මෘදුකාංග පද්ධතිය යාවත්කාලීන කල යුතුය.	ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි	කාර්යාංශයේ පරිගණක මෘදුකාංග පද්ධතිය වර්තමාන මෙහෙයුම් හා මූල්‍ය අවශ්‍යතාවයන්ට ගැලපෙන ආකාරයට වැඩිදියුණු කිරීමට ක්‍රියා කර නොතිබුණි.

පුනරුත්ථාපනය,
කැණීම් බලපත්‍ර
අවලංගු කිරීම, ගාස්තු
ආපසු ගෙවීම යනාදිය
හා ගිණුම් අංශයට
අදාළ හා පහසුකම්
ඇතුළත්ව
යාවත්කාලීන කර
නොතිබුණි.

3.67 නීති ආධාර කොමිෂන් සභාව

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	ලාභය/අතිරික්තය/ (ඌනතාවය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	69,571,095	81,101,947	(11,530,852)	(15,754,042)	තත්ත්වාගණනය කළ
2022	66,787,553	84,834,877	(18,047,323)	(13,906,980)	තත්ත්වාගණනය කළ
2023	64,931,041	87,192,512	(22,261,471)	(8,802,344)	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	1987 අංක 27 දරන නීති ආධාර කොමිෂන් සභා පනතේ, 4(එ) ඡේදයේ සඳහන් නීති ආධාර සැපයීමෙහිලා වූ යම් අංශයක් සම්බන්ධයෙන් පර්යේෂණාත්මක වැඩසටහන්, නීති ගැටළු මධ්‍යස්ථාන හා ව්‍යාපෘති පිහිටුවීම පාලනය කිරීම, සංවර්ධනය කිරීම හා ඒවාට සහයෝගය දැක්වීම හා ඒ කාර්යය සඳහා වැඩසටහන් හා ව්‍යාපෘති ඇති කිරීම සංවර්ධනය කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍යය කාර්ය මණ්ඩලය සේවයේ නියුක්ත කිරීම යන ප්‍රධාන බලතල මෙතෙක් ක්‍රියාත්මක	2021	පනතේ අරමුණු ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වේ.	අදහස් දක්වා නොතිබුණි.	පනතේ අරමුණු ක්‍රියාත්මක කිරීමට අදාළව නීති ආධාර අරමුදල වෙත ලැබෙන ප්‍රතිපාදන මගින් ජනතාව නීතිය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වාගෙන යනු ලබන අතර, UNDP/UNISRF/ EUROPEAN UNION වැනි විදේශ ව්‍යාපෘතීන් මගින් ලැබෙන මූල්‍ය ප්‍රතිපාදන මගින් JURE ව්‍යාපෘතිය යටතේ නීතිය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් හා නීති සායන රාශියක් මධ්‍යස්ථාන 85 මඟින් දීපව්‍යාප්තව සිදුකරමින් පවතී.

	කිරීමට අවශ්‍යය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.				එසේම පීඩාවට වැඩි වශයෙන් ලක්විය හැකි LGBTIQ ප්‍රජාව, ආදිවාසි ජනතාව, ධීවර ප්‍රජාව, වතුකම්කරුවන් හා විශේෂ හැකියාවන් සහිත පුද්ගලයන් වෙනුවෙන් ද නීතිය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් හා නීති සායන සිදුකරමින් පවතී.
2	රාජ්‍ය නීති ආධාර වැඩපිළිවෙල සිවිල් සමාජය තුළ විධිමත්ව බලගැන්වීමක් සිදු කිරීමේ අරමුණින් 2016 මාර්තු 30 ශ්‍රී ලංකාව සඳහා යෝජිත නීති ආධාර ප්‍රතිපත්තිය නමින් වූ ජාතික ප්‍රතිපත්තිය අමාත්‍ය මණ්ඩලය විසින් අනුමතකර තිබුණ ද, එය ක්‍රියාත්මක කර නොතිබුණි.	2021	නීති ආධාර වැඩසටහන් නියමිත පරිදි ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වේ.	අදහස් දක්වා නොතිබුණි.	එම නීති ආධාර ප්‍රතිපත්තියේ පවතින වැඩි දියුණු කළ යුතු තත්ත්වයන් හඳුනාගෙන ඒවා ජාතික අවශ්‍යතාවයන්ට ගැළපෙන ලෙස සකස් කිරීමට අවශ්‍යව ඇත. මුල් නීති ආධාර ප්‍රතිපත්තිය සකස් කිරීමේදී නීති ආධාර කොමිෂන් සභාවේ සහභාගීත්වයක් සිදු වී නැත. නව නීති ආධාර ප්‍රතිපත්තිය සකස් කිරීම සඳහා අධිකරණ අමාත්‍යාංශය විසින් 2024.08.30 දිනැතිව කමිටුවක් පත්කර ඇත. එම කමිටුව මගින් ඉදිරියේදී නීති ආධාර ප්‍රතිපත්තිය

					සමාලෝචනය කර එහි කටයුතු අවසන් කිරීමට කටයුතු කරනු ඇත.
3	කොමිෂන් සභාවේ 2022 කෙටුම්පත් වාර්ෂික වාර්තාව අනුව නීති ආධාර සැපයීම සඳහා 2022 ජනවාරි 01 දිනට ඉදිරියට ගෙන ආ නඩු සංඛ්‍යාව 38,099 ක් වූ අතර, 2022 ජනවාරි සිට දෙසැම්බර් දක්වා අලුතින් ගොනු කරන ලද නඩු සංඛ්‍යාව 11,380ක් වූයෙන් එම කාලසීමාව තුළ කටයුතු කිරීමට තිබූ මුළු නඩු සංඛ්‍යාව 49,479ක් විය. ඉන් නඩු 10,740ක් දෙසැම්බර් 31 දක්වා නිරවුල් කිරීමට කටයුතු කර තිබුණු අතර, එදිනට තවදුරටත් නිරවුල් කිරීමට තිබූ නඩු 38,739ක් විය. එය මුළු සේවා සැපයීමට තිබූ නඩු සංඛ්‍යාවෙන් සියයට 78ක් විය.	2021 2022	පනතේ අරමුණු ප්‍රකාරව කාර්ය සාධනය පවත්වා ගත යුතු ය.	පිළිතුරු සපයා නොතිබුණි.	2021 වර්ෂයට අදාළ නිරීක්ෂණයේ ප්‍රගතිය නිවැරදි වන අතර, පනතේ අරමුණු ප්‍රකාරව 2024 ජනවාරි 01 දිනට ඉදිරියට ගෙන ආ නඩු සංඛ්‍යාව 38905 ක් වූ අතර, 2024 ජනවාරි සිට සැප්තැම්බර් 30 දක්වා අලුතින් ගොනු කරන ලද නඩු සංඛ්‍යාව 9471 කි. එම කාලය තුළ කටයුතු කිරීමට තිබූ මුළු නඩු සංඛ්‍යාව 48376ක් විය. ඉන් නඩු 19941 නිරවුල් කිරීමට කටයුතු කළ අතර, 2024.09.30 දිනට පවතින නඩු ප්‍රමාණය 28935කි.
4	2023 දෙසැම්බර් 31 දිනට ප්‍රධාන කාර්යාලය හා මධ්‍යස්ථාන 85ක පැවති ඉන්වෙන්ට්‍රි අයිතම් වටිනාකම තක්සේරුකර ජංගම වත්කම් යටතේ	2023	ආයතනය සතු සියලු ඉන්වෙන්ට්‍රි අයිතම් වටිනාකම ජංගම වත්කම් යටතේ දැක්විය යුතු ය.	කොමිෂම මෙතෙක් ජංගම වත්කම්හි වටිනාකම අගය කිරීමක් සිදු නොකෙරුණු අතර, ඉදිරි වර්සයේ සිට සිදු කිරීමට කටයුතු කරන බව දන්වා	පවතින ගිණුම්කරන පරිගණක පද්ධතියේ පැවති සීමාකාරී තත්ත්වය තුළ කිසියම් දිනකට පාරිභෝජන ද්‍රව්‍ය

	ගිණුම්ගත කර නොතිබුණි.			තිබුණි.	ලෙස පැවති තොගය හඳුනාගැනීමට සහ සටහන් කිරීමට නොහැකි වී තිබුණි. ඒ පිළිබඳව අවධානය යොමුකොට එම පරිගණක පද්ධතියේ යාවත්කාලීන කරන ලද මෘදුකාංගය ආදේශකර ගැනීමට කටයුතු සිදුකර ඇත. අදාළ නව යාවත්කාලීන කරන ලද මෘදුකාංගය භාවිතා කර ඉදිරියේදී නිවැරදි ඉතිරි පාරිභෝගික ද්‍රව්‍ය තොග ශේෂය ගණනයකර ගැනීමට කටයුතු කරමි.
5	මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා ඇති ස්ථාවර වත්කම් තුළ ඇතුළත් 2009 වර්ෂයට පෙර සිට පැවත එන එකතුව රු.15,619,085ක් වූ පරිගණක, කාර්යාල උපකරණ හා ගෘහභාණ්ඩ හා 2014ට පෙර සිට පැවත එන රු.36,950ක් වූ පුස්තකාල පොත් යන වත්කම්වලට අදාළ ශේෂයන්ගේ	2022 2023	ස්ථාවර වත්කම්වලට අදාළ ශේෂ තහවුරුකර ගැනීමට අදාළ සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතු ය.	2009ට පෙර වත්කම් ලේඛනයක් නොතිබුණු අතර, වත්කම් ලේඛනය පිළියෙල කිරීමේදී ඊට පෙර වර්ෂවල අවසන් ගිණුම් හා මුදල් පොත පදනම් කරගෙන එම දත්ත ලබාගෙන තිබුණු බව ද මේ සම්බන්ධතොරතුරු ලබාගැනීමට ක්‍රමයක් නොමැති බවත් දන්වා තිබුණි.	නීති ආධාර කොමිෂම විසින් භාවිතා කරනු ලබන දේපළ පිරියත උපකරණ බොහොමයක් මේ වන විට සම්පූර්ණයෙන් ක්ෂය වී ඇත. එම තත්ත්වය යටතේ මෙම වත්කම්වල අගය නැවත ප්‍රතිස්ථාපනය කිරීමේ තත්ත්වයක් පැන නැගී ඇති බැවින්,

	නිවරද්‍යතාවය තහවුරු කර ගැනීම සඳහා ඊට අදාළ උපලේඛන විගණනයට ඉදිරිපත් නොවුණි.				කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය මගින් නිකුත්කර ඇති වත්කම් තක්සේරු කිරීමේ මාර්ගෝපදේශනය ට අනුව අදාළ වත්කම් කඩිනමින් හඳුනාගෙන ඒවා අංකනය කොට නැවත තක්සේරු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමි.
6	2023 දෙසැම්බර් 31 දිනට රු.2,428,014 ක් වූ ණයගැති ශේෂය තුළ වර්ෂ 01 - 02 ත් අතර රු.402,990 ක් ද, වර්ෂ 02 - 03 ත් අතර රු.707,008 ක් ද, වර්ෂ 3 - 5 ත් අතර රු.67,251 ක් හා වර්ෂ 5 ට වැඩි රු.230,500 ක් ලෙස ණයගැති ශේෂ පැවතිය ද, අදාළ ශේෂයන් අයකර ගැනීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි.	2023	ණයගැති ශේෂ අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කළ යුතු ය.	වසර 5ට වැඩි මුදල වනුයේ ගම්පහ ශාඛාව සඳහා ගෙවා ඇති තැන්පතු හා ශාඛාවන්හි ජංගම ගිණුම් විවෘත කිරීමේදී තැන්පත් කළ මුදල් වන අතර, මෙය නැවත ලබාගත හැකි තැන්පතු මුදල් ඉදිරියේදී ලබාගැනීමට හැකියාව ඇති බව දන්වා තිබුණි.	නීති ආධාර කොමිෂමට 2023.12.31 දිනට පැවති ණයගැති ශේෂයන් නොමැති අතර, එය මූල්‍ය තත්ව ප්‍රකාශනයේ ඉදිරියට කළ ගෙවීම් සහ ණය ගැතියන් ලෙස සටහන් කර තිබීම ගිණුම්කරණ සටහන් කිරීමේ දෝෂයක් ලෙස සළකමි. මෙම ශේෂය තුල ඉදිරියට කල ගෙවීම් සහ ලැබිය යුතු තැන්පතු පොලිය වේ. මෙය 2024 ගිණුම් අවසන් මුල්‍ය ප්‍රකාශන කට්ටලය තුල නිවැරදිව නිරූපනය කිරීමට සටහන් කර ගනිමි.
7	2023 දෙසැම්බර් 31 දිනට රු.2,390,922 ක් වූ ණයහිමි ශේෂය තුළ වර්ෂ 01 ට අඩු රු.1,200,621 ක් ද, වර්ෂ 1– 2 ත් අතර	2023	ණය හිමි ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු ය.	ගෙවිය යුතු ශේෂයන්හි වර්ෂ 1 හා 2 අතර ශේෂ මේ වසර තුළ ගෙවීම් සිදු කරන අතර වසර 5 ට වැඩි ශේෂය වනුයේ	2024 වර්ෂ මුල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ දි අදාල බැරකම් එහි කාලපරිච්ඡේදය අනුව, ජංගම සහ ජංගම නොවන

	ණයහිමි ශේෂය රු.513,019 ක් ද, වර්ෂ 3 -5 ත් අතර රු.929 ක් හා වර්ෂ 5ට වැඩි රු.676,353 ක් ලෙස ණයහිමි ශේෂ පැවතිය ද, අදාළ ශේෂයන් ගිණුම්වල ගැලපීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමු වී නොතිබුණි.			කොමිෂමෙන් සේවය කර ඉවත් වූ පිරිස වෙත දැනුවත් කළ ද චෙක්පත් ලබා නොගැනීම හේතුවෙන් එම චෙක්පත් අවලංගු වී ඇති බව දන්වා තිබුණි.	බැරකම් ලෙස සටහන් කිරීමට කටයුතු කරමි.
8	1982 අංක 43 දරන මුද්දර බදු පනත ප්‍රකාරව රු.25,000ට වැඩි ගෙවීම් සඳහා රු.25ක මුද්දර ගාස්තුවක් අයකළ යුතු වුව ද, අවස්ථා 26කදී කරන ලද රු.1,529,961ක් වටිනා ගෙවීම් සම්බන්ධයෙන් පනත ප්‍රකාරව කටයුතුකර නොතිබුණි.	2021 2023	යොමුගත පනත ප්‍රකාරව කටයුතු කළ යුතු ය.	ඉදිරියේදී අඩුපාඩු මගහරවා ගැනීමට කටයුතු කරනු ලබන බව දන්වා තිබුණි.	නීති ආධාර කොමිෂන් සභාව මුද්දර බදු පනත ප්‍රකාරව ලැබීම්.ගෙවීම් වලට අදාලව මුද්දර බදු අය කොට එය තෛයිමාසිකව දේශිය ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කිරීමට කටයුතු කරමි.
9	රාජ්‍ය බැංකු තුළ ආයෝජනය කර තිබූ රු.7,748,671ක් වූ ස්ථාවර තැන්පත් සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වගන්තිය ප්‍රකාරව මුදල් අමාත්‍යවරයාගේ හා අදාළ විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතීන් ලබාගෙන නොතිබුණි.	2022 2023	යොමුගත පනත ප්‍රකාරව කටයුතු කළ යුතු ය.	ස්ථාවර තැන්පතු අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගෙන සිදුකර ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට මේ සම්බන්ධව යොමුකර ඇති බව දන්වා තිබුණි.	මෙම මුදල නීති ආධාර කොමිෂන් සභාවේ හදිසි මූල්‍ය අවශ්‍යතාවයක දි මූල්‍යනය කිරීම සඳහා නිති ආධාර කොමිෂන් සභාව විසින් පවත්වාගෙන යන ගිණුම් ශේෂයකි. මේ සඳහා ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කොට ඇති අතර,ඉදිරියේ දී විධිමත් පරිදි

					අරමුදල් කළමණාකරනයක් ඇති කිරීමට කටයුතු කරනු ලැබේ.
10	2021 නොවැම්බර් 16 දිනැති පීඊඩී අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.6 වගන්තිය පරිදි 2022 වාර්ෂික වාර්තාව 2023 සැප්තැම්බර් 11 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කර නොතිබුණි.	2021 2022	චක්‍රලේඛය ප්‍රකාර කටයුතු කළ යුතු ය.	අදහස් දක්වා නොමැත.	භාෂා පරිවර්තන කටයුතු සිදුකර ඇත. 2022 වර්ෂයේ වාර්තාව මුද්‍රණයෙන් පසු 2024.01.10 දින අමාත්‍ය මණ්ඩල අනුමැතියට යොමු කරන ලදී. එහි අනුමැතිය ලැබීමෙන් පසු 2024.06.13 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.
11	කොමිෂන් සභාවේ බඳවා ගැනීමේ පරිපාටියට කාර්යක්ෂමතා කඩඉම් විභාග ඇතුළත්කර ඇති නමුත් කොමිෂන් සභාව ආරම්භයේ සිට 2023 වර්ෂය දක්වාම ප්‍රාථමික සේවා ගණයේ නිලධාරීන්ට පමණක් කාර්යක්ෂමතා කඩඉම් විභාග පවත්වා තිබුණි.	2023	යොමුගත ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු ය.	2023 වසරේදී ප්‍රාථමික සේවා ගනය සඳහා කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පැවැත් වූ අතර සෙසු තනතුරු සඳහා 2024 වසරේ දෙවන කාර්තුව තුළ කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීමට කටයුතු යොදා ඇති බව දන්වා තිබුණි.	ප්‍රාථමික සේවා කාණ්ඩය සඳහා 2023 වසරේ කාර්යක්ෂමතා කඩයිම් පරීක්ෂණ පවත්වා නිමකර ඇත. 2024.05.18 දිනැතිව නීති නිලධාරීන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පැවැත්වූ අතර, සෙසු කාර්ය මණ්ඩලය සඳහා විභාග පැවැත්වීමට අදාළ කටයුතු දැනට අධිකරණ නොවන නිලධාරීන් පුහුණු කිරීමේ ආයතනය හරහා සිදුකරමින් පවතී. එම සියළු විභාග මෙම වසර තුළ

					පවත්වා අවසන් කිරීමට නියමිත ය.
12	රු.1,590,277 ක් වූ ගෙවීම් වවුචර 41ක් සඳහා මුදල් රෙගුලාසි අංක 139(4) පරිදි අදාළ කුවිතාන්සි අමුණා නොතිබුණි.	2023	යොමුගත මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු ය.	මධ්‍යස්ථාන 85 කට අදාළව ප්‍රධාන කාර්යාලයට තැපැල් මඟින් ලදුපත් හා වවුචර් එවීමේදී ප්‍රමාදයන් සිදු වූ බවත්, එම වවුචර් මධ්‍යස්ථාන මඟින් ලබාගෙන විගණනය වෙත යොමුකරන බව දන්වා තිබුණි.	සියළු ගෙවීම් වවුචර්වලට අදාළ මූලාශ්‍ර ලේඛන අදාළ වවුචර් සමග ගොනුගත කිරීමට කටයුතු කරනු ලැබේ.
13	මුදල් රෙගුලාසි අංක 237(ආ) ප්‍රකාරව ගබඩා සැපයුම් සඳහා ගෙවීම් කිරීමේදී භාණ්ඩ ලැබී ඇති බවට ද, අදාළ බඩු ලේඛනයෙහි, තොග පොත යනාදියෙහි එකී භාණ්ඩ ඇතුළත් කර ඇති බවට ද, සහතිකයක් ඇමිණිය යුතු වුව ද, ආයතනයේ රු.7,509,063 ක් වූ මිලදී ගැනීම් 45 කදී උක්ත විධිවිධානයන් ප්‍රකාරව කටයුතුකර නොතිබුණි.	2023	යොමුගත මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු ය.	මින් ඉදිරියට භාණ්ඩ ලද බවට සහතික අදාළ වවුචර්වලටම ඇමිණීමට කටයුතු කරනු ලබන බව දන්වා තිබුණි.	භාණ්ඩ ලැබීම්වලට අදාළ ද්‍රව්‍ය ලැබීම් ලේඛන සහතික කොට අදාළ මූලාශ්‍ර ලේඛනවල ඇමිණීමට සටහන් කර ගතිමි.
14	මුදල් රෙගුලාසි අංක 237(අ)(1) ප්‍රකාරව 2023 වර්ෂයේදී රු.1,958,476 ක් වූ වාහන හා කාර්යාල උපකරණ අලුත්වැඩියාවන් 39 කට අදාළව නිසි පරිදි වැඩ නිමකළ බවට	2023	යොමුගත මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු ය.	මධ්‍යස්ථානවල වැඩ හෝ සැපයුම් වෙනුවෙන් ගෙවීම් කිරීමේදී සතුටුදායක ලෙස වැඩකර තිබෙන බවට හා අදාළ ගෙවීම් කිරීමට හැකි බවට මධ්‍යස්ථාන භාර නීති නිලධාරී විසින්	අදාළ අළුත්වැඩියා සඳහා 2024 වර්ෂයේ සිට අළුත්වැඩියා සාර්ථකව සිදුකොට ඇති බවට අදාළ නිලධාරින්ගේ සහතික කොට ගෙන ගෙවීම්

	සහතිකයක් ලබාගැනීමකින් තොරව ගෙවීම්කර තිබුණි.			යන්ත්‍රයට අදාළ කාඩ්පතෙහි සහතික කරනු ලබන බවත්ල ඉදිරියේදී මෙම කාඩ්පත අදාළ සේවය අවසන් වූ පසු පිටපතක් එවන ලෙසට දැනුවත් කරන ලද බව දන්වා තිබුණි.	සිදුකිරීමට කටයුතු කරමි.
15	2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතට අනුකූලව ඇප තැබිය යුතු නිලධාරීන්ගෙන් ඇප ලබාගැනීමට කටයුතුකර නොතිබුණි.	2022 2023	යොමුගත චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු ය.	ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂම ව්‍යවස්ථාපිත ආයතනයක් බැවින් ඇප තැබීම අදාළ නිලධාරීන් සහ එහි සීමාවන් පිළිබඳව උපදෙස් අධිකරණ අමාත්‍යාංශයෙන් විමසා ඇති බවත්ල ඒ ලද වහාම අවශ්‍ය පියවරගන්නා බව දන්වා තිබුණි.	සේවකයෙකුට ලැබෙන ඉතා සීමිත වැටුප් හා සාමාන්‍ය ගනුදෙනු ප්‍රමාණය අනුව ඇප තැබීම සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ උපදෙස් සඳහා දැනට යොමු කර ඇත. එහි උපදෙස් පරිදි කටයුතු කිරීම සම්බන්ධයෙන් දැනුම් දීමට කටයුතු කරනු ලැබේ.
16	ලංකා බැංකුවේ අළුත්කඩේ ශාඛාවේ පවත්වා ගෙනයනු ලබන ජංගම බැංකු ගිණුමේ 2023 ජනවාරි සිට දෙසැම්බර් දක්වා මාස 12 ක කාලය තුළ රු.මිලියන 17.4 සිට රු.මිලියන 4.9 දක්වා පරාසයක් තුළ වූ බැවින් එම අතිරික්ත මුදල නිෂ්කාර්ය ලෙස පැවතුණි	2021 2023	මුදල් නිශ්ක්‍රීයව පවත්වා නොගත යුතු ය.	"නිකුත් කළ නමුත් බැංකුව වෙත ඉදිරිපත් කළ චෙක්පත්" හි වටිනාකම අඩු වූ පසු මුදල් පොත අනුව ශේෂය විගණනය විසින් පෙන්වාදී ඇති ශේෂයට වඩා අඩු බව දන්වා තිබුණි.	මෙම ශේෂය බැංකු ප්‍රකාශනයෙහි නිරූපණය වන ශේෂය වන අතර නීති ආධාර කොමිෂමේ මුදල් පොතට අනුව ශේෂය 1,908,024.24ක් විය.

17	2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2.2 ප්‍රකාරව වෙළඳපොල මිල සැඳහුම් ක්‍රමයේදී ලංසු කැඳවීම සඳහා දින 07 ක අවම කාලයක් ලබාදිය යුතු වුවත්, 2023/2024 වර්ෂ සඳහා පවිත්‍රතා සේවා සැපයීමේ ප්‍රසම්පාදනයේදී නිසි පරිදි පිරිවිතර සකස් නොකර ලංසු කැඳවීමට දින 03 ක පමණ අවම කාලයක් ලබාදීමට කටයුතුකර ඇති අතර, ඒවා ඇගයීම දින 05ක් යනතුරු සිදුකර නොතිබූ බවත්, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.6 ඡේදය ප්‍රකාරව ලංසු විවෘත කිරීම පිළිබඳ අදාළ ආකෘතිපත්‍රයේ වාර්තාකර නොතිබුණු අතර, මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8 ප්‍රකාරව තෝරාගත් ආයතනය විසින් අදාළ කාලය සඳහා කාර්යසාධන සුරක්ෂණයක් ඉදිරිපත් කර නොතිබුණි.	2023	යොමුගත ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතු ය.	ඉදිරි වසරේ සිට නියමිත ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනයකර පවිත්‍රතා සේවා සැපයුම්කරුවන් තෝරාගැනීමට කටයුතු කරන බව දන්වා තිබුණි.	ඉදිරියේ දි ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන වලට යටත්ව සියළු ප්‍රසම්පාදන කටයුතු කිරිමට සටහන් කර ගනිමි.
18	රු.595,282 ක් වටිනාකමැති ගෘහ භාණ්ඩ, පොත් රාක්ක හා ටයර් මිලදී	2023	ප්‍රසම්පාදනයන්ට අදාළ තොරතුරු ගොනු තුළ පවත්වාගත යුතු	ඉදිරි වසරේ සිට නියමිත ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කර ප්‍රසම්පාදනය සිදු	නියමිත ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව මිල ගණන් කැඳවා මෙම මිලදී

	ගැනීමට අදාළ ප්‍රසම්පාදනයන් 09 ක මිල ගණන් කැඳවූ ආකාරය පිළිබඳ ප්‍රසම්පාදන ගොනු තුළ හඳුනාගත නොහැකි විය.		ය.	කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි.	ගැනීම් සිදුකර ඇත.
19	කොමිෂන් සභාවේ සමස්ත කාර්ය මණ්ඩලයෙන් සේවකයින් 88කගේ එනම් සියයට 24ක පුරප්පාඩු පැවති අතර, අධ්‍යක්ෂ (නීති) හා අධ්‍යක්ෂ (පරිපාලන හා මූල්‍ය) යන ප්‍රධාන තනතුරු තුන ද, “කළමනාකරණ” සේවා ගණයට අයත් නියෝජ්‍ය අධ්‍යක්ෂ (ප්‍රාදේශීය) හා කොමිෂන් සභාවේ මූල්‍ය පාලනයට සෘජුවම දායක වන නියෝජ්‍ය අධ්‍යක්ෂ (මූල්‍ය) තනතුරු ද “කළමනාකරණ” සේවා ගණයට අයත් නීති නිලධාරි තනතුරු 26ක් ද 2023 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩුව පැවතුණි. වාර්තාවේ දිනය වනවිට මෙම පුරප්පාඩු පිරවීම වර්ෂ 01 මාස 05 සිට වර්ෂ 05 ක් දක්වා කාලප්‍රමාදයක් පැවතුණි.	2021 2022 2023	පුරප්පාඩු අප්‍රමාදව සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතු ය.	පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා 2022 වසරේ සිට වාර ගණනාවකදී අනුමැතිය සඳහා ඉල්ලීම් ඉදිරිපත්කර ඇතත්ල ඒ සඳහා මෙතෙක් අනුමැතිය ලැබී නොමැති බව දන්වා තිබුණි.	අනුමත බඳවාගැනීමේ පරිපාටිය අනුව අධ්‍යක්ෂ (නීති) සහ අධ්‍යක්ෂ (පරිපාලන සහ මූල්‍ය) අභ්‍යන්තරව බඳවාගතයුතු තනතුරු වේ. මේ සඳහා සුදුසුකම් ලැබූ අය දැනට සක්‍රිය සේවයේ නොමැති බැවින් බඳවාගැනීම් සිදුකළ නොහැකි වී ඇත. සහකාර/ නියෝජ්‍ය අධ්‍යක්ෂ (මූල්‍ය) තනතුරේ පුරප්පාඩු සම්පූර්ණ කර ඇත. නීති නිලධාරීන්, කළමනාකරණ සහකාර (තාක්ෂණ සහ තාක්ෂණ නොවන) තනතුරු ඇතුළු විශාල තනතුරු සංඛ්‍යාවක පුරප්පාඩු පවතින අතර, 2022 වසරේ සිටම ඒ සඳහා බඳවා ගැනීමට අනුමැතිය අවස්ථා රාශියකදී ඉල්ලා ඇත. 2023 ආරම්භයේ නීති නිලධාරීන් 12ක්

					සහ 2024දී 9දෙනකු පමණක් බඳවාගැනීමට අනුමැතිය ලැබුණු අතර, එම පිරිස බඳවාගන්නා ලදී.
20	කොමිෂන් සභාවේ බඳවාගැනීමේ පරිපාටිය අනුව ජ්‍යෙෂ්ඨ කළමනාකරණයේ සිට ප්‍රාථමික සේවා ගණයේ නිලධාරියා දක්වා වූ නිලධාරීන්ට එක් ශ්‍රේණියක සිට අනෙක් ශ්‍රේණිය දක්වා උසස්වීමේදී කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයක් නොපවත්වා සිදු කිරීමට ඉඩකඩ ලබාදී තිබුණි.	2023	කාර්යසාධන කඩඉම් පරීක්ෂණ නිසිපරිදි පැවැත්විය යුතු ය.	2023 වසරේ ප්‍රාථමික සේවා ගණය සඳහා විභාග පවත්වා ඇති බවත්ල 2024 වසරේ දෙවන කාර්තුව තුළ සෙසු තනතුරු සඳහාත් කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පැවැත්වීමට කටයුතු කර ඇති බව දන්වා තිබුණි.	කාර්යක්ෂමතා කඩඉම් විභාග සිදුකරමින් පවතින අතර, නිසි උසස්වීම් පරිපාටිය අනුගමනය කරමින් එම කටයුතු නිවරදි කිරීමට ක්‍රියා කරමින් සිටී.

3.68 ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	ලාභය/අතිරික්තය/(අලාභය)/(ඌණතාවය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	16,589,363	1,742,366	14,846,997	(1,035,725)	තත්ත්වාගණනය කළ
2022	8,578,420	1,877,177	6,701,243	(6,925,256)	තත්ත්වාගණනය කළ
2023	8,197,684	1,614,754	6,582,930	(118,262)	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	වත්කම් හා පිරිවැය කළමනාකරණය සඳහා රජයේ සියලු මූල්‍ය නොවන වත්කම් ලේඛනගත කිරීමට අදාළ 2023 වර්ෂයේ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත ඉදිරිපත්කර නොතිබුණි.	2023 2022	යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු ය.	ඉදිරියේදීකටයුතු කිරීමටපියවරගනු ලබන බව දන්වා තිබුණි.	ඉතා ඉක්මනින් කටයුතු කර ඉදිරිපත් කිරීමට පියවර ගනු ලැබේ.
2	ව්‍යවස්ථාපිත ආයතනවල මුදල් වර්ෂය අවසන්වී දින 150ක් තුළ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.	2023	යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු ය.	කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය ලබාගැනීමට නොහැකි වීම නිසා මෙම ප්‍රමාදය වූ බව දන්වා තිබුණි.	2023 වර්ෂයට අදාළව 2024/10/07 දින විගණකාධිපති වෙත වාර්ෂික වාර්තා කෙටුම්පත යවන ලදී.
3	2016 වර්ෂයේදී රු.2,212,195ක් වැය කරමින් මිලදීගත්	2023	නීති දත්ත ගබඩා පද්ධතිය භාවිතයට ගත යුතු ය.	මෙය යාවත්කාලීන කිරීමේ ක්‍රමවේදය	තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශය

	නීති දත්ත ගබඩා පද්ධතිය මේ දක්වා භාවිතයට ගෙන නොමැති අතර, මේ වන විට අක්‍රීය තත්ත්වයේ පවතී.			පිළිබඳව මොරටුව විශ්වවිද්‍යාලයේ විශේෂඥවරුන් විසින් වාර්තාවක් සකස්කර එවීමට නියමිත බවත්, එම වාර්තාව ලද පසු ඒ අනුව කටයුතු කරන බව දන්වා තිබුණි.	ලැබීමට නියමිත ය.
4	2023 දෙසැම්බර් 31 දිනට ආයතනයෙහි අනුමත කාර්ය මණ්ඩලය 26ක් වුව ද, තනතුරු 08ක සේවකයින් 11ක ඌනතාවයක් විය. එය අනුමත කාර්ය මණ්ඩලයෙන් සියයට 42 ප්‍රතිශතයක් ගෙන තිබුණි.	2023	පුරප්පාඩු අප්‍රමාදව සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතු ය.	2024 අප්‍රේල් 24 දිනැති කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය මගින් එම තනතුරු බඳවාගැනීම සඳහා අනුමැතිය ලබාදී ඇති බව දන්වා තිබුණි.	පුරප්පාඩු පිරවීම සඳහා අයදුම්පත්‍ර කැඳවීම 2024 අගෝස්තු 02 වෙනි දින ගැසට් කර ඉදිරි කටයුතු සිදු කෙරෙමින් පවතී.

3.69 හානිපූරණය සඳහා වන කාර්යාලය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	604,002,890	390,018,977	213,983,914	(17,114,511)	තත්ත්වාගණනය නොකළ
2022	519,852,068	286,790,976	233,061,092	19,268,441	තත්ත්වාගණනය කළ
2023	259,066,078	41,346,289	217,719,789	(13,642,455)	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ගය	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	වන්දි ගෙවීමට ඇති ලිපිගොනු සංඛ්‍යාව නිවැරදිව තහවුරු කරගැනීම සඳහා වන්දි ඉල්ලුම් කිරීමේ ලිපිගොනු විස්තර ඇතුළත් ලේඛනයක් විගණනයට ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිය ද, එවැනි ලේඛනයක් ඉදිරිපත් කිරීමට හානිපූරණය සඳහා වන කාර්යාලය අපොහොසත් විය. 2023 දෙසැම්බර් 31 දිනට තවදුරටත් වන්දි ගෙවීමට ඇති ලිපිගොනු 8,626 ක් පවතින බව කාර්යාලය විසින් දන්වා තිබුණ ද, ලිපිගොනු කුමන කාලපරිච්ඡේදයක	2023 2022 2021	වන්දි ගෙවීමට ඇති ලිපිගොනු ක්‍රමවත්ව පවත්වාගෙන යා යුතු වන අතර, වන්දි ඉල්ලා ලැබෙන ලිපිගොනු ක්රමවත්ව ලේඛනයක ඇතුළත් කළ යුතු ය. එමෙන්ම අයවැය ඇස්තමේන්තු නිවැරදිව සකස්කර නියමිත වේලාවට ප්‍රතිපාදන ලබාගෙන වන්දි ගෙවීම් සිදුකළ යුතු බැවින් ගෙවීමට ඇති වන්දි මුදල් තක්සේරු කිරීමට පියවර ගත යුතු ය.	පරිගණක පද්ධතිය තුළින් අවශ්‍යතාවයට අනුකූලව ප්‍රතිලාභීන් පිළිබඳ විස්තර සහිත නාම ලේඛනයක් ලබාගැනීමට හැකි වන ලෙස දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීමට කටයුතු කර ඇත.	තවදුරටත් වන්දි ගෙවීමට ඇති ලිපිගොනු පිළිබඳව කාලවිශ්ලේෂණයක් ඉදිරිපත් කිරීමට හැකියාව ඇත. නමුත් එක් එක් ලිපිගොනුව සඳහා සිදුකරන ගෙවීම් වටිනාකම නිශ්චිත නොවන බැවින් සහ අත්‍යාවශ්‍ය ලිපිගොනු නොපැවතීම (උදා - පොලිස් වාර්තා, වටිනාකම තක්සේරු වාර්තා) හේතුවෙන් ගෙවීමට ඇති මුළු මුදල තක්සේරු කිරීමේ හැකියාවක් නැත.

	සිට වන්දි අයදුම් කළ අයදුම්කරුවන්ගෙන් සමන්විත වන්නේ ද යන්න පිළිබඳ කාලවිශ්ලේෂණයක් ඉදිරිපත් කිරීමට ආයතනය අපොහොසත් වූ අතර, මින් ලිපිගොනු 4,917කට අදාළව රු.1,802,446,195ක මුදලක් වන්දි ගෙවීමට නියමිතව තිබුණ ද, ඉතිරි ලිපිගොනු 3,709ක ප්‍රමාණයට අදාළව වන්දි ගෙවීමට ඇති මුදල තක්සේරු කර නොතිබුණි.				
2	සමාලෝචිත වර්ෂය තුළ වන්දි ලෙස ගෙවන ලද රුපියල් මිලියන 1,335ක මුදලින් රුපියල් මිලියන 753 ක් 2023 වර්ෂයේ අයදුම් කළ, අරගලයෙන් විපතට පත් වන්දිලාභීන්ට ගෙවීම් කර තිබුණ ද, පෙර වර්ෂවල සිට අනෙකුත් වන්දි සඳහා අයදුම් කළ වන්දිලාභීන්හට රුපියල් මිලියන 582ක් පමණක් ගෙවා තිබුණි. ඒ අනුව 2023 වර්ෂයට පෙර අයදුම්කළ වන්දිලාභීන්හට	2023	පෙරවර්ෂවල සිට අයදුම් කළ වන්දිලාභීන්හට වන්දිගෙවීමේදී ප්‍රමුඛතාවක් ලබාදීමට කටයුතු කළ යුතු ය.	අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කොට ඇති හානිපූරණය සඳහා වන කාර්යාලීය පනතට අනුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සකස්කොට ඇති හානිපූරණ ප්‍රතිපත්තිය හා මාර්ගෝපදේශ හා රීතීන්ට අනුකූලව අවශතාවයන්හි ප්‍රමුඛතාවය, සම්පත්වල සුලබතාවය යන කරුණු පදනම් කරගෙන ලබාදිය යුතු මූල්‍ය සහනයක් පිළිබඳ ගත් තීරණය මත	වර්තමානයේ ද මෙම තත්ත්වය එසේම පවතී.

	වන්දිගෙවීමේදී ප්‍රමුඛතාවක් ලබාදීම සාපේක්ෂ වශයෙන් අවම මට්ටමක විය.			2022 මැයි 09 වන දින සිදු වූ දේශපාලන නොසන්සුන්තාවයන් හේතුවෙන් අවශ්‍යතා ප්‍රමුඛතාවය මත පීඩාවට පත්වූවන්ගේ නිවාසවලට සිදු වූ හානි සඳහා හානිපූරණයන් සැලසීමට අධ්‍යක්ෂ මණ්ඩලයත්, අමාත්‍ය මණ්ඩලයත් අනුමත කර ඇත.	
3	සමාලෝචිතවර්ෂය තුළදීවන්දිගෙවීම්සඳහාචෙක්පත්නිකුත්කළ ද,යාවත්කාලීනනොකරනලදතොරතුරු මතවන්දිලබාදීමහේතුවෙන්2023 දෙසැම්බර් 31 දිනවනවිටවන්දිලාභීන්හටලබාදීතිබුණු චෙක්පත්අතුරින්රු.39,124,653ක්වටිනා චෙක්පත්318ක්බැංකුවවිසින්අගරුකරතිබුණි. මෙම වන්දි මුදල්වලින් රු.29,818,995ක ප්‍රමාණයක් නැවත එම වන්දිලාභීන් වෙතම සෘජු ප්‍රේෂණ මගින් ලබාදී තිබුණු අතර, තවත් රු.9,305,658ක ප්‍රමාණයක් නව	2023 2022	අදාළ ප්‍රතිලාභීන්ගේ යාවත්කාලීන කරන ලද තොරතුරු මත පදනම්ව වන්දි ගෙවීම් නිර්දේශ කිරීම කළ යුතු ය.	ගෙවීම් සිදු කිරීමට පෙර අදාළ නව බැංකු විස්තර හෝ පවතින විස්තරවල නිරවද්‍යතාවය තහවුරු කර එවන ලෙස අදාළ ප්‍රතිලාභියාට ලිපියක් යොමුකර අදාළ දායකයා වෙත මුදල් ප්‍රේෂණය කිරීමට කටයුතු යෙදීම, චෙක්පත් අගරු වී ගෙවීම් නොලද ප්‍රතිලාභීන්ගේ තොරතුරු කැඳවමින් නැවත ගෙවීම් සිදු කිරීමට කටයුතු කිරීම.	වන්දිලාභීන්ගේ තහවුරු කරගන්නා ලද තොරතුරු මත පදනම්ව ගෙවීම් ඉදිරියටත් සිදුකරගෙන යාමට කටයුතු කිරීම.

	වන්දිලාභීන් 85 දෙනෙකු වෙත ලබාදී තිබුණි.				
4	2019 වර්ෂයේදී පාස්කු ප්‍රහාරය සඳහා වන්දි ප්‍රදානය කිරීමේදී වන්දිලාභියෙකුට වැඩිපුර ගෙවන ලද රු.300,000ක් හා රු.112,900ක් වටිනා ලිපිද්‍රව්‍ය තොගයක් අස්ථානගතවීමේ සම්පූර්ණ අලාභය වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට ප්‍රමාණවත් පියවර නොගෙන අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය පරිදි පොත්වලින් කපාහැරීමට තීරණය කර තිබුණි.	2023	මෙම අලාභ අයකිරීම් සම්බන්ධව ප්‍රමාණවත් පියවර ආයතනය විසින් ගත යුතු ය.	ගෙවීම් සිදු කිරීමේදී පරිගණකගත ක්‍රමය ක්‍රියාත්මක කිරීම තුළින් නැවත මෙවැනි අක්‍රමිකතා සිදුවීම වළක්වා ගැනීමට කටයුතු යොදා ඇත. එසේම ලිපිද්‍රව්‍ය ඇතුළු ආයතනික වත්කම් පිළිබඳ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා ආරක්ෂිත පියවර ගෙන ඇත.	මූලික විමර්ශණ මණ්ඩලය පත් කොට එකී මණ්ඩලවල නිර්දේශයන් මත මෙකී පාඩු නිශ්චිත වශයෙන් නිලධාරීන්ගේ වරදකින් සිදු නොවූවක් බවට තහවුරු කර ගැනීමෙන් පසු අදාළ කරුණු සාමාජික මණ්ඩලය වෙත වාර්තා කිරීමෙන් අනතුරුව සාමාජික මණ්ඩල අනුමැතිය මත ගිණුම් පොත්වලින් කපාහැරීමට කටයුතු කර ඇත.
5	2023 සැප්තැම්බර් 01 වන දින සිට වසර දෙකක කාලයක් සඳහා හානිපූරණය සඳහා වන කාර්යාලයේ "අධ්‍යක්ෂ" තනතුර සඳහා ද්විතීයන පදනම යටතේ විධිමත් බඳවාගැනීමේ පටිපාටියකින් බැහැරව නිලධාරිනියක් බඳවාගෙන තිබුණි. එසේ වුව ද බාහිර හෝ අභ්‍යන්තර	2023	විධිමත් බඳවාගැනීමේ පටිපාටියකට අනුව නිලධාරින් බඳවාගත යුතු ය.	අධ්‍යක්ෂවරිය සඳහා නියමිත රාජකාරි ලැයිස්තුවක් ලබාදීම හා සාමාජික මණ්ඩලය මගින් එම කාර්යයන් අධීක්ෂණය කිරීම.	අධ්‍යක්ෂවරිය වෙත පවරා ඇති නියමිත රාජකාරී සාමාජික මණ්ඩලය මගින් අධීක්ෂණය හා ප්‍රගතිය සමාලෝචනය කිරීම.

	අයදුම්කරුවෙකු අධ්‍යක්ෂ තනතුර සඳහා බඳවාගත්තේ නම් මසකට වැටුප් හා සියලු දීමනා වශයෙන් රු.163,055ක් ගෙවිය යුතු වුව ද, ද්විතීයන පදනම යටතේ බඳවාගත් නිලධාරිනියට මසකට වැටුප් හා සියලු දීමනා වශයෙන් රු.201,474ක් ගෙවීම නිසා රු.38,419 ක අතිරේක වියදමක් දැරීමට සිදු වී තිබුණි. අධ්‍යක්ෂ තනතුරට බඳවාගත් මෙම නිලධාරිනිය සඳහා රාජකාරී ඉටුකිරීමට රාජකාරී ලැයිස්තුවක් ලබාදී නොතිබූ අතර, කාර්යයන් ඉටුකිරීම සම්බන්ධව ප්‍රමාණවත් කාර්යසාධනයක් ද සිදු වී නොතිබුණි.				
6	මුදල් රෙගුලාසි 264 ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේදී හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් වින්දිතයන් 362 දෙනෙකුට චෙක්පත් මගින් රු.547,526,491ක මුදලක් හා සෘජු	2023	මුදල් රෙගුලාසි 264 ප්‍රකාරව කටයුතු කිරීමට පියවරගත යුතු ය.	ගෙවීම් සිදු කිරීමට පෙර අදාළ නව බැංකු විස්තර හෝ පවතින විස්තර වල නිරවද්‍යතාවය තහවුරු කර එවන ලෙස අදාළ ප්‍රතිලාභියාට ලිපියක් යොමු කරනු ලබයි. මෙමගින්	ගෙවීම් සිදු කිරීමෙන් අනතුරුව ගෙවීම් සිදුකළ බව දන්වමින් ප්‍රතිලාභියාට ලිපියක් නිකුත් කිරීම සිදු කරන අතර, එම ලිපිය තුළ ඔවුන්ට මුදල් ලද බව තහවුරු කරමින් ආයතනය වෙත

	ප්‍රේෂණ මගින් වින්දිතයන් 5,430 දෙනෙකුට රු.786,977,664ක මුදලක් ගෙවා තිබුණ ද, අදාළ මුදල ආදායකයාට ලැබුණු බවට තහවුරු කරගෙන නොතිබුණි.			යාවත්කාලීන තොරතුරු මත පමණක් පදනම්ව ගෙවීම් කිරීම සිදු කිරීම.	නැවත එවීම සඳහා ලිපිතීරුවක් ද ඇතුළත් කොට ඇත.
7	2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ චක්‍රලේඛය 2.3 ඡේදය ප්‍රකාරව වාර්ෂිකව සිය ක්‍රියාකාරී සැලැස්ම සහ උපායමාර්ගික සැලැස්ම පිළියෙල කළ යුතු වුවත්, හානිපූරණ කාර්යාලයේ 2023 වර්ෂයේ අදාළ සැලැස්ම එපරිදි සකස්කර නොතිබුණි.	2023	චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම සහ උපායමාර්ගික සැලැස්ම පිළියෙල කිරීමට කටයුතු කළ යුතු ය.	චක්‍රලේඛය ප්‍රකාරව ආයතනයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සහ අදාළ උපායමාර්ගික සැලැසුම් කිරීමට උපදෙස් ලබාදී ඇත.	USAID ආයතනයේ මූල්‍ය හා තාක්ෂණික දායකත්වයෙන්, 2024 අගෝස්තු 5, 6 හා 7 තෙදින නේවාසික වැඩමුළුවක් පවත්වමින්, 2024 – 2029 කාලය සඳහා ආයතනයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සහ අදාළ උපායමාර්ගික කෙටුම්පත් සකස් කරන ලදී. එම කෙටුම්පත් 2023 දෙසැම්බර් 29 වන දින අධිකරණ අමාත්‍යාංශය වෙත යොමුකර ඇත.
8	2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ චක්‍රලේඛය 3.1 ඡේදයේ ඇමුණුම 03හි සඳහන් පරිදි මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ යුතු වාර්ෂික වාර්තාවේ අවම වශයෙන්	2023	චක්‍රලේඛය ප්‍රකාරව හෙළිදරව් කළ යුතු අංග ඇතුළත් කිරීමට කටයුතු කළ යුතු ය.	2023 වර්ෂයේ වාර්ෂික වාර්තාවට ආයතනයේ දැක්ම, මෙහෙවර, සභාපතිගේ අදහස් දැක්වීම සහ විගණන කළමනාකරණ වාර්තාව ඇතුළත් කිරීම සඳහා උපදෙස් ලබාදී	ආයතනයේ දැක්ම, මෙහෙවර, සභාපතිගේ අදහස් දැක්වීම සහ විගණන මතය ඇතුළත් වාර්තාව ඇතුළත් කරමින් 2023 වර්ෂයේ වාර්ෂික වාර්තාව මුද්‍රණ කටයුතු සඳහා යොමුකර ඇත.

	හෙළිදරව් කළ යුතු අංග වන ආයතනයේ දැක්ම හා මෙහෙවර, සභාපති අදහස් දැක්වීම, අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව, විගණන මතය ඇතුළත් වාර්තාව හා පසුගිය ආසන්නතම අවුරුදු 10ක ආයතනයේ මූල්‍ය තත්ත්වය පිළිබඳ තොරතුරු ඇතුළත් කර නොතිබුණි.			ඇත.	
9	ආයතනය සතු ත්‍රීරෝද රථය මුහුදු සුළං වැදීම හේතුවෙන් දිරාපත් වී ඇති අතර, වසර 02ක කාලයක සිට ධාවනය නොකර තිබෙන බව නිරීක්ෂණය විය.	2021	අපහරණය කළ යුතු පාවිච්චි කළ නොහැකි වාහන සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 770(4) ප්‍රකාරව කටයුතු කිරීම.	අදාළ ත්‍රීරෝද රථය පිළිසකර කිරීමට පියවරගන්නා ලදී.	ත්‍රීරෝද රථය පිළිසකර කර ධාවනයේ යොදවා ඇත.
10	කාර්යාලයේ 2023 දෙසැම්බර් 31 දිනට අනුමත නිලධාරීන් සංඛ්‍යාව 77ක් වූ අතර, තථ්‍ය නිලධාරීන් සංඛ්‍යාව 50ක් වූයෙන් තනතුරු 06කට පුරප්පාඩු 27ක් පැවතුණි.	2023 2022 2021	ඵලදායී සේවා මට්ටමක් පවත්වා ගැනීම සඳහා සේවක මණ්ඩල සමාලෝචනයක් සිදුකර ඒ අනුව අවශ්‍ය කටයුතු සිදු කිරීමට කළමනාකරණය පියවරගත යුතු ය.	2021 වර්ෂයේ සිට ම අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය මගින් අදාළ සේවක පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට ඉල්ලීම් ඉදිරිපත් කරන ලදී.	2023 දෙසැම්බර් 12 හා 20 දිනැතිව තනතුරු 05ක් සඳහා පහත සඳහන් පරිදි බඳවාගැනීම් සිදු කිරීමට අනුමැතිය ලබාගෙන ඇති අතර, ඒ සඳහා සුදුසුකම්ලත් නිලධාරීන් බඳවාගෙන ඇත. එනම් සහකාර/ නියෝජ්‍ය අධ්‍යක්ෂ - 01, හානිපූරණ නිලධාරීන් - 01, භාෂා පරිවර්තක - 01, අභ්‍යන්තර

විගණන සහකාර - 01, කළමනාකරණ සහකාර - 03 වශයෙනි.

3.70 අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	අතිරික්තය (ඌනතාවය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	23,057,886	5,249,969	17,807,917	(5,466,061)	තත්ත්වාගණනය කළ
2022	16,571,921	4,351,891	12,220,030	(5,463,248)	තත්ත්වාගණනය කළ
2023	19,960,057	10,228,258	9,731,799	(11,545,375)	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	ගණන්දීමේ නිලධාරියා විසින් වුවද, නිශ්චිත හා අවශ්‍ය නොවන කාර්යයන් සඳහා අතුරු අග්‍රිම ලබානොගත යුතු යැයි සඳහන් වුවද, නිලධාරීන් හතර දෙනෙකු විසින් අතුරු අග්‍රිම ලෙස ලබාගත් රු.526,800ක මුදල් වැය කිරීමකින් තොරව ආපසු ලබාදී තිබුණි.	2023	යොමුගත රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කළ යුතු ය.	මූලික විමර්ශන පැවැත්වීම සඳහා සංවිධාන කටයුතු සිදුකළ ද, ඇතැම් අවස්ථාවල එම කටයුතු අත්හිටුවීමට සිදු වූ අවස්ථාවලදී සම්පූර්ණ අත්තිකාරම් මුදල ආපසු පියවීමට සිදු වූ බව දන්වා තිබුණි.	මෙම තත්ත්වය නිවැරදි කිරීම සඳහා මගේ අංක: OMP/F&P/38/IFC /2024 හා 2024 ජූලි 19 දිනැති චක්‍රලේඛයක් මඟින් ආයතනයේ සියලුම නිලධාරීන්ට උපදෙස් ලබාදී ඇත. පුරප්පාඩු තනතුරු සඳහා කොන්ත්‍රාත් පදනම මත නව බඳවා ගැනීම් සඳහා අනුමැතිය ලැබී ඇති අතර, නව බඳවාගැනීම් සිදු කිරීම සඳහා අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගනිමින් පවතී.
2	රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද අංක 12/2003(iii) හා 2016 අගෝස්තු	2023	යොමුගත චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු ය.	මූලික විමර්ශන කමිටුවලට යොදා ගන්නා භාෂා පරිවර්තකයන් ක්ෂණික	මෙම ආයතනය විසින් ඉතා දුෂ්කර ප්‍රදේශවල මූලික විමර්ශන කටයුතු පැවැත්වීමේදී භාෂා

	22 දිනැති චක්‍රලේඛයෙන් සංශෝධිත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 12/2003(iv) හා 2017 පෙබරවාරි 27 චක්‍රලේඛයේ 03(ආ)(ඇ) අනුව මහජන රැස්වීම්, සාකච්ඡා හා වෙනත් දේශන සමගාමී ක්ෂණික පරිවර්තන සඳහා පළමු පැයට ගෙවනු ලබන රු.500ක ගාස්තුව වැඩි වන සෑම පැයකටම ගෙවිය යුතු වුවත්, කාර්යාලය විසින් විමර්ශන වැඩසටහන් 5ක් සඳහා සහභාගී වූ භාෂා පරිවර්තකයින් 35 දෙනෙකු සඳහා වැඩ කළ පැය ගණන පදනම් කර නොගෙන දිනකට රු.4,500 බැගින් රු.243,000ක මුදලක් ගෙවා තිබුණි.			පරිවර්තනයත් වින්දිතයන්ගෙන් හා සාක්ෂිකරුවන්ගෙන් ලබාගන්නා ප්‍රකාශ, ලිඛිත පරිවර්තනයත් යන කාර්යයන් දෙකම සිදු කරනු ලබන අතර, පෙ.ව. 8.30 සිට ප.ව. 4.30 දක්වා භාෂා පරිවර්තන සේවයත් ලබාගන්නා බැවින් එම පැය ගණන හා කාර්යයන් දෙකම වෙනුවෙන් මෙම ගෙවීම් සිදුකර ඇති බව දන්වා තිබුණි.	පරිවර්තකයන් එම ප්‍රදේශවල ඉතා සීමිත බැවින් ඔවුන්ව එම ස්ථානවලට සම්බන්ධ කර ගැනීමේ ප්‍රායෝගික දුෂ්කරතාවයන් පැවතීම හේතුවෙන් ද මෙම භාෂා පරිවර්තකයන් භාෂා හා ලිඛිත පරිවර්තනය යන දෙකම, දිනකට පැය 6-8 ක පමණ කාලයක් සිදුකරන බැවින් ද, පරිවර්තනයන් සඳහා රු.4,500ක මුදලක් ගෙවීමට 2022 ඔක්තෝබර් 20 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කර ඇත.
3	2023 ඔක්තෝබර් 02 දින විදේශගත වූ නිලධාරිනියක විසින් 2024 අප්‍රේල් 30 දින දක්වා චක්‍රලේඛය පරිදි විදේශ විනිමය ප්‍රේෂණය කිරීමට කටයුතු කර නොතිබූ අතර, භාවිතයට අපේක්ෂිත අනේවාසික විදේශ	2023	යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු ය.	අනේවාසික ගිණුමට මාසිකව මුදල් ප්‍රේෂණය කරන ලෙස අදාළ නිලධාරිනියට දැන්වුව ද, රැකියාවක් සොයා ගැනීමට නොහැකි වූ නිසා මේ දක්වා මුදල් එවීමට නොහැකි වූ බව	2024 ජූලි 10 දින පැවති 118 වන අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීම් දැනුවත් කිරීමේ පත්‍රිකාව (Note to the Board)අංක: 21/2024 මගින් මේ පිළිබඳ කරුණු වාර්තාකළ අතර, අධ්‍යක්ෂ මණ්ඩලය

	මුදල් ගිණුම පිළිබඳ විස්තර හා එහි ප්‍රගතිය ඇතුළත් වාර්තාවක් අධ්‍යක්ෂ මණ්ඩලයට හා අමාත්‍යාංශ ලේකම්වරයාට මාසිකව වාර්තා කළ යුතු වුව ද,ඒ අනුව කටයුතු කර නොතිබුණි.			දන්වා තිබුණු අතර, පවතින තත්ත්වය පිළිබඳව වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩලය වෙත හා අමාත්‍යාංශ ලේකම්වරයා වෙත කරුණු ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි.	විසින් අදාළ නිලධාරිනිය ගිවිසගෙන ඇති පරිදි අනේවාසික විදෙස් ගිණුමකට මුදල් ප්‍රේෂණය කළ යුතු බවත්, ඒ පිළිබඳව ඇයට දන්වා යවා ඇයගේ ප්‍රතිචාරය පිළිබඳව අධිකරණ අමාත්‍යාංශ ලේකම්වරයා වෙත දන්වා යැවීමටත් කටයුතු කළ යුතු බවත් තීරණය කර ඇත. ඒ අනුව මගේ අංක:OMP/ADM/STAFF/PF/54 හා 2024 අගෝස්තු 17 දිනැති ලිපිය මඟින් අදාළ නිලධාරිනිය වෙත දන්වා යවා ඇති නමුත්, එම නිලධාරිනිය මේ දක්වා පිළිතුරු ලබාදීමක් සිදුකර නොමැත. ඒ අනුව ඇයගෙන් පිළිතුරු ලිපියක් ලද පසු අධිකරණ අමාත්‍යාංශ ලේකම්වරයා වෙත දන්වා යැවීමට අපේක්ෂිත ය.
4	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික කාර්යසාධන	2022 2023	යොමුගත පනත ප්‍රකාරව කටයුතු කළ යුතු ය.	2023 වර්ෂයේ වාර්ෂික වාර්තාව Secretary General, Constitutional Council වෙත යොමුකර ඇති බව දන්වා තිබුණි.	2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව මගේ අංක: OMP/ADM/03-VOL II හා 2024 අගෝස්තු 14 දිනැති ආවරණ ලිපිය මඟින් විගණකාධිපති වෙත

	වාර්තාව ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි.				ඉදිරිපත් කර ඇත. 2023 වර්ෂයේ වාර්ෂික වාර්තාව පිළියෙළ කර අවසන් කර ඇත.
5	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කාර්යාලය විසින් විමර්ශනය අවසන්කළ ලිපිගොනු 1883ක් පුනර්ජීවන දීමනා ගෙවීම සඳහා හානිපූරණය සඳහා වන කාර්යාලය වෙත යවන ලද නමුත්, එම කාර්යාලය විසින් දෙසැම්බර් 31 වන විට ලිපිගොනු 206කට අදාළව පුනර්ජීවන දීමනා ගෙවා තිබුණි. ඒ අනුව හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් දීමනා ගෙවීමේ ප්‍රගතිය සියයට 10ක් වැනි අඩු මට්ටමක පැවතිය ද, ඒ සඳහා බලපෑ හේතු සම්බන්ධයෙන් ප්‍රමාණවත් පසුවිපරමක් සිදුකර නොතිබුණි.	2023	කාලීනව පසුවිපරම් කටයුතු කළ යුතු ය.	අංක: OMP/VFS/053 දරන 2024.02.16 සහ 2024.03.20 දින ලිපි යොමු කරමින් මේ සම්බන්ධව පසු විපරමක් සිදු කළ අතර, ඉන් අනතුරුව පුනර්ජීවන දීමනා ගෙවීමේ ප්‍රගතියක් ඇති බව නිරීක්ෂණය වන බව දන්වා තිබුණි.	පුනර්ජීවන දීමනා ගෙවීමේ ප්‍රගතිය පිළිබඳ පසුවිපරමක් කිරීම සඳහා 2024 සැප්තැම්බර් 25 දින හානිපූරණය සඳහා වන කාර්යාලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා හා අදාළ නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් මෙම කාර්යාලයේදී පැවති රැස්වීමේදී මෙම කාර්යාලය මඟින් විමර්ශන අවසන්කළ ගොනු 4,131ක් පුනර්ජීවන දීමනා ගෙවීම සඳහා යොමුකර ඇති බවත්, එම කාර්යාලය විසින් එදින වන විට ලිපිගොනු 3,478කට අදාළව ගෙවීම් කටයුතු සිදුකර ඇති බවත් දැනුම් දෙන ලදී.
6	විමර්ශන කටයුතු අවසන්කර ඒ සම්බන්ධයෙන් කළමනාකරණ මණ්ඩලයේ	2023	පසුවිපරම් කටයුතු සිදුකිරීමට කටයුතු කළ යුතු ය.	මේ සම්බන්ධයෙන් 2023 සැප්තැම්බර් 25 දින අමාත්‍යාංශයේ ලේකම්,	දක්නට නොමැති බවට වූ සහතිකය හා මරණ සහතික නිකුත් කිරීමේ ප්‍රගතිය පිළිබඳ

	අනුකූලතා වාර්තාව ලබාගැනීමෙන් පසු මරණ සහතික නිකුත් කිරීමට හා දක්නට නොමැති බවට සහතිකය නිකුත් කිරීමට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව වෙත ලිපිගොනු 424ක් පමණ යොමුකළ ද, ඉන් වර්ෂය තුළ සහතික 60ක් එනම් සියයට 14ක් පමණක් නිකුත්කර ඇති අතර, ඒ සම්බන්ධයෙන් ප්‍රමාණවත් පසුවිපරමක් සිදුකර නොතිබුණි.			රෙජිස්ට්‍රාර් ජනරාල් ඇතුළු පිරිසකගේ සහභාගීත්වයෙන් සාකච්ඡාවක් පැවැත් වූ අතර, අදාළ සහතික නිකුත් කිරීම වේගවත් කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව අවධානය යොමුකළ බව දන්වා තිබුණි.	රෙජිස්ට්‍රාර් ජනරාල් මඟින් දැනුවත්වීම හා මෙම ක්‍රියාවලිය වේගවත් කිරීමේ අවශ්‍යතාවය දැනුම්දීම සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇත.
7	මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද අංක 01/2021 හා 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර සඳහා වන අත්පොත 6.6 ඡේදය පරිදි ගිණුම් වර්ෂය අවසාන වී දින 60ක් තුළ මූල්‍ය ප්‍රකාශන හා වාර්ෂික වාර්තාවේ කෙටුම්පත් විගණනය වෙත ඉදිරිපත් කළ යුතු වුව ද, කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන 2024	2023	යොමුගත චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු ය.	මුදල් අංශයේ පැවති නිලධාරීන්ගේ පුරප්පාඩු හේතුවෙන් ගිණුම් හා වාර්තා ඉදිරිපත් කිරීමේ ප්‍රමාදයක් සිදු වූ බව දන්වා තිබුණි.	2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන හා විගණන වාර්තාව අංක: 01/2021 චක්‍රලේඛය ප්‍රකාරව ඉදිරිපත් කිරීමට අවශ්‍ය විධිවිධාන යොදා ඇත.

	මැයි මස 16 දින ඉදිරිපත් කර තිබුණි.				
8	මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද අංක 01/2021 හා 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර සඳහා වන අත්පොත 6.6 ඡේදය අනුව ගිණුම් වර්ෂය අවසාන වී මාස 05ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන හා විගණන වාර්තාව ඇතුළත් වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුව ද, 2022 වර්ෂයට අදාළ වාර්ෂික වාර්තාව 2024 ජුනි 30 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.	2023	යොමුගත චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු ය.	මුදල් අංශයේ පැවති නිලධාරීන්ගේ පුරප්පාඩු හේතුවෙන් ගිණුම් හා වාර්තා ඉදිරිපත් කිරීමේ ප්‍රමාදයක් සිදු වූ බව දන්වා තිබුණි.	2022 හා 2023 වර්ෂවලට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා සූදානම් කර ඇත. 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන හා විගණන වාර්තාව අංක: 01/2021 චක්‍රලේඛය ප්‍රකාරව ඉදිරිපත් කිරීමට අවශ්‍ය විධිවිධාන යොදා ඇත.
9	2016 අංක 14 දරන අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය පිහිටුවීම, පරිපාලනය හා කර්තව්‍ය ඉටු කිරීමපනතේ 11 කොටසේ (1)10හි දැක්වෙන කාර්යභාරයන් ඉටුකිරීම සඳහා කාර්යාලයේ ප්‍රධාන අංශ දෙකක් වන සෙවීම් හා විමර්ශන සහ සන්නිවේදන හා සමාජ	2022 2023	ආයතනයේ අපේක්ෂිත අරමුණු ඉටුවන ආකාරයට ක්‍රියාකාරී සැලැස්ම සකස් කළ යුතු ය.	සෙවීම් හා විමර්ශන අංශය වෙත ස්ථිර සේවක මණ්ඩලයක් නොසිටි නිසාත්, සන්නිවේදන හා සමාජ සම්බන්ධිකරණ අංශයේ පවතින සේවක පුරප්පාඩු සඳහා සේවකයන් බඳවාගෙන නොතිබූ නිසාත් එම අංශ ක්‍රියාත්මක නොවූ බව දන්වා තිබුණි.	වර්තමානය වන විට, සෙවීම් හා විමර්ශන අංශ ප්‍රධානවරියක් හා නිලධාරීන් 06ක් බඳවාගෙන ඇති අතර, එම අංශයේ රාජකාරී කටයුතු සිදුකර ගෙන යමින් පවතී. සන්නිවේදන හා සමාජ සම්බන්ධීකරණ අංශයේ පවතින සේවක පුරප්පාඩු සඳහා සේවකයන් බඳවාගෙන නොමැති බැවින් මේ

සම්බන්ධීකරණ අංශයන් සෘජුව සම්බන්ධ වුව ද, 2023 වර්ෂය සඳහා සකස්කර තිබූ ක්‍රියාකාරී සැලැස්මට එම අංශ මඟින් ඉටු කිරීමට අපේක්ෂිත කාර්යයන් ඇතුළත්කර නොතිබුණි.	දක්වා එම අංශය ක්‍රියාත්මක නොවේ.

3.71 අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	අතිරික්තය (ඌනතාවය) රු.	මතය
2021	50,625,910	3,910,596	46,715,314	(4,265,483)	තත්ත්වාගණනය නොකළ
2022	85,418,120	4,568,978	80,849,142	567,799	තත්ත්වාගණනය නොකළ
2023	91,763,237	5,606,617	86,156,620	(22,583)	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	2015 අංක 04 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරී පනතේ 29 වන වගන්තිය යටතේ පිහිටුවා තිබෙන අරමුදලෙන් වන්දි ප්‍රදානය කිරීම සඳහා යෝජනා ක්‍රමයක් සකස්කර එය පිළිගැනීම සහ ක්‍රියාත්මක කිරීම සිදුකළ යුතු වුව ද, අධිකාරිය පිහිටුවා වර්ෂ 07 ක් ගතවී තිබුණ ද, ඒ අනුව කටයුතු කර නොතිබුණු අතර, 2023 දෙසැම්බර් 31 දිනට මෙම	2021 2022 2023	වන්දි ප්‍රදානය කිරීම සඳහා යෝජනා ක්‍රමයක් කඩිනමින් සකස් කළ යුතු වේ.	නව පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව ගරු අමාත්‍යතුමා විසින් වන්දි ප්‍රදානය කිරීම සඳහා කමිටුවක් පත්කර ඇති අතර, එම කමිටුව කළමනාකරණ මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත්කර ඇති බව දන්වා තිබුණි.	නව පනතේ විධිවිධාන පරිදි කමිටුව පත්කර අදාළ ක්‍රියාවලිය අධ්‍යයනය කරමින් පවතී.

	අරමුදලෙහි රු.22,699,627 ක ශේෂයක් පැවතුණි.				
2	අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරි පනතේ 29 වගන්තිය අනුව පිහිටුවන ලද ආරක්ෂණ අරමුදලට සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය තුළ රැස්කළ දඩ මුදල් පිළිවෙලින් රු.2,876,775 ක් හා රු.2,100,600 ක් වූ අතර, පනතේ 29(4) වගන්තිය ප්‍රකාරව වින්දිතයින් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ වියදම් ලෙස පිළිවෙලින් රු.251,025 ක් හා රු.60,456 ක් ගෙවා තිබුණි. ආරක්ෂණ අරමුදලේ ප්‍රධාන වියදම් ලෙස එකී පනතේ 29(4) වගන්තිය ප්‍රකාරව ගෙවන වන්දි සැළකෙන බැවින් ද, පනතේ 2(ඇ) වගන්තිය ප්‍රකාරව අපරාධයක වින්දිතයින්ට එරෙහිව වරදක් සිදු කිරීම නිසා වරදකරු වූ තැනැත්තන්ගේ වින්දිතයන් හට වන්දි මුදල් ලබාගැනීමට	2021 2022 2023	ආදායම් රැස්කිරීමේ හා වන්දි ගෙවීමේ ක්‍රමය නිසි පරිදි ක්‍රියාත්මක කිරීමට වග බලාගත යුතු ය.	දැනට අධිකාරිය විසින් වන්දි ගෙවීම අධිකරණ නියෝගවලට පමණක් සීමා වී ඇති හෙයින් වන්දි කමිටුව ක්‍රියාත්මක වීමෙන් පසු වන්දි ගෙවීම වඩාත් සක්‍රීය කළ හැකිවනු බව දන්වා තිබුණි.	මේ වන විට වන්දි කමිටුව සක්‍රියව පවත්වාගෙන යනුලබන අතර, වන්දි ගෙවීමේ ක්‍රියාවලිය අධ්‍යයනය කරමින් පවතී. කමිටුව විසින් මේ වන විට රැස්වීම් වාර 3ක් පවත්වා ඇත.

	සැලැස්වීම අධිකාරියේ අරමුණක් වන බැවින් ද, ඉහත ආදායම් රැස් කිරීම හා වන්දි ගෙවීම අවම මට්ටමක පැවතුණි.				
3	අධිකාරිය යටතේ ක්‍රියාත්මක වන අපරාධයක වින්දිතයින් හා සාක්ෂිකරුවන් සඳහා ආරක්ෂාව ලබාදීමේ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා රැකවරණ නිවාසයක් සැකසීම සඳහා 2021 දෙසැම්බර් 27 දිනැතිව වස්කඩුව ප්‍රදේශයෙන් ඉඩම සහ ගොඩනැගිල්ල රු.20,799,000 කට මිලදීගෙන තිබුණි. ඒ සඳහා 2022 වර්ෂයේදී අවශ්‍ය ගෘහභාණ්ඩ හා අනෙකුත් උපකරණ මිලදී ගැනීමට රු.1,084,977 ක මුදලක් ද, විදුලිය සඳහා රු.7,339 ක මුදලක් ද වැයකර තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේදී රු.965,000 ක් වැයකර නිවාසය වටා තාප්පයක් ඉදිකර තිබුණි. එමෙන්ම සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රැකවරණ නිවාසයෙහි	2022 2023	කළ යුතු සියලු යටිතල පහසුකම් සංවර්ධන කාර්යයන් මේ වන විට අවසන් කර රැකවරණ නිවස්නය රැකවරණ අංශය වෙත බාරදී ඇති බවත්, ඔවුන් විසින් උපයෝජනයට අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගනිමින් පවතින බවත් දන්වා තිබුණි .	කඩිනමින් රැකවරණ නිවාසය ආරම්භ කිරීමට කටයුතු කළ යුතු ය.	රැකවරණ නිවසේ යටිතල /භෞතික පහසුකම් සියල්ල සම්පූර්ණ කර රැකවරණ අංශය වෙත භාරදී ඇත. මේ වන විට ක්‍රියාත්මක මට්ටමේ පවතී.

	රැකවරණය ලබා ගැනීමට පැමිණිලි 27ක් පමණ ලැබී තිබියදීත්, වර්ෂ දෙකක පමණ කාලයක සිට මෙම නිවාසය උපයෝජනය නොකර නිශ්කාර්යව පැවතිණි.				
4	2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල්චක්‍රලේඛ හා මුදල් රෙගුලාසි ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් ඇප තැබීමට කටයුතු කර නොතිබුණි.	2021 2022 2023	මෙම අධිකාරියේ මුදල් භාරකරුවෙකු (සරප්) පත්කර නොමැති අතර චෙක්පත් මඟින් ගනුදෙනු සිදු කරන බැවින් ඇප තැබීමක් සිදුකර නොමැති බව දන්වා තිබුණි.	චක්‍රලේඛ ප්‍රකාරව ඇප තැබීමට කටයුතු කළ යුතු ය.	මේ දක්වා ඇප තැබීමේ කටයුතු කර නොමැත.
5	අමාත්‍යාංශයෙන් අධිකාරියට ලැබුණු ජීප්රථ දෙකක් 2017 දෙසැම්බර් 21 දිනැති අංක 02/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛ ප්‍රතිපාදන ප්‍රකාරව අධිකාරියට පවරාගැනීමට කටයුතු කර නොතිබුණි.	2022 2023	මෙම රථ දෙක අධිකාරියේ නමින් ලියාපදිංචි කිරීම සඳහා කඩිනම් විසඳුමක් ලබා ගැනීමට අදාළ කටයුතු සිදු කරමින් සිටින බැව් දන්වා තිබුණි.	චක්‍රලේඛ ප්‍රකාරව ජීප්රථ දෙක පවරාගැනීමට කටයුතු කළ යුතු ය.	මෙම රථ දෙක ජාතික අධිකාරිය වෙත පවරා ගැනීමට පවතින ගැටලුකාරී තත්ත්වයන් හේතුවෙන් නැවතත් අධිකරණ අමාත්‍යාංශය වෙත භාරදීමට කටයුතු කරමින් පවතී.
6	2022 අගෝස්තු 22 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED 05/2022 චක්‍රලේඛයේ 3.9 ඡේදය ප්‍රකාරව 2023 පෙබරවාරි 20 දින	2023	මුදල් ප්‍රේෂණය කරන ලෙස දන්වා සිහිකැඳවීම් ලිපි 02 ක් අදාළ නිලධාරීන් වෙත යොමුකර ඇතත්, මේ වන තෙක්	චක්‍රලේඛ ප්‍රකාරව විදේශ විනිමය ප්‍රේෂණය කිරීමට කටයුතු කළ යුතු ය.	ඒ සම්බන්ධයෙන් අදාළ නිලධාරියා වෙත සිහිකැඳවීම් ලිපි 3 ක් යොමුකර ඇති අතර, ඒ පිළිබඳව කළමනාකරණ

	විදේශගත වූ නිලධාරියෙකු විසින් 2024 අප්‍රේල් මස දක්වා චක්‍රලේඛය පරිදි විදේශ විනිමය ප්‍රේෂණය කිරීමට කටයුතු කර නොතිබූ අතර, භාවිතයට අපේක්ෂිත අනේවාසික විදේශ මුදල් ගිණුම පිළිබඳ විස්තර හා එහි ප්‍රගතිය ඇතුළත් වාර්තාවක් අධ්‍යක්ෂ මණ්ඩලයට හා අමාත්‍යාංශ ලේකම්වරයාට මාසිකව වාර්තා කළ යුතු වුව ද,අධිකාරිය විසින් විදේශගත වූ නිලධාරීන් සඳහා එසේ වාර්තා පිළියෙලකර නොතිබුණි.		ප්‍රේෂණ ප්‍රගති වාර්තා ඉදිරිපත්කර නොමැති අතර, ඉදිරි කළමනාකරණ මණ්ඩල රැස්වීමේදී වාර්තා කිරීමට සැලසුම්කර ඇති බව දන්වා තිබුණි.		මණ්ඩලය වෙත දැනුවත් කර රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ 05 / 2022 හි 3.14 වගන්තියට අනුව ඔහුගේ ජ්‍යෙෂ්ඨත්වය පහත හෙලා ඉදිරි කටයුතු කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි.
7	එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ අරමුදල් යටතේ පළමු වාරිකය ලෙස රු.මිලියන 12.833 ක් අධිකාරියට ලැබී තිබුණු අතර, වර්ෂය තුළදී රු.මිලියන 9.1973 ක මුදලක් වැයකර තිබුණි. මෙම පළමු වාරිකයෙන් රු. මිලියන 3.6357 ක් හෙවත් ලැබුණු අරමුදල්වලින් සියයට 28ක් දෙසැම්බර් 31 දිනට ඉතිරි වී තිබුණි. මෙම වැඩසටහන	2023	මෙම ප්‍රතිපාදන අධිකාරියේ ප්‍රතිපත්ති සහ වැඩසටහන් අංශය විසින් කරනු ලබන දැනුවත් කිරීමේ වැඩසටහන් වන බවත්, ඒ සඳහා ප්‍රමාණවත් පිරිස් බලයක් නොමැති බවත්, එම නිසා දෙවන වාරිකය අධිකාරියට ලබාගැනීමට 2023 වර්ෂය තුළදී නොහැකි වූ බවත් දන්වා	අදාළ පුරප්පාඩු පුරවා ආයතනයේ කටයුතු කාර්යක්ෂම කරගෙන යාමට කටයුතු කළ යුතු ය.	ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් අංශය වෙත යොදවා ප්‍රමාදයකින් තොරව ක්‍රමානුකූලව වැඩ කටයුතුකර ගෙන යාමට අවශ්‍ය පියවරගෙන ඇත. දෙවන වාරිකයෙන් රු. මිලියන 6.95ක් මේ වන විට ලබාගෙන ඇත.

සඳහා පිළියෙලකර තිබූ ක්‍රියාකාරී සැලැස්මෙහි පළමු වාරිකය 2023 ජූනි 30 දිනෙන් අවසන් වන අතර, 2 වන වාරිකය වන රු.මිලියන 13.1188 ක මුදලක් 2023 ජූලි සිට දෙසැම්බර් දක්වා වෙන්කර තිබුණ ද, පළමු වාරිකය වියදම්කර අවසන්කර නොතිබීම හේතුවෙන් එම දෙවන වාරිකය 2023 දෙසැම්බර් 31 දින දක්වා ලබාගැනීමට අධිකාරිය විසින් කටයුතුකර නොතිබුණි.	තිබුණි.

3.72 මාර්ග සංවර්ධන අධිකාරිය

	මුළු වත්කම් රු.මිලියන	මුළු වගකීම් රු. මිලියන	ස්කන්ධය රු. මිලියන	බදු පෙර ලාභය (අලාභය) රු. මිලියන	මතය
2021	1,217,691.47	432,524.21	785,167.26	79,371.55	තත්ත්වාගණනය කළ
2022	1,267,360.70	434,197.28	833,163.41	43,501.83	තත්ත්වාගණනය කළ
2023	1,331,160.46	425,654.95	905,505.51	68,669.19	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශය ක්‍රියාත්මක තත්ත්වය
1	අධිකාරියට අයත් A සහ B ශ්‍රේණි වලට අදාළ මහා මාර්ගයන්ගේ මුළු දුර ප්‍රමාණය කිලෝමීටර් 12,225 ක් වුවත් ජාතික මහාමාර්ග ප්‍රාග්ධනිත කිරීම ආරම්භ කරන ලද 2018 වර්ෂයේ සිට 2022 දෙසැම්බර් 31 දිනට මාර්ග 285 කට අයත් කිලෝමීටර් 3,267 ක් පමණක් ප්‍රාග්ධනිත කර තිබුණි. ඒ අනුව, මාර්ග සංවර්ධන අධිකාරිය සතු A සහ B ශ්‍රේණි වලට අයත් කිලෝමීටර් 8958 ක දුර ප්‍රමාණය සඳහා වූ වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනවල දක්වා නොතිබුණු	2021, 2022, 2023	විවිධ විදේශීය සහ දේශීය ව්‍යාපෘති මගින් මූල්‍යායන කරමින් ඉදිකරනු ලබන හා විටින් විට පුනරුත්ථාපනය කරනු ලබන මහා මාර්ග ප්‍රාග්ධනිත කර සුදුසු පරිදි ක්ෂය කිරීම සඳහා අදාළ ක්‍රියාමාර්ග හඳුනාගෙන කඩිනමින් ක්‍රියාත්මක කළ යුතු බව.	ශ්‍රී ලංකා මාර්ග වත්කම් කළමනාකරණ පද්ධතිය මගින් ඉතිරි වී ඇති මාර්ගයන්හි ප්‍රාග්ධනිත කිරීමේ කටයුතු 2024 වසරේදී ආරම්භ කිරීමට නියමිත අතර 2024 වසරේදී කි.මී.2000 ක්ද 2025 වසරේදී කි.මී.4000 ක්ද හා 2026 වසරේදී කි.මී.5500 ක්ද වශයෙන් නිම කිරීමට අපේක්ෂිතය.	අධිකාරියට අයත් සියළු මාර්ග වත්කම් ලෙස සටහන්කරගෙන නොමැත.

	අතර, මෙය 2022 දෙසැම්බර් 31 දිනට සමස්ත මාර්ග පද්ධතියේ දුර ප්‍රමාණයෙන් සියයට 73 ක ප්‍රතිශතයක් විය.				
2	විදේශ ණය හා දේශීය වාණිජ බැංකු ණය මත ක්‍රියාත්මකවන ව්‍යාපෘතින් හි අවශ්‍යතාවය සඳහා මිල දී ගන්නා සහ ව්‍යාපෘති අතරේ හුවමාරු වන ඉන්වෙන්ට්‍රි ගත විය යුතු වත්කම් මිල දී ගන්නා සහ හුවමාරු වන අවස්ථාවන් හි දී අධිකාරියේ ස්ථාවර වත්කම් ලේඛනයේ යාවත්කාලීනව සටහන් වන ක්‍රමවේදයක් සකස් කර නොතිබීම නිසා වත්කම් ඒකක 17,883 ක වටිනාකම ගණනයකර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.	2022, 2023	මුදල් රෙගුලාසි මගින් නියමකර ඇති ආකාරයට භාණ්ඩ ලැබීම් හා නිකුතුකිරීම් සඳහා නිවැරදි ආකෘති භාවිතාවන බවට අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (මූල්‍ය හා වත්කම් කළමනාකරණ) විසින් සහතික විය යුතුය.	වත්කම් අධිකාරියට භාරදෙනු ලබන්නේ ව්‍යාපෘතීන් අවසන් වීමෙන් පසුව වන අතර, ව්‍යාපෘති වත්කම් භාරදීමට අදාලව නිකුත් කර ඇති අභ්‍යන්තර චක්‍රලේඛ අංක 216 හා 250 පරිදි අදාල වත්කම් ස්ථාවර වත්කම් ලේඛනයට යාවත්කාලීන කිරීමට කටයුතු කරනු ලැබේ.	අදාල වත්කම් වටිනාකම හඳුනාගෙන ගිණුමගතකර නොමැත
3	2020, 2021, 2022 හා 2023 වර්ෂය යන වර්ෂයන් හී දී විවිධ දේශීය/විදේශීය මූල්‍යාධාර මඟින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති 09 ක් විසින් අධිකාරිය වෙත පවරා දී තිබුණු	2022, 2023	ව්‍යාපෘති අවසන් කිරීමෙන් පසු වත්කම් භාරදීම හා භාරගැනීම ගිණුම්ගත කිරීම සම්බන්ධ විශේෂ අවධානය යොමුකර අවශ්‍ය පරිපාටීන් හඳුන්වා	තොරතුරු ලද පසු ගිණුම්ගත කරනු ලැබේ.	ගිණුම්ගත කිරීම අවසන්කර නොමැත.

	එකතුව රු.මි.22,587 ක් වූ වත්කම් ගිණුම්ගතකර නොතිබුණි.		දී ලිඛිත උපදෙස් නිකුත්කළ යුතුය. අවිධිමත් ලෙස වත්කම් භාරදුන් හා භාරගත් නිලධාරීන් සම්බන්ධව විනයානුකූලව කටයුතුකළ යුතුය.		
4	2008 අංක 40 දරන ජාතික මංමාවත් පනතේ 4(3), 6(1) සහ 7(1) වගන්ති වගන්ති ප්‍රකාරව පිළිවෙළින් "ඒකාබද්ධ මාර්ග පද්ධති සංවර්ධනය සහ නඩත්තුව සඳහා ක්‍රියාකාරී සැලැස්ම" සකස්කර නොතිබූ අතර "මාර්ග පද්ධති සංවර්ධන උපදේශක සභාව" සහ "දිස්ත්‍රික් මාර්ග පද්ධති සංවර්ධන සම්බන්ධීකරණ කමිටු" පිහිටුවා නොතිබුණි.	2021, 2023	පනතේ අදාළ විධිවිධාන වලට අනුව කටයුතු කළ යුතු බව.	දිස්ත්‍රික් මාර්ග පද්ධති සම්බන්ධීකරණ කමිටු සාමාජිකයන් ලෙස අදාල පළාත් පාලන ආයතන ප්‍රධානීන් හා පළාත් සභා නියෝජනය වන පරිදි මහජන නියෝජිතයින් නම් කළ යුතු බැවින්, එම ආයතන සඳහා සුදුසු මහජන නියෝජිතයින් තෝරා පත් කර ගැනීමෙන් අනතුරුව මෙහි සඳහන් දිස්ත්‍රික් මාර්ග පද්ධති සම්බන්ධීකරණ කමිටු පිහිටුවීමට පියවර ගැනීමට නියමිතය.	"මාර්ග පද්ධති සංවර්ධන උපදේශක සභාව" 2023 වර්ෂයේදී පිහිටුවා තිබුණද, කිසිදු රැස්වීමක් පවත්වා නොමැති අතර දිස්ත්‍රික් මාර්ග පද්ධති සංවර්ධන සම්බන්ධීකරණ කමිටු පිහිටුවා නොතිබුණි.
5	දේශීය බැංකු අරමුදල් සහ ග්‍රාමීය මාර්ග ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක වන ජාතික, ප්‍රාදේශිය හා ග්‍රාමීය වශයෙන් කි.මී 100,000 ක විකල්ප මාර්ග පුනරුත්ථාපනය	2021	ඇස්තමේන්තු පිළියෙල කිරීම වඩාත් නිවැරදිව විධිමත් අධීක්ෂණයක් යටතේ සිදු කළ යුතුය.	මෙම වැඩ කර ගෙන යනු ලබන ව්‍යාපෘතීන් වෙනුවෙන් සිදුකරනු ලබන ගෙවීම් සංශෝධනයන් , මහාමාර්ග අමාත්‍යාංශයේදී විගණන අංශ සමග සිදු කරනු ලැබූ	ඇස්තමේන්තු දෝෂ නිවැරදිකර නොමැත

	කිරීමේ වැඩසටහන යටතේ සකස්කරන ලද ඉංජිනේරු ඇස්තමේන්තු සංශෝධනය කිරීම හා නිවැරදි කිරීම සිදුකරන ලෙස සියලු පළාත් අධ්‍යක්ෂකවරු, ප්‍රධාන ඉංජිනේරුවරු හා විධායක ඉංජිනේරුවරු වෙත අදාල ව්‍යාපෘති අධ්‍යක්ෂක විසින් දන්වා තිබුණද, 2022 ඔක්තෝබර් 30 දින වනවිටත් එකතුව රු.මිලියන 15,690. 5 ක් වටිනා ව්‍යාපෘති 146 ක් සම්බන්ධයෙන් අදාල නිවැරදි කිරීම් සිදුකර නොතිබුණි.			සාකච්ඡාවේදී ඇතිකර ගත් එකඟතාවයන් මත ඉහත ක්‍රමවේදය තුළ අවසන් ගෙවීමට ප්‍රථමව සිදු කරනු ලබයි.	
6	අධිකාරිය සතු පිරිවැය රු.මිලියන 122 ක් වූ වාහන 44 ක් සහ කිසිදු පිරිවැයක් සඳහන් නොවූ වාහන 15 ක් වශයෙන් වාහන 60 ක් පිළිවෙළින් මහා මාර්ග අමාත්‍යාංශය සහ රාජ්‍ය අමාත්‍යාංශය හා ජනාධිපති ලේකම් කාර්යාලය වෙත ලබා දී තිබුණි.	2021, 2022, 2023	අධිකාරියට අයත් වාහන බාහිර ආයතන හා පුද්ගලයින් වෙත ලබාදීමේ හා නැවත භාරගැනීමේදී විධිමත් අනුමැතීන් සහිතව කටයුතුකළ යුතුය.	මාර්ග සංවර්ධන අධිකාරියට අයත් වාහන අදාල අනුමැතීන් මත පමණක් රේඛීය අමාත්‍යාංශය හා අගමැති කාර්යාලය ඇතුළු බාහිර ආයතන වෙත නිදහස් කර ඇත.	විගණන නිර්දේශය ක්‍රියාත්මකකර නොමැත.
7	2022 වර්ෂය අවසාන වන විටත් අධිකාරිය විසින්	2021, 2022	විධිමත් හා ඵලදායි ලෙස මානව සම්පත්	බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය සඳහා	බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය

	බඳවා ගැනීමේ පටිපාටියක් සකස් කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අනුමැතිය ලබාගෙන නොතිබුණි.		උපයෝජනය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමත බඳවා ගැනීමේ පටිපාටියක් ක්‍රියාත්මක කල යුතු බව .	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය මේ වන විට තනතුරු/සේවා ගණයන් කිහිපයකට පමණක් ලැබී ඇත.	සම්පූර්ණකර අනුමතකරගෙන නොමැත
8	අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළ මගනැගුම ඉමල්ෂන් සමාගමේ සියයට 99 ක ඍජු පාලන හිමිකමක් අධිකාරියට හිමි බව හෙළිදරව් කර තිබුණ ද, ඒ සඳහා වන කොටස් සහතික විගණනයට ඉදිරිපත් නොවූ අතර සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය තුල ද එම ප්‍රතිශතයට සමපාත නියෝජනයක් අධිකාරියට නොමැති බව නිරීක්ෂණය විය. තවද 2004 වර්ෂයේ දී අදාළ සමාගමේ රු.මිලියන 01 ක ආයෝජනයක් සිදු කල බව අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල සඳහන් වුවද අදාළ සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළ එය ණය මුදලක් ලෙස ගිණුම්ගතකර තිබුණි.	2021, 2022, 2023	අදාළ කොටස් සහතික ලබා ගැනීමට හා හිමිකම නියෝජනය වන පරිදි අධ්‍යක්ෂ මණ්ඩලය පත්කර ගැනීමට ද සමාගම විසුරුවා හැරීමට නියමිත බැවින් එයට පෙර හිමිකම පිළිබඳ ගැටලුව නිරාකරණය සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග අධිකාරිය විසින් ගත යුතු බව	මෙම සමාගම මේ වන විට ඈවර කිරීමේ ක්‍රියාවලියේ පවතින අතර හිමිකම පිළිබඳ ගැටළුව නිරාකරණය කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.	සමාගම සම්බන්ධයෙන් පවතින අධිකාරියේ පාලන හිමිකම තහවුරුකරගෙන නොමැත.

9	2008 අංක 40 දරන ජාතික මංමාවත් පනතේ 7(3) වගන්තිය අනුව, මාර්ග සංවර්ධන අධිකාරිය, අදාළ පළාත් සභාව, අදාළ පළාත් පාලන ආයතන සහ වෙනත් නියෝජිත ආයතන විසින් භාර ගෙන ඇති දිස්ත්‍රික්කයේ මාර්ග සංවර්ධන ව්‍යාපෘති නිශ්චිතව දක්වන "ඒකාබද්ධ මාර්ග පද්ධති සංවර්ධනය සහ නඩත්තුව සඳහා ක්‍රියාකාරී සැලැස්ම" සකස් කර නොතිබුණි.	2021, 2022, 2023	ජාතික මංමාවත් පනතේ විධිවිධාන අනුව ඒකාබද්ධ මාර්ග පද්ධති සංවර්ධනය සහ නඩත්තුව සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතු බව.	ජාතික මාර්ග පද්ධතියේ ඉදිරි වසර 10ක කාලය තුළ ප්‍රතිසංස්කරණය සහ වැඩිදියුණු කල යුතු මාර්ග කොටස් විද්‍යානුකූල පදනමක් මත හඳුනාගෙන ඉහළ ප්‍රමුඛතාවයන් සහිත ජාතික මහාමාර්ග තෝරාගෙන පස් අවුරුදු (2023-2027) නඩත්තු සැලසුම සකස් කර ඇත.	ඒකාබද්ධ මාර්ග පද්ධති සංවර්ධනය සහ නඩත්තුව සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස්කර නොමැත.
10	2005 නොවැම්බර් 03 දිනැති අංක: අමප/05/1711/016/ 110 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, මාර්ග නඩත්තු කිරීමේ භාරකාර අරමුදලක් පිහිටු වීමට කටයුතු කර නොතිබුණි.	2022, 2023	අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි මාර්ග නඩත්තු කිරීමේ භාරකාර අරමුදල පිහිටු විය යුතු බව.	මේ වන විට ආදායම් බලපත්‍ර ගාස්තු සමග බද්දක් අය කිරීම සඳහා සකස් කරන ලද දළ කෙටුම්පත් පනත අවශ්‍ය ඉදිරි කටයුතු සඳහා මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත.	මේ වන විටත් මාර්ග නඩත්තු කිරීමේ භාරකාර අරමුදල පිහිටුවා නොමැත.
11	1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනතේ 20 වන වගන්තිය ජීවන වියදම් දීමනාවට අමතරව, අධිකාරියට ම සුවිශේෂී වූ, විවිධ	2022	පාරිතෝෂික ගෙවීම් පනතේ විධිවිධාන අනුවම ක්‍රියා කළ යුතු බව.	මාර්ග සංවර්ධන අධිකාරිය විසින් පාරිතෝෂික ගෙවීම් කිරීමේදී සේවක අර්ථසාධක අරමුදල සඳහා දායක මුදල් ගණනය කිරීමට ජීවන වියදම්	අතිරේක දීමනා සහිතව පාරිතෝෂික ගෙවීම අඛණ්ඩව සිදුකරනු ලබයි.

	පරමාර්ථයන් සහිතව ගෙවනු ලබන මාර්ග සංවර්ධන අධිකාරී දීමනාව, අතිරේක වැඩ දීමනාව, ගැලපුම් දීමනාව හා ඉංජිනේරු දීමනාව ඇතුළු දීමනාවන් 12 ක් සැලකිල්ලට ගෙන පාරිතෝෂික ගණනය කිරීම හේතුවෙන් 2022 වර්ෂයට අදාළ පාරිතෝෂික වෙන් කිරීම් වටිනාකම රු.මිලියන 1,232.83 කින් අධි ගණනය වී තිබුණි. තවද, අනුමත නොවන දීමනා ඇතුළත්ව පාරිතෝෂික ගෙවීම් කිරීම හේතුවෙන් 2022 වර්ෂයේ දී රු.මිලියන 40.92 ක් වැඩියෙන් ගෙවා තිබුණි.			දීමනාවට අමතරව දිමනා 04 ක් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත අදාළකරගෙන ඇත.	
12	2022 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව අධිවේගී මාර්ග ඉදිකිරීම සඳහා ඉඩම් අත්පත්කර ගැනීම වෙනුවෙන් දරන ලද පිරිවැය රු.මිලියන 33,815.28 ක් වුවත් එයට අදාළ ඉඩම් ලේඛනයක් අධිකාරියේ ඉඩම් අංශය විසින් පවත්වා නොතිබුණි.	2021, 2022	අධිවේගී මාර්ග ඉදිකිරීම සඳහා අත්පත්කර ගත් ඉඩම් අධිකාරියේ ඉඩම් ලේඛනයක සටහන් කළ යුතු බව.	රේඛීය අමාත්‍යාංශය විසින් ගෙවීම් සිදුකරන ලද ඉඩම් තොරතුරු අධිකාරියේ දත්ත වාර්තාවල නිවැරදිව සඳහන් නොවේ.	මේ වන විටත් අධිවේගී මාර්ග ඉදිකිරීම් යටතේ අත්පත්කරගත් ඉඩම් සඳහා ඉඩම් ලේඛණයක් පවත්වාගෙන නොමැත.

13	2007 අංක 07 දරන සමාගම් පනතේ 133 වගන්තිය අනුව, සමාගමක් විසින් සෑම වර්ෂයකට වරක් කොටස්කරුවන්ගේ වාර්ෂික මහා සභා රැස්වීම පැවැත්විය යුතු වුවත්, අධිකාරියට අයත් එහි පරිපාලිත සමාගම් 04 ඒ අනුව කටයුතු කර නොතිබුණි.	2021, 2022, 2023	සමාගම් පනත අනුව වාර්ෂික මහ සභා රැස්වීම් පැවැත්වීමට කටයුතු කළ යුතු බව	පරිපාලිත සමාගම්වලින් සමහරක් ආයතන ස්ථාපනය කිරීමේදී කොටස් අයිතිය පිළිබඳව ඇති වූ නීතිමය ගැටලු නිසා එම ආයතන වාර්ෂික මහාසභා රැස්වීම් නොතිබීමට තීරණය කරන ලදී.	වාර්ෂිකව මහ සභා රැස්වීම් පවත්වා නොමැත.
14	1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 21(1) වගන්තිය අනුව, ප්‍රාදේශීය සභා පරිපාලන සීමාව තුළ පවතින මංමාවත් සහ මාර්ග වල අයිතිය එම පළාත් පාලන ආයතනය සතු වේ. මේ අනුව, අධිකාරිය විසින් එම මාර්ග අලුත්වැඩියා සහ සංවර්ධන කටයුතු සඳහා දරන වියදම් එම ආයතනවලට ප්‍රාග්ධනිත කළ යුතු වුවත් එසේ ප්‍රාග්ධනිත කිරීමකින් තොරව වියදමක් ලෙස කපා හැරීම විගණනයේ දී මතභේදාත්මක විය. 2022 වර්ෂයේ දී එලෙස අධිකාරියට අයත් නොවූ (Non-	2022	පලාත් පාලන ආයතන සීමාවට අයත් මාර්ග සඳහා දරන පිරිවැය අදාළ පලාත් පාලන ආයතනය විසින් ගිණුම්ගතකළ හැකි වන පරිදි අවශ්‍ය තොරතුරු ලබා දීමේ ක්‍රමවේදයක් සකස්කළ යුතුය	කි.මී. 100,000 ව්‍යාපෘතිය යටතේ මාර්ග සංවර්ධන අධිකාරියට අයත් නොවන (Non RDA) මාර්ග වෙනුවෙන් 2022.12.31 දිනට වැය කල මුදල (සියලුම Mob Advance අය කරගත් පසු) ප්‍රාග්ධනිත නොකර සංවර්ධන වියදම් යටතේ කපා හැරීම සිදු කර ඇත. ඒ වෙනුවෙන් 2022 වසරේදී Non RDA මාර්ග 225 ප්‍රමාණයට අදාල රු.මි. 9,706.84 ක වටිනාකම වියදම් ලෙස කපා හරින ලදී.	මෙම වටිනාකම වියදම් ලෙස ලියා හැරීම එලෙසම පවතී

	RDA) මාර්ග වෙනුවෙන් දරන ලද රු.මිලියන 9,706.84 ක් වියදම් ලෙස කපා හැර තිබුණි.				
15	අධිකාරිය විසින් ඉදිකිරීම් ව්‍යාපෘතීන් 10 ක් සඳහා කොන්ත්‍රාත්කරුවන්ට ලබා දී තිබූ අත්තිකාරම් මුදල්වල වටිනාකම රු.මිලියන 45,811.79 ක් වූ අතර, එම වටිනාකම් තුළ ව්‍යාපෘති 05 කට අදාළව ලබා දී තිබූ රු.මිලියන 15.53 ක අත්තිකාරම් 2015 වර්ෂයට පෙර ලබා දී තිබුණු අතර, 2022 වර්ෂය අවසන් වන විටත් අදාළ ශේෂ නිරවුල් කර නොතිබුණි. තවද, මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය අදියර I, මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය අදියර III සහ රුවන්පුර අධිවේගී මාර්ග ව්‍යාපෘතිය සඳහා එකතුව රු.මිලියන 39,976.2 ක් අත්තිකාරම් ලෙස ගෙවා තිබූ අතර, අදාළ ව්‍යාපෘති 03 හි වැඩ අතරමඟ නතරකර තිබුණි. ඒ අනුව වැඩ ආරම්භ කිරීම සඳහා ලබා දී	2022	කඩිනමින් කොන්ත්‍රාත් වැඩ අවසන් කර ගැනීමට සහ අත්තිකාරම් මුදල් අයකර තැනීමට කටයුතු කල යුතු බව	රුවන්පුර අධිවේගී මාර්ග ව්‍යාපෘතිය සඳහා වන වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් එම ව්‍යාපෘතියේ අවසාන බිල්පත මගින් නිරවුල් කර ගැනීමට නියමිත අතර මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘති 1 හා 3 සඳහා වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් වලින් රු. මිලියන 1359.86 අය කර ගෙන ඇත.	මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය අදියර I, මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය අදියර III සහ රුවන්පුර අධිවේගී මාර්ග ව්‍යාපෘති මගින් තවදුරටත් අයවිය යුතු අත්තිකාරම් වටිනාකම රු.මිලියන 38,616.34 කි.

	ඇති රු.මිලියන 45,811.79 ක අත්තිකාරම් පියවා ගැනීමට නොහැකි වී තිබුණි.				
16	සංචාරක නිවාස ඉදිකර ගැනීම සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත අධිකාරිය විසින් 2005 වර්ෂයේ දී රු.මිලියන 60 ක් ගෙවා තිබුණි. එම මුදලින් රු.මිලියන 44.18 ක වැඩ ඉටු කරවාගෙන තිබුණද, ඉතිරි රු.මිලියන 15.82 ට අදාළ වැඩ කරවා ගැනීමට හෝ අදාළ අත්තිකාරම් මුදල් ආපසු අයකර ගැනීමට 2022 වර්ෂය අවසන් වන විටත් අධිකාරිය කටයුතු කර නොතිබුණි.	2022	අදාළ කාර්යය නිමකරවා ගැනීමට හෝ ඉතිරි මුදල් ආපසු අයකර ගැනීමට කටයුතු කළ යුතු බව.	මෙම මුදල නැවත ලබා ගැනීමට ජාතික නිවාස සංවර්ධන අධිකාරියෙන් විමසීම් කළත් ඒ සම්බන්ධව එම අධිකාරිය ප්‍රතිචාර දක්වා නොමැත. එම නිසා එම මුදල ලබා ගැනීමට නොහැකි නම් ඒ වෙනුවට නිවාස ලබා ගැනීමට ඇති හැකියාව පිළිබඳව සොයා බලා අවශ්‍ය කටයුතු සිදු කිරීමට අපේක්ෂිතය.	මෙම මුදල නැවත ලබාගෙන හෝ ඊට අදාල කාර්යයන් ඉටුකරගෙන නොමැත.
17	2020, 2021 වර්ෂයන්ට අදාළව මාර්ග කි.මී.100,000 වැඩසටහන යටතේ ප්‍රසම්පාදන හා තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයින් වෙත 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ ප්‍රතිපාදන ඉක්මවා ගෙවා තිබුණු රු. මිලියන 6.19 ක මුදලක් 2022 වර්ෂය අවසන්	2022, 2023	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ ප්‍රතිපාදන ඉක්මවා කටයුතු නොකළ යුතු බව හා වැඩිපුර ගෙවන ලද මුදල් අයකර ගැනීමට හා වැඩිපුර ගෙවීම් අනුමතකල නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූලව ක්‍රියාමාර්ග ගත යුතු බව.	මෙම මුදල ගෙවන ලෙසට අදාළ නිලධාරීන් දැනුවත්කර ඇති අතර එයට අතිරේක වශයෙන් ඉදිරියේදී ගෙවීමට හිමිකම් ලබන මුදලින් අයකර ගැනීමට කටයුතු කරන බව දන්වමි.	අයකරගැනීම් අවසන්කර ඇත.

	වන විටත් අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි. තවද, අදාළ ශේෂය තුළ අධිකාරියේ සේවය කර විශ්‍රාම ගිය නිලධාරියකුගෙන් අයවිය යුතු රු.මිලියන 3.03 ක් ද ඇතුළත්ව තිබුණි.				
18	2022 දෙසැම්බර් 31 දින වන විට කි.මී. ලක්ෂයේ මාර්ග සංවර්ධන ව්‍යාපෘතියේ මාර්ග කි.මී. 6,426 ක් ඉදිකිරීම් කටයුතු සඳහා රු. මිලියන 193,518 ක් වූ වැඩ ඇණවුම් (Work Oder) 2481 ක් මහ නැගුම ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ සමාගම වෙත ලබා දී තිබුණු අතර, එයින් පිරිවැය රු.මිලියන 131,650 ක් වූ මාර්ග කි.මී. 4,732.8 ක වැඩ ආරම්භකර තිබුණි. ඒ අතරින් මාර්ග කි.මී.306.97 කට අදාළ වටිනාකම රු.මිලියන 5,920 ක වැඩ ඇණවුම් 71 ක කොන්ත්‍රාත් කටයුතු පමණක් සෘජුව සිදු කිරීමට සමාගම භාරගෙන තිබුණි. එය මුළු වැඩ ඇණවුම් වටිනාකමින් සියයට	2022	පවරන ලද වැඩ ඇණවුම් කාලීනව අවසන් කර ගැනීමටත් නියමිත අනුමැතියකින් තොරව උපකොන්ත්‍රාත් ලබා දුන් නිලධාරීන්ට විරුද්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු බව.	මාර්ග කිලෝමීටර් 100,000 සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ අමාත්‍ය මණ්ඩල තීරණක් අනුව මහනැගුම ආයතනයට කොන්ත්‍රාත්, වැඩ ඇණවුම් (Work Orders) ලෙස ලබා දී ඇත. ඒ අනුව මහනැගුම ආයතනයට මාර්ග කිලෝමීටර් 7,377.37 ක් සඳහා වටිනාකම රුපියල් මිලියන 190,800 ක් වූ වැඩ ඇණවුම් 2416 පළාත් පළාත්භාර අධ්‍යක්ෂකවරුන් විසින් ලබා දී තිබේ. තවද, මහනැගුම ආයතනය මගින් මෙම ව්‍යාපෘති උප කොන්ත්‍රාත් ලබා දීම සම්බන්ධව මාර්ග සංවර්ධන අධිකාරියට දැනුම් දීමක් කර නොමැත.	එම තත්වය එලෙසම පවතී.

03 ක් තරම් පහල අගයක් වූ අතර ඉතිරි වැඩ සියයට 97 ට අදාළ මාර්ග කි.මී. 4,425.87 ක් සඳහා පිරිවැය රු. මිලියන 125,730 ක් වූ වැඩ ඇණවුම් 1,753 ක කොන්ත්‍රාත් කටයුතු, සමාගමේ සේවා සපයන්නන් ලෙස හඳුනා ගන්නා උප කොන්ත්‍රාත්කරුවන් වෙත ලබා දී තිබුණි. තවද, මෙලෙස උප කොන්ත්‍රාත් ලබා දීම මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක: 2008/1109 ට පටහැණි වූ අතර, 2020 මැයි 07 දිනැති හා අංක අමප/20/0731/221/ 005-1 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, රාජ්‍ය සමාගමක් වෙත කොන්ත්‍රාත් ලබා දීමේ අරමුණු ද ඉටු වී නොතිබුණු අතර, උප කොන්ත්‍රාත්කරුවන් ගේ ලාභ ලෙස රජයේ මුදල් රු.මිලියන 20,955 ක් පමණ පෞද්ගලික කොන්ත්‍රාත්කරුවන් වෙත ප්‍රේෂණය වී තිබුණි. තවද, 2022 වර්ෂය අවසාන වන

	විට මුළු වැඩ ඇණවුම් වලින් රු.මිලියන 32,736 ක් වූ වැඩ ඇණවුම් 351 ක් අවලංගු කර තිබුණු අතර, රු.මිලියන 29,130 කට අදාළ වැඩ ඇණවුම් 306 ක ඉදිකිරීම් වැඩ ආරම්භ කර නොතිබුණි.				
19	1995 ජුලි 21 දින ජනාධිපති ලේකම් කාර්යාලය නිකුත්කළ රජයේ ඉඩම් පැවරීම පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහයේ 07 සහ 08 වගන්තිය අනුව ගිවිසුමේ කොන්දේසි ලෙස අවුරුදු 05 කට වරක් බදුකුලී ප්‍රතිශෝධනය කළ යුතු වුවත් ඊට පටහැනිව, දක්ෂිණ අධිවේගී මාර්ගයේ වැලිපැන්න සේවා පෙදෙසෙහි ආපන ශාලා සහ ඉන්ධන පිරවුම්හල් පවත්වා ගෙන යාම සඳහා ඉඩම් කැබලි 04 ක් වසර 30 ක් හා වසර 99 ක කාලයක් සඳහා බදු පදනම මත පුද්ගලික සමාගම් 02 ක් වෙත වාර්ෂික බදු කුලිය රු.10,000 බැගින් වන ගිවිසුම් 03 ක්	2023	ඉඩම් පැවරීම පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහයේ උපදෙස් කඩකළ නිලධාරීන් හඳුනාගෙන ආයතන සංග්‍රයේ ii කාණ්ඩයේ XLVII වැනි පරිච්ඡේදයේ 08 වන වගන්තිය අනුව හා XLVIII වන පරිච්ඡේදයේ 29 වන වගන්තිය අනුව, විනයානුකූලව කටයුතුකළ යුතුය.	තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද වාර්ෂික නාමික බදු කුලිය වන රු.10,000ක තක්සේරු මුදල මත කැබලි අංක 1 හා 9 සඳහා වසර 30කටද කැබලි අංක 4 හා 6 සඳහා වසර 99 වශයෙන් බදු දී ඇති අතර ඒ සඳහා ඔවුන්ගෙන් එකවර අදාල මුදල් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් රිසෝට් ස්පාස් (පුද්) සමාගමෙන් රු.21,800,000 මුදලක් 2013.02.13 දිනද කැනෝවින් හොටෙල් ඇන්ඩ් ස්පාස් (පුද්) සමාගම වෙතින් රු.2,924,905/= ක මුදලක් 2014.01.29 දිනද ලබාගෙන ඇත.	අදාල බදු කුලී ගිවිසුම සංශෝධනය කර නොමැත

	මගින් 2013 සහ 2014 වර්ෂයේ දී බඳවා දී තිබුණි.				
20	2006 සැප්තැම්බර් 22 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 හි ඇමුණුම II ඡේද අංක 04 අනුව, දෙපාර්තමේන්තුවේ නියමයන්ට හා මාර්ගෝපදේශයන්ට අනුව සකස් කරන ලද බඳවාගැනීමේ හා උසස් කිරීමේ පටිපාටියක් සකසා ගැනීමට යටත්ව එම දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත්කර තිබූ කාර්ය මණ්ඩල ප්‍රතිව්‍යුහගතකරණ නිර්දේශයන් ක්‍රියාත්මක නොකර අධිකාරිය විසින් බඳවා ගෙන තිබුණු නිලධාරීන් 114 දෙනෙකු වෙනුවෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර තිබුණු MM 1-3 වැටුප් පරිමාණයේ මූලික වැටුප් වටිනාකම වෙනුවට HM වැටුප් පරිමාවේ පිහිටු වීම හේතුවෙන් 2023 දෙසැම්බර් 31 දින වන විට රු. මිලියන 437.89 ක අමතර මුදලක් වැටුප්	2022, 2023	ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් මේ පිළිබඳ පරීක්ෂණයක් පවත්වා අනුමැතියකින් තොරව ඉහළ වැටුප් පරිමාණයක පිහිට වීමට අදාළ නිලධාරීන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රයේ ii කාණ්ඩයේ XLVII වැනි පරිච්ඡේදයේ 08 වන වගන්තිය අනුව කටයුතුකළ යුතුය. අදාළ පත්කිරීම් අනුමත කළ, වැටුප් ගෙවීම් අනුමත කළ නිලධාරීන් මගින් අතිරික්ත ගෙවීම් අයකරගත යුතුය.	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් මෙම වැටුප් පරිමාණයට අදාල අනුමැතිය තවමත් ලබා දී නොමැති අතර ඉදිරිපත්කළ කැබිනට් පත්‍රිකාව මගින් හෝ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය මගින් මෙම වැටුප් කේතයේ වැටුප් ලබාගන්නා නිලධාරීන්හට අභ්‍යන්තර වශයෙන් හිමිවීමට නියමිත උසස්වීම් ලබාගැනීමේදී මෙම ගැටළුව නිරායාසයෙන් විසඳේ.	මෙම ගැටළුව විසඳීමට කටයුතුකර නොමැත.

	ලෙස ගෙවා තිබුණි.				
21	2006 අගෝස්තු 01 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 28 (II) අනුව, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද සේවක ප්‍රමාණය ඉක්මවා බඳවා ගන්නා ලද නිලධාරීන් 857 ක් සඳහා 2023 වර්ෂයේ දී අධිකාරිය විසින් රු.මි. 309.7 ක මුදලක් වැටුප් ලෙස ගෙවා කර තිබුණි.	2023	අදාළ පත්කිරීම් අනුමත කළ, වැටුප් ගෙවීම් අනුමත කළ නිලධාරීන් මගින් අතිරික්ත ගෙවීම් අයකරගත යුතුය.	සේවා අවශ්‍යතාවය මත අවස්ථානෝචිතව සිදු කරන ලද බඳවා ගැනීම් හේතුවෙන් 2023 වර්ෂය අවසන් වන දිනට (2023-12-31 දිනට) 856 ක අතිරික්ත කාර්යය මණ්ඩලයක් පැවතීය.	නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.
22	2009 මැයි 26 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 39 අනුව, නිලධාරීන් හට අනුමත වූ වැටුපකට අමතරව යම් දීමනාවක් ලබා දෙන්නේ නම් ඒ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් හා වැටුප් සහ සේවක සංඛ්‍යා කොමිෂන් සභාවෙන් අනුමැතිය ලබා ගත යුතු වුව ද, ඊට පටහැනිව 2016 මාර්තු 28 දිනැති අංක 1698/2016 දරණ අධ්‍යක්ෂ	2023	අනුමත නොකළ දීමනා ගෙවීම් අනුමත කළ නිලධාරීන් මගින් අතිරික්ත ගෙවීම් අයකරගත යුතුය.	එක් එක් වෘත්තියට අදාලව පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය දරන විධායක නිලධාරීන් හට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත අධිකාරිය විසින් වෘත්තීය දීමනාවක් ගෙවනු ලබයි. මාර්ග සංවර්ධන අධිකාරි දීමනාව සාමූහික ගිවිසුමට එළඹීමේදී මහා භාණ්ඩාගාරය විසින් අනුමත කරන ලද දීමනාවක් වන අතර ඉන් ඉවත්වීමේදී අදාල වරප්‍රසාද එලෙසම පවතින බවට භාණ්ඩාගාර ලේකම්	අදාල දීමනා තවදුරටත් ගෙවීම සිදුකරනු ලබයි.

	මණ්ඩල අනුමැතිය මත පමණක් පදනම්ව අධිකාරියේ නිලධාරීන් සඳහා වෘත්තීය දීමනාවක් හා අධිකාරී දීමනාවක් ගෙවා තිබුණි. ඒ අනුව, 2023 වසරේ දී සේවකයන් 382 දෙනෙකු සඳහා රු.මිලියන 110.59 ක් ඇතුළුව, 2016 සිට 2023 දක්වා රු.මිලියන 736.46 ක් වෘත්තීය දීමනා ලෙස ගෙවා තිබුණු අතර 2023 වසරේ දී සේවකයන් 6,794 දෙනෙකු සඳහා රු.මිලියන 1,042.61 ක් ඇතුළුව, 2019 සිට 2023 දක්වා රු.මිලියන 5,232.61 ක් “මාර්ග සංවර්ධන අධිකාරි දීමනා” ලෙස ගෙවා තිබුණි.			එකඟ වූ බව අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් වෘත්තීය සමිති වෙත දැනුම් දී තිබුණි.	
23	මුල්‍ය ප්‍රකාශන අනුව දේශීය හා විදේශීය අරමුදල් භාවිතා කරමින් රු.මිලියන 767,630 ක පමණ වටිනාකමකින් යුතු අධිවේගී මාර්ග කි.මී. 312.6 ක් ඉදිකර ඇති බව සඳහන් විය. මෙම මාර්ගයන් හි සියලුම පරිපාලන කටයුතු අධිකාරිය වෙත පවරා තිබුණු අතර,	2023	ආරක්ෂිත වැඩ පිළිවෙලක් සඳහා ඵලදායී අභ්‍යන්තර පාලනයන් ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතුය.	වැටලීම් හා මුර සංචාර, තිබෙන පහසුකම් අනුව ප්‍රමාණාත්මකව මේ වනවිට වැඩි කර ඇතත් අධිවේගී මාර්ගයන්හි දේපළ මාර්ගය දිගේ විසිරී පවතින බැවින් එම දේපළ සඳහා සම්පූර්ණ ආරක්ෂාවක් ලබා දීම ඉතා අපහසු කාර්යයක් වී ඇත.	දේපළ ආරක්ෂාකර ගැනීමේ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කර නැත.

	පොලිසියට පහසුකම් සැපයීම ඇතුළුව මෙහෙයුම් කටයුතු සඳහා රු.මිලියන 2,000 කට වැඩි පිරිවැයක් දරමින් පැවතිය දී අධිවේගී මාර්ගයේ ඇති වත්කම් ආරක්ෂා කර ගැනීමට ප්‍රමාණවත් ආරක්ෂක වැඩපිළිවෙළක් සකස් නොකිරීම හේතුවෙන් 2023 දෙසැම්බර් 31 දින වන විට අධිවේගී මාර්ගයන්හි දේපළ සොරකම් කිරීම හා හානි වීම් වාර්තා වී ඇති අතර, එම හානි වීම්වල වටිනාකම රු. මිලියන 913.17 ක් පමණ වී තිබුණි.				
24	2021 වර්ෂයේ සිට 2024 ජනවාරි 31 දින දක්වා කාලය අවසන් වන විට අධිකාරිය තුල රු.මි.2.08 ක් ඉක්මවු මුදල් වංචා සිදුකර ඇති බව නියැදි විගණන මගින් අනාවරණය වී තිබුණි. මෙවැනි මුදල් වංචා වළක්වා ගැනීම සඳහා රිසිට් පත් ආදායම් පරීක්ෂා කිරීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක නොවන අතර දැනට භාවිතා කරන අයකැමි	2023	ඵලදායී අභ්‍යන්තර පාලනයන් ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතුය.	මුදල් ගෙවන අවස්ථාවේ ලබා දෙන රිසිට් පත් සංසන්දනය කර ගැනීම සඳහා දත්ත පද්ධතියක් සමස්ථ අධිවේගී මාර්ග ජාලය වෙතම නොමැත.	ඊට අදාල අභ්‍යන්තර පාලන ක්‍රමවේදය ස්ථාපිතකර නොමැත

	පද්ධතිය 2011 වර්ෂයේ තාවකාලිකව ස්ථාපිත කරන ලද පද්ධතියක් විය.				
25	මාර්ග සංවර්ධන ඉඩම්, රජයේ ඉඩම් ආඥා පනතේ 6 වන වගන්තිය ප්‍රකාර නිදහස් ප්‍රදානයක් වශයෙන් අධිකාරිය වෙත වෙන්කරදීම සඳහා 2014 ඔක්තෝබර් 30 දින අමාත්‍යමණ්ඩලය තීරණය කර තිබුණද, අධිකාරිය විසින් භුක්ති විඳින අක්කර 935.855 ක ඉඩම් එකී තීරණය පරිදි අධිකාරිය වෙත පවරාගෙන ගිණුම්ගතකිරීමට 2023 වර්ෂය අවසන් වන විටත් කටයුතුකර නොතිබුණි.	2023	අමාත්‍ය මණ්ඩලය තීරණය ක්‍රියාත්මක කිරීමට අදාළ වගකීම් නිශ්චිතව පවරා දී අවශ්‍ය පරිපාටීන් හඳුන්වා දී ලිඛිත උපදෙස් නිකුත්කළ යුතුය.	මේ වන විටත් නිදහස් දීමනා පත්‍ර යටතේ ඉඩම් කැබලි 356ක් සඳහා ඉල්ලුම්පත්‍ර ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත භාර දී ඇති නමුත් මෙතෙක් නිදහස් දීමනා පත්‍ර අධිකාරිය වෙත ප්‍රදානය කර නොමැත. ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව සමග මේ සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට අපේක්ෂිතය.	අමාත්‍ය මණ්ඩලය තීරණය ක්‍රියාත්මක කර නොමැත.
26	වටිනාකම රු.මිලියන 347.37 ක් වූ Aggregate Chip Spreaders යන්ත්‍ර 11 ක් 2010 වර්ෂයේ දී අධිකාරිය වෙත ජනාධිපති කාර්යසාධන බලකාය විසින් ආනයනය කර ලබා දී තිබුණු අතර, අදාළ යන්ත්‍රවල පළල මීටර් 4.2 ක් වීම හේතුවෙන් හා එම	2023	ප්‍රයෝජනයට ගතනොහැකි මෙම යන්ත්‍ර බාරගෙන ප්‍රයෝජනයට නොගෙන තබාගත් නිලධාරීන් සම්බන්ධයෙන් විනය පියවර ගත යුතුය.	මෙම යන්ත්‍රයන් ආයතනයේ අවශ්‍යතාවය පිළිබඳව විධිමත් අධ්‍යයනයක් සිදු නොකර ආර්ථික කටයුතු අමාත්‍යාංශය මගින් මිලදී ගෙන ලබා දී තිබූ ඒවා වන අතර දිවයින පුරා පවතින මාර්ග්වල ධාවනයට මෙම යන්ත්‍ර භාවිතා කිරීමට නොහැකි	නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.

	පළල සාමාන්‍ය පාරක පළලට වඩා වැඩි වීම හේතුවෙන් එම යන්ත්‍ර අධිකාරිය වෙත පැවරුනු දින සිට භාවිතා කර නොතිබුණු අතර, එම යන්ත්‍රවල වටිනාකම වර්ෂ 14 කට පසු රු.මිලියන 4.4 කට තක්සේරු කර අපහරණය කිරීමට 2024 වර්ෂයේ දී තීරණය කර තිබුණි. ඒ අනුව අදාළ යන්ත්‍ර අධිකාරියේ අවශ්‍යතාවලට නොගැලපෙන බව දැන දැනම ප්‍රයෝජනයට නොගෙන තබා ගැනීම විගණනයේදී මතභේදාත්මක විය.			විය. මාර්ග සංවර්ධන අධිකාරිය නඩත්තු කරන A හා B ශ්‍රේණියේ මාර්ගයන්හි මේ වන විට ගල්තාර ඇතිරීම සිදු නොකරන බැවින් මේවා අධිකාරියට භාර දුන් දින සිටම ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.	
27	බස්නාහිර පළාත් ව්‍යාපෘති කාර්යාලයට අයත් ගම්පහ ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය විසින් ක්‍රියාත්මක කළ කොන්ත්‍රාත් 02 ක් සඳහා එකම අංකය දරන වාහනයක් එකම කාල පරාසයක් තුළ ධාවනය කළ බව සඳහන් කරමින් එකතුව රු.මි. 5.29 ක බිල්පත් ඉදිරිපත්කර තිබුණි. ඒ අනුව අදාළ	2023	ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් මේ පිළිබඳ පරීක්ෂණයක් පවත්වා වගකිවයුතු නිලධාරීන් සම්බන්ධයෙන් XLVIII වන පරිච්ඡේදයේ 29 වන වගන්තිය අනුව, විනයානුකූලව කටයුතු කළ යුතුය.	වවුචර්පත් සඳහා ගෙවීම් සිදු කිරීම අත්හිටුවා ඇති අතර ඉදිරියේදී මෙවැනි ක්‍රියාවන් වැළැක්වීම සහ ප්‍රසම්පාදන ක්‍රමවේදය විනිවිදභාවයකින් යුතුව සිදු කරන ලෙස හා මුදල් රෙගුලාසි අනුව අදාල නිලධාරීන් වගකීමට යටත් බව සඳහන් කරමින් උපදෙස් ලබා දී ඇත.	නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.

	බිල්පත් ව්‍යාජ ඒවා බව නිරීක්ෂණය වන අතර, එම බිල්පත් වටිනාකම සහතික කල, අනුමතකල නිලධාරීන්ට එරෙහිව මුදල් රෙගුලාසි 156(1), 103(1)(අ) සහ 105 ප්‍රකාරව කටයුතුකර නොතිබුණි.				
28	ගම්පොල පැරණි පාලම අසල භාවිතයට නොගන්නා මාර්ග කොටස් 2017 වර්ෂයේ සිට දී.මු. ජයරත්න ආගමික ජෛව විවිධත්ව සංකීර්ණයේ ප්‍රචාරක මධ්‍යස්ථානයක් පවත්වා ගෙන යාම සඳහා සමාගමක් වෙත අධිකාරිය විසින් පවරා දී ඇති අතර මෙම ඉඩම සඳහා වාර්ෂික කුලී බදු අයකර ගෙන නොතිබුණි.	2023	විමර්ශණයක් සිදුකර අදාළ භූමිය පවරාදීමේදී විධිමත් පරිපාටීන් අනුගමනය කර නිසි අනුමැතියක් සහිතව සිදුකර තිබේද යන්න තහවුරුකර ගත යුතුය. ඒ අනුව වගකිවයුතු නිලධාරීන් හඳුනාගෙන විනයානුකූලව කටයුතු කළ යුතුය.	ගම්පොල පැරණි පාලම අසල භාවිතයට නොගන්නා මාර්ග කොටසේ භූමි ප්‍රමාණය වර්ග මීටර් 819ක් වන අතර කුලී ගාස්තු අය කිරීමකින් තොරව 2017 වසරේදී එම සමාගම වෙත මෙම කොටස පවරා ඇති අතර මෙම ඉඩම් කොටස සඳහා වාර්ෂික බදු මුදල් අය කරගැනීමට ඉදිරි කටයුතු සිදු කරමින් පවතී.	වාර්ෂික බදුකුලී අය නොකරනු ලබයි.
29	2015, 2017 සහ 2020 යන වර්ෂයන් හි දී ව්‍යාපෘති කටයුතු අවසන් කර අධිකාරිය වෙත බාර දුන් ව්‍යාපෘති 06 ක් මගින් අත්කරගත් සමස්ථ ඉඩම් කැබලි 21,757 ක ප්‍රමාණයෙන් ඉඩම්	2023	ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතු කාලීනව සිදුකර අමතර වියදම් අවම කරගත යුතුය.	ව්‍යාපෘති වලට අදාලව ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී අදාල ප්‍රාදේශීය ලේකම් වන අතර එම ඉඩම් අධිකාරිය වෙත පැවරීම සිදු කරනුයේ ලියාපදිංචි කිරීමෙන්	ඉඩම් අත්පත් ක්‍රියාවලිය අවසන්කර නොමැත.

	කැබලි15,019 කට අදාලව වන්දි හා පොලී ලෙස රු.මි. 196.24 ක් ගෙවා තිබුනු අතර ඉඩම් කැබලි 982 කට අදාල වන්දි හා පොලී 2023 වර්ෂය අවසන් වන විටත් ගෙවා අවසන් කර තිබූ රජයේ ඉඩම් කැබලි 5,756 කට අදාල වන්දි නොගෙවීමට අධිකාරිය තීරණයකර තිබුණි. තවද,ඉඩම් අත්පත් පනතේ විධිවිධාන අනුව අත්කරගත් සමස්ථ ඉඩම් කැබලි 21,757 ක ප්‍රමාණයෙන් කිසිදු ඉඩම් කැබැල්ලකට අදාලව ඉඩම් අත්පත් පනතේ 44 වගන්තිය යටතේ වන සහතිකය ලබාගැනීමට අධිකාරිය අපොහොසත් වී තිබුණි.			අනතුරුවය. එකී ලියාපදිංචි කිරීමේ කටයුතු කඩිනම් කිරීමේ ක්‍රමවේදය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර ඒ අනුව 2024 වසර මාර්ග ව්‍යාපෘතිවලට අදාල ඉඩම් අත්පත් කරගැනීමේ පනතේ 44 වගන්තිය යටතේ ලියාපදිංචිය කඩිනම් කිරීමේ වසර ලෙස සලකන ලෙස සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් දැනුවත් කර ඇත.	
30	මාර්ග කි.මී. 100,000 ව්‍යාපෘතිය යටතේ සංවර්ධනය සඳහා තෝරා ගෙන පසුව අතරමග නතර කරන ලද මාර්ග ධාවන තත්ත්වයට පත් කිරීමට 2023 ජනවාරි 30 දිනැති අංක 23/0127/608/010	2023	අමාත්‍ය මණ්ඩල අනුමැතියට පටහැනිව කටයුතු කළ නිලධාරීන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ II කොටස 48 පරිච්ඡේදයේ 29 වගන්තිය ප්‍රකාරව විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු	බොහෝමයක් මාර්ග ගමනාගමනයට සුදුසු තත්ත්වයට පත් කිරීමට (Motorable Condition) තෝරා ගැනීමත් සමග සංවර්ධන කටයුතු අවසන් නොකළ මාර්ග ප්‍රමුඛතා	විගණන නිර්දේශය ක්‍රියාත්මකතර නොමැත.

	දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අනුමැතිය ලැබී තිබුණ ද, ඇස්තමේන්තු පිරිවැය රු.මිලියන 2,891.24 ක් වූ නව මාර්ග කි.මී. 212.30 ක් ධාවන තත්ත්වයට පත්නොවූ මාර්ග යටතේ සංවර්ධනය කිරීමට තෝරා ගැනීම විගණනයේදී මතභේදාත්මක විය.		කළ යුතුය.	පදනමින් සැලසුම් අනුව ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා තෝරා ගන්නා ලදී.	
31	මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් සකස් කරන ලද 2020 ජනවාරි 14 හා 2020 නොවැම්බර් 26 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශ මගින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.5 මාර්ගෝපදේශයට නිකුත් කරන ලද අතිරේක 39 ට අනුව කොන්ත්‍රාත්කරුවන් ට පිරිනැමිය හැකි කොන්ත්‍රාත් වටිනාකම් සීමාවන් අවමය රු.මිලියන 75 සිට උපරිමය රු.මිලියන 300 දක්වා අසාමාන්‍ය පරාසයකින් ඉහළ දැමීමට ඉල්ලීම් ඉදිරිපත්කර තිබුණු අතර ඒ සඳහා	2023	CIDA ශ්‍රේණිය හා කොන්ත්‍රාත් වටිනාකම සංශෝධනයට CIDA ආයතනයේ එකඟතාවය ලබාගත යුතුය.	කොන්ත්‍රාත්කරුවන් ගේ ධාරිතාව සහ කොන්ත්‍රාත් වටිනාකම් සීමාවන් මෙම ව්‍යාපෘතිය සඳහා පමණක් වන පරිදි ඉහළ දැමීමට අමාත්‍ය මණ්ඩල සංදේශයක් මගින් අනුමැතිය ලබා දෙන ලදී.	විගණන නිරිදේශය ක්‍රියාත්මක කර නොමැත. මෙම ගැටළුව එලෙසම පවතී.

	කැබිනට් මණ්ඩල අනුමැතීන්ද ලබාගෙන තිබුණි. කෙසේ වුවද, කොන්ත්‍රාත්කරුවන්ට පිරිනැමිය යුතු CIDA ශ්‍රේණිය හා කොන්ත්‍රාත් ප්‍රදාන වටිනාකම වෙනස් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශ ඉදිරිපත්කිරීමට පෙර CIDA ආයතනයේ එකඟතාවය ලබා ගැනීමට අමාත්‍යාංශය කටයුතුකර නොතිබුණි.				
32	2020 ජනාවරි 14 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයේ 3.5(ඉ) වගන්තියට අනුව මාර්ග කි.මී. 100,000 ව්‍යාපෘතිය යටතේ වන සියලු මාර්ග වැඩ කොන්ත්‍රාත් සඳහා ගෙවීම, Milestone ගෙවීම් මත පදනම්ව නිමැයුම් පදනම (Milestone Delivery Modle) මත සිදුකරනු ඇති බව සඳහන් කර තිබුණි. මෙම ගෙවීම් ක්‍රමය වැඩි තාක්ෂණික අවශ්‍යතා ඇති ව්‍යාපෘතින් (Turnkey) සඳහා යොදාගනු ලබන ක්‍රමවේදයක් වන	2023	Standard Bidding Document Procurement of work Design and Build contracts (CIDA/SBD/04) හි වගන්ති අංක 4.1 අනුව කටයුතුකර නොමැති නිලධාරීන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රයේ ii කාණ්ඩයේ XLVII වැනි පරිච්ඡේදයේ 08 වන වගන්තිය අනුව කටයුතුකළ යුතුය. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(1) (ඇ) ඡේදය යටතේ වූ සමාලෝචනයේදී මෙම ක්ෂේත්‍රය සම්බන්ධ විශේෂ	ක්‍රමවේදය (Lump Sum) හරහා මූල්‍ය පරිපාලනය වඩා පහසු වන අතර වැඩ බිමේදී නිරීක්ෂණය කරනු ලබන කාර්යයන්ට අදාළ වන සියලු වැඩි වීම් කොන්ත්‍රාත්කරු විසින් සිදුකළ යුතු වෙයි. තවද මෙම ව්‍යාපෘතිය මහා පරිමාණ ව්‍යාපෘතියක් වන බැවින් සියලු ව්‍යාපෘතින් මැනුම්කර ගෙවීම් සිදු කිරීමට විශාල කාලයක් අවශ්‍ය වේ. මෙම ක්‍රමවේදය අනුගමනය කරන ව්‍යාපෘතියන් තුළ පවතින අවධානම හා වගකීම	මෙම ගැටළුව එලෙසම පවතී.

අතර ඇස්තමේන්තු සකස්කල හැකි මාර්ග ඉදිකිරීම් සඳහා සාමාන්‍යයෙන් භාවිතා නොකරන ක්‍රමයකි. තවද, Standard Bidding Document Procurement of work Design and Build contracts (CIDA/SBD/04) හි 4.1 වගන්තියට අනුව, මෙම ක්‍රමය යටතේ වන කොන්ත්‍රාත්තුවක් නිර්මාණය කිරීම, ක්‍රියාත්මක කරීම හා සම්පූර්ණ කිරීම කොන්ත්‍රාත්කරු විසින් සිදුකල යුතු වුවත් මෙම ව්‍යාපෘතිය සඳහා නිර්මාණය කිරීම (Design) අදාළ නොවන බව සඳහන් කර තිබුණි. ඒ අනුව මෙම ක්‍රමය සම්පූර්ණ වශයෙන් අනුගමනය කර නොතිබුණි. තවද, මෙම ක්‍රමය යටතේ කොන්ත්‍රාත් පිරිනැමීම සිදුකළද, අතර මඟ නතර කර ඇති කොන්ත්‍රාත් සම්බන්ධයෙන් මුදල් ගෙවීම් තීරණය කිරීමේ දී නැවත මැනුම් කර ගෙවීම් කිරීමේ ක්‍රමවේදය

අවධානය යොමුකර අවශ්‍ය පරිපාටීන් හඳුන්වා දී ලිඛිත උපදෙස් නිකුත්කළ යුතුය.

කොන්ත්‍රාත්කරු විසින් දැරිය යුතු වෙයි. ඉංජිනේරු ඇස්තමේන්තු වටිනාකම පමණක් කොන්ත්‍රාත්කරුවන් හට ලබා දී ඒ සඳහා තරඟකාරී වට්ටම් මුදලක් ලබා ගැනීම අනුගමනය කරන ලද ක්‍රමවේදය වේ.

	(Measure and Pay) අනුගමනය කිරීමට සිදු වී තිබුණි.				
33	මාර්ග කි.මී. 100,000 ව්‍යාපෘතිය මගින් කොන්ත්‍රාත් පැකේජයන්ට අදාළ ඉංජිනේරු ඇස්තමේන්තුව ලංසුකරුට ඉදිරිපත් කර ඒ සඳහා උපරිම වට්ටමක් ලබාදීමේ ක්‍රමය අනුගමනය කර තිබුණි. ඒ අනුව, තොරාගත් කොන්ත්‍රාත් පැකේජ 24 ක් සඳහා අදාළ ලංසුකරුවන් විසින් ලබා දී තිබූ වට්ටම් ප්‍රමාණය සියයට 0.19 සිට සියයට 13.56 දක්වා පරාසයක පැවතුණි. ඉංජිනේරු ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල නොකිරීම හේතුවෙන් පළාත් 09 මගින් ප්‍රධානයකරන ලද කොන්ත්‍රාත් වලට අදාල ඇස්තමේන්තු වටිනාකම 2023 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 3,484 කින් පමණ අධි ඇස්තමේන්තු වී තිබුණි. ඒ අනුව, අදාළ ඉංජිනේරු ඇස්තමේන්තුව ප්‍රසිද්ධ නොකර මිල කැඳවීම් හරහා	2023	ඉංජිනේරු ඇස්තමේන්තු සකස් කිරීමේ දී නිවැරදි නොවන ඉංජිනේරු ඇස්තමේන්තු මත කටයුතු කිරීම සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරීන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ II කොටසේ XLVIII පරිච්ඡේදයේ 29 වගන්තිය ප්‍රකාරව විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය.	රජයේ විගණන නිලධාරීන් ද සහභාගීත්වයෙන් පැවැත්වූ සාකච්ඡාවේදී ඇතිවූ එකඟතාවයන් අනුව ඇස්තමේන්තු නැවත විශ්ලේෂණය කරන ලෙස අදාල පළාත්භාර අධ්‍යක්ෂකවරුන් දැනුවත් කර ඇත. කොන්ත්‍රාත් ප්‍රධානය කිරීමේදී එක් එක් අයිතම සඳහා වටිනාකම් කොන්ත්‍රාත් සමාගම වෙත ලබා දීම සිදු නොවන බැවින් එම මාර්ගය ඉදිකිරීමට යන අවම පිරිවැය සම්පූර්ණ ඇස්තමේන්තු මුදල හා සසඳා බැලීමෙන් අනතුරුව එම ව්‍යාපෘතියට වට්ටම් මුදල් ලබා දීම සිදු කරයි. කොන්ත්‍රාත් ප්‍රධානය කර ගිවිසුම් ගත වී ඇති බැවින් එය වෙනස් කිරීම මගින් අමතර ගෙවීම් (Contractual Claim) සඳහා කොන්ත්‍රාත්කරුවෝ යොමු විය හැකි අතර එසේ වුවහොත්	මෙම ගැටළුව එලෙසම පවතී.

	කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීම සිදු කළේ නම් අස්ථිත්වයට වට්ටම් මඟින් හිමිවන ප්‍රතිලාභයට වඩා වැඩි වාසිදායක තත්ත්වයක් ලබාගත හැකිව තිබුණු බව නිරීක්ෂණය කෙරේ.			කොන්ත්‍රාත්කරුවන් හට ගෙවීමට සිදුවන මුදල ප්‍රමාණාත්මකව වැඩිවේ.	
34	මාර්ග කි.මී. 100,000 ව්‍යාපෘතිය විසින් ලබාගත් සේවාවන් වෙනුවෙන් කොන්ත්‍රාත්කරුවන් වෙත අවස්ථා දෙකක දී වටිනාකම රු.මිලියන 40,651.55 ක් වූ භාණ්ඩාගාර බැඳුම්කර නිදහස් කර තිබුණි. එම බැඳුම්කර නිදහස් කරන අවස්ථාව වන විට ව්‍යාපෘතිය විසින් බාහිර පාර්ශවයක් වෙත ගෙවීමට ඇති වටිනාකම් (බැඳීම්) නිවැරදිව ගණනය කර නොතිබීම හේතුවෙන් අවස්ථා 11 දී කොන්ත්‍රාත්කරුවන් 09 දෙනෙක් වෙත නිකුත් කර තිබුණු රු.මිලියන 121.17 ක් වූ භාණ්ඩාගාර බැඳුම්කර වලට සමාන මුදලක් පසුව ව්‍යාපෘතිය වෙත අදාල	2023	බැරකම් නිවැරදිව ගණනය නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ 29 වගන්තිය ප්‍රකාරව විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය.	පලාත් කාර්යාල වෙතින් යොමු කරන ලද බිල්පත් කිහිපයක් නැවත සංශෝධනය කරන ලද අතර ඒ අනුව අදාල වෙනසට අයවිය යුතු මුදල එම අවස්ථාවේදී අයකර ගැනීමට කටයුතු කරන ලදී.	මෙම ගැටළුව එලෙසම පවතී.

	කොන්ත්‍රාත්කරුවන් විසින් ගෙවා තිබුණි. ඒ අනුව එම වටිනාකමට අදාළ භාණ්ඩාගාර බිල්පත් සඳහා රජය විසින් ගෙවනු ලබන පොලිය හා වට්ටම් කරන ලද මුහුණත වටිනාකම රජයට සිදු වන පාඩුවක් විය.				
35	2020 පෙබරවාරි 13 දිනැති අංක: අමප/20/0142/221/005 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, 2020 ජනවාරි 14 දිනැති අංක 2020/01 දරන අමාත්‍ය මණ්ඩල සංදේශයේ 3.1 ඡේදයේ සඳහන් පරිදි මාර්ග කි.මී. 100000 ව්‍යාපෘතිය යටතේ මාර්ග තෝරා ගැනීමේ දී ලකුණු ලබා දිය යුතු පිළිවෙලට අනුව, ලකුණු 40 සීමාව ඉක්මවා ලබා ගන්නා මාර්ග පළමු අධියරේදී තෝරා ගැනීමට නිර්දේශ කර තිබුණු නමුත්, බස්නාහිර පළාත් ව්‍යාපෘති කාර්යාලය මඟින් රු.මිලියන 1,826 වැයකර ඉදිකරන ලද මාර්ග තෝරා ගැනීමේ දී එවැනි ලකුණු ලබා	2023	අමාත්‍ය මණ්ඩල සංදේශයේ සඳහන් නිර්ණායකයන් නොසලකා මාර්ග ඉදිකිරීමට අනුමත කළ නිලධාරීන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ II කොටස 48 පරිච්ඡේදයේ 29 වගන්තිය ප්‍රකාරව විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය.	100,000 ව්‍යාපෘතිය ක්‍රියාත්මක වීමේදී ව්‍යාපෘතියේ මාර්ග තෝරා ගැනීමට ලකුණු ලබා දීමේ ක්‍රමවේදය ක්‍රියාත්මක විය. ඒ අනුව ලකුණු ලබා දීමේ ක්‍රමවේදය මගින් ලකුණු 40 ඉක්මවා ඇති මාර්ග සඳහා ප්‍රමුඛතාවය ලබාදෙමින් එම ව්‍යාපෘතීන්ට අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව හරහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදු කර කොන්ත්‍රාත් පිරිනැමීම සිදු කළ අතර ලකුණු 40 ක ප්‍රමාණයට අඩු අත්‍යවශ්‍ය සහ ආර්ථික හා සාමාජීය වශයෙන් වැදගත් මාර්ග සෘජු කම්කරු ශ්‍රමය යටතේ සංවර්ධන කිරීම සිදු කරන ලදී.	මෙම ගැටළුව එලෙසම පවතී.

	දීමේ ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණු අතර ව්‍යාපෘති අරමුණෙන් බැහැරව පාසල් අභ්‍යන්තර මාර්ග සහ එළිමහන් ස්ථාන, උද්‍යාන භූමි, පල්ලි, පන්සල්, නිවාස සංකීර්ණ, පොලිස් ස්ථාන හා යුධ හමුදා කඳවුරු වලට අයත් පොදු ස්ථාන හා එම ආයතනය වලට අයත් අභ්‍යන්තර මාර්ග සංවර්ධන කටයුතු සිදු කර තිබුණි.				
36	2020 වර්ෂයේ සිට 2023 අගෝස්තු 31 දින දක්වා කාලය තුළ අධිකාරිය විසින් ඉදිකිරීම් අරක්ෂණ අරමුදල වෙත රු.මිලියන 32,553.12 ක් නිදහස් කර තිබුණු අතර, එම මුදලින් රු.මිලියන 224.2 ක් 2023 වර්ෂය අවසන් වන විට අදාළ අරමුදල මගින් රඳවාගෙන තිබුණි. තවද, කොන්ත්‍රාත් 212 කට අදාළ රු. මිලියන 1,492.82 ක වටිනාකමින් යුත් භාණ්ඩාගාර බැඳුම්කර සහ රු.මිලියන 29.94 ක් වූ බිල්පත් සඳහා	2023	එලදායී අභ්‍යන්තර පාලනයන් ස්ථාපිත කිරීමටත් අක්‍රමිකතා සම්බන්ධයෙන් විමර්ශණයක් සිදුකිරීමටත් කටයුතු කළ යුතුය.	මූලික විමර්ශණයක් සිදු කරගෙන යන අතර අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව (CID) මඟින්ද විමර්ශණයක් සිදුකර ගෙන යනු ලබයි. එම විමර්ශණ ප්‍රතිපල අනුව ඉදිරි කටයුතු සිදු කිරීමට නියමිත අතර දැනට සිදු වන ගෙවීම් වලදී අභ්‍යන්තර පාලන ක්‍රමවේදය ශක්තිමත් කර ඇත.	විමර්ශණ කටයුතු අවසන්කර නොමැත.

	ගෙවීම් අරමුදලින් බැහැරව සෘජුව කොන්ත්‍රාත්කරුවන් වෙත නිදහස්කර තිබුණු අතර එයින් රු.මිලියන 29.94 ක බිල්පත් ව්‍යාජ ඒවා බව අධිකාරියේ අභ්‍යන්තර විගණන අංශය මගින් අනාවරණය කර තිබුණි.				
37	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ යොමුව 5.3.4 වගන්තිය අනුව, මාර්ග කි.මී. 100,000 ව්‍යාපෘතිය ආරම්භයේ දී සමස්ථ දිවයිනම ආවරණය වන පරිදි ක්‍රියාත්මක කරනු ලැබූ කි.මී 50 හා කි.මි. 100 මාර්ගවල දික්කඩයන් සහ හරස් කඩයන්වල මැණුම් කටයුතු සිදු කිරීම (Longitudinal & Cross Section Survey) සඳහා පුද්ගලික සමාගම වෙත එකතුව රු.මී.79.26 ක් වූ කි.මී. 50 කොන්ත්‍රාත් 10 ක්ද, එකතුව රු.මී. 121.45 ක් වූ කි.මී. 100 කොන්ත්‍රාත් 08ක් පිරිනමා තිබුණි. කෙසේ වෙතත් එම	2023	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලට පටහැනිව කොන්ත්‍රත් ඇගයීම හා පිරිනැමීම සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරීන් හදුනාලෙන විධිමත් පරීක්ෂණයක් සිදුකළ යුතුය.	මිනුම් කටයුතු සඳහා අත්‍යවශ්‍ය වන උපකරණ ලැයිස්තුව හා මිනුම් කටයුතුවලට සම්බන්ධ වන කාර්යය මණ්ඩලයේ සුදුසුකම් පිළිබඳවද පැහැදිලිව දක්වා ඇති අතර ඒවා සපුරා ඇති ආකාරය පිළිබඳව ප්‍රමාණාත්මක හා ගුණාත්මකභාවය ඇගයීමට ලක් කිරිමෙන් පසු තාක්ෂණික කමිටු වාර්තාව සකස් කර ඇත.	විගණන නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත

කොන්ත්‍රාත් පිරිනැමීමේදී අදාළ කොන්ත්‍රාත් ආයතනය සතුව ඊට අවශ්‍ය උපකරණ පවතීද යන්න පිළිබඳ ඇගයීමක් තාක්ෂණික ඇගයීම් කමිටු විසින් සිදුකර නොතිබුණු බව නිරීක්ෂණය විය. තවද, අදාල කොන්ත්‍රාත්කරු වෙත පිරිනමා තිබුණු කොන්ත්‍රාත් ප්‍රමාණය සමස්ථ මැනුම් කි.මී. ප්‍රමාණය වු 2975 න් සියයට 44 ක් වී තිබුණි.

3.73 උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	ලාභය/අතිරික්තය/(අලාභය)/(ඌණතාවය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	6,005,267,727	51,236,367	5,954,031,360	6,720,314	තත්ත්වාගණනය කළ
2022	5,898,872,012	53,224,345	5,845,647,667	(1,480,749)	තත්ත්වාගණනය කළ
2023	5,781,642,350	37,476,448	5,744,165,902	(114,231,765)	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක වර්තමාන තත්ත්වය
1	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි 79 වන ඡේදය ප්‍රකාරව ජංගම වත්කම්වලට ඒවා වාර්තා කරන දිනයෙන් මාස දොළහක් තුළ උපලබ්ධි වෙතැයි අපේක්ෂා නොකළත් සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුළ උපලබ්ධි කිරීම සඳහා තබා ඇති වත්කම් අයත්වන නමුත්, රු.1,350,000 ක් වූ අයකර ගැනීමට නොහැකි වූ වසර 02 කට වඩා පැරණි කුලී තැන්පතු මුදල ජංගම නොවන වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබුණි.	2023 2022	යොමුගත ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව කටයුතු කළ යුතු ය.	බාහිර පාර්ශවයකින් කුලී පදනම මත ලබාගත් ගොඩනැගිල්ල සඳහා ආරක්ෂක තැන්පතු මුදල අයකර ගැනීම සඳහා නීතිමය පියවර ගෙන ඇති බැවින්, වසරක් ඇතුළත මෙම මුදල අයකර ගැනීමට අපහසු බැවින් මූල්‍ය ප්‍රකාශනවල ජංගම නොවන වත්කම් ලෙස පෙන්වා ඇති බව දන්වා තිබුණි.	අයකර ගැනීමට නියමිත කුලී තැන්පතු 2024 වර්ෂයේදී ජංගම වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශවල ගළපා ඇති බව දන්වා සිටිමි.
2	සිවිල් අභියාචනා අධිකරණ ගොඩනැගිල්ලේ	2023	මූල්‍ය ප්‍රකාශන තුළ ගිණුම්ගත කිරීම හා හෙළිදරව් කිරීම	මෙම කාර්යයන් දෙක අධිකරණ අමාත්‍යාංශයේ	සිවිල් අභියාචනා අධිකරණ ගොඩනැගිල්ලේ

	ව්‍යුහාත්මක ගැටලු අලුත්වැඩියා කිරීම සහ විනිසුරු නිල නිවාස ගොඩනැගිල්ලේ බිම් මහලේ පිහිටි ගරාජයේ කොන්ක්‍රීට් ස්ලැබ් එක අලුත්වැඩියා කිරීම සම්බන්ධයෙන් අධිකරණ අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂයේ ඍජුව ගෙවා ඇති මුදල පිළිවෙලින් රු.1,492,884ක් සහ රු.3,431,070ක් වූ අතර, එය ගිණුම්ගත කිරීමට සහ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට කටයුතුකර නොතිබුණි.		නිවැරදිව සිදුකළ යුතු ය.	2023 ජුනි 02 දිනැති අංක MOJ/AC/11/08/23 දරන ලිපිය සහ අවශ්‍ය ප්‍රතිපාදනයන් අමාත්‍යාංශය වෙතින් ගෙවන බවට වාචිකව දැනුම්දීම මත සිදු කරන ලද අතර, සිවිල් අභියාචනා මහාධිකරණයේ බිල්පත් ගෙවීම සඳහා රු.1,492,884ක් වවුචර් අංක P231284 මඟින් ද, විනිසුරු නිල නිවාස ගොඩනැඟිල්ලේ බිම්මහලේ පිහිටි ගරාජයේ කොන්ක්‍රීට් සැලැබ් එක අලුත්වැඩියා කිරීමේ බිල්පත් ගෙවීම සඳහා රු.3,431,070ක් වවුචර අංක P231285 මගින් ද අධිකරණ අමාත්‍යාංශය විසින් ගෙවීම් සිදු කරන ලදී. තව ද, මේ පිළිබඳව 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කරන බව දන්වා තිබුණි.	ව්‍යුහාත්මක ගැටළු අළුත්වැඩියා කිරීම ඉතාමත් ඉක්මනින් කිරීමට අවශ්‍ය වූයේ එහි පැවති අවධානම තුළින් මානව හා භෞතික සම්පත්වලට විය හැකි හානි වැළැක්වීම සඳහා ය. මේ පිළිබඳ හෙළිදරව් කිරීම් 2024 සිදු කර ඇති බව දන්වා සිටිමි.
3	2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන චක්‍රලේඛයේ 01 ඡේදය ප්‍රකාරව	2023	යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු ය.	කාර්යසාධන ගිවිසුම් සේවා නියුක්තීන්ට ලබාදී අත්සන් කර	2024 වර්ෂයේ අගෝස්තු මස සිට දෙසැම්බර් මස දක්වා අදාළ

	සමස්ත කාර්ය මණ්ඩලය සඳහා ම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කිරීම 2018 වර්ෂයේ සිට සිදුකළ යුතු නමුත්, මණ්ඩලය විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි.			ගැනීමක් සිදුකර නොමැති බැවින්, 2024 වර්ෂයේ සිට එය සකස් කරන බව දන්වා තිබුණි.	කාර්යය සාධන ගිවිසුම් අත්සන් කිරීමට ආයතනයේ අංශ වෙත යොමුකර තිබේ. 2025 වර්ෂයේ කාර්යසාධන ගිවිසුම් වසර මුල අත්සන් කිරීමට නියමිත වේ.
4	2008 පෙබරවාරි 06 දිනැති සහ 2018 ජනවාරි 24 දිනැති අංක 05/2008 සහ 05/2008 (i) දරන චක්රලේඛ ප්‍රකාරව රාජ්‍ය අංශයේ ක්‍රියාකාරකම් වඩාත් කාර්යක්ෂම කිරීමට සහ ඒ සඳහා සම්බන්ධවන්නා වූ පාර්ශවයන් අතර මනාඅවබෝධයක් සහ එකිනෙකා අතර විශ්වාසය වැඩි දියුණු කිරීමට පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය හඳුන්වාදීම සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම සිදුකළ යුතුව තිබුණ ද, මණ්ඩලය විසින් පුරවැසි/ සේවාලාභි ප්‍රඥප්තිය හඳුන්වාදීම සිදුකර නොතිබුණි.	2023	යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු ය.	පුරවැසි ප්‍රඥප්තියක් සකස්කර එය ලේඛනගත කර නොමැති බවත්, 2024 වර්ෂයේ සිට එය සකස් කරන බව දන්වා තිබුණි.	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 05/2008 සහ 05/2008 (i) පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය ප්‍රකාරව විශ්වාසනීයත්වය, ආචාරශීලී බව, සැලකිල්ල හා සේවා සැපයීමට අදාළ සූදානම ආදී කරුණු සැලකිල්ලට ගනිමින් මේ වන විට අප ආයතනය සඳහා පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සකස් කරමින් පවතී.
5	2004, 2006, 2008 වර්ෂ සහ 2010 වර්ෂයේ ආරම්භය දක්වා මිලදී ගෙන තිබූ එකතුව රු.58,833,546ක	2023 2021	ස්ථාවර වත්කම් ශේෂ තහවුරුකර ගැනීමට අදාළ සාක්ෂි/ උපලේඛන විගණනයට ඉදිරිපත් කළ යුතු	වත්කම් 08හි ආරම්භක ශේෂයන් පවතින නමුත්, එම ශේෂ තහවුරුකර ගැනීමට 2010 පෙර වත්කම්වල	ස්ථාවර වත්කම් ලේඛනයෙහි විගණන විමසුමේ දක්වා ඇති වත්කම් 08හි ආරම්භක ශේෂයන් පවතින

	ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් ඒවායේ පැවැත්ම තහවුරු කිරීමට අවශ්‍ය උපලේඛන හෝ ලේඛනගත සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.		ය.	උපලේඛන හා ඉන්වොයිස්පත් විනාශ වී ඇති බව දන්වා තිබුණි.	නමුත්, එම ශේෂ තහවුරු කර ගැනීමට අප සතුව 2010ට පෙර වත්කම්වල උපලේඛන හා ඉන්වොයිස්පත් විනාශ වී ඇති බව දන්වා සිටිමි. මේ පිළිබඳව තවදුරටත් සොයා බැලීමට කමිටුවක් පත් කළ අතර, එහි කමිටු වාර්තාවේ ද 2010ට පෙර වත්කම්වල උපලේඛන හා ඉන්වොයිස්පත් විනාශ වී ඇති බව සඳහන්කර ඇත. එසේ ම එම සියලුම ස්ථාවර වත්කම්වල ඵලදායී ජීවිත කාලය අවසන් වී ඇති අතර, සම්පූර්ණ ක්ෂයවීම් ද සිදුකර අවසන් වී ඇති බව වැඩිදුරටත් දන්වමි.
6	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 ඡේදය අනුව අවම වශයෙන් වසර 03ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ඇතුළත් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතු නමුත්, මණ්ඩලය විසින් එවැනි සැලැස්මක්	2023	යොමුගත ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතු ය.	ඉදිරි වසර 03 සඳහා දීර්ඝකාලීන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව ඉදිරි වසර තුනක් සඳහා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් 2025 වර්ෂයේ සිට සකස් කරමින් පවතී.

	පිළියෙලකර නොතිබුණි.				
7	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2.2 ඡේදය ප්‍රකාරව ජාතික තරගකාරී ලංසු කැඳවීමේදී අවම දින 21ක් ලංසු ඉදිරිපත් කිරීම සඳහා ලබාදිය යුතු නමුත්, පවිත්‍රතා සේවා සැපයීම සඳහා වූ ප්‍රසම්පාදනය සඳහා දින 18ක් පමණක් ලබාදී තිබූ අතර, ලංසු ඉදිරිපත්කර තිබුණේ ද එක් අයෙකු පමණක් විය.	2023	යොමුගත ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතු ය.	ඉදිරි ප්‍රසම්පාදන කටයුතුවලදී මෙවැනි අඩුපාඩු සැලකිල්ලට ගෙන, අදාළ කාර්යයන් එලෙස ඉටු කරන බව දන්වා තිබුණි.	ප්‍රසම්පාදන කටයුතුවලදී මෙවැනි අඩුපාඩු සැලකිල්ලට ගෙන, අදාළ කාර්යයන් ඉටු කරන බව දන්වා සිටිමි.
8	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.3.1(ඇ) ප්‍රසම්පාදන අත්පොතෙහි 2.8.4 සහ 7.11.1 ඡේද ප්‍රකාරව ලංසු ඇගයීම සඳහා උපදේශකයන්ගේ සේවය ලබාගැනීමේදී තාක්ෂණික ඇගැයීම් කමිටුව විසින් තම කමිටුවේ විධිමත් වාර්තාවක් සමඟ උපදේශකයන්ගේ වාර්තාව ප්‍රසම්පාදන කමිටුව වෙත ඉදිරිපත් කළ යුතු නමුත්, නිලධාරින් සඳහා රු.955,900ක නිලඇඳුම් මිලදී ගැනීම සඳහා වූ	2023	යොමුගත ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතු ය.	තේරීම් කමිටු වාර්තා පදනම්කර ගෙන ප්‍රසම්පාදන කටයුතු කරගෙන ගිය අතර, අදාළ තාක්ෂණික කමිටුවේ ඇගයීම් මත එම නිර්දේශයන් අනුව ඉදිරි කටයුතු කරන බව ද, ප්‍රතික්ෂේප කරන ලංසුවලට ප්‍රමාණවත් හේතූන් සහිතව ඉදිරියේදී කටයුතු කරන බව ද, පේෂකර්ම දෙපාර්තමේන්තුවේ පේෂකර්ම තාක්ෂණ විද්‍යාඥ I නිලධාරියෙකු නිලඇඳුම් සම්බන්ධ තාක්ෂණික ඇගයීම්	ප්‍රසම්පාදන අත්පොතෙහි 2.8.4 ප්‍රකාරව විෂයය පිළිබඳ දැනුමැති පාර්ශවයක් තාක්ෂණික ඇගයීම් කමිටුවේ සාමාජිකත්වය දැරිය යුතු ය යන නිර්දේශය මත මෙම වසරේදී පේෂකර්ම දෙපාර්තමේන්තුවේ පේෂකර්ම තාක්ෂණ විද්‍යාඥ I එම්.ජේ.එන්. මුතුනායක මහතා නිලඇඳුම් සම්බන්ධ තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයෙකු වශයෙන් පත්

	ප්‍රසම්පාදනයේදී, විෂයය පිළිබඳ දැනුම ඇති අයෙකු නොමැති වූ තාක්ෂණික ඇගයීම් කමිටුවක නිර්දේශයක් ලබාදී තිබුණි. තව ද, ප්‍රසම්පාදන අත්පොතෙහි 7.11.1 ඡේදය ප්‍රකාරව ප්‍රතික්ෂේප කරන ලද ලංසු සහ ඊට හේතූන් ද දක්වා ලංසු ඇගයීම් වාර්තාවක්, තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් පිළියෙල කළ යුතු වුව ද, එම වාර්තාවේ මේ සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත්කර නොතිබුණි.			කමිටු සාමාජිකයෙකු වශයෙන් පත් කරගෙන ඇති බව දන්වා තිබුණි.	කරගෙන ඇති බව දන්වා සිටිමි.
9	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.12.2 (අ) ඡේදය ප්‍රකාරව එක් ලංසුවක් පමණක් ලැබුණ ද, වෙළඳපොළ වටිනාකම් අනුව සැසඳීමක් සිදුකර මිල ගණන් සාධාරණ බව තීරණය කළ හැකි නමුත්, විනිසුරුවරුන්ගේ භෝජනාගාරය සඳහා මිල ගණන් කැඳවීමට අදාළව 2023 අප්‍රේල් 17 දින සැපයුම්කරුවන් 08ක් වෙත මිල ගණන් කැඳවීමට ආරාධනා කර ඇති අතර, එක්	2023	යොමුගත ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතු ය.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව ඉදිරි ප්‍රසම්පාදන කටයුතු කර ගෙන යන බව දන්වා තිබුණි.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.12.2(අ) ප්‍රකාරව ප්‍රසම්පාදන කටයුතු කර ගෙන යන බව දන්වා සිටිමි.

	සැපයුම්කරුවෙකු පමණක් ඊට ප්‍රතිචාර දක්වා තිබුණු බැවින්, මෙම ප්‍රසම්පාදනයට අදාළව වෙළඳපොල මිල ගණන් සැසඳීමක් සිදුකර නොතිබුණි.				
10	කොන්ත්‍රාත් වටිනාකම රු.444,000ක් වූ විනිසුරුවරුන්ගේ නිලනිවාස අලුත්වැඩියා කිරීමේදී 2023 මාර්තු 14 සහ 2023 ජුනි 20 දින තාක්ෂණික ඇගයීම් කමිටුවේ සහ ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතීන් ලබාදී තිබියදී අදාළ කාර්යයන් ආරම්භ කිරීමකින් තොරව, 2023 ඔක්තෝබර් 03 දින පැවති කළමනාකරණ මණ්ඩල රැස්වීම් තීරණය මත අදාළ මිල ගණන්පත්‍ර වලංගු කාලය සහ ලංසු සුරක්ෂණයේ වලංගු කාලය අවසන්වීම යන සාධක මත මෙම කොන්ත්‍රාත්තුව අවලංගු වී තිබුණි.	2023	ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමත ප්‍රසම්පාදනයන් කාලප්‍රමාදයකින් තොරව ආරම්භකර අවසන් කළ යුතු ය.	අදාළ විනිසුරු නිලනිවාසවල ස්ථාන මාරුවීම් කටයුතු සම්බන්ධ අධිකරණ අමාත්‍යාංශ තීරණය ලබාගත් පසුව 2023 ඔක්තෝබර් 03 දින කළමනාකරණ මණ්ඩල රැස්වීමට ද, අදාළ මිල ගණන් පත්‍රවල සහ ලංසු සුරක්ෂණයේ වලංගු කාලය අවසන්වීම හේතුවෙන්, ඉදිරිපත් කිරීමට නොහැකි වීම නිසා කොන්ත්‍රාත්තුව පිරිනැමීමට නොහැකි වූ බැවින් මෙම ප්‍රසම්පාදනය අවලංගු වී ඇති බව දන්වා තිබුණි.	ප්‍රසම්පාදනයන් සිදු කිරීමේදී කාලපමාවකින් තොරව ආරම්භ කර අවසන් කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි.
11	2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ (පොදු ව්‍යාපාර පිළිබඳ මාර්ගෝපදේශ	2023	යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව පාලන මණ්ඩලය විසින් අනුමත සැලැස්මක් ඉදිරිපත් කිරීමට	චක්‍රලේඛය ප්‍රකාරව උපරිමාධිකරණ සංකීර්ණයේ උපායමාර්ගික සැලැස්ම මේ සමඟ ඉදිරිපත් කරන බව	උපායමාර්ගික සැලැස්මක් 2023 වර්ෂයට සකස්කර ඔබ වෙත ඉදිරිපත් කරන ලදී. එහෙත් රාජ්‍ය ව්‍යාපාර

	සංග්‍රහය) ඡේද අංක 2.3 හි උපලේඛන I ප්‍රකාරව උපායමාර්ගික සැලැස්මක් මණ්ඩලය විසින් පිළියෙලකර නොතිබුණි.		කටයුතු කළ යුතු ය.	දන්වා තිබුණි.	චක්‍රලේඛ 01/2021 ට අනුව විධිමත්ව මේ වන විට සකස් කරන බව දන්වා සිටිමි.
12	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(1) ඡේදය ප්‍රකාරව මණ්ඩලයේ අභ්‍යන්තර විගණන කටයුතු කිරීම සඳහා එම මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් පත්කරනු ලබන තමාගේම අභ්‍යන්තර විගණකවරයෙකු සිටිය යුතු නමුත්, 2023 ජුනි 01 සිට මණ්ඩලයේ කාර්ය මණ්ඩලය තුළ අභ්‍යන්තර විගණකවරයෙකු ඇතුළත්ව නොතිබුණි. තව ද මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව මණ්ඩලයේ මුදල් කටයුතුවලට අදාළ අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත යොමුකළ යුතු නමුත්, සමාලෝචිත වර්ෂයට අදාළ අභ්‍යන්තර විගණන වාර්තා, වාර්තාවේ දිනය වන විටත් ඉදිරිපත් කර නොතිබුණි.	2023	යොමුගත පනත ප්‍රකාරව අභ්‍යන්තර විගණකවරයෙකු පත් කළ යුතු ය.	බඳවාගත් අභ්‍යන්තර විගණක 2023 ජුනි 01 දින සිට මණ්ඩලයෙන් ඉවත්වීම නිසා අභ්‍යන්තර විගණන වාර්තා ඉදිරිපත් කිරීමට නොහැකි වූ බව දන්වා තිබුණි.	අප ආයතනයට මුල් වතාවට 2022 අප්‍රේල් 01 දින සිට අභ්‍යන්තර විගණන නිලධාරිනියෙකු බඳවාගෙන එතැන් පටන් 2023 ජුනි 30 දක්වා අභ්‍යන්තර විගණන අංශයක් ක්‍රියාත්මක කරන ලදී. එම විගණන නිලධාරිනිය විසින් 2023 අප්‍රේල් දක්වා අදාළ අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිතුමා වෙත යොමු කරන ලදී. නමුත් 2023 ජුලි 01 දින සිට අභ්‍යන්තර විගණන නිලධාරිනිය වෙනත් රැකියාවක් ලැබීම මත සේවයෙන් ඉල්ලා අස්වන ලදී. ඉන්පසු නව අභ්‍යන්තර විගණන නිලධාරිනියක් 2024 ජුනි 14 දින

බඳවාගන්නා ලද අතර, පෞද්ගලික හේතුවක් මත 2024 ජුලි 22 දින සේවයෙන් ඉල්ලා අස්වන ලදී. ඉන්පසු නැවත අභ්‍යන්තර විගණන නිලධාරිනියක් 2024 අගෝස්තු 13 දින රාජකාරී කටයුතු භාරගත් අතර, එම නිලධාරිනිය විසින් උපරිමාධිකරණ සංකීර්ණ කළමණාකරණ මණ්ඩලයේ අරමුණු ඉටුකිරීමෙහිලා දායක වන ප්‍රධානතම දෙපාර්තමේන්තුව වන ඉංජිනේරු අංශයේ කාර්යභාරය, එහි සේවා නියුක්තිකයන්ගේ කාර්යභාරය, කාර්යසාධනය සහ අධීක්ෂණය පිළිබඳව විගණනයක් මේ වන විටත් ආරම්භකර ඇති අතර, මේ වන විට අදාළ විගණන නිරික්ෂණ සඳහා විසඳුම සකාච්ඡා කරමින් පවතී.

13	2018 අප්‍රේල් 27 දිනැති අංක එම්එස්ඩීඩබ්/08/65 දරන තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද ලිපිය ප්‍රකාරව මණ්ඩලය විසින් තිරසර සංවර්ධන අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධීකරණය කිරීමට නිලධාරීන් පත්කොට තිරසර සංවර්ධන වැඩසටහනක් පිළියෙලකර නොතිබුණි.	2023	යොමුගත ලිපිය ප්‍රකාරව කටයුතු කළ යුතු ය.	තිරසර සංවර්ධන අරමුණු ලේඛනගත කර ඒ සඳහා වෙනම වැඩසටහන් සකස්කර නොමැති බව ද, එම පනත අනුව 2024 වසරේ සිට එය ලේඛනගත කර ක්‍රියාත්මක කිරීමටත් සම්බන්ධීකරණ කිරීමට නිලධාරියෙකු පත් කරන බව දන්වා තිබුණි.	2018 අප්‍රේල් 27 දිනැති අංක එම්එස්ඩීඩබ්/08/65 දරන තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද ලිපිය ප්‍රකාරව අප ආයතය විසින් තිරසර සංවර්ධන අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධීකරණය කිරීමට නිලධාරින් පත්කොට තිරසර සංවර්ධන වැඩසටහනක් පිළියෙල කිරීමට හා එය ක්‍රියාත්මක කර තිරසර සංවර්ධන අරමුණු ඉටුකර ගැනීමට 2024 වර්ෂයේ කටයුතු කරන බව දන්වමි.

3.74 ජාතික නිවාස සංවර්ධන අධිකාරිය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	31,782,594,154	6,174,355,400	25,608,238,753	(841,637,238)	තත්ත්වාගණනය කළ
2022	30,201,695,466	5,612,557,082	24,589,138,384	(1,287,411,562)	තත්ත්වාගණනය කළ
2023	29,875,855,426	5,183,852,853	24,692,002,572	(1,007,031,976)	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	අධිකාරියේ ගිණුම්කරණ ප්‍රතිපත්ති සටහන් අංක 13 අනුව මුදල් ගෙවීමකින් තොරව නිවාස ඉදිකිරීමේ අරමුණින් රජයේ ඉඩම් අත්පත් කර ගැනීමේ දී ඉඩමේ වෙළඳපොල වටිනාකමට ඇස්තමේන්තු කර ඊට මූලික වියදම් ගැලපීමෙන් පසු සංචිත ගිණුමකට මාරු කළයුතු වුවත් සංචිත ලෙස හඳුනාගෙන ගිණුම්ගත කළයුතු 2013 න් පසු පවරාගෙන තිබූ අක්කර 781 රූඩ් 2 පර්චස් 20.7 ක් ගිණුම්ගත කර නොතිබුණි.	2021 2022, 2023	ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අනුකූලව කටයුතු කළ යුතු බව.	තක්සේරු කිරීමට අධික වියදමක් යන බැවින් කොටසින් කොටස තක්සේරු කර 2024 ගිණුම් වලදී සාධාරණ අගයයට පෙන්නුම් කරනු ලැබේ.	2024 මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කරන බව ප්‍රකාශ කර ඇත.
2	අධිකාරියෙහි දිස්ත්‍රික් කාර්යාල වල ණය එකතුකිරීම් පිළිබඳ පරික්ෂාවේදී දිස්ත්‍රික්	2021 2022, 2023	පැරණි ණය ශේෂ සම්බන්ධයෙන් විශ්ලේශණයක් සිදුකර අයකර	ණය අයකරගැනීම් වර්ධනය කර ගැනීම සඳහා විවිධ ක්‍රම අනුගමනය	මේ වන විටත් හිඟ හිටි ශේෂ අයකරගෙන නොතිබුණි.

	කාර්යාල 04 ක 1984-2014 කාලය තුල ලබාදී තිබූ ණය වලින් රු. මිලියන 179.6 ද දිස්ත්‍රික් කාර්යාල 03 ක 2018-2023 දක්වා ලබාදී තිබූ ණය වලින් රු. මිලියන 2,164.66 ක්ද 2023 දෙසැම්බර් 31 දින වන විට හිඟ හිටිව පැවතුණි. අයකර ගැනීමේ ශක්‍යතාව සොයා බැලීමකින් තොරව ණය ලබාදීම නිසාත් විධිමත් අයකරගැනීමේ පටිපාටියක් අනුගමනය නොකිරීමත් නිසා මෙම ණය අයකර ගැනීමට නොහැකි වී ඇති බව නිරීක්ෂණය විය.		ගැනීමට හැකි ක්‍රමයන් හඳුන්වා දිය යුතුය.	කර ඇත.	
3	**2012 ජනවාරි 01 දිනැති අධිකාරියේ අභ්‍යන්තර දේපළ කළමනාකරණ චක්‍රලේඛ අංක 2011/දෙ.ක/01** අනුව ප්‍රතිලාභින්ට ඉඩම් බැහැර කිරීමේදී අදාල පටිපාටිවලට පටහැනිව අවස්ථා 35 කදී ඉඩම් බැහැර කර තිබීම නිරීක්ෂණය විය. ඒ අතර වත්තල ගොංගිතොට, රුක්මල්ගම, විත්‍රා පටුමග, දෙමටගොඩ මහවිලවත්ත යන ඉඩම් ද ඇතුලත් විය. එවැනි බැහැර නොකළ ඉඩම් හා නිවාස සඳහා ද අධ්‍යක්ෂ මණ්ඩල	2021, 2022, 2023	දේපල කළමනාකරණ චක්‍රලේඛයට අනුගත විය යුතුය.	අධිකාරියේ පනතේ 75/1 අනුව ඇමතිවරයාට ඇති බලතල අනුව ඔහුගේ අනුමැතිය සහ අධ්‍යක්ෂ මණ්ඩල නිර්දේශ මත ඉඩම බැහර කර ඇත.	චක්‍රලේඛයට පරි භාහිරව ඉඩම් බැහැර කෙරේ.

	අනුමැතිය ලබාදී තිබූ අතර ඉන් අවස්ථා 17 ක් සඳහා තක්සේරු වටිනාකම් හා ඉඩමේ ප්‍රමාණය සඳහන් කර නොතිබුණි.				
4	කොළඹ මාලිගාවත්ත දිස්ත්‍රික් කාර්යාලයේ A,B,C යන රථගාල් හා ප්‍රදීපා මාවතේ පිහිටි රථගාල් සඳහා මාස 32 ක කාලයක් කිසිදු බදු කුලියක් ගෙවා නොතිබූ තැනැත්තෙකු වෙත නැවතත් 2022 ඔක්තෝබර් සිට 2023 අගෝස්තු දක්වා කුලියට ලබාදී තිබුණි. මේ කාලයට අදාලව ලැබිය යුතු රු. මිලියන 2.175 ක් ද අයකර ගෙන නොතිබුණි. මෙම රථගාල සඳහා ආරක්ෂක තැන්පතු ලෙස රු. මිලියන 1.575 ක් අයකර ගැනීමට තීරණය කර තිබුණද බදුකරු විසින් එයද ගෙවා නොතිබුණි. 2023 සැප්තැම්බර් 09 දින සියළුම රථගාල් මුද්‍රා තැබීමට තීරණය කළද ප්‍රදීපා මාවතේ රථගාල 2024 ජනවාරි 26 වන විටත් අනවසරෙන් භාවිතා කර තිබුණි. මේ අනුව අධිකාරිය මෙම ඉඩම නිසි පරිදි බදු දීමේ පදනමින් බැහැර කිරීමට කටයුතු කර ආදායම් උපයාගෙන	2022, 2023	අධිකාරිය සතු වත්කම් ආදායම් උත්පාදනය වන පරිදි ඵලදායීව භාවිතා යුතුය.	හිග මුදල් නොගෙවීම මත සියළුම රථගාල් මුද්‍රා තබා ඇත. නැවත මිලගණන් කැඳවුවද පළමු මිල ඉදිරිපත් වී නැත. දෙවන මිල තෝරා ගැනීමට තීරණය කර ඇත.	මේ වන විටත් රථගාල් බදු දී නොතිබුණි.

	නොතිබුණි				
5	අධිකාරියේ මාලිගාවත්ත දිස්ත්‍රික් කාර්යාලය යටතේ පවත්වාගෙන යනු ලබන ප්‍රදීපා උත්සවශාලා 03 ක් බදු පදනමින් බැහැර කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර තිබූ නමුත් 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය නොකර බදු දීමට කටයුතු කර තිබුණි. තවද මෝදර ප්‍රදීපා උත්සව ශාලවේ මුල් බදු ගිවිසුම අවලංගු කර නැවත වෙනත් පාර්ශවයක් වෙත බදු දී තිබුණ ද ඊට අදාල ලිපිගොනුව විගනනයට ඉදිරිපත් කරන ලෙස අවස්ථා කිහිපයකදී ඉල්ලුම් කළද එම ලිපිගොනුව ඉදිරිපත් කිරීමට කටයුතු නොකරන ලදි.	2022, 2023	අධිකාරිය සතු වත්කම් ආදායම් උත්පාදනය වන පරිදි ඵලදායීව භාවිතා යුතුය.	මෝදර ප්‍රදීපා ශාලාව අළුත්වැඩියාවට රු. මි. 8.6 ක ඇස්තමේන්තුවක් සකස් කර ඇත. එම නිසා කළමනාකාරිත්වය බදු පදනමින් ලබා දීමට තීරණය කර ඇත.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය නොකර මාසික කුලිය රු. 250,000 බැගින් බදු දී ඇත. ලිපිගොනු විගණනයට ඉදිරිපත් කර නොමැත.
6	අධිකාරියේ දේපළ කළමනාකරණ කොට්ඨාශය විසින් අධිකාරිය සතුව පවතින ඉඩම් පිළිබඳ ඉදිරිපත් කර තිබූ ඉඩම් සංඛ්‍යාවට අනුව 2019 සිට 2022 දක්වා කාලය තුලදී යාබද ඉඩම් කැබලි 300 ක්ද අනවසර ඉඩම් කැබලි 1503 ක්ද හිස් ඉඩම් කැබලි 2618 ක්ද අඩුවී තිබුණි. තවද 2023	2022 2023	අධිකාරිය සතු හිස්/ යාබද/ අනවසර ඉඩම් අධිකාරියේ අරමුණු ඉටුවන පරිදි භාවිතා කිරීමට කටයුතු කළයුතු බව.	ඉඩම් කොටස් 149 ක හෙක්ටයාර 5.81 ක තක්සේරු කර වාර්තාව එවා ඇත. ඉන් කොටසක් අලවි කර ඇත. ඉතිරි කොටස් විකිණීමට ද අනික් ඉඩම් තක්සේරු කර අලවි කිරීමට කටයුතු කෙරේ.	ඉඩම් අඩුවීම් වලට අදාල විස්තරාත්මක තොරතුරු ඉදිරිපත් කර නැත.

	සැප්තැම්බර් වන විට තවත් හිස් ඉඩම් කැබලි 61 ක්ද අඩුවී තිබුණි. එසේ අඩුවීමට හේතු වූ කරුණු පිළිබඳ විස්තරාත්මක තොරතුරු විගණනට ඉදිරිපත් කිරීමට අධිකාරියට නොහැකි වූ අතර මෙය විගණනයේදී මතභේදාත්මක විය.				
7	අධිකාරිය සතු කොළඹ 10 ඩාර්ලි පාරේ පිහිටි අක්කර 01 යි පර්චස් 26.5 ක ඉඩමේ නිවාස සහ වෙළඳ සංකීර්ණයක් සහිත මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතියක් ඉදිකිරීම සඳහා ප්‍රසිද්ධ මිල කැඳවීමකින් තොරව 2005 නොවැම්බර් 09 දිනැති කැබිනට් අනුමැතිය මත විදේශීය සමාගමකට ලබාදී තිබුණි. එම සමාගම සමග 2006 ජූනි 23 දින එළඹි ගිවිසුම ප්‍රකාරව ඉඩමේ වටිනාකම රජයේ ප්‍රධාන තක්සේරුකරුගේ රු. මිලියන 650 ක තක්සේරුව මත අයකිරීමටත්, වසර 06 ක් තුළ ව්‍යාපෘතිය අවසන් කිරීමෙන් පසු රු. මිලියන 162 ක ලාභාංශයක් අධිකාරියට ලබාදීමටත් එකගවී තිබුණි. නමුත් සමාගම යෝජිත	2021 2022 2023	ව්‍යාපෘති සඳහා ආයතන තෝරා ගැනීමේ දී හා ඉඩම් බැහැර කිරීමේ දී නිසි ක්‍රමවේදය අනුගමනය කල යුතු අතර අධිකාරියට අවාසිදායක නොවන කොන්දේසි ඇතුලත් කර ගිවිසුම් වලට එළඹිය යුතු අතර මනා අධීක්ෂනයක් සිදු කල යුතු අතර ඉහත කරුණු සම්බන්ධව නිසි අවධානයක් යොමු නොකළ නිලධාරීන්ට එරෙහිව විධිමත් පරීක්ෂණයක් සිදු කළ යුතුය.	ඩාර්ලි පාර අක්කර 01 යි පර්චස් 26.5 ක ඉඩම මිශ්‍ර සංවර්ධන නිවාස ව්‍යාපෘතියක් ඉදිකිරීම සඳහා BAY SAT MBH (Pvt) LTD නැමැති ජර්මනු සමාගම සමඟ ඒකාබද්ධ සහයෝගීතා ගිවිසුමකට 2006 ජූනි 23 එළඹී අතර කැබලි අංක 4,5 කොටස් 975 දරණ විකුණුම්කර ඔප්පුවකින් සමාගමට බැහැර කර ඇත. 2006 වර්ෂයේදී එකී සමාගමේ ස්වකීය නාමය L & T Infrastructure Development ලෙස වෙනස් කර ඇති අතර 2007 අගෝසතු 10 කැබලි අංක 1,2,3 කොටස් 983 දරණ විකුණුම්කර	නඩු කටයුතු තවදුරටත් පවතී.

සංවර්ධන කාර්යයන් ඉටු නොකර 2006 වර්ෂයේදීම ඉන් ඉවත්වී තිබූ අතර එම කාර්යය වෙනත් විදේශීය සමාගමකට පැවරීමකට නම් කර තිබුණි. මුදල් ගෙවීමට පෙර අංක 983 දරන ඔප්පුව මඟින් 2016 මැයි 05 දින මෙම ඉඩමේ අයිතිය එම නව සමාගමට අධිකාරිය විසින් පවරා දී තිබූ අතර ගිවිසුම් ප්‍රකාරව රු. මිලියන 712 විදේශීය මුදලින් අධිකාරියට ගෙවිය යුතු විය. එහෙත් එයට පටහැනිව එම සමාගම ඉඩමේ කැබලි අංක 2,3,4 යන බිම් කොටස් 3 සම්පත් බැංකුවට උගස්කර ලබාගත් රු. මිලියන 800 ක මුදලින් 2016 මැයි 05 දිනැති සම්පත් බැංකු චෙක්පත් දෙකක් මගින් දේශීය මුදලින් අධිකාරියට ගෙවීම් කර තිබුණි. එමෙන්ම විගණිත දිනය දක්වාම මෙම සමාගම විසින් යෝජිත සංවර්ධන කාර්යයන් ඉටුකර නොතිබුණි.මේ අතර සමාගම විසින් වෙනත් තෙවැනි සමාගමක් වෙත 2017 වර්ෂයේදී මෙම ඉඩමේ කැබලි අංක 05 කොටස ඔප්පුවක් මඟින් විකුණා තිබූ අතර එම සමාගම විසින් එම ඔප්පුව

ඔප්පුවකින් සමාගමට පවරා 2016 මැයි 05 අතිරේක ගිවිසුමකට එළඹී තිබූ අතර වසර 07 ඉක්මවා ගොස් ඇතත් සංවර්ධන කටයුතු ආරම්භ නොකළ බැවින් 975, 983 විකුණුම්කර ඔප්පු අධිකාරීය අවලංගු කරන ලදී. මෙම ඉඩමේ 1 සිට 5 දක්වා කොටස් සහ තවත් ඉඩමක කොටස් ඒකාබද්ධ කර ඇති අංශ 3011 සැලැස්මේ අංක 01 වන (819) දරණ ඉඩම 2007 ඔක්තෝබර් 31 ඩාර්ලි රෝඩ් ප්‍රයිවට් ලිමිටඩ් සහ OAK Street සමාගම විසින් රු. මිලියන 950 කට මහජන බැංකුවේ උකස් කර ඇත. මේ සම්බන්ධයෙන් OAK Street සමාගම ශ්‍රේෂ්ඨාධිකරණයේ මූලික අයිතිවාසිකම් නඩුවක්ද කොළඹ දිසා අධිකරණයේ නඩුවක් ද පවරා ඇති අතර එම නඩු තීන්දුවට එරෙහිව තවත් නඩුවක් සිවිල්

	මහජන බැංකුවේ උකස්කර රු.මිලියන 950 ක ණය මුදලක් ලබාගෙන තිබුණි. අධිකාරිය විසින් එම විකුණුම්කර ඔප්පුව අවලංගු කර තිබූ අතර එම තෙවැනි සමාගම අධිකාරියට එරෙහිව නඩු 3ක් ශ්‍රේෂ්ඨාධිකරණයේ, දිසා අධිකරණයේ සහ අභියාචනාධිකරණයේ ගොනුකර තිබූ අතර නඩු තීන්දුවක් ලබාදෙන තෙක් ඉඩමේ භුක්තිය අධිකරණය විසින් එම තෙවැනි සමාගම වෙත ලබාදී තිබුණි. ඉහත කරුණු අනුව අධිකාරිය පනතේ බලතල වලට අනුකූලව කටයුතු කර නොමැති බවත් අධිකාරිය සමඟ ගිවිසුම්ගත වන පාර්ශවයන්ට පක්ෂපාතී ලෙස තම කර්තව්‍යයන් ඉටුකර ඇති බවත් වැඩිදුරටත් නිරීක්ෂණය විය.			අභියාචනාධිකරණයේ පවරා ඇත. එය 2024 සැප්තැම්බර් 10 දින කැඳවීමට නියමිතය.	
8	අධිකාරිය සතු නාවල පරංගියා කුඹුර නැමති අක්කර 05 පර්චස් 10 ක ඉඩම කැබිනට් මණ්ඩල තීරණයකට අනුව 2004 වර්ෂයේදී වසර 03 ක් ඇතුළත නිවාස සංකීර්ණයක් ඉදිකිරීම සඳහා පෞද්ගලික සමාගමක් සමග ගිවිසුම්ගත වී තිබුණු අතර එම ඉඩමේ	2021 2022 2023	ව්‍යාපෘති සඳහා ආයතන තෝරා ගැනීමේ දී හා ඉඩම් බැහැර කිරීමේ දී නිසි ක්‍රමවේදය අනුගමනය කල යුතු අතර අධිකාරියට අවාසිදායක නොවන කොන්දේසි ඇතුලත් කර ගිවිසුම් වලට එළඹිය යුතු අතර මනා අධීක්ෂනයක් සිදු කල	නාවල, කිරි මණ්ඩල මාවතේ පිහිටි අක්කර 05 යි පර්චස් 10 ක් වූ පරංගියා කුඹුර ඉඩමේ නිවාස ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට Eco Home Lanka (PVT) Ltd සමඟ 2004 සැප්තැම්බර් 21 දින අධිකාරිය	නඩු කටයුතු තවදුරටත් පවතී.

2003 රජයේ තක්සේරු වටිනාකම වූ රු. මිලියන 75 කට එම සමාගම වෙත කොන්දේසි සහිත සින්නක්කර ඔප්පුවක් මගින් ඉඩම පවරාදී තිබුණි. 2004 වර්ෂයේදී 2003 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකමට ඉඩම පැවරීම හේතුවෙන් අධිකාරියට අහිමි වූ තක්සේරු ආදායම රු. මිලියන 46.5 ක් වී තිබුණි. කෙසේ වුවද, සමාගම විසින් ගිවිසුම්ගත පරිදි සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු වෙනුවට පවරා දෙන ලද ඉඩමෙන් පර්චස් 29.44 ක් රු. මිලියන 196.5 කට වෙනත් සමාගමකට 2006 වර්ෂයේදී විකුණා තිබුණි. එමෙන්ම සමාගම විසින් ඉතිරි ඉඩම සෙලාන් බැංකුවට උගස් කර රු.මිලියන 697.5 ක් ද ලබාගෙන තිබුණි. 1979 අංක 17 දරන ජාතික නිවාස සංවර්ධන අධිකාරී පනතේ 8 (1) වගන්තිය යටතේ 2020 ජූනි 26 දින අධිකාරිය විසින් ඔප්පුව අවලංගු කර තිබූ අතර සමාගම ඊට එරෙහිව නඩු පවරා තිබුණි. එමෙන්ම තවත් පුද්ගලයෙකු විසින්ද යතෝක්ථ ඉඩම තමා	යුතු අතර ඉහත කරුණු සම්බන්ධව නිසි අවධානයක් යොමු නොකළ නිලධාරීන්ට එරෙහිව විධිමත් පරීක්ෂණයක් සිදු කළ යුතුය.	ගිවිසුමකට එළඹ තිබූ අතර 2003 අගෝස්තු 21 දිනැති රජයේ තක්සේරුව වූ රු. මිලියන 75 කට කොන්දේසි සහිත ඔප්පුවක් මඟින් ඉඩම පවරා දී ඇත. මෙම තක්සේරුව වසර 02 කට වලංගු වේ. යෝජිත ව්‍යාපෘති කාර්යයන් ඉටු නොවීම සහ ඉඩමේ කොටසක් සෙලින්කෝ හොස්පිටල් සර්විස් සමාගමට විකිණීම නිසා සින්නක්කර ඔප්පුව අවලංගු කර භුක්තිය අධිකාරියට පවරා ගන්නා ලදී. මේ සම්බන්ධයෙන් Eco Home Lanka (PVT) Ltd විසින් අධිකාරිය ඇතුළු ආයතන 04 කට එරෙහිව අභියාචනාධිකරණයේ නඩු පවරා ඇත. එය 2024 ඔක්තෝබර් 11 කැඳවීමට නියමිතය. තවද තවත් පුද්ගලයෙකු විසින් ද ඉඩමේ අයිතිය ලබා ගැනීමට කොළඹ දිසා අධිකරණයේ ද නඩුවක් පවරා ඇත. වර්තමානයේ මෙම ඉඩම රු. ලක්ෂ 05 ක මාසික

	සතු පුද්ගලික ඉඩමක් බවට අයිතිය ලබාගැනීමට දිසා අධිකාරණයේ තවත් නඩුවක් පවරා තිබුණි. ඒ අනුව අධිකාරිය විසින් ව්‍යාපෘති සඳහා ඉඩම් බැහැර කිරීමේදී නිසි පරිදි ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය නොකිරීම, අවශ්‍ය කොන්දේසි ඇතුළත් කර නිවැරදිව ගිවිසුම් සකස් නොකිරීම හා නිසි අධීක්ෂණයකින් යුතුව කටයුතු කර නොතිබුණි.			කුලියකට සචින්ද්‍ර එන්ටර්ප්‍රයිසස් වෙත කුලියට ලබා දී ඇත.	
9	මාලිගාවත්ත අංක 4051 දරණ පිඹුරෙහි කැබලි අංක 49/C පර්චස් 12 ක් සහ ඇල්විටිගල මාවතේ 117 වත්තේ පර්චස් 7.25 යන ඉඩම් ස්වයං රැකියා ලාභින්ගේ සංගමයක් වෙත 2014 වර්ෂයේ පිළිවෙළින් තක්සේරු වටිනාකමින් සියයට 1 ක නාමික වටිනාකම වූ රු. 240,000 සහ රු. 180,000 බදු පදනමින් බැහැර කර තිබුණි. අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 98/641/21/062 අනුව මේ සඳහා අමාත්‍ය මණ්ඩල පූර්ව අනුමැතිය ලබාගත යුතු වුවත් එසේ කර නොතිබුණි. තවද අධිකාරියේ අංක 2011/දෙක/03 දරණ	2023	අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය.	ඉඩම් ලබාදී ඇති කාර්ය සඳහා යොදාගෙන නැති බැවින් ඉදිරියේදී බදු ගිවිසුම් අවලංගු කර හෝ රජයේ තක්සේරුවට බදු පදනමින් ලබාදීමට කටයුතු කරනු ලැබේ.	බදු ගිවිසුම අවලංගු කර හෝ රජයේ තක්සේරුවක් ලබාගෙන නොතිබුණි.

චක්‍රලේඛය පරිදි වාර්ෂික බදු කුලිය ඉඩමේ තක්සේරු වටිනාකමින් සියයට 4 ක් සහ වසර 2 න් 2ට හා 5න් 5ට තක්සේරු වටිනාකම අනුව බදු මුදල් සංශෝධනය කළ යුතු වුවත් ඊට පටහැනිව ගිවිසුම් ගත වී තිබුණි. තවද බදු ගිවිසුමේ සඳහන් නිශ්චිත පරමාර්ථ සඳහා ඉඩම භාවිතා කර නොතිබු බැවින් බදු ගිවිසුම අවලංගු කළයුතු බව නීතිපතිගේ අංක 11/01/05/05 හා 2017 දරණ ලිපිය මගින් දක්වා තිබුණි. 2019 ජූනි 26 හා 2023 සැප්තැම්බර් 15 යන දිනයන් වල එම බදු ගිවිසුම අවලංගු කර තිබු නමුත් 2023 මාර්තු 21 දින සිට නැවත මෙම සංවිධානයටම බදු දී තිබුණි. එමෙන්ම ව්‍යාජ බදු ගිවිසුමක් අධිකාරිය විගණනයට ඉදිරිපත් කර තිබු අතර එවැනි සංවිධානයක් පවතින බවට විගණනයට කිසිදු තොරතුරක් අනාවරණය නොවු අතර භෞතික පරික්ෂාවේදී මෙම ඉඩමේ නවීන මාදිලියේ අවන්හලක් ඉදිකෙරෙමින් පැවතුණි. මේ අනුව අධිකාරිය සතු ඉඩම්

	අධිකාරියට අවාසි සහගත ලෙස බැහැර කිරීම් සිදුවන බව නිරික්ෂණය විය.				
10	අධිකාරියේ පනතේ විධිවිධාන අනුව සින්නක්කර පදනමින් ඉඩම් බැහැර කරයි නම් එය නිවසක් ඉදිකිරීම සඳහා පමණක් විය යුතු වුවත් රන්පොකුණුගම නිවාස ක්‍රමයේ සැලසුම් අංක 166 කැබලි අංක 02 හා 03 හි පර්චස් 60 ක ඉඩම් කොටස ඉන්ධන පිරවුම්හලක් සඳහා සින්නක්කර බදු පදනමින් වසර 20 ක කාලයක් සඳහා 2012 වර්ෂයේදී මාසිකව රු. 30,000 ක කුලියට බදු දී තිබුණි. ඉන්පසුව ඊට යාබද පර්චස් 1.3 ක්ද රු. 650 ක බදුකුලියට ඊට එකතු කර දී තිබූ නමුත් එය ගිවිසුමට ඇතුලත් කර නොතිබුණි. තවද 2015 වර්ෂයේදී බදුගිවිසුම් කාලය අවුරුදු 10 කින් දීර්ඝ කර තිබූ නමුත් වසර 5 න් 5ට තක්සේරු වාර්තා ලබාගෙන බදුකුලිය සංශෝධන කර නොතිබුණි. 2021 ජනවාරි සිට දෙසැම්බර් දක්වා මාසිකව රු. 71,500 බැගින් බදුකුලී අයකර තිබුණි. මුල් බදුකරුගේ ඉල්ලීම මත වෙනත් අයෙකු වෙත	2023	අදාල නීතිරීති වලට අනුකූලව කටයුතු කළයුතුය.	බදුකරු 2015 ඉඩම ගන්නාවිට අසංවර්ධිතව පැවති බැවින් ඉඩම එවකට පැවති තක්සේරු මිලට ඉල්ලා ඇත. එදිනට තක්සේරු වාර්තාව ලැබී නැත.	ඉන්ධන පිරවුම්හල පවත්වාගෙන යන අතර ගිවිසුම් ගතවී නැත.

	මෙම ඉඩම් සින්නක්කර බදු පදනමට ලබාදීමට අංක 17/2022 දරණ 2022 දෙසැම්බර් 24 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාදී තිබුණි. මේ අනුව අධිකාරියේ පනතට පටහැනිව ඉඩමක් සින්නක්කර බදු පදනමින් ලබාදී ඇති අතර 2022 ජුනි 07 දින එවා තිබු රු. මිලියන 73.5 ක ඉඩම් තක්සේරු වාර්තාව වෙනුවට බදු ගන්නා විට 2015 ඉඩම අසංවර්ධිත ඉඩමක් බැවින් වසර 9 කට පෙර වු එනම් 2015 ඉඩමේ තක්සේරු වාර්තාවක් තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා තිබු අතර එම තක්සේරු වටිනාකම ලැබී නොතිබුණි.				
11	අධිකාරිය සතු මාලිගාවත්ත මහල් නිවාස සංකීර්ණයේ කො/න 104 පිඹුරේ කැබලි අංක 65 දරණ පර්චස් 21.5 ක ඉදිකර තිබු ගොඩනැගිල්ලක් සඳහා බදු තක්සේරුවක් ලබාගැනීමෙන් තොරව අධිකාරියේ මිල කමිටුව විසින් තීරණය කළ මාසික කුලිය වු රු. 3,900 බැගින් නාමික බදු කුලියට බද්දට දී තිබු අතර 1999 අගෝස්තු 19 දින සිට 2000 අගෝස්තු 19	2023	නීතියානුකූල ක්‍රියාමාර්ග ගතයුතුය.	හිඟ මුදල් ගෙවන ලෙස ලිඛිතව දන්වා ඇතත් සාධාරණ ප්‍රතිචාර දක්වා නැත.	හිඟ බදුකුලී ගෙවා නැති අතර තක්සේරු වටිනාකම මත බදුකුලී අයකර නොතිබුණි.

දක්වා බදු ගිවිසුමකට එළැඹී තිබුණි. අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 98/641/21/062 අනුව රජය සතු ඉඩම් ආගමික ආයතන පුනාරුත්ථාන, අධ්‍යාන හා පරියේෂණ ආයතන වලට ලබාදීමේදී අමාත්‍ය මණ්ඩල පූර්ව අනුමැතිය ලබාගත යුතු වුවත් එම අනුමැතිය ලබාගෙන නොතිබුණි. 2000 අගෝස්තු 19 දින ගිවිසුම අවසන් වුවද ගිවිසුම් නැවත අළුත් කර නොමැති වීම හා බදුකුලී නොගෙවීම මත ගොඩනැගිල්ලේ හිස් භුක්තිය නැවත අධිකාරියට භාර දෙන ලෙස නීති නිවේදන යවා ඇතත් එසේ භාරදී නොමැති අතර අධිකාරියේ අවසරයකින් තොරව 2000 වර්ෂයේදී ගොඩනැගිල්ලේ කොටසක් කඩා ඉවත්කර පෙර පාසල් පරිපාලන කටයුතු සඳහා නව ගොඩනැගිල්ලක් බදුකරු විසින් ඉදිකර තිබුණි. 1999 අගෝස්තු සිට 2004 ජූනි දක්වා හිඟ බදු කුලිය එම ගොඩනැගිල්ල ඉදිකිරීමට වැය වූ මුදලට හිලව් කර තිබූ අතර 2004-2011 දක්වා කුලිය 2011 ජූලි 19 ද නැවත 2013 මාර්තු

	දක්වා කුලිය, 2013 මැයි ද වශයෙන් ගෙවීම් පැහැර හැරීම් සිදුකළ ආයතනයකට වර්ෂ 23 ක් කිසිදු සොයැබැලීමකින් තොරව මෙම ගොඩනැගිල්ල බදු දී තිබුණි. 2013 වර්ෂයේ ගිවිසුමක් අත්සන් කර තිබූ ගිවිසුම 2018 දී නැවත අවසන් කර එහි පරිපාලනය විසින් මෙම පෙර පාසල සඳහා වසර 30 ට බද්ධට ලබාගැනීමට ඉල්ලුම් කර තිබූ අතර ඒ සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ලබාගත් තක්සේරු වාර්තාවට අනුව රු. 177,000 මාසික බදු කුලියක් අයකළ යුතු වුවද 2023 අප්‍රේල් දක්වාම රු. 3,900 කුලියට දී තිබූ අතර පෙර පාසලේ ඉල්ලීම මත 2023 වර්ෂයේ සිට රු. 30,000 ක් අයකිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර තිබුණි. තක්සේරු බදු කුලිය අය නොකිරීමෙන් 2018 සිට 2023 දක්වා රු. මිලියන 10.28 ක අලාභයක් අධිකාරියට සිදු වී තිබුණි.				
12	2020 දෙසැම්බර් 15 දිනැති අංක අමප/20/1381/306/057 දරණ අමාත්‍ය	2023	වර්තමානයේදී සිදුකළ හැකි දේ පිළිබඳව කඩිනමින් පරීක්ෂා කර බැලිය යුතුය.	ජාතික අයවැය චක්‍රලේඛ අංක 3/2022 ආරම්භ නොකරන	කිසිදු පරීක්ෂාවක් ඉදිකිරීම් සිදුනොකර අතහැර දමා

	මණ්ඩල තීරණයට අනුව හෙක්ටෙයාර් 7.6 ක් වූ යක්කල වැරැල්ලවත්ත ඉඩමේ මහල් 12 කින් යුත් නිවාස 154 කින් සමන්විත නිවාස සංකීර්ණයක් ඉදිකිරීමට අනුමැතිය ලැබී තිබුණි. ක්ෂේත්‍ර පරික්ෂාවේදී මෙම ඉඩම පිළිසකර කිරීම, ව්‍යාපෘති සැලැස්ම හා ඇස්තමේන්තු සැකසීම හා ඉඩම හරහා දිවෙන අධිබලැති විදුලි රැහැන් පද්ධතිය ඉවත් කිරීමට තීරණය කර තිබූ අතර ඉදිකිරීම් කටයුතු රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට භාරදී තිබුණි. අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂය අවසාන වන විට මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් රු. මිලියන 169.7 ක් වැය කර තිබූ අතර අත්තිවාරම් දැමීම පමණක් සිදුකර ව්‍යාපෘතිය අතහැර දමා තිබූ බැවින් මෙය අනාර්ථික වියදමක් ලෙස නිරීක්ෂණය විය.			ලෙස උපදෙස් ඇත. ලබාදී ඇත.	
13	2015 – 2019 වර්ෂවලදී අධිකාරිය විසින් ක්‍රියාත්මක කළ ආදර්ශ ගම්මාන ව්‍යාපෘතියෙහි සමාලෝචිත වර්ෂය වන විට අවිච්ඡේද ගම්මාන 2150 ක නිවාස 39,815 ක් පැවති අතර රු. මිලියන 190.63 ක් වැය කර	2021 2022, 2023	සුදුසු ක්‍රමවේදයකට අනුව අතරමග නවතා ඇති ව්‍යාපෘති සමීක්ෂණ කිරීමට කටයුතු කළයුතුය.	ආදර්ශ ගම්මාන සහ නීරෝ ගම්මාන සඳහා 2019 පසු ප්‍රතිපාදන ලැබී නොමැත.	අවිච්ඡේද ව්‍යාපෘති පිළිබඳ භාණ්ඩාගාරය දන්වා ප්‍රතිපාදන ඉල්ලා ඇත.

	නිවාස 681 ක් පමණක් සමාලෝචිත වර්ෂයේදී නිමකර තිබුණි. 2017 – 2019 වර්ෂවල ආරම්භ කළ ඉන්දියානු නිවාස ආධාර ව්‍යාපෘතිය යටතේ ගම්මාන 25 ක් තුල නිවාස 114ක් අවිච්ඡේදව පැවති අතර සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 103 ක් වැයකර නිවාස 143 ක් ඉදිකිරීමට සැලසුම් කළද රු. මිලියන 6.38 ක් වැයකර නිවාස 29 ක් පමණක්ද ග්‍රාම ශක්ති නිවාස ව්‍යාපෘතිය යටතේ සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 554 වැය කර නිවාස 1,605 ක් ඉදිකිරීමට සැලසුම් කළද රු. මිලියන 48.8 වැය කර නිවාස 57 ක් පමණක් ද ඉදිකර අවසන් කර තිබුණි.					
14	අධිකාරියට එරෙහිව සහ අධිකාරිය විසින් පවරා ඇති නඩු කටයුතු වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 44.14 ක් නීතිඥ ගාස්තු ලෙස වැයකර තිබුණි. මේ තුල සිංගප්පූරු ජාත්‍යන්තර බේරුම්කරණ අධිකරණයේ පවතින නඩුව වෙනුවෙන් රු මිලියන 6.97 ක්ද රාගම ලවන්‍යා හයිට්ස් නිවාස ව්‍යාපෘති සඳහා නීතිඥ	2022, 2023		ව්‍යාපෘති කටයුතු සහ අනෙකුත් කටයුතු වලදී විධිමත් හා නීතියානුකූලව ගිවිසුම් වලට එළඹී කටයුතු කළයුතුය.	බම්බලපිටියේ මහල් නිවාස ප්‍රතිසංවර්ධන ව්‍යාපෘතියට අදාල සිංගප්පූරු අධිකරණයේ පවතින නඩු වෙනුවෙන් වැඩි මුදල් වැය වේ.	නඩු කටයුතු දිගින් දිගටම පවතී.

ගාස්තු ලෙස රු. මිලියන 2.23 ක් ඇතුලත්ව තිබුණි. කොන්ත්‍රාත් පදනමට බඳවාගෙන තිබූ සේවකයන් විසින් කම්කරු විනිශ්චය සභා වල පවරා තිබූ නඩු සංඛ්‍යාව 852 ක් වූ අතර ඉන් 349 ක් නිශ්ප්‍රභා වී තිබුණි. කොළඹ සහ මාතර විනිශ්චය සභා විසින් ලබාදුන් නඩු තීන්දුවට අනුව නඩු 49 ක් වෙනුවනේ රු. මිලියන 13.8 ක් වන්දි ලෙස තැන්පත් කිරීමට අධිකාරියට සිදුවී තිබුණි. තවද මාතර කම්කරු විනිශ්චය සභාවේ තවදුරටත් නඩු 518 ක් පැවතුණු අතර 81 කට තීන්දු ලබා දී තිබුණද නැවත අභියාචනා අධිකරණයේ නඩු පවරා ඇත. එමෙන්ම පවතින නඩු වලට අදාලව රු. මිලියන 2616 ක් වන්දි මුදලක් අධිකාරියෙන් ඉල්ලුම් කර තිබුණි. කළමනාකරණය ගනු ලබන ඵලදායි නොවන තීරණ හේතුවෙන් මෙවැනි තත්ත්වයක් ඇති වී තිබියදීත් නැවත නැවතත් බඳවාගැනීමේ පටිපාටියකින් තොරව බඳවාගැනීම්ද, ව්‍යාපෘති සඳහා විධිමත් පරිදි ආයෝජකයින් තෝරාගැනීම, ඉඩම්,

	ගොඩනැගිලි බදුදීමේදී අත්‍යවශ්‍ය කොන්දේසි ගිවිසුම්වලට ඇතුලත් නොකිරීම වැනි කටයුතු දිගින් දිගටම සිදුකරමින් පැවතුණි.				
15	නිවාස සංකීර්ණ අළුත්වැඩියා, ජල ව්‍යාපෘති හා පාලම් ඉදිකිරීම වැනි ව්‍යාපෘති 53 ක් සඳහා අධිකාරිය විසින් රු. මිලියන 312.68 ක අත්තිකාරම් මුදල් ලබාදී තිබූ අතර එය 2023 දෙසැම්බර් 31 දින වන විටද නිරවුල් කර නොතිබුණි. එම ලබාදී තිබූ මුදලින් රු. මිලියන 106.24 ක් ලබාදී වර්ෂ 3-4 ක කාලයක්ද රු. මිලියන 41.91 ක් ලබා දී වසර 4-5 ක කාලයක්ද රු. මිලියන 164.53 ලබාදී වසර 05 ට වැඩි කාලයක්ද ගතවී තිබුණි. මෙම මුදලින් රු. මිලියන 254.36 ක් එනම් සියයට 81 ක්ම රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට ලබාදී තිබූ අතර සමාලෝචිත වසර අවසන් වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.	2021, 2022, 2023	අත්තිකාරම් කාලීනව නිරවුල් කිරීමට කටයුතු කළ යුතු බව.	මෙම මුදල් පියවා ගැනීමට අමාත්‍යාංශය මැදිහත් වීමෙන් සාකච්ඡා කටයුතු සඳහා යොමු වී ඇත.	නිරවුල් කරගෙන නොතිබුණි.
16	අධිකාරිය සතු අංක 302 සැලැස්මේ කැබලි අංක 01 දරන ඉඩමේ පර්චස් 159 ක බිම් කොටස 2006 දෙසැම්බර් 14 දිනැති	2023	අධිකාරියේ දේපල සම්බන්ධයෙන් නිසි අධීක්ෂණයක් සිදුකර විධිමත් පරිදි ගිවිසුම්ගත විය යුතුය.	ගිවිසුමේ ගොඩනැගිලි ඉදිකිරීමට අවසර දී ඇත. අනවසර කරුවන් සිටි කාලයට රු.	ගිවිසුම් ගතවීමේදී අධිකාරියට අවාසිසහගත කොන්දේසි ඊට ඇතුලත් කර

අංක 8207 දරණ කල්බදු ගිවිසුම මගින් වසර 50 කාලයක් සඳහා මෝදර වෙන්කටේෂ්වර දේවාලය සඳහා බදු දී තිබුණි. ගිවිසුම ප්‍රකාරව වාර්ෂික බදු කුලිය රු. මිලියන 1.15 ක් වූ අතර වසර 5 කට වරක් සියයට 2.5 කින් වැඩි වන පරිදි කුලී අයවිය යුතු විය. නමුත් කෝවිල සඳහා වෙන් කළ ඉඩමෙන් පර්චස් 39.7 ක අනවසර පදිංචිකරුවන් සිටීම හේතුවෙන් 2007 සිට 2013 ජූලි මාසය දක්වා බදු කුලී ගෙවීම පැහැර හැර තිබුණි. ඒ අනුව 2013 නොවැම්බර් 28 දිනට අයවිය යුතු රු. මිලියන 19.3 ක හිඟ කුලී මුදල සම්බන්ධයෙන් 2023 අගෝස්තු 11 දිනැති 13/2023 අධ්‍යක්ෂ මණ්ඩල තීරණය වූයේ රු. මිලියන 3 ක් පමණක් මාසිකව රු. 125,000 බැගින් වසර 2 කින් අයකර ගැනීමටය. මෙම කාලය තුල ඉඩමෙන් සියයට 75 ක් භාවිතා කර තිබූ නමුත් කුලී ගිවිසුමට එළඹීමේදී තැන්පතු මුදලක් ලබාගෙන නොතිබීම හේතුවෙන් හිඟ කුලී අයකර ගැනීමට නොහැකි වී තිබුණි. තවද අංක

මිලියන 3 ක් ඇත. ගෙවීමට එකඟ වී ඇත. අප්‍රේල් සිට ගෙවීම් කරගෙන යයි.

	SEI/A/4/34 දරන 1993 ජූලි 12 දිනැති රජයේ ඉඩම් වෙන් කිරීම සඳහා වූ මාර්ගෝපදේශ ජනාධිපති චක්‍රලේඛයට අනුව වසර 5 කට වරක් කුලි වැඩිකිරීම් සියයට 150 කට අඩු නොවිය යුතු බව සඳහන් කර තිබුණද අධිකාරිය එම චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. අධිකාරිය සතු හිස් ඉඩමේ කොවිලට සම්බන්ධ තවත් ගොඩනැගිල්ලක් ඉදිකරමින් පවතින අතර අධිකාරිය මෙම අනවසර ඉදිකිරීම සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.				
17	අධිකාරිය සතු හෙක්ටයාර 125.18 ක පැවති ඉඩම් කැබලි 3,110 ක් අනවසර පදිංචිකරුවන් විසින් භුක්ති විඳින අතර, එම ඉඩම් නියමානුකූල කිරීමට අවශ්‍ය නීතිමය කටයුතු සිදු කර නොතිබුණි.	2022	දැනට අනවසර පදිංචි ඉඩම් නියමානුකූල කිරිමට හෝ පවරා ගැනීමට කඩිනමින් කටයුතු කළයුතු වේ.	අනවසරයෙන් පදිංචි ඉඩම් කොටස් වල තක්සේරු වටිනාකම ඔවුනේගෙන් අයකර අධිාකරියේ 2014/01 චක්‍රලේඛයට අනුව නියමානුකූල කිරීමේ ක්‍රමවේදනය් සිදු කෙරේ.	දැනට අනවසර පදිංචි ඉඩම් 1,607 ක් පවතී.
18	අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂය තුල ප්‍රධාන ව්‍යාපෘති 7 ක් ක්‍රියාත්මක කිරීම	2022	වෙන් කල ප්‍රතිපාදන ඵලදායීව උපයෝජනය කර අපේක්ෂිත අරමුණ	ව්‍යාපෘති 02 ක් අවසන් කර ඇත.	තංගල්ල/ සොයිසාපුර ව්‍යාපෘති අවසන් කර ඇත. ඉතිරි

	සඳහා රු. මිලියන 4458.39 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණ ද සත්‍ය වශයෙන් රු. මිලියන 3352.92 ක් පමණක් ලැබී තිබුණි. සැලසුම් කල සියපත ව්‍යාපෘති 2 ක කිසිදු කටයුත්තක් සිදු කර නොතිබූ අතර ව්‍යාපෘති 2ක ඉදිකිරීම් කටයුතු සියයට 22 හා 29 මට්ටමක පැවති අතර තවත් ව්‍යාපෘති 3 ක ප්‍රගතිය සියයට 5 ත් 8 ත් අතර පරාසයක් තුළ පැවතුණි.		ලගා කර ගත යුතුය.		ව්‍යාපෘති අවසන් කර නැත.
19	අධිකාරිය සතු කුලියට/බද්දට ලබාදී තිබූ නිවාස හා කඩ සාප්පු ප්‍රමාණය 1,816 ක් වූ අතර එයින් 1,786 ක් කොළඹ දිස්ත්‍රික්කය තුළ පිහිටා තිබුණි. ඒ අතරින් 942 ක් රු.100 ට වඩා අඩු මාසික කුලී පදනම මත ලබාදී තිබූ අතර තවත් කඩ සාප්පු 09 ක් කිසිදු බදු මුදලක් අය නොකර බාහිර පාර්ශව වෙත ලබාදී තිබුණි. තවද නිවාස හා කඩසාප්පු 744 ක් මාසික බදු කුලිය රු.101 ත් රු.1,000 අතර මුදලකට කුලියකට ලබා දී තිබුණි. බදු කුලිය ගණනයේදී දේපලේ වටිනාකමින් සියයට 04 ක වටිනාකම හෝ ශුද්ධ ආදායම මත	2021	කුලියට , බද්දට දෙනු ලබන කඩසාප්පුවල වටිනාකම තක්සේරු කර කුලිය තීරණය කළයුතු අතර බදු කුලී ගිවිසුම් කොන්දේසි පරිදි අළුත් කළ යුතු බව.	දේපලවල වටිනාකම් තක්සේරු කිරීමේ කටයුතු සඳහා දිස්ත්‍රික් කාර්යාල වලින් තොරතුරු ලබාගනිමින් පවතී.	නිරීක්ෂණය පරිදි පවතී.

සියයට 4 ක් යන වටිනාකම්වලින් අඩු වටිනාකම බදු කුලිය ලෙස සැලකිය යුතු අතර සෑම වසර 02 කට වරක් බදු ගිවිසුම් අළුත් කිරීම කළ යුතු වේ. අධිකාරිය නිවාස හා කඩ සාප්පු බදු දීමේදී බදු කුලිය එසේ තක්සේරු කර නොතිබුණු අතර කොළඹ දිස්ත්‍රික්කයේ නිවාස හා කඩසාප්පු වලින් සියයට 89 ක් එනම් නිවාස හා කඩසාප්පු 1,582 ක බදු ගිවිසුම් ආරම්භ කරන ලද දින සිටම යාවත්කාලීන කර නොතිබුණි. ඒ අනුව වර්තමාන තක්සේරු වටිනාකමට කුලියට/බද්දට නොදීම නිසා අධිකාරියට ලබාගත හැකිව තිබූ ආදායම් අහිමි වී තිබුණි.

3.75 ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනය

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	බදු පෙර ලාභය (අලාභය) රු.	මතය
2021	660,375,835	64,418,585	595,957,250	37,439,379	තත්ත්වාගණනය කළ
2022	705,972,602	70,356,918	635,615,684	89,948,884	තත්ත්වාගණනය කළ
2023	920,413,638	66,393,614	854,020,024	219,994,455	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ගය	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට සමගාමීව නිකුත් කරන ලද යහපාලනය පිළිබඳ මෙහෙයුම් අත්පොතෙහි 3.2 (i) ඡේදය අනුව සේවකයන්ට ගෙවනු ලබන සියලු දීමනා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය හා රේඛීය අමාත්‍යාංශයේ නිර්දේශය ලබාගැනීමෙන් පසු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතු වුවත් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය පමණක් ලබාගෙන රසායනාගාර පරීක්ෂණ දීමනාව,	2021 2022	සේවකයන්ට ගෙවනු ලබන සියලු දීමනා සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගත යුතුය.	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා යොමු කර ඇත.	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී නොමැත.

	පාඨමාලා සම්බන්ධීකරණ දීමනාව, සති අන්ත පාඨමාලා සඳහා කාර්යමණ්ඩල දීමනාව සහ උපදේශන දීමනාව සඳහා 2021 හා 2022 වර්ෂයන්හීදී පිළිවෙළින් රු. 11,246,760 ක් හා රු. 12,730,369 ක් ගෙවා තිබුණි.				
2	ආයතනයේ සේවකයින්ගේ වෛද්‍ය බිල් ආවරණය කිරීම වෙනුවෙන් වූ රක්ෂණය සඳහා 2021 වර්ෂයේ වාරික ලෙස රු.1,475,953 ක්ද, වෛද්‍ය බිල් ප්‍රතිපූර්ණය කිරීම වෙනුවෙන් රු.1,674,573ක්ද භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමෙන් තොරව ගෙවා තිබුණි.	2021	චක්‍රලේඛ උපදෙස්වලට අනුකූලව කටයුතු කළ යුතුය.	පාලක මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇත.	භාණ්ඩාගාර අනුමැතිය ලබා ගෙන නොමැත.
3	2023 දෙසැම්බර් 31 දිනට ලැබියයුතු වෙළඳ ශේෂය රු.11,323,009 කින් වර්ෂ 3 ට වැඩි කාලයක සිට අය නොවන රු. 6,524,257 ක ශේෂයක් ද , වර්ෂ 1 ත් වර්ෂ 3 ත් අතර කාලයක සිට අය නොවී පවතින	2023	කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.	සිහිකැඳවීම් ලිපි යවා ඇත.	අය කරගෙන නොමැත.

	රු.1,577,681 ක ශේෂයක් ද පැවතුන අතර එම ණය ශේෂයන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.				
4	2009 අංක 12 දරන පේෂකර්ම හා ඇඟලුම් ආයතන පනතේ 4(එ) වගන්තිය ප්‍රකාරව නිෂ්පාදනය, ආනයනය, අපනයනය හා වෙනත් තාක්ෂණික තොරතුරු ඇතුළත් පේෂකර්ම හා ඇඟලුම් කර්මාන්තය පිළිබඳ දත්ත මූලාශ්‍රයක් පවත්වා ගත යුතු වුවත් පූර්ණ වශයෙන් ඒකාබද්ධ කරන ලද දත්ත ඇතුළත් තොරතුරු පද්ධතියක් ආයතනය විසින් පවත්වා ගෙන නොතිබුණි.	2021	පනතේ කාර්යයන් ඉටුකිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.	විධිමත් දත්ත පද්ධතියක් සඳහා අමාත්‍යාංශයෙන් ප්‍රතිපාදන ඉල්ලා ඇත.	පනත ප්‍රකාරව දත්ත පද්ධතියක් ස්ථාපිත කර නොමැත.
5	දේශීයව නිෂ්පාදනය කරන ලද සහ ආනයනික පේෂකර්ම හා ඇඟලුම් නිෂ්පාදන දේශීය වෙළඳපොළට ඇතුළුවීමේදී සෞඛ්‍ය සහ ආරක්ෂණ සහතිකයක් ලබාදීම අනිවාර්ය අවශ්‍යතාවයක් බවට පත්කර එම සහතික කිරීමේ බලය ආයතනය වෙත 2017 දෙසැම්බර්	2021	ඇඟලුම්වල සෞඛ්‍ය හා ආරක්ෂිත බව තහවුරු විය යුතුය.	අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත රු මිලියන 5 කින් මූලික කටයුතු ආරම්භ කර ඇත.	ඇගළුම් වල සෞඛ්‍ය හා ආරක්ෂිත බව තහවුරු වී නොමැත.

අමප/17/2707/723/050 දරන අමාත්‍ය මණ්ඩල තීරණයෙන් ලබාදුන්නද ඉදිරි ක්‍රියාමාර්ග නොගැනීම නිසා දේශීය වෙළඳපොළ තුළ පවතින ඇඟළුම්වල සෞඛ්‍යාරක්ෂිත බව සහ ආරක්ෂිතභාවය සහතික වී නොතිබුණි.

3.76 ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	31,020,684	16,685,830	14,334,854	-	තත්ත්වාගණනය කළ
2022	35,413,466	14,869,461	20,544,005	-	ගිණුම් පරීක්ෂා කර නැත
2023	-	-	-	-	ගිණුම් ලැබී නැත

	විගණන නිරීක්ෂණ	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 371(5) අනුව, අග්‍රිම ලබාදුන් වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට එම අග්‍රිම පියවිය යුතු නමුත්, 2017 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා ලබා දුන් එකතුව රු.6,138,242 ක් වූ අත්තිකාරම් මුදල් 2023 දෙසැම්බර් 31 දින වනවිටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.	2021	මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය.	ඉතිරිව ඇති අත්තිකාරම් පියවීමට අවශ්‍ය කටයුතු යොදා ඇත.	අත්තිකාරම් පියවා නොමැත.

2	2006 අංක 17 දරන ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය පනතේ 13 (ආ) සහ 13 (උ) වගන්ති අනුව අධිකාරියේ පහත සඳහන් අරමුණු ඉටුකර ගැනීම කෙරෙහි 2021 වර්ෂයේදී ද අවධානය යොමුකර නොතිබුණි. (i) පනතේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා විදේශ වෙළෙඳපලවල් ජයග්‍රහණය කිරීමට හැකි දේශීය ව්‍යවසායන් ජාත්‍යන්තරකරණය කිරීමේ අරමුණින් ව්‍යවසායන් ශ්‍රී ලංකාවෙන් පිට පිහිටුවීම සහ ක්‍රියාත්මක කිරීම උනන්දු කරවීම සඳහා දිරි ගැන්වීම. (ii) තාක්ෂණික දියුණුව, නිෂ්පාදන සංවර්ධනය සහ පේටන්ට් අයිතියේ වාණිජකරණයට අදාල පර්යේෂණ සහ සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා තාක්ෂණික සංවර්ධන අරමුදලක් පිහිටුවීම.	2021 ගනුදෙනු වාර්තාව	පනතේ අරමුණු ඉටු කර ගත යුතුය.	සංවර්ධන වැඩසටහන් ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන බව හා තාක්ෂණික සංවර්ධන අරමුදල පිහිටුවීම සඳහා යෝජනා සකස් කර අනුමැතිය ලබාගැනීමටත් ඒ තුලින් මූල්‍ය පහසුකම් ලබා ගැනීමටත් අධිකාරිය සැලසුම්කර ඇති බව.	පනතේ අරමුණු ඉටු කරගෙන නොමැත.

3.77 පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	560,498,000	138,859,000	421,639,000	7,101,000	තත්ත්වාගණනය කළ
2022	713,044,000	112,277,000	600,767,000	91,246,000	තත්ත්වාගණනය කළ
2023	834,431,000	178,157,000	656,274,000	52,338,000	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	**වාර්තාවේ වර්ෂය**	**විගණකාධිපති නිර්දේශය**	**විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ගය**	**වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්වය**
1	2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ සංශෝධන කටයුතු 2004 වර්ෂයේදී ආරම්භ කර වර්ෂ කීපයකදී පනතේ වගන්ති 30 ක් නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම හැර 2023 වර්ෂය වන විට වසර 19 ක් ගත වී ඇතත් පනත සංශෝධන කටයුතු අවසන් වී නොතිබුණි.	2023 3.1 (අ) 2022 3.2(අ) 2021 3.1	පනත සංශෝධන කටයුතු කඩිනමින් අවසන් කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය.	තවදුරටත් සිදු විය යුතු සංශෝධනයන් පිළිබඳ ලිපියක් අමාත්‍යාංශය වෙත යොමු කර ඇත.	පනත සංශෝධන කටයුතු අවසන් වී නොමැත.
2	අනාරක්ෂිත හා තත්ත්වයෙන් බාල නිෂ්පාදන මඟින් පාරිභෝගිකයන් සුරක්ෂිත කිරීම සඳහා හඳුනාගත් නිෂ්පාදන කීපයක්	2023 3.1(ආ) 2022 3.2(ඔ)	ක්‍රියාත්මක කිරීමේ හැකියාව තහවුරු කර ගැනීමෙන් පසුව ගිවිසුම් වලට එළඹීමට කටයුතු කළ යුතු අතර වගකිවයුතු	අධිකරණ ක්‍රියාමාර්ග ගෙන තිබුණු අතර ඒවා අවසන් වී නොමැත.	අභ්‍යන්තර පරීක්ෂණයක් පවත්වා වගකිව යුතු පාර්ශවයන් මේ දක්වා හඳුනා ගෙන නොමැත.

සම්බන්ධයෙන් ආරක්ෂිත ක්‍රමවේදයක් සකස් කිරීම සඳහා ස්විට්සර්ලන්තයේ එක් සමාගමක් සමඟ 2014 ජනවාරි මස 24 දින ගිවිසුමකට එළඹ තිබුණි. ඒ සම්බන්ධයෙන් නිකුත් කර තිබූ විධාන අංක 49 නිශ්ප්‍රභා කරවා ගැනීම සඳහා භාණ්ඩ නිෂ්පාදන සමාගම් කීපයක් විසින් අධිකාරියට විරුද්ධව මහා අධිකරණයේ ගොනු කර තිබූ ඉල්ලුම්පත්‍රය සඳහා මහා අධිකරණය මගින් විධානය ක්‍රියාත්මක කිරීම වලක්වමින් අතුරු නියෝගයක් නිකුත් කිරීම හේතුවෙන් එම ස්විට්සර්ලන්ත සමාගම සමඟ එළඹී ගිවිසුමට අනුකූලව ව්‍යාපෘතියේ කටයුතු ඉදිරියට කරගෙන යාමට නොහැකිවී තිබුණි. ගිවිසුම ක්‍රියාත්මක නොවීම හේතුවෙන් සමාගම විසින් ඒකපාර්ශවීයව ගිවිසුම අවලංගු කර ගිවිසුම් ප්‍රකාරව සම්පූර්ණ ආයෝජන මුදල වන රු.බිලියන 2.716 ක මුදලක් ගෙවන ලෙස ඉල්ලා	පාර්ශවයන් කඩිනමින් හඳුනා ගත යුතුය.

අධිකාරියට එරෙහිව 2018 වර්ෂයේදී ජාත්‍යන්තර බේරුම්කරණ අධිකරණයේ නඩුවක් ගොනු කර තිබුණි. බේරුම්කරණ නඩුව සඳහා අවසාන ප්‍රදානය 2022 මැයි 10 දින ලබා දී තිබුණු නියෝගය අනුව අධිකාරිය විසින් සමාගම වෙත රු. බිලියන 2.716 ක් ද, බේරුම්කරණ ගාස්තුව වශයෙන් ඇ.ඩො. 325,000 ක මුදලක් ද ගෙවියයුතු විය. බේරුම්කරණ නඩුවේ අවසාන ප්‍රදානයට එරෙහිව 2022 ජූලි 07 දින අධිකාරිය විසින් කොළඹ වාණිජ මහාධිකරණයේ පෙත්සමක් ගොනු කර තිබුණු අතර මේ සම්බන්ධයෙන් අධිකාරිය විසින් අභ්‍යන්තර විමර්ශණයක් පවත්වා වගකිවයුතු පාර්ශවයන් හඳුනාගෙන නොතිබුණි.

3.78 ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	3,624,960,671	552,131,395	3,072,829,276	309,988,251	තත්ත්වාගණනය කළ
2022	5,431,721,623	789,780,442	4,641,941,181	711,249,234	තත්ත්වාගණනය කළ
2023	5,561,635,694	1,195,986,352	4,365,649,342	1,055,623,029	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	**වාර්තාවේ වර්ෂය**	**විගණකාධිපති නිර්දේශය**	**විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ගය**	**වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්වය**
1	2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල සඳහන් රු. 67,154,145 ක ලැබිය යුතු භාණ්ඩාගාර තැන්පතු පොළී ආදායම, වර්ෂ 10කටත් වඩා වැඩි කාලයක සිට අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	2022 1.6.1 2023 1.5.4 (a)	ලැබිය යුතු භාණ්ඩාගාර තැන්පතු පොළී ආදායම කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.	නිරන්තර පසු විපරම් කටයුතු කිරීම.	නිර්දේශ ප්‍රකාරව කටයුතු කර නැත.
2	අපනයනකරුවන් 08 දෙනෙකු වෙත ලබා දී තිබුණු රු. 34,958,636 ක් වූ අපනයන බිල්පත් මත අත්තිකාරම් ගෙවීම් ශේෂය වර්ෂ 15කට අධික කාලයක් මුළුල්ලේ අය නොවී පැවතුණු අතර මෙම අත්තිකාරම් මුදලින් රු.22,870,492 ක් එක් අපනයනකරුවකු වෙත පමණක් ලබා දී	2022 1.6.2 2023 1.6.2	හිඟ ශේෂය සැසඳීමට සහ අයකර ගැනීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය.	අපනයනකරුවන් වෙත සිහි කැඳවීම් ලිපි යොමු කර ඇති අතර ඉදිරියේදි කොටස් වශයෙන් අයකර ගැනීමට කටයුතු කිරීම.	අයවිය යුතු ශේෂ මේ දක්වා අය කරගෙන නොමැත.

තිබුණි.

3	මූල්‍ය සේවා මත වූ වැට් බද්ද රු.2,185,511 ක් ලැබිය යුතු ශේෂයක් ලෙස වර්ෂ 06 කට වැඩි කාලයක සිට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.	2023 1.6.1	ශේෂ හිලව් කර ශේෂය සැසඳීමට සහ අයකර ගැනීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය.	දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් ලබා දුන් නිර්දේශ අනුව වර්තමානයේදී සංස්ථාව විසින් මූල්‍ය සේවා මත වැට් බදු ගෙවීම සිදු නොකිරීම.	ගෙවිය යුතු බදුවලින් අඩුකර ගැනීම සම්බන්ධව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙතින් විමසීම් සිදු කර ඇතත් මේ දක්වා අය වී නොමැත.

3.79 ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	1,450,681,865	198,833,869	1,251,847,996	211,709,684	තත්ත්වාගණනය කළ
2022	1,730,837,589	166,463,831	1,564,373,758	218,857,087	තත්ත්වාගණනය නොකළ
2023	1,909,682,336	267,650,852	1,642,031,484	83,766,528	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගනු ලැබූ වැලැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	මණ්ඩලය විසින් අපනයනකරුවන් සඳහා ලබා දී තිබුණු අපනයන ණය මුදලින් 2023 දෙසැම්බර් 31 දිනට අපනයනකරුවන් 146 දෙනෙකු වෙතින් අයවිය යුතු මුදල රු.38,027,520 ක් විය. එම මුදලින් සියයට 96 ක් එනම්, රු. 36,831,520 ක් වර්ෂ 25 ක් පැරණි ණය ශේෂ වූ අතර, එය අපනයනකරුවන් 145 කගෙන් අය විය යුතුව තිබුණි. ඉතිරි සියයට 4 ක වටිනාකම එනම්, රු.1,196,000 වර්ෂ 17 ක් පැරණි ණය	2023 1.6.1 (a) 2022 1.5.1(අ) 2021 1.6.1(අ)	ලැබිය යුතු ශේෂයන් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.	වර්තමානයේ ක්‍රියාත්මක තත්ත්වයේ පවතින සමාගම්වලට එරෙහිව ණය නැවත අයකර ගැනීම සඳහා නීතිමය පියවර ගැනීමට කටයුතු කර ඇත.	ණය ශේෂ අයකර ගෙන නොමැත.

	ශේෂයක් වූ අතර, එය එක් අපනයනකරුවකු ගෙන් අය විය යුතුව තිබුණි.				
2	ඌව පරණගම අපනයන නිෂ්පාදන ගම්මාන (UPEPV) වැඩසටහන වෙනුවෙන් ලබාදී තිබුණු රු.10,403,683ක් 2009 වර්ෂයේ සිට අඛණ්ඩව වර්ෂ 14 ක කාලයක් තුළ නැවත අයකරගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි.	2023 1.6.1 (c) 2022 1.5.1 (ඇ) 2021 1.6.1 (ආ)	ලැබිය යුතු ශේෂයන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.	ණය මුදල් නැවත ගෙවන ලෙස ගොවීන් වෙත ලිපි යොමු කිරීම සහ ණය මුදල් අය කර ගැනීම සඳහා නිලධාරියෙකු යෙදවීම.	ණය ශේෂය අයකර ගෙන නොතිබුණි. එම ණය ශේෂය ඉදිරියේදී ලියාහැරීමට පවතින ඉඩකඩ සොයා බලන බව දන්වා ඇත.
3	වෙනත් ණයගැතියන්ගෙන් අයවිය යුතු රු. 7,230,203 ක මුදලක් ලබා දී වසර 10 කට වඩා වැඩි කාලයක් ගත වී ඇතත් අය කර ගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි.	2023 1.6.1 (d)	ණයගැතියන්ගෙන් ලැබිය යුතු ශේෂයන් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.	අධිකරණ නියෝගයට අනුව කටයුතු කිරීම සහ දැනට වසා ඇති සමාගම්වල අධ්‍යක්ෂවරුන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කිරීම.	ණය මුදලින් රු.50,000 ක් අයකර ගෙන ඇත. වසා දමා ඇති සමාගම්වල අධ්‍යක්ෂවරුන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමින් පවතී.
4	2015 මැයි 25 දිනැති අංක: PED/01/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට පටහැනි ලෙස මණ්ඩලය විසින් MM, PL, MA සහ JM වැටුප් කාණ්ඩ	2023 1.7 (a)	රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ ප්‍රතිපාදන අනුව ප්‍රවාහන දීමනා ගෙවිය යුතුය.	වැළැක්වීමේ ක්‍රියාමාර්ග දන්වා නොතිබුණි.	දැනට PL, MA, JM සහ MM වැටුප් කාණ්ඩ යටතේ වන සේවකයින්ට පැමිණීම මත ලබා දෙන මාසික ප්‍රවාහන දීමනාව ගෙවීමට අනුමැතිය ලබා ගැනීමට

	වලට අදාළ ප්‍රවාහන දීමනා සඳහා සුදුසුකම් නොලබන සේවකයින් 162 දෙනෙක් වෙත රු.13,975,608 ක මුදලක් ප්‍රවාහන දීමනා ලෙස ගෙවා තිබුණි.				කටයුතු කරන බව දන්වා ඇත. චක්‍ර ලේඛයට පටහැනි ගෙවීම් මේ දක්වා අයකරගෙන නැත.
5	මණ්ඩලය විසින් සමාගම් 26 ක කොටස්වල රු. 40,217,028 ක මුදලක් ආයෝජනය කර තිබූ අතර, එම ආයෝජිත සමාගම්වල පැවැත්ම සම්බන්ධයෙන් ප්‍රමාණවත් පසුවිපරම් කටයුතු සිදු නොකිරිම හේතුවෙන් නාමයන් සමාගම් රෙජිස්ටරයෙන් කපා ඉවත් කර තිබූ මෙම සමාගම්වල ආයෝජිත මුදල් ආපසු ලබා ගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි.	2023 3.2	සඵලදායී සහ කාර්යක්ෂම ආයෝජන තීරණ ගැනීම සඳහා මණ්ඩලය විසින් ආයෝජිත සමාගම්වල පැවැත්ම සම්බන්ධයෙන් පසුවිපරම් කිරීමේ කටයුතු සිදුකළ යුතුය.	වැලැක්වීමේ ක්‍රියාමාර්ග දන්වා නොමැත.	සමාගම් පනත සඳහා සංශෝධන මෙතෙක් සිදුකර නොමැති නිසා වසා දැමූ සමාගම්වලට එරෙහිව නීති පියවර ගැනීමට නොහැකි බව දන්වා ඇත.

3.80 සීමාසහිත ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	5,917,328,167	4,786,107,882	1,131,220,285	472,717,911	තත්ත්වාගණනය කළ
2022	4,845,827,423	3,063,580,592	1,782,246,831	735,435,943	තත්ත්වාගණනය කළ
2023	8,576,237,152	2,406,574,646	6,169,662,506	1,501,214,947	අවසන් වාර්තාව නිකුත් කර නැත

	විගණන නිරීක්ෂණ	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්වය
1	2021/2022 වර්ෂයේදී සේවක වෛද්‍ය දීමනා, උත්සව දීමනා සහ මරණ පාරිතෝෂික ලෙස පිළිවෙලින් රු.2,833,385 ක්, රු.16,905,960 ක් සහ රු.1,000,000 ක් ගෙවා තිබුණද, සේවක වෛද්‍ය ප්‍රතිලාභ සඳහා අනුමත රක්ෂණ ක්‍රමයක් 2023 පෙබරවාරි 15 දින වන විටත් හඳුන්වා දී නොතිබුණි.	2021/2022	ප්‍රතිලාභ ගෙවීමට අදාල රක්ෂණ යෝජනා ක්‍රමයක් අනුමත කරවා ගත යුතුය.	අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත ගෙවීම් සිදුකර ඇති අතර දිරි දීමනා සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමේ කටයුතු සිදු කරමින් පවතී.	ප්‍රතිලාභ ගෙවීමට අදාල රක්ෂණ යෝජනා ක්‍රමයක් අනුමත කරවා ගෙන නොමැති අතර භාණ්ඩාගාර අනුමැතියද ලබා ගෙන නොමැත.
2	2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි 9.8.2 ඡේදයට පටහැනිව සමාලෝචිත	2021/2022	චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූලව කටයුතු කළ යුතුය.	දිරි දීමනා සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමේ කටයුතු සිදු කරමින් පවතී.	දිරි දීමනා සඳහා භාණ්ඩාගාර අනුමැතිය මේ දක්වා ලබා ගෙන නොමැත.

	වර්ෂයේදී භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමකින් තොරව කර්ය මණ්ඩල දිරි දීමනා ලෙස රු. 9,978,207ක් ගෙවා තිබුණි.				
3	2015 මැයි 25 දිනැති අංක PED 1/2015 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය අනුව නිල වාහන සඳහා හිමිකම නොමැති ස්ථිර පදනමින් බඳවාගත් නිලධාරීන් 41 දෙනෙකුට මාසික ප්‍රවාහන දීමනා ලෙස රු.2,952,500ක මුදලක්ද කොන්ත්‍රාත් පදනම මත බඳවාගනු ලැබූ නිලධාරීන් 10 දෙනෙකුට රු.1,160,000ක මුදලක්ද ගෙවා තිබුණි.	2022/2023	චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය.	අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය මත ප්‍රවාහන දීමනාවක් ලබා දී ඇති අතර, ප්‍රතිපූර්ණ ක්‍රමවේදය සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලැබී ඇත.	රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කර තිබූ ප්‍රතිපූර්ණ ක්‍රමවේදය අනුගමනය කිරීමෙන් තොරව ප්‍රවාහන දීමනා ගෙවීම සිදු කර තිබුණි.
4	භාණ්ඩ හරවා යැවීම හේතුවෙන් ණයහිමි ශේෂය තුල ඇතුලත් රු.16,603,289ක හර ශේෂය වසර 5 කට අධික කාලයක් ගත වී තිබුණද, මේ දක්වාත් ගැලපීම් කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	2021/2022	ණය පියවීමේ දී ආපසු යැවුම් අඩු කර පියවීම් කල යුතු බව.	වැළක්වීමේ ක්‍රියාමාර්ග දන්වා නොමැත.	අත්තිකාරම් හා ආපසු යැවුම් වෙන් කර හඳුනාගෙන ගිණුම් ගත කර නොතිබුණි.

5	2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.5 ඡේදය අනුව එකතුව රු. 914,186,176 ක් වූ දේපල පිරියත හා උපකරණ සම්බන්ධයෙන් භෞතික සත්‍යාපනයක් සිදු කර නොතිබුණි.	2021/2022	චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූලව කටයුතු කළ යුතුය.	ඉදිරියට රාජ්‍ය ව්‍යාපාර චක්‍ර ලේඛනයට අනුව භෞතික සත්‍යාපනය සිදු කර ඒ අනුව පසු කටයුතු කිරීමට සැලසුම් කර ඇති බව.	නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

3.81 නාගරික සංවර්ධන අධිකාරිය

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	බදු පෙර ලාභය (අලාභය) රු.	මතය
2021	219,766,078,165	142,662,257,313	77,103,820,852	267,082,339	තත්ත්වාගණනය කළ
2022	-	-	-	-	මූලා ප්‍රකාශණ ලැබී නොමැත
2023	-	-	-	-	මූලා ප්‍රකාශණ ලැබී නොමැත

	විගණන නිරීක්ෂණ	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01 - මූලා ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ ප්‍රමිතියේ 15 පරිච්ඡේදයට පටහැනිව 2021 වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද මූලා ප්‍රකාශනවල තක්සේරු කරන ලද අගයන් ලෙස හෙළිදරව් කර තිබු රු. මිලියන 511,722 ක් වත්කම්වලට අදාල පිරිවැය පමණක් පොත්වලට ගෙන තිබූ අතර එම අගය රු.මිලියන 184,790 ක් විය .මේ නිසා ප්‍රමිත අවශ්‍යතාවය අනුව 2021 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූලා ප්‍රකාශනවල සඳහන් වත්කම්වල අගය සාධාරණ ලෙස	2021	ආයෝජිත දේපල සාධාරණ අගයට මූලා ප්‍රකාශනවල නිරූපනය කිරීමට කටයුතු කල යුතුය.	2022 වර්ෂයේ මූලා ප්‍රකාශනවල නිරූපණය කිරීමට කටයුතු කරනු ලැබේ.	නිරික්ෂණය තවදුරටත් එලෙසම පවතී.

	ඉදිරිපත් නොවන බව නිරීක්ෂණය විය.				
2	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01 - මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ ප්‍රමිතියේ ඡේද අංක 30 ට පටහැනිව අධිකාරිය පිහිට වූ 1979 වසරේ සිට 2021 වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා වූ කාලය තුළ විටින් විට ක්‍රියාත්මක කරන ලද සියළුම ව්‍යාපෘති සම්බන්ධයෙන් දරන ලද එකතුව රු.මිලියන 185,876.66 ක්වූ සංවර්ධන වියදම් අධිකාරියේ ලෙජරය තුල ගණුදෙනු මට්ටමෙන් වාර්තාකර පසුව මූල්‍ය ප්‍රකාශන මට්ටමේ දී කෙරීගෙන යන වැඩ, ආයෝජිත දේපල, ඉඩම් හා ගොඩනැගිලි, ගණුදෙනුකරුවන්ගේ ව්‍යාපෘති හා සම්පූර්ණ කළ නිවාස යනාදී වත්කම් අයිතම 5 ක් යටතේ ලෙජරයට පිටතින් සිදුකල ගණනය කිරීමක් හා වර්ගීකරණයක් තුලින් වාර්තාකර තිබුණි. මේ අනුව අධිකාරියේ සංවර්ධන වියදම්, ගණුදෙනු හා සිද්ධි මට්ටමේ වාර්තා කිරීමෙන් පසු වත්කම් ලෙස වර්ගීකරණය කොට හඳුනාගැනීම	2021	ගිණුම් ක්‍රමය යලි සමාලෝචනය කර නිවැරදිව වත්කම්, වගකීම්, ආදායම්, වියදම් නිරූපනය වන පරිදි ගිණුම් ක්‍රමය සකස් කල යුතුය.	2024 ගිණුම් වලට අදාළව ශේෂපත්‍රය සංශෝධනය කර ඉදිරිපත් කිරීමට කටයුතු සිදු කරනු ලබන බව දන්වමි.	නිරීක්ෂණය තවදුරටත් එලෙසම පවතී.

	සඳහා ලෙජරය සකස්කර නොතිබීම නිසා මෙකී වත්කම් අයිතම 05 යටතේ දැක්වෙන අගයන් සකස්වීම, සාමාන්‍ය ගිණුම්කරණ ක්‍රියාවලියට පටහැනි බව නිරීක්ෂණය විය.මේ නිසා එකී වත්කම් අයිතම 05 යටතේ දැක්වෙන අගයන්වල නිවැරදිතාවය පිළිබඳ විගණයේ දී සෑහීමකට පත්විය නොහැක.				
3	අධිකාරිය විසින් විගණනය වෙත ඉදිරිපත් කල විලම්භිත කුලී ආදායම් ගිණුමට අදාල උපලේඛණයෙහි ඇතුලත් දේපළ අතුරින් දේපල 162 ක් ආදායම් උත්පාදනය පිණිස යොදා ගත්තද එම දේපළ ආයෝජිත දේපළ ලෙස ගිණුම්ගත කර නොතිබුණි. එයින් දේපල 106 ක තක්සේරුගත වටිනාකම රු.මිලියන 2,997.92 ක් බව නිරික්ෂණය විය . තවද ඉතිරි දේපල 56 ක තක්සේරු වටිනාකම හඳුනාගෙන නොතිබුණි. එබැවින් ආයෝජිත දේපල වල අගයෙහි නිවැරදිතාවය විගණනයේ දී නිශ්චිතව තහවුරු කිරීම කල නොහැකි විය.	2021	ආයෝජිත දේපළ හඳුනාගැනීම හා ගිණුම් කිරිම නිවැරදිව සිදුකල යුතුය.	2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කරනු ඇත.	නිරික්ෂණය තවදුරටත් එලෙසම පවතී.

4	2020 දෙසැම්බර් 31 දිනට බලාත්මක වන පරිදි අධිකාරිය විසින් සකස්කර තිබූ දේපළ තක්සේරු වාර්තාවෙහි අන්තර්ගතකර තිබූ රු. මිලියන 59.16 ක වටිනාකම සහිත අක්කර 48 රූඩ් 02 පර්චස් 39.6 ක දේපළ 38 ක් මූල්‍ය ප්‍රකාශනවලට නොගෙන මඟහැරී තිබුණි.	2021	අධිකාරියට අයත් සියලු වත්කම් මූල්‍ය ප්‍රකාශන වලට ගැනීමට කටයුතු කල යුතුය.	වෙළඳපල අගයට ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ.	නිරීක්ෂණය තවදුරටත් එලෙසම පවතී.
5	අධිකාරිය සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලද ප්‍රාග්ධන දායකත්වය රු.මිලියන 1,257.55 ක් ලෙස ශ්‍රී ලංකා ජනරජ මූල්‍ය ප්‍රකාශනයන්හි දැක්වෙන අතර අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල එම අගය රු.මිලියන 100 පමණක් වුයෙන් ඒ අතර රු.මිලියන 1,157.55 ක වෙනසක් නිරීක්ෂණය විය.	2021	තොරතුරු තහවුරු කරගෙන නිවැරදි අගය මූල්‍ය ප්‍රකාශන වලට ගත යුතුය.	මහා භාණ්ඩාගාරය විසින් නාගරික සංවර්ධන අධිකාරියේ හිමිකම වෙනුවෙන් කරන ලද දායකත්වයක් ලෙස ගිණුම් ගත කිරීම සිදුකරන ලෙස දන්වා ඇත.	නිරීක්ෂණය තවදුරටත් එලෙසම පවතී.
6	කල්බදු උපලේඛනයේ කල්බදු දේපල 168 ට අදාල කල්බදු වටිනාකම රු.මිලියන 569.85 ක් වු නමුත් ඊට අදාලව වාර්ෂික ආදායම හෝ 2021 වර්ෂයේ අවසාන දිනට විලම්භිත කල්බදු වටිනාකම හෝ හඳුනාගෙන නොතිබුණි. තවද එම කල්බදු අවලංගු කර	2021	කල්බදු පදනමින් ලබාදී ඇති දේපළ සම්බන්ධයෙන් විස්තීරණ පරීක්ෂණයක් සිදුකල යුතුය.	මේ අතුරින් 141 කට අදාලව තොරතුරු දැනටමත් සොයාගෙන ඇති අතර දේපළ 27 කට අදාල තොරතුරු තවදුරටත් සොයාගත යුතුව පවතී.	නිරීක්ෂණය තවදුරටත් එලෙසම පවතී

	ඇත්ද යන්න පිළිබඳව හෝ කිසිදු තොරතුරක් විගණනය වෙත ඉදිරිපත් නොකරන ලදී.				
7	කොන්ත්‍රාත් පිරිවැය, වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම්, අත්තිකාරම් පියවා ගැනීම්, රඳවා ගැනීම්, රඳවා ගැනීම් නිරවුල් කිරීම් යනාදිය ඇතුලත් කොන්ත්‍රාත් ලේඛනයක් අධිකාරිය විසින් නඩත්තු නොකරන අතර ඒ අනුව මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු බිල්පත් වටිනාකම රු. මිලියන 10,319 ක් සහ ගෙවිය යුතු රඳවාගැනීම් රු.මිලියන 2,480 ක වටිනාකම් නිවැරදි බව තහවුරු කර ගැනීමට විගණනයේදී නොහැකි විය.	2021	පරිපූර්ණ විස්තර සහිත කොන්ත්‍රාත් ලේඛනයක් නඩත්තු කිරීමට කටයුතු කල යුතුය.	ඉදිරියේදී මේ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට බලාපොරොත්තු වේ.	නිරීක්ෂණය තවදුරටත් එලෙසම පවතී.
8	පන්නිපිටිය වීරමාවතේ පිහිටි නිවාස 500 කින් යුත් නිවාස යෝජනා ක්‍රමය A,B,C,D සහ E ලෙස කුළුණු 05 කින් සමන්විත වූ අතර මෙම නිවාස ව්‍යාපෘතියෙහි B කුළුණෙහි පිහිටි නිවාස 71 පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වෙත ඒ සඳහා කුලිය භාණ්ඩාණ්ඩාගාරයෙන් අයකර ගැනීමේ පදනම මත ලබා දී	2021	අදාල හිඟ මුදල් අයකර ගැනීමට වහා ක්‍රියාකල යුතුය.	වෙන්කර නොගත් හා ගිවිසුම්ගතව මේ වන තෙක් පදිංචි නොවූ නිවාස ඒකක විවෘත වෙළඳපොලේ අලෙවි කිරීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම සඳහා කැබිනට් පත්‍රිකාවක් යොමු කොට ඇත.	2024 සැප්තැම්බර් 30 වන විටත් හිඟ ජල ගාස්තුව,විදුලි ගාස්තු, ගෑස් හා කළමනාකරණ ගාස්තු වෙනුවෙන් එකතුව රු.මිලියන 17.9 ලැබිය යුතුව පැවතුණි.

	තිබුණි.කෙසේ නමුත් මෙම නිවාස ඒකක වෙනුවෙන් 2023 ඔක්තෝබර් 30 දිනට අධිකාරියට අයවිය යුතු ජල ගාස්තුව, විදුලි ගාස්තුව සහ කළමණාකරණ ගාස්තුවෙහි එකතුව රු. මිලියන 11.84 ක් විය.				
9	නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය යටතේ අඩු ආදායම්ලාභී පවුල් සඳහා ලබාදී තිබූ නිවාස ඒකක වලින් අධිකාරිය මාසිකව රු.3,000 ක් බැගින් වූ වාරිකයක් අයකරනු ලබන අතර 2023 දෙසැම්බර් 31 වන විට කුලී සහ ජල බිල්පත් වෙනුවෙන් එකතුව රු.මිලියන 170.48 ක් අයකර ගැනීමට අධිකාරිය අපොහොසත් වී තිබුණි.	2021	අදාල හිඟ මුදල් අයකර ගැනීමට වහා ක්‍රියාකල යුතුය.	ගෙවීම් සැලසුම් ලබාදීම් මඟින් හිඟ ජල ගාස්තු අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග මේ වන විටත් ගනිමින් පවතී.	2024 සැප්තැම්බර් 30 වන විට කුලී සහ ජල බිල්පත් වෙනුවෙන් එකතුව රු.මිලියන 1294 ක් අයකර ගැනීමට තිබුණි.
10	1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරියේ (සංශෝධන) පනත II කොටසේ 8 (අ)(i) වගන්තිය ප්‍රකාරව ප්‍රකාශිත බල ප්‍රදේශ 85 ක් සඳහා සංවර්ධන සැලසුම් 54ක් පමණක් පිළියෙල කර තිබුණි.	2021	සංවර්ධන සැලසුම් පිළියෙල කිරීමේ කටයුතු කඩිනම් කිරීම සඳහා කාල රාමුව යලි සමාලෝචනය කල යුතුය.	2030 වන විට ප්‍රකාශිත ප්‍රදේශ සඳහා සංවර්ධන සැලසුම් ගැසට් කිරීමට අපේක්ෂා කෙරේ.	සියලු ප්‍රකාශිත බල ප්‍රදේශ ආවරණය වන පරිදි සංවර්ධන සැලසුම් සකස් කර නොතිබුණි.
11	2021 නොවැම්බර් 16 දිනැති මුදල් අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කරන ලද මෙහෙයුම් අත්පොතේ	2021	පරිපාලිත සමාගම් සමාලෝචන ප්‍රතිපත්තිය සකස් කිරීමට කඩිනමින් කටයුතු කල යුතුය.	මේ වන විට පරිපාලිත සමාගම් සමාලෝචන ප්‍රතිපත්තිය සකස් කර ඉහල	නිරීක්ෂණය තවදුරටත් එලෙසම පවතී

	7.7 වගන්තිය ප්‍රකාරව පරිපාලිත සමාගම් වෙනුවෙන් සමාලෝචන ප්‍රතිපත්තිය සකස්කල යුතු වුවත් මෙම වාර්තාවේ දිනය දක්වාම අධිකාරිය සතු කිසිදු පරිපාලිතයක් වෙනුවෙන් මෙම ප්‍රතිපත්තිය සකස්කර නොතිබුණි.			කළමනාකාරීත්ව යේ නිරීක්ෂණ සඳහා යොමු කර ඇත.	
12	2006 වර්ෂයේ දී අධිකාරිය රු.මිලියන 345 ක් ආයෝජනය කර පිහිටුවා තිබෙන නාගරික සංවර්ධන සහ ආයෝජන (පෞද්ගලික) සමාගමෙන් හා 2010 වර්ෂයේ පරිපාලිතයක් ලෙස පිහිටුවා තිබෙන ලංකා රෙස්ට් හවුසස් සමාගමෙන් ආරම්භ කළ දින සිට කිසිදු ලාභාංශයක් අධිකාරිය වෙත ලැබී නොතිබුණි. තවද රු.මිලියන 236.81 ක් ආයෝජනය කර තිබූ වෝටර්ස් එජ් සමාගමෙන්ද කිසිදු ලාභාංශයක් 2021 වර්ෂය සඳහා අධිකාරිය වෙත ලැබී නොතිබුණි. 2021 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පරිපාලිතයන්ගේ සහ ආශ්‍රිත සමාගම්වල සිදුකර තිබූ සමස්ථ ආයෝජනයේ පිරිවැය රු.මිලියන 677ක් වී තිබූ නමුත් 2021	2021	අදාල ආයෝජන සඳහා ප්‍රමාණවත් ප්‍රතිලාභයක් ලබාගැනීමට හැකිවන පරිදි සමාගම් වලට පත්කරන අධ්‍යක්ෂ මණ්ඩලය හරහා බලපැමක් කල යුතුය.	ලාභාංශ නොලබන ආයතන සම්බන්ධයෙන් අධිකාරියේ කළමනාකරණය විසින් ඉදිරියේ දී සලකා බලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ඇත.	නිරික්ෂණය තවදුරටත් එලෙසම පවතී.

	වර්ෂයේ ලැබී තිබූ ලාභාංශ අදායම රු. 444,079 ක් පමණක් විය.මෙය මුළු ආයෝජනයේ ප්‍රතිශතයක් ලෙස සියයට 0.067කට සමාන අගයක් විය.				
13	මීතොටමුල්ල පුනර්ජීවන ව්‍යාපෘතිය යටතේ නාගරික උද්‍යානයක් ඉදිකිරිම වෙනුවෙන් 2017 වර්ෂයේ දී නායයාමකට ලක්වූ කසල කන්ද ස්ථායීකරණය කිරීම සඳහා බ්ලැන්කට් ලේයරයක් යෙදීම හා හරිතාගාර වායු විමෝචන ඒකක ස්ථාපනය කිරිමේ කොන්ත්‍රාත්තුව 2020 ජුනි 09 දින රු. මිලියන 269.5 කට පෞද්ගලික ආයතනයක් වෙත ලබාදී තිබුණි. කෙසේ නමුත් මෙම ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 441.74 ක් අධිකාරිය විසින් දරා තිබු නමුත් සැලසුම් කළ පරිදි උද්‍යානයක් ඉදිකර නොතිබූ අතර ස්ථායීකරණය කරන ලද කසල පිහිටි ස්ථානය වර්තමානය වන විට වල් බිහිවී අතහැර දමා තිබූ බව විගණනය විසින් සිදු කරන ලද භෞතික පරික්ෂාවේදී	2021	ඉඩම් අත්පත්කර ගැනීමේ කටයුතු කඩිනම්කර මෙම භූමිය ඵලදායී, ආර්ථික සහ පාරිසරික කටයුත්තකට යොදා ගැනීමට කටයුතු කල යුතුය.	ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 44 වන වගන්ති ප්‍රකාරව අත්පත් කර ගැනීමේ කටයුතු අවසන් කර නොමැති බැවින්, ආයෝජකයෙකු තෝරා ගැනීම සඳහා වන ක්‍රියාවලිය අවසන් කිරීමට නොහැකිව ඇත.	ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතු තවමත් අවසන් වී නොමැත.

	නිරීක්ෂණය විය. තවද මෙම ස්ථානයේ ස්ථාපිත කිරීමට සැලසුම්කරණ ලද අපජලය බැහැර කිරීමේ පද්ධතියෙන් වැඩ නිමකර තිබුනේ සියයට 30 ක් වන අතර වායු විමෝචන පද්ධතියෙන් වැඩ නිමකර ඇත්තේ සියයට 25 ක් පමණි.				
14	අධිකාරිය සතු කොළඹ කොටුව ඩී.ආර්.විජේවර්ධන මාවතට මායිම්ව පිහිටි අක්කර 2 රූඩ් 2 පර්චස් 21.4 ක ඉඩම ප්‍රසිද්ධ මිල කැඳවීමෙන් තොරව 2007 වසරේ සිට මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘති 46 වෙනුවෙන් ගිවිසුමකින් හෝ අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව සමාගමක් වෙත ලබාදී තිබුණි. පසුව 2009 අගෝස්තු 12 දින මේ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණු අතර 2010 පෙබරවාරි 18 දින අවබෝධතා ගිවිසුමක් මගින් වසර 30 ක දීර්ඝ කාලීන බදු පදනමට රු. මිලියන 1,300 කට තක්සේරුකර මෙම ඉඩමේ භුක්තියද අදාල සමාගම වෙත භාරදී තිබුණි. මේ සඳහා 2009 අගෝස්තු සිට	2021	අධිකාරියට සිදුවූ අලාභ සම්බන්ධ වගකිව යුතු පාර්ශවයන්ට එරෙහිව ක්‍රියාකල යුතු අතර අදාල ඉඩම ඵලදායි ආර්ථික කටයුත්තකට භාවිත කිරීමට කටයුතු කල යුතුය.	මේවන විට නීතිපති දෙපාර්තමේන්තු වේ උපදෙස් ලබාගැනීමට කටයුතු කර ඇත. නීතිපති දෙපාර්තමේන්තුව මගින් ලබාදෙන උපදෙස් අනුව ඉදිරි කටයුතු කරනු ඇත.	නිරීක්ෂණය තවදුරටත් එලෙසම පවතී

2013 සැප්තැම්බර් 25 දින දක්වා අවස්ථා 07 කදී රු. මිලියන 557 ක් පමණක් සමාගම විසින් බදු මුදල් ලෙස ගෙවා තිබුනද සමාගම සමඟ අත්සන් කළ අවබෝධතා ගිවිසුම පරිදි මෙම ඉඩමේ කිසිදු සංවර්ධන කටයුත්තක් සිදුකර නොතිබූ අතර රථගාලක් ලෙස යොදා ගනිමින් 2007 වසරේ සිටම ආදායම් උපයා තිබුණි. පසුව 2013 මාර්තු 25 දින අවබෝධතා ගිවිසුමක් අත්සන් කර තිබූ අතර එම ගිවිසුමට ද පටහැනිව උපයාගත් ආදායමින් අදාල ගෙවීම් අධිකාරිය වෙත නොගෙවා තිබියදීත් 2016 අගෝස්තු 12 දිනැති ප්‍රධාන තක්සේරුකරුගේ රු.මිලියන 3,620 ක තක්සේරු වටිනාකමට නැවත 2017 පෙබරවාරි 16 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත වසර 50 කට බදුදීමට මුල් සමාගමේ හිමිකරු සතු තවත් සමාගමක් සමඟ රු.මිලියන 3,352 කට එකඟවී ගිවිසුම් ගතවී තිබුණි. කෙසේ නමුත් සමාගම විසින් ගෙවන ලද රු. මිලියන 557 ක් සඳහා ආරෝපිත

	පොලියක් වූ රු.මිලියන 330 ක් ගෙවීමට අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ විධිමත් අනුමැතියකින් තොරව ආයෝජනකරු සමඟ එකඟවී ඇත. එමනිසා අධිකාරියට දැරීමට සිදුවූ එම අලාභය සම්බන්ධව වගකිව යුතු පාර්ශවය සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් මේ දක්වා ගෙන නොතිබුණි. කෙසේ නමුත් 2023 දෙසැම්බර් 30 දින දක්වාම කිසිදු සංවර්ධන කටයුත්තක්ද එම ඉඩමේ සිදුකර නොතිබූ බවද නිරීක්ෂණය විය.				
15	නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය යටතේ අඩු ආදායම්ලාභී නිවැසියන් සඳහා ඉදිකරන නිවාස සංකීර්ණවල ඔවුන් පදිංචි කිරිමේදී පදිංචි වි සිටි වතු 18 ක ඉඩම් නිදහස් විමක් සිදුවුවත් එයින් වතු ඉඩම් 06 කට අදාළ හෙක්ටයාර් 11.23 ක පමණ වු ඉඩම්වල අයිතිය අධිකාරිය වෙත මේ දක්වා පවරාගෙන නොතිබුණි. තවද නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය යටතේ 2021 වර්ෂය අවසාන	2021	අදාල ඉඩම්වල අයිතිය කඩිනමින් අධිකාරියට පවරා ගැනීමට සහධිපත්‍ය කළමනාකරණ සහතික කඩිනමින් ලබාගැනීමට කටයුතු කල යුතුය.	නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය ආරම්භ කිරීමත් සමඟ ඉදිකර ඇති සියළුම නිවාස යෝජනා ක්‍රමවලට අදාළ ඉඩම් පවරා ගැනීම ආරම්භ කර ඇත. ඉන් නිවාස ව්‍යාපෘති 14 ක් පිහිටි ඉඩම පවරාගෙන ඇතත්, නිවාස ව්‍යාපෘති 8 ක ඉඩම් පවරාගැනීම ප්‍රමාද වී ඇත	නිරීක්ෂණය තවදුරටත් එලෙසම පවතී

	වන විට ඉදිකරන ලද නිවාස සංකීර්ණ 22 ක් අතුරින් නිවාස යෝජනා ක්‍රම 08 කට අදාල ඉඩම් මෙම වාර්තාවේ දිනය දක්වා අධිකාරියට පවරාගෙන නොතිබුණි. තවද මෙම නිවාස සංකීර්ණ 22 අතුරින් නිවාස සංකීර්ණ 20 ක් සඳහා ම මෙම වාර්තාවේ දිනය දක්වා සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ සහතිකය ලබාගැනීමට නොහැකි වි තිබුණි.				
16	ඔටර්ස් ඇක්වටික් හා 80 සමාජශාලාව යන ආයතන දෙක පිහිටි හෙක්ටර්යාර් 1.8274 ක ගොඩනැගිලි සහිත ඉඩම් තුනක් අධිකාරිය විසින් පවරාගෙන සංවර්ධනය කර මහජනයාට විවෘත කළ යුතු බවට 2020 ඔක්තෝබර් 27 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. තවද එකී අමාත්‍ය මණ්ඩල අනුමැතියට අදාළ 2020 ඔක්තෝම්බර් 12 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා මුදල් අමාත්‍යතුමාගේ නිරික්ෂණ අනුව මෙකී සංදේශයට ඇමුණුම්කර තිබූ ඉඩම් වානිජමය කටයුත්තක්	2021	මෙම ආයතන දෙකම පිහිටි ඉඩම් හා ගොඩනැගිලි සුදුසු වානිජ කටයුත්තක් සඳහා යොදාගැනීමට හා කැබිනට් තීරණය පරිදි ක්‍රියා කල යුතුය.	80 සමාජ ශා◌ාලව සහ ඔටර්ස් සමාජ ශාලාව සංවර්ධන කටයුතු සඳහා සුදුසු ආයෝජකයෙකු තෝරා ගනු ලැබූ පසු එමගින් උත්පාදනය වන ආදායමෙන් නාගරික සංවර්ධන අධිකාරිය විසින් අදාළ ඉඩම් සංවර්ධනය කිරීමේ දී හා අත්පත් කර ගැනීමේ දී දරනු ලබන වියදම් අඩුකර ගැනීමෙන් පසුව ඉතිරිවන ශේෂය ඒකාබද්ධ අරමුදලට බැර	නිරික්ෂණය තවදුරටත් එලෙසම පවතී

	සඳහා යොදවා ගන්නේනම්, එමඟින් උත්පාදනය වන ආදායමෙන් නාගරික සංවර්ධන අධිකාරිය විසින් අදාළ ඉඩම් සංවර්ධන කිරීමේදී හා අත්පත් කර ගැනීමේදී දරනු ලැබූ වියදම් අඩුකර ගැනීමෙන් පසු වටිනාකම ඒකාබද්ධ අරමුදලට බැරකළ යුතු බව අවධාරණය කර තිබුනද අධිකාරියට මේ දක්වා මෙම ආයතන දෙකම පිහිටි ඉඩම් හා ගොඩනැගිලි සුදුසු වානිජ කටයුත්තක් සඳහා යොදාගැනීමට නොහැකි වී තිබුණි.			කිරීමට කටයුතු කරනු ලැබෙන බව දන්වා සිටිමි.	
17	විගණන වෙත ඉදිරිපත් කරන ලද ඉඩම් වන්දි ගෙවීම් උපලේඛනයට අනුව, අධිකාරිය විසින් පවරාගෙන තිබූ ඉඩම් අක්කර 66 රූඩ් 02 පර්චස් 25.5 ක ප්‍රමාණයක් සඳහා හිමිකරුවන් නිශ්චිතව හඳුනාගත නොහැකිව තිබුණු අතර ඒ වෙනුවෙන් වෙන් කරන ලද වන්දි ප්‍රමාණය රු. මිලියන 2,040.72 ක් හා පොලිය රු.මිලියන 493.83 ක් බව නිරීක්ෂණය විය. මෙම ශේෂ අතුරින් 1984 වර්ෂයේ සිට පැවත එන ශේෂද මේ අතර තිබුණි. හිමිකරුවන්	2021	මේ සම්බන්ධව අමාත්‍යාංශ ලේකම් මට්ටමින් මැදිහත් වි අදාල වන්දි පරික්ෂණ අවසන් කර වන්දි ගෙවීම් කටයුතු කඩිනම් කිරිම කළ යුතුය	වන්දි ලේඛනයේ සඳහන්ව ඇති දැනට අත්පත් කරගත් ඉඩම් සඳහා වන්දිලාභීන් නිශ්චිතව හදුනාගෙන නොමැති පාර්ශවයන් සම්බන්ධයෙන් අදාළ ප්‍රාදේශීය ලේකම්වරුන් දැනුවත් කිරීමට අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරනු ඇත.	නිරික්ෂණය තවදුරටත් එලෙසම පවතී

	හඳුනානොගැනීම හේතුවෙන් වන්දි ගෙවීමේ කටයුතු අවසන් වී නොමැති නිසා පොලිය ලෙස අමතර වැයබරක් අධිකාරියට දෛනිකව උපචිත වෙමින් පැවතුනි.				
18	කොළඹ පිටකොටුව වෙළඳ සංකීර්ණය (මැනිං මාර්කට්) පැලියගොඩ නැවත ස්ථාපනය කිරීම සඳහා අධිකාරිය විසින් 2016 වර්ෂයේදී රු. මිලියන 6,990 ක භාණ්ඩාගාර ප්‍රතිපාදන උපයෝජනය කර ඉදිකළ පැලියගොඩ වෙළඳ සංකීර්ණය 2020 වර්ෂයේ සැප්තැම්බර් වන විට වැඩ නිමකර තිබුණි. නමුත් 2022 ඔක්තෝබර් 31 වන විටත් එහි කඩකාමර 1,395 කින් කඩකාමර 417 ක් තවමත් වෙළඳුන් වෙත ලබා නොදීම නිසා එම කඩකාමර නිශ්කාර්යව පවතිනබව නිරීක්ෂණය විය.	2021	අදාල කඩකාමර සුදුසුකම් සපුරන ලද වෙළඳ මහතුන් වෙත ලබාදී අධිකාරියට ලැබෙන ආදායම් වැඩිකර කරගත යුතුය.	වෙළඳ කුටි / කඩ කාමර බැහැර කිරීමට අපේක්ෂා කරමි.	2024 ඔක්තෝබර් 31 වන විට කඩකාමර 1,467 ක් ලබාදී තිබුණි.
19	හම්බන්තොට සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මාගම් රුහුණුපුර ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව ඉදිකිරීමේදී එහි ප්‍රධාන ශ්‍රවනාගාරය, කොරියානු අන්තර්	2021	ව්‍යාපෘතියෙන් විකල්ප අදායම් උත්පාදන මාර්ග සොයා බැලිය යුතු අතර ගොඩනැගිලි හා සෙසු සම්පත්වල ආරක්ෂාවට	පුද්ගලික අංශය සමග කෙටිකාලින කළමනාකරණ ක්‍රමවේදයන් ක්‍රියාත්මක කිරීම තුලින් ආදායම වැඩිකර ගැනීමට බලාපොරොත්තු	නිරික්ෂණය තවදුරටත් එලෙසම පවතී

	ජාතික සහයෝගීතා ඒජන්සිය විසින් රු.මිලියන 851.2ක් ද ශ්‍රවනාගාරයේ අනෙකුත් ඉදිකිරීම් සඳහා රු.මිලියන 3.83 ක් රජයේ අරමුදල් වලින් වැය කර තිබුණි. ඊට අමතරව මෙය පවත්වා ගෙන යාමට අයභාර වියදම් ලෙස වර්ෂ 2017 සිට 2021 දක්වා පමණක් රු.මිලියන 110.53 ක් අධිකාරිය විසින් වැයකර තිබූ නමුත් එම ව්‍යාපෘතියෙන් එම කාලපරිච්ඡේදයට අදාළව ආදායම ලෙස උපයා තිබුණේ රු. මිලියන 20.63 ක් පමණි. මෙම මධ්‍යස්ථානය පවත්වාගෙන යාම සඳහා අධිකාරිය සහ පුද්ගලික අංශය එකාබද්ධව සිදු කිරීමට බලාපොරොත්තු වන කටයුතු මේ දක්වා සාර්ථක වී නොතිබුණි.		ක්‍රියාමාර්ග ගත යුතුය.	වේ.	
20	එවකට පැවති මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ 2016 වර්ෂයේ දී ක්‍රියාත්මක වූ “සුබිත පුරවර” නගර සංවර්ධන ව්‍යාපෘතියෙහි එක් අදියරයක් වූ කොන්ත්‍රාත් වටිනාකම රු. මිලියන 269.12 ක්	2021	අපේක්ෂිත අරමුණුට භාවිත කිරීමට හැකිවන පරිදි ඉදිකිරීම් කටයුතු අවසන් කර ගොඩනැගිලි කුලියට ලබාදී අධිකාරියේ ආදායම් මාර්ග වැඩිකර ගැනීමට අවධානය යොමුකල යුතුය.	ගොඩනැගිල්ල ප්‍රසස්ථ භාවිතය සම්බන්ධයෙන් රාජ්‍ය පුද්ගලික හවුල්කාරිත්ව සහායෝගිතා පදනම මත සුදුසු ආයෝජකයෙකු හඳුනාගෙන ක්‍රියාත්මක කිරීම සම්බණ්ධයෙන් සලකා බැලීම	නිරික්ෂණය තවදුරටත් එලෙසම පවතී

	වූ මහල් 05කින් සමන්විත වර්ග මීටර් 8,032.9 පමණ ඉඩකඩකින් යුතු මහර පරිපාලන හා වානිජ සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු අධිකාරිය විසින් 2017 දී ආරම්භ කර 2019 සැප්තැම්බර් 30 දින වැඩ අවසන් කර තිබුණි. 2024 ජනවාරි 30 දින වනවිට වර්ග මීටර් 1,164.9 ක් පමණක් විවිධ රජයේ ආයතන හා සමාජ සංවිධාන විසින් භාවිත කරමින් පැවති අතර එම ආයතන සමඟ ගිවිසුමකට එළඹ නොතිබුණි. තවද වර්තමානය වන විට ගොඩනැගිල්ලේ ස්ථාපිත විදුලි සෝපාන යන්ත්‍ර දෙකද ක්‍රියා විරහිත වී තිබූ අතර ආසන 428 ක් සහිත සියලු පහසුකම් වලින් සමන්විත ශ්‍රවනාගාරයද ප්‍රයෝජනයට නොගෙන වසා දමා තිබුණි.			කෙරෙහි මේ වන විට අවධානය යොමු වී ඇත.	
21	2021 වර්ෂයේ සැප්තැම්බර් මාසයේදී වැඩ අවසන් කර තිබූ නිවාස ඒකක 608 කින් සමන්විත ඔවල් විව් නිවාස ව්‍යාපෘතියෙහි නිවාසලාභීන් සහ 2018 වැඩ අවසන් කර තිබූ නිවාස ඒකක 500 කින් සමන්විත අංගොඩ ලේක් ක්‍රිස්ට් නිවාස	2021	අදාල ව්‍යාපෘතියේ ඔප්පු ප්‍රදානය සම්බන්ධ කටයුතු කඩිනම් කර අවසන් කිරීමට කටයුතු කල යුතුය.	2024 වර්ෂයේ ජනවාරි මස සිට නිවැසියන් වෙත නීත්‍යානුකූල අයිතිය පැවරීමට කටයුතු කරමින් පවති.	2024 ඔක්තෝබර් 31 වන විට ඔවල් විව් නිවැසියන් වෙත නිවාසවල නීත්‍යානුකූල ඔප්පු 298 ක් ලබාදී තිබුණු අතර අංගොඩ ලේක් ක්‍රිස්ට් හි නිවැසියන් වෙත

	ව්‍යාපෘතියෙහි නිවාසලාභීන් විසින් පිළිවෙලින් රු. මිලියන 5,858.40 ක් සහ රු.මිලියන 1,880.02 ක මුදලක් අධිකාරිය වෙත ගෙවා තිබුණි. කෙසේ නමුත් ඕවල් විව් ව්‍යාපෘතියේ නිවැසියන් වෙත නිවාසවල නීත්‍යානුකූල ඔප්පු ලබාදී ඇති නිවාස ගණන 276 ක් වූ අතර අංගොඩ නිවාස ව්‍යාපෘතියේදී මේ වන විට ලබාදී ඇති ඔප්පු ගණන 61ක් පමණි.				නීත්‍යානුකූල ඔප්පු 165 ක් ලබාදී තිබුණි.
22	පන්නිපිටිය වීරමාවතේ පිහිටි නිවාස 500 කින් යුත් නිවාස යෝජනා ක්‍රමය ඉදිකිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය පත්කළ ප්‍රසම්පාදන කමිටුවක් මඟින් තෝරා ගන්නා ලද කොන්ත්‍රාත් සමාගමක් වෙත 2017 ජුනි 15 දින කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. මෙම ව්‍යාපෘතියේ වැඩ අවසන් කළ යුතු දිනය 2019 දෙසැම්බර් 31 දින වූ නමුත් එම කාලය තුළ වැඩ අවසන් කිරීමට නොහැකිවීම හේතුවෙන් එම කාලය 2022 සැප්තැම්බර් 29 දක්වා කාලය දිර්ස කර තිබුණි . මෙම නිවාස ඒකක 500න් ආරක්ෂක අමාත්‍යාංශය	2021	ව්‍යාපෘතියේ වැඩ අවසන්කර නිවාස කඩිනමින් නිවාස ලාභීන් වෙතට ලබාදිය යුතු අතර ඉතිරි නිවාස විකිණීමට කටයුතු කර ආදායම් මාර්ග වැඩිකර ගත යුතුය.	ආරක්‍ෂක අමාත්‍යාංශය හා නාවික හමුදාව විසින් පෙර විකුණුම් ක්‍රමය යටතේ රු.මිලියන 4,414.37 ක් ගෙවා වෙන්කරගන්නා A කුළුණේ ඉදිකිරීම් කටයුතු මේ වන විටත් සිදුකරමින් පවතී.	2024 ඔක්තෝබර් 31 වන විට ආරක්ෂක අමාත්‍යාංශයෙන් රු.මිලියන 676.7 ක් සහ නාවික හමුදාවේ රු.මිලියන 627.89 ක් ලැබී තිබුණ අතර ව්‍යාපෘතියේ වැඩ අවසන් කර නොතිබුණි.

	සහ නාවික හමුදාව වෙත නිවාස ඒකක 101 ක්ද ,පෙර විකුණුම් ක්‍රමය යටතේ විකුණන ලද නිවාස ඒකක 202 ක්ද වූ අතර ඉතිරි නිවාස 197 කිසිදු පෙර විකුණුම් සිදු කිරීමකින් තොරව ඉදිකිරීම් කටයුතු සිදුකරමින් තිබුණි. ආරක්ෂක අමාත්‍යාංශය සහ නාවික හමුදාව විසින් රු. මිලියන 1,011. 79 ක් හා පෙර විකුණුම් ක්‍රමය යටතේ මිලදී ගත් නිවාස සඳහා රු.මිලියන 2,176.84 ක් වශයෙන් එකතුව රු.මිලියන 3,188. 63ක මුදලක් අධිකාරිය වෙත ලැබී තිබූ නමුත් 2023 දෙසැම්බර් වන විටත් එම නිවාසවල වැඩ අවසන්කර නිවාස ලාභීන්ට භාරදී නොතිබුණි.				
23	කොළඹ කොටුව ට්‍රාන්ස්වර්ක් චතුරශ්‍ර ඉඩම රු.මිලියන 4,999.7 කට දේශීයව ස්ථාපිත විදේශීය පෞද්ගලික සමාගමක් වෙත මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා බදු ගිවිසුම 04 ක් මඟින් බදු දී තිබුණි. කෙසේ නමුත් මෙම වාර්තාවේ දිනට මෙම ව්‍යාපෘතිය නිමවී නොතිබූ අතර ව්‍යාපෘතියේ පළමු	2021	මේ සම්බන්ධ විධිමත් පරීක්ෂණයක් කළමනාකරණ මට්ටමින් සිදුකල යුතුය.	සංවර්ධන ව්‍යාපෘතිය අවසන් වන තෙක් එම වටිනාකම අයකරගත නොහැක.	නිරීක්ෂණය තවදුරටත් එලෙසම පවතී

	අදියර යටතේ අපේක්ෂිත සම්පූර්ණ මහල් 81 කින් සමන්විත වූ ගොඩනැගිල්ලෙන් මහල් 60 ක් සඳහා ගොඩනැගිලි සැකිල්ල පමණක් ඉදිකර තිබුණි. මෙම ප්‍රමාදය හේතුවෙන් නැවත ගිවිසුම්ගත වූ 2018 ජූලි 04 දිනට වූ වෙළඳපොල වටිනාකමත් පූර්ව කල්බදු වටිනාකමත් අතර වෙනස වූ රු.මිලියන 1,290.04 ක් මෙම ව්‍යාපෘතිය අවසන් නොවීම හේතුවෙන් අයකර ගැනීමට නොහැකිව තිබු බව නිරික්ෂණය විය.				
24	අධිකාරිය විසින් 2021 වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන 2021 පෙබරවාරි 28 දින වන විට විගණන වෙත ඉදිරිපත් කල යුතු වුවත් ඉදිරිපත් කරන ලද්දේ 2023 ජනවාරි 10 දින වන බැවින් අවුරුදු 02කට ආසන්න ප්‍රමාදයක් නිරීක්ෂණය විය.	2021	ගණන්දීමේ වගකීම කාලීනව ඉටුකිරීම සඳහා මූල්‍ය ප්‍රකාශන නියමිත කාල රාමුව තුල ඉදිරිපත් කල යුතුය.	අදහස් දක්වා නොමැත	2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනද මේ වන තෙක් ඉදිරිපත් කර නොමැත.

3.82 ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	423,002,000,000	777,598,000,000	(354,596,000,000)	(81,816,000,000)	තත්ත්වාගණනය කළ
2022	493,901,000,000	580,633,000,000	(86,732,000,000)	(617,589,000,000)	තත්ත්වාගණනය කළ
2023	311,436,000,000	277,965,000,000	33,471,000,000	120,310,000,000	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්වය
1	2013 ඔක්තෝබර් 29 දිනැති අංක 38/1140 දරන, අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට අනුව සංස්ථාව සතු බෙදුම්කරුවන් විසින් ක්‍රියාත්මක කරන (CODO) පිරවුම්හල්වලින් සහ භාණ්ඩාගාරය සතු බෙදුම්කරුවන් විසින් ක්‍රියාත්මක කරන (TODO)පිරවුම්හල් වලින් මාසික උපයෝගීතා ගාස්තුවක් (MUF) අය කිරීමට 2014 ජනවාරි 01 දින සිට බල පැවැත්වෙන පරිදි අනුමැතිය ලබා දී තිබුණි. නමුත් මෙම තීරණය සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කර	2021, 2022, 2023	අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ප්‍රමාදයකින් තොරව ක්‍රියාත්මක කල යුතුයි. වගකිවයුතු පාර්ශවයන්ගෙන් ආදායම් අහිමිවීම අයකර ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය.	2014 සිට 2023 නොවැම්බර් දක්වා මාසික උපයෝගිතා ගාස්තුව (MUF) මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කර ඇති අතර අධිකරණය විසින් 2023 දෙසැම්බර් මාසයේදී ලබා දී ඇති අතුරු නියෝගය හේතුවෙන් අයකර ගැනීම් නැවතී ඇත. එබැවින්, අලෙවි නියෝජිතයින්ගෙන් එකතු කළ යුතු MUF ණය ගැතියන්ගෙන් ලැබිය යුතු මුදල්	මෙම කාරණය විගණනය විසින් 2015 වර්ෂයේ සිට පෙන්වා දී තිබුණු නමුත් අධ්‍යක්ෂ මණ්ඩල තීරණය ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. 2023 දෙසැම්බර් මාසයේදී ලබා දී ඇති අතුරු නියෝගය අධිකරණය විසින් 2024 මාර්තු මාසයේදි ඉවත් කර තිබුණද 2024 ඔක්තෝබර් 15 වන දින වන විටත් අධ්‍යක්ෂ මණ්ඩල තීරණය සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කර නොතිබුණි.

	නොතිබුණු අතර (CODO) සහ (TODO) පිරවුම්හල් වලින් 11 දෙනෙකුගෙන් පමණක් මාසික උපයෝගීතා ගාස්තුව අයකරගෙන තිබුණි. ඒ අනුව 2023 වර්ෂය අවසන් වන දිනට අයකර නොගත් MUF මුදල රු.මිලියන 4,848 ක් දක්වා වර්ධනය වී තිබුණි.			ලෙස ඇතුළත් වේ. ලැබිය යුතු මුදල් එකතු කිරීම අධිකරණයේ තීරණය මත සිදු කෙරේ.	
2	2019 ජූලි 30 දිනැති අංක 05/1231 දරන අධ්‍යක්ෂක මණ්ඩලයේ තීරණය ප්‍රකාරව අලෙවි නියෝජිතයින්ගේ කොමිස් මුදල් ගෙවීමේ ඉහළ සීමාව නොසලකා හරිමින් අලෙවි නියෝජිතයින් හට කොමිස් මුදල් ගෙවා තිබුණි. 2023.12.31 දිනට එලෙස වැඩිපුර ගෙවූ අලෙවි නියෝජිත කොමිස් මුදල (පෙට්‍රල් සහ ඩීසල්) රු.මිලියන 26,306 ක් වී තිබුණි.	2021, 2022, 2023	අධ්‍යක්ෂ මණ්ඩල තීරණය ක්‍රියාත්මක කිරීමට වහා පියවර ගත යුතු අතර වැඩිපුර ගෙවූ කොමිස් මුදල සම්පූර්ණයෙන් අයකර ගත යුතුය.	අලෙවි නියෝජිතයන් විසින් 2019 ජූලි 30 දිනැති අංක 05/1231 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණයේ පනවා ඇති සීමාවන් ක්‍රියාත්මක කිරීම හා වැඩිපුර ගෙවූ කොමිස් මුදල අයකර ගැනීම සඳහා නිකුත් කර ඇති චක්‍රලේඛයට එරෙහිව අලෙවි නියෝජිතයන් විසින් අධිකරණයේ නඩුවක් ගොනු කර ඇත. 2022.03.10 දිනැති චක්‍රලේඛයට එරෙහිව කොමිස් අනුපාතය වෙනස් කිරීම සහ අතිරික්ත කොමිස් මුදල්	අධ්‍යක්ෂ මණ්ඩල තීරණය ප්‍රකාරව කටයුතු නොකිරීම සම්බන්ධයෙන් ඊට වගකිවයුතු පාර්ශවයන්ට එරෙහිව අවශ්‍ය ක්‍රියා මාර්ග ගෙන නොතිබුණු අතර ඉන්ධන මිල සූත්‍රය සකස් කිරීමේදී ද අධ්‍යක්ෂක මණ්ඩල තීරණයට අදාළවන අලෙවි නියෝජිතයින්ගේ කොමිස් මුදල් ගෙවීමේ ඉහළ සීමාව පිළිබඳ අවධානය යොමු කිරීමකින් තොරව සියයට 3 අදාළ කර ගෙන තිබුණි. මේ හේතුව නිසා 2021 වර්ෂය සඳහා රු. මිලියන 56 ක්ව පැවති වැඩිපුර ගෙවූ අලෙවි නියෝජිත

				අයකර ගැනීම වළක්වාලමින් අධිකරණය විසින් 2022 ජූලි මාසයේ අතුරු නියෝගයක් නිකුත් කර ඇති අතර එය ඉවත් කරන තෙක් හෝ අවසන් තීන්දුව ලබා දෙන තෙක් එම නඩුවට පෙර පැවති ක්‍රමයම පවත්වාගෙන යනු ලැබේ.	කොමිස් මුදල 2022 වර්ෂයේදී රු.මිලියන 11,376ක් ද, 2023 වර්ෂයේදී දී රු . මිලියන 14,874 ක් දක්වා ද ඉහල ගොස් තිබුණි.
3	පොදු පරිශීලක පහසුකම් සම්බන්ධයෙන් පහත සඳහන් ගැටළු නිවැරදි කිරීමට සංස්ථාව කඩිනම් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.				
i.	පොදු පරිශීලක පහසුකම් කොටස් හිමියන්ගේ ගිවිසුම 2008 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වී තිබුණද, ආයතන සඳහා පාලන ක්‍රියාපටිපාටි සහ පර්යන්ත ගාස්තු සහ ස්ලැබ් ගාස්තු ඇතුළු ප්‍රවාහන වියදම් තීරණය කිරීම සඳහා භාවිතා කරන මිල සූත්‍රය ඇතුළුව එම ගිවිසුම යටතේ ආවරණය වන පොදු පරිශීලක පහසුකම් ගිවිසුම අදාළ සියළු පාර්ශවයන්ගේ එකඟතාවය ඇතිව	2021, 2022, 2023	සම්බන්ධිත සියලු පාර්ශ්වයන්ගේ සහයෝගයෙන් ප්‍රමාදයකින් තොරව ගිවිසුමකට එළඹිය යුතුය.	CPSTL ආයතනය 2019 වසරේ සිට (වසර 5 ක කාලයක සිට) LIOC ආයතනය සමඟ කිසිදු ගිවිසුමක් අත්සන් කර නොමැත.	2024 ඔක්තෝබර් 15 දින වන විටත් සියළුම පාර්ශවයන්ගේ එකඟතාවය ඇතිව පොදු පරිශීලක පහසුකම් සඳහා ගිවිසුම් ගත වී නොතිබුණි.

	සංශෝධනය කර නොතිබුණි.				
ii.	එබැවින් සංස්ථාව සහ CPSTL අතර පවත්නා නියමයන් සහ කොන්දේසි LIOC විසින් ප්‍රතික්ෂේප කරන ඕනෑම අවස්ථාවක යම් අහිතකර තත්වයන් සහ පිරිවැය කෙරෙහි යම් බලපෑමක් සංස්ථාව විසින් දැරිය යුතු බව නිරීක්ෂණය විය.	2021, 2022, 2023	-එම-	CPSTL ආයතනය විසින් LIOC ආයතනය සමඟ එකඟ වූ කිසිදු කොන්දේසියක් සම්බන්ධයෙන් සංස්ථාව වෙත කිසිදු බලපෑමක් සිදු නොවිය යුතු බවට සහතික විය යුතුය.	අවදානම කළමනාකරණය කිරීම සඳහා 2024 ඔක්තෝබර් 15 දින වන විටත් සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.
iii.	පසුගිය වර්ෂ 13 ක කාලය වෙනුවෙන් ගබඩා සහ පර්යන්ත පහසුකම් සැපයීමේ මෙහෙයුම් ගාස්තු ලෙස රු.මිලියන 51,459 ක මුදලක් CPSTL විසින් අයකර තිබුණත්, නව යටිතල පහසුකම් සැලසුම් කිරීමට සහ සංවර්ධනය කිරීමට සහ පවතින පහසුකම් කඩිනමින් නඩත්තු කිරීමට CPSTL ආයතනය විසින් ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස නල මාර්ගයේ සහ ගබඩා පද්ධතියේ පවතින අකාර්යක්ෂමතාවයන් හේතුවෙන් ඇති වන ලද ප්‍රමාද ගාස්තු සංස්ථාවට දැරීමට සිදුව තිබුණි.	2021, 2022, 2023	CPSTL වෙත මාරු කරන ලද අරමුදල් අපේක්ෂිත අරමුණු සඳහා භාවිතා කරන බව සහතික කිරීමට සහ සංස්ථාවට සහ සමස්තයක් ලෙස රටට වන පිරිවැය අවම කිරීම සඳහා කළමණාකාරීත්වය විසින් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය.	මේ වන විට CPC අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2013 වසරේ අත්සන් කරන ලද ගිවිසුම්වල ඇතැම් වගන්ති සමාලෝචනය කර නව ගිවිසුමක් අත්සන් කිරීමට අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව CPSTL සමාගමට ප්‍රමාද ගාස්තු සම්බන්ධයෙන් යම් වගකීමක් තිබේ නම්, එම පිරිවැය අයකර ගැනීමට ප්‍රතිපාදන සලසමින් නව ගිවිසුම සකස් කර ඇත.	CPSTL සමාගමට ප්‍රමාද ගාස්තු සම්බන්ධයෙන් යම් වගකීමක් තිබේ නම්, එම පිරිවැය අයකර ගැනීමට ප්‍රතිපාදන සලසමින් නව ගිවිසුමකට 2024 ඔක්තෝබර් 15 දින වන විටත් එළඹී නොතිබුණි.

4	2007 සිට 2009 දක්වා කාලය තුල තෙල් ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් සිදු වූ හෙජින් ගනුදෙනුවලට අදාළව, 2023 දෙසැම්බර් 31 දිනට රටට සිදු වූ මුළු පාඩුව රු.මිලියන 14,028 ක් විය. තවද, පෞද්ගලික බැංකුවක් විසින් ඇ.එ.ජ.ඩොලර් 8,648,300 ක මුදලක් ඉල්ලා සංස්ථාවට එරෙහිව කොළඹ වාණිජ මහාධිකරණයේ නඩුවක් ද ගොනු කර තිබුණි.	2021, 2022, 2023	ගැටළුව නිරාකරණය සඳහා කඩිනමින් පියවර ගත යුතුය	වාර්තාවේ සඳහන් පරිදි අදාල පෞද්ගලික බැංකුව වාණිජ මහාධිකරණයේ නඩුවක් ගොනු කර ඇති අතර සංස්ථාව විසින් ඉහත නඩුකටයුත්තට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයේ මූලික විරෝධතාවක් ගොනු කර ඇත. එහි තීන්දුව දැනට ප්‍රකාශ කර නොමැත.	2024 ඔක්තෝබර් 15 දින වන විටත් ගැටළුව නිරාකරණය කර නොතිබුණි.
5	දැනට පවතින සපුගස්කන්ද තෙල් පිරිපහදුව මූලික මට්ටමේ පිරිපහදුවක් වන අතර එහි නිෂ්පාදන වෙළඳපොළට සැපයීම පිරිවැය ඵලදායී ආකාරයෙන් සිදු කිරීම සඳහා යෝජිත සපුගස්කන්ද තෙල් පිරිපහදුව පුළුල් කිරීමේ හා නවීකරණය කිරීමේ (SOREM) ව්‍යාපෘතිය හෝ විකල්ප ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි. එකී අරමුණ සඳහා රු.මිලියන 1,003 ක පිරිවැයකට අත්පත් කර ගත් ඉඩම මෙම	2021, 2022, 2023	දැනට පවතින පිරිපහදුව වැඩි දියුණු කර අඩුම මිලට රටේ ඉල්ලුම සපුරාලීම සඳහා නව පිරිපහදුවක් ඉදිකිරීමට අවධානය යොමු කළ යුතුය.	SOREM ව්‍යාපෘතියට ආයෝජකයෙකු තෝරා ගැනීම සඳහා යෝජනා සඳහා ඉල්ලීම් (RFP) කැඳවීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දී නොමැති අතර ව්‍යාපෘතිය අත්හිටුවා ඇත. 2024 මාර්තු 07 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 24/0490/621/30 මගින් සපුගස්කන්ද තෙල් පිරිපහදුව ඛනිජ තෙල් නීතිගත	2024 ඔක්තෝබර් 15 දින වන විටත් නව පිරිපහදුවක් ඉදිකිරීමේ කටයුතු ආරම්භ කර නොතිබුණු අතර මිලදී ගන්නා ලද ඉඩම ද නිෂ්කාර්යව පැවතුණි.

	වාර්තාවේ දිනය දක්වාම නිශ්කාර්යව පැවතුණි.			සංස්ථාවෙන් වෙන් වූ රජය සතු ව්‍යවසායයක් ලෙස ස්ථාපිත කිරීමට අමාත්‍ය මණ්ඩලය ප්‍රතිපත්තිමය අනුමැතිය ලබා දී ඇත. මීට අමතරව සපුගස්කන්ද තෙල් පිරිපහදුවේ යටිතල පහසුකම් තවදුරටත් සංවර්ධනය කිරීම වෙනුවට සුදුසු උපායමාර්ගික සහකරුවෙකු සම්බන්ධ කර ගනිමින් ත්‍රිකුණාමලය ප්‍රදේශයේ නව පිරිපහදුවක් පිහිටුවීමේ හැකියාව සොයා බලන ලෙස අමාත්‍ය මණ්ඩලය උපදෙස් දී ඇත.	
6	2005 දී නිකුත් කරන ලද SAP ERP පද්ධතියේ ආරම්භක අනුවාදය සංස්ථාව විසින් යාවත්කාලින කිරීමකින් තොරව 2010 අප්‍රේල් 01 දින සිට භාවිතා කරමින් පැවතුණි.	2021, 2022, 2023	SAP පද්ධතිය වැඩිදියුණු කිරීමට කඩිනම් පියවර ගත යුතුය.	ERP පද්ධතිය "SAP 4 HANA Rise" අනුවාදයට යාවත්කාලීන කිරීමට මෙහෙයුම් කමිටුව විසින් තීරණයක් ගන්නා ලදී. මෙම යාවත්කාලීන කිරීම සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින්	2024 ඔක්තෝබර් 15 දින වන විටත් SAP පද්ධතිය වැඩිදියුණු කර නොතිබුණි.

				අනුමත කරන ලදී. CPSTL සමාගම ලංසු කැඳවීම සඳහා ලංසු ලේඛන සකස් කරමින් සිටී.	
7	2012 සිට 2018 දක්වා කාලය තුළ ප්‍රමාද වී භාර දීම/අඩුවෙන් පැටවීම/ පිළිගත නොහැකි ගුණාත්මකභාවය සහ මිල වෙනස්කම් හේතුවෙන් සිදුවන පාඩු සඳහා දඩ මුදල් ලෙස ඩොලර් මිලියන 4.39ට සමාන රුපියල් මිලියන 1,443 ක දඩ මුදලක් සැපයුම්කරුවන්ගෙන් අය කර ගතයුතු නමුත් වර්ෂ 06 ක කාලයක් ගතවී ඇතත් සංස්ථාව විසින් එම මුදල් අය කර ගැනීමට අපොහොසත් වී තිබුණි.	2021, 2022, 2023	හිඟ ශේෂයන් එකතු කිරීමට හෝ ගෙවිය යුතු මුදල්වලට එරෙහිව පියවීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය.	එක් එක් සැපයුම්කරු සඳහා කොන්ත්‍රාත්තුවේ/ ටෙන්ඩරයේ නියම කර ඇති පරිදි නියමිත කාල රාමුව තුළ අදාළ හර සටහන් යවා ඇති අතර සංස්ථාව විසින් පසුවිපරම් කර ඇත. ඊට ප්‍රතිචාර වශයෙන් ඔවුන් විසින් ගෙවිය යුතු දඩ මුදල ඔවුන්ගේ ප්‍රමාද හිමිකම් වලට එරෙහිව පියවන ලෙස දැනුම් දෙන ලදී. මේ වන විට සංස්ථාවේ ප්‍රමාද කමිටුව (Demurrage Committee) විසින් ප්‍රමාද හිමිකම් ඉල්ලීම් ඇගයීමට ලක් කරමින් පවතින අතර නීතිපතිවරයාගේ මතය අනුව නඩු කටයුතු ආරම්භ කිරීමට පෙර	2024 ඔක්තෝබර් 15 දින වන විටත් හිඟ ශේෂයන් අය කර ගෙන නොතිබුණි.

				අදාළ පාර්ශවයන් සමඟ සාකච්ඡා ආරම්භ කර ඇත.	
8	සංස්ථාව විසින් ප්‍රතික්ෂේප කරන ලද නැව්ගත භාණ්ඩ තොගය මුදා හැරීමට පෙර රු.මිලියන 648ක නිෂ්පාදන බද්ද ද ඇතුළත්ව රු.මිලියන 1,617ක් තීරුබදු සහ බදු වෙනුවෙන් ගෙවා තිබුණු නමුත් සංස්ථාව විසින් 2017 ජනවාරි මාසයේ සිට සිදු කරන ලද ගෙවීම් වලින් එම මුදල අය කර ගැනීමට හෝ පියවා ගැනීමට අපොහොසත් වී තිබුණි.	2021, 2022, 2023	එම මුදල් අයකර ගැනීමට හෝ සමථයකට පත් කිරීමට කටයුතු කළ යුතුයි.	සංස්ථාව විසින් මුදල් ආපසු අයකර ගැනීමේ අයදුම්පතක් (refund application) ශ්‍රී ලංකා රේගුව වෙත ඉදිරිපත් කර ඇතත් රේගුවෙන් තවමත් ප්‍රතිචාරයක් ලැබී නොමැත.	2024 ඔක්තෝබර් 15 දින වන විටත් මුදල් අයවී හෝ සමථයකට පත් වී නොතිබුණි.
9	1930 දී ඉදිකරන ලද තෙල් ටැංකි 100 කින් සමන්විත වූ ත්‍රිකුණාමලයේ ටැංකි සංකීර්ණය 1964 අප්‍රේල් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි බ්‍රිතාන්‍ය රජයෙන් අත්පත් කර ගෙන තිබුණි. ඒ අනුව ශ්‍රී ලංකා රජය විසින් තෙල් ටැංකි සංකීර්ණය සංවර්ධනය කර භාවිතයට පියවර කිහිපයක් ගෙන තිබුණද, 2021 වසර දක්වා එම පියවරයන් සාක්ෂාත් කර ගැනීමට රජය අපොහොසත් වි	2022, 2023	සමාගම පිහිටුවීමේ අරමුණු ළගා කර ගැනීමට කඩිනමින් පියවර ගත යුතුය.	සංස්ථාවේ අරමුදල් භාවිතා කරමින් තෙල් ටැංකි 24 ක් සංවර්ධනය කිරීමට පියවර ගෙන ඇති අතර Trinco Petroleum Terminal (Pvt) Ltd සමාගම විසින් ඉතිරි ටැංකි 61 සංවර්ධනය කිරීම සඳහා කටයුතු සිදුකරමින් පවතී.	2024 ඔක්තෝබර් 15 දින වන විට Trinco Petroleum Terminal (Pvt) Ltd සමාගම විසින් ජාත්‍යන්තරව අභිලාෂ කැඳවීමක් (EOI) සිදු කර ඇති අතර ඒ සඳහා ලැබී තිබෙන ප්‍රතිචාර 07 ඇගයීමකට ලක් කර RFP (Request for Proposal) යොමු කිරීමට නියමිතව ඇත.

	තිබුණි. 2021 වර්ෂයේදි මෙම තෙල් ටැංකි සංකීර්ණය සංවර්ධනය කර ශාවිතා කිරීම සඳහා සංස්ථාව සහ LIOC එක්ව Trinco Petroleum Terminal (Pvt) Ltd නමින් ඒකාබද්ධ සමාගමක් පිහිටුවන ලද නමුත් තෙල් ටැංකි සංකීර්ණය සංවර්ධනයට මුදල් යෙදවීම සඳහා සුරක්ෂිත අභ්‍යන්තර හෝ බාහිර අරමුදල් ප්‍රභවයන් නොමැති වීම හේතුවෙන් උපාය මාර්ගික සැලැස්මට අනුව නියමිත වේලාවට සිය ව්‍යාපාරික කටයුතු ආරම්භ කිරීමට සමාගම අපොහොසත් වී තිබුණි.					
10	සංස්ථාව විසින් 2022 සහ 2023 වසර තුළ සිදු කරන ලද තෙල් ආනයනය කිරීම් කිහිපයකට අදාළව ගොඩබෑමේදි තෙල් තොගය අඩුවීම (out turn losses), ප්‍රමාද වූ භාරදීම සහ කොන්ත්‍රාත් වගකීම් ඉටු නොකිරීම හේතුවෙන් ඩොලර් මිලියන 26.9 ට සමාන රු. බිලියන 7.8ක් වෙනුවෙන් කරන ලද හිමිකම්පෑම්වලට	2023		විමර්ශණයක් සිදුකර අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.	මෙම කාරණය නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇත.	2024 ඔක්තෝබර් 15 දින වන විටත් අභ්‍යන්තර විමර්ෂණයක් ආරම්භ කර නොතිබුණි.

	එරෙහිව අඩමාන ණය වෙන්කිරීමක් මුල්‍යා ප්‍රකශන තුළ සිදුකර තිබුණි. කෙසේනමුත් අදාළ ටෙන්ඩර් ලේඛන/ගිවිසුම්වල පවතින දෝෂයක් හේතුවෙන් මෙම හිමිකම් අයකර ගැනීමට නොහැකි වී තිබුණු බව නිරීක්ෂණය විය.				
11	2022 වර්ෂයේ මාර්තු 01 සිට ඔක්තෝබර් 31 දක්වා, බැරලයකට ඇ.ඩො 7.48 ක මිල වාරිකයක් යටතේ ඩීසල් (LAD) බැරල් 1,960,000 ක් මිලදී ගැනීම සඳහා එළැඹ තිබුණු වාර ගිවිසුම, පෙර ගෙවීමේ ක්‍රමයට බැරලයකට ඇ. ඩො 6.98 ක මිල වාරිකයක් යටතේ සක්‍රියව පවත්වාගැනීමට සැපයුම්කරු ලබා දී තිබුණු විකල්ප අවස්ථාවද ප්‍රතික්ෂේප කරමින් අහෝසි කර තිබුණි.	2022	ඉන්ධන වඩාත් ලාභදායී ආකාරයෙන් ලබා ගැනීමට උත්සාහ කළ යුතුය.	එකල රටේ පැවති විනිමය අර්බුදය නිසා මෙම වාර ගිවිසුම සක්‍රීයව පවත්වාගෙන යාමට හැකියාවක් නොමැත. වාර්තාවේ දක්වා ඇති පරිදි, වාර කොන්ත්‍රාත්තුව බැරලයක් සඳහා ඩොලර් 6.98 ක මිලකට ක්‍රියාත්මක කිරීමට හැකියාව තිබුණද, මෙම වාර කොන්ත්‍රාත්තුව සඳහා කැබිනට් අනුමැතිය ලබා දී ඇත්තේ L/C නිකුත් කිරීමට යටත්ව බැරලයක ඩොලර් 7.48 ක මිල වාරිකයකට දින 180 ක ණය කාලයක් සඳහා ය.	මේ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂාවක් හෝ සිදුකර නොතිබුණි.

12	කෙසේ වෙතත්, වාර ගිවිසුම සක්‍රීය කාලසීමාව තුළ සංස්ථාව විසින් ඩීසල් බැරල් 497,996 ක් ලබාගෙන ඇති අතර එය පිළිවෙලින් බැරල් 274,185 ක් සහ 223,811 ක් බැරල් එකක් සඳහා ඇමෙරිකානු ඩොලර් 24 සහ ඇමෙරිකානු ඩොලර් 23 ක මිළ වාරික යටතේ ඉහත සැපයුම්කරුගෙන්ම අනුයාත යොජනා ක්‍රමය (Unsolicited) යටතේ මිලදී ගෙන තිබීමෙන් සංස්ථාවට රු. මිලියන 3,047.42 හෙවත් ඇමරිකානු ඩොලර් 8,252,081 අතිරේක පිරිවැයක් දරා තිබුණි.	2022	-එම-	පෙර ගෙවීමේ පදනම මත බැරලයක් ඩොලර් 6.98 ක මිලකට සැපයුම්කරුගේ දෙවන යෝජනාව ක්‍රියාත්මක කිරීමට සංස්ථා නිලධාරීන්ට නොහැකි විය. ඉන්දියානු කෙටි කාලීන නය යෝජනා ක්‍රමය යටතේ සියලුම ඩීසල් නැව් 2022 මැයි මාසයේදී ලබා දෙන ලදී. BK/139/2022 හා BK/168/2022 ඇණවුම් අංක යටතේ නැව් දෙකක් ජූලි මාසයේදී සහ අගෝස්තු මාසයේදී ඉන්ධන අවශ්‍යතාවය මත රටේ දැඩි බව සහ රටේ ආර්ථික ස්ථාවරත්වය යම් ප්‍රමාණයකට පවත්වා ගැනීම සඳහා ලබා ගන්නා ලදී. මෙම සිය කැමැත්තෙන් ලබාදුන් යෝජනාවක් යටතේ මෙම ඇණවුම් දෙක M/s Coral	-එම-

				Energy DMCC, UAE. සැපයුම්කරුගෙන් අවශ්‍ය නිශ්චිත අනුමැතිය අනුගමනය කිරීමෙන් එනම්, CPC හි අනුමැතිය ඇතිව STEC නිර්දේශ අනුව SSCAPC හි අනුමැතිය මත ලබාගෙන ඇත.	
13	තවද ඉහත වාර ගිවිසුම සක්‍රීය කාලය තුළදීම අවස්ථා 03 කදි වෙනත් සැපයුම්කරුවන් දෙදෙනෙකුගෙන් පිළිවෙළින් බැරලයකට ඇ.ඩො.17.00, ඇ.ඩො. 19.87 සහ ඇ.ඩො. 13.83 බැගින් ඉහල මිල වාරිකයකට සංස්ථාව විසින් ලංකා ඔටෝ ඩීසල් (LAD) බැරල් 922,381 ක් මිලදී ගෙන තිබීමෙන් රු. මිලියන 3,381.69 හෙවත් ඇ.ඩො. 9,146,741 අතිරේක පිරිවැයක් දරා තිබුණි.	2022	-එම-	රටේ පවතින දැඩි බව ඉන්ධන අවශ්‍යතාවය මත සහ රටේ ආර්ථික ස්ථාවරත්වය යම් ප්‍රමාණයකට පවත්වාගෙන යාමේ අරමුණින් මෙම මිලදී ගැනීම් සිදුකර ඇත. මෙම ඇණවුම් සිය කැමැත්තෙන් ලබාදුන් යෝජනාවක් මත ඉහළ කළමනාකාරිත්වයේ අනුමැතිය,STEC නිර්දේශයන්ට අනුව SSCAPC අනුමැතිය මත සැපයුම්කරු වෙත මෙම නොකැද වූ යෝජනාව ප්‍රදානය කර නිශ්චිත ප්‍රසම්පාදන ක්‍රියා	-එම-

				පටිපාටිය අනුගමනය කරමින් ලබාගෙන ඇත.	
14	2022 වර්ෂය තුල ඇණවුම් 06 කට අදාළව අවස්ථා 08 දී ලංකා ඔටෝ ඩීසල් LAD (Gas Oil 500 ppm) බැරල් 1,820,012 ක් ඇණවුම් කර තිබුණද, මිල කිරිම සඳහා DAP Colombo Basis (Incoterms 2010)) Gas Oil 500 ppm වෙනුවට PLATTS හි සාපේක්ෂව වැඩි සාමාන්‍ය අගයක් සහිත ලංකා සුපර් ඩීසල් (LSD) මිල හෙවත් Gas Oil 10ppm හි FOB Singapore Price Method පදනම් කර ගැනීම හේතුකොටගෙන සංස්ථාවට එකතුව ඇ.ඩො 10,499,898 ක් හෙවත්. රු මිලියන 3,872.96 ක වැඩිපුර පිරිවැයක් දැරීමට සිදුවී තිබුණි.	2022	-එම-	Platt's Gas Oil 10 ppm මිල දර්ශකය මත පදනම්ව සිය කැමැත්තෙන් ලබාදුන් යෝජනාවක් සඳහා සැපයුම්කරු LAD (ගෑස් තෙල් 500 ppm) මිල ඉදිරිපත් කර ඇත. එම අවස්ථා වලදී STEC සහ SSCAPC නිර්දේශය වූයේ මෙම LSD (ගෑස් ඔයිල් 10 ppm) පිරිවිතරයෙන් බැහැර වී අදාළ Platt's හි LAD (ගෑස් තෙල් 5 0 0 ppm) භාවිතා කර පිරිවිතරයට එකඟ වන ලෙස සැපයුම්කරුගෙන් ඉල්ලා සිටීමයි. එවැනි ඉල්ලීමක් කළ නමුත් සැපයුම්කරු ඊට එකඟ වී නැත. එසේම වෙනත් තරගකාරී විකල්ප යෝජනා මේ වන විට ලැබී නොමැත. මෙම පිරිවිතරයන්	පත් කළ කමිටුවේ සංයුතිය හා විෂය පථය පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවූ අතර කමිටුවේ වර්තමාන ක්‍රියාකාරිත්වයක් නොමැති බවට විගණනයේදී නිරීක්ෂණය විය.

				(ගෑස් ඔයිල් 10 ppm) සහිත LAD (ගෑස් ඔයිල් 5 0 0 ppm) මිලදී ගැනීම සම්බන්ධයෙන් සංස්ථාවේ කළමනාකාරිත්වය විසින් කමිටුවක් පත් කරන ලදී.	
15	ඉන්දියානු කෙටිකාලීන ණය පහසුකම යටතේ ද සංස්ථව විසින් ඉහත පරිදි අවස්ථා දෙකකදී ලංකා ඔටෝ ඩීසල් LAD (Gas Oil 500 ppm) බැරල් 599,722 ක් ඇණවුම් කර තිබුණද, ඒ සඳහා මිල කිරිම සඳහා PLAATS හි සාපේක්ෂව වැඩි සාමාන්‍ය අගයක් සහිත ලංකා සුපර් ඩීසල් LSD (Gas Oil 10ppm) වලට අදාල FOB Singapore Price Method යොදාගැනීම හේතුවෙන් සංස්ථාවට එකතුව ඇ.ඩො. 4,582,179 හෙවත් රු. මිලියන 1,669.54 ක වැඩිපුර පිරිවැයක් දැරීමට සිදුවී තිබුණි.	2022	-එම-	මිලියන 200ක ඉන්දියානු ණය ආධාර මුදලට යටත්ව, IOC, India (Indian Oil Corporation, India) සැපයුම්කරු විසින් මෙම ඇණවුම් යෝජනාව ඉදිරිපත් කර ඇත. එහිදී සැපයුම්කරු විසින් Platt's Gas Oil 10 ppm මිල දර්ශකය මත පදනම්ව LAD (ගෑස් තෙල් 500 ppm) සැපයුම සඳහා මිල සඳහන් කර ඇත. CPC LAD 500ppm මිල දර්ශකය සමඟ එකඟ වන ලෙස ඉල්ලා ඇති නමුත් සැපයුම්කරු එකඟ වී නැත.	මේ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂාවක් හෝ සිදුකර නොතිබුණි.

				මෙම කාල සීමාව තුළ රට තුළ පැවති ඇඩි විනිමය අර්බුදය හේතුවෙන් STEC සහ SSCAPC නිර්දේශය වූයේ මෙම LAD (Gas Oil 500 ppm) මිල දර්ශකයෙන් බැහැරව LSD (Gas Oil 10 ppm) අදාළ Platt's භාවිතා කිරීමයි. එසේම තරගකාරී වෙනත් විකල්ප යෝජනා මේ වන විට ලැබී නොමැත.	
16	2022 වර්ෂයේදී ආනයනය කරන ලද Siberian Light සහ Ural බොරතෙල් බැරල් 2,023,509 කට අදාලව ගෙවීම් කිරීමේදී මිල තීරණය කිරීම සඳහා PLAATS හි සාපේක්ෂව වැඩි සාමාන්‍ය අගයක් සහිත Dated Brent මිල දර්ශකය යොදාගැනීම හේතුවෙන්, ඒ ඒ නිෂ්පාදන වලට අදාලව Singapore PLATTS හි දෛනිකව ප්‍රසිද්ධ කරනු ලබන මිල දර්ශකයට අනුව ගණනය කරන ලද	2022	-එම-	CR/15/2022 සහ CR/38/2022 අංක යටතේ ඇණවුම් දෙකක් සැපයුම්කරු විසින් ඉදිරිපත් කරන ලද මිල දර්ශක මත පදනම්ව STEC නිර්දේශ සහ SSCAPC හි අනුමැතිය සමඟ සිය කැමැත්තෙන් ලබාදුන් යෝජනා හරහා මිලදී ගන්නා ලදී ලියාපදිංචි සැපයුම්කරුවන් කිසිවකු ටෙන්ඩර් සඳහා ලංසු ඉදිරිපත් නොකළ	-එම-

	මිලට (පිරිවැයට) සාපේක්ෂව, සංස්ථාව විසින් ඇ. ඩො. මිලියන 48.603,7 ක් හෙවත් රු. මිලියන 17,877 ක් අතිරේක පිරිවැයක් දැරීමට සිදුවී තිබුණි.			නිසාත්, මෙම කාලය තුළ බොරතෙල් මිලදී ගැනීමට වෙනත් විකල්ප මාර්ගයක් නොතිබූ නිසාත්, බොරතෙල් තොග දෙකක් මිලදී ගැනීමට සිදු විය. ඒ වගේම බොරතෙල් නැව්දෙකක මිලදී නොගත්තේ නම් පිරිපහදුවෙන් රටේ බලශක්ති අවශ්‍යතා සපුරාලීමට නොහැකි වීම නිසා රටම අර්බුදයකට ලක්වීමට ඉඩ තිබුණි.	
17	සංස්ථාවේ වාර්තාවලට අනුව, නිමි ඛනිජ තෙල් නිෂ්පාදන සඳහා 2021 වර්ෂයේදී සාමාන්‍ය මෙ.ටො. 40,000 ක තෙල් පටවනලද නැවකට පැවති ඇ.ඩො. 15,000 - 21,500 අතර පැවති දෛනික ප්‍රමාද ගාස්තු රේටය 2022 වර්ෂයේදී ඇ.ඩො. 16,000 - 55,000 දක්වා වැඩිවී තිබුණ. ඒ අනුව, 2022 වර්ෂය තුළ සැපයුම්කරුවන් විසින් ඉල්ලා සිටි හිඟ මුදල් රු. මිලියන 572 සිට රුපියල් මිලියන 5,463	2022	-එම-	2021 හා සසඳන විට 2022 දී නැව් ප්‍රමාද ගාස්තු ඉහළ යාමට හේතු වුයේ මෙම කාල සීමාවන් තුළ රට තුළ ඇති වූ දැඩි මූල්‍ය අර්බුදයයි. මෙම තත්ත්වය හේතුවෙන් සැපයුම්කරු සමඟ එකඟ වූ පරිදි නියමිත වේලාවට ඇණවුම් කරන ලද තෙල් භාණ්ඩ සඳහා L/C විවෘත කිරීම CPC හට	-එම-

දක්වා හෝ පෙර වසරට සාපේක්ෂව 9 ගුණයකින් වැඩි විය.

ඉතා අපහසු විය. සමහර විට එකඟ වූ පරිදි L/C හෝ අත්තිකාරම් ගෙවීම ලබා දෙන තුරු තෙල් නැව් දින කිහිපයක් ගොඩබෑමේ වරායේ නැංගුරම් ලා තිබුණි. මෙම තත්ත්වය මත පදනම්ව, සැපයුම්කරුවන් විසින් අදාළ නැව් සඳහා අයකරනු ලබන ප්‍රමාද අනුපාතය වැඩි කර ඇත. ටෙන්ඩරයේ සඳහන් ගොඩබෑමේ වරායේ ඇඩි යාත්‍රා කොන්දේසි හේතුවෙන් සැපයුම්කරුවන් විසින් යෝජනා කරන ලද නැව්වල ප්‍රමාද ගාස්තු රේටය ඉහළ මට්ටමක පවතින නමුත් එම නැව් තෙල් භාණ්ඩ ආනයනය සඳහා භාවිතා කළ යුතුය. එම කොන්දේසි සපුරාලිය හැකි නැව් වෙළඳපොලේ ඇත්තේ ඉතා සීමිත ප්‍රමාණයකි.

3.83 ලක්ෂ්මන් කදිර්ගාමර් ජාත්‍යන්තර සම්බන්ධතා හා ක්‍රමෝපාය අධ්‍යයන ආයතනය

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	බදු පෙර අතිරික්තය (ඌනතාවය) රු.	මතය
2021	164,832,945	2,007,904	162,825,041	(1,075,825)	තත්ත්වාගණනය කළ
2022	167,660,830	1,980,798	165,680,032	2,900,074	තත්ත්වාගණනය කළ
2023	-	-	-	-	ගිණුම් ඉදිරිපත් කර නැත

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	2006 අංක 32 දරන උපාය මාර්ග අධ්‍යයනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය (සංශෝධන) පනතේ				
	(i) 10 (අ) වගන්තිය ප්‍රකාරව ආයතනයේ කළමනාකරණ මණ්ඩලය විසින් පුද්ගලයින් පස් දෙනෙකුගෙන් සමන්විත ජාත්‍යන්තර උපදේශක සභාවක් පත්කළ යුතු වුවත් එවැනි උපදේශක සභාවක් පත්කර නොතිබුණි.	2021 / 2022	පනතේ විධිවිධාන ප්‍රකාරව ජාත්‍යන්තර උපදේශක සභාවක් පත්කළ යුතුය.	අධ්‍යක්ෂ මණ්ඩලයට කරුණු ඉදිරිපත් කර ඇති අතර මේ සම්බන්ධව කටයුතු කරමින් පවතින බව.	උපදේශක සභාවක් පත්කර නොමැත.
	(ii) 10 ඉ (1) වගන්තිය හා 10 ඉ (2) වගන්තිය ප්‍රකාරව 2006 සැප්තැම්බර් 29	2021 / 2022	පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.	වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොමැත.	පුහුණු ආයතනය හා සේවකයන් පවරාගෙන නොමැත.

	දින සිට බණ්ඩාරනායක ජාත්‍යන්තර තානාපති පුහුණු ආයතනය, මෙම ආයතනය වෙත පවරා ගතයුතු අතර එය ආයතනයේ ඒකකයක් වශයෙන් පුහුණු වැඩසටහන් හා වෙනත් අධ්‍යයන පාඨමාලා පැවැත්විය යුතුය. තවද එහි සේවයේ නියුක්තව සිටි නිලධරයන් හා සේවකයින්ද, ආයතනයේ නිලධරයන් හා සේවකයින් ලෙස සැලකිය යුතුය. එසේ වුවත් එම අවශ්‍යතා ඉටුකර නොතිබුණි.				
(iii)	10 ඉ (2) (i) වගන්තිය ප්‍රකාරව පනත ක්‍රියාත්මක වන දිනයට පෙර බණ්ඩාරනායක ජාත්‍යන්තර තානාපති පුහුණු ආයතනය විසින් පවත්වාගෙන යන යම් ගිණුමක බැරට තිබූ සියලු මුදල් ආයතනයේ අරමුදලට මාරු	2021 / 2022	පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.	ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත.	පුහුණු ආයතනයේ මුදල් අරමුදලට මාරු කර නොමැත.

	කළ යුතු වුවත්, එසේ කර නොතිබුණි.				
2	2021 නොවැම්බර් 16 දිනැති අංක 1/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මඟින් හඳුන්වා දෙන ලද				
	(i) මෙහෙයුම් අත්පොතහි 3.2 (i) වගන්තිය ප්‍රකාරව කාර්යය මණ්ඩලය බඳවා ගැනීමේ පටිපාටි සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.	2021 / 2022	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ නිලධාරින් හා එක්ව බඳවා ගැනීමේ පටිපාටි සකස් කරමින් පවතින බව.	බඳවා ගැනීමේ පටිපාටි සඳහා අනුමැතිය ලබාගෙන නොමැත.
	(ii) මෙහෙයුම් අත්පොතේ 6.6 වගන්තිය ප්‍රකාරව ආයතනය 2007 වර්ෂයේ සිට වාර්ෂික වාර්තා සභාගත කර නොතිබුණි.	2021 / 2022	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.	ඉදිරිපත් කිරීමට කටයුතු කරමින් පවතින බව.	වාර්ෂික වාර්තා සභාගත කර නොමැත.

3.84 ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර අතිරික්තය (ඌනතාවය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	990,070,543	182,980,253	807,090,290	28,872,819	තත්ත්වාගණනය කළ
2022	958,858,903	152,540,073	806,318,830	20,680,174	තත්ත්වාගණනය කළ
2023	987,540,466	137,002,135	850,538,331	61,799,947	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණ	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	වර්ෂ 06කට වැඩි කාලයක සිට අයනොවී පවතින රු.1,933,325ක ලැබිය යුතු ශේෂ 20ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	2023	ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කඩිනමින් ක්‍රියා කළ යුතුය.	රු.243,284ක ශේෂයක් නිරවුල් කර ඇත. ඉතිරිව ඇති රු.1,690,042ක මුදල සම්බන්ධයෙන් තොරතුරු ලබාගෙන නිර්දේශ ලබාගැනීම සඳහා ඉදිරි විගණන කමිටු රැස්වීමට යොමුකිරීමට කටයුතු කරමින් පවතී.	තවදුරටත් නිරවුල් කළ යුතු රු.1,690,042 ක ශේෂයක් පවතී.
2	1971 අංක 38 දරන මුදල් පනතේ 10 (05) වගන්තිය ප්‍රකාරව, විසර්ජනයකින් පසු ඉතිරි වන ශුද්ධ ආදායම ඒකාබද්ධ අරමුදලට	2021 2022 2023	මුදල් පනත අනුව විසර්ජනයෙන් පසු ශුද්ධ ආදායම ඒකාබද්ධ අරමුදලට යැවිය යුතුය.	ක්‍රියාමාර්ග ගෙන නැත.	නිර්දේශය ක්‍රියාත්මක කර නැත.

	යැවිය යුතු වුවත් ආයතනය එයට අනුකූලව කටයුතු කර නොතිබුණි.				
3	1982 අංක 9 දරන ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතන පනතේ 31 වන වගන්තිය ප්‍රකාරව, කිසිදු නීතියක් අමාත්‍යවරයා අනුමත කරන තුරු බලාත්මක නොවන නමුත් පශ්චාත් උපාධි අධ්‍යයන අංශයේ අතුරු නීති සංග්‍රහය (By Laws) සඳහා අදාළ අනුමැතිය ලබා ගැනීමකින් තොරව පශ්චාත් උපාධි අංශයේ මාර්ගෝපදේශයක් වශයෙන් භාවිතා කර තිබුණි.	2021 2022 2023	විධිමත් පරිදි අනුමැතිය ලබා ගත යුතුය .	පශ්චාත් උපාධි අතුරු නීති සංග්‍රහය අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගැනීම සඳහා 2023.08.31 දින ඉදිරිපත් කර ඇත.	මෙතෙක් අනුමැතිය ලබාගෙන නැත.
4	ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා නොතිබුණි.	2021 2023	ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යා යුතුය.	ස්ථාවර වත්කම් ලේඛනය සකස් කර ඇත. වත්කම් තක්සේරු කිරීම සඳහා මේ වන විට කටයුතු කරමින් පවතී.	යාවත්කාලීන කර නැත.
5	2013 පෙබරවාරි 07 දිනැති අංක 13/0150/523/005 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් ආයතනය පිහිටවනු ලැබූ පනත සංශෝධනය කිරීමට අනුමැතිය ලබා දී තිබුණ ද එය සිදුකර නොතිබුණි.	2021 2022 2023	වර්තමානය වනවිට තනතුරුවල සිදුකර තිබෙන වෙනස්කම් ද ආයතනයේ විෂය පථයේ සිදුකර ඇති වෙනස්කම් ද ඇතුළත්ව පනතට අවශ්‍ය සංශෝධනයන් සිදු කළ යුතුය.	වර්තමානයේ දී පනත සංශෝධනය කිරීමට ඇති අවශ්‍යතාවය නැවත සමාලෝචනය කර ඉදිරි කටයුතු සිදු කිරීම.	නිර්දේශය ක්‍රියාත්මක කර නැත.

6	2013 අප්‍රේල් 19 දිනැති අංක 13/0237/523/011 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව රාජ්‍ය නිලධාරීන්ට රාජ්‍ය පරිපාලනය හා කළමනාකරණය සම්බන්ධයෙන් පුහුණුව ලබා දීම සඳහා ආයතනය කටයුතු කළ යුතු වුවත්, රාජ්‍ය අංශයේ විධායක නිලධාරීන් පුහුණු කිරීම සඳහා විශේෂ අවධානය යොමුකර ක්‍රියාකර තිබීමෙන් විධායක නොවන සේවාවල නිලධාරින් පුහුණු කිරීමේ කාර්යය මගහැරී තිබීම.	2023	අමාත්‍ය මණ්ඩල තීරණය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.	විධායක නොවන නිලධාරීන් සඳහා දුරස්ථ ඉගෙනුම් ක්‍රමවේද භාවිතා කර නව්‍ය මුහුණුවරකින් යුක්තව, පුහුණු වැඩසටහන් පැවැත්වීම සඳහා කටයුතු සිදුකරමින් පවතී.	නිර්දේශය මෙතෙක් ක්‍රියාත්මක කර නැත.
7	තවද, උක්ත අමාත්‍ය මණ්ඩල තීරණය අනුව රාජ්‍ය නිලධාරින්ගේ දැනුම හා කුසලතා තව තවත් ඉහළ නැංවීමට හා ඔවුන්ගේ ආකල්පවල වඩාත් ධනාත්මක වෙනසක් ඇති කිරීමට හැකි වන පරිදි ආයතනය විසින් පවත්වනු ලබන පුහුණු පාඨමාලාවන්හි අන්තර්ගතය, පුහුණුවීම් ක්‍රමවේද විමර්ශනයට ලක්කොට ඒවා යලි සැකසීම සම්බන්ධයෙන් මාස දෙකක් ඇතුළත අමාත්‍ය මණ්ඩලය වෙත යැවිය යුතු වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි.	2023	අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව වාර්තාව සකස් කර ඉදිරිපත් කළ යුතුය.	මේ සම්බන්ධව ක්‍රියා කළයුතු ආකාරය පිළිබඳ උපදෙස් ලබාදෙන ලෙස 2024.08.23 දිනැති ලිපියක් මඟින් අමාත්‍යාංශ ලේකම් තුමාගෙන් විමසා ඇත.	නිර්දේශය ක්‍රියාත්මක කර නැත.

8	2008 වර්ෂයේදී නිකුත් කරන ලද අංක පීඩී/අයිසී/2008 දරන අභ්‍යන්තර චක්‍රලේඛයට අනුව ආයතනයේ සේවයේ නියුතු උපදේශකවරුන්ට ද්විතීයන අධ්‍යයන දීමනාව මූලික වැටුපෙන් සියයට 50 ක් ලබා ගැනීමට මසකට මිනිස් පැය 45ක දේශන පැය ප්‍රමාණයක් සම්පූර්ණ කළ යුතු වුවත්, එම දේශන පැය සම්පූර්ණ කර නොතිබියදීත් දීමනා ගෙවා තිබුණි. 2023 වර්ෂයේ මුල් මාස 07 සඳහා පමණක් සිදුකර තිබුණු ගණනය කිරීම් අනුව උපදේශකවරුන් 10 දෙනෙකු වෙත රු.2,792,232ක් දීමනා වශයෙන් ගෙවා තිබුණද, එම උපදේශකවරුන් විසින් ආවරණය කළයුතු පැය ගණන 3,240ක් හා ආවරණය කළ සත්‍ය පැය ගණන 1,392.5ක් වූයෙන් පුහුණු දේශන පැය 1,847.5 ක් ආවරණය කර නොතිබුණි.	2021 2022 2023	චක්‍රලේඛය ප්‍රකාරව උපදේශකවරු මසකට පැය 45ක දේශන කාලයක් සම්පූර්ණ කළ යුතුය.	වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නැත.	නිර්දේශය ක්‍රියාත්මක කර නැත.

3.85 ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනය

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	බදු පෙර අතිරික්තය (ඌනතාවය) රු.	මතය
2021	127,827,763	27,308,035	100,519,728	(13,849,436)	තත්ත්වාගණනය කළ
2022	186,251,881	38,488,992	147,762,889	47,590,386	තත්ත්වාගණනය කළ
2023	315,215,632	47,739,646	267,475,986	92,498,166	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	2018 ජුලි 18 දිනැති අංක 03/2018 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ II ඡේදය ප්‍රකාරව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය ලබා ගැනීමකින් තොරව 2020 හා 2021 වර්ෂවලදී නිලධාරින් 10 දෙනෙකු කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන 2021 වර්ෂය තුළදී රු.2,899,002ක මුදලක් වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණි.	2021	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.	2024 වර්ෂය වන විට මෙසේ බඳවා ගත් නිලධාරීන්ගෙන් 04 දෙනෙකු පමණක් ස්ථිර සේවයේ සේවා නියුක්තව සිටී.	කොන්ත්‍රාත් බඳවා ගැනීම සඳහා අනුමැතිය ලබාගෙන නැත.

2	2000 ජනවාරි 11 දිනැති පිඑෆ්/පිරී 5 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව නිසි අනුමැතියකින් තොරව ආයතනයේ නිලධාරීන්ට රු.630,000 ක් දිරි දීමනා ලෙස ගෙවා තිබුණි.	2021	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.	මේ වන විට ආයතනයේ නිලධාරීන්ට දිරිදීමනා ගෙවනු නොලැබේ.	දිරිදීමනා ගෙවීම සම්බන්ධයෙන් අනුමැතියක් ලබාගෙන නැත.
3	වැඩ තහනමකට ලක් වූ අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ පරිපාලන නිලධාරිනිය විධිමත් විනය පරික්ෂණයක් පැවැත්වීමකින් තොරව නැවත සේවයේ පිහිටුවා තිබූ අතර, වැඩ තහනමට ලක් වූ කාලයට අදාලව වැටුප් හා දීමනා ලෙස රු. 666,026ක මුදලක් ගෙවා තිබුණි.	2021	වැඩ තහනමකට ලක් වූ නිලධාරින් සම්බන්ධ විනය පරික්ෂණ පැවැත්වීම කඩිනම් කළ යුතුය.	පරිපාලන නිලධාරිනිය සමබන්ධව විධිමත් විනය පරීක්ෂණයක් පවත්වන ලදී. එහිදී ඇය චෝදනා පත්‍රයේ සඳහන් සියලු චෝදනාවලින් නිදහස් කරන ලදී.	අධ්‍යක්ෂ ජනරාල් වෙනුවෙන් විධිමත් විනය පරීක්ෂණයක් සිදු කර ඔහුගෙන් අයවිය යුතු මුදලක් වේ නම් අයකිරීමට කටයුතු කර නැත.
4	2022 අප්‍රේල් 26 දිනැති අංක 03/2022 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව රජයේ ආයතන මගින් ගොඩනැගිලි කුලියට ගැනීම නැවැත්විය යුතු වුවද ආයතනය පවත්වාගෙන යනු ලබන කුලී ගොඩනැගිල්ල සඳහා 2023 පෙබරවාරි 13 වන දින දක්වා රු.1,250,000 ක මාසික කුලියකට	2022	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.	ගොඩනැගිල්ලේ වටිනාකම නැවත තක්සේරු කර මාසික කුලී මුදල රු. 1,250,000 සිට රු. 800,000 දක්වා අඩුකර ඇත.	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නැත.

ගිවිසුම් ගත වී වර්තමානය වන විටත් එම ගොඩනැගිල්ලේම ආයතනය ස්ථාපිත කර තිබුණි.

3.86 රාජ්‍ය භාෂා කොමිෂන් සභාව

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර අතිරික්තය (ඌනතාවය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	18,801,908	8,234,269	10,567,639	552,524	තත්ත්වාගණනය කළ
2022	20,325,112	8,801,935	11,523,177	(9,548,362)	තත්ත්වාගණනය කළ
2023	17,767,531	9,174,453	8,593,078	(5,218,396)	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මත තත්ත්වය
1	නිත්‍යානුකූලව ගිවිසුමට එළඹීමට පෙර කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ නිල කාමරයට යාබදව සේදුම් කාමරයක් ඉදිකිරිම වෙනුවෙන් වටිනාකම රු. 1,251,126 ක්වූ (වැට් සහිත) ගිවිසුමකට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව එළඹ තිබුණු අතර සේදුම් කාමරය ඉදිකිරිම වෙනුවෙන් වැය කරනු ලබන මුදල නැවත අයකරගන්නා ආකාරය සම්බන්ධයෙන් නගර සභාව සමඟ එකඟතාවයකට පැමිණ නොසිටීමෙන් එම මුදල් නැවත	2021	ඉදිකිරිම් සිදුකිරිමට පෙර නිත්‍යානුකූලව ගිවිසුම්වලට එළඹිය යුතුය.	සේදුම් කාමරය සඳහා වැය කරනලද මුදල රු.993,596 ක් ප්‍රතිපූර්ණය කිරීම සම්බන්ධයෙන් නාගරික කොමසාරිස් සමඟ සාකච්ඡා කරන ලද අතර වාචික එකඟතාවය ලබාදෙන බව. විගණනයෙන් පෙන්වා දුන් පසු මෙවැනි ප්‍රාග්ධන වියදම් කොමිෂන් සභාව මඟින් සිදුකර නොමැත.	මුදල ප්‍රතිපූර්ණය කර නැත. ඒ සඳහා ලිඛිත එකඟතාවයක් ලබාගෙන නැත.

	අයකර ගැනීම ගැටළු සහගත බව විගණනයේදි නිරික්ෂණය විය.				
2	1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	2022	ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන යා යුතුය.	තක්සේරු කමිටුව විසින් වත්කම් ප්‍රත්‍යාගණනය කර ඇත. ඒ අනුව ස්ථාවර වත්කම් ලේඛනය නැවත ලිවීමට කළමනාරණ මණ්ඩල අනුමැතිය ගෙන ඇති බව.	ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර නොමැත.
3	1991 අංක 18 දරන රාජ්‍ය භාෂා කොමිෂන් සභා පනතේ13(3) වගන්තිය ප්‍රකාරව සභාපතිවරයා කොමිෂන් සභාවේ ප්‍රධාන විධායක නිලධාරියා වුවද, ඔහු කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයකු නොවිය යුතු වුවත් 2023 මාර්තු 13 දින සිට 2023 ඔක්තෝම්බර් 26 දක්වා කොමිෂන් සභාවේ සියළු ගෙවීම් සඳහා වියදම් සහතික කිරීම සභාපතිවරයා විසින් සිදු කර තිබුණි.	2023	පනතට අනුකූලව කටයුතු කළ යුතුය	ගණකාධිකාරී සේවයේ නිලධාරියකුගේ සේවය ලබා ගැනීම. මු.රෙ. 135 අනුව බලය බෙදීම	වර්තමානයේ නිවැරදි කිරිමට ක්‍රියාමාර්ග ගෙන ඇතත් නිලධාරියා වැරුද්දක් සිදු කර ඇත.
4	කොමිෂන් සභාවේ ප්‍රධාන මෙහෙවර රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරිම සම්බන්ධයෙන් විමර්ෂණය,	2023	අත්‍යාවශ්‍ය තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය.	අත්‍යවශ්‍ය තනතුරු බඳවා ගැනීමට 2024.05.22 දිනැති ලිපිය මඟින් අනුමැතිය ලබා දී ඇති බව.	නිලධාරින් බඳවාගෙන නැත.

අධීක්ෂණය,
අධ්‍යාපනය හා
උපදේශනය මගින්
ජනතාවගේ ද්විභාෂා
අවශ්‍යතාවය සැපයීම
වුවත් අනුමත කාර්ය
මණ්ඩලයක් එම
කාර්යය සඳහා නිපුන
නිලධාරී තනතුරු වන
භාෂා නිලධාරි, භාෂා
ප්‍රවර්ධන හා විමර්ශන
නිලධාරී යන
තනතුරුවල
පිළිවෙලින් පුරප්පාඩු
02, 07, 03 ක් ලෙස
පැවතුණි.

3.87 දේශීය ණය සහ සංවර්ධන අරමුදල

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	4,838,459,706	4,645,490,731	192,968,975	327,544,126	තත්ත්වාගණනය කළ
2022	3,979,372,136	4,313,065,189	(333,693,053)	(495,266,197)	වියාවනය කළ
2023	3,765,425,374	4,108,289,542	(342,864,168)	96,430,838	වියාවනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	ප්‍රවාහන දීමනා සඳහා හිමිකමක් රහිත තනතුරුවල සේවයේ නියුතු නියෝජ්‍ය අධ්‍යක්ෂවරියන් දෙදෙනෙකු වෙත 2017 නොවැම්බර් මස සිට 2019 ජූනි මස දක්වා මසකට රු.17,500 බැගින් රු.700,000ක ප්‍රවාහන දීමනාවක් ගෙවා තිබුණි.	2021	චක්‍රලේඛ උපදෙස්වලට අනුගත විය යුතුය. හිමිකමක් රහිතව ගෙවන ලද දීමනා ආපසු අයකරගත යුතුය.	මේ වන විට ගෙවීම් නතර කර ඇති බව හා 2024.09.04 පැවති කොමසාරිස් මණ්ඩල තීරණය පරිදි අදාළ නිලධාරින්ගෙන් මුදල් ආපසු අය කිරීමට 2024.08.28 දිනැති ලිපිය අදාළ නිලධාරින්ට ලියාපදිංචි තැපැල මඟින් ලිපි යවා ඇත.	හිමිකමක් නොමැතිව ගෙවූ දීමනා අයකරගෙන නැත.
2	2010 අප්‍රේල් 08 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව අනුමත කළ බඳවා ගැනීමේ පටිපාටිය අනුව නියමිත සුදුසුකම් සහිත පුද්ගලයෙකු අරමුදලේ අධ්‍යක්ෂවරයා ලෙස	2021	දීර්ඝකාලීනව වැඩ බැලීමේ තනතුරුවල අනුයුක්ත කිරීම ආයතනයේ කාර්යසාධනයට අහිතකර ලෙස බලපාන බැවින් පුරප්පාඩු පිරවිය යුතුය.	කොන්ත්‍රාත් පදනම මත අධ්‍යක්ෂවරයකු බඳවා ගැනීමට කටයුතු කිරීම.	ස්ථිර නිලධාරියෙකු පත්කර නොමැත.

	බඳවා ගත යුතු වුවත් ස්ථිර නිලධාරියෙකු මෙම තනතුර සඳහා පත්නොකර අඛණ්ඩව වැඩ බැලීමේ තනතුරක් ලෙස පවත්වා තිබුණි. අමාත්‍යාශ ලේකම්ගේ 2019 ජුලි 14 දිනැති ලිපියෙන් එම අමාත්‍යාංශයේ පළාත් සභා හා පළාත් පාලන අංශයේ අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන), අරමුදලේ ප්‍රධාන විධායක තනතුරේ වැඩ බැලීම සඳහා පත්කර තිබූ අතර එම අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) ඒ වන විටත් ලෝක බැංකු මූල්‍යයනය යටතේ ක්‍රියාත්මක වන ප්‍රාදේශීය සංවර්ධන ව්‍යාපෘතියේ ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා ලෙස ද කටයුතු කරමින් තිබුණි. ඒ අනුව ඔහු විසින් එක්වර තනතුරු 3ක කටයුතු කරමින් නියමිත පාරිශ්‍රමික ලබාගෙන තිබුණි.				
3	දේශීය ණය සහ සංවර්ධන ආඥා පනතේ 03 වන වගන්තිය ප්‍රකාරව, කාර්යමණ්ඩලය පත්කිරීමේ බලතල කොමසාරිස්	2021	තනතුර පුරප්පාඩු පිරවීමට කඩිනමින් කටයුතු කළ යුතුය.	2023 නොවැම්බර් 19 දින රු.901,556ක මුදලක් ගෙවා ඇත. අදාළ නිලධාරියා සම්බන්ධව විධිමත් විනය	ස්ථිර නිලධාරියෙකු පත්කර නොමැත. විධිමත් විනය පරීක්ෂණයක් පවත්වා නැත.

	මණ්ඩලය සතු වුවද කොමසාරිස් මණ්ඩලයේ අනුමැතියකින් තොරව එවකට අදාළ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ආයතනයේ අධ්‍යක්ෂ තනතුරේ වැඩ බැලීම/ රාජකාරි ඉටුකිරීම සඳහා ගණකාධිකාරී සේවයේ නිලධාරියෙකු පත්කර තිබුණි. තව ද 2015 හා 2016 වර්ෂවලදී එම නිලධාරියා වෙනුවෙන් ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 12:5:4 වගන්තිය හා 12:8 වගන්තියට පටහැනිව රු.382,056ක වැඩ බැලීමේ වැටුප් සහ චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව ප්‍රවාහන දීමනා රු.522,000ක් හා ඉන්ධන දීමනා රු.340,849ක් ලෙස එකතුව රු.1,244,905ක් ගෙවා තිබුණි.			පරීක්ෂණයක් පැවැත්වීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත 2023 දෙසැම්බර් 07 දින ලිඛිතව දන්වා ඇත.	
4	2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල පෙන්වන ලද ලාභය පදනම් කරගෙන රු.825,000ක ප්‍රසාද දීමනාවක් ගෙවා	2022	ලාභය මත පමණක් ප්‍රසාද දීමනා ගෙවිය යුතු අතර අලාභය මත ප්‍රසාද දීමනා නොගෙවිය යුතුය.	ක්‍රියාමාර්ග ගෙන නැත.	නිර්දේශ ක්‍රියාත්මක කර නැත.

	තිබුණද මූල්‍ය ප්‍රකාශනවල නිවැරදිව ගැළපීම් සිදු කළේ නම් එය අලාභයක් වන බැවින් එසේ ප්‍රසාද දීමනා ගෙවීම නිවැරදි නොවන බව නිරීක්ෂණය විය.				
5	මූල්‍ය කළමනාකරණ පද්ධතිය, ණය කළමනාකරණ පද්ධතිය හා පොදු මොඩියුලය වශයෙන් අංශ 03ක් ආවරණය වන පරිදි ක්‍රියාත්මක කෙරෙන පරිගණක මෘදුකාංගයක් ස්ථාපිත කිරීමට රු.2,938,000ක් සහ 2020 වර්ෂයේ සිට වාර්ෂික නඩත්තු ගාස්තු වශයෙන් රු.587,600 බැගින් වර්ෂ 03ක් සඳහා රු.1,762,800ක් ගෙවා තිබුණි. එසේ වුවද ණය කළමනාකරණ පද්ධතිය හැරෙන්නට මූල්‍ය කළමනාකරණ පද්ධතිය හා පොදු මොඩියුලය භාවිතා කර නොතිබුණි.	2022	පරිගණක පද්ධතියේ අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය.	නව ප්‍රසම්පාදනය සඳහා සකස් කළ ප්‍රසම්පාදන ලියවිලි 2024.08.14 අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවට අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇති බව.	පරිගණක මෘදුකාංගය ඌන උපයෝජිතව පවතී.
6	2023 දෙසැම්බර් 31 දිනට අය නොවන ණය ශේෂය රු.670,289,991ක් වූ අතර එය වර්ෂ 01 සිට වර්ෂ 34ක කාලයක් දක්වා	2023	ණය අයකර ගැනීම කළ යුතුය.	කල් පසු වූ ණය අය කර ගැනීම සඳහා පළාත් සභාවල ප්‍රධාන ලේකම්වරුන්ගේ ප්‍රධානත්වයෙන් රැස්වීම් පවත්වා	අයකර ගතයුතු ණය ශේෂ අයකරගෙන නැත.

	හිඟහිට තිබුණි.			දැනට ණය අය කර ගැනිම ආරම්භ කර ඇති බව හා දඹුල්ල ප්‍රාදේශීය සභාව, දඹුල්ල මහ නගර සභාව කලවාන ප්‍රාදේශීය සභාවල ණය අය කිරිම ආරම්භ කර ඇති බව.	
07.	වර්ෂය අවසානයේදී පළාත් පාලන ආයතනවල ණය ශේෂ තහවුරු කර ගන්නා බවට විගණකාධිපති වෙත වාර්තා කර තිබුණද 2023 දෙසැම්බර් 31 දිනට ණයගැති ශේෂ 16කට අදාලව රු.58,788,239 ක් සඳහා ශේෂ තහවුරු කිරීමේ ලිපි ඉදිරිපත් නොකෙරුණි.	2023	සියළුම ශේෂ තහවුරු කරගත යුතුය.	දඹුල්ල, මීගමුව, ගලිගමුව, වැලිගම යන සභාවල ශේෂ තහවුරු කර ඇත. ඉතිරි සහා 12 සඳහා ශේෂ තහවුරු කර ගැනීම සිදු කරමින් පවතින බව.	සියළුම ශේෂ තහවුරු කර නැත.

3.88 පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර අතිරික්තය (ඌනතාවය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	545,542,314	20,294,466	525,247,848	5,171,193	තත්ත්වාගණනය කළ
2022	553,367,983	26,039,639	527,328,344	2,079,104	තත්ත්වාගණනය කළ
2023	543,325,362	16,927,298	526,398,064	2,795,448	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපතිගේ නිර්දේශය	ආස්ථිතාය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXX පරිච්ඡේදයේ I වගන්තිය අනුව රජයේ නිලධාරීන් සම්බන්ධයෙන් ආණ්ඩුව සතු බලතලවලට පටහැනිව විවිධ තනතුරුවල නියුතු නිලධාරීන් 08 දෙනෙකුට මොඩියුලයන් සකස් කිරීමට පැවරුම් භාර දී ඇති අතර, ඒ වෙනුවෙන් රු.460,000ක් ගෙවා තිබුණි.	2021	ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය.	ආයතන සංග්‍රහයේ විධිවිධානවලට අනුකූලව කටයුතු සිදු කළ යුතු ආකාරය පිළිබඳව අදාළ නිලධාරීන් දැනුවත් කර ඇති බව.	ආයතන සංග්‍රහයේ විධිවිධානවලට පටහැනි ගෙවීම් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නැත.
2	2021 නොවැම්බර් 16 දිනැති 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ මෙහෙයුම් අත්පොතේ 3.2(v)	2022	චක්‍රලේඛ ප්‍රකාරව අනුමැතිය ලබාගත යුතුය.	ඉදිරියේදී මෙවැනි දීමනා ගෙවීමට පෙර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙතින් අනුමැතිය ගැනීමට අවශ්‍ය	චක්‍රලේඛයට පටහැනිව සිදු කරන ලද ගෙවීම් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නැත.

	ඡේදය ප්‍රකාර දිරිදීමනා ගෙවීමේදී දිරිදීමනා යෝජනා ක්‍රමය, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගෙන් අනුමත කරගත යුතු වුව ද එකී උපදෙස්වලට අනුගත නොවී 2020, 2021 හා 2022 වර්ෂවලදී එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන මගින් පවත්වන ලද පුහුණු වැඩසටහන් සඳහා ආයතනයේ දායකත්වය වෙනුවෙන් නිලධාරීන්ට රු.4,800,000ක් දිරිදීමනා ලෙස ගෙවා තිබුණි.			කටයුතු සිදු කරන බව.	
3	2017 ඔක්තෝම්බර් 25 දිනැති අංක 05/2017 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 02 IV ඡේදය ප්‍රකාර වෘත්තීය දීමනාව ගෙවීමේදී ආයතනයේ සේවය කරන ලද ජ්‍යෙෂ්ඨ මට්ටමේ සේවා කාලය පමණක් අදාළ කරගත යුතු වුවත් ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරියාගේ පෙර සේවා කාලය ද අදාළ කර ගනිමින් වෘත්තීය	2023	වැඩිපුර ගෙවන ලද මුදල ආපසු අයකර ගත යුතුය.	2021 වර්ෂයේ මේ දක්වා හිඟ වැටුප් වර්ධක සඳහා ලැබිය යුතු මුළු මුදල මෙම අතිරික්තව ගෙවා ඇති දීමනාව සඳහා ප්‍රථම වාරිකය ලෙස අඩු කර ගන්නා ලෙසත් ඉතිරිය වාරික වශයෙන් ගෙවීමටත් එකඟතාවය ප්‍රකාශ කර අභ්‍යන්තර මෙමෝවක් මඟින් දැනුම් දී ඇති බව.	2021 සිට 2024 දක්වා අධ්‍යක්ෂක තනතුරට හිමි මුළු වැටුප් වර්ධක අගය පළමු වාරිකය ලෙස රු.74,555ක් අයකරගෙන ඇත. තවදුරටත් අයවිය යුතු ශේෂ පවතී.

	දීමනාව ගෙවීම හේතුවෙන් රු.321,677 ක් වැඩියෙන් ගෙවා තිබුණි.				
4	2017 වර්ෂයේ සිට නිරවුල් නොවී පවතින ලැබිය යුතු පාඨමාලා ගාස්තු එකතුව රු.1,571,250 ක් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	2022/2023	ලැබිය යුතු පාඨමාලා ගාස්තු නිරවුල් කළ යුතුය.	එම විෂයට අදාළ නිලධාරී වන නියෝජ්‍ය අධ්‍යක්ෂක (පුහුණු) වෙත මේ සම්බන්ධව වාර්තාවක් ලබා දෙන ලෙස දැනුවත් කළද කළමනාකාරිත්වයට තීරණයක් ගැනීමට ප්‍රමාණවත් තරම් තොරතුරු ලැබී නොමැත. වර්තමානය වන විට එම නිලධාරිනියගේ සේවය තාවකාලිකව අත්හිටුවා ඇති බව.	ලැබිය යුතු ශේෂ නිරවුල් කරගෙන නැත.
5	ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් පළාත් පාලන ආයතන සඳහා ගිණුම්කරණ ප්‍රමිතයක් හඳුන්වා දී තිබුණි. එම ගිණුම් ප්‍රමිතය ක්‍රියාත්මක කරවීම සඳහා පළාත් මට්ටමෙන් පළාත් නවය විසින් එම පළාතේ පළාත් පාලන අමාත්‍යවරයා විසින් රීති සම්පාදනය කළ යුතු වුවද පළාත්	2021/ 2023	නව ගිණුම්කරණ ක්‍රමය සඳහා පළාත් මට්ටමෙන් රීති සම්පාදනය කර තවදුරටත් පවතින අඩුපාඩු සකස් කරගෙන මෙම ගිණුම් ක්‍රමය ක්‍රියාත්මක කිරීමට කටයුතු සිදු කළ යුතුය.	මෙම ගිණුම් ක්‍රමයේ පැවති අඩුපාඩු සියල්ල සකස් කර එය ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු සුදානම් කර ඇති අතර 2025 වසරේ සිට නැවතත් මේ සම්බන්දව පුහුණුව ලබා දීමට කටයුතු සුදානම් කර ඇති බව.	ගිණුම් ප්‍රමිතිය ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් 7 හි පළාත් මට්ටමින් රීති සම්පාදනය කර නැත.

	සහා 7ක් තුළ එසේ රීති සම්පාදනය කර නොතිබුණි. එසේ වුවද රු.මි.5 කට අධික මුදලක් වැය කර එම පළාත් 7හි නව ගිණුම්ක්‍රමය සම්බන්ධව පුහුණු වැඩසටහන් පවත්වා තිබුණි.				
6	1999 අංක 31 දරන පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතන පනතේ 3(අ), (ආ) අනුව පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල සභිකයින්ට, නිලධරයන්ට සහ සේවකයන්ට ඔවුන්ගේ රාජකාරි කටයුතු වඩාත් කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස ඉටු කිරීමට හැකිවන පරිදි ඒ සභිකයින්ට, නිලධරයන්ට හා සේවකයන්ට පුහුණුව සළසා දීම සහ පළාත් සභා සහ පළාත් පාලන කළමනාකරණය පිළිබඳ වැඩ මුළු හා පුහුණු පාඨමාලා පැවැත්වීම ආයතනයේ ප්‍රධාන කාර්යයක් විය. එසේ වුවද ඩිප්ලෝමා පාඨමාලා 10ක් සහ සහතික පත්‍ර පාඨමාලා 25ක්	2023	පනතෙන් පැවරී ඇති කාර්යයන් ඉටු කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය.	වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නැත.	සැලසුම් කරන සියලු පාඨමාලා පැවැත්වීමට ක්‍රියාමාර්ග ගෙන නැත.

	පැවැත්වීමට සමාලෝචිත වර්ෂයේ සැලසුම් කර තිබුණ අතර පිළිවෙලින් පාඨමාලා 02 ක් සහ 04ක් පමණක් පවත්වා තිබුණි.				
7	උක්ත පනතේ 3 (උ) අනුව පළාත් හා පළාත් පාලන ක්ෂේත්‍රයේ උපදේශක තත්ත්වයේ පැවරුම් භාර ගැනීම ආයතනයේ කර්තව්‍යයක් වුවද 2021 ,2022 හා 2023 වර්ෂවලදී කිසිදු උපදේශක තත්ත්වයේ පැවරුමක් භාරගෙන නොතිබුණි.	2023	පනතෙන් පැවරී ඇති කාර්යයන් ඉටු කිරිමට ක්‍රියා මාර්ග ගත යුතුය.	වර්තමානය වන විට ආයතනයේ උපදේශක තනතුරු දරන කිසිවෙකු නොමැති වීම හේතුවෙන් උපදේශන පැවරුම් භාරගෙන හෝ ලැබී නොමැති බව.	උපදේශන පැවරුම් භාරගැනීම සඳහා කටයුතු කර නැත.
8	ආයතනයට අදාළ පාරිසරික හා සමාජ වගකීම් හඳුනාගෙන ඒ අනුව ක්‍රියාකර නොතිබුණු අතර අපද්‍රව්‍ය කළමනාකරණය පළාත් පාලන ආයතනවල ප්‍රධාන කර්තව්‍යයක් වුව ද ඊට අදාළ කිසිදු පුහුණු වැඩසටහනක් හෝ වැඩමුළුවක් ආයතනය විසින් ක්‍රියාත්මක කර නොතිබුණි.	2023	ආයතනය අදාළ පාරිසරික හා සමාජ වගකීම් හඳුනා ගෙන ඒ අනුව ඉටුකළ යුතු කාර්යභාරය ද හඳුනා ගැනීමට කටයුතු කළ යුතුය.	2022 හා 2023 වසර සඳහා පරිසර ආරක්ෂණ හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳව සහතිකපත් පාඨමාලාවක් පැවැත්වීම සඳහා අයදුම්පත් කැඳවුවද ප්‍රමාණවත් තරම් අයදුම්පත් නොමැති වීම නිසාවෙන් පාඨමාලාව පැවැත්වීමට නොහැකි විය.	නිර්දේශය ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන නැත.

9	2022 හා 2023 වර්ෂ සඳහා සම්පත්දායක ලැයිස්තුව පාලක මණ්ඩලයට ඉදිරිපත් කර අනුමත කරවා ගැනීමකින් තොරව වැඩසටහන් සඳහා සම්පත් දායකයින් යොදවා ගෙන තිබූ අතර 2022 වර්ෂයේදී රු.1,510,604 ක් සහ 2023 වර්ෂයේ දී රු.2,159,000ක් ගෙවා තිබුණි.	2023	සම්පත්දායක නම් ලැයිස්තුව සඳහා පාලක සභාවේ අනුමැතිය ලබා ගත යුතුය.	2024 වසරේ සම්පත්දායක ලැයිස්තුව සකස් කර අවසන් කර ඇති අතර එය ඉදිරි පාලක මණ්ඩලය වෙත යොමු කිරීමට කටයුතු සූදානම් කර ඇති බව.	සම්පත්දායක නම් ලැයිස්තුව පාලක සභාව විසින් අනුමත කර නැත.
10	2013 වර්ෂයේ ආරම්භ කර එහෙත් වැඩ අවසන් නොකළ කාර්යාල ගොඩනැගිල්ල වෙනුවෙන් දරන ලද රු.46,275,072ක වියදම නිශ්කාර්ය වියදමක්ව පැවතුණි.	2021/2022/ 2023	ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු පිළිබඳ පරීක්ෂා කර රජයට සිදු කර ඇති අලාභය පියවා ගැනීමට කටයුතු කළ යුතුය.	මෙම ගොඩනැගිල්ල සම්බන්ධව කොන්ත්‍රාත්කරු සමඟ ඇති කරගත් ගිවිසුම් අවලංගු කර ඇත. නැවත මෙම ගොඩනැගිල්ල ඉදිකිරීම් සම්බන්ධව රජයේ ඉදිකිරීම් දෙපාර්තමේන්තුව හා CECB ආයතනය සමඟ සාකච්ඡා සිදු කර ඇති බව.	වියදම් නිශ්කාර්යව පවතී.
11	හිටපු අධ්‍යක්ෂවරයාට 2020 පෙබරවාරි සිට 2021 අගෝස්තු දක්වා වැඩිපුර ගෙවූ වැටුප් රු.513,000ක් ආපසු අයකරගෙන නොතිබුණි.	2021/ 2023	වැඩිපුර ගෙවන ලද වැටුප නොපමාව අයකර ගත යුතුය.	171 වන පාලක මණ්ඩලය විසින් වැඩිපුර ලබාගෙන ඇති වැටුප අයකර ගැනිම සම්බන්ධයෙන් ලබාදුන් තීන්දුව හිටපු අධ්‍යක්ෂක ජයන්ත මහතා වෙත යොමු කර ඇත.	වැඩිපුර ගෙවීම් අයකර ගැනීමට කටයුතු කර නොමැත.

12	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 2.6.1 (ii) අනුව සකස් කරන ලද පිරිවිතරය සමාලෝචනය කිරීම සහ අනුමත කිරීම තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භයට පෙර සිදුකළ යුතු වුවත් ආයතනය සඳහා E-content මොඩියුල සැකසීම පිළිබඳව ප්‍රසම්පාදනයේදී ප්‍රසම්පාදන දැන්වීම පළකර දින 13කට පසුව තාක්ෂණික ඇගයීම් කමිටුව පත්කර තිබුණි. එහිදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 2.8.1 (ආ) සහ (ඇ) ප්‍රකාර තාක්ෂණික ඇගයීම් කමිටුවේ අනිවාර්යයෙන් සිටිය යුතු විෂයය සම්බන්ධ විශේෂඥයෙක් කමිටුව නියෝජනය කර ද නොතිබුණි. උක්ත E මොඩියුල සැකසීමේ කාර්යය සඳහා සුදුසුකම්ලත් පාර්ශවයන් තෝරා ගැනීමට 2022 නොවැම්බර් 25 සහ 26 යන දිනයන්හි රේඛීය අමාත්‍යාංශයේ වෙබ් පිටුවෙහි පමණක් දැන්වීම් පළකර තිබුණි. මෙහිදී සුදුසුකම්ලත් උනන්දුවක් දක්වන	2023	ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ විධිවිධානවලට අනුගත විය යුතුය.	ඉදිරියේදී අමාත්‍යාංශයේ දැනුම ඇති පාර්ශව සම්බන්ධ කර ගැනීමට අපේක්ෂා කරේ.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල ට අනුගත වී නැත.

	අනෙකුත් පාර්ශවයන්ට සහභාගී වීම සඳහා සාධාරණ, සමාන හා උපරිම අවස්ථා ලබා නොදීම හේතුවෙන් මිල කැඳවීම 2023 මාර්තු 03 දක්වා මාස 3ක් දීර්ඝ කර තිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 6.2.2ට අනුව ලංසු ඉදිරිපත් කිරීමේ අවම කාලය දින 21 ක් වුවත් අවස්ථා 3 කදී දින 14ක් , දින 4ක් ද, දින 9 ක් ලබාදී තිබුණි.				
13	පළාත් පාලන ආයතන තනතුරු 53 සඳහා කාර්යය පටිපාටි සැකසීමේ කාර්යය සඳහා විධිමත් හා පිළිගත් ක්‍රමවේදයකට ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කරමින් සම්පත්දායකයින් තෝරාගෙන නොතිබුණි. තෝරාගත් සම්පත්දායකයින් සමඟ අවබෝධතා ගිවිසුම් අත්සන් කර නොතිබුණු අතර අදාළ කාර්ය සඳහා තෝරාගත් පළාත් පාලන ආයතනවල නිලධාරීන්ට භාණ්ඩාගාර අනුමැතියකින්	2023	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව සම්පත්දායකයින් තෝරා ගැනීමට කටයුතු කළ යුතුය. තෝරාගත් සම්පත්දායකයින් සමඟ අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීමට කටයුතු කළ යුතු අතර ගෙවීම් සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගත යුතුය.	පළාත් පාලන ආයතන තනතුරු 53 සඳහා කාර්යය පටිපාටි සැකසීම අවසන් කර ඇති බව.	නිර්දේශ අනුගමනය කර නැත.

	තොරව UNDP-CDLG ප්‍රදාන මුදල් යටතේ 2023 දෙසැම්බර් 31 වන විට රු.696,000 ක් සහභාගීත්ව දීමනා ගෙවා තිබුණි.				
14	2020, 2021 සහ 2022 වර්ෂවල වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.	2021/2022/2023	වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතුය.	පරිවර්තන කටයුතු සඳහා යොමු කර ඇති බව.	වාර්ෂික වාර්තා පාර්ලිමේන්තු සභාගත කර නැත.
15	මෙම ආයතනය ශ්‍රී ලංකාවේ සියළුම පළාත් පාලන ආයතනවල නිලධාරින්ට පුහුණු පාඨමාලා පවත්වනු ලබන එකම ආයතනය වුවද ඊට අදාළ සියළු විස්තර නිවැරදිව හා නොපමාව ලබා ගත හැකි වන ලෙස දත්ත පද්ධතියක් පවත්වා ගෙන ගොස් නොතිබුණි.	2023	සියළු තොරතුරු විධිමත්ව ඇතුළත්ව තොරතුරු පද්ධතියක් පවත්වා ගත යුතුය.	තොරතුරු පද්ධතියක් සැකසීම සඳහා සාකච්ඡා කරමින් පවතින බව.	තොරතුරු පද්ධතිය සකස් කර නැත.
16	තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ වසර 2030 න්‍යාය පත්‍රය පිළිබඳ ආයතනය විසින් දැනුවත් වී නොතිබීම හේතුවෙන් එහි කාර්යයන්ට සම්බන්ධ තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම	2023	තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක පිහිටුවා ගැනීමට හා කාර්යසාධන දර්ශක හඳුනා ගැනීමට කටයුතු කළ යුතුය.	ක්‍රියාමාර්ග ගෙන නැත.	තිරසර අරමුණු, ඉලක්ක හා කාර්යසාධන දර්ශක හඳුනා ගෙන නැත.

ඉලක්ක කරා ළගාවිය යුතු සන්ධිස්ථානයන් ද ඉලක්ක මත ළඟාවීම මැන බැලීම සඳහා වන දර්ශකයන් ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.89 රාජ්‍ය මුද්‍රණ සංස්ථාව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	බදු පෙර ලාභය (අලාභය) රු.	මතය
2021	2,127,220,289	2,235,877,897	(108,657,608)	(208,096,656)	තත්ත්වාගණනය කළ
2022	1,614,179,488	2,060,891,700	(446,712,212)	(380,702,801)	තත්ත්වාගණනය කළ
2023	4,056,711,989	1,885,587,473	2,171,124,516	2,794,248,182	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්ථාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	සමාලෝචිත වර්ෂය අවසාන වන විට වසා දමන ලද අලෙවිසැල් 04කට අදාල එකතුව රු. 37,529,625ක්වු ණයගැති ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	2021	මෙම හිඟ ණයශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කල යුතුය.	වර්තමානයේ දී ණය ගණුදෙනු සිදු කිරීමේදී වැඩි වශයෙන් රාජ්‍ය ආයතන සඳහා ප්‍රමුඛතාවය දී ඇති අතර, ඊට අදාල ලියවිලි විධිමත්ව පවත්වා ගනිමින් පාලනයක් ඇති කිරීමට කටයුතු කර ඇත	නීතිමය ක්‍රියාමාර්ග ගතහැකි ශේෂයන් හැකිතාක් හඳුනාගැනීමටත් 2012 වර්ෂයට පෙර ශේෂයක් නිශ්චිතව හඳුනාගෙන අයකර ගැනීමටත් කටයුතු කරන බව දන්වා ඇත.
2	අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව සංස්ථාවේ සභාපතිවරයා විසින් මුද්‍රණය කරනු ලබන එක් ලොතරැයි පතකින් සංස්ථාවට ලැබීමට නියමිත මුදල ශත 49 සිට ශත 44 දක්වා අඩු කිරීම නිසා	2021	අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව මෙලස තීරණ නොගත යුතුය.	මෙවැනි ප්‍රතිපත්තිමය තීන්දු සැමවිටම අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය යටතේ පමණක් සිදුකිරීමට කටයුතු කරනු ලබන බව දන්වා ඇත.	එම නිර්දේශය තවදුරටත් ක්‍රියාත්මක කරනු ලබයි.

	සමාලෝචිත වර්ෂයේදී සංස්ථාවට රු. 10,519,265 ක ආදායමක් අහිමි වී තිබුණි.				
3	ණයවර ලිපිවලින් රු. 448,299,364 කට කඩදාසි ආනයනය කර මිලදී ගැනීමට හැකියාව තිබියදී එසේ සිදුනොකර අවස්ථාකදී දේශීය සැපයුම්කරුවන්ගෙන් රු. 510,249,355 කට කඩදාසි මිලදී ගැනිම හේතුවෙන් සංස්ථාවට රු. 61,949,991 ක පාඩුවක් සිදු වී තිබුණි.	2021	මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදු කර වගකිව යුතු නිලධාරින් හඳුනාගත යුතුය.	ණයවර ලිපි විවෘත කළ හැකි සෑම අවස්ථාවකම සහ මූල්‍ය පහසුකම් පවතින සෑමවිටම දේශීය මිලදී ගැනීම්වලින් තොරව ආනයනය මත පදනම්ව භාණ්ඩ මිලදී ගැනීමට කටයුතු කරමින් පවතින බව දන්වා ඇත.	මෙය පිළිබඳ පරීක්ෂා කිරීමට අල්ලස් කොමිසම වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇත.
4	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ණයගැති ශේෂය රු.1,008,219,259 ලෙස දක්වා තිබුණි.ඉන් වසර 4 ත් – 11 ත් අතර කාල පරාසයක සිට පැවත එන රු.177,816,278කණයගැති ශේෂසමාලෝචිත වර්ෂය අවසාන වන විටද නිරවුල් කර ගැනීමට සංස්ථාව කටයුතු කර නොතිබුණි.	2022 2023	හිඟ ශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කල යුතුය.	වර්තමානයේ ණය ගණුදෙනු සම්බන්ධව අවශ්‍ය සියලු තොරතුරු වෙනමම තබා ගනිමින් ණය අයකර ගැනීමේ ක්‍රියාවලිය විධිමත් කර ඇත.	මෙම ණය ශේෂයන් රු.මිලියන 106.5ක් 2012 වර්ෂයට පෙර ශේෂයන් වන අතර ඊට උපකාරක තොරතුරු නොමැති වීමෙන් අයකර ගැනිමට නොහැකි වී ඇත. එසේ අයකර ගත නොහැකි ණය විගණන කමිටුව, කළමනාකරණ මණ්ඩලය වෙත කරුණු ඉදිරිපත්කර චක්‍රලේඛ උපදෙස් අනුව ඉවත් කිරීමට කටයුතු කරමින් සිටින බව දන්වා ඇත.
5	සංස්ථාව විසින් 2021 ඔක්තෝබර් 14 වන	2023	නිසි ආයෝජන ඇගයීමක් සිදු කර	ප්‍රාරම්භක වාර්තාව	2024 සැප්තැම්බර් 09 ප්‍රාරම්භක වාර්තාව

දින අත්පත් කරගෙන, නාරාහේන්පිට අලෙවිසැලේ ස්ථාපිත කර තිබුණු වටිනාකම රු.7,900,000 ක කොනිකා මිනොල්ටා (Konica minota) වර්ගයේ ඩිජිටල් මුද්‍රණ යන්ත්‍රය (Digital Printing Machine) මිලදී ගත් දින සිට 2024 අප්‍රේල් 30 විගණිත දිනය දක්වාම අක්‍රීයව පැවතුණි. තවද, නියෝජිත ආයතනය වෙත රු. 135,000 ක මුදලක් ගෙවා, මෙම යන්ත්‍රය, 2022 අප්‍රේල් මාසයේදී සංස්ථාවේ වගකිවයුතු පාර්ශවයකගේ ලිඛිත අනුමැතියක් නොමැතිව ගලවා ගෙන විත් සංස්ථාවේ ප්‍රධාන කාර්යාලයේ පෙර සැකසුම් අංශය තුළ සවිකර තිබුණි. එමෙන්ම, මෙම යන්ත්‍රය ක්‍රියාත්මක කිරීමට පුහුණුව ලද නිලධාරියාගේ නොසැලකිලිමත් බව නිසා මීයන් විසින් හානිකර තිබු අතර එය නැවත අළුත්වැඩියා කිරිමට රු.2,361,500 ක වියදමක් දරා තිබුණි. සිදුවූ හානියට	වත්කම් මිලදී ගත යුතු අතර එම වත්කම් කාර්යක්ෂම ලෙස භාවිතා කරමින් වත්කම් ආරක්ෂා කර ගැනීමට කටයුතු කල යුතුය.	අමාත්‍යාංශ ලේකම් හා අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක වෙත යොමු කිරීමත් ඉදිරියේදි මූලික විමර්ශනයක් සිදු කර අලාභයක් වෙතොත් එය හඳුනාගෙන ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බවත් දන්වා ඇත.	අමාත්‍යාංශය වෙත යොමු කර ඇත.

	අදාලව මුදල් රෙගුලාසි 103 (1) (ඇ), (ඊ) සහ (උ) වගන්ති ප්‍රකාරව පරික්ෂණයක් පවත්වා වගකිව යුත්තන් නිශ්චය කර එයට අදාළ මුදල අයකර ගැනිමට හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට සංස්ථාව විසින් 2024 මැයි 30 දක්වා කටයුතු කර නොතිබුණි.				
6	සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ මුදල් කළමනාකරු අභ්‍යන්තර පදනමින් බඳවා ගැනීමට රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව අනුමත කර තිබියදී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය අභ්‍යන්තර පදනමින් බඳවා ගැනීමට අදාල සුදුසුකම් පරීක්ෂාකර අදාල තීරණය ලබා දිය යුතු වුවත්, ඔවුන් බාහිර අයදුම්කරුවන්ට අදාල සුදුසුකම් පරීක්ෂාකර තීරණ ලබා දී තිබුණි. තවද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය දක්වා ඇති සටහන අනුව මුදල් කළමනාකරු පත් කිරීමට පෙර භාණ්ඩාගාර අනුමැතිය හා අධ්‍යක්ෂ මණ්ඩල	2023	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර ඇති රාජ්‍ය මුද්‍රණ සංස්ථාවේ බඳවා ගැනීමේ පටිපාටියට අනුව ක්‍රියා කල යුතුය.	සංස්ථාවේ බඳවා ගැනීම් පටිපාටිය සංශෝධනය දිගින් දිගටම ප්‍රමාද වීමෙන් ආයතනයේ නිලධාරීන්ට සාධාරණත්වයක් ගෙන දීමේ අරමුණින් තම රාජකාරිය තුළ ඉහළ කාර්ය සාධනයක් දැක්වූ තත්ත්වය තුළ සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට තීරණය කරන ලද බව දන්වා ඇත. මේ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර උපදෙස් ලබා ගන්නා බවත් දන්වා ඇත.	අධ්‍යක්ෂ මණ්ඩලයේ උපදෙස් පරිදි අමාත්‍යාංශය මඟින් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත මෙම බඳවා ගැනීම සම්බන්ධයෙන් ලිපියක් 2024 ජුලි 29 දිනැතිව යොමු කර ඇත. එය අමාත්‍යාංශය මඟින් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. දැනට සංස්ථාවේ අනුමත බඳවා ගැනීමේ පටිපාටිය සංශෝධනය කරමින් පවතී.

	අනුමැතිය ලබා ගත යුතු වුවද මුදල් කළමනාකරු පත් කිරීමේදි අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය පමණක් ලබාගෙන තිබුණි.				
7	සංස්ථාවේ සාමාන්‍යාධිකාරී හට අනුමත බඳවාගැනිමේ පටිපාටිය අනුව පළපුරුද්ද වශයෙන් ***“විවිධ ක්ෂේත්‍රයන්ට අයත් වෘත්තිකයින් එකතු කර ගනිමින් කණ්ඩායමක් වශයෙන් ඔවුන්ව මෙහෙයවීමේ හැකියාව හා මානව සම්පත් හා අනෙකුත් සම්පත් නිසි ලෙස කාර්යක්ෂමව කළමණාකරනය පිළිබඳ පළපුරුද්දක් තිබිය යුතුය***” යන්න සඳහන් වුවද 2024 ජනවාරි 01 දින සාමාන්‍යාධිකාරී ලෙස පත්කල නිලධාරියා හට උක්ත බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් පළපුරුද්ද ඇති බවට ඔහුගේ පෞද්ගලික ලිපිගොනුව පරික්ෂාවේදී තහවුරු නොවූ අතර ඔහුට සැපයුම් ක්ෂේත්‍රයේ පළපුරුද්ද පමණක් ඇති බවක් විගණනයට තහවුරු	2023	කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර ඇති රාජ්‍ය මුද්‍රණ සංස්ථාවේ බඳවා ගැනිමේ පටිපාටියට අනුව ක්‍රියා කල යුතුය	2022 සැප්තැම්බර් 07 දිනට අනුමත බඳවාගැනීමේ පටිපාටිය සංශෝධනය කිරීමට කටයුතු ආරම්භ කිරීම.	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සමඟ 2024 ඔක්තෝබර් 01 දින සාකච්ඡා පවත්වා අවශ්‍ය සංශෝධන සිදු කිරීමට කටයුතු කරමින් පවතී.

	විය. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය හා අධ්‍යක්ෂ මණ්ඩලය එම සුදුසුකම් පරීක්ෂා කර නොතිබුණි.				
8	ආයතන සංග්‍රහයේ 11 වැනි පරිච්ඡේදයේ 13.3 පරිදි වැඩ බැලීමේ පත්කිරීමක් කළ යුත්තේ නිත්‍ය පත්වීමක් කරනතෙක් තාවකාලික ප්‍රතිකර්මයක් වශයෙන් පමණි. තනතුරට පූර්ණ කාලීන නිලධාරියෙකුගේ සේවය අවශ්‍යනම් නිත්‍ය පත්කිරීම නොපමවා කළ යුතුය. එසේ වුවද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මුද්‍රණ සංස්ථාවේ නිලධාරින් 39 ක් 2000 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා විවිධ වර්ෂ වලදී වැඩ බැලීමේ තනතුරු සඳහා පත් කර ඇත. තවද, එම නිළධාරීන් තම නිත්‍ය තනතුරේ රාජකාරි වැඩ වලට අමතරව 2022 සිට 2023 වර්ෂය දක්වා වැඩ බලන නිළධාරීන් ලෙස කටයුතු කර එම කාලය සඳහා රු. 2,842,165 ක දීමනාවක් ලබාගෙන	2023	ආයතන සංග්‍රහයේ 11 වැනි පරිච්ඡේදයේ 13.3 පරිදි අදාළ පත් කිරීම සිදුකළ යුතුයි.	සම්මුඛ පරීක්ෂණ පවත්වා සුදුසුකම් සපුරා ඇති බොහොමයක් වෙත පත්වීම් ලබාදී වැඩ බලන තනතුරු බොහොමයක් මේවනවිට ස්ථිර කිරීමට කටයුතු කර ඇත. ඉදිරියේදී ආයතන සංග්‍රහයේ ii පරිච්ඡේදයේ 13.3 ප්‍රකාරව කටයුතු කිරීමට අදාල නිලධාරීන් වෙත වාචික උපදෙස් ලබාදී ඇත.	සංස්ථාවේ දැනට අනුමත බඳවා ගැනීමේ පටිපාටියේ 10වන වගන්තියේ Appointing Authority පවතිනුයේ අධ්‍යක්ෂ මණ්ඩලයට බැවින්, ඉදිරියේදි සියලුම වැඩ බැලීමේ/ රාජකාරි ඉටු කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන බව දන්වා ඇත.

තිබුණි.

9	සංස්ථාවේ ප්‍රාථමික සේවකයින් ගණයට අයත් කනිෂ්ඨ සාමාන්‍ය නිශ්පාදන සහයක සහ මුද්‍රණ කාර්යය සහයක 138 ක් සඳහා අනුමැතිය තිබුණද, 202 ක් ස්ථිර සේවකයින් ලෙස බඳවා ගැනීම නිසා සමස්ථ අතිරික්ත සේවක සංඛ්‍යාව 64 ක් සිටින බව නිරීක්ෂණය විය . මෙම අතිරික්ත සේවකයින් සඳහා 2022 සහ 2023 වර්ෂ වලදී රු.81,401,062 ක් වැටුප් වශයෙන් ගෙවා තිබුණි.	2023	නිසි මානව සම්පත් සැලැස්මක් සකස්කර ඒ අනුව බඳවා ගැනීම් සිදුකරමින් සේවක කළමනාකරණය සිදුකළ යුතුය.	මානව සම්පත් සැලැස්ම 2024-2027 (මධ්‍යකාලීන) මීළඟ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමුකිරීමට සකස් කරමින් පවතී.	මානව සම්පත් සැලැස්ම 2024-2027 (මධ්‍යකාලීන) මීළඟ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමුකිරීමට සකස් කරමින් පවතී.

3.90 ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	181,983,496	57,535,358	124,448,138	5,007,594	තත්ත්වාගණනය කළ
2022	186,114,133	50,848,903	135,265,230	10,817,092	තත්ත්වාගණනය කළ
2023	206,734,054	45,467,002	161,267,051	23,967,609	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්ථාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය විසින් තමන්ගේ සේවකයෙකුගේ සේවය අවසන් කිරීම කිසිදු සාධාරණ හා යුක්ති සහගත හේතුවක් නොමැති බවට කම්කරු විනිශ්වය අධිකරණයක් විසින් නිගමනය කිරීම නිසා එම සේවකයාට සමාලෝචිත වර්ෂයේදී රු.522,000 ක මුදලක් ගෙවීමට සිදුවී තිබුණි.	2021	මෙවැනි තත්ත්වයක් අනාගතයේදී ඇති වීම වැළැක්වීමට කටයුතු කළ යුතුය.	මෙම සේවකයා ඉවත් කිරීම සඳහා තීරණය ගනු ලැබූයේ පාලක මණ්ඩලයේ අනුමැතියට යටත්ව වන අතර ඉදිරියේදී මේ ආකාරයේ සේවක ගැටළු ඇතිවන අවස්ථාවන්හිදී නීතිඥවරුන්ගේ උපදෙස් අනුව ගත යුතු ක්‍රියාමාර්ග මත කටයුතු කිරීමට තීරණය කරනු ලැබේ.	මින් ඉදිරියට එවන් අවස්ථා මතුවුවහොත් පාලක මණ්ඩලයේ තීරණයට අමතරව එහි නීතිමය තත්ත්වයද සැලකිල්ලට ගනු ලැබේ.
2	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(1) සහ 40(2) උපවගන්තිය පරිදි ආයතනයේ	2022 2023	ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව අභ්‍යන්තර	අදාළ කරුණ සම්බන්ධව පාලක මණ්ඩලය සමඟ කළ සාකච්ඡාවේ නිගමනය වූයේ, ශ්‍රී	අදාළ කරුණ සම්බන්ධව පාලක මණ්ඩලය සමඟ කළ සාකච්ඡාවේ නිගමනය වූයේ, ශ්‍රී

අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීම සඳහා අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර නොතිබුණි.	විගණකවරයෙකු පත්කළ යුතුය.	ලංකා මුද්‍රණ ආයතනයේ ගිණුම් කටයුතු පිළිගත් බාහිර වරලත් ගණකාධිකාරිවරුන් විසින් සිදු කරන නිසාත්, ඉන් අනතුරුව ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය රජයේ විගණකාධිවරුන්ගේ විගණනයට ලක් වන නිසාත්, ඊට අමතරව කාර්තුවකට වරක් අමාත්‍යාංශයේ පැවැත්වෙන විගණන කමිටුවලට සහභාගී වන නිසාත්, ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය කුඩා ප්‍රමාණයේ ස්වයං උත්පාදන ආයතනයක් නිසාත්, අභ්‍යන්තර විගණකවරයෙකු පත් කිරීම හෝ විගණන කමිටු පත් කිරීම අනවශ්‍ය පිරිවැයක් බවයි. ඒ අනුව පාලක මණ්ඩලය විසින් දැනට ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ කටයුතු කෙරෙන ආකාරය ඉතාමත් යෝග්‍ය බවත්, පිරිවැය ඉතිරියක් බවත් පාලක මණ්ඩලය විසින් තීරණය කරන ලදුව එම තීරණය අමාත්‍යාංශයේ ලේකම් වෙත දන්වා යවා ඇත.	ලංකා මුද්‍රණ ආයතනයේ ගිණුම් කටයුතු පිළිගත් බාහිර වරලත් ගණකාධිකාරිවරුන් විසින් සිදු කරන නිසාත්, ඉන් අනතුරුව ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය රජයේ විගණකාධිවරුන්ගේ විගණනයට ලක් වන නිසාත්, ඊට අමතරව කාර්තුවකට වරක් අමාත්‍යාංශයේ පැවැත්වෙන විගණන කමිටුවලට සහභාගී වන නිසාත්, ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය කුඩා ප්‍රමාණයේ ස්වයං උත්පාදන ආයතනයක් නිසාත්, අභ්‍යන්තර විගණකවරයෙකු පත් කිරීම හෝ විගණන කමිටු පත් කිරීම අනවශ්‍ය පිරිවැයක් බවයි. ඒ අනුව පාලක මණ්ඩලය විසින් දැනට ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ කටයුතු කෙරෙන ආකාරය ඉතාමත් යෝග්‍ය බවත්, පිරිවැය ඉතිරියක් බවත් පාලක මණ්ඩලය විසින් තීරණය කරන ලදුව එම තීරණය අමාත්‍යාංශයේ

					ලේකම් වෙත දන්වා යවා ඇත.
3	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41 (1)සහ 41 (2)උපවගන්තිය පරිදි ආයතනයේ කටයුතු සිදු කිරීම සඳහා විගණන හා කළමනාකරණ කමිටුවක් පත්කර නොතිබුණි.	2022 2023	අදාල උප උපවගන්ති ප්‍රකාරව කටයුතු කල යුතුය.	අදාළ කරුණ සම්බන්ධව පාලක මණ්ඩලය සමඟ කළ සාකච්ඡාවේ නිගමනය වූයේ, ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ ගිණුම් කටයුතු පිළිගත් බාහිර වරලත් ගණකාධිකාරිවරුන් විසින් සිදු කරන නිසාත්, ඉන් අනතුරුව ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය රජයේ විගණකාධිවරුන්ගේ විගණනයට ලක් වන නිසාත්, ඊට අමතරව කාර්තුවකට වරක් අමාත්‍යාංශයේ පැවැත්වෙන විගණන කමිටුවලට සහභාගී වන නිසාත්, ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය කුඩා ප්‍රමාණයේ ස්වයං උත්පාදන ආයතනයක් නිසාත්, අභ්‍යන්තර විගණකවරයෙකු පත් කිරීම හෝ විගණන කමිටු පත් කිරීම අනවශ්‍ය පිරිවැයක් බවයි. ඒ අනුව පාලක මණ්ඩලය විසින් දැනට ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ කටයුතු කෙරෙන ආකාරය ඉතාමත් යෝග්‍ය බවත්, පිරිවැය ඉතිරියක් බවත්	අදාළ කරුණ සම්බන්ධව පාලක මණ්ඩලය සමඟ කළ සාකච්ඡාවේ නිගමනය වූයේ, ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ ගිණුම් කටයුතු පිළිගත් බාහිර වරලත් ගණකාධිකාරිවරුන් විසින් සිදු කරන නිසාත්, ඉන් අනතුරුව ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය රජයේ විගණකාධිවරුන්ගේ විගණනයට ලක් වන නිසාත්, ඊට අමතරව කාර්තුවකට වරක් අමාත්‍යාංශයේ පැවැත්වෙන විගණන කමිටුවලට සහභාගී වන නිසාත්, ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය කුඩා ප්‍රමාණයේ ස්වයං උත්පාදන ආයතනයක් නිසාත්, අභ්‍යන්තර විගණකවරයෙකු පත් කිරීම හෝ විගණන කමිටු පත් කිරීම අනවශ්‍ය පිරිවැයක් බවයි. ඒ අනුව පාලක මණ්ඩලය විසින් දැනට ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ කටයුතු කෙරෙන

				පාලක මණ්ඩලය විසින් තීරණය කරන ලදුව එම තීරණය අමාත්‍යාංශයේ ලේකම් වෙත දන්වා යවා ඇත.	ආකාරය ඉතාමත් යෝග්‍ය බවත්, පිරිවැය ඉතිරියක් බවත් පාලක මණ්ඩලය විසින් තීරණය කරන ලදුව එම තීරණය අමාත්‍යාංශයේ ලේකම් වෙත දන්වා යවා ඇත.
4	2016 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය විසින් පවත්වා ඇති පාඨමාලා වෙනුවෙන් අයවිය යුතු ශේෂය රු.20,131,190 ක් සමාලෝචිත වර්ෂයේදී ද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	2023	හිඟ ආදායම් නොපමවා අයකර ගැනීමට කටයුතු කළ යුතුය.	අයකරගෙන නොමැත.	අයකරගෙන නොමැත.
5	රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 21 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED 04/2023 විධිවිධාන පරිදි 2022 වර්ෂයේදී අලාභ ලබා ඇති ආයතනවලට ප්‍රසාද දීමනා ගෙවීම සඳහා හිමිකමක් නොමැති වුවද, 2022 වර්ෂය සඳහා රු.1,435,424 ක මෙහෙයුම් අලාභයක් ලබා තිබියදී, රු.511,250 ක් ප්‍රසාද දීමනා ලෙස ගෙවා තිබුණි.	2023	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.	ස්වයං උත්පාදන ආයතනයක් වශයෙන් අදාළ වර්ෂය තුළ මෙම ප්‍රසාද දීමනා ගෙවා ඇත්තේ ආයතනයේ සේවකයන් දිරි ගැනීමක් වශයෙන් බවත් මෙම ප්‍රසාද දීමනා ගෙවා ඇත්තේ මෙහෙයුම් ඉතුරුම් වලින් බවත් මෙම ප්‍රසාද දීමනා ගෙවීම සඳහා ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇති බවත් දන්වා ඇත.	අයකරගෙන නොමැත.

6	2017 නොවැම්බර් 01 සිට 2024 ඔක්තොබර් 31 දක්වා වසර 7 ක කාලයක් සඳහා අවස්ථා 4ක දී, ආයතනයේ විශ්‍රාමික ලේඛකාධිවරයා අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව කොන්ත්‍රාත් පදනම මත ප්‍රධාන විධායක නිලධාරී තනතුරට පත්කර වසර 6කුත් මාස 2ක කාලයක් සඳහා ඔහුගේ වැටුප් හා දීමනා වෙනුවෙන් රු.10,210,000 ක් ද, ඉන්ධන දීමනාව ලෙස රු.3,731,668 ක් සහ වාහන නඩත්තු දීමනා ලෙස රු.1,200,000 ක් වශයෙන් එකතුව රු.15,141,668 ක් අදාල කාලය තුල ආයතනය විසින් ගෙවා තිබුණි.	2023	නිසි අනුමැතින් සහිතව අදාළ තනතුර සඳහා නිලධාරීන් පත්කිරීමට කටයුතු කළ යුතුය.	මේ සම්බන්ධව අමාත්‍යංශ ලේකම් සමඟ සාකච්ඡා කළ බවත් එම උපදෙස් පරිදි කටයුතු සිදුකර ඇති බවත් දන්වා ඇත.	මේ සම්බන්ධව අමාත්‍යංශ ලේකම් සමඟ සාකච්ඡා කළ බවත් එම උපදෙස් පරිදි කටයුතු සිදුකර ඇති බවත් දන්වා ඇත.
7	2023 මාර්තු 01 සිට 2024 පෙබරවාරි 28 දක්වා වසරක කාලය සඳහා ආයතනයේ විශ්‍රාමික නිලධාරියෙකු අධ්‍යයන අධ්‍යක්ෂ තනතුර සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව වසරක කාලයක් සඳහා කොන්ත්‍රාත් පදනම මත පත්කර මාස	2023	නිසි අනුමැතින් සහිතව අදාළ තනතුර සඳහා නිලධාරීන් පත්කිරීමට කටයුතු කළ යුතුය.	ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ පනතට අනුව 18 (අ) වගන්තියේ බලතල ප්‍රකාරව පාලක මණ්ඩලය විසින් මෙම පත් කිරීම සිදු කර ඇත.	ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ පනතට අනුව 18 (අ) වගන්තියේ බලතල ප්‍රකාරව පාලක මණ්ඩලය විසින් මෙම පත් කිරීම සිදු කර ඇත.

10ක් සඳහා ඔහුගේ වැටුප් හා දීමනා වශයෙන් රු.1,500,000 ක් ආයතනය විසින් ගෙවා තිබුණි.

3.91 ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	5,802,055,012	1,285,047,409	4,517,007,603	173,420,992	තත්වාගණනය කළ
2022	-	-	-	-	-
2023	-	-	-	-	-

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපතිගේ නිර්දේශය	ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග	ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය
1	2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව හා 2021 නොවැම්බර් 16 දිනැති 01/2021 චක්‍රලේඛය සමග ඉදිරිපත් කළ මෙහෙයුම් අත්පොතේ ඡේද අංක 6.6 පරිදි ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත 2022 දෙසැම්බර් 14 දින ඉදිරිපත් කර තිබුණු අතර 2019, 2020 ,2021සහ	2019/2020/ 2021 ගනුදෙනු වාර්තාව	ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.	2019,2020,2021 යන වර්ෂවල මූල්‍ය ප්‍රකාශන නියමිත දිනට අවසන් කර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇති නමුත් 2018 වර්ෂයේ මූල්‍ය වාර්තා සඳහා විගණකාධිපති මතය ඉදිරිපත් වී නොතිබුණු බැවින් ඉහත වර්ෂ සඳහා වාර්ෂික වාර්තා සකස් කිරීම ප්‍රමාද වී ඇත.	2019, 2020 හා 2021 වර්ෂ වල මූල්‍ය ප්‍රකාශන විගණනය වෙත ඉදිරිපත් වී ඇති අතර 2022 හා 2023 වර්ෂවල මූල්‍ය ප්‍රකාශන මේ දක්වා විගණනය වෙත ඉදිරිපත් වී නැත.

	2022 වර්ෂ සඳහා මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.				
2	2020 දෙසැම්බර් 31 දිනට හා 2021 දෙසැම්බර් 31 දිනට අවුරුදු 5 ට වැඩි ණයගැති ශේෂ පිළිවෙලින් රු. 84,714,279 ක් හා රු.82,081,430 ක් විය. මෙම ණය ශේෂ අයකර ගැනිම අවිනිශ්චිත තත්ත්වයේ විය.	2019/2020/ 2021 ගනුදෙනු වාර්තාව	ණය අයකර ගැනීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය .	මෙම ණයගැති ශේෂයන් ඇතුළු මණ්ඩලයේ දිගුකාලීනව අය නොවූ ණයගැතියන් සම්බන්ධව තීරණ ගැනීම සඳහා රේඛීය අමාත්‍යාංශයේ ප්‍රධාන මූල්‍ය නිලධාරි ඇතුළු කමිටුවක් පත් කොට එම සියලු ණයගැතියන් විශ්ලේෂණය කොට සමාලෝචනය කර ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සඳහා කටයුතු කෙරෙමින් පවතී. මේ වන විට විධිමත් ක්‍රම වේදයකින් තොරව කිසිදු අවස්ථාවක ණය පදනම මත භාණ්ඩ හා සේවා අලවි නොකරන ලෙස කාර්ය මණ්ඩලය දැනුවත් කර ඇත.	මෙම ණය ගැති ශේෂයෙන් රු. 5,654,437.75 අය කර ගැනිමට කිසිදු හැකියාවක් නොමැති බව හඳුනා ගෙන මෙම වටිනාකම 2024 මූල්‍ය වර්ෂයේ පොත් වලින් ලියා හැර ඇත. ඉදිරියේදි තවදුරටත් අය කර ගත යුතු ණය සම්බන්ධයෙන් සොයා බලා කටයුතු කරමින් පවතී.

3	පොල් සංවර්ධන අධිකාරිය මඟින් පවත්වනු ලබන පොල් වෙන්දේසි වලදී මෙම අධිකාරිය විසින් නිකුත්කර ඇති නීති මාලාවන්ට අනුව නියමිත කාල තුළදී පොල් තොග ඉවත් කර නොගැනීම හේතුවෙන් තැරැව්කරුවන්ගෙන් 2021 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු වූ අවුරුදු 5 ට වැඩි හිඟ බිම්කුලි සහ දඩ රු.18,164,830 ක් වූ අතර එම ශේෂ අයකර ගැනීමට ඵලදායී පියවරන් ගෙන නොතිබුණි.	2019/2020/ 2021 ගනුදෙනු වාර්තාව	හිඟ බිම්කුලී හා දඩ මුදල් ශේෂ තැරැව්කරුවන්ගෙන් හෝ එම පොල් තොගය නිදහස් කළ වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගත යුතුය.	අවුරුදු 15 ට වැඩි ණයගැති ශේෂය අය කර ගැනිමට විවිධ ක්‍රියාමාර්ග ගෙන තිබේ. මෙම හිග බිම් කුලිය වසර 10කටත් පෙර ඇති වූ බිම් කුලියක් වන අතර මෙය අයකර ගැනිම සදහා නෛතික ක්‍රියාමාර්ග ගැනිමට කටයුතු කර ඇත.	තැරැව්කාර ආයතන සියල්ල මේ වන විට ව්‍යාපාර කටයුතුවල නොයෙදෙන අතර එම ආයතන වල සමහර අධ්‍යක්ෂවරුන් මිය ගොස් ඇති අතර තවත් අධ්‍යක්ෂවරුන් ආදාල ලිපිනයන්හි සොයා ගත නොහැකි බවත් එම නිසා ඉදිරියේදි එම හිග බිම් කුලිය මුදල් රෙගුලාසි වලට අනුකුලව පොත් වලින් ලියා හැරිම හැර වෙනත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගැනිමට නොහැකි වී ඇත.
4	2011 වර්ෂයේ සිට වැවිලි මානව සංවර්ධන භාරය වෙතින් අයවිය යුතු රු.3,689,824 ක මුදල අයකර ගැනීමට 2021 දෙසැම්බර් 31 දින දක්වාම ක්‍රියාමාර්ග ගෙන තිබුණ ද අයකර ගැනිමට නොහැකි වී තිබුණි.	2019/2020/ 2021ගනුදෙනු වාර්තාව	වැවිලි මානව සංවර්ධන භාරය වෙතින් අයවිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.	මෙම මුදල සම්බන්ධයෙන් අදාළ ආයතනයට ලිඛිතව දන්වා ඇති අතර එම ආයතනය මගින් පෙරලා දන්වා ඇත්තේ අදාළ වටිනාකම රේඛීය අමාත්‍යාංශය හරහා පියවීම සඳහා එවකට රේඛීය අමාත්‍යාංශයට දන්වා ඇති අතර මේ සම්බන්ධයෙන් රේඛීය	2024 ඔක්තෝබර් 15 දින වන විටත් මෙම ශේෂය අයවී නොමැත.

අමාත්‍යාංශයෙන් විමසීම් කර ඇත.අදාළ කරුණු තහවුරු කර ගැනිමෙන් පසු ඉදිරි පියවර ගැනිමට නියමිත වේ.
තවද, මෙම මුදල් අයකර ගැනිම සම්බන්ධයෙන් නෛතික ක්‍රියාමාර්ග ගැනිමට නීතිපති දෙපාර්තමේන්තු වෙන් උපදෙස් ලබා ගත් අතර එහිදී මෙම ආයතනයද රාජ්‍ය ආයතනයක් වන බැවින් ආමාත්‍ය මණ්ඩලයේ තිරණය අනුව එක් රාජ්‍ය ආයතනයකට,තව ත් රාජ්‍ය ආයතනයකට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග ගැනිමේ හැකියාවක් නොමැති බව දන්වා ඇති අතර ඒ අනුව මෙම ණය අය කර ගැනිම සම්බන්ධයෙන් ආමාත්‍යාංශයේ ලේකම් තුමා මගින් වැවිලි හා මානව සම්පත් අමාත්‍යාංශයේ නිලධාරින් සමග මේ වන විට

				සාකච්ඡාවක් සුදානම් කර ඇති අතර මෙය සිදු කරනුයේ විගණන හා කළමණාකරන කමිටු නිර්දේශයක් මත වේ.	
5	2013 වර්ෂයේ සිට පැවත එන මියගිය ආනයනික ගවයින් වෙනුවෙන් ලැබිය යුතු රක්ෂණ වන්දි රු.19,253,926 ක් 2021 දෙසැම්බර් 31 දක්වාම අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.	2019/2020/ 2021ගනුදෙනු වාර්තාව	ලැබිය යුතු රක්ෂණ වන්දි අයකර ගැනීමට කටයුතු කළ යුතුය	මේ සම්බන්ධයෙන් සභාපතිතුමන්ගේ උපදෙස් පරිදි නැවත විමර්ශණයක් සිදු කර ඇත. එහිදී අදාල විගණන නිරීක්ෂණයේ පැවති නිවැරදි නොවන තොරතුරු ප්‍රමාණයක් හදුනාගෙන ඇත. තවද අදාල රක්ෂණ ආයතනය විසින් මණ්ඩලය වෙත රක්ෂණ ප්‍රතිලාභ ගෙවීමට ඇති බවත් හදුනාගෙන ඇත. ඒ අනුව එම ආයතනයට විරුද්ධව රක්ෂණ කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් සිදු කර ඇත. විගණන විමසුම පාදක කර ගනිමින් ලැබිය යුතු හිමිකමක් වශයෙන් ගිණුම්ගත කර තිබූ නමුත් සත්‍ය	2024 ඔක්තෝබර් 15 දින වන විටත් මෙම රක්ෂණ වන්දි අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

				වශයෙන්ම එවන් හිමිකමක් නොවන වට්නාකමක් හඳුනාගෙන ඇත. එම වට්නාකම ගිණුම් වලින් ඉවත් කිරීමට සිදු වේ. ඒ අනුව තවදුරටත් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නියමිතවේ.	
6	ආනයනික ගවයන් සිටින රිදීයාගම ගොවි ගොවිපොළෙහි ඖෂධ, එන්නත්, කිරි දෙවීම් හා ගව ගාල් නඩත්තු යන වියදම් ද ඇතුළු සෘජු වියදම් සඳහා 2021 වර්ෂයේ දී රු. මිලියන 714 ක් වී ඇති අතර එම සෘජු වියදම් දැරූ පසු ව්‍යාපෘතියේ දළ අලාභය රු. මිලියන 16 වී තිබුණි. ඒ අනුව 2021 වර්ෂයේදී ගොවිපොළෙහි සෘජු වියදම් හෝ ආවරණය කර ගැනීමට නොහැකි වී ඇති බව නිරීක්ෂණය කෙරේ.	2019/2020/ 2021ගනුදෙනු වාර්තාව	ගොවිපොළ ලාභ ලබන තත්ත්වයට පත් කර ගැනීමට කටයුතු කළ යුතුය.	මේ වන විටත් වැලැක්වීමේ ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත.	රිදියගම ගොවිපලේ 2024 අගෝස්තු වන විට කිරි ආශ්‍රිත නිෂ්පාදන වලින් හා සතුන් අලවියෙන් ලැබි ඇති ආදායම රුපියල් මිලියන 373 ක් වන අතර සෘජු වියදම රුපියල් මිලියන 452 කි. නමුත් මෙම වර්ෂයේ සතුන්ගේ අගය වැඩිවිම රුපියල් මිලියන 231 ක් වි ඇත. එමගින් සමස්ථ ගොවිපල රුපියල් මිලියන 31 ක ලාභයක් ලබා ගැනිමට 2024 අගෝස්තු වන විට හැකියාව ලැබි ඇතත් සතුන්ගේ අගය කිරීම් වැඩිවීම් මත සිදුවන ලාභය තත්‍ය ලාභයක් නොවන හෙයින් ආදායම් වැඩි කිරීමට හෝ වියදම්

					අවම කිරීමට කටයුතු කර නොතිබුණි.
7	මැණික්පාලම ගොවිපොළෙහි 2020 හා 2021 භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව sprinkler system යටතේ ඇති ඉංජිනේරු උපාංග 135 ක ඌනතාවයක් නිරීක්ෂණය විය.	2019/2020/ 2021ගනුදෙනු වාර්තාව	ඉන්වෙන්ට්‍රි අයිතම සම්බන්ධයෙන් මනා අභ්‍යන්තර පාලනයක් පවත්වා ගත යුතුය.	මෙලෙස අයිතම 135 ඌණතාවයක් ඇති වීමට හේතුව බෝපත්තලාව හා මැණික්පාලම ජල අවශ්‍යතාවයන් සපුරා ගැනීමට ජල නල පද්ධතියක් ඉදිකිරීම සඳහා උපාංග භාවිතා කිරීම වේ. නමුත් මෙම බැහැර කිරීම, බැහැර කිරීමේ නිවේදන යොදා විධිමත්ව බැහැර කර නොමැත.	මෙම ගොවිපළවල් දෙක අතර ඉංජිනේරු උපාංග වල ශේෂ සසඳා නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.
8	සී/ස කුකුළු පාලන සංවර්ධන සමාගම සම්බන්ධයෙන් 2020 මාර්තු 12 දින ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා ලබාදුන් අංක අමප/20/0890/217/052 දරන 2020 ජුනි 18 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි දැනට ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට සියයට 100 ක් කොටස් හිමි සී / ස ශ්‍රී ලංකා කුකුළු පාලන සංවර්ධන (පුද්) සමාගම විසුරුවා හැරීමටත් , එම සමාගම සතු	2019/2020/ 2021ගනුදෙනු වාර්තාව	අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි සී / ස ශ්‍රී ලංකා කුකුළු පාලන සංවර්ධන (පුද්) සමාගම විසුරුවා හැරීමටත්, එම සමාගම සතු සියලු වත්කම් හා බැරකම් ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට පවරා ගැනීමටත් කටයුතු කළ යුතුය.	සීමාසහිත ශ්‍රී ලංකා කුකුළු පාලන සංවර්ධන සමාගම, ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට පවරා ගැනීම සම්බන්ධයෙන් මූලික කරුණු ඉටු කර ඇති අතර ඈවරකරුවෙකු පත් කර ඇත. 2022 නොවැම්බර් මස ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට නව අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කර ඇති අතර ඊට	2024 ඔක්තෝබර් 15 දින වන විටත් 2020 ජුනි 18 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි කටයුතු නිම වී නැත.

	සියලු වත්කම් හා බැරකම් ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට පවරා ගැනීමටත් , එම සමාගම සතු එකම ගොවිපොළ වන මාවත්ත ගොවිපොළෙහි කාර්ය මණ්ඩලය ඔවුන්ගේ අයිතිවාසිකම් රැකෙන පරිදි ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය වෙත අන්තර්ග්‍රහණය කර ගැනීමටත් , මාවත්ත ගොවිපොළ ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට අයත් ගොවිපොළක් ලෙසින් පවත්වා ගෙන යාමටත් නියමකර තිබුණු නමුත් සමාගම විසුරුවා හැර සියලු වත්කම් හා බැරකම් පවරා ගැනීමත් කාර්ය මණ්ඩලය අන්තර්ග්‍රහණය කරගැනීමත් 2022 දෙසැම්බර් 31 දින දක්වාම සිදුකර නොතිබුණි.			සමගාමීව සී/ස ශ්‍රී ලංකා කුකුළු පාලන සංවර්ධන සමාගමේ නව අධ්‍යක්ෂ මණ්ඩලය පෙබරවාරි මස පත් කර ඇති අතර ඒ අනුව ඉදිරි කටයුතු සිදු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාවක් සම්මත කර ගැනීමෙන් පසුව ඇවරකරු විසින් ඉදිරි ක්‍රියාමාර්ග කෙටිකලක් ඇතුළත නිම කරනු ඇත.	
9	අමප 15/0940/631/018-1 දරන 2015 ජුලි 16 දිනැති අමාත්‍ය මණ්ඩල තිරණ පරිදි සී/ස මහවැලි සත්ත්ව ව්‍යාපාරික සමාගමට අයත් සියලුම සම්පත්,	2019/2020/ 2021ගනුදෙනු වාර්තාව	අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි සමාගමට අයත් සියලුම සම්පත්, වත්කම්, කොටස් හා කළමණාකරණය අදාළ නීතිමය	කැබිනට් මණ්ඩල තීරණය ක්‍රියාත්මක කිරීම සඳහා සියයට 45 ක කොටස් හිමි මහවැලි අධිකාරියෙන් සමාගමේ ඉඩම්	2024 ඔක්තෝබර් 15 දින වන විටත් 2015 ජූලි 16 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ක්‍රියාත්මක වී නැත.

	වත්කම්, කොටස් හා කළමනාකරණය අදාළ නීතිමය ක්‍රියාවලීන්ට යටත්ව කොටස් ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය අත් කරගත යුතු බවට දන්වා ඇත. 2021 දෙසැම්බර් 31 දින දක්වා සමාගමෙහි කොටස් අයිතියෙන් සියයට 27 ක් පමණක් ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය අත්කරගෙන තිබුණු අතර සෙසු කොටස් වලින් මහවැලි අධිකාරිය සතුව සියයට 45 ක් ද, නෙදර්ලන්ත ෆිනෑන්සින් සතුව සියයට 23 ක් හා මහවැලි කලාපයේ ගොවීන් සතුව සියයට 05 ක් ද වශයෙන් අයිතිව තිබුණි. මෙම කොටස් පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට පවරාගැනීමට අවශ්‍ය නීතිමය ක්‍රියාවලීන් අනුගමනය කිරිමක් 2022 දෙසැම්බර් 31 දින දක්වා ම සිදුකර නොතිබුණි.		ක්‍රියාවලීන්ට යටත්ව ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය විසින් අත් කරගත යුතුය.	අයිතිය හා කොටස් අයිතිය ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය වෙත බාර දෙන ලෙස ඉල්ලා ඇතත් මේ වන තෙක් කිසිදු ප්‍රතිචාරයක් දක්වා නොමැත. මේ සම්බන්ධයෙන් රේඛීය අමාත්‍යාංශයේ ලේකම්තුමා විසින් 2024.09.11 දිනැති ලිපිය මගින් වාරිමාර්ග අමාත්‍යාංශය වෙත දන්වා ඇත්තේ කඩිනමින් ඉඩම් අයිතිය පවරා දෙන ලෙසයි. මේ පිළිබඳව මහවැලි අධිකාරියේ සාකච්ජාවක් 2024.10.14 දින පැවති අතර මේ වනතෙක් ඉඩම් පැවරීමක් සිදුව නොමැත.	
10	පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ ගොවිපොළ 4 ක් සතුව දිනකට එක් වරකදි ගව ආහාර	2019/2020/ 2021ගනුදෙනු වාර්තාව	නිෂ්කාර්යව ඇති ගව ආහාර නිෂ්පාදනය කළ හැකි යන්ත්‍ර භාවිතයට ගත	සත්ත්ව ආහාර නිෂ්පාදනය කිරීමට අවශ්‍ය අමුද්‍රව්‍ය විශාල ආයෝජනයක්	2024 ඔක්තෝබර් 15 දින වන විටත් මෙම යන්ත්‍ර නිෂ්කාර්යව පවතී.

	ටොන් 3.75 ක් නිෂ්පාදනය කළ හැකි යන්ත්‍ර 4ක් පවතී. ඒවායින් මසකට ගව ආහාර මෙ.ටො 900 (3.75*දින 30* පැය 8) ක් වන ලෙස වර්ෂයකට මෙට්‍රික් ටොන් 10,800 ක් නිෂ්පාදනය කළ හැකි වුවද යන්ත්‍ර වසර 01 සිට වසර 12 දක්වා කාලයක් නිෂ්කාර්යව පවතින බව අනාවරණය විය.		යුතුය .	එකවර සිදු කළ යුතු වේ. විශාල පරිමාණයේ ආහාර නිෂ්පාදනය කරන ආයතනවලින් තරගකාරි මිල ගණන් යටතේ මිලදී ගැනීම බොහෝ විට වාසිදායක වේ. මණ්ඩලය අඩු ධාරිතාවයකින් යුත් ඉතා පැරණි යන්ත්‍රෝපකරණ වන අතර ඒවායේ කාර්යක්ෂමතාවය ද ඉතා අඩුය. එබැවින් පවතින අවශ්‍යතාවය සම්පූර්ණයෙන්ම සපුරා ගත නොහැකි බැවින් හා බොහෝවිට නිෂ්පාදන පිරිවැය වැඩි වන බැවින් විවෘත තරගකාරි මිල ගණන් යටතේ බාහිර ආයතන වෙතින් සත්ත්ව ආහාර මිලදි ගැනිමට කටයුතු කරන ලදි.	
11	ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය යටතේ වන ගොවිපොළ 4 ක් සතුව කුකුළු ආහාර සකස් කිරීමේ යන්ත්‍ර 04 ක් ඇත. ඊට අමතරව මහවැලි සත්ත්ව ව්‍යාපාරික	2019/2020/ 2021ගනුදෙනු වාර්තාව	නිෂ්කාර්යව ඇති කුකුළු ආහාර සකස් කිරීමේ යන්ත්‍ර භාවිතයට ගත යුතුය.	සත්ත්ව ආහාර නිෂ්පාදනය කිරිමට අවශ්‍ය අමුද්‍රව්‍ය විශාල ආයෝජනයක් එකවර සිදු කළ යුතු වේ. විශාල පරිමාණයේ ආහාර නිෂ්පාදනය	2024 ඔක්තෝබර් 15 දින වන විටත් මෙම යන්ත්‍ර නිෂ්කාර්යව පවතී.

	සමාගම සතුව කුකුළු ආහාර සකස් කිරීමේ ඇඹරුම් හා මිශ්‍රණ යන්ත්‍ර 1 ක් ද , ශ්‍රී ලංකා කුකුළු පාලන සංවර්ධන (පුද්ගලික) සමාගම සතුව කුකුළු ආහාර සකස් කිරීමේ ඇඹරුම් හා මිශ්‍රණ යන්ත්‍ර 2ක්ද පවතී. මෙයින් කුකුළු ආහාර මසකට මෙට්‍රික් ටොන් 2,580 (10.75*දින 30* පැය8) ක් වන ලෙස වර්ෂයකට මෙට්‍රික් ටොන් 30,960 ක් නිෂ්පාදනය කිරීමේ හැකියාව පවතී. නමුත් 2021 දෙසැම්බර් 31 දිනට එම යන්ත්‍ර 8 වසර 01 සිට වසර 12 දක්වා කාලයක් නිෂ්කාර්යව පවතින බව අනාවරණය විය.			කරන ආයතනවලින් තරඟකාරී මිල ගණන් යටතේ මිලදී ගැනීම බොහෝ විට වාසිදායක වේ. මණ්ඩලය අඩු ධාරිතාවයකින් යුත් ඉතා පැරණි යන්ත්‍රෝපකරණ වන අතර ඒවායේ කාර්යක්ෂමතාවය ද ඉතා අඩුය. එබැවින් පවතින අවශ්‍යතාවය සම්පූර්ණයෙන්ම සපුරා ගත නොහැකි බැවින් හා බොහෝවිට නිෂ්පාදන පිරිවැය වැඩි වන බැවින් විවෘත තරඟකාරී මිල ගණන් යටතේ බාහිර ආයතන වෙතින් සත්ත්ව ආහාර මිලදී ගැනීමට කටයුතු කරන ලදි.	
12	2019 ,2020 ,සහ 2021 වර්ෂ වල ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු පිළිවෙලින් 33 ක් 12ක් සහ 38 වු ද තෘතියික මට්ටමේ පුරප්පාඩු පිළිවෙලින් 12ක් 10 ක් සහ 14 ද ද්විතීක මට්ටමේ පුරප්පාඩු පිළිවෙලින් 7ක් 22ක් සහ 7 ක් ද ප්‍රාථමික	2019/2020/ 2021ගනුදෙනු වාර්තාව	පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු අතර අතිරික්ත සේවකයින් සඳහා අනුමැතියක් ලබා ගත නොහැකි නම් ඒවා නීති විරෝධී බඳවා ගැනීම් සේ සලකා ක්‍රියා කළ යුතුය	අභ්‍යන්තර සේවක උසස්වීම් මගින් තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු කර ඇති අතර අතිරික්ත තනතුරු 50 ක් පවතින අතර අතිරික්ත තනතුරු ඉදිරියේදී අනුමත කර ගැනීමට කටයුතු කරනු ලැබේ. 2015 අයවැය	මණ්ඩලයේ වර්තමානයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ 24, තෘතීක මට්ටමේ 12, ද්විතීක මට්ටමේ 70 ක් හා ප්‍රාථමික මට්ටමේ 73 ක පුරප්පාඩු පවතී.

මට්ටමේ පුරප්පාඩු 42 ක් 102 ක් 113 ද වූ අතර 2020 වර්ෂයේ ප්‍රාථමික මට්ටමේ සේවක අතිරික්තය 64 ද 2021 වසරේ ජ්‍යෙෂ්ඨ මට්ටම ද්විතීක මට්ටම සහ ප්‍රාථමික මට්ටම සේවක අතිරික්ත පිළිවෙලින් 8ක් 2ක් සහ 61 විය.

යෝජනාවන්ට අනුව රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ 25/2014 හි සඳහන් පරිදි දින 180 ට වඩා වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති දෛනික වැටුප් ලබන චෙක්රෝල් සේවකයින්ගේ සේවය ස්ථිර කිරීම සිදු කරන ලදී. ඒ අනුව දියර කිරි ව්‍යාපෘතියට බඳවා ගන්නා ලද දෛනික වැටුප් ලබන චෙක්රෝල් සේවකයින්ගේ තනතුරු ස්ථිර කිරීම හා දියර කිරි ව්‍යාපෘතිය සඳහා කාර්යය මණ්ඩල අනුමත නොවීම හේතුවෙන් ප්‍රාථමික මට්ටමේ සේවක අතිරික්තයක් ඇත.

3.92 පොල් පර්යේෂණ මණ්ඩලය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	2,879,993,494	371,542,796	2,508,450,698	499,537,818	තත්ත්වාගණනය කළ
2022	3,115,704,953	528,021,145	2,587,683,808	824,153,395	තත්ත්වාගණනය කළ
2023	3,021,630,044	571,601,303	2,450,028,741	828,001,451	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණ	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	ගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	2021 වර්ෂයේ මැයි, ජුනි හා ජූලි මාසයන්හි අවස්ථා 04 කදී කොළඹ ප්‍රදේශයේ පෞද්ගලික සමාගමකට වෙන්දේසි කළ නමුත් මුදල් ගෙවා රැගෙන යාමට කටයුතු නොකළ රු.4,484,947 ක් වටිනා පොල් ගෙඩි 72,623 ක් 2022 පෙබරවාරි 10 දින දක්වා මාස 06 ත් මාස 09 ත් අතර කාලයක් රඳවාගෙන ඒවා පැළ වූ පසුව රු.3,011,053 කට නැවත අලෙවි කර තිබීමෙන් මණ්ඩලයට	2021	පොල් අලෙවි කිරීම සම්බන්ධ අභ්‍යන්තර පාලනය වැඩිදියුණු කිරීමටත්, වගකීම් ඉටු නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගැනීමටත් කටයුතු කළ යුතුය.	පොල් ගැණුම්කරුවන්ට පොල් ඉවත් කර ගැනීමට දින 35 ක කාලයක් ලබා දී ඇත.	අභ්‍යන්තර මූලික විමර්ශනයක් සිදුකර ඇති අතර පොල් ගැනුම්කරු වෙතින් මණ්ඩලයට වූ පාඩුව අයකරගෙන නොතිබුණි.

	රු.1,473,894ක පාඩුවක් සිදු වී තිබුණි.				
2	මණ්ඩලය සතු පොල් වතුවල පොල් අස්වැන්න ලබා ගැනීම සම්බන්ධයෙන් චක්‍රලේඛ නිකුත් කර තිබුණ ද, වැටෙන පොල් ප්‍රතිශතය අවම කිරීම, වාර්ෂිකව කැඩිය යුතු පොල් මුර ප්‍රමාණය, කලටි පොල්, පුහු පොල් හා නරක් වූ පොල් සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ආකාරය පිළිබඳව ප්‍රමාණවත් උපදෙස් ලබා දී නොතිබුණි. මෙම නිසා මණ්ඩලයේ පොල් අස්වැන්න වාසිදායකව හා සාර්ථකව කළමණාකරනය කර ඇති බවට නිරීක්ෂණය කළ නොහැකි විය.	2021	චක්‍රලේඛ මඟින් නිසි උපදෙස් ලබාදී වාසිදායකව පොල් අස්වැන්න ලබා ගනිමින් අස්වැන්න සාර්ථකව කළමණාකරනය කිරීමට කටයුතු කළ යුතුය.	අදාළ චක්‍රලේඛ නිකුත් කර ඇත. දෛනික පොල් එලදාව පිළිබඳ දත්ත දිනපතා ඉලෙක්ට්‍රොනික දත්ත පද්ධතියට ඇතුළත් කරනු ලැබේ.	චක්‍රලේඛ පිළිබඳ පසු විපරම් කරමින් පොල් අස්වැන්න පිළිබඳ විධිමත්ව කළමනාකරණය කර නොතිබුණි.
3	අඹකැලේ ජාන සම්පත් මධ්‍යස්ථානයේ අක්කර 75ක භූමි ප්‍රමාණය තුළ පොල් ගස් 4015 කට හා පල්ලම ජාන සම්පත් මධ්‍යස්ථානයේ අක්කර 200 ක භූමි ප්‍රමාණය තුළ පොල් පැළ 8000 කට ජලය සැපයීම සඳහා	2021	ශක්‍යතා අධ්‍යයනයන් මත ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමටත් ජල සැපයුම් පද්ධතිවල පවත්නා අඩුපාඩුකම් නිවැරදි කර ඒවා සාර්ථකව ක්‍රියාත්මක කිරීමටත් කටයුතු කළ යුතුය.	ශක්‍යතා අධ්‍යයන වලින් පසු පමණක් මේ වන විට මෙවැනි ව්‍යාපෘති ආරම්භ කෙරේ. 2022 වර්ෂයේදී ශක්‍යතා අධ්‍යයන වලින් අසමත් ඇතැම් ජල සම්පාදන ව්‍යාපෘති ආරම්භ	වර්තමානයේදී ද අඹකැලේ හා පල්ලම වතුවල ස්ථාපිතකර ඇති ජල සැපයුම් පද්ධති නිසි පරිදි ක්‍රියාත්මක නොවන අතර ටැංකි හා ළිඳේ ජලය වගාවන් සඳහා යොදා ගනියි.

	රු.26,425,215 ක වියදමකින් ජල සැපයුම් පද්ධති 02 ක් ස්ථාපිත කර තිබුණු නමුත් ඒ සඳහා ඉදි කළ නල ලිං 04 හි ජලය ප්‍රමාණවත්ව නොතිබීමෙන් ටැංකි 04 කට හා ළිඳකට ජලය එක් රැස් කර ක්ෂත්‍රය කොටස් කර දින 07 කට වරක් බැගින් ජලය සපයනු ලැබීමෙන් ගසකට ප්‍රමාණවත් ජලය නොලැබුණු අතරපල්ලම ජාන සම්පත් මධ්‍යස්ථානයේ අක්කර 215 ක භූමි ප්‍රමාණයක පවතින පොල් වගාව මෙම ජල සැපයුම් පද්ධතියෙන් ආවරනය නොවීය. ඒ හේතුවෙන් මෙම ජල පද්ධතිවලින් අපේක්ෂිත ප්‍රතිඵල ලැබෙන බව නිරීක්ෂණය නොවීය.			නොකරන ලදී.	
4	මණ්ඩලය විසින් දකුණු පළාතේ ග්‍රාම නිලධාරී වසම් 294කට අදාළව පොල්කොළ මැලවීමේ හා කොළ කුණුවීමේ රෝගය පිළිබඳ පරීක්ෂාව 2008 වර්ෂයේ සිට අදියර 5කින් ආරම්භකර වසර 14ක කාලයක් ගත	2022	වැලිගම පොල් කොළ මැලවීමේ හා කුණු වීමේ රෝගය වැලඳී ඇති ගස් සඳහා අවශ්‍ය ප්‍රතිකර්ම කිරීම, ප්‍රතිරෝධී පැළ හඳුන්වා දීම හා රසායනික ද්‍රව්‍ය භාවිතය සම්බන්ධ පර්යේෂණ නිම කිරීමට පියවර ගත	ආරක්ෂිත කලාපය තුල පස්වන අදියර ඉතිරි වී ඇති ග්‍රාම නිලධාරී වසම්වල රෝගී ගස් සලකුණු කිරීමේ හා ඉවත් කිරීමේ කටයුතු අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ඇත.	නිරෝගී ගස් රෝගී වීම වළක්වා ගැනීම අවශ්‍ය රසායනික ද්‍රව්‍ය භාවිතය පිළිබඳ පර්යේෂණ මේ දක්වා නිමකර නොතිබුණි.

	වුවද පරීක්ෂා කළ යුතු ග්‍රාම නිලධාරී වසම් 114 ක පරීක්ෂා කිරීම් කටයුතු නිමකර නොතිබුණි. එසේම රෝග පාලනය සඳහා “රෝගී කලාපය තුළ රෝග ලක්ෂණ පෙන්වන සියලුම පොල් ගස් හා පැළ කපා ඉවත් කිරීම” සිදුවන අතර 2013 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා ප්‍රතිරෝධී දෙමුහුන් පැළ 3,193ක් වැනි සුළු සංඛ්‍යාවක් පමණක් හඳුන්වා දී තිබුණි. රසායනික ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් පර්යේෂණ සිදු කරමින් පැවතියද සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අදාළ පර්යේෂණ නිමකර නොතිබුණි.		යුතුය.		
5	අධ්‍යයන නිවාඩු ලබා විදේශගතවී තිබුණු නිලධාරීන් 08 දෙනෙකුගෙන් හා අනිවාර්ය සේවා කාලය අඩුවෙන් සම්පූර්ණ කළ එක් නිලධාරියෙකුගෙන් ගිවිසුම් කඩකිරීම හේතුවෙන් අයවිය යුතු රු.45,789,992 ක මුදල සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අය වී	2023	සේවා ගිවිසුම් විධිමත් පරිදි සකස් කළයුතු අතර එම ගිවිසුම් කඩකරන නිලධාරීන්ගෙන් අයවිය යුතු ශේෂ අයකර ගැනීමේ නීතිමය කටයුතු කිරීම නිසි පරිදි කාලීනව මෙහෙයවිය යුතුය.	සේවා ගිවිසුම් කඩකල නිලධාරීන් 7 දෙනෙකුට නඩු පවරා ඇත. තවත් නිලධාරියෙකුට නඩු පැවරීමට කටයුතු කරනු ඇත	අනිවාර්ය සේවා කාලය අඩුවෙන් සම්පූර්ණ කළ නිලධාරියෙකුට නඩු පවරා නොමැති අතර ගිවිසුම් කඩකළ නිලධාරීන්ගෙන් රු.35,934,884 ක් අයවීමට ඇත.

	නොතිබුණි.				
6	පොල් පර්යේෂණ මණ්ඩලයේ 2012 ත් 2023ත් අතර කාලපරිච්ඡේදය තුළ අතහැර දැමූ හා ක්‍රියාත්මක නොවූ පර්යේෂණ 17 ක් පැවති අතර ඉන් පර්යේෂණ 07 ක් අතහැර දමා තිබුණු අතර පර්යේෂණය ආරම්භ කළ නිලධාරියා සේවය අතහැර යාම, විදේශගතවීම, මූල්‍ය ප්‍රතිපාදන නොමැති වීම හා වෙනත් කරුණු ඒ සඳහා බලපා තිබුණි. එම පර්යේෂණ සඳහා මණ්ඩලය විසින් වැය කර තිබුණු රු. මිලියන 5.179 ක් අනාර්ථික වියදම් ලෙස විගණනයේදී නිරීක්ෂණය විය.	2023	පර්යේෂණ ආරම්භ කිරීමට පෙර එහි ධාරිතාව හා හැකියාව පිළිබඳ අධ්‍යනයක් කර ඒ අනුව ඉදිරි කටයුතු සැලසුම් කිරීම තුළින් අනාර්ථික වියදම් අවම කර ගැනීමට කටයුතු කළ යුතුය.	එම පර්යේෂණ වලදී එකතු කර ගන්නා ලද තොරතුරු හා මිලදීගත් ද්‍රව්‍ය වෙනත් පර්යේෂණ සඳහා භාවිතා කරනු ඇත.	පර්යේෂණ සැලසුම් කිරීමේ අදියරේදීම අතහැර දැමීමට හේතුවන කරුණු කලින් හඳුනාගෙන අනාර්ථික වියදම් අවම කරගැනීමට මණ්ඩලය විසින් කටයුතු කර නොමැත.
7	කිනියම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන අක්කර 141 ක භූමි ප්‍රමාණය ආවරණය වන ආකාරයට පෞද්ගලික සමාගමකට රු.21,001,925 ක් ගෙවා නල ජල පද්ධතියක් සවි කර තිබු අතර. අක්කර 141 ම ආවරණය වන සේ සිටුවන ලද සියළුම ශාකවලට	2023	ව්‍යාපෘතියේ ධාරිතාවය පිළිබඳ නිසි අධ්‍යයනයකින් පසුව වාරි පද්ධතිය සැලසුම් කර ක්‍රියාත්මක නොකිරීම තුළින් වාරි පද්ධතියේ කොටසක් අක්‍රීය වීමට වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන අවශ්‍ය විධිමත් පියවර ගත යුතුය.	විනාඩියකට ජලය ලීටර 200 ක් ලබාගත හැකි බවට ජල සම්පාදන මණ්ඩලය මඟින් ලබාදී තිබූ වාර්තාවක් පදනම් කරගෙන කිනියම බීජ පොල් උයනේ භූගත ළිඳෙන් ජලය ලබාගැනීමට	සියළුම ශාකවලට ජලය සැපයීම අරමුණ වුවද මුළු ගස් ප්‍රමාණයෙන් සියයට 5 කට වැනි සුළු ප්‍රමාණයකට මෙමගින් ජලය සපයයි. ජල සම්පාදන මණ්ඩලය විසින් නිකුත් කල වාර්තාව අනුව ජල සම්පාදන පද්ධතිය

	ජලය සැපයීම මෙහි අරමුණ විය. අවශ්‍ය ධාරිතාවය නොමැති වීම හා නළ වාරි පද්ධතියේ කොටසක් අක්‍රීය වීම හේතුවෙන් ගස් 400 කට එනම් පවතින ගස් ප්‍රමාණයෙන් සියයට 5 ක් වැනි සුළු ප්‍රමාණයකට මෙමගින් ජලය සැපයීම සිදුකරන අතර ඉතිරි සියයට 95 සඳහාම බවුසර මගින් ජලය සපයන බව විගණනයේදී නිරික්ෂණය විය.			සැලසුම් කර මෙම ජල නල පද්ධතිය ඉදිකර තිබුණද වියලි කාලයේදී විනාඩියකට ජලය ලීටර 200 ක් පොම්ප කිරීමට නොහැකි බැවින් බීජ පොල් උයනෙන් කොටසකට ජල නළ පද්ධතිය ඔස්සේ ඉතිරි කොටසට ජලය රැස් කර බවුසර මඟින් ජලය යෙදීම සිදුකිරීමට හැකිපරිදි නවීකරණය කර ඇත.	ඉදි කලත් මේ වන විට ජල ධාරිතාව වෙනස් වී ඇති නිසා වගකිව යුතු පාර්ශවයන්ට එරෙහිව කටයුතු කර නොතිබුණි.
8	කප්රුවන බීජ නිෂ්පාදන ව්‍යාපෘතිය යටතේ 2013 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා ශ්‍රී ලංකා කොළ කුන්දිරා සහ සැන්රාමන් පැළ 15,173ක ප්‍රමාණයක් සිටුවීම සඳහා හලාවත වැවිලි සමාගම වෙත ලබා දී තිබුණ ද සිටුවන ලද පැළ අතුරින් සියයට 51 ඉක්මවූ පැළ ප්‍රතිශතයක් එනම් පැළ 7,799 ක් විවිධ හේතූන් මත සක්‍රීය තත්ත්වයේ නොමැති බව නිරීක්ෂණය විය.	2023	නිසි අධීක්ෂණයකින් යුතුව දෙමුහුන් පොල් පැළ නිෂ්පාදන ව්‍යාපෘතියේ කාර්යන් සිදුකර එහි අරමුණ සාර්ථක කර ගැනීමට කටයුතු කළ යුතුය.	විවිධ සමෝධානික පළිබෝධ පාලන ක්‍රම අනුගමනය කර මෙම පුරප්පාඩු ඇතිවීමේ තතත්වය පාලනය කර ඇත.	සක්‍රීය තත්ත්වයේ නොමැති පැළ 7,799 ක් වෙනුවෙන් පැල 1,000 ක් පමණක් වගාකරුවන් වෙත ලබා දි ඇත.

එම ශාක එලදැරීම ආරම්භවීමේ සිට වර්තමානය දක්වා කාලය තුළ නිපදවන ලද මුළු කප්රුවන බීජ පොල් ගෙඩි 104 ක් කිණියම වත්තේ තවාන් කර ඇති බවට ස්ථානීය පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. 2018 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා මෙම ව්‍යාපෘතියට රු.47,249,489 ක් වියදම් කර තිබුණු අතර 2013 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් දැරූ වියදම් වෙනම හඳුනාගෙන නොතිබුණු අතර මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් කිනියම වත්තේ දැවමය වටිනාකමක් සහිත තේක්ක ගස් 969 ක්ද, කපා ඉවත් කර තිබුණි.

3.93 ජාතික ගමනාගමන කොමිෂන් සභාව

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	901,809,912	426,194,939	475,614,973	(106,376,247)	තත්ත්වාගණනය කළ
2022	1,158,038,242	511,162,636	646,875,606	181,260,633	තත්ත්වාගණනය කළ
2023	1,646,743,824	806,952,782	839,791,042	492,915,436	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්වය
1.	1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 28 වන වගන්තිය ප්‍රකාරව යම් තැනැත්තෙකු වෙත 24 වගන්තිය යටතේ ලබාදෙන ලද මගී සේවා අවසර පත්‍රයක් වෙනත් තැනැත්තෙකුට පැවරිය නොහැකි විය යුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුලදී මගී සේවා අවසර පත්‍ර 33 ක අයිතිය පැවරීම සිදුකර තිබුණි.	2022	පනතෙහි විධිවිධානවලට පරිබාහිරව මගී සේවා අවසර පත්‍ර 33 ක අයිතිය පැවරීම සම්බන්ධයෙන් සොයා බලා ඒ් සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.	මෙම වගන්තිය සංශෝධනය විය යුතු බවට කොමිෂන් සභාව හඳුනාගෙන ඇති අතර මෙම වගන්තිය සංශෝධනය කිරීමට පියවරගෙන ඇත.	කොමිෂන් සභා පනතේ සංශෝධන කටයුතු සිදු කරමින් පවතී.
2.	2021 නොවැම්බර් 16 දිනැති පීඊඩී 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.8 වගන්තිය ප්‍රකාරව රාජ්‍ය ව්‍යාපාර විසින් අදාල රේඛීය	2022	චක්‍රලේඛ ප්‍රතිපාදන වලට පරිබාහිරව කටයුතු කර ඇති නිලධාරීන් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු අතර	ප්‍රවාහන අමාත්‍යාංශයේ ලේකම්ගේ ලිඛිත හා වාචික අනුමැතිය ලබාගෙන ඇත.	ප්‍රවාහන අමාත්‍යාංශය වෙනුවෙන් දරණ ලද වියදම් ප්‍රතිපූරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

	අමාත්‍යාංශයේ වියදම් දැරීම නොකල යුතු වුවත්, කොමිෂන් සභාව විසින් අමාත්‍යාංශයේ පවත්වන ලද වැඩමුළුවක් සඳහා රු.198,250 ක් හා අමාත්‍යවරයාගේ නිල නිවසේ ආරක්ෂක සේවා කටයුතු වෙනුවෙන් රු.225,128 ක් ද වශයෙන් රු. 423,378 ක වියදම් දරා තිබුණි.		ඉදිරියේදී චක්‍රලේඛ ප්‍රතිපාදන ප්‍රකාරව කටයුතු කිරීමට වගබලා ගත යුතුය.		
3.	අන්තර් පළාත් බස් රථ සේවා සැපයීම සඳහා මගී සේවා අවසර පත්‍ර නිකුත් කිරීමේ නිත්‍ය ක්‍රමවේදයක් සකස් කොට ඒ අනුව ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත සංශෝධනය කිරීමට කොමිෂන් සභාව මේ දක්වා කටයුතු කර නොතිබුණි.	2022	කොමිෂන් සභා පනත සංශෝධනය ප්‍රමාදවීමට හේතු සොයා බලා පනත සංශෝධනය කිරීමට කඩිනමින් කටයුතු කළ යුතුය.	පනත සංශෝධනයට අදාල කාර්යයන් දැනට සිදු කෙරෙමින් පවති.	පනත සංශෝධන කටයුතු සිදු කරමින් පවතී.
4.	සමාලෝචිත වර්ෂය තුලදී නිසි සැරිය සේවා පවත්වාගෙන යාමට හා නව ව්‍යාපෘති 100 ක් ක්‍රියාත්මක කිරීම සඳහා රු. මිලියන 34.5 ක් වෙන්කර තිබුණද, නව එක් සේවාවක් හෝ ආරම්භ කිරීමට කොමිෂන් සභාව කටයුතු කර නොතිබුණි.	2022	අවශ්‍යතාවයන් හා අරමුදල් තත්වයන් නිසි පරිදි හඳුනාගෙන ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමටත්, වෙන් කල ප්‍රතිපාදන නිශ්චිත කාර්යයන් වෙනුවෙන් වැය කිරීමටත් වගබලා ගත යුතුය.	සහනාධාර මුදල් වැඩි කිරීමට අරමුදල් ප්‍රමාණවත් නොවූ නිසා කොමිෂන් සභාවේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් නිසි සැරිය නව සේවාවන් ආරම්භ කිරීම තාවකාලිකව නැවැත්වීමට අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය ලබාගෙන ඇත.	නිසි සැරිය නව ව්‍යාපෘති ආරම්භ කර නොතිබුණි.

5.	1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 18 වන වගන්තිය ප්‍රකාරව පළාත් දෙකක් හෝ ඊට වැඩි ගණනක් අතර මගීන් ප්‍රවාහනය කිරීම සඳහා බස් රථ යෙදවීමට මගී සේවා අවසර පත්‍ර නිකුත් කිරීමේ බලතල කොමිෂන් සභාව සතු වුව ද මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය විසින් ද අන්තර් පළාත් මාර්ග සඳහා බලපත්‍ර 5 ක් නිකුත් කර තිබුණ ද ඒ සම්බන්ධයෙන් කොමිෂන් සභාව කිසිදු පියවරක් ගෙන නොතිබුණි.	2023	පනත ප්‍රකාරව මගී සේවා අවසර පත්‍ර නිකුත් කිරීම හා පැවරීම් සිදු කළ යුතුය.	අන්තර් පළාත් මාර්ග වල ධාවනය සඳහා මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරි විසින් නිකුත් කර ඇති මගී සේවා අවසර පත්‍ර ජාතික ගමනාගමන කොමිෂන් සභාව හරහා නිකුත් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී ඇත.	මේ සම්බන්ධයෙන් පළාත් ප්‍රවාහන අධිකාරි වලට උපදෙස් ලබාදී ඇත.
6.	2023 සැප්තැම්බර් 11 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අමප/23/1597/608/060-1 අනුව 2019 වර්ෂයේ ආරම්භ කළ ශ්‍රී ලංකා ගමනාගමන කාඩ්පත් ව්‍යාපෘතිය වෙනුවෙන් කොමිෂන් සභාව රු.391,441 ක් වියදම් දරා තිබුණු නමුත් ශක්‍යතා අධ්‍යයනයකින් තොරව ආරම්භ කර තිබුණු එම ව්‍යාපෘතිය සමාලෝචිත වර්ෂය වන විට අසාර්ථක වීම මත නතර කර තිබුණි.	2023	ශක්‍යතා අධ්‍යයනයක් මත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ යුතුය.	ආර්ථික කළමනාකරණය පිළිබඳ කැබිනට් කමිටුව මෙම ව්‍යාපෘතිය ඉදිරියට යාම පිලිබඳව ගැටළු සහගත තත්ත්වයක් පවතින හෙයින් මෙම සියළුම ගැටළු වලට විසඳුම් ලබා ගනිමින් නව ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා කැබිනට් මණ්ඩලය මගින් ප්‍රවාහන අමාත්‍යාංශය වෙත මෙම කාර්යය පවරා තිබුණි. ඒ අනුව කැබිනට් මණ්ඩලය විසින් පත්	2024 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම තුළ නැවත මෙම ව්‍යාපෘතිය ඇතුළත් කර තිබුණි.

				කරන ලද කමිටුවේ නිරීක්ෂණය මත අදාල ඉදිරි කටයුතු ප්‍රවාහන අමාත්‍යාංශය මගින් සිදු කරමින් පවතී.	
7.	1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 8 වන වගන්තියේ කොමිෂන් සභා කර්තව්‍යය යටතේ මගී සේවා අවසර පත්‍ර ප්‍රදානය කිරීම හා පනතේ 24 වන වගන්තිය අනුව අවසර පත්‍ර නිකුත් කිරීමට කොමිෂන් සභාවට ප්‍රතිපාදන සලසා තිබුණි. කොමිෂන් සභාව මගී සේවා අවසර පත්‍ර නිකුත් කිරීමේ නියමිත ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබුණු අතර මගී සේවා අවසර පත්‍ර ටෙන්ඩර් වටිනාකම, අවම තාක්ෂණික අගය මත, රු.3,000, රු.10,000 හා රු.15,000 යන වටිනාකම් මත ලබා දී තිබුණි. තව ද 2024 මැයි වන විට ද කොමිෂන් සභාව විසින් මගී සේවා අවසර පත්‍ර නිකුත් කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සලස්වමින් ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත සංශෝධනය කිරීමට ද	2023	මගී සේවා අවසර පත්‍ර නිකුත් කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතුය.	මගී සේවා අවසර පත්‍ර නිකුත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය අනුමත නව ක්‍රමවේදය හරහා මගී සේවා අවසර පත්‍ර නිකුත් කිරීමට කටයුතු කරමින් පවතී. මගී සේවා අවසර පත්‍ර ගාස්තු අය කිරීම සමාලෝචනය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කමිටුවක් පත් කර ඇති අතර, එම කමිටු වාර්තාව ජූනි මස පැවැත්වෙන අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කිරීමට කටයුතු සූදානම් කර ඇත. පනත් සංශෝධනය දැනටමත් නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති අතර, එහි ත්‍රෛභාෂා පරිවර්තන කටයුතු සිදු කරමින් පවතින බව දැනුවත් කර තිබුණි.	නීතිමය කටයුතු සිදු වෙමින් පවතී.

	කටයුතු කර නොතිබුණි.				
8.	වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව අන්තර් පළාත් නව දිගු දුර සංඥා කණු 300 ක් ඉදිකිරීම සඳහා රු.10,340,000 ක් වෙන්කර තිබුණ ද, සමාලෝචිත වර්ෂය තුළ දී රු.242,000 ක් වැයකර සංඥා කණු 84 ක් පමණ ඉදිකර තිබුණි. ඒ අනුව කණු 216 ක් ඉදිකිරීමට නොහැකිව තිබූ අතර එය ප්‍රතිශතයක් ලෙස සියයට 72 ක් පමණ විය. තව ද සංඥා කණු ඉදිකිරීමේ සත්‍ය පිරිවැය හා සැසඳීමේදී ඇස්තමේන්තු ගත පිරිවැය සියයට 90 කින් වැඩිපුර ගණනය කර තිබුණි.	2023	ක්‍රියාකාරී සැලැස්ම අනුව කාර්යයන් නිම කිරීමට කටයුතු කළ යුතුය.	දුර ගමන් සේවා බස් රථ සීමිත සංඥා පුවරු සැපයීම ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ ප්‍රතිපාදන මගින් සිදු කිරීම සඳහා 2023.12.31 තෙක් මුදල් අමාත්‍යාංශයෙන් අනුමැතිය ලැබී නොමැත.	2024 ක්‍රියාකාරී සැලැස්ම අනුව කණු 1,000 ක් සඳහා රු.40,100,000 ක් ප්‍රතිපාදන වෙන් කර තිබුණි.

3.94 ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	1,943,558,737	192,035,565	1,751,523,173	123,542,486	තත්ත්වාගණනය කළ
2022	2,078,635,682	189,782,022	1,888,853,660	422,911,482	තත්ත්වාගණනය කළ
2023	2,881,666,915	884,782,245	1,996,884,670	957,640,667	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1.	2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1. (ආ) වගන්තිය ප්‍රකාරව අවම වශයෙන් වසර 03 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මෙහි ලැයිස්තුගත කර තිබිය යුතු අතර, (ඉ) වගන්තිය අනුව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම මාස හයකට වැඩි නොවන කාලයක් තුළදී නිතිපතා යාවත්කාලින කළ යුතු වුවද, ආයතනය ඒ අනුව කටයුතු කර නොතිබුණි.	2021	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතුය.	වසර තුනක් සඳහා ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර නොතිබුණු අතර, වසරක් සඳහා ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර තිබුණි. මෙම වසර තුළ මාස 06 න් ප්‍රසම්පාදන සැලැස්ම යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි.	වසර 3 ක කාලයක් සඳහා ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර නොතිබුණි.

2.	ආයතනයේ ශාඛා කාර්යාල පිහිටුවීම සඳහා රජයේ ගොඩනැගිලි යොදා ගැනීමට හෝ ස්ථිර ගොඩනැගිලි ඉදිකිරීමට කටයුතු නොකර කුලී පදනම මත ලබාගෙන තිබූ පෞද්ගලික අංශයේ ගොඩනැගිලි සඳහා සමාලෝචිත වර්ෂයේදී ගොඩනැගිලි කුලී වශයෙන් රු. 31,437,501 ක් ගෙවා තිබුණි.	2022	රජයේ චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.	ඉදිරියේදී රජයේ ගොඩනැගිලි ලබා ගැනීමට කටයුතු කරන බව දන්වා තිබුණි.	තවදුරටත් පෞද්ගලික අංශයේ ගොඩනැගිලිවල ශාඛා කාර්යාල පවත්වාගෙන යනු ලැබේ.
3.	1971 අංක 38 දරන මුදල් පනත 11 වන වගන්තිය ප්‍රකාරව ආයතනය විසින් මුදල් ආයෝජනය කිරීමේදී මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගත යුතු වුවත් එසේ අනුමැතිය ලබාගැනීමෙන් තොරව රු.1,513,150,579 ක මුදලක් ස්ථාවර තැන්පතු හා භාණ්ඩාර බිල්පත් වල ආයෝජනය කර තිබුණි.	2021, 2022	මුදල් පනත ප්‍රකාරව කටයුතු කල යුතුය.	මෙම රු.1,513,150,579 ක ස්ථාවර තැන්පතු හා භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජනය කර ඇති මුදල නව ආයෝජන නොවන අතර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත ආයෝජන සිදු කරනු ලබයි.	පනත ප්‍රකාරව අනුමැතිය ලබා ගෙන නොමැත.
4.	1997 අංක 25 දරන ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතන පනතේ 3(ආ) වගන්තිය ප්‍රකාරව බර වාහන ඇතුළු සියළු වර්ගවල මෝටර් රථ වාහන වල රියදුරන් හා	2023	ප්‍රමිතීන් හා නිර්ණායක යාවත්කාලීන කිරීමට කටයුතු කළ යුතුය.	සේවාලාභීන්ගේ වෛද්‍ය පරීක්ෂණ සිදුකිරීම සඳහා අවශ්‍ය වන ප්‍රමිතීන් හා වෛද්‍ය නිර්ණායක ආරම්භයේ සිටම හඳුනාගෙන ඇති	තවදුරටත් පද්ධති වෛද්‍ය පරීක්ෂා වාර්තාවේ දෘශ්‍ය මට්ටම සටහන් කිරීමට කටයුතු කර නොතිබුණි.

	ධාවකයින් පරීක්ෂා කර ඒ රියදුරන් හා ධාවකයන්ට ශාරීරික හා මානසික යෝග්‍යතාවය පිළිබඳ සහතික ලබා දීම සිදුකරනු ලැබුව ද රුධිර සීනි මට්ටම 200 ට වැඩි සේවාලාභීන් වෛද්‍ය පරීක්ෂාවෙන් සමත් කර තිබුණු අතර පද්ධති වෛද්‍ය පරීක්ෂණ වාර්තාවේ පරීක්ෂණ අවස්ථාවේ දී සේවාදායකයින්ගේ දෘශ්‍ය මට්ටම සටහන් කිරීමට ද කටයුතු කර නොතිබුණි.			අතර මේ දක්වා ප්‍රමිතින් හා නිර්ණායකයන් ශ්‍රී ලංකාව තුල ඒ ඒ විෂය ක්ෂේත්‍රයට අදාලව පිහිටා ඇති විශේෂඥ වෛද්‍ය විද්‍යාලවල නිර්දේශ සහිතව යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි.	
5.	නුගේගොඩ ප්‍රධාන කාර්යාලයේ රියදුරු හා ආරක්ෂක විවේකාගාර ගොඩනැගිල්ලේ පළමු මහළ දින 180 කින් ඉදිකිරීමට 2022 පෙබරවාරි 09 දින පෞද්ගලික සමාගමක් සමඟ වැට් බදු සහිතව රු.6,629,903 ක වටිනාකමට ගිවිසුමකට එළඹී තිබුණි. කොන්ත්‍රාත්කරු වෙත 2024 වර්ෂය වන විට රු.7,309,432 ක් ගෙවා තිබුණ ද, ඉදිකිරීම් කටයුතු නිම කර නොතිබුණි.	2023	කොන්ත්‍රාත් ගිවිසුම් හා අධ්‍යක්ෂ මණ්ඩල තීරණ පරිදි කටයුතු කළ යුතුය.	කළමනාකරණය මේ සම්බන්ධයෙන් අවස්ථා රාශියකදී කටයුතු කරන ලද අතර, අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා කිහිපයක්ම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කරන ලදී. එසේම අප රාජකාරි කළයුත්තේ වර්තමානයේ රජය විසින් වරින් වර නිකුත් කරන රාජ්‍ය වියදම් කළමනාකරණ චක්‍රලේඛ වලට අනුව වේ. ඉහත කරුණු හේතුවෙන් 2023 වර්ෂයට අදාළ ප්‍රසම්පාදන සැලැස්ම අනුව මෙම කාර්යය නිම කර ගැනීමට නොහැකි වී තිබුණි.	අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මත නැවත ලංසු කැඳවා කොන්ත්‍රාතාත්ක රුවෙකු තෝරා ගැනීමට තීරණය කර තිබුණි.

6.	ආයතනයට වෛද්‍යවරුන්, පරිපාලන නිලධාරීන්, දත්ත විශ්ලේෂකයන් බඳවා ගැනීමට අදාළ බඳවා ගැනීමේ පටිපාටිය සඳහා අනුමැතිය ලැබී නොතිබීම හේතුවෙන් ආයතනයට අවශ්‍ය වෛද්‍යවරුන් 67 දෙනෙකුද, පරිපාලන නිලධාරීන් 17 දෙනෙකුද බඳවා ගැනීමට නොහැකි වී තිබුණි.	2021, 2022, 2023	බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කරවා පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතුය.	රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ වැටුප් හා දීමනා මත අපගේ ආයතනයෙන් වෛද්‍ය නිලධාරීන්ට ගෙවනු ලබන දීමනා අඩු බැවින් ස්ථිර පදනම මත වෛද්‍ය නිලධාරීන් ආයතනයේ සේවයට පැමිණීමට අකමැත්තක් දක්වයි. එබැවින් කොන්ත්‍රාත් පදනම මත හා දෛනික පැය පදනම මත වෛද්‍ය නිලධාරීන් බඳවා ගෙන සේවාලාභීන් අපහසුතාවයට පත් නොවන පරිදි සේවය අඛණ්ඩව පවත්වා ගෙන යනු ලබයි. පරිපාලන නිලධාරි තනතුර සඳහා බඳවා ගැනීමේ පරිපාටිය අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබුණි.	වෛද්‍ය නිලධාරි තනතුර පුරප්පාඩුව පවතී.

3.95 ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	බදු පෙර ලාභය (අලාභය) රු.	මතය
2021	19,482,396,000	9,177,719,000	10,304,677,000	1,262,996,000	තත්ත්වාගණනය කළ
2022	20,712,118,000	10,096,787,000	10,615,331,000	761,037,000	තත්ත්වාගණනය කළ
2023	18,742,623,000	7,689,078,000	11,053,545,000	1,223,298,000	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	සංස්ථාව වෙත නිදහස් රදවා ගැනීමේ පදනම මත (Free Hold Basis) රජය විසින් ලබාදී තිබූ මුතුරාජවෙල පිහිටි අක්කර 02 ක පමණ ඉඩමක් සඳහා අමප/19/2832/16/11 අංක හා 2019 ඔක්තෝබර් 29 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ඒ සඳහා දැරූ සංවර්ධනය කිරීමේ වියදම් අයකර ඉතිරි මුදල රජයේ ඒකාබද්ධ අරමුදලට බැර කරන ලෙසට දන්වා තිබුණද එලෙස එම ඉඩම 2019 දෙසැම්බර් 17 දින විකුණා රු. මිලියන 272.62 ක් ලබාගෙන තිබූ නමුත් දැරූ සංවර්ධන වියදම රු.	2023 2022 2021	අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව ඉතිරි මුදල රජයේ ඒකාබද්ධ අරමුදලට හෝ ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත ගෙවිය යුතුය	සංස්ථා පනතේ 3 (අ) වගන්තිය යටතේ මෙම සංස්ථාව වෙත පැවරී ඇති ඉඩම් විකිණීම් යටතේ බැහැර කරනු ලබන අවස්ථාවලදී එම ඉඩම් සඳහා වන නොදියුණු වටිනාකම ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත ගෙවිය යුතුය. ඒ අනුව ගෙවිය යුතු නොදියුණු වටිනාකම ඉදිරියේදී ගෙවීමට කටයුතු කරනු ලැබේ.	ගෙවිය යුතු නොදියුණු වටිනාකම මේ වන තෙක් ගෙවා නොමැත.

	මිලියන 21.02 ක් අඩුකර ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු රු. මිලියන 251.60 ක් 2024 මැයි දක්වාම බැරකර නොතිබූ අතර එම වගකීම් හඳුනාගෙන ඒ සඳහා සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන තුළ වෙන් කිරීම් සිදුකර නොතිබුණි.					
2	සංස්ථාව වෙත 2023 සැප්තැම්බර් 13 දින මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය වෙතින් ලද අංක PED/A/Rev –L/1/15 (ii) දරන ලිපියට අනුව රු.මිලියන 750 ක වටිනාකමක් ඒකාබද්ධ අරමුදලට ගෙවිය යුතු ලෙස නියම කර තිබූ අතර 2023 වර්ෂය තුළ සංස්ථාව විසින් රු.මිලියන 500 ක් පමණක් ගෙවා තිබූ අතර ඉතිරි රු.මිලියන 250 ජංගම වගකීම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබීම හේතුවෙන් ජංගම වගකීම් එම අගයෙන් ඌන ගණනය වී තිබුණි.	2023		බැදීම් නියමිත පරිදි ගිණුමගත කළයුතුවේ.	රාජ්‍ය ව්‍යාපාර සඳහා වන මෙහෙයුම් අත්පොතේ 5.3 ඡේදය අනුව බදු පසු ශුද්ධ ලාභයෙන් සියයට 30 ක් ඒකාබද්ධ අරමුදලට ගෙවිය යුතු බව නිර්දේශ කර ඇත. සංස්ථාවේ බදු පසු ලාභය වන රු. මිලියන 938 න් සියයට 30 ක ප්‍රමාණය වන රු. මිලියන 281 කි. එහෙත් සංස්ථාව විසින් ගෙවිය යුතු ප්‍රමාණය ඉක්මවා ගෙවා ඇත.	ඉතිරි මුදල් මේ දක්වා ගෙවා නොමැත.
3	වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මඟින් ප්‍රතිපාදන සලසා ගැනීමකින් තොරව 2020 දෙසැම්බර් 15 දින ආරම්භ කර තිබූ	2023 2022 2021		වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මඟින් ප්‍රතිපාදන වෙන්කර නොමැති හා නිසි පරිදි පූර්ව	හිටපු ජනාධිපතිතුමා සමග සංස්ථාවේ හිටපු සභාපතිතුමා සාකච්ඡා කල පරිදි ක්‍රියාත්මක කල මෙම ව්‍යාපෘතිය	මෙම ව්‍යාපෘතිය සඳහා දරන ලද වැඩවල වටිනාකම, අධ්‍යක්ෂ මණ්ඩලයේ

අතුරුගිරිය කොතලාවල අධිවේගී මාර්ග අන්තර් හුවමාරුව ආශ්‍රිතව රේඛිය උද්‍යානයක් ඉදිකිරීමේ සහ ජලාපවහන වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා සංසථාවේ මුදල් රු. මිලියන 195.03 ක් වැයකර තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන අනුමත කර ගැනීම උදෙසා ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා වූ අමාත්‍ය මණ්ඩල තීරණයේ සඳහන් පරිදි ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ නිර්දේශ අනුව ව්‍යාපෘති යෝජනාව සඳහා පුළුල් ශක්‍යතා අධ්‍යනයක් සිදු කර නොතිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා 2023 වර්ෂය දක්වා රු.මිලියන 3.06 ක පමණ නඩත්තු වියදමක් දැරීමට සංස්ථාවට සිදුවී තිබුණි. ඒ අනුව ඉහල කළමනාකරණයේ අභිමතය පරිදි සිදුකරන ලද මෙවැනි ව්‍යාපෘති හේතුවෙන් සංස්ථාවට දැරීමට සිදුවූ වියදම් සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන එම අලාභ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	අනුමැතියක් ලබාගැනීමකින් තොරව ව්‍යාපෘති ආරම්භ නොකල යුතුය.	සැලසුම් කරන ලද මෙම ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත මුදල රු.මි 796 ක් වන බැවින් හා විෂය පථය පුළුල්වීම හේතුවෙන් වෙනම ප්‍රතිපාදන සලසා ගැනීමට තීරණය කර තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති බව එවකට රේඛීය අමාත්‍යාංශයේ පැවති ප්‍රගති සමාලෝචන රැස්වීම් වලදී අනාවරණය වන ලදී.	අනුමැතිය මත සමාජ සුභසාධන වියදමක් ලෙස මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් කිරීමට කටයුතු කර තිබුණි. සංස්ථාවට දැරීමට සිදුවූ වියදම් සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන එම අලාභ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

4	1981 වර්ෂයේ සිට 2005 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදය තුළ සංස්ථාව විසින් පවරා ගත් ඉඩම්වලට අදාල වන්දි මුදල් ගෙවීමේ කටයුතු ප්‍රමාද වීම හේතුවෙන් එම ඉඩම් වෙනුවෙන් 2023 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු වන්දි මුදල රු. මිලියන 73.02 ක් වූ අතර ඊට අදාළව ගෙවිය යුතු පොළිය රු. මිලියන 123.69 ක් විය. ඒ අනුව 2023 වර්ෂය අවසානයට ගෙවිය යුතු වූ පොළිය 2022 වර්ෂයට වඩා රු. මිලියන 5.16 කින් වැඩි වී තිබුණි. එමෙන්ම ඉඩම් පවරා ගැනීම සඳහා අවුරුදු 14 සිට අවුරුදු 40 දක්වා කාල පරාසයක් ගතවී තිබීම හේතුවෙන් මෙම ඉඩම් වල අනවසර පදිංචිකරුවන්ගේ පදිංචිවීම වැඩි වී ඇති බව වැඩි දුරටත් අනාවරණය විය.	2023 2022 2021	ඉඩම් වලට අදාළ වන්දි මුදල් කාලීනව නිරවුල් කර වන්දි පොළිය අවම කර ගත යුතු අතර අනවසර පදිංචි කරුවන් ඉවත් කිරීමට කටයුතු කළ යුතුය.	මෙලෙස සිදුවන ප්‍රමාදයන් හැකිතාක් දුරට අවම කරගැනීම සඳහා හා අදාළ උපදෙස් ප්‍රාදේශීය ලේකම්වරුන්ට ලබාදීම සඳහා දිසාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් සියලුම ආයතන සම්බන්ධීකරණයෙන් කළමනාකරණ කමිටු රැස්වීම් කැඳවා එකී ප්‍රමාදයන් අවම කර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන තිබේ.	මෙම ගැටළුව 2024 ජූලි 25 දින පැවති පරිසර, ස්වභාවික සම්පත් හා තිරසාර සංවර්ධන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ආංශික උපදේශන කාරක සභාවේ අවධානයටද යොමු කරන තිබුණි.
5	1968 අංක 15 දරන ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථා පනතේ 2(ආ) 1 වගන්තිය අනුව දිවයින පුරා පළාත් මට්ටමින් පිහිටි පහත් වගුරු බිම්, නිසරු හෝ මඩ ඉඩම් හඳුනාගෙන අනවසර ඉඩම් ගොඩකිරීම් පාලනය කිරීම හා අධීක්ෂණය	2023 2022 2021	පනතේ විධි විධානවලට අනුකූල විය යුතුය.	මේ වන විට පළාත් 7 ක් තුල පිහිටි වගුරු, නිසරු, ගොහොරු ඉඩම් ප්‍රකාශයට පත් කිරීමට අදාළ නිර්දේශයන් ලැබීමෙන් අනතුරුව ඉඩම් අමාත්‍යාංශය වෙත යොමු කළ හැකි වේ. උතුරු	සිදුකරන ලද අනවසර ඉදිකිරීම් කිහිපයක් සම්බන්දයෙන් අධිකරණ නියෝග ලබාගෙන ඇත එසේම ජල රක්ෂිත ප්‍රදේශ ආරක්ෂා කරගැනීම සඳහා

කිරීමට හැකිවන පරිදි ඒවා ගැසට් නිවේදන මඟින් ප්‍රසිද්ධ කිරීමට සංස්ථාව වෙත බලය පවරා තිබුණද 2023 වර්ෂය අවසානයට සංස්ථාව විසින් එලෙස ගැසට් කරන ලද පළාත් ගණන 07 කට සීමාවී තිබුණි. මායිම් ගැසට් කර තිබුණු එම ඉඩම් ප්‍රදේශවල සිදු වන අනවසර ගොඩකිරීම් හා අනවසර පදිංචිවීම් වැළැක්වීමට සංස්ථාව අපොහොසත් වී තිබුණි. එමෙන්ම ඉහත පනතේ 8 (අ) වන වගන්තිය අනුව ගොඩකිරීමට හා සංවර්ධනය කිරීමට පවරා ගනු ලබන ඉඩම්, සංස්ථාව විසින් ගොඩනැගිලි ඉදිකිරීමට, කර්මාන්ත වාණිජ්‍ය හා කෘෂිකාර්මික කටයුතු වෙනුවෙන් වැඩි දියුණු කළ යුතු වුවද, සංස්ථාව විසින් එලෙස 1995 වර්ෂයේදි සංවර්ධන කටයුතු සඳහා පවරාගත් මුතුරාජවෙල හා මුදුන් ඇල ප්‍රදේශවල ඉඩම් අක්කර 800ක ප්‍රමාණයෙන් 2023 වර්ෂය අවසානයට වර්ෂ 28 ක කාලයක් ගතව තිබුණද ඉන් වැඩි දියුණු කළ ප්‍රමාණය අක්කර 400 ක් එනම්, සියයට 50 ක තරම් පහළ අගයක් විය.		පළාතට අදාළ සිතියම් හා උපලේඛන ලැබී ඇති අතර උපලේඛන පරිවර්තනය කිරීමේ කටයුතු සඳහා යොමු කර ඇත. අදාළ නිර්දේශ ලබා ගැනීමේදී ප්‍රාදේශිය ලේකම්වරුන්ගේ නිර්දේශ පළාත් ඉඩම් කොමසාරිස් මඟින් ඉඩම් කොමසාරිස්ටත් ඔවුන් මඟින් නැවත ඉඩම් අමාත්‍යාංශයටත් යොමු කරන බැවින් මේ සඳහා සැලකිය යුතු කාලයක් ගතවේ.	මායිම් ඇළවල් නිර්මාණය කිරීමද සිදු කරමින් පවතී.

6	සංස්ථාව 2010 ජූලි 14 දින නිකුත් කළ අංක 1662/17 දරන ගැසට් නිවේදනය පරිදි බස්නාහිර පළාත තුළ පිහිටි ඇල මාර්ගවල රක්ෂිත ඉඩම් (Reservation) ආරක්ෂා කිරීමට පියවර ගත යුතු වුවද 2023 වර්ෂය අවසාන වන විට උක්ත ගැසට් පත්‍රය නිකුත් කර වර්ෂ 13 ක් ගත වුවද එම රක්ෂිත ඉඩම් හඳුනාගැනීමට හෝ රක්ෂිත ඉඩම්වල පදිංචි අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීමට සාධනීය පියවර ගෙන නොතිබුණි.	2023 2022 2021	සංස්ථාවේ බලතල හා අරමුණු අනුව අනවසර ගොඩකිරීම් වැළැක්වීමට පියවර ගත යුතුය.	2010 ජූලි 14 දින නිකුත් කරන ලද අංක 1662/17 දරන ගැසට් නිවේදනයට අනුව ඇළේ මතුපිට පළලට අනුරූපීව තැබිය යුතු රක්ෂිත ප්‍රමාණයන් ප්‍රකාශයට පත්කර ඇත. ඒ අනුව බස්නාහිර පළාත තුළ පිහිටි ඇළ මාර්ගවල රක්ෂිත ඉඩම් තුළ කිසිදු ඉදිකිරීමක් සඳහා අවසර නොදෙන ලෙස පළාත් පාලන ආයතනයන් වෙත අදාළ ගැසට් පත්‍රයේ පිටපත් සහිතව නාගරික සංවර්ධන අධිකාරිය ඇතුළු සියලු පළාත්පාලන ආයතන දැනුවත් කර ඇත.	මෙම රෙගුලාසිය සම්බන්ධයෙන් සැලසුම් අනුමත කිරීමේ බලධාරියා වන නාගරික සංවර්ධන අධිකාරිය ඇතුළු සියලු පළාත්පාලන ආයතන දැනුවත් කර ඇත.
7	ගිවිසුම් ගතවීමකින් තොරව, නාගරික සංවර්ධන අධිකාරියට අයත් කිඹුලාවල පිහිටි ඉඩමක සංස්ථාව විසින් ඉදිකළ ආපන ශාලාව බදු පදනම මත පෞද්ගලික සමාගමකට 2017 වර්ෂයේදී ලබා දී තිබුණි. එහෙත් එකී ආපනශාලාව පිහිටි භූමි ප්‍රදේශය නාගරික සංවර්ධන අධිකාරියට අයත් ඉඩමක් බැවින්, සංස්ථාවට ආපනශාලාව අයිති	2023	ඉඩම පවරා ගැනීමට සහ හිඟ බදු මුදල අයකර ගැනීම සඳහා කඩිනම් පියවර ගත යුතුය.	සී/ස රක්නාලංකා ආරක්ෂක සමාගම මගින් පවත්වාගෙන යනු ලබන "අපි වෙනුවෙන් අපි" අවන්හල සහ රථවාහන නැවතුම්පොළ පිහිටි ඉඩම් කොටස නාගරික සංවර්ධන අධිකාරිය සතු ඉඩම් කොටසකි. එවකට රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ලබා දී ඇති උපදෙස් අනුව එකී	සංස්ථාව විසින් නාගරික සංවර්ධන අධිකාරිය වෙත යවන ලද 2024 අප්‍රේල් 09 සහ 2024 සැප්තැම්බර් 27 දිනැති ලිපි සඳහා මේ දක්වා පිළිතුරු ලබා දී නොතිබූ අතර මේ සම්බන්ධයෙන් තවදුරටත් අදාල පාර්ශවය සමග සාකච්ඡා කරමින්

	වුවත් ඉඩමේ අයිතිය නොමැති නිසා රු.මිලියන 24.58 ක් වූ බදු මුදල අයකර ගැනීමට 2023 වර්ෂය අවසානය දක්වාත් සංස්ථාවට නොහැකි වී තිබුණි.			සංවර්ධනයන් සිදුකර ඇත.	පවතී.
8	ඉදිකිරීම් කර්මාන්තය සඳහා වැලි සැපයීම සඳහා වෙරළෙන් ඔබ්බෙහි පිහිටි මුහුදු වැලි කියුබික් මීටර් මිලියන 4 ක් කැණීම සහ පොම්ප කිරීම සඳහා සංස්ථාව 2018 වර්ෂයේදි විදේශීය පෞද්ගලික සමාගමක් සමඟ කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ තිබුණි. එසේ වුවද ගිවිසුම්ගත විෂය පථය සම්පූර්ණ කර ගැනීමට පෙර සාධාරණ හේතුවකින් තොරව ඉහළ කළමනාකාරිත්වය විසින් සිය අභිමතය පරිදි 2020 අප්‍රේල් 10 දින ව්‍යාපෘතිය අත්හිටුවා තිබුණි. එහිදී ගිවිසුම කඩ කිරීම හේතුවෙන් සංස්ථාවට දැරීමට සිදුවන මූල්‍ය අලාභ පිළිබඳ සලකා බැලීමක් සිදු කර නොතිබුණි. ව්‍යාපෘතිය සඳහා වැයවන අමතර පිරිවැය, කොන්ත්‍රාත්කරු විසින් ඉටුකළ යුතු කාර්යයන් සම්බන්ධයෙන් ගිවිසුම්	2023	වගකිව යුතු වූ පාර්ශව හඳුනා ගෙන විනය පරීක්ෂණ සිදු කර වන්දි මුදල අයකරගැනීමට කටයුතු කළයුතුය.	නීතිපති දෙපාර්තමේන්තුවෙ උපදෙස් අනුව මැඩලිය නොහැකි බලපෑම් (Force majeure events) යටතේ ඉහත කොන්ත්‍රාත්තුව අවසන් කල හැකි බව සඳහන් කර ඇත. ඒ අනුව, 2020 අප්‍රේල් 10 දින ව්‍යාපෘතිය අත්හිටවන ලදී. තවද, 2020 පෙබරවාරි 25 දින කොන්ත්‍රාත්කරුගේ ඉල්ලීම පරිදි වැලි කැණීම් කටයුතු සිදුකරන යාත්‍රාව වෙනත් ව්‍යාපෘතියක් සඳහා නිදහස් කිරීමට කටයුතු කර ඇත්තේ 2020 පෙබරවාරි 10 දින සිට 2020 පෙබරවාරි 25 දක්වා කාලයට අදාලව එකී ලිපියේ සඳහන් කොන්දේසි අනුව සංස්ථාව විසින් නොදැරීමට යටත්වය (no any contractual claims). ඒ අනුව	බේරුම්කරණ තීන්දුවේ නියෝගය පරිදි කොන්ත්‍රාත්කරු වෙත ගෙවිය යුතු සියළු මුදල් මේ වන විට ගෙවා අවසන්කර ඇත. මේ සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන නොතිබුණි.

කොන්දේසි පරිදි කොන්ත්‍රාත්කරුට නිසි පරිදි උපදෙස් ලබා නොදීම, කොන්ත්‍රාත්කරු සමඟ පැවති ලිඛිත ගිවිසුම අවසන් වීමට ප්‍රථම කොන්ත්‍රාත්කරුවා වෙනත් ව්‍යාපෘතියකට නිදහස් කිරීම වැනි කරුණු කෙරෙහි සංස්ථාව අවධානය යොමු නොකිරීම විගණනයේදි ප්‍රශ්නකාරී විය. මේ සම්බන්ධයෙන් අගතියට පත් පාර්ශවය විසින් බේරුම්කරණයට යොමුව තිබූ අතර එම තීන්දුව මඟින් අදාළ විදේශිය පෞද්ගලික සමාගමට ඇ.එ.ජ. ඩොලර් 2,073,976 ක් (රු.මිලියන 753.08 ක්-එදිනට පැවති විනිමය අනුපාතිකය අනුව) වන්දි ලෙස ගෙවීමට සංස්ථාවට නියම කර තිබුණි. ඒ අනුව සංස්ථාව විසින් 2022 මූල්‍ය ප්‍රකාශවල සම්පූර්ණ මුදල ගෙවිය යුතු වන්දි ලෙස හඳුනාගෙන තිබුණි. ඊට අමතරව සංස්ථාව විසින් කොන්ත්‍රාත්කරු වෙනුවෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ගෙවන ලද ආදායම් බදු මුදල් ඇ.එ.ජ.ඩො.181,484.21 ක් (රු.මිලියන	කොන්ත්‍රාත්කරු විසින් 2020 පෙබරවාරි 25 දිනැති ලිපියේ සඳහන් කොන්දේසි උල්ලංඝනය කර ඇති බව සංස්ථා පාර්ශවයෙන් බේරුම්කරණයේදී කරුණු දැක්වීමට කටයුතු කරන ලදී. කොන්ත්‍රාත්කරු විසින් නැවත මෙම යාත්‍රාව සංස්ථාවේ වැලි කැණීමේ කටයුතු සඳහා පැමිණෙන දිනක් දැනුම් දෙනු ලැබුවේ කොන්ත්‍රාත් ගිවිසුම අවසන් කරන ලද 2020 අප්‍රේල් 10 දිනට පසුව දිනක දීය. මෙම කරුණු සැලකිල්ලට ගෙන මෙලෙස කොන්ත්‍රාත් ගිවිසුම අවසන් කිරීමට කටයුතු කර ඇත. එමෙන්ම සංස්ථාව පාර්ශවයෙන් 2020 ජනවාරි 31 දින කොන්ත්‍රාත්කරු වෙත පැහැදිලි උපදෙස් ලබා දී තිබියදී, කොන්ත්‍රාත්කරු විසින්ම මෙලෙස වැඩකටයුතු නවතා දමා ඇත. මෙය 2020 පෙබරවාරි 19 දින සංස්ථා පාර්ශවයෙන් කොන්ත්‍රාත්කරු

60.2) අඩුකර ගැනීමෙන් අනතුරුව, කොන්ත්‍රාත්කරු වෙත ගෙවිය යුතු වන්දි මුදල සහ අවසාන බිල්පතට අදාලව ඇ.එ.ජ. ඩොලර් 4,035,777.18 ක් (රු.මිලියන 1,338.87 ක්) 2023 නොවැම්බර් මාසයේදී කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි. මෙලෙස විශාල වන්දි මුදලක් ගෙවීමට සිදුවීම සංස්ථාවේ ද්‍රවශීලතාවයට අහිතකර ලෙස බලපාන බව නිරීක්ෂණය විය. කෙසේ වුවද සංස්ථා නිලධාරින් නොසැලකිලිමත් ලෙස කටයුතු කිරීම නිසා එළඹ තිබූ ගිවිසුමේ කොන්දේසි පරිදි මෙම වන්දි මුදල ගෙවීමට සිදුව තිබූ නමුත් මේ සඳහා වගකිව යුතු වූ පාර්ශව හඳුනා ගෙන අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. එමෙන්ම මුදල් රෙගුලාසි ප්‍රකාරව හානි හා පාඩු සම්බන්ධයෙන් අදාළ බලධාරින් වෙත දැනුම් දී නොතිබු අතර අදාළ පාඩුව සම්බන්ධ සිදුකළ යුතු මූලික හා ද්විතික පරීක්ෂණ 2023 වර්ෂය අවසාන වන විටත් පවත්වා නොතිබුණි.

වෙත යවා ඇති ලිපියෙන් තහවුරු වේ.

ඉහත සඳහන් කරුණු සංස්ථා පාර්ශවයෙන් බේරුම්කරණය වෙත ඉදිරිපත්කර ඇත. කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත්කර ඇති හිමිකම් පෑම් පිළිබඳව ව්‍යාපෘති ඉංජිනේරුවරයා විසින් වගඋත්තරකරු වන ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව වෙනුවෙන් ඉදිරිපත්කර ඇති සාක්ෂි ප්‍රකාශයෙහි දක්වා ඇත්තේ පැමිණිලිකරුවන වන කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කරන ලද හිමිකම් පෑම සඳහා වලංගු යොමුකිරීමක් සිදු කර නොමැති බවයි. ඒ අනුව කොන්ත්‍රාත්කරු බේරුම්කරණයක් සඳහා යොමුවී ඇති අතර බේරුම්කරණ විනිශ්චය සභාව විසින් මුල් හිමිකම් පෑම් 4 සඳහා ඇමෙරිකානු ඩොලර් 1,742,198 ක හිමිකමක් පමණක් කොන්ත්‍රාත්කරු වෙත ප්‍රදානය කරන ලදී. මෙය

				කොන්ත්‍රාත්කරුගේ මුළු හිමිකම් පැමෙන් සියයට 27.3 පමණි. මීට අමතරව බේරුම්කරණ විනිශ්චය සභාව විසින් අවසාන බිල් පත්‍රය සඳහා ඇමෙරිකානු ඩොලර් 2,135,131.62 ක හිමිකමක් පමණක් කොන්ත්‍රාත්කරු වෙත ප්‍රදානය කරන ලදී. ඉන් පසුව නීතිපති දෙපාර්තමේන්තුවෙන් මෙම බේරුම්කරණ ප්‍රදානය අභියෝගයට ලක් කළ හැකිදැයි විමසීමක් සිදු කල අතර මෙහිදී නීතිපති දෙපාර්තමේන්තුවෙහි අදහස වූයේ එසේ බේරුම්කරණ ප්‍රදානය අභියෝගයට ලක්කිරීමට වලංගු හේතු නොමැති බවයි.	
9	සසකාවා අනුස්මරණ ශ්‍රී ලංකා හා ජපන් සංස්කෘතික මධ්‍යස්ථානය වෙත බදු දී ඇති කොල්ලුපිටිය, 22 වන පටුමගෙහි පිහිටි ඉඩම් කොටස වසර 30 ක කාල සීමාවක් සඳහා බදු දී තිබූ අතර එම බදු කාලය 2017 ජුනි 30	2023 2022 2021	මෙම ඉඩම හා ගොඩනැගිල්ල සම්බන්ධයෙන් ගිවිසුමකට එළඹිය යුතු අතර නියමිත බදු මුදල් අයකළ යුතුය.	රාජ්‍යතාන්ත්‍රික සම්බන්ධතාවය හා සංස්කෘතික බැඳීම සලකා බලා සංස්ථා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගන්නා ලද ප්‍රතිපත්තිමය තීරණය මත 2017 ජූලි 01 දින සිට වාර්ෂිකව 10% ක වැඩිවීමක් සහිතව	සසකාවා භාරය විසින් එම ගොඩනැගිල්ල 2024 ජුනි 30 දින සිට තවත් වසර 2 ½ කින් දීර්ඝ කරන ලෙස දන්වා 2024 සැප්තැම්බර්18 දිනැති ලිපිය සංස්ථාව වෙත

	දිනෙන් අවසන් වී තිබුණි. එම බදු ගිවිසුම දීර්ස කිරීම සඳහා සංස්ථාව විසින් 2017 ජූලි 21 දින රජයේ ප්‍රධාන තක්සේරුකරු මගින් ලබාගත් නව තක්සේරු වාර්තාවට අනුව 30 අවුරුදු බදු පදනම මත එම ඉඩම ලබාදීමේදි ඉඩම සඳහා පමණක් වාර්ෂික බදු මුදල රු.මිලියන 12.68 ක් වී තිබුණි. නමුත් සසකාවාභාරය විසින් එකී බදු මුදල ගෙවීමට අපහසු බව දන්වමින් අභියාචනයක් ඉදිරිපත් කර තිබු අතර එම වටිනාකම අධ්‍යක්ෂ මණ්ඩල තීරණයකට අනුව රු.මිලියන 1.59 කට අඩු කිරීම හේතුවෙන් විශාල කුලී ආදායමක් සංස්ථාවට අහිමි වී ඇති බව විගණනයට නිරීක්ෂණය විය. තවද මෙම ඉඩම හා ගොඩනැගිල්ල සම්බන්ධයෙන් බදු ගිවිසුමකට එළඹීමට කටයුතු කර නොතිබුණි.			නැවත බදුදීම සිදුකර ඇත. 2023-2024 බදු මුදලට අදාළ වාරික හතරෙන් 03ක් මේ වන විට ගෙවා ඇත. සම්පූර්ණ බදු මුදල ගෙවූ පසු ඉදිරි කාලසීමාව සඳහා සංස්ථාව සහ සසකාවා භාරය අතර බදු ගිවිසුම් අත්සන් කිරීමේ කටයුතු සිදුකෙරේ. එසේම එම ගොඩනැගිල්ල කඩිනමින් බාරදෙන ලෙසද දැනුම් දී ඇත.	යොමුකර ඇති අතර එම ඉල්ලීම අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සඳහා යොමු කර ඇත.
10	සංස්ථාව සතු ඉඩම් හා ගොඩනැගිලි වෙනත් පාර්ශවයන් වෙත බදු පදනම මත ලබාදී ඇති අවස්ථාවලදී, එහි බදු කාලය අවසන් වී නැවතත් එම පාර්ශවයන් වෙතම	2023 2022	බාහිර පාර්ශවයන් වෙත බදු පදනම මත ලබාදුන් ඉඩම් හා ගොඩනැගිලි වල බදුකාලය අවසන් වීමෙන් පසු නැවත බදු දෙන්නේ නම්	වාර්ෂික බදු ගිවිසුම් දීර්ස කිරීමේදී ඉදිරි වර්ෂ සඳහා ප්‍රමාණවත් කාලයක් නොමැතිව දීර්ස කිරීමේ ඉල්ලීම් ලැබීම හේතුවෙන් මුදල්	මේ වන විට දීර්ස කිරීමේ ඉල්ලීම් පවතින ගිවිසුම් අවසන් වීමට අවම වශයෙන් මාස තුනකට පෙර දැනුම් දීමට කටයුතු කරන

	අදාළ ඉඩම් හා ගොඩනැගිලි බදු පදනම මත ලබාදෙන විට නව ගිවිසුමකට එළඹීමකින් තොරව එම දේපළ පරිහරණය කිරීමට බදුකරුවන්ට අවස්ථාව ලබාදී අදාළ හිඟ මුදල් ලබාගැනීමෙන් අනතුරුව පෙරදාතම් කල ගිවිසුම්වලට එළඹෙන බව විගණනයට නිරීක්ෂණය විය.		නියමිත පරිදි ගිවිසුම් ගතවිය යුතුය.	අයකරගැනීමේ ප්‍රමාදයන් මතුව ඇති නමුත් මේ වන විට දීර්ඝ කිරීමේ ඉල්ලීම් පවතින ගිවිසුම් අවසන් වීමට අවම වශයෙන් මාස තුනකට පෙර දැනුම් දීමට කටයුතු කරන ලෙස කොන්දේසි බදු ගිවිසුම්වලට ඇතුලත් කර ඇත.	ලෙසට වන කොන්දේසි බදු ගිවිසුම්වලට ඇතුලත් කර ඇත.
11	ඉඩම් අත්කරගැනීමේ පනතේ 460 වැනි පරිච්ඡේදයේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ සංස්ථාව සතු කිරිමණ්ඩල මාවතේ වරිපනම් අංක 95 දරන ඉඩමෙන් පර්චස් 4.67 ක් කොළඹ මහනගර සභාව විසින් ඊට අයත් නාරාහේන්පිට පිහිටි කිරිමණ්ඩල මාවත පුළුල් කර සංවර්ධනය කිරීම සඳහා 2014 වර්ෂයේදි භාවිතා කර ඇති අතර එම ඉඩම් කොටස වෙනුවෙන් සංස්ථාවට ලැබිය යුතු වන්දි ලබාගැනීමට 2023 වර්ෂය අවසාන වන විටත් කටයුතු කර නොතිබුණි.	2023 2022	සංස්ථාවට අයවිය යුතු වන්දි කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.	කොළඹ නගර සභාව විසින් කිරිමණ්ඩල මාවත පුළුල් කිරීම සඳහා අවශ්‍ය ඉඩම් කොටස් රජය වෙත අත්කරගැනීමේදී මෙම සංස්ථාව සතු හෙක්ටයාර් 0.0130 (පර්. 5.13) ක් අත්කරගෙන ඇත. නමුත් මැනුම් කිරීමේදී එම අත්කරගත් කොටසට පරිබාහිරව පර්චස් 4.67 ක් ද නගර සභාව විසින් භාවිතා කර ඇති බව අනාවරණය වූයෙන් එම ඉඩම් කොටස් සඳහාද අදාළ වන්දි හා පොලී මුදල් ගණනය කර මෙම සංස්ථාව වෙත ගෙවීම් කරන ලෙස දන්වා කොළඹ නගර සභාව වෙත	මේ සම්බන්ධව දන්වා කොළඹ මහ නගර සභාව වෙත යොමු කරන ලද ලිපි සඳහා මේ දක්වා පිළිතුරක් ලැබී නොමැති අතර මේ සම්බන්ධව අදාල පාර්ශවය සමග තවදුරටත් සාකච්ඡා කර අදාල අත්කරගැනීම සඳහා වන්දි ලබාගැනීමට කටයුතු කරමින් පවතී.

				දැනුම් දී ඇත.	
12	මැදමූලන අනුස්මරණ මධ්‍යස්ථානයක් ඉදිකිරීම වෙනුවෙන් තවදුරටත් සංස්ථාවට අයවිය යුතු බවට අධිකරණය වෙත වාර්තා කළ හා සංස්ථාවේ ගිණුම්වල දැක්වුණු වටිනාකම අතර වෙනස වූ රු. මිලියන 47.37 ක මුදල එම ව්‍යාපෘතිය වෙනුවෙන් නොදැරූ වියදමක් ලෙස දක්වා තිබීම හේතුවෙන් එම අමතරව වැයකළ වියදම සම්බන්ධයෙන් වැඩිදුර පරීක්ෂා කර ඒ සඳහා වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමකින් තොරව හා මු.රෙ.113 ප්‍රකාරව මහා භාණ්ඩාගාරයෙන් අනුමැතිය ලබා ගැනීමකින් තොරව පොත්වලින් කපා හැරීම සඳහා 2021 ජූනි 28 දිනැති අංක MRW/5404 දරන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදි ගත් තිරණයට අනුව සංස්ථාව විසින් කටයුතු කර තිබුණි. තවද මේ සම්බන්ධයෙන් 2023 වර්ෂය අවසාන වන විටත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.	2023 2022 2021	ව්‍යාපෘති ආරම්භ කිරීමට ප්‍රථම නිසි ශක්‍යතා අධ්‍යනයක් සිදුකර නිවැරදිව ඇස්තමේන්තු සකස් කළ යුතුය. දෝෂ සහිත වියදම් ලියවිලි සකස් කළ නිලධාරීන්ට එරෙහිව නිසි පරීක්ෂණ පවත්වා අවශ්‍ය විනය හා නීතිමය ක්‍රියා මාර්ග ගතයුතුය.	මැදමූලන අනුස්මරණ මධ්‍යස්ථානය ඉදිකිරීම වෙනුවෙන් ඉදිරිපත් කළ බිල්පතින් තවදුරටත් අයකර ගත නොහැකි වූ වටිනාකම, ගරු අධිකරණය වෙත ඉදිරිපත් කර තිබූ කරුණු සහ ගරු අධිකරණ තීරණයේ ඇතුළත් කරුණු ද සැලකිල්ලට ගෙන සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන පොත්වලින් ලියා හැරීමට කටයුතු කරන ලදී. මෙම ලියාහැරීම සම්බන්ධයෙන් මේ වන විට මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව දැනුවත් කිරීමට ද කටයුතු කර ඇත. අමතරව වැයකර ඇති වටිනාකම සම්බන්ධයෙන් වැඩිදුරටත් පරීක්ෂා කිරීම සඳහා ස්වාධීන කමිටුවක් පත්කර, එම කමිටුවේ නිගමන හා නිර්දේශ ලබා ගැනීමට ද කටයුතු කරන ලදී. මෙම ලියාහැරීම සම්බන්ධයෙන් එම	නිරීක්ෂණයේ පැවති කරුණු එලෙසම පවතී.

				කමිටුවේ නිර්දේශය මත සංස්ථාව විසින් ක්‍රියාත්මක කරනු ලබන වෙනත් ව්‍යාපෘතිවලින් අලාභයන් සිදුවූ විට ක්‍රියා කරන ආකාරයට මෙම ව්‍යාපෘතියට අදාළ බොල්ණය ද ලාභයට එරෙහිව කපා හැර ඇති නිසා එම ලියා හැරීම 2023 මැයි 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය PED/01/2021(1) ට අනුව විගණන කමිටුවේ නිර්දේශ මත සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කිරීමට කටයුතු කරන ලද අතර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවටද ලිඛිතව දැනුම් දීමට කටයුතු කරන ලදී	
13	ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 8,700 ක ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කළ කොළොන්නාව වැසි ජල අපවහන හා පරිසරය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය පසුව අමාත්‍ය මණ්ඩලයේ තීරණයකට අනුව භාණ්ඩාගාර ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කිරීමට සැලැසුම් කර තිබුණි. ව්‍යාපෘතිය 2018	2023 2022 2021	ඉදිකිරීම් කටයුතු කඩිනමින් අවසන් කර එහි ප්‍රතිලාභ මහජනතාවට ලබාදිය යුතුය.	මෙම ව්‍යාපෘතිය මහාභාණ්ඩාගාර අරමුදල් යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘතියක් වන අතර ලැබෙන සීමිත ප්‍රතිපාදන ප්‍රමාණයට ගැලෙපන වැඩ ප්‍රමාණය පමණක් සිදුකරනු ලැබේ.	නිරීක්ෂණයේ පැවති කරුණු එලෙසම පවතී.

	වර්ෂයේ සිට වසර 05 කින් නිමකළ යුතු වුවත් 2023 වර්ෂය අවසාන වන විටත් මෙම ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 7.6 ක තරම් ඉතා අඩු මට්ටමක පැවතුණි.				
14	මාදින්නාගොඩ නිවාස ව්‍යාපෘතිය සඳහා අත්පත් කර ගැනීමට යෝජිත ඉඩම අත්පත් කර ගැනීමට පෙර එනම් 2018 වර්ෂය වන විට එම ඉඩම සඳහා රු.මිලියන 112 ක් වැය කර අතුරු ප්‍රවේශ මාර්ගයක් ඉදිකිරීමට කටයුතු කිරීම හා 2024 ජුනි දක්වා ඉඩම අත්පත් කර නොගැනීම හේතුවෙන් ඒ සඳහා වැය කළ මුදල නිෂ්කාර්ය වියදමක් වී තිබුණි.	2023 2022 2021	අවශ්‍යතා නිසිපරිදි හඳුනාගෙන අදාල අනුමැතීන්ට යටත්ව ඉදිකිරීම් සිදුකළයුතුවේ.	මෙම සංස්ථාව විසින් යෝජිත කාර්යය හඳුනාගෙන එහි සැළසුම් සකස් කොට එම මාර්ගය සකස් කිරීමේ කටයුතු සිදුකරන ලදී. ඒ හා සමගාමීව එහි අවසාන අන්තය යාබද මාර්ගයට සම්බන්ධ කිරීම සඳහා ඒ ආශ්‍රිතව පිහිටි අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම පැවති පරිසර තත්වය තුල අනපේක්ෂිතව නොහැකි විය. මෙම අත්පත් කර ගැනීම කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් විසින් සාමාන්‍ය ක්‍රමවේදය යටතේ සිදු කරනු ලැබූ අත්පත් කර ගැනීමකි. 2020 මැයි 20 දිනැති අංක 2176/14 දරන ගැසට් නිවේදනය මඟින් කැබලි කිහිපයක් රජයට පවරා ගෙන ඇති අතර, තවත් කැබලි	2020 මැයි 20 දිනැති අංක 2176/14 දරන ගැසට් නිවේදනය මඟින් කැබලි කිහිපයක් රජයට පවරා ගෙන ඇති අතර, තවත් කැබලි 15 ක පමණ පරීක්ෂණ කටයුතු නිම කර ගැසට් මඟින් ප්‍රකාශයට පත් කිරීමට නියමිතය.

				15 ක පමණ පරීක්ෂණ කටයුතු නිම කර ගැසට් මඟින් ප්‍රකාශයට පත් කිරීමට නියමිතය. නිවාස ව්‍යාපෘතියක් සඳහා මෙම ප්‍රදේශයේ අත්පත් කරගැනීමක් සිදුව නොමැති බවද සටහන් කරමි.	
15	ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති අධිකාරියෙහි රසායනාගාර ඒකක A ගොඩනැගිල්ල ඉදිකිරීමට සංස්ථාව වෙත 2014 වර්ෂයේ සිට ලැබිය යුතු රු. මිලියන 61.58 ක වටිනාකම සංස්ථාව විසින් 2023 වර්ෂය අවසාන වන විටත් අයකරගෙන නොතිබුණි. ගොඩනැගිල්ල සැලසුම්කරණයේදී ඇති වූ දෝෂ සහගත තත්ත්වයක් හේතුවෙන් Micro piling සඳහා සංස්ථාව විසින් දරන ලද රු. මිලියන 46.40 ක වියදමක් ප්‍රතිපූර්ණය කිරීමට ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති අධිකාරිය සිය එකඟතාවය පළ කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන්ට එරෙහිව සංස්ථාව විසින් කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන	2023 2022 2021	ගිවිසුම ප්‍රකාරව වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගතයුතුය.	මෙම ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ඇති භූමියේ ස්ථාන දෙකක පස පරීක්ෂණයක් කර අදාල ගොඩනැගිල්ල සැලසුම් කරන ලදි. ස්ථාන කිහිපයක පමණක් පසෙහි දුර්වලතාවයන් නිරීක්ෂණය කරන ලදි. මෙම ස්ථාන වල ගොඩනැගිල්ලේ කනු වල සුළු වශයෙන් ගිලාබැසීමක් නිරීක්ෂණය කරන ලදි. එය තවදුරටත් ව්‍යාප්ත වේ යන උපකල්පනය මත මයික්‍රො 'Pile' ගසා එම ගිලාබැස්ම යම් තරමක් අඩු කරගන්නා ලදි. මෙවැනි දෝෂ ව්‍යාපෘති වල සිදු වන අතර මෙම ගොඩනැගිල්ල Design & Built	නිරීක්ෂණයේ පැවති කරුණු එලෙසම පවතී.

	නොතිබුණි.			යන ක්‍රමවේදය යටතේ කරන ලද බැවින් පරමාණු බලශක්ති අධිකාරියෙන් එය ප්‍රතිපූරණය කිරීමට සංස්ථාව කටයුතු කරමින් පවතී.	
16	1995 වර්ෂයේදි වසර 50 කට ඇස්තමේන්තුකල වටිනාකමට රු. මිලියන 0.25 ක් එකතුකර වසර 99 කට කැළණිය වෙදමුල්ල පිහිටි ඉඩම සංස්ථාව විසින් 99 අවුරුදු බදු කාලයක් සඳහා රු.මිලියන 35.5 ක වටිනාකමට පෞද්ගලික සමාගමක් වෙත 1998 මැයි 31 දින ලබාදී තිබුණි. මෙම ඉඩම බදු දීම තුළින් සංස්ථාවට මූල්‍යමය අවාසියක් සිදුවී තිබෙන බව විගණනයේදි නිරීක්ෂණය වූ අතර වසර 50 කට ඇස්තමේන්තුකළ වටිනාකම වසර 99 කට අදාළ කර ගැනීම පිළිබඳ විගණනයට ගැටළුකාරී විය.	2023 2022	ඉඩම සඳහා අයකරන වාර්ෂික බදු කුලිය නිවැරදිවත් කාලානුරූපීවත් තක්සේරු කළයුතුය.	එඩ්නා චොකලට් ආයතනය වෙත ලබා දී ඇති කැලණිය, වෙදමුල්ල ඉඩම සඳහා 1995 දෙසැම්බර් 04 දිනැති තක්සේරු වාර්තාව අනුව වසර 50ක කාලසීමාවක් සඳහා ලබාදී ඇති තක්සේරු වාර්තාවේ සඳහන් මුදලට වඩා 1996 ඔක්තෝබර් 20 දිනැති තක්සේරු වාර්තාවේ සඳහන් මුදල අඩු අගයක් බැවින් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත වැඩි අගයක් වාර්තාකර ඇති තක්සේරු වාර්තාව අනුව රු. මිලියන 35 ක මුදලකට 99 අවුරුදු බදු කාලසීමාවකට ලබා දී ඇත.	නිරීක්ෂණයේ පැවති කරුණු එලෙසම පවතී.
17	සංස්ථාවෙහි යාන්ත්‍රික අංශය, මෙන්ම ඉඩම් සංවර්ධනය කිරීමේ හා ගොඩකිරීමේ සමාගම ස්ථාපිත කිරීම සඳහා සංස්ථාව විසින් සිය වියදමෙන් 2018	2023	අවශ්‍යතා තක්සේරුවක් සහ පිරිවැය හා ප්‍රතිලාභ විශ්ලේෂණයක් මත පදනම්ව සැළසුම් සකස්කළ	මෙම ව්‍යාපෘතිය සංස්ථාව සතු මුදල් වැයකර සිදුකරන ලද්දක් බවත් එම වකවානුව තුල එකවර විශාල මුදලක් වැය කිරීමට	වර්තමානය වන විට මෙම ගොඩනැගිල්ලේ කොටසක් භාවිතයට ගනිමින් පවතී.

වර්ෂයේදී මුතුරාජවෙල ගොඩනැගිල්ලක් ඉදි කිරීමට කටයුතු ආරම්භ කර 2021 වර්ෂයේදී සම්පූර්ණකර තිබූ අතර මේ සඳහා රු.මිලියන 174.91 ක වියදමක් සංස්ථාව විසින් දරා තිබුණි. කෙසේ වෙතත් උක්ත ගොඩනැගිල්ල 2021 වර්ෂයේ සිට 2023 වර්ෂය අවසාන වන විටත් වසර 03 ක් ඌන උපයෝජිතව නිෂ්කාර්යව පැවතුණි.	යුතුය.	නොහැකිවූ බැවින් එම ව්‍යාපෘතිය 2020 වන තෙක් නිමකිරීමට නොහැකි විය. කෙසේ නමුත් 2021 වර්ෂය වන විට එම ගොඩනැගිල්ල නිම කර ඇති අතර වර්තමානය වන විට එම ගොඩනැගිල්ල භාවිතයට ගනිමින් පවතී

3.96 ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	14,873,178	339,579	14,533,599	183,179	තත්ත්වාගණනය නොකළ
2022	96,488,346	156,000	96,332,347	81,537,169	තත්ත්වාගණනය නොකළ
2023	244,076,766	158,700	243,918,066	147,747,119	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපතිගේ නිරිදේශය	විගණිත ආයතනය විසින් ගනු ලැබු වැළැක්වීමේ ක්‍රියාමාර්ගය	වාර්තාවේ දිනට නිරිදේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	1996 අංක 28 දරන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරිමේ පනතේ I වන කොටසේ 2 වන වගන්තිය ප්‍රකාරව ආබාධ සහිත තැනැත්තන් සඳහා ජාතික සභාවක් පිහිටුවා තිබුණි. 2023 වර්ෂයේදී ජාතික සභාව විසින් ආබාධ සහිත භාවය පිළිබඳ ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රියාකාරි සැලැස්ම සැකසීම, ආබාධිතත්වකළමනා කරණ තොරතුරු පද්ධතිය **(DMIS)** සැකසීම, ආබාධ සහිත තැනැත්තන්	2021 2022 2023	අබාධිත ප්‍රජාවගේ තොරතුරු ඇතුලත් දත්ත පද්ධතියක් පිළියෙල කිරීමට කටයුතු කල යුතුය.	2024 වර්ෂය තුළ ආබාධ සහිතභාවය පිළිබඳ ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර අවසන් කිරීමට නියමිත බව හා සමාජ සේවා දෙපාර්තමේන්තුව සමඟ සිදුකරන සමීක්ෂණ හරහා ලබා ගන්නා දත්ත හා එකී තොරතුරු ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලය සමඟ බෙදා ගැනීමට නියමිත බවත් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව හා ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික	මේ දක්වා ක්‍රියාත්මක කර නොමැත.

	සඳහා සුදුසු රක්ෂණ ක්‍රමවේදයක් සකස් කිරීම ඇතුලුව ගනු ලැබූ වැදගත් තීරණ ක්‍රියාත්මක කිරිමට මේ දක්වා නොහැකි වී තිබුණි.			සභාව අතර ආබාධ සහිත තැනැත්තන් උදෙසා රක්ෂණයක් ලබා දීම සම්බන්ධව සාකච්ඡාවක් පැවැත්වූ බව.	
2	2022 දෙසැම්බර් 31 දිනට සුපිරි වාසනා සම්පත ලොතරැයි ආදායමෙන් ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික අරමුදලට ලැබිය යුතු මුදල රු. 82,597,195 ක් වුවත්, සමාලෝචිත වර්ෂයේදී ඉන් රු. 24,050,000 ක් පමණක් ලබාදී තිබුණි. තවද සමාලෝචිත වර්ෂයට අදාලව සුපිරි වාසනා සම්පත ලොතරැයි ආදායමෙන් කිසිදු මුදලක් ජාතික මහලේකම් කාර්යාලයට ලැබී නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුදල රු.225,104,617 ක් විය. මේ හේතුවෙන් අබාධ සහිත තැනැත්තන් සඳහා නිවාස ආධාර වැඩසටහනේ අරමුණ නිසියාකාරව සාක්ෂාත් කර ගැනීමට නොහැකි වී තිබුණි.	2021 2022 2023	අරමුදලේ අරමුණු ඉටුවන ආකාරයට උපරිම කාර්යක්ෂමතාව යෙන් කටයුතු කළ යුතු අතර මුදල් ලබා ගැනීම් නිසි පරිදි කල යුතුය	මිය යාම, පදිංචිය හැර යාම, පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව, නිවාස සංවර්ධන අධිකාරිය හා ස්වෙච්ඡා ආයතන ආදී ආයතන මගින් නිවාස තනා දීම නිවාස ආධාර ප්‍රතික්ෂේප කිරීම ආදී හේතුන් මත නිවාස ආධාර ප්‍රතික්ෂේප වී නැවත ලැබුණු මුදල් වලින්ද නැවත නිවාස ආධාර ලබා දීම ඉදිරියේ දී සිදු කරනු ලබන බව.	මේ දක්වා ලොතරැයි ආදායම් නියමිත පරිදි අරමුදලට ලැබී නොතිබුණි.

3.97 ආයුර්වේද වෛද්‍ය සභාව

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	අතිරික්තය (ඌනතාවය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	12,384,286	6,207,816	6,176,470	115,858	තත්ත්වාගණනය නොකළ
2022	16,124,472	6,663,839	9,460,633	3,295,163	තත්ත්වාගණනය කළ
2023	21,003,392	7,293,926	13,709,466	6,734,838	තත්ත්වාගණනය නොකළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	1961 අංක 31 දරන ආයුර්වේද පනත III වන කොටසේ 11(1)(ඉ) වගන්තිය ප්‍රකාරව ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද වෛද්‍යවරුන් විසින් ඔවුන් අතරින් තෝරාපත් කරගනු ලැබූ සාමාජිකයන් තිදෙනෙකු සභාවේ සාමාජිකයන් ලෙස පත්කළ යුතු නමුත් එම සාමාජිකයන් තිදෙනා පත්කිරීමට සමාලෝචිත වර්ෂයේදීත් එකී විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	2023 2022 2021	ආයුර්වේද පනතට අනුව කටයුතු කළ යුතු අතර එසේ කටයුතු කළ නොහැකි වන ප්‍රායෝගික දුෂ්කරතා ඉවත් කර ගැනීමට කඩිනම් පියවර ගත යුතුය.	1963 මාර්තු 15 දිනැති 13564 අංක දරන ගැසට් පත්‍රය අනුව ආයුර්වේද කොමසාරිස්වරයා විසින් ඡන්ද විමසීමක් පැවැත්වීම සිදු කළ යුතු අතර අධික වියදම හා ක්‍රමවේදය කාලානුරූප නොවීම මත එය අපහසු බැවින් 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ අදාළ කොටස් සංශෝධනය කර ගැනීමට 2022 ජුනි 07 දින වෛද්‍ය සභාව විසින් තීරණය කරන ලද බව.	2024 සැප්තැම්බර් 30 දින වන විටද අදාල සාමාජිකයන් තිදෙනා පත්කිරීමට හෝ පහත සංශෝධනය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.
2	1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 18 (ඇ) හා (ඈ) වගන්ති ප්‍රකාරව 2023	2023 2022 2021	පනතේ අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතු අතර එසේ	බටහිර හෙද පුහුණුව ලබන හෙද නිලධාරීන් ආයුර්වේද රෝහල්වල සේවය	2024 සැප්තැම්බර් 30 දින වන විටද තත්ත්වය වෙනස් වී නොතිබුණි.

	දෙසැම්බර් 31 දිනට සභාවේ ලියාපදිංචිව තිබුණු හෙද නිලධාරින් සංඛ්‍යාව 39ක් හා ඖෂධවේදීන් සංඛ්‍යාව 260ක්වූ අතර ලියාපදිංචිය කාලානුරූපව අලුත් කිරීමේ ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණු බැවින් එම සංඛ්‍යා යාවත්කාලීන වී නොතිබුණි. ආයුර්වේද වෛද්‍ය ක්ෂේත්‍රයට සුවිශේෂ වූ හෙද නිලධාරින් බඳවා ගෙන පුහුණු කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දීම වෙනුවට බටහිර වෛද්‍ය ක්‍රමවේද යටතේ පුහුණුව ලැබූ හෙද නිලධාරින් 100ක් ආයුර්වේද වෛද්‍ය ක්ෂේත්‍රය සඳහා බඳවා ගෙන තිබුණද, එමගින් පනතේ අරමුණු අපේක්ෂිත මට්ටමින් ඉටුකර ගැනීමට නොහැකිවී තිබුණි.		කටයුතු කළ නොහැකි වන ප්‍රායෝගික දුෂ්කරතා ඉවත් කර ගැනීමට කඩිනම් පියවර ගත යුතුය.	සඳහා යොමු කර ඇති නමුත් ඔවුන් ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබීම නිසා ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා ගැනීමට මැලි වන බව, ආයුර්වේද රෝහල්වල සේවයට පැමිණෙන බටහිර හෙද නිලධාරීන් සඳහා මාස තුනක පූර්ණ කාලීන පුහුණුවක් NITM ආයතනයේ ආරම්භ කර ඇති බව. ඖෂධවේදීන් ගේ තොරතුරු යාවත් කාලීන කිරීමට හා ලියාපදිංචි නොවූ අය වෛද්‍ය සභාවේ ලියාපදිංචි කිරීමට අදාල තොරතුරු රැස් කිරීම සඳහා පළාත් කොමසාරිස්වරුන් හා රෝහල් අධ්‍යක්ෂවරුන් වෙත ලිපියක් යොමු කර ඇති බව.	
3	1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 19(1)(අ) වගන්තිය ප්‍රකාරව සභාව විසින් එම සභාවේ ලේකම් වශයෙන්ද කාර්ය මණ්ඩලයේ ප්‍රධාන නිලධාරියා වශයෙන්ද කටයුතු කළ යුතු ලේඛකාධිකාරීවරයෙකු පත්කළ යුතු වුවද, එම තනතුරට ස්ථිර	2023 2022 2021	මෙම ක්‍රියාවලිය ඉකුත් වසර ගණනාවක් තිස්සේ ක්‍රියාත්මක වන නමුත් මෙතෙක් ප්‍රමාණවත් ප්‍රගතියක් දක්වා නොමැත. ආයුර්වේද පනතට අනුව කඩිනම් පියවර	ආයුර්වේද වෛද්‍ය සභාවේ පූර්ණ කාලීන සේවය සඳහා ලේඛකාධිකාරීවරයෙකු සභාවේ අනුමැතිය මත පත් කර ඇති බව, ලේඛකාධිකාරී බඳවාගැනීම් පටිපාටිය සකස් කිරීමට අදාළ රීති සකස් කොට ගැසට් පත්‍රයේ පල කිරීම	තනතුරට අදාල බඳවා ගැනීමේ පටිපාටියක් සකස් කර තිබුණද එය කඩිනමින් අනුමත කර ගෙන සුදුසු අයෙකු බඳවා ගැනීමට 2024 සැප්තැම්බර් 30 දින දක්වාම කටයුතු කර නොතිබුණි.

	පදනමින් ලේඛකාධිකාරිවරයකු පත්කිරීමට කටයුතු නොකර කොන්ත්‍රාත් පදනමට සහ වැඩ බැලීමේ පදනමට දිගින් දිගටම බඳවාගැනීම් සිදුකර තිබුණි.		ගත යුතුය.	සඳහා 2024.02.07 වන දින රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති බව. හා ඒ අනුව ආයුර්වේද වෛද්‍ය සභාවේ ලේඛකාධිකාරී බඳවා ගැනීමේ පටිපාටිය සකස් කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට කටයුතු කරන බව.	
4	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(I)(ඇ) වගන්තිය ප්‍රකාරව සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරි හා ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කර පනතේ 38(2) වගන්තිය ප්‍රකාරව එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.	2023 2022 2021	පනතේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.	2018 අංක 19 දරන ජාතික විගණන පනත ප්‍රකාරව කටයුතු කරන බව.	2024 සැප්තැම්බර් 30 දින වන විටද අභ්‍යන්තර පාලන පද්ධති සමාලෝචනයක් සිදුකර වාර්තා කර නොතිබුණි.

5	2014 ඔක්තෝබර් 15 දිනැති අංක 1884/36 අතිවිශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත ආයුර්වේද වෛද්‍ය සභා රීති ප්‍රකාරව සභාවේ ලියාපදිංචි සියළුම වෛද්‍යවරුන් වර්ෂ 05කට වරක් සිය ලියාපදිංචිය අළුත් කරගත යුතු නමුත් 2023 දෙසැම්බර් 31 දින වන විට වර්ෂ 05 ඉක්මවූ වෛද්‍යවරුන්ගේ ලියාපදිංචිය අළුත් කිරීම සඳහා සභාව විසින් ප්‍රමාණවත් විධිමත් ක්‍රමවේදයක් හඳුනා ගෙන ක්‍රියාත්මක කර නොතිබුණි. ඒ අනුව 2023 දෙසැම්බර් 31 දින වන විට වෛද්‍යවරු 13,016ක් සිය ලියාපදිංචිය අළුත් කර ගෙන නොතිබුණි.	2023 2022 2021	ප්‍රකාශිත ආයුර්වේද වෛද්‍ය සභා රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. ලියාපදිංචිය හා ලියාපදිංචිය අලුත් කිරීම දිරිගැන්වීමට සුදුසු ක්‍රමවේද අනුගමනය කළ යුතුය.	ලියාපදිංචිය අලුත් නොකරන අය සක්‍රීය වෘත්තිකයන් ලෙස නොසැලකීමටත් ලියාපදිංචිය සෑම වසර 05 වරක් යාවත් කාලීන කිරීමටත් කටයුතු කරන බව හා එය මුද්‍රිත මාධ්‍ය හා පළාත් ආයුර්වේද කොමසාරිස්වරුන් මඟින් දැනුවත් කරන බව. ලියාපදිංචිය අලුත් නොකළ අයගේ නාමලේඛන දිස්ත්‍රික් මට්ටමින් සකස් කර පළාත් ආයුර්වේද කොමසාරිස්වරුන් මඟින් හා ජංගම කාර්යාල පවත්වමින් ලියාපදිංචිය අළුත් කිරීම සඳහා යොමු කර ගැනීමේ වැඩ පිළිවෙලක් ආරම්භ කර ඇති බව හා දේශීය වෛද්‍ය අංශය යටතේ සේවයේ නියුතු සංවර්ධන නිලධාරීන්ගේ රාජකාරී ලැයිස්තුවට මෙය ඇතුළත් කිරීමට අමාත්‍යාංශයෙන් ලිඛිතව ඉල්ලා ඇති බව.	ලියාපදිංචිය දිරිගැන්වීම සඳහා ක්‍රියාමාර්ග කිහිපයක් ගෙන ඇති නමුත් 2024 සැප්තැම්බර් 30 දින වන විටද 10,000කට අධික සංඛ්‍යාවක් ලියාපදිංචිය අළුත් කරගෙන නොතිබුණි.

6	සමාලෝචිත වර්ෂයේ එක් එක් මාසය අවසානයේ මුදල් පොතේ ශේෂය රුපියල් මිලියන 7 ත් 12 ත් අතර පැවැති අතර සාමාන්‍ය දෛනික ගනුදෙනු අවශ්‍යතාවය රඳවාගෙන ඉතිරි මුදල් ආයෝජනය කිරීම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි.	2023	ආයතනයේ අනාගත ස්ථාවර පැවැත්ම සඳහා ආයෝජන වත්කම් ගොඩනගා ගැනීමට කටයුතු කළ යුතුය.	2024 වර්ෂයේ දී ආයුර්වේද වෛද්‍ය සභාවේ මාසික ආදායම් පිළිබඳ අවධානය යොමු කරමින් ආයෝජන වත්කම් ගොඩනගා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන බව.	2024 ඔක්තෝබර් 15 දින වන විටද ආයෝජන හඳුනා ගැනීම කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි.
7	2023 දෙසැම්බර් 31 දින වන විට වෛද්‍ය සභාවේ ලියාපදිංචි වෛද්‍යවරු සංඛ්‍යාව 27,205 බවත්, මිය ගිය සංඛ්‍යාව 4,024ක් බවත් වාර්තා කර තිබුණු නමුත් මියගිය පාරම්පරික වෛද්‍යවරුන් පිළිබඳ නිවැරදි තොරතුරු යාවත්කාලීනව ලබා ගැනීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කර නොතිබුණි. තවද මිය ගිය වෛද්‍යවරුන්ගේ ලියා පදිංචිය අවලංගු කර ඒ බව මහජනතාවට නිවේදනය කිරීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කර නොතිබුණු බැවින් අදාල ලියාපදිංචි සහතික අවභාවිතා කිරීමේ ඉඩකඩක්ද පවතින බව නිරීක්ෂණය විය.	2023 2022 2021	සුදුසු හා නිවැරදි තීරණ ගැනීම සඳහා යාවත්කාලීන හා නිවැරදි සංඛ්‍යා ලේඛන පවත්වා ගත යුතුය.	ලියාපදිංචිය අලුත් කිරීම සහ මියගිය වෛද්‍යවරුන් පිළිබඳ තොරතුරු වෛද්‍ය සභාව වෙත වාර්තා කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ දේශීය වෛද්‍ය අංශය යටතේ සේවයේ නියුතු සංවර්ධන නිලධාරීන්ගේ සහය ලබා ගැනීම සඳහා සංවර්ධන නිලධාරීන්ගේ රාජකාරී ලැයිස්තුවට එම කරුණ ඇතුලත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකර දෙන ලෙස අමාත්‍යාංශය වෙත ලිඛිතව දැනුම් දී ඇති බව.	2024 ඔක්තෝබර් 15 දින වන විටත් මෙම ගැටළුව නිරාකරණය කර ගැනීම සඳහා ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.
8	2014 වර්ෂයේ සිට 2018 දක්වා මුල්වරට	2023	2015-2018 දක්වා	2023 වර්ෂයේ අවසාන ගිණුම්	2024 ඔක්තෝබර් 15 දින වන විටත්

	ලියාපදිංචි වූ වෛද්‍යවරුන් 1,139 දෙනෙකුගේ ලියාපදිංචිය සමාලෝචිත වර්ෂයේ අළුත් කිරීම මගින් රු.1,880,280ක ආදායමක් එකතු කර ගැනීමට ඇස්තමේන්තු කර තිබුණද ඉන් වෛද්‍යවරු 672 කුගේ ලියාපදිංචිය අළුත් කර රු.1,097,280ක ආදායමක් එකතු කර ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි.		ලියාපදිංචිය ලබා මෙතෙක් ලියාපදිංචිය අලුත් නොකළ වෛද්‍යවරුන් ගේ ලියාපදිංචිය අලුත් කර කඩිනමින් හිඟ ආදායම් එකතු කර ගැනීමට කටයුතු කළ යුතුය.	වාර්තාව සමඟ ඉදිරිපත් කර ඇති 2015-2018 දක්වා ලියාපදිංචිය ලබා මෙතෙක් ලියාපදිංචිය අලුත් නොකළ වෛද්‍යවරුන්ගේ ලියාපදිංචිය අලුත් කිරීමේ කටයුතු 2024 වර්ෂය තුලදී අවසන් කිරීමට කටයුතු කරනු ලබන බව හා ඒ අනුව අදාළ ආදායම් උපයා ගැනීමට හැකිවනු ඇති බව.	ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.
9	1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 20 (1) වගන්තිය ප්‍රකාරව ආයුර්වේද වෛද්‍ය සභාව නීතිගත සංස්ථාවක් වන බැවින් 1971 අංක 38 දරන මුදල් පනතට අනුකූලව මුදල් පාලනය සිදු කරන නමුත් විධිමත් අධීක්ෂණයක් සහිත ගිණුම්කරණ ඒකකයක් ස්ථාපිත කිරීම කෙරෙහි පාලක සභාවේ අවධානය යොමු කර නොතිබුණු අතර සභාවේ ගිණුම් කටයුතු යාවත්කාලිනව පවත්වා ගෙනයාම සඳහා ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරිගේ සහාය ලබාගැනීමට කටයුතු කර තිබුණි.	2023	විධිමත් අධීක්ෂණයක් සහිත ගිණුම්කරණ ඒකකයක් ස්ථාපිත කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය.	ආයුර්වේද වෛද්‍ය සභාවේ ගිණුම් කටයුතු යාවත්කාලීනව පවත්වාගෙන යාම සඳහා 1997 වර්ෂයේ සිට ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරීවරයා ගේ සේවය ලබාගෙන ඇති බව. 2018.11.27 වන දින සභාපත්‍රිකා අංක 20/02/05 අනුව ආයුර්වේද වෛද්‍ය සභාව සඳහා වෙනම ගණකාධිකාරී තනතුරක් ඇති කර ගැනීම පිළිබඳ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව හා සකච්ඡා කලද ගණකාධිකාරී තනතුරක් වෙනම අනුමත කර නොමැති නමුත් ගණකාධිකාරී	2024 සැප්තැම්බර් 30 දින වන විටද ස්වාධීන ගිණුම්කරණ ඒකකයක් ස්ථාපිත කර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

				තනතුරක් අනුමත කර ගැනීම සඳහා ඉදිරි කටයුතු කරන බව.	
10	2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 02 ඡේදය අනුව හඳුන්වාදුන් රාජ්‍ය ව්‍යාපාර සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශ 2.3 ඡේදය ප්‍රකාරව පිළියෙල කළ යුතු උපායමාර්ගික සැලැස්ම එකී විධිවිධාන ප්‍රකාරව පිළියෙල කර නොතිබුණි.	2023 2022	උපායමාර්ගික සැලැස්ම පිළියෙල කිරීමට රාජ්‍ය ව්‍යාපාර අයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතුය.	රාජ්‍ය ව්‍යාපාර අයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශ 2.3 අනුව උපායමාර්ගික සැලැස්ම පිළියෙල කිරීමට කටයුතු කරන බව.	2024 වර්ෂය සඳහා අදාල සැලැස්ම පිළියෙල කර ඉදිරිපත් කිරීමට එකඟ වී තිබුණි.
11	වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මට අනුව කාර්තු පදනමින් ප්‍රගතිය වාර්තා කිරීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබුණු අතර ආයුර්වේද වෛද්‍යවරු, පාරම්පරික ආයුර්වේද වෛද්‍යවරු, ආයුර්වේද හෙද නිලධාරින් හා හෙසජ්ජකවරු ලියාපදිංචි කිරීම වෙනුවෙන් විභාග පැවැත්වීම, විභාග ප්‍රතිඵල නිකුත් කිරීම යනාදී වශයෙන් වූ ක්‍රියාවලින්හි කාර්යයන් ඇගයීම සඳහා කාර්ය සාධන දර්ශක පිහිටුවා කාර්යය සාධනය සමාලෝචනය කිරීමට කටයුතු කර	2023 2022 2021	සැලසුම් කළ ක්‍රියාවලින්හි කාර්යයන් ඇගයීමට කාර්ය සාධන දර්ශක පිහිටුවා සමාලෝචනය කළ යුතුය.	කාර්ය සාධක දර්ශක පිහිටුවීමට අවශ්‍ය කටයුතු සැළසුම් කිරීම පිළිබඳ ආයුර්වේද වෛද්‍ය සභාවේ අවධානය යොමු කළ අතර ඒ අනුව 2022 වර්ෂයේ සිට පාරම්පරික වෛද්‍යවරුන් වශයෙන් ලියාපදිංචිය අපේක්ෂිත අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් බාරගැනීම මාර්තු 01 සිට ජුනි 30 දක්වාත්, සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම ජුලි 01 සිට දෙසැම්බර් 31 දක්වාත් පැවැත්වීමටත් ලිඛිත පරීක්ෂණ පෙබරවාරි	2024 සැප්තැම්බර් 30 දින වන විටත් කාර්ය සාධන දර්ශක පිහිටුවීමට කටයුතු කර නොතිබුණි.

	නොතිබුණි.			හා අගෝස්තු මාසවලදී පැවැත්වීමටත් සැළසුම්කර එය ක්‍රියාකාරී සැළැස්මටද ඇතුළත් කර ඇති බව.	
12	2018 අංක 19 දරන ජාතික විගණන පනත 40 වගන්තිය ප්‍රකාරව විගණනය කරනු ලබන අස්ථිත්වයේ පාලක මණ්ඩලය විසින් යථා පරිදි පත් කරනු ලබන අභ්‍යන්තර විගණකවරයකු සිටිය යුතු වුවත් ආයුර්වේද වෛද්‍ය සභාවට අභ්‍යන්තර විගණකවරයෙකු පත්කරගෙන නොතිබුණු බැවින් දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණකගේ සහාය ලබාගෙන තිබුණු නමුත් සමාලෝචිත වර්ෂයේ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු වී නොතිබුණි.	2023 2022	ආයුර්වේද වෛද්‍ය සභාවේ අභ්‍යන්තර විගණය විධිමත් කළ යුතුය.	ආයුර්වේද වෛද්‍ය සභාවේ අභ්‍යන්තර විගණන කටයුතු ආයුර්වේද දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශය මගින් සිදු කරනු ලබන අතර ආයුර්වේද වෛද්‍ය සභාව සඳහා අභ්‍යන්තර විගණක තනතුරක් ඇති කිරීම සම්බන්ධයෙන් ආයුර්වේද වෛද්‍ය සභාවේ අවධානයට යොමු කරන බව. මේ අනුව කටයුතු කිරීම ආරම්භ කරන තෙක් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශය මඟින් සකස් කරන විගණන සැළැස්ම තුළ ආයුර්වේද වෛද්‍ය සභාව පිළිබඳ ක්‍රියාකාරකම් ඇතුළත් කිරීමට කටයුතු කරන බව.	2024 ඔක්තෝබර් 15 දින වන විටද තත්ත්වය වෙනස් වී නොතිබුණි.
13	2023 ජනවාරි 27 දිනැති අංක 01/2023 දරන අයවැය චක්‍රලේඛයේ (ඇ) ඡේදය ප්‍රකාරව	2023	චක්‍රලේඛයේ විධි විධාන වලට අනුකූලව කටයුතු කළ යුතුය.	2024 වර්ෂයේ දී මේ පිළිබඳ සභාවේ අවධානය යොමු කරමින් කටයුතු කරන බව.	2024 ඔක්තෝබර් 15 දින වන විටද තත්ත්වය වෙනස් වී නොතිබුණි.

	තොරතුරු සංනිවේදන තාක්ෂණය භාවිතය, ඩිජිටල්කරණය, මාර්ගගත සේවා සැලසීම ආදී ක්‍රමවේද හඳුන්වා දීම මගින් සභාවේ පුනරාවර්තන හා මෙහෙයුම් වියදම් අවම කිරීම පිළිබඳව උපායමාර්ගයන් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම පිළිබඳව කළමණාකරනයේ අවධානය යොමුකර නොතිබුණි.				
14	තිරසාර සංවර්ධන පිළිබඳ එක්සත් ජාතින්ගේ වසර 2030 ''න්‍යාය පත්‍රය'' ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින නමුත් සමාලෝචිත වර්ෂයට අදාළව සභාව තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව ප්‍රමාණවත් අවබෝධයකින් කටයුතු කර නොතිබුණි. ඒ අනුව එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව ආයතනයේ කාර්යයන්ට සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු	2023 2022 2021	තිරසාර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීමට අදාළව ඉලක්ක, දර්ශක හඳුනා ගැනීමට හා ප්‍රගතිය මිණුම් කිරීමට කටයුතු කළ යුතුය.	තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව ආයුර්වේද වෛද්‍ය සභාව යටතට ගැනෙන කරුණු සම්බන්ධයෙන් ආයුර්වේද වෛද්‍ය සහා සාමාජිකයින් දැනුවත් කොට ඇති බව හා ක්‍රියාත්මක විය යුතු වැඩ සටහන් සකස් කිරීම සඳහා කටයුතු කරන බව.	2024 සැප්තැම්බර් 30 දින වන විටත් තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා දර්ශක හඳුනාගෙන නොතිබුණි.

	සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළඟාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.				
15	පාරම්පරික වෛද්‍යවරයෙකු වශයෙන් ලියාපදිංචි කිරීම සඳහා තැනැත්තෙකුගෙන් අල්ලස් ලබා ගැනීම හා ඒ සඳහා ගුරු වෛද්‍යවරයෙකුගේ අත්සන ව්‍යාජ ලෙස යෙදීම සහ වෛද්‍ය සහා සාමාජික තනතුර අවභාවිතා කිරීම යන චෝදනා සම්බන්ධයෙන් මූලික පරීක්ෂණ වාර්තාවකින් චෝදනා එල්ල කර තිබුණු වෛද්‍ය සභා සාමාජිකයකු, එකී කාරණයද ඇතුළත් වෛද්‍ය සභාවේ තීරණ ගැනීමේදී අඛණ්ඩව සහා රැස්වීම්වලට සහභාගී කර ගෙන තිබුණි.	2021	චෝදනාවක් ඉදිරිපත් වූ අයෙකු සම්බන්ධයෙන් තීරණ ගැනීමේදී අදාළ චූදිතගේ ඍජු හෝ වක්‍ර බලපෑමට යටත් නොවන ආකාරයට අපක්ෂපාතීව කටයුතු කළ යුතුය.	මේ සම්බන්ධයෙන් පොලිස් පරීක්ෂණයක් පැවැත්වෙන බව, විමර්ශන නිලධාරියා සකස් කළ චෝදනා පත්‍රයේ සඳහන් නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමට පෙර චූදිතගෙන් මේ පිළිබඳ ප්‍රකාශ සටහන් කර ගත් බව, මාලේවන සෝභිත ස්වාමීන් වහන්සේගේ පුද්ගලික ලේකම් ලෙස කටයුතු කරන වෛද්‍ය සභා සාමාජික මහතා කැඳවා ප්‍රකාශයක් සටහන් කර ගත් බව හා නැවත විමර්ශන වාර්තාවක් සකස් කර සභාවට ඉදිරිපත් කිරීමෙන් පසුව මේ පිළිබඳව සාකච්ඡා කිරීමට සභාව තීරණය කළ බව.	මෙවැනි අක්‍රමිකතා වලක්වා ගැනීම සඳහා සුදුසු පාලන ක්‍රම ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් සභාවේ ප්‍රමාණවත් අවධානය යොමුකර නොතිබුණි.

3.98 ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	අතිරික්තය (ඌනතාවය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	1,871,516,591	261,572,636	1,609,943,955	(14,500,336)	තත්ත්වාගණනය කළ
2022	1,929,546,849	301,953,207	1,627,593,642	59,122,972	තත්ත්වාගණනය කළ
2023	2,188,731,212	491,434,842	1,697,296,370	120,690,365	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	බැංකු සැසඳුම්වල දක්වා තිබුණු බැංකු ගිණුම් 03 කට සෘජුවම ලැබී තිබුණු වර්ෂයකටත් වඩා පැරණි රු.2,445,597 ක් වූ මුදල් හා චෙක්පත් නිශ්චිතව හඳුනාගෙන පොත්වලට ගැනීමට කටයුතු කර නොතිබුණි.	2023	2024 වර්ෂයේ ගිණුම් ඉදිරිපත් කිරීමට පෙර නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය.	වසරකට වඩා පැරණි තැන්පතු ආදායමක් ලෙස හඳුනා ගෙන ගිණුම්ගත කිරීමට අවශ්‍ය අනුමැතිය ලද පසු ගිණුම් වලට අවශ්‍ය ගැලපීම් සිදු කරන බව.	2024 ඔක්තෝබර් 15 දින වන විටද අදාල ගැලපීම් සිදු කර නොතිබුණි.
2	ගනුදෙනුවක නියමිත වටිනාකමට වඩා වැඩියෙන් ලැබීම් හෝ ගෙවීම් සිදු වූ අවස්ථාවලදී ඒවා නිවැරදි නොකිරීම හා නිවැරදිව ලැබීම් ගෙවීම් සටහන් නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට	2023 2022	2024 වර්ෂයේ ගිණුම් ඉදිරිපත් කිරීමට පෙර නිරවුල් කළ යුතුය.	ගිණුම් අංශය විසින් මුලාශ්‍ර ලේඛණ පදනම් කර ගනිමින් ණයගැති ලෙජර් ගිණුම් පවත්වාගෙන යනු ලබන බව. එම ණයගැති ශේෂ වලින් බැර ශේෂ පැවතිය හැකි බව හා ගිණුම් අංශය විසින් ණයගැති වාර්තා	2024 ඔක්තෝබර් 15 දින වන විටද අදාල ගැලපීම් සිදු කර නොතිබුණි.

	ණයගැති ගිණුම් 71 ක එකතුව රු. 512,633ක් වූ බැර ශේෂයන් ඉතිරිව තිබුණු අතර එම ගිණුම් නිරවුල් කිරිමට කටයුතු කිරීම වෙනුවට ජංගම වගකිම් යටතේ ඉකුත් වර්ෂ ගණනාවක සිට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.			පිළියෙල කර මාසිකව අලෙවි අංශයට යොමු කරන බව.	
3	සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු නිෂ්පාදන ගිණුමට අනුව නිෂ්පාදන පිරිවැය රු.1,059,361,507ක් වුවද, ඒකක නිෂ්පාදන පිරිවැය මත කාර්තු පදනමෙන් පිළියෙල කර තිබුණු නිෂ්පාදන පිරිවැය වාර්තා අනුව මුළු නිෂ්පාදන පිරිවැය රු.643,931,284ක් වූයෙන් වෙනස රු.415,430,223ක් විය. මෙම පිරිවැය විචලනයන් පිළිබඳ පසු විපරමක් කර නොතිබුණු අතර නිෂ්පාදන පිරිවැය වාර්තාවේ සඳහන් ඒකක නිෂ්පාදන පිරිවැය පදනම් කර ගනිමින් ඖෂධ වල විකුණුම් මිල තීරණය කර තිබුණු බැවින් සත්‍ය නිෂ්පාදන පිරිවැය විකුණුම් මිල මගින් ආවරණය නොවීමෙ අවදානම් සහගත තත්ත්වයක්	2023 2022	නිෂ්පාදන ගිණුම අනුව හඳුනාගන්නා සත්‍ය නිෂ්පාදන පිරිවැය මුළු නිෂ්පාදිත ඒකක සංඛ්‍යාව විසින් අන්තර්ග්‍රහනය කර ඇති සේ සලකා ඒ මත පදනම්ව ඒකකයක නිෂ්පාදන පිරිවැය තීරණය කළ යුතුය. මෙම පිරිවැය විචලනයන් පරික්ෂාකර අදාළ ගැලැපීම් සිදු කිරිමට කටයුතු කළ යුතුය.	මේ සම්බන්ධව පවතින විෂමතාවයන් පිළිබඳව අවධානය යොමුකර නිවැරදිව ගිණුම් තොරතුරු යාවත්කාලීන කිරීමට පියවර ගන්නා බව.	වාර්ෂික නිෂ්පාදන සැලසුම, කාර්තුමය නිෂ්පාදන වාර්තා සහ සත්‍ය නිෂ්පාදන තොරතුරු අතර පරස්පරතාවයක් පවතී. ඒ අනුව 2024 ඔක්තෝබර් 30 දින වන විටද සැලසුම්ගත නිෂ්පාදනය සහ සත්‍ය නිෂ්පාදනය සසඳා නිවැරදි කළමනාකරණ තීරණ ගැනීමට හැකියාවක් නොතිබුණු බව නිරීක්ෂණය විය.

	පවතින බව නිරීක්ෂණය විය.				
4	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 2 හි 25 ඡේදය ප්‍රකාරව සංස්ථාවේ නිමි තොග සම්බන්ධයෙන්, ප්‍රථමයෙන් ලැබීම් ප්‍රථමයෙන් නිකුත් කිරීම් ක්‍රමයට තොග ලෙජර පවත්වා තිබුණද එම තොග ලෙජරවල ඒකක මිල හා වටිනාකම් තීරු යාවත්කාලීන කර නොතිබුණු බැවින් සත්‍ය ඒකක පිරිවැය නොසලකා වර්ෂය අවසානයේ තොග ලෙජරයේ ඉතිරි ඒකක සංඛ්‍යාව, පසුව ගණනය කරන ලද ඒකක නිෂ්පාදන පිරිවැයකින් වැඩිකර 2023 දෙසැම්බර් 31 දිනට ඉතිරි නිමි ඖෂධ තොගයේ අගය රු.452,862,514 ක් ලෙස ගණනය කර ගිණුම් ගත කර තිබුණි.	2023 2022 2021	ප්‍රමිතය ප්‍රකාරව ප්‍රථමයෙන් ලැබීම් ප්‍රථමයෙන් නිකුත් කිරීම් ක්‍රමය හෝ හරිත සාමාන්‍ය ක්‍රමය යන පිරිවැය සූත්‍ර වලින් එකක් අඛණ්ඩව අනුගමනය කරමින් තොග ලෙජරවල ඒකක මිල හා වටිනාකම් තීරු යාවත්කාලීන කළ යුතු අතර ඒ මත පදනම්ව නිකුත් කරන තොගවල සත්‍ය පිරිවැය හා වර්ෂය අවසන් ඉතිරි තොගයේ සත්‍ය පිරිවැය ගණනය කර ගිණුම්ගත කළ යුතුය. පරිගණක නොමැති අංශවල තොග ලෙජර පොත් පවත්වා ගත යුතුය.	නව පරිගණක පැකේජය ස්ථාපිත කිරීමෙන් පසු තොග ලෙජරය ඒකක මිල සහ වටිනාකම සහිතව පවත්වා ගත හැකි බව, නව පරිගණක පැකේජයක් හඳුන්වාදීම සඳහා 2023.11.02 දින මිල ගණන් කැඳවා ඇති බව හා දැනට තොග අගය කරනු ලබන්නේ වර්ෂ අවසානයේ භෞතික තොග සත්‍යාපනයෙන් ලැබෙන ඒකක සංඛාව අදාළ තොග ඒකක පිරිවැය සමග ගණනය කිරීමෙන් ලැබෙන අගය මත බව.	2024 ඔක්තෝබර් 15 දින වන විටත් නිර්දේශිත ක්‍රියාමාර්ග ස්ථාපිත කර නොතිබුණි.
5	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 51 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය කර, ඇස්තමේන්තුගත දෝෂ හඳුනාගෙන, ශ්‍රී	2023	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය.	දේපළ පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය සිදු කිරීමට දැරීමට සිදු වන පිරිවැය සලකා බලා ඉදිරියේදී ප්‍රත්‍යාගණනය සිදු කිරීමට නියමිත බැවින් එහිදී මෙම කරුණු සැලකිල්ලට ගනු ලබන බව.	2024 ඔක්තෝබර් 15 දින වන විටද අදාල නිර්දේශය ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි.

	ලංකා ගිණුම්කරණ ප්‍රමිත 08 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු නොකර, සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු පිරිවැය රු.99,484,716 ක්වූ යන්ත්‍රෝපකරණ අයිතම 171 ක්, ජල සැපයුම් උපකරණ අයිතම 06 ක්,රසායනාගාර උපකරණ අයිතම 17 ක් හා ඉන්වෙන්ට්‍රි අයිතම 229ක් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් තිබුණි.				
6	ආයුර්වේද කොමසාරිස්වරයා විසින් “ආයුර්එක්ස්”(AyurEx) 2023 අන්තර්ජාතික ප්‍රදර්ශනය වෙනුවෙන් අනුග්‍රහක දායකත්වය ලබා ගැනීම සඳහා 2023 ජුලි 28 දිනැති ලිපිය මගින් ඉල්ලීම් කර තිබුණු අතර ඒ සඳහා 2023 අගෝස්තු 10 දිනැති අංක 14478 අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මත ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලීය සුභසාධක සංගමයේ අංක 167-1001-7317-0353 දරන මහජන බැංකු පුරහල ශාඛා ගිණුම වෙත රු.5,000,000 ක්	2023	මෙය මතභේදයට තුඩු දෙන කරුණක් බැවින් නීති රීති ප්‍රකාරව කටයුතු කළ යුතු අතර ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරවද කටයුතු කළ යුතුය.	AyurEx 2023 අන්තර්ජාතික ප්‍රදර්ශනය සඳහා මෙම සංස්ථාව විසින් එම ප්‍රදර්ශනයේ ප්ලැටිනම් අනුග්‍රාහක දායකත්වය දරමින් රුපියල් 5,000,000 ක අනුග්‍රාහකත්වයක් ලබාදෙන ලද බව. මෙරට ආයුර්වේද ක්ෂේත්‍රයේ පුරෝගාමී ආයතනය ලෙස AyurEx 2023 අන්තර්ජාතික ප්‍රදර්ශනයට ප්‍රධාන අනුග්‍රාහකත්වය දරමින් සහභාගී වීම තුළින් සංස්ථාවේ කීර්තිනාමය වර්ධනය කිරීමටත් නිෂ්පාදන හා සේවාවන් ප්‍රවර්ධනය කිරීමට	මේ සම්බන්ධයෙන් අධ්‍යක්ෂක මණ්ඩලයේ විචක්ෂණ අවධානය යොමුකර නොතිබුණි.

	ගෙවා තිබුණි. තවද ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයෙකු වූ ආයුර්වේද කොමසාරිස්වරයා විසින් කරන ලද ඉල්ලීමට අනුව ගෙවන ලද එම මුදල සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 24 ප්‍රකාරව සම්බන්ධිත පාර්ශව ගණුදෙනු යටතේ මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි.			හැකියාව ලැබුණු බව. ආයුර්වේද කොමසාරිස්වරයා මෙම සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු බැවින් ගිණුම්කරණ ප්‍රමිත අංක 24 ප්‍රකාරව සම්බන්ධිත පාර්ශව ගණුදෙනු යටතේ මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොමැති බැවින් ඉදිරියේදී හෙළිදරව් කිරීමට පියවර ගන්නා බව.	
7	හෙක්ටයාර 2.2 ක්වූ මැදවච්චිය ඔසු උයන, මැදවච්චිය ප්‍රාදේශීය ලේකම් විසින් සංස්ථාව වෙත පැවරීම සිදු කර තිබුණද එම ඉඩම තක්සේරු කර ගිණුම්ගත කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	2023	මූල්‍ය තොරතුරුවල විශ්වසනීයත්වය තහවුරු කිරීම සඳහා ඉඩම තක්සේරු කර ගිණුම්ගත කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.	මැදවච්චිය ඔසු උයන අප ආයතනය වෙත පවරා ඇති බවට ගිණුම් අංශය වෙත දැනුවත් කර නොමැති බව. මෙම ඉඩමේ තක්සේරු අගය ලද පසු ගිණුම් වලට අවශ්‍ය ගැලපීම් කරන බව.	2024 ඔක්තෝබර් 15 දින වන විටද එම ඉඩම තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.
8	2024 ජනවාරි 08 දිනැති මහජන බැංකුවේ ශේෂ සනාථ ලිපිය ප්‍රකාරව 2015 හා 2019 වර්ෂවල විවෘත කරන ලද ණයවර ලිපි ආන්තික ගිණුම් 03ක ශේෂ එකතුව රු.1,951,492ක් වුවද, එය මූල්‍ය ප්‍රකාශනවල රු.105,908,646ක්	2023	මෙම වරද වහාම නිවැරදි කළ යුතු අතර ගිණුම් අංශයේ අධීක්ෂන ක්‍රියාවලිය සමාලෝචනය කර විධිමත් කළ යුතුය.	විගණන නිරීක්ෂණයට එකඟ වන බවත් මෙම ණයවර ගිණුමේ ශේෂයෙන් රු.78,919,247 ක අගයක් 2024 ගිණුම් වර්ෂයේ නිරවුල් වන අතර ඉතිරි ශේෂයන් සඳහා සැපයුම් අංශය විසින් අදාළ පියවීම් ඉදිරිපත් කළ යුතු	2024 ඔක්තෝබර් 15 දින වන විටද මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

	ලෙස රු.103,957,154ක් වැඩියෙන් දක්වා තිබුණි. තවද ඉකුත් වර්ෂයේ ණයවර ලිපි ආන්තික ගිණුමේ ශේෂය රු.25,037,906 ක් වැඩියෙන් දැක්වීම නිරවුල් කිරීමටද කටයුතු කර නොතිබුණි.			බව.මේ සම්බන්ධයෙන් වසර ගණනාවක් තිස්සේ සැපයුම් අංශය ලිඛිතව හා වාචිකව දැනුවත් කර ඇති බව.	
9	2008 වර්ෂයේ හා ඊට පෙර සංස්ථාවේ රසායනාගාර කටයුතු සඳහා පිළිවෙලින් ලෝක සෞඛ්‍ය සංවිධානයෙන් හා ආයුර්වේද පර්යේෂණ ආයතනයෙන් ලැබී තිබුණු රු.3,994,341 ක හා රු.761,274 ක පරිත්‍යාග වාර්ෂිකව ක්‍රමක්ෂය ගිණුම්ගත කිරීම හරහා ආදායමට හඳුනා නොගෙන බාහිර දායකත්වය නමින් අතිරේඛ ප්‍රාග්ධනය සැපයීමක් ලෙස වර්ෂ 15 කටත් වැඩි කාලයක සිට අඛණ්ඩව මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.	2023	මූල්‍ය ප්‍රකාශන සමාලෝචනයක් සිදුකර ඉකුත් වර්ෂවල බැහැරවීම් නිවැරදි කළ යුතුය.	විගණන නිරීක්ෂණයට එකඟ වන බව. මෙම ශේෂ ක්‍රම ක්ෂය ලෙස වාර්ෂිකව ගිණුම් වලින් ලියා හැරීමට අවශ්‍ය අනුමැතිය සඳහා ඉහළ කළමණාකාරීත්වයට යොමු කර ඇති බව හා ඉදිරියේදී එම අනුමැතිය ලද පසු ගිණුම් වලට අවශ්‍ය ගැලපීම් සිදු කරනු ලබන බව.	2024 ඔක්තෝබර් 15 දින වන විටද මූල්‍ය ප්‍රකාශන සමාලෝචනයක් සිදුකර ඉකුත් වර්ෂවල බැහැරවීම් නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි
10	2011/2012 සිට 2013/2014 දක්වා තක්සේරු වර්ෂවලට අදාලව වෙන්කර තිබුණු රු.12,673,956 ක්වූ අදායම් බදු 2015, 2016 සහ 2017 යන	2023	මූල්‍ය ප්‍රකාශන සමාලෝචනයක් සිදුකර ඉකුත් වර්ෂවල ගිණුම්කරණ අඩුපාඩු නිවැරදි කළ යුතුය. ආදායම් බදු බැඳියාවක් නොමැති බවට ලිඛිත සනාථන	විගණන නිරීක්ෂණයට එකඟ වන බව හා බදු උපදේශකවරයකුගේ සේවාව ලබා ගෙන මේ සඳහා අවශ්‍ය ගැලපීම් ඉදිරියේදී ඉටු කිරීමට කටයුතු	2024 ඔක්තෝබර් 15 දින වන විටද මූල්‍ය ප්‍රකාශන සමාලෝචනයක් සිදුකර ඉකුත් වර්ෂවල බැහැරවීම් නිවැරදි කිරීමට

	වර්ෂවල දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ට ගෙවා තිබුණු අතර එම ගෙවීම් අදායම් බදු වෙන් කිරීම් ගිණුමට හර කිරීම වෙනුවට “ලාභාංශ බදු” නමින් වූ ව්‍යාජ වත්කම් ගිණුමකට හර කර තිබුණි. මෙම වරද නිවැරදි කිරීම සඳහා අදාල ව්‍යාජ වත්කම් ගිණුමේ ශේෂය අදායම් බදු වෙන් කිරීමේ ගිණුමට එරෙහිව කපා හැරීමට කටයුතු කිරීම වෙනුවට 2017 සිට සමාලෝචිත වර්ෂය දක්වා අඛණ්ඩව එක් එක් වර්ෂවලට අදාල අදායම් බදු ගැලපීමේ සටහන් වල දැක්වෙන අදායම් බදු වෙන්කිරීමේ ගිණුමේ ශේෂයෙන් උක්ත ව්‍යාජ වත්කම් ගිණුමේ ශේෂය අඩුකර දක්වා තිබුණි.		ලබා ගැනීමට කටයුතු කළ යුතුය.	කරන බව.	කටයුතු කර නොතිබුණු අතර ආදායම් බදු බැඳියාවක් නොමැති බවට ලිඛිත සනාථන ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.
11	මුදල් රෙගුලාසි 103, 104 සහ 105 ප්‍රකාරව 2019 වර්ෂයට අදාළව අලෙවි මධ්‍යස්ථාන හා ගබඩා 8 ක එකතුව රු.2,178,305 ක් වූ ඌනතා සහ රු.1,484,545 ක් වූ අතිරික්තතා සම්බන්ධයෙන් 2021 නොවැම්බර් 01 දිනැති අංක 14026 දරණ	2023	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.	විමසුම හා එකග වන බවත් මේ සම්බන්ධව වාර්තාවක් සකස් කර සභාපති වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කරනු ලබන බව. 2024 ජුනි මාසය අවසන් වීමට ප්‍රථම අදාල ක්‍රියාමාර්ග පිළිබඳව අධ්‍යක්ෂ	2024 ඔක්තෝබර් 15 දින වන විට මුදල් රෙගුලාසි අනුව කටයුතු අවසාන කර නොතිබුණි.

	අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ගෙන තිබුණු තීරණ අනුව කටයුතු කර නොතිබුණි.			මණ්ඩලය සහ විගණන කමිටුව දැනුවත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව.	
12	මුදල් රෙගුලාසි 156 (1) (අ) හා (ආ) ප්‍රකාරව 2019 දෙසැම්බර් 31 දිනට වාර්ෂික තොග සමීක්ෂණය අනුව හඳුනාගත් අංක 01/02 ගබඩාවේ 2012 ත් 2014 ත් කාලපරිච්ඡේදයේ මිල දී ගෙන ඇති මුද්දරප්පලම් තොග ඌනතාවය රු.2,876,893ක් සහ අංක 10 ලේබල් ගබඩාවේ පසුගිය වර්ෂවල මුද්‍රණය කළ නමුත් ප්‍රයෝජනයට නොගත් ලේබල් තොග ඌනතාවය රු. 461,310 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව වගකිවයුතු නිලධාරීන්ට විරුද්ධව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	2023	මුදල්රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.	විමසුම හා එකග වන බවත් මේ සම්බන්ධව වාර්තාවක් ලබාගැනීමට කමිටුවක් පත් කරන ලද අතර කමිටු වාර්තාව අනුව කඩිනමින් ඉදිරි ක්‍රියා මාර්ග ගන්නා බව.	2024 ඔක්තෝබර් 15 දින විටත් අදාල ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.
13	මුදල් රෙගුලාසි 880 හා 881 ප්‍රකාරව රජයේ ගිණුමට අදාල වවුචර සහතික කරන චෙක්පත් අත්සන් කරන නිලධාරින්ද ඇප තැබිය යුතු වුවත්, එකී විධිවිධාන ප්‍රකාරව ඇප තැබීමට අවශ්‍ය	2023	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.	වවුචර සහතික කරන සහ චෙක්පත් අත්සන් කරන නිලධාරින් සඳහා තැබිය යුතු ඇප ප්‍රමාණයන් පිලිබඳව අධ්‍යක්ෂමණ්ඩල තීරණයක් ලබාගෙන ඒ අනුව ඉදිරි කටයුතු සිදු කිරීමට පියවර	2024 ඔක්තෝබර් 15 දින වන විටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

	ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.			ගන්නා බව.	
14	1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය ප්‍රකාරව චක්‍රලේඛ නියමයන්ට පටහැනිව සමාලෝචිත වර්ෂයේදී නිෂ්පාදන දිරි දීමනා රු. 28,507,457 ක්, පැමිණීමේ දීමනා රු.10,464,986ක්, ඵලදායිතා දීමනා රු. 43,480,969 ක් ද, වශයෙන් එකතුව රු. 82,453,412 ක් ද, ඇතුළුව පසුගිය වර්ෂ 09කදී රු. 676,001,624 ක් මහා භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව දිරි දීමනා වශයෙන් ගෙවා තිබුණි.	2023	විධිමත් අනුමැතිය ලබා ගත් දිරිදීමනා යෝජනා ක්‍රමයක් මත පමණක් දිරිදීමනා ගෙවිය යුතුය.	මෙම සංස්ථාවේ වාර්තමානයේ ක්‍රියාත්මක වන දිරි දීමනා ක්‍රමය අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහිතව ක්‍රියාත්මක වන බව හා නව දිරි දීමනා ක්‍රමයක් සකස් කර අමාත්‍යාංශයේ නිර්දේශය සහිතව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇති අතර මේ දක්වා අනුමැතිය ලැබී නොමැති බව. නිෂ්පාදන කටයුතු කාර්යක්ෂමව පවත්වාගෙන යාමේදී අදාළ ඉලක්ක සපුරාලීමට දිරි දීමනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම අත්‍යාවශ්‍යව පවතින බැවින් අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය පරිදි පැරණි දිරි දීමනා ක්‍රමය තවදුරටත් ක්‍රියාත්මකව පවතින බව.	විධිමත් දිරි දීමනා ක්‍රමයකට 2024 ඔක්තෝබර් 15 දින වන විටද අනුමැතිය ලැබී නොමැති අතර පැරණි ක්‍රමයට අවිධිමත් දිරි දීමනා ක්‍රමය තවදුරටත් ක්‍රියාත්මක කරයි.
15	නිෂ්පාදිත ඖෂධ වර්ගය මත බර තැබීමක් කරමින් අදාළ නිෂ්පාදන ඒකක ප්‍රමාණයේ වැඩිවීම් මත ගණනය කරන දිරි දීමනාවක් නිෂ්පාදන කටයුතු සඳහා ඍජු දායකත්වයක් සපයන	2023	නිෂ්පාදන කටයුතු සඳහා ඍජු දායකත්වයක් සපයන සේවකයින් සඳහා යෙදාගන්නා නිෂ්පාදන පිරිවැය මත ඇගයීම, විවිධ කාර්යසාධනයන් සහිත සියලුම අංශ	මාසික නිෂ්පාදනය රුපියල් මිලියන 15 ඉක්මවන අවස්ථා වලදී මාසික නිෂ්පාදන පිරිවැය මත පදනම්ව දිරි දීමනා ගෙවීමට කටයුතු කරනු ලබන බව. පෙර වර්ෂයට	විධිමත් දිරි දීමනා ක්‍රමයකට 2024 ඔක්තෝබර් 15 දින වන විටද අනුමැතිය ලැබී නොමැති අතර පැරණි ක්‍රමයට අවිධිමත් දිරි දීමනා ක්‍රමය

	සේවකයින් සඳහා ක්‍රියාත්මක කිරීම තුළින් ආයතනයේ ඵලදායිතාවය ඉහළ නංවා ගැනීමට හැකි වන නමුත් එවැනි ක්‍රමයක් වෙනුවට රු. මිලියන 15 ඉක්මවා වැඩිවන මාසික නිෂ්පාදන පිරිවැය මත පදනම්ව සංස්ථාවේ සියළුම අංශවල සේවකයන්ට මාසිකව රු.මිලියන 02 ත් රු.මිලියන 06 ත් අතර මුදලක් අනුමැතියකින් තොරව නිෂ්පාදන දිරිදීමනා වශයෙන් ගෙවා තිබුණි. ඉකුත් වර්ෂයේ රු. 64,930,055 ක් වූ මෙම දිරිදීමනා වියදම සමාලෝචිත වර්ෂයේදී රු.82,453,412 ක් දක්වා සියයට 26 කින් වැඩිවී තිබුණු අතර නිෂ්පාදන පිරිවැය ඉහළ යන අවස්ථාවලදී සංස්ථාවේ ලාභදායිත්වය අඩු වුවද ගෙවන නිෂ්පාදන දිරි දීමනාව වැඩි කිරීමට සිදුව තිබුණි.		ඇගැයීමට නුසුදුසු වන අතර අදාළ නිෂ්පාදන ඒකක ප්‍රමාණයේ වැඩිවීම් මත ගණනය කරන දිරි දීමනාවක් නිෂ්පාදන අංශයට පමණක් හා වෙනත් කාර්යසාධන මත ගණනය කරන දිරි දීමනාවක් සෙසු අංශවලට හඳුන්වා දීමට පියවර ගෙන ආයතනයේ ඵලදායිතාවය ඉහළ නංවා ගැනීමට කටයුතු කළ යුතුය.	සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී නිෂ්පාදනය වර්ධනය වූ අතර එම නිෂ්පාදනය පදනම් කරගෙන දිරි දීමනා ගෙවීම හේතුවෙන් දිරි දීමනා ගෙවීම් වල වර්ධනයක් පවතින බව.	තවදුරටත් ක්‍රියාත්මක කරයි.
16	ගබඩා තුළ ක්‍රමවත් ලෙස තොග ගබඩාකර නොතිබුණු අතර උපරිම, අවම හා යලි ඇණවුම් හා ආර්ථික තොග මට්ටම් පවත්වා නොතිබුණු බවත්, බින් කාඩ් හා තොග ලෙජර විධිමත්ව භාවිතා කර	2023	ගබඩා හා තොග පරිපාලනය විධිමත් කළ යුතුය.	බින් කාඩ්පත් පවත්වාගෙන යාම වර්තමානයේ ඉතා අපහසු බව. අලෙවි මධ්‍යස්ථාන වල තොග ලෙජර් යාවත්කාලීනව පවත්වා ගෙන යන ලෙස උපදෙස් ලබා දී	2024 ඔක්තෝබර් 15 දින වන විටත් ගබඩා පරිපාලනය විධිමත් කිරීමට කටයුතු කර නොතිබුණි.

නොතිබුණු බවත්, සෙමින් චලනය වන තොග පැවති නමුත් එම අයිතම හඳුනාගෙන අලෙවි ප්‍රවර්ධන උපක්‍රම භාවිතා කර නොතිබුණු බවත්, ඖෂධවල මිල වැඩිවීම, ලේබල් හා ඇසුරුම් බොඳවීම ආදී වූ හේතූන් මත අලෙවියෙන් ඉවත් කර තිබුණු ඖෂධ වර්ග කල් ඉකුත් වූ ඖෂධ සමඟ එකට ගබඩාකර තිබුණු බවත්, එම තොග නැවත ලේබල් කර අලෙවි කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග නොගෙන කල් ඉකුත් වීමට ඉඩ හැර තිබුණු බවත්, අලෙවි මධ්‍යස්ථානවල හා ගබඩාවල පවතින කල් ඉකුත් වූ ප්‍රයෝජනයට ගත නොහැකි ඖෂධ වර්ග දීර්ඝ කාලයක සිට තොග පොත්වලින් ඉවත් නොකර සාමාන්‍ය තොග ලෙස ගණනය කර තිබුණු බවත්, අලෙවි මධ්‍යස්ථානවල පැවැති කල් ඉකුත් වූ ප්‍රයෝජනයට ගත නොහැකි ඖෂධ වර්ග මධ්‍යම ගබඩාවලට ප්‍රවාහනය නොකිරීම නිසා අක්‍රමිකතාවයන් සිදුවීමට ඉඩකඩ පැවැති බවත්, අලෙවි මධ්‍යස්ථානවල විශාල

ඇති බව. අවුරුදු 03 ක හානිවූ තොග පවතින බව ඉදිරියේ දී යාවත්කාලීනව පවත්වා ගැනීමට කටයුතු කරන බව. ගබඩාවේ ඉඩකඩ ප්‍රමාණවත් නොවන බැවින් 2022 හා 2023 හානිවූ තොග එකම ස්ථානයක රැස්කර තැබීමට සිදුවී ඇති බව. ලේබල් හා ඇසුරුම් බොඳවීම ආදී වූ හේතූන් මත අලෙවියෙන් ඉවත් කරන ඖෂධ නැවත නිෂ්පාදනාගාරයට යවා නැවත ප්‍රයෝජනයට ගත හැකි තත්වයට පත් කර ඇති බව හා 2023 ඔක්තෝබර් මස සිට උපරිම, අවම හා යලි ඇණවුම් හා ආර්ථික තොග මට්ටම් සකස් කර නිෂ්පාදන සැලසුම් සකස් කරන බව .

	ඉඩ ප්‍රමාණයක් ඌන උපයෝජිතව පැවති බවත්, නිරීක්ෂණය විය.				
17	සංස්ථාව විසින් අවස්ථා 160 කදී රු. 2,326,651 ක් වටිනා ඖෂධ නොමිලේ නිකුත් කර ඒවායේ පිරිවැය රු. 1,537,478 ක් පරිත්‍යාග ලෙස විකුණුම් හා බෙදා හැරීම් වියදම් යටතේ දක්වා තිබුණි. තවද අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අංක : 14192 ප්‍රකාරව පරිත්‍යාග ලබාදීම සම්බන්ධයෙන් මාර්ගෝපදේශ සංග්‍රහයක් සකස් කර අනුමැතිය ලබා ගැනීමට යටත්ව 2019 ජුලි 08 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් තීරණ අංක 13406 යටතේ පරිත්‍යාග ලබාදීම සඳහා අනුමැතිය ලබාදී ඇතත් වසර 05කට ආසන්න කාලයක් ගතව තිබුණද මෙතෙක් විධිමත් මාර්ගෝපදේශ සංග්‍රහයක් පිළියෙල කිරිමට කටයුතු කර නොතිබුණි.	2023 2022 2021	පරිත්‍යාග ලබාදීම සම්බන්ධයෙන් දරන පිරිවැය අවම කිරීමටත්. පරිත්‍යාග ලබාදීමේ ක්‍රියාවලිය සංස්ථාවේ අලෙවි ප්‍රවර්ධනයට හේතුවන පරිදි වඩාත් විනිවිද පෙනෙන ආකාරයට ක්‍රියාත්මක කළ යුතුය. ඒසඳහා මාර්ගෝපදේශ සංග්‍රහයක් කඩිනමින් සකස් කර අනුමත කර ගැනීමට කටයුතු කළ යුතුය.	කළමණාකරු (අලෙවි) විසින් පරිත්‍යාග ලබා දිම වෙනුවෙන් අනුමැතිය ලබා ගැනිම සඳහා යොමු කර ඇති අතර, අධ්‍යක්ෂ මණ්ඩලය 2019.07.08 දිනැති තීරණය අනුව දැනට පරිත්‍යාග සිදුකරන බව.	2024 ඔක්තෝබර් 15 දින වන විටද පරිත්‍යාග ලබා දීම වෙනුවෙන් සංස්ථාවේ අලෙවි ප්‍රවර්ධනය සඳහා හේතුවන පරිදි විනිවිද පෙනෙන ක්‍රමවේදයක් ස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබුණි.
18	සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ සමස්ථ විකුණුම් ඇස්තමේන්තුව	2023	පෞද්ගලික අංශයේ හා රාජ්‍ය අංශයේ විකුණුම් ආදායම වර්ධනය කර	සංස්ථාවේ වාර්ෂික සමස්ථ විකුණුම් අදායම් ඇස්තමේන්තුව ඊට	පෞද්ගලික අංශයේ විකුණුම් භාවිතා කර ගැනීම ඉලක්ක

	රු.1,700,000,000 ක්වූ අතර තත්‍ය විකුණුම් රු. 1,215,283,637 ක් විය. ඉන් රු. රු.770,881,496 ක් හෙවත් සියයට 63 ක්ම රාජ්‍ය අංශයෙන් ලැබී තිබුණු අතර පෞද්ගලික අංශයෙන් ලැබී තිබුණු ප්‍රමාණය රු. 444,402,141 ක් හෙවත් සියයට 37 ක් විය. වෙළඳ පොළ අවශ්‍යතා නිසිපරිදි හඳුනා නොගැනීමත්, නව ප්‍රචාරණ හා අලෙවි ප්‍රවර්ධන ක්‍රම උපායන් භාවිතා නොකිරීමත්, නිරායාසයෙන් ලැබෙන රාජ්‍ය අංශයේ ඉල්ලුම කෙරෙහි වැඩි නැඹුරුතාවයක් දැක්වීමත් පෞද්ගලික අංශයේ විකුණුම් අඩුවීමට හේතුවී තිබුණි.	ගැනීමට වෙළඳ පොළ අවශ්‍යතා නිසිපරිදි හඳුනා ගැනීමටත්, නව ප්‍රචාරණ හා අලෙවි ප්‍රවර්ධන ක්‍රම උපායන් භාවිතා කිරීමටත් කටයුතු කළ යුතුය.	පෙර වර්ෂයේ අගෝස්තු මස සකස් කරන බව හා ඒ අනුව වාර්ෂික ඇස්තමේන්තුව පිළියෙල කරන බව. මෙය ඉදිරි වර්ෂය සම්බන්ධයෙන් අවස්ථා කිහිපයක දි (අවස්ථා 03) මිල වැඩිවීම් හේතුවෙන් අලෙවියේ අඩුවීමක් දක්නට ලැබුණු බව. නව ප්‍රචාරණ හා අලෙවි ප්‍රවර්ධන ක්‍රම ලෙස ඩිජිටල් මධ්‍ය උපයෝගි කර ගනිමින් ප්‍රචාරන කටයුතු මෙන්ම අලෙවි කටයුතු 2024 වර්ෂයේ දි සිදු කරමින් පවතින බව. අලෙවි ප්‍රවර්ධන ක්‍රම ලෙස සංචාරක හෝටල් සහ නව සුපිරි වෙළඳසැල්, බටහිර ඔසුසැල්, නව ආයුර්වේද වෛද්‍යවරුන්ට ඍජුව අලෙවි කටයුතු සිදු කිරිම හා සංස්ථා නිෂ්පාදන ප්‍රවර්ධනය කරන බව.	කර ගනිමින් සැලසුම් සහගතව නව අලෙවි ක්‍රම උපායන් හඳුන්වා දීමට සහ ප්‍රමාණවත් ප්‍රචාරන ක්‍රම භාවිතා කිරීමට අවධානය යොමුකර නොතිබුණි.
19	සංස්ථාව විසින් තම 2023 වෙළඳපොල කොටස තීරණය කිරීම සඳහා කාලීනව වෙළඳපොල සමීක්ෂණයක් සිදුකර නොතිබුණු අතර තරඟකාරී ආයතන අතර සංස්ථාවේ වෙළඳපොල කොටස	සංස්ථාවේ වෙළඳපල කොටස තීරණය කිරීම සඳහා, එය වර්ධනය කර ගැනීම සඳහා මෙන්ම නව පාරිභෝගික අවශ්‍යතා තෘප්තිමත් වන පරිදි වෙළඳපල ප්‍රවනතා හඳුනාගැනීම	ඉදිරියේ දි බාහිර ආයතනයකට (විශ්වවිද්‍යාලයකට) ලබා දි වෙළඳපොල සමීක්ෂණයක් සිදු කිරිමට අපේක්ෂිත බව.	2024 ඔක්තෝබර් 15 දින වන විටද ප්‍රමාණවත් වෙළඳපොළ සමීක්ෂණ සිදුකර නොතිබුණි.

	අඩුවීමක් හෝ වැඩිවීමක් සිදුවී තිබේද යන්න පිළිබඳ අවබෝධයක් නොතිබුණි.		සඳහා වෙළඳපල සමීක්ෂණයක් සිදු කළ යුතුය.		
20	සංස්ථාව විසින් පිළියෙල කර තිබුණු නිෂ්පාදන සැලැස්ම හා අලෙවි සැලැස්මට අනුව කටයුතු ඉටුකරන සංස්ථාවේ විවිධ අංශවල ක්‍රියාවලීන්හි කාර්යයන් ඇගයීම සඳහා කාර්යසාධන දර්ශක පිහිටුවා එම කාර්යයන්හි කාර්යසාධනය සමාලෝචනය කර නොතිබුණි.	2023	සංස්ථාවේ එක් එක් අංශවල, ක්‍රියාවලිවල කාර්යසාධනය ඇගයීම සඳහා කාර්යසාධන දර්ශක පිහිටුවා එම කාර්යයන්හි කාර්යසාධනය සමාලෝචනය කළ යුතුය.	නිෂ්පාදනය හා අලෙවිය සම්බන්ධව වාර්ෂික සැලසුම් සකස් කර ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන ඇති බව. මේ සම්බන්ධව මාසිකව අධ්‍යක්ෂ මණ්ඩල සමාලෝචන වාර්තාවක් ඉදිරිපත් කරන අතර කළමනාකරණ රැස්වීම් වලදී සමාලෝචනය කිරීමටද පියවර ගෙන ඇති බව.	2024 ඔක්තෝබර් 15 දින වන විටද සංස්ථාවේ එක් එක් අංශවල ක්‍රියාවලියන්හි කාර්ය සාධනය මැනීම හා ඇගයීම සඳහා කාර්ය සාධන දර්ශක පිහිටුවා නොතිබුණි.
21	සංස්ථාවේ එදිනෙදා කටයුතු පවත්වාගෙන යාමේදී මුදල් ප්‍රවාහයන් තාර්කිකව හා විචක්ෂණශීලීව කළමනාකරණය කර ගනිමින් නිසි ක්‍රමවේදයක් ඔස්සේ කටයුතු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග නොගෙන සමාලෝචිත වර්ෂයේ රු.84,542,736 ක්වූ ස්ථාවර තැන්පතු 03 ක් කල් පිරීමට පෙර ආපසු ගැනීම නිසා රු. 2,506,031 ක තැන්පතු පොළී අදායමක් අහිමිවී තිබුණු බව නිරීක්ෂණ විය.	2023	සංස්ථාවේ එදිනෙදා කටයුතු පවත්වාගෙන යාමේදී මුදල් ප්‍රවාහයන් තාර්කිකව හා විචක්ෂණශීලීව කළමනාකරණය කර ගැනීමට කටයුතු කළ යුතුය.	අත්‍යාවශ්‍ය අමු ද්‍රව්‍ය ආනයන කටයුත්තක් සඳහා මෙම ස්ථාවර තැන්පතු 3 කල් පිරීමට ප්‍රථම ආපසු සංස්ථාවේ ජංගම ගිනුම් වෙත ලබාගෙන ඇති බව.	මුදල් ප්‍රවාහයන් තාර්කිකව හෝ විචක්ෂණශීලීව කළමනාකරණය කර ගැනීම සඳහා විධිමත් ක්‍රමවේදයක් ස්ථාපිත කර නොතිබුණි.

22	වර්ෂ 05කටත් පෙර සිට හිඟව පැවති රු.2,510,687 ක්වූ ණය ගැති ශේෂ 17 ක් පදනම් කර ගනිමින් සමාලෝචිත වර්ෂයේ රු. 2,507,072 ක ප්‍රමාණයක් අඩමාන ණය සඳහා වෙන් කර තිබුණු නමුත් එම ණය ගැතියන්ගෙන් ලැබිය යුතු මුදල් අයකර ගැනීමට විධිමත් හා ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	2023	ණයගැතියගෙන් ලැබිය යුතු මුදල් අයකර ගැනීමට විධිමත් හා ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගත යුතුය.	විමසුම හා එකඟවන බව හා රු. 2,507,072 ක අඩමාන ණය වෙන් කිරීමක් සිදු කර ඇති බව. මෙම ණයගැති ශේෂ වසර 05කට වඩා පෙරසිට පැවත එන බැවින් ප්‍රමාණවත් තොරතුරු නොමැති බව. මේ සම්බන්ධව අලෙවි අංශය මගින් ඉදිරි කටයුතු සිදු කරන බව.	මේ සම්බන්ධයෙන් ඉදිරි පියවර ගෙන නොතිබුණි.
23	2017, 2018, හා 2021 වර්ෂවල ප්‍රාග්ධන ප්‍රදාන ලෙස මහා භාණ්ඩාගාරයෙන් ලැබී තිබුණු රු. 97,000,000 කින් රු. 26,149,834 ක් හෙවත් සියයට 27 ක් 2024 අප්‍රේල් 30 දින වන විටත් උපයෝජනය නොකර බැංකු ගිණුමක රඳවා ගෙන තිබුණි.	2023	සංස්ථාවේ අරමුණු ඉටුකර ගනිමින් රටේ සංවර්ධනයට දායක විය හැකි අත්‍යවශ්‍ය හා ප්‍රමුඛ ව්‍යාපෘති පමණක් සැලසුම් කර එම සැලසුම් සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන පමණක් මහා භාණ්ඩාගාරයෙන් ලබාගත යුතුය. ඉතිරිව පවතින ප්‍රාග්ධන ප්‍රදානවලට අදාළ ව්‍යාපෘති නැවත සමාලෝචනය කර අත්‍යවශ්‍ය කාර්යයන් කඩිනමින් අවසන් කිරීමට කටයුතු කළ යුතුය.	පතිරගොඩ නව නිෂ්පාදනාගාර පරිශ්‍රයේ ඉදිකරමින් පවතින රස බෙහෙත් නිෂ්පාදනාගාරයට අදාලව සහ විදුලි ජනක යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා ලැබී ඇති ප්‍රාග්ධන ප්‍රතිපාදන රුපියල් 31,149,834 ක් බැංකු ගිණුමක රඳවාගෙන තිබුණු බව. ඉන් විදුලි ජනක යන්ත්‍රය මිලදී ගැනීම සඳහා ලැබී තිබූ රුපියල් මිලියන 05 ක ප්‍රතිපාදන මේ වන විට භාවිතා කර ඇති අතර අනෙකුත් ප්‍රතිපාදන ඉදිරියේ දී භාවිතා කිරීමට කටයුතු කරන බව.	මිලියන 5ක ප්‍රතිපාදන උපයෝගි කර ගනිමින් විදුලි ජනක යන්ත්‍රයක් මිලදී ගෙන ඇති නමුත් සෙසු ව්‍යාපෘති 2024 ඔක්තෝබර් 15 දින වන විටද නිමකර නොතිබුණි.
24	රෝගින්ගේ රස බෙහෙත් අවශ්‍යතාවය සපුරාලීමේ හා නිරෝගි	2023, 2022, 2021	ඉදිකිරීම් ආරම්භ කර දැනට වසර 05 ක් ඉක්මගොස් ඇති	සංස්ථාවේ පතිරගොඩ නව නිෂ්පාදනාගාර	2024 ඔක්තෝබර් 15 දින වන විටද ඉදිකිරීම් නැවත

සමාජයක් ගොඩ නැගීමේ අරමුණින් රු.45,725,759 ඇස්තමේන්තු පිරිවැයක් සහිත රස බෙහෙත් නිෂ්පාදනාගාරයක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය රු. 37,000,000 ක භාණ්ඩාගාර ප්‍රතිපාදන මත 2018 අගෝස්තු 25 දින ආරම්භ කර තිබුණි. 2020 ජනවාරි 02 දක්වා රු.12,144,400 ක් වැය කර ඉදිකිරීම්වලින් සියයට 30 ක් නිමකර තිබුණද සැලසුම් හා අධීක්ෂණ දුර්වලතා හේතුවෙන් එදින සිට ඉදිකිරීම් තාවකාලිකව නතර කර තිබුණි. 2023 සැප්තැම්බර් 30 වන විට වසර 05 ක් ඉක්මවා තිබුණු නමුත් අදාළ ඉදිකිරීම් නැවත ආරම්භ කර නොතිබුණි. ඒ අනුව එම ව්‍යාපෘතිය වෙනුවෙන් එතෙක් කළ වියදම අනාර්ථික බවට පත්ව තිබුණු අතර කොන්ත්‍රාත්තුවේ පිරිවැය රු. 58,940,280 ක් දක්වා රු. 25,431,163 කින් එනම් සියයට 75.89 කින් ඉහල ගොස් තිබුණි.	බැවින් ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු හැකි ඉක්මනින් ආරම්භ කර ව්‍යාපෘතිය නිම කිරීමට කටයුතු කළ යුතුය.	පරිශ්‍රයේ රස බෙහෙත් නිෂ්පාදනයට අදාළව ගොඩනැගිල්ලක් ඉදි කිරීමට ප්‍රසම්පාදන පිරිනමා එහි ඉදි කිරීම් කටයුතු 2019 වර්ෂයේ ආරම්භ කර ඇතත් ගැටලුකාරී තත්වයක් නිසා ඉදි කිරීම් ප්‍රමාද වී ඇති බව. මෙම ඉදි කිරීම සම්බන්ධ උපදේශන කටයුතු සපයන රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ නිර්දේශ සහ මැදිහත් වීම මත නැවත ඉදි කිරීම් කටයුතු ආරම්භ කරන ලද අතර Covid – 19 වසංගත තත්ත්වය හේතුවෙන් නැවත වරක් ඉදි කිරිම් කටයුතු ඇණහිට ඇති අතර නැවත අවස්ථා කිහිපයකදී සාකච්ඡා කලද මේ දක්වා ඉදි කිරීම් කටයුතු ආරම්භ කර නොමැති බව. මේ සම්බන්ධව සෞඛ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (ඉංජිනේරු) මැදිහත් වීම යටතේ සාකච්ඡා කර ඉටු කරන ලද සේවා කොටස් සම්බන්ධ ඇස්තමේන්තුවක් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව මගින් ලබාගෙන ඇති අතර ඒ අනුව ඉදිරි කටයුතු සිදු කරනු ලබන බව.	ආරම්භකර නොතිබුණි.

25	2018 වර්ෂයේදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් සේවා ගණ 09ක් යටතේ සංස්ථාව සඳහා සංශෝධිත බඳවා ගැනීමේ පටිපාටියක් අනුමත කර තිබුණු නමුත් ඒ අනුව සේවයේ ස්ථිර කිරීමේදී තෙවන පාර්ශව හරහා සුදුසුකම් සනාථ කර ගැනීමට හා සේවය ස්ථිර කල බවට පෞද්ගලික ලිපිගොනුවට පිටපතක් සහිතව ලිපියක් නිකුත් කිරිමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	2023, 2022. 2021	අදාළ බඳවාගැනීමේ පටිපාටි අනුව සේවයේ ස්ථිර කිරීමේදී තෙවන පාර්ශව හරහා සුදුසුකම් සනාථ කර ගැනීමට හා සේවය ස්ථිර කල බවට පෞද්ගලික ලිපිගොනුවට පිටපතක් සහිතව ලිපියක් නිකුත් කිරිමට කටයුතු කළ යුතුය.	විමසුම හා එකග වන බව හා විභාග දෙපාර්තමේන්තුවෙන් සහ උසස් අධ්‍යාපන ආයතන මඟින් සුදුසුකම් සනාථ කිරීම සිදු කරගනිමින් පවතින අතර 2024 වර්ෂයේ සිට ස්ථිර කිරීමේ ලිපි නිකුත් කිරිමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව.	බඳවා ගැනීමේ පටිපාටි වලට පටහැනිව බඳවා ගැනීම් සිදු කර තිබීම, සම්මුඛ පරික්ෂණ මණ්ඩල අක්‍රමිකතා, විනිවිද නොපෙනෙන ක්‍රියාකාරකම් ආදිය හේතුවෙන් මානව සම්පත් කළමනාකරණ කටයුතු දූර්වල තත්ත්වයක පවතී.
26	දේශීය වෛද්‍ය අමාත්‍යාංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය සහ ජනාධිපති ලේකම් කාර්යාලය වෙතින් ලද වාහන 04 මෙතෙක් පවරා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	2023	සංස්ථාවේ ධාවන කටයුතු සඳහා යොදවා ඇති වාහන පවරා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.	මේ වන විට PA – 7155, PA – 7161, KP – 4876 සහ LC – 9184 යන අංක දරන වාහන පමණක් සංස්ථාවේ ධාවන කටයුතු සඳහා යොදවා ඇති බව. එම වාහන මෙම සංස්ථාව වෙත පවරා ගැනීමට අදාල ලිපි ලේඛන අදාළ ආයතන වෙත යොමු කර ඇති අතර භාවිතයට නොගන්නා වාහන නැවත භාර දීමටද කටයුතු කර ඇති බව.	2024 ඔක්තෝබර් 15 දින වන විටද තත්ත්වය වෙනස් වී නොතිබුණි.

27	මුදල් රෙගුලාසි 1646 විධිවිධාන ප්‍රකාරව වාහන භාර නිලධාරින් විසින් වාර්තාව ඉදිරිපත් කරනු ලබන මාසයට පසු ඊලඟ මාසයේ 15 වැනි දිනට පෙර ගමන් පිළිබඳ මාසික සාරාංශයේ මුල් පිටපත් සමඟ ඒ ඒ මාසයේ දෛනික ධාවන සටහන් ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා මාර්ගයෙන් විගණකාධිපති වෙත යැවිය යුතු වුවත්, සංස්ථාව සතු වාහන සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි.	2023	මාසික සාරාංශයේ මුල් පිටපත් සමග ඒ ඒ මාසයේ දෛනික ධාවන සටහන් විගණකාධිපති වෙත යැවීමට කටයුතු කල යුතුය.	විමසුම හා එකග වන බවත් 2024 ජුනි මස සිට මෙය ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බව.	මුදල් රෙගුලාසිය අනුව කටයුතු නොකරයි.
28	තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින නමුත් සමාලෝචිත වර්ෂයට අදාළව සංස්ථාව තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව අවබෝධයකින් කටයුතු කර තිබුණද, එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව ආයතනයේ කාර්යයන්ට සම්බන්ධ	2023	තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීමට අදාළව ඉලක්ක, දර්ශක හඳුනා ගැනීමට හා ප්‍රගතිය මිණුම් කිරීමට කටයුතු කළ යුතුය.	අංක 2356121 – 2023.11.01 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය මගින් සංස්ථාවේ විෂය පථය පුළුල් වී ඇති බැවින් ඉදිරි කාල පරිච්ඡේදය සඳහා සැලසුම සකස් කිරීමේදී ඒ පිළිබඳව ද අවධානය යොමු කර තිරසාර සංවර්ධන ඉලක්ක ඇතුලත් කිරීමට කටයුතු කරන බව.	2024 ඔක්තෝබර් 15 දින වන විටත් තිරසාර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීමට අදාලව ඉලක්ක දර්ශක හඳුනා ගැනීමට හා ප්‍රගතිය මිනුම් කිරීමට කටයුතු කර නොතිබුණි.

	තිරසර සංවර්ධන අරමුණු ඉලක්ක හා එම ඉලක්ක කරා ළගා විය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළගාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන්ද ප්‍රමාණවත්ව හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.				
29	සංස්ථාව සතු ඔසු උයන්වලින් සපයා ගනු ලබන වියලි ඔසු අමුද්‍රව්‍යවල පිරිවැය හඳුනාගැනීම සඳහා විධිමත් ක්‍රමවේදයක් හඳුන්වාදී නොතිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය තුළ ඔසු උයන්වලින් ලැබී තිබුණු වියලි ඔසු අමුද්‍රව්‍ය කිලෝග්‍රෑම් 4,665 ක් රු. 1 බැගින්ද කිලෝග්‍රෑම් 21,423ක් පවත්නා වෙළඳපල මිල යටතේද අගය කර තිබුණි.	2022	ඔසු උයන්වලින් සපයා ගනු ලබන අමු හා වියලි ඔසු අමුද්‍රව්‍යවල පිරිවැය හඳුනාගැනීම සඳහා අඛණ්ඩව අනුගමණය කළ හැකි විධිමත් ක්‍රමවේදයක් හඳුන්වාදීමට කටයුතු කළ යුතුය.	ඔසු උයන් වලින් නිෂ්පාදනාගාර වෙත ලබා ගන්නා අමු ද්‍රව්‍ය සංස්ථාව විසින් නියම කර ඇති සහතික මිල ගණන් අනුව හා එසේ සහතික මිලක් නියම කර නොමැති අමු ද්‍රව්‍ය කාලීන මිල කිරීමක් සහිතව ගිණුම්ගත කිරීමට ඉදිරියේදී පියවර ගන්නා බව.	2024 ඔක්තෝබර් 15 දින වන විටද මේ සඳහා විධිමත් අභ්‍යන්තර පාලන ක්‍රම හඳුන්වාදී නොතිබුණි.
30	අලෙවි අංශයේ විකුණුම් වාර්තා සමඟ මූල්‍ය අංශයේ විකුණුම් වාර්තා සැසඳිමේදී, අත්පිට විකුණුම් රු. 732,947 ක් සහ ණයට විකුණුම් රු. 14,004,863 ක් අඩුවෙන්ද,ජංගම විකුණුම් රු. 1,070,304 ක් වැඩියෙන්ද ගිණුම්ගත කර තිබීම හේතුවෙන්	2022	විකුණුම් ආදායම උපචිත පදනම මත හඳුනාගත යුතුය. යාවත්කාලීන විකුණුම් තොරතුරු සම්පාදනය සඳහා අලෙවි අංශය හා ගිණුම් අංශය අතර අඛණ්ඩ අන්තර් සම්බන්ධතාවයක් සහ නිරන්තර සැසඳුම් ක්‍රියාවලියක් පවත්වාගෙන යාම	විමසුම හා එකග වන බව හා ගිණුම් අංශය විසින් මූලාශ්‍ර ලේඛන පදනම් කර ගනිමින් විකුණුම් වාර්තා පවත්වා ගෙන යන අතර අළෙවි අංශය විසින් ඔවුන්ගේ පරිහරණය සඳහා මූලාශ්‍ර ලේඛන රහිතව විකුණුම් වාර්තා පවත්වාගෙන බව.	අලෙවි අංශයේ විකුණුම් වාර්තා සමඟ මූල්‍ය අංශයේ විකුණුම් වාර්තා සැසඳීම් කරමින් වෙනස්කම් සම්බන්ධයෙන් විධිමත් පියවර නොගැනීම හේතුවෙන් අලෙවිසැල් වල වැරදි සහ වංචා

	සමාලෝචිත වර්ෂයේ විකුණුම් ආදායම රු. 13,666,506ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු බව නිරීක්ෂණය විය.		සඳහා සුදුසු යාන්ත්‍රණයක් හඳුන්වා දිය යුතුය.		ඉහළ ගොස් ඇති බව නිරීක්ෂණය විය.
31	සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු වාර්ෂික නිෂ්පාදන සැලැස්මට අනුව, අරිෂ්ඨ , ආසව, තෙල්, ක්වාත, සිරප් ඇතුළු ඖෂධීය දියර වර්ගයන්ගෙන් සැලසුම්ගත වාර්ෂික ඖෂධ නිෂ්පාදනය ලීටර. 627,712 ක් හා චූර්ණ, ගුගුල්, කල්ක, ලේප, ලේහ, මෝදක, රස, වටී ඇතුළු ඖෂධීය ද්‍රව්‍යයන්ගෙන් සැලසුම්ගත වාර්ෂික ඖෂධ නිෂ්පාදනය කිලෝ ග්‍රෑම්. 151,179 ක් නිෂ්පාදනය කිරීමට සැලසුම් කර තිබුණද, තත්‍ය නිෂ්පාදනය පිළිවෙලින් දියර වර්ගයන්ගෙන් ලීටර. 389,750 ක් හා ද්‍රව්‍ය කිලෝග්‍රෑම්. 70,799 ක් විය. ඒ අනුව අපේක්ෂිත වාර්ෂික නිෂ්පාදනය පිළිවෙලින් දියර වර්ගයන්ගෙන් ලීටර. 237,962 ක් එනම් සියයට 38 කින් හා ද්‍රව්‍ය කිලෝග්‍රෑම්. 80,380 කින් එනම් සියයට 53 කින්	2022	ඉකුත් වර්ෂවල ධාරිතාව හා පවතින සම්පත් ප්‍රමාණය සැලකිල්ලට ගෙන ඉදිරි වර්ෂයේ නිෂ්පාදන සැලසුම් සකස් කළ යුතු අතර අදාල නිෂ්පාදන ඉලක්ක සාර්ථක කර ගැනීම සඳහා ප්‍රමාණවත් කාර්යසාධන වර්ධනයක් පවත්වාගෙන යා යුතුය.	2022 වසරේ වාර්ෂික සැළසුම් ගත නිෂ්පාදනය කර්මාන්තශාලා පිරිවැය මිළ අනුව රු.683,458,641ක් වුවද , සත්‍ය වාර්ෂික නිෂ්පාදනය පිරිවැයට රු.495,531,635 ක් බව, ඒ අනුව වාර්ෂික සැළසුම්ගත නිෂ්පාදනයේ රු.187,927,006ක අඩු වීමක් පෙන්නුම් කර ඇති නමුත් වාර්ෂික සැළසුම් ගත නිෂ්පාදනයෙන් සියයට 72.5ක පමණ ඉලක්කයක් කරා ළඟා වීමට හැකි වූ බව. 2022 වර්ෂයේ පැවති අර්බුධකාරී තත්ත්වය හමුවේ නිෂ්පාදන පිරිවැය ඉහළ යාම, අමු ද්‍රව්‍ය හිඟය, ප්‍රවාහන ගැටළු, කාරක ප්‍රාග්ධන ගැටළු, සේවක පැමිණීම ආදී සීමාකාරී සාධක රාශියක් ප්‍රධාන වශයෙන් මෙයට බලපා ඇති බව.	වාර්ෂික නිෂ්පාදන සැලසුම සහ කාර්තුමය නිෂ්පාදන වාර්තා අතරද සත්‍ය නිෂ්පාදන තොරතුරු අතරද පරස්පරතාවයක් පවතී. ඒ අනුව 2024 ඔක්තෝබර් 15 දින වන විටද සැලසුම්ගත නිෂ්පාදනය සහ සත්‍ය නිෂ්පාදනය සසඳා නිවැරදි කළමනාකරණ තීරණ ගැනීමට හැකියාවක් නොමැති බව නිරීක්ෂණය විය.

	ළඟාකර ගැනීමට නොහැකිවී තිබුණි. තවද සමාලෝචිත වර්ෂයේ නිෂ්පාදන 12 ක් සඳහා නිෂ්පාදන වැඩපත් 2135 ක් සැලසුම් කර තිබුණද, නිමකළ තථ්‍ය වැඩපත් ප්‍රමාණය 1441 ක් වූයෙන් වැඩපත් 694 ක ප්‍රමාණයක් එනම් සියයට 33 ක්, ප්‍රධාන නිෂ්පාදනාගාරයේ නව නිෂ්පාදන 04 ක් සඳහා නිෂ්පාදන වැඩපත් 215 ක් සැලසුම් කර තිබුණද, නිමකළ තථ්‍ය වැඩපත් ප්‍රමාණය 127 ක් වූයෙන් වැඩපත් 88 ක ප්‍රමාණයක් එනම් සියයට 41 ක් හා නව නිෂ්පාදනාගාරයේ නව නිෂ්පාදන 12 ක් සඳහා නිෂ්පාදන වැඩපත් 1228 ක් සැලසුම් කර තිබුණද, නිමකළ තථ්‍ය වැඩපත් ප්‍රමාණය 423 ක් වූයෙන් වැඩපත් 805 ක ප්‍රමාණයක් එනම් සියයට 66 ක් නිමකර ගැනීමට නොහැකිවී තිබීම අපේක්ෂිත නිෂ්පාදන ඉලක්ක කරා ළඟා නොවීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.		
32	2022 වර්ෂයේ ක්‍රියාකාරි සැලසුම අනුව වාර්ෂික විනෝද චාරිකාව සඳහා රු.1,800,000 ක මූල්‍ය	2022	යම් මුදල් වර්ෂයක සෑම වර්ෂයකම ජේදයේ සඳහන් වියදම් සඳහා අයවැය තුළ මානව අඩුපාඩු අයවැයෙන් සම්පත් අංශයට අනාවරණය කර වෙන්කරන ප්‍රතිපාදන වාර්ෂික විනෝද ගැනීමට හෝ ඉදිරි වර්ෂ සඳහා චාරිකාව වෙනුවෙන් මෙවැනි අඩුපාඩු

ප්‍රතිපාදන වෙන්කර තිබුණද, 2020 හා 2021 වර්ෂවල ප්‍රතිපාදනද ඉතිරිව පවතින බවට වූ සාවද්‍ය කරුණු දැක්වීමක් මත පදනම්ව, 2022 පෙබරවාරි 10 දින පැවැති අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණ අංක 14143 මගින් 2022 වාර්ෂික විනෝද චාරිකාවට රු.4,500,000 ක වියදම් දැරිමට අනුමැතිය ලබා දී තිබුණි. නමුත් 2021 වර්ෂයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් රු.20,152,134 ක අලාභයක් හා රු.17,728,950 ක ශුද්ධ අලාභයක් ලබා තිබියදී රාජ්‍ය වියදම් පාලනය පිළිබඳව මනා අධීක්ෂණයක් හා සංයමයක් පවත්වාගත යුතු වුවද එම චාරිකාව සඳහා සලසා තිබු ප්‍රතිපාදන සීමාවද සියයට 147 ක් ඉක්මවා රු.4,442,861 ක් සංස්ථාවේ අරමුදල් වලින් වැය කිරීමේදී එහි අයහපත් බලපෑම පිළිබඳ නිසි අවධානයක් යොමු කර නොතිබුණි. තවද මේ වෙනුවෙන් වැයකිරීම සඳහා සංස්ථාවට ඖෂධ, භාණ්ඩ හා සේවා සපයන සැපයුම්කරුවන්ගෙන්	භාවිතා කළ නොහැකිය. මෙහෙයුම් අලාභ ලබමින් පවතින තත්ත්වය සැලකිල්ලට ගෙන වියදම් පාලනය පිළිබඳව මනා අධීක්ෂණයක් හා සංයමයක් ද මූල්‍ය විනයක්ද පවත්වාගත යුතුය. සැපයුම්කරුවන්ගෙන් මුදල් හා ද්‍රව්‍යාධාර ලබානොගත් බවටත් අක්‍රමිකතාවයක් හා වංචාවක් සිදු නොවූ බවටත් තහවුරු කර ගැනීම සඳහා විධිමත් පරීක්ෂණයක් පවත්වා සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය.	ප්‍රතිපාදන වෙන්කරන බව. රටතුල පැවති Covid 19 වසංගත තත්ත්වය හේතුවෙන් 2020 හා 2021 වර්ෂවල චාරිකාව සංවිධානය කිරීමට නොහැකි වූ බව. ඒ අනුව 2022 වර්ෂයේදී පසුගිය වසරවල අයවැයෙන් වෙන් කරන ලද ප්‍රතිපාදන අදාළ කරගනිමින් චාරිකාව සංවිධානය කළ බව.	ඉදිරියේදී වලක්වා ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබුණි.

	මුදල් හා ද්‍රව්‍යාධාර ලබාගත් බවට සාක්ෂි අනුව තහවුරු වූ නමුත් එම මුදල් කිසිවක් විනෝද චාරිකාවට වැයකළ බව හෝ අක්‍රමිකතාවයක් හා වංචාවක් සිදු නොවූ බව හෝ තහවුරු කෙරෙන ලිඛිත සාක්ෂි කිසිවක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.				
33	අන්තර්ජාතික වෛද්‍ය කලාපයක් ඇති කිරීම සම්බන්ධයෙන් වූ ප්‍රසම්පාදන කටයුතු පිළිබඳව ව්‍යාපෘති සැලසුම හා ඇස්තමේන්තු සැකසීම සඳහා මිල ගණන් කැඳවීමේදී ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ උපදේශකයන් තෝරා ගැනීම හා සේවයේ යෙදවීම සඳහා වූ මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.3 මාර්ගෝපදේශය ප්‍රකාරව ප්‍රසම්පාදනයට යොමුවීමේ කොන්දේසි (Terms of Reference) (TOR) පිළියෙල කර නොතිබුණි. තවද 3.14.3 මාර්ගෝපදේශය ප්‍රකාරව උපදේශන සේවාවල මුළු පිරිවැය රු.මිලියන 10 ක් නොඉක්මවන්නේ	2022	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ උපදේශකයන් තෝරා ගැනීම හා සේවයේ යෙදවීම සඳහා වූ මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශවලට අනුව කටයුතු කළ යුතුය.	2021 වර්ෂයේදී නාවින්න ආයුර්වේද කලාපය මහජනතාවට විවෘත කලාපයක් ලෙස ආකර්ෂණීයව සකස් කිරීම සම්බන්ධව නාගරික සංවර්ධන අධිකාරිය සමග සාකච්ඡා කිහිපයක් පැවැත්වූ බව. සැලසුම හා ඇස්තමේන්තු සකස් කිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය වෙතින් ඉල්ලීමක් කරන ලද බව COVID 19 වසංගත තත්වය හා එම ආයතනය මුහුණ දී ඇති විවිධ කරුණු දක්වමින් අප විසින් ඉල්ලා සිටින ලද කාර්ය ප්‍රමාද කළ බැවින් වෘත්තීය සුදුසුකම්ලත් ආයතන වෙතින් හා තැනැත්තන් වෙතින් විධිමත්ව සේවා ගාස්තු විමසීමට	සෞඛ්‍ය අමාත්‍යාංශයේ විගණනය හා කළමනාකරණ කමිටුව විසින් මේ සම්බන්ධව පරීක්ෂා කර වාර්තා කිරීමට අමාත්‍යාංශ විමර්ශන අංශයට පවරා ඇත. 2024 ඔක්තෝබර් 15 දින වන විටද කිසිදු ප්‍රගතියක් වාර්තා කර නොතිබුණි.

	නම් රාජ්‍ය ආයතන සඳහා උපදේශන සේවාව ප්‍රදානය කිරීමට හැකියාව තිබියදීත් සභාපති විසින් ප්‍රසම්පාදන මණ්ඩලයේ ආවරණ අනුමැතියට යටත්ව වාස්තු විද්‍යාඥ කටයුතු වල නියුතු පුද්ගලයකු වෙත මුළු ඉදිකිරීමේ පිරිවැයෙන් සියයට 5ක් ගෙවීමට යටත්ව කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි.			කටයුතු කර සැලසුම හා ඇස්තමේන්තුව සකස් කිරීමට එම ආයතනය වෙත කොන්ත්‍රාත්තුව ප්‍රදානය කළ බව.	
34	කිසියම් ලංසුවක වලංගු හා ප්‍රතිචාරාත්මකභාවය පිළිගනු ලැබීමට අවශ්‍ය වන්නා වූ කොන්දේසි ලංසු කැඳවීමේ ලේඛනවල පැහැදිලිව නිශ්චය කිරීමට තාක්ෂණික හා මූල්‍ය යෝජනා සඳහා සම්මත ලේඛන ලබා දිය යුතු නමුත් අන්තර්ජාතික වෛද්‍ය කලාපය සඳහා උපදේශන සේවා සපයන ආයතන 11ක් වෙත මිල ගණන් කැඳවීමේ දැන්වීම පමණක් යොමු කර මිල ගණන් කැඳවා තිබුණි. ඒ අනුව උපදේශක ආයතන 04ක් ලංසු ඉදිරිපත් කර තිබුණු අතර උක්ත මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2 මාර්ගෝපදේශය	2022	ප්‍රසම්පාදන ක්‍රියාවලිය මඟින් ඇගයීමේ සහ තේරීමේ කාර්යය පටිපාටියේ විනිවිදභාවය සහ නිත්‍යභාවය සහතික විය යුතුය .	උපදේශන ආයතන 11ක් වෙතින් සේවා ගාස්තු කැඳවා ඉදිරිපත් වූ මිල ගණන් 4ක් තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත ඉදිරිපත් කරන ලද බව. මෙම මිල ගණන් කැඳවීමේදී සංකල්ප පත්‍රිකාවට ඇතුලත් කරන ලද ව්‍යාපෘති කාර්යයන් පිළිබඳව තොරතුරු අදාල දැන්වීමේ ඇතුලත් කරන ලද අතර වැඩිදුර තොරතුරු විමසීම් කළ ආයතන වෙත ඒ සම්බන්ධ තොරතුරු හා ස්ථානීය පරීක්ෂාවන් සිදු කිරීමටද අවස්ථාව ලබා දෙන ලද බව.	සෞඛ්‍ය අමාත්‍යාංශයේ විගණනය හා කළමනාකරණ කමිටුව විසින් මේ සම්බන්ධව පරීක්ෂා කර වාර්තා කිරීමට අමාත්‍යාංශ විමර්ශන අංශයට පවරා ඇත. 2024 ඔක්තෝබර් 15 දින වන විටද කිසිදු ප්‍රගතියක් වාර්තා කර නොතිබුණි.

	ප්‍රකාරව දිනුම් ලංසුව තෝරා ගැනීම සඳහා සාධාරණ උපමානයන් සහ ක්‍රමවේදයන් විභව ලංසු කරුවන් වෙත සංනිවේදනය කිරිමට කටයුතු නොකර තාක්ෂණික ඇගයිම් කමිටුව විසින් තම අභිමතය පරිදි තීරණ කළ ලංසු ඇගයීමේ උපමානයන් 05ක් අනුව ලංසු ඇගයීම කර තිබුණි. ඒ අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලිය මඟින් සහතික වියයුතු ඇගයීමේ සහ තේරීමේ කාර්යය පටිපාටියේ විනිවිදභාවය සහ නිත්‍යභාවය සහතික වී නොතිබුණි.			
35	රු. මි. 100 ක් වූ 2022 අන්තර්ජාතික වෛද්‍ය කලාපයට අදාළ මුළු ව්‍යාපෘති පිරිවැයෙන් රු.මි. 40ක් භාණ්ඩාගාර ප්‍රතිපාදනවලින්ද රු.මිලියන 60ක් සංස්ථාවෙන්ද දැරීමට යෝජනා කර තිබුණද, ඒ සඳහා මහා භාණ්ඩාගාර අනුමැතිය හා ප්‍රතිපාදන ලබා දී නොතිබුණු අතර සංස්ථා දායකත්වය සඳහාද මුදල් වෙන්කර නොතිබුණි. 2023 සැප්තැම්බර් 30 දින වන විටත් වැඩ ආරම්භ කිරීමට කිසිදු සූදානමක් නොතිබුණු	අනුමැතිය හා ප්‍රතිපාදන නොමැතිව වියදම් දැරීම සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් සුදුසු පියවර ගත යුතුය.	ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවට ව්‍යාපෘති ඉදිරිපත් කිරීමේ ආකෘතියට අනුව ව්‍යාපෘති වාර්තාව සකස්කර රාජ්‍ය අමාත්‍යාංශය විසින් නිර්දේශ කර මහා භාණ්ඩාගාරය වෙත යොමුකර ඒ පිළිබඳව සාකච්ඡා කළද අදාළ ප්‍රතිපාදන නොලැබුණු බව. ඉදිකිරීමේ පිරිවැය රුපියල් මිලියන 100ක් හා අනෙකුත් පිරිවැයද ඇතුළත් කර 2023 වර්ෂය සඳහා ප්‍රාග්ධන අයවැය යෝජනාවක් ඉදිරිපත් කළද අනුමැතිය හෝ	සෞඛ්‍ය අමාත්‍යාංශයේ විගණනය හා කළමනාකරණ කමිටුව විසින් මේ සම්බන්ධව පරික්ෂා කර වාර්තා කිරීමට අමාත්‍යාංශ විමර්ශන අංශයට පවරා ඇත. 2024 ඔක්තෝබර් 15 දින වන විටද කිසිදු ප්‍රගතියක් වාර්තා කර නොතිබුණි.

	මෙම ව්‍යාපෘතිය සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තුවක් හෝ පිළියෙල නොකර රජයේ උපදේශකයන් තෝරා ගැනීමේ හා සේවයේ යෙදවීමේ මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශයන්ට පටහැනිව අවිධිමත්ව සේවයේ යොදවාගත් සැලසුම් ශිල්පියකුට රු.මිලියන 02 ක් ගෙවා තිබුණි.			ප්‍රතිපාදන ලබාදී නොමැති බව හා 2024 වර්ෂයේ ප්‍රාග්ධන අයවැය යෝජනා යටතේද මෙම ව්‍යාපෘතිය ඉදිරිපත් කර ඇති බව.	
36	පිළිගත් ආයතනයක් වෙත යොමුකර ප්‍රමිතිය සම්බන්ධයෙන්වූ රසායනාගාර පරීක්ෂණ වාර්තා ලබා ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂයේ පෙබරවාරි මස රු.2,840,000ක්වූ රසදිය (අශුද්ධ) කිලෝග්‍රෑම්100ක් මිලදී ගෙන තිබුණි.	2022	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශ 5.6.3 ප්‍රකාරව කටයුතු කළ යුතුය.	රසදිය ලබා ගැනීමේදී මෙම සංස්ථාව විසින් වෛද්‍යවරුන්ගේ නිර්දේශ මත පමණක් පදනම්ව මිලදී ගැනීම සිදු වන බව. රසදිය සම්බන්ධ රසායනාගාර පරීක්ෂාව සංකීර්ණ ක්‍රියාවලියක් බැවින් ඒ සඳහා සංස්ථාවේ අදාළ රසායනාගාර පහසුකම් නොමැති බව.	වෛද්‍ය නිර්දේශ පමණක් සැලකිල්ලට ගන්නා අතර 2024 ඔක්තෝබර් 15 දින වන විටද රසදිය මිලදී ගැනිමේදී රසායනාගාර පරීක්ෂණ වාර්තා සැලකිල්ලට නොගනී.
37	රසායනාගාර පරීක්ෂණ වාර්තා අනුව ප්‍රමිතියෙන් බැහැර බවට තීරණය වීමෙන් පසුව සංස්ථාවේ ආයුර්වේද වෛද්‍යවරයකුගේ නිර්දේශයක් ලබාගෙන සමාලෝචිත වර්ෂයේ ජනවාරි, පෙබරවාරි හා මාර්තු යන මාස වල	2022	ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් ඇගයීමේ සහ තේරීමේ කාර්යය පටිපාටියේ විනිවිධභාවය සහ නිත්‍යභාවය සහතික විය යුතුය.	මීපැණි, තෙල් වර්ග මිලදී ගැනීමට අදාල සැපයුම්කරුවන් මිල ගණන් ඉදිරිපත් කිරීමේදී නියැදි ලබා ගෙන එම නියැදි රසායනාගාරය වෙත යොමුකර වාර්තා ලබා ගැනීමටත් වෛද්‍යවරුන් වෙත යොමුකර වර්ණය, සුවඳ ආදී ඔවුන්	මේ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණක් සිදු කර අදාල නිලධාරීන්ට එරෙහිව විනයානුකූලව කටයුතු කිරීම සහ බාහිර බලපෑම් වලින් තොරව ස්වාධීන

	රු.1,462,500 කට මී පැණි කිලෝග්‍රෑම් 1500ක්, රු.3,784,500කට තල තෙල් කිලෝග්‍රෑම් 15,036ක් හා රු.2,810,475කට මී තෙල් කිලෝග්‍රෑම් 3,507ක් මිලදී ගෙන තිබුණි.			විසින් සැලකිල්ලට භාජනය කරනු ලබන වෙනත් කරුණු ද සැලකිල්ලට ගෙන වෛද්‍යවරුන්ගේ වාර්තා ලබා ගැනීමටත් කටයුතු කරන බව. මීපැණි හා තෙල් වර්ග ආදී දියරමය ස්වාභාවයේ අමුද්‍රව්‍ය වලට අදාලව රසායනාගාර වාර්තා සහ වෛද්‍යවරුන්ගේ වාර්තා සැසඳීමක් සිදු නොවන අවස්ථා පවතී. එවැනි අවස්ථා වලදී දෙපාර්ශවය විසින් සාකච්ඡා කර අමුද්‍රව්‍ය ගුණත්වය හා නිෂ්පාදන කටයුතු සඳහා පවත්නා අමුද්‍රව්‍ය අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන වෛද්‍යවරුන්ගේ නිර්දේශය මත අදාල මිලදී ගැනීම සිදු කිරීමට කටයුතු කරන අවස්ථා පවතින බව.	රසායනාගාර පරීක්ෂණ වාර්තා පදනම් කර ගනිමින් දියර වර්ග මිලදී ගැනීම සිදු කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි.
38	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1702/5 හා 2011 අප්‍රේල් 20 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ 05 වන උපලේඛනය ප්‍රකාරව, ආයුර්වේද කොමසාරිස් නිකුත් කරන සහතිකයක් මත ආයුර්වේද සංස්ථාවට පමණක් රේගු තීරුබදු නිදහස් ආනයන	2021	ඖෂධ නිෂ්පාදනය සඳහා සාපේක්ෂව අඩු පිරිවැයක් යටතේ තත්ත්වයෙන් උසස් අමුද්‍රව්‍ය සපයාගැනීමට සෑම අවස්ථාවකදීම උත්සාහ දැරිය යුතුය.	මේ වන විට ආනයනික වියළි සහ රස ඖෂධ හා තෙල් වර්ග සෘජුව ආනයනය කිරීමට කටයුතු කරමින් සිටින බව, විදේශ විනිමය ගැටළු සහ සැපයුම්කරුවන්ගේ ගෙවීම් කොන්දේසි හේතුවෙන් ගැටළුකාරී තත්ත්වයක් මතුව	මේ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රමාණවත් අවධානයක් යොමුකර නොතිබුණු අතර අක්‍රමිකතාව සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරින් හඳුනා ගෙන ඉදිරි

	යටතේ සංස්ථා නිෂ්පාදන සඳහා තලතෙල් ඇතුළු ඔසු අමුද්‍රව්‍ය කිහිපයක් සෘජුව ආනයනය කිරීමට හැකියාව තිබුණු නමුත් එසේ කටයුතු නොකර තලතෙල් ආනයනය කර සැපයීම් කරන පෞද්ගලික සැපයුම්කරුවන්ගෙන් සාපේක්ෂව වැඩි මිලට තලතෙල් මිලදී ගෙන තිබුණි. ඒ අනුව 2018 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුළදී සංස්ථාව රු.153,353,412 ක තලතෙල් මිලදී ගෙන තිබුණි.			ඇති බව, කඩිනම් අවශ්‍යතාවය සලකා දේශීය වෙළඳපලින් තරඟකාරී මිල ගණන් යටතේ මිලදීගැනීමට සිදුවන අවස්ථාද පවතින බව හා තලතෙල් ආනයනය කිරීම පිළිබඳව විශේෂ අවධානය යොමුකර කටයුතු කරන බව	ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි.
39	සමාලෝචිත වර්ෂය සඳහා තලතෙල් සැපයුම්කරුවන් 20 දෙනෙකුගෙන් මිල ගණන් කැඳවූ බවට සටහන් යොදා තිබුණු නමුත් ඒ බව සනාථ කළ හැකි ලිඛිත සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි. 2020 වර්ෂයේ අවස්ථා 04 කදී මිල ගණන් කැඳවා සැපයුම්කරුවන් 03 දෙනෙකුගෙන් විවිධ මිල ගණන් 05 ක් යටතේ රු.35,277,148 කට තලතෙල් කිලෝ ග්‍රෑම් 71,660.5 ක්ද 2021 වර්ෂයේ අවස්ථා	2021	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශයන්ට අනුකූලව කටයුතු කළ යුතුය.	අදහස් ඉදිරිපත් කර නොතිබුණි.	මේ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රමාණවත් අවධානයක් යොමුකර නොතිබුණු අතර අක්‍රමිකතාව සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන් හඳුනා ගෙන ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි.

03 කදී මිල ගණන් කැඳවා සැපයුම්කරුවන් 02 දෙනෙකුගෙන් විවිධ මිල ගණන් 05 ක් යටතේ රු.58,458,394 කට තලතෙල් කිලෝ ග්‍රෑම් 86,590.5 ක්ද මිලදී ගෙන තිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලට පටහැනිව විධිමත් පරිදි ප්‍රතිග්‍රහන ලිපි නිකුත් නොකිරීම, කාර්යය සාධන ඇප මුදල් ලබා නොගැනීම හා කිසිදු සැපයුම්කරුවකු සමඟ ගිවිසුමකට එළඹ නොතිබීම වැනි අවිධිමත් ප්‍රසම්පාදන ක්‍රමවේදයන් යටතේ එම මිලදී ගැනීම් සිදුකර තිබුණි. සැපයුම්කරුවන් සමඟ විධිමත් ගිවිසුම්වලට එළඹ නොතිබීමෙන් එකඟ වූ පරිදි තොග නොසැපයීම, තොග ප්‍රමාදය, සැපයීම පැහැර හැරීම හා මිල වැඩි කිරීම යනාදී හේතූන් මත අවස්ථා කිහිපයකදීම නිෂ්පාදනය ප්රමාදවීම හා ඇනහිටීම සිදුව තිබුණු නමුත් අදාළ සැපයුම්කරුවන්ට එරෙහිව නීත්‍යානුකූලව කටයුතු කිරීමට සංස්ථාවට නොහැකිව තිබුණු

	අතර අසාදු ලේඛනගත කළ යුතු එවැනි සැපයුම්කරුවන් වෙත නැවත ටෙන්ඩර් ප්‍රදානය කර තිබුණි.				
40	ලංසු විවෘත කිරීමේ කමිටුව ප්‍රසම්පාදන කමිටුව විසින් විධිමත්ව පත්කර නොතිබීම, නියමිත වේලාව පසුවී ටෙන්ඩරය විවෘත කර තිබීම, නියමිත වේලාවෙන් පසුව ලැබුණු ටෙන්ඩර් අයදුම්පත් 05 ක් භාරගැනීම, විධිමත්ව ලංසු විවෘත කිරීමේ වාර්තා පවත්වා නොතිබීම, සැපයුම්කරුවන් 04 දෙනෙකුගෙන් ප්‍රමාණවත් ලංසු සුරක්ෂණ ලබාගෙන නොතිබීම, අසම්පූර්ණ ලංසු අයදුම්පත් ඉදිරිපත් කර තිබුණු සැපයුම්කරුවෙකුට කාර්යයසාධන ඇපකරයද නොමැතිව කොන්ත්‍රාත්ත් වටිනාකම රු.2,511,343 ක් වූ ටෙන්ඩර් ප්‍රදානය කර තිබීම, සැපයුම්කරුවන් තිදෙනෙකුගෙන් ප්‍රමාදවී කාර්යයසාධන ඇපකර ලබා ගෙන තිබීම, ටෙන්ඩර් වටිනාකම් සම්බන්ධයෙන්	2021	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශයන්ට අනුකූලව කටයුතු කළ යුතුය.	විධිමත් ලෙස මිල ගණන් විවෘත කරන බව, ඉදිරියේදී විධිමත්ව ලංසු විවෘත කිරීමේ කමිටු පත්කරන බව, ලංසු විවෘත කිරීමේ ලේඛන විධිමත්ව පවත්වාගෙන යන බව, ටෙන්ඩර් විවෘත කිරීමට නියමිත දිනය විශේෂිත නිවාඩු දිනයක්වීම හෝ වෙනත් හේතුවක් නිසා ටෙන්ඩර් පෙට්ටිය නියමිත වේලාවට මුද්‍රාතබා ඉදිරි ආසන්නතම දිනකදී විවෘත කළ අවස්ථා කිහිපයක් පැවති බව, කොවිඩ් 19 වසංගත තත්ත්වය හා ආර්ථික අර්බුදය හේතුවෙන් ප්‍රසම්පාදන කටයුතු වඩාත් නම්‍යශීලීව කිරීමට සිදුවූ බව, සැපයුම්කරුවන්ගේ ඉල්ලීම හා ප්‍රසම්පාදන මණ්ඩල අනුමැතිය සහිතව ලංසු සුරක්ෂණ හා කාර්යසාධන ඇපකර ප්‍රමාදවී ලබාගැනීමට හෝ එම ඇපකර ලබානොගෙන අත්‍යාවශ්‍ය ඖෂධ	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලට අනුකූලව ඉදිරියේදී කටයුතු කරන බවට එකඟ වී ඇති නමුත් මෙම අක්‍රමිකතා වලට සම්බන්ධ නිලධාරින් සම්බන්ධයෙන් පරික්ෂා කර ඉදිරි කටයුතු සිදුකර නොතිබුණි.

	සැපයුම්කරුවන් සමඟ විධිමත් ගිවිසුම් අත්සන් කර නොතිබීම යන අඩුපාඩු පැවති බව වැඩපත් වර්ග 28 කට අදාළ අමු ඖෂධ මිලදී ගැනීමට අදාළ රු.22,268,024 ක් වූ ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් සිදුකළ විගණන පරීක්ෂණයේදී නිරීක්ෂණය විය. තවද විෂය විශේෂඥයින් විසින් පිළියෙළ කරන පිරිවැය ඇස්තමේන්තුවක් පදනම් කර ගෙන මිල ගණන් සැසඳීමක් සිදුකරමින් මිල ගණන් ඇගයීම් කර නොතිබීම හා වැඩපත්වල අඩංගු ඖෂධ වර්ගවල කේවල මිල ගණන් අනුව ඇගයීම් නොකර වැඩපතේ මිල එකතුව ඉකුත් වර්ෂය සමඟ සසඳා තාක්ෂණික ඇගැයීම් කමිටුව විසින් ඇගයීම් කර තිබීම හේතුවෙන් ඇතැම් වැඩපත්වල ඖෂධ සැපයුම් මිල ගණන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 25 සිට සියයට 118 දක්වා වැඩිවී තිබුණු බවද නිරීක්ෂණය විය.			අමුද්‍රව්‍ය මිලදී ගැනීමට සිදුවූ බව, වැඩි වටිනාකම් සහිත ප්‍රසම්පාදන කටයුතු වලදී හැකි සෑම අවස්ථාවකදීම ගිවිසුම්ගත වීමට කටයුතු කර ඇති බව, වැඩපත් සඳහා මිලගණන් කැඳවීමේදී ඖෂධ අමුද්‍රව්‍ය වෙන් වෙන් වශයෙන් මිල ගණන් කැඳවීම ප්‍රායෝගික නොවන බව, සියලු අමුද්‍රව්‍ය එකම සැපයුම්කරුවකු වෙතින් මිලදී ගැනීම නිෂ්පාදන ක්‍රියාවලියට පහසුවක් බව හා ප්‍රවාහන හා සැපයුම් ගැටළු නිසා ඖෂධ අමුද්‍රව්‍යවල මිල වැඩිවූ බව.	
41	විවිධ සම්බන්ධතා මත පූර්ව නිශ්චිත පුද්ගලයින් තනතුරුවලට පත් කර	2023, 2022, 2021	සියළුම පත්කිරීම් අදාළ බඳවා ගැනීමේ පටිපාටිවලට අනුකූලව හා	පූර්ව නිශ්චිත පුද්ගලයන් තනතුරට බඳවාගැනීමක් හෝ සම්මුඛ පරීක්ෂණ	2024 ඔක්තෝබර් 15 දින වන විටද තත්ත්වය සතුටුදායක

ගැනීම සඳහා බඳවා ගැනීමේ පටිපාටි සහ සම්මුඛ පරීක්ෂණ පරිසරය වෙනස් කිරීම, ඇතැම් තනතුරුවලට බඳවා ගැනීමෙන් පසු වෙනත් තනතුරුවලට පත්කිරීම් සිදු කිරීම, ඒ ඒ තනතුරුවලට අයත් රාජකාරි සඳහා ධූරාවලිය නොසලකා වගකීම් පැවරීම හෝ නොපැවරීම සම්බන්ධ තීරණ ගෙන තිබීම, කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නොපවත්වා ශ්‍රේණි උසස්වීම් හා වැටුප් වර්ධක ලබාදීම යනාදී වූ අඩුපාඩු සංස්ථාවේ මානව සම්පත් කළමනාකරණය සම්බන්ධයෙන් පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය විය.	විනිවිදභාවය ආරක්ෂා වන පදිරි සිදු කළ යුතුය. නියමිත කාලසීමාවන් තුළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පැවැත්වීමටත්, නියමිත පටිපාටි අනුව පමණක් උසස්වීම් ලබා දීමටත්, නිසි පරිදි තනතුරුවලට අදාළ වගකීම් හා බලතල පැවරීමටත් කටයුතු කළ යුතුය.	පරිසරයන් වෙනස් කිරීමක් සිදුකර නොමැති බව, ප්‍රාථමික සේවා ගණයන්ට බඳවාගෙන තිබුණු ඇතැම් සේවකයන් කළමනාකරණ සහකාර තනතුරුවලට අදාළ රාජකාරිමය කටයුතුවල යොදවා තිබුණු අවස්ථා පැවති බව, මේ වන විට එම සේවකයින් නිත්‍ය තනතුරේ රාජකාරි සඳහා පමණක් සේවයේ යොදවා ඇති බව හා කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පැවැත්වීම සම්බන්ධයෙන් අවසාන තීරණයන් ගෙන ඇති බව.	නොවූ බව නිරීක්ෂණය විය.

3.99 ජාතික ඖෂධ නියාමන අධිකාරිය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	3,904,362,748	789,356,922	3,059,005,826	1,125,414,862	තත්ත්වාගණනය කළ
2022	5,402,138,719	833,453,068	4,568,685,651	1,506,907,036	අහිතකර
2023	7,582,842,607	1,835,076,369	5,747,766,238	2,934,279,641	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	විගණන වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	අධිකාරිය විසින් වසර 08කට අධික කාලයක සිට භාවිතා කරන සෞඛ්‍ය අමාත්‍යාංශය සතු සිව්මහල් කාර්යාල ගොඩනැගිල්ල, ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාර ගොඩනැගිල්ල සහ එම ඉඩම සහ වාහන 06 ක් ද, ජනාධිපති ලේකම් කාර්යාලය වෙතින් පවරා ගන්නා ලද තවත් වාහන 03 ක් ද, තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.	2021 2022 2023	සියළු වත්කම් පවරා ගෙන තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය.	තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීමක් සිදුකර ඇති බව.	වත්කම් පවරාගෙන ගිණුම්ගත කර නොතිබුණි.
2	2017 ජුනි 28 දිනැති අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව	2021 2022 2023	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.	මෙම කටයුතු සම්බන්ධීකරණය සඳහා නිලධාරීන් පත්කර ඇති බව.	චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

	සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම තම ආයතනය යටතේ වන සියලුම වත්කම් පිළිබඳව නිවැරදිව තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළයුතු වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි.				
3	අධිකාරිය පිහිට වූ 2015 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වාම වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර නොතිබුණු අතර 2022 වර්ෂය වෙනුවෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය ආරම්භ කර තිබුණ ද එය සම්පූර්ණ කර නොතිබුණි. 2023 වර්ෂය සඳහා ද වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි.	2021 2022 2023	මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.	කඩිනමින් භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කරන බව.	භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කර නොතිබුණි.
4	අධිකාරිය විසින් 2021 සිට 2023 වර්ෂය දක්වා පිළිවෙලින් පොත් අගය ශූන්‍ය වූ පිරිවැය රු.7,233,052 ක් වූ වත්කම් අයිතම 187 ක්ද, රු.33,242,530 ක් වූ අයිතම 297 ක්ද, රු.40,425,110 ක් වූ වත්කම් අයිතම 339 ක්ද තව දුරටත් භාවිතා කරමින්	2021 2022 2023	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව කටයුතු කළ යුතුය.	වත්කම් හඳුනා ගැනීමට කටයුතු කරමින් පවතින බව.	ඵලදායී ජීවකාලය සමාලෝචනය කර නොතිබුණි.

	පැවතුණි.				
5	අධිකාරියේ දත්ත පද්ධතිය ස්වයංක්‍රීයකරණය කිරීමේ කොන්ත්‍රාත්තුව රු.මිලියන 29 කට වර්ෂ 05 ක කාලයක් සඳහා පෞද්ගලික සමාගමක් වෙත ප්‍රදානය කර තිබුණු අතර ඒ සඳහා රු.12,253,328 ක් ගෙවා තිබුණි. නමුත් අදාළ පෞද්ගලික සමාගමේ නොසැලකිල්ලෙන් හෝ හිතාමතා මෙම දත්ත පද්ධතියට ඇතුළත් කර තිබුණු ඇතැම් තොරතුරු මකා දමා තිබුණු අතර අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ විමර්ශන කටයුතු අවසන් වන තෙක් මෙම සේවාව අක්‍රීය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පත්කළ විශේෂඥ කමිටුව විසින් ඉදිරිපත් කරන ලද වාර්තාව මගින් පද්ධතියෙන් මකා දමා තිබුණු දත්ත නැවත ස්ථාපනය කළ නොහැකි බව දන්වා තිබුණු අතර මෙම වාර්තාවේ දිනය වන තෙක් සිදු වූ පාඩුව අය කර	2021 2022 2023	සුදුසු තොරතුරු පද්ධතියක් කඩිනමින් ස්ථාපිත කළ යුතු අතර අදාළ සමාගම සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය.	අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව විසින් විමර්ශනයක් පවත්වන අතර එහි අවසන් වාර්තා ලැබීමෙන් පසු ඉදිරි කටයුතු කිරීමට නියමිත බව. දත්ත පද්ධතියක් සකස් කිරීම සඳහා ලෝක සෞඛ්‍ය සංවිධානය සමඟ සාකච්ඡා කරමින් පවතින බව.	අදාළ සමාගම සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

	ගැනීමට හෝ අදාළ සමාගමට විරුද්ධව ඉදිරි ක්‍රියාමාර්ගයන් ගැනීමට කටයුතු කර නොතිබුණි.				
6	ඖෂධ තොරතුරු ප්‍රතිසංස්කරණ දත්ත පද්ධතිය සකස් කිරීමේ (Revamping the Medicine Database) කොන්ත්‍රාත්තුව පෞද්ගලික ආයතනයක් වෙත ප්‍රදානය කර තිබුණ ද, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1(ආ) ප්‍රකාරව විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ නොතිබුණි. මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.12.2 ප්‍රකාරව වැඩ අවසන් කිරීම පිළිබඳ සහතිකයක් ලබා ගැනීමෙන් තොරව රු.4,774,752 ක් ගෙවා තිබුණ ද, මෙම වාර්තාවේ දිනය වන විටත් පද්ධතිය නිෂ්කාර්යව පැවතුණි.	2022 2023	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතු අතර කඩිනමින් පද්ධතියේ දෝෂ සකස් කර භාවිතයට ගත යුතුය.	පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා අත්‍යවශ්‍ය අවම අවශ්‍යතා හඳුනාගෙන අදාළ ආයතන වෙත දැනුම් දීමට කටයුතු කර ඇති බව.	දත්ත පද්ධතිය නිෂ්කාර්යව පැවතුණි.
7	2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරී පනතේ 30(1) හා 31(1) උපවගන්ති ප්‍රකාරව ජාතික උපදේශන කමිටුව පිහිටුවා නොතිබුණි.	2023	පනතේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.	ඉදිරියේදී මේ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කරන බව.	ජාතික උපදේශන කමිටුව මෙතෙක් පිහිටුවා නොතිබුණි.

8	පනතේ 72(1) හා 93(1) උප වගන්ති ප්‍රකාරව, වෛද්‍ය උපකරණ හා සීමාස්ථ නිෂ්පාදන ඇගයීම සඳහා අධිකාරිය විසින් එම ඇගයීම් කමිටු වෙත පොදු මාර්ගෝපදේශ නිකුත් කළයුතු වුවද එවැනි මාර්ගෝපදේශ පිළියෙල කර නොතිබුණි.	2021 2022 2023	පනතේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.	වෛද්‍ය උපකරණ මාර්ගෝපදේශ වෛද්‍ය උපකරණ ඇගයීම කමිටුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇති බව.	ඇගයීම් කමිටු වෙත පොදු මාර්ගෝපදේශ නිකුත් කර නොතිබුණි.
9	පනතේ 69(1)(ආ)(v) උප වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ ඔහුගේ නාමිකයෙකු වෛද්‍ය උපකරණ ඇගයීම් කමිටුවට පත් කර නොතිබුණි. එබැවින් වෛද්‍ය උපකරණද ඇතුළුව විකිරණශීලී උපකරණ හා ද්‍රව්‍ය ආනයනය හා භාවිතය සම්බන්ධයෙන් බලපත්‍ර නිකුත් කිරීම හා නියාමනය පිළිබඳ බලතල හිමි ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව විසින් වෛද්‍ය උපකරණ ඇගයීම් කමිටුව නියෝජනය කිරීමේ අවශ්‍යතාවය ඉටුවී නොතිබුණි.	2021 2022 2023	පනතේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.	ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව වෙත දන්වමින් ලිපි යොමුකර ඇති බව.	පරමාණුක බලශක්ති නියාමන සභාවේ නාමිකයෙකු වෛද්‍ය උපකරණ ඇගයීම් කමිටුවට පත් කර නොතිබුණි.

10	පනතේ 58, 59, 82 , 83 හා 109 වගන්ති ප්‍රකාරව යම් ඖෂධයක් හෝ වෛද්‍ය උපකරණයක් අධිකාරියේ ලියාපදිංචි නොකර හා අධිකාරියෙන් බලපත්‍රයක් ලබා නොගෙන නිෂ්පාදනය කිරීම හෝ ආනයනය කිරීම නොකළ යුතු අතර ජීවිතයක් බේරාගැනීමට, බෝවන රෝග හෝ වසංගත රෝගයක් පැතිරීම වැළැක්වීමට, ජාතික අවශ්‍යතාවයක් හා ජාතික ආරක්ෂාව වැනි විශේෂිත අවස්ථාවලදී පමණක් ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි නිකුත් කිරීමට අධිකාරිය වෙත බලය ලැබී තිබුණි. නමුත් එවැනි තත්ත්වයන් යටතට නොවැටෙන, ලියාපදිංචිය අවලංගුවීම, ලියාපදිංචි සැපයුම්කරුවන් නොසිටීම වැනි හේතු මත රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව හා පෞද්ගලික ආයතන වෙනුවෙන් ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි නිකුත් කර තිබුණි.	2021 2022 2023	පනතේ සඳහන් විශේෂ අවස්ථාවලදී පමණක් ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි නිකුත් කිරීම තුළින් තත්ත්වය පිළිබඳ තහවුරුවක් නොමැති ඖෂධ රට තුළට ඇතුල්වීම අවම කරගත යුතුය.	WOR කමිටු නිර්දේශය මත පමණක් අත්‍යවශ්‍ය අවස්ථාවලදී පමණක් ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි නිකුත් කරන බව.	තත්ත්වය පිළිබඳ තහවුරුවක් නොමැති ඖෂධ රට තුළට ඇතුල්වීමේ අවධානමක් පවතී.
11	පනතේ 123 වගන්තිය ප්‍රකාරව, අධිකාරිය වෙත ඉදිරිපත් කරන	2021 2022 2023	පනතේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු	සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ඉදිරියේදී පත්	අභියාචනා කමිටුව ස්ථාපිත කර නොතිබුණි.

	අභියාචනා අසා තීරණය කිරීම සඳහා අභියාචනා කමිටුවක් ස්ථාපිත කර නොතිබුණි.		කළ යුතුය.	කිරීමට කටයුතු කරන බව.	
12	පනතේ 83(4) (ආ) හා 102(4)(ආ) උප වගන්ති ප්‍රකාරව ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කරනු ලබන වෛද්‍ය උපකරණ හා සීමාස්ථ නිෂ්පාදනවල තත්ත්වය පරීක්ෂා කිරීම සඳහා ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරය වෙත ඉදිරිපත් කර නොතිබුණි.	2022 2023	පනතේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.	සියලුම ඖෂධවල තත්ත්වය පරීක්ෂා කිරීම ප්‍රායෝගිකව අපහසු බැවින් අවශ්‍ය සංශෝධන මේ වන විට පනත් සංශෝධන කමිටුව වෙත ලබා දී ඇති බව.	පනත සංශෝධනය කර නොතිබුණි.
13	ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරය විසින් පර්යේෂණාගාරයේ ප්‍රමිතිය සම්බන්ධයෙන් අනුකූලතා තක්සේරු පිළිබඳ සහතිකය ලබාගැනීම සඳහා ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය වෙත 2020 පෙබරවාරි 06 දින අයදුම්පතක් ඉදිරිපත් කර තිබුණු නමුත් මෙම වාර්තාවේ දින වන විටත් එම ප්‍රමිති සහතිකය ලබාගැනීමට අපොහොසත්වී තිබුණි.	2021 2022	සහතිකය ලබාගැනීම සඳහා අවශ්‍ය මූලික අවශ්‍යතා සපයා ගැනීමට උපරිම උත්සාහයක් ගත යුතුය.	සහතිකය ලබාගැනීම සඳහා අවශ්‍ය මූලික අවශ්‍යතා තවමත් පරීක්ෂණාගාරයෙහි නොමැති බැවින් මෙම සහතිකය ලබා ගැනීම ප්‍රමාදවී ඇති බව.	ප්‍රමිති සහතිකය ලබාගෙන නොතිබුණි.

14	ජාතික ඖෂධ නියාමන අධිකාරී පනත බලාත්මක වීමත් සමඟ එතෙක් ශ්‍රී ලංකාව තුළ ඖෂධ, උපකරණ හා විලවුන් නියාමනය සම්බන්ධයෙන් බලාත්මකව පැවති 1980 අංක 27 දරන විලවුන්, උපකරණ සහ ඖෂධ පනත බලරහිත විය. මෙම පනත ඉවත් කර මේ වන විට වසර 09 ක කාලයක් ගත වී තිබුණ ද විලවුන් නියාමනය පිළිබඳ නව පනතක් සකස් කර සම්මත කර ගැනීමට හෝ අධිකාරි පනත අවශ්‍ය පරිදි සංශෝධනය කර ගැනීමට අපොහොසත් වී තිබුණි.	2023	විලවුන් නියාමනය පිළිබඳ නව පනතක් සකස් කර සම්මත කර ගැනීමට හෝ අධිකාරි පනත අවශ්‍ය පරිදි සංශෝධනය කර ගැනීමට කටයුතු කළ යුතුය.	කැබිනට් අනුමැතිය මත එහි බලතල සීමාකාරීව භාවිතා කරමින් විලවුන් නියාමන කටයුතු සිදු කරන බව. අධිකාරී පනතට විලවුන් ඇතුළත් කර පනත සංශෝධනය කිරීමේ කටයුතු සිදු කරමින් පවතින බව.	විලවුන් නියාමනය පිළිබඳ නව පනතක් සකස් කර සම්මත කර හෝ අධිකාරී පනත අවශ්‍ය පරිදි සංශෝධනය කර නොතිබුණි.
15	ආයතන සංග්‍රහයේ VIII පරිච්ඡේදයේ 4.1 ඡේදය ප්‍රකාරව මාණ්ඩලික නිලධාරීන් සඳහා අතිකාල දීමනා හිමි නොවුණද, 2021 වර්ෂයේදී මාණ්ඩලික නිලධාරීන් 26 දෙනෙකු වෙත අතිකාල දීමනා ලෙස රු.1,977,619 ක්ද 2023 වර්ෂයේදී මාණ්ඩලික නිලධාරීන් 36 දෙනෙකු වෙත රු.646,694 ක් ද ගෙවා තිබුණි.	2021 2023	භාණ්ඩාගාර/ අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගත යුතුය.	අධිකාරියේ කටයුතු අවම සේවක මණ්ඩලයක් යටතේ ඉටු කරවා ගැනීමට සිදු වීම නිසා මෙම ගෙවීම් සිදු කරන ලද බව දන්වා ඇති අතර වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	අදාළ අනුමැතීන් ලබාගෙන නොතිබුණි.

16	2022 දෙසැම්බර් 21 දිනැති අංක PED-08/2022 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව ඉතිරි කර ගත් නිවාඩු සඳහා දීමනා ලබා ගැනීමට හිමිකම් නොවූවද, 2022 සහ 2023 වර්ෂ සඳහා රු.8,129,017 ක් නිවාඩු දීමනා ලෙස ගෙවා තිබුණි.	2023	භාණ්ඩාගාර/ අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගත යුතුය.	උපයෝජනය නොකරන ලද විවේක නිවාඩු පදනම් කර ගනිමින් ගෙවීමක් ලබා දීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරන ලද බව දන්වා ඇති අතර වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	අදාළ අනුමැතීන් ලබාගෙන නොතිබුණි.
17	2022 අප්‍රේල් 26 දිනැති අංක 03/2022 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 02 ඡේදයට පටහැනිව අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව විශේෂ දීමනා හා පැමිණීමේ දීමනා ලෙස එකතුව රු.24,532,653 ක් ගෙවා තිබුණි.	2022 2023	භාණ්ඩාගාර/ අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගත යුතුය.	වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	අදාළ අනුමැතීන් ලබාගෙන නොතිබුණි.
18	2021 හා 2022 වර්ෂයන්හිදී පිළිවෙලින් අවස්ථා 18 කදී හා 80 කදී නිලධාරීන්ගේ අතපසුවීම් හා වෙනත් විවිධ හේතු මත එකතුව රු.7,224,180 ක ආදායම් ආපසු ගෙවා තිබුණි. මෙම තත්ත්වය වර්ෂ කිහිපයක සිට පැවති නමුත් අවම කර ගැනීම සඳහා ප්‍රමාණවත් පියවර	2021 2022	ආදායම් ආපසු ගෙවීම් අවස්ථා අවම කර ගැනීමට කටයුතු කළ යුතුය.	මේ සම්බන්ධයෙන් කමිටු නිර්දේශයක් මත ගෙවීම් කිරීමට කටයුතු කරමින් පවතී.	ආදායම් ආපසු ගෙවීමට සිදුවන අවස්ථා නිරීක්ෂණය වී තිබුණි.

ගෙන නොතිබුණි.

19	2020 සිට 2022 වර්ෂය දක්වා අධිකාරියේ අනුමත තනතුරු සංඛ්‍යාව 257 ක් වූ අතර පුරප්පාඩු සංඛ්‍යාව 2020 වර්ෂයේදී 182 ක්ද 2021 හා 2022 වර්ෂයන්හීදී 135 ක්ද වූ අතර 2023 වර්ෂයේ අනුමත තනතුරු 269 න් පුරප්පාඩු සංඛ්‍යාව 98 ක් විය.	2021 2022 2023	විධිමත් අනුමැතියට යටත්ව පුරප්පාඩු කඩිනමින් පිරවීමට කටයුතු කළ යුතුය.	මේ වන විට රජය විසින් බඳවා ගැනීම් අත්හිටුවා ඇති බැවින් බඳවා ගැනීම් සඳහා අනුමැතීන් ලබා ගැනීමට කටයුතු සිදුකරන බව.	බඳවා ගැනීම් සිදුකර නොතිබුණි.
20	ජාතික විගණන පනතේ 40 වගන්තිය සහ 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මඟින් ප්‍රකාශිත රජය සතු ව්‍යවසායන් සඳහා වන මාර්ගෝපදේශයෙහි 4.4 ඡේදය ප්‍රකාරව අභ්‍යන්තර විගණකවරයකු පත් කිරීමට කටයුතු කර නොතිබුණි.	2021 2022 2023	විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.	බඳවා ගැනීමට අදාළ කටයුතු සිදු කෙරෙමින් පවතින බව.	අභ්‍යන්තර විගණකවරයකු පත් කර නොතිබුණි.

3.100 විජය කුමාරතුංග අනුස්මරණ රෝහල

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බද්දු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	371,859,895	185,148,769	186,711,126	7,397,213	තත්ත්වාගණනය කළ
2022	379,708,243	221,201,905	158,506,337	(6,647,614)	තත්ත්වාගණනය කළ
2023	374,616,302	237,997,127	136,619,175	(17,078,072)	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය හා යොමුව	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 2.1හා 2.2 සිට 2.6 දක්වා වූ වගන්ති කාර්ය මණ්ඩලයේ සෑම සේවයක හා ශ්‍රේණියක තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම්, තනතුරෙහි වැටුප් පරිමාණය, වයස් සීමාව සහ අදාළ අනෙකුත් විස්තර ඇතුළත්කර බඳවා ගැනීමේ පටිපාටි පිළියෙල කර ආයතන සංග්‍රහයේ දක්වා ඇති ක්‍රියා පිළිවෙල අනුගමනය කරමින් එකී පටිපාටි සඳහා අදාළ අනුමැතිය ලබා ගැනීමට කටයුතු	2021-2.2.2(ආ) 2022-2.2.2(ඇ) 2023-2.2.2(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධාන වලට අනුකූලව කටයුතු කළ යුතුය.	රෝහල් අධ්‍යක්ෂ තනතුර සඳහා වූ බඳවාගැනීමේ පටිපාටිය සකස් කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත්කර ඇති බව හා අනෙකුත් තනතුරු සඳහා බඳවාගැනීමේ පටිපාටි සකස්කිරීම වෙනුවෙන් උපදෙස් ලබාගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කරමින් සිටින බව.	2024 සැප්තැම්බර් 30 දින වන විටත් බඳවා ගැනීම් පටිපාටි පිළියෙල කර අනුමැතිය ලබාගෙන නොතිබුණි.

	කළයුතු වුවද, මේ දක්වාම බඳවා ගැනීම් පටිපාටි පිළියෙල කර අනුමැතිය ලබාගෙන නොතිබුණි.				
2	2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව සියළුම රාජ්‍ය ආයතනවල ඇඟිලි සළකුණු සටහන් කිරීමේ යන්ත්‍ර භාවිතය මඟින් නිලධාරීන් කාර්යාලයට පැමිණීම හා පිටවීම සනාථ කිරීම සම්බන්ධයෙන් වූ වාර්තා තබා ගත යුතු වුවද, රෝහලේ පැමිණීම පිටවීම සනාථ කිරීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කර නොතිබුණි.	2022-2.2.2(ඇ) 2023-2.2.2(ආ)	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවලට අනුකූලව කටයුතු කළ යුතුය.	රෝහලට සම්බන්ධ සියළුම වෘත්තීය සමිතිවලින් ඉදිරිපත් වී තිබුණු ඉල්ලීම් සලකා බැලීමෙන් පසු ඇඟිලි සළකුණු යන්ත්‍ර භාවිතය රෝහලට අවශ්‍ය නොවන බව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කර ඇති බව.	2024 සැප්තැම්බර් 30 දින වන විටත් මෙම තත්ත්වය නිවැරදි කර නොතිබුණි.
3	2007 ඖෂධ හා උපාංග ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.1 හා 2.2 මාර්ගෝපදේශ ප්‍රකාරව ඖෂධ හා වෛද්‍ය උපාංග මිලදීගැනීමේදී සියළුම ලංසුකරුවන් ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචිවීම අනිවාර්ය වුවත්, ඊට අනුකූල නොවන ලෙස ලංසු ලියවිලි සමඟ ලියාපදිංචිය ඉදිරිපත් නොකල හා	2023-2.2.4(අ)	ලියාපදිංචි සැපයුම්කරුවන් ගෙන් පමණක් ඖෂධ මිලදී ගැනීමට කටයුතු කළ යුතුය.	රෝහලේ ඉතා හදිසි ශල්‍ය කර්ම හා ශල්‍යාගාර සේවා අඛණ්ඩව පවත්වාගෙනයාම සඳහා රෝහලේ ලියාපදිංචි සැපයුම් ආයතන මගින් මිල ගණන් කැඳවනු ලබන බව, ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි සහතික ලැබීමට කල්ගතවන බව හා අදාල ලියාපදිංචිය ලැබුණු වහාම එය ඉදිරිපත්කරන බව	2024 සැප්තැම්බර් 30 දින වන විටත් මෙම තත්ත්වය නිවැරදි කර නොතිබුණි.

	ලියාපදිංචිය කල් ඉකුත්ව තිබුණු ලංසුකරුවන් වෙත අවස්ථා 09කදී වටිනාකම රු.5,928,038ක්වූ ලංසු ප්‍රදානය කර තිබුණු අතර මේ සම්බන්ධයෙන් තාක්ෂණික ඇගයීම් කමිටුවේ අවධානය යොමුවී නොතිබුණි.			දන්වා ඇති බව හා සැපයුම්කරුවන් මීට ඉහතදීද රෝහල වෙත සැපයුම් කර ඇති බැවින් සෙසු පිරිවිතර ගැලපීම සහ අවම මිල පමණක් සලකා මිළදී ගැනීම සිදුකල බව.	
4	2007 ඖෂධ හා උපාංග ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.2 මාර්ගෝපදේශය ප්‍රකාරව හදිසි හා අත්‍යාවශ්‍ය අවස්ථාවක හැර මිලදිගැනීම්වලදී තාක්ෂණික ඇගයීම් කමිටුව සෞඛ්‍ය අමාත්‍යාංශ නියෝජිතයෙකු, රාජ්‍ය ඖෂධ සංස්ථාවේ නියෝජිතයෙකු, අවම විශේෂඥතාවක් සහිත උපදේශකවරුන් දෙදෙනෙකු හා මහා භාණ්ඩාගාරයෙන් නම් කරන ලද නියෝජිතයෙකුගෙන් සමන්විත වියයුතු වුවද, අවස්ථා 10කදී රෝහල විසින් මිලදීගත් රු. 27,461,853ක්වූ ඖෂධ හා උපාංග සම්බන්ධයෙන් එවැනි නියෝජනයක් සහිත කමිටුවක් පත් කර නොතිබුණි.	2023-2.2.4(ආ)	ඖෂධ හා උපාංග ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලට අනුව කටයුතු කල යුතුය.	සියළුම ශල්‍ය ද්‍රව්‍ය සහ උපාංග ඉතා අත්‍යාවශ්‍ය සහ හදිසි ශල්‍ය උපාංග වන අතර සැලසුම් සහිත ශල්‍ය කර්ම හා ජීවිතාරක්ෂක ශල්‍ය කර්ම සඳහා ශල්‍යාගාර සැත්කම් සේවා අඛණ්ඩව පවත්වාගෙන යායුතු බැවින් රෝහල් අධ්‍යක්ෂ මණ්ඩල මගින් පාලනය වන රෝහලක් වශයෙන් අදාල ලංසුකරුවන් තෝරාගැනීම සඳහා රෝහල් අධ්‍යක්ෂ විසින් ශල්‍ය වෛද්‍යවරයෙකු, ඖෂධවේදියෙකු හා පරිපාලන නිලධාරීගෙන් සමන්විත තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත්කර ඇති බව.	2024 සැප්තැම්බර් 30 දින වන විටත් මෙම තත්ත්වය නිවැරදි කර නොතිබුණි.

5	2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 මාර්ගෝපදේශය පරිදි රු.මිලියනයකට වැඩි භාණ්ඩ හා සේවා සම්බන්ධයෙන් වන ප්‍රසම්පාදනයන් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සභාපතීත්වයෙන් යුතු දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවක් මගින් සිදුකළ යුතු වුවත් ඊට අනුකූල නොවන ලෙස අවස්ථා 07කදී රු.24,726,763ක්වූ මිළදීගැනීම් ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව මගින් සිදුකර තිබුණි.	2023-2.2.4(ඇ)	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල ට අනුකූලව කටයුතු කළ යුතුය.	රෝහලේ හදිසි සහ අත්‍යාවශ්‍ය ඖෂධ සහ උපාංග මිළදී ගැනීම සඳහා පැවරී ඇති මූල්‍ය බලතල අනුව රු.100,000 දක්වා වූ සීමාව තුළ අධ්‍යක්ෂවරයාටත්. රු.100,000 සිට රු.මිලියන 12.5 දක්වා වූ සීමාව තුල ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවටත් පැවරී ඇති මූල්‍ය සීමාව තුල සිටිමින් සියළුම මිළදී ගැනීම් සිදුකර ඇති බව.	2024 සැප්තැම්බර් 30 දින වන විටත් මෙම තත්ත්වය නිවැරදි කර නොතිබුණි.

3.101 දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	බදු පෙර ලාභය (අලාභය) රු.	මතය
2021	21,764,424	5,556,050	16,208,374	(1,523,419)	තත්ත්වාගණනය කළ
2022	19,691,479	5,229,424	14,462,055	1,043,684	තත්ත්වාගණනය කළ
2023	23,770,916	4,884,357	18,886,559	7,658,339	තත්ත්වාගණනය නොකළ

	විගණන නිරීක්ෂණය	විගණන වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	2019 අප්‍රේල් 22 දිනැති අංක 09/2019 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව 2019 ජූලි 01 දින සිට ක්‍රියාත්මක කර තිබුණු 2019 අයවැය යෝජනා අනුව රාජ්‍ය නිලධරයන් සඳහා මාසිකව ගෙවීමට අනුමත කර තිබුණු රු.2,500 ක අන්තර් දීමනාව අර්ධ රාජ්‍ය සේවකයින්ට ගෙවිය නොහැකි නමුත්, 2019 ජූලි මාසයේ සිට 2021 දෙසැම්බර් මාසය දක්වා වූ මාස 30 ක කාලය තුළදී අධිකාරියේ නිලධාරීන් 13	2021	අන්තර් දීමනා ලෙස ගෙවා තිබුණු රු.690,648 ක් අදාළ දීමනා ලාභීන්ගෙන් හෝ වගකිවයුතු පාර්ශවයන්ගෙන් ආපසු අයකර ගත යුතුය.	මෙම ගෙවන ලද දීමනාව නැවත එම දීමනා ලාභීන්ගෙන් අයකරවා ගැනීමට අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරන ලදී. එමෙන්ම අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලැබුවේ, ඉදිරියේදී අධිකාරියේ සේවකයින් වෙත දීමනා ගෙවීමේදී, එම චක්‍රලේඛ සෞඛ්‍ය ලේකම් වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීම සුදුසු බවය. ඒ අනුව, වර්තමානයේ රජය විසින් දීමනා සම්බන්ධයෙන් නිකුත් කරනු ලැබූ චක්‍රලේඛ සියල්ලම, ගෙවීම් සිදු කිරිමට පෙර	මුදල් රෙගුලාසි '119 2 ආ' යටතේ සහ 2024 අගෝස්තු 21 දින සෞඛ්‍ය ලේකම්ගෙන් ලද අනුමැතිය යටතේ, මෙම ගෙවන ලද දීමනාව 2024 සැප්තැම්බර් මස සිට වසර 5ක් ඇතුලත එම දීමනා ලාභීන්ගෙන් අය කර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. දැනට වාරික එකක් අයකරගෙන ඇත.

	දෙනෙකු වෙත රු.690,648 ක් අන්තර් දීමනා ලෙස ගෙවා තිබුණි.			අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සෞඛ්‍ය ලේකම් වෙත ඉදිරිපත් කිරිමට නිර්දේශ ලබා දෙන ලදී. ඒ අනුව, අධිකාරියේ සේවකයින් වෙනුවෙන් දීමනාවක් ගෙවීමේදී, සෞඛ්‍ය ලේකම් වෙතින් අනුමැතියක් ලබා ගැනීමට කටයුතු සලසා ඇත.	
2	සමාලෝචිත වර්ෂය තුළදී අධිකාරිය විසින් 1948 මනෝ උපදේශන සේවාව වැඩිදියුණු කිරීම වෙනුවෙන් රු.1,380,500 ක්ද, එම සේවාව ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් රු.2,022,500 ක්ද හා එම සේවාව පවත්වාගෙන යාම වෙනුවෙන් රු.1,205,085 ක් ද වශයෙන් මුළු එකතුව රු.4,608,085 ක් වැයකර තිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී ලැබී තිබුණු ඇමතුම් 9,025 කින් ඇමතුම් 2,797 ක් වෙනුවෙන් උපදේශන සේවා සපයා තිබුණු අතර ඇමතුම් 1,084 ක් ශ්‍රී ලංකා සුරාබදු	2021	සේවාවේ ඵලදායිතාවය මැනීම සඳහා පසු විපරම් ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතුය.	1948 මනෝ උපදේශන සේවාවේදී දුම්කොළ හා මද්‍යසාර වලින් නිදහස් වීමට බලාපොරොත්තු වන පුද්ගලයින්ට මනෝ උපදේශනය ලබා දී පසුව නැවත ඇමතුම් ලබා ගන්නා ලෙස පවසන අතර ඒ අයුරින් මනෝ උපදේශන සැසි පැවැත්වීම සිදු කරනු ලබයි. උපදේශනලාභියා විසින්ම ලබා දුන් දුරකථන ඇමතුම් සඳහා එම අවස්ථාවේදී දුම්කොළ හා මද්‍යසාර නිවාරණය සඳහා භාවිතා වෙන චිකිත්සක ක්‍රමවේදයන්ට අනුව උපදේශනලාභියා සමඟ ඔහුටම ආවේණික වූ ක්‍රමවේදයක් ගොඩනගා ගන්නා අතර එම ක්‍රමවේදයන්ට අනුව කටයුතු කර ගැටළුවක් ඇති වන ඕනෑම	දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරියේ සභාපතිතුමන්ගේ අධීක්ෂණය යටතේ මෙම පසු විපරම් කිරීමේ ක්‍රියාවලිය සිදු කරගෙන යනු ලබන අතර කේත ක්‍රමයක් ඔස්සේ සේවාලාභීන් නම් කරනු ලබන අතර පසු විපරමේදී ප්‍රගතිය මැනීම සඳහා දර්ශක හතරක් යොදාගෙන ප්‍රගතිය සටහන් කරගැනීම සිදු කරනු ලබයි. එම දර්ශක වන්නේ 01. දුම්කොළ හා මද්‍යසාර භාවිතය නවතා නැත, 02. දුම්කොළ හා මද්‍යසාර භාවිතය මඳක් නවතා ඇත, 03. දුම්කොළ හා

	දෙපාර්තමේන්තුව, පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය හා අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය වැනි අදාළ ආයතන වෙත යොමු කර තිබුණි. ඇමතුම් 2,797 ක් වෙනුවෙන් උපදේශන සේවා සපයා තිබුණු නමුත් ඒ පිළිබඳ පසුවිපරමක් සිදු කිරීමේ ක්‍රමවේදයක් නොතිබුණු බැවින් එම සේවාවේ ඵලදායිතාවය මැනීමට අධිකාරියට නොහැකිවී තිබුණි.			අවස්ථාවකදී නැවත ඔවුන්ට කතා කිරීමේ හැකියාව පවතින බවට ඔවුන්ව දැනුවත් කිරීම සිදු කරයි. සති දෙකකින් දුම්කොළ හෝ මද්‍යසාර නිවාරණය කරගෙන යන ආකාරය සාකච්ඡා කිරීමට දුරකථන ඇමතුමක් ලබා ගන්නා ලෙස පවසන අතර ඇමතුම් ලබා ගන්නා උපදේශන ලාභීන්ගෙන් යම් ප්‍රමාණයක් පමණක් නැවත ඇමතුම් ලබා ගැනීම සිදු කරයි. එසේ උපදේශන ලාභීන් විසින් නැවත ඇමතුම් ලබාගැනීම සිදු නොකළහොත් අපගේ මනෝ උපදේශන නිලධාරීන් විසින් සති තුනකට පසුව පසු විපරම් කිරීම සිදු කරනු ලබයි. පසු විපරමේදී සාකච්ඡා කරගන්නා ලද කරුණු පදනම්ව තවත් මාසයක කාලයකට පසුව නැවත පසු විපරම් කිරීම සිදු කරනු ලබයි. එසේ සේවාලාභියාගේ ප්‍රගතිය මත පදනම්ව මනෝ උපදේශන ක්‍රියාවලිය සිදු කරගෙන යනු ලබයි	මද්‍යසාර භාවිතය බොහෝ දුරට අඩුයි සහ 04. දුම්කොළ හා මද්‍යසාර භාවිතය නවතා ඇත යන දර්ශක වේ. ඒ අනුව සේවලාභින්ගෙන් 1948 මනෝ උපදේශනය හරහා ලැබුණු සේවාවේ ඵලදායිතාවය මැනීම වර්තමානයේ සිදු කරගෙන යනු ලබයි.
3	1948 උපදේශන සේවාව සඳහා දෛනිකව ලැබෙන ඇමතුම් හා ඒවා	2021	1948 උපදේශන සේවාවේ දෛනික තොරතුරු විධිමත් පරිදි සටහන්	1948 මනෝ උපදේශන සේවාව සඳහා ඇමතුම් ලබා ගත් පුද්ගලයින් පිළිබඳ	වර්තමානයේ 1948 මනෝ උපදේශන සේවාව සඳහා ලැබෙන

සම්බන්ධයෙන් ගන්නා ලද ක්‍රියාමාර්ග පිළිබඳව තොරතුරු ඇතුළත්වන පරිදි සහ එම තොරතුරු ඉහල නිලධාරියෙකුගේ අධීක්ෂණයට ලක්වන බවට සනාථ කෙරෙන පරිදි විධිමත් ලේඛනයක් පවත්වා නොතිබුණු බැවින් 1948 උපදේශන සේවාවට ලද ඇමතුම් සහ සිදුකර තිබුණු උපදේශන සේවා සම්බන්ධයෙන් ඉදිරිපත් කර තිබුණු සංඛ්‍යාත්මක තොරතුරුවල නිවැරදිතාවය සනාථ කර ගත නොහැකි විය.	කෙරෙන සහ අධීක්ෂණය සිදු කළ හැකි වන පරිදි ලේඛනයක් හඳුන්වාදී පවත්වා ගත යුතුය. එය අවශ්‍ය විටදී විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය.	තොරතුරු උපදේශන නිලධාරීන් විසින් සටහන් තබා ගැනීම සඳහා ලේඛන පවත්වාගෙන යනු ලැබේ. ඒ සඳහා ඇති ලේඛන වර්ග දෙකක් ඇත. ඒවා නම් දුම්කොළ හා මද්‍යසාර භාවිතය වැලැක්වීම සඳහා මනෝ උපදේශනය ලබා ගැනීම සඳහා ඇමතුම් ලබා ගන්නා සේවා දායකයින්ගේ තොරතුරු ඇතුලත් කරන ලේඛනය සහ දුම්කොළ හා මද්‍යසාර භාවිතය වැලැක්වීම සඳහා මනෝ උපදේශනය ලබා ගැනීම සඳහා නොව අන්තරායකර ඖෂධ භාවිතය, නීති විරෝධී මත්වතුර ආදී වූ මනෝ උපදේශනය සඳහා අදාල නොවන ඇමතුම් වලට අදාල වන සේවාලාභීන්ගේ තොරතුරු ඇතුලත් වන ලේඛනයි. 1948 මනෝ උපදේශන සේවාව සඳහා දෛනිකව ලැබෙන ඇමතුම් පිළිබඳව දත්ත හා තොරතුරු එක් රැස් කොට මාසිකව ලැබුණු ඇමතුම් සංඛ්‍යාව පිළිබඳව ප්‍රගති වාර්තා සාදන අතර එම ප්‍රගති වාර්තා සභාපතිතුමා විසින් සහතික කරනු ලබයි.	ඇමතුම් වලට අදාල දෛනික තොරතුරු ලබා ගැනීම සඳහා දිනය, නම, කේතය, දුරකථන අංකය, වයස, ගම, රැකියාව, පවුලේ විස්තර, භාවිතය සහ ඇමතුම් විස්තරය ලෙස සටහන් ලබා ගැනීම මනෝ උපදේශන නිලධාරීන් විසින් සිදුකරන අතර එම සටහන් දෛනිකව ලබා ගැනීම අධීක්ෂණය කිරීම අධිකාරියේ නිලධාරීන් දෙදෙනෙකු විසින් සිදු කරගෙන යනු ලැබේ. මාසිකව ලබා ගන්නා ඇමතුම් වල ප්‍රගති වාර්තා සහ පසු විපරම් වාර්තා අධීක්ෂණය කිරීම සභාපතිතුමන් විසින් සිදු කරනු ලැබේ.

4	අධිකාරිය සහ ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ලෝක සෞඛ්‍ය සංවිධානය සමඟ ඇති කරගෙන තිබුණු එකඟතාවයකට අනුව ගෝලීය වැඩිහිටි දුම්කොළ සමීක්ෂණයේ අවසන් වාර්තාව 2021 ඔක්තෝබර් 31 දිනට පෙර නිකුත් කළ යුතු වුවද, 2022 මැයි 24 දින වන විටත් එම සමීක්ෂණයේ අවසන් වාර්තාව නිකුත් කර නොතිබුණි.	2021	ගෝලීය වැඩිහිටි දුම්කොළ සමීක්ෂණයේ අවසන් වාර්තාව කඩිනමින් නිකුත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකළ යුතුය.	ගෝලීය වැඩිහිටි දුම්කොළ සමීක්ෂණයේ අවසන් වාර්තාවට අදාලව කෙටුම් පත් කරන ලද අවසාන සමීක්ෂණ වාර්තාව ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් 2022 ජුනි මස 28 වන දින අප ආයතනයට සහ ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව වෙත විද්‍යුත් තැපැල මගින් එවන ලදී. එම වාර්තාව සමාලෝචනය කර අපගේ සහ ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවෙහි නිරීක්ෂණ ලෝක සෞඛ්‍ය සංවිධානය වෙත දැනුම් දෙන ලෙසත් ඉන් පසුව වාර්තාව අවසන් නිරීක්ෂණ සඳහා රෝග පාලනය සහ වැළැක්වීම සඳහා වන මධ්‍යස්ථානය - ඇමරිකා එක්සත් ජනපදය (Center for Disease Control and Prevention) වෙත යැවිය යුතු බවත් එම විද්‍යුත් තැපැල හරහා ආයතන ද්විත්වයටම දන්වන ලදී. ඒ අනුව අප ආයතනය විසින් අවසාන වාර්තාවෙහි කෙටුම්පත සඳහා වන අපගේ නිරීක්ෂණ ජූලි මස 01 දින ලෝක සෞඛ්‍ය සංවිධානය වෙත ලබා දෙන ලදී. ඒ අනුව ගෝලීය වැඩිහිටි	ගෝලීය වැඩිහිටි දුම්කොල සමීක්ෂණයේ අවසන් වාර්තාව දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරියේ නිල වෙබ් අඩවියේ ඊ ගොනුවක් ලෙස බාගත කිරීමට හැකි පරිදි දක්වා තිබේ.

				දුම්කොළ සමීක්ෂණයේ අවසන් වාර්තාවේ අවසන් අනුවාදය 2023 මැයි 31 ලෝක දුම්වැටි විරෝධී දිනයට සමගාමීව එම සමීක්ෂණය සඳහා සම්බන්ධ වූ ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ලෝක සෞඛ්‍ය සංවිධානය ආදී වූ පාර්ශ්වයන් සමඟ ප්‍රකාශයට පත් කරන ලදී.	
5	2021 අප්‍රේල් 09 දිනැති අංක සීජීඅයිආර්/2021/02 -02 දරන දේශීය ආදායම් දෙපාර්තමේන්තු ලිපිය ප්‍රකාරව රාජ්‍ය ආයතන හා රජයට අයත් ආයතන විසින් සැපයුම්කරුවන් වෙත ගෙවන ලද එකතුකල අගය මත බදු පිළිබඳ තොරතුරු නියමිත ආකෘති පත්‍ර ප්‍රකාරව සෑම කාර්තුවක්ම අවසන් වී ඊලඟ මාසයේ 15 වන දිනට පෙර දේශීය ආදයම් දෙපාර්තමේන්තුව වෙත යැවිය යුතු වුවත් එපරිදි අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂය පුරාවටම ක්‍රියාකර නොතිබුණි.	2022	දේශීය ආදායම් දෙපාර්තමේන්තු වේ විධිවිධාන ප්‍රකාරව එකතු කල අගය මත බදු වාර්තා ඉදිරිපත් කළ යුතුය.	අධිකාරිය විසින් සැපයුම්කරුවන් වෙත ගෙවනු ලබන එකතුකල අගය මත බදු පිළිබඳ තොරතුරු, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස නිලධාරීන් දැනුවත් කරන ලදී.	දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත අධිකාරිය විසින් ගෙවනු ලබන එකතු කල අගය මත බදු තොරතුරු ලබා දීමට කටයුතු සලසා ඇත.

6	අධිකාරියේ වාර්තා 2022 අනුව වර්තමානයේ දුම්කොළ නිෂ්පාදන සඳහා ශ්‍රී ලංකාවේ පවතින බදුකරණ ව්‍යුහය අවිධිමත් සහ සංකීර්ණ බවත්, එය බදු වර්ග කිහිපයක එකතුවකින් සමන්විත වන බවත්, 2016 වර්ෂයේ සිගරට් මත වූ සුරාබදු ආදායම රජයේ සමස්ථ ආදායමෙන් සියයට 7.3ක් වුවත් එය 2020 වර්ෂය වන විට සියයට 3.1 දක්වා පහත වැටී තිබුණු බවත් නිරීක්ෂණය විය. ඒ අනුව අධිකාරිය විසින් 2020 සහ 2021 යන වර්ෂවලදි ලෝක සෞඛ්‍ය සංවිධානයේ මූල්‍ය ප්‍රදාන සහ දේශිය අරමුදල් ලෙස රු.994,148ක වියදමක් දරා දුම්කොළ සඳහා නව බදුකරණ සූත්‍රයක් හඳුන්වාදී තිබුණු අතර මෙම නව බදුකරණ සූත්‍රය යොදා ගැනීමෙන් 2021 වර්ෂයේ රු. බිලියන 91.6 ක්ව පවතින සිගරට් මත වූ සුරාබදු ආදායම 2026 වර්ෂය වන විට රු. බිලියන 124.6 ක් දක්වා	දුම්කොළ සඳහා නව බදුකරණ සූත්‍රය නීතියක් බවට පත්කර ගැනීම කඩිනම් කළ යුතුය.	දුම්කොළ බදුකරණ සඳහා වන මොඩියුලය ගරු සෞඛ්‍ය අමාත්‍ය ආචාර්ය කෙහෙළිය රඹුක්වැල්ල මැතිතුමා වෙත ඉදිරිපත් කරන ලදී. එසේ ඉදිරිපත් කරන ලද දුම්කොළ සඳහා වන නව බදුකරණ සූත්‍රයට අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශය අමාත්‍ය මණ්ඩලය සඳහා ඉදිරිපත් කිරීමට අදාල කටයුතු සිදු කරන ලද අතර එසේම ජනාධිපතිවරයා වෙත 2021 දෙසැම්බර් 27 දින ලිපියක් මඟින් මෙම බදුකරණ සූත්‍රය ක්‍රියාවට නොනැන්වීම පිළිබඳව දැනුවත් කර ඇත. දුම්කොළ හා මද්‍යසාර වලට අදාලව තවදුරටත් බදුකරණය පිළිබඳව අධ්‍යනය කිරීම සඳහා ලෝක සෞඛ්‍ය සංවිධානයේ බදුකරණ විෂයෙහි ප්‍රවීණයන් සමඟ සාකච්ඡාවන් පවත්වන ලද අතර එහිදී බදුකරණ ක්‍රියාවලිය සඳහා එම ක්‍රියාවලින් පහසු කරවන සියලු පාර්ශවයන් වන සෞඛ්‍ය අමාත්‍යාංශයේ බෝ නොවන රෝග ඒකකය, මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, සුරාබදු දෙපාර්තමේන්තුව සහ	දුම්කොළ හා මද්‍යසාර වලට අදාලව තවදුරටත් බදුකරණය පිළිබඳව අධ්‍යනය කිරීම සඳහා ලෝක සෞඛ්‍ය සංවිධානයේ බදුකරණ විෂයෙහි ප්‍රවීණයන් සමඟ සාකච්ඡාවන් පවත්වන ලද අතර එහිදී බදුකරණ ක්‍රියාවලිය සඳහා එම ක්‍රියාවලින් පහසු කරවන සියලු පාර්ශවයන් වන සෞඛ්‍ය අමාත්‍යාංශයේ බෝ නොවන රෝග ඒකකය, මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, සුරාබදු දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා රේගුව හා සමඟ ක්‍රියාකාරී කමිටුවක් හරහා තව දුරටත් බදුකරණ ක්‍රියාවලිය පිළිබඳව සාකච්ඡා කිරීමෙන් අනතුරුව බදුකරණ ක්‍රියාවලිය පිළිබඳව අදහස් විමසීම සඳහා IMF නියෝජන කමිටුව සමඟ සාකච්ඡා කර එම කමිටුව වෙත

	වැඩිකර ගත හැකි බවටත්, එය දුම්කොළ පරිභෝජනය සියයට 1.1 කින් පහත වැටීමකට සහ වාර්ෂිකව රාජ්‍ය ආදායම සියයට 6 කින් පමණ වැඩිවීමකට හේතුවන බවටත් අපේක්ෂා කර තිබුණි. කෙසේ නමුත් දුම්කොළ සඳහා නව බදුකරණ සූත්‍රය මෙම වාර්තාවේ දිනය වන විටත් නීතියක් බවට පත්වී නොතිබුණි.			ශ්‍රී ලංකා රේගුව හා සමඟ ක්‍රියාකාරී කමිටුවක් හරහා තව දුරටත් බදුකරණ ක්‍රියාවලිය පිළිබඳව සාකච්ඡාවන් පවත්වන ලදී.	බදුකරණ ක්‍රියාවලිය පිළිබඳ යාවත්කාලීන මොඩියුලය ඉදිරිපත් කිරීම සිදුකර ඇත.
7	2006 අංක 27 දරන දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය පනතේ 35(2)(ඇ) වගන්තිය ප්‍රකාරව දුම්කොළ නිෂ්පාදන හෝ මධ්‍යසාර නිෂ්පාදන මහජනයාට අලෙවිකිරීම සඳහා තබා ඇති ස්ථානයක් තුළ දුම්කොළ නිෂ්පාදන හා මධ්‍යසාර නිෂ්පාදන ඒ ස්ථානයේ අලෙවි කිරීම සඳහා තිබෙන බව නියමකොට හඳුන්වා දෙමින් සහ ඒවායේ මිල ගණන් දක්වමින් නියමිත ප්‍රමාණයේ දැන්වීමක් ප්‍රදර්ශනය	2022	දුම්කොළ නිෂ්පාදන හෝ මධ්‍යසාර නිෂ්පාදන මහජනයාට අලෙවි කිරීම සඳහා තබා ඇති ස්ථානවල ප්‍රදර්ශනය කර තිබෙන දැන්වීම් නියාමනය කඩිනමින් ඉටුකළ යුතුය.	දුම්කොළ නිෂ්පාදන හෝ මද්‍යසාර නිෂ්පාදන මහජනයාට අලෙවි කිරීමට තිබෙන බව නියමකොට හඳුන්වා දෙමින් ඒවායේ මිල ගණන් දක්වමින් නියමිත ප්‍රමාණයේ දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට අදාලව නියාමනය කිරීම් සඳහා අවස්ථාවන් කිහිපයකදී සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත දැනුම් දීම් සිදුකල අතර 2024/01/12 දිනද මේ පිළිබඳව සලකා බලන මෙන් ඉල්ලා සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත ඉල්ලුම් කරන ලදී.	මේ සඳහා අදාල වන රෙගුලාසිය පනවන ලෙස සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත ඉල්ලීම් සිදු කර තිබුනද, ඒ සඳහා අවශ්‍ය කටයුතු සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ඉටුකර නොතිබුණ බව විගණනය වෙත දන්වා ඇත.

	කිරිම සඳහා අවසර ලබා දී තිබුණද, උක්ත වගන්තියට අදාළවන පරිදි නියෝග සකස් කර පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. ඒ අනුව පනත යටතේ වූ බලයලත් නිලධාරින්ට දුම්කොළ නිෂ්පාදන හෝ මධ්‍යසාර නිෂ්පාදන මහජනයාට අලෙවි කිරීම සඳහා තබා ඇති ස්ථානවල ප්‍රදර්ශනය කර තිබෙන දැන්වීම් නියාමනය කිරිමට නොහැකිවී තිබෙන බව නිරික්ෂණය විය.				
8	2012 අගෝස්තු 08 දිනැති අංක 1770/15 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට්පත්‍රයේ 10 ඡේදය ප්‍රකාරව සහ 2015 අංක 3 දරන දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය පනත මඟින් සංශෝධිත 2006 අංක 27 දරන දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය පනතේ 34 අ(5) වගන්තිය ප්‍රකාරව	2022	සෞඛ්‍ය අවවාද වෙනස් කිරීමෙහි සඵලදායකත්වය උපරිම කර ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතුය.	2022 වර්ෂයේ අධිකාරිය විසින් යොමු කරන ලද නව රූපමය අවවාද ඇතුළත් රෙගුලාසිය සංශෝධන සහිතව සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත 2024/01/04 දින යොමු කිරීමෙන් අනතුරුව එම රෙගුලාසියට අදාලව 2024/05/29 දින අධිකාරියෙහි මතය විමසමින් ලිපි යොමු වූ අතර ඒ සඳහා අධිකාරියෙහි මතය ඉදිරිපත් කරමින් 2024/07/01 දින නැවත සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත යොමු කරන ලදී.	නව රූපමය අවවාද ඇතුලත් රෙගුලාසිය අදාල සංශෝධන සහිතව නිති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත සෞඛ්‍ය අමාත්‍යාංශය හරහා යොමුකිරීම සඳහා අවශ්‍ය කටයුතු අධිකාරිය විසින් සිදු කර ඇත.

සිගරට් සහ දුම්කොළ නිෂ්පාදකයින්ට සෞඛ්‍ය අවවාද මාස හයකට වරක් වෙනස් කර සිගරට් පැකට්, ඇසුරුම් හෝ කාඩ්බෝඩ් පෙට්ටි මත ප්‍රදර්ශනය කිරීමට හැකිවන පරිදි ඉහත ගැසට්පත්‍රය මඟින් ප්‍රකාශිත සෞඛ්‍ය අවවාද 08 ක සංචිතය පුළුල් කිරීම සඳහා 2022 වර්ෂයේදී සෞඛ්‍ය අවවාද 10 ක් හඳුනාගෙන තිබුණු නමුත් ඒවා වර්ගකිරීමක් කර නොතිබුණි. එසේම මෙම වාර්තාවේ දිනය දක්වාම එම නව සෞඛ්‍ය අවවාද රජයේ ගැසට්පත්‍ර මඟින් ප්‍රකාශයට පත් කර නොතිබුණි. එම නිසා 2015 වර්ෂයේ සිට මෙම වාර්තාවේ දිනය දක්වා වූ වසර 08 ක පමණ කාලපරිච්ඡේදය තුළ සෞඛ්‍ය අවවාද 08 ක සංචිතය පමණක් භාවිතා වීමෙන් සෞඛ්‍ය අවවාද වෙනස් කිරීමෙහි සඵලදායකත්වය උපරිම කර ගැනීමට අධිකාරිය අපොහොසත් වී

තිබුණි.

9	අධිකාරිය විසින් 2021 හා 2022 යන වර්ෂයන්හිදී රු.1,307,282 ක වියදමක් දරා අවස්ථා තුනකදී සහතිකපත්‍ර මනෝ උපදේශන පාඨමාලා පවත්වා පුද්ගලයින් 108 දෙනෙකු සඳහා සහතික පත්‍ර නිකුත්කර තිබුණු අතර ඉන් නිලධාරීන් 83 ක් ස්වේච්ඡා පදනම මත වැටුප් හෝ දීමනා ගෙවීමකින් තොරව කාර්යාල වේලාවෙන් පසුව ඉහත මනෝ උපදේශන සේවාවේ යෙදීමට අවස්ථාව ලබා දී තිබුණි. ඒ අනුව 2022 වර්ෂය තුළ උපදේශනය කර තිබුණු මුළු ඇමතුම් සංඛ්‍යාව 3,666 ක් වූ අතර ඉන් ඇමතුම් 2,085ක් ස්වේච්ඡා මනෝ උපදේශන සේවා නිලධාරීන් විසින් උපදේශනය කර තිබුණි. කෙසේ නමුත් දින 143 කදී සිදුකරන ලද මනෝ උපදේශන සංඛ්‍යාව පිළිබඳව එම ස්වේච්ඡා නිලධාරීන් විසින් අධිකාරියට වාර්තා කර	2022	ස්වේච්ඡා මනෝ උපදේශන සේවා නිලධාරීන් විසින් සිදුකරන උපදේශනය සම්බන්ධයෙන් වූ අධිකාරියේ අධීක්ෂණය ශක්තිමත් කිරීමට වැඩපිළිවෙලක් සකස් කළ යුතුය.	1948 මනෝ උපදේශන සේවාවට අදාලව ස්වේච්ඡාවෙන් මනෝ උපදේශණය ලබා දෙන මහත්ම මහත්මීන් රාජ්‍ය සේවයේ නියතු රාජ්‍ය නිලධාරීන් වන අතර කාර්ය බහුල තත්ත්වයන් මධ්‍යයේ වුවද අප අධිකාරිය වෙත ලබා දෙන දායකත්වය ප්‍රශංසනීය වන අතර ලැබුණු මුළු ඇමතුම් සංඛ්‍යාව සහ මනෝ උපදේශනය ලබා දුන් ඇමතුම් සංඛ්‍යාව වාර්තා කිරීම සිදුකරනු ලබයි. එසේ මනෝ උපදේශනය ලබා දීමෙන් අනතුරුව කාර්යාලිය වේලාවකදී නැවත මනෝ උපදේශන සැසි සඳහා සම්බන්ධ වන ලෙස දැනුවත් කිරීමද ඔවුන් විසින් සිදු කරනු ලබයි. කාර්යාලිය වේලාවෙන් පසුව මනෝ උපදේශනය ලබා දුන් පසු ඒ පිළිබඳව තොරතුරු ආධිකාරිය වෙත දැනුම් දෙන ලෙස එම ස්වේච්ඡා මනෝ උපදේශනය ලබා දෙන මහත්ම මහත්මීන් වෙත දැනුම් දී ඇත.	ස්වේච්ඡාවෙන් මනෝ උපදේශනය ලබා දෙන මහත්ම මහත්මීන්ගේ වැඩමුර ලැයිස්තුව පූර්වයෙන් ඔවුන්ට දැනුවත් වීම සඳහා යොමුකරන අතර ඔවුන්ට මනෝ උපදේශනය ලබා දීමට අපහසු දිනයක් වෙතොත් ඒ පිළිබඳව අධිකාරිය දැනුවත් කරන අතර පද්ධතිය වෙත දුරකථන අංක ඇතුල් කිරීමට පෙර එම මහත්ම මහත්මීන්ට 1948 මනෝ උපදේශනය සඳහා ඇමතුම් ලැබෙන බවට අදාල දිනයේදී සිහි කැඳවීමක් සිදු කරන අතරම මනෝ උපදේශනය සඳහා පද්ධතියෙන් දුරකථන අංක ඉවත් කරන අවස්ථාවේදී ලැබුණු ඇමතුම් පිළිබඳව තොරතුරු අධිකාරිය වෙත දැනුම් දෙන ලෙස සිහි කරවමින්ද

	නොතිබුණි. එසේම ස්වේච්ඡා නිලධාරීන් විසින් උපදේශනය කරන ලද ඇමතුම් සංඛ්‍යාව පමණක් වාර්තාකරන අතර ඔවුන් විසින් සපයා තිබුණු උපදේශන සේවාවේ ගුණාත්මකභාවය පිළිබඳව ඇගයීමක් අධිකාරිය විසින් සිදුකර තිබුණු බවට ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය. ඒ අනුව ස්වේච්ඡා මනෝ උපදේශන සේවා නිලධාරීන් විසින් සිදුකර තිබුණු උපදේශනය සම්බන්ධයෙන් වූ අධිකාරියේ අධීක්ෂණය දුර්වල මට්ටමක පැවතුණි.				නැවත සිහිකැඳවීම් සිදු කිරීම කරනු ලැබේ. ඒ අනුව ඔවුන් විසින් සිදු කරනු ලබන මනෝ උපදේශන ක්‍රියාවලිය පිළිබඳව සොයා බලනු ලැබේ.
10	2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන පොදු ව්‍යාපාර චක්‍රලේඛයේ 4.4 ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අධිකාරිය සඳහා අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.	2022	අභ්‍යන්තර විගණනයක් සිදුකළ යුතුය.	අධිකාරිය වෙනුවෙන් අභ්‍යන්තර විගණනයක් පැවැත්වීම සිදු කරනු ලබනුයේ, අදාල රේඛීය අමාත්‍යංශය හරහාය. සෞඛ්‍ය අමාත්‍යංශයේ අභ්‍යන්තර විගණන අංශය 2024 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණනයක් 2024 ජූලි මස තුලදී පැවැත්වීමට කටයුතු යොදන ලදී.	සෞඛ්‍ය අමාත්‍යංශයේ අභ්‍යන්තර විගණන අංශය මඟින්, අධිකාරිය වෙනුවෙන් අභ්‍යන්තර විගණනයන් සිදු කරයි. ඒ අනුව, 2024 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණනයක් සිදු කරන ලදී.
11	අධිකාරිය විසින් පිළිවෙලින් රු.566,465 ක් හා	2023	ජංගම දුරකථන යෙදවුම් සේවය අඛණ්ඩව	දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය මඟින්	මෙම දුරකථන යෙදවුම් දෙක සඳහා මාසිකව

රු.301,490 ක් වැය කර මහජනතාවගෙන් තොරතුරු ලබා ගැනීම සඳහා VNATA Media Violation හා බලයලත් නිලධාරීන් වෙනුවෙන් “VNATA Authorized Officer’s” යන ජංගම දුරකථන යෙදවුම් හඳුන්වා දී තිබුණි. නමුත් ණය කාඩ් මඟින් ගෙවිය යුතු වන මාසික Server using charges ගෙවීම සඳහා ණය කාඩ් පහසුකම් සහිත නිශ්චිත වැඩපිළිවෙලක් අධිකාරිය විසින් සකස් කර නොතිබුණු අතර ඒ වෙනුවට අධිකාරියේ සභාපතිවරයාගේ පෞද්ගලික ණය කාඩ්පත මඟින් ගෙවීම් කර තිබුණි. මේ හේතුව නිසා අධිකාරියේ සභාපතිවරුන් මාරුවන විට කිසියම් කාලසීමාවක් මෙම යෙදවුම අක්‍රීය වීමක් සිදු වී තිබුණි. ඒ අනුව 2023 පෙබරවාරි සිට මැයි දක්වා ආසන්න වශයෙන් මාස 4 ක කාලයක් මෙම	ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු කළ යුතුය.	ක්‍රියාත්මක කර ඇති VNATA Media Violation සහ VNATA Authorized Officers යන යෙදවුම් වලට අදාළව එම යෙදවුම් සක්‍රිය තත්ත්වයේ අඛණ්ඩව පවත්වා ගැනීමට අදාළව මාසිකව ගෙවිය යුතු Server Using Charges ස්වයංක්‍රියව අයවන පරිදි ණය කාඩ්පත් ඇතුල් කර මාසයේ පළමු දින අයවන පරිද්දෙන් පවත්වාගෙන යායුතු වේ. මෙම යෙදවුම් නිර්මාණය කර ඇති සමාගම සමඟ මෙම Server Using Charges මාසිකව ගෙවීම සම්බන්ධයෙන් අධිකාරිය විසින් 2023 පෙබරවාරි මාසයේදී විමසන ලද අතර එහිදී එම සමාගම විසින් මාස තුනක් සඳහා රුපියල් 48,000 ක් ලෙස ඉදිරිපත් කල අතර ඒ අනුව මාසයකට මෙම Server Using Charges සඳහා රුපියල් 16,000 ක මුදලක් සමාගම හරහා ගෙවීම් සිදු කරන විට යෙදවීමට සිදු වේ. නමුත් මෙම Server Using Charges සඳහා අධිකාරිය විසින් සභාපති තුමාගේ ණය කාඩ්පත හරහා ගෙවීම් සිදු කරන විට වූ වියදම	Server Using Charges ලෙස අයකරනු ලබන ප්‍රමාණය වන්නේ ඇමරිකානු ඩොලර් 20කි. ඩොලර් 20 සඳහා වන වටිනාකම් අගය ගෙවීම සභාපතිවරයාගේ ණය කාඩ්පත හරහා ගෙවීම සිදු කරමින් මෙම යෙදවුම් දෙකම සක්‍රියව පවත්වාගෙන යාම සිදුවේ.

යෙදවුම අක්‍රිය වී තිබුණු අතර මෙම යෙදවුම් දෙක නැවත සක්‍රීය තත්වයට පත් කිරීමට රු.58,000 ක අතිරේක වියදමක් දැරීමට සිදු වී තිබුණි. එසේම මෙම යෙදවුම් දෙක සංවර්ධනය කිරීම හා නඩත්තු කටයුතු වෙනුවෙන් සැපයුම්කරු සමඟ ලිඛිත එකඟතාවයකට එළඹී නොතිබුණි.

වන්නේ එය රුපියල් 6,000 - 8,000 ක් අතර ප්‍රමාණයකි.
ඒ අනුව මෙම සේවාව අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල තීරණය වූයේ අධිකාරිය වෙත ණය කාඩ්පතක් ලබා ගැනීමේ ඇති හැකියාව පිළිබඳව බැංකු මඟින් විමසන ලෙසයි. අධිකාරියේ සභාපතිවරුන් මාරු වන විට මෙම ණය කාඩ්පත් ඉවත් කර ගැනීමට සිදුවන හෙයින් ණය කාඩ්පත් පහසුකම අධිකාරිය වෙත ලබා ගැනීමට අදාළව බත්තරමුල්ල ලංකා බැංකු ශාඛාව සහ බත්තරමුල්ල මහජන බැංකු ශාඛා වලින් ණය කාඩ්පත් අධිකාරිය නමට ලබා ගැනීමට අදාළව සාකච්ඡා කල නමුත් එසේ අධිකාරිය වෙත ණය කාඩ්පත් පහසුකම ලබා දීමට අපහසු බව එම බැංකු වෙතින් දන්වන ලදී.
කෙසේ නමුත් බැංකු විසින් ණය කාඩ්පතක් අධිකාරිය වෙත නිකුත් කිරීමට නොහැකි බව දැන්වීමෙන් අනතුරුව නැවත සභාපතිවරයාගේ ණය කාඩ්පත් දත්ත ඇතුළු කර ගෙවීම් සිදු කරගෙන යාම සිදු කරන ලදී.

12	2023 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ පුරප්පාඩු සංඛ්‍යාව 5 ක් වූ අතර 2024 අප්‍රේල් 30 දිනට එම පුරප්පාඩු සංඛ්‍යාව 6 දක්වා වැඩි වී තිබුණි. ඉහත පුරප්පාඩු අතරින් සාමාන්‍යාධිකාරී තනතුර 2022 ජුලි 27 වන දින සිට මේ දක්වාත්, පරිපාලන නිළධාරී තනතුර 2024 මාර්තු 04 දින සිට මේ දක්වාත් පුරප්පාඩුව පැවතුණි. එසේම පූර්ණ කාලීනව සේවයේ යෙදවීමේ අවශ්‍යතාවයක් ඇති උපදේශන සහ නීති නිලධාරී තනතුරු සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන තිබුණි.	2023	අධිකාරියේ කටයුතු ක්‍රමානුකූලව සිදුකර ගෙන යා හැකි පරිදි පුරප්පාඩු තනතුරු වලට බඳවා ගැනීම් කිරීමට කටයුතු කල යුතු නිර්දේශය	අධිකාරියේ පර්යේෂණ නිලධාරි තනතුරක් 2023 අගෝස්තු 25 දින පුරප්පාඩු වූ අතර 2024.05.09 වන දින සිට තෝරාගත් නිලධාරියා රාජකාරි භාර ගන්නා ලදී.අධිකාරියේ අනෙක් පර්යේෂණ නිලධාරි තනතුර 2024.01.08 දින පුරප්පාඩු වූ අතර, එම තනතුර සඳහා බඳවා ගැනීම් සිදු කිරීමට අදාල අනුමැතීන් අධිකාරිය වෙත ලැබී නොමැත. අධිකාරියේ සංවර්ධන නිලධාරි තනතුරක් 2023.11.03 දින පුරප්පාඩු වූ අතර 2024.05.27 දින සිට එම තෝරාගත් නිලධාරියා රාජකාරි භාර ගන්නා ලදී. අධිකාරියේ පරිපාලන නිලධාරි තනතුර 2024.03.04 දින පුරප්පාඩු වූ අතර එම බඳවා ගැනීම සඳහා අවශ්‍ය අනුමැතීන් ලබා ගැනීම සඳහා දැනටමත් කටයුතු සිදුකරන ලදී. අධිකාරියේ සාමාන්‍යාධිකාරි තනතුර සඳහා බඳවා ගැනීමට දිගින් දිගටම කටයුතු සිදු කල අතර එම තනතුර පුරවා ගැනීමට තවමත් අනුමැතිය දී නොමැත. එම බඳවා ගැනීමට කැබිනට් අනුමැතිය	2024 අප්‍රේල් 30 දිනට එම පුරප්පාඩු සංඛ්‍යාව 6 න්, 2024 වසරේ මැයි මාසය වන විට සංවර්ධන නිලධාරී තනතුරක් සහ පර්යේෂණ නිලධාරී තනතුරක් සඳහා බඳවා ගැනීම් සිදුකිරීමෙන් අනතුරුව පුරප්පාඩු තනතුරු ගණන 04ක් වූ නමුත් 2024 ඔක්තොම්බර් මාසය වන විට රියදුරු තනතුරු දෙකක්ද පුරප්පාඩු වූ හෙයින් මේ වනවිට පුරප්පාඩු තනතුරු ගණන 06ක් වේ.

ලබා ගැනීමට අදාලව සකස් කල අවසන් කැබිනට් පත්‍රිකාව සෞඛ්‍ය අමාත්‍යතුමන්ගේ කාර්යාලයේ එතුමන්ගේ අත්සනට 2024.05.21දින යොමු කොට ඇත.
දැනට අනුමත කාර්ය මණ්ඩලයට අතිරේකව ස්ථිර පදනමින් සංවර්ධන නිලධාරි තනතුරු දෙකක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් DMS/1767/NATA/2023 හා 2024.01.23 දින එවන ලද ලිපිය මගින් ද්වීතියන පදනම මත එම නිලධාරීන් බඳවා ගැනීමට අනුමැතිය ලබා දී ඇත.
මේ වන විට රාජ්‍ය සේවයේ නියුතු, සුදුසුකම් සපුරා ඇති නිලධාරින් අතුරින් සංවර්ධන නිලධාරින් දෙදෙනෙකු රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය හරහා අප අධිකාරිය වෙත අනුයුක්ත කර දෙන මෙන් ඉල්ලා සිටි අතර, 2024.05.13 දින රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ එම දැන්වීම

පල කර තිබූ අතර 2024.05.31 දිනට අයදුම් පත් යොමු කරන මෙන් එහි දන්වා තිබුණ ද අප අධිකාරිය වෙත කිසිදු අයදුම්පතක් ලැබී නොතිබුණි.
අධිකාරියේ මනෝ උපදේශක හා නීති නිලධාරි තනතුරු දෙක දැනට කොන්ත්‍රාත් පදනම මත පවතින අතර එම තනතුරු දෙක පූර්ණ කාලීනව යෙදවීමට අවශ්‍ය කටයුතු ඉදිරියේදී සම්පාදනය කරනු ඇත.

3.102 ජාතික යොවුන් සේනාංකය

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	බදු පෙර ලාභය (අලාභය) රු.	මතය
2021	3,483,010,040	3,167,727,976	315,282,064	17,031,512	තත්ත්වාගණනය කල
2022	3,404,468,717	3,001,177,673	403,291,045	(4,786,751)	තත්ත්වාගණනය කල
2023	3,425,111,652	2,974,694,667	450,416,985	(58,937,916)	තත්ත්වාගණනය කල

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශය ක්‍රියාත්මක තත්ත්වය
1	නිපුණතාවය පදනම්ව තරුණ තරුණියන් රැකියා සඳහා යොමු කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා ශ්‍රම වෙළඳපොල සිටින පිරිස් සඳහා න්‍යායික දැනුම හා පුහුණුව ලබා දීම වෙනුවෙන් 2022 වර්ෂයේ දී සේනාංකය වෙත රු. මිලියන 90 ක අමතර ප්‍රතිපාදනයක් ලබා දී තිබූ අතර එම අරමුදලින් රු.මිලියන 25.8 ක් උපයෝජනය කර දැනටමත් ආයතනය මඟින් ක්‍රියාත්මක කරන පාඨමාලා 2ක් සහ රු.මිලියන 1.6 ක් වැය කරමින් මාර්ගගත පුහුණු පාඨමාලා පවත්වා තිබුණද අදාල පුහුණුලාභීන්ගේ	2022	අමතර ප්‍රතිපාදන අදාල කාර්යය සඳහාම යෙදවිය යුතුය.	වැලැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	නිර්දේශ ක්‍රියාත්මක වී නොතිබුණි.

	ප්‍රගතිය පිළිබඳ දත්ත ආයතනය සතුව නොතිබුණි. තවද ආයතනය සතුව ප්‍රතිපෝෂක දත්ත (Feedback) පැවතියේ පුහුණුලාභීන් 723 කගේ පමණි. මෙයින් මේ වන විට වෘත්තීය පුහුණු සුදුසුකම් (NVQ) සහතික නිකුත් කර තිබුණේ පුහුණුලාභීන් 712 ක් සඳහා පමණි. මේ අනුව නිපුණතාව පදනම්ව නව රැකියාවක් ලබා දීමේ අරමුණින් සිදුකරනු ලැබූ පුහුණු කිරීමේ කටයුතු වලින් ප්‍රමාණවත් කාර්යසාධනයක් අත්පත් කරගෙන නොතිබුණි.				
2	2017 දෙසැම්බර්21 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 02/2017 හි 02 ඡේදය ප්‍රකාරව සේනාංකය සතු වාහන 07 ක් එම ආයතනය නමින් ලියාපදිංචි කිරීමට කටයුතු කර නොතිබුණි.	2022, 2023	චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුය	වාහන අයිතිය පවරාගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවති.	නිර්දේශය ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමින් පවති.
3	ඉදිකිරීම් කොන්ත්‍රාත් වෙනුවෙන් ලබා දී තිබුණු රු.108,558,448 ක අත්තිකාරම් ශේෂය තුල අවුරුදු 5 කට වඩා	2022, 2023	පැරණි අත්තිකාරම් ශේෂ අය කර ගැනීමට අවධානය යොමු කළ යුතුය.	අත්තිකාරම් ශේෂ නිරවුල් කිරීමට පියවර ගනිමින් පවතී.	නිර්දේශය ක්‍රියාත්මක වී නොමැත.

	හා අවුරුදු 2-3 අතර කාලයක සිට පැවත එන පිළිවෙලින් රු.101,968,773 ක හා රු.6,639,675 ක ශේෂයන් අයකර ගැනීම සඳහා මෙම වාර්තාවේ දින වනවිටත් විධිමත් හා ඵලදායී පියවර ගෙන නොතිබුණි. තවද, 2023 දෙසැම්බර් 31 දිනට පැවති වසර 05කට වඩා පැරණි රු.50,000 ක කුළී අත්තිකාරම් ශේෂයද පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි.				
4	සමාලෝචිත වර්ෂයේ වසර 05 කට වඩා පැරණි හා වසර 2-3 ක් අතර කාලයක සිට පැවත එන පිළිවෙලින් රු.2,180,986 ක හා රු.9,297,851 ක වූ ශේෂ ආදායම් ලෙස ගිණුම්ගත කිරිම කෙරෙහි හැර අදාල ශේෂයන් පියවීම සම්බන්ධයෙන් සොයාබලා ඒ අනුව කටයුතු කර නොතිබුණි.	2022, 2023	ගෙවිය යුතු ශේෂ පියවීමට කටයුතු කළ යුතුය.	2024 වර්ෂය තුලදී එම ශේෂයන් නිවැරදි කිරීම සඳහා ක්‍රියාමාර්ගයන් ගෙන ඇත.	නිර්දේශය ක්‍රියාත්මක කරමින් පවතී.
5	2023 දෙසැම්බර් 31 දිනට සේනාංකයේ පුහුණු මධ්‍යස්ථාන ස්ථාපිත කර තිබූ ඉඩම් 63 ක් අතරින් ඉඩම් 28 ක් පමණක් සේනාංකයට	2022, 2023	පවතින ඉඩම් නීත්‍යානුකූලව පවරා ගැනීමට කටයුතු කළ යුතුය.	ඉඩම් පවරා ගැනීමට අවශ්‍ය කටයුතු ක්‍රියාත්මක කරමින් පවතී.	නිර්දේශය ක්‍රියාත්මක වී නොමැත.

	පවරාගෙන තිබුණු අතර ඉතිරි ඉඩම් 35 ක් පවරා ගැනීමේ කටයුතු මෙතෙක් නිම කර නොතිබුණි.				
6	2016 හා 2017 වර්ෂවල ඉදිකිරීම් ආරම්භකර විවිධ හේතු මත අත්හැර දමා තිබු පුහුණු මධ්‍යස්ථාන 13 ක් පැවතුණි. ඒ වෙනුවෙන් රු. මිලියන 852.63 ක මූලික ඇස්තමේන්තුවක් අනුමත කරගෙන තිබූ අතර ප්‍රවර්ථන වර්ෂය අවසන් වන විට ඉන් රු.මිලියන 438.12 ක වියදමක් දරා තිබුණි. මෙම ව්‍යාපෘති වර්ෂ 07 කට වැඩි කාලයක සිට සම්පූර්ණ නොකර පැවතීම හේතුවෙන් අපේක්ෂිත ප්‍රතිලාභ ලභාකර ගැනීමට නොහැකිවී තිබුණි.	2022, 2023	අත්හැර දමන ලද ව්‍යාපෘති සම්බන්ධයෙන් ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට සැලසුම් කළ යුතුය.	ඉදිකිරීම් කටයුතු සිදු කරමින් පවති.	ඉදිරි වර්ෂ වලදී ඉදි කිරීම් නිම කිරීමට සැලසුම් කර ඇති අතර නිර්දේශ ක්‍රියාත්මක වෙමින් පවතී.
7	සේනාංකයේ ප්‍රධාන කාර්යයන් වූ යොවුන් සංවර්ධනය, රැකියා පුහුණුව සහ වෘත්තීමය අධ්‍යාපනය කාර්යක්ෂමව හා ඵලදායීව කරගෙන යාම සඳහා අවශ්‍ය මධ්‍යස්ථානාධිපති සහ උපදේශක තනතුරු 137ක් දිගින් දිගටම පුරප්පාඩු වී පැවතීම සේනාංකයේ අරමුණු කරා ළඟා වීම හා	2023	අත්‍යාවශ්‍ය කාර්යයන් පවත්වාගෙන යාම සඳහා කාර්ය මණ්ඩල කළමනාකරණය කර ගත යුතුය.	තනතුරු සඳහා බඳවා ගැනීම් සිදුකර ඇත.	මෙතෙක් අවශ්‍ය බඳවා ගැනීම් සිදු කර නොමැත.

පාඨමාලාවල
ගුණාත්මක භාවය
ආරක්ෂා කර ගැනීම
කෙරෙහි දැඩිව බලපා
තිබුණි.

3.103 ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	බදු පෙර ලාභය (අලාභය) රු.	මතය
2021	278,103,218	15,985,953	262,117,265	1,849,020	තත්ත්වාගණනය නොකල
2022	265,732,657	15,215,890	250,516,767	2,319,003	තත්ත්වාගණනය කල
2023	233,240,057	7,906,581	225,333,476	5,168,343	තත්ත්වාගණනය නොකල

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශය ක්‍රියාත්මක තත්ත්වය
1	ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය සතුව රු.86,746,214 ක් වටිනා නවීන තාක්ෂණික උපකරණ වලින් සමන්විත රසායනික පර්යේෂණාගාරය 2022 නොවැම්බර් 03 දින සිට භාවිතයට ගැනීමට සුදුසු තත්වයක පැවතුණ ද පර්යේෂණ කටයුතු ආරම්භ කර තිබුණේ 2023 අගෝස්තු මසදීය. තවද එම පරීක්ෂණගාරයේ පර්යේෂණ කටයුතු සඳහා විශ්වවිද්‍යාල 02ක සිසුන් 06 දෙනෙකුට පමණක් අවස්ථාව ලබාදී තිබුණි. ඒ අනුව අවශ්‍යතාව පවතින ආයතන හඳුනාගෙන	2022, 2023	පවත්නා සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ගැනීමට කටයුතු කළ යුතුය.	LC-MS/MS උපකරණයේ පර්යේෂණ කටයුතු සඳහා ගෙවීමක් සිදු කොට පෞද්ගලික විශ්ව විද්‍යාල වල සිසුන්ටද ඒ සඳහා සහභාගී වීමට අවස්තාව ලබාදීමටත් මේ සඳහා තවත් රාජ්‍ය විශ්වවිද්‍යාල සම්බන්ධ කරගැනීමට කටයුතු කිරීම සඳහාත් අදාල උපදෙස් ලබාදී තිබූ අතර පර්යේෂණාගාරය භාවිතා කර ආදායම් ඉපැයීම සඳහා කටයුතු ආරම්භ කිරීමට උපදෙස් ලබාදී ඇත.	නිර්දේශය ක්‍රියාත්මක කරමින් පවතී.

	පර්යේෂණාගාරය ස්ථාපිත කිරීමේ අරමුණු ළඟාකර ගැනීමට කටයුතු කර නොතිබුණි.				
2	බැංකු ප්‍රකාශය අනුව සමාලෝචිත වර්ෂයේ සෑම දිනකම අවසානයේදී බැංකු ජංගම ගිණුමක අවම වශයෙන් රු.මිලියන 02 ක මුදලක් නිෂ්ක්‍රියව තබාගැනීම හේතුවෙන් නියෝජ්‍යායතනයට රු.766,378 ක මූල්‍යමය පාඩුවක් සිදු වී තිබුණි.	2023	බැංකු ගිණුම් පවත්වාගෙන යාමේ දි පවතින ශේෂ සම්බන්ධයෙන් සැළකිලිමත් විය යුතුය.	ඒ අනුව කටයුතු කරමින් පවතී.	නිර්දේශය ක්‍රියාත්මක කරමින් පවතී.

3.104 සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	5,598,195,623	238,002,647	5,360,192,977	18,323,010	තත්ත්වාගණනය කල.
2022	5,501,762,331	284,033,591	5,217,728,742	(93,820,025)	තත්ත්වාගණනය කල
2023	5,429,667,516	298,129,209	5,131,538,307	(20,555,683)	තත්ත්වාගණනය කල

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශය ක්‍රියාත්මක තත්ත්වය
1	සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ ප්‍රධාන පිහිනුම් තටාකය හා කිමිදුම් තටාකය සඳහා ස්ථාපිත ජලය පවිත්‍ර කිරීමේ පද්ධතියේ හා ළමා පිහිනුම් තටාකයේ ජල කාන්දුව වැළැක්වීමට අවශ්‍ය ක්‍රියාමාර්ග නොගැනීම හේතුවෙන් අධිකාරියේ ගෘහස්ත ක්‍රීඩාංගනයේ 2021 වර්ෂයේ ජල ගාස්තුව සියයට 71 ක් එනම් රු. මිලියන 3.8 න් වැඩි වී තිබුණි.	2021	ජල කාන්දුව වැළැක්වීමට අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය.	අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු සිදු කර ඇත.	ජල කාන්දුව අවම කර ගැනීමට කටයුතු කර ඇති බැවින් නිර්දේශය ක්‍රියාත්මක වී ඇත.
2	සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ පාපන්දු පිටිය අලුත්වැඩියා හා වැඩිදියුණු කිරීමේ	2022 2023	විධිමත් පරිදි ව්‍යාපෘති කළමණාකරණය සිදු කර අපේක්ෂිත ඉදිකිරීම් නිසිපරිදි	ඉදිරියේදි නිවැරදි කිරීමට කටයුතු සිදු කරමින් පවති.	අලාභය අය කර ගෙන නොමැති බැවින් නිර්දේශය ක්‍රියාත්මක වී නොමැත .

	කොන්ත්‍රාත්තුව රු. මිලියන 32 කට (බදු රහිත) පෞද්ගලික ආයතනයකට ලබා දී ක්‍රීඩාපිටිය භාවිතා කළ නොහැකි තත්ත්වයකට පත්ව තිබුණි. කොන්ත්‍රාත්කරු ලවා අඩුපාඩු සකස් කර ගැනීමට අධිකාරිය කටයුතු කර නොතිබුණ අතර රු. මිලියන 38 ක් වැයකරන ලද මෙම ව්‍යාපෘතිය අසාර්ථක වීමට වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන සිදු වූ අලාභය අයකර ගැනීමට අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.		සිදුකර අප්‍රමාදව ඉදිකිරීම් අවසන් කල යුතුය.		
3	මූල්‍ය ප්‍රකාශනවල කෙරීගෙන යන වැඩ යටතේ දක්වා තිබුණු රු.මිලියන 202.8 ක ඉදිකිරීම් වල වැඩ නිමකර භාවිතයට ගෙන තිබූ රු. මිලියන 164.9 ක ඉදිකිරීම්, ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කර නොතිබුණි	2022, 2023	ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කළ යුතුය.	නිවැරදි කිරීමට කටයුතු සිදුකරමින් පවතී.	නිර්දේශය මෙතෙක් ක්‍රියාත්මක වී නොමැත.
4	පිරිවැය රු. මිලියන 2,856.6 වූ ඉඩම් සම්බන්ධයෙන් හා රු. මිලියන 8.8 ක් වූ තොග සම්බන්ධයෙන් විස්තරාත්මක	2022, 2023	වත්කම් හා තොග සම්බන්ධයෙන් විධිමත් ලේඛන පවත්වාගෙන යා යුතුය.	ඉදිරියේදි නිවැරදි කිරීමට කටයුතු කරමින් පවතී.	නිර්දේශය මෙතෙක් ක්‍රියාත්මක වී නොමැත .

	උපලේඛන, වත්කම් ලේඛන, හිමිකම් ඔප්පු සහ තොග සත්‍යාපනය වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබීම නිසා මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති ඉඩම් වල හා තොගයේ වටිනාකමේ, නිරවද්‍යතාවය හා භෞතික පැවැත්ම පිළිබඳව තහවුරු කර ගැනීමට නොහැකි විය.				
5	1971 අංක 38 දරණ මුදල් පනතේ 11 වගන්තිය රජයේ නිතිගත සංස්ථාවක කිසිදු මුදලක් මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව මිස ආයෝජනය කරනු නොලැබිය යුතු වුවද අධිකාරිය විසින් කළමනාකරණ මණ්ඩල අනුමැතිය මත 2023 දෙසැම්බර් 31 දිනට සමාලෝචිත වර්ෂය අවසානයේ රු. මිලියන 55 ක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි.	2023	මුදල් පණතේ විධිවිධාන වලට අනුකූල විය යුතුය.	අදාල අනුමැතින් ලබා ගැනීමට කටයුතු කරමින් පවති.	නිර්දේශය ක්‍රියාත්මක වෙමින් පවති .
6	2021 නොවැම්බර් 16 දිනැති අංක 1/2021 දරණ චක්‍රලේඛයෙන් හඳුන්වා දුන් රජය සතු ව්‍යාපාර සඳහා වන මෙහෙයුම් අත් පොත	2022,2023	චක්‍රලේඛ හා මාර්ගෝපදේශ වලට අනුකූල විය යුතුය.	ඉදිරියේදි නිවැරදි කිරීමට කටයුතු කරමින් පවති.	නිර්දේශය මෙතෙක් ක්‍රියාත්මක වී නැත

	සහ ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශයේ 2.3, 05 මාර්ගෝපදේශය සහ මෙහෙයුම් අත්පොතේ සහ 3.1.2 ඡේදය ප්‍රකාරව උපාය මාර්ගික සැලැස්මක්, ප්‍රධාන කාර්යසාධන දර්ශක හඳුන්වාදීම සහ තනතුරු 29 ක් සඳහා බඳවාගැනීමේ පටිපාටිය විගණිත දින වන විටත් පිළියෙල කිරීම හා අනුමත කරවාගෙන නොතිබුණි.				
7	විවිධ ආයතන හා පුද්ගලයන් 42 ගෙන් අයවිය යුතු රු. මිලියන 32.4 ක ශේෂයක් පැවති අතර මෙම ශේෂය තුල වර්ෂ 3-5 ත් අතර සහ වර්ෂ 5 ට වැඩි කාලයක් තිස්සේ අය නොවී පවතින පිළිවෙලින් රු. මිලියන 7.6 ක් සහ රු. මිලියන 12 ක ශේෂයන් අයකර ගැනීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.	2022, 2023	ණය ගැති ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය.	ඉදිරියේදි අය කර ගැනීමට කටයුතු කරමින් පවති.	නිර්දේශය ක්‍රියාත්මක කරමින් පවති.
8	2023 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්ම අනුව රු.මිලියන 398 ක මුලික ඇස්තමේන්තුවක් මත ප්‍රාග්ධන ව්‍යාපෘති 10	2023	ක්‍රියාකාරී සැලැස්මට අනුව ඉදිකිරීම් සිදු කළ යුතුය.	ඉදිරියේදි අවශ්‍ය සැලසුම් අනුව කටයුතු කිරීමට එකඟ වී ඇත.	නිර්දේශය ක්‍රියාත්මක කරමින් පවති.

	ක් ක්‍රියාත්මක කිරිම සඳහා සැලසුම් කර තිබුණද ප්‍රවර්ථන වර්ෂය තුල රු. මිලියන 26.3 ක් වැය කර ඉදිකර තිබුණේ එක් ව්‍යපෘතියක් පමණි.				
9	2023 දෙසැම්බර් 31 දිනට බැංකු ජංගම ගිණුමක රු. මිලියන 46 ක ශේෂයක් පැවති අතර වර්ෂයේ සෑම දිනකම අවසානයෙදි අවම වශයෙන් රු. මිලියන 18 ක සාමාන්‍ය ශේෂයක් කිසිඳු ප්‍රයෝජනයකට නොගෙන අක්‍රියව තබා ගැනිම හේතුවෙන් පවතින පොලි අනුපාතය අනුව අධිකාරියට උපයාගත හැකිව තිබූ රු. මිලියන 3 ක පොලී ආදායමක් අහිමි වි තිබුණි. මෙම ගිණුමේ ශේෂය අධිකාරියේ ප්‍රධාන කාර්යයන් සඳහා යොදවා ගැනීමට හෝ ඒවායින් උපරිම ප්‍රයෝජනය ලබාගැනීමට හෝ නිසි යාන්ත්‍රණයන් හඳුනා නොගැනීම හේතුවෙන් මෙම මුදල් අක්‍රීයව පැවතුණි.	2023	ජංගම බැංකු ශේෂ වලින් උපරිම ප්‍රතිලාභ ලබා ගත හැකි යාන්ත්‍රණයක් හඳුනා ගත යුතුය.	නිරීක්ෂණය පිළිගෙන අවශ්‍ය කටයුතු කිරීමට එකඟ වී ඇත.	නිර්දේශය මෙතෙක් ක්‍රියාත්මක වී නොමැත.

10	ඉදිකිරීම් කොන්ත්‍රාත් 04 ක් වෙනුවෙන් රු. මිලියන 21ක අත්තිකාරම් 2017,2019 හා 2021 වර්ෂ වලදී ගෙවා තිබුණ අතර එම මුදල් 2022 වර්ෂයේදී පියවා ගත යුතුව තිබුණ ද, මෙම වාර්තාවේ දිනය දක්වාම පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි.	2022, 2023 (අවසන් වාර්තාව)	අත්තිකාරම් පියවා ගැනීමට කට යුතු කළ යුතුය.	ඉදිරියේදි අවශ්‍ය කටයුතු කිරීමට පියවර ගනිමින් සිටී.	නිර්දේශය මෙතෙක් ක්‍රියාත්මක වී නොමැත.
11	අධිකාරිය සතු ක්‍රීඩා හෝටලයේ නවාතැන් පහසුකම් ලබාදීමේදී එක් එක් පාර්ශවයන් වෙනුවෙන් විධිමත් ගාස්තු ක්‍රමයක් නිශ්චය කර ඒ අනුව ගාස්තු අයකර ගැනීමට නිසි යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කර නොතිබීමෙන් හා අධිකාරියේ ප්‍රධාන ආදායම් මාර්ගයක් වන ගෘහස්ථ ක්‍රීඩාගාරය , ක්‍රීඩාංගණය හා පිහිණුම්තටාක වෙන් කර දීමේ දී පිරිවැයට සාපේක්ෂව ආදායම් විශ්ලේෂණයක් සිදුකර ගාස්තු නිශ්චය කර නොතිබීමෙන් හා හෝටලයේ පවතින මුළුතැන්ගෙය, රටබීමහල හා භෝජනාගාරය	2023	පවතින සම්පත් වලින් උපරීම ප්‍රයෝජන ගැනීමට හා ආදායම් උපයා ගැනීමට විධිමත් ක්‍රමවේද සකස් කළ යුතුය.	ඉදිරියේදි නිවැරදි කිරීමට කටයුතු කරමින් පවතී.	මෙතෙක් නිර්දේශය ක්‍රියාත්මක වී නොමැත.

ප්‍රයෝජනයට නොගෙන අක්‍රීයව පැවතීම හේතුවෙන් ආදායම් රැස්කිරීම් අවිධිමත් පරිදි සිදු වී තිබූ අතර ආදායම් උපයාගැනීමට තිබූ අවස්ථාද අහිමි වී තිබුණි.

3.105 ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	784,602,499,859	287,738,572,571	496,863,927,288	(3,193,187,848)	තත්ත්වාගණනය කළ
2022	956,570,978,895	424,705,489,122	531,865,489,773	(2,699,807,068)	තත්ත්වාගණනය කළ
2023	987,027,797,995	421,113,341,428	565,914,456,567	5,286,525,126	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්වය
1	විගණනයට ඉදිරිපත් කරන ලද සත්‍යාපන වාර්තාවට අනුව රු. මිලියන 720 ක සමස්ථ වටිනාකමක් සහිත පිරිවැය මධ්‍යස්ථාන අටක ස්ථාවර වත්කම් සත්‍යාපනය කිරීමට නොහැකිවතිබූ අතර භෞතිකව නොපැවතුණි. තවද, ප්‍රාදේශීය සහයක මධ්‍යස්ථානවල ඇති රු. මිලියන 999 ක් වටිනා වත්කම් පැහැදිලිව හඳුනාගත නොහැකි වූ අතර සමාලෝචිත වර්ෂය තුළදී එම වත්කම්වල ක්ෂය වීම් සඳහා රු. මිලියන 33 ක ප්‍රතිපාදනයක් සිදු කර තිබුණි.	2023	අයථා පරිහරණය සහ අස්ථානගතවීම් වළක්වා ගැනීම සඳහා වත්කම් කළමනාකරණය කිරීමට කළමනාකාරීත්වය විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.	මෙම වත්කම් විවිධ ස්ථානවලට මාරු කර ඇති බැවින් බොහෝ අවස්ථාවලදී ඒවා සත්‍යාපනය නොවේ. ඒවා භෞතිකව තිබුණද සමහර අවස්ථාවලදී සත්‍යාපන කමිටුවලට ඒවා සත්‍යාපනය කිරීමට නොහැකි විය. ඒ අනුව, මණ්ඩලය විසින් ඒවා භාවිතා කර ඇති බැවින් එම වත්කම්වල ක්ෂයවීම් සඳහා වෙන්කිරීම් නිවැරදි වේ. භාවිතා කළ නොහැකි වත්කම් සඳහා, ඒවා අනාගතයේදී අපහරණය කරනු ලබන අතර වෙන්කර ඇති	ස්ථාවර වත්කම්වල භෞතික සත්‍යාපනය ආරම්භ කිරීමට පෙර ස්ථාවර වත්කම් ලේඛනයේ ඇති සියලුම ස්ථාවර වත්කම් මාරු කිරීම් නිවැරදිව යාවත්කාලීන කරන ලෙස පිරිවැය ගණකාධිකාරීවරුන්ට අදාල උපදෙස් ලබා දී ඇත.

				ක්ෂයවීම් සඳහා ගැලපීම් කරනු ඇත.	
2	වත්කම් වර්ගීකරණයට අදාළ අභ්‍යන්තර පාලනයන්හි දුර්වලතා හේතුවෙන් 2012 වර්ෂයේ සිට සෑම වසරකම වත්කම් හා ක්ෂයවීම් සඳහා පෙර වර්ෂයේ ගැලපීම් සිදු කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, 2023 වර්ෂයේ ආරම්භක රඳවාගත් ඉපැයීම් රු. මිලියන 2,584 කින් වෙනස් කර තිබුණු අතර විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර ඇති පෙර වර්ෂවල ලාභය, එම මූල්‍ය ප්‍රකාශන භාවිතා කරන්නන්ට වැරදි තොරතුරු ලබා දෙමින් ප්‍රමාණාත්මක ලෙස වෙනස් කර තිබුණි.	2023	පෙර වර්ෂයේ ගැලපීම් මූල්‍ය ප්‍රකාශනවලට සැලකිය යුතු වෙනස්කම් ඇති කර ඇති බැවින් පෙර වර්ෂයේ ගැලපීම් අවම කිරීම සඳහා අභ්‍යන්තර පාලනයන් හඳුන්වා දීම.	එල්.කේ.ඒ.එස් 8 ට අනුව පූර්ව කාල පරිච්ඡේද වැරදි නිවැරදි කිරීම නියාමන අවශ්‍යතාවයකි. ගනුදෙනුවල සංකීර්ණත්වය සහ වත්කම් පදනම රු. බිලියන 477 කින් සමන්විත වීම හේතුවෙන්, වර්ෂයෙන් පසුව ගැලපීම් සිදු කිරීමට සිදුවනු ඇත. එබැවින්, මණ්ඩලය එකී අවශ්‍යතාවලට අනුකූලව කටයුතු කර ඇත.	වත්කම් ප්‍රාග්ධනීකරණය කිරීමේදී නිවැරදි වත්කම් කාණ්ඩය සහ අදාළ අරමුදල් ප්‍රභවයන් පරීක්ෂා කර හඳුනා ගැනීමට අදාළ උපදෙස් ප්‍රාදේශිකයන්ට ලබා දී ඇත.
3	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (එල්.කේ.ඒ.එස් 20) විධිවිධානවලට පටහැනිව**,** 2023 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති 26 කට අදාළව එකතුව රු. මිලියන 7,004 ක සහ එක් ව්‍යාපෘතියකට අදාළව රු. මිලියන 334 ක විදේශ ප්‍රදාන ශේෂයන් පිළිවෙලින් වසර 15 කට සහ වසර 12 කට වැඩි කාලයක් තිස්සේ	**2023**	අදාළ ගිණුම්කරණ ප්‍රමිතිවල විධිවිධානවලට අනුකූලව ලද විදේශ ප්‍රදාන ක්‍රමක්ෂය කිරීමට කටයුතු කළ යුතු අතර එම ප්‍රදානයට අදාළ නිශ්චිත වත්කම් හඳුනාගනිමින් ප්‍රදාන ක්‍රමක්ෂය ඇතුළු විස්තරාත්මක උපලේඛණ	ඉඩම් ඇතුළු ක්ෂය නොකළ වත්කම්වලට අදාළ ප්‍රදාන කාල සීමාව පුරාම ක්ෂය නොවී පැවතුනි. එසේම, පවතින ගොඩනැගිලිවල ආයු කාලය වසර 50 ඉක්මවයි. එවැනි කාල සීමාවක් දක්වා අදාළ ප්‍රදාන ක්‍රමක්ෂය කර ඇත. ඉදිරියේදී අදාළ ප්‍රදාන ක්‍රමක්ෂය	අදාළ ප්‍රදාන ක්‍රමක්ෂය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතී**.**

	ක්‍රමක්ෂය කිරීමකින් තොරව මූල්‍ය ප්‍රකාශනවල පැවතී බව අනාවරණය විය. තවද, ව්‍යාපෘති සඳහා ලද රු. මිලියන 42,267 ක් වූ රජයේ ප්‍රදාන, විදේශ ප්‍රදාන සහ දේශීය ප්‍රදාන වසර තුනකට වැඩි කාලයක් තිස්සේ ක්‍රමක්ෂය කිරීමකින් තොරව පැවතී අතර විගණනයට තොරතුරු ඉදිරිපත් කර නොමැති බැවින් මූල්‍ය ප්‍රකාශනවලට ක්‍රමක්ෂය නොකිරීමේ බලපෑම විගණනයේදී තහවුරු කර ගත නොහැකි විය.		විගණනයට ඉදිරිපත් කළ යුතුය.	කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ.	
4	සැමට ජලය ව්‍යාපෘතිය සම්බන්ධයෙන් රු. මිලියන 5,294 ක් වූ ලද මුළු ප්‍රදානයෙන් ප්‍රමාද ගාස්තු වශයෙන් දරන ලද රු. මිලියන 1,378 ක්, මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 4.3 හි වගන්තියට පටහැනිව එම ව්‍යාපෘතිය සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලද ප්‍රදානයට එරෙහිව කපා හැර තිබුණි. තවද, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (එල්.කේ.ඒ.එස්) 39 වන වගන්තියේ අවශ්‍යතාවයට අනුව එය නිසි ලෙස අනාවරණය කර නොතිබුණි	**2023**	අවශ්‍ය හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශනවල සිදු කළ යුතුය.	ප්‍රමාද ගාස්තු ගෙවීමට භාණ්ඩාගාරයෙන් ලද මුදල් ප්‍රදාන ලෙස ගිණුම්ගත කර ඇත. ප්‍රමාද ගාස්තු ගෙවීම ප්‍රාග්ධනිත කිරීම ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල නොවේ. මෙම ගැටලුව නිවැරදි කිරීම සඳහා සැමට ජලය ව්‍යාපෘතියට අදාළ ප්‍රමාද ගාස්තු මහා භාණ්ඩාගාරයෙන් ලද ප්‍රදානයට එරෙහිව හිලව් කර තිබුණි.	නිවැරදි වී නොමැත.

5	දේපල, පිරියත හා උපකරණ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (එල්.කේ.ඒ.එස් 16) 51 වන වගන්තිය ප්‍රකාරව, මණ්ඩලය විසින් අඛණ්ඩව භාවිතා කරනු ලබන ස්ථාවර වත්කම් කාණ්ඩ 16 කට අයත් වටිනාකම රු.බිලියන 3.67 ක් වන සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වත්කම්වල ඵලදායී ජීවිත කාලය ගැලපීම සඳහා වාර්ෂිකව සමාලෝචනය කර නොතිබුණි.	**2023**	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය, එල්.කේ.ඒ.එස් 16 හි අවශ්‍යතාවලට අනුකූල වන බවට සහතික වීම.	එල්.කේ.ඒ.එස් 16 හි 51 වන ඡේදයට අනුව, රට පුරා විසිරී ඇති අතිවිශාල වත්කම් පදනම හේතුවෙන් මණ්ඩලයේ වත්කම් පදනම තක්සේරු කිරීම ප්‍රායෝගික නොවන අතර මණ්ඩලයට විශේෂිත වූ සැලකිය යුතු වත්කම් ප්‍රමාණයක් පවතී. එබැවින්, වත්කම්වල ප්‍රයෝජනවත් ආර්ථික ආයු කාලය නැවත තක්සේරු කිරීමට රජයේ තක්සේරුකරුගේ සේවය ලබා ගැනීම අපහසු වේ. කෙසේ වෙතත්, 2023 වර්ෂයේදී පැවති විගණන හා කළමනාකරණ කමිටුව විසින් සමස්ත මෝටර් රථ පන්තියම නැවත තක්සේරු කිරීමට තීරණය කර ඇත.	අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතී.
6	ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතියේ (එස්.එල්.එෆ්.ආර්.එස් 16) 51 වැනි වගන්තියේ අවශ්‍යතාවයට අනුව භාවිත අයිතිය සතු වත්කම් ලෙස අනාවරණය කිරීමෙන් තොරව මූල්‍ය ප්‍රකාශනවල සටහන් තුළ	**2023**	ගිණුම්කරණ ප්‍රමිත අවශ්‍යතාවයට අනුකූල විය යුතුය.	එස්.එල්.එෆ්.ආර්.එස් 16, කල්බදු ප්‍රමිතියේ අවශ්‍යතාවයට අනුව කල්බදු ඉඩම් භාවිත අයිතිය සහිත වත්කම් ලෙස හෙළිදරව් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ඉදිරියේදී ගනු ලැබේ.	**SLFRS 16-** කල්බදු අවශ්‍යතාවයට අනුව කල්බදු ඉඩම් භාවිතයේ අයිතිය වත්කම් ලෙස හෙළි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග අනාගතයේදී

	සින්නක්කර ඉඩම් යටතේ කල්බදු ඉඩම ලෙස රු. මිලියන 670 ක් වටිනා කල්බදු වත්කම් අනාවරණය කර තිබුණි. තවද, කල්බදු කාල සීමාව තුළ භාවිත අයිතිය සතු වත්කම්වල ක්ෂයවීම් මණ්ඩලය විසින් ගිණුම්ගත කර නොතිබූ අතර සාක්ෂි නොමැති වීම හේතුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට ක්ෂයවීම්වලට එමගින් සිදු කර ඇති බලපෑම විගණනයේදී තහවුරු කර ගත නොහැකි විය.				ගන්නා බව දන්වා ඇත.
7	මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල 3.2.1 වගන්තියට අනුව, රු. මිලියන 1,106 ක් වූ සෙමින් චලනය වන තොග සඳහා ප්රතිපාදන සලසා නොතිබුණි. තවද, තොග සත්‍යාපනයේ දී තොග වර්ගීකරණයේ ස්වභාවය හඳුනා ගැනීමට ක්‍රියා පටිපාටියක් සකස් කර නොතිබුණි.	**2023**	මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූල විය යුතුය.	අයිතම චලනය නොවනවා ද නැද්ද යන්න තීරණය කිරීම සඳහා ගනු ලබන නිර්ණායක මත පදනම්ව, මෙම අයිතම සියල්ල අඛණ්ඩව වසර තුනක කාලයක් තිස්සේ චලනය නොවන ලෙස සටහන් වී ඇති බව පැවසිය නොහැක. එබැවින්, එම චලනය නොවන තොග සඳහා ශුද්ධ උපලබ්ධි අගය තක්සේරු කිරීම අවශ්‍ය නොවේ. වර්තමානයේදී, මණ්ඩලය විසින් යල් පැන ගිය තොග සඳහා ප්‍රතිපාදන සලසා ඇත.	2024 මූල්‍ය ප්‍රකාශන වල අවශ්‍ය ගැලපීම් සිදු කරනු ඇත.

8	මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සටහන් අංක 3.2.1 අනුව, සමාලෝචිත වර්ෂය අවසානයේ තොග ශේෂය හරිත සාමාන්‍ය පිරිවැය ක්‍රමයට අගය කළ යුතුය. කෙසේ වෙතත්, තොග ලැබීම් සහ නිකුත් කිරීම් අතර අසාමාන්‍ය මිල විචලනයන් හේතුවෙන් කළමනාකරණ තොරතුරු පද්ධතියෙන් ලබාගත් තොග ශේෂය හරිත සාමාන්‍ය පිරිවැය ක්‍රමයට අනුකූල නොවන බව නියදි විගණන පරීක්ෂණයෙන් අනාවරණය වූ අතර සමාලෝචිත වර්ෂය තුළදී තොග ගැලපුම් ලෙස තොග වටිනාකමින් රු. මිලියන 200 ක් වූ අසාමාන්‍ය මිල විචලනයන් අඩු කර තිබුණි. එබැවින්, මූල්‍ය ප්‍රකාශනවල තොග ශේෂයේ නිරවද්‍යතාවය විගණනයේදී තහවුරු කර ගැනීමට නොහැකි විය.	**2023**	අසාමාන්‍ය මිල විචලනයන් ඉවත් කිරීමට කටයුතු කළ යුතුය.	තොග කළමනාකරණ පද්ධතිය (අයිඑම්එස්) හරහා සමස්ත දිවයිනම සමස්තයක් ලෙස ගෙන එක් එක් අයිතමය සඳහා හරිත සාමාන්‍ය පිරිවැය ගණනය කර ඇත. ලෙජරය සහ තොග සත්‍යාපනය මඟින් දීප ව්‍යාප්ත මුළු මිල විචලනය, මණ්ඩලයහි භෞතිකව සත්‍යාපනය කළ මුළු තොග ශේෂයෙන් ආසන්න වශයෙන් සියයට 1 කට වඩා අඩු බව නිරීක්ෂණය වේ. යෝජිත අයිඑම්එස් හි වර්ධනයන් ක්‍රියාත්මක කිරීමත් සමඟ අනාගතයේදී මිල විචලනය ඉතා අවම වනු ඇතැයි අපේක්ෂා කෙරේ.	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි කාර්මික සම්බන්ධතා වෙත තොග ඌනතා සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට ඉදිරිපත් කර ඇති අතර අනාගතයේදී මිල විචලනය ඉතා අවම කරගැනීම හරහා තොග කළමනාකරණ පද්ධතියේ වැඩිදියුණු කිරීම් කරන ලෙස තාක්ෂණික අංශයට දන්වා ඇත.
9	ලද තොරතුරුවලට අනුව, පිරිවැය රු. මිලියන 25,697 ක් වූ නිම කරන ලද සහ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති හැට අටක් (68)	**2023**	ප්‍රාග්ධනීකරණ ක්‍රියාවලිය කඩිනම් කිරීම.	ප්‍රාග්ධනීත කිරීම සාමාන්‍යයෙන් කොටසින් කොටස ක්‍රියාත්මක වන අතර විවිධ අදියරවලදී	අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතී.

	2023 දෙසැම්බර් 31 වන දිනට ප්‍රාග්ධනිත කිරීමෙන් තොරව කෙරීගෙන යන වැඩ ගිණුමේ පැවතුණි. එබැවින්, වර්ෂයට අදාළ දේපල, පිරියත සහ උපකරණ එම අගයෙන් අඩුවෙන් දක්වා තිබුණි. තවද, සමාලෝචිත වර්ෂය තුළදී එවැනි වත්කම්වල ක්ෂයවීම් ගණනය කර නොතිබුණි. තවද, මෙම කාරණය පෙර වර්ෂවල සිට නැවත නැවතත් අවධාරණය කර තිබියදීත් හේතු හඳුනා ගැනීමට සහ මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය ගැලපීම් සිදු කිරීමට පරීක්ෂණයක් සිදු කිරීමෙන් තොරව කෙරීගෙන යන වැඩ යටතේ දක්වා ඇති ව්‍යාපෘති 05 ට අදාළ එකතුව රු. මිලියන 199 ක් වූ ශේෂයන් වසර දහතුනකට වැඩි කාලයක් තිස්සේ නොවෙනස්ව පැවතුණි. හානිකරණ බලපෑම හඳුනා ගැනීම සඳහා කිසිදු හානිකරණ පරීක්ෂාවක් සිදු කර නොතිබුණි.		කිසියම් හානිකරණ පරීක්ෂාවක් සිදු කර ප්‍රතිපාදන සැලසීම.	සම්පූර්ණ කිරීම සඳහා අගයකිරීම සහ අනුමැතිය ලබා ගත යුතුය. මෙම ව්‍යාපෘතිවල බොහොමයක් තවමත් ඉහත ක්‍රියාවලියේ පවතී. අදාළ ව්‍යාපෘති යටතේ කිසියම් වත්කමක් සම්පූර්ණ කර භාවිත කළ හැකි තත්ත්වයක තිබේ නම් ප්‍රාග්ධනිත කරන ලෙස අදාළ ගණකාධිකාරීවරුන් ට දැනුම් දී ඇත.	
10	වත්කම් සහ වගකීම් පිළිවෙලින් රු. මිලියන 150 ක් සහ රු. මිලියන 51 ක් මූල්‍ය ප්‍රකාශනවල මෙහෙයුම්	**2023**	පවතින ශේෂය නිරවුල් කිරීමට කටයුතු කළ යුතු අතර අනාගතයේදී නිරවුල් නොකළ	හස්ත ක්‍රමය පරිගණක ගත කිරීම හේතුවෙන්, 1999 වර්ෂයේ සිට මෙම ශේෂයන් නැවත	ගිණුම් අක්‍රිය කිරීමට පියවර ගෙන ඇති අතර පවතින ශේෂ නිවැරදි කිරීමට

	නොවන වත්කම් සහ මෙහෙයුම් නොවන වගකීම් ලෙස දීර්ඝ කාලයක් තිස්සේ පවතී. කෙසේවෙතත්, ඒවා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. තවද, හඳුනා නොගත් පෙර වර්ෂයේ රු. මිලියන 235 ක ශේෂයක්, රු. මිලියන 22 ක තොග ශේෂයක්, රු. මිලියන 8 ක බැංකු ශේෂයක් සහ අමාත්‍යාංශයට ලබා දී ඇති රු. මිලියන 15 ක අත්තිකාරමක් මෙහෙයුම් නොවන වත්කම් ලෙස ඉහත ශේෂයට ඇතුළත් කර තිබුණි.		ශේෂයන් ඇතිවීම වැලැක්වීමට ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතුය.	නැවත ඇතුළත්ව තිබුණි. ඉහත ශේෂ නිරවුල් කිරීම සඳහා විශේෂ කමිටු සැකසීම, පිළිගත් විගණන ආයතනවල සේවාවන් වැනි විවිධ ක්‍රියාමාර්ග ආරම්භ කර ඇත. උපකාරක ලියකියවිලි නොමැතිකම හේතුවෙන් ශේෂයන් නිරවුල් කළ නොමැත. රු.මිලියන 149 ක වගකීම් අවශ්‍ය අනුමැතීන් ලබා ගැනීමෙන් පසුව ආදායම් සහ වියදම් වෙත මාරු කරනු ඇත. මෙම ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතින අතර 2024 වර්ෂයේදී නිරවුල් කරනු ඇත.	අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතී.
11	පිරිවැය මධ්‍යස්ථානවල වත්කම් ලේඛනවල සටහන්ව තිබූ ඉඩම් හතරක් සහ වාහන දෙකක් එම වත්කම්වල වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබූ අතර බස්නාහිර දකුණ ප්‍රදේශයට අයත් ඉඩම් තුනක් ගිණුම්ගත කර හෝ ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර නොතිබුණි.	**2023**	භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු මුදල් හඳුනාගැනීමේ දෝෂය නිවැරදි කිරීමට පියවර ගත යුතුය.	පශ්චාත් ස්ථාවර වත්කම් සත්‍යාපනය කිරීම සඳහා කමිටුවක් පත් කර ඇති අතර හැකි ඉක්මනින් පශ්චාත් සත්‍යාපන වාර්තාවට අනුව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට නියමිතය.	පිරිවැය ගණකාධිකාරීවරුන්ට අදාල උපදෙස් ලබා දී ඇත.

12	වැට් බදු වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන මනුගත විකුණුම්, තොග විකුණුම්, බවුසර් සැපයුම් සහ ප්‍රධාන මෙහෙයුම්වලින් ලැබෙන ආදායම අතර රු.මිලියන 1,456 ක නොසැසඳු වෙනසක් නිරීක්ෂණය විය.	**2023**	වෙනස්කම් සඳහා හේතු හඳුනා ගැනීමට මූල්‍ය ප්‍රකාශන, වාණිජ පද්ධතිය සහ වැට් බදු ප්‍රකාශනවල ප්‍රකාශිත ආදායමෙහි ශේෂයන් සංසන්ධනය කිරීම සහ විකුණුම් සංඛ්‍යාවල නිරවද්‍යතාවය තහවුරු කර ගැනීම සඳහා විගණකවරුන් වෙත සියලු විස්තර ඉදිරිපත් කිරීම.	දැනටමත් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර ඇති සමහර ආදායම් කාණ්ඩ වැට් බදු ප්‍රකාශන සඳහා ඇතුළත් කර නොමැති අතර මෙම වෙනස්කම් සඳහා කාල වෙනස්කම් බලපා ඇත.	අදාල සැසඳුම් සකස් කිරීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගනිමින් පවතී
13	ප්‍රාග්ධන දායකත්වයට අදාළව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂය සහ මහා භාණ්ඩාගාරයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂය අතර රු.මිලියන 10,770 ක වෙනසක් හඳුනා ගන්නා ලදී.	**2023**	වෙනස්කම් සඳහා සැසඳීම් සිදු කර ඒ අනුව වාර්තා ගැලපීම	සැසඳීම් සකස් කර ඇති අතර හඳුනාගත් වෙනස්කම් 2024 දී නිරවුල් කරනු ඇත.	සැසඳීම් සිදු කරඇති අතර හඳුනා ගත් වෙනස්කම් සඳහා ගැලපීම් 2024 වර්ෂයේදී සිදු කරනු ඇත.
14	එකතුව රු. මිලියන 2,344.78 ක් වූ වෙළඳ ණයගැතියන්, නව සම්බන්ධතා ණයගැතියන්, ජලාපවහන ණයගැතියන් සහ අනෙකුත් ණයගැතියන් වසර දෙකකට වැඩි කාලයක් තිස්සේ අයකර ගැනීමකින් තොරව පැවතුණි. ඉහත වෙළඳ	**2023**	හිඟ ශේෂයන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.	හිඟ මුදල් ක්‍රමිකව වර්ධනය විය. හිඟ මුදල් අයකර ගැනීමට දැන් කටයුතු කර ඇත.	හිඟ ශේෂයන් අය කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගනිමින් පවතී

	ණය ගැතියන්ගෙන් සියයට 66 ක් බස්නාහිර මධ්‍යම, දකුණ, බස්නාහිර උතුර සහ බස්නාහිර දකුණු ප්‍රදේශ නියෝජනය කරයි. නව සම්බන්ධතා ණයගැතියන් මාස තුනක් ඇතුළත වාරික 3 කින් අයකර ගැනීමට නියමිතව තිබුණද, රු. මිලියන 32.5 ක් වසර 3 කට වඩා වැඩි කාලයක් තිස්සේ අයකර ගැනීමකින් තොරව පැවතුණි.					
15	අමාත්‍ය නිල නිවාස සඳහා ලබාදී ඇති ජල සම්බන්ධතා 23 ක් සම්බන්ධයෙන් රු. මිලියන 3.5 ක මුදලක් සමාලෝචිත වර්ෂය අවසානයේදී අයකර ගැනීමකින් තොරව දීර්ඝ කාලීනව හිඟව පැවතුණි.	**2023**	අදාළ පාර්ශවයන්ගෙන් අයවිය යුතු මුදල අය කර ගැනීමට ප්‍රමාණවත් හා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය	අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතී.	නීතිමය කටයුතු ආරම්භ කරමින් පවතී.	
16	2023 දෙසැම්බර් 31 දිනට හිඟ (විසන්ධි කරන ලද) ණය ගැතියන් රු. මිලියන 1,886.73ක් විය. එයින් සියයට 69 ට සමාන රු. මිලියන 1,293.21 ක් වසර දෙකකට වැඩි කාලයක් තිස්සේ අයකර ගැනීමකින් තොරව පැවතුණි.	**2023**	අයකර ගැනීමේ ක්‍රියාවලිය වේගවත් කිරීම සඳහා පියවර ගත යුතුය.	හිඟ මුදල් අයකර ගැනීමට දැනටමත් නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත. නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට සිද්ධීන් 2464 ක් ප්‍රධාන කාර්යාලයට වාර්තා විය. 2023 වර්ෂයේදී සිද්ධීන් 1972 ක් ද අවසන් කර ඇත.. අයකර ගැනීමේ ප්‍රගතියක් ඇත.	හිඟ ශේෂයන් අය කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගනිමින් පවතී	

17	ගාල්ල නගර සභාවේ වසර 20 ක සිට අයවිය යුතු නීතිවිරෝධී සම්බන්ධතා දෙකක් සම්බන්ධයෙන් රු.මිලියන 1.76 ක හිඟ ශේෂයක් සහ වසර 6 කට වඩා වැඩි කොළඹ මහ නගර සභාවට අදාළව අයවිය යුතු රු. මිලියන 28 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකරගෙන නොතිබුණි.	**2023**	අනවසර ජල සම්බන්ධතා හේතුවෙන් දරන ලද අලාභ අයකර ගැනීමට කඩිනම් පියවර ගත යුතුය.	ලිඛිත දැනුවත් කිරීම්වලින්, රූස්වීම් කිහිපයක් පැවැත්වීමෙන් සහ හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කිරීමෙන් පසුව ගාල්ල මහ නගර සභාවේ ගිණුම් අංකවලින් හිඟ මුදල් අය කර ගෙන ඇත. තවද, කළමනාකරණ මට්ටමින් තීරණ ගත යුතුය.	අධීක්ෂණය කිරීම සඳහා කමිටුවක් පත් කර ඇත
18	බාහිර ආයතනවල තැන්පත් කර ඇති ආපසු ගෙවිය හැකි කෙටි කාලීන තැන්පතු එකතුව රු. මිලියන 60 ක් වසර තුනක් තිස්සේ ආපසු අයකර ගැනීමෙන් තොරව පැවතුණි.	**2023**	තැන්පතු සහ අත්තිකාරම්වල පැවැත්ම සමාලෝචනය කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතු අතර අයකර ගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කළ යුතුය.	මෙම තැන්පතුව අයකර ගැනීම සඳහා 2022 වර්ෂයේදී මාර්ග සංවර්ධන අධිකාරිය වෙත දන්වා ඇතත්, මේ දක්වා පියවීමක් කර නොමැත. එබැවින්, මාර්ග සංවර්ධන අධිකාරියට කරනු ලබන ඉදිරි ගෙවීම්වලින් මෙය අයකර ගැනීමට කටයුතු කරනු ඇත.	මාර්ග සංවර්ධන අධිකාරියෙහි අනාගත ගෙවීම් වලදී මෙය අයකර ගැනීමට කටයුතු කරනු ඇත.
19	2023 දෙසැම්බර් 31 දිනට අදාළ ඉඩම් අත්පත් කර ගෙන තිබුණද, ප්‍රාදේශීය සේවා මධ්‍යස්ථානය (මධ්‍යම) විසින් ප්‍රාදේශීය ලේකම්වරයා වෙත ගෙවන ලද රු. මිලියන 47 ක ඉඩම් අත්තිකාරම් මුදල නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.	**2023**	අත්තිකාරම් ගෙවීම් වරින් වර සමාලෝචනය කළ යුතුය.	ප්‍රාග්ධනීකරණ අදියරේදී වත්කම් ආකෘති සොයා ගැනීමට සහ වැරැද්ද නිවැරදි කිරීමට වහාම පියවර ගනු ඇත.	ප්‍රාග්ධනීකරණ කටයුතු කිරීමට අවශ්‍ය පියවර පවතී

	එබැවින්, වත්කම් එම අගයෙන් අඩුවෙන් දක්වා තිබුණි.				
20	හිටපු සේවකයන්ට ලබාදුන් රු. මිලියන 17 ක ණය සහ අත්තිකාරම් වසර අටකට වඩා වැඩි කාලයක් තිස්සේ ගිණුම්වල පැවතුණි. කෙසේ වෙතත්, විගණනය මගින් කරන ලද නියදි පරීක්ෂණයට අනුව, ණය සහ අත්තිකාරම් ලබාගෙන ඇති ඉහත සේවකයන්ගෙන් සියයට 90 කට වඩා වැඩි පිරිසකට, 2011 අගෝස්තු 05 දිනැති පී 12/2011 දරන අධ්‍යක්ෂ මණ්ඩල චක්‍රලේඛයේ අංක 03.5 ඡේදය ප්‍රකාරව නියමිත මුදල් අයකර ගැනීමෙන් තොරව විශ්‍රාම යාමට ඉඩ ලබාදී තිබුණි.	**2023**	එම ශේෂයන් අයකර ගැනීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතු අතර ඒවා අයකර ගැනීමට නොහැකි නම් ලැබිය යුතු මුදල් අයකර නොගෙන සේවකයන්ට විශ්‍රාම යාමට ඉඩ දුන් සේවකයන්ට එරෙහිව පියවර ගත යුතුය	නියමිත ක්‍රමවේදයට අනුව විශ්‍රාම ගිය අයගෙන් මණ්ඩලයට අයවිය යුතු මුදල අයකර ගන්නා ලෙස මුදල් දෙපාර්තමේන්තුවට දැනුම් දී ඇත.	හිඟ ශේෂයන් විසඳීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගන්නා බව දන්වා ඇත.
21	2021 නොවැම්බර් 17 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ රජය සතු ව්‍යවසායන් සඳහා වූ මෙහෙයුම් අත්පොතේ ඡේද අංක 5.1ට පටහැනිව, ඒකාබද්ධ අරමුදලට ලාභ ගෙවීමෙන් තොරව 2023 වර්ෂය සඳහා ප්‍රසාද දීමනා වෙනුවට රු. මිලියන 287.85 ක් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය යටතේ	**2023**	මෙහෙයුම් අත්පොතෙහි අවශ්‍යතාවයට අනුකූල වීම.	ඵලදායිතා මට්ටම් වැඩි වීම අනුව ඵලදායිතා දිරිගැන්වීම් ගෙවා ඇත. ආදායම, එකතු කිරීම, එන්.ආර්.ඩබ්ලිව් යනාදී ඵලදායිතා නිර්ණායක ඇතුළත් සූත්‍රයක් අනුව මෙය ගණනය කර ඇත. උපයන ලද ලාභය සහ නිකුත් කරන ලද රජයේ චක්‍රලේඛ	නිවැරදි කර නොමැත.

	ඵලදායිතා දිරි දීමනාව ලෙස ගෙවා තිබුණි. එම මුදලට අමතරව, සමාලෝචිත වර්ෂය තුළදී වැටුප සමඟ මාසික ඵලදායිතා දීමනාව ලෙස රු. මිලියන 471.39 ක් සේවකයන්ට ගෙවා තිබුණි.				අනුව පමණක් ප්‍රසාද දීමනා ගෙවනු ලබයි. ඒ අනුව ප්‍රසාද දීමනා ගෙවා නැත.	
22	2006 සැප්තැම්බර් 22 දිනැති අංක 30 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය සහ 2021 නොවැම්බර් 17 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ රාජ්‍ය සතු ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතේ 3.2(i) වගන්තිය සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2011 මැයි 23 දිනැති අංක ඩීඑම්එස්/ඊ2/19/4/064 දරන ලිපියෙහි අවශ්‍යතාවයන්ට පටහැනිව මණ්ඩලයේ බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය සහ උසස් කිරීමේ ක්‍රියා පටිපාටිය සඳහා අනුමැතිය 2024 මාර්තු මාසය අවසන් වන විටත් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ලබාගෙන නොතිබුණි.	**2023**		බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය සහ උසස් කිරීමේ ක්‍රියා පටිපාටිය සඳහා අනුමැතිය හැකි ඉක්මනින් ලබා ගත යුතුය.	විශේෂඥ කමිටුවක් විසින් සකස් කරන ලද බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇති අතර සම්මත ආකෘතිය සකස් කිරීම සඳහා ආපසු ලබා දී ඇත. ඉන්පසුව, යෝජිත බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය සමාලෝචනය කරමින් පවතින අතර අවසන් කිරීම සඳහා වෘත්තීය සමිති සමඟ සාකච්ඡා කෙරේ. ඒ අනුව, බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය නැවත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ඇත.	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කරමින් පවතී.
23	2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020	**2023**		අලාභ අයකර නොගැනීම, අලාභ	තථ්‍ය අලාභය මෙතෙක් ගණනය	රක්ෂණ සමාගමෙන් 50%

	දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ අවශ්‍යතාවයන්ට පටහැනිව සාමාන්‍යාධිකාරීවරයාට වෙන් කර තිබූ වාහනයට 2023 අප්‍රේල් 12 වැනි දින මෙම අනතුර සිදු වුවද, එම රිය අනතුරෙන් සිදු වූ රු. මිලියන 13 ක අලාභය පිළිබඳව 2023 දෙසැම්බර් 31 දින වන විටත් ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාට සහ මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුවට මණ්ඩලය විසින් වාර්තා කර නොතිබුණි.		තක්සේරු කිරීමට වසරකට වැඩි කාලයක් ගත කිරීම සහ එසේම සුදුසුකම් ලත් කාල සීමාව තුළ රක්ෂණයෙන් හිමිකම් ලබා නොගැනීම සම්බන්ධයෙන් කළමනාකරණය වගකිව යුතුය	කර නොමැති බැවින් එය පැහැදිලිව හඳුනා ගැනීමෙන් පසුව අදාළ රියදුරුගෙන් පැහැදිලි කිරීම් කැඳවනු ලැබේ.	ක් අත්තිකාරමක් ලැබී ඇති අතර මණ්ඩලයේ වැඩ බිම හරහා අළුත් වැඩියාව සිදුකරමින් පවතී. විනය පරීක්ෂණ කටයුතු අවසන් අතර අලාභය හඳුනාගෙන වැරදිකරුගෙන් අයකරගන්නා බව අමාත්‍යාංශ විගණන කළමනාකරණ කමිටුව වෙත දන්වා ඇත.
24	2020 ජනවාරි 27 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ ඡේද අංක 1.2 අනුව එක් වාහනයක් වෙන් කිරීම වෙනුවට මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයාගෙන් විශේෂ අනුමැතියක් ලබා ගැනීමෙන් තොරව මණ්ඩලයේ වාහන ප්‍රතිපත්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අංක 5/15/2022-898 අනුව සභාපතිවරයාට සහ උප සභාපතිවරයාට වාහන දෙක බැගින් 2022 සහ 2023 වර්ෂවලදී වෙන් කර තිබුණි.	**2023**	චක්‍රලේඛ අවශ්‍යතාවයට අනුකූල වීම සහ පවරා ඇති වාහනවලට අමතරව කරන ලද අමතර වියදම් අයකර ගැනීම.	අවශ්‍යතාවය අනුව වාහන අදාළ අංශ වෙත වෙන් කරයි. මෙම වාහන ලේකම් අංශය වෙත වෙන් කර ඇත	ඉවත්ව ගිය සභාපති සහ උප සභාපති විසින්2024 සැප්තැම්බර් 29 දින එම වාහන මණ්ඩලය වෙත භාරදී ඇති අතර වර්ථමාන සභාපති වරයාට එක් වාහනයක් පමණක් වෙන් කර ඇත. වාහන අව භාවිතයෙන් මණ්ඩලයට දැරීමට සිදුවී ඇති අලාභ අයකිරීමට කටයුතු කර නොතිබුණි.

25	අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ ඡේද අංක 3.2.2 අවශ්‍යතාවයන්ට පටහැනිව අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා නොගෙන 2022 ජනවාරි සිට 2023 ජූලි දක්වා කාලය තුළදී අතිරේක සාමාන්‍යාධිකාරීවරුන් සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන් සඳහා ඉන්ධන ලීටර් 23,313 ක අතිරික්ත ඉන්ධන භාවිතය සඳහා මණ්ඩලය රු. මිලියන 7.4 ක් ගෙවා තිබුණි. මහා භාණ්ඩාගාරයෙන් විශේෂ අනුමැතියක් ලබා ගැනීමෙන් තොරව මණ්ඩලයේ ඉහල කළමණාකරණ මට්ටම්වල නිළධාරීන් වෙත කාර්යාල වේලාවෙන් පසු සහ නිවාඩු දිනයන්හි පුද්ගලික පරිහරණය සඳහා කිලෝමීටරයකට රු. 2 සිට රු. 15 දක්වා සහනදායි මිලකට සීමාවකින් තොරව 1990 වර්ෂයේ සිට මණ්ඩලයේ වාහන භාවිතා කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය ලබා දී තිබුණි. ඒ අනුව, 2022 ජනවාරි සිට 2023 ජූලි දක්වා සේවකයන් 13 දෙනෙකුගේ පෞද්ගලික	**2023**	නිසි අනුමැතියකින් තොරව චක්‍රලේඛයේ විධිවිධාන උල්ලංඝනය නොකළ යුතුය.	පී 19/2008 දරන අධ්‍යක්ෂ මණ්ඩල චක්‍රලේඛයේ දක්වා ඇති සීමාවන්ට වඩා භාවිතා කරන අමතර ඉන්ධන සඳහා නිකුත් කරන ලද චක්‍රලේඛයට අනුව අදාළ අධිකාරිය හරහා අනුමැතිය ලබා ගත හැක.	භාණ්ඩාගාර නිලධාරියෙකුගෙන් සමන්විත කමිටුවක් හරහා භාවිතය අධ්‍යනය කර තීරණ ගන්නා බව අමාත්‍යාංශ විගණන කළමනාකරණ කමිටුව වෙත දන්වා ඇත.

	පරිහරණය සඳහා භාවිත කළ ඉන්ධන ලීටර් 12,010 ක් සඳහා රු. මිලියන 4 ක මණ්ඩලයේ අරමුදල් මණ්ඩලය අවභාවිත කර ඇති බව නියැදි විගණනයේ දී අනාවරණය විය.				
26	2022 ජනවාරි 14 දිනැති අංක 01/2015 (ii) දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයට පටහැනිව මහා භාණ්ඩාගාර ලේකම්වරයාගේ අනුමැතියකින් තොරව මසකට ලීටර් 145 වෙනුවට අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව මණ්ඩලයේ සභාපති සහ උපසභාපතිවරයා විසින් 2021 ජනවාරි මස සිට අසීමිතව ඉන්ධන භාවිතා කර තිබුණි. කෙසේ වෙතත්, පීඊඩී චක්‍රලේඛ අංක 01/2015 හි 3.2.1 ඡේදයට පටහැනිව, 2022 ජනවාරි සිට 2023 ජූලි දක්වා කාලය තුළදී සභාපතිවරයා විසින් භාවිතා කරන ලද රු. මිලියන 2 ක් වටිනා ලීටර් 5,806 ක් සහ උප සභාපතිවරයා විසින් භාවිතා කරන ලද රු. මිලියන 2.3 ක් වටිනා ලීටර් 6,393 ක් සඳහා අනුමැතිය ලබාගෙන නොතිබුණි. තවද, උප සභාපතිවරයාට පවරා ඇති අංක පී.කේ 3575	2023	චක්‍රලේඛ අවශ්‍යතාවයට අනුකූල නොවීමෙන් මණ්ඩලයට සිදුවී අති අලාභ අදාළ වගකිව යුත්තන්ගෙන් අයකලයුතු වීම.	රේඛීය අමාත්‍යවරයාට පැවරී ඇති බලතල අනුව අදාළ රේඛීය අමාත්‍යවරයා විසින් 2021.11.25 දිනැති එස්/25 අංකය දරන ලිපිය මගින් එය අනුමත කර ඇත. උප සභාපතිවරයාට පවරන ලද පීකේ-3575 දරන වාහනය අමාත්‍යාංශ නිලධාරීන් විසින් අවස්ථා කිහිපයකදී භාවිත කර ඇත. නමුත්, මණ්ඩලය විසින් ඉන්ධන වියදමක් දරා නොමැත.	අනුමැතියෙන් තොර ඉන්ධන භාවිතය සඳහා අයකර ගැනීමක් සිදුකර නොමැත.

	දරන වාහනය 2022 සහ 2023 වර්ෂවලදී සාමාන්‍යාධිකාරීවරයාට සහ පාලන අධිකාරියට නොදන්වා බාහිර පාර්ශ්වයක් විසින් භාවිතා කර තිබුණි. එම කාලය තුළදී වාහනය කිලෝමීටර් 13,698 ක් ධාවනය කර තිබුණි.				
27	පූර්ණ වැටුප් අධ්‍යයන නිවාඩු සඳහා නිලධාරීන් විසින් අත්සන් කරන ලද ගිවිසුමේ 13 (ආ) ඡේදය සහ ආයතන සංග්‍රහයේ XV (2013) පරිච්ඡේදයේ 4.7 වගන්තියට පටහැනිව අධ්‍යයන නිවාඩුව අවසන් වීමෙන් පසු මණ්ඩලයට අඛණ්ඩව සේවය සැපයීමට නොහැකි වූ නිලධාරීන් දෙදෙනෙකුගෙන් ශිෂ්‍යත්ව සඳහා කරන ලද වියදම්වල වටිනාකම මණ්ඩලයට ආපසු ගෙවා නොතිබුණි. ඊට අදාල බැඳුම්කර වටිනාකම රු. 20,190,832 කි.	**2022**	ගිවිසුම් කොන්දේසි අනුව මණ්ඩලය විසින් කරන ලද වියදම් සේවකයාගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය	එය නිරවුල් කිරීමට කටයුතු කරමින් ඇත.	අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව දන්වා තිබුණි.
28	1999 සිට 2006 දක්වා වර්ෂයන් තුළ ත්‍රිකුණාමලය, කැලණිය සහ අම්පාර ප්‍රාදේශිකවල සිදු කරන ලද රු. මිලියන 246.64 ක මුදල් වංචාවන් 2021 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගෙන නොතිබුණි. කෙසේ	**2022**	අනාගතයේදී එවැනි තත්ත්වයන් වළක්වා ගැනීම සඳහා අභ්‍යන්තර පාලන ක්‍රියා පටිපාටි ඇති බවට සහතික වීම සහ මණ්ඩලයට සිදු වූ සියලුම පාඩු අයකර ගැනීමට කටයුතු කළ	ත්‍රිකුණාමලය කාර්යාලයේ මූල්‍ය වංචාව සම්බන්ධයෙන් ත්‍රිකුණාමලය මහාධිකරණයේ නඩු 08ක් පවරා ඇත. කැලණිය කාර්යාලයේ මූල්‍ය වංචාව සම්බන්ධයෙන්	නීතිමය ක්‍රියාමාර්ග ගනිමින් ගනිමින් පවතී.

	වෙතත්, ත්‍රිකුණාමලය ප්‍රාදේශිකය හා සම්බන්ධව රු. මිලියන 171.9 ක මුදල් වංචාව අතරින් රු.මිලියන 24.15 ක් පමණක් සමාලෝචිත වර්ෂය අවසානයට වෙනත් ණය ගැතියන් ලෙස වාර්තා කොට තිබුණි. තවද, 2001 වර්ෂය තුළ බණ්ඩාරවෙල ප්‍රාදේශිකයේ සිදු කළ රු. 272,735 ක තවත් මුදල් වංචාවක් 2022 දෙසැම්බර් 31 දින වන විටත් වගකිව යුතු පුද්ගලයින්ගෙන් අය කරගෙන නොතිබුණි.		යුතුය.	අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව කොළඹ මහාධිකරණයේ නඩුවක් පවරා ඇත. මෙම නඩු අතරින් එක් නඩුවකට අදාළ අලාභය, මණ්ඩලයට අලාභය ගෙවා දැමීමෙන් අනතුරුව පියවා ඇත. තවද, නීතිපති දෙපාර්තමේන්තුවද අවශ්‍ය පරිදි කරුණු විමසා ඇති අතර අනෙකුත් නඩු සම්බන්ධයෙන් නීතිපතිවරයාගේ උපදෙස් මත නීතිමය ක්‍රියාමාර්ග ගනිමින් සිටී.	
29	තාක්ෂණික විශේෂඥයින්ගේ නිර්දේශ ලබා ගැනීමෙන් තොරව පානීය ජලය සඳහා ලුණු මිශ්‍ර වීම වැළැක්වීම සඳහා නිල්වලා ලවණ බාධකය ඉදිකිරීම යටතේ රු. මිලියන 5 කට සවි කරන ලද ෂීට් පයිල්ස් ගොවීන්ගේ බලපෑම මත සහ දිස්ත්‍රික් ලේකම්වරයාගේ උපදෙස් මත රු. මිලියන 8 ක් වැය කර ඉවත් කර තිබුණි. තවද, පරිසර අධිකාරියේ කමිටුවක් විසින් නිකුත් කරන ලද වාර්තාවකින් ද මාතර දිස්ත්‍රික්කය ජලයෙන්	**2023**	දරන ලද ව්‍යාපෘති පිරිවැය ඵලදායි කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.	තාක්ෂණික හේතූන් පිළිබඳ පැහැදිලි සාක්ෂි නොමැතිව ගොවීන්ගේ විරෝධතාවයක් හේතුවෙන් මාතර දිස්ත්‍රික් ලේකම්වරයාගේ උපදෙස් පරිදි අඩි 40 ක් දිග ෂීට් පයිල්ස් ඉවත් කර ඇත. එම අවස්ථාවේදීම මෙම ෂීට් පයිල්ස් ඉවත් කිරීමට මණ්ඩලය පැහැදිලි විරෝධයක් දක්වා ඇත. කෙසේ වෙතත්, අනෙකුත් පාර්ශවකරුවන් විසින් මණ්ඩලයේ විරෝධතා	තත්වය එසේම පවතී.

	යටවීමට බාධක ඉදිකිරීම සහ වෙනත් හේතු බලපාන බව අවධාරණය කර තිබුණි. ෂීට් පයිල්ස් ඉවත් කිරීමෙන් පසු මණ්ඩලයේ තත්ත්ව පරීක්‍ෂණ වාර්තා මඟින් ජලයට ලුණු ඇතුළත් වී ඇති බව පෙන්වයි. එබැවින්, ෂීට් පයිල්ස් ඉවත් කිරීමේ පිරිවැය ඵලදායී නොවීය.			සැලකිල්ලට නොගෙන ස්ටීල් ෂීට් පයිල්ස් ඉවත් කිරීමට තීරණය කර තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, දිගුකාලීන බලපෑම සලකා බැලීමේදී මෙම ස්ටීල් ෂීට් පයිල්ස් ඉවත් කිරීම ඵලදායී නොවේ.	
30	2023 දෙසැම්බර් 31 වැනි දිනට යල්පැනගිය, ප්‍රයෝජනයට ගත නොහැකි සහ චලනය නොවන තොග පිළිවෙළින් රු. මිලියන 2.6 ක්, රු. මිලියන 173 ක් සහ රු. මිලියන 552 ක් අපහරණය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමෙන් තොරව පැවතුණු අතර තොග පමාවූ කාලය හඳුනා ගැනීමට වයස් විශ්ලේෂණ මණ්ඩලය විසින් ලබා දී නොතිබුණි	**2023**	ගබඩා කළමනාකරණ ක්‍රියාවලි අත්පොතෙහි දක්වා ඇති උපදෙස් අනුව එම අයිතම ඉවත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.	ගබඩා කළමනාකරණ ක්‍රියා පටිපාටි අත්පොතට අනුව එම වත්කම් පිළිබඳ පශ්චාත් තොග සත්‍යාපනය කරනු ලබන අතර යෝජිත අයි.එම්.එස් වර්ධනයන්ගෙන් පසුව තොග වයස් විශ්ලේෂණය ලබා දෙනු ඇත.	අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතී.
31	වසර තුනකට වඩා වැඩි කාලයක් තිස්සේ පවතින රු. මිලියන 30 ක තොග හිඟය නිරවුල් කිරීමට මණ්ඩලය විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	**2023**	විමර්ශනය අනවශ්‍ය ලෙස ප්‍රමාද නොකළ යුතු අතර එම ප්‍රමාදය නිසා සිදුවන අලාභ වගකිවයුතු නිලධාරීන් විසින් දැරිය යුතුය	මේ වන විට තොග හිඟය පිළිබඳ විස්තරාත්මක විමර්ශනයක් කාර්මික සබඳතා දෙපාර්තමේන්තුව විසින් සිදු කර ඇත.	තොග හිඟය පිළිබඳ විමර්ශනය කර මේ සම්බන්ධයෙන් අවසන් තීරණ දැනුම් දෙන ලෙස කාර්මික සබඳතා දෙපාර්තමේන්තු වට සිහිකැඳවීම් යවා ඇත.

32	2023 වර්ෂයේ භෞතික සත්‍යාපන වාර්තාවලට අනුව, රු. මිලියන 106 ක සමස්ත වටිනාකමකින් යුත් ගොඩනැගිලි, ව්‍යුහයන්, යටිතල පහසුකම්, පරිගණක හා වෙනත් උපකරණ, සමීක්ෂණ උපකරණ, ජංගම උපකරණ ආදිය හානි වී ඇති බව, භාවිතයෙන් ඉවත් කර ඇති බව සහ පිරිවැය මධ්‍යස්ථාන අටකට අදාළව කඩා ඉවත් කර ඇති බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, එම අයිතම අපහරණය කිරීමට සහ ඉවත් කිරීමට නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	**2023**	චක්‍රලේඛ අවශ්‍යතාවයට අනුව.	පශ්චාත් ස්ථාවර වත්කම් සත්‍යාපනය කිරීම සඳහා කමිටුව පත් කර ඇති අතර පශ්චාත් සත්‍යාපන භාවිතා කළ නොහැකි වත්කම් අපහරණය කිරීම වාර්තාවට අනුව හැකි ඉක්මනින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ඇත. අදාළ අනුමැතිය සහිතව ඉතිරි වත්කම් ඉදිරියේදී අපහරණය කරනු ලැබේ.	පිරිවැය ගණකාධිකාරී වරුන්ට අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ලබා ගැනීමටත් භාවිතා කළ නොහැකි වත්කම් අපහරණය කිරීමටත් උපදෙස් ලබා දී ඇත
33	හයිඩ්‍රේටඩ් ලයිම්, ඇලුමිනියම් සල්ෆේට්, බ්ලීචිං පවුඩර්, ක්ලෝරීන්, පොලි ඇලුමිනියම් ක්ලෝරයිඩ් වැනි පරිභෝජන ද්‍රව්‍ය සඳහා තොග මට්ටම් මණ්ඩලය විසින් ස්ථාපිත කර නොතිබුණි. පරිභෝජන ද්‍රව්‍යවල අවශ්‍යතා තක්සේරු කිරීමේදී, තොගවල ආයුකාලය හඳුනා නොගැනීම, නිර්වචනය නොකළ තොග මට්ටම් වැනි එම්.අයි.එස් පද්ධතියේ සීමාවන් ද බලපායි. එබැවින්, තීරණ ගැනීමේදී සමහර අවස්ථාවන්හිදී ද්‍රව්‍ය	**2023**	මණ්ඩලයට වන අනවශ්‍ය වියදම් වලක්වා ගැනීම සඳහා තොග මට්ටම් ස්ථාපිත කිරීම සහ අරමුදල් ඵලදායී ලෙස කළමනාකරණය කිරීම.	ඉදිරියේදී මෙම ගැටලුව විසඳීමට කටයුතු කරනු ඇත.	තවදුරටත් නිවැරදි වී නොමැත.

	අවශ්‍යතා වැරදි ලෙස තක්සේරු කර ඇත.				
34	ගාල්ල ප්‍රදේශයේ අපජල අපහරණ ව්‍යාපෘතිය යටතේ අපජල පවිත්‍රාගාරයක් ඉදිකිරීම සඳහා ඉඩමක් මිලදී ගැනීම සඳහා මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ නීති නිලධාරියාගේ නිර්දේශය මත 2014 අප්‍රේල් මාසයේදී මණ්ඩලය විසින් තක්සේරු වටිනාකමින් රු. මිලියන 21.45 ක් හෙවත් සියයට 30 ක අත්තිකාරමක් එක් ඉඩම් හිමියෙකුට ගෙවා තිබුණි. පසුව, ඉඩමේ අයිතිය සම්බන්ධයෙන් ඇති වූ ආරවුලක් හේතුවෙන්, ගෙවූ අත්තිකාරම් මුදල අයකර ගැනීමට අධිකරණයේ නඩුවක් ගොනු කර තිබුණි. තවද, ඉඩම් හිමියා විසින් ඉඩම මිලදී ගැනීමට පෙර එම ඉඩම මණ්ඩලයට විකිණීමට ඉඩම් හිමියාගේ කැමැත්ත ලබාදී තිබූ බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, 2022 ජුලි 31 දින වන විටත්, ඉඩම් හිමියාගෙන් ගෙවූ අත්තිකාරම්, ඒ සඳහා දඩ මුදල් අයකර ගැනීමට සහ මණ්ඩලයේ වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව කිසිදු පියවරක් ගැනීමට මණ්ඩලය	**2022**	මණ්ඩලයේ වත්කම්වල අයිතිය සුරක්ෂිත බවට සහතික වීම සහ ආරවුලක් ඇති වූ ඉඩම් මිලදී ගැනීමට නිර්දේශ කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව පියවර ගැනීම.	අත්තිකාරම් මුදල් අයකර ගැනීම සඳහා අධිකරණයේ ගොනු කර ඇති නඩුව අධිකරණයේ විභාග වෙමින් පවතින අතර විමර්ශනයෙන් පසු නීති නිලධාරියාට අනතුරු ඇඟවීමේ ලිපියක් නිකුත් කර තිබුණි.	අධිකරණයේ නඩුව විභාග වෙමින් පවතී.

	අපොහොසත් වී තිබුණි.				
35	පොතුවිල් භාර නිලධාරී කාර්යාලයේ තිබුණු රු. මිලියන 10 ක් වටිනා බූව්බල් කැමරා පද්ධතියක් 2017 ජුලි 03 දින අක්කරෙයිපත්තුව කළමණාකාර කාර්යාලයට යවා තිබුණි. කෙසේ වෙතත්, 2022 දෙසැම්බර් මාසය අවසන් වන විටත් එය අලුත්වැඩියා කර නොතිබූ අතර 2022 දෙසැම්බර් 31 දිනට අක්කරෙයිපත්තු කළමණාකාර කාර්යාලයේ භෞතික සත්‍යාපනයේදී එය හඳුනාගෙන නොතිබුණි.	**2022**	කැමරාව අලුත්වැඩියා කිරීමට පියවර ගැනීම සහ භාණ්ඩ සමීක්ෂණයේදී කැමරාව සත්‍යාපනය නොවීමට හේතුව පරීක්ෂා කිරීම.	එය අලුත්වැඩියා කිරීමේ කටයුතු සිදුවෙමින් පවතී.	අලුත්වැඩියා කටයුතු සිදුකර නොමැත.
36	පිරිවැය මධ්‍යස්ථාන අතර පැවරු රු. 43,500,242 ක වත්කම් මූලික පිරිවැය මධ්‍යස්ථානවල ගිණුම්වලින් ඉවත් කර නොතිබුණි. එබැවින්, එම වත්කම්වල වගකීම් එම වත්කම් භාවිතා නොකරන පිරිවැය මධ්‍යස්ථාන වෙත පැවරේ.	**2022**	වත්කම් පැවරීම සම්බන්ධයෙන් නිසි වාර්තා තබා ගැනීමේ වගකීම එම පිරිවැය මධ්‍යස්ථාන භාර නිලධාරියාට පැවරිය යුතුය.	විගණන විමසුම සමඟ එකඟ වන අතර වත්කම් එක් පිරිවැය මධ්‍යස්ථානයකින් තවත් පිරිවැය මධ්‍යස්ථානයකට මාරු කිරීමේදී වත්කම් පැවරීමේ ආකෘති පත්‍ර ඉදිරිපත් නොකිරීම හේතුවෙන් මෙම තත්ත්වය උද්ගත වී ඇත. නිවැරදි පියවරයන් ලෙස නිසි වාර්තා තබා ගැනීමට අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත.	තවදුරටත් නිවැරදි වී නොමැත.

37	2014 ඔක්තෝබර් 10 වැනිදා සිට කොළඹ දකුණ කාර්යාල අවකාශය සඳහා කොළඹ මහ නගර සභාව සමඟ බදු කුලිය මණ්ඩලය විසින් සංශෝධනය කර නොතිබුණි. තවද, 2014 ඔක්තෝබර් සිට මේ දක්වා කුලී සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි.	**2022**	ගිවිසුමේ කොන්දේසි අනුගමනය කළ යුතුය	ගිවිසුමක් පවතින අතර එය විගණකාධිපතිවරයාට ඉදිරිපත් කරනු ඇත.	තවදුරටත් නිවැරදි වී නොමැත.
38	රු. 11,276,750 ක් වූ සේවක ආරක්‍ෂක තැන්පතුවෙන් රු. 7,434,562 ක් විශ්‍රාමික සේවකයින්ගේ ආරක්‍ෂක තැන්පතුවෙන් සමන්විත වන අතර එය විශ්‍රාම යාමේදී පියවා නොතිබුණි. තවද, 1980 ඔක්තෝබර් 07 දිනැති මණ්ඩල චක්‍රලේඛ අංක 80/28, අගයන් වැඩි දියුණු කිරීම සඳහා යාවත්කාලීන කර නොතිබූ අතර චක්‍රලේඛයේ හඳුනාගත් තනතුරු 14 වෙනුවට තනතුරු දෙකක් සඳහා පමණක් ආරක්ෂක තැන්පතු ලබාගෙන තිබුණි.	**2022**	සේවකයින් විශ්‍රාම ගිය විට ආරක්ෂක තැන්පතු නිරවුල් කළ යුතු අතර යාවත්කාලීන කොන්දේසි සඳහා චක්‍රලේඛය සංශෝධනය කළ යුතුය.		ශේෂයන් නිවැරදි කරීමට කටයුතු කරමින් ඇති අතර චක්‍රලේඛය යාවත්කාලීන කර ඇත.
39	තාක්ෂණික කමිටුව හරහා සුදුසු ඉඩම් තෝරා නොගැනීම, අවශ්‍යතාවයට ප්‍රමුඛතාවය නොදීම, ඉඩම්වල ආරක්‍ෂාව තහවුරු නොකිරීම සහ	**2022**	ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය විධිමත් කළ යුතුය.	ඉඩම් අත්පත් කර ගැනීමේ පනත මඟින් මණ්ඩලය සඳහා ඉඩම් අත්පත් කර ගැනීම සිදු කරනු ලබන අතර, ඒ සඳහා පියවර	ඉඩම් පිළිබඳ දත්ත රැස්කරමින් පවතී.

	අනවසර පදිංචිය සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීම ප්‍රමාද කිරීම හේතුවෙන් ව්‍යාපෘති සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ සැලකිය යුතු ප්‍රමාදයක් නිරීක්ෂණය විය. තවද, ඉඩම් සඳහා දත්ත පද්ධතියක් මණ්ඩලය විසින් ස්ථාපිත කර නොතිබුණි.			මාලාවක් අනුගමනය කරන අතර සම්පූර්ණ කිරීමට වසර කිහිපයක් ගත වේ.	
40	2000 වසරට පෙර මිලදී ගත් රු. 2,000,000 ක පිරිවැයක් සහිත නල කපන යන්ත්‍රයක් අක්‍රිය තොගයක් ලෙස බටහිර නිෂ්පාදන ප්‍රාදේශීය සහාය මධ්‍යස්ථානයේ ගබඩාවේ පැවතුණි.	**2022**	තාක්ෂණය කල් ඉකුත් වීමට පෙර යන්ත්‍රය භාවිත කළ යුතු අතර දීර්ඝ කාලයක් වත්කම් අක්‍රිය කිරීම සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරීන්ගෙන් විමසිය යුතුය.	එය තවමත් නිකුත් කර නොමැති බැවින් එය තොගයේ ඇත. එය නිකුත් කරන විට එය ප්‍රග්ධනීකරණය කරනු ලැබේ.	තවදුරටත් එසේම පවතී.
41	ප්‍රාදේශීය සහාය සේවා මධ්‍යස්ථානයේ (බටහිර නිශ්පාදන) නිල නිවාස වල පදිංචි නිලධාරීන් 11 දෙනෙකුගෙන් නියමිත නිවාස කුලියට වඩා අඩු කුලියක් අය කිරීම හේතුවෙන් රු.1,432,839ක මුදලක් මණ්ඩලයට අහිමි වී තිබුණි.	**2021**	නිල නිවාස වල පදිංචි නිලධාරීන්ගෙන් නියමිත කුලියට වඩා අඩු කුලියක් අය කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්ගන් අලාභය අය කර ගැනීමට කටයුතු කළ යුතු වීම.	නිල නිවාස සංග්‍රහය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලැබීමෙන් අනතුරුව අනු කමිටුවේ නිර්දේශ අනුගමනය කරමින් සෑම ප්‍රාදේශීය සහාය සේවා මධ්‍යස්ථානයකම නිවාස කුලී ක්‍රියාත්මක කරනු ලැබේ.	විගණන නිර්දේශ ක්‍රියාත්මක කර නැත.
42	මණ්ඩලය විසින් 1981 වර්ෂයේදී නිල නිවාස හා ගබඩාවක් ඉදි කිරීම	**2021**	මණ්ඩලයේ වත්කම් වල හිමිකාරීත්වය	කළුතර ඉඩමට අදාලවමානව සම්පත් අංශය මගින්	නඩුව අධිකරණයේ විභාග වෙමින්

සඳහා කළුතර ප්‍රදේශයේ ඉඩමක් අත්පත් කර ගෙන තිබූ අතර 1991 වර්ෂයේදී එම ඉඩමේ හිමිකරුවන්ට වන්දි ගෙවීම සඳහා රු.531,000ක් කළුතර දිස්ත්‍රිකකයේ ආණ්ඩුකාරවරයාට හා රු.106,980 ක මුදලක් තක්සේරු දෙපාර්තමේන්තුවටත් ගෙවා තිබුණි. කෙසේ වෙතත්, මණ්ඩලයේ කළමනාකාරීත්වය විසින් ඉඩම ආරක්ෂා කිරීම සඳහා පූර්ව ක්‍රියාමාර්ග ගැනීමට අසමත් වීම හේතුවෙන් එම ඉඩමෙහි දැනටමත් අනවසරයෙන් පවුල් කිහිපයක් පදිංචි වී තිබුණි. කෙසේ වෙතත්, වසර 41 ක් තිස්සේ මෙම ඉඩමේ හිමිකාරීත්වය ආරක්ෂා කර ගැනීමට මණ්ඩලයේ නීති නිලධාරීන් දෙදෙනාගේ කිසිදු ක්‍රියාකාරී මැදිහත්වීමක් සිදු වී නොමැති බව නිරීක්ෂණය විය.ඒ වෙනුවට මෙම කරුණ මෙහෙයවීමට සමාලෝචිත වර්ෂය අවසානයට රු.3,472,875ක වියදමක් දරා බාහිර නීතිඥයෙකු ලබාගෙන තිබුණි..තවද, දෙහිවල ජලාශය දිගු කිරීම සඳහා ලබා ගන්නා ලද තවත්	ආරක්ෂා වී ඇති බව සහතික විය යුතු වීම.	බාහිර නීතිඥයකු බඳවා ගෙන ඇති අතර මෙම නඩුව අධිකරණයේ විභාග වෙමින් පවතී. දෙහිවල ඉඩමට අදාල ක්‍රියාත්මක කිරීමේ ආඥාව ක්‍රියාත්මක වෙමින් පවතී. අනවසර පදිංචිකරුවන් ඉවත් කරන ලෙස ගල්කිස්ස මහේස්ත්‍රාත් අධිකරණයෙන් නියෝගයක් නිකුත් කර ඇත.	පවතින අතර බාහිර නීතිඥයකු හරහා පෙනී සටී .

	ඉඩමක් සඳහා 1981 දී භුක්තියේ හිමිකම ලැබීමත් ඉඩම සුරක්ෂිත කිරීමට පියවර ගැනීමට කළමනාකාරීත්වය අසමත් වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එහි අනවසර පදිංචිකරුවන් 08 දෙනෙකු පදිංචි වී තිබුණි.				
43	මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2023 දෙසැම්බර් 31 දිනට දේශීය මිලදී ගැනීම් මත මාර්ගස්ථ තොගය සහ ආනයනික මාර්ගස්ථ තොගය පිළිවෙළින් රු. මිලියන 1,246 ක් සහ රු. මිලියන 4,827 ක් විය. එම තොග අතරින්, රු. මිලියන 642 ක් වූ දේශීය මිලදී ගැනීම් නිරවුල් කිරීමෙන් තොරව මාස තුනකට වැඩි කාලයක් තිස්සේ පැවතුණු අතර රු. මිලියන 3,070 ක් වූ ආනයනික මාර්ගස්ථ තොග නිරවුල් කිරීමෙන් තොරව වසර දෙකකට වැඩි කාලයක් තිස්සේ පැවතුණි.	**2023**	දිගුකාලීන මාර්ගස්ථ තොග ශේෂ විමර්ශනය කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු අතර මූල්‍ය ප්‍රකාශනවල මාර්ගස්ථ තොග හඳුනාගැනීමේ නිරවද්‍යතාවය සහතික කිරීම	ණයවර ලිපි මගින් ආනයනය කරන ලද තොග සඳහා සම්පූර්ණ පිරිවැය වෙන් කිරීම සඳහා මෙම ගිණුම් පාලන ගිණුම් ලෙස ක්‍රියා කරයි. සාමාන්‍යයෙන් එක් ණයවර ලිපියකට සම්පූර්ණ කළ යුතු තොග කිහිපයක් හෝ ලොට්ස් කිහිපයක් පවතී. සියලුම තොග සම්පූර්ණ කරන තුරු ණයවර ලිපි පාලන ගිණුම්වල ශේෂයන් නිරවුල් කළ නොහැක.	**2024** වර්ෂයේදී නිවැරදි කරන බව දන්වා ඇත.
44	ගම්පහ, අත්තනගල්ල සහ මිනුවන්ගොඩ ජල සම්පාදන ව්‍යාපෘතිය සඳහා චීන සංවර්ධන බැංකුව විසින් ලබා දී ඇති ණය සඳහා වන සහන කාලයෙන් පසුව, සමාලෝචිත වර්ෂය	**2023**	අනාර්ථික පිරිවැය අවම කර ගැනීම සඳහා ව්‍යාපෘති ක්‍රියාකාරකම් කඩිනම් කළ යුතුය.	රටේ අතුරු ණය ප්‍රතිපත්තිය හේතුවෙන් 2022 අප්‍රේල් මාසයේ සිට අයි.පී.සී ගෙවීම් කොන්ත්‍රාත්කරු වෙත සිදු කර නොමැත. එස්ක්‍රෝ	එකී ණය මුදල ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා චීන සංවර්ධන බැංකුව සමඟ සාකච්ඡා කරමින් පවතින අතර සාකච්ඡා අවසන් වූ පසු

	අවසානයේදී එ.ජ.ඩො මිලියන 45 ක ණය වාරික හයක් ගෙවා තිබුණි. කෙසේ වෙතත්, චීන සංවර්ධන බැංකුව විසින් ලබා දී ඇති ණයවලින් රු. මිලියන 16,836.51 ට සමාන එ.ජ.ඩො මිලියන 52 ක මුදලක් හෙවත් ණය මුදලින් සියයට 29 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ව්‍යාපෘති කටයුතු සඳහා යොදා නොගෙන එස්ක්‍රෝ ගිණුමේ රඳවා ගෙන තිබුණි.			ගිණුමේ පවතින ඉතිරි අරමුදල් ලබා ගැනීම සඳහා සී.ඩී.බී සමඟ සාකච්ඡා කර ඇති අතර අයි.එම්.එෆ් සමඟ රජයේ සාකච්ඡා අවසන් කිරීමෙන් පසු හිතකර විසඳුමක් අපේක්ෂා කෙරේ.	මෙම ගිණුම සඳහා අදාළ නිවැරදි කිරීම් සිදු කරන බව දන්වා තිබුණි.
45	රු .මිලියන 33 ක වියදමින් ඉදිකරන ලද ජල සම්පාදන යෝජනා ක්‍රම හතරක කාර්යාල නිල නිවාස 13 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විට ප්‍රෙයා්ජනයට නොගෙන පැවතුණි	**2023**	නිලධාරීන්ගේ නිල නිවාස සම්පූර්ණයෙන් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය.	අවශ්‍ය පරිදි අලුත්වැඩියා කිරීමෙන් පසුව කාර්ය මණ්ඩල නිල නිවාස අනාගතයේදී භාවිතා කරනු ඇත.	අනාගතයේදී භාවිතා කිරීමට සැලසුම් කර ඇත.
46	ඉගිනියාගල සහ වඩිනාගල සහ දමන ජල සම්පාදන යෝජනා ක්‍රමවලට අදාළව පිළිවෙලින් රු. මිලියන 5.5 ක් සහ රු. මිලියන 9 ක් වටිනා සියලුම ඉදිකිරීම් 2001 වර්ෂයේ සිට අක්‍රියව පැවති අතර එම වත්කම් ප්‍රයෝජනයට ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	**2023**	වත්කම් ඵලදායී ලෙස භාවිතා කිරීමට කටයුතු සම්පාදනය කිරීම.	මේවා අතහැර දමා ඇති නමුත් අනාගතයේදී මේවා අනාගත භාවිතය සඳහා පුනරුත්ථාපනය කරනු ලැබේ. ඉඟිනියාගල ජල පොම්පය මහඔය ඩබ්ලිව්.එස්.පී (එම්.ටී.එන් 16501) වෙත භාරදී ඇත. බෙදාහැරීමේ පද්ධතිය පරගහකැලේ	අදාල උපකරණ කාර්යාලවලට භාර ගැනීමට කටයුතු කරමින් පවතී.

				ඩබ්ලිව්.එස්.එස් වෙත සම්බන්ධ කර ඇත. වැවේ සිට පැරණි ඉන්ටේක් ලයින් විකල්ප භාවිතයන් සඳහා වෙන් කර ඇත.	
47	අම්පාර, මොණරාගල හා මඩකලපුව ප්‍රදේශ සඳහා ජල සැපයුම් ලබා දීම සඳහා අම්පාර ජල සම්පාදන (අදියර III) ව්‍යාපෘතිය රු.මිලියන 20,825 ක ඇස්තමේන්තු වටිනාකමකට 2010 නොවැම්බර් මස ආරම්භ කර 2015 දෙසැම්බර් නිම කළ යුතුව තිබුණි. ව්‍යාපෘතියේ සංරචක II යටතේ 2014 අගෝස්තු හා 2015 මාර්තු නිම කිරීමේ සැලසුම් සහිතව ජල කුළුණු 06ක් ඉදිකිරීමට සැලසුම් කර තිබූ අතර 2013 ජනවාරි සහ මාර්තු කොන්ත්‍රාත් ප්‍රදානය කර තිබුණි. කෙසේ නමුත් කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යසාධනය හේතුවෙන් 2020 අගෝස්තු 24 දින එය අවලංගු කර තිබුණි. ඒ අනුව රු.30,351,710ක පිරිවැයක් දරා අඩක් නිම කළ ජල කුළුණු 06 හා රු.15,790,210ක් වටිනා ඩීඅයි නල හා උපාංග 2022 පෙබරවාරි අවසානය වන විටත් නිශ්කාර්යව පැවතුණි.	**2021**	ව්‍යාපෘතියේ අරමුණු සඵලදායීව ඉටු කර ගැනීම සඳහා අඩක් ඉදි කල ජල කුළුණු හා ඩීඅයි නල හා උපාංග භාවිතයට අවශ්‍ය කඩිනම් පියවර ගත යුතු වීම.	මෙම වැඩබිම් 06 දිගු කාලයක් තිස්සේ දුර්වල කාර්යසාධනයක් පෙන්වූ බැවින් හා කොන්ත්‍රාත්කරු ලබා දී ඇති කාලයට ඉලක්ක ලඟා කර ගැනීමට අපොහොසත් වූ බැවින් මෙම කොන්ත්‍රාත්තු අවලංගු කරන ලදී. ඉහත ජල කුළුණු වල ඉතිරි වැඩ සඳහා වූ කොන්ත්‍රාත්තුවට 2021 මාර්තු 10 දින නව කොන්ත්‍රාත් ලෙස ලංසු කැඳවා ඇති අතර රටේ වත්මන් ආර්ථික තත්වය හේතුවෙන් අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ පිරිනැමීම අපේක්ෂාවෙන් සිටී. තවද, සෘජු පොම්ප කිරීම නිසා පීඩනය වැඩි වීම හේතුවෙන් නිතර පුපුරා යාම්, ආදායම් නොලබන ජලය ඉහළ යාම් ආදී නිසා මෙහෙයුම් හා නඩත්තු අංශය නොයෙකුත්	2024 සැප්තැම්බර් 30 වන දින වන විටත් නිවැරදි නොවී නිශ්කාර්ය තත්වයේ පවතී.

				අපහසුතා වලට මුහුණ දේ. එබැවින් මෙම ජල කුළුණු 06 ඉදි කිරීම වැදගත් වේ.	
48	මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති නැවත ක්‍රමෝපාය කිරීම සහ වේගවත් කිරීම සම්බන්ධයෙන් 2022 සැප්තැම්බර් 05 දිනැති සහ අංක. 22/1286/604/022 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් ලබා දී ඇති නියෝග අනුව, 2022 දෙසැම්බර් 31 දිනට නිම කළ යුතු ව්‍යාපෘති හතක් 2022 දෙසැම්බර් 31 දිනට නිම කර නොතිබූ අතර තාවකාලිකව අත්හිටුවිය යුතු ව්‍යාපෘති 12 ක් තවමත් අත්හිටුවීමේ ක්‍රියාවලියේ පවතී. තවද, 2023 වසර තුළදී ව්‍යාපෘති 10 ක් සම්පූර්ණ කිරීමටත්, 2023 වර්ෂයේදී ව්‍යාපෘති දෙකක් තාවකාලිකව අත්හිටුවීමටත් කමිටුව නිර්දේශ කර තිබුණි. කෙසේ වෙතත්, එම ව්‍යාපෘති සඳහා සැලකිය යුතු මුදලක් වැය කර තිබුණද, එම ව්‍යාපෘතිවලින් අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීමට නොහැකි විය.	**2022**	දැනට ක්‍රියාත්මක ව්යාපෘති සඳහා අමාත්‍ය මණ්ඩල තීරණයෙන් ලබා දී ඇති උපදෙස් අනුව කටයුතු කළ යුතුය.	අවශ්‍ය සියලුම සංශෝධන සහිතව ව්‍යාපෘති නැවත ක්‍රමෝපාය කිරීමට දැනටමත් කටයුතු කර ඇත.	2022 වසරේ අවසන් විය යුතු ව්‍යාපෘති 7න් 3ක් පමණක් අවසන් කර තිබූ අතර තාවකාලිකව අත් හිටවිය යුතු ව්‍යාපෘති 12න් 04ක් පමණක් දඅත්හිටුවා තිබුණි. 2023 වර්ෂය වන විට අවසන් කල යුතු ව්‍යාපෘති 10 න් කිසිවක් අවසන් කර නොතිබුණි.
49	මණ්ඩලය විසින් අපහරණය කරන ලද වාහන 196 ක් තවමත්	**2022**	වාහනවල ලියාපදිංචි සහතික කඩිනමින් අවලංගු	එය විමර්ශනය කරමින් පවතින අතර වාහන 196 ක්	ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත.

	මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ මණ්ඩලය නමින් ලියාපදිංචි කර ඇති අතර ලියාපදිංචි කළ වාහන 32 ක් හඳුනාගත නොහැක.		කිරීමට කටයුතු කළ යුතු අතර වාහනවල මණ්ඩලයේ නම ලියාපදිංචි ලේඛනයෙන් ඉවත් කිරීම සහ වාහන 32 සම්බන්ධයෙන් විශේෂ පරීක්ෂාවක් සිදුකිරීම.	මණ්ඩලය විසින් වරින් වර අපහරණය කර ඇත.	
50	මණ්ඩලයට ජල මීටර ප්‍රසම්පාදනය සඳහා අරමුදල් නියෝජිතායතනයේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව මහ කොළඹ ජල හා අපජල කළමණාකරණ වැඩිදියුණු කිරීමේ ආයෝජන ව්‍යාපෘතියේ අරමුදල් හරහා බැදීම් ගාස්තු ලෙස අමතර රු. මිලියන 67 ක් මණ්ඩලය විසින් ගෙවා තිබුණි. එබැවින්, එම කොන්ත්‍රාත්තු මගින් මිළදී ගත් ජල මීටරයක මිල රු. 720.98 කින් හෙවත් සියයට 12.93 කින් වැඩි වී තිබුණි. කෙසේ වෙතත්, ජල මීටර 44,701 ක් සහ 253,009 ක් පිළිවෙලින් 2022 සහ 2023 වසර අවසානයේදී තොගයේ පැවතුණි.	**2023**	විෂය පථයෙන් බැහැර ක්‍රියාකාරකම් සඳහා අරමුදල් නියෝජිතායතනයේ අනුමැතිය ලබා ගත යුතු අතර මණ්ඩලයට දැරීමට සිදුවන අනාර්ථික පිරිවැය වළක්වා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.	එවකට රටේ පැවති තත්ත්වය අනුව අඛණ්ඩ ජල සැපයුමක් ලබාදීමට සහ පශ්චාත් කොවිඩ් කාලපරිච්ඡේදයෙන් පසුව හා ආර්ථික අර්බුදය තුළදී එම අරමුණ ඉටු කිරීමට, ලංකා බැංකුවට ප්‍රමාණවත් ඩොලර් ද්‍රවශීලතාවයක් නොමැති බැවින් GCWWMIP ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්කරුවන් ගේ ඩොලර් ගිණුම හරහා ණයවර ලිපි විවෘත කිරීමට ඉහළ කළමනාකාරීත්වය තීරණයක් ගෙන ඇත.	අනුමැතිය ලබාගෙන නොතිබුණි.

51	කොන්ත්‍රාත් අංක Sup&MM/chem/HL-01/2021/22 යටතේ වන ලංසු ලියකියවිලිවල ඇමුණුම් 12 අවශ්‍යතාවය ප්‍රකාරව පූර්ව සුදුසුකම් සපුරා නොමැති කොන්ත්‍රාත්කරු වෙත ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය මත ඇස්තමේන්තුගත මිලට සාපේක්ෂව රු. මිලියන 49.37 ක අවාසිදායක විචලනයක් සහිතව හයිඩ්‍රේටඩ් ලයිම් මෙට්‍රික් ටොන් 2500 ක් ප්‍රසම්පාදනය කිරීමට මණ්ඩලය විසින් කොන්ත්‍රාත් පිරිනමා තිබුණි.	**2023**	මේ පිළිබඳ විධිමත් පරීක්ෂණයක් පැවැත්විය යුතුය..	මුලදී අඩුම ලංසුකරු වෙත කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබූ අතර කොන්ත්‍රාත්කරු පරාමිති මැංගනීස් අන්තර්ගතය සඳහා නිදහස් කිරීමක් ඉල්ලා ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, කොන්ත්‍රාත්තුව අවලංගු කරන ලද අතර, තොග හිඟ තත්ත්වය, කොන්ත්‍රාත් ගිවිසුම සඳහා ගතවන කාලය, ණයවර ලිපි විවෘත කිරීමේ ප්‍රමාදයන්, නිෂ්පාදනය හා නැව්ගත කිරීමේ කාලය සහ විශේෂ කමිටු නිර්දේශ සැලකිල්ලට ගනිමින් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම සඳහා ඊළඟ ලංසුකරුවා සලකා බලන ලදී.	තත්වය එසේම පවතී.
52	ජල මීටර් ප්‍රසම්පාදනය කිරීමේදී, කොන්ත්‍රාත් අංක DGM/M&E/WM/15/2021/09 යටතේ ආර්ථික අර්බුදය පැවති අවස්ථාවේදී ණයවර ලිපි විවෘත කිරීම ප්‍රමාද වූ කාලය තුළදී රුපියලේ	**2023**	තීරණ ගැනීමේදී පිරිවැය සලකා බැලිය යුතුය	එවකට රටේ පැවති තත්ත්වය අනුව අඛණ්ඩ ජල සැපයුමක් ලබාදීමට සහ පශ්චාත් කොවිඩ් කාලපරිච්ඡේදයෙන් පසුව හා ආර්ථික අර්බුදය තුළදී එම	තත්වය එසේම පවතී. පසු ප්‍රසම්පාදනයන්හි දීද ඇස්තමේන්තුගත වටිනාකමට සාපේක්ෂව ඉහල වටිනාකම්වලට ප්‍රසම්පාදනය

	අගය අවප්‍රමාණය වීම සඳහා රු. මිලියන 48.97 ක් ගෙවා තිබුණි. තවද, තෝරාගත් කොන්ත්‍රාත්කරු විසින් කොන්ත්‍රාත්තුව ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් මෙම කොන්ත්‍රාත්තුව සඳහා ඇස්තමේන්තුගත වටිනාකම වූ රු. මිලියන 83.58 හා සසඳන විට රු. මිලියන 167.39 ක් වැය කර තිබුණි.			අරමුණ ඉටු කිරීමට, ලංකා බැංකුවට ප්‍රමාණවත් ඩොලර් ද්‍රවශීලතාවයක් නොමැති බැවින් GCWWMIP ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්කරුවන් ගේ ඩොලර් ගිණුම හරහා ණයවර ලිපි විවෘත කිරීමට ඉහළ කළමනාකාරීත්වය තීරණයක් ගෙන ඇත.	පිරිනමා තිබුණි.
53	මූල්‍ය හැකියාව නොමැති වීම හේතුවෙන් තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ප්‍රතික්ෂේප කරන ලද කොන්ත්‍රාත්කරුට එ.ජ.ඩො 765,000 ක් සහ රු. මිලියන 9.9 ක් වටිනා ඇලුමිනියම් සල්ෆේට් ටොන් 3,000 ක් සැපයීම සහ භාර දීම සඳහා ප්‍රසම්පාදන කමිටුව විසින් කොන්ත්‍රාත්තුවක් පිරිනමා තිබුණි. කෙසේ වෙතත්, භාණ්ඩ සැපයීමට අපොහොසත් වීම හේතුවෙන් කොන්ත්‍රාත්කරු වෙතින් ඇවර කළ අලාභ ඉල්ලීමෙන් තොරව මණ්ඩලය කොන්ත්‍රාත්තුව අවසන් කර තිබුණි.	**2022**	භාණ්ඩ සැපයීමට අපොහොසත් වීම හේතුවෙන් කොන්ත්‍රාත්කරු ගෙන් අලාභ අය කළ යුතුය.	පිළිතුරු සපයා නොමැත.	තත්වය එසේම පවතී.

54	කද්දුව පොම්පාගාරය සඳහා රු. මිලියන 45.93 කට මිළදී ගත් පොම්ප හතරක් ආරම්භයේ සිටම නිසි පරිදි ක්‍රියාත්මක නොවීය. දෝෂ වගකීම් කාලය තුළදී එම දෝෂ නිවැරදි කිරීමට කොන්ත්‍රාත්කරු යොමු නොවීම නිසා හඳුනාගත් දෝෂ නිවැරදි කිරීම සඳහා මණ්ඩලය විසින් මණ්ඩලයේ මුදල් වැය කර තිබුණි. කෙසේ වෙතත්, දෝෂ වගකීම් කාලය 2022 අප්‍රේල් 22 දිනෙන් අවසන් වන විටත් දෝෂ නිවැරදි කිරීම සඳහා මණ්ඩලය විසින් දරන ලද පිරිවැය අයකර ගැනීමට සහ කොන්ත්‍රාත්තුවේ කොන්දේසි කඩකිරීමට එරෙහිව ක්‍රියා කිරීමට මණ්ඩලය විසින් ක්‍රියා කර නොතිබුණි.	**2023**	මණ්ඩලය විසින් දරන ලද පිරිවැය,රඳවා ගත් මුදල් හා කාර්ය සාධන බැඳුම්කරය හරහා ආවරණය කර ගත යුතුය.	දෝෂ නිවැරදි කිරීම සඳහා දරන ලද පිරිවැය අයකර ගැනීමට මණ්ඩලය ගෙන ඇති ක්‍රියාමාර්ග සම්බන්ධයෙන්, අලාභ සඳහා වන්දි වශයෙන් කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතු රඳවා ගැනීමේ මුදල් ගෙවා නොමැත.	තවදුරටත් කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතු මුදල් රඳවා ගෙන ඇත.
55	ඉතිරි වැඩ අවසන් කිරීමට අපොහොසත් වූ කොන්ත්‍රාත්කරුට එරෙහිව පියවර ගැනීමෙන් තොරව මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති නැවත ක්‍රමෝපාය කිරීම සහ වේගවත් කිරීම පිළිබඳ කමිටුවේ නිර්දේශ අනුව මණ්ඩලය විසින් මාතර අදියර IV ව්‍යාපෘතිය අන්‍යෝන්‍ය වශයෙන් අවසන් කර තිබුණි. ඉඩම අත්පත් කර ගැනීම ප්‍රමාද වීම හේතුවෙන්	**2023**	අනවශ්‍ය ප්‍රමාදයන් සහ මණ්ඩලයට සිදුවන පිරිවැය වළක්වා ගැනීම සඳහා කොන්ත්‍රාත් ගිවිසුමට එළඹීමට පෙර ඉඩම් නිරවුල් කර ගත යුතුය.	මාතර අදියර IV ඩබ්ලිව්.එස්.පී ව්‍යාපෘතිය අන්‍යෝන්‍ය වශයෙන් අවසන් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී ඇත. ඉඩම් හිමිකරු මණ්ඩලයට එරෙහිව අධිකරණයේ නඩුවක් ගොනු කරන ලද අතර රටේ පැවති කොවිඩ් 19 වසංගතය සහ මූල්‍ය	තත්වය එසේම පවතී.

	මෙම ව්‍යාපෘතිය යටතේ මණ්ඩලය විසින් ප්‍රමාද ගාස්තු ලෙස රු. මිලියන 72.7 ක් හා ඇ.ඩො. මිලියන 2.1 ක් ගෙවා තිබුණි. ගනු ලැබූ අවිධිමත් තීරණ හේතුවෙන් ව්‍යාපෘතිය ප්‍රමාද වීම මත විනිමය අනුපාත වෙනස්කම් ලෙස තවත් රු. මිලියන 1,715 ක් ගෙවා තිබුණි. තවද, ව්‍යාපෘති කොන්ත්‍රාත්තුව අවසන් කිරීමෙන් පසු වසරක කාලයක් සඳහා කොන්ත්‍රාත් සේවකයින් සඳහා රු. මිලියන 30 ක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව ගෙවා තිබුණි.			අර්බුදය හේතුවෙන් ව්‍යාපෘතිය ප්‍රමාද විය. මෙහෙයුම් සහ නඩත්තු කටයුතු අත්‍යවශ්‍ය කාර්යයන් වන බැවින් මෙම කාර්යයන් දැනට සිටින කාර්ය මණ්ඩලය සමඟ සිදු කළ නොහැක	
56	2023 මැයි 28 දිනට ගිවිසුම්ගත ණය කාලසීමාව අවසන් වී ඇතත් මහනුවර උතුර - පාතදුම්බර ජල සම්පාදන ව්‍යාපෘතියේ ව්‍යාපෘති කාලය දීර්ඝ කර නොතිබුණි. ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 88 ක් වූ අතර කොන්ත්‍රාත්තුවේ හිඟ වටිනාකම රු. බිලියන 12 ක් විය. විදුලි සම්බන්ධතා ගාස්තු රු. මිලියන 102 ක් නොගෙවීම හේතුවෙන් පොම්පාගාරය සහ සේවා ටැංකි 25 ක් ක්‍රියාත්මක කිරීමට	**2023**	ව්‍යාපෘතියේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමට අරමුදල් සැපයිය යුතුය.	කොන්ත්‍රාත්කරුවන්ට නොගෙවීම හේතුවෙන් තීරණාත්මක වැඩ නිම කිරීම ප්‍රමාද වීමෙන් ජනන යන්ත්‍ර සහ පොම්ප යන දෙකෙහිම පරීක්ෂණ පැවැත්වීමට නොහැකි වී ඇත.	තොග මීටර් 34 ක් ලබාගැනීම මූල්‍ය අර්බුදය නිසා අත්හිටුවා ඇත. වැල්වයන් බොහොමයක් මණ්ඩලයේ මෙහෙයුම් හා නඩත්තු අංශයන් විසින් ප්‍රතිස්ථාපනය කර ඇති නිසා මණ්ඩලයේ හා ව්‍යාපෘතියේ අවශ්‍යතාවය මත භාවිතා කරන බව දන්වා ඇත. විදුලි සම්බන්ධතා

	නොහැකි විය. එ.ජ.ඩො 8,840,917 කට මිළදී ගෙන සවි කර ඇති පොම්ප 16 ක් සහ ජනක යන්ත්‍ර 6 ක් භාවිත කර නොතිබුණි. ව්‍යාපෘතිය මගින් තොග මීටර 15 ක් සහ වැල්වයන් 132 ක් සවි කිරීමට සැලසුම් කර තිබුණද තොග මීටර් 15 ක් පමණක් සවි කර තිබුණි.				ගාස්තු කොන්ත්‍රාත්කරු ගෙවීමෙන් පසු විදුලි බලය ලබාගැනීමත් සමඟ පොම්පාගාරය සහ සේවා ටැංකි ක්‍රියාත්මක කල හැකි බව දන්වා ඇත.
57	2020 මැයි 14 දිනැති මුලික නිම කිරීමේ දින සිට දින දීර්ඝ කිරීම් 08 ක් ලබා දී තිබියදීත්, අලුත්ගම, මතුගම, සහ අගලවත්ත ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය සියයට 95.34 ක ප්‍රගතියක් පමණක් ළඟා කරගෙන තිබුණි. කොන්ත්‍රාත්කරු විසින් ස්ථාපනය කරන ලද නව පොම්පය ඉහළ කම්පන සහ ස්ථාපනය කිරීමේ ගැටලු මත ක්‍රියාකාරී තත්ත්වයක නොමැති වීම හේතුවෙන් පැරණි තුළුමුවෙහි මෙහෙයුම් නවතා තිබුණි. නව පොම්පය ක්‍රියා විරහිත වීම හේතුවෙන්, මණ්ඩලය විසින් ජලය කොලේමෝදර නව තුළුමුවේ සිට කිලෝමීටර් 15.5 ක් දුරින් පිහිටි කෙත්හේන පවිත්‍රාගාරයට පොම්ප කර ඇත. මේ හේතුවෙන්, පැරණි තුළුමුවෙහි අක්‍රීය	**2023**	කොන්ත්‍රාත්තුවේ අඩුපාඩු හේතුවෙන් මණ්ඩලය විසින් දරන ලද අනවශ්‍ය වියදම් සඳහා හිමිකම් පෑම සහ දෝෂ වගකීම් කාලය තුළ කොන්ත්‍රාත්කරු ගේ අඩුපාඩු නිවැරදි කිරීම.	විවිධ පාලනය කළ නොහැකි හේතූන් මත කොන්ත්‍රාත්කරුට දීර්ඝ කිරීම් 08 ක් ලබා දී ඇත. දැනට, කොන්ත්‍රාත්කරු කම්පනයට හේතු සොයා බලමින් සිටින අතර අවශ්‍ය ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග ගනිමින් සිටී.	නිවැරදි කිරීමේ කටයුතු කොන්ත්‍රාත් කරුගේ වියදමින් සිදුකිරීම ආරම්භකර ඇත.

	කාලසීමාව තුළ මණ්ඩලයට රු. මිලියන 106 ක අමතර විදුලි පිරිවැයක් දැරීමට සිදු විය.				
58	කොන්ත්‍රාත් ගිවිසුමේ සාමාන්‍ය කොන්දේසිය 08 ට පටහැනිව මණ්ඩලය විසින් මිලදී ගත් සහ බෙදා හැර ඇති රු. මිලියන 19 ක් වටිනා ඩීඅයි නළවල ප්‍රමිතිය පරීක්ෂා කිරීම සඳහා පත් කරන ලද කමිටුව විසින් ඉදිරිපත් කරන ලද දෘශ්‍ය තත්ත්ව පරීක්ෂණ වාර්තාව මත මණ්ඩලය විසින් ගෙවීම් කර තිබුණි. කෙසේ වෙතත්, භෞතික පරීක්‍ෂණයේ දී ඩීඅයි නළ 95 න් ඩීඅයි නළ 10 ක සම්බන්ධක (DI planges) වල ජලය කාන්දු වීම හේතුවෙන් ඩීඅයි නළවල පිළිගත හැකි මට්ටමේ ගුණාත්මකභාවයක් නොමැති බව විගණන පරීක්‍ෂණයේදී අනාවරණය විය.	**2023**	සැපයුම ලද අවස්ථාවේ දෘශ්‍ය තත්ත්ව පරීක්ෂා කිරීමට වඩා ගුණාත්මකභාවය පරීක්ෂා කිරීමට ක්‍රියා පටිපාටිය සකස් කළ යුතුය.	සපයනු ලබන භාණ්ඩවල ගුණාත්මකභාවය පරීක්ෂා කිරීම මණ්ඩලයේ කාර්ය මණ්ඩලය විසින් සිදු කරනු ලබයි. මෙම විගණන විමසුමේ සඳහන් කර ඇති පරිදි එය ප්‍රමාණ පරීක්ෂණයක් පමණක් නොවේ.	පිළිගත හැකි මට්ටමේ ගුණාත්මකභාවය ක් සහිත තත්ත්ව පරීක්ෂණයක් තවදුරටත් සිදුවී නොමැත.
59	“සැමට ජලය” ව්‍යාපෘති සඳහා ආරම්භයේ දී ප්‍රසම්පාදන කමිටු විසින් මුදල් තිබෙන බව තහවුරු කර නොතිබුණි. එබැවින්, ව්‍යාපෘති තොරතුරු පද්ධතිය මඟින් සපයන ලද තොරතුරුවලට අනුව, 2023 දෙසැම්බර් 31 දිනට සැලසුම් කළ	**2023**	අරමුදල් භාවිතා කිරීමට පෙර ප්‍රසම්පාදන කමිටුව විසින් ව්‍යාපෘතිවල ශක්‍යතාවය සහතික කර ගත යුතුය.	එකඟ වේ.	දිවයින පුරා පවතින නල යම් මට්ටමක භාවිතාවක් පවතින බව වාර්තා වී ඇත. අරමුදල් ප්‍රමාණවත් නොවීම මත ව්‍යාපෘති කටයුතු අඩු කරමින්

	ක්‍රියාකාරකම් 475 ක් අතරින් ක්‍රියාකාරකම් 106 කට අදාළව සියයට 6 ක් හෝ ඊට අඩු ප්‍රගතියක් පමණක් ළඟාකරගෙන තිබුණි . තවද, මෙම ව්‍යාපෘතිය සඳහා ආනයනය කරන ලද රු. මිලියන 5,198.89 ක් වටිනා HDPE නළ ප්‍රමාණයක් 2023 දෙසැම්බර් 31 දිනට නිසි කළමනාකරණයක් නොමැති වීම හේතුවෙන් දිවයින පුරා අනාරක්ෂිත ලෙස තොගවල පැවතුණි				ධාරිතා වැඩිදියුණු කිරීමේ සහ බෙදාහැරීම පුළුල් කිරීමේ ව්‍යාපෘතිය යටතේ මෙම වැඩසටහන ක්‍රියාත්මක වෙමින් පවතී.
60	**<u>කළු ගඟ ජල සම්පාදන පුළුල් කිරීමේ ව්‍යාපෘතිය (1)</u>** ව්‍යාපෘතිය එහි කටයුතු 2020 දෙසැම්බර් මාසයේදී ආරම්භ කල අතර 2025 අප්‍රේල් මාසය වන විට අවසන් කිරීමට නියමිතය. කළුගඟ ජල සම්පාදන පහසුකම් පුළුල් කිරීම සහ ජලය බෙදාහැරීමේ ජාල ප්‍රතිව්‍යුහගත කිරීම මගින් බස්නාහිර පළාතේ දකුණු ප්‍රදේශයේ සුරක්ෂිත ජලය සැපයීම සහ ජල සම්පාදන කාර්යක්ෂමතාව ඉහළ නැංවීමත් එමගින් එහි ජනතාවගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීමට දායකවීමත් ව්‍යාපෘතියේ අරමුණ වේ.	2021	කොන්ත්‍රාත් කාලය තුළ ව්‍යාපෘතිය නිම කිරීමට හැකිවන පරිදි ව්‍යාපෘතියේ කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතු වීම.	මෙම කාල සීමාව තුළ ශ්‍රී ලංකා රජය අතුරු ණය ප්‍රතිපත්තියක් අනුගමනය කර ඇත. එබැවින් මෙම ව්‍යාපෘතිය සඳහා පරිත්‍යාගශීලීන්ගේ මුදල් ලබා ගැනීම වැළැක්විය. එබැවින් මෙම ව්‍යාපෘතියේ ප්‍රගතිය ඇනහිටිණි. කෙසේ වෙතත්, ව්‍යාපෘති කටයුතු 2023 වර්ෂයේදී ආරම්භ වේ.	2023 දෙසැම්බර් 31 දින දක්වා ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 8 ක් වන අතර මූල්‍ය ප්‍රගතිය සියයට 1කි.

	ඉදිකිරීම් කටයුතු සඳහා කොන්ත්‍රාත් පැකේජ දහයකින් සහ එක් උපදේශන සේවා පැකේජයකින් ව්‍යාපෘතිය සමන්විත වේ. කොන්ත්‍රාත්තු දහයෙන්, ව්‍යාපෘතිය-1 හි කොන්ත්‍රාත් පහේ සවිස්තරාත්මක සැලසුම් සහ ඉදිකිරීම් කටයුතුද ව්‍යාපෘතිය -2 හි ඉතිරි කොන්ත්‍රාත් පැකේජ පහ සම්බන්ධයෙන් පමණක් විස්තරාත්මක සැලසුම් කිරීමේ කටයුතු ද ව්‍යාපෘතිය යටතේ නිම කිරීමට සැලසුම් කර ඇත. කෙසේ වෙතත්, උපදේශන කොන්ත්‍රාත්තුව පමණක් ප්‍රදානය කර සවිස්තරාත්මක සැලසුම් ආරම්භ කර ප්‍රසම්පාදන ක්‍රියාවලියට සහාය ලබා දී තිබුණි. එබැවින් 2021 දෙසැම්බර් 31 දින දක්වා ව්‍යාපෘතියේ කිසිදු භෞතික ප්‍රගතියක් පෙන්නුම් කර නොතිබුණි.				
61	**ආනමඩුව ජල සම්පාදන ව්‍යාපෘතිය** ව්‍යාපෘතිය 2017 පෙබරවාරි මස එහි කටයුතු ආරම්භ කරන ලද අතර 2020 පෙබරවාරි වන විට අවසන් කිරීමට සැලසුම් කර තිබුණි. පසුව, කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යසාධනය හේතුවෙන් ව්‍යාපෘතියේ	**2021**	ණය දෙන ආයතනය විසින් පනවනු ලබන බැඳීම් ගාස්තු වලක්වා ගැනීම සඳහා කොන්ත්‍රාත් කාලය තුළ ව්‍යාපෘතිය නිම කිරීමට හැකිවන පරිදි ව්‍යාපෘතියේ කටයුතු කඩිනම්	නලවල අමුද්‍රව්‍ය සහ එච්ඩීපීඊ වර්ණය පිළිබඳ සමථයකට පැමිණීමට ප්‍රමාද වීම, නල බහලුම් නිදහස් කර ගැනීමේ ප්‍රමාදය, තුළුමුව ස්ථානය වෙනස් කිරීම, ගෙවූ වැට් බදු, එන්බීටී,හානි ගෙවීම් ප්‍රතිපූරණය	2023 දෙසැම්බර් 31 දින දක්වා ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 76 ක් වන අතර මූල්‍ය ප්‍රගතිය සියයට 68කි. 2023 දෙසැම්බර් 31 දින දක්වා ණය දෙන ආයතනයට

	කාලය 2022 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කර තිබුණි. ඒ අනුව ණය දෙන ආයතනයට බැඳීම් ගාස්තුව ලෙස රජය රු. මිලියන 16.91ක් වැය කොට තිබුණි.		කිරීමට පියවර ගත යුතු වීම.	ප්‍රමාද වීම, කොවිඩ් වසංගත තත්ත්වය ආදිය හේතුවෙන් ව්‍යාපෘතිය දීර්ඝ කර ඇත.	බැඳීම් ගාස්තුව ලෙස රජය රු. මිලියන 22.08 ක් වැය කොට තිබුණි. 2023 මැයි 26 දින කොන්ත්‍රාත්රුගේ දුර්වල කාර්යසාධනය නිසා ගිවිසුම අවලංගු කර බැඳුම්කරය මුදල් බවට පත්කර ශේෂ වැඩ සඳහා කොන්ත්‍රාත් 4ක් පිරිනමා ඇත.
62	**අඹතලේ බලශක්ති ඉතුරුම් ව්‍යාපෘතිය** අඹතලේ ජල පවිත්‍රාගාරවල රු. මිලියන 67 කට වඩා පවතින සාමාන්‍ය මාසික බලශක්ති පිරිවැය අඩු කිරීමට අඩු කාර්යක්ෂමතාවයෙන් යුතු පැරණි පොම්ප නව පොම්ප මගින් ප්‍රතිස්ථාපනය කිරීමත් වසර 70 ත් 100 ත් අතර වන පැරණි කුඩා සම්ප්‍රේෂණ නල පද්ධතිය සඳහා ඉහළ ධාරිතාවයකින් යුත් පයිප්ප ප්‍රතිස්ථාපනය කිරීමෙන් සර්ෂණ පිරිවැය අවම කිරීමත් මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ විය.ව්‍යාපෘතියේ ආයෝජන වියදම එජඩො මිලියන 70 ට සමාන රු.මිලියන 9,100 ක් වන අතර ව්‍යාපෘති	**2021**	ව්‍යාපෘතියේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා කොන්ත්‍රාත් කාලය තුළ ව්‍යාපෘතිය නිම කිරීමට හැකිවන පරිදි ව්‍යාපෘතියේ කටයුතු කඩිනම් කිරීමට ක්‍රියා කළ යුතු වීම.	ජලාශය අඹතලේ ජල පවිත්‍රාගාර පරිශ්‍රයට විතැන් කිරීම, රට තුල පවතින විදේශ මුදල් හිඟය හේතුවෙන් කොන්ත්‍රාත්කරුට ණයවර ලිපි විවෘත කිරීමට නොහැකි වීම, කින්ද ඇළ පාලම ඉදිකිරීමට එරෙහිව ජනතා විරෝධය, මුදල් ලබාදීම තාවකාලිකව නතර කිරීම, මා.සං.අ. සීමා කිරීම්, කොවිඩ් 19 වසංගතය ආදිය හේතුවෙන් ව්‍යාපෘතිය ප්‍රමාද විය.	2024 ජූනි දක්වා නැවතත් කාලය දීර්ඝ කර ගෙන තිබුණු අතර 2023 දෙසැම්බර් 31 දිනට භෞතික ප්‍රගතිය සියයට 81 කි. 2024 සැප්තැම්බර් 30 දක්වා ව්‍යාපෘතියේ වැඩ අවසන්කර භාර දී නොමැත.

	කටයුතු 2014 සැප්තැම්බර් මාසයේ ආරම්භ කර වසර 4 ½ කින් 2019 ජුනි මාසය වන විට අවසන් කිරීමට මුලින් සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතිය එම දිනය වන විට සම්පූර්ණ කිරීමට අපොහොසත් වීම හේතුවෙන් , 2023 ජුනි දක්වා මුලික සම්පූර්ණ කිරීමේ කාල සීමාවට සමාන කාල සීමාවක් සඳහා කාලය දීර්ඝ කර ගෙන තිබුණි. **වෙනත් සංවිධානවලට මුදාහළ සම්පත්**				
63	2015 වර්ෂයේ සිට රේඛීය අමාත්‍යාංශය වෙත අවිධිමත් ලෙස මුදා හැර ඇති සේවකයින් සඳහා සමාලෝචිත වර්ෂය සඳහා ගෙවූ රු. මිලියන 24.34 ක් ඇතුළුව රු. මිලියන 263.33 ක් මණ්ඩලය විසින් රේඛීය අමාත්‍යාංශයෙන් ප්‍රතිපූරණය කර ගත යුතුව තිබුණි. අයකර ගැනීමෙන් තොරව, 2020 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ජනාධිපති කාර්යාලයට නිදහස් කළ සේවකයාගේ වැටුප් ලෙස රු. මිලියන 5 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද,	**2023**	මෙහෙයුම් අත්පොතෙහි අවශ්‍යතාවයන්ට අනුකූල වීම.	රේඛීය අමාත්‍යාංශයෙන් ලද ඉල්ලීම් අනුව, සේවකයින් නිදහස් කර ඇත. නිදහස් කරන සේවකයන්ට ගෙවන වැටුප ප්‍රතිපූරණය කරන ලෙස සෑම මාසයකදීම රේඛීය අමාත්‍යාංශයට ඉල්ලීම් යවනු ලබයි. මෙම මුදල ක්‍රමානුකූලව මුදාහරින බව අමාත්‍යාංශය දන්වා ඇත. රේඛීය අමාත්‍යාංශය විසින් මණ්ඩලය වෙත ප්‍රතිපූරණය නොකරන බැවින්, සමහර සේවකයින් නැවත මණ්ඩලය	රේඛීය අමාත්‍යාංශයට මුදා හැර ඇති සේවකයින් 15 දෙනාගෙන් 09 දෙනෙකු නැවත මණ්ඩලයේ සේවය සඳහා 2024 ඔක්තෝබර් 16 දින වන විට වාර්තා කර ඇත. ජනාධිපති කාර්යාලයට නිදහස් කළ සේවකයාද මණ්ඩලයේ සේවය සඳහා 2024 ඔක්තෝබර් 16 දින වන විට වාර්තා කර ඇත.

	2022 ජූලි 22 දින සිට වැටුප් ගෙවීමකින් තොරව අගමැති කාර්යාලයට එක් සේවකයෙකු නිදහස් කර තිබුණි. තවද, රු. මිලියන 66.47 ක් වටිනා වාහන 6 ක් රේඛීය අමාත්‍යාංශයට නිදහස් කර තිබූ අතර ඉන් රු. මිලියන 39.26 ක් වටිනා විදේශාධාර ව්‍යාපෘතියක අරමුදල් උපයෝගීකරගෙන මිලදීගත් එක් වාහනයක් ව්‍යාපෘතිය සඳහා ප්‍රයෝජනයකට නොගෙන රේඛීය අමාත්‍යාංශයේ අමාත්‍යවරයාගේ සම්බන්ධීකරණ ලේකම්වරයා විසින් 2019 වර්ෂයේ ආනයනය කළ අවස්ථාවේ සිට භාවිත කර තිබුණි.			වෙත අනුයුක්ත කර ඇත. එම වාහන නැවත මණ්ඩලයට ලබා ගැනීමට කටයුතු කරමින් ඇත.	වාහන 5ක් 2024 ඔක්තෝබර් 08 වන දින විට මණ්ඩලයට ආපසු ලබා දී ඇති අතර එක් වාහනයක්(PC 5865) තවදුරටත් අමාත්‍යාංශයේ පවතී.
64	ඉදිරිපත් කරන ලද තොරතුරුවලට අනුව, 2023 දෙසැම්බර් 31 වැනි දිනට සේවක හිඟය 2,625 ක් සහ සේවක අතිරික්තය 104 ක් වූ අතර තනතුරු 21 ක් සම්පූර්ණයෙන්ම පුරප්පාඩු විය. කෙසේ වෙතත්, මණ්ඩලයේ කාර්යමණ්ඩල අවශ්‍යතාවය සපුරාලීම සඳහා කාර්යමණ්ඩල අවශ්‍යතා මණ්ඩලය විසින් සමාලෝචනය කර නොතිබුණි.	**2023**	සේවක සංඛ්‍යාව පිළිබඳ නිසි ඇගයීමකින් පසුව මණ්ඩලයට ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීම හෝ මණ්ඩලයේ අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනය කිරීම.	වත්මන් අවශ්‍යතාවලට සරිලන පරිදි කාර්ය මණ්ඩල සැලැස්ම යාවත්කාලීන කර අවශ්‍ය කාර්ය මණ්ඩලය වැඩි කිරීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ඉල්ලා ඇතත් මෙතෙක් අනුමැතිය ලැබී නොමැත. තවද, මේ වන විට රජයේ	මේ පිළිබඳව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු ව සමඟ සාකච්ඡා පවත්වයි.

				බඳවා ගැනීම් නතර කර ඇති බැවින්, සේවකයන් අවශ්‍ය වුවද බඳවා ගැනීම් සිදු කිරීමට නොහැකි වී ඇත.	
65	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව 2016 මාර්තු 24 දිනැති අංක 01/2016 දරන චක්‍රලේඛය සහ 2023 ජනවාරි සිට බලාත්මක එහි සංශෝධනවල ඡේද අංක 2.2.7 සහ 07 ට පටහැනිව මාතර අදියර IV ව්‍යාපෘතිය සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගත් සේවකයන් එකොළොස් දෙනෙකු මණ්ඩලයේ රාජකාරි සඳහා මණ්ඩලය විසින් අනුයුක්ත කර ගෙවීම් කර තිබුණි.	**2023**	ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර අනුමැතිය ලබා ගත යුතුය.	මණ්ඩලය විසින් මෙහෙයුම් සහ නඩත්තු ක්‍රියාකාරකම් සඳහා ව්‍යාපෘති කාර්ය මණ්ඩලය යොදවා ඇත. ව්‍යාපෘති කාර්ය මණ්ඩල සමාජිකයින් 11 දෙනෙකු ප්‍රාදේශීය සහයක මධ්‍යස්ථානයට අනුයුක්ත කර ඇත. මෙහෙයුම් සහ නඩත්තු කටයුතු අත්‍යවශ්‍ය කාර්යයන් වන බැවින් මෙම කාර්යයන් දැනට සිටින කාර්ය මණ්ඩලය සමඟ සිදු කළ නොහැක.	නිවැරදි කිරීම් සිදු කර නොමැත.
66	ස්ථාන මාරු ප්‍රතිපත්තියේ අවශ්‍යතාවලට මණ්ඩලය අනුකූල නොවූ අතර සිදු කරන ලද නියැදි පරීක්ෂණය අනුව, බස්නාහිර දකුණු ප්‍රදේශයේ සේවකයන් 591 දෙනාගෙන් සේවකයන් 273 දෙනෙක් වසර 05 ක අවශ්‍යතාවයට පටහැනිව අවුරුදු 07 සිට අවුරුදු 38 දක්වා එකම ස්ථානයක සේවය කරයි. තවද, එක්	**2023**	සේවකයින්ගේ ප්‍රතිලාභ වෙනුවෙන් සේවකයින් මාරු කිරීම සඳහා දත්ත පදනමක් කඩිනමින් සකස් කිරීම.	කාර්ය සාධක බලකාය විසින් අනිවාර්ය ස්ථාන මාරු සලකා බැලීම සඳහා අයදුම්පත් කැඳවා ඇති අතර, එම වැඩසටහන නුදුරේදීම ක්‍රියාත්මක කිරීමට නියමිත වේ.	2024.02.22 දිනැති නිසා/මසා/ස්ථාන මාරු අංකය සහිත ලිපියට අනුව එකම සේවා ස්ථානයේ වසර පහකට වැඩි කාලයක් සේවය කරන සේවකයන්ගේ අනිවාර්ය ස්ථාන මාරුවීම් සඳහා අයදුම්පත් කැඳවා ඇතත් 2024

	එක් සහ සෑම සේවකයෙකු සඳහාම මානව සම්පත් අංශය විසින් නිසි දත්ත පද්ධතියක් පවත්වා ගෙන නොතිබුණි.				සැප්තැම්බර් 30 දක්වා ක්‍රියාත්මක වී නොතිබුණි.
67	විමර්ශන නිලධාරීන්ගේ හිඟය හේතුවෙන් 2022 ජනවාරි සිට 2023 අගෝස්තු දක්වා විමර්ශන ඒකකයට සේවකයින්ගෙන් ලද පැමිණිලි 144 ක් අතරින් පැමිණිලි 49 ක් පමණක් විසඳා ඇත.	**2023**	සේවකයින් අතර විශ්වාසය වර්ධනය කිරීම සඳහා විසඳුම් ක්‍රියා පටිපාටිය කඩිනම් කිරීම.	අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ඇතිව 2023.09.15 දින පැවරුම් පදනම මත විමර්ශන නිලධාරීන් 10 දෙනෙකු පත් කර ඇත. ඒ අනුව, 2022 ජනවාරි සිට 2023 අගෝස්තු දක්වා, මේ දක්වා ලැබී ඇති පැමිණිලි අතරින් පැමිණිලි 137 ක් මූලික කටයුතු සඳහා යොමු කර ඇත. එම පැමිණිලි අතරින්, 102 ක් මේ වන විට අවසන් කර ඇත.	අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ඇතිව 2023.09.15 දින පැවරුම් පදනම මත විමර්ශන නිලධාරීන් පත් කර ඔවුන් හරහා විමර්ශනය කරමින් පවතී.
68	සැමට ජලය නැමති ව්‍යාපෘතියේ සිවිල් ඉංජිනේරු, ප්‍රමාණ මිනින්දෝරු, ඉංජිනේරු සහකාර (සිවිල්) යන තනතුරු සඳහා බඳවා ගත් සේවකයන් 157 දෙනා සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබාගෙන නොතිබුණි.	**2022**	ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර අනුමැතිය ලබා ගත යුතුය.	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් කීපවතාවක්ම අනුමැතිය ඉල්ලා ඇතත් මේ දක්වා අනුමැතිය ලැබී නොමැත.	විශාල ප්‍රමාණයක් අනුමත කාර්යමණ්ඩලය තුලට අන්තර් ග්‍රහණය කර ඇති අතර ඉතා සීමිත ප්‍රමාණයක් අනුමැතිය නොමැතිව තවදුරටත් සේවයේ යොදවා ඇත.
69	නියැදි විගණනයට අනුව, සේවකයින් බඳවා ගැනීමේදී සහ උසස්වීම් ලබාදීමේදී පත්වීම්	**2022**	සේවය ස්ථිර කිරීමට පෙර සියලුම බඳවා ගැනීම් සඳහා වන	කළමනාකරණ සහකාර ආශ්‍රිත තනතුරු සඳහා අ.පො.ස සා.පෙළ	අධ්‍යාපනික, වෘත්තීය සහ සේවා සහතිකයේ නිරවද්‍යතාවය

	ලිපියට අනුව අධ්‍යාපනික, වෘත්තීය සහ සේවා සහතිකයේ නිරවද්‍යතාවය තහවුරු කර නොමැති බව අනාවරණය විය		සහතික තහවුරු කළ යුතුය	සහ උසස් පෙළ සඳහා වන සහතික මේ දක්වා තහවුරු කර ඇති අතර ඉදිරියේදී සියලුම බඳවාගැනීම් තහවුරු කිරීමට බලාපොරොත්තු වේ.	තහවුරු කර ගැනීමට කටයුතු කර ඇත.
	වාහන පද්ධති කළමනාකරණය සහ ගිණුම් කටයුතුභාවය				
70	1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 05 (04) වගන්තියේ අවශ්‍යතා අනුව, මෙම කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් වක්‍ර සම්බන්ධතාවයක් පවතින බව හෙළිදරව් නොකර මණ්ඩලයේ සභාපති විසින් තමා සභාපතිත්වය දැරූ ප්‍රසම්පාදන කමිටුව මඟින් සූර්ය පද්ධතියක් මිලදී ගැනීම සඳහා රු. මිලියන 73 ක කොන්ත්‍රාත් වටිනාකමකට මණ්ඩලයේ සභාපතිවරයාට ඍජු සම්බන්ධතාවයක් ඇති සමාගමකට කොන්ත්‍රාත්තුව පිරිනැමීමට තීරණයක් ගෙන තිබුණි.	**2023**	මෙම ගනුදෙනුව සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදු කළ යුතුය.	ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට අනුව තරඟකාරී ලංසු තැබීමේ පටිපාටිය අනුගමනය කර ඇත.	විගණන නිරීක්ෂණ පිළිබඳ අවධානය යොමුකර නොතිබුණි.

	සංයුක්ත සැලැස්ම සහ ක්‍රියාකාරී සැලැස්ම				
71	2020-2025 සඳහා වූ සංයුක්ත සැලැස්මට අනුව, ජාතික ප්‍රතිපත්ති රාමුව යටතේ "සැමට ජලය" සංකල්පය සමඟ ඒකාබද්ධව වර්ෂය තුළ නව ජල සම්බන්ධතා 160,000 ක් ලබාදීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, වර්ෂය තුළදී නව සම්බන්ධතා 115,509 ක් ලබා දී ඇත. තවද, ඉකුත් වර්ෂයට සාපේක්ෂව නව සම්බන්ධතා සංඛ්‍යාව සියයට 24.61 කින් අඩු වී ඇතත් මනුගත අලෙවි ආදායම ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 77 කින් වැඩි වී ඇත. 2023 සැප්තැම්බර් 01 වැනි දින ජල ගාස්තු ඉහළ නැංවීම විකුණුම් වර්ධනයට ප්‍රධාන හේතුව විය. 2023 වර්ෂය සඳහා ආදායම් නොවන ජලය සඳහා ස්ථාපිත 23.91 ක ඉලක්කගත ප්‍රතිශතයට සාපේක්ෂව 25.32 ක ප්‍රතිශතයක් ලබාගෙන ඇති අතර දකුණු සහ මධ්‍යම ප්‍රාදේශීය සහයක මධ්‍යස්ථානවල ආදායම් නොවන ජල ප්‍රතිශතය සමාලෝචිත වර්ෂය තුළදී සියයට 30 ට වඩා වැඩි විය.	**2023**	ආයතනය නිවැරදි මාර්ගයට යොමු කිරීම සඳහා ළඟා කර ගත හැකි ඉලක්ක ස්ථාපිත කළ යුතුය.	ආර්ථික අර්බුදය හේතුවෙන් බලාත්මක කරන ලද රජයේ ප්‍රසම්පාදන සීමා කිරීම් සහ කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමෙන් පසුව අධික මිල ඉහළ යාම හේතුවෙන් 2023 වර්ෂය සඳහා ඉලක්කගත සම්බන්ධතාවය ලබා ගැනීමට නොහැකි විය. අප විසින් 2015 සිට 2022 දක්වා අපගේ නව සම්බන්ධතාවල ස්ථාවර වර්ධන ඉලක්කයක් පවත්වා ගෙන ගිය අතර, සාමාන්‍යයෙන් වසරකට සම්බන්ධතා 136,000 ක් ලබා දී ඇත. අභියෝග මධ්‍යයේ වුවද, 2023 දී සම්බන්ධතා 115,500 ක් එකතු කිරීමත් සමඟ අපගේ කාර්ය සාධනය ස්ථාවරව පැවතුණි.	සැලසුම් කල ඉලක්ක සංශෝධනය කළද සංශෝධිත ඉලක්කද ළඟාකරගෙන තිබුණේ සියයට 71 ක් පමණි.

විගණන කමිටුව

72	ශ්‍රී ලංකා ජාතික මානව සම්පත් සංවර්ධන සභාව විසින් නිකුත් කරන ලද රාජ්‍ය ව්‍යවසායක සභාපති සහ අධ්‍යක්ෂවරුන් සඳහා යහපාලනය පිළිබඳ අත්පොතේ 4.4.1 හි අවශ්‍යතාවයට අනුව අධ්‍යක්ෂවරුන් ස්වාධීන විය යුතු වුවත්, මණ්ඩලයේ හිටපු සාමාන්‍යාධිකාරීවරයා 2023 ඔක්තෝම්බර් මාසයේ සිට විශ්‍රාම ගැනීමෙන් පසුව පාලක මණ්ඩලයේ සාමාජිකයෙකු සහ විගණන කමිටු සාමාජිකයෙකු ලෙස පත් කර තිබුණි. කෙසේ වෙතත්, එය මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. 2023 වර්ෂය තුළදී රු. මිලියන 6.25 ක විශ්‍රාම ප්‍රතිලාභ ඇයට ලබා දී තිබුණි.	**2023**	අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්වාධීනත්වය පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය.	මෙම සාමාජිකයා විගණන කමිටුවේ සාමාජිකයෙකු ලෙස පත් කර ඇත.	2024 මූල්‍ය ප්‍රකාශන තුල අවශ්‍ය හෙළිදරව් කිරීම් සඳහා ක්‍රියාමාර්ග ගනිමින් පවතී.
	තිරසාර සංවර්ධන අරමුණු				
73	තිරසාර සංවර්ධන අරමුණු අංක 06 ට (SDG) අනුකූලව, වසර 2025 වන විට සියයට 100 ක නල ජල ආවරණය සාක්ෂාත් කර ගැනීම සඳහා මණ්ඩලය විසින් සංයුක්ත සැලැස්ම සකස් කර තිබුණි. මෙම	**2023**	එකඟ වූ ඉලක්ක සපුරා ගැනීමට කටයුතු කළ යුතුය.	2020-2025 සඳහා වූ ආයතනික සැලැස්ම, "සැමට ජලය" වැඩසටහන මත මුලින් ගොඩනගන ලද අතර, පවතින ආර්ථික අර්බුදය හේතුවෙන් බාධා කිරීම්වලට මුහුණ දී	ස්ථාපිත ඉලක්ක අපේක්ෂිත පරිදි ලඟාකර ගෙන නොමැත.

අරමුණ සපුරා ගැනීම සඳහා මණ්ඩලය විසින් ඉලක්ක 08 ක් සහ දර්ශක 08 ක් හඳුනාගෙන තිබූ අතර මෙම ඉලක්ක අතරින් ජල අංශයේ නීතිමය රාමුව සවිබල ගැන්වීම, ගෘහ හා ගෘහස්ථ නොවන නල ජල ආවරණය 313,217 කින් වැඩි කිරීම සහ නල අපවහන ආවරණය 867 කින් වැඩි කිරීම යන ඉලක්ක සමාලෝචිත වර්ෂය තුළදී සියයට 100 කින් ලඟා කර ගැනීමට මණ්ඩලය අපේක්ෂා කර තිබුණි. කෙසේ වෙතත්, 2023 දෙසැම්බර් 31 වන දිනට ජල අංශයේ නෛතික රාමුව සවිබල ගැන්වීම සියයට 60 ක්, ජල සම්බන්ධතා 187,339 ක් සහ මලාපවහන සම්බන්ධතා 338 ක් පමණක් ලඟා කරගෙන තිබුණි.

ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, ඩබ්ලිව්.එෆ්.ඒ වැඩසටහනේ විෂය පථය ප්‍රමාණයෙන් අඩු වූ අතර 2025 වන විට ධාරිතාව සහ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා පවතින ජල සම්පාදන යෝජනා ක්‍රම ප්‍රශස්ත කිරීම කෙරෙහි පමණක් අවධානය යොමු කරමින් ධාරිතා වැඩිදියුණු කිරීමේ සහ බෙදාහැරීම පුළුල්කිරීමේ ව්‍යාපෘතිය (සී.ඊ.ඩී.ඊ) වෙත ප්‍රමුඛතාවය යොමු කර ඇත.

3.106 රක්ෂණ නියාමන කොමිෂන් සභාව

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පසු ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	8,714,259,219	80,746,472	8,633,512,746	69,783,461	තත්ත්වාගණනය නොකළ
2022	9,811,476,278	115,219,827	9,696,256,451	122,869,939	තත්ත්වාගණනය නොකළ
2023	12,047,285,193	127,712,503	11,919,572,690	152,510,932	තත්ත්වාගණනය නොකළ

	විගණන නිරීක්ෂණය	වාර්තා කරනු ලබන වර්ෂය	විගණකාධිපතිගේ නිර්දේශය	ආයතනය විසින් ගන්නා ලද වැළැක්වීමේ පියවර	වර්තමාන තත්ත්වය
1	**1.5 නොසැපයූ විගණන සාක්ෂි** (a) රක්ෂණයේ හර මූලධර්ම යනු ජාත්‍යන්තර රක්ෂණ අධීක්ෂකවරුන් ගේ සංගමය මගින් සකස් කරන ලද ගෝලීය වශයෙන් පිළිගත් මූලධර්ම රාමුවකි. රක්ෂණ නියාමකයින් ගේ නියාමන සහ අධීක්ෂණ කාර්යයේ ගුණාත්මක බව තක්සේරු කිරීමේදී සහ රට තුළ රක්ෂණ ක්ෂේත්‍රය සඳහා රෙගුලාසි	2021, 2022	කළමනාකාරීත්වය විසින් විගණනය මගින් ඉල්ලා සිටින තොරතුරු නියමිත වේලාවට විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය.	ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් 2023 වසරේ විගණන කෙටුම්පත් මතයට දෙන ලද පිළිතුර අනුව රක්ෂණයේ හර මූලධර්ම පිළිබඳ සමාලෝචනය කරගෙන යනු ලබයි.	කෙටුම්පත් මතයට ලබා දී ඇති පිළිතුරට අනුව, ICP 1,2,9,10 බොහෝ දුරට සමාලෝචනය කර ඇත. රක්ෂණ පනතට සංශෝධන සිදු කිරීම සඳහා අධිකරණ අමාත්‍යාංශය විසින් පිහිටුවන ලද කමිටුවක් මගින් සියලුම හර මූලධර්ම පිළිබඳ සමාලෝචනයක් සිදු කෙරේ. සමාලෝචන වාර්තාව තවමත් අවසන් කර නොමැත.

හඳුන්වා දීමේ රාමුවක් ලෙස භාවිතා කිරීමේදී එම මූලධර්ම ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. ජාත්‍යන්තර රක්ෂණ අධීක්ෂකවරුන් ගේ සංගමයේ සාමාජිකයෙක් වශයෙන් මෙම කොමිෂන් සභාව මගින් 2022 වර්ෂය සඳහා සාමාජික ගාස්තුව ලෙස රු.5,999,664 ක් ගෙවා තිබුණි. කොමිෂන් සභාව විසින් රක්ෂණයේ මූලික මූලධර්මවලට අනුකූලවන ආකාරය හඳුනාගැනීම සඳහා 2021 වර්ෂයේ විගණනයේදී තොරතුරු ඉල්ලා සිටි තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

1.6 නීති රීති රෙගුලාසි සහ කළමනාකරණ තීරණ (ඉ) 2021 රාජ්‍ය ව්‍යාපාර ව්‍යවසායන් සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශවල මාර්ගෝපදේශ 2.6 අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයා ප්‍රධාන වශයෙන් මණ්ඩලයේ වගකීම් ඉටු කිරීම සම්බන්ධයෙන් මහපෙන්වීම් ඉටු කිරීම සම්බන්ධයෙන් මහපෙන්වීම සඳහා වගකිවයුතු අතර, ව්‍යවස්ථපිත අවශ්‍යතා සහ කර්මාන්තයේ හොඳම භාවිතයන්ට අනුකූලව සියලුම ක්‍රියාපටිපාටි අනුගමනය කරන බවට සහතික විය යුතු අතර මාර්ගෝපදේශයේ දක්වා ඇති අවශ්‍ය සුදුසුකම් තිබිය යුතුය. තවද, දැනටමත් වෙනත් කාර්යයක නිරතව සිටින කිසියම් සේවකයෙකු අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් ලෙස පත් නොකළ යුතු අතර අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු ලේකම් ලෙසද කටයුතු කළ යුතුය. නමුත් කොමිසමට සුදුසුකම් ලත් ලේකම්වරයෙක් නොමැත. මාර්ගෝපදේශයට	2022,2023	කොමිෂන් සභාවට අවශ්‍ය සුදුසුකම් ඇති ලේකම්වරයෙකු මාර්ගෝපදේශයේ විධිවිධානවලට අනුව පත් කළ යුතු අතර එම ලේකම්වරයා කොමිෂන් සභාවේ අනුකමිටුවල ලේකම්වරයා ලෙසද කටයුතු කළ යුතුය .	කොමිෂන් සභාව විගණන ආයතනවලින් අයදුම්පත් කැඳවා තිබූ අතර එම ඉල්ලීමට ප්‍රතිචාර වශයෙන් කිසිදු යෝජනාවක් ඉදිරිපත් වී නොතිබුණිඑය . කොමිෂන් සභාවට ද දන්වා තිබුණි. නීතිමය ආයතන, ලේකම් සහ විගණන ආයතන වෙතින් අයදුම්පත් කැඳවීම දීර්ඝ කරන ලෙස කොමිසමේ සාමාජිකයින් උපදෙස් දෙන ලදී.	රක්ෂණ නියාමන කොමිෂන් සභාවට තවමත් අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයෙකු පත් කිරීමට නොහැකි විය

පටහැනිව ඔවුන්ලේ ස්ථිර වගකීම්වලට අමතරව දැනට විමර්ශන අධ්‍යක්ෂ කොමිෂන් සභාවේ ලේකම් ලෙස ක්‍රියා කරන අතර සහකාර අධ්‍යක්ෂ- නීති විගණන කමිටුවේ ලේකම්වරයා ලෙස කටයුතු කරනු ලබයි.				
(ඊ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 7 වැනි වගන්තිය. බැංකු හරහා ණය ලබාදීමට ප්‍රතිපාදන සලසා තිබුණදවාහන , ණය රු.1,200,000 සමාලෝචිත වර්ෂය තුළ කොමිසමේ අරමුදල්වලින් පිළිවෙලින් සියයට 4.2 ක් සහ සියයට 9 ක පොලී අනුපාතයකට රු.600,000ක කොටසක් සඳහා ලබා දී තිබුණි .	2022	කොමිෂන් සභාවේ සේවකයන්ගේ ප්‍රතිලාභ තීරණය කිරීමේදී කොමිෂන් සභාව රජයේ ප්‍රතිපත්තිවලට අනුකූල විය යුතුය .	ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් ලබා දී ඇති පිළිතුරට අනුව, ඔවුන් 2021 නොවැම්බර් 16 වන දින රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව (PED) විසින් නිකුත් කරන ලද මෙහෙයුම් අත්පොතේ 2.3 වගන්තියට අනුව සකස් කරන ලද කොමිෂන් සභාව විසින් අනුමත කර ඇති පරිපාලන අත්පොත අනුගමනය කරයි. වාහන ණය යෝජනා ක්‍රමය එම පරිපාලන අත්පොතෙහි කොටසකි.	මෙම ණය මුදල 2023 වර්ෂයේදීත් අඛණ්ඩව ලබා දී ඇත
3.3 ව්‍යාපෘති පරිපාලනයේ අඩුපාඩු (අ) මෙම ව්‍යාපෘතිය යටතේ, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ	2021,2022	ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීම සඳහා කොමිෂන් සභාව නිසි සම්බන්ධීකරණය සහ බලපෑම්	විසර්ජන සම්බන්ධක දර්ශක සම්බන්ධයෙන් කොමිසමේ වගකීම පැන නගින්නේ ජාතික රක්ෂණ භාර	ජාතික රක්ෂණ භාර අරමුදලේ රක්ෂණ සහ ප්‍රතිරක්ෂණ ව්‍යාපාර වෙන් කිරීම තවමත් සිදු

අධීක්ෂණය යටතේ ජාතික රක්ෂණ භාර අරමුදලේ රක්ෂණ සහ ප්‍රතිරක්ෂණ ව්‍යාපාර වෙන් කිරීම සඳහා ඇමරිකානු ඩොලර් 945,450 (SDR මිලියන 0.67) වෙන් කර තිබුණි. එසේ වුවද, මෙම මුදල් එම අරමුණ සඳහා භාවිතා කර නොතිබුණි.		කිරීමේ ක්‍රියාමාර්ග ගත යුතුය .	අරමුදල වෙන් කිරීම සඳහා සිය යෝජනාව ඉදිරිපත් කළ පසු පමණි. කෙසේ වෙතත්, අරමුදල ඔවුන්ගේ ප්‍රතිපත්ති තීරණයට අනුව වෙන් කිරීම සඳහා වූ යෝජනාව ඉදිරිපත් කර නැත. එබැවින් කොමිසම මගින් සම්බන්ධීකරණයෙන් බලපෑම් කිරීමේ ක්‍රියාමාර්ගවලින් මෙම කාර්යය සාක්ෂාත් කර ගත නොහැක.	කර නොමැත
3.2 අරමුදල් ඌණ උපයෝජනය කොමිෂන් සභාවේ සේවකයන් සඳහා ස්වයං දායක රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දීමට කොමිෂන් සභාව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. ඒ වෙනුවට කොමිෂන් සභාව මගින් 2022 වසර සඳහා රක්ෂණ ආවරණයක් ලබා ගැනීම සඳහා සේවකයින්ගෙන් කිසිදු දායක මුදලක් ලබාගැනීමකින් තොරව කොමිෂන් සභාවේ අරමුදල් වලින් රු.මිලියන 6.3 (2021 – රුපියල් මිලියන 6.2) ක් වැය කර තිබුණි. කෙසේ වුවද, 2017 වර්ෂයේ දී ජාතික	2021,2022	සේවකයින් සඳහා ස්වයං දායක රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දිය යුතු බව නිර්දේශ කෙරේ .	ආයතනය විසින් කිසිදු වැළැක්වීමේ පියවරක් ගෙන නොමැත	ස්වයං දායක රක්ෂණ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කර නැත

රක්ෂණ භාර අරමුදල මගින් අර්ධ රාජ්‍ය අංශයේ සේවකයින් සඳහා මසකට රුපියල් 1000 ක දායක මුදලක් අය කරමින් අග්‍රහාර රක්ෂණ යෝජනා ක්‍රමය පුළුල් කරගෙන තිබුණි. වෛද්‍ය රක්ෂණ ආවරණය සඳහා 2022 වර්ෂය සඳහා කොමිසමේ අරමුදලින් එක් සේවකයෙකුට රුපියල් 132,038 ක් වැය කර ඇති බව නිරීක්ෂණය විය.

3.4 **මානව සම්පත් කළමනාකරණ**

නීතිපතිවරයාගේ මතය මත කොමිෂන් සභාව විසින් සේවක සංඛ්‍යාව හා වැටුප් ක්‍රමය ඔවුන් විසින්ම තීරණය කර තිබුණි. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් 2019 මැයි 31 දිනැති සංදේශය මගින් 2018 ජූලි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි, කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය සඳහා වැටුප් ගැලපීම් සිදු කිරීම, සේවක මණ්ඩල සංශෝධනය, රු. 7,800 ක් වන ජීවන වියදම් දීමනාව ගෙවීම, මූලික වැටුපෙන් 15% ක නිපුනතා දීමනාවක් සහ රු.12,500 ක විශේෂ ජීවන වියදම් දීමනාවක් ගෙවීම සඳහා

2022

කොමිෂන් සභාව ඔවුන්ගේ සේවක තනතුරු සහ වැටුප් ව්‍යුහය සඳහා මුදල් අමාත්‍යාංශයෙන් අනුමැතිය ලබා ගත යුතුය .

රක්ෂණ කර්මාන්ත නියාමන පනතේ 10 වැනි වගන්තියට අනුව, 2000 අංක 43 දරන්නේ මෙසේය. “කොමිසමට තම කාර්යභාර කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා අවශ්‍ය යැයි සලකන නිලධාරීන් පත් කළ හැකි අතර එසේ පත් කරනු ලබන නිලධාරීන්ට එම ක්‍රමයට සහ එම මිල ගණන් යටතේ වැටුප් ගෙවිය යුතු අතර කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන සේවා කොන්දේසිවලට යටත් විය යුතුය. ” තවද PED 01/2021 හි ඇමුණුම A හි

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව නීතිපතිවරයා වෙතින් තවත් නීතිපති මතයක් ලබා ගෙන ඇත. එයින්ද ඔවුන්ට ඔවුන්ගේම කාර්ය මණ්ඩලය සහ වැටුප් ක්‍රමය තීරණය කළ හැකි බව සනාථ වේ.

සභාපතිවරයාගේ අනුමැතිය ඉල්ලා තිබුණි. කොමිෂන් සභාව මුදල් අමාත්‍යාංශයේ විෂය පථය යටතේ පවතින ආයතන වුවද, කොමිෂන් සභාව විසින් එහි සේවක සංඛ්‍යාව තීරණය කිරීමට සහ වැටුප් හා දීමනා වැඩි කිරීමට මහා භාණ්ඩාගාරයෙන් නිෂ්කාශනය හෝ ඒකඟතාවය ලබාගෙන නොතිබුණි.

ලැයිස්තුගත කර ඇති ආයතනයක් ලෙස ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වර්ග කළ හැක. ඒ අනුව, කොමිෂන් සභාව PED 01/2021 ප්‍රකාරව මුදල් අමාත්‍යාංශයට දන්වනු ඇත.මේ සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශ නිලධාරීන් සමග සාකච්චා කරනු ඇත.

3.107 ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	21,955,592	7,004,692	14,950,900	(3,381,172)	තත්ත්වාගණනය කළ
2022	22,783,003	6,779,129	16,003,874	1,653,226	තත්ත්වාගණනය කළ
2023	20,846,534	4,877,747	15,968,787	363,321	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	තාක්ෂණික දියුණුවක් සමග ක්‍රමයෙන් වර්ධනය වී ඇති e පුවත්පත් ප්‍රකාශණ ලියාපදිංචිය සම්බන්ධයෙන් 1973 අංක 05 දරණ ශ්‍රී ලංකා පුවත්පත්මණ්ඩල පනතේ 25 වන වගන්තියසංශෝධනය කර ගැනීමට මණ්ඩලය කටයුතු කර නොතිබුණි.	2022 2023	පුවත්පත් මණ්ඩල පනතට අදාළව සංශෝධන කාලීනව සිදුකිරීමට කටයුතු කළ යුතුය.	විද්‍යුත් මාධ්‍ය සම්බන්ධව විකාශණ අධිකාරියක් ආරම්භ කිරීමට අනුමැතිය ලැබී ඇත. ඊට සරිලන පරිදි ශ්‍රී ලංකා පුවත්පත්මණ්ඩල පනත සංශෝධනය කරනු ලබන බව දන්වා ඇත.	මෙම වසර ආරම්භයේ පනතේ වගන්තිය සංශෝධනය කිරීම සඳහා ඉදිරිපත් කරන ලද කැබිනට් සංදේශයට කැබිනට් අනුමැතිය ලැබී නොමැත.
2	1973 අංක 05 දරණ ශ්‍රී ලංකා පුවත්පත්මණ්ඩල පනතේ 26 වන වගන්තිය සෑම පුවත්පතකම මුද්‍රණකරු සහ ප්‍රකාශක විසින් මුද්‍රණය කරනු ලබන හෝ පළ කරනු ලබන සෑම තදනන්තර සහ අන්‍යාකාර මුද්‍රණයක	2023	පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.	විවිධ අවස්ථාවල ලිඛිතව හා වාචිකව පුවත්පත් කර්තෘවරුන්ටත් නීති අංශවලටත් දැනුම් දී තිබුණ ද මුද්‍රණ පිරිවැය, ප්‍රවාහන පිරිවැය ඉහල යාම නිසා නිසි වේලාවට ලබාදීමේ හැකියාවක්	විවිධ අවස්ථාවල ලිඛිතව හා වාචිකව පුවත්පත් කර්තෘවරුන්ටත් නීති අංශවලටත් දැනුම් දී තිබූ නමුත් මුද්‍රණ පිරිවැය, ප්‍රවාහන පිරිවැය ඉහළ යාම නිසා නිසි වේලාවට ලබාදීමේ හැකියාවක්

	හෝ මුද්‍රණාංකයක පිටපතක් කොමසාරිස්වරයාගේ කාර්යාලයට භාරදීමට සැලැස්විය යුතු වුවත් එසේ සිදු නොවීම නිසා 2019 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා පුවත්පත් හා සඟරා ලබා ගැනීමට මණ්ඩලයට රු.532,900 ක අතිරේක වියදමක් දැරීමට සිදු වී තිබුණි.			නොමැති බැවින් එක් පිටපතක් මිලදී ගනු ලබන බව දන්වා ඇත.	නොමැති බැවින් එක් පිටපතක් මිලදී ගනු ලැබේ. කෙසේ වෙතත් පනත පරිදි කටයුතු කිරීමට හැකි සෑම ක්‍රියා මාර්ගයක්ම ගනු ඇත.
3	1973 අංක 05 දරණ ශ්‍රී ලංකා පුවත්පත්මණ්ඩල පනතේ 30 වන වගන්තිය ප්‍රකාරව,ලියාපදිංචි නොකර වෙළඳපලට නිකුත් කරන පුවත්පත් සම්බන්ධව කටයුතු කිරීමට අවශ්‍ය රීති හා නියෝග සම්පාදනයට ක්‍රියා කර නොතිබුණි.	2021 2022 2023	පනත ප්‍රකාරව රීති හා නියෝග සම්පාදනය කළ යුතුය.	2021 ජනවාරි 12 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව අමාත්‍යාංශ ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත්කර ඇත. පනත සංශෝධනයට කටයුතු කරමින් පවතින බව දන්වා ඇත.	පනත සංශෝධනය කර නොමැත.

3.108 ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	බදු පෙර ලාභය (අලාභය) රු.	මතය
2021	2,090,904,050	1,926738,529	164,165,521	(229,358,727)	තත්ත්වාගණනය කළ
2022	1,506,160,557	1,857,363,101	(351,202,545)	(541,002,219)	තත්ත්වාගණනය කළ
2023	1,284,772,704	1,852,572,047	(567,799,343)	(359,678,634)	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ වර්තමාන තත්ත්වය
1	2023 වර්ෂය තුළ සංස්ථාවේ ශුද්ධ වත්කම් රු.567,799,343 ක ඍණ අගයක් දක්වා පිරිහී තිබුණු අතර 2022 වර්ෂයේ දී ශුද්ධ වත්කම් රු.351,202,545 ක ඍණ අගයක් ගෙන තිබුණි. 2023 ජනවාරි 01 දිනට රු. 1,111,944,969 ක් වූ සමුච්චිත අරමුදල් ඍණ ශේෂය සමාලෝචිත වර්ෂයේ රු.343,214,422 ක අලාභය සහ වර්ෂය තුළදී සිදුකරන ලද පෙර වර්ෂ ගැලපුම්වලින් පසුව 2023 වර්ෂය අවසානය	2022 2023	සංස්ථාවේ ඍණ කාරක ප්‍රාග්ධන තත්ත්වය අඛණ්ඩ පැවැත්ම කෙරෙහි බලපෑ හැකි බැවින් කළමනාකාරීත්වය ඒ පිළිබඳව අවධානය යොමු කළ යුතු ය.	අනෙකුත් නාලිකා හා තරඟකාරීව කටයුතු කල හැකි වැඩසටහන් නිෂ්පාදනය කරමින් ගුවන් කාල ආදායම වර්ධනය කරගැනීමට හා වැඩසටහන් පිරිවැය අවම කර ගැනීමට අවධානය යොමු කර වර්තමාන පාලක මණ්ඩලය විසින් කටයතු කරනු ලබන බව දන්වා ඇත.	ශුද්ධ වත්කම් ඍණ අගයක් ගැනීම,අඛණ්ඩ අලාභ හා ඍණ කාරක ප්‍රාග්ධන තත්ත්වය නොවෙනස්ව පවතින බැවින් අඛණ්ඩ පැවැත්ම අවදානමට ලක් වී ඇත.

	වන විට රු.1,459,985,460 ක සෘණ වටිනාකමක් දක්වා පිරිහී තිබුණි. 2022 වර්ෂයේ දී රු. 567,596,278 ක සෘණ කාරක ප්‍රාග්ධන තත්වය සමාලෝචිත වර්ෂය තුළ දීද රු.600,839,596 කින් තවදුරටත් වර්ධනය වී තිබුණි.				
2	2021 වර්ෂයේ අවසන් දිනට එක් ජංගම ගිණුමක පැවති රු. 237,068,873 ක බැංකු අයිරාවක් සඳහා රු. 22,480,822 ක් පොලී ලෙස ගෙවා තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ මාස 07 ක් අනුමත අයිරා සීමාවද වරින් වර ඉක්මවා තිබුණි.	2021 2022 2023	වියදම් නිවැරදිව කළමනාකරණය කිරීම සඳහා කටයුතු කළ යුතුය.	ක්‍රියාමාර්ග ගෙන නොමැත.	ස්ථාවර තැන්පතු මුදල් කර බැංකු අයිරා වටිනාකම පියවා ඇති අතර 2024 සැප්තැම්බර් 29 දිනට බැංකු අයිරා වටිනාකම රු.10,580,422 ක් ව පවතී.
3	2021 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 377,267,803 ක් වූ සේවාදායක ණයගැති ශේෂය තුළ ඇතුළත් වසර 4 ඉක්මවා ඇති ශේෂය රු. 115,553,535ක් වූ ඉන් රු. 38,958,322 ක් සඳහා පමණක් නීතිමය ක්‍රියාමාර්ග ගෙන තිබුණි. මුළු ණයගැති ශේෂයෙන් රු. 152,166,097 ක් මිලියන 5ට වැඩි වටිනාකම් සහිත රාජ්‍ය ආයතන 08 ක් ඇතුලුව	2021 2022 2023	ණය ගැති ශේෂ අයකර ගැනීමට අප්‍රමාදව කටයුතු කළ යුතුය.	2024 වර්ෂයේ මාර්තු මාසයේදීද රාජ්‍ය ආයතන වලින් අය විය යුතු මුදල් අය කර ගැනීම පිණිස ජන මාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අත්සනින් යුතුව ලිපි යැවීමට කටයුතු කර ඇත.	2024 අගෝස්තු 31 දිනට සේවාදායක ණයගැති ශේෂය රු.414,463,420 ක් ව පවතින අතර ණයගැති ශේෂය තුළ ඇතුළත් වසර 4 ඉක්මවා ඇති ශේෂය රු.141,230,628 ක් දක්වා වැඩි වී තිබුණි.

	ණයගැතියන් 15 දෙනෙකුගෙන් සමන්විත වී තිබුණි. එහි ඇතුලත් ජාතික ඉතිරි කිරීමේ බැංකුව සමග එළඹී විධිමත් ගිවිසුමක් නොමැති වීම නිසා බැංකුවෙන් ලැබිය යුතු රු. මිලියන 10 ක් අයකර ගැනීමට නීතිමය පියවර ගනු ලැබුවද අය කර ගැනීම අවිනිශ්චිත වී තිබුණි.				
4	2002 අංක 14 දරන එකතු කල අගය මත බදු පනතෙහි 26(1) වගන්තිය ප්‍රකාරව සංස්ථාව විසින් 2019 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ අවසන් දින දක්වා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු රු. 410,126,071 ක් වූ එකතු කල අගය මත හිඟ බදු මුදල් වටිනාකම තුළ රු. 154,048,724 ක් 2023 වර්ෂයේ ගෙවිය යුතු එකතු කල අගය මත බදු වගකීම ලෙස පැවති අතර මෙම බදු ගෙවීම පැහැර හැරීම මත ඉහත පනතෙහි 27(1) වගන්තිය ප්‍රකාරව සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ගෙවිය යුතු දඩ මුදල රු.49,215,129 ක් ව පැවතුණි.	2022 2023	එකතු කල අගය මත බදු පනතේ විධිවිධාන ප්‍රකාරව නියමිත දිනට බදු ගෙවීම තුළින් දඩ මුදල් ගෙවීම වළක්වා ගැනීමට කළමනාකරණයේ අවධානය යොමු කළ යුතු ය.	මෙහි සඳහන් බදු වාරික වශයෙන් ගෙවීමට හා අධිභාරය කපා හැරීමට අවශ්‍ය ලේඛණ මේ වන විට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත අනුමැතිය පිණිස ඉදිරිපත් කර ඇත. එම හිඟ මුදල වාරික වශයෙන් ගෙවීමට අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම පිණිස රේඛීය අමාත්‍යාංශය මගින් අදාල ලිපි යොමු කර ඇත.	හිඟ බදු මුදල් මෙතෙක් ගෙවා නොමැත.

5	ජපන් ආධාර යටතේ (JAICA Project-1982) පිහිටුවන ලද පිදුරුතලාගල විකාශනාගාරයේ විකාශන කටයුතු සඳහා භාවිතා කරනු ලබන බොහෝ යාන්ත්‍රික උපකරණ 2023 වර්ෂය වන විට වසර 40 කටත් වඩා පැරණි වන අතර ඒවායේ ක්‍රියාකාරීත්වය හදිසියේ බිඳවැටීමක් සිදුවුවහොත් විකාශනාගාරයේ කටයුතු අඩාල වීමේ අවදානමක් පවතින බව නිරීක්ෂණය විය. තවද ට්‍රාන්ස්මීටරයක් සහ UPS උපකරණයක් 2023 සැප්තැම්බර් 06 දින සිට අක්‍රීයව පැවති අතර අක්‍රීයව පැවති යන්ත්‍ර හා පිරියත අළුත්වැඩියා කිරීමේ කටයුතු අප්‍රමාදව සිදුකිරීමේ අවශ්‍යතාවය පිළිබඳව ද සංස්ථාව අවධානය යොමු කර නොතිබුණි.	2023	අක්‍රියව පවතින යන්ත්‍ර සූත්‍ර පිළිබඳව කළමනාකරණයේ කඩිනම් අවධානය යොමු කළ යුතු ය.	මෙම උපකරණ අළුත්වැඩියාව සඳහා අදාල සමාගම වෙත දැනුම් දී ඇතත් ඒවායේ පැරණි බව නිසා අළුත්වැඩියාව අපහසු වී ඇත. ඒ සඳහා ඇති වෙනත් සමාගම් සමගද සාකච්ඡා කරමින් ඇත. කෙසේ වුවද මේ සඳහා අළුතින් උපකරණ මිළදී ගැනීම සඳහා 2025 අයවැය ලේඛනයට ඇතුලත් කර ඇත.	අළුත්වැඩියා කටයුතු මෙතෙක් සිදු කර නොමැත.
6	වෙළඳ දැන්වීම් ප්‍රචාරය වෙනුවෙන් සේවාදායක ආයතනයන් වෙත සපයන ලද පැකේජයන්ට අදාළ උපලේඛණ, සංස්ථාව විසින් නිකුත් කරන ලද ඉන්වොයිස් වටිනාකම් සහ ගුවන්	2023	සංස්ථාවේ ආදායම් උපයන මාර්ග දැඩි ලෙස සීමා නොකල යුතුය.වැඩිම ආදායමක් ඉපයිය හැකි ගුවන් කාලය තුළ දී ඉතා ඉහළ වට්ටමක් ලබා දීම පිළිබඳව	අපේක්ෂිත අලෙවි ඉලක්ක සපුරා ගැනීමේදී පවතින තරඟකාරිත්වයට මුහුණ දෙමින් සංස්ථාව වෙත එන සේවාදායකයින් ග්‍රහණය	ඉතා ඉහළ වට්ටම් ලබා දීම තවමත් ක්‍රියාත්මක වේ.

කාලයට අදාළ රේට්කාඩ් වටිනාකම් සැසඳීමේදී සේවාදායකයන් වෙත සියයට 51 සිට සියයට 97 දක්වා පරාසය තුළ ඉතා ඉහළ වට්ටම් ලබා දී තිබුණි. වැඩිම ආදායමක් ඉපයියහැකි ගුවන් කාලය තුළදීද මෙලෙස ඉතා ඉහළ වට්ටම් පිරිනැමීම තුළින් සංස්ථාවේ ආදායම් ඉපයීමේ මාර්ග දැඩි ලෙස සීමා වීමට හේතු වී තිබුණි. එසේම විවිධ අවස්ථා වලදී එකිනෙකට වෙනස් වූ වට්ටම් පිරිනමා තිබුණු අතර එය විධිමත් ක්‍රමවේදයක් ඔස්සේ සිදුනොවන බව නිරීක්ෂණය විය. මෙලෙස වට්ටම් ලබාදීමෙන් පසු ආයතනයට ලැබෙන මුදලින් අදාළ නියෝජිත ආයතන සහ අලෙවි විධායක නිලධාරීන් වෙත කොමිස් මුදල් ද ගෙවියයුතු අතර මෙම ක්‍රියාවලිය ප්‍රමාණවත් ආදායම් ජනනය වන ආකාරයට විධිමත්ව නියාමනය වන අයුරින් සිදුකිරීමේ අවශ්‍යතාවය පිළිබඳ ඉහළ කළමනාකාරීත්වයේ අවධානය යොමුවී නොතිබුණි.

කළමනාකාරීත්වය අවධානය යොමු කළ යුතු ය.

කරගැනීම පිණිස වට්ටම් ලබාදීම වැනි අලෙවි උපක්‍රම භාවිතා කිරීමට සිදු වන බවත් අංක 836.08.32 හා 2018 ඔක්තෝබර් 12 දිනැති සංස්ථා මණ්ඩල තීරණය මගින් වට්ටම් ලබාදීමේ ක්‍රමවේදය සඳහා අනුමැතිය ලබාදී ඇති බවත් දන්වා ඇත.

3.109 ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පසු ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	466,399,640	466,399,640	-	(352,589,980)	තත්ත්වාගණනය නොකළ
2022	481,719,766	481,719,766	-	(331,264,461)	තත්ත්වාගණනය නොකළ
2023	350,021,474	350,021,474	-	(446,662,381)	තත්ත්වාගණනය නොකළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපතිගේ නිර්දේශය	ආයතනය විසින් ගන්නා ලද වැළැක්වීමේ පියවර	වර්තමාන තත්ත්වය
1	ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ 20(4) වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාව විසින් චර්යාධර්ම සංග්‍රහයක් පිහිටුවනු ලැබිය යුතු අතර එය කොමිෂන් සභාවේ නිලධරයන්ට හා සේවකයන්ට අදාල විය යුතුය. සමාජිකයන්ගේ හා සේවා නියුක්තයන්ගේ චර්යාව සම්බන්ධව පවතින රෙගුලාසිය 1997 සිට භාවිතා කරන අතර එය ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ ඉහත යොමුගත වගන්ති ඇතුළත් කරමින් යාවත්කාලීන කර නොතිබුණි.	**2023**	පවතින චර්යා ධර්ම සංග්‍රහය යාවත්කාලීන කිරීමට නිර්දේශ කරනු ලැබේ	කොමිෂන් සභාව, චර්යාධර්ම සංග්‍රහය යාවත්කාලීන කිරීමේ ක්‍රියාවලියේ නිරත වේ.	ක්‍රියාත්මක වෙමින් පවති

2	කොමිෂන් සභාවේ අනුමත කාර්ය මණ්ඩලයේ විධායක වර්ගීකරණයට අයත්, ප්‍රාග්ධන වෙළඳපොල සංවර්ධන අධ්‍යක්ෂක, අවේක්ෂණ අධ්‍යක්ෂක, බාහිර සම්බන්ධතා අධ්‍යක්ෂක, සහකාර අධ්‍යක්ෂකවරු 9 න් 3 ක්, ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් 9 න් 4 ක්, කළමනාකරුවන් 16 න් 4 ක්, ජ්‍යෙෂ්ඨ සහකාර කළමනාකරුවන් 22 න් 7 ක් හා සහකාර කළමනාකරුවන් 49 න් 24 ක් 2024 ජූනි 10 වන විට සැලකිය යුතු කාලයක් තිස්සේ පුරප්පාඩුව පවතින බව නිරීක්ෂණය විය. කළමනාකරණ තනතුරු පුරප්පාඩුව පැවතීම කොමිෂන් සභාවේ ඵලදායී ක්‍රියාකාරීත්වයට බලපෑ හැකිය.	2022, **2023**	පවතින ප්‍රධාන තනතුරු පිරවීම අවශ්‍ය වේ.	කොමිෂන් සභාව දැනටමත් තනතුරු කිහිපයක්පුරවා ඇත.ඉතිරිය ආයතනයේ අවශ්‍යතාවය මත පදනම්ව ඉදිරියේදී පුරවනු ලැබේ.	ක්‍රියාත්මක වෙමින් පවතී

3.110 උක් පර්යේෂණ ආයතනය

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	බදු පෙර ලාභය (අලාභය) රු.	මතය
2021	461,957,890	134,800,224	327,157,666	25,400,283	තත්ත්වාගණනය කළ
2022	794,708,527	126,158,140	668,550,387	(11,259,996)	අහිතකර
2023	723,251,316	109,815,489	613,435,827	(49,180,086)	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1.	2021 දෙසැම්බර් 31 දිනට පැලවත්ත අංශයෙන් ලැබී තිබුණු සෙස් බද්ද රු.3,041,310 ක් බවට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද එම අංශය සනාථ කර තිබුණු වටිනාකම රු.1,194,310 ක් වූයෙන් රු.1,847,000 ක වෙනසක් නිරීක්ෂණය විය. 2013 – 2015 අතර කාලය තුළ ලංකා සීනි සමාගමේ පරිහරණය සඳහා ලබාදී තිබුණු ආයතනයට අයත් වාහනයක සිදුකළ අලුත්වැඩියා කටයුතු වෙනුවෙන් එම සමාගම රු.1,847,000 ක	2021	ලැබිය යුතු සම්පූර්ණ සෙස් බදු මුදලම අයකර ගත යුතුය.	අලුත්වැඩියා කරන ලද වාහනයට හිලව් කරගෙන ඇති මෙම සෙස් බදු මුදල ආයතනය වෙත ගෙවන ලෙස පැල්වත්ත සීනි සමාගම වෙත 2016 වර්ෂයේ සිට ලිඛිතව දැනුවත් කිරීම් සිදුකර ඇත. අමාත්‍යාංශ මට්ටමින් අදාළ පියවර ගනිමින් පවතී.	2024 සැප්තැම්බර් 25 දින වන විටත් ලැබිය යුතු සෙස් බදු මුදල අයකර නොමැත.

	මුදලක් ගෙවිය යුතු සෙස් බද්දට හිලව් කර තිබීම ඊට හේතු වූ බව නිරීක්ෂණය වුවද එම මුදල ආපසු ලබාගැනීමට නොහැකි වී තිබුණි.				
2.	කන්තලේ සීනි සමාගමට ලබාදී ඇති වර්ෂ 05 කට වැඩි කාලයක සිට හිඟ හිට ඇති රු.1,000,000 ක ණය මුදල අයකර ගැනීමට ආයතනය අසමත් වී තිබුණි.	2021	අයකරගැනීමට නිසි ක්‍රියාමාර්ග ගත යුතුය.	ණය මුදල අයකරගැනීම සම්බන්ධව අමාත්‍යාංශ මට්ටමින් අදාළ කටයුතු සිදුකරමින් පවතී.	2024 සැප්තැම්බර් 25 දින වන විටත් ණය මුදල් අයකර නොමැත.
3.	1981 අංක 75 දරන උක් පර්යේෂණ පනත මගින් වාණිජ වශයෙන් උක් වගාකිරීම, දේශීය සීනි කර්මාන්තයට අදාළ සංවර්ධන කටයුතු සිදුකිරීම, දේශීය සීනි කර්මාන්තය නියාමනය කිරීම සහ හඳුන්වාදෙන උක් ප්‍රභේදවල වාණිජ අනුවර්තිතාවය (Commercial Adoption) තීරණය කිරීම යනාදිය සඳහා ආයතනයට බලතල පවරා නොතිබීම හේතුවෙන් ආයතනය පිහිටුවා අවුරුදු 37 ක කාලයක් ගත වුවද සීනි කර්මාන්තය රට	2021	දේශීය සීනි කර්මාන්තයේ උන්නතිය උදෙසා ආයතනය සතුව තිබිය යුතු බලතල ලබාගත හැකි ආකාරයට පනත සංශෝධනය කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය.	ක්‍රියාමාර්ග ගෙන නොමැත.	2024 සැප්තැම්බර් 25 දින වන විටත් පනතට සංශෝධන සිදුකර නොතිබුණි.

	තුළ නිසි පරිදි ස්ථාපිත වී නොතිබුණි. ආයතනය විසින් නිකුත් කළ 2021 දෙසැම්බර් පුවත් හසුනට අනුව 2020 වර්ෂයේදී දේශීය සීනි නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 61,000 ක් ද, සීනි ආනයනය මෙට්‍රික් ටොන් 683,000ක් ද වීමෙන් සමස්ථ සීනි සැපයුමෙන් සියයට 91.8 ක් ආනයනය කර ඇති බවටත්, ඒ සඳහා රු.බිලියන 51 ක් වැයකර ඇති බවටත්, එය ආහාර ද්‍රව්‍ය සඳහා වන වියදමෙන් සියයට 13 ක් බවටත් නිරීක්ෂණය විය.				
4.	දේශීය උක් වගාවේ උසස් වාණිජමය උක් ප්‍රභේද දියුණු කිරීම හා ඒ සඳහා පර්යේෂණ පැවැත්වීම සඳහා පිහිටුවා ඇති එකම ආයතනය උක් පර්යේෂණ ආයතනය වුවද එහි පර්යේෂණ කටයුතු සඳහා දායක වන ප්‍රධාන තනතුරු වන නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ සහ තාක්ෂණ හුවමාරු) තනතුර 2020 වර්ෂයේ සිටත්	2021	පුරප්පාඩු පිරවිය යුතුය.	ක්‍රියාමාර්ග ගෙන නොමැත.	2024 සැප්තැම්බර් 25 දින වන විටත් පුරප්පාඩු සම්පූර්ණ කර නොමැත.

	ප්‍රධාන තාක්ෂණ හුවමාරු නිලධාරී තනතුර හා ප්‍රධාන පර්යේෂණ නිලධාරී තනතුරු 02 ක් තනතුර ඇති කළ දින සිටත්, ඉතිරි ප්‍රධාන පර්යේෂණ නිලධාරී තනතුරු 03 ක් 2013 හා 2021 වර්ෂ අතර කාලය තුළත් පුරප්පාඩුව පවතින අතර ආයතනයේ අරමුණ සහ කාර්යයන් ඉටු කිරීමට එය බාධාවක් වී ඇති බවට නිරීක්ෂණය විය.			
5.	පුනරාවර්ථන වියදම් සඳහා මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන අරමුදල් යොදා ගනිමින් ආයතනය විසින් වෛද්‍යාධාර රක්ෂණ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කර තිබුණු අතර ඒ වෙනුවට ජාතික රක්ෂණභාර අරමුදල මගින් රක්ෂණාවරණය ලබාගත යුතු බව ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් විසින් 2017 වර්ෂයේදී දැනුම් දී තිබුණි. ඒ පිළිබඳව අවධානය යොමු නොකර සමාලෝචිත	2023	ජාතික රක්ෂණභාර අරමුදල මගින් රක්ෂණාවරණය ලබාගත යුතුය. ක්‍රියාමාර්ග ගෙන නොමැත	2024 සැප්තැම්බර් 30 දක්වාත් නිර්දේශය ක්‍රියාත්මක වී නොතිබුණි.

	වර්ෂයේදීද භාණ්ඩාගාර අරමුදල් යොදා ගනිමින් රු.10,364,935 ක වෛද්‍යාධාර දීමනා ගෙවා තිබුණි.				
6.	ආයතනයේ අරමුදල් භාවිතා කර සේවකයින් සඳහා නිවාස ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විට සේවකයින් 07 දෙනෙකුගෙන් රු. 4,271,069 ක නිවාස ණය අය වීමට තිබුණි. තවද අදාළ නිවාස ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා ලබාගත් අනුමැතිය පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.	2023	විධිමත් අනුමැතිය ලබාගැනීමෙන් පසුව ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කළ යුතුය.	සේවක සුභසාධක කටයුතු යටතේ චක්‍රීය ගිණුමක් (Revolving Account) පවත්වා ගැනීම මගින් මෙම නිවාස ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කර පවත්වා ගෙන යනු ලබන අතර එය වරින් වර සංශෝධනයට ලක්කර පාලක මණ්ඩල අනුමැතිය ලද පසු ආයතනයේ කාර්යාල කාර්ය සංග්‍රහය (MOP) අනුව ක්‍රියාත්මක කරනු ලබන බව.	උක් පර්යේෂණ ආයතනයේ නව කාර්යාල කාර්ය සංග්‍රහයටද (MOP) මෙම දේපළ ණය ඇතුළත් කර ඇති අතර ඒ සඳහා මහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබුණි.
7.	සීනි නිෂ්පාදන ආයතන 03 කින් ලැබිය යුතු වසර 02 ක සිට වසර 05 ක කාලයක් දක්වා පැරණි රු.4,890,951 ක ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	2023	බාහිර ආයතනවලින් ලැබිය යුතු මුදල් අයකරගත යුතුය.	රාජ්‍ය ආයතන 02ක් වන ,කන්තලේ සීනි සමාගමෙන් හා ලංකා සීනි සමාගමෙන් ලැබිය යුතු ණය අයකර ගැනීම සඳහා අමාත්‍යාංශ මට්ටමින් සාකච්ඡා සිදු කෙරෙමින් පවතින බව.	2024 සැප්තැම්බර් 25 දින වන විටත් ණය මුදල් අයකර නොමැත.

8.	කන්තලේ සීනි කර්මාන්තශාලාව ආරම්භ කිරීමේ අරමුණින් ඊට අවශ්‍ය බීජ උක් සැපයීම, ප්‍රදේශයට සුදුසු උක් ප්‍රභේද තෝරා ගැනීම ඇතුළුව පර්යේෂණ කටයුතු සඳහා පහසුකම් සැපයීම අරමුණු කරගෙන 2011 වර්ෂයේදී කන්තලේ සීනි කර්මාන්තායතනය සතු ඉඩමෙන් අක්කර 400 ක භූමි ප්‍රමාණයක් හා ගොඩනැගිලි 13 ක් ලබාගෙන තිබුණි. 27 දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයක් අනුයුක්ත කර 2023 වර්ෂය දක්වා වසර 12 ක කාලයක් පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් වශයෙන් රු. මිලියන 139 ක් වැයකර තිබුණද, කන්තලේ සීනි කර්මාන්තායතනය ආරම්භ නොකිරීම නිසා දරන ලද පිරිවැය නිෂ්කාර්ය වී තිබුණි.	2021 2023	කන්තලේ උප මධ්‍යස්ථානය පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය පිළිබඳව නැවත සලකා බැලීමටත්, එහි වත්කම්වලින් නිසි ප්‍රයෝජන ලබා ගැනීමටත් කටයුතු කළ යුතුය.	රේඛීය අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කර ලිඛිතව උපදෙස් ලබාගෙන ඒ අනුව කටයුතු කරන බව.	2024 සැප්තැම්බර් 25 දින වන විටත් අදාළ වත්කම් නිෂ්කාර්යව පවතින බව.
9.	උපාධි පාඨමාලා සහ වෙනත් වෘත්තීය විභාග හැදෑරීම සඳහා	2023	උපාධි පාඨමාලා සහ වෘත්තීය විභාග සඳහා ගාස්තු රජයේ මුදලින් දැරීමට	ආයතන නිලධාරීන් සඳහා ලබා දී ඇති උපාධි පාඨමාලා සහ වෘත්තීය ගාස්තු	නිලධාරීන් දෙදෙනෙකු පමණක් උපාධි පාඨමාලාව

	නිලධාරීන් 06 දෙනෙකු වෙත 2003 වර්ෂයේ සිට රු. 17,527,351 ක් ගෙවා තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට එම පාඨමාලා කාලයන් අවසන් වී තිබුණු නමුත් නිලධාරීන් විසින් අදාළ සුදුසුකම් සම්පූර්ණ කරගත් බව විගණනයට තහවුරු නොකෙරුණි.		පෙර විධිමත් අනුමැතිය ලබාගත යුතුය.	ගෙවීමට පෙර අදාල උපාධි පාඨමාලාවන් වෘත්තීය විභාගයන් පිළිබඳ සියළු විස්තර සහිතව උක් පර්යේෂණ ආයතනීය පාලක මණ්ඩළයේ දී අනුමත කරනු ලැබේ.	සම්පූර්ණ කර උපාධි ප්‍රධානෝත්සවය පවත්වන තෙක් සහතික ඉදිරිපත් කිරීමට නොහැකි වී ඇති අතර අනෙකුත් අය පාඨමාලා සම්පූර්ණ නොකිරීම සම්බන්ධයෙන් ආයතනයේ පාලක මණ්ඩලය දැනුවත් කර පාලක මණ්ඩලය විසින් ඔවුන්ට පාඨමාලාව අවසන් කිරීම සඳහා අවසන් දින වකවානු නියම කිරීම පමණක් සිදුකර ඇත.
10.	නිලධාරීන් 48 දෙනෙකු සඳහා මාසිකව කුලී අයකිරීමෙන් තොරව ලබාදී තිබුණු නිල නිවාස සඳහා සමාලෝචිත වර්ෂයේදී විදුලි ගාස්තු වෙනුවෙන් ආයතනය විසින් රු.2,034,663 ක් වැයකර තිබුණි.	2023	නිල නිවාසය සඳහා නියමිත පරිදි කුලී මුදල් අයකළ යුතුය. නිල නිවාසවල විදුලි ගාස්තු හා ජල ගාස්තු අදාළ නිලධාරීන් විසින් දරාගත යුතුය.	ක්‍රියාමාර්ග ගෙන නොමැත.	2024 සැප්තැම්බර් 25 දින වන විටත් නිවාස කුලී සහ විදුලි වියදම් අයකර නොමැත.
11.	ඉදිකිරීම් කර්මාන්ත 10 ක් සඳහා රු. 34,931,153 ක ඇස්තමේන්තු සකස් කර තිබුණු අතර	2023	පෞද්ගලික ගිණුමකට ගෙවා ඇති මුදල් නැවත අයකර ගත යුතුය.	ක්‍රියාමාර්ග ගෙන නොමැත.	2024 සැප්තැම්බර් 25 දින වන විටත් අදාළ මුදල් අයකරගෙන

	ඇස්තමේන්තු සකස් කිරීමේ කොන්ත්‍රාත් පරිපාලන ගාස්තු ලෙස රු. 1,471,122 ක මුදලක් මහවැලි අධිකාරියේ නියෝජ්‍ය නේවාසික ව්‍යාපාර කළමනාකාර (ඉංජිනේරු) වරයෙකුගේ පෞද්ගලික ගිණුමකට ගෙවා තිබුණි.				නොමැත.
12.	වලව නියෝජ්‍ය නේවාසික ව්‍යාපාර කළමනාකාර (ඉංජිනේරු) වරයා විසින් මහවැලි අධිකාරියේ ලිපි ශීර්ෂ භාවිතා කර ඉදිකිරීම් කර්මාන්ත 02 ක් සඳහා 2021 වර්ෂයේ සකස් කර තිබුණු රු.24,411,265 ක ඇස්තමේන්තු වලට අදාළ වැඩ කොටස් විගණිත දිනය වූ 2024 මාර්තු 13 දින වන විටත් ආරම්භ කර නොතිබුණු නමුත් ඇස්තමේන්තු සකස් කිරීමේ ගාස්තු ලෙස රු.976,425 ක් එම නිලධාරියාගේ පුද්ගලික ගිණුමට ගෙවා තිබුණි.	2021 2023	අනුමැතියකින් තොරව පෞද්ගලික ගිණුමකට ගෙවා ඇති රාජ්‍ය මුදල් නැවත අයකරගත යුතුය.	ක්‍රියාමාර්ග ගෙන නොමැත.	2024 සැප්තැම්බර් 25 දින වන විටත් අදාළ මුදල් අයකරගෙන නොමැත.

13.	ඉදිකිරීම් කර්මාන්ත 20 ක් සඳහා බාහිර පුද්ගලයින් දෙදෙනෙකු සහ ආයතනයක් වෙතින් රු.33,704,917 ක ඇස්තමේන්තු සකස් කර ගෙන ඇස්තමේන්තු සකස් කිරීම් ගාස්තු වශයෙන් රු.621,456 ක් ගෙවා තිබුණු අතර එම ගාස්තු ගෙවීමේ පදනම සහ ගාස්තු ගෙවීම සඳහා අනුමැතිය විගණනයට ඉදිරිපත් නොකෙරුණි.	2023	විධිමත් අනුමැතියකින් තොරව බාහිර පුද්ගලයන්ට සහ ආයතනවලට ගෙවා ඇති මුදල් අයකරගත යුතුය.	ක්‍රියාමාර්ග ගෙන නොමැත.	2024 සැප්තැම්බර් 25 දින වන විටත් අදාළ මුදල් අයකරගෙන නොමැත.

3.111 ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	373,662,679	79,841,356	293,821,323	(2,251,968)	තත්ත්වාගණනය කළ
2022	317,313,736	52,492,658	264,821,078	13,913,000	තත්ත්වාගණනය කළ
2023	428,684,384	75,580,908	353,103,476	(3,173,781)	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	ජාතික පසු අස්වනු කළමණාකරන ආයතනයේ ක්‍රියාත්මක පර්යේෂණ අංශය මඟින් පර්යේෂණ ක්‍රියාවලියකින් පසුව නව උත්පාදන නිෂ්පාදනය කර සමාජගත කිරීම ප්‍රධාන අරමුණක් වේ. නමුත් සිදුකරන ලද විගණන පරීක්ෂාවේදී 2000 වර්ෂයේ සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා වූ වර්ෂ 24 ක කාලය තුළ යාන්ත්‍රික වැඩපොළේ පවත්වාගෙන යන නිෂ්පාදිත යන්ත්‍ර සහ උපකරණ ලේඛනය අනුව එළිදක්වා ඇති නව උත්පාදන යන්ත්‍ර වර්ග 19 න් එක්	2022	සමාජ අවශ්‍යතාවය හඳුනාගෙන යන්ත්‍ර නිපදවීමටත්, ඒවා කාර්යක්ෂම සමාජගත කරමින් ආයතනයේ කාර්යසාධනය ඉහළ නැංවීමටත් කටයුතු කළ යුතුය.	දේශීය යන්ත්‍ර නිෂ්පාදනයේදී යොදාගන්න අමුද්‍රව්‍ය මිල අනෙකුත් රටවලට සාපේක්ෂව ඉහළ අගයක් ගන්නා බැවින් විදේශයෙන් ගෙන්වන ආදේශක යන්ත්‍ර දේශීය නිෂ්පාදිත යන්ත්‍ර වලට සාපේක්ෂව ඉතා අඩු මිලකට අලෙවි කරන බැවින් මෙම යන්ත්‍ර සමාජගත කිරීමේ අපහසුතවයක්ද පවතී. තවද මෙම බොහෝ යන්ත්‍ර පර්යේෂණ මගින් හඳුන්වා දී අවුරුදු 10 කට වඩා පැරණි අතර මේ වන විට මෙම යන්ත්‍ර වලට	නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.

	යන්ත්‍ර වර්ගයක් පමණක් සමාජ ගත කර තිබුණි.			වඩා ඉහල තාක්ෂණයෙන් යුත් ක්‍රියාකාරී යන්ත්‍ර බිහි වී ඇති බැවින් ද මෙම යන්ත්‍ර සමාජ ගත කිරීම අපහසු වී ඇත.	
2	2016 වර්ෂයේ සිට 2019 අගෝස්තු මාසය දක්වා කාලය තුළ ක්‍රියාත්මක කර තිබූ පළතුරු ඉදවීමට කාබනික ක්‍රම හඳුන්වාදීමේ පර්යේෂණයේ (Induction Of Fruit Ripening By Organic method) සොයා ගැනීම් සඳහා පේටන්ට් අයිතිය ලබා ගැනීම හා පර්යේෂණයේ ප්‍රතිඵල වාණිජ මට්ටමින් ප්‍රචලිත කිරීම සඳහා රු.9,572,715ක් වැය කර තිබුණද, විගණිත දිනය වූ 2023 දෙසැම්බර් 31 දින වන විටද ව්‍යාපෘතිය ක්‍රියාකාරී මට්ටමේ නොතිබුණි.	2022 2023	විගණන නිරීක්ෂණයන් සමාලෝචනය කර නිරවුල් කිරීම සඳහා විධිමත් ක්‍රියාමාර්ගයන් ගත යුතුය.	කාබනික ක්‍රම මඟින් පලතුරු ඉදවීම උත්තේජනය (Induction of fruit ripening by organic methods) යන පර්යේෂණ ව්‍යාපෘතිය සඳහා මෙම මුදල වැයවී ඇත්තේ පලතුරු ඉදවීමේ ක්‍රියාවලියට අදාලව අත්‍යවශ්‍ය විද්‍යාගාර විශ්ලේෂන කටයුතු කිහිපයක් සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනීමට වන අතර, මේ ආශ්‍රිතව පර්යේෂණ ප්‍රකාශන 03ක් සිදු කොට ඇත. තවද හඳුනාගත් තාක්ෂණයන් වාණිජව භාවිතා කිරීමේ ශක්‍යතාව අඩු බව හඳුනා ගැනින. වාණිජ මට්ටමේ ශක්‍යතාව අඩු නිසා පේටන්ට් බලපත්‍ර ලබා ගැනීම සිදු නොවිණි.. මේ සඳහා අවශ්‍ය GC යන්ත්‍රයක්, ජෙනරේටරයක්, Refrigerated	නිර්දේශයේ පරිදි කටයුතු කර නොතිබුණි.

				Centrifuge යන උපකරණ ලබා ගැනීමට රුපියල් අසූ දෙලක්ෂයක පමණ මුදලක් වැය වී ඇති අතර, මෙම උපකරණ දැනටමත් භාවිතයේ පවතී.	
3	2017 වර්ෂයේ කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍රතිපාදන උපයෝගී කරගෙන ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහන යටතේ ආනයන කරනු ලබන ආහාර වර්ග 07 ක, බැරලෝහ වර්ග 04 ක් අන්තර්ගතව තිබේද යන්න පරීක්ෂා කිරීමට ක්‍රියාත්මක කර තිබූ ව්‍යාපෘතිය සඳහා 2017 වර්ෂයේ රු.1,956,120 ක වියදමක් දරා නියැදි 500 ක් පරීක්ෂා කර තිබුණි. ඊට අදාළ ව්‍යාපෘති වාර්තාව අනුව ඇතැම් ආහාර ද්‍රව්‍යවල උපරිම ආරක්ෂක මට්ටම ඉක්මවා Cadmium, Arsenic And Leaf වැනි බැරලෝහ අන්තර්ගත බව තහවුරු කරගෙන තිබුණි. එසේ වුවද, එම වාර්තාවේ නිගමන හා යෝජනා අනුව බැරලෝහ අන්තර්ගත ආහාර ද්‍රව්‍යයන්	2021 2022 2023	විගණන නිරීක්ෂණයන් සමාලෝචනය කර නිරවුල් කිරීම සඳහා විධිමත් ක්‍රියාමාර්ගයන් ගත යුතුය.	ව්‍යාපෘතියේ මූලික සැලසුම අනුව අවසන් වාර්තාව නිකුත් කිරීමට සැලසුම් කරන ලද්දේ සාම්පල 1000 පරීක්ෂා කිරීමෙන් පසුව බැවින් සාම්පල 500 ක් පලමු වසරේදී විශ්ලේෂණය කරන ලදී. නමුත් ඊලග සාම්පල 500 විශ්ලේෂණය කිරීම සඳහා මුදල් ලබා නොදුන් බැවින් එම විශ්ලේෂණය කරන ලද සාම්පල 500 වාර්තාව ඉදිරි කටයුතු සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශයට බාර දී ඇත. මෙම පර්යේෂණයට අදාලව පර්යේෂණ පත්‍රිකාවක් 2019 වසරේදී ප්‍රකාශයට පත් කර ඇත.	නිර්දේශයේ පරිදි කටයුතු කර නොතිබුණි.

පිළිබඳ වැඩිදුර පරීක්ෂාවක් ආයතනය විසින් සිදුකර, ඒ සම්බන්ධව වගකිවයුතු සියළුම පාර්ශව වෙත නිසි ක්‍රියාමාර්ග ගැනීම සඳහා තොරතුරු ලබාදී නොතිබුණි. මේ සම්බන්ධයෙන් ජාතික විගණන කාර්යාලය විසින් 2023 වර්ෂයේ අමාත්‍යාංශයේ පැවති විගණන හා කළමනාකරණ කමිටුවේ අවධානයද යොමුකර ඇතත් පර්යේෂණ සඳහා වැය වූ මුදල නිශ්කාර්ය වියදමක් බවට පත් වෙමින් පැවතිණි.

3.112 මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	බදු පෙර ලාභය (අලාභය) රු.	මතය
2021	509,535,947	232,819	509,303,128	-	තත්ත්වාගණනය කළ
2022	578,267,380	348,946	577,918,433	-	තත්ත්වාගණනය කළ
2023	706,785,577	344,369	706,441,208	-	තත්ත්වාගණනය කළ

	විගණන වාර්තාවට ඇතුළත් කර ඇති ප්‍රධාන අඩුපාඩු	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ පියවර	වාර්තාවේ දිනට නිර්දේශ ක්‍රියාත්මක තත්ත්වය
1	අවසන් ගිණුම් අනුව කාණ්ඩ 7කට අදාළ රු.4,385,243 ක් වටිනා ස්ථාවර වත්කම් තහවුරු කර ගැනීම සඳහා ඊට අදාළ විස්තරාත්මක උපලේඛන හා ස්ථාවර වත්කම් ලේඛනය විගණනයට ඉදිරිපත් නොවුණි. එබැවින් එම ස්ථාවර වත්කම්වල වටිනාකම සහ ඊට අනුරූපී ක්ෂය වටිනාකම්වල නිවැරදිතාවය පිළිබඳව විගණනයේදී සනාථ කරගත නොහැකි විය.	2023	ස්ථාවර වත්කම් ලේඛණය හා විස්තරාත්මක උපලේඛන සකස් කළ යුතුය.	ස්ථාවර වත්කම් ලේඛනයක් සභාව සතුව නොමැති බව, ආරම්භක ශේෂයට නව මිලදී ගැනීම් ගළපන ලද වටිනාකම් 2023 අවසන් ගිණුම් තුළ ඇතුළත් කරන ලද බව, සියලුම වත්කම් ප්‍රත්‍යාගණනය කර යාවත්කාලීන වටිනාකම් හඳුනා ගැනීමටත්, ස්ථාවර වත්කම් ලේඛනයක් සකස් කිරීමටත් කටයුතු කරන බව දන්වා තිබුණි.	ස්ථාවර වත්කම් ලේඛණය හා විස්තරාත්මක උපලේඛන සකස් කර නොතිබුණි.

2	2014 දෙසැම්බර් 12 වන දිනැති පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවේ පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 351 හි 10.6 වගන්තිය අනුව රටේ මාර්ග ආරක්ෂාව වඩා හොඳින් කළමනාකරණය කිරීම සඳහා මෙම ආයතනය ජාතික කොමිෂන් සභාවක් බවට පත් කර ඊට අවශ්‍ය බලතල, අධිකාරිය හා මූල්‍ය සම්පත් ලබා දීම, කොමිෂන් සභාවේ කටයුතු වලට සහය වීම සඳහා ඉහළ සුදුසුකම් සහිත පුහුණුවලත් කාර්යමණ්ඩලයකින් සමන්විත පූර්ණ ලේකම් කාර්යාලයක් ස්ථාපිත කිරීම කළයුතු වුවද, උක්ත විධිවිධාන ප්‍රකාරව මෙතෙක් මෙම ආයතනය කොමිෂන් සභාවක් ලෙස ස්ථාපිතකර නොතිබීම හේතුවෙන් මෙම සභාවේ කාර්යන් ඉටුකිරීමට විධිමත් නෛතික බලයක් ලැබී නොතිබුණි.	2021, 2022, 2023	මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික කොමිෂන් සභාව ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතුය.	කොමිෂන් සභාවක් බවට පත් කිරීම සඳහා අවශ්‍ය අවසන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව එම කාර්යය තාවකාලිකව නවතා දමන ලෙස ජනාධිපති ලේකම් කාර්යාලය මඟින් දන්වන ලදි. එම පනත් කෙටුම්පත 2024 වර්ෂයේදී නැවත නීති කෙටුම්පත් සම්පාදක වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලදි. තවද,මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව සඳහා කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව සංවර්ධන නිලධාරීන් 05 දෙනෙකු, අධ්‍යක්ෂවරයෙක්, සහකාර අධ්‍යක්ෂවරයෙක් හා ගණකාධිකාරීවර යෙක් වශයෙන් කාර්ය මණ්ඩලය අනුමත කර තිබුණි.	කොමිෂන් සභාවක් ලෙස ස්ථාපිත කර නොමැත.

3	අංක 2245/31 හා 2021 සැප්තැම්බර් 17 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව රක්ෂණ ආයතන 14 ක් විසින් ප්‍රේෂණය කර තිබුණු රු.74,206,951 ක රක්ෂණ ආදායමේ නිවැරදිතාවය තහවුරු කර ගත හැකි ආකාරයේ අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් කළමනාකරණය විසින් සකස්කර නොතිබුණි.	2021, 2022, 2023	අදාළ රක්ෂණ ආයතන විසින් ප්‍රේෂණය කරනු ලබන මුදල්වල නිවැරදි භාවය තහවුරු කර ගත හැකි ආකාරයේ අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් කළමනාකරණය විසින් සකස් කළ යුතුය.	ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව හා රක්ෂණ ආයතනය සතුව රක්ෂණ දායකත්වයට අදාළ තොරතුරු නොමැති බැවින් එම ආයතනවල එකඟතාවය මත සභාව මඟින් රක්ෂණ ආයතන වෙත ලබා දී ඇති ආකෘති පත්‍රය අදාළ ආයතනයේ ප්‍රධාන අභ්‍යන්තර විගණකගෙන් හෝ ප්‍රධාන මූල්‍ය නිලධාරීගෙන් තහවුරුවක් සහිතව මාසිකව සභාව වෙත ලබා ගැනීමට කටයුතු කරන බව දන්වා තිබුණි.	ක්‍රමවේදයක් ස්ථාපිත තර නොතිබුණි.
4	2021 පෙබරවාරි 10 දිනැති රජයේ ගිණුම්කාරක සභාව විසින් ලබා දී තිබු නියෝගය පරිදි ආයතනය විසින් අධික වේගය නිසා සිදු වන මාර්ග අනතුරු අවම කිරීමේ වැඩසටහන් 2021 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීමට අදාල ප්‍රසම්පාදන කටයුතු සම්පූර්ණ නොකිරීම හේතුවෙන් වසර තුනක් ගත වුවද	2021, 2022, 2023	ගිණුම්කාරක සභා නියෝගය ක්‍රියාත්මක කළ යුතුය.	2021,2022,2023 ක්‍රියාකාරී සැලසුම්වල ඇතුළත් කර රු.මි.150 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණු ශ්‍රී ලංකා පොලීසියට අවශ්‍ය වේග මාපක ඇතුළු තාක්ෂණික උපකරණ ලබා දීම සඳහා වන ව්‍යාපෘතිය සඳහා වන රාජ්‍ය	ක්‍රියාත්මක කිරීමට අදාල කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

	අදාල නියෝගය ක්‍රියාත්මක කර නොතිබුණි.			ගිණුම්කාරක සභාවේ නියෝගය අවලංගු කර ගැනීමේ අපේක්ෂාව ඇතිව 2023 සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මෙන් ඉවත් කිරීමට කටයුතු කර තිබුණි.	
5	මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 2014 පෙබරවාරි 17 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2014 (4) (ඇ) වගන්තිය ප්‍රකාරව ආයතනය විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සමඟ පිළියෙල කර තිබුණු වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මෙහි රු.මිලියන 120 ක් වටිනා ක්‍රියාකාරකම් 31 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම්කර කර තිබුණද, රු.මිලියන 52 ක් වටිනා ප්‍රසම්පාදන කාර්යයන් 20 ක කිසිදු කාර්යසාධනයක් වාර්තා වී නොතිබුණු අතර, තවත් ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් 11 ක අපේක්ෂිත ඉලක්කගත අරමුණු	2021, 2022, 2023	ප්‍රසම්පාදන සැලසුම තාත්වික වියයුතු අතර, ආයතනයේ අපේක්ෂිත අරමුණු ලඟාකර ගැනීම සඳහා එමගින් කටයුතු කළ යුතුය.	සභාපති ධූරය 2023 වසර තුළදී තෙවරක් වෙනස් වීම හේතුවෙන් 2023 ක්‍රියාකාරී සැලැස්ම, ප්‍රසම්පාදන සැලැස්ම හා අයවැය සංශෝධනය කළ අතර ඒ සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලැබීමෙන් අනතුරුව එහි කටයුතු ආරම්භ කලද අපේක්ෂිත පරිදි කාර්යයන් අවසන් කිරීමට නොහැකි වූ බැවින් නව සංශෝධන ඇතුළත් කර 2024 ක්‍රියාකාරී සැලැස්ම, ප්‍රසම්පාදන සැලැස්ම හා අයවැය ලේඛනය සකස් කරන ලදි.	2024 වර්ෂයේදී ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර ඇතත් ප්‍රගතිය අවම මට්ටමක පැවතුණි.

	සැලසුම් කළ පරිදි ඉටු වී නොතිබුණු බවත්, එහි මූල්‍ය කාර්යසාධනයේ සාමාන්‍ය සියයට 10 ක් පමණක් බවත් නිරීක්ෂණය වූයෙන්, ආයතනය විසින් 2023 වර්ෂය සඳහා සකස්කළ ප්‍රසම්පාදන සැලැස්ම කාර්යක්ෂමතාවයකින් යුතුව ක්‍රියාත්මක කරමින් අපේක්ෂිත අරමුණු ලඟාකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.			2024 වර්ෂයේදී අපේක්ෂිත කාර්ය සාධනය ලඟා කර ගැනීමට කටයුතු කරන බව දන්වා තිබුණි.	
6	ආයතනය විසින් පිළියෙල කළ ක්‍රියාකාරී සැලැස්මේ කුළුණු (Pillars) 05 ක් යටතේ ක්‍රියාත්මක කළ යුතු රු.මිලියන 110 ක් වටිනා ව්‍යාපෘති 22 කට අදාළව කාර්යයන් 35 ක් හඳුනාගෙන සැලසුම්කර තිබුණද,ඉන් රු.මිලියන 55ක වටිනාකමින් යුතු කාර්යයන්ගෙන් 21ක් එනම් සියයට 50ක් සම්පූර්ණයෙන්ම ඉටු කර නොතිබුණි. තවද, ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් ඇස්තමේන්තුගත වටිනාකම රු.මි.55 ක් වූ ව්‍යාපෘති 09 කට අදාළ කාර්යයන් 14 ක් සමාලෝචිත	2023	ක්‍රියාකාරී සැලැස්ම තාත්වික විය යුතු අතර සැලසුම් කල පරිදි එහි ඇතුළත් කාර්යයන් ඉටු කල යුතුය.	සභාවේ සභාපති තනතුර විටින් විට වෙනස් වූ අතර 2023.06.16 දිනැති ජාතික සභා රැස්වීමේදී සභාවේ 2023 ක්‍රියාකාරී සැලැස්ම, ප්‍රසම්පාදන සැලැස්ම හා අයවැය සංශෝධනය කළ අතර, ඒ සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලැබීමෙන් අනතුරුව එහි කටයුතු ආරම්භ කලද, අපේක්ෂිත පරිදි කාර්යන් අවසන් කිරීමට නොහැකිවූ බැවින් එම	කාර්යසාධනය උපරිම මට්ටමට ළඟා කර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොමැත.

	වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීම ආරම්භ කර, ඒ සඳහා රු.මිලියන 25 ක් වැය කර තිබුණද, එම ව්‍යාපෘතිවල කාර්යසාධනය සියයට 50 ට අඩු මට්ටමක පැවතුණි.			සංශෝධනයන් එක් කරමින් 2024 ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රසම්පාදන සැලැස්ම සකස් කරන ලදි.	
7	මාර්ග ආරක්ෂාව සම්බන්ධයෙන් ඇති පොත් හා වෙනත් තොරතුරු පරිශීලනය කිරීම සඳහා 2005 අප්‍රේල් 04 දිනැති අංක 1387/4 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ 2(ආ) හි සඳහන් පරිදි මාර්ග ආරක්ෂාව විෂය පිළිබඳ පුස්තකාලයක් පවත්වාගෙන යාමට 2017 වර්ෂයේ සිට සැලසුම් කර තිබුණි. එසේම 2021 වර්ෂයේදී එය ඊ-පුස්තකාලයක් ලෙස රු.570,000 පිරිවැයක් සහිතව අවසන් කර තිබුණි. එය යාවත්කාලීන කිරීම හා ඒ සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාකාරකම් වෙනුවෙන් 2023 වර්ෂයේදී රු.700,000 ක් වෙන්කර ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර තිබුණද, 2023 සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මෙන් එය ඉවත් කර තිබුණි. ඒ	2023	යෝජනාවෙහි ඉදිරි කටයුතු විධිමත් පරිදි ක්‍රියාත්මක කළ යුතුය.	2021 වර්ෂයේදී ස්ථාපිත කරන ලද සභාවේ විද්‍යුත් පුස්තකාලය යාවත්කාලීන කිරීම හා ඒ සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කිරීම සඳහා වන ව්‍යාපෘතිය 2023 ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් කර තිබුණද, 2023 සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් නොවීම හේතුවෙන් සිදුවී ඇති දෝෂය හඳුනාගෙන එය 2024 ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කරන ලද අතර, විද්‍යුත් පුස්තකාලය පිහිටුවීමේ අරමුණු ඉටුවන පරිදි 2024 වර්ෂයේදී එය යාවත්කාලීන කිරීමටත් ඒ සම්බන්ධයෙන් ජනතාව ප්‍රමාණවත් පරිදි දැනුවත් කිරීමටත්	ඊ-පුස්තකාලය ක්‍රියාත්මක කර නොතිබුණි.

	හේතුවෙන් ඊ-පුස්තකාල ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ඉටුවී නොතිබුණි.			කටයුතු කරන බව දන්වා තිබුණි.	
8	2022 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ කුළුණු 01 යටතේ ක්‍රියාත්මක කර තිබුණු "යතුරුපැදි අනතුරු අවම කිරීම" සඳහා වන පර්යේෂණයක් අදියර 4 ක් යටතේ සිදුකර 2022 වර්ෂය තුළ අවසන් කර වාර්තා ලබා ගැනීමට බාහිර පාර්ශවයක් වෙත එකඟතා ගිවිසුමකට අනුව පවරා තිබුණි.2023 වර්ෂයේ දී එහි අදියර 2 ක් පමණක් සම්පූර්ණ කර වාර්තාවක් සභාවට ලබා දී තිබුණද, මේ වනවිට පර්යේෂණයේ ඉතිරි අදියර 2 ක ක්‍රියාත්මක කිරීමට නොහැකි තත්ත්වයක් පැන නැගී ඇති අතර,ඒ සඳහා මෙතෙක් දරා තිබූ රු.700,000 ක මුදල නිශ්කාර්ය වී තිබුණි. තවද, ව්‍යාපෘතිය ඉදිරියට ගෙන යාමේ අවිනිශ්චිතතාවය හා එකඟතා ගිවිසුම කඩකිරීම සම්බන්ධයෙන් සභාව විසින් අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.	2023	ගිවිසුම් කඩවීම සම්බන්ධයෙන් ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළයුතු අතර පර්යේෂණය සම්පූර්ණ කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය.	පර්යේෂණ කාර්යයයෙහි අදියර 2 ක් සම්පූර්ණ කර එහි වාර්තාවන් මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව වෙත ලැබී ඇති අතර 2024 වර්ෂයේදී අදාළ පාර්ශවය විසින් ඉතිරි වාර්තා දෙකෙන් එක් වාර්තාවක් සභාව වෙත යොමු කර ඇත. මේ සම්බන්ධයෙන් ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳව ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම්ගෙන් විමසීම් සිදු කර තිබුණි.	පර්යේෂණය සම්පූර්ණ කර නොමැති අතර ගිවිසුම් කඩවීම සම්බන්ධයෙන් පියවර ගෙන නොතිබුණි.

3.113 ශ්‍රී ලංකා හදබිම අධිකාරිය

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	බදු පෙර ලාභය (අලාභය) රු.	මතය
2021	113,175,891	49,073,403	64,102,488	18,878,424	තත්ත්වාගණනය කළ
2022	142,602,309	46,855,825	95,746,484	15,279,737	තත්ත්වාගණනය කළ
2023	242,938,613	50,527,233	192,411,380	57,991,050	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1.	ශ්‍රී ලංකා හදබිම අධිකාරිය සතුව පැවති අලෙවි අංශයට සැපයුම්කරුවන් විසින් 2014 සහ 2015 වර්ෂවලදී සපයන ලද භාණ්ඩ වෙනුවෙන් වංචනික ලෙස දෙවරක් මුදල් ගෙවා තිබීම සම්බන්ධයෙන් කරන ලද විධිමත් විනය පරීක්ෂණයේ නිර්දේශ වාර්තාව අනුව නිලධාරීන්ගෙන් අය කරගත යුතු මුදල රු.2,116,410 ක් විය. ඉන් රු.844,251 ක් සමාලෝචිත වර්ෂය තුළදී අයකරගෙන තිබුණු අතර රු.1,272,159 ක මුදලක් තවදුරටත් අයකරගත යුතුව පැවතුණි.	2021	හිඟ මුදල අයකර ගැනීමට පියවර ගත යුතුය.	අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇති බව.	තව දුරටත් අයකර ගත යුතු මුදල රු.1,112,240 ක් වේ.

2.	ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ කළමනාකරණ සහකාර (තාක්ෂණික) නිලධාරීන් බඳවාගැනීම සඳහා වූ පරිපාටියේ 5.3(ii) ඡේදයෙන් නියමකර තිබෙන විධිවිධාන අනුව පවත්වන ලද ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ඉහළම ලකුණු ලැබූවන් අතරින් කුසලතා අනුපිළිවෙල අනුව සුදුස්සන් තෝරාගෙන පත්වීම් ලබාදිය යුතු වුවද පවත්වන ලද ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ඉහළම ලකුණු ලබාගෙන පළමු ප්‍රමුඛතාවයේ සිට 4 වන ප්‍රමුඛතාවය දක්වා වූ ප්‍රමුඛතා ලැබූ අයදුම්කරුවන් හතරදෙනාට පත්වීම් ලබා නොදී ප්‍රමුඛතාවය 7,14 සහ 18 (18 යටතේ අයදුම්කරුවන් දෙදෙනෙක් ඇත.) ලබා සිටි අයදුම්කරුවන් 4 දෙනාට පත්වීම් ලබාදී තිබුණි. මේ අනුව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ඉදිරිපත් කර තිබුණු කුසලතා පිළිවෙල නොසලකා පත්වීම් ලබා දී තිබුණි.	2021	බඳවා ගැනීමේ පරිපාටියට අනුව බඳවා ගැනීම් කළ යුතුය.	පිළිතුරු සපයා නැත.	බඳවා ගැනීමේ පටිපාටිය අනුව බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි.
3.	ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ කලාප නිලධාරීන් බඳවාගැනීම සඳහා වූ පරිපාටියේ 4.3.3(1) ඡේදයෙන්	2021	බඳවා ගැනීමේ පටිපාටියට අනුව බඳවා ගැනීම් කළ යුතුය.	පිළිතුරු සපයා නැත.	බඳවා ගැනීමේ පටිපාටිය අනුව බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

	නියමකර තිබෙන විධිවිධාන අනුව පවත්වන ලද ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ඉහළම ලකුණු ලැබූවන් අතරින් කුසලතා අනුපිළිවෙල අනුව සුදුස්සන් තෝරාගෙන පත්වීම් ලබාදිය යුතු වුවද පවත්වන ලද ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණවලදී ඉහළම ලකුණු ලබාගෙන පළමු ප්‍රමුඛතාවය හිමිකරගත් අයදුම්කරුට ලබානොදී 6 වන ප්‍රමුඛතාවය ලබාගත් අයදුම්කරුට කලාප නිලධාරී පත්වීම ලබා දී තිබුණි. මේ අනුව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ඉදිරිපත් කර තිබුණු කුසලතා පිළිවෙල නොසලකා පත්වීම් ලබා දී තිබුණි.				
4.	කොත්මලේ අක්කර 05 ක ගොවිපල ඉඩම අධිකාරියට පවරා ගෙන නොතිබුණි.	2021 2022 2023	ගොවිපල ඉඩම පවරාගැනීමට කටයුතු කළ යුතුය.	ඒ සම්බන්ධයෙන් කෘෂිකර්ම අමාත්‍යතුමා දැනුවත් කිරීමට කටයුතු කර ඇති බව.	2024 සැප්තැම්බර් 30 දින තෙක් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.
5.	පල්ලේකැලේ ගොවිපලේ ජලාශය ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය රු. 5,751,630 ක මුදලකට කොන්ත්‍රාත්කාර ආයතනයකට ඉදිකිරීම් පවරා දින රහිත ගිවිසුමක් අත්සන් කර තිබුණි. අධිකාරිය වෙනුවෙන් අධිකාරියට	2023	කොන්ත්‍රාත් ඉටුකිරීමේ දී විධිමත් පරිදි ගිවිසුම්ගත විය යුතු අතර ගිවිසුමේ සඳහන් පරිදි ඉදිරි කටයුතු සිදු කළ යුතුය. ඉටු නොකළ වැඩ සඳහා ගෙවීම් කළ නිලධාරීන් සම්බන්ධව අවශ්‍ය	ඉංජිනේරුවරයෙකුගේ පරීක්ෂාවට ලක් කිරීමට අවශ්‍ය වු බැවින් අදාල චෙක්පත් රඳවා ගැනීමට කටයුතු කර ඇතිබව.	විගණනයෙන් පෙන්වා දීමෙන් පසු රු.2,617,122 ක් පමණක් ගෙවා ඇත. ප්‍රමාද ගාස්තු රු.213,230 ක් අය කර ඇත. එසේම සියයට 10 රඳවා

අයත් නොවන බාහිර ඉංජිනේරුවරියෙකුගේ නමක් යොදා කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුම් ගතව තිබුණි. ඉදිකිරීම් භූමියේ පස් ඉවත් කිරීම සඳහා ඝන මීටර් 1727 ක් සඳහා රු.1,770,641 ක් වැඩිපුර ගෙවා තිබුණු අතර ඇල හා සොරොව්ව ඉදිකිරීමේදී දඟර වානේ කම්බි සඳහා රු.22,943 ක් වැඩිපුර ගෙවා තිබුණි. ගිවිසුම් අනුව ව්‍යාපෘතිය 2023 දෙසැම්බර් 30 දින වැඩ අවසන් කල යුතු වුවත් 2024 පෙබරවාරි 28 දින වන විටත් වැඩ අවසන් කර නොතිබුණු බැවින් දින 61 ක් සඳහා රු.171,145 ක ප්‍රමාද ගාස්තු ද ඇලේ හා වැව් පතුලේ පස් ඉවත් කිරීමේදී ඝන මීටරයකට රු.520 ක් වෙනුවට ඝන මීටරයකට රු.1,025 ක් ගෙවීම හේතුවෙන් රු.1,920,026 ක් වැඩිපුර ගෙවා තිබුණි.	ක්‍රියාමාර්ග ගත යුතුය.	ගැනීමක්ද සිදු කර ඇත.ගෙවා ඇති මුදල තුළ පස් ඉවත් කිරීමට ඝන මීටර් 1557.25 ක් සඳහා රු.786,832 ක් වැඩිපුර ගෙවා තිබුණි.

3.114 හෝමියෝපති වෛද්‍ය සභාව

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	13,466,377	2,966,726	10,499,651	(312,581)	තත්ත්වාගණනය කළ
2022	2022	1.6 (අ) (i)	2022	1.6 (අ) (i)	තත්ත්වාගණනය කළ
2023	-	-	-	-	-

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය හා යොමුව	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	2016 අංක 10 දරන හෝමියෝපති පනතේ 31(1) උපවගන්තිය ප්‍රකාරව, හෝමියෝපති ඖෂධවේදීන් ලියාපදිංචිකිරීම සඳහා හෝමියෝපති ඖෂධවේදී ලේඛනයක් පවත්වාගත යුතු වුවද, 2022 ඔක්තෝබර් 31 දින වනවිටත් එම ලේඛනය පවත්වාගෙන යාමට කටයුතු කර නොතිබුණි.	2021-1.5 (ආ)(iv) 2022-1.6 (අ)(ii)	හෝමියෝපති පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.	හෝමියෝපති රෙගුලාසි මේ වන විට සකස් වෙමින් පවතින අතර ගැසට් කිරීම අවසන් වූ විගස ඖෂධවේදීන් ලියාපදිංචි කිරීම සිදු කළ හැකි බව. .	2024 සැප්තැම්බර් 30 දින වන විටත් මෙම තත්ත්වය නිවැරදි කර නොතිබුණි.
2	ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 16.1 වගන්තිය ප්‍රකාරව, සේවයෙහි ස්ථිරකිරීම, උසස් කිරීම හා කාර්යක්ෂමතා කඩඉම් වලින් උසස් කිරීම ආදී විභාග නියමිත දිනවල පැවැත්වීමට ආයතන ප්‍රධානී වගබලා ගතයුතු	2021-1.5 (ඇ) (i) 2022-1.6 (ඇ) (i)	ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.	කාර්යක්ෂමතා කඩඉම් විභාගය පැවැත්වීම සඳහා ආයුර්වේද දෙපාර්තමේන්තුව වෙත වෛද්‍ය සභාව විසින් බලය පවරා ඇති බව, ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් මෙය	2024 සැප්තැම්බර් 30 දින වන විටත් මෙම තත්ත්වය නිවැරදි කර නොතිබුණි.

	වුවද, 2014 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා බඳවාගෙන තිබුණු තනතුරු 04 කට අදාළව නිලධාරීන් 32 දෙනෙකු වෙනුවෙන් විගණිත දිනය වූ 2022 ඔක්තෝබර් 31 දින වනවිටත් කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීමට කටයුතු කර නොතිබුණි. මේ හේතුවෙන් මෙම නිලධාරීන් සේවයෙහි ස්ථිර කළ නොහැකිව තිබුණු අතර ඔවුන්ගේ පරිවාස කාලය දීර්ඝ කිරීමටද කටයුතු කර නොතිබුණි.			කඩිනමින් සිදු කරන බව දන්වා ඇති බව හා එතෙක් නිලධාරීන්ගේ පරිවාස කාලය දීර්ඝ කිරීමට වෛද්‍ය සභාව ඉදිරියේදී කටයුතු කරන බව.	
3	2016 අංක 10 දරන හෝමියෝපති පනතේ විධිවිධානවලට අනුව හෝමියෝපති වෛද්‍ය විද්‍යාලයක් ආරම්භ කිරීම සඳහා 2008 වර්ෂයේදී ගොඩනැගිල්ලක් ඉදිකර 2009 වර්ෂයේදී ඒ සඳහා රු. 1,199,254 ක ලී බඩු හා වෙනත් අවශ්‍ය උපකරණ සපයාගෙන තිබුණි. එහි අධ්‍යයන කටයුතු ආරම්භ කිරීමට අදාළ නීතිමය රාමුව පිළියෙල කිරීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් 2022 ඔක්තෝබර් 31 දින වන විටත් අධ්‍යයන කටයුතු ආරම්භ කිරීමට නොහැකි වී තිබුණි. ඒ අනුව මිලදීගෙන තිබුණු	2021-3.2 2022-3.2	ඉදිකර ඇති ගොඩනැගිල්ල හා මිලදී ගෙන ඇති උපකරණ අදාළ අරමුණ වෙනුවෙන් යොදවා ගැනීමට කඩිනමින් පියවර ගත යුතුය.	වෛද්‍ය විද්‍යාලයක් ආරම්භ කිරීම සඳහා ශික්ෂණ රෝහලක්, එක් එක් විෂයයන් සඳහා අධ්‍යනාංශ සුදුසුකම්ලත් ආචාර්ය මහාචාර්ය ආදී බොහෝ සම්පත් අවශ්‍ය වන බව, මේ වන විට ශ්‍රී ලංකාවේ මෙම සම්පත් කිසිවක් නොමැති බැවින් ඉදිකර ඇති කාමර 04 ක් සහිත ගොඩනැගිල්ල විනාශවීම වළක්වා ගැනීම සඳහා අමාත්‍යාංශයේ ලේකම්ගේ වාචික උපදෙස් මත සංවර්ධනය කර වෛද්‍ය සභා	2024 සැප්තැම්බර් 30 දින වන විටත් මෙම තත්ත්වය නිවැරදි කර නොතිබුණි.

	ස්ථාවර වත්කම් වර්ෂ 13 කට අධික කාලයක් තිස්සේ නිෂ්කාර්යව පැවතුන අතර ගොඩනැගිල්ල අරමුණුගත කාර්යයෙන් බැහැරව හෝමියෝපති වෛද්‍ය සභාවේ කාර්යාලය පවත්වාගෙන යාම සඳහා භාවිතා කර තිබුණි.			කාර්යාලය ලෙස තාවකාලිකව භාවිතා කරන බව.	
4	2016 අංක 10 දරන හෝමියෝපති පනතේ 15 වගන්තියේ (ඇ) හා (ඉ) උප වගන්ති ප්‍රකාරව, හෝමියෝපති වෛද්‍ය සභාව විසින් හෝමියෝපති ආයතනයක් පිහිටුවා නොතිබුණු අතර රජයේ හෝමියෝපති ශික්ෂණ රෝහල හැර හෝමියෝපති වෛද්‍ය ක්‍රමයට ප්‍රතිකාර ලබාදෙන හෝමියෝපති ආයතන නියාමනය කිරීම සඳහා අවම ප්‍රමිතීන්, රීති හා රෙගුලාසි පිළියෙල කිරීමට කටයුතු කර නොතිබුණු හෙයින් එම ආයතන නියාමනය කිරීමේ කාර්යය ඉටුවී නොතිබුණි.	2021-1.5 (ආ) (i) 2022-1.6 (අ) (i)	හෝමියෝපති පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.	හෝමියෝපති ආයතනයක් පිහිටුවීම සඳහා මූල්‍ය ප්‍රතිපාදන වෛද්‍ය සභාව සතුව නොමැති බව, සභාව වෙත වෙන් කරන ලද ප්‍රාග්ධන වියදම්ද මෙම වර්ෂය සඳහා ලබා නොදුන් බැවින් රටේ ආර්ථික තත්ත්වය සමතයකට පත් වන තෙක් ආයතනය පිහිටුවීම තාවකාලිකව කල්දමා ඇති බව හා නියාමනය සඳහා අවම ප්‍රමිතීන් තීරණය කිරීම රෙගුලාසි සකස් කිරීම මේ වන විට සිදු කරමින් පවතින බව.	2024 සැප්තැම්බර් 30 දින වන විටත් මෙම තත්ත්වය නිවැරදි කර නොතිබුණි.

3.115 ශ්‍රී ලංකා පදනම

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	බදු පෙර ලාභය (අලාභය) රු.	මතය
2021	922,787,363	379,889,978	542,897,384	24,437,646	තත්ත්වාගණනය කළ
2022	913,626,527	360,415,822	553,210,705	53,397,480	තත්ත්වාගණනය කළ
2023	919.986.832	89.227.164	830.759.668	8.806.726	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	154(6) වාර්ථාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	ශ්‍රී ලංකා පදනම විසින් උසස් ජාතික ඩිප්ලෝමා , ඩිප්ලෝමා සහ සහතික පත්‍ර පාඨමාලා සහ විවිධ වැඩමුළු 130 ක් සමාලෝචිත වර්ෂයේදී පවත්වා තිබුණි. ආයතනය තුළ ස්ථිර කථිකාචාර්යවරු 11 ක් සිටින අතර ඔවුන්ට වාර්ෂික වැටුප් හා වෙනත් දීමනා ලෙස රු.15,633,473 ක් සහ බාහිර කථිකාචාර්යවරු සඳහා රු.17,078,356 ක් වැටුප් ලෙස ගෙවා තිබුණි. නියැදි පරීක්ෂාවකදී පාඨමාලා සහ වැඩමුළු 94 කින් 67 ක් සඳහා මුළුමනින්ම බාහිර	2021	දැනට ස්ථිර තනතුරවල නිරතවන කථිකාචාර්ය වරුන්ගෙන් උපරිම සේවය ලබා ගැනීමට කටයුතු කළ යුතුය.	දැනට සිටින කථිකාචාර්යවරුන් විසින් විවිධ විෂය ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි පාඨමාලා පවත්වන බැවින් මේ සඳහා අභ්‍යන්තර වශයෙන් කථිකාචාර්යවරුන් බඳවා ගෙන පාඨමාලාවෙහි දේශන පවත්වනවාට වඩා බාහිර දේශකවරුන් මගින් එම පාඨමාලවන් සඳහා අවශ්‍ය කාලයට පමණක් යොදා ගැනීම මූල්‍ය වශයෙන් හා පරිපාලනමය වශයෙන් ලාභදායි හා ඵලදායි වන බැවින් බාහිර	අමාත්‍යාංශ හා ආයතනික විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්වලදි ගත් තීරණයක් අනුව බාහිර සම්පත්දයකයින් පාඨමාලාවල අවශ්‍යතාවය අනුව යොදා ගැනිමට කටයුතු සිදු කරනු ලැබේ.

	කථිකාචාර්යවරු පමණක් සේවයේ යොදවා තිබූ අතර පාඨමාලා 27 කදී බාහිර කථිකාචාර්යවරුන්ගේ සම්පත් දායකත්වය සියයට 75 ඉක්මවා තිබුණි. ආයතනයේ පාඨමාලා සම්බන්ධීකරණ ඒකකයක් පැවතිය ද පදනමේ ස්ථිර කථිකාචාර්යවරු මෙම පාඨමාලාවල සම්බන්ධීකරණ කටයුතු පමණක් සිදු කර තිබුණි.			සම්පත්දයකයින් යොදා ගැනිමට කටයුතු කිරීම	
2	ශ්‍රී ලංකා පදනම විසින් උසස් ජාතික ඩිප්ලෝමා, ජාතික ඩිප්ලෝමා, සහතික පත්‍ර පාඨමාලා සහ විවිධ වැඩමුළු 103 ක් සමාලෝචිත වර්ෂයේදී පවත්වා ස්ථිර කථිකාචාර්යවරු 10 ක් සඳහා දේශක ගාස්තු වශයෙන් රු.15,633,473 ක් සහ බාහිර කථිකාචාර්යවරු සඳහා රු.17,078,356 ක් ගෙවා තිබුණි. නියැදි පරීක්ෂාවකදී පාඨමාලා සහ වැඩමුළු 45 කින් 29 ක් සඳහා බාහිර කථිකාචාර්යවරු පමණක් සේවයේ යොදවා තිබූ අතර පාඨමාලා 06 කදී බාහිර කථිකාචාර්යවරුන්ගේ සම්පත් දායකත්වය	2022	දැනට ස්ථිර තනතුරුවල නිරත වන කථිකාචාර්යවරුන් ගෙන් උපරිම සේවය ලබා ගැනීමට කටයුතු කළ යුතුය.	දැනට සිටින කථිකාචාර්යවරුන් විසින් විවිධ විෂය ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි පාඨමාලා පවත්වන බැවින් මේ සඳහා අභ්‍යන්තර වශයෙන් කථිකාචාර්යවරුන් බඳවා ගෙන පාඨමාලාවෙහි දේශන පවත්වනවාට වඩා බාහිර දේශකවරුන් මගින් එම පාඨමාලවන් සඳහා අවශ්‍ය කාලයට පමණක් යොදා ගැනීම මූල්‍ය වශයෙන් හා පරිපාලනමය වශයෙන් ලාභදායි හා ඵලදායි වන බැවින් බාහිර සම්පත්දයකයින්	අමාත්‍යාංශ හා ආයතනික විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්වලදි ගත් තීරණයක් අනුව බාහිර සම්පත්දයකයින් පාඨමාලාවල අවශ්‍යතාවය අනුව යොදා ගැනිමට කටයුතු සිදු කරනු ලැබේ.

	සියයට 75 ඉක්මවා ගොස් තිබුණි. ආයතනයේ පාඨමාලා සම්බන්ධීකරණ ඒකකයක් පැවතියදී පදනමේ ස්ථිර කථිකාචාර්යවරු මෙම පාඨමාලාවල සම්බන්ධීකරණ කටයුතු පමණක් සිදුකර තිබුණි.			යොදා ගැනීමට කටයුතු කිරීම	
3	2010 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා ශ්‍රී ලංකා පදනම විසින් පවත්වා ඇති අධ්‍යාපනික වැඩසටහන් සහ වැඩමුළු සඳහා විවිධ ආයතන වලින් ලැබිය යුතු රු.15,144,408 ක් සහ 2014 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා ව්‍යාපාර සංවර්ධන අංශය විසින් බාහිර පාර්ශවයන්ට සපයන ලද සේවා වෙනුවෙන් අයවිය යුතු රු.2,093,692 ක් අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි.	2023	හිඟ ආදායම් නොපමාව අයකර ගැනීමට කටයුතු කළ යුතුය.	අය කර ගත හැකි වූ සියලු ශේෂ මේවනවිට අයකර ගෙන ඇත.ඉතිරි ශේෂ අයකර ගැනීම සඳහා අදාල ආයතන වෙත ලිඛිතව නැවත වරක් දන්වා ඇති අතර එම ආයතනවලින් පිළිතුරු ලිපි හා දුරකථන ඇමතුම් මඟින් කටයුතු කර ඇත.	2024 සැප්තැම්බර් 30 වන දින වන විට රු.11,998,707 ක් තවදුරටත් අයවීමට ඇත.
4	ආයතන සංග්‍රහයේ xii පරිච්ඡේදයේ 14.3.3 වගන්තිය ප්‍රකාරව, සම්පූර්ණ වැටුප් සහිත අධ්‍යයන නිවාඩු පිළිබඳ ඉල්ලීම ආයතන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත යුතු වුවද, ආයතනයේ සේවයේ නියුතු කථිකාචාර්යවරුන්	2023	ආයතන සංග්‍රහයේ විධිවිධාන වලට අනුකූලව සම්පූර්ණ වැටුප් සහිත අධ්‍යයන නිවාඩු සඳහා ආයතන අධ්‍යක්ෂකගේ අනුමැතිය ලබාගත යුතුය.	නිවාඩු අනුමත කිරීම සඳහා කළමනාකරණ මණ්ඩලය වෙත බලය පැවරී ඇති හෙයින් මෙම කතිකාචාර්යයවරුන් දෙදෙනා ඔවුන්ට නියමිත රාජකාරි සියල්ල ආයතනයට පැමිනෙන දිනයන්හිදි ආවරණය කරන	ඉදිරියේදි ආයතන සංග්‍රහය,අදාල චක්‍රලේඛ විධිවිධාන හා කලමණාකරන මණ්ඩල තීරණ අනුව කටයුතු කරනු ලබන බව දක්වා ඇත.

	දෙදෙනෙකු සඳහා වර්ෂ 2ක් සහ මාස 6ක කාලයක් සඳහා සම්පූර්ණ වැටුප් සහිත අධ්‍යයන නිවාඩු ලබාදී රු.8,030,919 ක් ගෙවා තිබුණි.			බවට අධ්‍යන අධ්‍යක්ෂ හරහා සහතික වී ඇති නිසා එවකට සිටි කලමනාකරණ මණ්ඩලය වසර දෙකක වැටුප් සහිත අධ්‍යන නිවාඩු සතියකට දින 03 බැගින් ලබා දීම සඳහා 2020.12.22 දින අනුමැතිය ලබා දී ඇත.	
5	2023 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම පරිදි, ශ්‍රී ලංකා පදනම විසින් පාඨමාලා සහ වැඩමුළු 82 ක් පැවැත්වීමෙන් රු.124,328,000 ක ආදායමක් ලබාගැනීමට සැලසුම් කර තිබුණද, 2023 වර්ෂය තුළදී එම පාඨමාලා සහ වැඩමුළු අතුරින් 65 ක් (සියයට 79) පැවැත්වීමට අපොහොසත් වීම නිසා රු.95,618,000 ක් වූ අපේක්ෂිත ආදායමක් (සියයට 77) අහිමි වී තිබුණි.	2023	ප්‍රායෝගික තත්ත්වයන් සලකාබලා සැලසුම් සකස්කළ යුතු අතර සැලැස්මේ කාර්යභාරයන් ඉටුකළ යුතුය.	ප්‍රායෝගික තත්වයන් සලකා බලා ඉලක්කගත අදායමක් ලබා කර ගත හැකි පරිදි 2024 වසරේ ක්‍රියාකාරි සැලැස්ම පිලියෙල කිරීමට කටයුතු කිරීම.	ඉලක්කගත අදායමක් ලබා කර ගත හැකි පරිදි 2024 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම පිලියෙල කර ඇත.

3.116 ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	බදු පෙර ලාභය (අලාභය) රු.	මතය
2021	6,655,936,753	2,067,640,650	4,588,296,103	420,599,958	තත්ත්වාගණනය නොකළ
2022	9,572,530,005	3,077,610,096	6,494,919,909	3,387,758,673	තත්ත්වාගණනය කළ
2023	10,887,604,954	3,979,365,634	6,908,239,320	4,557,199,326	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	2002 අංක 34 දරණ ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය පනතේ 7(ඇ) වගන්තිය ප්‍රකාරව, අධිකාරිය විසින් ශ්‍රී ලංකාව සඳහා වන ගුවන් සේවා සංවර්ධන සැලැස්ම සඳහා මෙතෙක් කැබිනට් අනුමැතිය ලබාගෙන නොතිබුණි.	2021, 2022 සහ 2023	අධිකාරිය 2002 අංක 34 දරණ ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරී පනත අනුව කටයුතු කල යුතු වීම.	ජාතික ගුවන්සේවා සංවර්ධන සැලැස්මේ පළමු කෙටුම්පත වරාය, නාවික හා සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා වෙත භාර දී ඇති අතර එය පාර්ශවකරුවන්ගේ අදහස් සඳහා අධිකාරියේ වෙබ් අඩවියේ පළකර ඇත.	ජාතික සිවිල් ගුවන් සේවා ප්‍රධාන සැළැස්ම සඳහා කැබිනට් අනුමැතිය ලබාගෙන නොතිබුණි.
2	2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය පනතේ 9 වගන්තිය ප්‍රකාරව, පනතේ දෙවන උපලේඛනයේ සඳහන් ගුවන් තොටුපළ 14 ක් සහ පනතේ තුන්වන	2022 සහ 2023	අධිකාරිය 2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ පනත අනුගමනය කළ යුතු වීම.	රාජ්‍ය ප්‍රදානයක් ලෙස මායිම් නැවත ගැසට් කිරීමට සහ දේපළ ලබා ගැනීමට අවශ්‍ය පරිපාලන කටයුතු සිදුවෙමින් පවතින අතර ඒ සඳහා විවිධ රාජ්‍ය සංවිධානවල	ගුවන් තොටුපළ 10ක් ගැසට් පත්‍ර මගින් ප්‍රකාශයට පත් කිරීමට කටයුතු කර නොතිබුණි.

	උපලේඛනයේ සඳහන් ගුවන් තොටුපළ පහසුකම් 08 ක් සහ ඊට අදාළ ඉඩම, 2016 වසර වන විටත් ගැසට් පත්‍රයකින් ප්‍රකාශයට පත් කිරීමට අධිකාරිය කටයුතු කර නොතිබුණු අතර පනත සම්පාදනය කර වසර 21ක් ගතවී ඇතත් ගුවන් තොටුපළ 10ක් ගැසට් පත්‍ර මගින් ප්‍රකාශයට පත් කිරීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි.			මැදිහත්වීම සහ අවශ්‍ය ක්‍රියාමාර්ග මාලාවක් ගත යුතු බැවින් තවත් දීර්ඝ කාලයක් ගත වේ	
3	2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරි පනතේ තුන්වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ගුවන් යානා පහසුකම් සහ ඉඩම් විධිමත් බදු ගිවිසුමකින් හෝ කුලී ගාස්තුවකින් තොරව සීමාසහිත ගුවන් තොටුපල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පෞද්) සමාගම වෙත ලබා දී තිබුණි.	2022 සහ 2023	අධිකාරිය ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පෞද්) සමාගම සමග බදු ගිවිසුමට එළඹිය යුතු අතර ඒ සඳහා කුලී ගාස්තු අය කළ යුතු වීම.	මඩකලපුව ගුවන් තොටුපළ සඳහා බදු ගිවිසුමක් සකස් කර එය සමාලෝචනය සඳහා AASL වෙත යවා ඇති අතර අනෙකුත් ගුවන් තොටුපළ සහ ගගනගාමී පහසුකම් සඳහා එම ක්‍රියා පටිපාටියම අනුගමනය කරනු ඇත.	බදු ගිවිසුමකට හෝ නීත්‍යානුකූල එකඟතාවයකට පැමිණ නොතිබුණි.
4	2017 දෙසැම්බර් 21 දිනැති අංක 2050/38 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ 09 වන වගන්තිය ප්‍රකාරව 2019 අප්‍රේල් 02	2023	අධිකාරිය විසින් 2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ පනත අනුගමනය කළ යුතු වීම.	පිළිතුර ලැබී නැත.	ඉඩම්, මායිම් ඇතුළුව නැවත ගැසට් කිරීමට කටයුතු කර නොතිබුණි.

<table>
<tr><td></td><td>දිනැති ගැසට් පත්‍රය මඟින් සහ අංක CP/19/2008/105/009 -1 දරණ අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී ලබාදුන් අනුමැතිය මත යාපනය ගුවන් තොටුපළ සිවිල් ගුවන් සේවා අධිකාරියට පවරා දී ඇති අතර 2019 ඔක්තෝබර් 17 වැනි දින ජාත්‍යන්තර ගුවන් තොටුපළක් ලෙස මෙහෙයුම් ආරම්භ කරන ලදී. යාපනය ගුවන් තොටුපලේ අක්කර 349ක ඉඩම්වල මායිම් හඳුනා ගැනීමේ ක්‍රියාවලිය අධිකාරිය විසින් අවසන් කර ගැසට් පත්‍රයක් මගින් ප්‍රකාශයට පත් කිරීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි.</td><td></td><td></td><td></td><td></td></tr>
<tr><td>5</td><td>රු. මිලියන 02 ක් වටිනා උපකරණයක් අත්පත් කර ගත් දිනයේ සිට අධිකාරියේ මෙහෙයුම් සඳහා භාවිතා නොකොට ගබඩාවල සහ සෞඛ්‍ය ඒකකයේ රඳවා තිබුණි. කෙසේ වෙතත්, අධිකාරිය එම වත්කම් සම්පූර්ණයෙන්ම ක්ෂය කර 2022 වර්ෂයේදී නැවත තක්සේරු කර ඒ අනුව ගිණුම්ගත කර තිබුණි. තවද රු. මිලියන 09ක්</td><td>2023</td><td>අධිකාරිය සතු සියලු වත්කම්වල, ඒවායේ පිහිටීම, තත්ත්වය සහ භාවිතය හා ඉතිහාසය ඇතුළත් වන පරිදි විස්තීරණ දත්ත ගබඩාවක් පවත්වාගත යුතු වීම.</td><td>පහත ක්‍රියාමාර්ග ගෙන ඇත.
<table>
<tr><th>අයිතමය</th><th>වටිනාකම (රු.)</th><th>ගත් ක්‍රියාමාර්ග</th></tr>
<tr><td>Breath Analyzer tester for alcohol</td><td>1,705,677</td><td>මෙය ජපානයෙන් ලැබුණු පරිත්‍යාගයකි. මෙම කාරණය අවසන් කිරීමට කටයුතු කරනු ඇත.</td></tr>
<tr><td>KI-8168 Rexton Jeep</td><td>7,650,000</td><td rowspan="2">මෙම කාරණය අවසන් කිරීමට කටයුතු කරනු ඇත</td></tr>
<tr><td>YM - 4182 Three-Wheeler</td><td>1,000,000</td></tr>
<tr><td>Total</td><td>10,355,677</td><td></td></tr>
</table></td><td>උපකරණ හා වාහන දෙක මෙතෙක් බැහැර කිරීමට හෝ අලුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි.</td></tr>
</table>

	වටිනා වාහන දෙකක් අධිකාරියේ පරිශ්‍රය තුළ නිෂ්ක්‍රීයව තිබුණි.				
6	2008 මැයි 22 දිනැති අංක 1550/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ (අති විශේෂ) ගැසට් පත්‍රයේ 07 සහ 08 වගන්ති සහ 2023 නොවැම්බර් 28 දිනැති අංක 23/1937/628/094 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව ගැසට් මගින් නියම කර ඇති පරිදි, එකතු කරන ලද විදේශීය විකුණුම් අධිභාරය (OSS) ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතුය. කෙසේ වෙතත්, ගැසට් නිවේදනය ආරම්භයේ සිටම OSS ආදායම, ඒකාබද්ධ අරමුදලට බැර නොකර අධිකාරියේ ආදායම ලෙස ලෙස හඳුනා ගෙන තිබුණි. තවද, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් රඳවා ගත් ඉපැයීම් ඒකාබද්ධ අරමුදලට. ප්‍රේෂණය කරන ලෙසත් උපදෙස් ලබා දී තිබුණද, මෙම වාර්තාව නිකුත් කරන දිනය වන විටත් අධිකාරිය රඳවා ගත් ඉපැයීම් ප්‍රේෂණය කර නොතිබුණි.	2022 සහ 2023	අමාත්‍ය මණ්ඩල තීරණ හා භාණ්ඩාගාර උපදෙස්වල අවශ්‍යතා සපුරාලීමට කටයුතු කළ යුතු වීම.	2024/02/19 දිනැති 2 වැනි කැබිනට් තීරණය මගින් පළමු කැබිනට් තීරණය අවලංගු කර මාසික පදනමින් රු. මිලියන 90 ක් රඳවා ගැනීමෙන් පසු OSS ආදායම ප්‍රේෂණය කරන ලෙස දන්වා තිබුණි.	අධිකාරිය විසින් 2002 සිට 2023 නොවැම්බර් දක්වා එකතු කරගත් OSS අදායම පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් පියවීම සඳහා යොදාගෙන ඇති අතර එම මුදල් භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

7	2023 දෙසැම්බර් 05 දිනැති අංක CP/23/2271/604/221 දරන කැබිනට් තීරණය ප්‍රකාරව 2022 වසර සඳහා ශුද්ධ ලාභයක් උපයා ඇති බව අධිකාරිය, කැබිනට් සංදේශයේ සඳහන් කර තිබුණද, අධිකාරිය විසින් ඉහත ශුද්ධ ලාභය ගණනය කර ඇත්තේ, එක්රැස් කර ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු විදේශීය විකුණුම් අධිභාරය (OSS), අධිකාරියේ ආදායම ලෙස ලබා ගැනීමෙන් අනතුරුවය. ඒ අනුව, 2022 පාදක වර්ෂයේ රු. මිලියන 33 ක පාඩුවක් ලබා තිබියදීත් රු. මිලියන 09 ක ප්‍රසාද දීමනාවක් ගෙවා තිබුණි.	2023	අමාත්‍ය මණ්ඩලයට වාර්තා කරන තොරතුරුවල නිරවද්‍යතාවය සහ විශ්වසනීයත්වය අධිකාරිය විසින් සහතික කළ යුතු වීම.	2024 පෙබරවාරි 19 දිනැති කැබිනට් තීරණය සමඟ 2020,2021 සහ 2022 වසර සඳහා ලාභය වෙනස් වී නොමැත. 2023 වසරේ රු. මිලියන 4,600 ක ලාභය රු. මිලියන 360 කින් අඩු වීමක් පමණක් සිදු වේ.	ප්‍රසාද දීමනාව ගෙවීමට ඉදිරිපත් කර තිබූ තොරතුරු නිවැරදි නොවූ බැවින් ඒ පිළිබඳ පැහැදිලි කිරීමක් මෙතෙක් ඉදිරිපත් කර නොතිබුණි.
8	2023 දෙසැම්බර් 11 දිනැති අංක PED 04/2023 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව පැමිණීම, කාර්ය සාධනය හෝ වෙනත් ආකාරයක දිරිගැන්වීමක් මත පදනම්ව ගෙවන ආයතන සඳහා ඉහත ප්‍රසාද දීමනාව ගෙවිය නොහැකි වුවද, අධිකාරිය විසින් ඉහත ප්‍රසාද දීමනාවට අමතරව රු. මිලියන	2023	අධිකාරිය චක්‍රලේඛ උපදෙස් වලට අනුකූල විය යුතු වීම.	අංක PED/04/2023 දරන PED චක්‍රලේඛය ප්‍රකාරව CAASL විසින් විශේෂ කැබිනට් අනුමැතිය ලබාගෙන නොමැතිව ගෙවා ඇති නම් ප්‍රසාද මුදල චක්‍රලේඛයේ සඳහන් ප්‍රමාණයෙන් පමණක් වෙනස් වේ.	දිරිගැන්වීම මත දීමනාවක් ගෙවන බැවින් ප්‍රසාද දීමනාව සඳහා විශේෂ අනුමැතියක් ලබා ගෙන නොතිබුණි.

	63 ක දීමනා ගෙවා තිබුණි.				
9	2022 අංක 25 දරණ සමාජ ආරක්ෂණ දායකත්ව පනතේ අංක 2 (ඇ) වගන්තියට අනුව, 2022 ඔක්තෝබර් 01 දින සිට බලපැවැත්වෙන පරිදි පෙර වසර සහ සමාලෝචිත වර්ෂය සඳහා. ආදායම් බදු නිශ්චය කිරීම සඳහා හඳුනාගත් රු.මිලියන 11 ක් වූ අපගමන බද්දේ සේවා ගාස්තු අදායමට අදාල සමාජ ආරක්ෂණ දායකත්ව බදු ගෙවා නොතිබුණි.	2023	අවසාන තීරණය සම්බන්ධයෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තු වට ලිඛිතව ඉල්ලීමක් කළ යුතු අතර ඒ අනුව මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කළ යුතු වීම.	අධිකාරිය විසින් තක්සේරු වලට එරෙහිව අභියාචනා ඉදිරිපත් කර ඇති අතර, IRD විසින් අවසන් තීරණය දැනුම් දී නොමැත. තවද, අපගමන බද්ද යනු රජයේ බද්දක් බව රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට තහවුරු කර ඇත.	අපගමන බද්දේ සේවා ගාස්තු අදායමට අදාල සමාජ ආරක්ෂණ දායකත්ව බදු ගෙවා නොතිබුණි.
10	2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ පළමු උපලේඛනයේ (ජේ) වගන්තියට අනුව, සමාලෝචිත වර්ෂය සඳහා රු. මිලියන 364 ක් වන අපගමන බද්ද මත සේවා ගාස්තු අදායම මත රු. මිලියන 55ක හා 2016 දෙවන කාර්තුවේ සිට 2022 දෙසැම්බර් 31 දක්වා ආදායම මත රු.මිලියන 113 ක එකතු කළ අගය මත බදු ගෙවා නොතිබුණි.	2021, 2022 සහ 2023	අභියාචනය සම්බන්ධයෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තු වෙන් තොරතුරු කැඳවා ඔවුන්ගේ තීරණය අනුව මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කළ යුතු වීම.	CAASL තක්සේරුවලට එරෙහිව අභියාචනා කර ඇත.	අපගමන බද්දේ සේවා ගාස්තු අදායමට අදාල එකතු කළ අගය මත බදු ගෙවා නොතිබුණි.
11	2023 ජනවාරි 11 දිනැති අංක 2314/16 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික	2023	අපගමන බද්ද ලෙස අයකර ගන්නා මුදල් සඳහා	සඳහන් කළ ගුවන් සමාගම් ලැයිස්තුවට සක්‍රීයව ක්‍රියාත්මක නොවන, ඇපකරය	සියලුම ගුවන් සමාගම්වලින් ඇපකර ලබා ගැනීමට කටයුතු

	සමාජවාදී ජනරජයේ (අති විශේෂ) ගැසට් පත්‍රය අනුව අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරන පරිදි රු. මිලියන 3,776 ක අපගමන බද්ද ලෙස එකතු කළ යුතු මුදල් සඳහා සුරක්ෂිතයක් ලෙස බැංකු ඇපකරයක් හෝ මුදල් ඇපයක් ගුවන් සමාගම් හතක් (7) ක් විසින් ලබා දී නොතිබුණි.		ඇපකරයක් ලෙස අධිකාරිය, බැංකු ඇපකරයක් හෝ මුදලක් ලබා ගත යුතු වීම.	සඳහා මුදල් තැන්පතු ලබා දී ඇති සහ බැංකු ඇපකරය කල් ඉකුත් වීමට මාසයකට වඩා වැඩි කාලයක් ඇති ඒවා ඇතුලත් විය.	කර නොතිබුණි.
12	2019 ඔක්තෝබර් 11 වැනි දින ගන්නා ලද කැබිනට් තීරණයට අනුව යාපනය ජාත්‍යන්තර ගුවන් තොටුපළ සංවර්ධනය කර කලාපීය වාණිජ ගුවන් ගමන් ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය වෙත ලබා දෙන අපගමන බදු ප්‍රේෂණවලින් රු. මිලියන 01 ක මුදලක් රඳවා ගෙන තිබුණද ගුවන්තොටුපළේ සංවර්ධන කටයුතු මෙතෙක් ආරම්භ කර නොතිබුණි.	2021	තැන්පතු රඳවා තබා ගැනීමේ අවශ්‍යතාවය විශ්ලේෂණය කර අදාළ අරමුණ සඳහා ඵලදායී ලෙස භාවිතා කළ යුතු වීම.	ඵලායන්ස් එයාර් සමාගම විසින් 2022 ශීත සෘතුවේදී මෙහෙයුම් ආරම්භ කිරීමේ සැලසුම් ඉදිරිපත් කර ඇත.	වසර 05කට වඩා ගත වී තිබුණද සංවර්ධන කටයුතු මෙතෙක් ආරම්භ කර නොතිබුණි.
13	අංක EL/01/2023 දරන නියෝගයේ 09 වැනි ඡේදයට අනුව, නියමිත කාල සීමාව	2023	අපගමන බද්ද අයකර ගැනීමට නිසි යාන්ත්‍රණයක්	අතපසු වීමක් හේතුවෙන් සිදු වූ සිදුවීම් කිහිපයක් හැර ගුවන් සමාගම් විසින්	ප්‍රමාද පොලිය මෙතෙක් අය කර නොතිබුණි.

	තුළ අපගමන බද්ද ගෙවීමට අපොහොසත් වන ගුවන් සමාගම් ගෙවිය යුතු මුළු මුදලට අමතරව පොළිය ගෙවීම අවශ්‍ය වේ. 2023 දෙසැම්බර් 31 වන විට, ගුවන් සමාගම් හයකින් අයවිය යුතු හිඟ අපගමන බද්දෙහි රු.මිලියන 01 ක් වූ ප්‍රමාද පොළිය මෙම වාර්තාව නිකුත් කරන දිනය දක්වා අයකර ගැනීමට අධිකාරිය අපොහොසත්ව වී තිබුණි.		හඳුන්වා දිය යුතු වීම.	අපගමන බද්ද ගණනය කිරීම සඳහා ගුවන් ගමන් දිනයට අදාළ විනිමය අනුපාතිකය අදාළ නොකළ නමුත් පසුව ඒ සියල්ල නිවැරදි කරන ලදී.	
14	අධිකාරිය විසින් යාපනය ගුවන් තොටුපළේ තාවකාලික මගී පර්යන්තයක්, ගිනි නිවන ගොඩනැගිල්ලක් සහ පර්යන්ත මාර්ගයක් ඉදිකිරීමs සඳහා AASL වෙත රු. මිලියන 216ක අත්තිකාරම් ලබා දී තිබුණි. 2020 අගෝස්තු 11 දින ඉදිකිරීම් කටයුතු අවසන් කර තිබුණද, 2023 අගෝස්තු 31 දක්වාත් මෙම අත්තිකාරම් පියවීමකින් තොරව පැවතුණි.	2023	නියමිත කාල සීමාව තුළ හෝ අදාළ වැඩසටහන අවසන් වූ විට අත්තිකාරම් පියවිය යුතු වීම.	අත්තිකාරම් පියවීම් අවසන් කිරීමට කම්ටු පත් කරන ලෙසට රේඛීය අමාත්‍යාංශය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත. මේ සම්බන්ධයෙන් දිගින් දිගටම සාකච්ඡා පැවැත්වේ.	අත්තිකාරම් මෙතෙක් පියවා නොතිබුණි.
15	2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන්	2023	අධිකාරිය විසින් 2002 අංක 34	නීති කෙටුම්පත් සම්පාදකවරයා සමඟ	ශ්‍රී ලංකා ගුවන් යානා අනතුරු

	සේවා අධිකාරිය පනතේ වගන්තිය 7(ඌ) ප්‍රකාරව, 2010 අංක 14 සිවිල් ගුවන් සේවා පනතේ 56 වැනි වගන්තියට අනුව ගුවන් යානා විමර්ශන මණ්ඩලයක් පත්කර ශ්‍රී ලංකා භූමිය තුළ සිදු වූ ගුවන් යානා අනතුරු පිළිබඳ විමර්ශන ආරම්භ කළ යුතුය. එසේම, 2016 ජූලි 26 දිනැති අංක CP/16/375/709/063 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් ශ්‍රී ලංකා ගුවන් යානා අනතුරු විමර්ශන කාර්යාංශයක් පිහිටුවීමටත් ඒ සඳහා සභාපතිවරයෙකු සහිත කාර්ය මණ්ඩලයක් පත් කිරීමටත් රේඛීය අමාත්‍යාංශයේ හෝ අධිකාරියේ අයවැයෙන් රු.මිලියන 50 ක ප්‍රතිපාදනයක් වෙන් කිරීමටත් හා 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනත සංශෝධනය කිරීමටත් අනුමැතිය ලැබී තිබුණි. කෙසේ වෙතත් අධිකාරිය කැබිනට් තීරණය ක්‍රියාත්මක කිරීමට අදාලව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.		දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරි පනත අනුගමනය කළ යුතු වීම.	සාකච්ඡා කර එකී නීති සම්පාදනය කිරීමට 2016 වසරේ සිට මෙම අධිකාරිය අවශ්‍ය සියලු පියවර ගෙන ඇති අතර එය දැන් අවසන් අදියරේ පවතී. තවද, සිවිල් ගුවන් සේවා විෂය පවරන ලද අමාත්‍යවරයාගේ වැය ශීර්ෂයෙන් වාර්ෂිකව රු. මිලියන 50ක අරමුදලක් වෙන් කිරීමට ප්‍රතිපාදන ඇත. 2010 අංක 14 දරන CA පනතේ අදාළ වගන්ති අවලංගු කිරීමට AAIB පනත් කෙටුම්පතේ ප්‍රතිපාදන ඇත.	විමර්ශන කාර්යාංශය මෙතෙක් පිහිටුවා නොතිබුණි.
16	1958 අංක 15 දරන සේවක අර්ථසාධක	2023	EPF සහ ETF ගණනය කිරීම	CAASL කම්කරු දෙපාර්තමේන්තුවෙ	2024 අප්‍රේල් දක්වා වැඩිපුර ගෙවන ලද

	අරමුදල (EPF) පනතේ 47 වැනි වගන්තිය, 1980 අංක 16 දරන සේවක භාරකාර අරමුදල (ETF) පනතේ 44 වැනි වගන්තිය සහ 2013 සැප්තැම්බර් 11 දිනැති අංක 02/2013 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව EPF සහ ETF පනත්වල අර්ථ දක්වා ඇති ඉපැයීම්වලට පටහැනිව, අධිකාරිය විසින් EPF සහ ETF දායකත්වය ගණනය කිරීමේදී විවිධ දීමනා වර්ග 7ක් ඇතුළත් කර තිබුණි. මෙම වැරදි ගණනය කිරීම නිසා, 2020-2023 නියැදි පරීක්ෂණ කාලය තුළ රු. මිලියන 125 ක මුදලක් සේවක අර්ථසාධක අරමුදලට හා රු. මිලියන 15 ක මුදලක් සේවක භාරකාර අරමුදලට වැඩියෙන් බැර කර තිබුණි.		පනතේ ඇතුළත් නිර්වචනය අනුව සිදු කළ යුතු වීම	න් පැහැදිලි කිරීමක් බලාපොරොත්තුවෙන් සිටින අතර CAASL විසින් පනතේ විධිවිධාන අනුව EPF සහ ETF ගණනය කිරීමට පියවර ගෙන ඇත.	දායකත්ව මුදල් සම්බන්ධව ඉදිරි පියවර මෙතෙක් ගෙන නොතිබුණි.
17	2022 අගෝස්තු 08 දිනැති අංක 04/2022 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 2.8 මග පෙන්වීම අනුව අධිකාරිය උත්සව කටයුතුවලට අදාළව කිසිදු වියදමක් නොදැරිය යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළ අධිකාරිය විසින්	2023	අධිකාරිය චක්‍රලේඛ උපදෙස් වලට අනුකූල විය යුතු වීම	CAASL හි කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා ප්‍රධාන වශයෙන් අභිප්‍රේරණ සාධකයක් ලෙස ජනවාරි 1 වන දින උත්සවය, සිංහල සහ දෙමළ අලුත් අවුරුදු උත්සවය වැනි ප්‍රධාන ප්‍රධාන සැමරුම්	චක්‍රලේඛ උපදෙස්වලට පටහැනිව උත්සව කටයුතුවලට අදාලව වියදම් දැරීම සම්බන්ධයෙන් විශේෂ අනුමැතියක් ලබා ගෙන නොතිබුණි.

	උත්සව කටයුතු සඳහා රු. මිලියන 01 ක මුදලක් වැය කර තිබුණි.			සඳහා වියදම් කිරීමට සිදු විය.	
18	2022 මැයි 18 වන දින වීරවිල සංචාරක බංගලාවේ කොටසක් ගින්නකින් හානි වී ඇති අතර, සංචාරක බංගලාවේ කළමනාකරණ සහ නඩත්තු සේවා සපයන්නා විසින් අධිකාරියේ උපදෙස් පරිදි ක්‍රියා කර නොතිබුණු නමුත් අධිකාරිය මේ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 101, 103 & 104 ප්‍රකාරව පියවර ගෙන නොතිබුණි.	2023	අධිකාරිය මු.රෙ. 101-104 අනුව ක්‍රියා කළ යුතු වීම.	CAASL හි 83 වැනි විගණන හා කළමනාකරණ කමිටුව විසින් දුමිඳු කේටර්ස්හි රු.252,000/- ක බැඳුම්කරය නිදහස් කර වහාම අලුත්වැඩියා කිරීමට නිර්දේශ කරන ලදී. අලුත්වැඩියා කටයුතු ආරම්භ කිරීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදු වෙමින් පවතී.	මුදල් රෙගුලාසි ප්‍රකාරව පරීක්ෂණ මෙතෙක් ආරම්භ කර නොතිබුණි.
19	අධිකාරිය විසින් වීරවිල සංචාරක බංගලාව ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රු. මිලියන 24 ක් වැය කර තිබූ අතර එය එහි මුළු අයවැය ප්‍රතිපාදනය රු.මිලියන 8 කින් ඉක්මවා තිබුණි. අධිකාරිය විසින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට පටහැනිව ලංසු ඉදිරිපත් කර තිබූ එකම කොන්ත්‍රාත්කරු තෝරාගෙන තිබුණද දෙපාර්ශවය විසින්	2023	ප්‍රසම්පාදන අත්පොත සහ මාර්ගෝපදේශ යේ අවශ්‍යතාවලට අනුකූල වීම අවශ්‍ය වීම.	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 7.12.2 අනුව, එක් ලංසුවක් පමණක් ලැබුණද, ප්‍රසම්පාදන ක්‍රියාවලිය යම් යම් කොන්දේසි යටතේ ඉදිරියට යා හැකිය. ලංසුකරු C7 මට්ටමේ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) ලියාපදිංචි වී ඇත. නානකාමර 12 ක බිත්ති ටයිල් වැඩ නිම කිරීම සඳහා මුල් ව්‍යාපෘති විෂය පථයේ වෙනසක් ලෙස දීර්ඝ කිරීම ලබා දී ඇත.බංගලාව එහි	ප්‍රසම්පදන කටයුතු විධිමත්ව සිදු නොකිරීම සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කර නොතිබුණි.

විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් අත්සන් කර නොතිබුණි. 2022 මැයි 18 දින කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමෙන් මාස 10කට පසු අමතර වැඩ ඉල්ලීමකින් තොරව රු.මිලියන 02 වටිනාකමැති වැඩ, කොන්ත්‍රාත්කරු විසින් සම්පූර්ණ කර ඇති අතර, අතිරේක වැඩ සඳහා BOQ, TEC සහ PC විසින් අනුමත කර නොතිබුණි. ඒ සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 8.12.2 ප්‍රකාරව සම්පූර්ණ කිරීමේ සහතිකයක් නිකුත් කර නොතිබුණි. තවද, 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනතේ 11(1) වගන්තියට අනුව කොන්ත්‍රාත් ලියාපදිංචි සහතිකය ලබාගෙන නොතිබූ අතර, කොන්ත්‍රාත්කරු විසින් ලබා දුන් කාර්ය සාධන සහතිකය වැඩ නිම කිරීමට පෙර කල් ඉකුත් වී තිබුණි. සනීපාරක්ෂක උපකරණ සැපයීම සහ සවිකිරීමේ අවශ්‍යතා නොමැතිව සනීපාරක්ෂක

පදිංචිකරුවන්ට හොඳ තත්ත්වයේ පවතින බව සහතික කරමින්, සනීපාරක්ෂක ක්‍රියාකාරීත්වය සඳහා උසස් තත්ත්වයේ සවි කිරීම් ස්ථාපනය කිරීම අවශ්‍ය යැයි සලකනු ලැබීය.

	උපකරණ ආදේශ කිරීම සඳහා රු. මිලියන 02 ක් ගෙවා තිබුණි.				
20	2016 වසරේ සිට වීරවිල සංචාරක බංගලාවේ කළමනාකරණ හා නඩත්තු කොන්ත්‍රාත්තුව අලුත් කිරීමකින් තොරව, වලංගු ගිවිසුමක් නොමැතිව අධිකාරිය විසින් රු. මිලියන 06 ක් ගෙවා තිබුණි. මීට අමතරව, ප්‍රතිසංස්කරණ කාලය තුළ සේවා සපයන්නා වෙත රු. මිලියන 01 ක් ද ගෙවා තිබුණි.	2023	නිසි යාන්ත්‍රණයක් හඳුන්වා දී මුදලට සරිලන වටිනාකමක් ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම.	2024 මැයි මාසයේ දී ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ වූ බැවින් සමාලෝචිත කාල සීමාව තුළ අඩු වෙන් කිරීම් ප්‍රමාණයක් සිදු කරන ලදී. එබැවින් මෙම කාල සීමාව තුළ නිල රාජකාරි සඳහා කාර්ය මණ්ඩල නවාතැන් සැපයීම හැර, වෙන් කිරීම් සිදු කර නොමැත.	වර්තමානය වන විට මෙම සේවාව වෙනත් සැපයුම්කරුවෙකුට ලබා දී තිබුණි.
21	2015 අප්‍රේල් 09 දිනැති අංක DMS/1748 දරන මුදල් අමාත්‍යාංශ ලේකම්වරයාගේ ලිපිය ප්‍රකාරව තාක්ෂණික දීමනාව වලංගු බලපත්‍ර හෝ සහතික ඇති නිලධාරීන් සඳහා පමණක් ගෙවිය යුතු වන අතර, අධිකාරිය විසින් බලපත්‍ර හෝ සහතිකවල වලංගුභාවය තහවුරු නොකර නිලධාරීන් 27 දෙනෙකුට රු. මිලියන 32 ක තාක්ෂණික දීමනා ගෙවා තිබුණි.	2023	දීමනා ගෙවීමට පෙර බලපත්‍රවල හෝ සහතිකවල වලංගුභාවය තහවුරු කළ යුතු වීම.	මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද ලිපියේ සඳහන් විධිවිධාන සහ විශේෂ තාක්ෂණික දීමනාව ගෙවීම සඳහා ඇගයීම් මණ්ඩලයේ නිර්දේශය සහ මාණ්ඩලික කමිටුවේ අනුමැතිය මත විශේෂ තාක්ෂණික දීමනාව ගෙවනු ලැබේ.	දීමනාව ගෙවීමට අදාළ බලපත්‍රවල වලංගුභාවය තහවුරු කර නොතිබුණි.

22	කාර්ය මණ්ඩල සහ පරිපාලන රීති අත්පොතෙහි 14.5.1 සහ 14.8.2.(IV) වගන්ති ප්‍රකාරව දේපළ ණය සහ වාහන ණය සඳහා පොලී අනුපාතය සියයට 7ක් විය යුතු වුවද, අත්පොත ආරම්භයේ සිට අධිකාරිය අය කර තිබුණේ සියයට 4.2ක් පමණි. එහි ප්‍රතිඵලයක් ලෙස, නියැදි විගණනයේදී අනාවරණය වූ පරිදි, 2022 සහ 2023 වර්ෂයන්හිදී පිළිවෙලින් රු. මිලියන 02 සහ රු. මිලියන 02 ක ණය පොලී අදායම් අධිකාරියට අහිමි වී තිබුණි.	2022 සහ 2023	අත්පොතේ 1.10 වගන්තිය අනුව සංශෝධන ක්‍රියාත්මක කිරීමට පෙර මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ අනුමැතිය අවශ්‍ය වීම.	2023 ඔක්තොම්බර් 11 දින පැවති එහි 193 වන රැස්වීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය වාහන සහ දේපල ණය සඳහා පොලී අනුපාතිකය 7% දක්වා වැඩි කිරීමට අනුමැතිය ලබා දෙන ලදී.	අත්පොත ආරම්භයේ සිට 2023 ඔක්තෝබර් 11 දක්වා අය කළ යුතු සියයට 7 ක පොලිය අය කිරීමට පියවර ගෙන නොතිබුණි.
23	2010 අංක 14 සිවිල් ගුවන් සේවා පනතේ 124 වගන්තියට අනුව, අධිකාරිය මෙතෙක් ගුවන්යානා මගින් භාණ්ඩ සහ තැපැල් රැගෙන යාම සඳහා සේවා සපයන්නන් හඳුනාගෙන නොමැති අතර, ඉහත සඳහන් සේවා දෙක සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය ද ආරම්භ කිරීමට පියවර ගෙන නොතිබුණි.	2023	අධිකාරිය 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනත අනුගමනය කළ යුතු වීම.	ගුවන් ප්‍රවේශපත්‍ර නියෝජිතයන් සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ මූලික අරමුණ ගුවන් ප්‍රවේශ හා ගුවන් විධිමත්ව නිකුත් කිරීම ගුවන් තහවුරු කරමින් ආරක්ෂාව තහවුරු කිරීමයි. සිවිල් ගුවන් සේවා අධිකාරිය මෙම ක්‍රියාවලිය මගින් මූල්‍ය ප්‍රතිලාභ උපයාගැනීමට අරමුණු කර නැත.	මගී, භාණ්ඩ හා තැපැල් සම්බන්ධයෙන් වන රෙගුලාසි යාවත්කාලීන කර නිකුත් කර නොතිබුණි..

	එබැවින්, අධිකාරියට මෙම සේවා දෙකෙන් ආදායමක් උපයා ගැනීමට නොහැකි වී තිබුණි.				
24	2023 දෙසැම්බර් 31 දිනට A කාණ්ඩයේ සේවා සපයන්නන් 1458 න් 947 ක් සහ B කාණ්ඩයේ සපයන්නන් 183 න් 164ක් නිසි වලංගු බලපත්‍රයක් නොමැති ගුවන් ප්‍රවාහන සේවා සපයන්නන් ලෙස ව්‍යාපාර පවත්වාගෙන ගියද, ඒ සම්බන්ධයෙන් 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 97 වැනි වගන්තියේ දක්වා ඇති විධිවිධාන ප්‍රකාරව අධ්‍යක්ෂ ජනරාල් විසින් ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	2023	අධිකාරිය 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනත අනුගමනය කළ යුතු වීම.	බලපත්‍ර අලුත් කිරීමට අපොහොසත් වන ව්‍යාපාර සඳහා පහත ක්‍රියාමාර්ග ගෙන ඇත. (i) ආයතන 922කින් 877 දෙනෙකු ලැයිස්තුවෙන් ඉවත් කර ඇත. මේවා ක්‍රියා නොකරන ලෙස වර්ග කර ඇත. (ii) යාවත්කාලීන නොකළ බලපත්‍ර ඇති ආයතනවලට ඔවුන්ගේ පද්ධති විසන්ධි කිරීමට උපදෙස් දෙනු ලැබේ.	යාවත්කාලීන බලපත්‍රයක් නොමැතිව ව්‍යාපාර පවත්වා ගෙන යන ආයතන සම්බන්ධයෙන් මෙතෙක් ඉදිරි පියවර ගෙන නොතිබුණි.
25	අධිකාරිය විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශවලට අනුව ගුවන් ප්‍රවේශපත්‍ර නියෝජිතායතන බලපත්‍ර හිමියන්ට ව්‍යාපාරය කරගෙන යාමට ප්‍රමාණවත් කාර්යාල ඉඩකඩක් තිබිය යුතු වුවද, අධිකාරිය විසින් 2023 වර්ෂය තුළ බලපත්‍ර නිකුත් කළ	2023	අධිකාරිය 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනත අනුගමනය කළ යුතු වීම.	නියෝජිතායතන බහුලව පැතිරීම හේතුවෙන් ස්ථානීය පරීක්ෂා කිරීම් ප්‍රායෝගික නොවන අතර අධිකාරියට එවැනි පරීක්ෂණ කිරීමට අවශ්‍ය මානව පිරිස් හා සම්පත් හිඟයි. කෙසේ වෙතත්, අධිකාරිය හැකිතාක් බලපත්‍ර නොමැති ආයතන ඇමතීමට උත්සාහ	රෙගුලාසි යාවත්කාලීන කර මෙතෙක් නිකුත් කර නොතිබුණි.

	බලපත්‍රලාභීන් 505ක් විසින් මෙම කොන්දේසිය සපුරා ඇත්දැයි තහවුරු කරගෙන නොතිබුණි.			කරනු ඇත.	
26	2016 ජාතික අයවැයෙන් අභ්‍යන්තර ගුවන් ප්‍රවාහනය වැඩිදියුණු කිරීමේ අරමුණින්, PPP විධිවිධාන හරහා දිගන, බදුල්ල සහ පුත්තලම යන ස්ථානවල නව අභ්‍යන්තර ගුවන් තොටුපළ තුනක් ස්ථාපිත කිරීමට සැලසුම් කරන ලදී. ඒ් සඳහා 2022 දෙසැම්බර් 31 දින වන විට අධිකාරිය විසින් රු. මිලියන 02 ක් ගෙවා තිබුණු අතර වර්තමානය වන විට ගුවන් තොටුපළවල් තුනේ ඉදිකිරීම් කටයුතු අත්හිටුවා තිබුණි.	2022 සහ 2023	සංවර්ධන කටයුතු වල ප්‍රගතිය සමාලෝචනය කල යුතු වීම.	බදුල්ල ගුවන් තොටුපලේ ගාස්තු සඳහා ගෙවීම් පියවා ඇත. පුත්තලම ගුවන් තොටුපළ සංවර්ධනය සඳහා අධිකාරියේ පරිපාලන ගාස්තු අය කළ නමුත් කැබිනට් තීරණය අනුව ව්‍යාපෘතිය නතර විය. දිගන ගුවන් තොටුපළක් සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් ශක්‍යතා අධ්‍යයනයක් සිදුකිරීම සඳහා කමිටුව පමණක් පත් කර තිබුණි.	දරන ලද වියදම් අනාර්ථික වී තිබුණි.
27	අධිකාරියේ කාර්ය මණ්ඩල සහ පරිපාලන අත්පොතෙහි 1.4 වගන්තියට අනුව, අධිකාරියේ ආයතනික පාලනයේ රීති, කාර්ය මණ්ඩල හා පරිපාලන නීති, ආයතනික නීති සහ මූල්‍ය නීති ලෙස ප්‍රධාන කොටස් තුනකින් සමන්විත වේ. අත්පොත අනුව මූල්‍ය රීති වෙන	2022 සහ 2023	කාර්ය මණ්ඩල සහ පරිපාලන අත්පොතෙහි රීති 1.4 වගන්තියට අනුව අධිකාරිය කටයුතු කළ යුතු වීම.	මූල්‍ය ක්‍රියා පටිපාටි අත්පොත සමාලෝචනය කර එහි සංශෝධන ඉදිරිපත් කිරීමට මණ්ඩලය තීරණය කළේය. මෙම අත්පොත 2024 වසර අවසන් වන විට අවසන් වේ.	මූල්‍ය අත්පොත මෙතෙක් නිකුත් කර නොතිබුණි.

වෙනම නිකුත් කළ යුතු වුවද, මෙම වාර්තාව නිකුත් කරන දිනය දක්වා මූල්‍ය රීති නිකුත් කර නොතිබුණි.

3.117 ජාතික ශිල්ප සභාව

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	291,712,924	178,241,995	113,470,929	10,260,755	තත්ත්වාගණනය කළ
2022	373,929,366	168,299,459	205,629,907	7,877,209	තත්ත්වාගණනය කළ
2023	442,122,937	169,039,940	273,082,997	11,019,195	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01	වරාගොඩ, මොලගොඩ, පොල්ගොල්ල හා බුලත්සිංහල පුහුණු මධ්‍යස්ථාන වල පිහිටුවීමට යෝජිතව තිබූ අමුද්‍රව්‍ය බැංකු වෙනුවෙන් 2021 වර්ෂයේ මිලදී ගත් රු.1,136,076 ක් වටිනා උපකරණ ඌණ උපයෝජිතව පැවතුණි.	2021 2022 2023	රජයේ මුදල් උපරිම කාර්යක්ෂමතාවය කින් යුක්තව ආයෝජනය කළ යුතුය.	අමුද්‍රව්‍ය ගබඩා සතුව ඇති කාර්යාල උපකරණ පලාත් කාර්යාල වල ප්‍රයෝජනය සඳහා යොදාගන්නා ලෙස 2024.02.29 දිනැති ලිපිය මගින් දන්වා ඇත.	අදාල කටයුතු කරමින් පවතී.
02	2013 වර්ෂයේ සිට දීර්ඝ කාලීන බදු පදනම මත කාවන්තිස්සපුර ගම්මානය ඉදිකිරීම සඳහා හෙක්ටයාර් 1.6187 ක භූමියක් තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබා ගෙන බදු කුලී වශයෙන් රු. 3,360,000 ක් හා	2021 2022 2023	කාවන්තිස්සපුර ගම්මානය ඵලදායීව ආයෝජනය කිරීමට කටයුතු කළ යුතුය.	මෙම ගම්මානය තුල කෙසෙල් කෙදි ආශ්‍රිත නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීම සඳහා පෞද්ගලික ආයෝජකයෙක් කැමැත්ත පළ කර තිබුණද පෞද්ගලික හේතුවක් නිසා එම	කෙසෙල් කෙදි ආශ්‍රිත ව්‍යාපෘතිය සාර්ථක නොවන තත්වයක් තුල ගම්මානය නැවත තිස්සමහාරාම ප්‍රාදේශිය ලේකම් වෙත පවරා දීමට කටයුතු කරමින් පවතී.

	ඉන්දීය රජයේ මුල්‍ය ආධාර රු.18,432,042 ක් හා සභාව විසින් රු.8,744,211 ක් වැය කර ඉදිකිරීම් කර තිබුණද විගණිත දිනය වන විටත් භූමිය හා ගොඩනැගිලි නිෂ්කාර්යව පැවතුණි.			නිෂ්පාදන කටයුතු මෙම කාලසීමාව තුළ ආරම්භ කිරීමට නොහැකි බව දන්වා ඇත.	
03	වේවැල් යන්ත්‍ර තුනක් නිෂ්පාදනය කරගැනීම සඳහා කාර්මික සංවර්ධන මණ්ඩලයට 2022 වර්ෂයේදී රු.3,850,740 ක් ගෙවා තිබුණ ද 2023 දෙසැම්බර් 31 දින වන විටත් අදාළ යන්ත්‍ර සභාව වෙත ලැබී නොතිබුණි.	2022 2023	රජයේ මුදල් උපරිම කාර්යක්ෂමතාවය කින් යුක්තව ආයෝජනය කළ යුතුය. යන්ත්‍ර කඩිනමින් ලබා ගැනීමට කටයුතු කළ යුතුය.	හැකි ඉක්මනින් අදාල යන්ත්‍ර ලබා දෙන ලෙස 2024.02.02 හා 2024.02.21 දිනැති ලිපි මගින් කාර්මික සංවර්ධන මණ්ඩලයෙන් ඉල්ලා ඇත.	අදාල යන්ත්‍ර මෙතෙක් ලැබී නොමැත.

3.118 කාර්මික තාක්ෂණ ආයතනය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	2,936,677,216	1,359,223,837	1,577,453,379	47,679,836	තත්ත්වාගණනය කළ
2022	2,973,131,874	1,420,011,859	1,553,120,015	27,510,988	තත්ත්වාගණනය කළ
2023	2,880,997,961	1,243,510,746	1,637,487,115	92,240,946	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	**වාර්තාවේ වර්ෂය**	**විගණකාධිපති නිර්දේශය**	**විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග**	**වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය**
01	ප්‍රධාන අරමුණු 04ක් ඉටුකර ගැනීමේ අපේක්ෂාවෙන් නවීන ඖෂධ රසායනාගාරයක් රුපියල් මිලියන 99.42 ක වියදම් දරා ආයතනය තුල 2019 වර්ෂයේ සිට පවත්වාගෙන ගොස් තිබුණද දිවයිනේ ඇති රෝහල් පද්ධතියද ඇතුලත්ව සියළුම බටහිර ඖෂධ සපයාගැනිම හා බෙදාහැරීම් කිරීමේදී ජාතික ඖෂධ නියාමන අධිකාරිය මඟින් උක්ත රසායනාගාරයේ පුළුල් සේවාවන් ලබා ගැනීමට කටයුතුකර නොතිබීම නිසා රසායනාගාරය පිහිටුවීමේ ප්‍රධාන	2021, 2022, 2023	ජාතික ඖෂධ නියාමන අධිකාරිය හරහා මෙම රසායනාගාරය තෙවන පාර්ශවීය පර්යේෂණාගාරයක් ලෙස භාවිතයට ගැනීමට කටයුතු කල යුතු අතර රසායනාගාරය පිහිටු වීමේ ප්‍රධාන අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය.	ඖෂධ නිෂ්පාදනවල ගුණාත්මකභාවය පිළිබඳ තුන්වන පාර්ශවයක, ස්වාධීන පරීක්ෂණ අනිවාර්ය කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශාය සහ ජාතික ඖෂධ නියාමන අධිකාරිය සමග ප්‍රතිපත්තිමය එකඟතා ඇති කර ගැනීමට කටයුතු සිදු කරමින් පවති.	විගණකාධිපති නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.

	අරමුණ වූ ශ්‍රී ලංකාව තුළ ඖෂධ අංශයේ සංවර්ධනය සඳහා ස්වාධීන ප්‍රතීතනයලත් තෙවන පාර්ශවීය පරීක්ෂණාගාරයක් ලෙස මෙම රසායනාගාරය මෙතෙක් භාවිතා කර නොතිබුණි.				
02	2016 අගෝස්තු 31 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව මහජන උපයෝගිතා කොමිසමේ (PUCSL) නියමයන්ට අනුකූලව තුන්වන පාර්ශවීය බණිජතෙල් නිෂ්පාදනයේ පරීක්ෂාවන් සිදුකිරීම පිණිස උපකරණ අත්පත්කර ගැනීමට හා සවිකිරීමට රු.මිලියන 117.7 ක් වැයකර ස්ථාපනය කර තිබූ බණිජතෙල් හා ලිහිසිතෙල් රසායනාගාරය සඳහා බණිජතෙල් සාම්පල් ලැබීමේ ක්‍රමවේදයක් නිර්මාණය වී නොතිබීම නිසා රසායනාගාරය පිහිටුවීමේ මූලික කර්තව්‍ය ඉටුවී නොතිබුණි.	2021 2022 2023	අදාළ ආයතන සමඟ සම්බන්ධවී තෙවන පාර්ශවීය බණිජතෙල් පරීක්ෂාවන් සිදුකරන රසායනාගාරයක් ලෙස ක්‍රියාත්මක විමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.	ජාතික අවශ්‍යතාවයක් බැවින් ඒ සඳහා බලශක්ති අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ පූර්ණ කැපවීම මත අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි හැකි ඉක්මනින් ක්‍රියාවට නැංවීම සඳහා කටයුතු සිදු කරමින් පවතී.	විගණකාධිපති නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.

03	ලැබිය යුතු ශේෂ තුළ පවත්නා වර්ෂ 2 ක සිට වර්ෂ17 ක් දක්වා කාලයක් පැරණි එකතුව රු.78,130,236 ක් වූ විවිධ ණයගැති ශේෂ සමාලෝචිත වර්ෂයේදීද අයකර ගැනීමට කටයුතුකර නොතිබූ අතර විදේශ ශිෂ්‍යත්ව ගිවිසුම්වල කොන්දේසි කඩකළ නිලධාරින් 19 දෙනෙකුගෙන් අයවිය යුතු රු.16,561,557 ක් වූ මුදල 2023 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගෙන නොතිබුණි.	2022 2023	ලැබිය යුතු ශේෂයන් හැකි ඉක්මනින් අය කරගත යුතුය	වසර 10කට පෙර සිට පැවතෙන ශේෂයන් ඉදිරි වර්ෂවලදී කපා හැරීමට කටයුතු කෙරෙමින් පවතී.	අදාල ශේෂ අයකර ගෙන නොමැත.
04	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වසර 06 කට අධික කාලයක සිට අක්‍රීය බැංකු ගිණුම් 03ක පැවති රු. 2,443,512 ක ශේෂය උපයෝජනය කිරීමට හෝ ආයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි.	2022 2023	අක්‍රිය බැංකු ගිණුම් ශේෂ උපයෝජනය කිරීමට හෝ ආයෝජනය කිරීමට කටයුතු කල යුතුය.	ව්‍යාපෘතියට අදාළ මෙම මුදල නුදුරු අනාගතයේදි ආයතනයට පවරා ගැනීමට කටයුතු කරනු ලැබේ.	විගණකාධිපති නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.
05	සමාලෝචිත වර්ෂය අවසන් වන විට ආයතනය සතුව තාක්ෂණයන් 486ක් පැවතියද, එවැනි තාක්ෂණයන් භෞතිකව ලේඛනගත කර	2022 2023	තාක්ෂණ සොයා ගැනීම් නිසි පරිදි සංරක්ෂණය කල යුතු අතර නව තාක්ෂණයන් රටේ සුභ සිද්ධිය සඳහා යොදා ගැනීමට හැකි වන පරිදි	තාක්ෂණ හුවමාරු සිදු කිරීමේදී ගැනුම්කරුවන් සඳහා තාක්ෂණ පියවර අඩංගු වාර්තාවක් නිකුත් කරන අතර ඒවා අදාල අංශ තුල	විගණකාධිපති නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොමැත.

හෝ මෘදුකාංග ලෙස හෝ නිශ්චිතව සුරක්ෂිතාගාරයක සංරක්ෂණය කර තැබිම මෙතෙක් සිදුකර නොතිබුණි. මින් සමහර තාක්ෂණයන් පර්යේෂකයන් හෝ පර්යේෂණ කණ්ඩායම් සතු දැනුමක් ලෙස හඳුනාගෙන තිබූ අතර, එකී පර්යේෂකයින් ආයතනයෙන් ඉවත්විම/විශ්‍රාම යාම/ මියයාම/වෙනත් ආයතනයකට යාම/ විදේශගතවිම වැනි සිද්ධීන් මත එකී තාක්ෂණයන් ද ආයතනයට අහිමිවීමේ අවදානමක් පවතින බවත්, මේවා ආයතනය සතු අස්පෘශ්‍ය වත්කමක් වුවද, නව තාක්ෂණයන් සොයාගැනීම් වල වටිනාකම හඳුනාගැනීමට ප්‍රමාණාත්මක තොරතුරු පවත්වාගෙන ගොස් නොතිබුණි. මෙම හේතු නිසා මහජන මුදල් හා ප්‍රදාන භාවිතා කර සිදු කරන ලද ඉහත පර්යේෂණ වල	තාක්ෂණ පැවරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.	සුරැකිව පවතී. හුවමාරුව සඳහා සූදානම් කර ඇති ණතාක්ෂක්‍රම පිළිබඳ දත්ත නිළධාරීන්ගේ වාර්තා පොත් වල සුරැකිව ඇති අතර විශ්‍රාම යාමේදී හෝ ආයතනයෙන් ඔවුන් ඉවත් වීමේ දී එම වාර්තා පොත් අංශ ප්‍රධානියාට භාර දීම සිදුකල යුතුය. එසේම තාක්ෂණ දත්ත පිරිවිතර ගබඩා කිරීමට තාක්ෂණ බැංකුවක් පවත්වාගෙන යාමට කටයුතු සිදුකරමින් පවතී.

	ප්‍රතිඵල ජනතාවට අහිමි වීම, තාක්ෂණයන්ගේ ප්‍රතිඵල ආර්ථික සංවර්ධනයට උපයෝජනය නොවීම වැනි තත්වයක් නිරීක්ෂණය විය.				
06	මුදල් රෙගුලාසි 371(5) හා 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර අත්තිකාරම් ලබාගැනීම් අදාල වර්ෂයේ දෙසැම්බර් 31 දිනවන විට නිරවුල් කළයුතු වුවත් දේශීය මිලදී ගැනීම් සඳහා ලබා දී තිබූ එකතුව රු.25,496,730ක් වූ නිරවුල් නොකළ අත්තිකාරම් ශේෂ 2018 සිට 2023 දක්වා ඉදිරියට ගෙන එමින් පැවතියද එම ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.	2023	අදාල වර්ෂය අවසානයේදී අත්තිකාරම් ලබා ගැනිම නිරවුල් කරගත යුතුය.	මෙම අත්තිකාරම් ගෙවීම් තුළ පරිගණක පද්ධතියක් මිලදී ගැනීම සඳහා කරන ලද අත්තිකාරම්ද පවතින අතර එම පද්ධතිය මේ වන තෙක් නිමකර නොමැත. තවද කෙරීගෙන යන වැඩ වෙනුවෙන් කරන ලද අත්තිකාරම් මුදල් මෙහි ඇතුලත් වේ. කෙස් වෙතත් මෙම අත්තිකාරම් මුදල් ගෙවූ වැඩ කඩිනමින් ඉටුකරමින් පවතී.	විගණකාධිපති නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.
07	ඖෂධ වලට අදාළ පරීක්ෂණ සේවාවන් සැපයීම සඳහා ආයතනයට අත්‍යවශ්‍ය වන මාලඹේ පිහිටි ඖෂධ තාක්ෂණ අංශය (Malabe Herbal Technology	2023	අදාල යන්ත්‍ර අලුත්වැඩියා කිරීමට හෝ එසේ කල නොහැකිනම් සුදුසු පරිදි අපහරනය සඳහා අවශය ක්‍රියාමාර්ග ගත යුතුය.	Pilot Freeze Dryer හා GR Microwave System යන්ත්‍රයේ කොටසක් අලුත්වැඩියා කිරීමට ප්‍රසම්පාදන අංශය මගින් සිදු කරමින් පවතී. අනෙකුත් සියලු වත්කම්	අලුත්වැඩියා කිරීමට හා අපහරණය කටයුතු සිදුකරමින් පවතී

	Section) තුල ඇති රු.2,202,614ක් වටිනා යන්ත්‍රෝපකරණ 04 ක් අක්‍රීයව පැවැති අතර විගණිත දිනය වූ 2024 මැයි 31 දින වන විටත් එම යන්ත්‍ර අලුත් වැඩියා කිරීමට හෝ සුදුසු පරිදි අපහරණය සඳහා හඳුනා ගැනීමක් කර නොතිබුණි.			ලේඛනයෙන් ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ.	
08	2018 සිට 2022 දක්වා කාලය තුල වටිනාකම රු.85,738,759 ක මහා භාණ්ඩාගාර ප්‍රතිපාදන වැයකරමින් නිම කරන ලද පර්යේෂණ 59ක් අතරින්, රු.28,625,249 ක් වූ පර්යේෂණ 18 කට අදාලව තාක්ෂණයන් 56 ක් සංවර්ධනය කර තිබුණ අතර ඉන් පර්යේෂණ 04 කට අයත් තාක්ෂණ පැවරීම් 6ක් පමණක් සිදුකර තිබුණි. රු.27,039,217 ක් වැය කරන ලද පර්යේෂණ 14 කට අදාලව පර්යේෂකයින් 02 සිට 07 දක්වා කණ්ඩායම් ලෙස වර්ෂ 01 සිට 03 දක්වා කාලයක්	2023	නිමකරන ලද පර්යේෂණ වල තාක්ෂණ සොයාගැනීම් නිසි පරිදි සංවර්ධනය කල යුතු අතර නව තාක්ෂණයන් රටේ සුභසිද්ධිය සඳහා යොදාගැනීමට හැකිවන පරිදි තාක්ෂණ පැවරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.	කාර්මික තාක්ෂණ ආයතනය මගින් රටේ කර්මාන්ත දියුණුවට අවශ්‍ය තාක්ෂණ ක්‍රම නිපදවීම නොකඩවා සිදු කරන අතර ඒ සඳහා රජයේ සහ වෙනත් දේශීය සහ විදේශීය අරමුදල් යොදාගනී. තාක්ෂණ හුවමාරු ක්‍රමෙව්දය තවදුරටත් ශක්තිමත් කර වැඩි තාක්ෂණ හුවමාරු ප්‍රමාණයක් සිදු කිරීමේ අටියෙන් ITI Business Center (ITI ව්‍යාපාරික මධ්‍යස්ථානය) මෑතකදී ස්ථාපනය කරන ලදී.	නව තාක්ෂණයන් රටේ සුභ සිද්ධිය සඳහා යොදා ගැනීමට අවශ්‍ය සාර්ථක ක්‍රියාමාර්ග ගැනීම ඉතා මන්දගාමී තත්වයක පවතී.

	කායික හා මානසික ශ්‍රමය වැය කරමින් සංවර්ධනය කර තිබූ තාක්ෂණයන් 50ක් විගණන අවස්ථාව වන විටත් පැවරීමක් කර නොතිබුණු අතර එම තාක්ෂණයන් යල් පැනීම් මෙන්ම ඵලදායි භාවිතයෙන් ලබාගත හැකි ආර්ථික වාසි රටට අහිමි වි තිබුණි. එමෙන්ම පර්යේෂණ මගින් සොයාගත් විසඳුම් අදාල ආහාර ,සෞඛ්‍ය, පරිසර වැනි විවිධ ක්ෂේත්‍රවල හඳුනාගත් ගැටලු නිවැරදි කිරීමට යොමු නොවීම මත අවම භාවිතයකට හෝ ලක්වීමක් සිදුනොවන බවත් මේ සම්බන්ධව වගකිව යුතු අංශ වෙත යොමු කර සම්බන්ධිකරණ වැඩපිළිවෙලක් ආයතනය තුල ක්‍රියාත්මක කර නොතිබුණි.				
09	ආයතනයේ පර්යේෂණ කණ්ඩායම් විසින් පර්යේෂණ සිදුකිරීම් මත ඒ ඒ කාලපරිච්ඡේද තුල පර්යේෂණ දීමනා ලෙස 2020, 2021	2022 2023	පර්යේෂණ සිදුකිරීමේ අරමුණු සාර්ථක ලෙස ඉටුකරන තාක්ෂණ සොයාගැනීම් වල ඵලදායීතාවය හා සාර්ථකත්වය	ඒ ඒ කර්මාන්ත වලින් යොමුකරන ඔවුන්ගේ අවශ්‍යතා අනුව අදාල සොයාගැනීම සිදු කර ඒ හරහා අදාල කර්මාන්තයේ ප්‍රගමනයට ක්‍රියා	පර්යේෂණ දීමනා ගෙවීමට පෙර ආයතනය පිහිටුවීමේ මූලික අරමුණු කෙරේ අවධානයක් යොමු නොකර පර්යේෂණ දීමනා

හා 2022 වර්ෂවල රු.59,915,608ක් ගෙවීම් ලබා තිබුණද ආයතනය පිහිටුවීමේ මූලික අරමුණ වන ශ්‍රී ලංකාවේ තාක්ෂණ මට්ටම උසස් කිරීම සඳහා නිෂ්පාදන වල තත්ත්වය,තාක්ෂණික කර්මාන්ත වලදී භාවිතා කරන තාක්ෂණ ක්‍රියාවලි හා ක්‍රම වැඩිදියුණු කිරීම සහ කර්මාන්ත වලදී භාවිතා කිරීම සඳහා අලුත් ක්‍රියාවලි හා ක්‍රමෝපායන් සොයා ගැනීම පිණිස පර්යේෂණ සිදුකිරීම යන අංශ සඳහා දායකත්වයක් ලබාදීම යන කාරණා මගහැරී ඇති බවත් ආයතනය පිහිටුවීමේ පනතේ දැක්වෙන ප්‍රධාන අරමුණට ප්‍රවේශයක් වී නොතිබුණු බවත් නිරීක්ෂණය විය.	ඇගයීම් කර පර්යේෂණ දීමනාව ගෙවීම් කළ යුතුය.	කරනු ලැබේ.	ගෙවීම වර්තමානය වන විටත් සිදුවේ.

3.119 ජාතික පර්යේෂණ සභාව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	බදු පෙර ලාභය (අලාභය) රු.	මතය
2021	695,443,958	8,593,798	686,850,160	(960,252)	තත්ත්වාගණනය කළ
2022	530,342,348	10,586,830	519,755,518	(172,111)	තත්ත්වාගණනය කළ
2023	412,784,638	7,843,450	404,941,188	3,998,779	තත්ත්වාගණනය කළ

අ/අ	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01	ඉලක්ක මත පදනම් වූ බහු විෂයානුබද්ධ පර්යේෂණ වසර 05 කින් නිම කළයුතු අතර 2014 වර්ෂයේ ආරම්භ කරන ලද ව්‍යාපෘති 05ක් අතරින් පර්යේෂණ 4ක් පමණක් අවසාන වී තිබුණි. ශ්‍රී ලංකාවේ සර්ප දෂ්ඨ කිරීම් සඳහා බහුසංයුජතා ප්‍රතිවිෂ වර්ගයක් වැඩිදියුණු කිරීමේ පර්යේෂණය වසර 07 ක් ඉක්මවා තිබුණ ද නිම වී නොතිබුණි.	2021	ව්‍යාපෘති නිම කිරීමට හැකිවන ලෙස සැළසුම් සකස්කර ව්යාපෘති ආරම්භ කළ යුතු අතර අදාළ කාලරාමුව තුළ ව්‍යාපෘති අවසන් කිරීමට හැකිවන ලෙස කටයුතු කළ යුතුය.	ක්‍රියාත්මක තත්වයේ පවතින ව්‍යාපෘති සියල්ල ඒවායේ නියමිත කාලරාමුවලට අනුව සිදුවන්නේද යන්න පරීක්ෂා කර, කාලරාමුවෙන් බැහැරව ක්‍රියාත්මක වන ව්‍යාපෘතිවල ප්‍රධාන පර්යේෂකවරුන්ගෙන් ඒ සඳහා සාධාරණීකරණ හේතූන් ලබාගෙන ඇත. තවද තම ව්‍යාපෘතීන් ඉක්මනින් අවසන් කිරීම සඳහා ඔවුන්ට දැනුම්දී ඇත.	2024 ඔක්තෝම්බර් 10 දින වන විටත් ව්‍යාපෘති වල පර්යේෂණ අවසන් කර වාර්තා ලබා දී නොමැත.
02	TO-14-04 පර්යේෂණ ව්‍යාපෘතිය මඟින් ඩෙංගු වාහකයන් පාලනය කිරීම සඳහා නව කීට ප්‍රභේදයක්	2021	පර්යේෂණ ප්‍රතිඵල ඵලදායීව භාවිතා කිරීම තුලින් රටට ප්‍රතිලාභ ලබාගත හැකිවන පරිදි	ප්‍රදානය කළ ව්‍යාපෘති සමීප ලෙස අධීක්ෂණය කිරීමටද පියවර ගෙන ඇත.	2024 ඔක්තෝම්බර් 10 දින වන විටත් ඩෙංගු මර්දනය කිරීමේ

	සොයාගෙන තිබුණද එම කීටයන් රට තුළ ව්‍යාප්ත කිරීම මඟින් ශ්‍රී ලංකාවේ ඩෙංගු මර්ධනය කිරීමේ සැළැස්මක් ක්‍රියාත්මක කිරීම සිදුවන්නේද යන්න පිළිබඳ අධීක්ෂණයක් ජාතික පර්යේෂණ සභාව විසින් සිදුකිරීම හා ඒ සඳහා පසුවිපරම් කිරීමට අවධානය යොමුකර නොතිබුණි. මේ නිසා උක්ත පර්යේෂණය මගින් අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීමට නොහැකි වී තිබුණි.		ව්‍යාපෘති සැළසුම් කිරීම හා අධීක්ෂණය කල යුතුය.		සැලැස්මක් ක්‍රියාත්මක කිරීම සිදුවන්නේද යන්න පිළිබඳව අධීක්ෂණ වැඩ පිළිවලක් ක්‍රියාත්මක කර නොතිබුණි.
03	TO-14-05 පර්යේෂණ ව්‍යාපෘතිය මඟින් 2024 වර්ෂයේදී රු.47,001,209 ක් වැයකර නිදන්ගත වකුගඩු රෝගය පිළිබඳ අධ්‍යයනයක් සිදුකර තිබූ අතර එහි ප්‍රතිඵලය ලෙස වකුගඩු රෝගය වැළඳීමට හේතුව පානීය ජලය තුළ ෆ්ලෝරයිඩ්, කැල්සියම් හා මැග්නීසියම් සංඝටක ඇතුළත් වී තිබීම බව සොයාගෙන තිබුණ ද එම සංඝටක පානීය ජලය තුල ඇතුළත්වීම වැළැක්වීමට අවශ්‍ය පියවර ගැනීම සඳහා අදාළවන ආයතන සම්බන්ධකර ගැනීම	2021	පර්යේෂණ ප්‍රතිඵල ඵලදායීව භාවිතා කිරීම තුලින් රටට ප්‍රතිලාභ ලබාගත හැකිවන පරිදි ව්‍යාපෘති සැළසුම් කිරීම හා අධීක්ෂණය කල යුතුය.	ප්‍රදානය කළ ව්‍යාපෘති සමීප ලෙස අධීක්ෂණය කිරීමටද පියවර ගෙන ඇත.	2024 ඔක්තෝම්බර් 10 දින වන විටත් පර්යේෂනයේ ප්‍රතිඵල ජාතික අවශ්‍යතාවයට යොදා ගැනීම පිළිබඳව අවධානය යොමුව නොතිබුණි.

	නිසිපරිදි සිදු නොවීම නිසා පර්යේෂණයේ ප්‍රතිඵලය ජාතික අවශ්‍යතාවයට යොදාගැනීම මන්දගාමී වී හෝ මඟහැරී තිබූ අතර ඒ පිළිබඳ පසුවිපරම් කිරීම පිළිබඳ ජාතික පර්යේෂණ සභාව අවධානය යොමුකර නොතිබුණි.				
04	පර්යේෂණ ව්‍යාපෘති අංක TO-14-10 මඟින් රු.41,723,915 ක් වැයකර කිරි නිෂ්පාදනය අතින් ශ්‍රී ලංකාව ස්වයංපෝෂිත කිරීම සඳහා වූ පර්යේෂණය 2020 වර්ෂයේ නිමකර තිබුණ ද, පර්යේෂණය මඟින් හඳුනාගත් තාක්ෂණය ප්‍රායෝගිකව භාවිතා කිරීම පිළිබඳ ප්‍රගතිය අධීක්ෂණය කිරීම හා පසුවිපරම් කිරීමක් ආයතනය සිදුකර නොතිබුණි. වර්තමානය වන විට ශ්‍රී ලංකාව කිරි නිෂ්පාදනය අතින් ස්වයංපෝෂිත තත්ත්වයට ළඟාවීමේ අරමුණ ද ඉටු වී නොතිබුණි.	2021	පර්යේෂණ ප්‍රතිඵල ඵලදායීව භාවිතා කිරීම තුළින් රටට ප්‍රතිලාභ ලබාගත හැකිවන පරිදි ව්‍යාපෘති සැළසුම් කිරීම හා අධීක්ෂණය කල යුතුය.	පර්යේෂණ ප්‍රතිඵල ඵලදායීව භාවිතා කිරීමට ව්‍යාපෘතීන් ඉක්මනින් අවසන් කිරීම සඳහා ඔවුන්ට දැනුම්දී ඇත.	2024 ඔක්තෝම්බර් 10 දින වන විටත් පර්යේෂණ මඟින් හඳුනාගත් තාක්ෂණය ප්‍රායෝගිකව භාවිතා කිරීම පිළිබඳ ප්‍රගතිය හා අධීක්ෂණය පසු විපරම්කිරීම පිළිබඳ වැඩපිළිවලක් සකසා නොතිබුණි.
05	2016 වර්ෂයේ සිට 2021 දක්වා කාලය තුල නිමකර තිබූ පෞද්ගලික රාජ්‍ය	2022	ව්‍යාපෘති තුළින් ප්‍රතිලාභ ලබා ගැනිමට කටයුතු කල යුතුයි.	ව්‍යාපෘති තුළින් ප්‍රතිලාභ ලබා ගැනිම සඳහා මෙම වැඩසටහනේ ව්‍යුහය	2024 ඔක්තෝම්බර් 10 වන විටත් විගණකාධිපති

	සහයෝගීතා පර්යේෂණ ව්‍යාපෘති 11ක් වෙනුවෙන් සභාව විසින් රාජ්‍ය අරමුදල් රු.34,536,475 ක් වැයකර තිබුණි. එයින් ව්‍යාපෘති 8 ක් සඳහා භාවිතා කරන ලද වත්කම් රු.4,634,712 ක් පර්යේෂණ ආයතනවලට පවරා තිබුණද එම ව්‍යාපෘති වාණිජකරණය කිරීමෙන් සභාව වෙත ලබාගත හැකි පුරස්කාර හිමිකම් යනාදී කිසිදු ප්‍රතිලාභයක් ලබාගෙන නොතිබුණි.			නවීකරණය කරන ලදී. මෙම ව්‍යාපෘතිවල ආදායම් එකතු කර ගැනීම සඳහා උපායමාර්ග සකසා ඒවා පර්යේෂණ ප්‍රදාන මාර්ගොපදේශයට ඇතුලත් කරන ලදී.	නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.
06	පර්යේෂණ ව්‍යාපෘති ඇගයීම් සිදුකිරීම වෙනුවෙන් කමිටු පත්කර තිබුනද, එම කමිටු විසින් ව්‍යාපෘති තෝරා ගැනීමේදී සලකා බැලිය යුතු කරුණු හා පර්යේෂණ සඳහා මිලදී ගන්නා වත්කම් පර්යේෂණ වලින් පසු භාවිතයට ගන්නා ආකාරය සහ පර්යේෂණයේ ප්‍රතිඵලයක් වශයෙන් වාණිජකරණය කල හැකි ව්‍යාපෘති තුලින් පුරස්කාරය අයකර ගන්නා ආකාරය සොයා බැලිමෙන් තොරව 2021 හා 2022 වර්ෂයේ දි	2022	පර්යේෂණ ව්‍යාපෘති ඇගයිමේදි සැලකිල්ලට ගත යුතු කරුණු නිසි පරිදි සලකා බලා ව්‍යාපෘති ඇගයිම් සිදුකල යුතුය.	ව්‍යාපෘති සැලසුම හා පර්යේෂණ ප්‍රතිපල භාවිතයට ගැනීමේ සැලසුම් ප්‍රායෝගික නම් පමණක් නව පර්යේෂණ ප්‍රදාන ලබාදේ. නව පර්යේෂණ යෝජනා අයදුම් පත්‍ර ඒ අනුව නවීකරණය කර ඇත.	වාණිජකරණය හා පුරස්කාරය යකරගන්නා ආකාරය නිර්ණය කර නොතිබුණි.

	රු.4,580,453 ක් කමිටු දිමනා ගෙවා තිබුණි.				
07	සමාලෝචිත වර්ෂය තුළ ID සහ TO ව්‍යාපෘති 38 ක් නිමකර වටිනාකම රු.129,549,528 ක් වූ උපකරණ ව්‍යාපෘති සිදු කරනු ලැබූ ආයතන වෙත භාරදී තිබුණ ද, ඒ සම්බන්ධයෙන් සභාවට ඇති ප්‍රතිලාභ පවරා ගැනීම (පේටන් අයිතිය, තාක්ෂණ පැවරුම් මගින් හිමිකම්, පුරස්කාර හිමිකම් යනාදී) සිදුවී නොතිබුණි.	2022	ව්‍යාපෘති තුලින් ලබාගතහැකි ප්‍රතිලාභ ලබාගත යුතුය.	ව්‍යාපෘති තුලින් ලබාගත හැකි ප්‍රතිලාභ උපරිමයෙන් ලබා ගැනීම සඳහා නව පර්යේෂණ යෝජනා අයදුම් පත්‍ර නවීකරණය කර ඇත.	ව්‍යාපෘති තුලින් ප්‍රතිලාභ ලබාගැනීමට විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොමැත.
08	TO-14-04 පර්යේෂණ ව්‍යාපෘතිය මඟින් ඩෙංගු වාහකයන් පාලනය කිරීම සඳහා රු.46,087,658 වියදමක් දරා ඩෙංගු මර්ධනයට නව කීට ප්‍රභේදයක් සොයාගෙන තිබුණද එම කීටයන් රට තුළ ව්‍යාප්ත කිරීම මඟින් ශ්‍රී ලංකාවේ ඩෙංගු රෝගය මුළුමනින් තුරන් කිරීම තෙක් ව්‍යාපෘතියේ ප්‍රතිඵලය යොදාගත යුතුව තිබියදී ඒ පිළිබඳ අධීක්ෂණයක් හෝ පසුවිපරම් කිරීමක් සිදුකර නොතිබුණි.	2022	පර්යේෂණ ප්‍රතිඵල ඵලදායිව භාවිතා කිරිම තුලින් රටට ප්‍රතිලාභ ලබාගත හැකි වන පරිදි ව්‍යාපෘති සැලසුම් කිරිම හා අධික්ෂණය කල යුතුය.	ප්‍රදානය කළ ව්‍යාපෘති සමීප ලෙස අධීක්ෂණය කිරීමටද පියවර ගෙන ඇත. මෙය ක්‍රමවත් ව සිදුවීම සඳහා පර්යේෂණ ප්‍රදාන මාර්ගොපදේශය බලගන්වා ඇත.	විගණකාධිපති නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

09	පර්යේෂණ ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට පෙර ඒ සඳහා පූර්ව ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ හැකියාව හඳුනා ගතයුතු වුවත් එසේ නොකිරීමෙන් මහා භාණ්ඩාගාර ප්‍රදාන රු.11,241,250 ක් ලබාගෙන ආරම්භ කර තිබූ පර්යේෂණ 03 ක් ක්‍රියාත්මක නොකර අත්හිටුවා තිබුණි.	2023	පර්යේෂණ සඳහා ලැබෙන භාණ්ඩාගාර ප්‍රදාන ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගැනීමට නිසි පරිදි ශක්‍යතා අධ්‍යයනයක් කර අදාල කාලයේදී ක්‍රියාත්මක කර පර්යේෂණ ව්‍යාපෘති තුලින් රටට නිසි ප්‍රතිලාභ ලබා දිය යුතුය.	පර්යේෂණ යෝජනා කැඳවීමේදී ව්‍යාපෘති කාල රාමුව තුල නියමිත පරිදි ඉටුකර ගත හැකි ව්‍යාපෘති හඳුනා ගෙන ඒ සඳහා පූර්ව ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර ව්‍යාපෘති හඳුනා ගැනීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.	ව්‍යාපෘති පිළිබඳ නිසි ශක්‍යතා අධ්‍යයන සිදුකර නොමැත.
10	2022 වර්ෂයේ ආරම්භ කර 2023 වර්ෂයේ අවසන් කිරීමට නියමිත ව්‍යාපෘති 05 ක් සඳහා අමාත්‍යාංශයෙන් රු.12,256,290 ක් ලබා දී තිබුණද, එම ව්‍යාපෘති සඳහා සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු. 6,928,581 ක් පමණක් වැය කර තිබුණි. ඒ අනුව සැලසුම් කල පරිදි අවසන් නොවීම හා අරමුදල් වලින් රු.5,327,709 ක වටිනාකමක් ඌන උපයෝජිතව පැවතුණි.	2023	පර්යේෂණ ව්‍යාපෘති සඳහා ලැබෙන මුදල් වලින් උපරිම ඵලදායීතාවයක් ලැබෙන පරිදි විධිමත් වැඩපිළිවෙලකින් ව්‍යාපෘති ක්‍රියාත්මක කල යුතුය.	ක්‍රියාත්මක තත්වයේ පවතින ව්‍යාපෘති සියල්ල ඒවායේ නියමිත කාලරාමු වලට අනුව සිදුවන්නේද යන්න පරීක්ෂා කර, කාලරාමුවෙන් බැහැරව ක්‍රියාත්මක වන ව්‍යාපෘති වල ප්‍රධාන පර්යේෂකවරුන්ගෙන් ඒ සඳහා සාධාරණීකරණ හේතූන් ලබාගෙන ඇත. තවද තම ව්‍යාපෘතීන් ඉක්මනින් අවසන් කිරීම සඳහා ඔවුන්ට දැනුම් දී ඇත.	පර්යේෂණ වාර්තා නියමිත දිනට ලබා ගැනීමට හැකිවන පරිදි විධිමත් පාලනයක් ක්‍රියාත්මක කර නොතිබුණි.

3.120 නවීන තාක්ෂණය පිළිබද ආතර් සී. ක්ලාක් ආයතනය

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	බදු පෙර ලාභය (අලාභය) රු.	මතය
2021	349,425,380	64,473,583	284,951,797	7,705,317	තත්ත්වාගණනය කළ
2022	353,848,286	72,507,900	281,340,386	31,554,058	තත්ත්වාගණනය කළ
2023	350,422,546	80,477,926	269,944,620	23,433,105	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01	පෘථිවි නිරීක්ෂණ දත්ත ලබාගැනීම හා බෙදා හැරීම සඳහා ජාතික මධ්‍යස්ථානයක් පිහිටුවීමේ ව්‍යාපෘතිය සැලසුම් කළ පරිදි කාර්යයන් ඉටු නොකිරීම නිසා මෙම ව්‍යාපෘතිය සඳහා තෝරාගෙන තිබූ තලගල ප්‍රදේශයේ පිහිටි අක්කර 12 ක භූමිය 2019 වර්ෂයේ සිට ඌන උපයෝජිතව පවතින අතර 2013 වසරේ සිට සැලසුම් කරන ලද මෙම ව්‍යාපෘතිය 2022 වසර වන විටත් ආරම්භ කිරීමට නොහැකි වී තිබුණි.	2021	සැළසුම් කළ පරිදි කාර්යයන් ඉටුකර ව්‍යාපෘති සඳහා වෙන්කරගෙන ඇති වත්කම් නිවැරදිව උපයෝජනය කර ගතයුතු අතර ව්‍යාපෘති ආරම්භ කිරීමට පෙර නිසිපරිදි ශක්‍යතා අධ්‍යනයක් සිදු කිරීමටත් ප්‍රසම්පාදන ක්‍රියාවලිය නිසිපරිදි අනුගමනය කිරීමටත් වැට ඉදිකිරීම සඳහා ලබාදි ඇති මුදල් ආපසු අයකර ගැනීමටත් කටයුතු කළයුතුය.	2022 වර්ෂයේ දී අමාත්‍යාංශයේ මූලිකත්වයෙන් චීනයේ බීජිං තානාපති කාර්යාලයේ අනුග්‍රහකත්වයෙන් AIR-CAS ආයතනය සමඟ සාකච්ඡාවක් පවත්වා 2022 අප්‍රේල් මාසයේදී AIR-CAS ආයතනය විසින් මූලික දත්ත තත්ත්ව තක්සේරුව සඳහා GF-1, GF-2 සහ GF-3 චන්ද්‍රිකා මඟින් ශ්‍රී ලංකාව ආවරණය වන පරිදි ලබා ගත් නියදි දත්ත කිහිපයක් අප වෙත	2024 ඔක්තෝම්බර් 10 දින වන විටත් විගණකාධිපති නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

	එසේම මෙම ඉඩම ලබාගැනීමට පෙර ව්‍යාපෘතිය ආරම්භයේදී නිසි ශක්‍යතා අධ්‍යනයකින් තොරව තෝරාගෙන තිබූ හෝමාගම, පිටිපන පිහිටි අක්කර 10 ක් වූ ඉඩම වටා වැටක් ඉදිකිරීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව නාගරික සංවර්ධන අධිකාරිය තෝරාගෙන තිබුණු අතර, වැට ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම සඳහා අත්තිකාරම් මුදලක් වශයෙන් ලබා දිය හැකිව තිබිය දී ඇප සුරක්ෂණයක් ද රහිතව මුළු කොන්ත්‍රාත් වටිනාකම වූ රු.3,543,744 ම අදාළ ආයතනයට ගෙවා තිබූ අතර, නැවත මෙම ඉඩම නාගරික සංවර්ධන අධිකාරිය වෙත පවරාගෙන තිබූ නමුත් වැට ඉදිකිරීම සඳහා ලබාදී තිබූ මුදල් ආපසු ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.			ලබා දී ඇත. ආයතනයේ විද්‍යාඥයින් විසින් මෙම දත්ත විශ්ලේෂණය කර වාර්තාවක් ලබා දී ඇත.	
02	පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව වෙනුවෙන් පුරාවිද්‍යා ගවේෂණ හා කැණීම් කටයුතු සඳහා ඡායා	2021	අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන අදාළ යානය භාවිතයට ගත යුතුය.	ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් UAV යානයේ පියාසර උස සීමා	යානය මිලදී ගැනීමට පෙර ආරක්ෂිත පියාසර උස සීමා පිළිබඳ ශක්‍යතා

	පිටපත් ලබාගැනීමේ අරමුණින් වටිනාකම රු. 10,564,677 ක් වූ නියමුවන් රහිත යානයක් 2016 අගෝස්තු මාසයේදී මිලදී ගෙන තිබුණි. යානය මිලදී ගැනිමට පෙර එය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් රු.110,322 ක වියදමක් දරා නිලධාරීන් දෙදෙනෙකුට විදේශීය පුහුණුවක්ද ලබා දී තිබූ අතර විගණිත දිනය වූ 2022 මැයි 25 වන විටත් අදාල යානය භාවිතයට ගෙන නොතිබුණි.			කිරීම නිසා එය අපේක්ෂිත අරමුණ සඳහා භාවිතා කිරීමට නොහැකි වී ඇත. මේ වනවිට ආයතනයේ සන්නිවේදන අංශය UAV මෙහෙයුම් පිළිබඳව වැඩි නිපුණතාවයක් ලබා ඇති බැවින් මෙම UAV යානය 2020 ජූලි මාසයේදී ඔවුන් වෙත භාර දෙන ලදි. ඉදිරියේදී මෙම UAV යානය ආරක්ෂක අංශවල ව්‍යාපෘති සඳහා සහ UAV යානා පියාසර කිරීම පිළිබඳ ආරක්ෂක අංශ නිලධාරීන් පුහුණු කිරීම සඳහා භාවිතා කිරීමට ආයතනය බලාපොරොත්තු වේ.	අධ්‍යයනයක් නොකර යානය මිලදී ගැනීම නිසා අපේක්ෂිත අරමුණු ඉටුකර ගත නොහැකිව අසාර්ථක ව්‍යාපෘතියක් ලෙස පවතී.
03	Tea color sorting යන්ත්‍රය නිෂ්පාදනය සඳහා රු.13,171,672 ක වියදමක් දරා ඇතත්, ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය Field Programmable Gate තාක්ෂණය නොමැති වීම හේතුවෙන් වෙළඳපලට එලිදැක්වීමට හා අලෙවි කිරීමට නොහැකිවී තිබීමෙන් වැය කරන ලද මුදල නිෂ්කාර්ය වියදමක් වී තිබුණි.	2023	ව්‍යාපෘති නියමිත කාලය තුල නිම කර අපේක්ෂිත අරමුණු ළඟා කර ගැනීමට කටයුතු කළ යුතුය.	අපේක්ෂිත අරමුණු ළඟාකර ගැනීමට නොහැකි තත්ත්වයක පවතී.	2024 ඔක්තෝම්බර් 09 වන දින තෙක් විගණකාධිපති නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. අසාර්ථක ව්‍යාපෘතියක් ලෙස පවතී.

04	පුස්තකාල ස්වයංක්‍රියකරණ පද්ධතිය සඳහා මිලදී ගත් රු.1,375,400 ක් වටිනා උපාංග 02 ක් සවි නොකර 2018 වර්ෂයේ සිට ද, 2015 වර්ෂයේ ස්ථාපනය කරන ලද රු.17,348,222 ක් වටිනා ආලෝක මිනුම් පද්ධතිය 2022 වර්ෂයේ සිට ද නිෂ්කාර්යව පැවතුණි.	2023	අදාල උපකරණ ඵලදායී අයුරින් ප්‍රයෝජනයට ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය.	ඵලදායී අයුරින් ප්‍රයෝජනයට ගැනීමට අවශ්‍ය උපදෙස් ලබාදී ඇත.	2024 ඔක්තෝම්බර් 09 වන දින වන විටත් මෙම උපකරණ භාවිතයෙන් තොරව පැවතුණි.

3.121 ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	බදු පෙර ලාභය (අලාභය) රු.	මතය
2021	650,039,683	170,023,646	480,016,037	19,164,239	තත්ත්වාගණනය නොකළ
2022	619,582,526	183,376,873	436,205,653	18,644,297	තත්ත්වාගණනය නොකළ
2023	588,933,584	209,545,967	379,387,617	(12,166,999)	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණ	**වාර්තාවේ වර්ෂය**	**විගණකාධිපති නිර්දේශය**	**විගණිත ආයතනය විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග**	**වර්තමානය වන විට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය**
01	2021 වර්ෂය සඳහා පරිගණක මිලදී ගැනීමට රු.4,522,370 ක මුදලක් වැය කර තිබුණු අතර මධ්‍යස්ථානයේ ප්‍රාථමික මට්ටමේ සේවකයින් හැරුණු විට දැනට සිටින නිලධාරි සංඛ්‍යාව 143 ක් වුවත් ආයතනය සතු මුළු පරිගණක (Desktop, Laptop, Notebook, Tablet) 240ක් විය. ඒ අනුව පරිගණක අවශ්‍ය නිලධාරීන් සංඛ්‍යාව ඉක්මවා පරිගණක යන්ත්‍ර 97ක් නිෂ්කාර්යව මිලටගෙන තිබුණි.	2021	අවශ්‍යතාවය හඳුනාගෙන අවශ්‍ය ප්‍රමාණයට පමණක් සම්පත් ලබා ගෙන මුදල් අරපිරිමැස්මෙන් භාවිතාකළ යුතුය.	2023 වර්ෂයේ නව පරිසනක මිලදී ගැනීම සීමා කිරීම.	2024 වර්ෂය වන විට පරිසණක 45ක් අපහරණය කර ඇති අතර මෙම වර්ෂය තුළ ද පරිසනක 20ක් පමණ අපහරණය කිරීමට ඇත.

02	2001 ජුලි මාසයේදී ආසියානු සංවර්ධන බැංකු ණය ව්‍යාපෘතිය යටතේ සපයාගෙන තිබූ ධාරිතාවය 2,500KG ක් වූ රු. 26,488,211ක වටිනාකමැති CNC Milling යන්ත්‍රය සඳහා 2014 හා 2015 වර්ෂවල රු.10,441,338ක වියදම් දරා උපාංග යොදා අලුත්වැඩියා සිදු කිරීමෙන් අනතුරුව ඊට වඩා අඩු ධාරිතාවයකින් යුතු (2,200 KG) තවත් CNC Milling යන්ත්‍රයක් 2017 වර්ෂයේදී රු. 26,150,497කට කට සපයාගෙන තිබුණි. පළමු යන්ත්‍රයෙන් ඉටු කිරීමට ප්‍රමාණවත් කාර්යයභාරයන් පවා නොතිබියදී තවත් යන්ත්‍රයක් මිලදී ගැනීමට වැයකල මුදල නිෂ්කාර්ය වී තිබුණි.	2022	ආයතනය සතු යන්ත්‍ර කාර්යක්ෂමව හා ඵලදායිව අරමුණ කරා යොදා ගත යුතුය.	2017 වර්ෂයේදී නව නිපැයුම්කරුවන්ගේ කොමිෂම හා එක්ව නව නිපැයුම්කරුවන් සඳහා තාක්ෂණික උදව් ලබාදීම පිණිස තාක්ෂණික ඉන්කියුබේටර් අංශය පිහිටු වන ලදී. සේවාවන් ලබාදීම සඳහා නව නිපැයුම්කරුවන්ගේ කොමිෂම විසින් CNC Milling යන්ත්‍රයක් ඉන්කියුබේටර අංශය වෙත ලබාදෙන ලදී. ඉන්කියුබේටර් අංශය සතුව තිබූ වසර 20 ක් පමණ පැරණි CNC Milling යන්ත්‍රය වරින් වර දෝශවලට ලක්වීම මෙහිදී ද සැලකිල්ලට ගෙන තිබුණි.	ඉන්කියුබේටර් අංශය සතුව තිබූ වසර 20ක් පමණ පැරණි CNC Milling යන්ත්‍රය දැනට ක්‍රියාවිරහිත තත්වයේ පවතී. නව නිපැයුම්කරුවන් ගේ කොමිෂම විසින් ඉන්කියුබේටර් අංශයට ලබාදුන් CNC Milling යන්ත්‍රය දැනට ක්‍රියාකාරී තත්වයේ පවතී.
03	මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ (මානව සම්පත් කළමනාකරණ) නිලධාරිනිය 2022 පෙබරවාරි 07 දින සිට කාර්මික උද්‍යානය වෙත කිසිදු රාජකාරි පැවරීමකින් තොරව මාරුකර තිබූ	2022	ආයතනයට උපරිම ප්‍රතිඵල ලැබෙන පරිදි මානව සම්පත් කළමනාකරණය කල යුතුය.	විමර්ශන කටයුතු අවසන් කර ඉහත නම් සඳහන් නිලධාරීනිය වෙත චෝදනා පත්‍රයක් ඉදිරිපත් කර ඇත. එම චෝදනා පත්‍රය අධ්‍යක්ෂ මණ්ඩලයේ උපදෙස් මත 2023 අප්‍රේල් 27 වෙනි දින අධ්‍යක්ෂ (මානව සම්පත්) වෙත	විධිමත් විනය පරීක්ෂණ කටයුතු අවසන් අදියරේ ක්‍රියාත්මක වෙමින් පවතී.

	අතර, මූලික විමර්ශන වාර්තාවක් 2022 ඔක්තෝබර් 17 දින ඉදිරිපත් කර තිබුනද චෝදනා පත්‍රයක් ලබානොදී විගණිත දින වූ 2023 අප්‍රේල් 06 දින දක්වා වැටුප් ලෙස ගෙවා තිබූ රු.3,047,473 ක මුදල නිෂ්කාර්ය ශ්‍රම පිරිවැයක් වී තිබුණි.			යොමුකර ඇත.	
04	ව්‍යාපෘති 09ක් සඳහා ඇස්තමේන්තුගත වියදම් රු.15,594,000ක් වුවද, තත්‍ය වියදම රු.8,754,145ක් දැරිමෙන් පසුව ව්‍යාපෘති වල ආර්ථිකභාවය, සේවකයන් ලබාගත හැකි ආකාරය, අරමුදල් ලබාගත හැකි ආකාරය වැනි කරුණු පිළිබඳව ව්‍යාපෘති ආරම්භ කිරීමට ප්‍රථම විධිමත්ව පූර්ව ශක්‍යතා අධ්‍යයන සිදුනොකිරීම හේතුවෙන් ඉතිරි අරමුදල් ලබා ගැනීමට නොහැකි වීම මත අතරමග නවතා දමා තිබුණි.	2022	නිසි පරිදි ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර ව්‍යාපෘති තෝරා ගත යුතුය.	යාන්ත්‍රික ක්‍රියාවලියේ වැඩි දියුණු කිරීම සඳහා අමතර මුදල් නොලැබීම හා අනුමැතිය නොලැබීම හේතුවෙන් ව්‍යාපෘති ඉදිරියට කරගෙන යෑමට නොහැකි වී ඇත.	මෙම ව්‍යාපෘති ඉදිරියට කරගෙන යාමට නොහැකි වී ඇත.
05	ව්‍යාපෘති වල ආර්ථිකභාවය, සේවකයන් ලබාගත හැකි ආකාරය,	2022	නිසි පරිදි ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර ව්‍යාපෘති තෝරා ගත යුතුය.	විමර්ශනයක් සිදුකර මෙම ව්‍යාපෘතිය සඳහා මිලදී ගන්නා ලද භාණ්ඩ ලැයිස්තුගත	මෙම ව්‍යාපෘතිය සඳහා භාවිතා කරන ලද විද්‍යුත් උපකරණ

අරමුදල් ලබාගත හැකි ආකාරය වැනි කරුණු පිළිබඳව ව්‍යාපෘති ආරම්භ කිරීමට ප්‍රථම විධිමත්ව පූර්ව ශක්‍යතා අධ්‍යයන සිදුනොකර ඇස්තමේන්තු පිරිවැය රු.2,900,000ක් වූ ව්‍යාපෘතියක් 2020 නොවැම්බර් මාසයේ මාසයේ ආරම්භ කර රු.615,683 ක් වියදම් කිරීමෙන් පසු අක්‍රිය තත්ත්වයේ පැවතියදී එම ව්‍යාපෘතියේ ඉදිරි ක්‍රියාකාරීත්වය පිළිබඳ පරීක්ෂා කිරීමකින් තොරව 2022 පෙබරවාරි මාසයේ එම අරමුණින්ම යුතු තවත් ව්‍යාපෘතියක් රු.4,000,000 ක ඇස්තමේන්තුවක් මත ආරම්භ කර රු.538,579 ක වියදම් දරා තිබුණද එම ව්‍යාපෘතියද අක්‍රියව පැවතුණි.		කර සුදුසු අංශයන් සඳහා භාවිතා කිරීමට ලබාදෙන ලෙස තීරණය කරන ලදී.	මෙකාට්‍රොනික් අංශයට ද අනෙක් භාණ්ඩ අදාල අනෙකුත් අංශයන්ට ද පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සඳහා භාවිතා කිරීමට ලබා දී ඇත.

3.122 ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	-	-	-	-	-
2022	7,035,040	436,700	6,598,340	6,598,340	තත්ත්වාගණනය නොකළ
2023	6,729,389	874,190	5,855,199	(1,347,843)	තත්ත්වාගණනය නොකළ

	විගණන නිරීක්ෂණ	වාර්තාවේ වර්ෂය හා යොමුව	නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01	2019 අංක 22 දරන ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතන පනතේ 4 (ඊ) වගන්තිය ප්‍රකාරව නවෝත්පාදන කටයුතුවල නිමැවුම් වාණිජකරණය කිරීම සඳහා නවෝත්පාදනයේ ජාත්‍යන්තර කටයුතු අදාළ අමාත්‍යාංශ දෙපාර්තමේන්තු නවෝත්පාදන ආයතන සමඟ සම්බන්ධ වී සිදුකළ යුතු වුවත් ඒ ආකාරයෙන් කටයුතු කර නොතිබුණි.	2023	පනතේ සඳහන් අරමුණු කාර්යක්ෂමව සහ සඵලදායීව ඉටුකරගැනීම සඳහා උපකාරීවන පරිදි සැලසුම් සකස්කර ඒ අනුව කටයුතු කළ යුතුය.	NIA 2023 වසර තුළ දී සමාජයීය, විද්‍යා හා තාක්ෂණ, ආරක්ෂක, පාරිසරික සහ සේවා ආවරණය වන සේ, රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන සමග කටයුතු කරන බව.	නවෝත්පාදන වාණිජකරණය කරවීමේ කටයුතු කරගෙන යනු ලබන බව.
02	පර්යේෂණ හා තාක්ෂණ හුවමාරුව මඟින් බිහිවන උසස්	2023	ආයතනික අරමුණු ඉටුකර ගැනීම සඳහා කාර්යක්ෂමව	‘‘සාර්ථකව’’ නිම කළ තාක්ෂණ පැවරීම් දෙකක්	මහා පරිමාණ තාක්ෂණ පැවරීම් 05 ක්

තාක්ෂණ ව්‍යවසායන් සඳහා පහසුකම් සැලැස්වීම තුළින් ජාතික නවෝත්පාදන ව්‍යවසායකත්ව උපායමාර්ග අරමුණුවලට සහය ලබාදීම නියෝජ්‍යායතනයේ කර්තව්‍යයක් වුවත්, 2023 වර්ෂයේදී සාර්ථකව නිම කිරීමට හැකිව තිබුණේ තාක්ෂණ පැවරීම් දෙකක් පමණි. තවද නියෝජ්‍යායතනය විසින් පනතේ සඳහන් අරමුණු ඉටු කර ගැනීම වෙනුවෙන් රු.665,890 ක් වැය කර වෙබ් පිටුවක් නිර්මාණය කර ආයතන දෙකක පමණක් නවෝත්පාදන දත්ත එයට ඇතුළත් කර තිබුණි.	කටයුතු කළ යුතුය.	පමණක් වුවද අප විසින් පහසුකම් සැපැයූ තාක්ෂණ පැවරීම් ගණන ඊට වැඩි ය. ආයතනය විසින් B2P Platform නිර්මාණය කරන ලද්දේ දීර්ඝකාලීන භාවිතය සඳහා වන අතර, ඊට දත්ත ඇතුළු කිරීම කළ යුත්තේ විවිධ පර්යේෂණ ආයතන, විශ්ව විද්‍යාල හෝ පුද්ගලික මට්ටමේ නව්‍යකාරකයන් හා පර්යේෂකයන් විසිනි. වාණිජකරණයට සූදානම් සිය නව්‍යකරණයන් මෙම B2P Platform වෙත එවන මෙන් සියලු පර්යේෂණ ආයතන, විශ්වවිද්‍යාල හා නව නිපැයුම් කරුවන් මෙන් ම පර්යේෂකයන් වෙතින් ඉල්ලමින් දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණ, වැඩමුළු මෙන් ම රැස්වීම් හා සාකච්ඡා පවත්වන ලදි.	සම්බන්ධයෙන් අදාළ අංශවල අවධානය යොමුකර පැවරීම් සම්බන්ධයෙන් සාකච්ඡා කිහිපයක් පවත්වා ඇත.

3.123 ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	3,573,630	14,865,121	(11,291,491)	(3,711,160)	තත්ත්වාගණනය කළ
2022	22,868,956	6,344,467	16,524,489	8,531,246	තත්ත්වාගණනය කළ
2023	18,759,664	9,829,763	8,929,901	(7,239,466)	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණ	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග	වර්තමානය වන විට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01	1994 අංක 11 දරන විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පනතේ 5(ඇ) ඡේදය ප්‍රකාරව ආයතනයේ අරමුණුවලට අදාලව විද්‍යා හා තාක්ෂණ ආයතනවල ප්‍රගතිය සමාලෝචනය කළ යුතු වුවත් විද්‍යා හා තාක්ෂණ ආයතන යටතට ගැනෙන ආයතන 66 කින් (2010 - 2020 කාලය තුළ) සමාලෝචනය සිදුකර වාර්තා ඉදිරිපත් කර තිබුණේ ආයතන 22 ක් සඳහා පමණි. ඇගයීම් ක්‍රියාවලිය හා සම්බන්ධ මාර්ගෝපදේශය අනුව මෙම වාර්තාවල ඇති නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමට අදාළව ගත් ක්‍රියාමාර්ග පිළිබඳව වගකීම අදාළ ආයතනයට හා කොමිෂමට පැවරී ඇති	2021	පනතේ අරමුණු කරා ලඟා වීමට වඩාත් සුදුසු ක්‍රමවේදයක් සකස්කර භාවිතා කිරීමට කටයුතු කළ යුතුය.	පනත ප්‍රකාරව NASTEC ආයතනය සඳහා බලය පවරා ඇත්තේ විද්‍යා හා තාක්ෂණ ආයතනවල ප්‍රගතිය සමාලෝචනය සිදුකිරීමට පමණි. අදාළ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට බලය ඇත්තේ ආයතනවලට සහ අදාළ විෂය බාර අමාත්‍යාංශ වලටය. ඒ අනුව ආයතන සහ අදාළ විෂය බාර අමාත්‍යාංශ සම්බන්ධීකරණය කරමින් එම නිර්දේශ ක්‍රියාත්මක කිරීමට හා අදාළ ගැටළු නිරාකරණය සඳහා වැඩමුළු මාලාවක් පැවැත්වීමට කටයුතු කරන ලදී.	විද්‍යා හා තාක්ෂණ ආයතන සම්බන්ධ කර ගනිමින් ඒවායේ සමාලෝචන ක්‍රියාවලිය යාවත්කාලින කිරීම සහ පවතින ගැටළු අධ්‍යයනය කර විසඳුම් ලබාදීම සිදු කරගෙන යනු ලැබේ.

	අතර එම නිර්දේශ ක්‍රියාත්මක වූයේද, පිළිගත්තේද එයින් ප්‍රතිලාභ අත්වූයේද යන්න සොයා බලා වාර්තා සකස් කර නොතිබුණි.				
02	කොමිෂන් සභාව විසින් අවසන් වාර්තා නිකුත් කරන ලද ප්‍රතිපත්ති හා සමාලෝචන වාර්තාවල ඇතුළත් නිර්දේශ ඒ ඒ ආයතන විසින් ඵලදායී ලෙස යොදාගනු ලබන්නේද යන්න පසුවිපරම් කිරීමේ ක්‍රියාවලියක් ආයතනය විසින් සකස් කර නොතිබුණි.	2021	පසු විපරම් කිරීමේ සුදුසු ක්‍රමවේදයක් සකස්කර භාවිතා කිරීමට කටයුතු කළ යුතුය.	සමාලෝචිත ආයතන සමග අදාළ බාහිර වාර්තා එකතු කරගනිමින් නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සහ නිර්දේශ ක්‍රියාත්මක කිරීමේදී පැන නැගුනු ගැටළු නිරාකරණය කර ගැනීමේ වැඩමුළු පැවැත්වීමට කටයුතු කරන ලදී.	විද්‍යා තාක්ෂණ ආයතන සම්බන්ධ කර ගනිමින් ඒවායේ සමාලෝචන ක්‍රියාවලිය යාවත්කාලින කිරීම සහ පවතින ගැටළු අධ්‍යයනය කොට විසඳුම් ලබාදීමත් එම ආයතනවලින් අදහස් ලබා ගැනීමත් සිදු කරගෙන යනු ලැබේ.
03	ජාතික විද්‍යා හා තාක්ෂණික කොමිෂන් සභාව විසින් 2023 වර්ෂය සඳහා පිළියෙල කරන ලද වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රගතිය අනුව වර්ෂය තුළ සැලසුම්කර තිබූ ප්‍රධාන ක්‍රියාකාරකම් 06 ක් සඳහා රුපියල් මිලියන 20 ක් ප්‍රතිපාදනය කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විට වැය කර ඇති සත්‍ය වටිනාකම රු. මිලියන 4 ක් පමණක් වී තිබුණි. එය සමස්ථ	2023	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව කටයුතු කළ යුතුය.	රජයේ වියදම් පාලනය සඳහා නිකුත් කරන ලද අයවැය චක්‍රලේඛ පිළිපදිමින් අදාළ මුල්‍යාමය කටයුතු කිරීම සිදුකරන ලදී. මෙම වර්ෂය සඳහා අදාල ක්‍රියාකාරකම් සිදු කිරීමට මුදල් ප්‍රතිපාදන ඉල්ලා සිටියද මුදල් ලැබුණේ අප්‍රේල් මාසයේදීය. එහෙත් BICOST ක්‍රියාකාරකම් අනුග්‍රාහක දායකත්වය මත සිදු	මේ වනවිට වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව ක්‍රියාකාරකම් සිදු කරගෙන යනු ලබයි.

වෙන්කිරීමෙන් සියයට 20 ක් වැනි කුඩා ප්‍රමාණයකි. එසේම සේවක කාර්ය මණ්ඩල පුහුණු සඳහා රු. මිලියන 1.2 ක මුදලක් වෙන් කර තිබුණද විගණිත දිනය වන විට ඉන් සියයට 30 ක් පමණක් වැය කර තිබුණි. ආයතනය විසින් මානව සම්පත් සංවර්ධනය කිරීම් පිළිබඳ සැළකිලිමත්වීම අවම මට්ටමක පැවතුණි.

කරන ලදී. මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය මගින් 27.01.2023 නිකුත් කළ ජාතික භාණ්ඩාගාර චක්‍රලේඛ 1/2023 අංක 6 අනුව නිලධාරීන්ගේ පුහුණු අවස්ථා ලබා දීමේදී සේවා ව්‍යවස්ථා බඳවා ගැනීම් පටිපාටි හා චක්‍රලේඛ විධිවිධාන අනුව සම්පූර්ණ කල යුතු පුහුණුවීම් සඳහා පමණක් අවස්ථාව සලසා දෙන ලෙස දන්වා ඇත.

3.124 මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	162,809,707	22,068,484	140,741,223	(12,105,126)	තත්ත්වාගණනය නොකළ
2022	133,666,843	18,469,719	115,197,124	(5,319,778)	තත්ත්වාගණනය කළ
2023	151,041,334	24,820,148	126,221,186	5,796,846	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	**වාර්තාවේ වර්ෂය**	**විගණකාධිපති නිර්දේශය**	**විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග**	**වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්වය**
01	මැණික් පිළිස්සීම සඳහා 2013 වර්ෂයේදී රු. 10,977,344 කට මිලදී ගත් විදුලි උඳුනක් වර්ෂ 06 ක කාලයක් නිෂ්කාර්යව පැවතුණු අතර 2020 - 2021 කාලය තුල රු. 3,953,540 ක වියදම් දරා මෙම උඳුන අමතර කොටස් සහ විදුලි පරිපථ යොදා වැඩි දියුණු කර තිබුණි. 2020 - 2021 කාලය තුල පර්යේෂණ ධාවන වාර 05 කට පමණක් යන්ත්‍රය භාවිතා කර තිබුණි.	2021	ආයතනය විසින් මේ සඳහා අධික වියදමක් දරා ඇති නිසා ඵලදායි හා කාර්යක්ෂම ලෙස මෙම යන්ත්‍රය භාවිතයට ගත යුතුය.	මේ වන විට විදුලි උඳුන භාවිතයෙන් පුළුල් පරාසයක යං ගෙවුඩ, පුෂ්පරාග, ටැන්සනයිට්, මිල්කි යං ගෙවුඩ, සිල්කි යං ගෙවුඩ, කිරිංචි, සහ තොරමල්ලි ආදී මැණික් ගුණාංගයන් අඩු මැණික් ඛනිජ වල වර්ණය සහ පැහැදිලි බව වර්ධනය කිරීම වෙනුවෙන් ඔක්සිකාරක, මද ඔක්සිකාරක, රික්ත නළ, සාමාන්‍ය වායු ගෝල තත්ත්ව සහ නයිට්‍රජන් වායු තත්ත්ව ආදී සුවිශේෂී තත්ත්වයන් යටතේ මැණික් තාප පිරියම් පර්යේෂණ සිදු කර සාර්ථක ප්‍රතිඵල ලබා ගෙන ඇත.	• ගෙවුඩ තාප පිරියම් කිරීමේ පාඨමාලාවේ භාවිතා කර ඇත. • මේ වන විට විදුලි උඳුනේ පාලක පුවරුවේ දෝෂයන් හඳුනා ගෙන ඇති අතර අදාළ දේශීය නියෝජිත ආයතනය හරහා යථා තත්ත්වයට පත් කිරීමට කටයුතු සිදු කරමින් පවතී.

02	2017-2031 කාලය තුල ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 300.65 කින් කරගෙන යනු ලබන ශ්‍රී ලංකාව තුල මැණික් නිධි ගවේෂණය හා ඇගයීමේ ව්‍යාපෘතිය මගින් දිස්ත්‍රික් 05ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 50ක මැණික් නිධි ගවේෂණය සිදුකර වාර්තා සහ සිතියම් නිකුත් කිරීමට සැලසුම් කලද දිස්ත්‍රික් 04 ක පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 11 ක ගවේෂණ කටයුතු කර 08ක පමණක් වාර්තා සහ සිතියම් නිකුත් කර තිබුණි.	2021	ආයතනයේ මෙහෙයුම් කාර්යක්ෂමව හා ඵලදායිව ඉටු කරගත හැකි ආකාරයට කටයුතු කළ යුතුය.	ආයතනයේ සිටි කාර්යය මණ්ඩලයෙන් සුදුසු පර්යේෂණ නිලධාරීන් තිදෙනෙකු පමණක් යොදවා එම කටයුතු සාමාන්‍ය වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර ක්‍රියාත්මක කිරීමට සිදු වීම මත ව්‍යාපෘති ඉලක්කයන් ඒ ආකාරයෙන් ලබා ගැනීමට නොහැකි විය.	නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.
03	මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ රත්නපුර දිස්ත්‍රික් කාර්යාලය ඉදි කිරීම සඳහා 2016 වර්ෂයේ රු.14,204,402 ක් වැය කර 30 අවුරුදු බදු පදනම මත ලබාගත් ඉඩමෙහි ප්‍රවර්තන වර්ෂය තෙක් අදාල කාර්යන් සිදු නොවීම හේතුවෙන් වසර 07 කට අධික කාලයක සිට එම ඉඩම ඌණ උපයෝජිතව පැවතුණි.	2022/2023	අදාල කාර්යය ඇතුලත්ව ප්‍රසම්පාදන කාලසටහන යාවත්කාලීන කර ඒ අනුව කාර්ය ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය.	ඉදිකිරීමට බලාපොරොත්තු වන ගොඩනැගිල්ල සඳහා වූ ගොඩනැගිල්ල සැලැස්මක (Concept Building Plan) ඇස්තමේන්තු ගත පිරිවැය වාර්තාවක් ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය (CEEB) වෙතින් 2018 වර්ෂයේ දිනැතිව සකස්කර ඇත. ගොඩනැගිල්ල සාදා නිමකිරීමේ	අදාල ගොඩනැගිල්ල ඉදිකිරීම නාගරික සංවර්ධන අධිකාරිය ඒකාබද්ධ ව්‍යාපෘතියක් වශයෙන් මැණික් හා ස්වර්ණාභරණ පුහුණු ගොඩනැගිලි සංකීර්ණයක් ආරම්භ කිරීමට අවශ්‍ය සාකච්ඡා රේඛීය අමාත්‍යාංශ ලේකම් මැදිහත්වීමෙන් සිදු කර ඇත.

				අරමුණින් 2021 – 2025 පස් අවුරුදු සැලැස්මටද එය ඇතුලත් කරන ලද අතර සැලසුම් කරන ලද පරිදි එම බාහිර උපදේශන සේවය ලබා ගෙන 2021 වසරේදී සිදු කිරීමට නියමිත වූවත් ඉදිකිරීමට අවශ්‍ය ප්‍රතිපාදන සපයා ගැනීමේ ගැටළුව මත මෙහි ඉදිරි කටයුතු සිදු කිරීම ප්‍රමාද වී ඇත.	
04	ශ්‍රී ලංකාවෙහි ඇති මැණික් විභව ස්ථාන පිලිබඳ තොරතුරු සමීක්ෂණය කර එම තොරතුරු ඇතුලත් දත්ත පද්ධතියක් නිර්මාණය කිරීම සහ එම තොරතුරු ඇසුරින් පතල් කැනීම් කටයුතු සඳහා ඉඩම් හිමියන් යොමුකිරීම මුලික අරමුණු ඇතිව ආරම්භකරන ලද “ශ්‍රී ලංකාව තුල මැණික් නිධි ගවේෂණය හා ඇගයීම් ව්‍යාපෘතිය” සඳහා 2009 සිට 2023 දක්වා රු 30,589,687 ක වියදමක් දරා පර්යේෂණ පවත්වා පර්යේෂණ වාර්තා නිකුත් කර තිබුනද මෙම ව්‍යාපෘතිය ඉදිරි ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් මැණික් හා ස්වර්ණාභරණ	2023	ව්‍යාපෘතියේ අරමුණු ඉටුකර ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලයේ හා රේඛිය අමාත්‍යාංශයේ උපදෙස් පරිදි කටයුතු කළ යුතුය.	මැණික් නිධි ගවේෂණ ව්‍යාපෘතිය හරහා අප ආයතනය මඟින් හඳුනා ගන්නා ලද නව මැණික් විභව ප්‍රදේශද අධිකාරිය වෙත කැණීම් සඳහා යොමුකිරීම වෙනුවෙන් ලබාදෙන ලදී. මේ යටතේ නියමු ව්‍යාපෘතියක් ලෙස ගාල්ල දිස්ත්‍රික්කයේ තවලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඉඩම් කිහිපයක කැණීම් කටයුතු 2023 අප්‍රේල් 25 සිට 2023 අප්‍රේල් 30 යන දින වල ආයතන දෙකෙහිම සහභාගිත්වය සහිතව සිදු කෙරුණි. කෙසේ නමුදු මෙම කටයුතු ඉදිරියට ගෙනයාමෙහි ලා ජාතික මැණික් හා	තවලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දියත් කරන ලද නියමු ව්‍යාපෘතියේ සාර්ථකත්වය මත මේ වන විට කැණීම් බලපත්‍ර දහයක් පමණ නිකුත් කර එම පතල් කැණීම් කටයුතු ක්‍රියාත්මකව ඇත.

	අධිකාරිය සමග විධිමත් එකගතාවයකට එළඹීමට අසමත් වීම හේතුවෙන් පර්යේෂණ වල ප්‍රතිඵල ලබාගැනීමට නොහැකි වී තිබුණි.			ස්වර්ණාභරණ අධිකාරිය දක්වන පසුගාමී ස්වභාවය අප ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී සාකච්ඡාවට බඳුන්වූ අතර මෙම ඉඩම් කර්මාන්තගත කිරීම සඳහා කර්මාන්ත අමාත්‍යාංශය හරහා කටයුතු සලසාගන්නා ලෙස එහිදී උපදෙස් ලබාදෙන ලදී.	
05	ආයතනයේ 2023 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්යමණ්ඩලය 136 කුගෙන් තත්‍ය සේවක සංඛ්‍යාව 64 ක් විය. ඒ අනුව කාර්ය මණ්ඩලයෙන් 72 ක්, එනම් අනුමත මුළු සේවක සංඛ්‍යාවෙන් සියයට 52 ක් පුරප්පාඩුව පැවතුණි.එම පුරප්පාඩු තුළ ඇතුලත් දේශක හා පුහුණු කිරීමේ නිලධාරී තනතුරු 19 ක් පුරප්පාඩුව පැවතීම මෙම ආයතනය පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානයක් වශයෙන් ක්‍රියාත්මක කිරීමට මානව සම්පත් ගැටලුව බලපා ඇති බව නිරීක්ෂණය විය.	2023	අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවා ගෙන ආයතනයේ අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය.	ආයතනයේ පවතින තාක්ෂණික කාර්ය මණ්ඩලයේ හිඟකම සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩලය හා අමාත්‍යාංශය දැනුවත් කර අදාළ බඳවා ගැනීම් සිදු කිරීමට ආයතනය විසින් දිගින් දිගටම කටයුතු කර ඇත. ජාතික මැණික් හා ස්වර් ණාභරණ අධිකාරිය හා මැණික් හා ස්වර් ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය ඒකාබද්ධ කිරීමේ කටයුතු අවසන් වන තෙක් මෙම බඳවා ගැනීම් සිදු නොකරන ලෙස උපදෙස් ලබා දී ඇත.	ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය හා මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය ඒකාබද්ධ කිරීමේ ප්‍රතිපත්තිමය තීරණයකට මේ වන විට එළඹ ඇති බැවින් බඳවා ගැනීම් සඳහා අනුමැතිය ලබාදී නොමැත.

3.125 ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	බදු පෙර ලාභය (අලාභය) රු.	මතය
2021	2,671,747,970	375,850,755	2,295,897,215	56,623,886	තත්ත්වාගණනය කළ
2022	2,913,648,319	404,181,877	2,509,466,442	184,081,575	තත්ත්වාගණනය කළ
2023	3,358,653,286	399,760,251	2,958,893,035	445,059,698	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණ	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග	වර්තමානය වන විට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01	ආයතනයේ වාර්තාගත තොග ප්‍රමාණයන් සහ භෞතික තොග ප්‍රමාණයන් ඇතුලත් තොග සත්‍යාපන වාර්තා පරීක්ෂාවේදී රු.694,140 ක් වටිනා තොග අයිතම පොත්වල සටහන් නොවීම් හා රු.758,442 ක් වටිනා තොග අයිතම ඌණතාවයක්ද නිරීක්ෂණය විය.	2021	තොග සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර පාලනයන් යෙදිය යුතුය.	භෞතික තොග අගයන් හා පොත්වල ඇති තොග අගයන් නිසියාකාරව නිවැරදිව තබා ගැනීමට ගබඩා සේවක පිරිස දැනුවත් කර ඇත.	සටහන් නොවූ අයිතම පොත්වල සටහන් කිරීමට පියවර ගෙන ඇත. තොග ඌණතා සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතී.
02	ප්‍රාථමික ගණයේ පුරප්පාඩු සංඛ්‍යාව 21 ක් වුවද අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවමින් පෞද්ගලික ආයතනයකින් කාර්යාල කාර්ය සහායක සේවය සඳහා නිසි	2021	අමතර සේවකයන් අවශ්‍යනම් බඳවා ගැනීමේ පටිපාටිය සංශෝධනය කර අවශ්‍ය අනුමැතීන්ද ලබාගෙන විධිමත් පරිදි බඳවාගැනීම සිදුකල යුතුය.	පරීක්ෂණාගාරවල සහ සෙසු අංශවල කටයුතු කාර්යක්ෂමව පවත්වාගෙන යාමට කාර්යාල කාර්යය සහයකයින්ගේ සේවාව අත්‍යාවශ්‍ය වන බැවින් මෙම කාර්යයන් ඉටු	බඳවා ගැනීමේ පරිපාටිය සංශෝධනය කිරීමේ කටයුතු සිදුකරමින් පවතී. අනුමැතිය ලබා ගෙන නැත.

	අනුමැතියකින් තොරව සේවකයන් බඳවාගෙන තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී එලෙස බඳවාගත් සේවකයින් 40 ත් 50 අතර සංඛ්‍යාවක් සඳහා එකතු වටිනාකම රු.8,284,029 ක් ගෙවා තිබුණි.			කිරීම සඳහා ප්‍රාථමික සේවා සණයේ සේවා නියුක්තීන් ඉදිරියේදී බඳවා ගන්නා තුරු මහා මණ්ඩලයේ අනුමැතිය ඇතිව, වාර්ෂිකව ටෙන්ඩර් කැඳවා, කොන්ත්‍රාත්කරුවෙකු මගින් මේ වන විට 27 දෙනෙකුගේ සේවය ලබා ගනු ලැබේ.	
03	ආනයන පරීක්ෂා කිරීමේ මාර්ගෝපදේශයේ 1.1.4 ප්‍රකාරව වරාය පරිශ්‍රය තුලදී නියැදිකරණය සඳහා ප්‍රායෝගික අපහසුතා ඇති විට හා පරීක්ෂණ වාර්තාව කෙටි කාලයකදී ලබා ගත නොහැකි විට ආනයනකරුගේ හා නිෂ්පාදකයාගේ අතීත කාර්යසාධනය හා ආනයනකරුගේ පුද්ගලික ඇපකරණ ලිපියක් (guarantee letter) මත පදනම්ව ආනයනික තොගය ආනයනකරුගේ ගබඩාව වෙත මුදා හැරීමට අවසර ලබා දිය හැකි වුවද අවස්ථා 58 කදී ආනයනකරුගෙන් පුද්ගලික ඇපකරණ ලියවිලි (personal quarantine letter)	2022	මාර්ගෝපදේශයට අනුකූලව කටයුතු කල යුතුය.	රසායනාගාර විශ්ලේෂණ වාර්තාව සහ සීනි නිෂ්පාදකයාගේ සතුටුදායක අතීත කාර්යසාධනය සැලකිල්ලට ගනිමින්, සීනි තොග විකිණීම සඳහා නිකුත් කරනු ලබන අතර අහඹු පදනමක් මත සාම්පල පරීක්ෂා කරනු ලැබේ.	මාර්ගෝපදේශයට අනුකූලව කටයුතු කරමින් පවතී.

	ලබා ගැනීමෙන් තොරව පරීක්ෂණ වාර්තා ලැබීමට ද පෙර එකතුව කිලෝග්‍රෑම් 10,986,250 ක සීනි තොග ආනයනකරුගේ ගබඩාව වෙත මුදා හැර තිබුණි.				
04	2022 වර්ෂය හා 2024 වර්ෂයට අදාළව 2023 වර්ෂයේදී ලැබුණු එකතුව රු.14,226,329 ක ආදායම සම්බන්ධයෙන් අදාල ගිණුම්වල ගැලපීම් නොකර සමාලෝචිත වර්ෂයේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට ගලපා තිබුණි.	2023	වර්ෂයට අදාල ආදායම නිවැරදිව ගණනය කළහැකි පරිදි ශක්තිමත් අභ්‍යන්තර පාලනයක් යොදා ගත යුතුය.	අදාල නිවැරදි ගැලපීම් 2024 වර්ෂයේදී සිදු කිරීමට පියවර ගෙන ඇත.	වර්ෂයට අදාල ආදායම් නිවැරදිව ගණනය කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී.
05	සමාලෝචිත වර්ෂය අවසානයට බැංකු සැසඳුම් ප්‍රකාශයට අනුව වර්ෂ 01 සිට වර්ෂ 04 ක් දක්වා කාල පරාසය තුළ හඳුනා නොගත් තැන්පතුවල එකතු වටිනාකම රු.9,923,267 ක් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.	2023	ආයතනයේ බැංකු ගිණුමට ලැබෙන සියළු ආදායම් හා අනෙකුත් ලැබීම් හඳුනා ගැනීම සඳහා සුදුසු කේතකරණ ක්‍රමයක් හෝ වෙනත් පාලන ක්‍රමවේදයක් හඳුන්වාදීම හා ඒ තුලින් වාර්ෂික ආදායම නිවැරදිව හඳුනා ගැනීම කළ යුතුය.	බැංකු ගිණුමට සෘජුවම ලැබෙන තැන්පතුවල හඳුනා නොගත් තැන්පතු හඳුනාගැනීම සඳහා අදාල අංශ වල සහය ලබාගෙන හඳුනාගැනීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී.	නව තැන්පතු අංක ක්‍රමයක් මඟින් තැන්පතු හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර ඇත.

06	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය 780 හා 2015 මැයි 25 දැනැති අංක 1/ 2015 සහිත රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 4.1 ඡේදය ප්‍රකාරව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් ලද විශේෂිත අනුමැතීන්ට පටහැනිව මධ්‍ය මට්ටමේ නිලධාරීන් ප්‍රවාහනය වෙනුවෙන් 2023 මැයි හා ජුනි මාසයන් සඳහා එකතු වටිනාකම රු.5,021,100 ක් අවස්ථා 12 කදී පෞද්ගලික අංශය වෙත ගෙවා තිබුණි.	2023	චක්‍රලේඛ විධිවිධාන හා විශේෂ අනුමැතීන් ඉක්මවා කටයුතු කළ නොහැකි බැවින්, එවැනි අවශ්‍යතාවයක් මතුවුවහොත් අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය.	ආයතනයේ වාහන කිහිපයක් සම්පූර්ණයෙන්ම ද අනෙක් ඒවා සාමාන්‍ය පරිදි අළුත්වැඩියා කිරීමට කටයුතු කළ අතර ඒ සඳහා සැලකිය යුතු කාලයක් වැය කිරීමට සිදු විය. මේ හේතුවෙන් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් කණ්ඩායම් ප්‍රවාහනය සඳහා බාහිරින් වාහන ලබා ගැනීමට අවසර දී තිබූ ගිවිසුම් කාලය 2023-07-31 දින දක්වා දීර්ඝ කිරීමට සිදු විය.	චක්‍රලේඛ විධිවිධාන අභිභවා කටයුතු කර ඇත.
07	SLS ලාංඡනය භාවිතය සඳහා බලපත්‍ර නිකුත් කළ විට නිරතුරුවම, නිෂ්පාදිත අදාළ ශ්‍රී ලංකා ප්‍රමිතියට අනුකූල වීම තහවුරු කිරීම වෙනුවෙන් තත්ව පද්ධතිය සතුටුදායක ලෙස ක්‍රියාත්මක කිරීම සහ බලපත්‍ර කොන්දේසිවලට අනුකූලවීම සත්‍යාපනය කිරීම සඳහා විවෘත වෙළඳපොලෙන් නිෂ්පාදිතයේ නියැදි ලබා ගෙන පිරිවිතරයන්හි	2023	ප්‍රමාණවත් පරිදි වෙළඳපොල සමීක්ෂණයන් සිදු කිරීම කළ යුතුය.	රට තුළ පැවති COVID - 19 වසංගත තත්ත්වය සහ රටේ පැවති ආර්ථික අර්බුදය හමුවේ සමහර නිෂ්පාදන වෙළඳපල තුල සුලබ නොවීම හේතුවෙන් පසුගිය කාලය තුළ (2020-2023) වෙළඳපල නියැදි ලබා ගැනීම සීමා විය. කෙසේ වෙතත් 2023-12-31 දිනෙන් අවසන් වූ වර්ෂය තුලදී වෙළඳ පල නියැදි 183ක් සහ වෙළඳ පලට නිකුත් කිරීමට	ප්‍රමාණවත් පරිදි වෙළඳපොල සමීක්ෂණයන් සිදු කර නැත.

අනුකූලතාවය පිරික්සීම සඳහා පරීක්ෂාවන් සිදුකළ යුතුය. එසේ වුවද, 2023 දෙසැම්බර් 31 දිනට ප්‍රමිති සහතික ලාංඡනය ලබාගෙන තිබූ භාණ්ඩ සංඛ්‍යාව 924 ක් වුවත් 2023 වර්ෂයේදී වෙළඳපොල සමීක්ෂණ සිදුකර තිබුණේ භාණ්ඩ වර්ග 183 ක් එනම් සියයට 20 ක් සඳහා පමණි.	පෙර ආනයන පරීක්ෂණ සඳහා නියැදි 298 ක් ලබා ගෙන ඇත. ඒ අනුව SLS පසු විපරම් පරීක්ෂණ කටයුතු සඳහා නියැදි 481 ක් ලබාගෙන පරීක්ෂණ කටයුතු අවසන් කර ඇත. 2024 වර්ෂය සඳහා වෙළඳ පල නියැදි 350 ක් ලබාගෙන අදාල පරීක්ෂණ සිදු කිරීමට සැලසුම් කර ඇත. ප්‍රමාණවත් පරිදි වෙළඳපොල පරීක්ෂාවන් සිදු කිරීම දැනටමත් සාර්ථකව සිදු කරමින් පවතී.

3.126 ජාතික විද්‍යා පදනම

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	2,202,224,621	108,525,996	2,093,698,625	(12,722,038)	තත්ත්වාගණනය කළ
2022	2,170,111,143	103,923,506	2,066,187,637	(38,548,294)	තත්ත්වාගණනය කළ
2023	2,150,197,319	92,222,383	2,057,974,936	(20,842,306)	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1.	2017 වර්ෂයේ සිට "දේශගුණික විපර්යාස හා ජාතික ආපදා" යන තේමාව යටතේ වටිනාකම රු.61,783,085 ක් වූ පර්යේෂණ ව්‍යාපෘති 05 ක් සඳහා ප්‍රදානයන් සිදුකර තිබුණද මෙම පර්යේෂණ ව්‍යාපෘති සම්බන්ධයෙන් අදාල අරමුණු ඉටු නොවීම, වියදම් සඳහා අධි ඇස්තමේන්තු සකස්කර තිබීම, ප්‍රගති වාර්තා හා මූල්‍ය වාර්තා ඉදිරිපත් කිරීමට ප්‍රමාදවීම් හා ඉදිරිපත් නොකිරීම, සැලසුම් කළ පරිදි ව්‍යාපෘති කාර්යයන් ඉටු නොකිරීම, ඇගයීම් කමිටු විසින් ප්‍රගති වාර්තා ඇගයීම් කිරීමට ප්‍රමාදවීම් හා ඇගයීම් කිරීමට කටයුතු කර නොතිබීම	**2021**	පර්යේෂණ ප්‍රතිඵල රටේ සංවර්ධනයට දායක කරගත හැකි පරිදි තාත්වික සහ යෝග්‍ය මාතෘකා යටතේ පර්යේෂණ ආරම්භ කර සිදුකිරීම සඳහා පර්යේෂකයින් මෙහෙයවීම සහ අපේක්ෂිත අරමුණු ඉටු කර ගත හැකි පරිදි පර්යේෂණයේ කටයුතු සමීපව සුපරීක්ෂණය සඳහා කටයුතු යෙදීම කළ යුතුය.	මෙම පර්යේෂණ වැඩ සටහන 2012 දී ආරම්භ කරන ලද අතර රටේ සංවර්ධනයට දේශගුණික විපර්යාස වල බලපෑම ඇති විය හැකි ඉතාමත් යෝග්‍ය ක්ෂේත්‍ර 05 කට අදාලව පර්යේෂණ ප්‍රදාන 05 ක් ලබා දෙන ලදී. මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය විසින් සකසන ලද දේශගුණික විපර්යාස ප්‍රතිපත්තිය, ජාතික දේශගුණික විපර්යාස අනුවර්තන උපාය මාර්ගය හා ක්‍රියාකාරී සැලැස්ම, ජාතික අනුවර්තන සැලැස්ම යන ඉතා වැදගත් තොරතුරු පරිශීලනය කරමින් මේ	මේ වන විට මෙම ව්‍යාපෘති අවසන් අදියරට ලඟා වී ඇති අතර , අවසන් වාර්තා ලබා දෙමින් හා ඇගයීම් කරමින් පවතී.

	යන කරුණු විගණනයේදී නිරීක්ෂණය විය.			ක්ෂේත්‍රය පිළිබඳව විශේෂඥ කමිටුවක නිර්දේශ මත මෙම ව්‍යාපෘති සිදු කෙරිණි.	
2.	ජාතික විද්‍යා පදනම විසින් තාක්ෂණික ප්‍රදාන හා තරඟකාරී පර්යේෂණ ප්‍රදාන යටතේ අරමුණු 3ක් ඉටු කර ගැනීම සඳහා ප්‍රදානයන් ලබා දී තිබුණද 2017 – 2021 කාලච්ඡේදය තුල දී නිම කරන ලද තාක්ෂණික ප්‍රදාන 31 කින් මුළු වටිනාකම රු.40,468,833 ක් වූ පර්යේෂණ 16 ක ප්‍රතිඵල වාණිජකරණය වී නොතිබුණි. එසේම පර්යේෂණ 31 සඳහා රු. 110,120,240 ක පිරිවැයක් දරා තිබුණද, ඉන් එකදු පර්යේෂණයක් සඳහා හෝ පේටන්ට් ලබා නොතිබුණි.	**2021**	රජයේ අරමුදල් වැය කරමින් සිදු කරන ලද පර්යේෂණ තුලින් අපේක්ෂිත අරමුණු ළඟා කර ගත යුතුය.	ජාතික විද්‍යා පදනම මගින් මෙවැනි ව්‍යාපෘති තුළින් ලැබෙන නිෂ්පාදන ක්‍රියාවලි තාක්ෂණයන් වාණිජකරණය සහ ප්‍රවර්ධනය කිරීම සඳහා 2024 වර්ෂයේ සිට "Lab to Market" ක්‍රියාවලිය හඳුන්වාදෙන ලදී.	මෙවැනි ව්‍යාපෘති තුළින් ලැබෙන නිෂ්පාදන ක්‍රියාවලි තාක්ෂණයන් වාණිජකරණය කිරීම හා ප්‍රවර්ධනය කිරීම සඳහා 2024 වර්ෂයේ සිට "Lab to Market" ක්‍රියාවලිය හඳුන්වා දී ඇත.

3.127 ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	129,674,181	111,458,217	18,215,964	(3,433,824)	තත්ත්වාගණනය කළ
2022	129,655,233	105,329,427	24,325,806	4,992,449	තත්ත්වාගණනය කළ
2023	120,279,857	94,384,040	25,895,817	(10,586)	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ගය	වාර්තාවේ දිනට නිර්දේශයන් ක්‍රියාත්මක තත්ත්වය
01	ක්‍රියාකාරී සැලැස්මට අනුව පේටන්ට් බලපත්‍ර 40 ක් සඳහා මූල්‍ය හා තාක්ෂණික සහය ලබාදීමට අපේක්ෂා කර තිබුණද වර්ෂය තුළ නව නිපැයුම්කරුවන් 04 දෙනකු පමණක් කොමිසම වෙත යොමු වී තිබුණි.	2022	පේටන්ට් අයදුම් කරුවන් ඉලක්ක කර දැනුවත් කිරීමේ වැඩමුළු හා වැඩසටහන් සිදුකර ක්‍රියාකාරී සැලැස්මේ අපේක්ෂිත ඉලක්කයන් ළඟාකර ගැනීමට කටයුතු කළ යුතුය.	රටතුල ඇතිවූ අර්බුධකාරී වාතාවරණය හා ඉන්ධන හිඟය වැනි කොමිසමේ පාලනයෙන් තොර කාරණා නිසා අදාල ඉලක්කයන් වෙත ළඟාවී නොතිබූ නමුත් මේ වනවිට රට යථා තත්වයට පත්ව ඇති බැවින් ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු සිදුකරගෙන යනු ලබයි.	පේටන්ට් සඳහා තාක්ෂණික සහාය ලබා දීමට දැනුවත් කිරීමේ වැඩසටහන් සිදු කර ඇත.
02	ණයගැති ශේෂය තුළ ඇතුලත් වසර 5 කට වැඩි රු.12,632,009 ක් හා වසර 3 ට වැඩි රු.1,740,600 ක් ලෙස එකතුව රු.14,372,609 ක් වූ ණය ශේෂ අයකර ගැනීමට නොහැකි වී තිබුණි.	2023	ලැබිය යුතු මුදල් අයකර ගැනීමට කඩිනම් පියවර ගත යුතුය.	ආයතනය මඟින් සෘජුව නව නිපැයුම්කරුවන්ට ලබා දුන් ණය ක්‍රමවේදය වෙනුවට එම අරමුදල්ම භාවිතා කරමින් වාණිජ ණය දෙන ආයතන මඟින් නව නිපැයුම් වාණිජකරණය	යම් ප්‍රමාණයකට අයවීම් විධිමත්ව පැවති අතර. රු.4,709,568 ක ණයශේෂ 2023 වර්ෂය අවසානය වන විටද පැවතුණි.

				සඳහා වන මූලාධාර ක්‍රමවේදයක් හඳුන්වා දී ඇත. එසේම ණය ගෙවීම් තව දුරටත් පැහැර හැරියහොත් කොමිසම විසින් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව.	
03	නිසි ශක්‍යතා අධ්‍යනයක් හා සැලැස්මකින් තොරව ශ්‍රී ලංකා නවෝත්පාදන හැසිරවීමේ යාන්ත්‍රණය වෙත ලැබෙන අයදුම්පත් හැසිරවීම සඳහා රු.4,600,000 ක මුදලක් වැය කර 2018 වර්ෂයේ දී දත්ත පද්ධතියක් සකසා ඇතත්, ස්ථාපිත කල වර්ෂයේ සිට මේ දක්වා ලැබී ඇති මුළු අයදුම්පත් ප්‍රමාණය 39 ක් වූ බැවින් සමාලෝචිත වර්ෂය වන විටත් දත්ත පද්ධතිය ක්‍රියාකාරී තත්ත්වයේ නොතිබුණි.	2023	රජයේ වියදම් දැරීමේදී කාර්යක්ෂමව සහ ඵලදායී වන ලෙස කටයුතු කළ යුතුය.	නවෝත්පාදන කඩිනම් කිරීමේ අරමුදල් යාන්ත්‍රණයේ මුදල් භාවිතා කරමින් වාණිජ ණය දෙන ආයතන මඟින් නව නිපැයුම් වාණිජකරණය සඳහා වන මූලාධාර ක්‍රමවේදයක් හඳුන්වා දී ඇත.	නවෝත්පාදන කඩිනම් කිරීමේ අරමුදල් යාන්ත්‍රණය නැමැති වැඩසටහන හා දත්ත පද්ධතිය වර්තමානය වන විට ක්‍රියාත්මක නොවේ.
04	අධ්‍යාපන වෙළඳ ප්‍රදර්ශනයේ වියදම් වෙනුවෙන් දොම්පේ ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු රු.500,000 ක මුදල ප්‍රාදේශීය සභාවේ නිල බැංකු ගිණුමට	2023	රජයේ නිවැරදි ගිණුම්වලට මුදල් බැර කිරීමට කටයුතු කල යුතු ය.	දොම්පේ ප්‍රාදේශිය සභාවේ ලිපි ශීර්ෂය සහිතව ශාලා ගාස්තු, විදුලිය, ජලය, මේස පුටු සඳහා රු.500,000ක මුදලක් වෙන් කර තිබූ අතර නව	ප්‍රදේශිය සභාවට මුදල් ලබා දිය යුතු වුවද නිල නොවන බැංකු ගිණුමට බැර කිරීම වර්තමානය වන විටත් නිවැරදි වී

අයත් නොවන සංස්කෘතික හා ආගමික කමිටුව නමින් ගිණුමකට බැර කර තිබුණි.	නිපැයුම්කරුවන්ට වාණිජ විභවයක් සහිත ප්‍රදේශයකින් අඩි **100X20** කුටියක් සකස් කර දුන් අතර අදාල ගිණුම පිළිබඳ මහජන බැංකුවෙන් තහවුරු කර ගැනීමෙන් පසු චෙක්පතක් මාර්ගයෙන් ගෙවීමට කටයුතු කර ඇත.	නොමැත.

3.128 ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	3,462,499,909	1,710,915,811	1,751,584,098	242,023,008	තත්ත්වාගණනය කළ
2022	4,710,180,370	2,149,702,577	2,560,477,793	425,747,708	තත්ත්වාගණනය කළ
2023	6,062,630,885	3,038,425,340	3,024,205,545	995,430,030	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්වය
01	ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ කඩ කාමර කුලියට ගැනීමට එකඟ වී තිබූ බදු කුලී ගිවිසුම 2021 ඔක්තෝබර් 31 දිනෙන් අවසන් කර තිබුණද ලබාදී තිබූ රු.16,368,300ක ආරක්ෂිත ඇප තැන්පතුව 2024 පෙබරවාරි 28 දින වන විටත් අයකර ගෙන නොතිබුණි.	2021	ආරක්ෂිත ඇප තැන්පතුව කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.	සාප්පු අංක 36 නිරවුල් බුක්තියෙන් බාර නොදීම හේතුවෙන් එම ආයතනයට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත. අධිකරණය විසින් සාප්පුව භාරදෙන ලෙසටත්, හිඟ මුදල් ගෙවන ලෙසටත් නියෝග කර ඇතත් සාප්පු හිමිකරු විසින් අධිකරණ නියෝගය අනුව මෙතෙක් ක්‍රියාකර නොමැත.	ඇප තැන්පතුව තවමත් අයකරගෙන නොතිබුණි.
02	අධිකාරිය පවත්වාගෙන ගිය ගොඩනැගිල්ලට ආසන්නයේ පෞද්ගලික සමාගමක් විසින් සිදු කල පෞද්ගලික	2021	විනිවිද භාවයකින් යුතුව ප්‍රසම්පාදන කාර්ය පරිපාටිය අනුගමනය කළ යුතු අතර අධිකාරියට දැරීමට සිදුවූ මුදල්	ගිලා බැසීමට ලක් වූ ගෝල්ෆේස් ටෙරස් හි පිහිටි අධිකාරියේ ගොඩනැගිල්ලට අදාළව සිදුවූ අලාභය අයකර	ආයතනයට වූ පාඩුව මෙතෙක් අයකර ගෙන නොමැත.

ඉදිකිරීමක් හේතුවෙන් ගොඩනැගිල්ලට හානි සිදුවීමෙන් ඇතිවූ අනාරක්ෂිත තත්ත්වය හේතුවෙන් එම ස්ථානයෙන් ඉවත් වීමට සිදුවීම නිසා, ප්‍රසම්පාදන පරිපාටිය අනුගමනය කිරීමකින් තොරව 2021 සැප්තැම්බර් 03 දින සිට කෙටි කාලයක් සඳහා පෞද්ගලික ගොඩනැගිල්ලක් කුලියට ගෙන අධිකාරිය පවත්වාගෙන ගොස් තිබුණි. පසුව ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කර වැඩි මිල ඉදිරිපත් කල ආයතනයේ මිල ගණන් මත අධිකාරිය දැනට ස්ථාපිත කර ඇති ගොඩනැගිල්ල තෝරාගෙන පවත්වාගෙන යන අතර නව ගොඩනැගිල්ලෙහි අධිකාරිය ස්ථාපිත කිරීම වෙනුවෙන් විගණිත දිනය වූ 2022 අප්‍රේල් 22 දින වන විට රු. 53,244,339 ක වියදමක් දරා තිබුණි.

අදාළ පාර්ශවයන්ගෙන් අය කර ගැනීමට කඩිනමින් ක්‍රියාමාර්ග ගත යුතුය.

ගැනීම සඳහා අධිකරණයේ DPS 228/2022 අංක දරන නඩුව ගොනු කර ඇත. නව ගොඩනැගිල්ල ලබා ගැනීමේදී අවම මිල ඉදිරිපත් කර තිබූ ආයතනයට අයත් ගොඩනැගිල්ලෙහි ඇති තාක්ෂණික අඩුපාඩු හා අධිකාරියේ අරමුණට නොගැලපීම හේතුවෙන් අධිකාරිය සඳහා බඳු පදනම මත ලබාගැනීමට සුදුසුම ගොඩනැගිල්ල අංක 12, මැස්සන්ස් ටවර්, ඇල්ෆඩ් හවුස් ගාඩ්න්, කොළඹ 03 පිහිටි ගොඩනැගිල්ල ලෙස තාක්ෂණ ඇගයීම් කමිටු නිර්දේශය මත ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමත කරන ලදී. ඒ අනුව අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කර අනුමැතිය ලබාගෙන ගිවිසුම අවලංගු නොකර දැනට කාර්යාල කටයුතු පවත්වාගෙන යන බව දන්වා සිටිමි.

03	කිලෝ ග්‍රෑම් 510ක් බර "Rough Sapphire Cluster" මැණික් පාෂාණය 2021 ඔක්තෝබර් 27 දින අයිතිකරු විසින් පිළියෙල කරන ලද ඉන්වොයිසියට අනුව ඇ.එ. ජනපද ඩොලර් 10,000,000 කට එනම් රු.2,030,600,997 කට තක්සේරු කර තිබූ අතර සහතික පත්‍රයක් ලබා ගැනීම සඳහා ස්විට්සර්ලන්තයේ ගැබ්ලින් රසායනාගාරය වෙත යවා තිබුණි. එම මැණික් පාෂාණය දින 443 කට පසුව මෙරටට ගෙන ඒමේදී 2020 මාර්තු 02 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ 13.6 ඡේදය ප්‍රකාරව අයකරගත යුතු ඉන්වොයිසියේ සම්පූර්ණ නැව්ගත වටිනාකමින් සියයට 1ක් වූ ඇ.එ.ජ. ඩොලර් 10,000,000 * 1% = 100,000 කට සමාන රු. 37,100,000 ක් (2023 ජනවාරි 13 දිනට ඇ.එ.ජ. ඩොලර් 1 = රු.371) බලපත්‍ර ලාභියාගෙන් අයකර ගෙන නොතිබුණි.	2022	මැණික් ගල් තක්සේරු කිරීමේදී විධිමත් ක්‍රමවේදයක් සකස් කල යුතුය.	අධිකාරිය විසින් අය කරනු ලබන සියළුම ගාස්තු අංක 2324/33 දරන 2023 මාර්තු 22 දිනැති ගැසට් නිවේදනය මඟින් පලකිරීමට කටයුතු කර ඇති අතර ඒ අනුව ගාස්තු අය කිරීමට කාර්ය මණ්ඩලය දැනුවත් කර ඇත. 2022 සැප්තැම්බර් 09 වන දින එලෙස අපනයනය කරනු ලබන මැණික්ගලෙහි ඉන්වොයිස් වටිනාකමින් 1% ක මුදල් ගෙවන ලෙස ලිඛිතව දැනුම් දීමට කටයුතු කරනු ලැබීය. නමුත් මෙම මැණික්ගල අලෙවිකිරීමට අසමත්වී තිබීමත් එම මැණික්ගල විදේශ රටවල ගෙනයාම සඳහා විශාල පිරිවැයක් දරා තිබීමත් කිසිදු ආදායම් ඉපයීමක් සිදුකර නොතිබීමත් හේතුවෙන්ද ව්‍යාපාරිකයාගේ ඉල්ලීම සැලකිල්ලට ගෙන ව්‍යාපාරිකයින්ද ආරක්ෂා කර ගැනීමේ වගකීම අධිකාරිය සතු වන බැවින්ද මෙම මුදල	එසේම මෙම මැණික් ගල සඳහා ජාත්‍යන්තර වෙළඳපල තුලින් ලැබූ උපරිම ලංසුව මත 2023 ජනවාරි 26 වන දින ඇමරිකානු ඩොලර් 10,700 කට තක්සේරු කර ගෙවුඩ කට්ට නොවන මෙරටදී අගය එකතු කල නොහැකි රළු මැණික් අපනයනයේදී අයකරනු ලබන 1% ක සේවා ගාස්තුවක් අයකර නැවත අපනයනය කිරීමට කටයුතු කර ඇත.

				අයකර නොගැනීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර ඇත.	
04	සෑම රඳවා ගැනීම් අනුනියෝජිතයකු විසින්ම එකතුකළ රඳවා ගැනීම් බදු එක් එක් ලිත් මාසය අවසාන වී දින 15ක් ඇතුලත දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාට ප්‍රේෂණය කලයුතු වුවත්, අධිකාරිය විසින් 2023 නොවැම්බර් 30 දින දක්වා එකතු කරන ලද රඳවා ගැනීම් බදු මුදල රු.690,476,013 ක් සමාලෝචිත වර්ෂය අවසන් වනවිට ප්‍රේෂණය කිරීමට කටයුතු කර නොතිබුණි.	2023	දේශීය අදායම් පනතේ විධිවිධාන ප්‍රකාරව රඳවා ගැනීම් බදු ප්‍රේෂණය කිරීමට කටයුතු කල යුතුයි.	එකතුකල රඳවාගත් බදු නියමිත කාල සීමාව තුල ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කිරීමට අධ්‍යක්ෂ (මූල්‍ය) වෙත උපදෙස් ලබා දී ඇත.	ඉදිරියේදී, සලකා බලනු ලබන කාලපරිච්ඡේදය තුලම ගෙවීම් කිරීමට කටයුතු කරනු ලැබේ.
05	පිරිවැය වටිනාකම රු.9,724,501 ක් වූ මැණික් ගල් තාපකරණයට ලක් කිරීම හඳුනා ගැනීමේ FTIR යන්ත්‍ර දෙකක් අවිධිමත් කළමනාකරණය හේතුවෙන් භාවිතා කල නොහැකි තත්ත්වයේ පවතී.	2023	වත්කම් නිසි ක්‍රියාකාරී තත්ත්වයෙන් පවත්වාගනිමින් මෙහෙයුම් කටයුතු සඳහා භාවිතා කළ යුතුය.	FTIR යන්ත්‍ර දෙක කඩිනමින් භාවිතයට ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස අධ්‍යක්ෂ (තක්සේරු/රත්න විද්‍යාඥ) වෙත උපදෙස් ලබා දී ඇත.	රත්නපුර ප්‍රාදේශීය කාර්යාලයේ පවතින යන්ත්‍රයේ කොටස් අස්ථාන ගතවීම සම්බන්ධයෙන් මේ වන විට අලාභය සහ වගකිවයුතු පාර්ශවය නිශ්චය කර ගැනීම සඳහා මූලික පරීක්ෂණයක් සිදුකර ඇත. කොළඹ ප්‍රධාන කාර්යාලයේ පවතින

					යන්ත්‍රය භාවිතා නොකරයි.
06	මැණික් කැණීම හා ගැරීමෙන් පසු භූමිය යථාවත් කර ඇප මුදල් ඉල්ලා සිටීම සිදු කල යුතු වුවත්, එසේ සිදු කර නොමැතිව අනතුරුදායක ලෙස සහ පරිසරයට හානි කරන ආකාරයට අතහැර දමා ඇති අවදානම් සහගත පතල් වලවල් බලපත්‍රය අවලංගු වී මාස 02 කින් පසුව අධිකාරිය විසින් වසා දමා භූමිය යථාවත් කල යුතු වුවත්, නියැදි පරීක්ෂාවේදී එසේ වසා දමා නොමැති වලවල් 19 ක් නිරීක්ෂණය විය.	2023	මැණික් පතල් වලවල් වසා අදාල භූමි නිසි ලෙස ප්‍රතිසංස්කරණය කල යුතුය.	නොවැසූ පතල් වලවල් කඩිනමින් වසා දැමීම සඳහා අධ්‍යක්ෂ(ක්‍රියාත්මක සහ ප්‍රාදේශීය සංවර්ධන) වෙත උපදෙස් ලබා දී ඇත.	මෙතෙක් ප්‍රතිසංස්කරණය කර නැත. වලවල් වසා ඉදිරි කටයුතු කිරීමට ඉඩම් අංශය වෙත යොමු කර ඇත.
07	බෙලිදෙණියෙහි, පිරිවැය රු.889,000 ක ඉඩම හා පිරිවැය රු.5,358,507 ක ගොඩනැගිල්ල වසර 12 කට වැඩි කාලයක සිට කිසිදු ප්‍රයෝජනයකට නොගෙන පැවතුණි.	2023	වත්කම් ඌන උපයෝජිතව තබා නොගැනීමට වග බලා ගත යුතුය.	මෙම ගොඩනැගිල්ල ඌන උපයෝජනය වීම වළක්වා ලීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට පවරා දීමට අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට නියමිතය. ඉඩම සහ ගොඩනැගිල්ල අවසතු කිරීම සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද 2430 අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව	මෙම ඉඩම ප්‍රාදේශීය ලේකම් වෙත ‘‘අවසතු‘‘ කිරීම සඳහා නැවත අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් යොමු කරන ලෙසට විගණන කමිටුව විසින් උපදෙස් ලබා දී ඇත.

පරිදි මැණික් සහ ස්වර්ණාභරණ පර්යේෂණ අභ්‍යාස ආයතනය අදාළ පවරා ගැනීම සිදුකර නොමැත

3.129 ජාතික මෝස්තර මධ්‍යස්ථානය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	179,198,279	40,937,395	138,260,884	4,902,973	තත්ත්වාගණනය කළ
2022	214,257,165	35,653,077	178,604,088	3,323,435	තත්ත්වාගණනය කළ
2023	205,256,096	35,892,389	169,363,707	(11,739,450)	තත්වාගණනය නොකළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්වය
01	2020 වර්ෂයේ බතික් නිෂ්පාදන ඉගැන්වීම හා එම කර්මාන්තයේ නියුතු ශිල්පීන්ට පොදු පහසුකම් සැලසීම අරමුණු කරගනිමින් පිරිපහදු පද්ධතියක් රු.2,991,720 ක් වැයකර 2021 දෙසැම්බර් 16 දින ස්ථාපිත කර තිබුණද 2023 වර්ෂයේදීද එමගින් අපේක්ෂිත අරමුණු ඉටු කරගෙන නොතිබූ අතර පිරිපහදු පද්ධතිය නිශ්ක්‍රියව පැවතුණි.	2023	මුදල් රෙගුලාසි 780 ප්‍රකාරව රජයේ මුදල් අරපිරිමැස්මෙන් හා කාර්යක්ෂමව ඵලදායීව ආයෝජනය කළ යුතුවේ.	බතික් කර්මාන්තකරුවන්ට නත්තරම්පොත බතික් පුහුණු මධ්‍යස්ථානයේ සහ බතික් අපජල පිරිපහදු කිරීමේ පද්ධතියේ සේවා ලබා ගැනීමට අයකිරීම් ක්‍රමයක් යටතේ විධිමත් ක්‍රමවේදයක් සකස් කරන ලදී. ප්‍රදේශයේ බතික් කර්මාන්තකරුවන්ට අප ජල පිරිපහදු කිරීමේ සේවය ලබා ගත හැකි පොදු පහසුකම් මධ්‍යස්ථානයක් ඇති බවට දැනුවත් කිරීම සිදු කර ඇත.	පද්ධතිය සම්බන්ධයෙන් ප්‍රදේශයේ බතික් නිෂ්පාදකයින් දැනුවත් කර ඇති අතර මේ දක්වා ව්‍යවසායකයින් 15 දෙනෙකු අපජලය පිරිපහදු පහසුකම ලබාගෙන ඇත.

02	නව නිර්මාණ සහ නව තාක්ෂණය පිළිබඳ දැනුම ලබාදීමේ ව්‍යාපෘතිය යටතේ ශිල්පීන්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා ගුණාත්මක පුහුණුවක් රටපුරා ව්‍යාප්ත කිරීමේ අරමුණින් වැඩසටහන් 29 ක් පැවැත්වීමට රු.මිලියන 8.5 ක් වෙන්කර තිබුණ ද පුහුණු වැඩසටහන් 17 ක් පමණක් පවත්වා තිබුණි. මේනිසා වැඩසටහන් හරහා ශිල්පීන්ට නව නිර්මාණ 450 ක් හඳුන්වාදීමට සැලසුම්කර තිබුණ ද නව නිර්මාණ 216 ක් පමණක් හඳුන්වා දී තිබුණි.	2023	සැලසුම්වලට අනුකූලව වඩාත් ඵලදායී නව නිර්මාණ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුය.	2023 වර්ෂයේදී අනුමත කාර්යය මණ්ඩලය පදනම්ව ඉලක්ක සකස් කළ අතර මෝස්තර අංශයේ කාර්ය මණ්ඩලය පුරප්පාඩු වීම සැලකිල්ලට ගෙන 2024 වර්ෂයේ සංවර්ධන ඉලක්ක සකස් කරන ලදී.	2024 වර්ෂය සඳහා නව නිර්මාණ පුහුණු වැඩසටහන් 14 ක් ඉලක්ක කර ඇති අතර ඉන් 10 ක් මේ වන විට අවසන් කර ඇත. එමෙන්ම නව නිර්මාණ 110 ක් හඳුන්වා දීම සඳහා ඉලක්ක කර ඇත. මේ වන විට ඉන් 93 ක් විවිධ හස්ත කර්මාන්ත ක්‍රමවේද ඔස්සේ හඳුන්වා දී ඇත.

3.130 අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	75,020,771	14,233,785	60,786,986	14,524,699	තත්ත්වාගණනය කළ
2022	109,971,147	24,376,786	85,594,361	41,895,359	තත්ත්වාගණනය කළ
2023	185,596,776	13,610,137	171,986,639	85,375,506	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණ	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01	මණ්ඩලය විසින් 2022 වර්ෂය සඳහා පිළියෙල කරන ලද වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි සම්පූර්ණ ක්‍රියාකාරකම් 167 ක් නිරූපණය වූ අතර, ඉන් ක්‍රියාකාරකම් 30 ක් සඳහා පමණක් මූල්‍ය ඉලක්කයන් ලබා දී තිබුණි. මූල්‍ය ඉලක්කයන් ලබා දී තිබු එකතු වටිනාකම රු.823,000ක් වු ක්‍රියාකාරකම් 10ක හා මූල්‍ය වටිනාකම ඉදිරිපත් කර නොතිබූ ක්‍රියාකාරකම් 45 ක අපේක්ෂිත ප්‍රගතිය ලගාකරගෙන නොතිබුණි.	2022	ක්‍රියාකාරී සැලැස්ම ප්‍රගතිය මැනිය හැකි පරිදි නිශ්චිත ඉලක්කයන් සහිතවද, අපේක්ෂිත පිරිවැය සහිතවද සකස්කළ යුතුය.	ක්‍රියාකාරී සැලැස්මේ සපයන ලද තොරතුරු සඳහා මූල්‍යමය ඉලක්ක ලබාදීමට අදාල පියවර ගන්නා ලදී.	2024 වර්ෂයේ සිට කාර්යයන් සඳහා මූල්‍ය ඉලක්ක ඉදිරිපත් කර ඇත.

3.131 ජාතික සමූපකාර සංවර්ධන ආයතනය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	899,160,444	104,515,757	794,644,687	(941,564)	තත්ත්වාගණනය කළ
2022	857,322,780	64,342,537	792,980,243	(5,547,435)	තත්ත්වාගණනය කළ
2023	851,320,248	64,815,712	786,504,536	3,003,434	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපතිගේ නිර්දේශය	ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග	ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය
1.	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ශේෂ 02 ක එකතුව රු.10,032,374 ක් වූ අතර ඉන් වසර 01ත් 05ත් අතර කාලයට අදාල රු.108,451 ක් හා වසර 05 ට වැඩි රු.9,923,923ක් නිරවුල් කර නොතිබුණි.	2021 2022 2023	ගෙවිය යුතු ශේෂ නිරවුල් කළ යුතුය.	නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතින බව.	මේ වන විට ද ශේෂ නිරවුල් කර නොමැති බව.
2.	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ශේෂ 02 ක එකතුව රු.3,014,533 ක් වූ අතර ඉන් වසර 05 ට වැඩි රු.790,462 ක් අය කර නොතිබුණි.	2021 2022 2023	ලැබිය යුතු ශේෂ අයකර ගත යුතුය.	රු.145,340 ක ශේෂය අයකර ගැනීමේ ගැටලුවක් පවතින අතරරු.645,122ක් අයකර ගැනීමට නීතිමය පියවර ගෙන ඇති බව.	මේ වන විට ද ශේෂ නිරවුල් කර නොමැත.
3.	2020 ජුලි 31 දිනැති කළමනාකරණ මණ්ඩල තීරණය අනුව, අභ්‍යන්තර කථිකාචාර්යවරයෙක් මසකට අවම පැය 60 ක් දේශන පැවැත්විය	2022 2023	කාර්යය මණ්ඩලය ඵලදායීව ඉහළ කාර්යක්ෂමතාවය කින් සේවයේ යොදවා ගත යුතුය.	අමාත්‍යාංශ ලේකම්වරයාගේ උපදෙස් මත දේශන පැය ප්‍රමාණය පැය 40 ක් හා විෂය සමගාමී ක්‍රියා පැය 20ක්	මේ දක්වා නිරාකරණය කරගෙන නොමැත.

	යුතු වුවද ප්‍රමාණවත් පාඨමාලා ප්‍රමාණයක් සැලසුම් කර නොපැවැත්වීම හේතුවෙන් කථිකාචාර්යවරුන් 09 දෙනෙකු සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට ජුනි දක්වා කාලය තුල මසකට පැය 60 ට වඩා අඩුවෙන් දේශන සඳහා යොදවා තිබුණු අතර කථිකාචාර්යවරු තිදෙනෙකු මාස 03 කදී එක් දේශනයකට හෝ යොදවා නොතිබුණි. තවද කථිකාචාර්යවරු 03 දෙනෙකුගේ මාස 02 ක හා කථිකාචාර්යවරු 04 දෙනෙකුගේ එක් මාසයක දේශන පැවැත්වීමේ පැය ගණන් විගණනයට ඉදිරිපත් නොවුණි.			ලෙස දැනට තීරණය කර ඇති බවත් ඉදිරියට, අදාල ක්ෂේත්‍රයන්හි පාඨමාලා සම්බන්ධීකරණය කොට ඒවායේ අධ්‍යයන කටයුතුවලට මැදිහත්වී මෙම අඩුපාඩුව නිරාකරණය කරගන්නා ලෙසට උපදෙස් ලබාදී ඇති බව.	
4.	කාමර 120 කින් යුත් නේවාසිකාගාර 09 ක උපයෝජනය සම්බන්ධයෙන් පරීක්ෂාවේදී මුල් මාස 06 තුල කාමර භාවිතයට ගත හැකි දින ගණනට සාපේක්ෂව සියයට 4 සිට සියයට 20 ක පරාසයක උපයෝජනයක් පමණක් සිදුව තිබීම හේතුවෙන් නේවාසිකාගාර 09 හි කාමර ඌණ උපයෝජිතව	2023	ඌන උපයෝජිත වත්කම් ප්‍රයෝජනයට ගෙන ආදායම් උපයාගැනීමට කටයුතු කළ යුතුය.	ඉන්ධන අර්බුදය හා විදුලි කප්පාදුව හේතුවෙන් හා රටතුල පැවති ආර්ථික අර්බුදය හේතුවෙන් පුහුණු කටයුතු මාර්ගගත ක්‍රමය යටතේ පැවැත්වීමත් බාහිර ආයතන වැඩසටහන් පැවැත්වීම අඩුවීමක්වුවද 2023 ජූලි මාසයේ සිට උපයෝජන මට්ටම ඉහල අගයක් ගෙන ඇති බව.	2024 සැප්තැම්බර් 30 දිනය දක්වාත් වත්කම් පූර්ණ උපයෝජනය කර නොතිබුණි.

	පැවතුණි. ඒ තුල පැවති කාමර 38 කින් සමන්විත නේවාසිකාගාර 02 ක් අප්‍රේල් මාසය තුල භාවිතා කර නොමැති අතර කාමර 06 කින් සමන්විත නේවාසිකාගාර 02 ක් ජනවාරි මාසය තුල එක් දිනක් පමණක් උපයෝජනය කර තිබුණි.				
5.	බහු කාර්ය ගොඩනැගිල්ලේ බිම් මහලෙහි වර්ග අඩි 3564 කින් සමන්විත කොටසක් උපයෝජනයකින් තොරව වසා දමා තිබුණු අතර එහි පැවති වෘත්තීය අංශයේ පාඨමාලාද තාවකාලිකව වසා දැමීම හේතුවෙන් එම අංශයද ආදායම් ඉපැයුම් කටයුත්තකට යොදා නොගැනුණි. තවද පැරණි කාර්යාල ගොඩනැගිල්ලෙහි A13 හා A12 යන කාමර ඌන උපයෝජිත බව නිරීක්ෂණය විය.	2021 2022 2023	වත්කම් නිසිපරිදි උපයෝජනය කළ යුතුය.	බහුකාර්ය ගොඩනැගිල්ලේ පරිශ්‍රයන් උපයෝජනය කර ගැනීමට ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කර තිබුණ ද ඒ සඳහා අමාත්‍යාංශයේ අනුමැතියක් නොලැබුණු බවද, A 13 හා A 12 කාමර මාර්ගගත ක්‍රමයට දේශන පැවැත්වීමට යොදා ගන්නා බව.	බදු දීම සඳහා ප්‍රසම්පාදනය සිදු කරමින් පවතී.

3.132 ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	බදු පෙර ලාභය (අලාභය) රු.	මතය
2021	2,118,261,217	483,188,439	1,635,072,778	59,318,302	තත්ත්වාගණනය කළ
2022	2,271,906,719	511,948,779	1,759,957,940	126,732,525	තත්ත්වාගණනය කළ
2023	2,513,141,543	607,318,582	1,905,822,961	16,596,485	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	**වාර්තාවේ වර්ෂය**	**විගණකාධිපති නිර්දේශය**	**විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ගය**	**වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය**
01	කාර්මික සංවර්ධන මණ්ඩලය සතු කාර්මික ජනපද 16හි (ඇල්පිටිය කාර්මික ජනපදය හැර) බිම් කොටස් 733ක් පවතින අතර ඉන් බිම් කොටස් 53ක් කර්මාන්තකරුවන්ට බෙදා දී නොතිබීමෙන් වර්ෂ කිහිපයක සිට භාවිතයෙන් තොරව පැවතුණි. 2023 දෙසැම්බර් 31 දිනට කර්මාන්ත ශාලා 26ක් ක්‍රියාත්මක නොවී වසා දමා තිබූ අතර ඒවා වෙනත් කර්මාන්තකරුවන්ට බෙදා දීමට කටයුතු කර නොතිබුණි. තවද මණ්ඩලය සතු කාර්මික ජනපද 05ක ඉඩම් කට්ටි 23ක් පුද්ගලික පදිංචිය සඳහා භාවිතයට ගෙන තිබුණි.	2023	බිම් කොටස් කර්මාන්තකරුව න්ට බෙදා දීමට හා ඵලදායී ලෙස කර්මාන්ත නගා සිටුවීමට කටයුතු කළ යුතුය.	මෙම පවරා නොමැති බිම් කොටස්වල යටිතල පහසුකම් ප්‍රමාණවත් පරිදි සංවර්ධනය කර තිබුණද එම ප්‍රදේශවල කර්මාන්ත ආරම්භ කිරීම සඳහා ආයෝජකයින් පෙළඹීම ඉතා අඩු මට්ටමක පවතින බැවින් මෙම බිම් කොටස් හිස්ව පවතී. මේ සම්බන්ධව නව ආයෝජකයින් සොයා ගැනීම සඳහා ක්‍රියාකරමින් සිටී. වසා දමා ඇති කර්මාන්ත නව ආයෝජකයන් වෙත පවරා දීම සඳහා අදාළ දිස්ත්‍රික් කාර්යාල කටයුතු කරමින් සිටින අතර පදිංචි වීම් ඉවත් කිරීම සඳහා නීතිමය පියවර ගැනීමට අදාළ ලේඛන ප්‍රමාණවත් නොවීම	පවරා නොමැති බිම් කොටස් හා වසා දමා ඇති කර්මාන්ත වලට නව ආයෝජකයින් සොයා ගැනීමත් පුද්ගලික පදිංචි බිම් කොටස්වල නැවත කර්මාන්ත ගැන්වීමටත් කටයුතු කරමින් පවතී.

				මත මොවුන් නැවත කර්මාන්ත ගැන්වීම සිදුකිරීමට උත්සහ දරමින් පවතී.	
02	ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයට අයත් මාතර වැඩහල වෙත ජාතික ශිල්ප සභාව විසින් රු.3,850,740ක වටිනාකමකින් යුතු යන්ත්‍ර 3ක් සකස් කිරීමට 2021 වර්ෂයේ දී ඇණවුමක් ලබා දී තිබුණ ද, මා වේවැල් කැලයෙන් ඇදීම සඳහා වන රු.351,000 ක් වටිනා යන්ත්‍රය හැර අනෙකුත් යන්ත්‍ර දෙක 2024 අප්‍රේල් අවසන් වනවිටත් වැඩ අවසන්කර ශිල්ප සභාවට භාර දී නොතිබුණි.	2023	භාරගත් වැඩ ඇණවුම් නිසිකලට ඉටුකිරීමට කටයුතු කළ යුතුය.	හැකි ඉක්මනින් මෙම වැඩ ඇණවුම අවසන් කිරීමට අවශ්‍ය කටයුතු කරමින් පවතී.	ඇණවුම අවසන් කිරීමට අවශ්‍ය කටයුතු කරමින් පවතී.
03	පැලියගොඩ රබර් සංවර්ධන හා සේවා මධ්‍යස්ථානයට රබර් ආශ්‍රිත නිෂ්පාදන වල ගුණත්වය වැඩි දියුණු කිරීම, නාස්තිය අවම කිරීම, නිෂ්පාදන ක්‍රියාවලියේ කාර්යක්ෂමතාවය වැඩි කිරීම හා නිෂ්පාදන පිරිවැය අවම කිරීම, සුළු හා මධ්‍යම මට්ටමේ කර්මාන්ත වලට භාවිතය හඳුන්වා දීම හා දිරිගැන්වීම ආදි අරමුණු පෙරදැරිව	2023	යන්ත්‍රය ඵලදායීව භාවිතා කිරීමට කටයුතු කළ යුතුය.	මෙම යන්ත්‍රයේ පවතින දෝෂ සහගත තත්වයන් අදාල සමාගමට දැනුම් දී තිබූ අතර එය අළුත්වැඩියා කෙරෙමින් පැවතියද මේවන තෙක් එම යන්ත්‍රය යථා තත්ත්වයට පත් කරගැනීමට නොහැකි වී තිබුණි.	යන්ත්‍රයේ අළුත්වැඩියා කටයුතු සිදු කරමින් පවතී.

	රබර් ඉන්ජෙක්ෂන් මෝල්ඩිං යන්ත්‍රයක් 2016 වර්ෂයේදී රු.9,318,026 ක මුදලකට මිලදී ගෙන තිබුණි. මිලදී ගත් දින සිට පුහුණු ලාභීන් 328 දෙනෙකුට පමණක් පුහුණුව ලබා දී තිබූ අතර, 2020 වර්ෂයේ සිට 2024 වර්ෂයේ විගණිත දින වන විටත් මෙම යන්ත්‍රය ක්‍රියාකාරී මට්ටමකින් තොරව පැවතිණි.				
04	පැලියගොඩ රබර් භාණ්ඩ සංවර්ධන හා සේවා මධ්‍යස්ථානයේ රබර් ආශ්‍රිත යන්ත්‍රෝපකරණ 64 ක් පැවති අතර ඉන් යන්ත්‍ර 26 ක් වර්ෂයක සිට වර්ෂ 39 ක් දක්වා කාල පරාසයක සිට අක්‍රීයව පැවති අතර Compressor යන්ත්‍රය 2017 වර්ෂයේ සිට භාවිතයකින් තොරව ඇසුරුම් වලම ගබඩාවේ පැවතිණි. තවද, එහි පවතින අමුද්‍රව්‍ය වර්ග 17ක් හා යන්ත්‍ර අමතර කොටස් වර්ග 284 ක් වර්ෂ 1 සිට වර්ෂ 17 ක් දක්වා කාල පරාසයක සිට භාවිතා කිරීමකින් තොරව නිෂ්කාර්යව පැවතිණි.	2023	භාවිතයට නොගත් යන්ත්‍ර භාවිතයට ගැනීම හා අක්‍රීය යන්ත්‍ර ඉවත් කිරීමට කටයුතු කළ යුතුය.	දැනට අක්‍රිය තත්ත්වයේ පවතින යන්ත්‍ර සූත්‍ර අපහරණය කිරීම සඳහා ප්‍රධාන කාර්යාලයෙන් කමිටුවක් පත්කර ඇති අතර ඒ සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමට මූල්‍ය අංශයට යොමු කර ඇත. අළුතින් මිලදී ගන්නා ලද කම්ප්‍රෙශර් යන්ත්‍රය පැරණි යන්ත්‍රය අළුත්වැඩියා කරන අවස්ථාවන්හිදි ප්‍රයෝජනයට ගනු ලැබේ. ගබඩාවේ පවතින භාවිතා නොවන අමුද්‍රව්‍ය දැනට නිෂ්පාදන කටයුතු සඳහා භාවිතා නොවන ඒවා වන අතර අපහරනය සඳහා යොමු කල යුතුය. ගබඩාවේ පවතින යන්ත්‍ර අමතර කොටස් යන්ත්‍ර මිලදී ගැනීමේදී	අක්‍රිය තත්ත්වයේ පවතින යන්ත්‍ර සූත්‍ර හා යන්ත්‍ර අමතර කොටස් අපහරනය සඳහා කටයුතු කරමින් පවතී.

				ඒ සමඟ ලැබුන ඒවා වන අතර සමහර කොටස් වලට අදාල යන්ත්‍ර භාවිතයෙන් ඉවත්ව ඇත. ඒවා අපහරනය කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට යෝජිතය.	
05	නවකිම පෙර වැවුම් මධ්‍යස්ථානයේ පිහිටුවූ රොබෝ තාක්ෂණය සඳහා වන විශිෂ්ඨතා මධ්‍යස්ථානය වෙනුවෙන් ගොඩනැගිලි නවීකරණය, වැටුප් හා වේතන ලෙස රු.මිලියන 51 ක් වැයකර තිබුණු අතර 2018 හා 2019 වර්ෂයන්හිදී රු.මිලියන 35 ක් වටිනා රොබෝ තාක්ෂණික උපකරණ ස්ථාපිතකර තිබුණද අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවා ගැනීම හා එහි කටයුතු ආරම්භ කිරීම කර නොතිබුණි. 2023 වර්ෂයේ දී මෙම ව්‍යාපෘතිය සඳහා IRB 2600 welding power source එකක්, Reproving of 45 existing Robot cell එකක් හා එය භාවිතා කිරීමට දින 04කට ඉංජිනේරුවන් දෙදෙනෙකු පුහුණුකිරීම හා වෙනත් වියදම්	2023	ව්‍යාපෘතිය කඩිනමින් නැවත ආරම්භ කර වත්කම් ඵලදායීව භාවිතා කිරීමට කටයුතු කළ යුතුය.	රොබෝ තාක්ෂණය සඳහා වන විශිෂ්ඨතා මධ්‍යස්ථානය අප විසින් ඉතා සුදුසු පරිදි ස්ථාපිත කිරීමට උත්සාහ කලද මෙම මධ්‍යස්ථානය විවිධ අමාත්‍යාංශ යටතේ පැවති අතර දැනට මෙම මධ්‍යස්ථානයේ හිමිකාරිත්වය මණ්ඩලය සතුව නොමැත. නමුත් මෙම රොබෝ යන්ත්‍ර අලුත්වැඩියා කර ඉදිරි වැඩ කිරීමට අවශ්‍ය කටයුතු අප විසින් ඉටු කරමින් පවති.	2024 සැප්තැම්බර් මාසය වන තෙක් මෙම ව්‍යාපෘතිය ආරම්භ කර නොමැත.

	ඇතුළුව රු.5,164,149 ක් දරා තිබුණි. කෙසේ වුවද මෙම ව්‍යාපෘතිය 2023 දෙසැම්බර් 31 දින වන විටත් ක්‍රියාත්මක මට්ටමක නොපැවතුණි.				
06	2020 වර්ෂයේ යුනිඩෝ ආයතනය විසින් ඇ. ඩො. 101,130 ක් වටිනා යන්ත්‍ර උපකරණ 12 ක් සහ ඇ.ඩො.1167.44 ක් වටිනා භාණ්ඩ මණ්ඩලයට ලබාදී ඒවා ලක්සල ගොඩනැගිල්ලේ ස්ථාපනය කර තාවකාලිකව උණ දැව පුහුණු මධ්‍යස්ථානය ආරම්භ කර තිබුණි. 2022 සැප්තැම්බර් මස මෙම පුහුණු මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ජාතික ශිල්ප සභාවට පැවරීම නිසා එහි තිබූ යන්ත්‍ර උපකරණ ඉවත් කර කටුබැද්ද නවබිම පරිශ්‍රයේ ගොඩනැගිල්ලක අසුරා තිබීමෙන් 2024 මැයි වන විටත් ඒවා භාවිතයෙන් තොරව නිෂ්කාර්යව පැවතිණි.	2023	ව්‍යාපෘතියේ අරමුණු කඩිනමින් ළඟා කර ගැනීමට හා වත්කම් ඵලදායීව භාවිතා කිරීමට හා පුහුණු මධ්‍යස්ථානය කඩිනමින් ආරම්භ කිරීමට කටයුතු කළ යුතුය.	එම ගොඩනැගිල්ල මේ වන තෙක් නවීකරණය කිරීමට නොහැකි වී ඇත. එම ගොඩනැගිල්ල නවීකරණය කිරීමට මණ්ඩලය සතු මුදල් නොමැති වීමෙන් එය කඩිනමින් කිරීමට නොහැකි වී ඇත.ඉදිරියේදී මුදල් ලැබුණු පසු ගොඩනැගිල්ල නවීකරණය කර පුහුණු වැඩසටහන් පැවැත්වීමට නියමිතය.	ඉදිරියේදී මණ්ඩලය වෙත ප්‍රතිපාදන ලැබුණු පසු ගොඩනැගිල්ල නවීකරණය කර පුහුණු වැඩසටහන් පැවැත්වීමට නියමිතය.
07	2022 වර්ෂයේදී විමලසුරේන්ද්‍ර විදුලි බලාගාරයෙන් ඉවත් කරන ලද අබලි ලෝහ මිලදී ගැනීම සඳහා ගෙවන ලද	2023	හිඟ මුදල ලබා ගැනීමට හෝ භාණ්ඩ ලබාගැනීමට ආයතනය කටයුතු කළ යුතුය.	අබලි ශේෂයන් හෝ ඊට අදාල වටිනාකම අප වෙත නැවත ලබා ගැනීම සඳහා අදාල ගබඩා වෙත වෙන වෙනම ලිඛිතව දැනුම්	මේ වන තෙක් මෙම අබලි ද්‍රව්‍ය හෝ මුදල ලබාගෙන නොතිබුණි.

	රු.3,754,298 ක් සඳහා අබලි තඹ ලෝහ ප්‍රමාණවත්ව නොතිබීම හේතුවෙන් මණ්ඩලයට භාණ්ඩ ලැබී නොතිබුණි. එම මුදල ආපසු ලබා ගැනීමට හෝ භාණ්ඩ ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.			දෙන ලදී.	
08	2017 ඔක්තෝබර් 25 දිනැති මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 5/2017 පරිදි 2012 ජනවාරි මස 01 දින සිට ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයට අයත් නිලධාරීන් සඳහා මාසිකව රු.15,000ක දීමනාවක් ගෙවීමට අනුමැතිය ලබා දී තිබූ අතර මෙම චක්‍රලේඛයෙන් දීමනා ගෙවීමට අනුමත කර නොමැති ආයතන සඳහා දීමනා ගෙවන්නේ නම් අමාත්‍යාංශ ලේකම් හරහා මුදල් අමාත්‍යාංශයෙන් අනුමැතිය ලබාගත යුතු වුවත් කාර්මික සංවර්ධන මණ්ඩලය එවන් අනුමැතියකින් තොරව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත නිලධාරීන් 12ක් සඳහා 2018 වර්ෂයේ සිට මෙම දීමනාව	2023	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.	මේ සම්බන්ධව අධ්‍යක්ෂක මණ්ඩලය වෙත යොමු කර ඇත.	භාණ්ඩාගාර අනුමැතිය මෙතෙක් ලබාගෙන නොමැත.

	ගෙවා තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානය දක්වා වැඩිපුර ගෙවන ලද මුදල රු.7,717,590 ක් විය.				
09	2022 අගෝස්තු 08 දිනැති මුදල් අමාත්‍යාංශයේ ජාතික අයවැය චක්‍රලේඛ අංක 04/2022 හි 2.4 ඡේදයේ සදහන් විධිවිධානවලින් බැහැරව 2023 වර්ෂයේදී කොන්ත්‍රාත් පදනමින් නිලධාරින් 106 දෙනෙකු බඳවාගෙන ඉන් 61 දෙදෙනෙකු ස්ථිර කර තිබුණි.	2023	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.	2023 ජූනි 05 වන දින කර්මාන්ත අමාත්‍යාංශයේ ප්‍රගති සමාලෝචන රැස්වීමේදී බඳවා ගැනීම් පිළිබඳ ගන්නා ලද තීරණයේ සහ මණ්ඩලයේ ඉහළ කළමනාකාරීත්වයේ තීරණය මත මණ්ඩලයේ පුරප්පාඩු පවතින ඉහළ තනතුරු සඳහා සුදුසුකම් සපුරා ඇති ස්ථිර සේවකයන්ට උසස්වීම ලබාදීමත් කොන්ත්‍රාත් පදනම මත සේවයේ නියුතු සේවකයින් සඳහා අවස්ථාව ලබාදීමත් අරමුණ වූ බව.	මෙම බඳවාගැනීම් සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

3.133 ලංකා පිඟන් සංස්ථාව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	බදු පෙර ලාභය (අලාභය) රු.	මතය
2021	294,190,271	640,506,587	(346,316,316)	5,054,619	තත්ත්වාගණනය කළ
2022	299,908,449	642,457,197	(342,548,748)	5,778,945	තත්ත්වාගණනය කළ
2023	270,854,446	643,196,444	(372,341,998)	(40,289,658)	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01	වෙළඳ හා වෙනත් ණයගැතියන්ගෙන් අයවිය යුතු රු.5,946,973 ක ණය ශේෂයෙන් රු.5,848,709 ක් වූ ණය ශේෂ වසර තුනකට වැඩි කාලයක සිට පැවත එන ණය ශේෂ වුවද අඩමාණ ණය වෙන් කිරීමේ ප්‍රතිපත්තියක් ස්ථාපනය කරගෙන ඒ සඳහා ප්‍රතිපාදන සිදුකර නොතිබුණි.	2023	බොල් ණය හා අඩමාන ණය ප්‍රතිපත්තියක් ඇති කර ගෙන නිවැරදිව ගැලපීම් කිරීමට කටයුතු කළ යුතුය.	අඩමාණ ණය වෙන් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය නිකුත් කරන ප්‍රතිශතය ඉදිරියේදී ගිණුම් වලට අදාළ වනු ඇත.	ප්‍රතිපත්තියක් ඉදිරියේදී ස්ථාපනය කර ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් පිළියෙල කරමින් පවතී.
02	එරගම කම්හල සතු භූමියේ අක්කර 3.5 ක කොටසක් පෞද්ගලික පාර්ශවයක් විසින් අත්පත් කරගෙන සිටීම, මහියංගනය කම්හල පවතින ඉඩමේ 2015 වර්ෂයට පෙර සිට පවුල් 125 ක් භාවිතා කිරීම,	2023	සංස්ථාව සතු දේපළ බාහිර පාර්ශව විසින් භාවිතා කිරීම වළක්වා ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය.	මේ සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුවට යොමු කර L -168 යටතේ නඩුවක් ගොනුකර ඇත.	එම නඩුව විභාග වෙමින් අවසන් අදියරේ පවතී.

	ඇලයාපත්තුව ඉඩමේ කොටසක් පෞද්ගලික පාර්ශව විසින් භාවිතා කිරීම යන ගැටළු නිරාකරණය වී නොතිබුණි.				
03	2023 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්ම අනුව නිෂ්පාදනය වැඩිකිරීම සඳහා මහියංගනය කම්හල හා එරගම කම්හලේ ඒකක 6,125,000 ක වාර්ෂික නිෂ්පාදන ඉලක්කයක් කරා ලඟාවීමට අපේක්ෂා කර තිබුණද 2023 වර්ෂයේ එම කම්හල්වල තත්‍ය නිෂ්පාදනය ඒකක 1,118,444ක් වී තිබීමෙන්. නිෂ්පාදන කාර්යසාධනය සියයට 18 ක් වැනි අඩු අගයක් ගෙන තිබුණි.	2023	නිෂ්පාදනය කෙරෙහි බලපානු ලබන සාධක කෙරෙහි සැලකිලිමත් වෙමින් අපේක්ෂිත නිෂ්පාදන ඉලක්ක පිහිටුවා ගත යුතු අතර එම ඉලක්ක ලගා කර ගැනීමට කටයුතු කළ යුතුය.	ඉන්ධන මිල 04 ගුණයක් වැඩිවීමත් අමුද්‍රව්‍ය මිල විශාල වශයෙන් ඉහළ යාමත් හේතුවෙන් අපේක්ෂිත නිෂ්පාදන ඉලක්ක ලඟා කර ගැනීමට නොහැකි විය.	ඉදිරියේදී නිෂ්පාදන කටයුතු වේගවත් කිරීමට කටයුතු කර ඇත.
04	පෙර වර්ෂයට සාපේක්ෂව විකුණුම් සියයට 25 කින් වැඩි කිරීමට අපේක්ෂා කර තිබුණද 2022 වර්ෂයේ රු.90,774,254 ක් වූ විකුණුම් ආදායම 2023 වර්ෂයේදී රු. 65,297,488 ක් දක්වා රු.25,476,766 කින් එනම්, සියයට 28 කින් පහත වැටී තිබුණි.	2023	විකුණුම් කෙරෙහි බලපාන සාධක කෙරෙහි අවධානය යොමු කරමින් විකුණුම් ඉලක්ක පිහිටුවා ගත යුතු අතර එම ඉලක්ක ලගා කර ගැනීමට කටයුතු කළ යුතුය.	රටතුල ඇති වී ඇති උද්ධමනය හේතුවෙන් නිෂ්පාදනයට ඇති ඉල්ලුම පහල බැසීමට හේතු වී ඇත.	දැනට අලෙවියේ වර්ධනයක් පෙන්නුම් කර ඇත.
05	සෑම රජය සතු ව්‍යාවසායක් සඳහාම අනුමත කාර්ය	2023	චක්‍රලේඛ විධිවිධාන පරිදි කාර්ය මණ්ඩලය	2012 වසරේ ප්‍රතිව්‍යුහ ගත කිරීමට ලක් වු ආයතනයක් බැවින්	කාර්ය මණ්ඩලයක් අනුමත කර

මණ්ඩලයක් සමඟ වූ සංවිධාන සැලැස්මක් සකස් කර තිබිය යුතු වුවද සංස්ථාව සඳහා කාර්ය මණ්ඩලය අනුමත කරගෙන නොතිබුණු අතර සංවිධාන සැලැස්මක් සකස් කර නොතිබුණි.	අනුමත කර ගැනීමට සහ සංවිධාන සැලැස්මක් සකස් කර ගැනීමට කටයුතු කළ යුතුය.	කාර්යය මණ්ඩලයක් ගෙන නොමැත. අනුමත කර ගැනීමට නොහැකි වී ඇත.

3.134 ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	1,519,590,062	1,071,150,478	448,439,584	(58,546,847)	තත්ත්වාගණනය කළ
2022	1,404,970,130	1,054,429,223	350,540,907	(99,040,670)	තත්ත්වාගණනය කළ
2023	1,353,985,121	1,043,890,389	310,094,732	57,120,290	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්වය
01	2023 ජනවාරි 01 දින කෞතුකාගාර දෙපාර්තමේන්තුව විසින් මුද්‍රා තබා වසා දමන ලද අලෙවි ප්‍රදර්ශනාගාරයේ ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය දරන ලද වියදම් වෙනුවෙන් කෞතුකාගාර දෙපාර්තමේන්තුවෙන් රු.107,548,197 ක මුදලක් ලැබිය යුතුව පැවතුණි.	2023	දරන ලද වියදම් ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කළ යුතුය.	අමප/23/1491/620/09-1 අංක දරන හා 2023 අගෝස්තු 28 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය විසින් ජාතික කෞතුකාගාර පරිශ්‍රයේ පවත්වාගෙන ගිය ලක්සල ප්‍රදර්ශනාගාරය හා ආපන ශාලාව 2023 දෙසැම්බර් 31 වන දින එම දෙපාර්තමෙන්තුව වෙත නැවත භාර දෙන ලදි. ඒ අනුව මෙම මණ්ඩලය වෙත තවදුරටත් රු.7,548,197 ක මුදලක් ගෙවීමට ඇති බව කෞතුකාගාර දෙපාර්තමේන්තුව විසින් සඳහන් කර ඇත.	තවදුරටත් ලැබිය යුතු රු107,548,197 ක මුදලක් පවතී.

02	2012 ඔක්තෝබර් 11 දිනැති හා අංක 12/1523/553/020 දරන කැබිනට් තීරණය මගින් මණ්ඩලය වෙත පවරා දෙන ලද සළුසල ආයතනයට අයත් අක්කර 01 පර්චස් 30 ක ගාල්ල උණවටුන භූමිය හා ගොඩනැගිලි සඳහා ගැනුම් ප්‍රතිෂ්ඨාව ලෙස මණ්ඩලය විසින් 2012 දෙසැම්බර් 12 දින රු.15,248,575 ක් ගෙවා තිබුණ ද, සමාලෝචිත වර්ෂයේ ද දේපලේ නීත්‍යානුකූල හිමිකාරිත්වය හා පරිහරණය කිරීමේ අයිතිය ලබා ගැනීමට අපොහොසත් වී තිබුණි. එහෙත් ලංකා සළුසල ආයතනය මෙම ඉඩම නැවත 2023 සැප්තැම්බර් 22 දින රු.25,000,000 ක මුදලකට කාර්මික සංවර්ධන මණ්ඩලයට පවරා දී තිබුණද ඒ සඳහා ලක්සල ආයතනයට ලැබිය යුතු මුදල් 2024 සැප්තැම්බර් 25 වන දින වන විටත් සළුසල ආයතනයෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	2022 2023	ගෙවන ලද ගැණුම් ප්‍රතිෂ්ඨාව හා එම කාලපරිච්ඡේදය වෙනුවෙන් ලැබිය යුතු මුදල් නොපමාව අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ.	මෙම මණ්ඩලය වෙත අගතියක් නොවීම සඳහා අදාල භූමිය ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය - ලක්සල වෙත නීත්‍යානුකූලව පවරා දෙන ලෙසට දිගින් දිගටම ලිඛිත ඉල්ලීම් සිදුකර ඇත.	කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්තුමියගේ උපදෙස් අනුව රු.15,248,575 ක මුදල මණ්ඩලය වෙත කඩිනමින් ලබා දිය යුතු වුවත් මෙතෙක් ලබා දී නොමැත.
03	ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ XLVIII පරිච්ඡේදයේ 21 හා 23 වගන්ති ප්‍රකාරව 2015 නොවැම්බර් 19 දින	2022 2023	ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදය ප්‍රකාරව කටයුතු	මෙම මණ්ඩලයේ පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වෙත ඉහත තත්ත්වය දිගින් දිගටම වාර්තා කර ඇති	විනය පරීක්ෂණ නිලධාරී විසින් ලබා දී ඇති අවසන් විනය පරීක්ෂණ වාර්තාව

	පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී ගත් තීරණය පරිදි නිලධාරිනියන් දෙදෙනෙකු වැඩ තහනමකට ලක් කර තිබුණද 2023 මැයි 20 විගණන දින වන විටත් මණ්ඩලයේ විනය බලධරයා විසින් විනය නියෝග ලබා දී නොතිබුණි.		කළ යුතුය.	අතර අධ්‍යක්ෂ මණ්ඩලය ලබා දුන් උපදෙස් පරිදි මෙතෙක් කටයුතු කර ඇත.	සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙතෙක් තීරණයක් ගෙන නොමැත. එස්.ආර්.එම් පෙරේරා මිය විසින් වත්තල කම්කරු අධිකරණයේ ගොණුකර ඇති නඩුවේ තීන්දුව අනුව නඩුව සමථයකට පත් කරමින් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය යටතේ රු.6,294,099 ක මුදලක් පැමිණිලි පාර්ශවය වෙත ගෙවා ඇත.
04	වර්ෂ 2015 සිට 2018 වර්ෂය දක්වාවූ කාලපරිච්ඡේදය තුළ මණ්ඩලයට එරෙහිව බාහිර පාර්ශව විසින් නඩු 5 ක් ගොනුකර තිබූ අතර මෙම නඩු දැනට වර්ෂ 5 ත් 9 ත් අතර කාලයක සිටම අඛණ්ඩව පවතින බවත් එම නඩු වෙනුවෙන් 2015 සිට 2023 දක්වා නීතිමය ගාස්තු වශයෙන් රු.5,853,303 ක මුදලක් වැයකර තිබුණි. එමෙන්ම මෙම නඩු 5 සඳහා යම් හෙයකින් විත්තියට අවාසිදායක වන ලෙස තීන්දුව ප්‍රකාශ වුවහොත් රු.48,858,665 ක	2023	නඩු සම්බන්ධව අදාළ පාර්ශවයන්ගෙන් කරුණු විමසා මණ්ඩලයට වාසිදායක වන ලෙස තීන්දු ලබාගැනීමට කටයුතු කළ යුතුවේ.	මෙම මණ්ඩලයේ නීති නිලධාරියෙකු නොමැති බැවින් විවිධ පාර්ශව විසින් මණ්ඩලයට එරෙහිව පවරනු ලබන නඩු කටයුතු සඳහා අධිකරණය ඉදිරියේ පෙනීසිටීමට හා අවශ්‍ය අවස්ථාවන්හිදී නීතිමය උපදෙස් ලබා ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත අවස්ථානුකූලව බාහිර නීතිඥ සේවාව ලබා ගැනීමට සිදුව ඇත. ඒ අනුව ඊට අදාළව නීතිඥ වියදමක් දැරීමට සිදුව ඇත.	මුදල් ගෙවීම් කිරීම වළක්වාලමින් මණ්ඩලයට අගතියක් ඇති නොවන පරිදි බාහිර නීතීඥ සහයද සහිතව ඉහත නඩු කටයුතු අවසන් කිරීමට කටයුතු සිදු කරමින් පවතී.

	මුදලක් මණ්ඩලයෙන් ගෙවීමට සිදු විය හැකි බවත් නිරීක්ෂණය විය.				
05	කිසිදු මෙහෙයුම් කටයුත්තක් සඳහා උපයෝජනය නොකර 2009 වර්ෂයේ සිට වසා දමා ඇති කෙසෙල්වත්ත ව්‍යාපෘතිය සතු රු.4,921,120 ක වටිනාකමින් යුතු යන්ත්‍ර සූත්‍ර හා ගොඩනැගිලි ඌණ උපයෝජිතව පවතින අතර ඒ වෙනුවෙන් වාර්ෂිකව දරන රු.1,041,600 ක ආරක්ෂක වියදම ද නිෂ්කාර්ය වියදමක් බව නිරීක්ෂණය විය.	2023	ඵලදායී කටයුත්තකට ආයෝජනය කළ යුතුවේ.	කෙසෙල්වත්ත ව්‍යාපෘති පරිශ්‍රය ඵලදායීව භාවිතා කිරීමේ අරමුණින් අභිලාෂයන් කැඳවීමේ යෝජනා (EOI) කැඳවා එහි කොටසක් ව්‍යාපෘතියක් වෙනුවෙන් යෙදවීම සඳහා ගිවිසුම්ගත වී ඇත. තවද එම පරිශ්‍රය මෙම මණ්ඩලයේ වත්කමක් බැවින් එය ඌණ උපයෝජිතව පැවතියද ආරක්ෂක වියදම් හා විදුලි බිල් වියදම දැරිය යුතුව ඇත.	ඵලදායීව යොදා ගැනීමට කටයුතු කර නැත.

3.135 ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බඳු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	1,583,518,923	590,936,723	992,582,200	44,642,491	තත්ත්වාගණනය කළ
2022	1,644,455,837	589,110,048	1,055,345,789	60,802,048	තත්ත්වාගණනය කළ
2023	1,657,219,226	598,517,021	1,058,702,205	141,147,874	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01	සංස්ථාව විසින් ලංකා සිමෙන්ති සමාගමේ රු.1,083,618,910 ක් ආයෝජනය කර තිබූ අතර එය ලංකා සිමෙන්ති සමාගමේ කොටස් ප්‍රාග්ධනයෙන් සියයට 62.45 ක් විය. සමාගම විසින් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නොමැති බැවින් 2016 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වාම ඒකාබදධ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර නොතිබුණි. එම ආයෝජනවල වෙළෙඳපොල වටිනාකම වාර්ෂිකව තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.	2023	ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට කටයුතු කළ යුතු අතර ආයෝජනවල වෙළෙඳපල වටිනාකම වාර්ෂිකව තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය.	ලංකා සිමෙන්ති සමාගමේ සිදු කර තිබෙන ආයෝජනයේ වෙළඳපොල වටිනාකම මිනුම් කල හැක්කේ කොටස් වෙළඳපොල දත්ත මත පදනම්ව වුවත් සමාගම විසින් වාර්තා ඉදිරිපත් නොකිරීම නිසා කොටස් වෙළඳපොල කොටස් මිල දර්ශකයේ අගය ප්‍රකාශ කර නොමැත. 2016 වර්ෂයේ නිරූපිත වටිනාකම ගිණුම්වල පෙන්නුම් කර ඇත.	නිර්දේශ ක්‍රියාත්මක කර නැත.
02	මූල්‍ය ප්‍රකාශනවල සටහන් මගින් හෙළිදරව් කර තිබූ	2023	වත්කම්වල සාධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල	ඉඩම් තක්සේරු කර ගිණුම් ගත කිරීමට අවස්ථා	විගණන නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

	අක්කර 6340 ක ඉඩම් 03 ක් හා ඝණ මීටර් 25,750 ක හුණුගල් තොගය තක්සේරු කර ගිණුම් ගත කර නොතිබුණි.		දැක්විය යුතුය.	කිහිපයකදීම උත්සහ කලද , ඊට වැයවන පිරිවැය ඉතා අධික බැවන් තක්සේරු කටයුතු ප්‍රමාදව ඇත. කැණීම් කරන ලද හුණුගල් තොගය වාණිජමය වටිනාකමක් සහිත බැවින් එය තක්සේරු කර විකිණීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවක් 2020 වර්ෂයේදී පත්කරන ලදී.	
03	1957 අංක 49 දරන කාර්මික සංස්ථා පනත මඟින් පිහිටුවා ඇති ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ දැක්ම ශ්‍රී ලංකා සිමෙන්ති කර්මාන්තයේ දියුණුව සඳහා මඟ පෙන්වීම සහ නායකත්වය ලබා දීම වන අතර මෙහෙවර වශයෙන් රටේ අවශ්‍යතා සපුරාලීම සඳහා ගුණාත්මක සිමෙන්ති හා අනෙකුත් සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන ප්‍රමාණවත් ලෙස සැපයීම සහතික කිරීම වුවද වර්තමානය වන විට සංස්ථාව විසින් සිමෙන්ති හෝ සිමෙන්ති ආශ්‍රිත කිසිදු නිෂ්පාදනයක් සිදු කරනු නොලබන අතර අරුවක්කාලු හුණුගල්	2023	සංස්ථාව පිහිටුවීමේ මූලික අරමුණු ඉටුවන ආකාරයට මෙන්ම සංස්ථාව සතු ස්වභාවික සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීමට හැකිවන ආකාරයට කටයුතු කළ යුතුය.	2016 වර්ෂවලදී ක්‍රියාත්මක වූ ස්වේච්ඡා විශ්‍රාම වන්දි යෝජනා ක්‍රමය හේතුවෙන් මේ වන විට සේවකයින් 14 දෙනෙකුට පමණක් කාර්ය මණ්ඩලය සීමා වී ඇත. කන්කසන්තුරේ සිමෙන්ති කාර්මාන්තශාලාව අක්‍රිය වීම සහ පුත්තලම හා ගාල්ල ඇතුළු අනෙකුත් කර්මාන්තශාලා ජනතාකරණය කිරීමත් සමඟ 1993 සිට ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව සිමෙන්ති නිෂ්පාදන කටයුතුවලින් බැහැරව ඇත.	කන්කසන්තුරේ නව සිමෙන්ති කර්මාන්තශාලාව ක් ආරම්භකිරීමේ මූලික පියවර ලෙස එම භූමිය පිරිසිදු කිරීම සඳහා ටෙන්ඩර් කැඳවා මේ වන විට භූමිය පිරිසිදු කිරීමේ කටයුතු ආරම්භ කර ඇත.

	නිධිය හා එහි ඛනිජ වැලි වෙන් කර ගැනීමේ ව්‍යාපෘතියක් සඳහා බදු දීමෙන් ලැබුණු රු.132,603,156 ක මුදල හා කොල්ලුපිටියේ පිහිටි ඉඩම රථගාලක් වෙනුවෙන් බදු දීමෙන් ලැබුණු රු.5,896,572 ක් වූ කුලී ආදායම පමණක් 2023 වර්ෂයේ සංස්ථාවේ ප්‍රධාන අදායම් මාර්ග වී තිබුණි.				
04	2015 වර්ෂයේදී තක්සේරු දෙපාර්තමේන්තුව විසින් රු. 218,040,000 කට තක්සේරු කර තිබූ කන්කසන්තුරෙහි පිහිටි සංස්ථාවට අයත් තෙල් ටැංකි 2 ක් සහ නළ පද්ධති, ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත රාජ්‍ය සමාගම විසින් ලිඛිත ගිවිසුමකට එළඹීමකින් තොරව සමාලෝචිත වර්ෂය දක්වා භාවිතා කරනු ලබයි.	2023	වත්කම් භාවිතය සම්බන්ධයෙන් ලිඛිත ගිවිසුමකට එළඹීමට කටයුතු කල යුතුය.	යුද්ධය පැවති සමයේ අවශ්‍යතාවය සලකා මෙම තෙල් ටැංකි අපගේ අනුදැනුමකින් තොරව ඛණිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම විසින් භාවිතා කර ඇත. එම මුදල ලබා ගැනීම සඳහා දිගින් දිගටම කටයුතු කල අතර අවසන් වරට 2024 ජූලි 08 දින මුදල් අමාත්‍යාංශයේ නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම් තුමාගේ ප්‍රධානත්වයෙන් සමාගමෙහි සභාපතිතුමන් ඇතුළු නිලධාරින් කණ්ඩායම පැවැත්වූ	මුදල් අයවී හෝ ගිවිසුම් ගත වී නොමැත.

				සාකච්ඡාවේදී ඛණිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගමෙහි සභාපති විසින් අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය මත මෙම මුදල් ගෙවීමට එකගතාවය පල කර ඇත.	
05	අංක අමප/21/0175/320/004 හා 2021 පෙබරවාරි 16 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව ප්‍රකාරව කන්කසන්තුරෙහි සිමෙන්ති කර්මාන්තශාලා පරිශ්‍රයේ ඇති ප්‍රයෝජනයට ගත නොහැකි යකඩ හා ලෝහ සුන්බුන් ඉවත් කර, කර්මාන්තශාලා පරිශ්‍රය පිරිසිදු කිරීමේ කාර්යය අමාත්‍යාංශයේ සෘජු අධීක්ෂණය යටතේ සිදු කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස දක්වා තිබුණද, සමාලෝචිත වර්ෂයේ දක්වා පුවත්පත් දැන්වීමක් පල කිරීම හැර ඒ සම්බන්ධයෙන් වෙනත් කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.	2023	අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව ප්‍රකාරව නියමිත පරිදි පිරිසිදු කිරීමට අවශ්‍ය ක්‍රියා මාර්ග කඩිනමින් ගත යුතුය.	කන්කසන්තුරේ සිමෙන්ති කර්මාන්තශාලා පරිශ්‍රයේ විසිරි ඇති ප්‍රයෝජනයට ගත නොහැකි ද්‍රව්‍ය ඉවත් කර කර්මාන්තශාලා පරිශ්‍රය පිරිසිදු කිරීම වෙනුවෙන් සුදුසු කොන්ත්‍රාත්කරුවකු සොයා ගැනීම සදහා ලංසු කැදවීම සිදුකර ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදු කරමින් පවතී.	ටෙන්ඩර් ක්‍රියාපටිපාටිය අවසන් කර අමාත්‍ය මණ්ඩල අනුමැතියද ලබාගෙන 2024 ජූලි 26 වන දින අදාළ පරිශ්‍රය කොන්ත්‍රාත්කරු වෙත භාර දී ඇතත් මාස 2 1/2 ක කාලයක් ගත වූ පසුවද විගණකාධිපති නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

06	වටිනාකම රු. මිලියන 735 ක් වූ සංස්ථාව සතු පර්චස් 89.07 ක් වූ කොල්ලුපිටිය ඉඩම 2008 වර්ෂයේදී ලංකා බැංකුවට උකස් කර ලබා ගෙන තිබූ ණය මුදලින් , 2023 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ණය ශේෂය රු.38,700,000 ක් විය. මෙම ණය මුදල වෙනුවෙන් 2023 වර්ෂයේ රු.10,477,085 ක පොලී මුදලක් ගෙවා ඇතත් , එකී ඉඩම බදු දීමෙන් වර්ෂය තුළ ලද කුලී ආදායම රු.5,896,572 ක් පමණි. ඉතාමත් ඉහළ වාණිජමය වටිනාකමකින් යුතු මෙම ඉඩම ඵලදායි ආයෝජනයක් සඳහා යොදා ගැනීමට සංස්ථාව අපොහොසත් වී තිබුණි.	2023	සංස්ථාව සතු දේපළ ඵලදායි ආයෝජනයක් සඳහා යොදාගත යුතුය.	මෙම ඉඩම සුදුසු ඵලදායි ආයෝජනයක් ලැබෙන තෙක් තාවකාලිකව වාහන රථගාල පවත්වාගෙන යනු ලබයි. මහල් 32 කින් සමන්විත ගොඩගැල්ලක් සෑදීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.	මෙම ඉඩමේ පවත්වාගෙන යනු ලබන තාවකාලික රථගාල තවමත් ක්‍රියාත්මක වේ.
07	2023 වර්ෂය සඳහා පිළියෙල කර තිබූ ක්‍රියාකාරි සැලැස්ම ප්‍රකාරව අඩු වියදම් අඩු බර ගඩොල් නිෂ්පාදනය, කන්කසන්තුරෙහි පිහිටි නිවාඩු බංගලාව ප්‍රතිසංස්කරණය කිරීම, දේශීය හෝ විදේශීය ආයෝජකයින් සමඟ එක්ව	2023	ක්‍රියාකාරි සැලැස්ම ප්‍රකාරව සැලසුම් කළ කාර්යයන් ඉටු කිරීමට කටයුතු කල යුතුය.	අඩු වියදම් අඩු බර ගඩොල් නිෂ්පාදනය සඳහා බාහිර සමාගමකින් ව්‍යාපෘති යෝජනාවක් ලැබී ඇති අතර එම ව්‍යාපෘති යෝජනාව සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබීමෙන් පසු රේඛීය අමාත්‍යාංශය වෙත	නාවික හමුදාවේ ශ්‍රම දායකත්වයෙන් නවීකරණ කටයුතු සිදු කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය මිලට ගැනීම සඳහා මිල කැඳවීම සිදු කර ඇත.

කන්කසන්තුරෙහි සිමෙන්ති කර්මාන්තශාලාව නැවත ස්ථාපිත කිරීම සහ ඩොලමයිට් පොහොර නිෂ්පාදනය කිරිමේ හැකියාව පිළිබඳ පර්යේෂණ සිදු කිරීම ලෙස ව්‍යාපෘති හතරක් සැලසුම් කර තිබුණද එම ව්‍යාපෘති ක්‍රියාත්මක කර නොතිබුණි.	යොමු කිරීමට කටයුතු කරනු ලැබේ. කන්කසන්තුරේ පිහිටි නිවාඩු බංගලාව ප්‍රතිසංස්කරණය කිරීම සඳහා මූලික සැලසුම් සකස් කර, ඇස්තමේන්තු පිළියෙළ කර රේඛීය අමාත්‍යාංශය දැනුවත් කිරීමට කටයුතු කර ඇත.

3.136 මහජන උපයෝගිතා කොමිෂන් සභාව

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	905,056,300	63,475,375	841,580,925	109,578,047	තත්ත්වාගණනය නොකළ
2022	11,191,586,326	62,438,213	1,129,148,113	293,050,725	තත්ත්වාගණනය කළ
2023	1,215,593,075	63,508,424	1,152,084,651	22,356,238	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ගය	වාර්තාවේ දිනට නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය
(අ)	දීර්ඝ කාලීනව හිඟව පවතින ශේෂයන් සම්බන්ධයෙන් මූල්‍ය උපකරණ පිළිබඳ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අංක 09 හි 5.5 ඡේදය ප්‍රකාරව අයකර ගැනීමේ හැකියාව පිළිබඳව විධිමත් ඇගයීමක් සිදුකර අවශ්‍ය ගැලපීම් සිදුකල යුතු වුවද 2023 දෙසැම්බර් 31 දිනට වර්ෂ දෙකකට වැඩි කාලයක් පවතින වාර්ෂික නියාමන ගාස්තු රු.මිලියන 82.17 ක් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. තවද, 2014 සිට 2019 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදයට අදාලව ලංකා විදුලිබල මණ්ඩලයෙන් ලැබිය	2021 -1.5 2022-1.5 (ආ) 2023-1.5.1 (ආ) හා 1.6	ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුකූල විය යුතු අතර දිගු කාලීනව අය නොවී පවතින ශේෂයන් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු අතර ලැබිය යුතු ශේෂයන්හි පවතින වෙනස්කම් සම්බන්ධයෙන් අදාල ආයතන සමග එකඟතාවයකට පැමිණ නිරවුල් කර ගත යුතුය.	ලංකා විදුලිබල මණ්ඩලයෙන් ලැබිය යුතු ශේෂය වන රු. මිලියන 81.8 න් 2024.04.05 වන දින වන විට රු මිලියන 62.7 ක් ලැබී ඇත. මෙම ගැටලුව නිවැරදි කිරීමේ පියවරක් ලෙස, මේ සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් ඉල්ලා ලංවිම වෙත 22-4-2024දින ලිපියක් යැවීමට කොමිෂන් සභාව පියවර ගෙන ඇත. එම පිළිතුර අනුව ඉදිරි කටයුතු කිරීමට බලාපොරොත්තු වන අතර තවදුරටත් සාකච්චා කර මේ වසර තුල අවශ්‍ය වුවහොත් පොත්වලින්	මෙම රු.මිලියන. 81.8 න් රු.මිලියන 67.2.ක් මේ වනවිට ලැබී ඇතිඅතර, ඉතිරි රු.මිලියන 14.6 පිළිබඳ සාකච්ඡා කරමින් පවතී.

	යුතු වාර්ෂික නියාමන ගාස්තුව රු.මිලියන 81.87 ක් වුවද, මණ්ඩලයෙන් සෘජුව ලැබුණු ශේෂ සනාථ කිරීම් අනුව එම ශේෂය රු.මිලියන 62.77 ක් වූයෙන් රු.මිලියන 19.11 ක වෙනසක් නිරීක්ෂණය විය			ලියාහැරීමට කටයුතු කිරීමට බලාපොරොත්තුවේ. තවද, අපගේ අවබෝධයට අනුව, ලංවිම විසින් නියාමන බද්ද අසම්පූර්ණ ලෙස පියවීම ප්‍රධාන සාධක දෙකක් මත සිදුවී ඇත.	
(ආ)	2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා පනතේ 16 සහ 17 වගන්තීන් ප්‍රකාරව ශ්‍රී ලංකාවේ යටිතල පහසුකම් කර්මාන්ත එනම් විදුලිය, ඛනිජ තෙල්, ඉන්ධන හා ජලය පිළිබඳ කර්මාන්ත නියාමනය කළයුතු වුවත් ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය අධීක්ෂණය කිරීම සඳහා අදාල පනත් සංශෝධනය නොකිරීම හේතුවෙන් වර්ෂ 21 කට වැඩි කාලයක් මුළුල්ලේ ඛණිජ තෙල් හා ජලය යන කර්මාන්ත කොමිෂන් සභාවේ නියාමනයට යටත් කිරීමට නොහැකි වී තිබුණි.	2021- 1.6 (ඉ) 2022- 1.6 (අ) 2023 (1.7) (අ)	ඛනිජතෙල් හා ජලය නියාමනය කිරීමට අදාළ නීතිමය රාමුව සකස් කර ගැනීමට කටයුතු කළ යුතු ය.	ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය අධීක්ෂණය කිරීම සඳහා අදාල පනත් සංශෝධනය නොවීම නිසා වර්ෂ 21 කට වැඩි කාලයක් මුළුල්ලේ ඛණිජ තෙල් හා ජලය යන කර්මාන්ත කොමිෂන් සභාවේ නියාමනයට යටත් කිරීමට නොහැකි වී තිබූ නමුත් ඒ සඳහා අවශ්‍ය උපදේශකවරුන්ගේ සේවය ලබා ගනිමින් අවශ්‍ය නීතිරීති සකස් කිරීම ඇතුළු විශාල කාර්යභාරයක් අප ආයතනය ඉටුකර ඇත.	ජල සේවා සහ ඛණිජ තෙල් යන විෂයයන් නියාමනයට අදාල පනත් කෙටුම්පත්සකස් කොට අවසන් කිරීමට කොමිෂන් සභාවේ පූර්ණ සහාය ලබා දී ඇත.පනත් කෙටුම්පත් සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය හා පාර්ලිමේන්තු අනුමැතිය ලබාගැනීම අදාල රේඛීය අමාත්‍යාංශවල වගකීමකි.

(ඇ)	2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ පළමු කොටසෙහි පරිච්ඡේද (ii) හි 7 වන ඡේදය ප්‍රකාරව බද්දට යටත් වන ආයෝජන ආදායම් ඉපයූවද,එම පනතේ 126 (i) ඡේදය ප්‍රකාරව බදු වාර්තා ඉදිරිපත් කොට එම පනතේ 145 වන ඡේදය ප්‍රකාරව බදු ගෙවීමට කටයුතු කර නොතිබුණි.	2023- 1.7 (ආ)	බද්දට යටත් ආදායම් මත බදු ගෙවීමට කටයුතු කල යුතු වේ.	ආයෝජන ආදායම් සඳහා ආදායම් බදු ගෙවීමට ඇති යෝග්‍යතාවය පිළිබද සොයා බලා කටයුතු කිරීමට පියවර ගන්නා බව දන්වා සිටිමි.	මේ සඳහා දේශීය ආදායම් දෙපාර්තුමේන්තුව වෙතින් අවශ්‍ය උපදෙස් ලබාගෙන එම කටයුතු ආරම්භ කර ඇත.
(ඇ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය				
	(i) මුදල් රෙගුලාසි ,(1)103 104(3 (සහ (4)104 ට පටහැනිව කොමිෂන් සභාවේ සභාපති වෙත දින 23 ජුනි 2023 න අනුයුක්ත කර .රුමිලියනක් 5.5 වටිනාමෝටර් රථය 2023 දින 11 දෙසැම්බර් හදිසි අනතුරකට ලක්වී සිදුවූ රු.මිලියන18.2 ක අලාභය රක්ෂණ ආයතනය විසින් ප්‍රතිපූර්ණය කිරීම ප්‍රතික්ෂේප කර තිබූ හෙයින් එම	2023 – 1.7 (ඇ) (i)	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට අදාල අලාභය වගකිව යුතු පාර්ශවයන්ගෙන් අය කර ගැනීමට කටයුතු කල යුතුය.	මූලික පරීක්ෂණය පැවැත්වීමෙන් අනතුරුව අලාභය අයකර ගැනීම සහ විනය නීති උල්ලංඝනය වීමක් සිදුවී ඇතිද කරුණු පිළිබඳව සොයා බැලීමට විමර්ෂණ නිළධාරීන් පත් කිරීමට කටයුතු කර ඇති අතර එහි වාර්තාව ලැබුණ පසු ඒ අනුව වාහනයේ අලාභය පියවා ගැනීමට කටයුතු කරනු ඇත.කෙසේ වෙතත්, වාහනය කොළඹට රුගෙන ඒමට වැය වූ රු. 32,000.00 මුදල	විනය පරීක්ෂණය අවසන් අදියර තුල පවතී. මේවන විට විත්තිකරුට කරුණු ඉදිරිපත් කිරීම සඳහා ලබාදී ඇති දින 14ක කාල සීමාව තුල පවතින අතර එය අවසන්වී දින 7ක් ඇතුලත අවසන් වාර්තාව ලබා දෙනු ඇත.රියදුරු විසින් රු.10000ක මුදලක් මේවන විට ගෙවා ඇත.

	වටිනාකම හා වාහනය කොළඹට ගෙන ඒමේ වියදම වූ රු.32,000. ක් වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට 05 මාර්තු 2024 වන විටත් කොමිෂන් සභාව අපොහොසත් වී තිබුණි.			අයකර ගැනීමට රියදුරු වෙත මේ වන විට ලිපියක් යවා ඇත.	
	(ii) මුදල් රෙගුලාසි371 ට පටහැනිව මාණ්ඩලික තත්ත්වයේ නොවන නිලධාරීන් 11දෙනෙකු වෙත 2023 වර්ෂයේ දී අවස්ථා 142 ක දී එකතු වටිනාකම රු.මිලියන 5.16.. ක තත්කාර්ය අතුරු අග්‍රිම ලබා දී තිබූ අතර නියමිත කාලය තුල අග්‍රිම පියවා නොතිබියදී නැවත නැවත එකම නිලධාරීන් වෙත එකතුව රු.මිලියන 31.2ක තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි .	2021 -3.1 (ii) 2022-1.6 (ආ) (ii) 2023- 1.7 (ඇ) (ii)	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය.	2023 අගෝස්තු මාසයෙන් පසුව කිසිදු අත්තිකාරම් පියවීමකින් තොරව නැවත අත්තිකාරම් ලබාදීමක් සිදු නොවන බැවින් මෙවැනි දෑ ඉදිරියේදි සිදු නොවන ලෙස පියවර ගෙන ඇත.	2023 අගෝස්තු මාසයෙන් පසු කිසිදු තත්කාර්ය අතුරු අග්‍රිම ලබාදීමක් සිදු නොකෙරේ.
(ඉ)	2006 සැප්තැම්බර් 22 දිනැති අංක 30 දරන කළමණාකරන සේවා චක්‍රලේඛය හා 2023	2022 - 1.6 (ඊ)	කළමණාකරන සේවා චක්‍රලේඛ හා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක	මෙම විගණනකාධිපතිතු මාගේ සහ කොමිෂන් සභාවේ	නීතිපති උපදෙස් අපේක්ෂාවෙන් පසුවේ.

	සැප්තැම්බර් 06 දින පවත්වන ලද පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නියෝග අංක 09 ප්‍රකාරව කොමිෂන් සභාවේ බඳවා ගැනීම් හා උසස්කිරීම් පටිපාටිය සඳහා කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි.	2023-1.7 (ඈ)	සභාවේ නියෝග පරිදි කටයුතු කළ යුතු ය.	අදහස් වල පරස්පරතාවය විසඳා ගැනීමට නීතිපති තුමාගේ උපදෙස් 2023-11-10 දින පතා ඇති අතර එය නුදුරේම ලැබීමට නියමිතය.	
(ඊ)	2018 ජූලි 18 දිනැති අංක 03/2018 දරන කළමණාකරණ සේවා චක්‍රලේඛයේ I හා II ඡේදයන්ට පටහැනිව **(i)** ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශ හා මහා භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතියකින් තොරව ආයතනයේ කාර්ය මණ්ඩලය වෙත 2023 වර්ෂයේදී එකතුව රු 48.4 මිලියන. ක දීමනා ගෙවා තිබුණි.	2021-1.6 (ආ) (i) 2022-1.6 (ඇ) (i) 2023-1.7(ඉ) (i)	කාර්ය මණ්ඩල දීමනා ගෙවීමේදී කළමණාකරණ සේවා චක්‍රලේඛ ප්‍රතිපාදන ප්‍රකාරව කටයුතු කල යුතුය.	මෙම විගණනකාධිපතිතුමාගේ සහ කොමිෂන් සභාවේ අදහස් වල පරස්පරතාවය විසඳා ගැනීමට නීතිපති තුමාගේ උපදෙස් 2023-11-10 දින පතා ඇති අතර එය නුදුරේම ලැබීමට නියමිතය.	නීතිපති උපදෙස් අපේක්ෂාවෙන් පසුවේ.
	(ii) කොමිෂන් සභාවේ ස්ථිර සේවකයන්	2021-1.6	නිවාස හා දේපල ණය යෝජනා ක්‍රමය සඳහා භාණ්ඩාගාර	මෙම විගණනකාධිපතිතුමාගේ සහ	නීතිපති උපදෙස් අපේක්ෂාවෙන්

	සඳහා භාණ්ඩාගාර අනුමැතියකින් තොරව ක්‍රියාත්මකර තිබුණු නිවාස හා දේපල ණය යෝජනා ක්‍රමය මගින් නිලධාරීන් 19 දෙනෙකු විසින් ලබාගෙන තිබුණු එකතුව රු 98.09 මිලියන.ක නිවාස හා දේපළ ණය වෙනුවෙන් .රුමිලියන 44.6 ක් පොලී වශයෙන් 2023 වර්ෂයේදී ප්‍රතිපූර්ණය කර තිබුණි.	(ආ) (iv) 2022-1.6 (ඇ) (ii) 2023-1.7(ඉ) (ii)	අනුමැතිය ලබා ගත යුතු අතර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයන්ට අනුකූල වන පරිදි කොමිෂන් සභාව විසින් පොලිය ප්‍රතිපූර්ණය කල යුතුය.	කොමිෂන් සභාවේ අදහස් වල පරස්පරතාවය විසඳා ගැනීමට නීතිපති තුමාගේ උපදෙස් 2023-11-10 දින පතා ඇති අතර එය නුදුරේම ලැබීමට නියමිතය.	පසුවේ.
(iii)	භාණ්ඩාගාර අනුමැතියකින් තොරව ක්‍රියාත්මක කර තිබුණු කොමිෂන් සභාවේ ස්ථිර සේවකයන් සඳහා වූ වාහන ණය යෝජනා ක්‍රමයෙන් එක් නිලධාරියකු ලබාගෙන තිබූ එකතුව රු.මිලියන ක 3 ණය මුදලේ පොලිය ලෙස රු 240,762.ක් 2023 වර්ෂයේදී ප්‍රතිපූර්ණය කර තිබුණි.	2021-1.6 (ආ) (iii) 2023-1.7(ඉ) (iii)	වාහන ණය යෝජනා ක්‍රමය සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගත යුතු අතර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයන්ට අනුකූල වන පරිදි කොමිෂන් සභාව විසින් පොලිය ප්‍රතිපූර්ණය කල යුතුය.	මෙම දීමනා ගෙවීම සඳහා මහා භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුද යන්න ඇතුලත්ව මෙම කරුණු සම්බන්ධව නෛතික උපදෙස්, නීතිපති දෙපාර්තමේන්තුව වෙතින් ඉල්ලා ඇත.	නීතිපති උපදෙස් අපේක්ෂාවෙන් පසුවේ.

(උ)	(iv)	25 මැයි 2015 දිනැති අංක දරණ 1/2015 පාර ව්‍යාරාජ්‍ය 3.3 ලේඛයේවක්‍ර ඡේදය සහ අංක)01/2015i (දරණ 2016 27 ඔක්තෝබර් දිනැතිරාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 2 වනඡේදයට පටහැනිව කොමිෂන් සභාවේ නිලධාරීන් 24 දෙනෙකුට චක්‍රලේඛයේ සඳහන් අනුමත මාසිකව නිල වාහන දීමනාව ඉක්මවා රු10., 000 බැගින් වැඩිපුර .රුමිලියන .24 1 ක් ගෙවා තිබුණි. ඊට අමතරව වාහන දීමනා ලබා ගන්නා නිලධාරීන් 11 දෙනෙකුට රියදුරු දීමනාව ලෙස මාසිකව රු20., 000 බැගින් එකතුව රු.මිලියන 07.2 ක්ද 2023 වර්ෂයේදී ගෙවා තිබුණි.	2022-1.6 (ඉ) 2023-1.7(ඊ)	පනතේ ප්‍රතිපාදන ක්‍රියාත්මක කිරීමේදී රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛවල විධිවිධාන වලට අනුකූල විය යුතුය.	මෙම ගෙවීම් සඳහා මහා භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුද යන්න ඇතුලත්ව මෙම කරුණු සම්බන්ධව නෛතික උපදෙස්, නීතිපති දෙපාර්තමේන්තුව වෙතින් ඉල්ලා ඇත.	නීතිපති උපදෙස් අපේක්ෂාවෙන් පසුවේ.

(උ)	2022 ජනවාරි 14 දිනැති අංක PED - 1/2015(ii) දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට පටහැනිව කොමිෂන් සභාවේ අධ්‍යක්ෂක ජනරාල්, නියෝජ්‍ය අධ්‍යක්ෂක ජනරාල් හා අධ්‍යක්ෂක තනතුරු දරන නිලධාරීන් 12 දෙනෙකුට චක්‍රලේඛය ප්‍රකාරව නිල වාහන හිමි නිලධාරීන්ට ගෙවිය යුතු අනුමත මාසික ඉන්ධන දීමනාව ඉක්මවා 2023 වර්ෂය තුලදී ඉන්ධන ලීටර 3972 ක් සඳහා රු.මිලියන 1.4 ක් ආසන්න වශයෙන් ගෙවා තිබුණි.	2021-1.6 (ඇ) 2022-1.6 (ඇ) 2023-1.7(උ)	පනතේ ප්‍රතිපාදන ක්‍රියාත්මක කිරීමේදී රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛවල විධිවිධාන වලට අනුකූල විය යුතුය.	මෙම ගෙවීම් සඳහා මහා භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුද යන්න ඇතුලත්ව මෙම කරුණු සම්බන්ධව නෛතික උපදෙස්, නීතිපති දෙපාර්තමේන්තුව වෙතින් ඉල්ලා ඇත.	නීතිපති උපදෙස් අපේක්ෂාවෙන් පසුවේ.
(ඌ)	කොමිෂන් සභාව විසින් ගිවිසුමකට එළඹීමකින් තොරව පරිගණක පද්ධති සංවර්ධනය කිරීම් හා වැඩිදියුණු කිරීම් සඳහා වූ කොන්ත්‍රාත් 09 ක් ආයතන 04 කට 2021 හා 2022 වර්ෂයන්හිදී ප්‍රදානය කොට තිබූ අතර පද්ධතීන් සියල්ලම 2022 වර්ෂය අවසානය වන විට නිම කල යුතුව පැවතුණි. 2022 වර්ෂය අවසානය වන විට රු.මිලියන 3.5 ක් වැයකර තිබූ	2022-3.1 (i) 2023-3.1 (i)	කොන්ත්‍රාත් ප්‍රමාදයන් වැලැක්වීමට සමීප අධීක්ෂණයක් සිදු කල යුතුය.	ව්‍යාපෘති නවය, සැලසුම් කල දිනයට අවසන් කිරීම සම්බන්ධව, පාලනය කල හැකි සහ පාලනය කල නොහැකි හේතු නිසාවෙන් ඇතිවූ ප්‍රමාදයන් පැවතුනි. ව්‍යාපෘති අවසන් කිරීමේ දිනයන් මිලදී ගැනීමේ ඇණවුමේ දිනය අනුව ගණනය කර තිබුණද ඇතැම් ව්‍යාපෘති මිලදී ගැනීමේ ඇණවුමේ දිනයට ආරම්භ කිරීමේ ප්‍රමාදයන්	මෙම ව්‍යාපෘති 5 අතරින් එක් ව්‍යාපෘතියක් මේවන විට වැඩ අවසන් කර ඇත.එසේම තවත් ව්‍යාපෘති 3 ක වැඩ 80%ක් පමණ අවසන්වී ඇත.එක් ව්‍යාපෘතියක් පමණක් 40% ක පමණ ප්‍රගතියක් පවතී.

	පද්ධතීන් 5 ක් සම්පූර්ණකර භාවිතා කිරීමට 2024 මාර්තු වන විටත් අපොහොසත්වී තිබුණි.			පැවතුනි. මේ ව්‍යාපෘති කිසිවක් අතහැර දමා නැති අතර ඒවා සියල්ලම ක්‍රියාත්මකව පවතී. ඇතැම් ව්‍යාපෘති නිම කිරීමේ ප්‍රමාදයන් පමණක් පවතී.	
(එ)	විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් කල්ඉකුත් වී තිබුණු ඒස් පවර් ඇඹිලිපිටිය (පුද්ගලික) සමාගම, ඒස් පවර් ජෙනරේෂන් මාතර (පුද්ගලික) සමාගම සහ ඒෂියා පවර් (පුද්ගලික) සමාගම්වලින් 2009 අංක 30 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 13 වන වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ බලපත්‍ර නොමැතිව 2016 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා මූලික විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් දීර්ඝ කරමින් කෙටිකාලීන පදනමින් ලංකා විදුලිබල මණ්ඩලය විසින් විදුලිය මිලදී ගෙන තිබුණි. කෙසේ වෙතත්, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් උක්ත පනතේ	2023-3.1 (i i)	විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් කල්ඉකුත් වී තිබුණු ආයතනයන්ගෙන් විදුලිය මිලදී ගැනීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විදුලිබල පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වීම.	මේ පිලිබඳව විදුලිබල මණ්ඩලයට එරෙහිව තොරතුරු නොදීම පිළිබඳ නඩු පවරා ඇත. තවද, අනුමත නොකල පිරිවැය පාරිභෝගිකයා මත පැටවීම නවතා දැමීමට අදාල පියවර ගෙන ඇත. තවද , 2023සිදු වූ මෙවැනිම කරුණු ගැන ඉදිරියේදි නීතිපති උපදෙස් මත ක්‍රියාකිරීමට පියවර ගනු ඇත.	මේ සම්බන්ධව නීතිපති උපදෙස් පතා ඇත.

7 වන වගන්තිය අනුව එම සමාගම්වලට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

3.137 ගාලු උරුමය පදනම

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	1,353,926,218	2,962,640	1,350,963,578	(584,118)	තත්ත්වාගණනය නොකළ
2022	1,384,492,978	15,000,462	1,369,492,516	1,411,764	තත්ත්වාගණනය නොකළ
2023	1,396,562,446	15,766,443	1,380,796,003	(4,290,716)	තත්ත්වාගණනය නොකළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපතිගේ නිර්දේශ	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1.	ගාලු උරුමය පදනමට වැඩි බලතල ලබා ගැනීමට හා පදනම සඳහා ආදායම් උත්පාදනය නංවාලීමේ යන අරමුණු සඳහා 1994 අංක 07 දරන ගාලු උරුමය පදනම් පනත සංශෝධනය කිරීමේ අවශ්‍යතාවය හඳුනාගෙන ඒ සඳහා 2015 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල සංදේශයක් පිළියෙල කර තිබුණද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් එම පනතේ සංශෝධනයක් සිදු කර නොතිබුණි.	2021	පනත සංශෝධනය කරවා ගැනීමට කටයුතු කළ යුතුය	2018 වර්ෂයේදී එවකට පැවති රජය විසින් ගාලු උරුමය පදනම සඳහා නව පනතක් සකස් කිරීමට අවශ්‍ය මූලික කටයුතු ආරම්භ කර තිබුණි. එහිදී දැනට පවතින පනත සංශෝධනය කිරීමක් අපේක්ෂා නොකළ අතර දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශයේ මූලිකත්වයෙන් “Southern Forts Authority Act ” ලෙස නව පනත සකස් කිරීමට කටයුතු යොදා තිබුණි. නව කළමනාකරණ මණ්ඩලය එම පනතම සංශෝධනය කිරීමටත් ඒ සඳහා නව යෝජනා සකස් කිරීමටත් 2022 පෙබරවාරි 21 වන දින	දැනට මේ පිළිබඳව කටයුතු කරමින් පවතී.

				පැවති කළමනාකරණ මණ්ඩල කමිටු රැස්වීමේදී තීරණය වූ අතර එම යෝජනා අමාත්‍යාංශයට යොමු කර පනත සංශෝධනයට කටයුතු කරනු ලැබේ.	
2.	පුරා විද්‍යා දෙපාර්තමේන්තමේන් තුවේ අධීක්ෂණය හා සම්බන්ධීකරණය යටතේ ලෝක බැංකු ආධාර මත සංරක්ෂණය කර නිමකරන ලද උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය, ගාලු උරුමය සංචාරක ප්‍රවර්ධන කටයුතු සඳහා භාවිතා කිරීමට 2022 අගෝස්තු මස 20 දින ගිවිසුම්ගතව භාරදී තිබුණි. සංචාරක ප්‍රවර්ධනය සඳහා ගාලු උරුමය පදනම වෙත භාරදී තිබුණු ප්‍රදර්ශන භාණ්ඩ හා ආකෘති සහිත ප්‍රදර්ශන කුටි 06 ක් විගණිත දින වූ 2024 පෙබරවාරි 09 දින වන විටත් දීර්ඝ කාලයක සිට වසා දමා තිබුණි. එම ප්‍රදර්ශන කුටි නඩත්තුවකින් තොරව දීර්ඝ කාලීනව වසා දමා තිබීම හේතුවෙන් විනාශ වෙමින් පැවතුණි.	2023	ප්‍රදර්ශන කුටි සංචාරක ආකර්ෂණය ලබා ගත හැකි පරිදි ප්‍රදර්ශනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.	ප්‍රදර්ශන කුටි සංචාරක ප්‍රවර්ධන කටයුතු සඳහා යෙදවීම හා මහජන ප්‍රදර්ශනය සඳහා ආරම්භ කිරීමට නම් එහි ප්‍රදර්ශ ගැලරි කළමනාකරුවන් ලෙස කාර්ය මණ්ඩලයන් යෙදවිය යුතු ය. දැනට පවතින කාර්ය මණ්ඩලය ඒ සඳහා ප්‍රමාණවත් නැත.	විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

3.138 අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	අතිරික්තය (ඌනතාවය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	572,740,261	80,275,293	492,464,968	15,018,049	තත්ත්වාගණනය කළ
2022	638,596,727	84,580,450	554,016,277	(48,359,337)	තත්ත්වාගණනය කළ
2023	630,781,264	53,807,088	576,974,176	(2,248,627)	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණ	**වාර්තාවේ වර්ෂය**	**විගණකාධිපති නිර්දේශය**	**විගණිත ආයතනය විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග**	**වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්වය**
1	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 හි 49 ඡේදය ප්‍රකාරව, එක් පන්තියකට අයත් වත්කම් ප්‍රත්‍යාගණනය කරන විට අදාළ වත්කම් පන්තිය එකවර ප්‍රත්‍යාගණනය කළ යුතු වුවද ඊට පටහැනිව කොටස් වශයෙන් ප්‍රත්‍යාගණනය සිදු කර තිබුණි. ඒ අනුව 2023 දෙසැම්බර් 31 දිනට ගොඩනැගිලි ගිණුම් ශේෂය රු.217,592,705 ක් වුවද ඉන් රු 44,929,705 ක් වූ ගොඩනැගිලි පිරිවැයටත් රු172,663,000 ක් වූ ගොඩනැගිලි ප්‍රත්‍යාගණ අගයටත් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.	2023	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය.	රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීමක් කර ඇති අතර නිලධාරීන්ගේ පැමිණීම අනුව ඉදිරියේදී ප්‍රත්‍යාගණන කටයුතු සිදු කිරීමට පියවර ගනිමි.	ප්‍රත්‍යාගණන කටයුතු සිදු කිරීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි.

2	1992 වර්ෂයේදී 99 අවුරුදු බදු පදනම මත ලබා ගෙන තිබූ ප්‍රධාන කාර්යාලය ඉඩම 2018 වර්ෂයේදී රු.365,000,000 ක වටිනාකමකට ප්‍රත්‍යාගණය කර ප්‍රවර්තන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. තවද බදු දේපල වටිනාකම වෙන්ව දැක්විය යුතු වුවත් ඉඩම් වල වටිනාකම යටතේ ගිණුම්ගත කර තිබුණි. මෙම ඉඩමේ බදු වටිනාකම රු 4,350,000 ක් වූ අතර වාර්ෂික ක්‍රමක් ක්ෂය වටිනාකම් එකතුව රු 1,318,182 ක් වුවත් එම වටිනාකම ගිණුමට ගෙන නොතිබුණි.	2023	මූල්‍ය ප්‍රකාශන වලට නිවැරදි වටිනාකම් ඇතුළත් කිරීමට කටයුතු කල යුතුය.	මෙම ඉඩම 1992 වර්ෂයේ කල්බදු (මූල්‍ය) පදනම මත ලබාගත් එකක් වන අතර "ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 12-කල්බදු" හි 84 පරිච්ඡේදයට අනුව 2018 ජනවාරි 01 දින සිට ප්‍රථම ආරම්භ වන ගිවිසුම් සඳහා ක්‍රමක්ෂය ප්‍රතිපත්තිය අනිවාර්ය නොවේ.	නිවැරදි වටිනාකම් මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් කර නොතිබුණි.
3	සමාලෝචිත වර්ෂයේදී පාරිතෝෂික වෙන්කිරීම් වටිනාකම රු. 42,856,163 ක ශේෂය තුල සේවයේ නොමැති නිලධාරීන් හතරදෙනෙකු සඳහා ද රු. 1,973,454 ක පාරිතෝෂික වෙන්කිරීම් සිදු කර තිබුණි.මේ හේතුවෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම නොවන වගකීම් වටිනාකම රු. 1,973,454 කින් වැඩියෙන් දක්වා තිබුණි.	2023	මූල්‍ය ප්‍රකාශන වලට නිවැරදි අගයන් ඇතුළත් කල යුතුය.	සේවයේ නොමැති නිලධාරින් 4 දෙනෙකු සඳහා රු.1,973,454.00ක "පාරිතෝෂික ප්‍රතිපාදන සේවක ලැයිස්තුව" තුළ ඇතුළත් වටිනාකම දෝෂ2024 වර්ෂය තුළ නිවැරදි කරමි.	2024 මූල්‍ය ප්‍රකාශන සමග නිවැරදි කිරීමට කටයුතු කරමින් පවතී.

4	ප්‍රාග්ධන සංචිත රු .65,503711සඳහා සාක්ෂිලෙස ලෙජර් ගිණුම් හා ජනල් සටහන් විගණනයවෙත නොලැබුණි.	2023	ශේෂය හඳුනා ගැනීමට කටයුතු කල යුතුය	ප්‍රාග්ධන සංචිත ශේෂය 2016.12.31 දින සිටම නොවෙනස්ව පැවතී ඇත. ඊට පෙර මෙම ශේෂය ජනිත වී ඇති ආකාරය පැහැදිලිව පොත් වලින් සොයාගැනීම සඳහා අපහසුතාවයක් පවතී.	ශේෂය හඳුනා ගැනිමට කටයුතු කර නොතිබුණි.
5	වසර 20 කට වඩා වැඩි කාලයක සිට අය නොවී පවතින අත්තිකාරම් ගිණුමේ පැවති රු.1,434,534 ක හර ශේෂය අයකර ගැනීමට අවශ්‍ය පියවර ගැනීම් පිළිබඳව ලිඛිත තොරතුරු නොපැවතුණු අතර එකී විස්තර විගණනය වෙත ඉදිරිපත් නොවුණි	2023	අත්තිකාරම් ශේෂයේ නිරවද්‍යතාවය සනාථ කර ගැනීමට කටයුතු කළ යුතුයි.	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020ට අනුව, ඊට අදාළ හානි සම්බන්ධයෙන් බලයලත් නිලධාරියාට යොමු කොට එම ශේෂයන් කපා හැරීම සඳහා කටයුතු කරන ලෙස උපදෙස් ලැබී ඇත. ඒ අනුව, 2024/06/06 දින මහජන ආරක්‍ෂක අමාත්‍යාංශයේ ලේකම් ගේ අනුමැතිය සඳහා ලිපියක් යොමු කොට ඇත.	කපා හැරීමට කටයුතු කරමින් පවතින බව දන්වා ඇත.
6	2008 අංක 1 දරන මාදක ඖෂධ සහ මනෝවර්තක නීති විරෝධි ලෙස ජාවාරම් කිරිමට එරෙහි සම්මුති පනතේ විධිවිධාන වලට යටත්ව අධිකාරියේ පාලක මණ්ඩලය 2023 වර්ෂයේ එක් අවස්ථාවක් පමණක් රැස් වී තිබූ අතර නියෝග 10 ඡේද ප්‍රකාරව එහි කාර්යයන් පිළිබඳ පුරෝගාමී අධිකාරියේ පාලක මණ්ඩලයේ සාමාජිකයන් විසින් සමාලෝචනය සිදු කිරීම	2023	පනත ප්‍රකාරව කටයුතු කලයුතුය	මේ කාලවකවානුවේදී ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සඳහා ප්‍රමාණවත් කරුණු උද්ගත වී නොතිබුණ අතර, කිසිදු මාණ්ඩලික පත්‍රිකාවක් ඉදිරිපත් නොවූ බැවින්, ආයතනයේ එදිනෙදා කටයුතු සුමටව සිදු වූ බැවින් ද රැස්වීම් කමිටුවේ අවශ්‍යතාවයන් මතු නොවූ අතර, එලෙස අවශ්‍ය වූ සෑම අවස්ථාවකදිම රැස්වීම්	පනත ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

	සඳහා පුරෝගාමී අධිකාරියේ මණ්ඩලය අවම රැස්වීම් ප්‍රමාණය හෝ පවත්වා නොතිබුණි.			කැඳවා අවශ්‍ය තීරණ ගැනීමට කටයුතු කර ඇත.	
7	මෙම මධ්‍යස්ථානයට හිමිනමකගේ පෞද්ගලික ධන පරිත්‍යාගයෙන් ඉදි කර තිබූ රු 12,800,000 ක් පමණ වටිනා ගොඩනැගිල්ලක් හා ජාත්‍යන්තර ආයතනයක ආධාර මත ඉදි කර තිබූ රු 7,844,963 ක් වටිනා ගොඩනැගිල්ලක් ප්‍රතිකාර හා පුනරුත්ථාපන කටයුතු සඳහා භාවිතයට ගත හැකි පරිදි සියලු ලී බඩු හා උපකරණ වලින් සමන්විතව ඇතත් එම ගොඩනැගිල්ල 2023 වර්ෂය තුල දී ඖෂධ වලට ඇබ්බැහි වූ තැනැත්තන් පුනරුත්ථාපන කටයුතු සඳහා භාවිතා නොකර නිෂ්කාර්යව පැවතුණි. මෙම ගොඩනැගිලි ඉදිකර මණ්ඩලය වෙත 2021 වර්ෂයේ බාර දී ඇති අතර අවශ්‍ය කරන යටිතල පහසුකම් හා කාර්ය මණ්ඩලය අනුයුක්ත කර ගැනීම සඳහා කටයුතු කර නොතිබීම ඊට හේතුවිය.	2023	පරිත්‍යාග වශයෙන් ලද ගොඩනැගිලි හා ලී බඩු උපකරණ ඵලදායී කාර්යයන්ට යොදා ගැනීමට කටයුතු කල යුතුය.	මුදල් අමාත්‍යාංශයේ හා ජාතික අයවැය චක්‍රලේඛ අනුව බඳවාගැනීම් තාවකාලිකව නතර කරන ලද බැවින් පුරප්පාඩු පිරවීමට නොහැකි විය. අග්‍රාමාත්‍ය කාර්ය මණ්ඩල සමාලෝචන කමිටුවේ අනුමැතිය හා 2023.09.22 දින පැවති මණ්ඩලීය රැස්වීමේදී ලද අනුමැතිය පරිදි පුරප්පාඩු පිරවීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.	පුනරුත්ථාපන කටයුතු සඳහා යොදා ගැනීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කර නොතිබුණි.

8	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 49 ඡේදය ප්‍රකාරව, එක් පන්තියකට අයත් වත්කම් ප්‍රත්‍යාගණනය කරන විට අදාළ වත්කම් පන්තිය එකවර ප්‍රත්‍යාගණනය කළ යුතු වුවද, ඊට පටහැනිව කොටස් වශයෙන් ප්‍රත්‍යාගණනය සිදු කර තිබුණි. ඒ අනුව 2022 දෙසැම්බර් 31 දින වන විට මුළු පිරිවැය රු.130,951,185 ක් වූ ගොඩනැගිලි එහි පිරිවැයටත් මුළු පිරිවැය රු.21,920,729 ක් වූ ගොඩනැගිලි එහි ප්‍රත්‍යාගණනය අගයටත් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.	2022	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය.	තක්සේරු දෙපාර්තමේන්තුවේ නිලධාරින් පැමිණීම මත ඉදිරියේදි ප්‍රත්‍යාගණන කටයුතු සිදු කරන බව කාරුණිකව දන්වා සිටිමි.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
9	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 65 ඡේදය ප්‍රකාරව, වත්කමක අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය අඩුතරමින් සෑම වාර්ෂික වාර්තාකරන කාලපරිච්ඡේදයක් අවසන් වන දිනයේ දී සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.43,265,362 ක් වූ මෝටර් වාහන (ජංගම නොවන වත්කම්) සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබුණු නමුත් තවදුරටත් භාවිතයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇති වූ	2022	එම	විගණන නිරීක්ෂණයෙන් පෙන්වා දුන් පරිදි ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාරව අදාල ප්‍රතිශෝධනයන් කඩිනමින් සිදු කර මූල්‍ය ප්‍රකාශය තුළ ගැලපීමට කටයුතු කරමි.	එකවර ප්‍රත්‍යාගණනය කර 2024 වර්ෂය තුළ දී ගිණුම්ගත කිරිමට පියවර ගෙන ඇත.

	ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.				
10	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 7 හි 42 ඡේදයට පටහැනිව පරිත්‍යාග මත ඉදිකෙරෙමින් පවතින නව දිගන්ත ප්‍රතිකාර පුනරුත්ථාපන මධ්‍යස්ථානයේ ඇස්තමේන්තුගත පිරිවැය රු.5,816,589 ක් වූ අතර ඉදිකිරීම් කටයුතු සඳහා වැයකර ඇති මුදල රු. 3,598,600 ක් වුවද ගොඩනැඟිල්ල ඉදිකිරීම් පිරිවැය දැක්වීම වෙනුවට ප්‍රත්‍යාගණනය කරන ලද වටිනාකම රු.4,500,000 ක් කෙරීගෙන යන වැඩ යටතේ දක්වා තිබුණි.	2022	එම	කෙරීගෙන යන වැඩවල වර්තමාන වෙළඳපොළ වටිනාකම ගණනය කළ යුතු බැවින් තක්සේරු දෙපාර්තමේන්තුවෙන් කරන ලද ඉල්ලීමකට අනුව රු. 4,500,000 තක්සේරු වටිනාකමක් ලැබුණි. ඒ අනුව එම අගය අවසන් ගිණුම් වල සටහන් කිරිමට කටයුතු කරන ලදි.	ප්‍රමිත ප්‍රකාරව මෙතෙක් කටයුතු කර නොතිබුණි.
11	UNODC ගොඩනැල්ල හා නව දිගන්ත ගොඩනැගිල්ල ඉදිකිරිම සඳහා ද්‍රව්‍ය හා මූල්‍ය පරිත්‍යාග ලැබීම් ලේඛණගත කර තිබුණද ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 11 හි , 97 ඡේදය ට අනුව අත්පත් කරගත් දිනට වූ සාධාරණ අගය මත අයභාරය හඳුනා ගැනිම හා 106 ඡේද ප්‍රකාර මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරිමට මණ්ඩලය කටයුතු කර නොතිබුණි	2022	එම	ශේෂ පත්‍ර දින වන විටත් මෙම ගොඩනැඟිල්ල විධිමත් පරිදි නිමකර භාර දී නොතිබු බැවින් අදාළ අගය කෙරීගෙන යන වැඩ යටතේ දක්වා තිබුණි. මේ වන විට විධිමත් පරිදි භාර දී ඇති බැවින් අදාළ ගිණුම් යාවත්කලීන කිරිමට කටයුතු කරමි.	ප්‍රමිත ප්‍රකාරව මෙතෙක් කටයුතු කර නොතිබුණි.

12	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 19 හි 59 ඡේදය ප්‍රකාරව අනාගත සේවක ප්‍රතිලාභ පියවීම සඳහා එම වගකීම්, වට්ටම් පදනමක් මත මැනිය යුතු වුවත් මණ්ඩලය විසින් සේවක පාරිතෝශිත වෙන්කිරීම ගණනය කිරීමේදී මුදලේ වර්තමාන අගය/වට්ටම් ක්‍රමය සැලකිල්ලට ගෙන නොතිබුණි.	2022	එම	ගිණුම්කරන ප්‍රමිත ප්‍රකාරව ඉදිරි ගිණුම් වර්ෂයේ දී කටයුතු කරන බව.	මුදලේ වර්තමාන අගය/වට්ටම් ක්‍රමය සැලකිල්ලට ගෙන ගිණුම් තබනු ලබයි.
13	මූල්‍ය ප්‍රකාශනවල බදු ඉඩම් සම්බන්ධව අනුගමනය කරනු ලබන ගිණුම් ප්‍රතිපත්තිය නව දිගන්තය පුනරුත්ථාපන මධ්‍යස්ථානයේ ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ කල්බදු ඉඩමට අදාළව පමණක් හෙලිදරව් කර තිබුණි. ඒ අනුව බදු ඉඩම් සම්බන්ධයෙන් මණ්ඩලය අනුගමනය කරනු ලබන ගිණුම්කරන ප්‍රතිපත්තිය හෙළිදරව් කර නොතිබුණි.	2022	මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුය.	මණ්ඩලය සතු සියළු බදු ඉඩම් සම්බන්ධව සිදු කරන ගිණුම් ප්‍රතිපත්තිය ඉදිරි මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කිරිමට කටයුතු කරමි.	මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කිරිමට කටයුතු කර නොතිබුණි.
14	නිලධාරීන් 09 දෙනෙකු වෙනුවෙන් ගෙවිය යුතු රු.6,193,135 ක පාරිතෝශික මුදල ජංගම වගකීම් යටතේ සහ ජංගම නොවන වගකීම් යටතේ පාරිතෝශික වෙන්කිරීම් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් සමාලෝචිත	2022	ගෙවිය යුතු පාරිතෝෂික මුදල් නිවරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.	ඉදිරියේ දී නිවරදිව ගිණුම්ගත කිරීමට අදාළ නිලධාරින්ට උපදෙස් දෙන ලදී.	2024 මූල්‍ය ප්‍රකාශණ සමග නිවැරදි කිරීමට කටයුතු කරමින් පවතී.

	වර්ෂයේ ඌණතාවය සහ ජංගම නොවන වගකීම් රු.6,193,135 කින් වැඩියෙන් දැක්වුණි.				
15	අවිනිශ්චිත ගිණුම තුළ රු .185, 685 ශෙෂයක් වර්ෂ 09 ක් පුරා පැවතිණි.	2022	අවිනිශ්චිත ගිණුමේ ශේෂය හැකි ඉක්මණින් හදුනා ගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.	ශේෂය හදුනා ගෙන නිරවුල් කිරීමට හැකි සෑම උත්සාහයක්ම ගන්නා බව දන්වා සිටිමි.	තවදුරටත් පවතින බව.
16	පොල් ආදායම රු. 1,734, 826 ක් ලෙස ආදඅයම් වාර්තා වල තිබුණි.	2022	ආදායම් වාර්තා යාවත්කාලීනව ගිණුම් අංශය විසින් පවත්වා ගෙන යා යුතුය.	පොල් අදායම සැසඳුම් කළ හැකි පරිදි සැසඳුම් ලේඛණයක් ඉදිරියේදී පවත්වා ගෙන යාමට කටයුතු කරමි	එම ලේඛනය මෙතෙක් විධිමත්ව පවත්වා නැත.
17	2022 දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් ගිණුමේ පැවති රු.1,087,009 ක හර ශේෂය වර්ෂ 20 කට වඩා වැඩි කාලයක සිට චලනය නොවී පවතින අතර එම ශේෂයන් තහවුරු කර ගැනීම සඳහා ප්‍රමාණවත් තොරතුරු නොතිබුණි.	2022	අත්තිකාරම් ශේෂයෙහි නිරවද්‍යාතාවය සනාථ කර ගැනීමට ප්‍රමාණවත් තොරතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතුය.	මෙම ශේෂයන් සනාථ කර ගැනීම සඳහා ප්‍රමාණවත් සාක්ෂි මණ්ඩලය සතුව නොමැති අතර කාර්ය මණ්ඩලය යොදවා අදාල ලේඛන සියුම් ලෙස පරීක්ෂා කරමින් සිටි.	අත්තිකාරම් ශේෂයෙහි නිරවද්‍යාතාවය සනාථ කර ගැනිමට කටයුතු කර නොතිබුණි.
18	2008 අංක 1 දරණ මාදක ඖෂධ සහ මනෝවර්තක නිති විරෝධි ලෙස ජාවාරම් කිරිම සම්මුති පනතේ 18 වැනි වගන්තිය සමඟ 31 වන වගන්තිය හා අණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි වගන්තියේ (2) වැනි ඡේදයට අනුව සාදනු ලැබූ නියෝග අංක 1653/7-	2022	පනතේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.	අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාලයෙන් එවන ලද ලිපියට අනුව පුරප්පාඩු පිරවීමට ලබා දී ඇති උපදෙස් අනුව, 2023 මැයි 23 දින යොමු අංක NDDCB/HR/01/02-1 දරණ ලිපිය මඟින් අවශ්‍ය කරුණු යළි රේඛිය අමාත්‍යාංශය	පනත ප්‍රකාරව මෙතෙක් කටයුතු කර නොතිබුණි.

	2010 මැයි 10 දින අතිවිශේෂ ගැසට් පත්‍රයනියෝග 5 ඡේදඅධිකාරියේ බලතල කාර්යයන් හා කර්තව්‍යන් ක්‍රියාත්මක කිරිම ,ඉටුකිරිම සහ සිදුකිරිම සඳහා අවශ්‍ය විය හැකි ලේකම්වරයෙකු සහ වෙනත් නිලධරයන් සහ සේවකයන් අධිකාරිය විසින් පත්කරනු ලැබිය යුතු වුවද 2022 වර්ෂය අවසන් වන තුරු අවශ්‍ය වන කාර්යය මණ්ඩලය බඳවා ගැනීම් සිදුකර නොමැති අතර නිලධාරින් දෙදෙනෙකු පමණක් අනුයුක්ත කර තිබුණි.			වෙත යොමු කර ඇත.	
19	නියෝග 8 ඡේදය හා නියෝග 10 ඡේදය2008 අංක 1 දරණ මාදක ඖෂධ සහ මනෝවර්තක නීති විරෝධි ලෙස ජාවාරම් කිරිමට එරෙහි සම්මුති පනතේ විධිවිධාන වලට යටත්ව අධිකාරිය රැස්විම්වල කටයුතු කිරිම සම්බන්ධව අනුගමනය කල යුතු වන අතර නියෝග 10 ඡේද ප්‍රකාරව එහි කාර්යයන් පිළිබඳ පුරෝගාමී අධිකාරියේ මණ්ඩලයේ සාමාජිකයන් විසින් සමාලෝචනය සිදු කළ යුතු වුවද එසේ සිදු කර නොතිබුණි.	2022	-එම-	ඉදිරි කටයුතු විගණන නිරික්ෂණයේ පෙන්වා දුන් පරිදි ක්‍රියාත්මක කිරිමට උපදෙස් හා අනුමැතිය 2023 මැයි 23 දින ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල රැස්වීමේ දී ලබා දී ඇත.	පනත ප්‍රකාරව මෙතෙක් කටයුතු කර නොතිබුණි.

20	2007 අංක 54 දරණ ඖෂධවලට ඇබ්බැහි තැනැත්තන් (ප්‍රතිකාර හා පුනරුත්ථාපනය) පනතට අනුසාංගිකව නිකුත් කරන ලද 2010 මැයි 10 දිනැති අංක 1653/19 - 2010 ගැසට් පත්‍රය2022 වර්ෂය වන විට පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන 26 ක බලපත්‍ර වලංගු කාලය අවසන් වී තිබූ අතර මධ්‍යස්ථාන වල බලපත්‍ර අලුත් කිරීම සඳහා පවතින අවම ප්‍රමිතීන් තවදුරටත් සංවර්ධනය කිරීමට කාලය ලබා දී තිබුණද 2022 වර්ෂයේ දී කිසිදු මධ්‍යස්ථානයක බලපත්‍ර අලුත් කර නොතිබුණි. මෙම වාර්තාවේ දින වන විට 2023 වර්ෂයට අදාළව බලපත්‍ර 08 ක් පමණක් අලුත් කර තිබුණි	2022	පනතේ විධිවිධාන ප්‍රකාරව සාධන ලැබූ නියෝග අනුව කටයුතු කල යුතුය.	2023 වසරේ අප්‍රේල් මස වන විට පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන නැවත විමර්ශනය කර බලා අවම ප්‍රමිතීන් සංවර්ධනය කර ඇති ප්‍රතිකාර මධ්‍යස්ථාන 08 ක බලපත්‍ර අලුත් කිරීම සිදුකර ඇති ජූනි මස තුළ බලපත්‍ර අලුත් කිරීමට නියමිත අනෙකුත් පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථානවල බලපත්‍ර අලුත් කිරීමට අවශ්‍ය කටයුතු සූදානම් කර ඇත.	අලුත් කිරීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි.
21	මත්ද්‍රව්‍ය භාවිතා කරන පුද්ගලයින් සහ ඔවුන්ගේ පවුල් වල සමාජිකයින් සඳහා අවශ්‍ය උපදේශන සේවාවන් ලබා දීම, අවශ්‍ය මූලික මට්ටමේ මැදිහත්වීම් සිදු කිරීම ,අවශ්‍ය ප්‍රතිකාර සේවාවන් (ප්‍රතිකාර මධ්‍යස්ථාන / මනෝවෛද්‍ය සායන සහ වෙනත් අවශ්‍ය සේවාවන්) වෙත යොමු කිරීම සහ තොරතුරු ලබා දීමේ අරමුණින් 2020 වර්ෂයේ මාර්තු මස අන්තරායකර ඖෂධ	2022	දුරකථන අංක 1927 උපකාරක සේවාව නිසි පරිදි ක්‍රියාත්මක වීමට අවශ්‍ය පහසුකම් සැපයිය යුතුය.	සේවය සැපයීමට සිටින නිලධාරීන් සංඛ්‍යාව සීමිතවීම මත අදාළ කාලය තුළ ඇමතුම් සංඛ්‍යාවේ අඩුවීමක් සිදුවී ඇත. දැනට පවතින කාර්යමණ්ඩල හිඟය සැළකිල්ලට ගනිමින් විශ්වවිද්‍යාල උපාධි අපේක්ෂකයින් සීමාවාසික පුහුණුව යටතේ හෝ සේවේච්ඡා පදනම මත කණ්ඩායමක් සම්බන්ධ කරගනිමින් අවශ්‍ය තාක්ෂණික	සේවාව සැපයීමට අවශ්‍ය පහසුකම් සලසා දී නොතිබුණි.

	පාලක ජාතික මණ්ඩලයේ ප්‍රධාන කාර්යාල පරිශ්‍රය තුළ 1927 දුරකථන උපදේශන සේවා ඒකකය ආරම්භ කර තිබුණි. සේවා සැපයීමට සිටින නිලධාරීන් සීමිත වීම මත මෙම දුරකථන උපදේශන ඒකකයේ ප්‍රගතිය 2021 වර්ෂයට වඩා 2022 වර්ෂයේදී සියයට 38 කින් අඩු වී තිබීම හේතුවෙන් අපේක්ෂිත අරමුණ ඵලදායි ලෙස ඉටු නොවන බව නිරීක්ෂණය විය.			පුහුණුවීම් යටතේ සේවාවන් සැපයීමට යොදවා ගැනීමට සැළසුම් කර ඇත.	
22	මණ්ඩලයට අයත් “නව දිගන්ත” ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා පෞද්ගලික ආයතනයකින් රු. 5,000,000 ක පරිත්‍යාග මුදලක් 2021 වර්ෂයේදී ලැබී තිබුණි. ගොඩනැගිල්ල ඉදිකිරීම් කටයුතු සඳහා රු. 8,948,612 ක ඇස්තමේන්තුවක් සකසා තිබූ අතර ඉදිකිරීම් කටයුතු ශ්‍රී ලංකා නාවික හමුදා ශ්‍රම දායකත්වයෙන් සිදු කිරීම වෙනුවෙන් රු.3,132,014 ක් අඩුකර රු. 5,816,589 ක පිරිවැය ඇස්තමේන්තුවක් සකසා තිබුණි. ඉදිකිරීම් කටයුතු සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා රු.	2022	පරිත්‍යාග වශයෙන් ලද මුදල් ආර්ථික හා ඵලදායී ලෙස යොදවා ගැනීමට කටයුතු කල යුතුය.	වැඩබිමක කටයුතු සිදු කරන විට යම් යම් ඉතිරි වීම් හෝ ඌනතාවයන් අපේක්‍ෂා කළ හැකිය. නමුත් මෙය ඵලදායී ලෙස යොදවා ගැනීම පිණිස මෙවැනිම ආධාර මත ඉදිවන UNODC ගොඩනැගිල්ල වෙත ලබා දීමට මණ්ඩලය විසින් තීරණය කර ඇත.	පරිත්‍යාග වශයෙන් ලද මුදල් ආර්ථික හා ඵලදායි ලෙස යොදවා ගැනිමට කටයුතු කර නොතිබුණි.

	3,598,600 ක් වැය කර තිබුණද, ඉදිකිරීම් කටයුතු තාවකාලිකව නතර කර තිබුණි. 2022 මාර්තු 25 දින භෞතිකව සිදු කරන ලද පරීක්ෂණ කමිටු වාර්තාව අනුව මිලදී ගත් ද්‍රව්‍ය වලින් රු.1,310,475 ක් වටිනා ද්‍රව්‍ය වැඩ බිමෙහි ඉතිරිව තිබුණි. ඒ අනුව පරිත්‍යාග වශයෙන් ලද මුදල් ආර්ථික හා ඵලදායී ලෙස යොදවා ගෙන නොමැති බව නිරීක්ෂණය විය. තවද, මෙම ගොඩනැගිල්ලේ ඉදිකිරීම් නතර කිරිම නිසා ද්‍රව්‍ය ආධාර වශයෙන් ලැබී තිබූ සිමෙන්ති මළු 100 ක් UNODC ආධාර මත ඉදි කෙරෙමින් පවතින ගොඩනැගිල්ලක් වෙත ලබා දීමට මණ්ඩලයේ අනුමැතිය ලබා දී තිබුණි.				
23	2007 අංක 54 දරණ ඖෂධවලට ඇබ්බැහි තැනැත්තන් (ප්‍රතිකාර පුනරුත්ථාපනය) පිළිබඳ පනත සංශෝධනය කිරිම සඳහා 2022 ජනවාරි 24 දින පැවති ආමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අමප/21/2279/303/176 ප්‍රකාරව පනතට අදාළ සශෝධන කටයුතු නිම කිරිමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි.	2022	පනතට අදාල සංශෝධන කිරිම කඩිනමින් කිරීමට කටයුතු කල යුතුය.	නීති කෙටුම්පත් සම්පාදක විසින් අවසන් සංශෝධිත කෙටුම්පත සකසා ඉදිරිපත් කර ඇති අතර ඉංග්‍රිසි පරිවර්තනය ද සහිතව 2023 මැයි 02 දින අධිකරණ අමාත්‍යාංශය හා නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.	නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව වෙත යොමු කර තිබුනද මෙතෙක් සංශෝධන සිදුකර නොතිබුණි.

24	2007 අංක 54 දරන ඖෂධවලට ඇබ්බැහි තැනැත්තන් (ප්‍රතිකාර හා පුනරුත්තාපනය) පිළබඳ පනතේ 7 වන වගන්තිය ප්‍රකාරව නීති ක්ෂේත්‍රයේ විශිෂ්ඨත්වයට පත් තැනැත්තන් අතරින් හෝ අන්තරාදායක ඖෂධ ඇබ්බැහිය හා සම්බන්ධ කායික විද්‍යාත්මක හෝ සමාජ ගැටළු යන පිළිබඳ පලපුරුද්ද හා දැනුම ඇති තැනැත්තන් අතරින් දහදෙනෙකුට නොවැඩි තැනැත්තන් සංඛ්‍යාවකින් සමන්විත තුලනික්ෂණ මූල මණ්ඩලයක් පත් කර නොතිබුණි.	2022	පනතේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය	තුලනීක්ෂණ මූල මණ්ඩලය පත් කිරීම හා ක්‍රියාත්මක කිරීම ප්‍රායෝගිකමය වශයෙන් ගැටලු සහගත වන බැවින් සංශෝධිත පනත් කෙටුම්පත සකස් කිරීමේදී තුලනීක්ෂණ මූල මණ්ඩලය වෙනුවට තක්සේරු කමිටුවක් පත් කළ යුතු ආකාරය පිළිබඳ ඇතුළත් කරන ලදි.	පනතේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
25	2007 අංක 54 දරන ඖෂධවලට ඇබ්බැහි තැනැත්තන් (ප්‍රතිකාර හා පුනරුත්තාපනය) පිළිබඳ පනතේ 4 (02) සහ (03) යන වගන්ති ප්‍රකාරව බලය පැවරී ඇති නිළධාරියෙකුට යුක්ති සහගත වේලාවන්හිදි පනත යටතේ බලපත්‍ර දී තිබෙන හෝ නාමෝදිෂ්ඨ යම් ප්‍රතිකාර මධ්‍යස්ථානයකට ඇතුළු වී අවශ්‍ය යයි සලකන පරික්ෂාවන් සිදු කල හැකි වුවද ආයතන 26 න් 2022 වර්ෂයේදී මධ්‍යස්ථාන 16 ක් පමණක් පරික්ෂාවට ලක් කර තිබුණ අතර නියමිත කාලාන්තරීය වාර්තා මඟින් ප්‍රතිකාර මධ්‍යස්ථානයෙහි සාර්ථකත්වය පිළිබඳ	2022	පනතේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.	මේ සම්බන්ධයෙන් 2023 මැයි 22 දින ජ්‍යෙෂ්ඨ කාර්යය මණ්ඩලය උදෙසා පැවති රැස්වීමේදී, නිවාරණ, අධ්‍යාපන හා පුහුණු අංශයේ හා බාහිරසේවා අංශයේ නිලධාරීන්ගේ සහයෝගය ලබාගනිමින් මධ්‍යස්ථාන නිරීක්ෂණ කටයුතු සිදු කිරීමට යෝජනා කරන ලද අතර, ඉදිරියේ දී පුරප්පාඩු පිරවීමට අවශ්‍ය තීරණ ගන්නා තෙක් මෙම විකල්ප ක්‍රමය යොදා ගනිමින් පෞද්ගලික ප්‍රතිකාර පුනරුත්ථාපන මධ්‍යස්ථාන අධීක්ෂණය කිරීමට	මධ්‍යස්ථාන සියල්ලම පරික්ෂාවට ලක් කර තිබුණි.

	තොරතුරු මණ්ඩලයේ අවධානයට යොමු කර නොතිබුණි.			සැලසුම් කර ඇත.	
26	2014 අප්‍රේල් 30 දින, රු.4,085,018 ක බදු වටිනාකමකට තිස් අවුරුදු බදු පදනම මත ලබාගෙන ඇති හෝමාගම පිටිපන ඉඩම වසර 8 ක් ගතව තිබියදීත් යොදාගනු ලැබීමට අපේක්ෂිත කාර්යය නිශ්චිතව නාගරික සංවර්ධන අධිකාරිය වෙත දැනුම් නොදීම හේතුවෙන් මෙම ඉඩම ඵලදායී කාර්යයක යොදා ගැනීමකින් තොරව නිෂ්කාර්යව පැවතුණි.	2022	ඉඩම් ඵලදායී කාර්යයන්ට යොදා ගැනීමට කටයුතු කල යුතුය.	රජයේ ප්‍රතිපාදන හෝ මහජන ආධාර මුදල් ලද විගස තාවකාලිකව හෝ ගොඩනැගිල්ලක් ඉදිකර බාහිර සේවා නිලධාරීන් හා උපදේශකයින් යෙදවීමට සැලසුම් කර ඇත. මණ්ඩලය විසින් බදු ඔප්පුව ලබා ගැනීමට අවශ්‍ය ඉල්ලීම් මේ වන විට සිදු කර ඇති අතර, තවදුරටත් මේ සම්බන්ධයෙන් කටයුතු කරමින් පවතී.	තවදුරටත් නිෂ්කාර්යව පවතී.
27	1984 අංක 11 දරන අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩල පනතේ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා 374 කින් යුත් කාර්යය මණ්ඩලයක් අනුමත වී තිබුණද 2022 දෙසැම්බර් 31 දිනට තත්‍ය කායීය මණ්ඩලය 225 ක් වූයෙන් එදිනට පුරප්පාඩු සංඛ්‍යාව 149 ක් විය. මේ හේතුවෙන් මණ්ඩලයේ අරමුණු, බලතල හා කාර්යයන් ක්‍රියාත්මක කිරීමේදී බලාපොරොත්තුවන කාර්ය සාධනය ලඟා කර ගත නොහැකි වී තිබුණි.	2022	නිසි අධ්‍යයනයකින් පසුව අනුමත කාර්ය මණ්ඩලය සුදුසු පරිදි සංශෝධනය කිරීමට කටයුතු කළ යුතුය.	මේ වන විට අමාත්‍ය මණ්ඩල තීරණය අනුව හා මුදල් අමාත්‍යාංශයේ ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 බලපැවැත්වෙන බැවින් මෙම තනතුරු වල පුරප්පාඩු පිරවීමට නොහැකි වී ඇත. මණ්ඩලයේ අත්‍යාවශ්‍ය තනතුරු වල පුරප්පාඩු පිරවීම සඳහා 2023 මැයි 23 දින යොමු අංක NDDCB/HR/0/02/-01 දරණ ලිපිය මගින් සේවක අවශ්‍යතාවය පුරෝකථනය කර රේඛීය අමාත්‍යාංශය වෙත ලිපි යවා ඇත.	සංශෝධනය කිරීමට කටයුතු කරමින් පවතී.

28	2022 වර්ෂය සඳහා මණ්ඩලය අනුමත කර තිබූ ක්‍රියාකාරී සැළැස්ම සඳහා අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ ඇති අංශ 07 න් අංශ 03 ක පමණක් භෞතික ප්‍රගතිය විගණනය සඳහා ඉදිරිපත් විය. පර්යේෂණ අංශයේ යෝජිත වැඩ සටහන් 06 න් වැඩසටහන් 03 ක භෞතික ප්‍රගතිය සියයට 50 ක ආසන්නව පැවතුණි.	2022	සැලසුම්ගත ක්‍රියාකාරකම් අපේක්ෂිත පරිදි ඉටු කිරීමට කටයුතු කල යුතුය.	කඩිනමින් මෙම වාර්තා විගණනය වෙත යොමු කිරීමට කටයුතු කරමින් පවතී.	මේවන විට භෞතික ප්‍රගතිය සතුටු දායක මට්ටමක පවතී.
29	නීති විරෝධි මත්ද්‍රව්‍ය නිෂ්පාදනය ප්‍රවාහනය, ජාවාරම, විකිණීම සහ භාවිතයට එරෙහිව නිතීය ඵලදායී ලෙස බලාත්මක කිරීම සඳහා ජාතික මාදක රසායනාගාරය ක්‍රියාකාරි සැළැස්මට අනුව භෞතික ප්‍රගතිය පිලිබඳව ඉදිරිපත් කරන ලද දත්තයන්ට අනුව 2022 වර්ෂය කිසිදු ප්‍රගතියක් ලබා ගෙන නොතිබූ යෝජිත වැඩ සටහන් 08 ක් ද සියයට 10 වඩා භෞතික ප්‍රගතියක් ලබා නොගත් යෝජිත වැඩ සටහන් 03 ක් ද විය.	2022	එම	ආයතනය විසින් නිසි ලේඛන පවත්වාගෙන නොයාම නිසා ප්‍රගතිය ලබා දීමට නොහැකි වීම, ආයතන සම්බන්ධීකරණය කර ගැනීමට නොහැකි වීම, මාදක රසායනාගාරයේ ප්‍රමාණවත් විද්‍යාත්මක නිළධාරින් නොමැති වීම ,	සැලසුම්ගත ක්‍රියාකරකම් අපේක්ෂිත පරිදි ඉටු කර ගැනිමට කටයුතු කර නොතිබුණි.
30	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 49 ඡේදය ප්‍රකාරව, එක් පන්තියකට අයත් සියලු වත්කම් මුළුමනින්ම ප්‍රත්‍යාගණනය කළ යුතු වුවද, 2017 දෙසැම්බර් 31 දිනට මුළු පිරිවැය	2021	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය.	මහනුවර හා නවදිගන්තය මධ්‍යස්ථාන වල ප්‍රත්‍යාගණන කටයුතු නිම කර ඇති බව, ගාල්ල හා තලංගම ප්‍රතිකාර මධ්‍යස්ථාන 02 හි ප්‍රත්‍යාගණන	සියලුම ප්‍රත්‍යාගණන කටයුතු නිම කිරීමට පියවර ගෙන නොතිබුණි.

	රු.73,583,056 ක්වූ ඉඩම් හා ගොඩනැගිලිවලින් මුළු පිරිවැය රු.10,447,264 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි පමණක් ප්‍රත්‍යාගණනය කර තිබුණි. ඒ හේතුවෙන් 2021 දෙසැම්බර් 31 දින වන විටත් මුළු පිරිවැය රු.63,135,792 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි එහි පිරිවැයටත් මුළු පිරිවැය රු.10,447,264 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි එහි ප්‍රත්‍යාගණන අගයටත් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර තිබුණි.			කටයුතු මේ වන විට අවසන් අදියරයේ පවතින බව හා සියළු වත්කම්වල ප්‍රත්‍යාගණන වටිනාකම් 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ ගැලපීමට කටයුතු කරන බව.	
31	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 65 ඡේදය ප්‍රකාරව, ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීව කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබුණු නමුත් තවදුරටත් භාවිතා කරනු ලබන පිරිවැය රු.195,730,952 ක් වූ වත්කම් වල ඵලදායී ජීවකාලය පිළිබඳ වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 ප්‍රකාරව ප්‍රතිශෝධනය කර නිවැරදි ධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි	2021	-එම-	ජංගම නොවන වත්කම්වල අවශේෂ වටිනාකම් සහ ප්‍රයෝජනවත් ජීව කාලය ඇස්තමේන්තු කිරීමේ කටයුතු මේ වන විටත් ආරම්භ කර ඇති බව හා ඉදිරියේදී ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කරන බව.	එකවර ප්‍රත්‍යාගණනය කර 2024 වර්ෂය තුළ දී ගිණුම්ගත කිරීමට තීරණය කර ඇත.

32	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 19 හි 59 ඡේදය ප්‍රකාරව, විශ්‍රාම ප්‍රතිලාභ වගකීම වට්ටම් ක්‍රමය මත අගය කර නොතිබුණු අතර එම වගකීම රු.58,433,472 ක් ලෙස මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කර තිබුණි.	2021	-එම-	ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කර 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන බව.	විශ්‍රාම ප්‍රතිලාභ වගකීම වට්ටම් ක්‍රමය මත අගය කරනු ලබයි.
33	අවිනිශ්චිත ගිණුමේ ශේෂය රු 480,900 ක් වර්ෂ 08 ක කාලයක සිට පැවත වයි.	2021	අවිනිශ්චිත ගිණුමේ ශේෂය හැකි ඉක්මනින් හඳුනා ගෙන නිරවුල් කළ යුතුය.	සියළුම මූලාශ්‍ර ලේඛන පරීක්ෂා කරමින් අවිනිශ්චිත ගිණුමේ ශේෂයට හේතු හඳුනාගැනීමට කටයුතු කරමින් පවතින බව.	එය තවදුරටත් පවතී.
34	2021 දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් ගිණුමේ පැවති හර ශේෂය රු.1,782,060 ක් වර්ෂ 20 කට වැඩි කාලයක සිට චලනය නොවී පැවති අතර එම ශේෂයෙහි නිරවද්‍යතාව සනාථ කර ගැනීමට ප්‍රමාණවත් තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.	2021	අත්තිකාරම් ගිණුම් ශේෂයෙහි නිරවද්‍යතාව සනාථ කර ගැනීමට ප්‍රමාණවත් තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය.	මෙම ශේෂ හඳුනාගැනීමට මණ්ඩලයේ මූල්‍ය අංශය විසින් කටයුතු කරමින් සිටින බව.	අත්තිකාරම් ගිණුම් ශේෂයෙහි නිරවද්‍යතාව සනාථ කර ගැනිමට කටයුතු කර නොතිබුණි.
35	2007 අංක 54 දරන ඖෂධවලට ඇබ්බැහි තැනැත්තන් (ප්‍රතිකාර හා පුනරුත්ථාපනය) පිළිබඳ පනතේ 4 වන වගන්තියප්‍රතිකාර මධ්‍යස්ථානවල කටයුතු පිළිබඳව සහ ඖෂධවලට ඇබ්බැහිවූවන්ට ප්‍රතිකාර ලබාදීම හා ඔවුන් පුනරුත්ථාපනය කිරීමෙහිලා	2021	පනතේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.	මධ්‍යස්ථානවල ප්‍රගතිය සම්බන්ධයෙන් වාර්තා ඉදිරියේදී මණ්ඩලය වෙත සපයා ගැනීමට කටයුතු කරන බව.	පනත ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

	මධ්‍යස්ථානවල සාර්ථකත්වය පිළිබඳව තොරතුරු ඇතුළත් කර නියමිත කාලන්තරීය වාර්තා ප්‍රතිකාර මධ්‍යස්ථාන අධ්‍යක්ෂවරයා විසින් 2019 සැප්තැම්බර් 19 දින සිට මණ්ඩලය වෙත ඉදිරිපත් කර නොතිබුණි.				
36	ශ්‍රී ලංකා මත්ද්‍රව්‍ය භාවිතය පිටු දැකීමේ රාජ්‍ය නොවන සංවිධානයන්ගේ ඒකාබද්ධ සම්මේලනය (SLFONGOADA) නමින් වූ රාජ්‍ය නොවන සංවිධානය ස්ථාපිත ගොඩනැගිල්ලේ කුලිය වශයෙන් රු.330,000 ක් මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය තුළදී ගෙවා තිබුණි.	2021	මණ්ඩලයේ වියදම් දැරීම සඳහා පමණක් භාණ්ඩාගාර ප්‍රදාන උපයෝගී කර ගත යුතුය.	ශ්‍රී ලංකා මත්ද්‍රව්‍ය භාවිතය පිටු දැකීමේ රාජ්‍ය නොවන සංවිධානයන්ගේ ඒකාබද්ධ සම්මේලනය (FONGODA) 1984 අංක 11 දරන අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය පනත යටතේ අනු කමිටුවක් ලෙස 1986 දී පිහිටුවා ඇති බව හා මාණ්ඩලීය අනුමැතිය ඇතිව ගෙවා ඇති බව.	මාණ්ඩලීය නොවන වියදම් දැරීම සඳහා භාවිතා කර තිබුණි.
37	විශ්වවිද්‍යාල සිසුන් ඇතුළු විද්වතුන්ගේ පරිශීලනය සඳහා පැවති මණ්ඩලයෙහි ප්‍රධාන කාර්යාලය තුළ පවත්වාගෙන ගිය මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් වූ පොත්පත් 2,689 කින් සහ වැදගත් ලිපිලේඛන හා සඟරා වලින් සමන්විත වූ පුස්තකාලය, ප්‍රධාන කාර්යාල භූමියෙන් තලංගම මධ්‍යස්ථානය වෙත 2021 අගෝස්තු මාසයේදී	2021	පුස්තකාලය හැකි ඉක්මනින් නිසියාකාරව ස්ථාපිත කර පරිශීලකයින් සඳහා විවෘත කළ යුතුය.	මේ වන විට පුස්තකාලය යළි ස්ථාපනය කිරීමට කටයුතු කරමින් පවතින බව.	පුස්තකාලය යළි ස්ථාපනය කර ඇත.

	මාරුකර යවා තිබුණි. 2022 අගෝස්තු මාසය වන විට වසරක් ගතවී තිබුණු නමුත් පිරිවැය රු.1,484,156 ක් වටිනා පොත්පත් භාවිතයකින් තොරව තලංගම මධ්‍යස්ථානයෙහි ගොඩ ගසා තිබුණි. පුස්තකාලයට අනුයුක්තව සිටි පුස්තකාලාධිපති සහ පුස්තකාල සහායක නිලධාරීන් ප්‍රසම්පාදන අංශයේ රාජකාරිවලට අනුයුක්ත කර තිබුණි.				
38	මහනුවර, නවදිගන්තය හා ගාල්ල ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථාන සඳහා රු.612,000 ක් වැයකර මිලදී ගෙන තිබුණු CCTV කැමරා පද්ධති ක්‍රියාත්මක නොවන නමුත් ඒවා අලුත්වැඩියා කිරීමට හෝ නව උපකරණ සවි කිරීමට හෝ කටයුතු කර නොතිබීම එම මධ්‍යස්ථානවල ආරක්ෂාවට දැඩි බලපෑමක් එල්ලවී තිබුණි. 2019 ඔක්තෝබර් මාසයේදී නවදිගන්තය මධ්‍යස්ථානය තුළ සේවාලාභියකු සියදිවි නසාගෙන තිබුණු නමුත් CCTV කැමරා නොමැතිකමින් ඒ පිළිබඳ සාක්ෂි ලබා ගැනීමට නොහැකිවී තිබුණි.	2021	අත්‍යාවශ්‍ය උපකරණ ප්‍රසම්පාදනයන් කඩිනම් කිරීමට හැකි උපරිමයෙන් කටයුතු කළ යුතුය.	CCTV කැමරා පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය 2022 වසරේදී ආරම්භ කර ඇති නමුත් පවතින මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් භාණ්ඩාගාරයෙන් ඒ සඳහා ප්‍රතිපාදන ලැබෙන තෙක් ප්‍රසම්පාදන කටයුතු නවතා ඇති බව.	CCTV කැමරා පද්ධතිය ක්‍රියාත්මක නැත

39	සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලයේ ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් ලැබී තිබුණු භාණ්ඩාගාර අග්‍රිම මුදල රු.මිලියන 16.473 කින් රු. මිලියන 7.731 ක් හෙවත් සියයට 47 ක් පමණක් උපයෝජනය කර තිබුණි.	2021	CCTV කැමරා වැනි අත්‍යාවශ්‍ය ප්‍රාග්ධන වියදම් සඳහා මණ්ඩලය වෙත ලැබෙන අග්‍රිම මුදල් උපරිම ලෙස උපයෝජනය කළ යුතුය.	Covid 19 වසංගත තත්ත්වය හේතුවෙන් ආයතනය වසා තැබීම, සේවාමුර ක්‍රමයට සේවයට වාර්තා කිරීම හා වියදම් අවම කිරීමට සිදුවීම ප්‍රාග්ධන වියදම් පිළිබඳ ක්‍රියාවලිය ප්‍රමාදවීමට හේතුවූ බව.	CCTV කැමරා මෙතෙක් සවිකර නොමැත.
40	සංශෝධිත විෂ, අබිං සහ අන්තරායදායක ඖෂධ ආඥාපනතෙහි සඳහන් මරණීය දණ්ඩනය හෝ ජීවිතාන්තය දක්වා සිරදඬුවම් නියම කිරීම සඳහා හෙරොයින්, කොකේන් සහ මොෆීන් ප්‍රමාණය ග්‍රෑම් 02 සිට ග්‍රෑම් 05 දක්වා ඉහළ නැංවීමට ඉදිරිපත්වී තිබුණු යෝජනා සම්බන්ධයෙන් මණ්ඩලයෙන් කරුණු දැක්වීමක් සිදු කර නොතිබුණි.	2021	මණ්ඩලයට අදාළ පනත් සශෝධනයේදී මණ්ඩලයෙහි නිර්දේශයන් ලබා දිය යුතුය.	අමාත්‍යාංශය මගින් ගත් ප්‍රතිපත්තිමය තීරණයක් නිසා මණ්ඩලයේ නිර්දේශ යැවීම නුසුදුසු බව.	2022 අංක 41 (සංශෝධිත) පනත මගින් 2 සිට 5 දක්වා ඉහළ නැංවීමට අනුමැතිය ලැබී ඇත.
41	සමාලෝචිත වර්ෂය තුළදී මණ්ඩලය විසින් පවත්වා තිබුණු උපදේශන සහතිකපත් පාඨමාලා ගාස්තු ලෙස ලැබී තිබුණු රු.1,740,000 කින් රු.435,000 ක් හා රු.87,000 ක් පිළිවෙලින් සුභසාධක සංගමය හා බෞද්ධ සංගමය වෙත ලබාදී තිබුණි.	2021	මණ්ඩලය සතු සියළු අදායම් මණ්ඩලයේ ආදායම් ලෙස සලකා ගිණුම්ගත කළ යුතුය	2019 පෙබරවාරි 26 දිනැති මණ්ඩලික රැස්වීමේදී ගන්නා ලද තීරණයන් අනුව කටයුතු කර ඇති බව.	මණ්ඩලය සතු සියලු ආදායම් මණ්ඩලයේ ආදායම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.
42	2014 අප්‍රේල් 30 දින රු.4,027,518 ක් වැයකර තිස් අවුරුදු බදු පදනම	2021	අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම සඳහා කඩිනමින්	ආරක්ෂක අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය ප්‍රකාරව, මෙම ඉඩම	අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනිමට කටයුතු

මත හෝමාගම පිහිටි පර්චස් 40 ක ඉඩම මිලදී ගෙන තිබුණු නමුත්, 2022 අගෝස්තු 30 දින වන විටත් එය ඵලදායී කාර්යයක යොදා ගැනීමකින් තොරව නිෂ්ක්‍රීයව පැවතුණි.තිබුණු ලංසුකරු වෙත රු.241,380 කට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. තෝරා ගෙන තිබුණු ලංසුකරු විසින් ඉදිරිපත් කර තිබුණු යන්ත්‍රයෙහි නඩත්තු පිරිවැය අනෙකුත් ලංසුකරුවන් විසින් ඉදිරිපත් කර තිබුණු නඩත්තු පිරිවැයට වඩා ඉතා ඉහළ අගයක් ගෙන තිබුණු බවද නිරීක්ෂණය විය.	කටයුතු කළ යුතු බව.	නාගරික සංවර්ධන අධිකාරියට නැවත පවරාදී ඒ වෙනුවට වෙනත් සුදුසු ප්‍රදේශයකින් ඉඩමක් ලබාගැනීම හෝ දැනට භාවිතා කර ඇති වසර 6 සඳහා නිශ්චිත බදු මුදලක් ලබාදී ඉතිරි මුදල් ප්‍රතිපූරණය කර ගැනීමට ඇති හැකියාව සලකා බැලීමට හෝ කටයුතු කළ යුතු බව මණ්ඩලය තීරණය කර ඇති බව.	කර නොතිබුණි.

3.139 ජාතික තරුණ සේවා සභාව

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	අතිරික්තය (ඌනතාවය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	3,591,849	677,836	2,914,013	(249,189)	තත්ත්වාගණනය කළ
2022	3,506,670	752,559	2,754,111	(255,710)	තත්ත්වාගණනය කළ
2023	3,456,670	626,881	2,829,251	(68,272)	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	විගණන වාර්තාවේ වර්ෂය	විගණකාධිපතිගේ නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	සභාවට නීත්‍යානුකූල අයිතිය තිබූ අක්කර 03 පර්චස් 92 ක ප්‍රමාණයක් වූ ඉඩම් 03 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.	2021 2022 2023	සභාවට නීත්‍යානුකූල අයිතිය හිමි වත්කම්වල වටිනාකම මූල්‍ය ප්‍රකාශනයන්හි ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය.	තක්සේරු දෙපාර්තුමේන්තුවේ අදාල තක්සේරු වාර්ථා ලැබීමෙන් පසු අදාල වටිනාකම් ගිණුම් ගතකරන බවට දන්වා සිටිමි.	නිර්දේශ අනුව කටයුතු කරමින් පවතී.
2	සභාවේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ පරිපාලිත සමාගම වෙත ගෙවිය යුතු ශේෂය ලෙස රු.මිලියන 1.18ක් දක්වා තිබුණද, පරිපාලිත සමාගම මගින් තහවුරු කළ එම ශේෂය රු.මිලියන 110.94ක් වූයෙන් ශේෂයන් අතර රු.මිලියන 109.76ක නොසැසඳුණු වෙනසක් පැවතුණි.	2021 2023	සීමාසහිත ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගමට ගෙවිය යුතු ණය ශේෂ සමාගමේ තොරතුරු සමග පරීක්ෂා කර නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය.	ඉදිරියේදී සමාගම සමග සාකච්ඡා කර තීරණයක් ගන්නා බව දන්වා සිටිමි.	නිර්දේශ අනුව කටයුතු කර නොතිබුණි.

3	ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලද ශ්‍රී ලංකා යූත් ස්ටාර්ට් අප් චැලේන්ජ් වැඩසටහන යටතේ උප වැඩසටහන් 4 ක් සඳහා 2021 දෙසැම්බර් 20 දින වන විට රු. 1,402,810 ක් වැයකර තිබුණද එම වැඩසටහන් ක්‍රියාත්මක නොකිරීම මත එම මුදල නිෂ්ක්‍රීය වියදමක් බවට පත්වී තිබුණි.	2021	ව්‍යාපෘති ආරම්භ කිරීමේ අරමුණු ඉටුවන පරිදි සැලසුම් පිළියෙළ කර නිසි අධීක්ෂණයක් යටතේ ක්‍රියාත්මක විය යුතු අතර, රජයේ මුදල් අරපිරිමැසුම්දායක ව භාවිතා කිරීම ගැන විශේෂ අවධානය යොමු කළ යුතුය.	මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලද සභාපතිවරයා සභාවෙන් ඉවත්ව ගිය පසු නව සභාපති විසින් එම වැඩසටහන ඉදිරියට කරගෙන යාමට කටයුතු කර නොමැති බව දන්වා සිටිමි.	නිර්දේශ අනුව කටයුතු කර නොතිබුණි.
4	ජාතික තරුණ සේවා සභාවේ අරමුණුවලට පරිබාහිර කාර්යයක් ලෙස ලේ දන්දීමේ වැඩසටහනක් පැවැත්වීම සඳහා රු. 11,519,609 ක් වැය කර තිබුණි. මේ සඳහා සභාවේ ගොඩනැගිලි හා උපකරණ භාවිත කිරීමකින් තොරව දිනකට රු. 83,525 ක් බැගින් දින 24 ක් සඳහා රු. 2,004,600 ක් ගෙවා ඩෝම්ස් 01 ක් ආයතන භූමිය තුළ සකස් කිරීම මත එම වියදම නිෂ්කාර්යය වියදමක් බව නිරීක්ෂණය විය.	2021	වැඩසටහන් පැවැත්වීමේදී රාජ්‍ය අරමුදල් අවම වශයෙන් යොදා ගැනීමට කටයුතු කළ යුතුය.	සැලසුමෙන් තොරව වැඩසටහන් ආරම්භ කිරීඹ නිසා මෙසේ සිදුවූ බව දන්වා සිටිමි.	නිර්දේශ අනුව කටයුතු කර නොතිබුණි.
5	2020 වර්ෂයේ ආරම්භ කර තිබුණු එරමිණියාය ස්විස් පුහුණු මධ්‍යස්ථානයේ ඉදිකිරීම් ව්‍යාපෘති හතරක් සඳහා එකතුව රු. 4,563,066 ක් ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයුම්කරුවන්	2021	මුදල් රෙගුලාසි ප්‍රකාරව විධිමත් පරීක්ෂාවක් සිදුකර ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය.	මූලික විමර්ශණයක් මේ වන විට ආරම්භ කර කටයුතු සිදු කරමින් පවතී. නිලධාරියාගේ වැඩ තහනම් කිරීමට කටයුතු කර ඇත.	නිර්දේශ අනුව කටයුතු කරමින් පවතී.

	දෙදෙනෙකුට ගෙවීම් කර තිබුණිද එම ද්‍රව්‍ය වලින් සියයට 54 ක් හෙවත් එකතුව රු. 2,459,188 ක් වටිනා ද්‍රව්‍ය ඉදිකිරීම් භූමියට ලැබුණු බවට ව්‍යාජ ලේඛන සකස් කර නිලධාරීන් විසින් අයථා පරිහරණය කර තිබුණි.				
6	2014නොවැම්බර් 12 දිනැති අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට පටහැනිව නුපුහුණු ලිපිකරුවන් 15දෙනෙකු හා නුපුහුණු කම්කරුවන් 03දෙනෙකු 2021 වර්ෂයේ සිට 2023 දක්වා බඳවාගෙන ප්‍රධාන කාර්යාලයේ විවිධ අංශවලට හා පුහුණු මධ්‍යස්ථානවලට අනුයුක්ත කර රු.11,547,501 ක් දීමනාවකින් ගෙවා තිබුණි.	2021 2023	බඳවා ගැනීමේ පටිපාටියට අනුව පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය.	ඉදිරි ක්‍රියාමාර්ග විගණනය වෙත වාර්තා කර නොතිබුණි	නිර්දේශ අනුව කටයුතු කර නොතිබුණි.
7	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ මුදල් රෙගුලාසි 156 සහ ආයතන සංග්‍රහයේ II කොටස අනුව රු . මිලියන10 .9 ක් පිරිවැය වූ කුකුල් කෑම මිලදී ගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී ප්‍රසම්පාදන මණ්ඩලයේ අනුමත සීමාවන් ඉක්මවා අනුමත කිරීම හා වෙනත්	2022	චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය.	කුකුල් කෑම මිලදී ගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්බන්ධයෙන් නොසැලකිලිමත් භාවයෙන් කටයුතු කිරීම පිලිබඳව සොයාබලා විනයානුකූලව කටයුතු කිරීම සඳහා පියවර ගනිමි.	නිර්දේශ අනුව කටයුතු කරමින් පවතී.

	ගොවිපොලවල සඳහන් මිල ගණන් නොසසඳා නොසැලකිලිමත් භාවයකින් කටයුතු කිරීම නිසා සිදු වී තිබූ දළ වශයෙන් රු . මිලියන 4.6 ක පාඩුව සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාර ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.				
8	2015 වර්ෂයේ සිට 2022 දෙසැම්බර් 31 දිනට සභාව විසින් වෙනත් රාජ්‍ය ආයතනවලින් ලබා ගෙන තිබූ වාහන 02 ක් විධිමත්ව පවරාදීමට හෝ පවරාගැනීමට කටයුතු කර නොතිබුණි.	2022 2023	විධිමත්ව පවරා ගැනීමට කටයුතු කළ යුතුය.	වාහන 02 පවරා ගැනීම සඳහා අමාත්‍යාංශය වෙත තොරතුරු ඉදිරිපත් කර ඇති බව දන්වා සිටිමි.	නිර්දේශ අනුව කටයුතු කරමින් පවතී.
9	ලෙව්වේගොඩ පුහුණු මධ්‍යස්ථානය සඳහා හාලිඇල ප්‍රාදේශීය ලේකම් විසින් ප්‍රදානය කර තිබූ අක්කර 24 රූඩ් 03 පර්චස් 53 ක්වූ ඉඩම් ප්‍රමාණයෙන් අක්කර 13 රූඩ් 03 හා පර්චස් 50 ක පිඹුරුපත අනුව භෞතිකව නොතිබූ අතර, එම ඉඩම් කොටස් මැනීම් සිදුකර ඒවායේ ප්‍රමාණය නිරවුල් කරවාගෙන නොතිබුණි.	2022	ඉඩම් කොටස් මැනීම් සිදුකර ඒවායේ ප්‍රමාණය නිරවුල් කරගත යුතුය	රේඛීය අමාත්‍යාංශ ලේකම් විසින් ඉඩම පවරාගැනීම සම්බන්ධ කටයුතු සිදු කරමින් පවතින බව දන්වා සිටිමි.	නිර්දේශ අනුව කටයුතු කරමින් පවතී.
10	2017 වර්ෂයේ අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුව නිලාවේලි	2022	ඵලදායීව ප්‍රයෝජනයට ගත හැකි වන පරිදි	ඉඩම සංවර්ධන කටයුතු සිදුකරමින් පවතින බවත්, පවරා	නිර්දේශ අනුව කටයුතු කර නොතිබුණි.

	ගොවිපොළ සඳහා අක්කර 200 ක ප්‍රමාණයක් ලබාදී තිබුණද, එහි පුහුණු පාඨමාලා ආරම්භ නොකර අක්කර 29.5 ක පමණක් පනතේ අරමුණු නොවන ගොවිපොලක් පවත්වාගෙන යාමට කටයුතු කර තිබුණි. වගාවන් සිදු නොකර, ආදායම් නොලබා වසර 03 ක් තුල ආරක්ෂක හා නඩත්තු වියදම් වෙනුවෙන් රු. මිලියන 15.5 ක්ද ඉදිකිරීම් සඳහා රු. මිලියන 22.9 ක්ද, නීත්‍යානුකූලව අයිතිය ලබා ගැනීමේ නෛතික කටයුතු සඳහා රු.652,500ක්ද වැය කර තිබුණි. එයට අමතරව සත්ව පාලනය සඳහා රු.මිලියන 5.2 ක් වැයකර තිබුණි.		පද්ධතිය සකස් කළ යුතු වීම.	ගැනීම සම්බන්ධව නඩු කටයුතු සිදු කරන බවත් දන්වා සිටිමි.	
11	1990 අංක 01 දරන දේපල පවරා ගැනීමේ පනතේ හදිසි නීති විධිවිධාන යටතේ සභාවට පවරා ඇති බලංගොඩ පොලිස් වසමේ හල්දලමුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ , වල්හපුතැන්න පතන වත්ත නැමැති අක්කර 01 රූඩ් 03 පර්චස් 30 ක ඉඩම හා එහි පිහිටි ගොඩනැගිල්ල 2021 පෙබරවාරි 25 දින රු. මිලියන 7.6 ක් වූ	2022	නිෂ්කාර්ය දේපල නඩත්තු කර ප්‍රයෝජනයට ගත යුතු වීම.	යෞවන සමාජ ප්‍රාදේශිය සම්මේලනයේ තරුණ තරුණියන් විසින් නඩත්තු කටයුතු කරන බව දන්වා සිටිමි.	නිර්දේශ අනුව කටයුතු කර නොතිබුණි.

	අගයකට තක්සේරු කර තිබුණද, වර්තමානයේ නිෂ්කාර්යව පවතින අතර, ඉඩමෙහි පවතින ගොඩනැගිල්ල නිසි පරිදි නඩත්තු නොකිරීම හේතුවෙන් විනාශ වීමේ අවදානමකට පත්ව තිබුණි.				
12	විධිමත් අනුමැතියකින් තොරව ආදායම් එකතුකිරීමේ ක්‍රියාවලියේ නිරතවී ඉතිරි කිරීම් ජංගම හා ස්ථාවර තැන්පත් විවෘත කරමින් සභාවට අයත් භෞතික හා මානව සම්පත් උපයෝජනය කර පවත්වාගෙන යනු ලබන ක්‍රීඩා සමාජ යටතේ සමාලෝචිත වර්ෂය අවසානයේ පැවති රු.මිලියන 11.61 ක ඉතිරි කිරීම් ගිණුමේ ශේෂය, රු.20,000 ක ජංගම ගිණුම් ශේෂය හා රු.මිලියන 16.25 ක ස්ථාවර තැන්පතු ශේෂය මූල්‍ය ප්‍රකාශන වලට ගෙන නොතිබුණු අතර වර්ෂය තුළ ලද ආදායම් රු.මිලියන 8.15 ක් හා වියදම් රු.මිලියන 7.93 ක් පිළිබඳ ප්‍රකාශයක්ද පිළියෙල කර නොතිබුණි. තවද, බැංකු ජංගම ගිණුම් සඳහා බැංකු සැසඳුම් ප්‍රකාශද පිළියෙල කර නොතිබුණි. එබැවින්	2022 2023	සභාවේ අංශයක් වශයෙන් පවතින ක්‍රීඩා සමාජය වත්කම්, වගකීම්, ආදායම්, වියදම් සභාවේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් විය යුතු බව	2024 මූල්‍ය ප්‍රකාශන සකස් කරන විට ජාතික තරුණ සේවා සභාවේ මූල්‍ය ප්‍රකාශන වලට ඇතුලත් කරන ලෙසට උපදෙස් දෙන ලදී.	නිර්දේශ අනුව කටයුතු කර නොතිබුණි.

	මෙම ක්‍රීඩා සමාජය විසින් රැස් කරන ලද ආදායම් හා ඒ මත දරන ලද වියදම් සහ වර්ෂය අවසානයේ පවතින ගිණුම් ශේෂ වල නිවැරදිතාවය පිළිබඳව විනිශ්වය කිරීමට නොහැකි වී තිබූ අතර මෙමඟින් මූල්‍ය අක්‍රමිකතා සිදුවීමට හැකි අවස්ථාද විගණනයෙන් බැහැර කිරීමට නොහැකි විය.				
14	16 නොවැම්බර් 2021 1/2021 දිනැති අංක පාර ව්‍යාදරන රාජ්‍ය ලේඛය මඟින් චක්‍ර හඳුන්වාදුන් මෙහෙයුම් 3.5 අත්පොතෙහි වගන්තියට පටහැනිව වෙනත් අමාත්‍යාංශ සඳහා නිලධාරින් දෙදෙනෙකු කිසිඳු අනුමැතියක් නොමැතිව මුදාහැර තිබුණි.	2023	චක්‍රලේඛය අනුව නිලධාරීන් මුදා හැරීම සිදු කළ යුතුයි.	නිළධාරින් සභාවට නැවත රාජකාරී සඳහා පැමිණ ඇත.	නිර්දේශ පරිදි කටයුතු කර තිබුණි.
15	2022 ජනවාරි 14 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2015(2) අනුව සභාවේ අධ්‍යක්ෂක ජනරාල් වරයා හා අධ්‍යක්ෂකවරු දෙදෙනෙකු චක්‍රලේඛ අනුව හිමිකම් ලබන ඉන්ධන දීමනාවට වඩා රු. මිලියන 2.48 ක ඉන්ධන උපයෝජනය කර තිබුණි.	2023	ඉන්ධන දීමනාව හිමි නිලධාරීන් චක්‍රලේඛ ප්‍රකාරව සහා අනුමැතිය ගෙන අතිරේක ඉන්ධන ලබා ගැනීම සිදු කළ යුතුය.	අමාත්‍යාංශ ලේකම්වරයාගෙන් අනුමැතිය ලබාගන්නා බව දන්වා සිටිමි.	නිර්දේශ අනුව කටයුතු කර නොතිබුණි.

16	2009 අප්‍රේල් 16 දිනැති 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව සභාවේ පළාත් කාර්යාල, දිස්ත්‍රික් කාර්යාල, පුහුණු මධ්‍යස්ථාන හා ගොවිපොළවල ඇඟිලි සළකුණු සටහන් කිරීමේ යන්ත්‍ර ස්ථාපිත කර නොතිබුණි.	2023	චක්‍රලේඛයට අනුගතව කටයුතු කළ යුතු අතර, ඇඟිලි සළකුණු යන්ත්‍ර ස්ථාපිත කිරීම කඩිනම් කළ යුතු බව	කමිටුවක් පත්කර ඇති අතර එම කමිටු නිර්දේශ මත පදනම්ව ඉදිරි කටයුතු සිදුකරන බව දන්වා සිටිමි.	නිර්දේශ අනුව කටයුතු කර නොතිබුණි.
17	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XV ඡේදයේ 11.1 වගන්තිය අනුව 2023 සැප්තැම්බර් මස 12 දින රු.මිලියන 39.40ක් වැය දරා විදේශ සංචාරයක් සඳහා ආර්ථික පන්තියේ ප්‍රවේශ පත්‍රයක් භාවිතා කිරීම වෙනුවට අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත රු.මිලියන. 2.77ක වැය දරා ව්‍යාපාරික පන්තියේ ප්‍රවේශපත්‍රයක් ලබාදී තිබුණි.	2023	චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු බව	සංචාරය සඳහා පිටත්ව යාමට සිදුවූයේ අවසන් මොහොතේ බැවින් පිරිමැසුම් පන්තියෙහි ටිකට්පත් කිසිවක් පිටත්ව යාමේදී ඉතිරිව නොමැති බැවින් එසේ ටිකට්පත් මිලදී ගැනීමට සිදුවූ බව දන්වා සිටිමි.	නිර්දේශ අනුව කටයුතු කර නොතිබුණි.
18	අමාත්‍යාංශය මගින් පත්කළ කමිටුව විසින් නිකුත් කර ඇති සේවක ගැටළු හා අක්‍රමිකතා පිළිබඳ නිර්දේශයන්හි නිර්දේශ අංක 10 නිර්දේශයට පටහැනිව තරුණ සේවා නිළධාරියෙකුට සහකාර අධ්‍යක්ෂ (ආවරණ) ඇතුළු තනතුරු ක් ලබාදී 03	2023	අමාත්‍යාංශ නිර්දේශ අනුව කටයුතු කළ යුතුය.	අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව ආවරණ තනතුරු ඉවත් කිරීමට අපේක්ෂිතය.	නිර්දේශ අනුව කටයුතු කර නොතිබුණි.

තිබුණි.

19	1979 අංක 69 දරන ජාතික තරුණ සේවා සභා පනතේ 4 (ඊ), 5(2)(උ) සහ 5(2)(ඌ) වගන්ති ප්‍රකාරව තරුණ තරුණියන් කෘෂිකර්ම ක්ෂේත්‍රයට නැඹුරු කිරීමට ගොවිපොළවල් ආරම්භ කිරීම අරමුණ වුවද, සභාවේ පවතින ගොවිපොළ 09ක පුහුණු පාඨමාලා පවත්වාගෙන යාමට කටයුතු කර නොතිබුණි.	2023	තරුණ තරුණියන් කෘෂිකර්ම ක්ෂේත්‍රයට නැඹුරු කිරීමට ගොවිපොළවල් ආශ්‍රිතව පාඨමාලා ආරම්භ කළ යුතුය.	සභාව සතුව පවතින ගොවිපළ 05ක කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාල පාඨමාලා මේ වන විට ක්‍රියාත්මක වන අතර, 2025 වර්ෂයේ ජනවාරි මස වන විට තවත් ගොවිපළ 04 ක කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාල පාඨමාලා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය.	නිර්දේශ අනුව කටයුතු කරමින් පවතී.
20	අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව සභාවේ අරමුණුවලට අදාළ නොවන දේශගුණික විපර්යාස මැඩලීම යන මැයෙන් වූ මාර්ගගත ක්‍රමය ඔස්සේ පෞද්ගලික හෝටලයක පවත්වා තිබූ වැඩසටහනක් සඳහා රු.මිලියන.1.19ක් වියදම් කර තිබුණි.	2023	සභාවේ අරමුණු අනුව වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුය.	සභාපති/තරුණ සේවා අධ්‍යක්ෂ ජනරාල් තුමාගේ උපදෙස් පරිදි 2023වර්ෂයේ නොවැම්බර් මස 05 වන දින පවත්වන ලද දේශගුණික විපර්යාස මැඩලීම පිළිබඳ වැඩමුළුව පවත්වන ලදී.	නිර්දේශ අනුව කටයුතු කර නොතිබුණි.
21	සභාපතිවරයාගේ අභිමතය පරිදි නිලධාරීන් හා විවිධ බාහිර ආයතන සඳහා සභාවේ ගොඩනැගිලි නොමිලේ හෝ වට්ටම් සහිතව ලබාදීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියක් නොමැති වුවද, පෞද්ගලික ආයතන සඳහා	2023	සභාවේ තීරණ ක්‍රියාත්මක කිරීමේදී අවාසිදායක නොවන තීරණ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ගෙන ක්‍රියාත්මක කළ යුතුය.	ගොඩනැගිලි වට්ටම් සහිතව හා නොමිලේ සැපයීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් ලබාගෙන නොමැති බව දන්වමි.	නිර්දේශ අනුව කටයුතු කර නොතිබුණි.

	ගොඩනැගිලි නොමිලේ සහ වට්ටම් සහිතව කුලියට ලබාදීම හේතුවෙන් රු.මිලියන 3.80ක බදු කුලී ආදායමක් සමාලෝචිත වර්ෂයේ සභාවට අහිමි කරගෙන තිබුණි.				
22	යෞවන සමාජවල තරුණ තරුණියන්ගේ දායකත්වයෙන් නව නිර්මාණ එළිදැක්වීම සභාවේ එක් අරමුණක් වුවද, ඊට පටහැනිව නළු නිළියන් සම්බන්ධ කරගෙන ටෙලිනාට්‍යයක් නිෂ්පාදනය කර ඒ සඳහා රු.මිලියන 4.83ක් දරා තිබූ අතර, මේ දක්වා එම ටෙලි නාට්‍ය කටයුතු ද අවසන් කර නොතිබුණි.	2022 2023	ව්‍යාපෘති ආරම්භ කිරීමේ අරමුණු ඉටුවන පරිදි සැලසුම් පිළියෙළ කර නිසි අධීක්ෂණයක් යටතේ ක්‍රියාත්මක විය යුතු අතර, රජයේ මුදල් අරපිරිමැසුම්දායක ව භාවිතා කිරීම ගැන විශේෂ අවධානය යොමු කළ යුතුය.	මෙම ටෙලි නිර්මාණය රූපවාහිනි නාලිකාවක් වෙත මුදල් අයකර ලබාදීමට කඩිනමින් කටයුතු කරන අතර ඉදිරියේදී මෙවන් අනාර්ථකාරී කාර්යයන් සඳහා යොමු නොවන ලෙස කටයුතු කරන බව දන්වා සිටිමි.	නිර්දේශ අනුව කටයුතු කරමින් පවතී.
23	2023 නොවැම්බර් 16 දින සිට 19 දින දක්වා පැවැත්වූ 34 වන ජාතික යෞවන ක්‍රීඩා උළෙල පැවැත්වීම වෙනුවෙන් රු. 9,696,450 ක ආහාර, වතුර බෝතල් හා ටී-ෂර්ට් මිලදී ගැනීමේදී තරගකාරී මිල කැඳවීමකින් තොරව මිල කමිටුවක් මගින් එය සිදුකර තිබුණි. මේ හේතුවෙන්, වෙළෙඳපොළේ පවතින තොග මිල අනුව මි.ලී. 500 පානීය ජල බෝතල් 20600 ක්	2023	ක්‍රියාකාරී සැලැස්මට අනුව අනුමත වූ කාර්යයන් සඳහා ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය අනුගමනය කිරීමට කටයුතු කළ යුතුය.	කිසිදු අවස්ථාවක රු.30.00ක මිල ගණනක් සමාගම විසින් ඉදිරිපත් කර නොමැති නිසා කිසිදු අවිධිමත් ගෙවීමක් සිදුකර නොමැති බව මෙයින් දන්වා සිටිමි.	නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.

	රු.30 බැගින් මිලදී ගැනීමට අවස්ථාව තිබියදී, එය නොසළකා රු.70 බැගින් මිලදීගෙන තිබීමෙන් රජයට රු.මිලියන 0.82ක පාඩුවක් සිදු කර තිබුණි.				
24	අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව 2023 දෙසැම්බර් 31 දින නෙළුම් කුළුණ පරිශ්‍රයේදී පැවැත්වුණු සංගීතමය වැඩසටහනට සභාව විසින් රු.මිලියන 10.29ක් වැය කර තිබුණද, එම වැඩසටහන පැවැත්වීමෙන් ලද රු.මිලියන 6.86ක ටිකට්පත් ආදායම සභාවට ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.	2023	සභාවේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී වඩාත් සැළකිලිමත්ව කටයුතු කළ යුතුය.	ගනු ලබන ඉදිරි ක්‍රියාමාර්ග විගණනය වෙත වාර්තා කර නොතිබුණි.	නිර්දේශ අනුව කටයුතු කර නොතිබුණි.
25	සභාව විසින් පසුගිය වර්ෂයන් තුළ රු.මිලියන 4.7ක් වැයකර ඇඟිලි සළකුණු සටහන් යන්ත්‍ර මිලදීගෙන තිබුණද ,එම යන්ත්‍ර නිසි ලෙස ක්‍රියාත්මක කර නොතිබීම නිසා ඌණ උපයෝජිතව පැවතුණි.	2023	කාර්ය මණ්ඩලයේ පැමිණීම පිටවීම ඇඟිලි සළකුණු යන්ත්‍රය මගින් සනාථ විය යුතුය.	කමිටුවක් පත්කර ඇති අතර එම කමිටු නිර්දේශ මත පදනම්ව ඉදිරි කටයුතු සිදුකරමි.	නිර්දේශ අනුව කටයුතු කර නොතිබුණි.
26	සභාවේ පරිපාලිත සමාගමක් වන යුත් සර්විසස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් සමාගමේ ගණකාධිකාරීවරයා ලෙස සේවය කිරීම	2023	සභාවේ ප්‍රධාන තනතුරු සඳහා පත් කිරීමේදී අභ්‍යන්තර පාලනය පිළිබඳ සැළකිළිමත් විය	මේ වන විට එම තත්වය නිවැරදි කර ඇති බව දන්වා සිටිමි.	නිර්දේශ අනුව කටයුතු කර තිබුණි.

	සඳහා රේඛීය අමාත්‍යාංශය විසින් මුදාහරින ලද ශ්‍රී ලංකා ගණකාධිකරණ සේවයේ නිලධාරියෙකු සභාවේ ප්‍රධාන අභ්‍යන්තර විගණක ලෙස රාජකාරී කරමින් සිටියදී අධ්‍යක්ෂ (මුදල්) තනතුරේද කටයුතු කිරීම සඳහා පත් කර තිබීම නිසා සභාවේ අභ්‍යන්තර පාලන පද්ධතිය දුර්වල වී තිබුණි.		යුතුය.		
27	සභාවේ ප්‍රධාන කාර්යාලයේ හා දිස්ත්‍රික් කාර්යාලවල සී/ස ශ්‍රී ලංකා ජාතික තරුණ සේවා සමූපකාර සමිති සංගමයේ කාර්යාල ස්ථාපිත කර තිබුණද ,ඒ සඳහා කිසිදු බදු කුලියක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	2023	සභාවට ලැබිය යුතු ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.	ඉදිරියේදි බදු කුලී අය කර ගැනීමට ක්‍රමවේදයක් සකස් කිරීමට සටහන් කර ගන්නා ලදි.	නිර්දේශ අනුව කටයුතු කර නොතිබුණි.
28	තරුණ තරුණියන් නව කෘෂි තාක්ෂණයට ඉක්මණින් අනුගත කරවීම අරමුණු කොට රු.මිලියන 250 ක ප්‍රතිපාදන යටතේ 2022-2025 වර්ෂ තුල ක්‍රියාත්මක කිරිමට සකස් කරන ලද කෘෂි ව්‍යවසායකත්ව වැඩසටහන හා තරුණ කෘෂි නිෂ්පාදන සමාගම් පිහිටුවීමේ වැඩසටහන කිසිඳු කාර්යයක් සමාලෝචිත වර්ෂයේදීද	2023	කෘෂි ව්‍යවසායකත්ව වැඩසටහන හා තරුණ කෘෂි නිෂ්පාදන සමාගම් පිහිටුවීමේ වැඩසටහන ස්ථාපිත කිරීම කඩිනමින් කළ යුතුය.	සමාලෝචිත වර්ෂයේ නියමිත පරිදි කෘෂි සමාගම් ක්‍රියාත්මක කිරිමට නොහැකි වුව ද මේ වන විටත් කෘෂි සමාගම් 21ක් ලංකාව පුරා ස්ථාපිත කර ඇත.	නිර්දේශ අනුව කටයුතු කරමින් පවතී.

	ක්‍රියාත්මක කර නොතිබුණි.				
29	සභාවේ ප්‍රධාන ගබඩාවේ පැවති වටිනාකම රු.මිලියන 3.5 ක්වූ අයිතම වර්ග 37ක් ප්‍රධාන ගබඩාවෙන් විවිධ පුද්ගලයන් හා විවිධ ආයතන වෙත තාවකාලික පදනමින් ලබා දී තිබූ අතර, ඒවා නැවත ප්‍රධාන ගබඩාව වෙත ලබා ගැනීමට හෝ වගකිව යුතු නිලධාරීන්ගෙන් එම වටිනාකම අයකර ගැනීමට හෝ කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.	2021 2022 2023	වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකිරීම් සිදුකර පද්ධතිය ක්‍රමවත් කළ යුතුය.	2021.11.16 දිනැති රාජ්‍ය ව්‍යවසායන් සඳහා වූ මෙහෙයුම් අත්පොතෙහි පරිච්ඡේද අංක 6.9හි සඳහන් පරිදි කටයුතු කිරීමට අපේක්ෂිතය.	නිර්දේශ අනුව කටයුතු කරමින් පවතී.
30	2020, 2021 සහ 2022 වර්ෂවලදී දෙහිවල පුහුණු මධ්‍යස්ථානයේ පාඨමාලා සඳහා ගාස්තු ගෙවා ලියාපදිංචි නොකරන ලද සිසුන් 341දෙනෙකු සඳහා තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ජාතික වෘත්තීය සුදුසුකම් සහිත (NVQ) සහතිකපත් පිරිනමා තිබුණි. තවද, සහතිකපත් නිකුත් කිරීමේ බලයක් පුහුණු මධ්‍යස්ථානයට නොමැති වුවද, ඊට පටහැනිව සභාවේ විභාග හා ඇගයීම් අංශයෙන් සනාථ නොවුණු සහතිකපත්	2023	සහතිකපත් නිකුත් කිරීමේදී විනිවිදභාවයෙන් කටයුතු කළ යුතුය.	නිකුත් කරන ලද සහතිකවල තොරතුරු Scan කර විභාග ඇගයීම් අංශයේ දත්ත පද්ධතියට ඇතුලත් කර සුරක්ෂිත කර ඇත.සඳහන් කර ඇති සහතිකපත් 791ද විභාග අංශයෙන් නිකුත් කර ඇත.	නිර්දේශ අනුව කටයුතු කර නොතිබුණි.

	791ක් පුහුණු මධ්‍යස්ථානය විසින් නිකුත් කර තිබුණි.				
31	තරුණ තරුණියන් කලාපීය ජාත්‍යන්තර තරුණ සම්මන්ත්‍රණ සහ වැඩමුළු සඳහා සහභාගී කරගැනීමට වෙන් කරන ලද රු.මිලියන 4.89ක ප්‍රතිපාදන උපයෝගී කර ගනිමින් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා, අධ්‍යක්ෂ (කාර්මික හා වෘත්තීය පුහුණු) හා තවත් කාන්තාවක් පමණක් විදේශ සංචාරවලට සහභාගී වී තිබුණි.	2023	ක්‍රියාකාරී සැලැස්ම අනුව වෙන් කරන ලද ප්‍රතිපාදන එම කාර්යයන් සඳහා යෙදවීමට කළමනාකරණය විසින් සිදුකළ යුතුය.	ගනු ලබන ඉදිරි ක්‍රියාමාර්ග විගණනය වෙත වාර්තා කර නොතිබුණි.	නිර්දේශ අනුව කටයුතු කර නොතිබුණි.
32	යෞවන සමාජ සම්මේලනය වෙත සමාලෝචිත වර්ෂයේදී ආධාර, දීමනා හා ණය මුදලක් ලෙස පිළිවෙළින් රු.මිලියන 4.65ක් , රු.මිලියන.1.93ක් හා රු.මිලියන 5ක් ලබාදී තිබූ අතර, එලෙස ලබාදුන් මුදල් උපයෝජනය පිළිබඳ කිසිදු පසුවිපරමක් සිදුකර නොතිබුණි. එසේම, ජාතික ක්‍රීඩා අරමුදල විසින් සභාවේ වැඩසටහනක් සඳහා ලබාදී තිබූ මුදලින් ඉතිරිව පැවති රු.මිලියන 1.4ක් ආපසු නොයවා	2023	සභාවේ භාණ්ඩාගාර ප්‍රතිපාදන ඒ සඳහා ඉල්ලුම් කරන ලද වැඩසටහන් අනුව භාවිතා කිරීම කළ යුතුය.	ගනු ලබන ඉදිරි ක්‍රියාමාර්ග විගණනය වෙත වාර්තා කර නොතිබුණි.	නිර්දේශ අනුව කටයුතු කරමින් පවතී.

	පොළොන්නරුව දිස්ත්‍රික් යෞවන සමාජ බල මණ්ඩලය වෙත ලබාදී තිබුණි.				
33	34 වැනි ජාතික යෞවන ක්‍රීඩා උළෙල වෙනුවෙන් මිලදී ගත් රු.මිලියන 0.73ක් වටිනා ටී-ෂර්ට් 768ක් එම උත්සවය නිමා වීමෙන් පසු ගබඩාවෙන් කිහිප අවස්ථාවකදී නිකුත් කර තිබූ අතර , ඉන් රු.මිලියන 0.32ක් වටිනා ටී-ෂර්ට් 337ක් එය ලබාගත් තැනැත්තා කවුරුන්ද යන්න සඳහන් නොකර අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය ලෙස සඳහන් කර ගබඩාවෙන් නිකුත් කර තිබුණි .තවද, පාසල් හා යෞවන සමාජ මට්ටමින් බෙදාහැරීම සඳහා මිලදීගත් රු.මිලියන 0.80ක පාපන්දු 100ක් අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය නමින් නිකුත් කර තිබුණි.	2023	භාණ්ඩාගාර ප්‍රතිපාදන අවශ්‍ය වැඩසටහන් සඳහා යෙදවීමේදී ඒවා අදාල වැඩසටහන සඳහාම යෙදවිය යුතුය.	ගනු ලබන ඉදිරි ක්‍රියාමාර්ග විගණනය වෙත වාර්තා කර නොතිබුණි.	නිර්දේශ අනුව කටයුතු කර නොතිබුණි.
34	සේවක අර්ථසාධක අරමුදල වෙත නියමිත පරිදි දායක මුදල් ප්‍රේෂණය නොකිරීම මත රු.මිලියන 0.21ක අධිභාරයක් සමාලෝචිත වර්ෂය තුළ ගෙවීමට සිදුවී තිබුණි.	2023	අලාභයන් සිදු නොවීමට කළමනාකරණය කටයුතු කළ යුතුයි.	ගම්පහ කම්කරු කාර්යාලය මගින් මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු දැමීම හේතුවෙන් අධිකරණ නියෝග මත මෙම මුදල ගෙවීමට හේතු වී ඇති බව දන්වා සිටිමි.	නිර්දේශ අනුව කටයුතු කර නොතිබුණි.

35	2021 වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් නොමැතිව බටහිර පළාත් අධ්‍යක්ෂ විසින් සපුගස්කන්ද පුහුණු මධ්‍යස්ථානයේ රොබෝටික් පුහුණු පාඨමාලාව ආරම්භ කිරීමේ අරමුණින් මිලදී ගන්නා ලද රු.මිලියන 17.42 ක උපකරණ එම පාඨමාලාව ආරම්භ කිරීමට අපොහොසත් වූ බැවින් සහ නිසිලෙස අවශ්‍යතාවය පුරෝකථනය නොකොට සමාලෝචිත වර්ෂයේදී මිලදීගත් එකතුව රු.මිලියන 7.70ක් වටිනා සම්මාන 31ක් හා පුටු හා වායු සමීකරණ උපකරණ ප්‍රයෝජනයට නොගෙන මේ දක්වාම නිෂ්කාර්යව පැවතුණි.	2023	නිෂ්කාර්ය සම්පත් ප්‍රයෝජනයට ගැනීම සඳහා කටයුතු කළ යුතුය	නව උපදේශකවරුන් යටතේ 2024.10.01 දින සිට නව පාඨමාලා ආරම්භ කිරීමට සැලසුම්කර ඇත. ඉදිරි වර්ෂයේ (2024) යෞවන සම්මාන තරගාවලියෙන් ජයග්‍රහණය කරනු ලබන ජයග්‍රාහකයින් සඳහා ප්‍රදානය කිරීමට හැකියාව ඇති බව දන්වා සිටිමි.	නිර්දේශ අනුව කටයුතු කරමින් පවතී.
36	ජාතික තරුණ සේවා සභාවේ සියයට 98 ක කොටස් හිමිකාරත්වයක් ඇතිව ශ්‍රී ලංකා යූත් සර්විසස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් සමාගම 1981 වර්ෂයේදී ආරම්භ කර තිබුණද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබූ අතර, සමාගම විසින්2020 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශන සකස් කර විගණනයට ඉදිරිපත් කර	**2021** 2022 2023	ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.	ඒකාබද්ධ කර 2024 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට උපදෙස් දී ඇති බව දන්වා සිටිමි.	නිර්දේශ අනුව කටයුතු කර නොතිබුණි.

නොතිබුණි.

37	ලැබිය යුතු ශේෂය රු.මිලියන 144.55ක්වූ අතර, ඉන් වර්ෂ 05ට වැඩි කාලයක සිට පැවත එන රු. මිලියන 18.75ක ශේෂයක් වුවද එය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	2023	ලැබිය යුතු ශේෂයන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.	ලැබිය යුතු ශේෂ වටිනාකම් 2024 වර්ෂයේදී අයකර ගැනීමට කටයුතු කරනු ඇත.	නිර්දේශ අනුව කටයුතු කරමින් පවතී.
38	2014 සිට 2023 වර්ෂයේ ආරම්භය දක්වා වූ කාල පරිච්ඡේදය තුළ ධාවනයෙන් ඉවත් කරන ලද වාහන 04ක් අපහරණ කිරීමට හෝ අළුත්වැඩියා කර නැවත භාවිතයට ගැනීමට හෝ කටයුතු නොකර සභාවේ හා පුහුණු මධ්‍යස්ථානවල ගාල්කර තිබුණි .තවද, තවත් වාහන 10ක් වර්ෂය පුරා ධාවනය කිරීමකින් තොරව නිෂ්ක්‍රීයව පැවතුණි.	2023	වත්කම් ගිණුම්ගත කළ යුතු බව හා අළුත්වැඩියා කිරීමක් හෝ අපහරණය කිරීමක් මගින් වාහන සඳහා කළ යුතුය.	ධාවනයෙන් ඉවත් කරන ලද වාහන වෙන්දේසි කිරීමටද ගාල්කර තිබෙන වාහන භාවිතා කරන බව දන්වා සිටිමි.	නිර්දේශ අනුව කටයුතු කරමින් පවතී.
39	1994 සිට 2014 දක්වා කාල පරිච්ඡේදය තුළ දේශපාලන හේතුන් මත විවිධ ගැටළුවලට මුහුණු දුන් අයට සහන සැලසීම සඳහා අමප අංක 17/0186/734/005 දරන හා 2017 පෙබරවාරි 02 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි විශ්‍රාම නිලධාරීන්ගෙන් යුත් කමිටුවක් පත් නොකර	2023	නිර්දේශ ලබාදුන් නිලධාරීන් 40 දෙනෙකුගේ උසස්වීම්, වැටුප් වර්ධක ලබාදීම්, හිග වැටුප් ගෙවීම් සමබන්ධයෙන් නැවත සළකා බැලිය යුතුය.	ඉදිරියේදී මේ සම්බන්ධයෙන් කටයුතු කරන බව දන්වා සිටිමි.	නිර්දේශ ක්‍රියාත්මක කරමින් පවතී.

	ඊට පටහැනිව පත් කරන ලද කමිටුවලින් නිර්දේශ ලබාගනිමින් නිලධාරීන් 40 දෙනෙකු සඳහා සහන ලබාදී තිබුණි.				
40	සභාවේ ප්‍රධානම මාණ්ඩලික තනතුරු 03ක් වන අධ්‍යක්ෂ (මුදල්), අධ්‍යක්ෂ(සංවර්ධන) හා අධ්‍යක්ෂ (පුහුණු) තනතුරු සඳහා ස්ථිර පදනමින් පත්වීම් සිදු නොකර ද්විතීය හා කොන්ත්‍රාත් පදනම මත පත්කිරීම වසර ගණනාවක් සිට සිදුකර තිබුණි. මේ සම්බන්ධයෙන් 2023 අගෝස්තු 19 දින අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව ස්ථිර පදනමින් සුදුසුකම් අනුව නිලධාරීන් බඳවා ගැනීමට අනුමත කර තිබුණද, මේ දක්වා එය සිදුකර නොතිබුණි.	2023	අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව ස්ථිර පදනමින් සුදුසුකම් අනුව නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කළ යුතුය.	සභාවේ ප්‍රධානතම මාණ්ඩලික තනතුරු 03 වන අධ්‍යක්ෂ(මුදල්)/ අධ්‍යක්ෂ(සංවර්ධන)/ අධ්‍යක්ෂ(පුහුණු) තනතුරු 03 සඳහා සුදුසුකම් සපුරන නිලධාරින් ස්ථිර පදනමින් බඳවා ගැනීමට කටයුතු සිදු කරමින් පවතී.	නිර්දේශ ක්‍රියාත්මක කරමින් පවතී.
41	සභාපතිවරයාගේ අභිමතය පරිදි සභාවේ කාර්ය මණ්ඩයේ නොමැති ස්වේච්ඡා තනතුරක් සඳහා පුද්ගලයෙකු බඳවාගෙන ඔහු වෙත සභාවේ නේවාසිකාගාරයේ නවාතැන් පහසුකම් හා අධ්‍යක්ෂ ජනරාල්වරයාට වෙන් කරන ලද වාහනය ඔහු	2023	රාජ්‍ය සම්පත් පරිහරණයේදී සැළකිලිමත්ව කටයුතු කළ යුතුය.	නැවත මෙවැනි තත්ත්වයක් ඇති නොවන බව දන්වා සිටිමි.	නිර්දේශ අනුව කටයුතු කර නොතිබුණි.

වෙත ලබා දී ඒ සඳහා ඉන්ධන සැපයීමෙන් රාජ්‍ය සම්පත් අවිධිමත්ව පරිහරණයට ඉඩ සලසා තිබුණි.

3.140 ශ්‍රී ලංකා භූ විද්‍යා ආයතනය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	අතිරික්තය (ඌනතාවය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	5,709,397	123,001	5,586,396	1,155,435	තත්ත්වාගණනය නොකළ
2022	5,757,162	40,000	5,717,162	144,266	තත්ත්වාගණනය නොකළ
2023	6,977,375	69,000	6,908,375	1,327,238	තත්ත්වාගණනය නොකළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණනිත ආයතනය විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ගය	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්වය
01	2014 අංක 3 දරන ශ්‍රී ලංකා භූ විද්‍යා ආයතන පනතේ 11 (1) වගන්තිය ප්‍රකාරව පරිසර විෂයය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත හා 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය කිරීම)පනත යටතේ පත් කරන ලද ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන රෙජිස්ට්‍රාර්වරයා වෙත වාර්ෂික වාර්තාව ඉදිරිපත් කළ යුතු වුවද, 2021 හා 2022 වර්ෂයන්ට අදාළ වාර්ෂික වාර්තා 2024 මාර්තු 31 දින දක්වා ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි.	2022 2023	පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.	පසුගිය වාර්ෂික වාර්තා සමඟ 2023 වර්ෂයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලබන බව.	මේ දක්වා ඉදිරිපත් කර නොතිබුණි.

02	2016 මාර්තු 21 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙහි 2 වන ඡේදය ප්‍රකාරව ආයතනයේ ලියාපදිංචි කාර්යාලය ස්ථාපිත කිරීම, පාලනය සහ පවත්වාගෙන යාමෙහි අවශ්‍යතාවය සඳහන් කර තිබුණද, ශ්‍රී ලංකා භූ විද්‍යා ආයතනය සඳහා ආරම්භයේ සිට සමාලෝචිත වර්ෂය දක්වාම ස්ථිර ලිපිනයක් සහිත කාර්යාලයක් නොතිබුණි.	2023	පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.	මේ සඳහා මූලික සාකච්ඡා පවත්වා ඇති අතර ඉදිරියේදී අවශ්‍ය කටයුතු සිදුකරනු ලබන බව.	මේ වන විටද ස්ථිර ලිපිනයක් සහිත කාර්යාලයක් නොමැත.

3.141 ජාතික ව්‍යාපාර කලමනාකාරීත්ව ආයතනය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	අතිරික්තය (ඌනතාවය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	3,060,307,320	983,854,302	2,076,453,018	201,818,410	තත්ත්වාගණනය නොකළ
2022	3,269,857,504	1,186,797,580	2,083,059,923	167,022,296	තත්ත්වාගණනය නොකළ
2023	3,628,169,613	1,579,789,518	2,048,380,095	211,684,932	තත්ත්වාගණනය නොකළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01	ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය විසින් ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව විද්‍යායතනයේ ආයෝජනය කර තිබුණු රු.මිලියන 800 ක මුදල සඳහා 2017 වර්ෂයේ සිට කිසිදු ප්‍රතිලාභයක් ලැබී නොතිබුණි.	2022	යෙදවූ ප්‍රාග්ධනයට ප්‍රමාණවත් ප්‍රතිලාභයක් ලබා ගැනීමට කටයුතු කල යුතුය.	බුංවත් භාවය (Solvency Test) පරීක්ෂාවේ දී ලාභාංශ ගෙවිය හැකි මට්ටමක නොපවතින බව ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව විද්‍යායතනයේ උපකුලපති විසින් 2022.03.14 දිනැති ලිපිය මගින් රේඛීය අමාත්‍යාංශයේ ලේකම්ට දන්වා ඇති බව.	ආයෝජනය කර ඇති රු.800,000,010ක් හා ඒ සඳහා පොළිය රු.1,081,434,224 ක් ලෙස එකතුව රු.1,881,434,234 ගෙවීමට එකගතාවය මත, අංක 24/0958/607/058-1 හා 2024 ජුනි 04 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව විද්‍යායතනය 2024 ජුලි 15 දින සිට 2007 අංක 07 දරන සමාගම් පනතේ 32 වගන්තිය යටතේ

					ඇපයෙන් සීමිත සමාගමක් ලෙසට පරිවර්ථනය කර තිබුණි.
02	2021 දෙසැම්බර් 02 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී, ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව විද්‍යායතනය ලාභාංශ නොගෙවීම සම්බන්ධයෙන් අවසන් තීරණයකට එළඹීම සහ මෙම NIBM හා NSBM ආයතන දෙකෙහි හැසිරීම සහ ව්‍යුහය අධීක්ෂණය සඳහා විශේෂඥ මණ්ඩලයක් පත්කරන ලෙස කමිටුව විසින් ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නියෝගයක් ලබා දී තිබුණද ඒ අනුව කටයුතුකර නොතිබුණි.	2022	පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නියෝග අනුව කටයුතු කල යුතුය.	විශේෂඥ මණ්ඩලය විසින් NIBM හි අනුබද්ධ ආයතනයක් ලෙස NSBM ආයතනය රාජ්‍ය ප්‍රතිපත්ති අනුව තිරසාර උසස් අධ්‍යාපන ක්‍රමයක් සංවර්ධනය කිරීම සඳහා සාමූහිකව තම කණ්ඩායම් අරමුණු සාක්ෂාත් කර ගත යුතු බව නිර්දේශ කර ඇති බව.	විශේෂඥ මණ්ඩලයේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.
03	ආයතනය විසින් ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන යනු ලබන කොළඹ පිහිටි ඉඩම සඳහා 2017 වර්ෂයේදී රු.මිලියන 50 ක් ගෙවීම් කර තිබුණද, 2024 අගෝස්තු 15 දින දක්වාම එම ඉඩමේ අයිතිය පවරා ගෙන නොතිබුණි.	2022	අයිතිය පවරා ගැනීම් කටයුතු කඩිනමින් සිදු කළ යුතුය.	තිබ්බිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් සමඟ කටයුතු කරමින් අදාළ පවරා ගැනීමට කටයුතු කරනු ලබන බව.	ඉඩමේ අයිතිය මේ දක්වා පවරා ගෙන නොතිබුණි.

04	2021 දෙසැම්බර් 02 දින පැවති රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් විගණකාධිපතිගේ නිරීක්ෂණ සමාලෝචය කරමින් කළමනාකරණ දෙපාර්තමේන්තුව හා එක්ව දිරිදීමනා ගණනය කිරීම සඳහා පිළිගත හැකි ක්‍රමවේදයක් සකසන ලෙසට උපදෙස් ලබා දී තිබුණද, 2024 අගෝස්තු 31 දින දක්වාම එම කාර්යය නිම කර නොතිබුණි.	2022, 2023	රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නිර්දේශ අනුව කටයුතු කළ යුතුය.	දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මගින් ආදායම් බදු ගණනය කිරීමේදී ඉවහල් කර ගනු ලැබූ ආදායම, දිරිදීමනා ගණනයේ දී භාවිතා කර ඇති අතර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු නිර්දේශය මත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමත කර ඇති ක්‍රමවේදයට අනුව දිරි දීමනා ගණනය කර ඇති බව.	මෙතෙක් නව ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.

3.142 ජාතික අධ්‍යාපන ආයතනය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	අතිරික්තය (ඌනතාවය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	7,684,794,739	499,104,306	7,185,690,433	(72,631,933)	තත්ත්වාගණනය කළ
2022	8,091,069,866	274,250,252	7,816, 819,614	572,939,994	තත්ත්වාගණනය කළ
2023	7,976,860,154	314,038,799	7,662,821,355	(150,995,694)	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්වය
01	“සැලසිනේ” රූපවාහිනී ආයතනය සමඟ 2021 දෙසැම්බර් 24 දින නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කිරීම සඳහා ගිවිසුමකට එළඹ තිබුණු අතර ගිවිසුම අනුව රූපවාහිනී වැඩසටහන් 05 ක් නිෂ්පාදනය කිරීමට රු.15,412,150 ක වියදමක් දරා තිබුණි. ඊට අදාළ ප්‍රචාරක වැඩසටහන් 2021 දෙසැම්බර් 29 දිනට ප්‍රථම අවසන් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අදාල වැඩසටහන් ප්‍රචාරණය කර නොතිබුණි.	2022	ගිවිසුම්ගත කාර්යයන් නියමිත දිනවලදී නිම කිරීමට කටයුතු කළ යුතුය.	අදාළ සැලැස්ම හා ප්‍රචාරණ ව්‍යාපෘතියේ ආරම්භක දිනය ගරු ජනාධිපතිතුමා විසින් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සලකා බැලීම සඳහා පත් කර ඇති කැබිනට් අනු කමිටුවේ නිර්දේශ ලබා දීමෙන් පසුව තීරණය කිරීමට නියමිත බව.	2022 වර්ෂයේ නිර්මාණය කරන ලද වැඩසටහන් 05 මේ වනවිටත් ප්‍රචාරණය කර නොතිබුණි.

02	ජාතික අධ්‍යාපන ආයතනයේ අනුමත බඳවා ගැනීමේ පටිපාටිය අනුව සුදුසුකම් සපුරා නොතිබුණු නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් තනතුරු දරන නිලධාරීන් දෙදෙනෙකු සම්බන්ධයෙන් 2022 වර්ෂයේ දී විගණනය විසින් පෙන්වා දුන් අඩුපාඩු සියල්ල ආයතනයේ කළමණාකරණය විසින් පිළිගෙන වර්ෂයක කාලයක් ගත වී තිබුණද සුදුසුකම් නොමැති නිලධාරීන් සඳහා තවදුරටත් අදාල වැටුප් හා දීමනා ගෙවමින් පැවතුණි.	2022,2023	අනුමත බඳවා ගැනීමේ පරිපාටිය අනුව බඳවා ගැනීම් හා උසස් කිරීම් සිදු කල යුතුය.වැරදි ලෙස ලබා දුන් උසස් කිරීම් නිවැරදි කල යුතුය.	ත්‍රි පුද්ගල කමිටුවක් පත්කර නිර්දේශ ලබාගෙන 2024 ජූනි 24 දින නීතිපති විමසා ඇති අතර ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	මෙතෙක් නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

3.143 ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	අතිරික්තය (ඌනතාවය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	2,954,570,810	450,775,029	2,504,065,781	(57,777,077)	තත්ත්වාගණනය කළ
2022	3,034,813,032	485,363,321	2,549,449,711	6,715,737	තත්ත්වාගණනය කළ
2023	4,248,235,309	486,028,328	3,762,206,981	(81,595,957)	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ගය	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01	2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 6.1 ඡේදය ප්‍රකාරව නිපුණතා ඉලක්ක සපුරා ගැනීම පිණිස සෑම නිලධාරියකුටම අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු කාලයක් ආවරණය වන පරිදි මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කල යුතුය. ඒ අනුව පුහුණු ප්‍රතිපත්තියක් සකස් කර ක්‍රියාත්මක කිරීම වෙනුවට එක් එක් නිලධාරියාට පෞද්ගලික වන සේ අධ්‍යක්ෂ අනුමැතිය මත නිලධාරීන් 10 දෙනකු වෙත 2020 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාල	2021	සෑම නිලධාරී කාණ්ඩයක් සඳහාම සුදුසු පරිදි පුහුණු ප්‍රතිපත්තියක් සකස් කර ක්‍රියාත්මක කළ යුතුය.	මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සඳහා තොරතුරු එක්රැස් කිරීම සඳහා ආකෘති පත්‍රයක් දැනටමත් සියලු දිස්ත්‍රික් කාර්යාල හා අනෙකුත් අංශ වෙත ලබා දී ඇති බව.	2024 වර්ෂය සඳහා ද සෑම නිලධාරී කාණ්ඩයක් සඳහාම සුදුසු පරිදි පුහුණු ප්‍රතිපත්තියක් සකස් කර ක්‍රියාත්මක කර නොතිබුණි.

	පරිච්ඡේදය සඳහා පශ්චාත් උපාධි හා වෙනත් පාඨමාලා සඳහා රු.1,338,537 ක් ප්‍රතිපූර්ණය කර තිබුණි. එහෙත් එම පාඨමාලා සම්පූර්ණ කල බවට කිසිදු සාක්ෂියක් ලබා ගෙන නොතිබුණි.				
02	2018 හා 2021 වර්ෂවල දුරකථන සේවා සමාගමකින් පිළිවෙලින් ටැබ් යන්ත්‍ර 450 හා 500 ක් ලැබී තිබුණු අතර කිසිදු අනුමැතියකින් හා ප්‍රතිපත්තියකින් තොරව අධිකාරියේ විවිධ තනතුරු දරන නිලධාරීන් සඳහා එම ටැබ් යන්ත්‍ර සමග සිම්පත් බෙදාහැර තිබුණි. එමෙන්ම සේවයෙන් ඉවත් වී සිටි නිලධාරීන් 35 දෙනෙකු වෙත නිකුත් කර තිබුණු ටැබ් යන්ත්‍ර ද ආපසු ලබා ගැනීමට 2022 දෙසැම්බර් 31 දින දක්වාම කටයුතු කර නොතිබුණි.	2021	ටැබ් යන්ත්‍ර බෙදාහැරීමේදී රාජකාරී අවශ්‍යතාව පිළිබඳ සැලකිලිමත් වියයුතු අතර සේවයෙන් ඉවත්වීමේදී නිලධාරීන් වෙත ලබාදී ඇති ටැබ් යන්ත්‍ර ආපසු ලබා ගැනීමට කටයුතු කළ යුතුය.	Tab යන්ත්‍ර බෙදා දීම සිදු කර ඇත්තේ අධිකාරියේ සභාපතිතුමා, උප සභාපතිතුමා සහ අධ්‍යක්ෂ ජනරාල් විසින් ලබා දී තිබු ලිඛිත අනුමැතිය යටතේ වන අතර යම් නිලධාරියෙක් එසේ ලබා දී නොතිබුනේ නම් එම යන්ත්‍ර නැවත ලබා ගැනීම සඳහා මේ වන විට උපදෙස් ලබා දී ඇති බව.	සේවයෙන් ඉවත්වූ නිලධාරීන් වෙත ලබාදී ඇති ටැබ් යන්ත්‍ර ආපසු ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.
03	හිඟ සේවක අර්ථසාධක අරමුදල් හා සේවක භාරකාර අරමුදල් වලට අදාලව ගෙවන ලද එකතුව රු.82,437,195 ක් වූ අධිභාර හා	2021	සේවක අර්ථසාධක අරමුදල් හා සේවක භාරකාර අරමුදල් ප්‍රමාදයකින් තොරව ගෙවීමට	මෙම අධිකාරියේ 2007 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර	මෙම අධිභාරය ගෙවීමට වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

	සේවකයාගෙන් අයවිය යුතු රු.58,908,280 ක් අදාල වගකිවයුතු නිලධාරීන්ගෙන් අය කිරීම වෙනුවට ඉකුත් වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.		කටයුතු කළ යුතුය.	අරමුදල් ගණනය කිරීමේදී සේවකයින්ගේ ජීවන වියදම් දීමනාව ඇතුලත් කර නොගැනීම හේතුවෙන් හිඟ සේවක දායක මුදල් වශයෙන් රු. 58,908,280.00 ක් සහ අධිභාරය ලෙස රු. 82,437,195.00 ක් ගෙවීම සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන් මේ වන විට අධිකාරියේ සේවයෙන් විශ්‍රාම ගොස් ඇති බැවින් එම මුදල් ඔවුන්ගෙන් අය කිරීමේ හැකියාවක් නොමැති බව.	
04	අනුමත කාර්ය මණ්ඩලයට අයත් නොවන හා බඳවාගැනීමේ පරිපාටියට පටහැනි ලෙස අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත කොන්ත්‍රාත් පදනම යටතේ අධිකාරිය සඳහා අධ්‍යක්ෂ තනතුරකට බඳවාගෙන අධිකාරියේ අරමුණට පරිබාහිර කාර්යභාර්යක් ඉටු කරමින් සිටි නිලධාරියෙකු වෙත	2021	අනුමත බඳවාගැනීමේ පටිපාටියට අනුකූලව බඳවාගැනීම් සිදු කළ යුතුය.	අධිකාරියේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද කාර්ය මණ්ඩලයේ ඇතුලත් තනතුරක් නොවන අධ්‍යක්ෂ තනතුරක් සඳහා එවකට කටයුතු කළ සභාපති තුමාගේ උපදෙස් අනුව පාලක මණ්ඩල අනුමැතිය මත කොන්ත්‍රාත් පදනම යටතේ	මෙම අනුමත නොවන බඳවා ගැනීම හා එම පුද්ගලයාට ගෙවන ලද අනුමත නොවන ගෙවීම් සම්බන්ධයෙන් විගණන දින වන විටත් කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි.

	2021 ජුලි සිට 2022 අගෝස්තු දක්වා එකතුව රු. 2,106,740 ක් වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණි.			නිලධාරියෙකු බඳවා ගෙන ඇත. නමුත් 2022 සැප්තැම්බර් මස සිට ඔහුගේ සේවය අවසන් කර ඇති බව.	
05	බහුකාර්ය සංවර්ධන කාර්යසාධක බලකා දෙපාර්තමේන්තුව සමඟ ඇතිකර ගත් ගිවිසුමකට අනුව 2020 වර්ෂයේ දී ආරම්භ කරන ලද රැකියාලාභීන් 100,000 ක් පුහුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා 2022 දෙසැම්බර් 31 දිනට රු.100,835,305 ක් වැයකර අපේක්ෂා කල රැකියාලාභීන්ගෙන් සියයට 35 ක් එනම් 34,660 දෙනෙක් පමණක් පුහුණුව නිමකර තිබුණි. මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් 2021 වර්ෂයේදී රු.4,650,800 ක් වැයකර තොරතුරු පද්ධතියක් ස්ථාපිත කර තිබුණ ද මෙමඟින් රැකියාලාභීන් රැකියාගත කිරිම පිළිබඳ තොරතුරු ලබා ගත නොහැකි වී තිබුණි.	2021 2022	ව්‍යාපෘතිවල කාර්යසාධනය වර්ධනය කර ගැනීමට කටයුතු කල යුතුය.	මෙම ව්‍යාපෘතිය යටතේ රැකියා ලාභීන් 100,000 ක් පුහුණු කිරීමට ඉලක්ක කලද එහි පලමු අදියරයේ පුහුණුව සාර්ථකව අවසන් කල රැකියාලාභීන් 34,660 ක් සඳහා 2023.08.31 වන දින වන විට සහතික පත්‍ර නිකුත් කර ඇති බව .	තොරතුරු පද්ධතිය මඟින් රැකියාලාභීන් රැකියාගත කිරීම පිළිබඳ තොරතුරු ලබා ගත හැකි පරිදි මෘදුකාංග සංවර්ධනය කර නොතිබුණි.

06	කර්මාන්ත සහයෝගීතා ආධුනිකත්ව පුහුණු මධ්‍යස්ථානය යටතේ Higher Diploma in Digital Technician පාඨමාලාව සඳහා විද්‍යාගාරයක් ස්ථාපනය කිරීම වෙනුවෙන් 2021 නොවැම්බර් 19 දින චීන තානාපති කාර්යාලය මඟින් රු.10,099,202 ක් වටිනා අයිතම 84 ක පරිත්‍යාගයක් ලැබී තිබුණි. 2022 වර්ෂය අවසාන වන විටද අදාල ඩිප්ලෝමා පාඨමාලාව ආරම්භ කිරීමට සහ පරිගණක විද්‍යාගාරය ස්ථාපනය කිරීමට කටයුතු කර නොතිබුණි.	2022	කාර්යසාධනය වර්ධනය සඳහා ලැබෙන ප්‍රතිලාභ කාර්යක්ෂම ලෙස උපයෝජනය කළ යුතුය.	Higher Diploma in Digital Technical යන පාඨමාලාව ආරම්භ කිරීම සඳහා අවශ්‍ය විද්‍යාගාර පහසුකම් 2022.04.22 දින විටත් සම්පාදනය කර තිබුණි. අධ්‍යක්ෂ මණ්ඩල තීරණ මත ඉදිරියේදී එම පාඨමාලාව ආරම්භ කරනු ලබන බව.	Higher Diploma in Digital Technical යන පාඨමාලාව වර්තමානය වන විටත් ආරම්භ කර නොතිබුණි.
07	පෙර දැනුම ඇගයීමේ ක්‍රියාවලියට (RPL) සහතිකපත් 5000 ක් බෙදාදීම සඳහා 2015 වර්ෂයේ දී මාතර දිස්ත්‍රික්කයේ පවත්වන ලද නිපුණතා අභිෂේක වැඩසටහනේදී සිදු වී තිබූ අක්‍රමිකතා සම්බන්ධයෙන් පවත්වන ලද විමර්ශනයට අදාල නිර්දේශ 2023 වර්ෂය වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි.	2022	විමර්ශන වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම කඩිනම්කළ යුතුය	ව්‍යාපෘතියට 2015 දී රු.මිලියන 101.9 ක් වියදම් කලද රු. මිලියන 66.41 පමණක් ප්‍රතිපූර්ණය කරන ලද අතර ඉතිරි රු.මිලියන 35.5 ක් ලැබිය යුතු ශේෂයක් ලෙස හඳුනා ගන්නා ලදි. රු.මිලියන 5.5 ක් හොල්සිම් ආයතනයෙන් ලැබුණි. ඒ අනුව ඉතිරි රු. මිලියන 29.9 ක අවසාන	අවසාන ගිණුම්වලින් මෙම ශේෂය ඉවත් කර තිබූ අතර විමර්ශන වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

				ගිණුම්වල නිරූපණය වන බව.	
08	ජාතික ආධුනිකත්ව හා පුහුණු කිරීමේ අධිකාරිය පිහිටුවීමේ අරමුණින් බැහැරව පුද්ගලයන් විදේශ රැකියා වලට යොමු කිරීමට 2022 වර්ෂයේදී ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් NAITA Foreign Employment (Private) Limited නමින් සමාගමක් පිහිටුවා බාහිර පුද්ගලයන්ගෙන් රු.මිලියන 1.2ක මුදලක් ලබාගෙන තිබුණද 2023 ඔක්තෝබර් 15 වන දින වන විටත් කිසිදු පුද්ගලයෙක් විදේශ රැකියා සඳහා යොමුකර නොතිබුණි. මෙම සමාගමේ ආදායම් හා වියදම්, පාලන ගිණුමක් මඟින් අධිකාරියේ ප්‍රධාන බැංකු ගිණුම හරහා සිදුකර තිබුණු අතර 2022 දෙසැම්බර් 31 දිනට මෙම පාලන ගිණුමේ ශේෂය රු.608,385 ක් ව තිබුණි. මෙම සමාගම පූර්ණ අක්‍රිය	2022	අධිකාරිය පිහිටුවීමේ අරමුණ ක්‍රියාත්මක කිරීමට විශේෂ අවධානය යොමු කළ යුතුය. එසේම අක්‍රීය තත්ත්වයේ බවතින ඒජන්සියේ බලපත්‍ර අලුත් කිරීම සඳහා ගෙවන ලද මුදල් එයට වගකිය යුතු නිලධාරීන්ගෙන් අය කිරීමට කටයුතු කළ යුතුය.	මේ වන විට එම සමාගම පූර්ණ අක්‍රිය තත්වයේ පවතී. සමාගම විසින් රු. මිලියන 1.2 ක ආදායම් උපයන ලද නමුත් කිසිදු පුද්ගලයෙක් මෙතෙක් විදේශ ගත කර නැති බව. 2022 වර්ෂයට අදාලව ප්‍රමාණවත් ගණුදෙනු නොමැති අතර පාලක ගිණුමක් හරහා සියළුම වියදම් හා ආදායම් ගිණුම්ගත කර ඇති බව.	මේ වන විට එම සමාගම පූර්ණ අක්‍රිය තත්වයේ පවතින අතර අරමුණින් බැහැරව කටයුතු කිරීමට වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

	තත්ත්වයේ පැවතුණද 2023 වර්ෂය සඳහා ද විදේශ රැකියා ඒජන්සියෙහි බලපත්‍රය අලුත් කිරීම සඳහා රු. 224,000ක් විදේශ සේවා නියුක්ති කාර්යාංශයට ගෙවා තිබුණි.				
09	කටුනායක ඉංජිනේරු තාක්ෂණ ආයතනයේ තාක්ෂණික පුහුණු කටයුතු වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති වටිනාකම තුළ ඇතුළත් රු.73,804,932ක් වූ පුහුණු උපකරණ 2024 අගෝස්තු 16 දින දක්වාම කටුනායක ඉංජිනේරු තාක්ෂණ ආයතනය වෙත ලැබී නොතිබුණි. තවද වටිනාකම රු.87,588,591ක් වූ පුහුණු උපකරණ භාවිතයට ගතහැකි වන පරිදි ස්ථාපිත නොකිරීම සහ එම උපකරණ භාවිතයට ගැනීමට අවශ්‍ය අනෙක් උපකරණ නොලැබීම හේතුවෙන් වසර 02කට අධික කාලයක සිට ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.	2023	ආයතනය වෙත ලැබී නොතිබුණ උපකරණ සම්බන්ධයෙන් පරීක්ෂා කර කඩිනමින් අදාල උපකරණ ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය.	නොලැබුණු පුහුණු උපකරණ පිළිබඳ ලේඛනයක් අමාත්‍යාංශය මඟින් පත් කරන ලද අධීක්ෂණ නිලධාරීන්ට හා KIP ආයතනය වෙත දන්වා යවා ඇති නමුත් මේ වන තෙක් නිසි ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බව.	විගණන දින වන විටත් අදාල උපකරණ ගෙන්වා ගැනීමට කටයුතු කර නොතිබුණි.

10	2020 වර්ෂයේදී සිසුන් 70 ක් බඳවා ගෙන තිබූ Mechanical General Engineering පාඨමාලාව සඳහා 2021 වර්ෂයේදී රු.661,111,008 ක වටිනා උපකරණ ලැබී තිබුණද මෙම උපකරණ ඵලදායීව උපයෝජනය කිරීමට කටයුතු සැලසුම් කර නොතිබීම හේතුවෙන් 2022 හා 2023 වර්ෂයන්හිදී ඇතුලත්ව තිබුණු සිසුන් සංඛ්‍යාව පිළිවෙලින් 31 ක් හා 25 ක් විය. ඒ අනුව 2020 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේ සිසුන් බඳවාගැනීම් සියයට 64 කින් අඩු වී තිබුණි.	2023	ව්‍යාපෘතිය අනුමත කර ගැනීමේදී සැලසුම් කර තිබූ පරිදි බඳවාගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව වැඩි කර ගනිමින් මෙම වත්කම් වලින් උපරිම ප්‍රයෝජනයක් ලබා ගැනීමට අධිකාරිය කටයුතු කළ යුතුය.	මෙම ක්ෂේත්‍රයෙහි රැකියාවල අඩුවීමක් ද ඇති වීම මත සිසුන් සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයට හා යාන්ත්‍රික ඉංජිනේරු ක්ෂේත්‍රයන්ට යොමු වීමේ අඩු වීමක් සිදු වූ බව	මෙම වත්කම් වලින් උපරිම ප්‍රයෝජනයක් ලබා ගැනීමට අධිකාරිය කටයුතු කර නොතිබුණි.

3.144 ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	අතිරික්තය (ඌනතාවය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	47,042,583	17,214,283	29,828,300	(3,003,852)	අහිතකර
2022	-	-	-	-	ගිණුම් ඉදිරිපත් කර නැත
2023	-	-	-	-	ගිණුම් ඉදිරිපත් කර නැත

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්වය
01	2018 ජනවාරි 24 දින සිට මාස 09 ක කාලයකින් ප්‍රධාන ගොඩනැගිල්ල නවීකරණය කිරීම නිම කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශය විසින් රු.211,937,795 ක් වූ බදු රහිත කොන්ත්‍රාත්තුවක් කොන්ත්‍රාත් සමාගමකට ලබා දී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වනවිට රු.252,463,612 ක් ගෙවා අවස්ථා 03 කදී කොන්ත්‍රාත් කාලය දීර්ඝ කරගෙන තිබුණද, 2021 මාර්තු කොන්ත්‍රාත්තුව නවතා දමා තිබුණි. 2021 ජනවාරි 05	2021	කොන්ත්‍රාත්තුවේ වැඩ නියමිත පරිදි නිමකර ගැනීමට කටයුතු කළ යුතුය.	ගොඩනැගිල්ලේ ඉතිරි නවීකරණ කටයුතු තරඟකාරී වෙළෙඳපොළේ මිල ගණන් කැඳවීමක් හරහා සුදුසු පාර්ශවකරුවෙකු තෝරා ගන්නා ලෙස නිර්දේශ වී ඇති බව.	හඳුනාගෙන තිබුණු අඩුපාඩු කිසිවක් සම්පූර්ණ කර නොතිබුණු අතර ඉතිරි නවීකරණ කටයුතු ද ආරම්භ කර නොතිබුණි.

දිනැති අංක 15-02-07 දරන සභාපතිගේ ලිපිය අනුව බිම් මහලේ සිට සිව්වන මහල දක්වා අසම්පූර්ණ හා නියමිත පරිදි නිම නොකළ කොන්ත්‍රාත් කාර්යයන් හඳුනාගෙන තිබුණු නමුත් එම අඩුපාඩු කිසිවක් සම්පූර්ණ කර නොතිබුණි.

3.145 ජාතික මූලික අධ්‍යයන ආයතනය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	අතිරික්තය (ඌනතාවය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	815,020,146	426,633,037	388,387,109	(102,650,637)	තත්ත්වාගණනය කළ
2022	1,122,200,895	296,294,091	825,906,804	82,707,333	තත්ත්වාගණනය කළ
2023	1,205,248,123	322,825,301	882,422,822	4,242,947	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01.	**විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**				
	එකතුව රු.100,040,521ක් වූ පර්යේෂණ ව්‍යාපෘති සඳහා ගිවිසුම් ලිපිගොනු හා අනිකුත් ලේඛන විගණනයට ඉදිරිපත් නොකෙරුණි.	2023	විගණනයට අදාළ සියලු තොරතුරු ඉදිරිපත් කළ යුතුය.	අදාළ ලිපි ගොනු විගණනය සඳහා ඉදිරිපත් කර ඇති බව.	පර්යේෂණ ව්‍යාපෘතිවලට අදාල කිසිදු තොරතුරක් මෙම වාර්තාවේ දිනය දක්වාම ඉදිරිපත් කර නොතිබුණි.
02.	**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**				
(අ)	2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.12 ඡේදය ප්‍රකාරව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තුමේන්තුවේ හා මහා භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව 2019 වර්ෂයේ සිට 2023 දෙසැම්බර් 31	2023	චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය.	රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තුමේන්තුවේ හා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය වෙනම ලබා ගැනීමක් සිදු කර නොමැති බව හා වර්ෂයේ අයවැය ලේඛනයට එම මුදල ඇතුළත් කර ඇති බව.	මේ වන විට රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තුමේන්තුවේ හා මහා භාණ්ඩාගාරයේ අනුමැතියන් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් ඇත.

	දින දක්වා කාලයට අදාළව ආයතනයේ දායකත්වය වශයෙන් රු.6,582,112 ක මුදලක් සේවක අග්‍රහාර රක්ෂණ අරමුදල වෙතද, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රු.4,300,820 ක මුදලක් සේවක තේ පැන් සංග්‍රහ වියදම් ලෙසද ගෙවා තිබුණි.				
(ආ)	2021 නොවැම්බර් 16 දිනැති අංක PE/ 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3.2 ඡේදය ප්‍රකාරව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත ආයතනයේ විගණිත වාර්තාව සමඟ පසුගිය වර්ෂයේ කාර්යසාධනය ඇතුළත් වාර්ෂික වාර්තාව භාෂා ත්‍රිත්වයෙන් පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත් 2020, 2021 හා 2022 වර්ෂයන්ට අදාළව වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.	2023	චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය.	අදාළ සංශෝධනයන් සිදු කර අමාත්‍යාංශය වෙත මේ වන විට යොමු කර ඇති බව.	2021 හා 2022 වර්ෂවලට අදාල වාර්ෂික වාර්තා 2024 සැප්තැම්බර් 30 දක්වා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.
03.	**මෙහෙයුම් සමාලෝචනය**				
3.1	**කළමනාකරණ අකාර්යක්ෂමතා**				
(අ)	පේටන්ට් බලපත්‍රය අලෙවි කිරීමෙන් පසු	2022	ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ	2014 වර්ෂයෙන් පසු මුදල් වැය කර	මෙම ව්‍යාපෘතිය වෙනුවෙන්

	ආයතනය විසින් ඒ සඳහා වියදම් දැරිය යුතු බවට ගිවිසුමේ කිසිදු බැඳීමක් නොතිබියදී 2014 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසාන දිනය දක්වා කාලය තුළ Biofilm Bio Fertilizer ව්‍යාපෘතියේ පර්යේෂණ කටයුතු වෙනුවෙන් රු.138,931,059 ක මුදලක් වැය කර තිබුණි. එසේ වුවද එම පේටන්ට් බලපත්‍රය අලෙවි කළ සමාගමේ විගණිත මූල්‍ය ප්‍රකාශන මගින් ආදායමේ නිවැරදිතාවය තහවුරු කර ගැනීමකින් තොරව 2014 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා රු.7,380,146 ක් Royalty Payment වශයෙන් ලබාගෙන තිබුණි.		යුතුය.	ඇත්තේ මෙම ව්‍යාපෘතියේ සොයා ගැනීම් අනෙකුත් බෝග සඳහා භාවිතයට ගත හැකි ආකාරය නිරීක්ෂණය කිරීමටත් යූරියා පොහොර භාවිතය සම්පූර්ණයෙන් නතර කොට කොම්පෝස්ට් පොහොර පමණක් වී වගාව සඳහා භාවිතා කිරීමට ඇති හැකියාව නිරීක්ෂණය කිරීම සඳහා වන බව.	තවදුරටත් වාර්ෂිකව වියදම් දරමින් පවතී.
(ආ)	ආයතනය සතු සේවක අර්ථසාධක අරමුදලට අයත් ස්ථාවර තැන්පතු ගිණුම් 20 කට අදාළ කල් පිරී තිබුණු රු.201,880,632 ක ආයෝජනයන් සමාලෝචිත වර්ෂය තුළ නැවත ආයෝජනය කිරීමේදී මිල ගණන් කැඳවීමකින් තොරව එම බැංකුවේම ආයෝජනය කර තිබුණි.	2023	අරමුදල් කාර්යක්ෂම හා උපරිම ප්‍රතිලාභ අත්වන අයුරින් ආයෝජනය කළ යුතුය.	පැවති ආර්ථික අර්බුදයන් හමුවේ පොලී අනුපාත එක් වරම ඉහළ ගිය බැවින් ආයතනයට විධිමත්ව මිල ගණන් කැඳවා එය සිදු කිරීමට කල් ගත වන බැවින් වාචිකව මිල ගණන් විමසා හොඳම විකල්ප ආයෝජනය සිදු කර ඇති බව.	2024 සැප්තැම්බර් 30 දින වන විටදීද නිවැරදි වී නොතිබුණි.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

(අ)	2021 වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට රු.47,485,576 ක් වැය කර ක්‍රියාත්මක කරමින් තිබුණු ක්වොන්ටම් භෞතික විද්‍යාව හා ව්‍යවහාරික ඉලෙක්ට්‍රොනික ("Quantum Physics and Applied Electronic") පර්යේෂණ ව්‍යාපෘතිය භාර විද්‍යාඥවරයා 2020 සැප්තැම්බර් 02 දින ආයතනයෙන් ඉල්ලා අස්වී තිබීම හේතුවෙන් එම පර්යේෂණ ව්‍යාපෘතිය තවදුරටත් ක්‍රියාත්මක නොකර අතහැර දමා තිබුණි.	2021	අපේක්ෂිත අරමුණු ඉටු කරගත හැකි වන අයුරින් පර්යේෂණ අඛණ්ඩව කරගෙන යා යුතුය.	මෙම පර්යේෂණ ව්‍යාපෘතියෙහි විද්‍යාඥයා 2020 සැප්තැම්බර් මාසයේදී ඉල්ලා අස්වූ බවත් පර්යේෂණයේ ඉදිරි කටයුතු වෙනත් විද්‍යාඥවරයෙකුට භාරදී නොතිබුණු බව.	ඉල්ලා අස් වූ විද්‍යාඥයා ස්වෙච්ඡා පදනම මත බඳවාගෙන ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණි.
(ආ)	2022 වර්ෂය අවසාන දින වන විට රු.6,500,000 ක් වැය කර ක්‍රියාත්මක වෙමින් තිබුණු Waste water Treatment at Service Station පර්යේෂණ ව්‍යාපෘතිය හා පසුගිය වසර 03 ක කාලය තුළ ක්‍රියාත්මක කරන ලද වටිනාකම සොයාගත නොහැකි වූ පර්යේෂණ ව්‍යාපෘති 03 ක් 2022 වර්ෂය අවසන් වන විට ක්‍රියාත්මක නොකර අතරමඟ නවතා දමා තිබුණි.	2022	අපේක්ෂිත අරමුණු ඉටු කර ගත හැකි වන අයුරින් පර්යේෂණ කටයුතු අවසන් කළ යුතුය.	පර්යේෂණයේ ඉදිරි කටයුතු සඳහා ප්‍රතිපාදන හා පර්යේෂණ සහකරුවන් නොමැති වීම හේතුවෙන් ඉදිරියට කරගෙනයාමට නොහැකි වී ඇති බව.	පර්යේෂණ සහායකයින් සහ ඊට අදාල කාර්යය මණ්ඩල නොමැති වීම හේතුවෙන් එකී පර්යේෂණ ප්‍රදාන ආයතනයට අහිමිවී තිබුණි.

(ඇ)	සමාලෝචිත වර්ෂයේ අනුමත ප්‍රසම්පාදන සැලැස්මෙන් බැහැරව හා අනුමැතියකින් තොරව රු.14,350,305 ක ප්‍රසම්පාදන කාර්යයන් 07 ක් සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කර තිබුණි.	2023	අනුමත ප්‍රසම්පාදන සැලැස්මට අනුව කටයුතු කළ යුතුය.	පරිසර අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ දඹුල්ල රුක් උද්‍යානයේ ක්‍රියාත්මක ව්‍යාපෘති 7 කඩිනමින් නිම කිරීමට උපදෙස් ලබා දී තිබූ බැවින් ප්‍රසම්පාදන සැලැස්මෙහි ඇතුළත් කර නොමැති බව.	2024 සැප්තැම්බර් 30 දක්වාම නිවැරදි කර නොතිබුණි.
3.3	**අරමුදල් ඌන උපයෝජන**				
(අ)	ආයතනය ආරම්භයේ සිට මේ දක්වා පර්යේෂණ ව්‍යාපෘති 06 කට අදාළව ලැබී තිබුණු පේටන්ට් බලපත්‍ර 06 ක් සමාලෝචිත වර්ෂය අවසාන දිනය වන විටත් අලෙවි කිරීමට හෝ වෙනත් ආකාරයකින් උපයෝජනය කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.	2023	පේටන්ට් බලපත්‍ර ප්‍රශස්ථ අයුරින් උපයෝජනය කළ යුතුය.	දැනට සක්‍රීයව පවතින පේටන්ට් බලපත්‍ර සඳහා ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර ඇති බව.	2024 සැප්තැම්බර් 30 දක්වාම වාණිජකරණයට ලක් කර නොතිබුණි.
(ආ)	සමාලෝචිත වර්ෂයේදී පර්යේෂණ ප්‍රදාන 09 කට අදාළ එකතුව රු.1,333,984 ක අරමුදල් වර්ෂයේ දෙසැම්බර් 31 දක්වාම උපයෝජනය නොකර නිෂ්කාර්යව පැවතුණි.	2023	අරමුදල් අදාල කාර්යයන් සඳහා ඵලදායී ලෙස උපයෝජනය කළ යුතුය.	2024 වර්ෂය තුළ දී ව්‍යාපෘති 03 ක අරමුදල් භාවිතයට ගෙන ඇති අතර ඉතිරි මුදල් පර්යේෂණ අරමුදලට බැර කිරීමට නියමිත බව.	පර්යේෂණ ප්‍රදාන 06 ක අරමුදල් 2024 සැප්තැම්බර් 30 දක්වාම උපයෝජනය කර නොතිබුණි.

3.146 ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	අතිරික්තය (ඌනතාවය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	139,624,913	66,959,124	72, 665,788	(826,262)	තත්ත්වාගණනය නොකළ
2022	230,061,731	73,818,083	156,243,647	(10,255,583)	තත්ත්වාගණනය කළ
2023	219,305,324	85,183,032	134,122,292	(11,341,231)	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණ	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01	අධිකාරිය පිහිටුවා වසර 20 ක් ගත වූ පසුව ළමා ආරක්ෂාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සඳහා 2019 ඔක්තෝබර් 29 දින අනුමැතිය ලැබී තිබුණද මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අදාල පස් අවුරුදු ක්‍රියාකාරී සැලැස්ම සඳහා කැබිනට් අනුමැතිය ලබා ගැනීමට 2023 වර්ෂයේ අවසන් දිනය දක්වාම අපොහොසත්වී තිබුණි. ජාතික ප්‍රතිපත්තිය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නීතිමය, පරිපාලනමය හෝ වෙනත් සංශෝධන නිර්දේශ	2021	ළමා ආරක්ෂක ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට කඩිනම් පියවර ගත යුතුය.	ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තු නිර්දේශ ලබා ගැනීමෙන් අනතුරුව ඉදිරි කටයුතු සිදු කිරීමට නියමිතය.	ළමා ආරක්ෂණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අදාල පස් අවුරුදු ක්‍රියාකාරී සැලැස්ම අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම සඳහා රේඛීය අමාත්‍යාංශය වෙත 2024.09.13 වන දින යොමු කර ඇත.

	කිරීමේ කාර්යයන්, ළමා අපචාර වැළැක්වීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව ආණ්ඩුවට උපදෙස් දීම ඇතුළු ඊට අනුශාංගික කාර්යයන් ද ඉටු වී නොතිබුණි.				
02	2014 වර්ෂයේ සිට ජාතික ළමා ආරක්ෂක අධිකාරියට භාවිතයට ගන්නා ලෙස වාචිකව පවරන ලද මුලතිවු දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් ගොඩනැගිල්ල වාර්තාවේ දිනය දක්වාම කිසිදු ප්‍රයෝජනයකට නොගෙන නිෂ්කාර්යව පැවතුණු අතර මෙම ගොඩනැගිල්ලේ ආරක්ෂක සේවා සැපයීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී පමණක් රු.1,084,684 ක් වැය කර තිබුණි.	2022, 2023	ගොඩනැගිල්ල ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය.	අමාත්‍යාංශය විසින් මෙම අධිකාරිය වෙත ලිපියක් යොමු කරමින් මෙම ගොඩනැගිල්ල විධිමත්ව අමාත්‍යාංශය වෙත පවරා දෙන ලෙස දැනුම් දී ඇති අතර, ඒ අනුව කටයුතු කරමින් පවතී.	ගොඩනැගිල්ල විධිමත්ව අමාත්‍යාංශය වෙත පවරා දී නොමැති අතර කිසිදු ප්‍රයෝජනයකට ගෙන නොමැත.
03	ජාතික ළමා ආරක්ෂක අධිකාරියට යාබද ඉඩම රු.18,317,757 ක වටිනාකමකට 2016 වර්ෂයේදී වර්ෂ 30ක කල් බදු පදනම සඳහා ලබාගෙන තිබුණද එම ඉඩම වාර්තාවේ දිනය දක්වාම කිසිදු කාර්යයකට යොදා නොගෙන නිෂ්කාර්යව පැවතුණි	2021, 2022, 2023	ඉඩම ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය.	ජාතික ළමා ආරක්ෂක අධිකාරී පරිශ්‍රයේ පවතින ඉඩ පහසුකම් සීමා වීම සහ සේවා ව්‍යාප්ත කිරීමේ අරමුණින් සැලසුම් කරන ලද ඉදි කිරීමක් වෙනුවෙන් මෙම ඉඩම කල්බදු ලෙස ලබා ගෙන තිබුණ නමුත්, මෙම ඉඩමෙහි යෝජිත ඉදිකිරීම්	කිසිදු කාර්යයකට යොදා නොගෙන නිෂ්කාර්යව පැවතුණි.

සඳහා මුදල් අමාත්‍යාංශ ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා දිගින් දිගටම සාකච්ඡා කළ ද ඒ සම්බන්ධ ප්‍රතිපාදන වෙන් කිරීමක් සිදු කර නොමැති බැවින් ඉදිරි කටයුතු සිදු කිරීමට නොහැකි වී ඇත.

3.147 තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	අතිරික්තය (ඌනතාවය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	125,473,605	43,192,746	82,280,859	(3,548,803)	තත්ත්වාගණනය කළ
2022	234,588,648	47,440,614	187,148,034	23,722,454	තත්ත්වාගණනය කළ
2023	251,206,574	39,715,742	211,490,832	11,065,996	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණ	විගණන වාර්තාවේ වර්ෂය	විගණකාධිපතිගේ නිර්දේශය	විගණිත ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්වය
01	2023 අප්‍රේල් 20 දින වන විට තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි වී තිබුණු ආයතන අතරින් ලියාපදිංචිය කල් ඉකුත් වී වසර 20 ට වැඩි කාලයක් ගත වී තිබූ ආයතන 20 ක් සම්බන්ධයෙන් හා වසර 01 ත් වසර 20 ත් අතර කාලයක් කල් ඉකුත් වී තිබූ ආයතන 1763 ක් සම්බන්ධයෙන් ලියාපදිංචිය අලුත් කිරීම සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.	2022	ලියාපදිංචිය කල් ඉකුත් වූ ආයතනයන්හි ලියාපදිංචිය අලුත් කිරීමට හෝ ලියාපදිංචිය අවලංගු කිරීමට හෝ කටයුතු කල යුතුය.	ලියාපදිංචිය අවසන් වීමට මාස 3කට පෙර ඔවුන් වෙත ලියාපදිංචිය අලුත් කිරීම සඳහා ඉල්ලුම් කරන ලෙස දන්වා යවා ඇති බව	ලියාපදිංචිය අලුත් කිරීම සඳහා විධිමත් වැඩ පිළිවෙලක් සකස් කර නොතිබුණි.
02.	2017 වසරේ සිට 2023 වසර දක්වා ආයතන 371 ක් ලියාපදිංචිය අලුත්කර ගැනීම සඳහා	2022	පනතෙහි දක්වා ඇති විධිවිධාන ප්‍රකාරව ලියාපදිංචිය අලුත් කිරීමට හෝ	ආයතනය ආරම්භ කිරීමේ සිට මේ දක්වා ලියාපදිංචි වී ඇති	ලියාපදිංචිය අලුත් කිරීම සඳහා විධිමත් වැඩ පිළිවෙලක්

	ඉල්ලීම්කර තිබුණ ද විගණිත දිනය වන විට ද එම ආයතනවල ලියාපදිංචිය අලුත් කර නොතිබුණි.		පරීක්ෂාවකින් පසු අනීතික ක්‍රියාවන්හි යෙදෙන ආයතන නම් ලියාපදිංචිය අවලංගු කිරීමට හෝ කඩිනමින් පියවර ගත යුතුය.	ආයතන අතුරින් බොහෝ ආයතන වසා ඇති බව නිරීක්ෂණය වූ අතර, ඒවා වසා ඇති ආයතන ලෙස නම් කිරීමට කටයුතු කරමින් පවතී.	සකස් කර නොතිබුණි. 2022 හා 2023 වර්ෂ වලදී ලියාපදිංචිය අලුත් කිරීම සඳහා ඉල්ලුම් කරන ලද ලියාපදිංචිය කල් ඉකුත් වූ ආයතන 62ක් සඳහා 2024 සැප්තැම්බර් 30 දින වන විටත් ලියාපදිංචිය අළුත් කර හෝ අවලංගු කර නොතිබුණි.
03.	ලියාපදිංචිය කල් ඉකුත් වූ ආයතන නැවත ලියාපදිංචි කිරීමට සහ එම ආයතන ලියාපදිංචිය අලුත් නොකර වෘත්තීය පුහුණු කටයුතු දිගටම සිදු කරන බවට ක්‍රමානුකූලව පරීක්ෂා කිරීම සඳහා වැඩපිළිවෙලක් සකස්කර නොතිබීම හේතුවෙන් වෘත්තීය පුහුණු ආයතන සම්බන්ධයෙන් කොමිෂන් සභාවෙන් ඉටුවිය යුතු නියාමනය නිසි පරිදි සිදු වී නොතිබුණි.	2023	වෘත්තීය පුහුණු ආයතන සම්බන්ධයෙන් කොමිෂන් සභාවෙන් ඉටුවිය යුතු නියාමනය නිසි පරිදි ඉටු කිරීමට කටයුතු කළ යුතුය.	ලියාපදිංචිය අළුත් නොකර ඇති බොහෝ ආයතන මේ වන විට වසා ඇති බව නිරීක්ෂණය කර ඇත. ලියාපදිංචිය නොලබා පවත්වාගෙන යනු ලබන ආයතනය මඟින් face bookවල පළ කරනු ලබන දැන්වීම් වලට ප්‍රතිවිරුද්ධව දැන්වීම් මෙම කොමිෂන් සභාවෙන් පළ කරනු ලබන බව.	පනතේ මේ සම්බන්ධයෙන් අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමට අදාල උසාවිය නම් කර නොමැති බැවින් එවැනි ආයතනවලට විරුද්ධව නීත්‍යානුකූලව කටයුතු කිරීමට තවදුරටත් නොහැකි වී ඇති බව කොමිෂන් සභාව විසින් දැනුම් දී ඇත.
04.	2016 පෙබරවාරි 26 දිනැති අංක MSDVT/SSDP/2016-1 දරන නිපුණතා	2023	නියාමන ආයතනයක් ලෙස කොමිෂන් සභාවේ වගකීම් ඉටුවන සේ	පසුගිය වකවානුව තුළ රටේ පැවැති ආර්ථික පසුබෑම	2024 වර්ෂයේදී මේ සම්බන්ධයෙන් ආයතන දැනුවත්

	සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශයේ චක්‍රලේඛය අනුව වෘත්තීය පුහුණු ආයතන මගින් ඉටුකරන සේවාවන් වඩාත් ගුණාත්මක හා ඉහල තත්ත්වයකින් ක්‍රියාත්මක කිරීමේ අරමුණින් තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හඳුන්වා දී ඇති තත්ත්ව කළමනාකරණ පද්ධතිය හෝ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ පවතින ISO 9001:2008/2015 තත්ත්ව කළමනාකරණ පද්ධතිය වෘත්තීය පුහුණු ආයතන විසින් ස්ථාපිත කිරීම අනිවාර්ය කර තිබුණි. එසේ වුවද මේ සම්බන්ධයෙන් අදාල ආයතන දැනුවත්කර එපරිදි කටයුතු කිරීම සඳහා කොමිෂන් සභාව විසින් 2019 වර්ෂයෙන් පසුව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.		ක්‍රියාත්මක විය යුතුය.	තුළ බොහෝ ආයතනවල තත්ත්ව කළමනාකරණය සිදුකිරීමට නොහැකි තත්ත්වයක් උදා වුණි. කෙසේ වුවද පැවතුන ආයතනවල තත්ත්ව පද්ධතිය ක්‍රියාත්මක කරගෙන යාමට උපදෙස් ලබා දුන් බව.	කිරීම සඳහා වැඩසටහන් පැවැත්වීමට කටයුතු කර තිබුණි.එසේ වුවද කොමිෂන් සභාවේ දත්ත පද්ධතියට අනුව 2019 වර්ෂයෙන් පසුව තත්ත්ව කළමනාකරණ පද්ධති ස්ථාපිත කර නොතිබුණි.
05.	2023 සැප්තැම්බර් 01 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ අනුකාරක සභාව විසින් නිර්දේශ කළ පරිදි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභා පනත සංශෝධනය කිරීමේ කාර්යය අවසන් කර නොතිබුණි.	2023	ආයතන ලියාපදිංචි කිරීමෙන් බලාපොරොත්තුවන නියාමන කාර්යය ඉටුකළ හැකි පරිදි ක්‍රියාත්මක වීමට අවශ්‍ය නෛතික පරිසරය සකසා ගැනීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතුය.	තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ අනුමැතියකින් තොරව පවත්වා ගෙන යනු ලබන ආයතනවලට එරෙහිව තෘතියික හා වෘත්තීය අධ්‍යාපන පනත	2024 සැප්තැම්බර් මස වන විටද පනත සංශෝධනය කිරීමේ කාර්යය අවසන් කර නොතිබුණි.

යටතේම නඩු පැවරීම සඳහා ප්‍රතිපාදන ඇතුලත් කිරීමට උපදෙස් ලැබී ඇති අතර ඒ අනුව කටයුතු කරමින් පවතින බව.

3.148 බටංගල විශ්වවිද්‍යාල විද්‍යායතනය

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	අතිරික්තය (ඌනතාවය) රු.	මතය
2021	94,204,102	8,123,605	86,080,497	19,597,628	තත්ත්වාගණනය නොකළ
2022	82,453,864	8,331,814	74,122,050	9,145,926	තත්ත්වාගණනය නොකළ
2023	77,747,105	8,825,923	68,921,182	5,283,353	තත්ත්වාගණනය නොකළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපතිගේ නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01.	1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය ප්‍රකාරව නිලධාරීන්ට දීමනා හා වෙනත් මූල්‍යාධාර ගෙවීම සඳහා අමාත්‍ය මණ්ඩලයෙන්, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය හෝ භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගත යුතු වුවද විද්‍යායතනය ඊට පටහැනිව සමාලෝචිත වර්ෂය තුළ දී පමණක් රු. 793,175 ක් ප්‍රශ්න පත්‍ර සකස් කිරීම හා ප්‍රමිත කිරීම, විභාග රාජකාරී හා පිළිතුරු පත්‍ර ලකුණු කිරීම ආදිය වෙනුවෙන් ගෙවා තිබුණි. මේ තත්ත්වය විද්‍යායතනය ආරම්භයේ සිටම පෙන්වාදී	2021	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.	විශ්වවිද්‍යාල විද්‍යායතනයන්හි බාහිර කථිකාචාර්යවරුන්ට සහ අභ්‍යන්තර විභාග සඳහා ගෙවීම් කිරීමට NVQ 05 හා NVQ 06 සඳහා වන දීමනා පිළිබඳ ඉල්ලීමක් සිදු කර ඇති අතර එම ඉල්ලීමට මෙතෙක් ප්‍රතිචාර ලැබී නොමැත.	විශ්වවිද්‍යාල විද්‍යායතනයන්හි බාහිර කථිකාචාර්යවරුන්ට සහ අභ්‍යන්තර විභාග සඳහා ගෙවීම් කටයුතු කිරීමට NVQ 05 සහ NVQ 06 මට්ටම් සඳහා විශේෂ ගෙවීමේ පටිපාටියක් නිර්මාණය කිරීම පිළිබඳ ඉල්ලීමක් සිදු කර ඇති අතර එම ඉල්ලීමට මෙතෙක් ප්‍රතිචාර ලැබී නොමැත.

	තිබුණත්, සමාලෝචිත වර්ෂය දක්වාම ඒ තත්ත්වය නිවැරදි කර ගැනීමට කටයුතු කර නොතිබුණි.				
02.	පනාවල බටංගල කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් අක්කර 5 ක ඉඩමක බටංගල විශ්වවිද්‍යාල විද්‍යායතනය 2016 ඔක්තෝබර් 18 වන දින ස්ථාපිත කර ඇතත් විගණිත දිනය වන 2022 ජනවාරි 28 දින දක්වාම ඉඩම පවරා ගැනීමේ කටයුතු අවසන් කර නොතිබුණි.	2021 2022	කඩිනමින් ඉඩම පවරා ගැනීම සඳහා කටයුතු කල යුතුය.	බටංගල විශ්වවිද්‍යාල විද්‍යායතනය පිහිටි භූමි භාගය ආයතනය වෙත පවරාගැනීම සඳහා 2016 වසරේ සිටම කටයුතු ආරම්භ කර ඇති අතර පවරා ගැනීම සඳහා දෙහිඕවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා කටයුතු සම්පාදනය වෙමින් පවතී.	බටංගල විශ්වවිද්‍යාල විද්‍යායතනය පිහිටි භූමියේ පවරා ගැනිමේ කටයුතු මේ වනවිටත් අවසන්ව් නැත.
03.	බාහිර කථිකාචාර්යවරුන් සඳහා සැලසුම් කරන ලද පැය ගණනට සාපේක්ෂව සම්පූර්ණ කරන ලද පැය ගණන සම්බන්ධයෙන් සිදු කරන ලද නියැදි පරීක්ෂාවේදී සම්පූර්ණ කරන ලද පැය ගණන සියයට 27 සිට සියයට 53 දක්වා පහළ මට්ටමක පැවතීම හේතුවෙන් සිසුන්ට ලැබෙන විෂය දැනුමේ ප්‍රමාණාත්මකභාවය හා ගුණාත්මකභාවය සම්බන්ධයෙන් විගණනයේදී සෑහීමකට පත්විය නොහැකිය.	2023	බාහිර කථිකාචාර්යවරුන් වෙනුවෙන් සැලසුම් කරන ලද දේශන පැය ප්‍රමාණය සම්පූර්ණයෙන් ඉටුකරවා ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය.	බාහිර කථිකාචාර්යවරුන් ආයතන පිහිටි ප්‍රදේශය වෙත ගමන් කිරීමේදී ඔවුන්ට සිදුවන අපහසුතාවන් හා දැරීමට සිදුවන වියදම මෙන්ම දේශන පැවැත්වීම වෙනුවෙන් පැයකට ගෙවනු ලබන ගාස්තුව ප්‍රමාණවත් නොවීම වැනි කරුණු හේතුකොට ගෙන ඇතැම් මොඩියුල සඳහා බාහිර කථිකාචාර්යවරුන් මාර්ග ගත ක්‍රමය ඔස්සේද පැවැත්වීමට තම මනාපය පළකරනු ලබන බව.	මාර්ගගතව සිදුකෙරෙන බාහිර කථිකාචාර්යවරුන්ගේ දේශනවලදී මෙම තත්වය නිරීක්ෂණය වී ඇති අතර මේවන විට මාර්ගගතව සිදුකෙරෙන දේශන අවම මට්ටමකින් සිදුකෙරෙයි.

3.149 මාතර විශ්වවිද්‍යාල විද්‍යායතනය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	අතිරික්තය (ඌනතාවය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	214,443,169	11,298,512	203,144,658	(27,561,656)	තත්ත්වාගණනය නොකළ
2022	188,260,975	12,306,242	175,954,733	(27,189,925)	තත්ත්වාගණනය නොකළ
2023	177,022,708	14,509,165	162,513,544	(13,314,589)	තත්ත්වාගණනය නොකළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්වය
01.	පාඨමාලා මොඩියුලවලට අදාළව අවස්ථාවන් 21 කදී සැලසුම් කර තිබුණු අනුමත දේශන පැය 1911 කින් පැය 1500 ක් ආවරණය කර නොතිබුණි. ඒ අනුව සැලසුම් කල දේශන පැය ප්‍රමාණයන් ආවරණය කිරීම දුර්වල මට්ටමක පැවැතීම හේතුවෙන් විද්‍යාර්ථයින්ට අවශ්‍ය දැනුම ප්‍රමාණාත්මකව ලැබෙන බවට විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය.	2023	විද්‍යාර්ථයින්ට අවශ්‍ය දැනුම ප්‍රමාණාත්මකව ලබා ගත හැකි පරිදි සැලසුම් කළ පාඨමාලා පැය ගණන ආවරණය කිරීමට පියවර ගත යුතුය.	මොඩියුල වල නියමිත පැය ප්‍රමාණයන් ආවරණය නොවීමට ඇතැම් බාහිර දේශකවරුන් විදෙස්ගත වීම, පෞද්ගලික හේතූන් මත ඉවත් වීම සහ පැයකට කරන ගෙවීම අඩුවීම හේතු වී ඇත. මොඩියුල වල නියමිත විෂය කරුණු ආවරණය කර ඇති බව.	මෙම ගැටළුව මේ දක්වා විසඳී නොතිබුණි.
02	2015, 2017 හා 2018 වසර වලදී විලේපනවේදය පාඨමාලාව සඳහා බඳවා	2023	බඳවා ගන්නා සිසුන් රඳවා ගැනීමට අවශය පියවර ගැනීමට	2019,2020 සහ 2021 වර්ෂවල ආරම්භයේ සිට කොවිඩ් 19, ආර්ථික අර්බුදය වැනි	වෘත්තීය මාර්ගෝපදේශන නිළධාරීන් දෙදෙනෙකු

	ගත් සිසුන් 35 දෙනෙකුගෙන් සිසුන් 24 දෙනෙකු හා 2019 සිට 2021 වර්ෂ තුලදී ආරම්භ කරන ලද පාඨමාලා 9 සඳහා බඳවා ගත් සිසුන් 824 දෙනාගෙන් සිසුන් 95 දෙනෙකු සමාලෝචිත වර්ෂය අවසන් වන විට පාඨමාලා හැර ගොස් තිබුණි. එම සිසුන් පාඨමාලාවන් හැර යාමට හේතුන් සොයා බලා රඳවා ගැනීමට අවශ්‍ය පියවර ගැනීමට කළමනාකරණයෙහි අවධානය යොමු කර නොතිබුණි.		කළමනාකරණය කටයුතු කළ යුතුය.	ගැටළු පැවති අතර සිසුන් විදෙස්ගත වීමේ ප්‍රවණතාවය හේතුවෙන් සිසුන් පාඨමාලා හැර යාමේ ප්‍රවණතාවයක් පවතී. දේශීය හා ජාත්‍යන්තර වශයෙන් NVQ සුදුසුකම ලබා ගැනීමේ වැදගත්කම සහ එයට ඇති ඉල්ලුම පිළිබඳව දරුවන් දැනුවත් කිරීම සියලුම දේශකවරුන් විසින් සිදුකරනු ලබන බව.	පත්කර, එම නිළධාරීන් මගින් වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් පැවැත්වීමට කටයුතු කර තිබුණි.
03.	සිසුන්ගේ ප්‍රායෝගික ක්‍රියාකාරකම් සඳහා 2014 වර්ෂයේදී රු.1,250,000 ක් වැයකර මිල දී ගෙන තිබුණු Vehicle Hoist and Wheel Alignment උපකරණය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි.	2023	නිසි ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර මිලදී ගත යුතු අතර මිලදී ගන්නා ලද උපකරණ අදාල කාර්යය සඳහා උපයෝජනය කළ යුතුය.	මෙම උපකරණය ස්ථාපනය කිරීම සඳහා ප්‍රමාණවත් බිම් කොටසක් ආයතනයේ නොමැති බව. විකල්ප ඉඩමක් ලබාදෙන ලෙස UNIVOTEC ආයතනය සහ අමාත්‍යාංශය වෙත ඉල්ලීම් කර ඇති නමුත් තවමත් ඉඩමක් ලැබී නොමැති බව.	මේ වන විටත් යන්ත්‍රය නිෂ්කාර්යයව පවතී.

3.150 මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	අතිරික්තය (ඌනතාවය) රු.	මතය
2021	30,832,125	4,777,124	26,055,000	1,193,977	තත්ත්වාගණනය කළ
2022	55,968,617	5,309,706	50,658,910	(550,915)	තත්ත්වාගණනය කළ
2023	59,762,072	5,429,301	54,332,771	(1,370,102)	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01	1997 අංක 18 දරන මානව සම්පත් සංවර්ධනය කිරීමේ පනතේ 14 (1) වගන්තිය අනුව ජාතික මානව සම්පත් සංවර්ධනය කිරීමේ ප්‍රතිපත්තියක් සකස් කිරීම හා එය කාලීනව සමාලෝචනය කිරීම, මානව සම්පත් සංවර්ධනය පිළිබඳ අමාත්‍යවරයාට හා රජයට උපදෙස් ලබාදීම සිදු කල යුතු වුවත් ආයතනය පිහිටුවා වසර 25 ක් ගත වී ඇතත් ජාතික සභාව පිහිටුවීමේ ඉහත මූලික අරමුණු සාක්ෂාත් කර ගැනීමට 2022 දෙසැම්බර් 31 දින වන විටත්	2021 2022	ප්‍රධාන අරමුණ ඉටුකිරීම සඳහා ඵලදායි ක්‍රියාමාර්ග ගනිමින් ආයතනය පිහිටුවීමේ අරමුණු සාක්ෂාත් කරගත යුතුය.	සංශෝධිත මානව සම්පත් සංවර්ධන ප්‍රතිපත්තිය සඳහා 2017 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී ඇති අතර වර්තමාන අවශ්‍යතාවට අනුකූල වන පරිදි මෙම ප්‍රතිපත්තිය සංශෝධනය කිරීම සඳහා සැලසුම් කර ඇති බව.	දැනට පවත්නා මානව සම්පත් හා රැකියා ප්‍රතිපත්තිය ආයතනයේ මීළඟ පාලක මණ්ඩලයේ අනුමැතිය සඳහා යොමු කිරීමට සැලැසුම් කොට පවතී.

	අපොහොසත් වී තිබුණි.				
02	1997 අංක 18 දරන මානව සම්පත් සංවර්ධනය කිරීමේ පනතේ දක්වා ඇති පරිදි සභාව විසින් ඉටු කරනු ලබන කර්තව්‍යවලට සමාන කර්තව්‍ය ඉටුකරන ශ්‍රී ලංකාවෙන් බැහැර පිහිටි ජාත්‍යන්තර නියෝජ්‍යායතන සහ වෙනත් සංවිධාන සමඟ සම්බන්ධතා ඇතිකරගෙන පවත්වාගෙන යාමට කටයුතු කල යුතු වුවත් 2022 දෙසැම්බර් 31 දින වන විටත් මෙම කාර්ය ඉටුකර නොතිබුණු අතර 2022 වර්ෂය සඳහා සකස්කර තිබූ ක්‍රියාකාරී සැලැස්ම පරීක්ෂාවේ දී මේ සඳහා අවශ්‍ය ක්‍රියාකාරකම් සැලසුම් කර හෝ නොතිබුණි.	2022	පනතේ දක්වා තිබෙන කාර්යයන් ඉටුකිරීම කෙරෙහි මූලිකවම අවධානය යොමු කළ යුතුය.	2023 අගෝස්තු 02 දින කලාපීය මානව සම්පත් සංවර්ධන සැලැස්ම ඩකාහි පිහිටි BIMSTEC ස්ථිර ලේකම් කාර්යාලය වෙත යොමු කල බවත්, මේ වන විට එම සැලැස්ම අදහස් හා යෝජනා සඳහා සාමාජික රටවල් වෙත යොමු කර ඇති බව.	සාමාජීය රටවල් නියෝජනය මානව සම්පත් සංවර්ධන සැලැස්ම සාකච්ඡාවට භාජනය කිරීම සඳහා සමුළුවක් ලබන වර්ෂය මුලදී ලංකාවේ අනුග්‍රහයෙන් පැවැත්වීමට නියමිතව ඇත.
03	ඉහත පනතෙහි 16(2) ඊ වගන්තිය ප්‍රකාරව ආයතනයේ මූලික අරමුණ ඉටු කර ගැනීමට උපකාරී වන මානව සම්පත් සංවර්ධනයට අදාල විවිධ ක්ෂේත්‍ර පිළිබඳව තොරතුරු ඇතුලත් දත්ත බැංකුවක් පවත්වා ගැනීම සිදු කල යුතු වුවත් 2021	2021 2022 2023	ආයතනයේ මූලික අරමුණ ඉටු කර ගැනීමට උපකාරි වන දත්ත බැංකුවක් පවත්වා ගැනීම කෙරෙහි මූලිකවම කටයුතු කල යුතුය.	මෙහිදී එකතු කරනු ලැබූ දත්ත ඇසුරින් වාර්තාවක් සම්පාදනය කර අග්‍රාමාත්‍ය කාර්යාලයට භාර දෙන ලදී. මෙහි දෙවන අදියර ලෙස ඩිජිටල් දත්ත පද්ධතියක් සම්පාදනය කිරීම සඳහා යෝජනා වුවද,	එකතු කරනු ලැබූ දත්ත ඇසුරින් සම්පාදිත වාර්තාව ඉදිරි කටයුතු සඳහා රේඛීය අමාත්‍යාංශ වෙත යවා තිබුණි.

වර්ෂයේදී ද දත්ත බැංකුව නිර්මාණය කිරීම සඳහා උපදේශකවරයෙකුගේ සේවය ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව දැනුම්දී තිබුණද 2022 දෙසැම්බර් 31 දින වන විටත් දත්ත බැංකුවක් පවත්වා ගෙන නොතිබුණි	ප්‍රතිපාදන ලබාගැනීමේ පවතින දුෂ්කරතා හේතුවෙන් එම අදහස ක්‍රියාවට නැංවීම අඩපණ විය.

3.151 රත්මලාන විශ්වවිද්‍යාල විද්‍යායතනය

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	අතිරික්තය (ඌනතාවය) රු.	මතය
2021	201,578,599	13,081,675	188,496,924	29,237,093	තත්ත්වාගණනය නොකළ
2022	193,557,471	13,271,625	180,285,845	30,291,210	තත්ත්වාගණනය නොකළ
2023	159,548,380	14,797,081	144,751,299	35,500,266	තත්ත්වාගණනය නොකළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපතිගේ නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01.	2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 ඡේදය ප්‍රකාරව විගණිත වාර්ෂික මූල්‍ය ප්‍රකාශන හා විගණන වාර්තා සමඟ වාර්ෂික කාර්යසාධන වාර්තාව භාෂාත්‍රයෙන් සකස් කර මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුලත පාර්ලිමේන්තුවේ සභාගත කලයුතු වුවද විද්‍යායතනය ආරම්භක කල 2015 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වාම ඒ අනුව කටයුතු කර නොතිබුණි.	2021	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව අදාල වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කල යුතුය.	වාර්ෂික වාර්තාව පිළියෙල කර ඉදිරියේදී විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ.	මෙම වසරේ සිට නිවැරදි කිරීමට කටයුතු කරනු ලබන බව දන්වා ඇත .

02.	විද්‍යායතනය පිහිටා තිබූ හෙක්ටයාර 0.427 ක් වූ භූමි ප්‍රමාණය විද්‍යායතනය ආරම්භ කළ 2014 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම පවරාගෙන වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.	2021	ඉඩම පවරා ගැනීමේ කටයුතු කඩිනමින් සිදුකල යුතුය.	ඉඩම පවරාගැනීම සඳහා අමාත්‍යාංශය වෙත ඉල්ලීම් ඉදිරිපත්කර ඇති අතර මෙතෙක් ඒ සඳහා ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත.	ඉඩම ආයතනයේ නමට පවරා ගෙන ඇතත් ගිණුම්ගත කර නොමැත.
03.	බාහිර කථිකාචාර්යවරුන් විසින් පාඨමාලාවන්ට අදාල විෂයයන් (Module) 39 ක් සම්බන්ධයෙන් ආවරණය කලයුතු යැයි සැලසුම් කල දේශන පැය ප්‍රමාණය 3,186 ක් වුවද සත්‍ය වශයෙන් දේශන පැය 1,230 ක් පමණක් සිදුකර තිබුණි.සැලසුම් කරන ලද පැය ගණනට සාපේක්ෂව සම්පූර්ණ නොකරන ලද පැය ගණන සියයට 13 සිට සියයට 70 දක්වා පරාසයක පැවතුණි.	2022	විෂය නිර්දේශය ආවරණය වන පරිදි නියමිත පැය ගණන අනුව දේශන පැවැත්වීමට කටයුතු කල යුතුය.	අදාළ විෂය නිර්දේශයන්හි එක් එක් මොඩියුලයට අදාල නියමිත පැය ගණන ආවරණය නොවීමේ තත්වය ඉස්මතු වනුයේ රටෙහි පැවති කොවිඩ් වසංගතය, ආර්ථික අර්බුදය, විදුලිය බිඳවැටීම වැනි කරුණු කාරණාවන් නිසා බව සඳහන් කිරීමට කැමැත්තෙමු.	විෂයයන් සඳහා ප්‍රමාණවත් පැය ගණනක් පමණක් සැලසුම් කිරීමත් , එම පැය ගණන සම්පූර්ණ කර ගැනිමට කටයුතු කරන බවටත් තහවුරු කිරීමේ ක්‍රමවේදයක් අධ්‍යයන අංශ ප්‍රධානි අධික්ෂණය යටතේ ස්ථාපිත කර ඇත.
04.	ආහාර තාක්ෂණ විද්‍යාගාරයේ පැවති රු. 147,400 ක් වටිනා Automatic Water Distiller උපකරණය 2015 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වාම භාවිතයෙන් තොරව නිෂ්කාර්යව පැවති අතර එම	2022	සම්පත් කාර්යක්ෂම හා ඵලදායී අයුරින් භාවිත කිරීමට කටයුතු කල යුතුය.	අමාත්‍යාංශය විසින් ප්‍රසම්පාදනය කර අප ආයතනය වෙත එවන ලද අතර මෙම උපකරණය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ආහාර තාක්ෂණ විද්‍යාගාරය නිසි	ඉහත උපකරණය මේ වන විට අලුත්වැඩියාව සඳහා යොමු කර ඇත.

	උපකරණයේ වගකීම් කාලයද අවසන් වී තිබුණි.			පරිදි සකස් කර නොමැත. එම විද්‍යාගාරය සකස්කිරීමේ කටයුත්ත මේ වනවිටත් අමාත්‍යාංශය භාරගෙන තිබෙන බැවින්, විද්‍යාගාරය නිසිපරිදි සකස් කිරීමෙන් අනතුරුව මෙම උපකරණය භාවිතයට ගත හැකිය.	
05.	නිපුණතා ආංශික සංවර්ධන (SSDP) වැඩසටහන යටතේ 2021 වර්ෂයේදී කාර්යයන් 03 ක් ඉටු කිරීම වෙනුවෙන් ලැබී තිබුණු රු. මිලියන 5.8 ක් විගණිත දිනය වූ 2023 පෙබරවාරි 08 දක්වාම එකී කාර්යයන් ඉටුකිරීම වෙනුවෙන් උපයෝජනය කර නොතිබුණි.	2022	ණය ආධාර මඟින් ලබාදෙන ප්‍රතිපාදන තුලින් උපරිම ප්‍රයෝජන ලැබෙන සේ යෙදවීමට කටයුතු කල යුතුය.	ගමන් සහ සංචාරක පාඨමාලාව වෙනුවෙන් හඳුන්වා දුන් මොඩියුල දෙකක් ප්‍රායෝගික ගැටලු හේතුවෙන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ අතර ශිෂ්‍ය ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය සංවර්ධනය හා ක්‍රියාත්මක කිරීම සඳහා ආයතනය බලාපොරොත්තු වූ පද්ධතිය සැපයීමට සැපයුම්කරු අපොහොසත් වීම හේතුවෙන් මෙය අවසන් කිරීමට නොහැකි විය.	මෙම ගොඩනැගිල්ල smart classroom සඳහා හා වෘත්තිය මාර්ගෝපදේශන අංශය සඳහා වෙන් කර එහි කටයුතු ආරම්භ කර ඇත.
06.	විද්‍යායතනයේ අත්පොත අනුව ඉටුකළ යුතු කාර්යයන් 19 ක් දක්වා තිබුණද විශ්වවිද්‍යාල විද්‍යායතනය පිහිටුවන	2023	විද්‍යායතනය පිහිටුවීමේ අරමුණු ළඟාකර ගැනීමට කටයුතු කල යුතුය.	දැනට පවත්නා සේවක හිඟය හේතුවෙන් සිසුන්ගේ අධ්‍යයන කටයුතු සිදුකර ගැනීම ඉතා	පුරප්පාඩු පිරවීම මේ වන විට සිදු කරමින් පවතින අතර ඉදිරි කාර්යයන් ඉදිරියේ සිදු කිරීමට කටයුතු කරමින් ඇත.

	ලද 2016 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා වසර 08 ක් පමණ ගතවී තිබුණද ඉන් කාර්යයන් 7 ක් ඉටු කිරීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමුකර නොතිබුණි.			අභියෝගාත්මක වී ඇති බැවින් මෙහි සඳහන් ක්‍රියාකාරකම් සඳහා අවධානය යොමු කිරීම ඉතා අපහසු වේ. කෙසේ වුවත් මෙම වසරේ සිට මීට අදාල කටයුතු කිහිපයක් ආරම්භ කිරීමට සැලසුම් කර ඇත.	
07.	ආහාර තාක්ෂණ විද්‍යාගාරය තුල පාඨමාලා පැවැත්වීම සඳහා අවශ්‍යවන පහසුකම් හා පවතින ඉඩකඩ ප්‍රමාණවත් නොවීම හේතුවෙන් එම විද්‍යාගාරය තුල පැවති එකතු වටිනාකම රු.2,937,996 ක් වූ විද්‍යාගාර උපකරණ 2015 වර්ෂයේ සිට විගණිත දිනය වූ 2024 පෙබරවාරි 06 දින වන විටත් භාවිතයෙන් තොරව නිෂ්කාර්යව පැවතුණි. එසේම මෙම විද්‍යාගාරයේ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා 2021 හා 2022 වර්ෂ වලදී රු.13,000,000 ක් ප්‍රතිපාදන වෙන්කර තිබුණද ප්‍රතිසංස්කරණ කටයුතු නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය වන විට එහි වියදම් ඇස්තමේන්තුව	2023	මෙම විද්‍යාගාරයට අවශ්‍ය පහසුකම් ලබා ගැනීමට කටයුතු කල යුතුය.	විද්‍යාගාරය නවීකරණය කිරීම සඳහා අදාල ප්‍රසම්පාදන කටයුතු කරගෙන යාමට අවස්ථා කිහිපයකදී උත්සහ දැරුවද සුදුසු ඉල්ලුම්කරුවෙකු ඉදිරිපත් නොවීම හේතුවෙන් සහ ඒ ඒ අවස්ථාවන් වලදී ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති වූ බැවිනි.එහි අවසාන ඇස්තමේන්තුව මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශයේද (CECB) සහයෝගය ඇතිව සිදුකරන ලද අතර එම කටයුතු 2023 ජූනි 28 අධ්‍යක්‍ෂ මණ්ඩල අනුමැතියට අනුව වර්තමානයේ ඉටුවෙමින් පවතී.	2024 වර්ෂයේ අදාල ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීම ආරම්භ කර ඇති අතර ඉදිකිරීම් ආරම්භ කරමින් පවතී.

	රු.41,454,958 ක් දක්වා වැඩි වී තිබුණද අදාල ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කර නොතිබුණි.				
08.	විද්‍යායතනය විසින් ජාතික වෘත්තීය සුදුසුකම (NVQ Level) 05 හා 06 මට්ටමේ පවත්වාගෙන යනු ලබන පාඨමාලා 10 න් එක් පාඨමාලාවක් සඳහා අවම වශයෙන් කථිකාචාර්යවරුන් දෙදෙනෙකු බැගින් සිටිය යුතු වුවද 2022 වර්ෂයේ සිට 2023 වර්ෂය අතර කාලය තුලදී පාඨමාලා 05 ක් සඳහා එක් කථිකාචාර්යවරයෙකු බැගින් පමණක් සේවයේ යොදවා සිටි අතර විදුලි තාක්ෂණය පාඨමාලාව වෙනුවෙන් කථිකාචාර්යවරයෙකු සේවයේ යොදවා නොතිබුණි.	2023	අත්‍යාවශ්‍ය තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු කල යුතුය.	දැනට විද්‍යායතනයේ පවතින පුරප්පාඩු පිළිබඳව වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය හරහා අමාත්‍යාංශය දැනුවත් කර ඇති අතර අමාත්‍යාංශය මඟින් පවතින පුරප්පාඩු පිරවීම සම්බන්ධව අනුමැතිය ලබාගැනීම සඳහා කලමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත 2024.01.08 දිනැතිව ලිපියක් යවා ඇත.	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කර එවා ඇති කථිකාචාර්ය පුරප්පාඩු 3 ක් සඳහා බඳවා ගැනීමට අදාල කටයුතු මේ වන විටත් සිදු කර ඇත.

3.152 විශ්වවිද්‍යාල විද්‍යායතනය - කුලියාපිටිය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	අතිරික්තය (ඌනතාවය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	215,498,558	10,984,249	204,514,309	(515,696)	තත්ත්වාගණනය නොකළ
2022	184,650,399	9,823,604	174,826,795	(1,164,355)	තත්ත්වාගණනය නොකළ
2023	161,616,485	10,256,493	151,359,993	(23,653,706)	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01	ශ්‍රීලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයහි මුදල් රෙගුලාසි 880 රජයේ මුදල්, ආදායම්, මුද්දර හෝ බඩුබාහිරාදිය භාර ගැනීම හෝ භාරව සිටීම, රජයේ මුදල් බෙදා හැරීම හෝ මුද්දර නැතහොත් බඩුබාහිරාදිය නිකුත් කිරීම, සම්බන්ධයෙන් පරිපාලනමය වශයෙන් වගකිවයුතු හෝ බලය පැවරීම යටතේ එම කටයුතු පවරනු ලැබ ඇති නිලධාරීන්ද, රජයේ ගිණුමට අදාළ වුවත් සහතික කරන චෙක්පත් අත්සන් කරන අයද ස්වකීය රාජකාරී කටයුතු අවංකව ඉටුකරන බවට 612 වැනි අධිකාරිය වන	2022	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.	ආඥා පනත අනුව කටයුතු කරමින් සිටින බව.	ඇප මුදල් තැන්පත් කිරීමට කටයුතු කර නොතිබුණි.

	රජයේ නිලධාරීන්ගේ ඇප ආඥාපනතට අනුකූලව ඇප තැබිය යුතු වුවත්, එලෙස කටයුතු කර නොතිබුණි.				
02	සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විට විද්‍යායතනය පිහිටුවා වසර 09 කට වැඩි කාලයක් ගත වී තිබුණද භාවිත කරනු ලබන හෙක්ටයාර් 5.41 ක භූමි ප්‍රමාණය තුළ සමාලෝචිත වර්ෂය අවසාන වන විට විද්‍යායතනයේ වියදමින් රු.150,033,529 ක් වටිනාකමැති ගොඩනැගිලි හා යටිතල පහසුකම් ඉදිකිරීම් සිදුකර ඇතත්, එම භූමිය විද්‍යායතනය වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. එසේම අදාළ වගකිව යුතු නිලධාරීන් විසින් භූමිය සඳහා භුක්ති විදීමේ සහතිකයක් ද ලබාගැනීමට කටයුතුකර නොතිබුණි.	2021 2022 2023	විද්‍යායතනය වෙත ඉඩම පවරා ගැනීමට කටයුතු කළ යුතුය.	මේ පිළිබඳ අදාළ නිලධාරීන් වෙත ලිපි යොමු කර ඇති බව හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත විමසීම් කලද භුක්ති විදීමේ සහතික නිකුත් කිරීමේ ක්‍රියාපිළිවෙතක් නොමැති බව.	අදාළ භූමිය විද්‍යායතනය වෙත පවරා ගෙන නොතිබුණි.

3.153 වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	අතිරික්තය (ඌනතාවය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	1,665,152,040	203,683,975	1,461,468,065	13,654,128	තත්ත්වාගණනය නොකළ
2022	2,402,750,479	218,679,409	2,184,071,070	57,072,162	තත්ත්වාගණනය නොකළ
2023	2,409,982,534	248,054,136	2,161,928,398	60,583,175	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපතිගේ නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01.	විශ්වවිද්‍යාලයේ පීය ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුව රු. 14,506,548 ක මුදලකට 2016 සැප්තැම්බර් 10 වන දින පුද්ගලික කොන්ත්‍රාත්කරුවෙකුට ප්‍රදානය කර 2019 සැප්තැම්බර් 12 වන දින රු. 2,901,285 ක අත්තිකාරම් මුදලක් ලබාදී තිබුණි. කොන්ත්‍රාත්තුව 2019 නොවැම්බර් 22 වන විට නිම කල යුතු වුවද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අදාල කාර්යය ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණු අතර රජයේ මුදල් වසර 2	2020 2021	කොන්ත්‍රාත්තුව ක්‍රියාවට නැංවීමට හෝ ලබාදී ඇති අත්තිකාරම් මුදල් රජයට අයකර ගැනීමට කටයුතු කළ යුතුය.	මෙම කොන්ත්‍රාත්තුව දින 60 ක කාලයක් තුල සිදු කිරීමට නියමිත වුවත් අදාල වැඩබිම සම්පූර්ණයෙන්ම කොන්ත්‍රාත්කරුට නියමිත දිනවලට ලබා දීමට නොහැකි විය. එසේම පැවති කොවිඩ් වසංගත තත්ත්වය නිසා විශ්වවිද්‍යාලය මාස කීපයක්ම සම්පූර්ණයෙන්ම වසා දමා තිබුණි.	කොන්ත්‍රාත්කරුගෙන් කිසිඳු ප්‍රතිචාරයක් නොමැති බැවින් අදාල ලිපි ගොනුව වසා දැමීම සඳහා ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය සඳහා යොමු කිරීමට කටයුතු යොදා ඇත.

	කට වැඩි කාලයක් බාහිර පාර්ශවයක් වෙත අත රඳවා තිබුණි. තවද මෙම කොන්ත්‍රාත්තුව සඳහා ලබාගෙන තිබූ කාර්යසාධන සුරක්ෂණයේ වලංගු කාලය 2021 ජුනි 19 දින ඉකුත් වී ඇති අතර එය දීර්ඝ කර ගැනීමටද කටයුතු කර නොතිබුණි.				
02.	විශ්වවිද්‍යාලය මගින් පවත්වාගෙන යනු ලබන ඉංජිනේරු උපාධි පාඨමාලා සඳහා ප්‍රතීතනය ලබා ගැනීමට 2010 මැයි 18 දින පැවති රැස්වීමේදී තීරණය කර තිබුණද 2023 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලය පිහිටුවා වසර 10 ට වැඩි කාලයක් ගත වී ඇතත් අපේක්ෂිත මට්ටමට උපාධි පාඨමාලාවල තත්ත්ව සහතික කිරීමට හැකියාව ලැබී නොතිබීම හේතුවෙන් ප්‍රතීතනය ලබාගැනීමට නොහැකි වී තිබුණි.	2021 2023	අදාල ප්‍රතීතන කටයුතු කඩිනමින් සිදු කිරීමට කටයුතු කල යුතුය.	ඉංජිනේරු උපාධි පාඨමාලා ප්‍රතීතනය සඳහා අයදුම්පත් සම්පූර්ණ කරමින් පවතින අවස්ථාවේදී, ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් 2022 වර්ෂයේ මැදභාගයේදී නව ප්‍රතීතන අත්පොතක් නිකුත් කිරීම හේතුවෙන් ප්‍රතීතන ක්‍රියාවලිය තාවකාලිකව නතර කරන ලදී. නැවත අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා මෙම විශ්වවිද්‍යාලයේ නිලධාරීන් හා ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ නිලධාරීන් අතර සාකච්ඡා කිහිපයක් පවත්වන ලද අතර, අදාල පීඨය මගින් ඉංජිනේරු උපාධිය සඳහා ප්‍රතීතනය ලබා ගැනීම සඳහා	විසඳුම් ලබා ගැනීමට ශ්‍රී ලංකාවේ ඉංජිනේරු කවුන්සිලයේ සභාපති තුමා සමග සාකච්ඡාවක් 2024.09.27 දින පැවැති අතර එහිදී ලැබුන නිර්දේශ මත ඉදිරි ක්‍රියාමාර්ග ගනු ලැබේ.

				කඩිනමින් කටයුතු කරමින් පවතී.	
03.	2017 ජනවාරි 03 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව රු. මිලියන 927.34 ක ඇස්තමේන්තුවක් මත විශ්වවිද්‍යාලය සඳහා වැඩහලක්, සිසුන් 600 ක් සඳහා නේවාසිකාගාරයක් සහ ආසන 300 කින් යුතු ආපන ශාලාවක් ඉදිකිරීමට අනුමැතිය ලබාදී තිබුණි. 2018, 2019 හා 2020 වර්ෂයන්හිදී රු. මිලියන 281.36 ක් මෙම ව්‍යාපෘතිය සඳහා වෙන්කර තිබුණු අතර ඉන් රු. මිලියන 22.5 ක් පමණක් උපදේශන ගාස්තු ලෙස ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් 2021, 2022 වර්ෂයන් වලදී සාකච්ඡා වී තිබූ නමුත් ඉහළ කළමනාකාරීත්වය නිසි කාලය තුල ක්‍රියා නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන විට වියදම් ඇස්තමේන්තුව රු.මිලියන 3,046.8 ක් දක්වා එනම් සියයට 300 කින් වැඩි වී තිබුණි.	2023	රාජ්‍ය මුදල් උපරිම කාර්යක්ෂමතාව කින් හා ඵලදායීතාවයකින් යුතුව භාවිතා කිරීමට කටයුතු කල යුතුය.	ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂක ජනරාල් ඇතුළු නිලධාරීන් සහ වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ උපකුලපති ඇතුළු නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් 2023 අගෝස්තු මස 25 දින පැවති රැස්වීමේදී ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා මුදල් ප්‍රතිපාදන වෙන් නොකිරීමට රජය මේ වන විට ගෙන ඇති තීරණයේ වෙනසක් සිදුවී නොමැති බැවින් මේ සඳහා ඉදිරි වර්ෂය තුලදී මුදල් වෙන් කළ නොහැකි බව ප්‍රකාශ කරන ලදී.	රජයේ තීරණ අනුව ඉදිකිරීම් කටයුතු නතර කොට ඇත.

04.	වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ බහුකාර්ය ශබ්දාගාර සංකීර්ණයක් හා දේශනශාලා සංකීර්ණයක් සහිත ගොඩනැගිල්ලක් ඉදිකිරීමට 2011 අප්‍රේල් 27 දිනැති අංක අමප/11/2152/539/017-1 දරන අමාත්‍ය මණ්ඩලයෙන් අනුමැතිය ලබාදී තිබූ අතර ඒ සඳහා රු. මිලියන 434.4 ක් භාණ්ඩාගාරයෙන් හා ආංශික නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය මඟින් වෙන්කර තිබුණි. 2020 දෙසැම්බර් 31 වන විට ඉන් රු. මිලියන 304.5 ක් වියදම් කර තිබුණි. 2023 ජුනි 26 දිනැති රැස්වීම් වාර්තාව අනුව තව දුරටත් සම්පූර්ණ කලයුතු අත්‍යාවශ්‍ය කොන්ත්‍රාත් වැඩ (Major & Miner repairs & Constructions Works) සම්පූර්ණ කර ඉදිකිරීම් වැඩ අවසන් කිරීමටත්, බහුකාර්ය ශබ්දාගාරය හා දේශනශාලා සංකීර්ණයට අදාල වන Central AC 2630700 System පද්ධතියට විධිමත් සේවා හා නඩත්තු	2021 2022 2023	අයවැය ප්‍රතිපාදන සලසාගෙන ප්‍රමාදයකින් තොරව ව්‍යාපෘතියේ ඉතිරි වැඩ අවසන් කිරීමට කටයුතු කල යුතුය.	මේ වනවිට ශබ්දාගාරයට අදාලවන Central AC System හි තිබුණු අඩුපාඩු සියයට 100 ක්ම සම්පූර්ණ කර ඇත. මෙම A/C පද්ධතිය විධිමත් ආකාරයට මෙම විශ්වවිද්‍යාලය වෙත භාරදුන් පසුව අදාල ආයතනය සමඟ සේවා හා නඩත්තු ගිවිසුමකට එළඹීමට නියමිතය.	මෙහි අඩුපාඩු වලින් ශබ්දාගාරයෙහි ඇති බාහිර ශබ්ද වැලැක්වීමේ ප්‍රතිරෝධක සම්පූර්ණ කර නැති අතර, ඒ සඳහා මුදල් ප්‍රතිපාදන නොමැති බව පවසා ඇත.

ගිවිසුම් නොමැති වීමත් සාකච්ඡා කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

3.154 ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	අතිරික්තය (ඌනතාවය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	5,756,729,366	549,561,225	5,207,198,141	132,500,160	තත්ත්වාගණනය කළ
2022	5,489,357,242	504,049,696	4,985,307,546	115,032,758	තත්ත්වාගණනය කළ
2023	6,356,047,023	749,716,780	5,606,330,243	97,086,919	තත්ත්වාගණනය නොකළ

	විගණන නිරීක්ෂණ	විගණන වාර්තාවේ වර්ෂය	විගණකාධිපතිගේ නිර්දේශය	විගණිත ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්වය
01.	විධිමත් පරිදි ඉඩමේ අයිතිය තහවුරු කර ගැනීමකින් තොරව යාපනය උසස් තාක්ෂණ ආයතනය විසින් ඉදිකිරීමට යෝජිත සිව් මහල් ගොඩනැගිල්ලක් සඳහා 2016 වර්ෂයේ දී රු.36,989,498 ක අත්තිකාරම් මුදලක් හා 2017 වර්ෂයේදී රු.13,941,163 ක අන්තර් ගෙවීමක් සිදු කර තිබුණද ඉඩමේ නීත්‍යානුකූල අයිතිය නොමැතිවීම හේතුවෙන් ඉදිකිරීම් නතර කිරීමෙන් දරන ලද වියදම නිෂ්කාර්යය වියදමක් වී තිබුණි. මෙම කොන්ත්‍රාත්තුවට	2021, 2022, 2023	අයිතිය තහවුරු කර ගැනීමෙන් පසු කඩිනමින් ගොඩනැගිල්ලේ අවශ්‍යතාවය හඳුනාගෙන ඉදිකිරීම් ආරම්භ කිරීමට කටයුතු කළ යුතුයි.	ඉඩමේ අයිතිය පිළිබඳ ප්‍රාදේශීය ලේකම් විසින් ලබා දුන් සනාථ කිරීම අනුව ඉදිකිරීම් කටයුතු ආරම්භ කළ අතර එම අවස්ථාවේ අධිකරණයේ ප්‍රශ්නගත කරුණක් ඉදිරිපත් විය.මේ සම්බන්ධයෙන් කොළඹ අභියාචනාධිකරණයේ පැවති නඩුව දැනට අවසන්ව ඇති අතර යාපනය දිසා අධිකරණයේ පවතින නඩුවට අදළව ඉදිරි පියවර ගැනීමට කටයුතු කරමින් පවතින බව.	ඉඩම සම්බන්ධයෙන් පවතින නඩු කටයුත්ත හේතුවෙන් 2024 සැප්තැම්බර් වන විටත් ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට නොහැකිවී තිබුණි.

	අදාල රු.8,330,743 ක් වූ කාර්යසාධන සුරක්ෂණය හා රු.33,322,972 ක් වූ අත්තිකාරම් සුරක්ෂණය කාලය දීර්ඝ කර නොගැනීම හේතුවෙන් 2019 ඔක්තෝබර් 21 දිනෙන් කල් ඉකුත් වී තිබුණි. මේ සම්බන්ධයෙන් පවරා තිබූ නඩු කටයුත්ත 2023 ඔක්තෝබර් අවසන්වී තිබුණද 2024 සැප්තැම්බර් වන විටත් ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට කළමනාකරණයේ අවධානය යොමුවී නොතිබුණි.				
02.	නිල නිවාසයක් හා ක්‍රීඩා පිටියක් තැනීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියට අයත් රු.18,305,976 ක් වටිනා රත්නපුර පිහිටි ඉඩම වෙනුවෙන් මූලික තැන්පත් ලෙස රු.1,000,000 ක් 2016 දෙසැම්බර් 30 දින අධිකාරියට ගෙවා තිබුණි. එහෙත් ඉතිරි මුදල් ගෙවීම සඳහා මූල්‍ය ප්‍රතිපාදන නොමැති වීම හේතුවෙන් ගෙවන ලද මුදල	2022, 2023	ඉඩම සඳහා ගෙවා ඇති මුදල නැවත ලබා ගැනීමට කටයුතු කළ යුතුය.	මෙම ඉඩම පවරා ගැනීම අනවශ්‍ය බව හා ඉඩම නැවත නාගරික සංවර්ධන අධිකාරියට භාරදීමටත් ගෙවා ඇති රු.1,000,000 ක මුදල නැවත ලබාගැනීමට හැකිද යන්න සොයාබලන ලෙස පාලක සභා රැස්වීමේදී තීරණය වූ බව.	ඉඩම නැවත නාගරික සංවර්ධන අධිකාරියට භාරදීමට යෝජනා වූ නමුත් ගෙවන ලද රු.1,000,000 ක මුදල නැවත ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

	නැවත ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.				
03.	පුස්තකාල කටයුතු නව තාක්ෂණයෙන් යුතුව පවත්වා ගෙන යාම සඳහා ස්ථාපිත KOHA පරිගණක පද්ධතිය ස්ථාපිත කිරීම සඳහා රු.1,013,315 ක් වැය කර තිබුණද මෙම පද්ධතිය ක්‍රියාත්මක තත්ත්වයට පත් නොකිරීම හේතුවෙන් දරන ලද වියදම නිෂ්කාර්ය වියදමක් වී තිබුණි.	2022, 2023	පද්ධතිය ක්‍රියාත්මක කිරීමේ තත්ත්වයට කඩිනමින් පත්කර ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය.	පද්ධතිය ක්‍රියාත්මක කිරීමට අදාලව තවත් එක් පුහුණු වැඩමුළුවක් පැවැත්වීමට නියමිතව තිබූ නමුත් කොවිඩ් 19 වසංගත තත්ත්වය සහ රජයේ වියදම් සීමාකිරීම හේතුවෙන් එම වැඩමුළුව අවසන් කරගත නොහැකි වූ අතර අදාල පුහුණු වැඩමුළුව පැවැත්වීමේ මුලික වැඩ කටයුතු සංවිධානය කරමින් පවතින බව.	එම වැඩමුළුව අවසන් කරගත නොහැකි වී තිබුණු අතර අදාල පුහුණු වැඩමුළුව පැවැත්වීමේ මුලික වැඩ කටයුතු සංවිධානය කරමින් පැවතුණි.

3.155 ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	අතිරික්තය (ඌනතාවය) රු.	මතය
2021	7,985,269,351	831,905,916	7,153,363,434	(60,618,509)	තත්ත්වාගණනය කළ
2022	7,997,217,620	870,841,898	7,126,375,721	(544,059,934)	තත්ත්වාගණනය කළ
2023	7,478,253,523	911,226,039	6,567,027,484	(677,908,091)	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	**විගණන වාර්තාවේ වර්ෂය**	**විගණකාධිපතිගේ නිර්දේශය**	**විගණිත ආයතනය විසින් ගනු ලැබූ වැලැක්වීමේ ක්‍රියාමාර්ග**	**වර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය**
01	2006 වර්ෂයේ සිට 2015 මැයි මාසය දක්වා සේවක භාරකාර අරමුදල් දායකය ගණනය කිරීමේදී ජීවන වියදම් දීමනාව සැලකිල්ලට නොගැනීම හේතුවෙන් 2019 වර්ෂයේදී ගෙවීමට සිදු වී තිබුණු රු. 7,898,073 ක අධිභාර මුදල් එයට වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.	2021	නොසැලකිලිමත් ලෙස කටයුතු කිරීම හේතුවෙන් අධිභාර ගෙවීමට සිදුවී තිබුණි. එම නිසා අදාල වගකිව යුතු නිලධාරින් හඳුනාගෙන ඔවුන්ගෙන් එම මුදල් අයකර ගැනීමට පියවර ගත යුතුය.	එම තත්වය නොසැලකිල්ලෙන් සිදුවූවක් නොවන අතර මෙම දීමනාව අන්තර් දීමනාවක් ලෙස වැරදි ලෙස අර්ථ නිරූපණය කර ගැනීමෙන් මෙම තත්වය උද්ගත වී ඇත. අධ්‍යක්ෂක මණ්ඩලය වෙත කරුණු ඉදිරිපත් කර අනුමැතිය ලබාගෙන මෙම ගෙවිම සිදු කර ඇත.	නිලධාරින්ගෙන් එම මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.
02	ආංශික සංවර්ධන ව්‍යාපෘතියේ (SSDP) මූල්‍ය ප්‍රතිපාදන මත වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන 03 ක නවීකරණ කටයුතු	2022	දරන ලද වියදමට සරිලන ප්‍රතිලාභයක් ලබාගැනීමට හැකිවන පරිදි කටයුතු සැලසුම්	SSDP ව්‍යාපෘතිය විසින් එක් එක් වසරවලදි ලබා දෙන ලද ප්‍රතිපාදන සීමාසහිත වූ බැවින් එම මධ්‍යස්ථාන 3 හි	SSDP ව්‍යාපෘතිය මේ වන විට අවසන් වී තිබුණද එම මධ්‍යස්ථාන 3 හි ඉදිකිරීම් ආරම්භ කිරීමට කටයුතු කර

	වෙනුවෙන් 2014 වර්ෂයේදී උපදේශක සමාගම් වෙත රු.1,212,570 ක් ගෙවා තිබුණු නමුත් එම නවීකරණ කටයුතු 2023 ජූලි 31 දින දක්වාම ආරම්භ කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් දරන ලද වියදම අනාර්ථික ගනුදෙනුවක් වී තිබුණි.		කරගත යුතුය.	ඉදිකිරීම් ආරම්භ කිරීමට නොහැකි වුණි. එහෙත් ලබා දෙන ලද සැලැසුම් හා ඇස්තමේන්තු (ප්‍රමාණපත්‍ර) ඉදිරියේදි ප්‍රයෝජනයට ගැනීම සඳහා අප සතුව ඇත. තවද මේ පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයෙන් උපදෙස් ලබා ගෙන ඇති අතර එය විගණන හා කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කිරීමට නියමිත බව.	නොතිබුණි.
03	වෘත්තීය පුහුණු අධිකාරියේ පාඨමාලා හදාරන සිසුන්ගේ වැඩිදුර පුහුණු කටයුතු සඳහා සහ වඩා හොඳ පුහුණුවක් ලබාදීමේ පරමාර්ථයෙන් අහංගම හෝටල් පාසැල රු.මිලියන 148.92 ක් වැයකර 2019 වර්ෂයේදී හෝටලයක් ලෙස නවීකරණය කර තිබුණද එම වර්ෂයේ සිට 2023 ජුනි 30 දක්වාම මෙම සංචාරක හෝටලය තුලින් කිසිඳු ආධුනිකයෙකුට ප්‍රායෝගික පුහුණුව ලබා දී නොතිබුණි.	2022	වෘත්තීය පුහුණු අධිකාරිය පිහිටුවීමේ පනතෙහි දක්වා ඇති අරමුණු අනුව කටයුතු කළ යුතුය.	මෙම හෝටලය ප්‍රසම්පාදන ක්‍රමවේද භාවිතා කරමින් නීත්‍යානුකූල ලෙස පෞද්ගලික හෝ රාජ්‍ය අංශයේ ආයතනයක් වෙත දීර්ඝකාලීනව බදු දීමටත් ඒ සඳහා ප්‍රසම්පාදන ක්‍රමවේද මඟින් ආයෝජකයින් තෝරා ගැනීමටත් උපදෙස් ලබා දී අනුමැතිය ලබා දී ඇත. තවද අදාල බදු හිමිකරු විසින් අපගේ ආධුනිකයින් වැඩිදුර පුහුණුවට බඳවා ගත යුතු බව බදු ගිවිසුම්වල සඳහන් කළ යුතු බව දැනුම් දී ඇති බව.	S Net Chember (pvt) ltd සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කර ඇති අතර 2024 සැප්තැම්බර් 30 දින දක්වා ප්‍රගතියක් වාර්තා වී නොතිබුණි.

04	ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ සම්පූර්ණ (සියයට 100 ක) කොටස් අයිතිය සහිතව 2013 දෙසැම්බර් 18 දින කැබිනට් අනුමැතියක් රහිතව අධිකාරියේ අරමුදල් වලින් VTA Holdings Ltd නමින් 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කර තිබූ සමාගම ඈවර කිරීමට අවශ්‍ය ලේඛන 2022 ජූනි 20 දින සමාගම් රෙජිස්ටාර් දෙපාර්තමේන්තුව වෙත භාර දීමට කටයුතු කර තිබුණි. සමාගමේ බැංකු ගිණුම් හා මෙහෙයුම් කටයුතු පිළිබඳ වාර්තාවක් සකස් කරන ලෙස අමාත්‍යාංශයේ ලේකම් විසින් උපදෙස් ලබා දී තිබුණද එම වාර්තාව 2023 ජූලි 20 දින වන විටද සකස් කර නොතිබුණි.	2022	අමාත්‍යාංශ ලේකම්ගේ උපදෙස් පරිදි සමාගමේ බැංකු ගිණුම් හා මෙහෙයුම් කටයුතු පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.	මෙම සමාගම අධිකාරියේ නිලධාරී මණ්ඩලයක් මගින් පාලනය නොවුනු බැවින් සමාගම පිළිබඳව මූලික වාර්තාවක් ලබා දීමට කමිටුවක් දැනටමත් පත් කර ඇත. මෙම කමිටු වාර්තාව අමාත්‍යාංශ විගණන හා කළමනාකරණ කමිටුවට හා ආයතනික විගණන හා කළමනාකරණ කමිටුවට ඉදිරියේදී ඉදිරිපත් කිරීමට නියමිත බව.	කමිටු වාර්තාවක් මේ දක්වා ඉදිරිපත් කර නොතිබුණි. සමාගම් නාම ලේඛණයෙන් මෙම සමාගමේ නම ඉවත් කරදෙන ලෙස ඉල්ලමින් 2024 සැප්තැම්බර් 02 දින සමාගම් රෙජිස්ටාර් වෙත ඉල්ලීමක් කර තිබුණි.
05	13 වසරක අඛණ්ඩ අධ්‍යාපන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා 2019 හා 2022 වර්ෂවලදී ඇනවුම් කරන ලද එකතු වටිනාකම රු.28,078,556 ක් වූ උපකරණ වර්ග 19 ක් 2022 දෙසැම්බර් 31 දින වන විටත් සැපයුම්කරුවන් විසින්	2022	කළමනාකරණය විශේෂ අවධානය යොමු කර 13 වසරක අඛණ්ඩ අධ්‍යාපන ව්‍යාපෘතිය සඳහා අවශ්‍යය උපකරණ ලබදීමට කටයුතු කළ යුතුය.	මෙම පුහුණු උපකරණ අයිතමයන්ද සපයා දීමට නොහැකි වී ඇත්තේ ආනයනික සීමා හේතුවෙන් බව අදාල සැපයුම් ආයතන විසින් ලිඛිතව අධිකාරිය වෙත දැනුම් දී ඇත. තවද ඇතැම් සැපයුම්කරුවන්	2024 වර්ෂය වන විට ප්‍රමාද වීම් හා පිරිවිතරවල නොගැලපීම් නිසා ප්‍රතික්ෂේප වූ රු. මිලියන 28ක ප්‍රතිපාදන වලින් මේ වන විට රු.මිලියන 10.4 ක පුහුණු උපකරණ මිලදී ගෙන ඇත. සපයන ලද භාණ්ඩවල

	අධිකාරිය වෙත සපයා නොතිබුණි. තවද, 2019 හා 2022 වර්ෂයේදී ඇනවුම් කර, අධිකාරියට ලැබී තිබූ උපකරණ වලින් රු.4,589,944 ක්වූ අයිතම වර්ග 07ක් පිරිවිතරයන්ට නොගැලපීම නිසා ප්‍රතික්ෂේප කර තිබුණු අතර 2022 දෙසැම්බර් 31 වන විටද එම අයිතම නැවත සපයා නොතිබුණි.			විසින් ලබා දුන් උපකරණ අවසන් තාක්ෂණික ඇගයීම් සමග පිරිවිතරයන්ට නොගැලපීම හේතුවෙන් එම අයිතම භාර නොගත් අතර එම සැපයුම්කරුවන්ට නිවැරදි පිරිවිතර මත භාණ්ඩ සපයන ලෙස දන්වා තිබූ නමුත් රටෙහි පැවති ඩොලර් අර්බුදය මත එම උපකරණ ආනයන සීමා මත සැපයිය නොහැකි බව දන්වා ඇති බව.	පිරිවිතර නොගැලපීම හේතුවෙන් ප්‍රතික්ෂේප වූ ඉතිරි උපකරණ මිලදී ගැනීම සඳහා නැවත ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කර ඇත.
06	හම්බන්තොට මිරිජ්ජවිල ජාතික වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ 2017 වර්ෂයේ ඉදිකිරීම් ආරම්භ කරන ලද වැඩහල් ගොඩනැගිල්ල වෙනුවෙන් වැය කරන ලද රු.19,053,095 ක් 2017 වර්ෂයේ සිට කෙරීගෙන යන වැඩ ගිණුම තුල දක්වා තිබුණු අතර කොන්ත්‍රාත්කරු විසින් ඉදිකිරීම් අතරමඟ නවතා දැමීම හේතුවෙන් ගොඩනැගිල්ලේ ඉදිකරන ලද කොටස් දිරාපත් වෙමින් පැවතුණි.	2022	අතරමග නවතා ඇති ඉදිකිරීම් කටයුතු කඩිනමින් අවසන් කර භාවිතයට ගතහැකි තත්ත්වයට පත්කරගැනීමට වහාම ක්‍රියා කළ යුතු අතර කොන්ත්‍රාත්කරුට විරුද්ධව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට පියවර ගත යුතුය.	කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යය සාධනය හේතුවෙන් ඉදිකිරීම් වැඩ අවසන් කළ නොහැකි වූ හෙයින් 2015.01.05 දින ව්‍යාපෘතිය අත්හිටුවා ඇත. ව්‍යාපෘතියේ ඉතිරි ඉදිකිරීම් නිම කිරීම සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදු කරන ලද නමුත් පෙර ව්‍යාපෘතිය විධිමත්ව අවසන් කර නොතිබීම නිසා නැවත ඉදිකිරීම් කටයුතු කිරීමට මෙතෙක් නොහැකි වී ඇති බව.	ගොඩනැගිල්ලේ ව්‍යුහාත්මක ස්ථායීතාවය පරීක්ෂා කිරීමේ අවසාන පරීක්ෂණ වාර්තාව NBRO විසින් ලද පසු ඒ මත නැවත ඉදිකිරීම් ආරම්භ කිරීමට අපේක්ෂා කරන බව දන්වා තිබුණි. 2024 සැප්තැම්බර් 30 දින වන විටද ප්‍රගතියක් වාර්තා වී නොතිබුණි.

07	ඔරුගොඩවත්ත ශ්‍රී ලංකා ජාතික වෘත්තීය පුහුණු ආයතනය සඳහා 2020 වර්ෂයේදී කොරියානු රජයේ ආධාරයෙන් සිසුන් 100 කට ආසන්න සංඛ්‍යාවක් සඳහා නවාතැන් පහසුකම් සැපයිය හැකි කාමර 48 කින් යුත් සියලු පහසුකම් සහිත ශිෂ්‍ය නේවාසිකාගාරයක් ඉදිකර තිබුණි. එහෙත් විගණිත දිනය වූ 2023 ජුනි 30 වන විටද පූර්ණ කාලීන පාඨමාලා හදාරන සිසුන් සඳහා නේවාසිකාගාර පහසුකම් ලබාදීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි.	2022	සිසුන්ට සහනයක් සැලසීම සහ වෘත්තීය අධ්‍යාපනය සඳහා සිසුන් යොමුවීමේ වර්ධනයක් සිදුවන ආකාරයෙන් නේවාසිකාගාර පහසුකම් සිසුන් වෙත ලබාදීමට අවශ්‍ය කටයුතු ඉටු කළ යුතුය.	මේ වන විට ආයතනයේ උපදේශකවරුන් සඳහා මාසික දීමනාවක් අයකර ගෙන නේවාසික පහසුකම් ලබා දී ඇති බව.	2024 සැප්තැම්බර් 30 දින වන විටද සිසුන් සඳහා නේවාසිකාගාර පහසුකම් ලබා දීමට අවශ්‍ය කටයුතු ඉටුකර නොතිබුණි.
08	අම්පාර දිස්ත්‍රික්කයේ පොතුවිල් හා යාපනය දිස්ත්‍රික්කයේ කරෛනගර් හෝටල් පාසැල් පරිශ්‍රය තුල අධිකාරියේ අරමුණින් බැහැරව සංචාරකයින් සඳහා ලබාදීමේ අරමුණ ඇතිව රු.91,026,186 ක් වැයකර ඉදිකර තිබූ කාමර 22 ක් 2023 ජූලි 30 දින වන විටද ඌන උපයෝජිතව පැවතුණි.	2022	වෘත්තීය පුහුණු අධිකාරිය පිහිටුවීමේ පනතෙහි දක්වා ඇති අරමුණට අනුකූලව කටයුතු කළ යුතුය.	පොතුවිල් හා කරෛයිනගර් හෝටල් පාසල් ද විධිමත්ව බදු දීමට නියමිත බව.	2024 සැප්තැම්බර් 09 දින පවත්වන ලද අමාත්‍යාංශ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදි මෙම හෝටල් පාසැල් සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග හා එහි ප්‍රතිලාභ පිළිබඳව විස්තරාත්මක වාර්ථාවක් දෙසතියක් ඇතුලත විගණකාධිපති වෙත හා අමාත්‍යාංශ අභ්‍යන්තර විගණන අංශය වෙත ඉදිරිපත් කරන ලෙස උපදෙස් ලබා දී තිබුණද එම

					වාර්තා ලබා දී නොතිබුණි.
09	අමාත්‍යාංශය හා වෙනත් ආයතන මඟින් විවිධ කාර්යයන් සඳහා වර්ෂ 2019 සිට 2022 දක්වා අධිකාරිය වෙත ලබා දී තිබූ රු.38,998,981 ක් අදාල කාර්යයන් සඳහා යොදා ගැනීමකින් තොරව මෙම වාර්තාවේ දිනය වන විටත් බැංකු ජංගම ගිණුමක නිෂ්කාර්යව රඳවා ගෙන තිබුණි.	2023	නිශ්චිත කාර්යයක් වෙනුවෙන් ලද මුදල් එම වර්ෂය තුලදීම අදාල කාර්යය සඳහා උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය.	මෝටර් කාර්මික පුහුණු උපකරණ මිලදී ගැනීම සඳහා වෙන් කර තිබූ ප්‍රතිපාදනයන්ගෙන් රු.මිලියන 27ක් ඉතිරි වීමට ප්‍රධාන හේතුව කොවිඩ් 19 වසංගත තත්වය හා භාණ්ඩ ආනයනය සීමා වීම බව.	2024 ජුලි මස වන විට රු.මිලියන 9 ක උපකරණ පමණක් අධිකාරිය වෙත ලැබී තිබුණි.
10	අධිකාරිය සතු වාහන අළුත්වැඩියා කිරීම හා වෘත්තීය පුහුණු පාඨමාලා හදාරන සිසුන් සඳහා රැකියාගත පුහුණුව ලබාදීමේ අරමුණ ඇතිව අධිකාරිය විසින් 2011 වර්ෂයේ සිට පවත්වාගෙන තිබුණු වාහන නඩත්තු ඒකකය ආයතනයේ කාර්යසාධනයට ඵලදායී ලෙස දායක වී තිබුණි. එහෙත් විවිධ හේතු මත 2018 දෙසැම්බර් 31 දින සිට විධිමත් අනුමැතියක් ලබා ගැනීමකින් තොරව වසාදමා තිබූ අතර මෙම ඒකකය සතුව තිබූ උපකරණ භාවිතා කිරීමෙන් තොරව මෝටර් රථ කාර්මික අංශයේ ගබඩා කර තිබුණි.	2023	පරිපාලන ගැටළු විසඳගෙන වත්කම් ඵලදායීව උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය.	එහි පරිපාලන කටයුතු සහ අධීක්ෂණ කටයුතු විධිමත් අභ්‍යන්තර පරිපාලනයක් සහිතව පවත්වාගෙන යෑම සඳහා සුදුසු නිලධාරී මඩුල්ලකගේ සහභාගීත්වයක් නොවූණ බැවින් තාවකාලිකව නඩත්තු ඒකකය වසා දමන ලද බව.	කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

11	2010 වර්ෂයේ දී රු.5,823,000 ක් වැයකර මිලදීගෙන තිබූ හම්බන්තොට දිස්ත්‍රික්කයේ හේනකඩුව වෙලේවත්ත පිහිටි රූඩ් 02 පර්චස් 33.5 ක ඉඩම හා 2017 වර්ෂයේදී රු.34,030,346 ක් වැයකර දීර්ඝ කාලීන බදු පදනම මත ලබාගත් පානදුර මෝදරවිල පිහිටි අක්කර 01 කින් යුත් ඉඩම් 2023 වර්ෂය වන විටත් වෘත්තීය පුහුණුව සඳහා ඵලදායීව භාවිතා කිරීමකින් තොරව පැවතුණි.	2023	වත්කම් ඵලදායීව උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය.	වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ ආධුනිකයින් සඳහා බාහිර ක්‍රියාකාරකම් සහ දෛනික ක්‍රියාකාරම් සඳහා ඵලදායීව යොදා ගෙන ඇත. පානදුර මෝදරවිල නව මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා අදාළ සැලසුම් සකස් කර ආංශික නිපුනතා සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මුදල් ප්‍රතිපාදන වෙන්කර තිබුණද 2020 වසරේ පැවති වසංගත තත්වය හේතුවෙන් එය ප්‍රමාද වීම නිසා කොන්ත්‍රාත්තුව ප්‍රදානය නොකරන ලද බව.	වෘත්තීය පුහුණුව සඳහා ඵලදායීව භාවිතා කිරීමට කටයුතු කර නොතිබුණි.
12	ඉදිකිරීම් ආරම්භ කිරීමට පෙර ශක්‍යතා අධ්‍යයන වාර්තාවක් ලබාගැනීමට කටයුතු නොකර 2017 වර්ෂයේදී කුච්චවේලි හෝටල් පාසලේ ආධුනිකයින් 52 දෙනෙකුට නවාතැන් ලබාදිය හැකි අංග සම්පූර්ණ කාමර 12 කින් සමන්විත දෙමහල් නේවාසිකාගාර ගොඩනැගිල්ලක් රු.මිලියන 140.21 ක්	2023	ස්ථිර ජල සැපයුමක් ලබා ගෙන ආධුනිකයන්ගේ නේවාසිකාගාර ලෙස භාවිතා කිරීමට කටයුතු කල යුතුයි.	ජල සම්පාදන හා ජල ප්‍රවාහන මණ්ඩලය මගින් ස්ථිර ජල සැපයුමක් ලබා දෙන තෙක් බවුසර් මගින් මධ්‍යස්ථානයට අවශ්‍ය ජල පහසුකම් ලබා දීමේ එකඟතාවය මත මෙම මධ්‍යස්ථානය ආරම්භ කල බව.	එම ගොඩනැගිල්ල ආධුනිකයන්ගේ නේවාසිකාගාර ලෙස තවදුරටත් භාවිතා කිරීමට නොහැකිවී තිබුණි.

වැයකර ඉදිකර තිබුණද එම වර්ෂයේ සිට මේ දක්වාම ස්ථිර ජල සැපයුමක් ලබා ගැනීමට නොහැකි වීම හේතුවෙන් ආධුනිකයන්ගේ නේවාසිකාගාර ලෙස භාවිතා කිරීමට නොහැකිවී තිබුණි.

3.156 ශ්‍රී ලංකා සාගර විශ්ව විද්‍යාලය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	අතිරික්තය (ඌනතාවය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	718,115,199	149,952,382	568,162,817	(573,779)	තත්ත්වාගණනය කළ
2022	2,333,173,590	159,136,066	2,174,037,524	(44,713,970)	තත්ත්වාගණනය කළ
2023	2,324,879,231	169,153,575	2,155,725,656	3,733,753	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණ	විගණන වාර්තාවේ වර්ෂය	විගණකාධිපතිගේ නිර්දේශය	විගණිත ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්වය
01.	2023 දෙසැම්බර් 31 දිනට එකතුව රු.25,997,939 ක් වූ ලැබිය යුතු ගිණුම් තුල අයිතම 6 කට අදාලව එකතුව රු.11,907,417 ක් වසර 5 ඉක්මවා තිබුණද එම ශේෂයන් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම කටයුතු කර නොතිබුණි.	2022 2023	අයවිය යුතු ණය ශේෂ කඩිනමින් අය කර ගැනීමට කටයුතු කළ යුතුය.	මෙම ශේෂයන්ගෙන් අත්තිකාරම් ගිණුමෙන් රු.3,740,167 ක් ගිණුම්තුලින් ලියා හැරීම සඳහා අවශ්‍ය අනුමැතිය ලැබී ඇති අතර ලැබිය යුතු පාඨමාලා ගාස්තු රු.5,913,500 සම්බන්ධව මු.රෙ 109 යටතේ අලාභයන් පොත් වලින් ඉවත්කිරීම සඳහා අවශ්‍ය අනුමැතිය 2024.10.10 දින අමාත්‍යාංශය වෙත යොමුකර ඇත. නේවාසිකාගාර තැන්පතුව රු.1,650,000	ඉතිරි රු.7,563,500 ක සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

				නැවත අයකර ගැනීම සඳහා අවශ්‍ය නීතිමය පියවර ලබා ගනිමින් පවතී.	
02.	2023 ජනවාරි 18 දිනැති අංක BD/HRD/126/214/19/2023 දරන භාණ්ඩාගාර ලේකම් විසින් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් අමතන ලද චක්‍රලේඛ ලිපියේ 5 වන ඡේදය ප්‍රකාරව බැඳුම්කර කඩකරන ලද ආචාර්යවරු දෙදෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂයේ අයකර ගෙන තිබූ රු.2,876,769 ක මුදල භාණ්ඩාගාරය වෙත යැවීමට කටයුතු කර නොතිබුණි.	2023	භාණ්ඩාගාර ලේකම්ගේ චක්‍රලේඛ ලිපියට අනුව අදාල මුදල් භාණ්ඩාගාරය වෙත යැවීමට කටයුතු කළ යුතුය.	මෙම මුදල් සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ අංක 737 සහ අංක 805 හි අන්තර්ගතය 2014 අංක 31 දරන ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාල පනතේ 20 වගන්තියේ (ත) ප්‍රකාරව ලබා දී ඇති බලතල අනුව විශ්වවිද්‍යාලයේ ඉදිරි කටයුතු සඳහා භාවිතා කිරීමට මූල්‍ය කමිටුවේ නිර්දේශ සහිතව විශ්වවිද්‍යාලයේ පාලන මණ්ඩලයට පත්‍රිකාවක් ඉදිරිපත් කර එය රේඛීය අමාත්‍යාංශය මහින් භාණ්ඩාගාරය වෙත යොමුකර එකඟතාවය ලබාගැනීමට කටයුතු කරන බව.	මුදල් භාණ්ඩාගාරය වෙත යැවීමට කටයුතු කර නොතිබුණි.

3.157 ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	අතිරික්තය (ඌනතාවය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	13,541,473,680	23,331,565,771	(9,790,092,091)	(3,054,542,680)	ව්‍යාවනය කළ
2022	36,488,007,215	25,255,849,458	11,232,157,757	484,219,604	ව්‍යාවනය කළ
2023	55,291,220,571	17,734,234,792	37,556,985,779	2,188,818,588	අභිතකර

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපතිගේ නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනයට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01	අමතර කොටස් මිලදී ගැනීම් සඳහා ගිවිසුම් ප්‍රකාරව ගෙවීම් නොකිරීමට එරෙහිව සැපයුම්කාර සමාගමක් විසින් පවරා තිබූ බේරුම්කරණ නඩුවක් හේතුවෙන් සැපයුම්කරුට ගෙවීමට තිබූ මුදල හා පොලී මුදල් වලට අදාළ ඩොලර් වටිනාකම බේරුම්කරණ තීන්දුව ප්‍රකාශයට පත් කළ 2019 මැයි 09 දිනැති නියෝගය අනුව නිරවුල් නොකිරීම මත හා එම මුදල් 2023 වර්ෂය දක්වා ප්‍රමාද වී ගෙවීම් කිරීම හේතුවෙන් රුපියලේ අගය අවප්‍රමාණය වීම මත අවප්‍රමාණික වටිනාකම ලෙස	2023	ගිණුම්කරණ ප්‍රමිතයට අනුව විනිමය අලාභ නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.	බේරුම්කරණයට අදාළ සියලුම ගෙවීම් මේ වන තෙක් ගෙවීම් කර අවසන් නොමැති බැවින් මීට අදාළව ගෙවීමට සිදුවන සම්පූර්ණ මුදල ශ්‍රී ලංකා රුපියල් වලින් තීරණය කිරීමේ අපහසුවක් පවතී. එබැවින් මෙම ගෙවීම් කටයුතු නිරවුල් කිරීමෙන් අනතුරුව ඊට අදාළ ගැළපීම් මූල්‍ය වාර්තා වලට ගැළපීම් කිරීමට කටයුතු කරනු ඇත.	ගිණුම්කරණ ප්‍රමිතියට අනුව ඉදිරි වර්ෂයේදී විනිමය අලාභ නිවැරදිව ගිණුම්ගත කරන බව දන්වා තිබුණි.

	සැපයුම්කරුට රු.මිලියන 462.89 ක මුදලක් වැඩියෙන් ගෙවීමට සිදුවී තිබුණි.				
02	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 (LKAS 16) හි 07 ඡේදයට අනුව දේපල, පිරියත හා උපකරණයක පිරිවැය වත්කමක් ලෙස හඳුනා ගැනීමට නම් එම වත්කමෙහි අනාගත ආර්ථික ප්‍රතිලාභ අස්ථිත්වය තුළට ජනිත කරවීමේ හැකියාවක් පැවතිය යුතු වුවද සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ගිණුම්ගත කර තිබූ රු.1,367,754,792 ක් වූ භාවිතයට ගත නොහැකි ලෙස අබලි වූ බස් රථ සහ රු.1,041,195 ක් වූ භාවිතයට ගත නොහැකි ලෙස අබලි වූ අනෙකුත් වාහන තවදුරටත් දේපල, පිරියත හා උපකරණ ලෙස ගිණුම්ගත කර තිබූ අතර, ඒ සම්බන්ධයෙන් වූ උපලේඛන ද විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	2023	ගිණුම්කරණ ප්‍රමිතයට අනුව වත්කම් නිවැරදිව වර්ගීකරණය කර ගිණුම්ගත කළ යුතු අතර, නිවැරදි වත්කම් උපලේඛන විගණනයට ඉදිරිපත් කළ යුතුය.	2005.10.19 වන දිනැති 2005 අංක 27 දරන ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩල පනත මඟින් සියළුම සේවා ස්ථාන සහ සමාගම් ඒකාබද්ධ කරමින් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය පිහිටුවා ඇත. ඒ අනුව විමසුමෙහි පෙන්වා දී ඇති ශේෂයන් 2005.10.18 දිනට සකසන ලද ඒකාබද්ධ ගිණුම් තුළ නිරූපණය වූ දීර්ඝ කාලයක් පවතින වත්කම් ශේෂ වේ.	ගිණුම්කරණ ප්‍රමිතියට අනුව වත්කම් වර්ගීකරණය කර වත්කම් උපලේඛන නිවැරදිව සකස් කර ඉදිරිපත් කර නොමැත.
03	බදුල්ල, මහියංගනය, කැප්පෙටිපොල, මූතූර් හා කාත්තන්කුඩි ඩිපෝවල පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුම්වල මුදල්	2023	අයිරා ශේෂය පිළිබඳව සොයා බලා වගකිව යුත්තන් සම්බන්ධයෙන් පියවර ගත යුතුය.	බදුල්ල ඩිපෝව විසින් මෙම දෝෂය සිදු කර ඇති බව පිළිගනිමි. මහියංගනය ඩිපෝව හා	අයිරා ලබා ගැනීම සම්බන්ධයෙන් වගකිවයුත්තන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

	ගිණුමට අනුව පැවතිය යුතු අයිරා ශේෂ අවසන් ගිණුම් වල අඩුවෙන් පෙන්වීම හේතුවන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අවසන් ගිණුම්වල පෙන්වා තිබූ එකතු අයිරා ශේෂය රු.14,789,142 කින් අඩුවෙන් දක්වා තිබුණි.			කැප්පෙටිපොල ඩිපෝව, කාත්තන්කුඩි ඩිපෝව විසින් මෙම වරද සිදු කර ඇති බව පිළිගනිමි.	
04	ඉන්දියානු ණය ප්‍රදාන යටතේ මිලදී ගන්නා ලද බස් රථවල දෛනික ආදායමෙන් රු.5,500 ක මුදලක් දෛනිකව ප්‍රාදේශීය කාර්යාල හරහා ප්‍රධාන කාර්යාලයේ ගිණුමකට මාරු කර අරමුදලක් ස්ථාපනය කර තිබූ අතර, ඒ සඳහා මහා භාණ්ඩාගාරයේ හෝ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එම අරමුදල රු.443,065,080 කින් වර්ධනය කර ගෙන තිබූ අතර, මෙය අවසන් ගිණුම්වල වෙනම හෙළිදරව් කර නොතිබුණි.	2023	අරමුදල් ස්ථාපනය විධිමත් විය යුතු අතර, ඒ සඳහා අමාත්‍ය මණ්ඩල හා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගත යුතු වේ.	2023 වර්ෂයේදී ඉන්දියානු ණය ආධාර යටතේ බස්රථ 500 ක් ශ්‍රී ලං.ග.ම. වෙත ලබා දෙන ලදී. මේ සඳහා ගෙවීම් මහා භාණ්ඩාගාරය මඟින් කරනු ලබන අතර මහා භාණ්ඩාගාරය සමග සාමූහික අභිලාෂ ප්‍රකාශය සම්බන්ධ සාකච්ඡාවකදී ලබා දුන් උපදෙස් අනුව මෙම අරමුදල රැස් කර ඇත.	අරමුදල් ඇති කිරීම සඳහා විධිමත් පරිදි අනුමැතිය ලබා ගෙන නොතිබුණි.
05	කොවිඩ් කාල වකවානුව තුළදී ප්‍රාදේශික 09 ක රෝහල් කාර්යය මණ්ඩලය ප්‍රවාහනය සඳහා 2020 වර්ෂයේ	2023	කාර්ය මණ්ඩල ප්‍රවාහන ගාස්තු කඩිනමින් අය කර ගැනීමට කටයුතු කළ යුතුය.	මධ්‍යම රජයේ රෝහල් සහ පළාත් සභා රෝහල් සඳහා ශ්‍රී ලං.ග.ම. විසින් ලබාදී ඇති බස් රථ වෙනුවෙන්	කාර්යය මණ්ඩල ප්‍රවාහන ගාස්තු කඩිනමින් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

	සිට 2021 වර්ෂය දක්වා මණ්ඩලයේ බස් රථ යෙදවීම හේතුවෙන් අය කරගත යුතුව තිබූ රු.මිලියන 151.50 ක් අදාළ සේවාව සපයා අවුරුදු 02 ක් ගත වී තිබුණ ද අය කර ගැනීමට මණ්ඩලය අපොහොසත්වී තිබුණි.			තවදුරටත් ලැබිය යුතු ආදායම අයකර ගැනීම සඳහා සෞඛ්‍යය අමාත්‍යාංශයේ නිලධාරීන් වෙත ලිඛිතව දැනුම් දී ඇත.	
06	ලැබිය යුතු කොන්දොස්තර හිඟ මුදල් ශේෂය ලෙස ගිණුම්ගත කර තිබූ රු.6,168,805 ක ශේෂය තුළ වසර ගණනාවක සිට හිඟව පවතින රු.4,753,550 ක් පවතින අතර, එම ශේෂයෙහි සේවය හැරගිය සහ විදේශගත පුද්ගලයින්ගෙන් ආපසු අය කර ගත නොහැකි වූ රු.328,242 ක මුදලක් හා රත්මලාන ඩිපෝවෙහි විස්තර සොයාගත නොහැකි වූ රු.6,363 ක ශේෂයක් පැවතුණි.	2023	පරීක්ෂා කර බලා හිඟ ශේෂ අය කර ගැනීමට කටයුතු කළ යුතුය	අදාළ ශේෂයන් දිගින් දිගටම මූල්‍ය වාර්තා වල පෙන්නුම් කරන බව පිළිගනිමි. මෙහි සඳහන් මුදල් වලට අදාළ කොන්දොස්තර මහතුන් බොහෝමයක් සේවය අතහැර ගොස්, මිය ගොස් සහ නොදන්වා විදේශ ගතව ඇති බැවින් මෙම මුදල් අයකර ගැනීමට නොහැකි වී ඇත.	හිඟ ශේෂ අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.
07	සමාලෝචිත වර්ෂයේ අවසන් ගිණුම් තුළ ජංගම වගකීම් යටතේ ඇතුළත් කර තිබූ රු.2,712,682,543 ක ගෙවිය යුතු ශේෂය තුළ සේවක වැටුපෙන් අඩු කර තෙවන පාර්ශවයන් වන සමිති සමාගම් හා මූල්‍ය ආයතන ඇතුළු ආයතන 05 ක් සඳහා ගෙවි යුතු වසර	2023	මෙම ශේෂයන් සත්‍ය වශයෙන්ම ගෙවිය යුතු ශේෂයක් ද යන්න තහවුරු කර ගැනීම සඳහා ශේෂ සනාථ ලබා ගෙන ගිණුම් කරණ දෝෂ යක් නම් ආදායමට ගැනීමට කටයුතු කළ යුතුය.	මෙම ශේෂයන් මූල්‍ය වාර්තා තුළ අතීතයේ සිට පැවත එන ශේෂයන් වේ. 2005 සිට 2017 දක්වා කාලය තුළ ශ්‍රී ලං.ග.ම. තුල පැවති මූල්‍ය අර්බුදය හේතුවෙන් සැපයුම්කරුවන්ට ගෙවීම් කිරිමේදි ඩිපෝ මට්ටමින්	සත්‍ය වශයෙන්ම ගෙවිය යුතු ශේෂයන් ද යන්න තහවුරු කර ගෙන ගිණුම්කරණ දෝෂය ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි.

	දෙකකට වඩා වැඩි රු.109,516,143 ක් හා ගිණුම් 27 කට අදාළ වසර දෙකක් ඉක්මවූ රු.2,603,166,400 ක ණයහිමි ශේෂයක් පවතින අතර, එය සාවද්‍ය ගිණුම් සටහනක් බව නිරීක්ෂණය වන බැවින් ආදායමට බැර කිරීමට කටයුතු කර නොමැති අතර, මෙම ශේෂයන්ගෙන් රු.1,078,029,266 ක් වසර 10 ක් ඉක්මවූ ණය ශේෂ විය.			ගෙවීම් කිරීමට නොහැකි වූ අවස්ථාවන්හිදී සැපයුම් දාමය අඛණ්ඩව පවත්වා ගැනිම සඳහා අදාළ වවුචර් පත් ප්‍රධාන කාර්යාලයට ගෙන්වා ගෙන ගෙවීම් කර ඇත.	
08	මුදල් රෙගුලාසි 105 ප්‍රකාරව අලාභ හානි සම්බන්ධව අය කර ගත හැකි උපරිම අගය හා අය කර ගත යුතු මුදල තීරණය කළ යුතු වුවත් පිරිවැය රු.1,041,195 ක් වටිනා හානි වූ මෝටර් වාහන සම්බන්ධයෙන් යථෝක්ත මුදල් රෙගුලාසි අනුව කටයුතු කර නොමැති අතර, 2022 මැයි 09 දින සිදුවූ කලබලකාරී සිද්ධියේදී හානියට පත් බස් රථ හා වාහන වටිනාකම වූ රු.12,136,724 ක් සම්බන්ධයෙන් ද මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාර කටයුතු කර නොතිබුණි.	2021 / 2022 / 2023	අලාභ හානි අය කර ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතුය	විගණනය විසින් පෙන්වා දී ඇති අලාභානි අගය රු.12,136,724 ක් නිවැරැදි වේ. මෙම අලාභය මේ වන තෙක් අයකර ගැනීමට නොහැකිවී ඇත්තේ එම කටයුත්තට අදාළව සිදුවන විමර්ශණ කටයුත්ත තවමත් අවසන් කර නොමැති බැවිනි.	අලාභහානි අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

09	මුදල් රෙගුලාසි 208 (ඈ) ප්‍රකාරව නිසි ගණන්දීමේ නිලධාරියාගේ පූර්ව අනුමැතියකින් තොරව, වාර්ෂික විසර්ජන පනත හරහා වෙන් කර තිබූ ප්‍රතිපාදන අදාළ කාර්යය සඳහා පමණක්ම යෙදවිය යුතු නමුත් සමාලෝචිත වර්ෂයේ බස් රථ පුනරුත්ථාපනය සඳහා ලබා දුන් රු.34,740,000 ක මුදල විධිමත් අනුමැතියකින් තොරව වෙනත් කාර්යයන් සඳහා යොදවා තිබුණි.	2023	රජයේ ප්‍රතිපාදන අදාළ කාර්යය සඳහා පමණක් යෙදවීමට වගබලා ගත යුතුය.	විගණන විමසුමෙහි පෙන්වා දී ඇති පරිදි ජාතික අයවැයෙන් කොටස් හිමියන් සඳහා වන්දි මුදල් ගෙවීමට ලබාදුන් මුදල ලෙස ලබාදී ඇති රු.8,981,180 ක මුදල වෙනත් කාර්යයක් සඳහා යොදවා නොමැත.	රජයේ ප්‍රතිපාදන අදාළ කාර්යය සඳහා පමණක් යොදවා නොතිබුණි.
10	මුදල් රෙගුලාසි 387 ප්‍රකාරව චෙක්පත් මගින් කෙරෙන සියලුම ගෙවීම් සඳහා තම බැංකු ශේෂය ප්‍රමාණවත්දැයි ගෙවන නිලධාරියා විසින් නිතරම සොයා බැලිය යුතු අතර, කිසිම ආණ්ඩුවේ බැංකු ගිණුමකින් අයිරා ලබා ගැනීම තහනම් වුවත්, මණ්ඩලය විසින් 2023 දෙසැම්බර් 31 දිනට රු.548,969,542 ක අයිරාවක් පවත්වාගෙන තිබූ අතර, ඒ සඳහා අයිරා පොලිය ලෙස සමාලෝචිත වර්ෂය තුළදී රු.907,131 ක මුදලක් ගෙවා තිබුණි.	2022 / 2023	අයිරා පහසුකමක අවශ්‍යතාවය උද්ගත නොවන පරිදි මූල්‍ය කළමනාකරණය කර ගත යුතුය.	විගණන විමසුමෙහි පෙන්වා දී ඇති පරිදි 2023.12.31 දිනට රු.548,969,542/- ක මුදල මුදල් පොතට අනුව අයිරාව වේ. එලෙස අයිරාවක් පැන නැඟීමට හේතුවක් වනුයේ බවුසරයක් සඳහා ගෙවනු ලබන චෙක්පතෙහි වටිනාකම රු.මි.2.5 කට ආසන්න වීමත්, පසු දින ආදායමින් එම චෙක්පතෙහි වටිනාකම ආවරණය කරගැනීමේ අපේක්ෂාවෙන් ඉන්ධන ලබා	අයිරා පවත්වා ගෙන යාම වැළැක්වීමට උත්සහා කර නොතිබුණි.

				ගැනීමත් නිසාය.	
11	මුදල් රෙගුලාසි 395 (ඇ) ප්‍රකාරව බැංකු ගිණුමක් ඇති සෑම ආයතනයක් විසින්ම එක් එක් මාසය අවසානයේදී දී ඇති ගණුදෙනු තත්ත්වය සම්බන්ධයෙන් ඊළඟ මාසයේ 15 වන දිනට පෙර බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කළ යුතු වුවත් හර ශේෂ වටිනාකම රු.13,392,009 ක් වූ ජංගම ගිණුම් 08 ක සහ රු.9,794,929 ක අයිරා ශේෂ සහිත ජංගම ගිණුමක බැංකු සැසඳුම් ප්‍රකාශ විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.	2022 / 2023	යාවත්කාලීනව බැංකු සැසඳුම් සකස් කර විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය.	ලැයිස්තුවේ සඳහන් ගිණුම් 02 ක් ඉතිරි කිරීමේ ගිණුම් වන අතර, එම ගිණුම් සඳහා බැංකු සැසඳුම් ප්‍රකාශ සකස් කිරීමේ අවශ්‍යතාවයක් නොමැත.	බැංකු සැසඳුම් යාවත්කාලීනව සකස් කර නොතිබුණි.
12	මුදල් රෙගුලාසි 395 (ඇ) ප්‍රකාරව 2023 දෙසැම්බර් මස සකසන ලද බැංකු සැසඳුම් ප්‍රකාශන අනුව නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ රු.19,247,645 කට අදාළ ඩිපෝ 05 ක හා ඉන්ධන පිරවුම් හල් 02 ක මුදල් නොවූ චෙක්පත් පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	2022 / 2023	මුදල් නොවූ චෙක්පත් පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් කළ යුතුය.	ලැයිස්තුවේ සඳහන් ගිණුම් 02 ක් ඉතිරි කිරීමේ ගිණුම් වන අතර, එම ගිණුම් සඳහා බැංකු සැසඳුම් ප්‍රකාශ සකස් කිරීමේ අවශ්‍යතාවයක් නොමැත.	මුදල් නොවූ චෙක්පත් පිළිබඳ විස්තර ඉදිරිපත් කර නොතිබුණි.
13	මුදල් රෙගුලාසි 486 ප්‍රකාරව තලංගම ඩිපෝව මගින් අධිවේගී	2023	අගරු චෙක්පත් සම්බන්ව මුදල් රෙගුලාසි අනුව	අමාත්‍ය මණ්ඩල තීරණයට යටත්ව මූල්‍ය බැඳීම් හා	අගරු චෙක්පත් පිළිබඳව මුදල් රෙගුලාසි ප්‍රකාරව

	මාර්ග ප්‍රවාහන (පුද්ගලික) සමාගම වෙත 2023 වර්ෂය තුළදී ඉන්ධන ලබා දීම වෙනුවෙන් එම සමාගම විසින් ලබා දී තිබූ රු.1,511,560 ක වටිනාකමින් යුත් අංක 144266 හා අංක 144253 දරන චෙක්පත් දෙක අගරු වී තිබූ බව නිරීක්ෂණය වූ අතර, ඒ පිළිබඳව මුදල් රෙගුලාසි විධිවිධාන පරිදි කටයුතු කර නොතිබුණි.		කටයුතු කළ යුතුය.	වගකීම් ශ්‍රී ලං.ග.ම. විසින් දැරිය යුතු බැවින් ඒ අනුව මෙම අයකිරීම ශ්‍රී ලං.ග.ම. වෙතම පැවරී ඇත. කෙසේ නමුත් විගණන විමසුම මඟින් පෙන්වා දී ඇති රු.1,511,560/- ක මුදල අගරු වීම සම්බන්ධව සහකාර කළමනාකාර මුදල් වෙතින් නිදහසට කරුණු විමසා ඇත.	කටයුතු කර නොතිබුණි.
14	1983 අංක 12 දරන පාරිතෝෂික පනතේ විධිවිධාන අනුව සේවයෙන් ඉවත්වූ සේවකයන් හට ඔවුනට හිමි පාරිතෝෂික මුදල ඉවත් වූ දිනයේ සිට මාසයක් ඇතුළත ගෙවිය යුතු වුවද, මීතොටමුල්ල ඩිපෝවේ සේවකයන් හට ඉවත් වූ දිනයේ සිට මාසයක් ඇතුළත පාරිතෝෂික ගෙවීමට අපොහොසත් වීම හේතුවෙන් 2023 සැප්තැම්බර් 11 විගණිත දින වන විට පාරිතෝෂික අධිභාර වශයෙන් රු.459,729 ක මුදලක් ගෙවීමට සිදුවී තිබුණි.	2023	පාරිතෝෂික අධිභාර වගකිව යුතු පුද්ගලයින්ගෙන් අය කර ගත යුතුය.	මෙම සේවක මහතා 2017.10.21 වන දින විශ්‍රාම ගොස් සිටි අතර ඔහුට 2018.07.09 හා 2019.01.17 යන දින වාර දෙකකදී පාරිතෝෂිත ගෙවා ඇත. දැඩි මූල්‍ය අර්බුදයක් හේතුව මත පාරිතෝෂික මුදල් මාසයක් ඇතුලත ගෙවා ගැනීමට නොහැකි වී ඇත.	අධිභාර වගකිව යුතු පුද්ගලයින් ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.
15	අධිවේගී මාර්ගයේ ධාවනය කිරීම සඳහා නව බස් රථයක් මිලට ගැනීම වෙනුවෙන්	2023	නව බස් රථයක් මිලදී ගැනීමට හෝ අත්තිකාරම් මුදල ගෙවීමට	තංගල්ල ඩිපෝව වෙත බස් රථයක් ලබා ගැනීම සඳහා ගත් මුදල 2022	නව බස් රථ මිලදී ගැනීමට ලබා දුන් මුදල් ආපසු ගෙවා නොතිබුණි.

	අත්තිකාරම් මුදල ලෙස රු.5,000,000 ක් 2022 දෙසැම්බර් 01 දින තංගල්ල ඩිපෝව විසින් රුහුණ ප්‍රාදේශීය කාර්යාලය වෙත බැර කර තිබුණ ද, 2023 දෙසැම්බර් 31 දින දක්වා නව බස් රථය හෝ ලබා ගත් මුදල අදාළ ඩිපෝව වෙත ආපසු ලබා දීමට ප්‍රාදේශීය කාර්යාලය මගින් කටයුතු කර නොතිබුණි.		කටයුතු කළ යුතු ය.	වර්ෂයේදී අවුරුදු 60 සම්පූර්ණ කර ඇති සියළුම දෙනා විශ්‍රාම යැවීමට කටයුතු කරන ලෙස රජය මඟින් දැනුවත් කිරීමත් සමග ඔවුන්ගේ පාරිතෝෂිත මුදල් ගෙවීමට රුහුණු ප්‍රාදේශිකය වෙත ලබා දීමට කටයුතු කරන ලදී.	
16	මණ්ඩලයට අයත් අධි සුඛෝපභෝගී බස් රථ 125 කට GPS ඒකක හා CCTV කැමරා පද්ධති සවි කිරීම සඳහා පුද්ගලික සමාගමක් සමඟ 2018 වර්ෂයේදී ගිවිසුම්ගතව තිබූ අතර ඒ සඳහා 2018 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා රු.මිලියන 33 ක් ගෙවා තිබුණි. මෙම පද්ධති සවි කිරීම සඳහා අධි සුඛෝපභෝගී බස්රථ ලබා නොදීම, පරිගණක මෙහෙයුම් පද්ධතියක් ස්ථාපනය නොකිරීම, අන්තර්ජාල පහසුකම් ලබා නොදීම ආදී කරුණු මත ව්‍යාපෘතිය මේ වන විට සම්පූර්ණයෙන්ම අසාර්ථක වීමෙන් මණ්ඩලය විසින් ගෙවන ලද සම්පූර්ණ මුදලම පාඩුවක් වී තිබූ අතර එම උපකරණද	2021/ 2023	මූලික ශක්‍යතා අධ්‍යයනයක් හරහා අවශ්‍යතා නිසි පරිදි හඳුනාගෙන නිරන්තර අධ්‍යයන මගින් නිවැරදිව ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමට කටයුතු කළ යුතු අතර, සිදු වූ පාඩුව ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කළ යුතුය.	අදාළ ආයතනය සමඟ ශ්‍රී ලං.ග.ම. අත්සන් කළ ගිවිසුම අනුව මෙම උපකරණ සඳහා ගෙවීම් කළ අතර, මෙම සැපයුම්කරු සඳහා මුදල් ගෙවීමේදී නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ධාවන) විසින් අදාළ උපකරණ නිසි ලෙස සවිකර ඇති බවටත්, එම උපකරණ ක්‍රියාකාරී තත්ත්වයේ පවතින බවටත් ලබාදුන් සහතික කිරීම මත මෙම උපකරණ වලට අදාළව සැපයුම්කරු සඳහා ගෙවීම් සිදුකර ඇත. මීට අමතරව මෙම ගෙවීම්වලට අදාළ අවසන් වාරික ගෙවීම සඳහා වෙනම අධ්‍යක්‍ෂ මණ්ඩල අනුමැතියක්	අවශ්‍යතා නිසි පරිදි හඳුනාගෙන නිරන්තර අධ්‍යයනය මගින් නිවැරදිව ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමට කටයුතු කර නොතිබූ අතර, පාඩුව ප්‍රතිපූර්ණය කර ගැනීමට ද කටයුතු කර නොතිබුණි.

	අස්ථානගතවී තිබුණි.			ලබාගැනිමෙන් පසුව සිදුකර ඇත.	
17	ලංසුකරුවන්ගෙන් මිල ගණන් කැඳවීමකින් තොරව වෙළඳපොල මිලට වඩා රු.19.64 ක වැඩි මිලකට ඩිපෝ 24 ක් මඟින් ටිකට් රෝල් 364,400 ක් මිලදී ගැනීම වෙනුවෙන් රු.මිලියන 7.16 ක් වැඩිපුර ගෙවා තිබූ අතර, ටිකට් රොල් මිලදී ගැනීම සඳහා ලංසු කැඳවා තිබියදී සාරාණුකූලව ප්‍රතිචාර දැක්වූ ලංසුකරුගේ මිල ගණන් වලට වඩා රු.59.19 (රු.108.84-රු.49.65) ක වැඩි මිලකට ටිකට් රෝල් 603,180 ක් මිලදී ගැනීම වෙනුවෙන් රු.මිලියන 35.70 වශයෙන් එකතුව රු.මිලියන 42.86 ක් වැඩිපුර ගෙවා තිබුණි. එමෙන්ම මුල් සැපයුම්කරු විසින් සපයන ලද ටිකට් රෝල් කඩදාසිවල පළල, රෝලක විශ්කම්භය හා රෝලක තිබිය යුතු තත්ත්ව බර විචලනය වී තිබූ අතර, ප්‍රවේශ පත්‍ර කඩදාසිවල කාබන් ඇතුරුම් පෘෂ්ඨය ප්‍රමාණවත් නොවීම තුළ ප්‍රවේශ පත්‍ර පැහැදිලිවම මුද්‍රණය වී නොතිබුණි.	2023	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව මිලදී ගැනීම් සිදු කළ යුතු අතර, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලට පටහැනි මෙවැනි ක්‍රියා වැළැක්වීමට හා සිදු වූ පාඩු අය කර ගැනීමට කටයුතු කළ යුතුය.	සියළුම ප්‍රාදේශිකයන් සඳහා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ධාවන) තැන විසින් බෙදා වෙන්කර ඇති ටිකට් රෝල් ප්‍රමාණයන් සම්බන්ධයෙන් ප්‍රාදේශිකයන් දැනුවත් කර ඇත. විගණනය විසින් පෙන්වාදී ඇති පරිදි අනුමත නොකළ සැපයුම්කරුවන්ගෙන් ටිකට් රෝල් මිලදී ගෙන ඇත්නම් ඒ පිළිබඳව සොයාබලා අවශ්‍ය විනය ක්‍රියාමාර්ග ගැනිමට කටයුතු කරන බව දන්වා සිටිමි.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව මිලදී ගැනීම් සිදු කර නොතිබූ අතර, මෙවැනි ක්‍රියා වැළැක්වීමට හා සිදුවූ පාඩු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

18	නැවත පිරවූ ටයර් 8,840 ක් හා පෙරසවි ටයර් 34,856 ක් මිලදී ගැනීමේ දී තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශ අනුමත කිරීමකින් තොරව ලංසු කැඳවීමට පෙර සලකා බැලිය යුතුව තිබූ කරුණු හා සාධක සලකා බැලීමට යටත්ව ප්‍රසම්පාදන කමිටුව විසින් ටෙන්ඩරය සඳහා අනුමැතිය ලබා දීම කල්දමා තිබුණි. 2017 වර්ෂයේ සිට නව ටෙන්ඩර් කැඳවීමකින් තොරව 2022 වර්ෂය දක්වා ටයර් මිලදී ගනිමින් තිබූ මිල ගණන් ටෙන්ඩර් කැඳවා තෝරාගත් සැපයුම්කරුවන් විසින් ඉදිරිපත් කළ මිල ගණන් වලට වඩා 2022 වර්ෂයේ මිල ගණන් ඉහළ වීම පිළිබඳ සලකා බැලීමකින් තොරව හා සාරානුකූල ලංසුකරුවන්ට ටෙන්ඩරය පිරිනමා මිලදී ගැනීම සිදු නොකර ටයර් මිලදී ගනිමින් තිබූ මිල ගණන් මතම මිලදී ගැනීම හේතුවෙන් රු.මිලියන 356 ක් වැඩිපුර ගෙවා තිබුණි.	2023	නිවැරදිව හා පූර්ව අධ්‍යයනයකින් යුතුව ප්‍රසම්පාදන කටයුතු සැලසුම් කළ යුතු අතර, ආයතනයට උපරිම වාසි ගෙන එන ලෙස ලංසුකරුවන් තෝරා ඔවුන්ට ටෙන්ඩර් පිරිනැමිය යුතු වේ. එමෙන්ම ටෙන්ඩර් ප්‍රමාද කර පූර්ව සැපයුම්කරුවන් ට වාසි ලැබෙන පරිදි කටයුතු කළ ටෙන්ඩර් මණ්ඩලයට එරෙහිව ක්‍රියා කළ යුතුය.	අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 19/3139/123/084-I අනුව 2019.11.11 දින පැවති රැස්වීම් තීරණයට අනුව නව ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවසන් වන තෙක් ශ්‍රී ලං.ග.ම. ටයර් නැවත පිරවීම සහ පෙරසවි කිරීමේ සේවාවන් වර්තමාන සැපයුම්කරුවන් වෙතින් මිලදී ගැනීමට අනුමැතිය හිමිවී ඇත. මේ සම්බන්ධයෙන් තාක්‍ෂණික ඇගයීම් කමිටුව විසින් ඉදිරිපත් කරන ලද තාක්‍ෂණික ඇගයීම් කමිටු වාර්තාව 2022.07.06 දින පැවති අමාත්‍ය මණ්ඩල ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව වෙත යොමු කිරීමෙන් පසු එම කමිටුව විසින් ඒ සඳහා අනුමැතිය ලබා නොදුන් බව සහ නව ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කරන ලෙස දන්වමින් ප්‍රවාහන අමාත්‍යාංශයේ ලේකම් තැන දැනුවත් කර ඇත.	ආයතනයට උපරිම වාසි ගෙන එන ලෙස සැපයුම්කරුවන් තෝරා ඔවුන්ට ටෙන්ඩරය පිරිනැමීමට කටයුතු කර නොතිබූ අතර, සැපයුම්කරුවන්ට වාසි අත්වන පරිදි ටෙන්ඩර් මණ්ඩලය කටයුතු කර තිබුණි.
19	සමාලෝචිත වර්ෂය තුළ බස් රථ සඳහා වැය කර ඇති ඉන්ධන වියදම රු.මිලියන	2023	බස් රථ වල ඉන්ධන පොම්ප අළුත්වැඩියා කර ධාවනයට	ඉන්ධන පොම්ප අළුත්වැඩියා කර ධාවනය වන අඩු ඉන්ධන	බස් රථවල ඉන්ධන පොම්ප අළුත්වැඩියා කර ඒ තුළින් ඉන්ධන වියදම අඩු කර

40,415.45 ක් විය. ශ්‍රී ලංගම රථ ඇණියට අළුතින් එක් කළ බස් රථ 500 ට අමතරව අනෙක් සියළුම බස් රථ වසර 05 කට වඩා වයසින් වැඩි බස් රථ වන අතර, මෙම බස් රථ වල ඉන්ධන පොම්පවල පවතින දුර්වලතාවය මත ඉන්ධන දහනය අධික බව විගණන භෞතික පරික්ෂාවේදී නිරීක්ෂණය විය. මේ සම්බන්ධව සිදු කරන ලද භෞතික නියැදි පරීක්ෂාවකට අනුව අලුත්වැඩියා කරනලද ඉන්ධන පොම්පයකින් ධාවනය කළ හැකි කිලෝමීටර ප්‍රමාණය 3.8 සිට 4.0 ක පරාසයක වූ අතර මණ්ඩලයට අයත් සෑම ඩිපෝවක්ම බස් රථ වල ඉන්ධන තුලනය කරනුයේ ලීටරයකට කි.මී.2.5 ත් 3.1 ත් අතර පරාසයක බැවින්, ඉන්ධන තුලනය ලීටරයකට කිලෝමීටර් 3.8 ක ප්‍රමාණයකින් පවත්වා ගැනීමේදී ඉන්ධන ලීටරකින් ධාවනය වන කිලෝමීටර් ප්‍රමාණය 0.7 ක් එනම් සියයට 18 ක ප්‍රතිශතයකින් වැඩි විය යුතු අතර වාර්ෂික ඉන්ධන පිරිවැය රු.මිලියන 7,274.78 කින් අඩු කර ගත

යොදවා ඒ තුළින් ඉන්ධන වියදම අඩුකර ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතුය.

ක්‍රියාකාරිත්වයක් සහිත බස්රථ වලට සවි කිරීම තුළින් ඉන්ධන ක්‍රියාකාරිත්වය ඉහළ මට්ටමකට ගෙන ආ හැකි බව පිළිගන්නා අතර, වර්තමානයේ ප්‍රාදේශීය වැඩපොළ තුළ ඉන්ධන පොම්ප අළුත්වැඩියා කිරීම උපරිම ධාරිතාවයකින් සිදු කරනු ලබයි.

ගැනීමට කටයුතු කර නොතිබුණි.

	හැකිව තිබියදී පිළිබඳ කළමනාකරණයේ අවධානය යොමුව නොතිබුණි.				
20	ඉන්ධන නිකුත් කිරීම සම්බන්ධව තලංගම ඩිපෝ කළමනාකරු හා අධිවේගී මාර්ග ප්‍රවාහන (පුද්ගලික) සමාගම සමඟ ඇති කර ගෙන තිබූ අවබෝධතා ගිවිසුමකට අනුව පළමුව රු.500,000 ක තැන්පත් මුදලක් තැබීමටත් එම තැන්පතු මුදලින් සියයට 80 ක් දක්වා ඉන්ධන නිකුත් කිරීමටත් එකඟ වී තිබුණි. අවබෝධතා ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව ලබා දිය හැකි ණය සීමාව රු.400,000 ක් වූ අතර, එම ණය සීමාව ඉක්මවා රු.1,978,010 ක් වටිනා ඉන්ධන, ඩිපෝ කළමනාකරණය විසින් ණය පදනම මත එකී සමාගම වෙත ලබා දී තිබූ අතර එසේ ඉන්ධන නිකුත් කිරීම වෙනුවෙන් ඩිපෝවට ලැබිය යුතුව තිබූ රු.2,378,010 ක මුදල අය කර ගැනීමට නොහැකි වී තිබුණි.	2023	ගිවිසුම්ගත කොන්දේසි අනුව කටයුතු කළ යුතුය.	අධිවේගී ප්‍රවාහන සමාගම ඇවර කරන බවට අමාත්‍ය මණ්ඩල තීරණය දැනුම් දුන් පසු දුන් රු.1,511,560 ක් වටිනා අංක 144266 හා 144253 දරන චෙක්පත් 02 අගරු විය. ඉන් අනතුරුව අදාළ බස්රථ සඳහා ඩීසල් ලබා දීම අත්හිටවනු ලැබීය.	ගිවිසුම් හා සීමාවන් ඉක්මවා ණය පදනම මත ඉන්ධන නිකුත් කළ නිළධාරීන් සම්බන්ධයෙන් මෙතෙක් කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත.
21	රිය අනතුරු වන්දි නඩු වලින් විසඳුම් ලබා දී තිබූ NWP/HCCA/KUR/106/2019/F දරන නඩුවේ තීන්දුව හා	2023	වන්දි ප්‍රතිපූර්ණය කිරීමට කටයුතු නොකිරීම සම්බන්ධව වගකිව යුත්තන්ට එරෙහිව	අංක NWP/HCCA/KUR/106/2019/F දරන නඩුවේ තීන්දුව මඟින් නියම වූ	වන්දි ප්‍රතිපූරණය කිරීමට කටයුතු නොකළ පුද්ගලයන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

	කාර්යය සටහන් අනුව රියදුරුගේ නොසැලකිලිමත්භාවය හේතුවෙන් 2023 වර්ෂයේදී රු.3,965,000 ක් වන්දි වශයෙන් ගෙවා තිබූ අතර, වැල්ලවාය දිසා අධිකරණයේ පැවති නඩු අංක 1135/M දරණ නඩුවේදී රියදුරු වරද පිළිගැනීම හේතුවෙන් රු.2,125,000 ක වන්දියක් ගෙවා තිබුණි. මේ අනුව මණ්ඩලය විසින් ගෙවා තිබූ මුළු වන්දි මුදල රු.6,090,000 ක් වන අතර, මණ්ඩලය විසින් මෙම නඩුවට විෂය මූලික වූ බස් රථ දෙක රක්ෂණය කර නොතිබූ බැවින්, පාඩුව රක්ෂණයෙන් හානිපූරණය කර ගත නොහැකි වී තිබුණි.		ක්‍රියාමාර්ග ගත යුතුය.	රු.3,965,000.00 ක මුදල 2023.08.23 වන දින පැමිණිලිකාරියට ගෙවන ලදී. එසේම වැල්ලවාය දිසා අධිකරණයේ නඩු අංක 1135/M නඩුවේ පැමිණිලිකරු රිය අනතුර හේතුවෙන්ම ස්ථිර ආබාධයකට ලක් වී ඇති බවට සාක්ෂි අධිකරණයේ ඉදිරිපත් වී ඇත. ඒ අනුව ස්ථිර ආබාධයකට ලක් වී ඇති බව යන කරුණ වන්දි ගෙවීමේදී වැඩි වන්දි ප්‍රමාණයක් නියම කිරිමට පාදක කරගෙන ඇත.	
22	රුහුණ ප්‍රාදේශීය කාර්යාලය විසින් පාලනය වන ඩිපෝවන් විසින් ධාවනය කළ යුතු දුර ගමන් සේවා 41 ක් හා කෙටි ගමන් සේවා 124 ක් දීර්ඝකාලීනව ධාවනය නැවතී තිබූ බවත්, එම නිසා දෛනිකව අහිමි වන ධාවන කිලෝමීටර් ප්‍රමාණය 43,245 ක් වන අතර, මෙම සේවා වාර 165 ක් ධාවනයට එක් නොකිරීම	2023	බස් රථ මිලදී ගැනීමේදී හා මෙහෙයුම් කටයුතු සිදු කිරීමේදී මණ්ඩලයට පාඩු සිදු නොවන ලෙස හා මහජනතාවට උපරිම සේවයක් සැලසෙන පරිදි ධාවන කටයුතු සැලසුම් කළ යුතුය.	රුහුණු ප්‍රාදේශිකයේ ඩිපෝ මඟින් ධාවනය කරනු ලබන කෙටි දුර සේවා වලින් මගී අවශ්‍යතාවය මත ධාවනය කරනු ලබන බස්රථ අවශ්‍යතාවය හඳුනාගෙන බස්රථ ධාවනයට එක් කර ඇත.	බස් රථ මිලදී ගැනීමේදී හා මෙහෙයුම් කටයුතු සිදු කිරීමේදී මණ්ඩලයට පාඩු සිදු නොවන ලෙස කටයුතු සැලසුම් කර නොතිබුණි.

	හේතුවෙන් 2023 වර්ෂය තුළදී මණ්ඩලයට අහිමි ව තිබූ ආදායම රු.2,430,801,450 ක් විය.				
23	2012 වර්ෂයේ සිට වසර 04 ක් අඛණ්ඩව මිලදී ගන්නා ලද රු.මිලියන 1,942 ක් වටිනා අත්‍යාවශ්‍ය නොවන අමතර කොටස් බොහොමයක් ගබඩාවේ නිෂ්කාර්යව පවතින බව නිරීක්ෂණය විය. එමෙන්ම එම අමතර කොටස් සඳහා ගෙවීම් ප්‍රමාද කිරීම හේතුවෙන් සැපයුම්කාර සමාගම් විසින් පවරන ලද බේරුම්කරණ නඩුවේ සමථ තීන්දුව ප්‍රකාර ගෙවිය යුතු වූ රු.මිලියන 664 ක් සැපයුම්කරු වෙත නොගෙවීම හේතුවෙන් සැපයුම්කරු විසින් නැවත බේරුම්කරණ නඩුවක් පවරා තිබුණි. එහි 2023 වර්ෂයේ සමථ තීන්දුව ප්‍රකාර රු.මිලියන 1,126 ක් ගෙවීම් කිරීමට සිදු වීම හේතුවෙන් රු.මිලියන 462 ක විනිමය පාඩුවක් මණ්ඩලයට සිදුවී තිබුණි.	2023	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ අනුමත සීමාවන්ට යටත්ව මිලදී ගැනීම් පරිපාටිය ක්‍රියාවට නැගිය යුතු අතර, මිලදී ගනු ලබන භාණ්ඩ තාක්ෂණිව සුදුසු බවට තහවුරු කර ඒ සඳහා ගෙවීම් කළ යුතු වේ. එමෙන්ම ප්‍රසම්පාදන පරිපාටි උල්ලංඝණය කරමින් කටයුතු කළ නිලධාරීන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගත යුතුය.	මෙම සිද්ධිය සම්බන්ධයෙන් සම්පූර්ණ වාර්තාවක් ඇමුණුමක් ලෙස ඉදිරිපත් කර ඇත.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ අනුමත සීමාවන්ට යටත්ව මිලදී ගැනීම් පටිපාටිය ක්‍රියාවට නගා නොතිබූ අතර, තාක්ෂණිකව නොසුදුසු භාණ්ඩ සඳහා ගෙවීම් කර තිබූ අතර, ප්‍රසම්පාදන පරිපාටි උල්ලංගණය කළ නිලධාරීන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.
24	2018 වර්ෂයේදී ආසන 32-35 බස්රථ 100 ක් හා 50-54 බස්රථ 400	2023	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ අනුමත	2018.06.05 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය වෙනස්	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ අනුමත

	ක් වශයෙන් බස්රථ 500 ක් මිලදී ගැනීමට ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර තිබුණද එය මිලදී ගෙන නොතිබුණි. 2023 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ආසන 32 ක් සහිත Ashok Leyland Lynx නව බස් රථ 500 ක් එක් බස් රථයක් USD 26,662.50 බැගින් USD 13,311,250 කට එනම් රු.මිලියන 5,513 කට Ashok Leyland Limited India වෙතින් මිලදී ගෙන තිබුණි. ඒ අනුව එක් බස් රථයක වටිනාකම රු.මිලියන 11.02 ක් වූ අතර ආසන 32-35 බස් රථයක 2018 වර්ෂයේ ඇස්තමේන්තු වටිනාකම වූ රු.මිලියන 5 ට අනුව එම වර්ෂය තුළ ප්‍රසම්පාදන කටයුතු සිදු කර බස් රථ මිලදී නොගැනීම හේතුවෙන් 2023 වර්ෂයේදී ඇස්තමේන්තුගත වටිනාකමට වඩා රු.මිලියන 6.02 ක් වශයෙන් රු.මිලියන 3,010 ක් වැඩියෙන් ගෙවා තිබුණි.		සීමාවන්ට යටත්ව මිලදී ගැනීම් පරිපාටිය ක්‍රියාවට නැගිය යුතු අතර, මිලදී ගනු ලබන භාණ්ඩ තාක්ෂණිව සුදුසු බවට තහවුරු කර ඒ සඳහා ගෙවීම් කළ යුතු වේ. එමෙන්ම ප්‍රසම්පාදන පරිපාටි උල්ලංඝණය කරමින් කටයුතු කළ නිලධාරීන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගත යුතුය. මූලික අවශ්‍යතාවන් නිසි පරිදි හඳුනා ගෙන මූල්‍ය ශක්‍යතාවය අනුව මහජන අවශ්‍යතාවයන් කාර්යක්ෂම හා සුවපහසු ලෙස ඉටු කිරීමට හැකිවන පරිදි තීන්දු තීරණ ගෙන බස් රථ මිලදී ගැනීමේදී මගීන්ට සුව පහසුව ගමන් කළ හැකි බස් රථ සේවාවක් හඳුන්වා දිය යුතුය.	කොට 2020.01.01 දින ඉදිරිපත් කර තිබූ බස් රථ මිලදී ගැනීමේ යෝජනාව අමාත්‍ය මණ්ඩලය අනුමත කර ඇත. තාක්ෂණික දෝෂ වගකීම් කාලය තුළ අශෝක් ලේලන්ඩ් ආයතනය මගින් සිදු කර දෙන බව දන්වා ඇත.	සීමාවන්ට යටත්ව මිලදී ගැනීම් පරිපාටිය ක්‍රියාවට නගා නොතිබූ අතර, මිලදී ගනු ලබන භාණ්ඩ තාක්ෂණිව සුදුසු බවට තහවුරු කර නොතිබුණි. ප්‍රසම්පාදන කටයුතු උල්ලංඝණය කර නිලධාරීන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.
25	2019 මැයි 09 දිනැති බෙරුම්කරණ නියෝගයට අනුව	2023	තොග අයිතම වල වටිනාකම තක්සේරු කර	දැනට මීට අදාළ බෙරුම්කරණ කටයුතු අවසන්	තොග අයිතම් තක්සේරුකර තොගයට ගැනීමටත්

	ස්ටීල් ඉම්පෙක්ස් ඇන්ඩ් ඉන්ඩස්ට්‍රීස් ආයතනය සඳහා නොගෙවූ බිල්පත් වලට ගෙවීම් කරන ලද රු.75,384,696 ක වටිනාකමින් යුත් ලැබීම් නියෝග 20 කට අදාළ තොග අයිතම් ගබඩා පොත්වලට ගෙන තිබූ අතර, එම අමතර කොටස් භාවිතා කරන ටාටා වර්ගයේ හා ලේලන්ඩ් වර්ගයේ පැරණි බස් රථ දැනට භාවිතයෙන් ඉවත්ව තිබූ බැවින්, නිශ්කාර්යව පැවති අතර අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.		තොගයට ගැනීමටත් භාවිතා නොකරන තොග සම්බන්ධව අවශ්‍ය ඩිපෝවන් වලට ලබා දීමට හෝ අපහරණයකිරීම ටත් කටයුතු කළ යුතුය.	කර ඇති අතර ඊට අදාළ තොග ශ්‍රී ලං.ග.ම. තොගයට ගනිමින් ඇත. එසේ ලබා ගන්නා තොගයන්හි පවතින අයිතම ශ්‍රී ලං.ග.ම. රථ ඇණිය සඳහා භාවිතා කළ හැකි නම් ඒවා හඳුනාගෙන ඩිපෝවන් වෙත ලබා දීමට කටයුතු කරනු ලබන අතර, එකී තොග භාවිතා කළ නොහැකි නම් ඊට අදාළ අපහරණ කටයුතුද ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ඇත.	භාවිතා නොකරන තොග ඩිපෝවන් වලට නිකුත් කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.
26	මණ්ඩලයේ ඒකල ප්‍රධාන ගබඩාවේ 2023 වර්ෂයේ අවසානයට සිදු කළ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව අමතර කොටස් වර්ග 50 කට අදාළව රු.7,186,995 ක වටිනාකමින් යුත් අමතර කොටස් 10,039 ක් දැනට භාවිතයට ගත නොහැකි තත්ත්වයේ භාණ්ඩ බව වාර්තා කර තිබුණු නමුත් අපහරණයට කටයුතු කර නොතිබුණි.	2023	තොග අයිතම වල වටිනාකම තක්සේරු කර තොගයට ගැනීමටත් භාවිතා නොකරන තොග සම්බන්ධව අවශ්‍ය ඩිපෝවන් වලට ලබා දීමට හෝ අපහරණය කිරීමටත් කටයුතු කළ යුතුය.	වාර්තාව පදනම් කරගෙන ශ්‍රී ලං.ග.ම. සියළු ඩිපෝවන් වෙත දැනුවත් කර ඇත්තේ, එම ලේඛන තුළ අඩංගු අයිතම වලින් ඩිපෝවන් වලට අවශ්‍ය අමතර කොටස් තිබේ නම් එම අමතර කොටස් අදාළ ඩිපෝවන් වෙත ලබාදීමට කටයුතු කල හැකි බවයි.	තොග අයිතම් තක්සේරුකර තොගයට ගැනීමටත් භාවිතා නොකරන තොග ඩිපෝවන් වලට නිකුත් කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.
27	2023 වර්ෂයේදී බස් රථ සඳහා නව ටයර් මිලදී ගැනීමේදී ඉදිරිපත් කරන ලද ලංසු තාක්ෂණික	2023	මිලදී ගැනීම් සිදු කිරීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු	ටයර් මිලදී ගැනීම සඳහා ලංසු කැඳවීමේ දී ලංසු පත්‍රිකාව මඟින් ඉදිරිපත් කළ	මිලදී ගැනීම් සිදු කිරීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතු

	පිරිවිතරයන්ට අනනුකූල බවට තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් තීරණය කරන ලද තෝරාගත් සැපයුම්කරුවෙකුට සභාපතිවරයාගේ උපදෙස් මත ටෙන්ඩරය පිරිනැමීමට පෙර නව ටයර් 2,660 ක ඇණවුමක් ලබා දී තිබුණි. ඒ අනුව ගෙන්වන ලද ටයර් තාක්ෂණික පිරිවිතරයන්ට අනනුකූලව තිබියදී අදාළ සැපයුම්කරුට උක්ත ටෙන්ඩරය පිරිනමා තිබූ අතර, එකී සමාගමෙන් රු.මිලියන 355.73 ක් වටිනා නව ටයර් 5,842 කින් ටයර් 516 ක් ගම්පහ ප්‍රාදේශිකයට නිකුත් කර තිබූ අතර එම ටයර් අතරින් අකාලයේ අසාර්ථක වූ ටයර් 43 ක් සඳහා ප්‍රතිදාන අය කර ගැනීමට හෝ ගිවිසුම් ප්‍රකාර නව ටයර් ලබා ගැනීමට මණ්ඩලය විසින් කටයුතු කර නොතිබුණි.		කළ යුතු අතර, මිලදී ගනු ලබන ටයර් තාක්ෂණිකව සුදුසු බවට පරීක්ෂා කර භාවිතය සඳහා මුදා හැරිය යුතුය.	පිරිවිතරයන් හා තෝරා ගත් ලංසුකරු ලබා දී තිබූ පිරිවිතරයන් කොතරම් දුරට ගැළපෙන්නේ ද යන්න බලා ලිඛිත තොරතුරු පදනම් කර ගනිමින් තාක්‍ෂණ ඇගයීම් කමිටුව Ferentino Tyre සමාගමේ ටයර් මිලදී ගැනීම නිර්දේශ කර තිබුණ ද මණ්ඩලීය පිළිවෙත් අනුව භෞතික පරීක්‍ෂාවක් සිදු කර පිරිවිතරයන්ට අනුකූල වූ ටයර් පමණක් භාර ගැනීම සිදුවේ.	අතර, මිලදී ගනු ලබන ටයර් තාක්ෂණිකව සුදුසු බවට පරීක්ෂා කර භාවිතය සඳහා මුදා හැරිමට කටයුතු කර නොතිබුණි.
28	බස්රථ වලට ඉන්ධන හා ලිහිසි තෙල් මිලදී ගැනීමේ ප්‍රසම්පාදන කටයුතු කඩිනම් කරන ලෙස අමාත්‍ය මණ්ඩලය 2022 නොවැම්බර් නියෝග කර තිබියදී 2022 ඔක්තෝබර් මස	2023	ප්‍රසම්පාදනයක නියත කාලය තුළ ප්‍රසම්පාදන මාර්ගෝපදේශව ලට අනුව සිදු කර මිලදී ගැනීම කඩිනම් කිරීම හරහා අවිධිමත් මිලදී ගැනීම්	තාක්‍ෂණික ඇගයීම් කමිටු වාර්තාව 2023.04.10 දිනට ප්‍රථම ලබාදීමට ප්‍රසම්පාදන කාලසටහන (PTS) අනුව නියමිතව තිබූ නමුත් ලබාදීමට හැකිව ඇත්තේ	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලට අනුව මිලදී ගැනීම් කඩිනම් කර අවිධිමත් මිලදී ගැනීම් අත්හිටුවීමට කටයුතු කර නොතිබුණි.

	ආරම්භ කළ ප්‍රසම්පාදන කටයුතු 2023 මැයි මස අවසන් කර ටෙන්ඩරය ප්‍රදානය කළ යුතුව තිබුණි. නමුත් 2023 දෙසැම්බර් මස ටෙන්ඩරය ප්‍රදානය කිරීම මත රු. මිලියන 682 කට මිලදී ගත හැකිව තිබූ එම ද්‍රව්‍යයන් සඳහා මිල සැඳහුම් ක්‍රමය යටතේ මිලදී ගැනීමට රු.මිලියන 1049 ක් ගෙවීමට සිදු වීමෙන් රු.මිලියන 367 ක් වැඩිපුර ගෙවීමට සිදුව තිබුණි.		අත්හිටුවීමට කටයුතු කළ යුතුය.	2023.08.25 දින දීය. අනතුරුව 2023.10.09 දින පැවති ස්ථාවර අමාත්‍යමණ්ඩල ප්‍රසම්පාදන කමිටුව (SCAPC) කමිටුවේදී තාක්‍ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශ අනුමත කළ අතර 2023.12.11 පැවති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව 2023.12.22 දින අදාළ ආයතන 02 වෙත ටෙන්ඩරය පිරිනමා ඇත.	
29	මණ්ඩලයේ බස් රථ ඇණිය සඳහා 2023 වර්ෂයට අවශ්‍ය අශෝක් ලේලන්ඩ් වැසි අමතර කොටස් මිලදී ගැනීම අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුව මගින් සිදු කළ යුතුව තිබූ අතර, එය 2022 ඔක්තෝබර් 14 දින ආරම්භ කර 2023 මැයි 03 දින කොන්ත්‍රාත්තුව පිරිනැමිය යුතුව තිබුණි. අශෝක් ලේලන්ඩ් එන්ජින් හා ගියර් පෙට්ටි අමතර කොටස් මිලදී ගැනීම අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව හරහා 2022 ඔක්තෝබර් 12 දින ආරම්භ කර 2023 අප්‍රේල් 02 දින කොන්ත්‍රාත්තුව පිරිනැමිය යුතුව තිබුණි.	2023	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කළ යුතු අතර, අදාළ ප්‍රසම්පාදනයන් නියමිත කාලය තුළ නිමා කර අමතර කොටස් හිඟය නැති කර බස් රථ නියමිත පරිදි ධාවනයට යෙදවීම සඳහා අවශ්‍ය සහය ලබා දිය යුතුය.	තාක්‍ෂණ ඇගයීම් කමිටු වාර්තාව 2023.04.10 දින ලබාදීමට නියමිතව තිබුණද, 2023.05.08 වන දින අමාත්‍යාංශය වෙත ලබාදී ඇත. 2023.05.16 දින පැවති SCAPC කමිටු රැස්වීමේදී TEC මගින් නිර්දේශිත සාරානුකූල අවම ලංසු ඉදිරිපත් කරන ලද ආයතන 05 ක් වෙත ප්‍රසම්පාදනය පිරිනැමීමට තීරණය කරන ලදී. ඒ අනුව පිරිනැමීමේ ලිපි 2023.09.15 වන දින එම ආයතන 05 වෙත	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කර නොතිබූ අතර, නියමිත කාලය තුළ ප්‍රසම්පාදනයන් නිමා කර අමතර කොටස් හිඟය මඟ හරවා බස් රථ ධාවනයට යෙදවීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කර නොතිබුණි.

මෙම මිලදී ගැනීම් කඩිනම් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් 2022 නොවැම්බර් 14 දින ප්‍රතිපත්තිමය තීරණයක් ලබා දුන්නද අශෝක් ලේලන්ඩ් වැසි අමතර කොටස් මිලදී ගැනීමේ ටෙන්ඩරය පිරිනැමීම මාස 03 කුත් දින 16 ක් ප්‍රමාද වී තිබූ අතර, අශෝක් ලේලන්ඩ් එන්ජින් හා ගියර් පෙට්ටි මිලදී ගැනීමේ ටෙන්ඩරය මාස 08 කුත් දින 03 ක් ප්‍රමාද වී ප්‍රදානය කර තිබුණි. අශෝක් ලේලන්ඩ් එන්ජින් හා ගියර් පෙට්ටි අමතර කොටස් අයිතම් 533 ක් සඳහා ලැබී තිබූ ලංසු සඳහා තෝරාගත් ලංසුකරුවන් 07 දෙනෙකුට එයින් අයිතම 168 ක් සඳහා ප්‍රසම්පාදන සිදු කිරීමටත්, නැවත මිල කැඳවීමකින් තොරව ඉතිරි අයිතම 365 සඳහා 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව මිලදී ගැනීම් සිදු කළ යුතු බවට ටෙන්ඩර් මණ්ඩලය තීරණය කර තිබුණි. අශෝක් ලේලන්ඩ් වැසි අමතර කොටස් 240 ක වාර්ෂික අවශ්‍යතාවය 74,256 ක් වූ අතර, මිලදී ගැනීමට තීරණය කර තිබූ ප්‍රමාණයෙන්

නිකුත් කර ඇත. 2023.09.06 වන දින පැවති අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව (MPC) කමිටු රැස්වීමේදී TEC මඟින් නිර්දේශිත සාරානුකූල අවම ලංසු ඉදිරිපත් කරන ලද ආයතන 06 ක් වෙත ප්‍රසම්පාදනය පිරිනැමීම තීරණය කරන ලදී. 2023.12.05 වන දින ශ්‍රී ලං.ග.ම. සභාපති වෙත ලැබී ඇති අතර, ඒ අනුව, පිරිනැමීමේ ලිපි 2023.12.14 වන දින එම ආයතන 06 වෙත නිකුත් කර ඇත.

	මාස 04 ක අවශ්‍යතාවය වූ අයිතම 24,752 ක් සඳහා ඉදිරිපත් කර තිබූ ලංසු අනුව අමතර කොටස් 180 ක් සඳහා ලංසුකරුවන් 05 දෙනෙකුට රු.මිලියන 88.01 කට ටෙන්ඩරය පිරිනමා තිබූ අතර ඉතිරි අයිතම 60 සඳහා අර්පනයක් නොතිබූ බැවින්, එම අයිතම් 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වගන්ති 2.14.1 ට අතිරේක 35 ලෙස නිකුත් කර තිබූ 2020 මාර්තු 25 දිනැති නියෝගය අනුව ප්‍රසම්පාදනය කළ යුතු බව ටෙන්ඩර් මණ්ඩලය විසින් දන්වා තිබුණි. කෙසේ වෙතත් 2023 වර්ෂය තුළදී මෙම ටෙන්ඩර් දෙක ප්‍රදානය මගින් කිසිදු අමතර කොටසක් ලැබී නොතිබූ අතර, පාලන ගිණුම් අංක W-5 යටතේ ඩිපෝ හා ප්‍රාදේශීය කාර්යාල මගින් මිල සැඳහුම් ක්‍රමය යටතේ අමතර කොටස් මිලදී ගැනීම සඳහා රු.මිලියන 2,032.62 ක් වැය කර තිබුණි.				
30	රියදුරු හා කොන්දොස්තර මහතුන්ගේ අතිකාල වියදම් හැර කාර්යාල හා අනෙකුත් වැඩබිම් කාර්යය මණ්ඩලයන්හි	2023	ස්වයං පාලන ක්‍රමවේද හරහා අතිකාල පාලනයට ක්‍රියාමාර්ග ගැනීම හා	2022 ට වඩා 2023 වර්ෂයේ දළ වශයෙන් 33% ආසන්න ප්‍රමාණයකින් අතිකාල වැඩිවීම	අතිකාල පාලනයට ක්‍රියාමාර්ග ගැනීම හා අතිකාල අධීක්ෂණයට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

	සමාලෝචිත වර්ෂයේ අතිකාල වියදම රු.මිලියන 896 ක් වූ අතර, 2022 වර්ෂයේ අතිකාල වියදම වන රු.මිලියන 671 හා සංසන්දනයේදී අතිකාල වියදම රු.මිලියන 225 ක් එනම් සියයට 33 ක ප්‍රමාණයකින් වැඩි වී තිබුණි. අදාළ සේවකයන්ට සාමාන්‍ය රාජකාරි වේලාවන්හිදී ඉටු කළ යුතු කාර්යය පිළිබඳව රාජකාරි ලැයිස්තු ලබා නොදීම, ඇඟිලි සලකුණු යන්ත්‍ර හරහා පැමිණීම හා පිටවීම සනාථ කර ඒ අනුව අතිකාල ගණනය නොකිරීම, පාලනයකින් තොරව අඛණ්ඩව දිවා රාත්‍රී එක දිගට දින දෙකකට වැඩි කාලයක් අතිකාල රාජකාරිවල නිරතවීම අසාමාන්‍ය ලෙස අතිකාල වර්ධනය වීමට හේතු වී තිබුණි.		අතිකාල අධීක්ෂණයට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය	පිළිගනී. ශ්‍රී ලං.ග.ම. අතිකාල ලේඛන ගත හා ලේඛන ගත නොවන වශයෙන් කොටස් දෙකකින් ලබා දෙනු ලබයි. මෙහිදී විශේෂයෙන් ලේඛන ගත අතිකාල පාලනය කල නොහැකිය.	
31	එක්සත් ජාතින්ගේ තිරසර සංවර්ධනය සඳහා වූ 2030 න්‍යාය පත්‍රයට අනුව එම න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීමට අදාළ වන අරමුණු හඳුනාගෙන ඒ සඳහා අවශ්‍ය සම්පත් හා ධාරිතාවන් සුරක්ෂිත කිරීමට මණ්ඩලය විසින් කටයුතු කර	2022 / 2023	එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධනය සඳහා වූ 2030 න්‍යාය පත්‍රය අනුව මණ්ඩලය විසින් හඳුනාගත් කාර්යසාධන දර්ශක (KPI) සකස් කර ඒ සඳහා අනුමැතිය ලබා ගත යුතු	එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධනය සඳහා වූ 2030 න්‍යාය පත්‍රය අනුව මණ්ඩලය විසින් හඳුනාගත් කාර්යසාධන දර්ශක (KPI) සකස් කර ඒ සඳහා අනුමැතිය ලබා ගත යුතු වේ.	එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධනය සඳහා වූ 2030 න්‍යාය පත්‍රය අනුව මණ්ඩලය විසින් හඳුනාගත් කාර්යසාධන දර්ශක (KPI) සකස් කර ඒ සඳහා අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

	නොතිබූ අතර, තිරසර සංවර්ධන ඉලක්ක කරා ළඟාවීම පරීක්ෂා කිරීම සඳහා මණ්ඩලය විසින් භාවිතා කරන කාර්යය සාධන දර්ශක (KPI) මොනවාද යන්න හඳුනාගෙන නොතිබුණි.		වේ.		
32	2022 දෙසැම්බර් 31 දිනට වෙනත් ලැබිය යුතු ආදායමක් ලෙස පෙන්වා තිබූ රු.1,549,623,472 ක පොලිස් බලපත්‍ර ශේෂය තුළ වසර 10 ඉක්මවූ රු.44,957,258 ක් ද වසර 05 ත් 10 ත් අතර රු.91,395,964 ක ශේෂයක් ද වසර 02 ත් 05 ත් අතර රු.120,493,842 ක ශේෂයක් පැවතිය ද එම ශේෂ අයකර ගැනීම සඳහා විධිමත් ක්‍රියාමර්ග ගෙන නොතිබුණි.	2022	ලැබිය යුතු පොලිස් බලපත්‍ර ශේෂය තුළ වසර දෙකට වැඩි අය නොවූ මුදල් ශේෂයන් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ.	මුදල් වර්ෂයට අදාළ සියළුම පොලිස් වවුචර් සඳහා ලැබිය යුතු මුදල නොලැබෙන අතර ඒ හේතුවෙන් ඩිපෝවෙහි ගිණුම් වාර්තා නිවැරදි ලෙස පවත්වාගෙන යාමට නොහැකිවී ඇත. එමෙන්ම ප්‍රධාන කාර්යාලය වෙත පොලිස් මූලස්ථානයෙන් ලැබෙන මුදල ඒ ඒ ඩිපෝවන්ට අදාළව ගෙවිය යුතු මුදල ලෙස බෙදාහැරීමක් සිදු නොවන බැවින් ගිණුම් කටයුතු වල දෝෂ සිදුවන බව නිරික්ෂණය වී ඇත.	ලැබිය යුතු පොලිස් බලපත්‍ර ශේෂය තුළ අය නොවූ මුදල් ශේෂයන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.
33	2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව රාජකාරි සඳහා සේවයට වාර්තා කරන නිලධාරීන්ගේ පැමිණීම හා පිටවීම තහවුරු කිරීම සඳහා, ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා	2022	පැමිණීම හා පිටවීම ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතයෙන් සටහන් කළ යුතු අතර අතිකාල ගෙවීමේදී වේලාවන් තහවුරු කර ගැනීම සඳහා	වයරින් පද්ධති මුළුමනින්ම අක්‍රිය මට්ටමේ පැවති අතර වයරින් පද්ධතිය පිලිසකර කිරීම සඳහා රු.369,600 ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් විය. මේ වන විටත්	පැමිණීම හා පිටවීම ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතයෙන් සටහන් කළ යුතු අතර අතිකාල ගෙවීමේදී වේලාවන් තහවුරු කර ගැනීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කර නොතිබුණි.

	කළ යුතු අතර, තම රාජකාරියට අමතරව ඇමතුම් රාජකාරි වැනි නිශ්චිත රාජකාරි සඳහා කාර්යාලයට වාර්තා කරන නිලධාරීන් ද, ඔවුන්ගේ පැමිණීම ඇඟිලි සලකුණු යන්ත්‍ර මගින් සනාථ කළ යුතු වේ. නමුත් ප්‍රධාන කාර්යාලය, ප්‍රාදේශීය කාර්යාල හා ඩිපෝවන්හි 2019 වර්ෂයේ සිට පැමිණීම හා පිටවීම සටහන් කිරීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කර නොතිබුණි. මේ හේතුවෙන් අතිකාල හා නිවාඩු දින වැටුප් ගෙවීම්වල නිරවද්‍යතාවය පිළිබඳව විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය. තවද ප්‍රධාන කාර්යාලයෙහි ඇති ඇඟිලි සලකුණු යන්ත්‍ර අළුත්වැඩියා කිරීම සඳහා 2022 වර්ෂයේදී රු.369,600 ක මුදලක් ද වැයකර ඇතත් ඒවා තවදුරටත් ක්‍රියාත්මක තත්වයට පත්කර නොමැති බව නිරීක්ෂණය විය.		ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කළ යුතු වේ.	ශ්‍රී ලං.ග.ම. සඳහා නව යන්ත්‍ර 250 ක් මිලදී ගැනීමට ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර ඇත. සේවකයන්ගේ පැමිණීම මෙන්ම අතිකාල ගෙවීම් සඳහා කාලය ගණනය කිරීම් නිවැරදිව කරගැනීමට ඇති හැකියාව පිළිබඳව ගැටළු නිර්මාණයවී ඇති බවද පිළිගනිමි.	
34	රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED 1/2015 හි 3.1 වගන්තියෙහි ඇතුළත් වගුවේ 4 වගන්තිය අනුව, 2006 වසරේ නිකුත් කරන ලද	2022	වැඩියෙන් ලබා ගෙන ඇති ඉන්ධන වලට අදාළ පිරිවැය අදාල පාර්ශවයන්ගෙන් අය කර ගැනීමට	නිලධාරීන් රාජකාරී ගමන් සඳහා ලබාගත් ඉන්ධන ප්‍රමාණය පිළිබඳවත් ඔවුන් ගමන් ගත් ආකාරයත් ලබා ගත් ඉන්ධන	වැඩියෙන් ලබා ගෙන ඇති ඉන්ධන වලට අදාළ පිරිවැය අදාල පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

	කළමණාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක MSD 30 ප්‍රකාරව HM 1-1 ගණයේ හෝ ඊට ඉහළ එම දෙපාර්තමේන්තුවෙන් අනුමත කරන ලද තනතුරක් දරණ වෙනත් ඕනෑම නිලධාරියෙකුට වර්තමාන සංශෝධනයට අනුව නිල වාහන භාවිතා කිරීමට හිමිකම් ඇති ඉන්ධන ප්‍රමාණය ලීටර් 115 ක් වුවද ඩිපෝ වල ඩිපෝ අධිකාරි ඇතුළු නිලධාරීන් භාවිතා කරන වාහන වලට 2022 වර්ෂයේ එම සීමාව ඉක්මවා ඉන්ධන ලබා ගෙන තිබූ අතර ඒ සඳහා වැය කර තිබූ මුදල රු.2,747,405 ක් විය.		කටයුතු කළ යුතු වේ.	රාජකාරී කටයුතු සඳහා භාවිතා කළේද යන්න පිළිබඳව සොයා විධිමත් වාර්තාවක් ලබා ගැනිමෙන් අනතුරුව රාජකාරී කටයුතු වලින් පරිබාහිර කටයුතු සඳහා ඉන්ධන ලබාගෙන ඇත්නම් එය අය කිරීමට කටයුතු කරන බව දන්වමි.	
35	මණ්ඩලය විසින් පළාත් මට්ටමින් වායු විමෝචන මධ්‍යස්ථාන 09 ක් ඉදි කිරීම සඳහා අදාළ උපකරණ කට්ටල 2018 අප්‍රේල් 26 දින මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙහි වායු විමෝචන භාරකාර අරමුදල වෙතින් භාරගෙන තිබූ අතර, ඒ සඳහා එකී අරමුදල වෙතින් රු. මිලියන 22 ක් වැය කර තිබුණි. මෙම වායු	2021 / 2022	මෙම වායුවිමෝචන මධ්‍යස්ථාන අක්‍රිය තත්වයට පත් කිරීම සඳහා කටයුතු කළ පුද්ගලයින් සොයා බලා ඔවුන්ගෙන් එම අලාභය අය කර ගැනීමටත්, සම්බන්ධිත පුද්ගලයින්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීමටත්	මෙම ව්‍යාපෘතියේ ශක්‍යතා වාර්තා සැකසීමක් අවශ්‍ය නොවීමට හේතුවූයේ 2016.03.09දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය හේතුවෙනි. මෙම ව්‍යාපෘතිය ඉදිරියට නොයාමට හේතු වූයේ සැපයුම්කරුවන් දෙපාර්ශවයක් විසින් ගෙන තිබූ අධිකරණමය	වායු විමෝචන මධ්‍යස්ථාන අක්‍රිය තත්වයට පත් කිරීම සඳහා කටයුතු කළ පුද්ගලයින්ගෙන් අලාභය අය කර ගැනීමට හෝ ඔවුන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි.

විමෝචන මධ්‍යස්ථානවලට අදාළ සිවිල් වැඩ ඉදිකිරීම වෙනුවෙන් රු. මිලියන 89.84 ක ඇස්තමේන්තු මුදලින් 2022 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 27.96 ක මුදලක් වැය කර තිබුණි. මෙම වායු විමෝචන මධ්‍යස්ථාන 09 හි භූමිය ඇස්පෝල්ට් යොදා කාපට් කිරීම සඳහා 2018 අගෝස්තු 16 දින රු. මිලියන 49.9 කට මග නැඟුම මාර්ග ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ සමාගම හා ගමනාගමන මණ්ඩලය ගිවිසුමකට එළඹ තිබූ නමුත් ඒ සඳහා දරණ ලද වියදම් විගණනය සඳහා ඉදිරිපත් නොවීය. දැනට මෙම වායු විමෝචන මධ්‍යස්ථාන ක්‍රියාත්මක නොවන අතර, වායු විමෝචන භාරකාර අරමුදල මගින් ලබා දී තිබූ රු. මිලියන 22 ක උපකරණ දිරාපත් වෙමින් පවතින බව නිරීක්ෂණය විය. තවද මෙම වායු විමෝචන මධ්‍යස්ථාන සඳහා ඉදි කරන ලද ගොඩනැගිලි වෙනත් කාර්යයන් සඳහා භාවිතා කර තිබූ අතර, උපකරණ කට්ටල සමඟ ලබාදුන් පරිගණක වෙනත්	කටයුතු කළ යුතු වේ.	ක්‍රියාමාර්ගය මෙම ව්‍යාපෘතිය ඉදිරියට ගෙන යාමට සාධකයක් වේ යයි යන වැරදි අවබෝධය මතය.

	කාර්යයන් සඳහා යොදා ගෙන තිබුණි. ඒ අනුව වැය කරන ලද රු. මිලියන 49.96 ක මුදල සහ ඉදිරිපත් නොකරන ලද අනෙකුත් වියදම් නිෂ්කාර්යය වියදමක් වී තිබුණි.				
36	කටුබැද්ද අධි සුඛෝපභෝගී සංචාරක ප්‍රවාහන සේවයට අයත් වටිනාකම රු.10,800,000 ක් වූ අධි සුඛෝපභෝගී බස් රථයක් අධිවේගී මාර්ගයේදී අනතුරකට ලක් වී අලුත්වැඩියාවන් සිදුනොකර ධාවන තත්වයෙන් ඉවත් කර තිබුණි. ඒ සඳහා පූර්ණ රක්ෂණාවරණයක් ලබාගෙන තිබුණද රක්ෂණ සංස්ථාවෙන් ලබාදී තිබූ කාලය තුළ බස් රථයෙහි අලුත්වැඩියාවන් සිදුකිරීමට ඩිපෝ අධිකාරි විසින් අපොහොසත්වීම නිසා හානි පූර්ණය කිරීම රක්ෂණ සංස්ථාව විසින් ප්‍රතික්ෂේප කර තිබුණි.	2022	අදාළ වගකිව යුතු පුද්ගලයින්ගෙන් අය කර ගැනීමට හෝ ඔවුන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතු වේ.	අදාල අනතුරු අලාභය රක්‍ෂණ වන්දි මඟින් ප්‍රතිපූර්ණය කරගැනීමට එවකට එහි කළමනාකාරිත්වය ක්‍රියාකර නැත. මෙ පිළිබඳ සත්‍ය තොරතුරු අනාවරණය කර ගැනිමට නැවත විමර්ශයක් ආරම්භ කිරීමට කටයුතු යොදා ඇත.	වගකිව යුතු පුද්ගලයින්ගෙන් පාඩු අයකර ගැනීමට හෝ ඔවුන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි.
37	පහසුකම් හා තත්වය උසස් කිරීම තුළින් පිරිවැය පාලනය අරමුණු කර වැඩි ධාරිතාවයෙන් යුත් නවීන යන්ත්‍ර උපකරණ වලින් සමන්විත ටයර් පෙරසවි කිරීමේ කර්මාන්ත ශාලාව	2022	කර්මාන්ත ශාලාවේ ධාරිතාව වැඩි කර නිෂ්පාදනය වැඩි කිරීම හරහා විශාල පිරිවැයකින් සිදු කරන මිලදී ගැනීම් නවතාලිය	2022 වර්ෂයේ මේ සඳහා රු.මි.50 ක් වෙන් කර තිබූ අතර, ජාතික තරඟකාරී මිල ගණන් යටතේ පුවත්පත් දැන්වීමක් පළ කර අදාල මිල කැඳවීම් සිදුකරන	කර්මාන්ත ශාලාවේ ධාරිතාව වැඩිකර නිෂ්පාදනය වැඩි කිරීම හරහා විශාල පිරිවැයකින් සිදු කරන මිලදී ගැනීම් නවතාලීමට කටයුතු කර නොතිබුණි.

	නවීකරණය සඳහා 2022 වර්ෂයට රු. මිලියන 50 ක් වෙන් කර තිබූ අතර, ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 69.4 ක් වී තිබුණි. ඒ තුළින් දැනට පවතින නිෂ්පාදනාගාරයේ ධාරිතාවය වන ඒකක 15,000 ක් දක්වා දෙගුණ කිරීමට සැලසුම්කර තිබූ නමුත් එම කාර්යය ඉටු නොවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී මණ්ඩලයේ කලාප 06 ක් මගින් පමණක් රු.786,866,930 ක වටිනාකමින් යුත් පෙරසවි ටයර් 53,706 ක් මිලදී ගෙන තිබූ බව නිරීක්ෂණය විය. තවද කර්මාන්ත ශාලාවේ පවතින නිෂ්පාදන ධාරිතාවය උපරිම ලෙස උපයෝගී කරගෙන ටයර් පෙරසවි කිරීම කළ හැකි වූවත් අදාළ ප්‍රාදේශික හා ඩිපෝ වලින් පෙරසවි කිරීම සඳහා අවශ්‍ය ටයර් කර්මාන්ත ශාලාව වෙත එවීමට කටයුතු කර නොතිබුණි.		යුතු වේ.	ලදී. නමුත් එකී ප්‍රසම්පාදන කටයුත්තේදී මිල ගණන් ඉදිරිපත් කළ ආයතන අතරින් ආයතනයක් තෝරා ගැනීමට පත් කළ තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් නිර්දේශ කර ඇත්තේ මේ සඳහා නව ප්‍රසම්පාදන කටයුත්තකට යාම සුදුසු බවයි. ඊට හේතු ලෙස ඔවුන් දන්වා ඇත්තේ එම ආයතන මගින් අදාල යන්ත්‍ර මිලදී ගැනීමට පෙර භෞතික පරීක්ෂාවක් සඳහා ලබාදිය නොහැකි බව සහ ඉදිරිපත් කර ඇති යන්ත්‍ර ආනයනය කර ලබා දීමට හැකි බවය.	
38	සී/ස අර්ථසාධක වත්කම් ලංකා සමාගම (Provident Property Lanka LTD) වෙත පවරා තිබූ ශ්‍රී ලංකා ගමනාගමන	2022	මණ්ඩලය සතු ඉඩම් වෙනත් පාර්ශවයන් වෙත පැවරීමේදී එම ඉඩම් පිළිබඳ නිවැරදි පත්තීරු	ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය 2015 වර්ෂයට පෙර සේවක අර්ථසාධක අරමුදලට ගෙවිය	මණ්ඩලය සතු ඉඩම් වෙනත් පාර්ශවයන් වෙත පැවරීමේදී එම ඉඩම් පිළිබඳ නිවැරදි පත්තීරු පත් හා වටිනාකම ලබා ගෙන

මණ්ඩලයට අයත් රු.10,250,500,000 ක් වූ ඉඩම් වටිනාකම සේවක අර්ථසාධක අරමුදලෙහි ආයෝජනය කර ශ්‍රී ලංගම වෙත මුදල් ලබා දීමට 2016 ජුනි මස 07 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව තීරණය කර තිබූ නමුත් එම සමාගම විසින් ඒ සඳහා මුදල් ගෙවා නොතිබුණි. ශ්‍රී ලංගම විසින් සමාගම වෙත පවරා දී තිබූ එම ඉඩම් ශ්‍රී ලංගම වෙත ආපසු පවරා ගැනීමට 2022 දෙසැම්බර් 31 දින දක්වා කටයුතු කර නොතිබුණි. මෙම ඉඩම් කට්ටි අතර, මණ්ඩලයේ ගමනාගමන මෙහෙයුම් සඳහා අත්‍යාවශ්‍ය කැස්බෑව, හෝමාගම, මහරගම, මොරටුව හා කටුබැද්ද ඩිපෝවලට අයත් වූ හෙක්ටයාර් 12.1566 ක් හා පිලියන්දල බස් නැවතුම්පලට අයත් හෙක්ටයාර් 0.3306 ක ඉඩමක්ද තිබූ බව නිරීක්ෂණය විය. දැනටමත් මෙම සමාගම අක්‍රිය සමාගමක් බවට සමාගම් රෙජිස්ට්‍රාර් මගින් ලබාගත් තොරතුරු අනුව තහවුරු විය. එසේ තිබියදී 2023 ජනවාරි	පත් හා වටිනාකම ලබා ගෙන ඒවා නිසි පරිදි ගිණුම් ගතකර පැවරීම් හෝ අලෙවි කිරීම් සිදු කළ යුතු වේ.	යුතු මුදල පියවීමට විසඳුමක් ලෙස ශ්‍රී ලං.ග.ම. සතුව පැවති නමුත් එම ඉඩම් එවකට පරිහරණය කරන ලද ආයතන වෙතම පවරා ලැබෙන මුදලින් හිඟ අර්ථසාධක අරමුදල් පියවා දැමීමට කටයුතු කරන ලෙස අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබාදෙන ලදී . ඒ අනුව ශ්‍රී ලං.ග.ම. භාරයේ පැවතුන ඉඩම් කට්ටි 13 ක නොදියුණු තක්සේරු වටිනාකම මත එම ඉඩම් තක්සේරු කර නිදහස් දීමනා පත්‍ර මඟින් ප්‍රොවිඩන් ප්‍රොපටි ලංකා සමාගම වෙත පවරා ඊට අදාල මුදල ලබා දෙන ලෙස අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දෙන ලදී. කොතලාවල ආරක්‍ෂක විශ්ව විද්‍යාලයට පවරා ගත් වේරහැර ඉඩම සඳහා ලැබූ රු.මි. 5,054 ක මුදලින් ශ්‍රී ලං.ග.ම. සේවක අර්ථසාධක අරමුදල් ගෙවා	ඒවා නිසි පරිදි ගිණුම්ගතකර පැවරීම හෝ අලෙවි කිරීම් සිදු කර නොතිබුණි.

	23 අමාත්‍ය මණ්ඩලය විසින් ගත් තීරණයකට අනුව එම සමාගම වෙත පවරා තිබූ ඉඩම් ඉල්ලුම්කාර පාර්ශව වෙත පවරා දී එම ඉඩම් වල වටිනාකම ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය වෙත ගෙවීමට තීරණය කිරීම හේතුවෙන් එම ඉඩම් කට්ටි නැවත ශ්‍රී ලංගම වෙත පවරා ගැනීම පිළිබඳ අවිනිශ්චිතතාවයක් ඇතිවී තිබුණි.			අවසන් කර ඇත.	
39	බස් රථ වලට අවශ්‍ය ඉන්ධන නිකුත් කිරීමේදී රියදුරු විසින් ඉදිරිපත් කරන ලොග් සටහන් පත්වල අදාළ ගමනාන්තය සහිතව ඒ සඳහා අවශ්‍ය ඉන්ධන ප්‍රමාණය සටහන් කළ යුතු අතර, ඉන්ධන නිකුත් කරන නිලධාරියා විසින් අදාල ලොග් සටහන් පත්‍රිකාවේ සඳහන් ප්‍රමාණයට අනුව ඉර - 08 පත්‍රිකාවේ බස් රථයට යොදන ඉන්ධන ප්‍රමාණය හා බස් රථ අංකය සටහන් කළ යුතුය. නමුත් මහරගම හා ගම්පහ ඩිපෝවල 2022 අගෝස්තු මාසය තුල ලොග් සටහන්වල සටහන් නොකරන ලද රු.11,752,880 ක වටිනාකමින් යුත් ඉන්ධන ලීටර් 27,318 ක් ඉර - 08 පත්‍රිකාවේ	2022	ඉන්ධන නිකුත් කිරීම සම්බන්ධයෙන් විධිමත් අභ්‍යන්තර පාලනයක් පවත්වා ගත යුතු අතර, ඒ සම්බන්ධයෙන් ඍජු අධීක්ෂණයක් සිදු කළ යුතු වේ.	මහරගම ඩිපෝවේ ඩීසල් ලීටර් 9,916 ක් හා ගම්පහ ඩිපෝවේ ඩීසල් ලීටර් 17,402 ක් ඉර 8 වාර්ථාව අනුව බස් රථ වල අංක සඳහන් නොවී තිබීමත් නිකුත් කළ ඉන්ධන ප්‍රමාණය ලොග් සටහන් පතෙහි සඳහන් නොවී තිබීමත් මණ්ඩලීය පිළිවෙත් පැහැර හැරීමකි. විගණන නිරීක්ෂණය පිළිබඳව විශේෂ විමර්ෂණයක් සිදු කොට තෙමසක් ඇතුළත වාර්ථාවක් ලබා දීමට කටයුතු කරමි. කෙසේ වෙතත් විශේෂ විමර්ෂණයේදී යම් අක්‍රමිකතාවයක් සිදුවී ඇති බව	ඉන්ධන නිකුත් කිරීම සම්බන්ධයෙන් විධිමත් අභ්‍යන්තර පාලනයක් නොතිබූ අතර, ඍජු අධීක්ෂණයක් සිදුකර නොතිබුණි.

	සටහන් කර බස් රථවලට නිකුත් කලා සේ ගිණුම්ගත කර තිබුණි.			අනාවරණය වුවහොත් වගකිව යුත්තන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගන්නා බව ද දන්වා සිටිමි.	
40	මහරගම ඩිපෝවේ 2022 වර්ෂයේ අගෝස්තු මාසයේ අවසන් දිනට පැවතිය යුතු ඉන්ධන තොග ප්‍රමාණය ලීටර් 326,772 ක් විය. නමුත් එදිනට ටැංකිවල තිබූ සත්‍ය ඉන්ධන තොගය ලීටර් 48,598 ක් ලෙස සටහන් කර තිබුණි. ඒ අනුව රු.119,614,820 ක් වටිනා ඉන්ධන ලීටර් 278,174 ක ඌණතාවයක් නිරීක්ෂණය වූ අතර, එම ඌණතාවය සඳහා හේතු විගණනයට ඉදිරිපත් නොවීය. මෙලෙස පවත්නා ඉන්ධන තොග ඌණතාවය වෙනුවෙන් මණ්ඩලය විසින්ද සමාලෝචිත වර්ෂයේ ගිණුම්වල රු.36,799,884 ක වෙන් කිරීමක් කර තිබුණි. එසේම මහරගම ඩිපෝවේ 2023 පෙබරවාරි 28 දිනට දෛනික එකතු මුදල් සේප්පුවේ තැන්පත් කර තිබූ අතර, 2023 මාර්තු 01 දින සිදු කරන ලද භෞතික මුදල් පරීක්ෂාවේදී	2022	ඌණතාවය අය කර ගෙන වගකිව යුත්තන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගත යුතු වේ.	විගණන නිරීක්ෂණය හා එකඟ වන අතර මෙහිදී මණ්ඩලීය පිළිවෙත් අනුගමනය නොකර තිබීම සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පැවැත්වීමට කඩිනමින් කටයුතු කරනු ලැබේ.	ඌණතාවය අයකර ගෙන වගකිව යුත්තන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

	සේප්පුවේ රඳවා තිබූ මුදලින් රු.63,510 ක ඌණතාවයක් අනාවරණය විය.				
41	2022 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මට අනුව පැරණි බස් රථ අළුත්වැඩියා කර ධාවනයට එක් කිරීම අරමුණු කර පැරණි ස්ටාටර් මෝටර් 2040 ක්, පැරණි ඕල්ටනේටර් 1200 ක්, පැරණි ඉන්ධන පොම්ප 1080 ක් හා පැරණි ඉන්ධන විදින 3000 ක් අළුත්වැඩියා කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 180 ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබුණද රු.මිලියන 10.36 ක් වැය කර 2022 වර්ෂයේදී ස්ටාටර් මෝටර් 14 ක්, ඉන්ධන පොම්ප 409 ක් හා ඉන්ධන විදින 1760 ක් පමණක් නිෂ්පාදනය කර තිබූ අතර මෙම අමතර කොටස් අළුත්වැඩියා කර භාවිතයට ගැනීමේ හැකියාව මණ්ඩලය සතුව තිබියදී ඒවා අළුත්වැඩියා කිරීමේ කටයුතු සිදු නොකර බාහිරින් මිලදී ගෙන තිබුණි. මේ සඳහා සමාලෝචිත වර්ෂය තුළ මණ්ඩලයේ කලාප 04 කින් පමණක් වැය	2022	මණ්ඩලය තුළ හා ඩිපෝවල පවත්නා සම්පත් හා ශ්‍රමය උපරිම අයුරින් උපයෝජනය කර බස් රථ ධාවනයට යෙදවිය හැකි වන පරිදි වැඩ සැලසුම් කිරීමටත් ඒ අනුව නිෂ්පාදනය වැඩි කර බාහිරින් මිලදී ගැනීම සඳහා වැය වන පිරිවැය අවම කර ගැනීමට කටයුතු කළ යුතු අතර, වාර්ෂිකව ප්‍රතිපාදන වෙන් කිරීමේදී විධිමත් අධ්‍යයනයකින් යුතුව ප්‍රතිපාදන වෙන් කළ යුතු වේ.	ශ්‍රී ලං.ග.ම. රථ ඇණියේ ධාවනය වන බස් රථ නඩත්තුව සඳහා අවශ්‍ය වන ස්ටාටර් මෝටර්, ඔල්ටර්නේටර්, ඉන්ධන පොම්ප හා ඉන්ධන විදින අළුත්වැඩියාව ප්‍රාදේශීය වැඩපල මගින් හා ඩිපෝ ගරාජය මඟින් ඉටුකර ගැනීමට සැලසුම් කර ඇත. නමුත් නැවත 2022 වර්ෂයේ බාහිර ආයතන මගින් එම කටයුතු ඉටුකිරීමට ශ්‍රී ලං.ග.ම. සභාපතිතුමා විසින් අනුමැතිය ලබාදී ඇති අතර ඒ අනුව නැවත බාහිර ආයතන මගින් උප කොටස් අළුත්වැඩියා කිරීම නිසා ප්‍රාදේශීය වැඩපල මඟින් අළුත්වැඩියාවන් සිදුකර ගැනීම අඩුවී ඇත.	මණ්ඩලය තුළ හා ඩිපෝවල පවත්නා සම්පත් හා ශ්‍රමය උපරිම අයුරින් උපයෝජනය කර වැඩ සැලසුම් කිරීමටත් ඒ අනුව නිෂ්පාදනය වැඩි කර භාහිරින් මිලදී ගැනීම සඳහා වැය වන පිරිවැය අවම කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

	කර තිබූ මුදල රු.1,205,210 ක් විය.				
42	ඔරුගොඩවත්ත ඉන්ධන පිරවුම්හල රු.61,014,316 ක කොන්ත්‍රාත් වටිනාකමකට මාස 03 ක් තුළ ඉදිකිරීම සඳහා 2018 මාර්තු මස කොන්ත්‍රාත් සමාගමක් සමඟ ගිවිසුම් අත්සන් කර තිබුණි. 2022 දෙසැම්බර් 31 දින වන විට රු.32,118,352 ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණද ඉදි කිරීම් අවසන් කර නොතිබීම හේතුවෙන් ඉන්ධන පිරවුම්හල භාවිතයට ගෙන නොතිබුණි. ඒ අනුව කළ වැඩ පිළිබඳ තක්සේරු වාර්තාවක් සහ ඉදිරි වැඩ සඳහා ඇස්තමේන්තුවක් සකස් කරන ලෙස මධ්‍යම ඉංජිනේරු පිළිබඳ කාර්යංශයට (CECB) දන්වා ඇතත්, මේ දක්වා මෙම තක්සේරු වාර්තාව හා ඇස්තමේන්තුව ලබා දී නොතිබුණි. තවද සිදුකරන ලද ස්ථානීය පරීක්ෂණයේදී ඉන්ධන පිරවුම්හලේ වහල දිරාපත් වීම ඇතුළු, කළ වැඩවල ප්‍රමිතිය පිළිබඳ සැලකිල්ලකින් තොරව හා සැලසුම්වලට අනනුකූල ලෙස කළ වැඩ සඳහා ගෙවීම් නිර්දේශ කර ගෙවීම්	2021 / 2022	ඔරුගොඩවත්ත ඉන්ධන පිරවුම්හල ක්‍රියාත්මක කිරීම සඳහා වසර 05 කට අධික කාලයක් ගතව ඇති අතර, ඒ තුළින් මණ්ඩලයට හිමිකර ගැනීමට තිබූ ආදායමක් අහිමිවී ඇති අතර, ඉන්ධන පිරවුම්හල දිරාපත්වී විනාශනයට පත්ව යන බැවින් කඩිනමින් ඒ සඳහා ක්‍රියාත්මක වී ඉන්ධන පිරවුම්හල ආරම්භ කිරීමට කටයුතු කළ යුතු වේ.	ඔරුගොඩවත්ත ඉන්ධන පිරවුම්හලේ නිසි කලට වැඩ නිම නොකිරීම සම්බන්ධයෙන් ලාෆ් ඉංජිනියරින් පුද්ගලික සමාගම විසින් තබා තිබූ රු.3,051,000 ක වටිනාකමින් යුත් කාර්ය සාධන ඇපකරය 2020.06.11 දින ශ්‍රී ලං.ග.ම. විසින් පවත්වා ගෙන යනු ලබන ලංකා බැංකු ශාඛාවේ 0001168517 දරන ගිණුම වෙත බැර කර ගැනීමට කටයුතු කර ඇත. ඉදිකළ ගොඩනැගිල්ලේ වහලය මුළුමනින් නොව තැන් තැන් වලින් දිරාපත්වී ඇති බව පිළිගනිමි. එමෙන්ම ඉන්ධන පිරවුම්හළ සඳහා සුප්‍රීම් ට්‍රේඩිං සමාගම මඟින් ලබාගත් ඉන්ධන පොම්ප 07 හා අනිකුත් උපකරණ වලින් මෙතෙක් නිසි ප්‍රයෝජන ලබා නොමැති බවද පිළිගනිමි. ඉන්ධන අර්බුදය පැවති	ඔරුගොඩවත්ත ඉන්ධන පිරවුම්හල ක්‍රියාත්මක කිරීම සඳහා වසර 05 කට අධික කාලයක් ගත වීම තුළ මණ්ඩලයට හිමිකර ගැනීමට තිබූ ආදායම අහිමිවී තිබුණි. එමෙන්ම පිරවුම්හල දිරාපත්වී විනාශයට පත්ව යමින් තිබුණි.

	කිරීම හේතුවෙන් මේ වන විට මණ්ඩලයට රු.8,978,845 ක අලාභයක් දැරීමට සිදුව තිබුණි. එසේම 2022 දෙසැම්බර් 31 දිනට රු.11,565,320 ක් ගෙවා ගෙන්වන ලද ඩීසල් හා පෙට්‍රල් පොම්ප 07 ක් හා ජෙනරේටරයක් අනාරක්ෂිතව ගබඩා කර තිබූ අතර, ජෙනරේටරයේ වගකීම් කාලයද ඉක්මවා ගොස් තිබුණි.			සමයෙහි ඉන්ධන පිරවුම්හළ ආරම්භ කිරීමට උපදෙස් ලබා දෙන ලද අතර ඒ හේතුවෙන් හඳුනාගත් මූලිකව සිදුකළ යුතුව තිබූ අළුත්වැඩියා කාර්යයන් සිවිල් ඉංජිනේරු වැඩබිම් සේවක මහතුන් මගින් අවශ්‍ය භාණ්ඩ සපයාදී සිදුකරන ලදි. ඒ සඳහා වැයවූ මුදල රු.704,958.74 ක් පමණ වේ.	
43	මණ්ඩලය විසින් තොරතුරු විශ්ලේෂකවරුන් දෙදෙනෙකුට රු.75,000 ක බැගින් වූ මාසික වැටුප් ගෙවා සකස් කරන ලද මානව සම්පත් කළමනාකරණ පද්ධතිය (නව), අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකා ඇතුළත් කිරීමේ තොරතුරු පද්ධතිය, ලේඛන හුවමාරු කර ගැනීමේ තොරතුරු පද්ධතිය හා කොටස් සහතික නිකුත් කිරීම වෙනුවෙන් වූ මෘදුකාංග 04 ක් ස්ථාපනය කර ඇති නමුත් එම නිලධාරීන් මණ්ඩලයෙන් ඉවත්ව යාමත් සමඟ එම තොරතුරු පද්ධති හා මෘදුකාංග ද අක්‍රීය තත්වයට පත්ව ඇති	2022	අක්‍රීය තත්වයට පත්ව ඇති පද්ධති හා මෘදුකාංග අක්‍රීය වීමට හේතු සොයා සිදු වූ පාඩු පියවා ගැනීමටත් සියළු පද්ධති වෙනුවට නව මධ්‍යගත පද්ධතියක් ස්ථාපනයට අවශ්‍ය කටයුතු සිදු කළ යුතු වේ.	ශ්‍රී ලංගම පරිපාලන තීරණ මත හා මෘදුකාංග සංවර්ධන නිලධාරීන් විසින් පැරණි පද්ධතීන් වර්තමානයට ගැළපෙන ලෙස නව්‍යකරණය නොවීමත් පද්ධතිවල අනාරක්ෂිත බවත්, වාර්තා ලබා ගැනීමේ ගැටලු සහගත බවත් වෘත්තීය නිලධාරීන් මණ්ඩලයේ සේවයට එකතු නොවීමත් මෙම පද්ධති අසාර්ථක වීමට හේතු වී තිබුණි.	අක්‍රීය තත්වයට පත්ව ඇති පද්ධති හා මෘදුකාංග අක්‍රීය වීමට හේතු සොයා සිදු වූ පාඩු පියවා ගැනීමටත් සියළු පද්ධති වෙනුවට නව මධ්‍යගත පද්ධතියක් ස්ථාපනයට අවශ්‍ය කටයුතු සිදු කර නොතිබුණි.

	අතර ඒ සඳහා දරණ ලද වියදම් ද නිශ්කාර්යය බව නිරීක්ෂණය විය.				
44	මණ්ඩලය සතුව රු.226,417,397 ක් වටිනා ටිකට් මැෂින් 10,575 ක් පවතින අතර, ඉන් රු.107,070,821 ක් වටිනා මැෂින් 4,250 ක් එනම් සියයට 40 ක ප්‍රමාණයක් ක්‍රියා විරහිතව තිබුණි. නමුත් මණ්ඩලය මෙම මැෂින් අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට හැකි තත්වයකට පත් කර නොතිබුණි. මෙම මැෂින් අතුරින් මැෂින් 493ක් අළුත්වැඩියාවට යොමු කර තිබුණ ද අළුත්වැඩියා කටයුතු කඩිනමින් ඉටු කර නොතිබුණු අතර, රු.432,305 ක් වන මැෂින් 23 ක් අස්ථානගත වී තිබුණි.	2021	අදාල ටිකට් මැෂින් මිලදී ගැනීමේදී ජීවකාලය තුළ සේවා කිරිම් හා නඩත්තු කිරීම් ගිවිසුම් පරිදි කරවාගත යුතු වේ.	සියයට 50 වඩා වැඩි මැෂින් ප්‍රමාණයක් අවු 05 කට වඩා පැරණි වී ඇති බැවින් නිතර නිතර ආපදා වලට ලක්වේ. 2019 වර්ෂයෙන් පසුව ටිකට් මැෂින් මිලදී නොගැනීම නිසා ටිකට් මැෂින් අවශ්‍යතාවය යාවත්කාලීන වී නොමැත. අස්ථානගතවූ ටිකට් මැෂින් සම්බන්ධයෙන් විනය කටයුතු ක්‍රියාත්මක කර ඇතැම් අස්ථානගතවීම් සම්බන්ධයෙන් කොන්දොස්තර මහතාගෙන් අයකිරීම් සිදුකර ඇත. අළුත්වැඩියාවට යොමුකලද ඇතැම් ටිකට් මැෂින් සඳහා අළුත්වැඩියාවට අධික වියදමක් දැරීමට සිදුවන අළුත්වැඩියාව සඳහා වැයවන වියදම සැලකූ විට නව ටිකට් යන්ත්‍රයක් මිලදී ගැනීම යෝග්‍ය වේ.	අදාල ටිකට් මැෂින් මිලදී ගැනීමේදී ජීවකාලය තුළ සේවා කිරීම් හා නඩත්තු කිරීම් ගිවිසුම් පරිදි නිසි ලෙස ඉටු කර නොතිබුණි.

3.158 ශ්‍රී ලංකා වරාය අධිකාරිය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය/ (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	492,621,205,733	122,487,728,519	370,133,477,214	25,601,331,063	ව්‍යාවනය කළ
2022	731,689,857,861	178,079,845,524	553,610,012,337	57,025,790,184	තත්ත්වාගණනය කළ
2023	739,506,223,402	157,499,931,261	582,006,292,141	40,359,243,118	තත්ත්වාගණනය කළ

	විගණන වාර්තාවලට ඇතුළත් කර ඇති ප්‍රධාන අඩුපාඩු	විගණන වාර්තාවේ වර්ෂය	විගණකාධිපතිගේ නිර්දේශය	විගණිත ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ පියවර	වර්තමාන තත්ත්වය
1. **1.1.**	**මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ** **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල නොවීම**				
(අ)	මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සඳහා වූ සංකල්පනාත්මක රාමුවෙහි 4 වන පරිච්ඡේදයේ 4.3 සිට 4.6 දක්වා වගන්ති සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි 7(අ) යන වගන්තිවලට පටහැනිව වරාය අධිකාරියට අනාගත ආර්ථික ප්‍රතිලාභ සහ හිමිකමක් නොමැති රු.මිලියන 947.5 ක් වූ අක්කර 02 ක රේගු දෙපාර්තමේන්තුවට ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා ලබාදී තිබූ ඉඩම, රු.මිලියන	2021 2022 2023	ප්‍රමිතය ප්‍රකාරව ගිණුම්ගතකළ යුතු අතර අනෙකුත් ආයතන සමග පවතින ගැටළු කඩිනමින් නිරාකරණය කරගැනීමට කටයුතු කළ යුතු බව.	රේගු දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලය ඉදිකිරීම සඳහා ලබාදෙන ලද ශ්‍රී ලංකා වරාය අධිකාරියට අයත් ඉඩම පැවරීමේ කටයුතු සම්බන්ධයෙන් ක්‍රියාකිරීමේදී අයකරගත යුතු මුදල හා ඊට පෙර භුවමාරුකරගත් වෙනත් ඉඩම් සම්බන්ධයෙන් දෙපාර්ශවය අතර ගැටළුකාරී තත්ත්වයක් පැන	මෙම ඉඩම් සම්බන්ධව කටයුතු තවමත් නිරාකරණයවී නොතිබුණි.

628.5 ක් වූ අක්කර 2 රූඩ් 3 පර්චස් 9.61 ක් වූ නෙළුම් කුළුණ ඉදිකිරීම සඳහා පවරාගෙන තිබූ ඉඩම, රු.මිලියන 83.7 ක් වූ අක්කර 01 රූඩ් 02 පර්චස් 14.9 ක් වූ ඉඩම නාගරික සංවර්ධන අධිකාරිය වෙත පවරාගෙන තිබූ ඉඩම සහ රු.මිලියන 19.8 ක් වටිනා අක්කර 4 රූඩ් 3 පර්චස් 3.2 ක් වූ කිඹුලාවල ඉඩම ඇතුළු මුළු වටිනාකම රු.මිලියන 1,679.5 ක ඉඩම් අක්කර 11 පර්චස් 27.71 ක් වත්කම් ලෙස ගිණුම්ගත කර තිබුණි.	නැඟී ඇත. සාකච්ඡා මාර්ගයෙන් ගැටළුව විසඳා එම ගණුදෙනුව හැකි ඉක්මනින් අවසන් කිරිමට අපේක්ෂිතය. මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශය දැනුවත්කර රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ලිපියක් ඉදිරිපත් කර ඇත. කොළඹ 10, ඩී ආර් විජේවර්ධන මාවතේ පිහිටි නෙළුම් කුළුණ ඉදිකර ඇති භූමිය නාගරික සංවර්ධන අධිකාරිය විසින් භුක්තිය බාරගෙන ඇත. එහෙත් වන්දි පරීක්ෂණයේ තීරණය මෙතෙක් ලබාදී නොමැත. අක්කර 01 රූඩ් 02 පර්චස් 14.9 වන ඉඩමද නාගරික සංවර්ධන අධිකාරිය වෙත පවරාගෙන ඇති මුත් නිත්‍යානුකූලව හුවමාරු කිරීමේ කටයුතු අවසන්වී නොමැත. කිඹුලාවල පිහිටි ඉඩම සඳහා වන්දි ලබාගැනීම සම්බන්ධයෙන් පවතින නඩු කටයුතු අවසන් වූ වහාම

				පොත්වලින් ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ.	
(ආ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 27 වගන්තියට අනුව 2023 වර්ෂය සඳහා පූර්ණ බහාලුම් සඳහා ලැබිය යුතු බිම් කුලී ආදායම් ලෙස රු.මිලියන 1,672 ක වටිනාකමක්ද අර්ධ බහාලුම් (වාහන) සඳහා ලැබිය යුතු බිම් කුලිය ආදායම ලෙස රු.මිලියන 1,102 ක වටිනාකමක්ද 2023 මූල්‍ය ප්‍රකාශන තුළ ගැලපුම්කර නොතිබුණි.	2021 2022 2023	නිශ්කාෂණය කර නොගත් ආනයනික බහාලුම්/ වාහන නිශ්කාෂණය කරගන්නා තෙක් ලැබිය යුතු ආදායමක් සේ හඳුනාගත යුතු බව.	2024.02.13 දින පැවති විගණන කමිටු තීරණයක් පරිදි මෙම ආදායම පිළිබඳ හෙළිදරව් කිරීමක් පමණක් 2023 ගිණුම් තුළ සිදු කරන ලදි. ප්‍රතිපත්තියක් සකස් කර 2024 වර්ෂයේදී ඒ අනුව කටයුතු කිරීමට පියවර ගනු ලැබේ.	2023 ගිණුම් තුළ හෙළිදරව් කිරීම පමණක් සිදුකර ඇති අතර මේ වන තෙක් අදාළ ගැලපීම් ගිණුම්වල සිදු කර නොතිබුණි.

1.1.2. ගිණුම්කරණ අඩුපාඩු

(අ)	හම්බන්තොට වරාය ව්‍යාපෘතිය සඳහා ක්ෂේත්‍ර රාජකාරී වෙනුවෙන් හා ඉඩම් එළිපෙහෙලි කිරීමට අදාලව 2014 වර්ෂයේදී රු.මිලියන 4.39 ක මුදලක් ද, ඉඩම් අහිමිවූවන්ට වන්දි ගෙවීම සඳහා 2015 සහ 2016 වර්ෂයන්හිදී රු.මිලියන 108.77 ක මුදලක් ගෙවා තිබූ අතර අදාල වන්දි ගෙවීම් පිළිබඳ වාර්තාව අධිකාරිය වෙත ලැබී තිබූ නමුත් වැය කරන ලද	2021 2022 2023	අදාල අනුමැතීන් කඩිනමින් ලබාගෙන ඉඩම්වල හිමිකම අධිකාරියට පවරාගැනීමට කටයුතුකළ යුතු බව.	ඉඩම් හිමියන් සඳහා වන්දි ගෙවීම් සිදු වුවද, තවමත් අදාල ඔප්පු මගින් ඉඩම් වල අයිතිය වරාය අධිකාරිය වෙත පවරා නොමැති බැවින් මෙම මුදල ප්‍රාග්ධනිත කිරීමට නොහැකි වේ. හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් හා ඉඩම් කොමසාරිස් ජෙනරාල් කාර්යාලය විසින් අදාල ඉඩම් ඔප්පු පිළියෙළ කර අනුමැතිය ලබා	ඉඩම්වල අයිතිය තවමත් ශ්‍රී ලංකා වරාය අධිකාරියට තවමත් පවරාගෙන නොතිබුණි.

	රු.මිලියන 113.16 ක මුදල ඉඩම් ලෙස ප්‍රාග්ධනිත කර නොතිබුණි.			ගැනීමේ කටයුතු මේ වන විට සිදු කෙරෙමින් පවතී.	
(ආ)	2010 වර්ෂයේදි SAGT සමාගම ආරම්භ කරන අවස්ථාවේදී අධිකාරිය විසින් ලබාදුන් දොඹකර තුනක අගය හුවමාරු කරගැනීම සඳහා රු.මිලියන 141.63 ක වටිනාකමට එම සමාගමෙහි කොටස් අධිකාරිය වෙත ලබාදෙන බවට එකඟ වී තිබූ අතර මෙම මුදල හෝ කොටස්වල හිමිකම 2023 වර්ෂය අවසන් වන තෙක් අධිකාරිය වෙත ලබා දී නොතිබුණි.	2021 2022 2023	අදාළ සමාගම සමග සාකච්ඡා කර ගිවිසුම පරිදි දොඹකරවල වටිනාකම සඳහා අධිකාරියට ලැබිය යුතු හිමිකම ලබා ගැනීම සඳහා කටයුතු කළ යුතු බව.	වරාය අධිකාරියට ලැබිය යුතු කොටස් හිමිකම ලබාගැනීම සඳහා SAGT සමාගම සමග සාකච්ඡා කර අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන ලෙස නීති අංශය වෙතද දන්වා ඇත.	මෙම මුදල හෝ කොටස්වල හිමිකම මේ වනතෙක් ලැබී නොතිබුණි.
1.1.3.	**නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**				
	ගිණුම් අංක 423 දරන නැව් නියෝජිතයාගේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.1,609,428,559 ක වෙනසක් සහිතව ඉදිරිපත් වී තිබුණි.	2023	අදාළ වෙනසට හේතු සොයා බලා එම වෙනස්කම් නිවැරදි කළ යුතු බව.	දැනටමත් 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන හා ශේෂ සනාථ අතර තිබූ මෙම වෙනසට හේතු හඳුනාගෙන අදාළ ගැලපීම් සිදුකිරීමට කටයුතු කරන අතර 2024 වර්ෂයේදී වෙනසක් නිරීක්ෂණය වුවහොත් එම වෙනසට හේතු සොයාබලා ගැලපීම්	එම වෙනසට හේතු හඳුනාගෙන ඇතත් අදාල ගැලපීම් මූල්‍ය ප්‍රකාශන තුළ සිදුකර නොතිබුණි.

				කිරීමට කටයුතු කරනු ඇත.	
1.2. **1.2.1.**	**ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්** **ලැබිය යුතු මුදල්**				
(අ)	2023 දෙසැම්බර් 31 දිනට පූර්ව වර්ෂවලට අදාලව ලද අනෙකුත් පර්යන්තයන් ද ඇතුලුව නිරවුල් නොකරන ලද මුළු වෙන්දේසි ආදායම රු.මිලියන 189.42 ක් විය. එම ශේෂය තුළ වෙනත් පර්යන්ත සහ ආයතනවලට ගෙවීමෙන් පසු අධිකාරියේ ආදායම් ලෙස හඳුනාගත යුතු වර්ෂ 2 ඉක්ම වූ වෙන්දේසි විකුණුම් මුදල් ලැබීම් රු.මිලියන 83.86 ක් වී තිබුණි.	2021 2022 2023	පවත්නා ගැටළු නිරාකරණය කරගෙන ලැබිය යුතු දෑ හැකි ඉක්මනින් අයකර ගැනීමට කටයුතු කළ යුතු බව.	2022 වර්ෂයේ පවත්වන ලද ටෙන්ඩර් අංක 450 න් පසුව සාර්ථක ලංසුකරුවන් රැගෙන යන අයිතම සඳහා ශ්‍රී ලංකා රේගුවට සහ පුද්ගලික පර්යන්තවලට ගෙවිය යුතු මුදල් සෘජුවම එම ආයතනවලට ගෙවීමටත් ශ්‍රී ලංකා වරාය අධිකාරියට අයවිය යුතු ගාස්තු හා මහා භාණ්ඩාගාරයට ප්‍රේෂණය කළ යුතු මුදල් වරාය අධිකාරිය විසින් අයකර ගැනීමටත් කටයුතු සිදු කර ඇත.	මේ වන විටත් මෙම විකුණුම් මුදල් නිරාකරණය කිරීමට කටයුතු කර නොතිබුණි.
(ආ)	2023 දෙසැම්බර් 31 දිනට ණයගැතියන්ගෙන් අයවිය යුතු ශේෂ සම්බන්ධයෙන් නඩු කටයුතු ආරම්භ කර ඇති (Under Litigation) නැව් නියෝජිත ණයගැති වටිනාකම රු.මිලියන 439 ක් වූ අතර එයින් කොළඹ වරායට	2021 2022 2023	දීර්ඝකාලීනව මුදල් නොගෙවා ඇති ණයගැතියන් සම්බන්ධයෙන් නඩු පැවරීමට ඇති හැකියාව නීති කොට්ඨාශය විසින් තක්සේරු කළ යුතු බව.	නැව් නියෝජිත ණයගැතියන් පිළිබඳව නව සම්මත මෙහෙයුම් ක්‍රියාපටිපාටියට (SOP) අනුව කටයුතු කරනු ලැබේ.	MC Shipping Agencies (Co) Ltd හා Uni Marine Shipping Agency (Pvt) Ltd යන ආයතන වෙත නඩු පැවරීම සඳහා හැකියාවක් නොමැති බව තව දුරටත් නීති

	අදාල රු.මිලියන 406 ක ශේෂය සඳහා ණයගැතියන් 13 දෙනෙකු (Marshal of Admiralty High Court ඇතුළුව) මූල්‍ය කොට්ඨාශය මගින් දක්වා තිබුණ ද එම වටිනාකම තුළ වූ රු.මිලියන 65 ක ණයගැතියන් 06 දෙනෙකු සම්බන්ධයෙන් නඩු පවරා ඇති බවට නීති කොට්ඨාශය මගින් සනාථ කර නොතිබූ අතර අධිකාරියේ 2023 දෙසැම්බර් 31 දිනට වසර 5 ඉක්ම වූ නැව් නියෝජිත ණයගැති ශේෂය රු.මිලියන 369 ක් වූ අතර එයින් රු.මිලියන 358 ක් නීති කටයුතු සඳහා යොමු කළ ණයගැතියන් වුව ද රු.මිලියන 12 ක් සඳහා නීති කටයුතු ආරම්භ කර නොතිබුණි.				කොට්ඨාශය මගින් දන්වා ඇති බැවින් AR (Account Receivable Committee) කමිටුව මගින් ලබාදුන් නිර්දේශ අනුව ඒම මුදල් කපාහැරීම සඳහා විගණන කමිටු අනුමැතිය ලබාගෙන ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කිරීමට නියමිතව ඇත. අනෙකුත් ණයගැතියන් සඳහා නීති කටයුතු ආරම්භ කර නොතිබුණි.
(ඇ)	අධිකාරිය විසින් දීර්ඝ කාලීනව මුදල් අයකරගෙන නොතිබූ 2023 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 42.25 ක වටිනාකමකින් යුත් නැව් නියෝජිත ණයගැතියන් දෙදෙනෙක් සම්බන්ධයෙන්	2021 2022 2023	දීර්ඝකාලීනව නඩු තීන්දු ක්‍රියාත්මකවී නොතිබීමට හේතු සොයාබලා ඒවා ක්‍රියාත්මක කිරීමට කළමනාකරණය කටයුතු කළ යුතු බව.	මෙම නඩුවේ නියෝගය 2017.11.24 දින පක්ෂව තීන්දු කර ඇත. මෙම තීන්දුවට එරෙහිව විත්තිකරු විසින් අභියාචනයක් සිවිල් අභියාචනාධිකරණ යේ ගොනු කර ඇත. එම	නඩු තීන්දු ක්‍රියාත්මක කර මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

	පවරන ලද නඩු කටයුතුවල නියෝග අධිකාරියට පක්ෂව තීන්දු කර තිබුණ ද නියෝග දිනයේ සිට දීර්ඝ කාලයක් ගතවී තිබුණ ද එම තීන්දු ක්‍රියාත්මක කර නොතිබුණි.			අභියාචනය සඳහා මෙම විත්තිකරු විසින් අභියාචනා ගොනුවේ සඳහන් කර ඇති තීන්දු ප්‍රකාශය ක්‍රියාත්මක කිරීම සඳහා විත්තිකරුගේ නිවැරදි ලිපිනයක් ලබා ගැනීමට කටයුතු කරමින් පවතී.	
(ඇ)	අධිකාරිය විසින් MV Jammi නෞකාව සඳහා ලබාදෙන ලද සේවා සඳහා අයවිය යුතු මුදල් වෙනුවෙන් කොළඹ මහාධිකරණයේ නඩුවක් ගොනු කර තිබූ අතර එහිදී ලද තීන්දුව අනුව රු.මිලියන 197.09 (ඇ.එ.ජ ඩොලර් 1,945,712) ක මුදලක් අදාල යාත්‍රාවෙන් අධිකාරිය වෙත ලැබිය යුතුව තිබූ අතර අදාල නෞකාව වෙන්දේසියෙන් ලද මුදල අධිකරණයේ තැන්පත් කර තිබුණු බවත් හිමිකම් සහිත විවිධ පාර්ශවයන් වෙත අදාල මුදල් ප්‍රමාණයන් මුදාහැරීමෙන් පසුව ඉතිරි වූ මුදල වන ඇ.එ.ජ ඩොලර් 692,080 ක මුදල සම සමව බෙදා ගැනීමට පෙත්සම්කාර Sri	2022 2023	අදාළ ආයතන සමග තවදුරටත් සාකච්ඡාකර අධිකාරිය වෙත ලැබිය යුතු මුදල හැකි ඉක්මණින් ලබාගැනීමට කටයුතු කළ යුතු බව.	ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් MV Jammi නෞකාව සඳහා අයවිය යුතු ගාස්තු සම්බන්ධයෙන් කොළඹ මහ අධිකරණයේ HC Rem 11/2005 යටතේ ලැබී ඇති තීන්දුව පරිදි ඇමරිකානු ඩොලර් 692,080.00 ක මුදලක් හිමිකම් පාර්ශවයන් වෙත ලැබෙන බව නීති කොට්ඨාශය මඟින් දන්වා ඇති අතර එය ලැබෙන දිනයක් පිළිබඳව නිශ්චිතව සඳහන්ව නොමැති බැවින් ලියා හැරීම සඳහා කටයුතු කළ නොහැක.	මෙම මුදල මේ වන තෙක් ලැබී නොතිබුණි.

Lanka Shipping Company Limited හා අධිකාරිය එකඟතාවයකට පැමිණ තිබුණි. මහාධිකරණ රෙජිස්ට්රාර් විසින් මෙම නඩුවට අදාළ ලිපිගොනුවලට අනුව මෙම යාත්‍රාවට අදාළ කිසිදු මුදලක් තැන්පත් වී නොමැති බව සඳහන් කරන අතර එම ණයගැති ශේෂ වටිනාකම සඳහා මුදල් ලැබීම පිළිබඳ අවිනිශ්චිතතාවයක් පැවතුණි.				

1.2.2. අත්තිකාරම්

නැව් නියෝජිතයින් විසින් කලින් ගෙවන ලද අත්තිකාරම් පියවීමෙන් පසු, 2023 දෙසැම්බර් 31 දිනට ඉතිරිව පැවති ශේෂය රු.මිලියන 913.49 ක් වූ අතර එයින් රු.මිලියන 232.50 ක් මාස 06 සිට වර්ෂ 05 ඉක්මවා තිබුණු නමුත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. තවද, එම නැව් නියෝජිතයින් විසින් ඉන්වොයිස් වටිනාකමට වඩා වැඩියෙන් ගෙවන ලද රු.මිලියන 2,407 ක් නැව් නියෝජිත බැර ශේෂ (Shipping	2023	සේවා ලබා ගැනීම වෙනුවෙන් අධිකාරිය වෙත ගෙවන ලද අත්තිකාරම් මුදල්වලින් අදාළ සේවාව සැපයීමෙන් පසු ඉතිරිවන අත්තිකාරම් මුදල් හා වැඩිපුර ගෙවීම් පිළිබඳ විස්තරාත්මක උපලේඛණ හා වයස් විශ්ලේෂණ, පිළිබඳ සැලකිල්ලට ගෙන කල්ගිය සහ චලනය නොවන ශේෂ	නැව් නියෝජිත ණයගැතියන් පිළිබඳව නව සම්මත මෙහෙයුම් ක්‍රියාපටිපාටියට (SOP) අනුව කටයුතු කරනු ලැබේ.	කොළඹ වරායට අදාලව නැව් නියෝජිතින් විසින් ගෙවන ලද අත්තිකාරම් පියවීමෙන් පසු 2024.09.30 දිනට රු.මි.224 ක් විය. 2024.09.30 දිනට මාස 06 සිට වර්ෂ 05 ඉක්මවා ඉතිරිව පැවති ශේෂය රු.මි. 164.2 ක් විය. කොළඹ වරායට අදාලව 2024.09.30 දිනට නැව් නියෝජිතින්ගේ බැර ශේෂය

	Agent Credit Balances) ලෙස මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබුණි. 2023 දෙසැම්බර් 31 දිනට එයින් රු.මිලියන 388 ක්, මාස 06 සිට වර්ෂ 5 ක කාල පරාසයක් දක්වා නිරවුල් කර නොතිබුණි.		නිරවුල් කිරීමට කටයුතු කළ යුතු බව.		රු.මිලියන 339.3 ක් ක් වූ 2024.09.30 දින වන විට මාස 06 සිට වර්ෂ 05 ඉක්මවූ බැර ශේෂය රු.මි. 237 ක් විය. ගාල්ල වරායේ 2024.09.25 දින වන විට අත්තිකාරම් ගිණුමේ ශේෂය රු. 84,270.84 ක් ද බැර ශේෂය රු. 615,364.24 ක් ද විය.ත්‍රිකුණාමලය වරායේ 2024.09.30 දින වන විට අත්තිකාරම් ගිණුමේ ශේෂය රු.මිලියන 29.32 ක් ද ඉතිරි ශේෂය රු.මිලියන 5.62 ක් ද බැර ශේෂය රු. 794,597.71 ක් ද විය.
1.3.	**නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**				
(අ)	1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය පනතෙහි 39 වන වගන්තිය සහ 40 වන වගන්තියේ විධිවිධානවලට පටහැනිව ගාස්තු නිදහස් කාලසීමාව ඉක්මවා දින 2825	2021 2022 2023	අධිකාරිය පනතෙහි 39 වන වගන්තිය සහ 40 වන වගන්තියේ විධිවිධානවලට හානියක් නොමැතිව ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කටයුතු කළ යුතු බව.	විකුණුම් අංශය විසින් පවත්වාගෙන යනු ලබන අත්හල නැව් භාණ්ඩ (බහළු) පිළිබඳව වාර්තාවක් ගූගල් පත්‍රිකාවක් යටතේ සිදු කරයි. එම වාර්තාව විකුණුම් අංශ නිළධාරීන් හා	තවමත් මෙම බහාලුම් වරාය පරිශ්‍රය තුළ පැවතුණි.

	සිට දින 6922 දක්වා වූ කාල පරාසයක් වරාය පරිශ්‍රය තුළ පැවති බහාලුම් 08 ක අන්තර්ගත භාණ්ඩ/ ද්‍රව්‍ය කුමක්ද යන්න හඳුනාගැනිමට නොහැකිවී තිබුණු අතර දීර්ඝ කාලයක් ගතවී ඇතත් එම බහාලුම් සම්බන්ධයෙන් පනතෙහි 39 වන වගන්තිය ප්‍රකාරව අධිකාරිය කටයුතු කර නොතිබුණි.			ප්‍රධාන කළමණාකරු (සේවා සැපයුම්) හා අධ්‍යක්ෂ (සේවා සැපයුම්) නිරීක්ෂණය කළ හැකි අතර එහි දැනට SAGT, CICT හා JCT අංගනවලින් විකුණුම් අංශය වෙත ලබා දී ඇති දින 21 ක් ඉක්මවූ බහළු සම්බන්ධව නිරීක්ෂණය කළ හැක.	
(ආ)	ආයතන සංග්‍රහයේ IV වන පරිච්ඡේදයේ 3.3 වගන්තිය අනුව ස්ථිර නිලධරයෙකු පත් කිරීමට වහා පියවර ගත යුතු වුවද 2023 දෙසැම්බර් 31 වන විට වැඩ බැලීම සඳහා හෝ නිළධාරියෙකු පත් නොකර ඇති ඇබෑර්තුගත තනතුරු 16 ක් පැවතුණි.	2022 2023	අධිකාරියේ පවතින පුරප්පාඩු නිසි පරිදි බඳවාගැනීමේ පටිපාටියට අනුව බඳවාගෙන සම්පූර්ණ කළ යුතුය.	මේ වන විට සියළු අදාළ තනතුරු පුරප්පාඩු සඳහා ස්ථිර වශයෙන් නිළධරයන් පත් කිරීමට කටයුතු කර ඇති අතර, ඡන්ද කටයුතු හේතුවෙන් ආරක්ෂක නියාමක තනතුර පමණක් බාහිර අයදුම්පත් කැඳවා 100 දෙනෙකු බඳවා ගැනීමට අදාළ ඉදිරි කටයුතු තාවකාලිකව අත්හිටුවා ඇත.	ඇබෑර්තුගත තනතුරු සඳහා බඳවාගැනීම්වල ට අදාළව ඉදිරි කටයුතු සිදුකර බඳවාගැනීම් සිදුකර නොතිබුණි.
(ඇ)	2021 නොවැම්බර් 16 දිනැති අංක පීඊඩී/01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය සමග නිකුත් කර ඇති රාජ්‍ය ව්‍යාපාර සඳහා වූ සංස්ථාපිත				

යහපාලන මාර්ගෝපදේශය

i.	වගන්ති අංක 2.2.5 සහ 2023 සැප්තැම්බර් 27 දිනැති අංක 01/2021 (ii) දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ වගන්ති අංක 2 හා 3 අනුව අධිකාරිය සතු පරිපාලිත සමාගම් සඳහා පරිපාලිත සමාගම් ප්‍රතිපත්තියක් සකස් කර නොතිබුණි.	2021 2022 2023	පරිපාලිත සමාගම් ප්‍රතිපත්තියක් සකස් කළ යුතු බව.	අනුබද්ධ ආයතන ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා අභ්‍යන්තර කමිටුවක් පත් කර ඇත.	පරිපාලිත සමාගම් සඳහා පරිපාලිත සමාගම් ප්‍රතිපත්තියක් මේ වන තෙක් සකස්කර නොතිබුණි.
ii.	වගන්ති අංක 4.3 අනුව 2022 පෙබරවාරි 25 දින පත්කරන ලද අවදානම් කමිටුවෙහි දැනට සාමාජිකයන් දෙදෙනෙකුගෙන් (02) පමණක් සමන්විත වී තිබූ අතර අවදානම් කමිටුව ත්‍රෛමාසිකව රැස්වී නොතිබුණි. මේ හේතුවෙන් ආයතනයේ ව්‍යාපාරික මෙහෙයුම් කෙරෙහි බලපෑමක් ඇති කළ හැකි අවදානම් හඳුනාගෙන තක්සේරු කළ	2021 2022 2023	කමිටුව නිසි පරිදි රැස්වී අවශ්‍ය අවදානම් හඳුනාගැනීම් යනාදිය ඉක්මණින් සිදුකළ යුතු බව.	අංශ ප්‍රධානීන් විසින් තමන්ගෙ අංශවලට අදාළ අවදානම සම්බන්ධයෙන් නිරීක්ෂණ සහ අදහස් ඉදිරිපත් කිරීමෙන් පසු කළමණාකාරිත්වය සමග සාකච්චා කර ඉදිරි පියවර ගැනීමට නියමිතය.	අවදානම් කමිටුවක් පත්කර තිබුණද මේ වන තෙක් එය රැස්වී හෝ ක්‍රියාත්මක තත්ත්වයේ නොතිබුණි.

	නොහැකි වීම, මූල්‍ය හා මූල්‍ය නොවන අවදානම් බලපෑම ගණනය කළ නොහැකි වීම වැනි අවදානම් ඇතිවිය හැකිවේ.				
(ඇ)	2021 නොවැම්බර් 16 දිනැති අංක පිඊඩී 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රල්බය සමග නිකුත් කරන ලද මෙහෙයුම් අත්පොතෙහි 3.7 වගන්තිය, 2020 ජනවාරි 27 දිනැති අංක පිඊඩී 01/2020 චක්‍රලේඛයෙහි 1.1 වගන්තිය සහ 2015 මැයි 25 දිනැති අංක පිඊඩී 2/2015 චක්‍රලේඛය පටහැනිව අධිකාරියේ සභාපතිවරයාගේ දිමනා ගෙවිමේදී භාණ්ඩාගාර අනුමැතියකින් තොරව සාමාන්‍ය සේවයකරන පැය ඉක්මවා ලබාදෙන සේවය සඳහා ස්ථාවර ගෙවීමක් ලෙස රු.1,480,000 ක් හා Entertainment allowance නම් රු.540,000 ක මුදලක් ද ඇතුළුව රු.2,020,000 ක මුදලක් 2023 වර්ෂය තුළ ගෙවා තිබුණි.	2023	අදාල චක්‍රලේඛ ප්‍රකාරව පමණක් දීමනාවන් ලබාගැනීමට කටයුතු කළ යුතු බව හා නැතහොත් භාණ්ඩාගාරයෙන් අනුමැතිය ලබා ගත යුතු බව.	සභාපතිවරයා විසින් ඉටුකරනු ලබන කාර්යභාරය සැලකිල්ලට ගෙන ඉහළ කළමනාකාරිත්ව කමිටුවේ හා අධ්‍යක්ෂ මණ්ඩල තීරණය ප්‍රකාරව මෙම දීමනාවන් ගෙවීමට කටයුතු කර ඇත. ඉදිරියේදී මෙම ගෙවීම් සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීම කටයුතු කරනු ලැබේ.	භාණ්ඩාගාරගාර අනුමැතිය මේ වන තෙක් ලබාගෙන නොතිබුණි.

(ඉ)	1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය පනතේ (v) කොටසෙහි 38 (1) (අ) සහ (ආ) වන වගන්තිය අනුව අත්අඩංගුවට ගත් කන්ටේනර් 06 ක් සඳහා අධිකාරියට අයවිය යුතු රු.මිලියන 22.5 ක් අයකරගෙන නොතිබුණි.	2022	වරාය පනත ප්‍රකාරව වරායට ගෙවිය යුතු සියළු ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතු බව.	අදාළ ගාස්තු අයකර ගැනීම පිළිබඳව ශ්‍රී ලංකා රේගුව දැනුවත් කර ඇති අතර සිහිකැඳවීමේ ලිපියක් සකස් කොට නිසි පරිදි වාර්තා කිරීමේ වැඩපිළිවෙලක් සකස් කර ගැනීමට ශ්‍රී ලංකා රේගුව සමග කටයුතු කරනු ලැබේ.	අධිකාරියට අයවිය යුතු සියලුම ගාස්තු මෙතෙක් අයකර ගෙන නොතිබුණි.
(ඊ)	2021 නොවැම්බර් 16 දිනැති අංක පීඊඩී/01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය				
	i. 3.3 2 (i) ඡේදය සහ 2013 ජනවාරි 23 දිනැති අංක DMS/F1/3/3-1 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද ලිපිය ප්‍රකාරව අධිකාරිය විසින් කෙටුම්පත් බඳවා ගැනීමේ හා උසස්කිරීමේ පටිපාටි සකස්කර තිබුණද ඒ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය	2021 2022 2023	චක්‍රලේඛ විධිවිධාන පරිදි බඳවා ගැනීමේ පටිපාටියක් සකස් කර විධිමත් අනුමැතීන් ලබා ගැනීමට කටයුතු කළ යුතු බව.	බඳවාගැනීමේ පටිපාටිය කෙටුම්පත් කර මේ වන විට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අනුමැතිය ලබා ගැනීම සඳහා රේඛීය අමාත්‍යාංශය මඟින් යොමු කර ඇති අතර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් ලබා දෙනු ලබන මගපෙන්වීම්, නිර්දේශ හා අදහස් මත ඉදිරි කටයුතු සිදු කිරීමට අපේක්ෂිතය.	කෙටුම්පත් බඳවා ගැනීමේ හා උසස්කිරීමේ පටිපාටි සකස්කර තිබුණද ඒ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

	ලබාගෙන නොතිබුණි.				
ii.	3.4 වගන්තිය අනුව නිසි රැකියා ඇගයීමකින් හෝ අධ්‍යනයකින් තොරව බඳවාගැනීම් සිදු නොකළ යුතු වුවද, අධිකාරියේ අංශ 07 ක සේවක සංඛ්‍යාවේ 187 ක අතිරික්තයක් පැවතුණි.	2022 2023	නිසි රැකියා ඇගයීමක් සිදුකර නව කාර්යය මණ්ඩල සහ බඳවාගැනීමේ පටිපාටියන් ඉක්මණින් සකස් කරගත යුතු බව.	අතිරික්ත සේවකයින් විශ්‍රාම ගැනීම හෝ වෙනත් තනතුරු සඳහා උසස් වීමේදී ක්‍රමානුකූලව එම තනතුරුවල අතිරික්තය හීන වෙමින් පවතියි. 2023 වසරේදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වසින් ක්ෂේත්‍ර පරීක්ෂාවකින් පසු සේවක සංඛ්‍යාව අනුමත කිරමේදී ද මෙලෙස සේවක අතිරික්තයක් පවතින අතර, එම අතිරික්තය ඔවුනට පෞද්ගලික වන සේ අනුමත කර තිබුණි.	ඇබෑර්තුගත තනතුරු සඳහා බඳවාගැනීමේදී නිසි රැකියා ඇගයීමක් සිදුකර බඳවාගැනීම් සිදුකර නොතිබුණි.
iii.	3 වන පරිච්ඡේදයේ 3.4 වගන්තියේ ix වන උපවගන්තියට පටහැනිව වැඩ බැලීම සඳහා පත්කළ වසරක කාල සීමාව ඉක්මවූ තනතුරු 13 ක් සඳහා 2022 දෙසැම්බර් 31 දින වන විටත් අදාළ පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබුණි.	2022 2023	මෙම පුරප්පාඩු විධිමත්ව පිරවීමට ඉක්මණින් කටයුතු කළ යුතු බව.	බඳවා ගැනීමේ පටිපාටි සකස් කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබන තෙක් පුරප්පාඩු පිරවීම සිදු නොකරන ලෙසට ලද උපදෙස් මත විශ්‍රාම ගැනීම නිසා තනතුරුවල ඇතිවූ පුරප්පාඩු පිරවීමට අවස්ථාවක් නොලැබුණි. කෙසේ වෙතත්, එම	ඇබෑර්තුගත තනතුරු සඳහා මේ වන විටත් පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබුණි.

				තනතුරු සඳහා වන කාර්යභාරයේ පවතින අත්‍යවශ්‍යතාවය අනුව, වැඩ බැලීමේ පදනම මත සේවකයින් සේවයේ යොදවා ඇත.	
(උ)	ශ්‍රී ලංකා වරාය අධිකාරියේ 2021 ජනවාරි 30 දිනැති අංක 02/2021 චක්‍රලේඛයේ 07 ඡේදයේ I හා II වගන්ති අනුව				
i.	වසර 05 ක් ඉක්මවා එකම නිල නිවාසයේ පදිංචිව සිටින නිලධාරීන් 399 දෙනාම 2022 දෙසැම්බර් 31 දිනට අදාල නිවාසවල පදිංචිය සඳහා නව ඉල්ලුම්පත්/ ගිවිසුම් අළුත්කිරීමේ ඉල්ලුම්පත් ඉදිරිපත් කර නොතිබුණි.	2021 2022 2023	නිල නිවාස නැවත ලබාගැනීමට අවශ්‍ය නම් අදාල චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු බව.	මේ වන විට 2024.04.22 දිනැති අංක 27/2023 දරණ නව චක්‍රලේඛය මේ සම්බන්ධයෙන් නිකුත් කොට ඇත.වසර 05 ඉක්මවා එකම නිල නිවාසයේ රැඳී සිටින නිළධාරීන් 376 ක් වන අතර මෙම නිළධාරීන් සියළු දෙනාට අත්‍යවශ්‍ය පදනම මත නිවාස වෙන්කර ඇත.	චක්‍රලේඛ නිකුත් කලද ඒ අනුව කටයුතු නොවන බවත් තවම වසර 05 ඉක්මවා එකම නිල නිවාසයේ රැඳී සිටින බව නිරීක්ෂණය විය.
ii.	අධිකාරියේ නිළධාරීන්ට ලබාදෙන නිල නිවාස සඳහා වූ පදිංචි කාලසීමාව, පළමුව නිවාස ලබා දුන් දින සිට වසර 5 ක උපරිමයකට සීමා	2021 2022 2023	නිල නිවාස වල තවදුරටත් රැඳීසිටීමට අවශ්‍ය නම් ගෙවීම් කර අදාල චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු බව.	ඉහත පරිදි වේ.	චක්‍රලේඛ නිකුත් කලද ඒ අනුව කටයුතු නොවන බවත් තවම වසර 05 ඉක්මවා එකම නිල නිවාසයේ රැඳී සිටින බව

	වන අතර, එම කාලසීමාව සම්පූර්ණ වීමෙන් පසුව තවත් මාස 06 ක කාලයක් පදිංචිව සිටින නිලධාරියා නිල නිවාසයට ගෙවිය යුතු කුලී මුදලින් දෙගුණයක් ගෙවිය යුතු වුවද, 2022 දෙසැම්බර් 31 දිනට වර්ෂ 05 මාස 06 ක් ඉක්මවා සහ වර්ෂ 28 තෙක් කාල පරාසයක් තුල අදාල නිල නිවාසවලින් ඉවත් වී නොගොස් රැඳී සිටින නිලධාරීන් සංඛ්‍යාව 399 ක් වී තිබුණි.				නිරීක්ෂණය විය.

2. මෙහෙයුම්

2.1. සමාලෝචනය කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ)	වරාය පරිශ්‍රයේ ආරක්ෂාව තහවුරු කිරීම උදෙසා වරාය පිවිසුම් දොරටු වෙත CCTV Camera සවිකිරීමේ කටයුතු සඳහා රු.මිලියන 600 ක ප්‍රතිපාදන යටතේ ආරම්භ කළ ව්‍යාපෘතියේ ප්‍රගතිය සියයට 60 ක් ලබා කරගනිමින් දැනට ආරක්ෂිත කැමරා 587 න් 226 ක් මෙතෙක්	2021 2022 2023	වරාය පිවිසුම් දොරටු වෙත CCTV Camera සවිකිරීමේ කටයුතු කඩිනමින් නිමකල කළ යුතු බව.	වාර්ෂික අයවැය මගින් වෙන්කර ගත් මුල්‍ය ප්‍රතිපාදන භාවිතා කරමින් දොරටුවල CCTV කැමරා පද්ධති සවිකරන ලදී. අංක 4, 4A, 5 සහ 8 යන දොරටුවල CCTV කැමරා පද්ධති සවිකර නිමා කර ඇති අතර අංක 7 දොරටුවේ වැඩ නිම කරමින් පවතී.	මෙතෙක් CCTV කැමරා පද්ධති සවිකිරීම නිම නොකර පවතින පිවිසුම් දොරටු කිහිපයක් පැවතුණි.

සවිකර නොතිබුණි.

(ආ)	2017 නොවැම්බර් සිට මෙහෙයුම් කටයුතු නතර කර තිබූ අධිකාරියේ පරිපාලිත සමාගමක් වන මාගම්පුර වරාය කළමනාකරණ සේවා (පුද්ගලික) සමාගම [MPMCS] විසින් 2014 වර්ෂයේදී පුද්ගලික බැංකුවකින් ඇමරිකානු එක්සත් ජනපද (ඇ.එ.ජ) ඩොලර් මිලියන 24 ක ණය මුදලක් ලබාගෙන තිබුණි. බැංකුව විසින් මෙම ණය අයකර ගැනීම සඳහා පරිපාලිත සමාගමට හා අධිකාරියට විරුද්ධව නඩු දෙකක් 2020 වර්ෂයේ කොළඹ දිසා අධිකරණයේ පවරා තිබුණ ද, 2023 වර්ෂය අවසාන වන විටද නඩු කටයුතු අවසන්ව නොතිබුණි.	2021 2022 2023	මෙම නඩුව කඩිනමින් නිරාකරණය කරගැනීමට අවශ්‍ය කටයුතු සඳහා මූල්‍ය ආයතනය සමග සාකච්ඡා කිරීම හෝ නීතිමය ක්‍රියාමාර්ග කඩිනම් කිරීමට කටයුතු කළ යුතු බව.	අධිකාරියට විරුද්ධව බැංකුව විසින් ගොනු කරන ලද අංක DDR/1349/2019 දරණ නඩුවේ නියෝගය අධිකාරියට එරෙහිව 2024.09.10 දින ලබා දුන් අතර නිතිපති දෙපාර්තමේන්තුව විසින් දෙන ලද උපදෙස් ප්‍රකාරව අභියාචනා නොතීසිය 2024.09.12 දින දිසා අධිකරණයේ ගොනු කර ඇත. HC/Civil/97/2021/ CO දරණ සමාගම ඈවර කිරීමේ ඉල්ලීම දැනට කොළඹ වාණිජ මහාධිකරණයේ විභාග වෙමින් පවතින අතර 2024.12.22 දින නැවත කැඳවීමට නියමිතය.	මෙම ණය මුදල මේ වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.
(ඇ)	ඉඩම් පිළිබඳ විගණනය				
	i. කොළඹ 10 විජේවර්ධන මාවතේ සන්නිවේදන කුලුණ ඉදිකරන ස්ථානය අසල ඇති ඉඩම ශ්‍රී	2021 2022 2023	බදු ගිවිසුමකට ඇතුලත්වී රජයේ තක්සේරුකරුගේ තක්සේරුව මත බදු ප්‍රමාණය තීරණය කර බදු ලබා ගැනීම කළ	අදාල ඉල්ලීම හදිසි කටයුත්තක් සේ සලකා රජයේ ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව ලබාගන්නා තෙක්	මෙතෙක් කල්බදු ගිවිසුමකට එළඹී නොතිබුණි.

	ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත ලබාදීම වෙනුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ශේෂය වන රු.මිලියන 37.9 වූ අතර මෙම මුදල් අයකර ගැනීමට අධිකාරිය අපොහොසත් වී තිබුණු අතර ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සමඟ කල්බදු ගිවිසුමකට එළඹ නොතිබුණි.		යුතු බව.	රු.50,000/-ක නාමික මාසික බදුකුලියක් අයකිරීමට යටත්ව තාවකාලික කොන්දේසි මාලාවකට එකඟව අදාල පරිශ්‍රය විදුලි සංදේශ නියාමන කොමිසම වෙත භාරදෙන ලද අතර අදාල බදු කුලිය නොකඩවා ගෙවීමට කටයුතු කර ඇත.තවද, මෙම ආයතන දෙක බදු ගිවිසුමකට එලැඹී නොමැත.	
ii.	අධිකාරිය විසින් බදු දීමට හෝ වෙනත් ඵලදායී කාර්යයකට යොදාගැනීමට අපේක්ෂිත වුවත්, රු.මිලියන 2,997 ක් වටිනා අක්කර 29 රූඩ් 03 පර්චස් 9.39 ක් වන ඉඩම් කැබලි 05 ක් මෙතෙක් අපේක්ෂිත අරමුණට යොදා නොගෙන පැවතුණි.	2022 2023	ඉඩම් කැබලි 05 ක් වෙනත් ඵලදායී කාර්යයකට යොදාගැනීමට කටයුතු කළ යුතු බව.	කොළඹ 10, ඩී.ආර්. විජේවර්ධන මාවතේ පිහිටි ඉඩම් කොළඹ නගර සංවර්ධන සැළසුමට අනුව නාගරික සංවර්ධන අධිකාරිය සමඟ ඒකාබද්ධව සංවර්ධනය කිරීමට සිදුවී තිබේ. කොළඹ කොම්පඤ්ඤ වීදියේ පිහිටි කිව් පාරේ ඉඩම සහ කොළඹ 02 කොම්පඤ්ඤ වීදියේ පිහිටි මෝගන් පාරේ පිහිටි ඉඩම සුදුසු ආයෝජනයකට බදු දීමට නියමිතය. මහර ගල්වල පිහිටි	මෙතෙක් මෙම සංවර්ධන ව්‍යාපෘති ආරම්භකර නොතිබුණි.

			ඉඩම මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතියක් සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත.	
iii. 2023 දෙසැම්බර් 31 දිනට අධිකාරිය විසින් තක්සේරු දෙපාර්තමේන්තු වෙන් තක්සේරු වටිනාකමක් ලබා නොගෙන බදු දී ඇති අක්කර 214 රූඩ් 8 පර්චස් 148.25 ක් හා වර්ග මීටර් 15,620 ක් වූ ඉඩම් කට්ටි 14 ක් විය. මේ හේතුවෙන් අධිකාරියට ලබාගත හැකිව තිබූ බදුකුලී ආදායම් අඩුවීමක් සිදු වී තිබුණි.	2023	බදු ගිවිසුමකට ඇතුලත්වී රජයේ තක්සේරුකරුගේ තක්සේරුව මත බදු ප්‍රමාණය තීරණය කර බදු ලබා ගැනීම කළ යුතු බව.	(පහත වගුව බලන්න)	මෙතෙක් කල්බදු ගිවිසුමකට එළඹී නොතිබුණි.

අනු අංකය	ආයතනයේ නම	හේතු
01	CICT	
02	PVQ Respositary Warehouse Land Melsta Gama Pvt Ltd	මෙම ආයතන ටෙන්ඩර් කැඳවා මූලික ගෙවීමක් සිදුකර දිගුකාලීන පදනමක් මත බදු දී ඇති අතර විශේෂිත අනුපාතයක් මත වසර 03 කට හෝ 05 කට වරක් මෙම ආයතනවල බදුකුළිය වැඩිකර ඇත. තක්සේරු වාර්තා ලබා ගැනීමේදී ඇති වන ප්‍රමාදයන් මෙවැනි ක්‍රියා මාර්ග හේතුවෙන් අවම කර ගත හැකිවේ.
03	Tokyo Cement Company PVQ Warehouse 01	
04	Tokyo Cement - Samudra	
05	NFCL Penna Port Storages Pvt Ltd – PVQ Area	
06	Insee Cement	
07	Holcim Cement - Kappalthuri	
08	SAGT –QEQ Area	අමාත්‍ය මණ්ඩල තිරණයක් මත ලබා දී ඇත
09	W.A.Tucke & Co.ltd	මෙම පරිශ්‍රය නැවත භාර දෙන ලෙස දැනුම් දී ඇත.
10	Dialog Axiata PLC.	වරාය නියමු ස්ථානයේ බිත්තියක් මත

		තිරස්ව සවිකොට ඇති ඇන්ටනාවක් සඳහා කළමණාකාරීත්වය විසින් තීරණය කරනු ලැබූ ගාස්තුවක් අයකරනු ලබන අතර එය වාර්ෂිකව 5% බැගින් වැඩි කරනු ලැබේ.
11	Ministry of Port & Shipping.	බදුකුළී නිසි පරිදි ගෙවමින් පවතින අතර බදු ගිවිසුමකට එළැඹීමට නියමිතය.
12/ 13	Ocean Pick Pvt Ltd.	රජයේ තක්සේරු වටිනාකම මත බදු ගිවිසුමකට යටත්ව බදු දී ඇති මෙම පරිශ්‍රය සඳහා වාර්ෂිකව 5% බැගින් බදුකුළිය වැඩිකරනු ලැබේ.

iv.	ත්‍රිකුණාමලය වරායේ ඉඩම්වල 2017 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා අනවසර පදිංචිකරුවන්ට එරෙහිව 2023 ජූලි 10 දින වන විට පවරන ලද නඩු සංඛ්‍යාව 147 ක් වූ අතර කාලච්ඡේදය තුළ ඉවත් වූ පදිංචිකරුවන් ගණන 110 ක් විය. තවද, අධිකරණයේ ඉවත්කිරීම් නියෝග ලබාදී තිබියදී ඉවත්	2023	ත්‍රිකුණාමලය වරාය පරිශ්‍රයේ අනවසරයෙන් පදිංචි වී සිටින පදිංචිකරුවන් ඉවත් කිරීම හෝ එම ඉඩම්වල නිරවුල් කිරීම් කළ යුතු බව.	2022.01.12 දින සිට 2022.05.23 දින දක්වා ගොනු කරන ලද නඩු 24 න් වග උත්තරකරුවන් 23 දෙනෙක්ම ඉවත් කිරීම සඳහා නියෝග නිකුත් කරන ලදී. නඩු පැවරීමට යෝජිත අනවසර පදිංචිකරුවන් 46 දෙනා අතුරින් 14 දෙනෙකුට එරෙහිව නඩු පවරා ඇති අතර ඉන් 04 දෙනෙකු ඉවත් කිරීම සඳහා මේ වන විටත් නියෝග	නඩු කටයුතු මෙතෙක් නිමවී නොතිබුණි.

	නොවූ පිරිස 36 ක් ද විය. තවද, ත්‍රිකුණාමලය වරායට අයත් හෙක්ටයාර් 1,871 ක් වූ විශාල ඉඩම් කට්ටි 04 ක් ආර්ථිකමය වශයෙන් භාවිතයට නොගෙන පැවතුණි.			ලැබී ඇත.	
(ඈ)	වත්කම් පිළිබඳව නිවැරදි/ යාවත්කාලීන වාර්තා තබාගැනීමට කළමනාකරණය කටයුතු කළ යුතු අතර මාරුකර යවන ලද හෝ විකුණන ලද හෝ ඉවත්කල ස්ථාවර වත්කම් සහ අළුතින් මිලදීගත් ස්ථාවර වත්කම් නිසි පරිදි ඇතුලත් කර ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි.	2023	අදාල වත්කම් වත්කම් ලේඛණයෙන් ඉවත් කිරීමට කටයුතු කළ යුතු බව	ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කිරීමට අවශ්‍ය ලියකියවිලි අදාල කොට්ඨාශ හා අංශ වලින් ලබා දිය යුතුවේ. එම ලිපි ලේඛන මුදල් කොට්ඨාශය වෙත ලැබීමත් සමඟ ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කරනු ලැබේ.	ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කිරීමට කටයුතු සිදු කර නොමැත.
(ඉ)	2022 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ කොට්ඨාශ 25 මගින් ඉදිරිපත් කරන ලද කාර්ය මණ්ඩල විස්තර අනුව තනතුරු 86 කට අදාළ අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා සේවකයින් 914 දෙනෙකු සේවයේ යොදවා තිබුණද අධිකාරියේ	2021 2022 2023	කළමනාකරණය විසින් කාර්ය මණ්ඩලය ඵලදායිව සේවයෙහි යොදවා අතිකාල වියදම් අඩු කර ගැනීමට කටයුතු කළ යුතු අතරම අතිකාල කලින් අනුමත කිරීම හා කල වැඩ වාර්තා	අනුමත කරන ලද සේවක සංඛ්‍යාව තුළ අන්තර්ගත නොවන විවිධ කාර්ය සහායක, සෞඛ්‍ය සේවක, ඡායා අනුපිටපත් යන්ත්‍ර ක්‍රියාකරු, මුළුතැන්ගෙයි සහායක සහ ආම්පන්නකරු යන තනතුරුවල එවකට	2024 අගෝස්තු 31 දින වන විටද අධිකාරියේ කොට්ඨාශ 35 මගින් ඉදිරිපත් කරන ලද කාර්ය මණ්ඩල විස්තර අනුව තනතුරු 196 කට අදාල අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා

මෙහෙයුම් කටයුතු (Operations) සඳහා සෘජුවම සම්බන්ධතාවයක් දක්වන කොට්ඨාශයන්හි සේවකයන් 726 දෙනෙකු පුරප්පාඩුව පැවති අතර අධිකාරියේ මෙහෙයුම් කටයුතු වෙනුවෙන් සෘජුවම සම්බන්ධතාවයක් නොදක්වන කොට්ඨාශ 10 ක සේවකයින් සඳහා සමාලෝචිත වර්ෂයේදී අතිකාල දීමනා වශයෙන් රු. මිලියන 924 ක් ඇතුළුව අධිකාරියේ සමස්ත අතිකාල දීමනාව රු.මිලියන 11,968 ක් ගෙවා තිබුණි.		පවත්වාගෙන යාමට ද කටයුතු කළ යුතු බව.	සිටි සේවකයින් එම තනතුරු නාමවලින්ම සිටින බැවින් ඔවුන් අතිරික්තයක් සේ පෙන්නුම් කරනු ඇත. වැඩ සහායක, කම්කරු, ආම්පන්නකරු, විවිධ කාර්ය සහායක, සෞඛ්‍ය සේවක, ඡායා අනුපිටපත් යන්ත්‍ර ක්‍රියාකරු, මුළුතැන්ගෙයි සහායක යන තනතුරු නාමයන් යටතේ සිටින සේවකයින් වැඩ සහායකයින් ඉටු කරන කාර්යයන් සිදුකරන බැවින් ඔවුන්ද සේවා අවශ්‍යතාවය අනුව අතිකාල සේවයේ යෙදීමට සිදුවනු ඇත. නෞකා මෙහෙයුම් පාලක තනතුරු 102 ක් සැලසුම් ලිපිකරු සහ සැසඳුම් සමීක්ෂණ ලිපිකරු තනතුරු දෙක ඒකාබද්ධ කරමින් ඇති කල අතර ඔවුන් එම තනතුරු නාමය යටතේම නෞකා මෙහෙයුම් පාලක තනතුරෙහි කාර්යයන් ඉටු කරන බැවින්	සේවකයින් 919 දෙනෙකු සේවයේ යොදවා තිබුණද අධිකාරියේ බහාලුම් මෙහෙයුම් කටයුතු (Container Operations) සඳහා සෘජුවම සම්බන්ධතාවයක් දක්වන අංශයෙහි සේවකයන් 206 දෙනෙකු පුරප්පාඩුව පවතින බව නිරීක්ෂණය විය. එසේම අධිකාරියේ මෙහෙයුම් කටයුතු වෙනුවෙන් සෘජුවම සම්බන්ධතාවයක් නොදක්වන අංශ 8 ක සේවකයින් 116 දෙනෙකුගේ අතිරික්තයක් පැවතුණි. 2024 වර්ෂය තුළදී සේවක අතිරික්ත පැවති අංශවල සේවකයින් වෙනුවෙන් ගෙවන ලද රු. මිලියන 1,982 ක අතිකාල දීමනා ඇතුළුව වර්ෂය සඳහා සමස්ථ අතිකාල දීමනාව

				ඔවුන්ව අතිකාල සේවයේ යොදවනු ලබයි. තනතුරු කිහිපයක් ඒකාබද්ධ කොට අළුත් තනතුරු නිර්මාණය කිරීමත් සමහර තනතුරු අහෝසි වී යන ලෙස සැලකීමත් එම තනතුරු සඳහා සේවකයින් බඳවා නොගැනීමත් හේතුවෙන් 2024.08.31 දිනට සමස්ථ සේවක සංඛ්‍යාව 7764 කි.	රු. මිලියන 5,303 ක් ගෙවා තිබුණි.
(ඊ)	අධිකාරිය සතුව නිල නිවාස 635 ක් පවතින අතර 2022 දෙසැම්බර් 31 දිනට පදිංචිය වසර 05 (2018 වර්ෂයට පෙර) ඉක්ම වූ නිල නිවාස 399 ක් හා වසර 05 ක් (2018-2022) ඇතුළත ලබාදුන් නිල නිවාස 205 ක් සමග මුළු නිල නිවාස 604 ක් උපයෝජනය වී ඇති අතර නිල නිවාස 31 ක් නිශ්කාර්යව පැවතුණි.	2022	අදාල නිල නිවාස චක්‍රලේඛ ප්‍රකාරව උපයෝජනයට ගත යුතු බව.	මේ වන විට භාවිතයට ගත නොහැකි නිවාස ප්‍රමාණය වැඩිවී ඇත.	මේ වන විට භාවිතයට ගත නොහැකි නිවාස ප්‍රමාණය වැඩිවී තිබුණි.
(උ)	2022 අංක 14 දරන අධිභාර බද්ද පනතේ 2 (1) (අ) වගන්තිය අනුව, 2020/21 වර්ෂයේ අධිකාරියේ බදු අයකළ හැකි ආදායම වන රු.මිලියන 4,787.77 මත ගණනය කළවිට	2022 2023	වැඩිපුරගෙවන අධිභාර බද්ද ඉක්මණින් නැවත අයකරගැනීමට හෝ ගෙවිය යුතු ආදායම් බදු වලින් හිලව්කර ගැනීමට කටයුතු කළ යුතු බව.	මෙම වැඩිපුර ගෙවූ අධිභාර බදු මුදල හට ගනු ලැබුවේ 2020/2021 ආදායම් බදු වාර්තාව නැවත සංශෝධනය කිරීම හේතුවෙනි. මෙම සංශෝධනය මෙන්ම නැවත අය	අධිභාර බදු මුදල මෙතෙක් නැවත අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

	අධිභාර බද්ද රු.මිලියන 1,196.94 වුවද, අධිකාරිය රු.මිලියන 1,952.2 ක් අධිභාර බදු ලෙස ගෙවා තිබුණි. තවද, මෙලෙස වැඩිපුර ගෙවූ රු.මිලියන 755.33 ක මුදල 2022 අංක 14 දරන අධිභාර බද්ද පනතේ 5 (1) වගන්තිය ප්‍රකාරව නැවත අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.			කර ගැනීම සඳහා ඉල්ලීම්ද ආදායම් දෙපාර්තමේන්තුව වෙත සිදු කර ඇති අතර, පළමුව 2020/2021 බදු වාර්තාව සංශෝධනය කිරීමේ කටයුතු දැනට ආදායම් බදු නිළධාරින් විසින් සිදු කරමින් පවති. එය අවසන් වූ පසු අධිභාර බදු වැඩිපුර ගෙවීම නැවත අය කර ගැනීමට හැකි වේ.	
2.2.	**මෙහෙයුම් අකාර්යක්ෂමතා**				
	කන්කසන්තුරේ වරාය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ශ්‍රී ලංකා රජය ඉන්දියානු එක්සිම් බැංකුව සමඟ ඇ.එ.ජ ඩොලර් මිලියන 45.27 ක ණය මුදලක් ලබා ගැනීමට ගිවිසුම් ගත වී තිබුණි. නමුත් එම ණය මුදල ප්‍රමාණවත් නොවේ යැයි පුරෝකථනය කර ඇ.එ.ජ ඩොලර් මිලියන 16.23 ක අතිරේක මුදලක් සමඟ ඇ.එ.ජ ඩොලර් මිලියන 61.5 ක් දක්වා එම ණය මුදල ඉහළ නංවා ගැනීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇතත් ඉන්දියානු රජය එය අනුමත කර නොතිබුණි. එබැවින්	2021 2022 2023	යථාර්ථවාදී වන පරිදි සැලසුම් සකස් නොකිරිම හා සැලසුම්ගත පරිදි ව්‍යාපෘති ක්‍රියාත්මක නොකිරීම නිසා බැදීම් ගාස්තු හා මිල විචලනයන් වැනි අනාර්ථික වියදම් දැරීමට සිදු වන නිසා සැලසුම් හැකිතාක් පරිදි යථාර්තවාදී විය යුතු බව.	2018 ජනවාරි 10 වන දින ශ්‍රී ලංකා රජය සහ ඉන්දියාවේ EXIM බැංකුව අතර ඇති කර ගත් ණය ගිවිසුමට අනුව, ණය ගැණුම්කරු වන ශ්‍රී ලංකා රජය ඉන්දියාවේ EXIM බැංකුවට කැපවීමේ ගාස්තුව සහ පොලී ගාස්තු ගෙවිය යුතුය. විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් මෙම ගෙවීම ශ්‍රී ලංකා වරාය අධිකාරියට සිදු කිරීමට නිර්දේශ කර ඉදිරිපත් කරන විට, ශ්‍රී ලංකා වරාය අධිකාරිය කැපවීම සහ පොලී ගාස්තුව	මෙම ව්‍යාපෘතිය මෙතෙක් ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණි.

	වරායෙහි ඉදිකිරීම් කටයුතු මෙතෙක් ආරම්භ කර නොතිබුණි. එසේම ණය මුදලින් ඇ.එ.ජ ඩොලර් මිලියන 0.905 (ඇ.එ.ජ ඩොලර් 905,194.38) ක් පමණක් වැයකර තිබුණු අතර ලබා නොගත් ණය සඳහා කැපකිරීමේ ගාස්තු (Commitment charges) ලෙස ඇ.එ.ජ ඩොලර් 32,048.73 (රු.මිලියන 9.2) ක මුදලක් සහ ණය පොළිය ලෙස ඇ.එ.ජ ඩොලර් 37,042.48 (රු.මිලියන 11.14) ක මුදලක් ද අනාර්ථික වියදමක් වී තිබුණි.			ගෙවීම අනිවාර්ය වන අතර එය ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පාලනයෙන් තොරවේ.	

2.3 ප්‍රසම්පාදන කළමනාකරණය

(අ)	අධිකාරියේ 2023 අගෝස්තු 29 දිනැති අංක PAM/195/2023 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණයේ 3.1 හි දක්වා ඇති පරිදි අධිකාරියට අවශ්‍ය ධාරිතාවය 2000 cc - 3000 cc රථ වාහන සැපයීම සම්බන්ධව ප්‍රසම්පාදනයේදී මෝටර් රථ වාහන කුලියට ලබාගැනීම ජාතික තරඟකාරී ලංසු (NCB) ක්‍රමය යටතේ සිදුකල යුතු බව සඳහන් වුවද, 2023	2023	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව කටයුතු කළ යුතු බව.	අංක PA/HD/25 දරණ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට අනුව සභාපති, උප සභාපති හා කළමණාකාර අධ්‍යක්ෂ කාර්යාල වෙත සුදුසු වාහන ලබා දීමට කටයුතු කර ඇත.	මෝටර් රථ වාහන කුලියට ලබාගැනීමේ ප්‍රසම්පාදනයන් සඳහා සැපයුම්කරුවන් තෝරා ගැනීමේදී ජාතික තරඟකාරී ලංසු ක්‍රමය අනුගමනය කර නොතිබුණි.

වර්ෂය වෙනුවෙන් වාර්ෂික කුලිය රු.මිලියන 20 ක් වටිනා රථ වාහන 03 ක් ප්‍රසම්පාදනයේදී සැපයුම්කරුවන් ලියාපදිංචිය සඳහා ජාතික තරඟකාරී ලංසු ක්‍රමය අනුගමනය කර නොතිබුණි.

3.159 සී/ස ලංකා නැව් සංස්ථාව

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	12,471,081,730	20,385,307,920	(7,914,226,190)	(4,567,786,074)	තත්ත්වාගණනය කළ
2022	13,136,693,198	22,346,787,526	(9,210,094,328)	(433,605,111)	තත්ත්වාගණනය කළ
2023	11,032,441,459	19,390,642,311	(8,358,200,852)	1,174,795,701	-

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ගය	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1.1	**සමාගමේ අඛණ්ඩ පැවැත්ම**				
	2023 මාර්තු 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ අලාභය රු.1,857,129,766 ක් වූ අතර සමුච්චිත පාඩුව රු.10,855,139,608 ක් විය. තවද, 2023 මාර්තු 31 දිනට සමාගමේ ශුද්ධ වත්කම් වල අගය රු.9,210,094,328 ක සෘණ අගයක් විය. වර්ෂය සඳහා වූ අලාභය පෙර වර්ෂයට සාපේක්ෂිතව සියයට 67.79 කින් අඩු වී ඇති අතර සමාගමේ ශුද්ධ වත්කම්වල සෘණ ශේෂය පෙර වර්ෂයට සාපේක්ෂිතව සියයට 16.37 කින් ඉහළ ගොස් ඇත. සමාගම නෞකා	2021/2022 2022/2023	සමාගමේ අඛණ්ඩ පැවැත්ම ආරක්ෂාකර ගැනීම සඳහා විශේෂ මහා සහා රැස්වීම්වල ගනු ලැබූ මූල්‍යමය අලාභය අවම කිරීමේ ක්‍රියාමාර්ග ගැනීමට කළමනාකරණයකටයුතු කළ යුතු බව.	අතිවිශේෂ මහා සභා රැස්වීම්වලදී කළ යෝජනා පහත පරිදි වේ **1.** පාවෙන නාවික ඉන්ධන ගබඩාවක් ක්‍රියාත්මක කිරීම. **2.** ශ්‍රී ලංකා ධජයේ ලියාපදිංචිය ප්‍රවර්ධනය කිරීම. **3.** මගීන් සහ නොරොච්චෝලේ භාණ්ඩ ප්‍රවාහන කටයුතු සඳහා බෝට්ටුවක් ඉදි කිරීම.	මෙහි සඳහන් යෝජනා දැනට ක්‍රියාත්මක මට්ටමේ නොතිබුණි.

දෙකක් මිලදී ගැනිම සඳහා 2014 වර්ෂයේදී ඇ.ඩො.මිලියන 70 ක කාලින ණයක් (Term Loan) සහ එම ණය පොලිය ගෙවීමට පොලී ප්‍රාග්ධනිත ණයක් ලෙස ඇ.ඩො.මිලියන 5.44 ක් මහජන බැංකුවෙන් ලබා ගෙන තිබූ අතර, 2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය තුළ ගෙවා තිබූ කාලින ණය, පොලී ප්‍රාග්ධනිත ණය සහ ඊට අදාළ පොලියරු.2,828,293,385 ක් සමාගම විසින් මහජන බැංකුවට ගෙවීමට සිදුවීම මත 2023 මාර්තු 31 දිනට එක්සත් ජනපද ඩොලර් ණය ශේෂය ශ්‍රී ලංකා රුපියල් අගයට පරිවර්තනය කිරීමේදී රු.2,811,891,329 ක් වූ විනිමය අලාභයක් සිදුව තිබීම සමාගමේ සමස්ථ අලාභයට හේතු වී තිබුණි. ඒ අනුව සමාගමේ අඛණ්ඩ පැවැත්ම සම්බන්ධව පවතින අවිනිශ්චිතතාව පිළිබඳව පැහැදිලි ඇඟවීමක් ඇති බව නිරික්ෂණය විය. මෙම තත්ත්වය මග හරවා ගැනිම සඳහා 2021 ජූලි 30 වැනි දින පැවති විශේෂ මහා සභා රැස්වීමේ දී (EGM) සමාගම ක්‍රියාමාර්ග යෝජනා කර තිබුණද, එම විනිමය අලාභය

4. කන්කසන්තුරේ සිට නම් කරන ලද ඉන්දියන් වරායන්/ වරායක් අතර මගී සහ නාවික භාණ්ඩ ප්‍රවාහන යාත්‍රාවක් ක්‍රියාත්මක කිරීම.

5. නොරොච්චෝලේ නැව් තොටුපලේ සිට ජැටිය වෙත ගල් අඟුරු ප්‍රවාහනය කිරීම සඳහා ස්වයං-චලිත බත්තල් 05ක් ඉදි කිරීම.

6. ශ්‍රී ලංකාව හා බංග්ලාදේශය අතර බහාලුම් පෝෂක සේවාවක් ක්‍රියාත්මක කිරීම.

7. නැව් සංස්ථාව තුළ අළුතින් ස්ථාපිත කරනු ලැබූ නව ව්‍යාපාර ප්‍රවර්ධන ඒකකය සේවා විවිධාංගීකරණය යටතේ නව ව්‍යාපාරික අවස්ථාවන්ට ප්‍රවේශ වීම.

අවම කිරිමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරිමට සමාගම අපොහොසත් වී තිබුණු අතර 2023 මාර්තු 24 දින පැවති විශේෂ මහා සභා රැස්වීමේදී ඒ සඳහා නව ව්‍යාපාරික ව්‍යාපෘති 06 ක් තවදුරටත් යෝජනා කර තිබුණි.

8. භාණ්ඩ ප්‍රවාහන සේවා (Logistics Services) කටයුතු සම්බන්ධයෙන් අප විසින් සිදු කරන ලද නව ව්‍යාපාරික අවස්ථා.

i. අධ්‍යාපන අමාත්‍යංශය වෙත ගෙන්වන ලද නිල ඇඳුම් තොගවල නිෂ්කාශන කටයුතු සිදු කිරීම.
ii. රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව වෙත ගෙන්වන ලද කඩදාසි තොගවල නිෂ්කාශන කටයුතු සිදු කිරීම.
iii. සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ගෙන්වන ලද සහල් තොගවල ප්‍රවාහන හා නිෂ්කාශන කටයුතු සිදු කිරීම.

iv. ශ්‍රී ලංකන් කේටරින් ආයතනය,

			Anti-Leco Metering සහ වෙනත් පුද්ගලික ආයතන සඳහා මුහුදු හා ගුවන් මගින් භාණ්ඩ ප්‍රවාහන කටයුතු සිදු කිරීම. v. ලෝක බැංකුව හරහා අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලැබුණු වියලි ආහාර තොග දීප ව්‍යාප පාසල් සඳහා බෙදා හැරීම. vi. අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ආලේපිත කඩදාසි පුවරු හා තහඩු (coated paper boards and container plate) ප්‍රවාහනය හා නිෂ්කාශනය කටයුතු සිදු කිරීම.	

1.2 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

මුල්‍ය තත්ත්ව ප්‍රකාශනයට අනුව 2023 මාර්තු 31 දින වන විට සී/ස ලංකා නැව් සංස්ථාවට අයවිය යුතු වෙළඳ ණයගැති වටිනාකම රු.2,070,761,878 කි.	2021/2022 2022/2023	ණයගැතියන් ගෙන් මුදල් එකතු කර ගැනීම සඳහා විධිමත් අභ්‍යන්තර පාලන ක්‍රමයක් අනුගමනය	2022 අගෝස්තු 19 වන දින පවත්වන ලද පේෂ්ඨ කළමණාකාරිත්වය විසින් තීරණය කරන පරිදි ප්‍රධාන වශයෙන් දීර්ඝ කාලින ණය අය	සමාගමට අයකර ගතයුතු මුළු ණය මුදල් අයකර ගැනීමට කටයුතු කර නොමැති අතර 2024

	එයින් රු.1,034,044,153 ක ප්‍රමාණයක් වසර 4 කට වඩා වැඩි කාලයක් අය කර ගැනීමට නොහැකි ශේෂ වන අතර රු.257,530,960 ක් වසර 1 සිට 4 දක්වා අයකර ගැනිමට නොහැකි ශේෂ වන අතර 2022/2023 වර්ෂය තුළ ඇති වූ වෙළඳ ණයගැති වටිනාකම රු.779,186,765 ක් විය. ඉහත වෙළඳ ණයගැතියන් අතරින් දේශිය රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන වලින් සමාගමට අයවිය යුතු මුදල් රු.1,525,359,729 ක් වන අතර එයින් ද රු.618,045,453 ක් වසර 03කට වඩා වැඩි පැරණි ණයගැතියන් වන බවත්, වසර 03 කට වඩා පැරණි විදේශීය හා අනෙකුත් වෙළඳ ණයගැතියන්ගෙන් 2023 මාර්තු 31 දිනට අයවිය යුතු ශේෂය රු.163,752,420 ක් විය.		කිරීමට කළමනාකරණය කටයුතු කළ යුතු බව.	කර ගැනීමේ කමිටුවක් පිහිටුවන ලදී. තවද සාමාන්‍යාධිකාරිතු මාගේ උපදෙස් පරිදි එක් එක් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ කමිටු සමාජකයින් ඇතුලත්ව සාමාන්‍යාධිකාරිතු මාගේ ප්‍රධානත්වයෙන් මාසිකව පවත්වන ලදී .	සැප්තැම්බර් 30 දිනවන විට අයවිය යුතු දේශීය රාජ්‍ය වෙළඳ ණයගැති වටිනාකම රු.230,468,193ක් සහ විදේශීය වෙළඳ ණයගැති වටිනාකම රු. 361,367,994කි .
1.3	**නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**				
	2018 අංක 19 ජාතික විගණන පනතේ 16.2 වගන්තිය සහ 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ මෙහෙයුම් අත්පොතේ 6.6	2021/2022 2022/2023	ජාතික විගණන පනත හා රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ උපදෙස් පරිදි ගිණුම් වර්ෂය අවසන්වී අදාළ කාලය තුළ	2024/25 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන නියමිත දිනයේදී ඉදිරිපත් කිරීමට කටයුතු යොදා ඇත. මේ සඳහා වැඩ බලන සාමාන්‍යාධිකාරිතු	2023/24 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණනයට ලබා දී ඇත්තේ 2024 අගෝස්තු 02 දින වන අතර චක්‍රලේඛ

	වගන්තිය අනුව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ඇතුළත සමාගම විසින් මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවද, සමාගමේ මූල්‍ය ප්‍රකාශන විගණනය වෙත ඉදිරිපත් කර තිබුණේ මාස දෙකකට වැඩි ප්‍රමාදයකින් යුතුව 2024 අගෝස්තු 02 දින දීය.		සමාගම විසින් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු බව.	මාගේ ප්‍රධානත්වයෙන් ත්‍රෛමාසික මූල්‍ය අංශයේ නිලධාරීන් සමග ප්‍රගති සමාලෝචන රැස්වීමක් පැවැත්වෙන අතර එහිදී හඳුනාගනු ලබන දුෂ්කරතා බාධාවන් සඳහා පිළියම් යොදමින් ඉදිරියට කරගෙන යනු ලැබේ. එසේම මූල්‍ය අංශය සඳහා නව පරිගණක පාදක ගිණුම්කරණ පද්ධතියක්ද ස්ථාපනය වෙමින් පවතින අතර එය නියමිත පරිදි ස්ථාපනය වීමෙන් පසු මාසිකව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ හැකියාව ලැබේ.	ප්‍රකාරව නියමිත දිනට විගණනයට මූල්‍ය ප්‍රකාශන ලබාදී නොතිබුණි.
2	**මෙහෙයුම් සමාලෝචනය**				
2.1	**මෙහෙයුම් අකාර්යක්ෂමතා**				
	i. 2016 ජනවාරි 21 දිනැති අංක. අමප 16/0035/737/003 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව සහ 2005 මැයි 06 දිනැති අංක. 415 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ විධිවිධානවලට අනුව, සියලුම රාජ්‍ය ආයතන භාණ්ඩ	2021/2022 2022/2023	රාජ්‍ය ආයතන නැව් මගින් භාණ්ඩ ආනයනය කිරීමේදී නැව් සංස්ථාව හරහා ප්‍රවාහනය කරවා ගැනීමට අදාළ ක්‍රියාමාර්ග කළමනාකරණ ය විසින් ගත යුතු බව.	වාරය නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශයේ ලේකම්ගේ MPS/P&D/02/04/08/Vol-02 හා 2022 නොවැම්බර් 29 දිනැති සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් සහ සියළුම පළාත් පාලන ලේකම්වරුන්	පසුගිය වර්ෂවලට සාපේක්ෂව සැලකිය යුතු ප්‍රගතියක් අත්කරගෙන නොමැත.

ආනයනය කළ යුත්තේ සී/ස ලංකා නැව් සංස්ථාව හරහා වන අතර එහිදී සමාගම, රාජ්‍ය ආයතනවලට ප්‍රමුඛත්වය ලබා දිය යුතුවේ. 2019 අප්‍රේල් 01 සිට 2023 මාර්තු 31 දක්වා වර්ෂ 4 තුළ රාජ්‍ය අංශයේ භාණ්ඩ ආනයනය කිරීමේ ආයතන ගණන සහ අවස්ථා ගණන පරීක්ෂා කිරීමේදී, සී/ස ලංකා නැව් සංස්ථාව හරහා භාණ්ඩ ආනයනය කිරීමේ ආයතන ගණන සහ අවස්ථා ගණන සාපේක්ෂව අඩුවෙමින් පවතින බව නිරීක්ෂණය විය. විස්තර පහත පරිදි වේ.

වර්ෂය	2019/20	2020/21	2021/22	2022/23
ආයතන ගණන	28	22	23	27
ආනයන වාර ගණන	2,357	1,925	1,300	821

ඇමතූ ලිපිය සම්බන්දයෙන් නැව් සංස්ථාව ඉටු කරන ප්‍රයත්නයට දායක වන ලෙස ඉල්ලීමක්ද කර ඇත. ඒ අනුව 2023/24 මූල්‍ය වර්ෂයේ (2023 අප්‍රේල් 01 දින සිට 2024 මාර්තු 31 වන දින දක්වා) භෞතික කාර්යය සාධනය (Physical Performance) විසිසම ඒකක (Twenty-foot equivalent units) 1052ක් වන අතර භාණ්ඩ ආනයනය/අපනය නය කරන ලද වාර ගණන 1073ක් වේ.

2024 වර්ෂයේ අප්‍රේල් 01 වන දින සිට සැප්තැම්බර් 30 වන දින දක්වා භෞතික කාර්යය සාධනය ආසන්න වශයෙන් (Physical Performance) විසිසම ඒකක (Twenty-foot equivalent units) 573ක් වන අතර භාණ්ඩ ආනයනය/අපනය නය කරන ලද වාර ගණන 450 ක් වේ.

ii. අංක 415දරන 2021/2022 රාජ්‍ය ආයතන සමාගම විසින් නිකුත් කරනු ලබන නැව් ගාස්තු

රාජ්‍ය මුදල් 2022/2023 චක්‍රලේඛයේ විධිවිධානවලට අනුව සී/ස ලංකා නැව් සංස්ථාව විසින් අත්හැරීමේ නිවේදනයක් නිකුත් කළයුතු වන්නේ රජයට වඩාත් වාසිදායක ලෙස ආනයන භාණ්ඩ ප්‍රවාහනය කිරීමට සමාගම අපොහොසත් වන අවස්ථාවකදී පමණි. සමාගමට දැරීමට සිදුවන නැව් කුලිය, සැපයුම්කරු එකඟවන ලද නැව් කුලියට වඩා වැඩිවන අවස්ථාවලදී ඒ බව අත්හැරීමේ නිවේදනයක් මගින් ආනයනකරුට දැන්විය යුතු වුවත්, නැව්ගත කිරීමෙන් අනතුරුව අත්හැරීම් නිවේදන ඉල්ලා සිටීම, හදිසි මිලදී ගැනීම හේතුවෙන්, CIF මිල ගණන් මත ප්‍රසම්පාදනය පිරිනමා තිබීම හා වෙනත් හේතු මත සමාගම විසින් 2019/20 වර්ෂය තුළ 319ක් ද, 2020/21 වර්ෂයේදී 298ක් ද ,2021/22 වර්ෂයේදී 185 ක් ද, 2022/23 වර්ෂයේදී 118ක් ද, වශයෙන්	නැව් මගින් භාණ්ඩ ආනයනය කිරීමේදී නැව් සංස්ථාව හරහා ප්‍රවාහනය කරවා ගැනීමට අදාළ ක්‍රියාමාර්ග කළමනාකරණය විසින් ගත යුතු බව.	මුළු අත්හැරීමේ නිවේදන සංඛ්‍යාවෙන් ඉතා වැඩි ප්‍රමාණයක් මෙම කාණ්ඩය යටතේ නිකුත් කරනු ලබන අතර ඒ හා සම්බන්ධ ප්‍රධානම ආයතනයන් ලෙස සෞඛ්‍ය අංශයට සම්බන්ධ ආයතනයන් හඳුනාගෙනතිබේ. එම ආයතනයන්හි ඇති ව්‍යුහය මෙන්ම ආනයනය කරනු ලබන භාණ්ඩ ප්‍රමාණයේ විශාලත්වය හේතුවෙන් අනුගමනය කරනු ලබන විවිධ ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග මෙයට බලපා තිබේ. කෙසේ වෙතත්, නැව් ගත කිරීමට ප්‍රථමව සාමාන්‍ය පරිදි ප්‍රවාහනය සඳහා අදාළ ආයතන විසින් අපවෙත විමසීම් ලබා දෙන්නේ නම්, ඒවාට අදාළ ප්‍රවාහන කටයුතු නැව් සංස්ථාව මගින් ඉටු කිරීමේ හැකියාවක් තිබිය හැකි අතර විදේශ විනිමය ගලායැම්	සංශෝධනයක් සිදුකර අත්හැරීමේ නිවේදන අඩුකර ගැනීමට කටයුතු කර නොමැත.

චක්‍රලේඛයේ නියමයන්ට බැහැරව අත්හැරීම් නිවේදන නිකුත් කර තිබුණි.			ප්‍රමාණය අවම කර, විදේශ විනිමය ප්‍රමාණයක් රට තුල ඉතිරි කිරීමේ හැකියාවක්ද තිබිණි. එය කල හැකි වන්නේ අදාළ ප්‍රසම්පාදනයන් සිදුකරන ආයතන, ලංසු ලේඛන පිලියෙල කිරීම වැනි ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී මේ පිලිබඳ සැලකිල්ලක් දැක්වුව හොත් පමණි.	
iii. පූර්ණ රාජ්‍ය හිමිකාරිත්වය ඇති සමාගමක් ලෙස රාජ්‍ය අංශයේ ආනයන භාණ්ඩ ප්‍රවාහනය තුළින් සමාගමේ ලාභදායිත්වය වර්ධනය කරගැනීම මෙන්ම, විදේශිය නැව් සමාගම් මගින් සිදු කෙරෙන රාජ්‍ය ආනයන තරඟකාරී නැව් ගාස්තු ක්‍රමයක් මත සමාගම වෙත නතුකර ගැනීමේ වගකීම සමාගම වෙත පැවරී තිබුණද සමාගමේ ප්‍රවාහන ගාස්තුව, ආනයනයට සම්බන්ධ සැපයුම්කරුවන්ගේ නැව් ගාස්තුවලට වඩා වැඩිවීම හේතුවෙන්	2021/2022 2022/2023	නාවුක ක්ෂේත්‍රයේ පවතින දැඩි තරඟකාරී තත්ත්වය යටතේ භාණ්ඩ ප්‍රවාහනය සමාගම වෙත නතුකර ගැනීමේ විධිමත් මිල තීරණය කිරීමේ ක්‍රමවේදයක් අනුගමනය කළ යුතු බව.	නිත්‍ය නැව් සේවා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හා විවිධ රාජ්‍ය ආයතන වල සැපයුම් අංශයන්හි කාර්යය මණ්ඩල අතර 2023 දෙසැම්බර් හා 2024 ජනවාරි මාසයන්හි පැවති සාකච්ඡාවන්හිදී ද, රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ 415 ට අනුව කටයුතු කිරීමේ අවශ්‍යතාවය පෙන්වා දුන් අතර අත්හැරීමේ නිවේදන නිකුත් කිරීම අත්‍යාවශ්‍ය අවස්ථාවන්ට පමණක් ලසු කිරීම සම්බන්ධයෙන් ඔවුන්ගේ අවධානය	නැව් ගාස්තු සංශෝධනයක් සිදුකර අත්හැරීමේ නිවේදන අඩුකර ගැනීමට කටයුතු කර නොමැත.

	2019/2020 සිට 2022/23 වර්ෂය දක්වා වර්ෂ 4 තුළ පිළිවෙලින් මෙම අත්හැරීමේ නිවේදන 174ක්, 163ක්, 150ක් සහ 67ක් නිකුත් කර තිබුණි.			යොමු කරවන ලදී.	
iv.	විදේශ කටයුතු අමාත්‍යාශයට අදාළ රාජ්‍ය තාන්ත්‍රික නිලධාරීන්ගේ ආනයන සහ අපනයන ගමන් මළු බඩු බාහිරාදිය හැසිරවීම, ඇසුරුම් කිරීම, ප්‍රවාහනය හා නිෂ්කාශණය සී/ස ලංකා නැව් සංස්ථාව විසින් සිදු කරනු ලබන අතර සේවාව සපයන ආයතනය වන සී/ස ලංකා නැව් සංස්ථාව විසින් අදාළ මිල ගණන් පිළිබඳ තීරණය ගත යුතු වුවද, එය විදේශ කටයුතු අමාත්‍යංශයේ අධ්‍යක්ෂක ජනරාල්ගේ FA/OAM&D/HD/CSC/GEN හා 2023 ජනවාරි 25 දින දරන ලිපිය අනුව මිල ගණන් තීරණය කරනු ලබන බව හෙළිදරව් විය.	2021/2022 2022/2023	පිළිතුරේ දක්වා ඇති පරිදි විදේශ කටයුතු අමාත්‍යාංශය සමඟ සම්බන්ධ වී අදාළ ගාස්තු සංශෝධනය කර ගැනීමට කළමණාකාරීත්වය කටයුතු කළ යුතු බව.	අනපේක්ෂිත අයුරින් ආර්ථිකයේ සිදුවූ මෙම වෙනස්කමටසරිල න ආකාරයෙන් අපගේ සේවාවන් සඳහා වූ ගාස්තුන් ඉහල නංවන ලෙස 2022.05.31, 2022.07.05 හා 2022.10.20 වැනි දිනයන්හි ලිඛිතවද, ඊට අමතරව දෙපාර්ශවය අතර පැවති සාකච්ඡා මගින්ද ඉල්ලීම් කලද, විදේශ කටයුතු අමාත්‍යංශයේ පවත්නා ඇස්තමේන්තු, අයවැය හා වෙනත් ප්‍රයෝගික කාරණාවන්ට අමතරව ඒ වන විටත් රටෙහි පැවති මූල්‍ය අස්ථාවර බව හමුවේ, සමාගම විසින් ඉල්ලුම් කරන ලද මිල ගණන්	විදේශ කටයුතු අමාත්‍යංශයෙන් මිලගණන් සංශෝධනයට අදාල ඉල්ලීම් හෝ මිලගණන් සංශෝධනයට අදාල ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි

			මුළුමනින්ම ගෙවීමට නොහැකි බව ඔවුන් ප්‍රකාශ කල අතර ආසන්න වශයෙන් 25%ක පමණ ප්‍රමාණයකින් ගාස්තු ඉහල නැංවීමට අනුමැතිය ලබාදුන්නේ ඉදිරියේදී අපගේ ඉල්ලීම් සලකා බැලීමටද එකඟ වෙමිනි.	

2.2 ප්‍රසම්පාදන කළමනාකරණය

i. 2020 නොවැම්බර් 10 සී/ස ලංකා නැව් සංස්ථාව සහ TERO MARINE ASIA PACIFIC PTELTD සමඟ වසර 6 ක කාල සීමාවක් සඳහා සමාගමේ නෞකාවන් වෙනුවෙන් පරිගණක පාදක නැව් කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කිරිමට USD 102,800 කට ගිවිසුම් ගත වී තිබුණි. පළමු වර්ෂය තුළ අදියර 03 කින් මෙම පද්ධතිය ක්‍රියාත්මක කිරිමට සැලසුම් කර තිබූ අතර එහි අත්තිකාරම් මුදල් වෙනුවෙන් රු.2,903,208 ක්	2021/2022 2022/2023	සමාගමේ ඉදිරි මෙහෙයුම් කටයුතු සඳහා මෙම පරිගණක පද්ධතිය යොදා ගන්නේද නැද්ද යන්න පිළිබඳව කළමනාකරණය විසින් සමාලෝචනයක් සිදුකර විධිමත් තීරණයක් ගත යුතු බව.	අදාල පරිගණක පාදක මෙහෙයුම් පද්ධතිය දැනට ක්‍රියාත්මකව පවතින අතර ප්‍රසම්පාදන පද්ධතිය පමණක් ඉදිරියේදී මිලදී ගන්නේද නැද්ද යනවග සමාලෝචනය කිරිමට නියමිතය. ඩොලර් 15,400 ක මුදලක් අදාල ආයතනයට ඉදිරියේදී ගෙවීමට නියමිත අතර, ඒ සඳහා ක්‍රියාමාර්ග ගෙන යනු ලබයි.	පරිගණක පාදක නැව් කළමනාකරණ පද්ධතියේ ප්‍රසම්පාදන පද්ධතිය දැනට ක්‍රියාත්මක නොවේ.

(USD 15,400) සහ පද්ධති සැලසුම් පිළිගැනීම වෙනුවෙන් රු.1,563,087 ක් (USD 7,700) ක් ලෙස රු.4,466,295 ක් වැයකර නෞකා 02 සඳහා පද්ධතිය ස්ථාපිත කර වසර 3 ක කාලයක් ගත වී තිබුණද, මෙම පරිගණක පද්ධතිය ක්‍රියාත්මක නොකර පැවති අතර සමාගමේ ඉදිරි මෙහෙයුම් කටයුතු සඳහා යොදා ගන්නේද නැද්ද පිළිබඳව කළමනාකරණය විසින් සමාලෝචනයක් සිදු කර ප්‍රයෝජනයට ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් අදාල වියදම නිශ්කාර්ය වියදමක් බවට පත්ව තිබුණි.				
ii. පුත්තලම ලක්විජය බලාගාරයට ගල් අඟුරු ප්‍රවාහනය කරන නැව්වලට විවිධ සේවා සැපයීම සඳහා ලංසු කැඳවා තෝරාගත් බෝට්ටු සේවා 02ක් වෙනුවෙන් තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව අනුව ජාත්‍යන්තර	2022/2023	පුවත්පත් දැන්වීම්වලට අමතරව අදාළ ප්‍රදේශයේ ජනතාව දැනුවත් කිරීමට කටයුතු කර තවදුරටත් ලංසු ලබා ගැනීමටත් එම සේවාවේ පවතින අඩුපාඩු අවම කර	අවශ්‍ය කරන බෝට්ටු සේවය සපයා ගැනීම සඳහා අලුතින් ප්‍රසම්පාදන කටයුතු සිදුකෙරෙමින් පවතින අතර 2024 සැප්තැම්බර් 26 දින පුවත්පත් දැන්වීම් පළ කර ඇති අතර ඊට අමතරව ප්‍රාදේශීය ප්‍රජාව	අවශ්‍ය කරන බෝට්ටු සේවය සපයා ගැනීම සඳහා අලුතින් ප්‍රසම්පාදන කටයුතු පමණක් සිදුකෙරමින් පවතින අතර තවමත් පැරණි බෝට්ටු සේවාව

වර්ගීකරණ සංගම් සම්මේලනයේ සාමාජික සංගමයකින් ලබාගත් වලංගු මුහුදු ගමන් සඳහා යෝග්‍යතා සහතිකය (Seaworthiness Certificate) හෝ වර්ගීකරණ සංගම් සහතිකය ඉදිරිපත් නොකිරීම, තාක්ෂණික ඇගයීමේදී සැලකිය යුතු ලෙස ප්‍රතිචාර නොදැක්වීම යන කරුණු හේතුවෙන් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම නිර්දේශ කර නොතිබුණි. එසේම, ගොඩබිම බලයලත් නිලධාරී (Designated Person Ashore-DPA) විසින් බෝට්ටු පිළිබඳව සිදුකරන ලද භෞතික පරීක්ෂාවේදී මෙම ලංසුකරුවන් දෙදෙනා ලංසු කැඳවීමේ සඳහන් නිර්ණායකයන් සපුරා නොමැති බව තහවුරු වූ අතර 2014/15 වර්ෂයේ සිට මේ දක්වා මෙම බෝට්ටු සැපයුම්කරුවන් දෙදෙනා පමණක් ලංසු ඉදිරිපත් කරන	ගැනීමටත් විධිමත් ක්‍රියාමාර්ග කලමණාකාරීත්වය විසින් ගත යුතු බව.	දැනුවත් කිරීම සඳහා පුවත්පත් දැන්වීම්වලට අමතරව, කල්පිටිය ප්‍රාදේශීය සභාව, කල්පිටිය ධීවර අධ්‍යක්ෂක හා නොරොච්චෝලේ ජලජ සම්පත් දෙපාර්තමේන්තුව යන පාර්ශව දැනුවත් කිරීමට කටයුතු කර ඇත.	ක්‍රියාත්මකවේ.

තත්ත්වයක් පවතින බවත් මෙම සැපයුම්කරුවන් සම්බන්ධයෙන් පවතින සේවා විශ්වාසය මත පමණක් පදනම්ව සේවා අවශ්‍යතාවය සලකා ඉල්ලුම්කරුවන් දෙදෙනා ඉදිරිපත් කළ මිල ගණන්වලට 2022 සැප්තැම්බර් 21 දින මෙම ප්‍රසම්පාදනය පිරිනමා තිබුණි. 2023/24 වර්ෂයේද මෙම සේවාව සඳහා මෙම සැපයුම්කරුවන් දෙදෙනා වෙතම ප්‍රසම්පාදනය පිරිනමා තිබූ අතර බෝට්ටුවලට අදාළ ලංසු කැඳවීමේ නිර්ණායකයන් සපුරා නොමැති වීම හේතුවෙන් එහි ගමන් කරන නිලධාරින්ගේ ආරක්ෂාව පිළිබඳව ගැටළුවක් පවතින බවත්, එම අඩුපාඩු හේතුවෙන් යම් අනතුරකදී රක්ෂණ ප්‍රතිලාභ ලබාගැනීමේ අවදානමක් පවතින බවත් නිරීක්ෂණය විය.

3.160 අනුරාධපුර විශ්වවිද්‍යාල විද්‍යායතනය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	අතිරික්තය (ඌනතාවය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	223,894,642	9,602,428	214,292,214	54,545	තත්ත්වාගණනය නොකළ
2022	199,345,340	11,088,537	188,256,802	(26,243,336)	තත්ත්වාගණනය නොකළ
2023	196,724,147	11,343,360	185,380,787	(17,949,496)	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01	අනුරාධපුර විශ්වවිද්‍යාල විද්‍යායතනය පිහිටා ඇති අක්කර 02 රූඩ් 03 පර්චස් 17 ක වපසරිකින් යුත් භූමියේ අක්කර 01ක පමණ භූමියක් තුළ ඉදිකර ඇති ගොඩනැඟිලි තුල සිසුන් 600 ක පමණ ප්‍රමාණයක් වාර්ෂිකව අධ්‍යාපනය හදාරනු ලැබේ. ඉඩමේ හිමිකාරීත්වය ලබාගැනීමට කටයුතු කර ඉතිරි අක්කර 01 කට වැඩි භූමිය විද්‍යායතනයේ සංවර්ධන කටයුතු සඳහා යොදා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම අපොහොසත් වී තිබුණි.	2022	භූමියේ හිමිකාරීත්වය ලබා ගැනීමට කටයුතු කල යුතු අතර මුළු භූමියම සිසුන්ගේ අධ්‍යාපන කටයුතු වෙනුවෙන් සංවර්ධනය කිරීම සිදු කළ යුතුය.	අදාළ ඉඩම විද්‍යායතනය වෙත පවරා දෙන ලෙස මේ වන විටත් වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය හා රේඛීය අමාත්‍යාංශය වෙත දැනුම් දී ඇති බව.	ඉඩමේ හිමිකාරීත්වය ලබාගැනීමට නොහැකි වීම නිසා සිසුන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා යොදා ගැනීමට නොහැකි වී ඇත.

3.161 යාපනය විශ්වවිද්‍යාල විද්‍යායතනය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	අතිරික්තය (ඌනතාවය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	266,953,701.97	10,140,612.97	256,813,089.00	(3,578,609.90)	තත්ත්වාගණනය කළ
2022	504,749,669.86	11,722,513.30	493,027,156.56	216,483.32	තත්ත්වාගණනය කළ
2023	527,440,944.61	12,252,033.86	515,188,910.75	(38,245,345.38)	තත්ත්වාගණනය නොකළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01	පසුගිය වසර 3 ක කාලය තුළ විද්‍යාලයේ ඉගෙනුම ලැබූ සිසුන් 678 දෙනෙකුගෙන් සිසුන් 125 දෙනෙකු අදාළ පාඨමාලා සම්පූර්ණ නොකර අධ්‍යාපනය හැර ගොස් තිබුණි.	2023	සිසුන් පාඨමාලා හැරයාමේ ප්‍රතිශතය අවම කිරීමට කටයුතු කළ යුතුය.	COVID-19, ශ්‍රී ලංකාවේ ආර්ථික අර්බුදය සහ අනෙකුත් අවස්ථා හේතුවෙන් විශ්වවිද්‍යාල විද්‍යාතනයේ අධ්‍යාපනය හැර යාම ගැටලුවක් වී ඇති බව.	2022 වසරේ අවසන් කණ්ඩායමේ ඉගෙනුම ලැබූ සිසුන් 264 දෙනෙකුගෙන් ඉවත් වූයේ සිසුන් 17 දෙනෙකු පමණි.

3.162 ශ්‍රී ලංකා විදේශ සේවානියුක්ති කාර්යාංශය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	අතිරික්තය (ඌනතාවය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	17,556,649,045	6,014,150,907	11,542,498,138	632,791,840	තත්ත්වාගණනය කළ
2022	27,030,548,313	9,393,173,006	17,637,375,307	7,790,334,318	තත්ත්වාගණනය කළ
2023	27,904,084,795	9,006,870,655	18,897,214,140	7,783,933,513	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01	2008 දෙසැම්බර් 31 දිනැති අංක 30/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා 2021 ඔක්තෝබර් 14 හා 2022 පෙබරවාරි 10 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු ලිපි චක්‍රලේඛයට පටහැනිව 2002 වර්ෂයේ ගනු ලැබූ අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මත දීමනා ඇතුළත් දළ වැටුප මෙන් 12 ගුණයක් ආපදා ණය ලෙස ගෙවීමට කාර්යාංශය විසින් කටයුතු කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී නිලධාරීන් 525 දෙනෙකු වෙත සීමාව ඉක්මවා එකතුව රු.67,673,231ක් ආපදා ණය ලෙස	2021 2022	රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව මඟින් චක්‍රලේඛයෙහි සඳහන් සීමාව ඉක්මවා ණය ලබාදීම සිදු කළ නොහැකි බව කාර්යාංශය දැනුවත් කර ඇති බැවින් ඊට අනුකූලව කටයුතු කළ යුතුය.	පනතේ 16(2) ඉ හා ඊ උපවගන්ති ප්‍රකාරව ලැබී ඇති බලතල අනුව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත කාර්ය මණ්ඩලය වෙත 1995.05.01 දින සිට ආපදා ණය මුදල ලබාදීම සිදු කරනු ලබන අතර 2008.12.31 වන දින නිකුත්කර ඇති 30/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවලට අදාළ කර ගත හැකිද යන්න පිළිබඳ පැහැදිලි කිරීමක් ලබා දෙන ලෙස රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත	චක්‍රලේඛය රාජ්‍ය සංස්ථා වලට අදාළ කර ගත හැකිද යන්න රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත ලිපියක් යොමු කර ඇති අතර කාර්යාංශය විසින් ආපදා ණය එලෙසම ගෙවීම් සිදුකරනු ලබයි.

	ගෙවා තිබුණි. තවද ක්ෂණික ණය ලෙස නිලධාරියකුගේ මාසයකට සමාන වැටුපක් සියයට 4.2 පොළී අනුපාතයක් යටතේ නිලධාරීන් 107 දෙනෙකු සඳහා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතුව රු.3,826,900ක් ගෙවීම් කර තිබුණි.			ලිපියක් යොමු කර ඇති බව.	
02	අබුඩාබි තානාපති කාර්යාලයේ කම්කරු සුබසාධන අංශයේ කාර්‍යමණ්ඩල සාමාජිකයෙකු විසින් සිදුකරන ලද රු.1,149,258ක මුදල් අක්‍රමිකතාව සහ කාර්යාංශයේ කළමනාකරුවෙකු විසින් සිදු කරන ලද රු.3,638,368ක මුදල් අවභාවිතය සිදු කර සමාලෝචිත වර්ෂය අවසන් වන විට වසර 9 ක් ගත වී ඇතත් එය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	2021 2022	මුදල් අක්‍රමිකතා සම්බන්ධයෙන් මූලික පරීක්ෂණ හා විධිමත් විනය පරීක්ෂණ සිදු කිරීම ඉතා දුර්වල මට්ටමක පවතින බැවින් විනය පරීක්ෂණ කටයුතු කඩිනම් කළ යුතුය.	අබුඩාබි තානාපති කාර්යාලයේ නිලධාරියාට විරුද්ධව අධි චෝදනා පත්‍ර සකස් කර එම ගොනුව කොළඹ මහේස්ත්‍රාත් අධිකරණය වෙත යොමු කර ඇත. කාර්යාංශයේ කළමනාකරුවා සම්බන්ධයෙන් පැවැත්වූ විධිමත් විනය පරීක්ෂණයෙන් පසු කාර්යාංශ සේවයෙන් පහ කර ඇත. අයවීමට ඇති රු.3,638,368 ක මුදල අයකර ගැනීම සඳහා නීතිමය පියවර ගැනීමට නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති අතර, ඒ සම්බන්ධයෙන් අදාළ නීතිමය	අදාළ නීතිමය පියවර ගනිමින් සිටිනු ලබයි.

				පියවර ගනිමින් සිටින බව.	
03	හෝමාගම හා කහගොල්ලෙහි ඉඩම් බදු පදනම මත ලබා ගැනීම සඳහා අත්තිකාරම් ලෙස රු.46,000,000 ක් හා වෙනත් වියදම් සඳහා රු.1,719,680 ක් වශයෙන් එකතුව රු.47,719,684 ක් වැය කර තිබුණද අදාළ ඉඩම් නිෂ්කාර්යව පැවතීම හේතුවෙන් වෙනත් ආයතන විසින් එම ඉඩම් නැවත අත්පත් කර ගැනීමට කටයුතු කරමින් පැවතියද කාර්යාංශය විසින් ගෙවන ලද අත්තිකාරම් මුදල නැවත අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	2021 2022	ඉඩම් කාර්යාංශය වෙත පවරා ගැනීමට හෝ ගෙවන ලද අත්තිකාරම් මුදල නැවත ලබා ගැනීමට කටයුතු කළ යුතුය.	කහගොල්ල ඉඩම සඳහා ගෙවන ලද අත්තිකාරම් මුදල ඉඩම පවරා දීමට ප්‍රථම ප්‍රතිපූර්ණය කර ලබාදෙන ලෙස හා හෝමාගම ඉඩමෙහි කොටසක් ලංකා විදුලිබල මණ්ඩලය වෙත ලබා දීමට නාගරික සංවර්ධන අධිකාරිය කටයුතු කරමින් පවතින අතර ඒ වෙනුවට වෙනත් ඉඩමක් කාර්යාංශය වෙත ලබා දීමට කටයුතු කරමින් පවතී.	කහගොල්ල ඉඩම සඳහා ගෙවන ලද අත්තිකාරම් මුදල ආපසු ලබා ගැනීමට කටයුතු කර නොමැති අතර හෝමාගම ඉඩමෙහි ප්‍රයෝජනයට නොගෙන කවදුරටත් පවතී.
04	රැකියා බලපත්‍ර ක්‍රමය (Employment Permit System) යටතේ දකුණු කොරියාව වෙත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් යැවීමට අදාළව එරට රජය මැදිහත්ව අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුමෙහි කාලය 2019 සැප්තැම්බර් 29 දිනෙන් අවසන්වී තිබුණු අතර එම ගිවිසුමට අනුව සාධාරණ හේතුවකින් තොරව යාවත්කාලීන	2021 2022	රාජ්‍යයන් දෙකක් අතර ක්‍රියාත්මක මෙම රැකියා වැඩසටහනට අදාළ ගිවිසුම යාවත්කාලීන කිරිම ප්‍රමාදවීමට හේතු පරික්ෂා කර කඩිනමින් එම කටයුත්ත නිම කිරිමට අවශ්‍ය කටයුතු කළ යුතුය.	අමාත්‍ය මණ්ඩලයේ නිර්දේශය අනුව යාවත්කාලීන කරන ලද අවබෝධතා ගිවිසුම කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය විසින් නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති අතර නීතිපතිතුමාගේ නිර්දේශ මේ වන විට ලැබී ඇති	කොරියානු රජයේ එකඟතාවය ලබා ගැනිම සඳහා සංශෝධිත ගිවිසුම විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය විසින් යොමු කර තිබුණි..

	කිරීම ගිවිසුම් කාලය අවලංගු වී මාස 06 ක් ඉක්ම යන විටත් ප්‍රමාද වුවහොත් එම ගිවිසුම අවලංගු කිරීමේ හෝ අත්හිටුවීමේ හැකියාව පවතී. එසේ වුවද 2023 ජූනි 27 වන විටත් ගිවිසුම යාවත්කාලීන කර නොතිබුණි. මෙම ගිවිසුම යටතේ පසුගිය වර්ෂ 06 තුළ ශ්‍රමිකයින් 20,667 දෙනෙකු රැකියා සඳහා යොමු කිරීමේ කටයුතු කාර්යාංශය විසින් සිදුකර තිබුණි.			බැවින් අදාළ නිර්දේශද එකී ගිවිසුමට ඇතුළත් කරමින් කොරියානු පාර්ශවයේ එකඟතාවය ලබා ගැනිම සඳහා සංශෝධිත ගිවිසුම විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය විසින් යොමු කර ඇති බව.	
05	2023 ජනවාරි 18 දින පැවති පොදු ව්‍යාපාර කාරක සභා රැස්වීමේදීද විදේශ දූත මණ්ඩල සඳහා නිලධාරින් තෝරා ගැනීමේ ක්‍රමවේදය පිළිබඳව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ උපදෙස් අනුව විධිමත් ක්‍රියාපටිපාටියක් සකස් කරන ලෙස නිර්දේශ ලබාදී තිබුණද 2023 ජනවාරි 17 දින අනුමත කර තිබූ ක්‍රියාපටිපාටිය අඩුපාඩු පවතින බව සඳහන් කර කාර්යාංශය විසින් ප්‍රතික්ෂේප කර තිබුණි. චක්‍රලේඛ විධිවිධාන වලට පටහැනිව 2023 වර්ෂයේදි දූත මණ්ඩල සේවය සඳහා පෙර දූත	2021 2022 2023	අනුමත කරන ලද විදේශ දූත මණ්ඩල සඳහා නිලධාරින් බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටියේ පවත්නා අඩුපාඩු නිවැරදි කරවාගෙන නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කළ යුතුය.	විදේශ දූත මණ්ඩල සඳහා අවශ්‍ය කාර්යය මණ්ඩලය බඳවා ගැනීම පිණිස වන බඳවා ගැනීම් පටිපාටිය, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර කාර්යාංශය වෙත ලබා දී ඇති අතර සේවක විරෝධතාවයක් මතු වීම හේතුවෙන් එම ගැටළුව විසඳා ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත කිහිප අවස්ථාවක දී රේඛීය අමාත්‍යාංශා හරහා ලිපියොමු	විදේශ දූත මණ්ඩල සඳහා නිලධාරින් තෝරා ගැනීමේ ක්‍රමවේදය පිළිබඳව විධිමත් ක්‍රියාපටිපාටියක් සකස් කර ගැනීමට කටයුතු කරමින් පවතී.

	මණ්ඩල සේවයේ නිරතව සිටි කාර්යාංශයේ නිලධාරීන් 07 දෙනෙකු බඳවාගෙන තිබූ අතර, ඉන් දෙදෙනෙකු 3 වන හා 4 වන වතාවට දූත මණ්ඩල සේවය අවසන් කර පැමිණි නිලධාරීන් විය. තවද දූත මණ්ඩල සේවය අවසන් කර වසර 3 ක් කාර්යාංශයේ සේවය සම්පූර්ණ නොකරන ලද නිලධාරියෙකුද බඳවාගෙන තිබුණි.			කර ඇති බව.	
06	විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් ලැබිය යුතු රු.869,955,802ක ලැබිය යුතු ශේෂයට අදාළ ශේෂ තහවුරු ලිපිය	2022 2023	විධිමත්ව ශේෂ තහවුරු කිරීම් විගණනය වෙත ලබා දීමට කටයුතු කළ යුතුය.	මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු මුදල සම්බන්ධයෙන් 2024.04.08 දින රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් විසින් යොමු කළ ලිපියට අනුව කටයුතු කිරිම සඳහා 2024.05.09 දින සාමාන්‍යාධිකාරිතු මාගේ අත්සනින් විදේශ රැකියා අමාත්‍යාංශය හරහා විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත ලිපියක් යොමු කර ඇති බව.	විදේශ රැකියා අමාත්‍යාංශය හරහා විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත ලිපියක් යොමු කර ඇතත් එම තහවුරු කිරීම් මෙතෙක් ලැබී නොතිබුණි.
07	2016 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා මියගිය විගමණික	2021 2022	මරණ වන්දි ලිපිගොනු විධිමත්ව පවත්වා ගෙනයා		නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතී.

	ශ්‍රමිකයින් 157 දෙනෙකු වෙත මරණ වන්දි වෙනුවෙන් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන් ලැබී තිබූ රු.47,995,092ක් ඔවුන් වෙත ගෙවීම් නොකර සුබසාධක අරමුදලේ ගෙවිය යුතු ලෙස දක්වා තිබුණි. තවද, ගිණුම් අංශය හා සුභසාධන අංශය අතර සම්බන්ධීකරණයක් නොතිබීම හේතුවෙන් 2018 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාල පරිච්ඡේදයට අදාළව ගිණුම් අංශය වෙත ලැබී තිබුණු හිමිකම් ඉල්ලීම් 81ක් වෙනුවෙන් රු.22,539,765කට අදාළව තොරතුරු සුභසාධන අංශයේ නොතිබුණු අතර සුභසාධන අංශය වෙත ලැබී තිබුණු මරණ වන්දි 9ක් වෙනුවෙන් රු.4,282,435කට අදාළ තොරතුරු ගිණුම් අංශයේ නොතිබුණි.		යුතු අතර අවශ්‍ය ලිපිලේඛන පිළිබඳව වන්දි ඉල්ලුම්කරුවන් නිසි පරිදි දැනුවත් කළ යුතුය. රක්ෂණ වන්දි ලැබුණු වහාම එම වන්දි මුදල් ගෙවා නිම කිරීමට විධිමත් වැඩපිළිවෙලක් සකස් කළ යුතුය.		
08	දකුණු කොරියාවේ ධීවර අංශයේ රැකියාවක නියුතුව සිටි ශ්‍රමිකයෙකු 2019 ඔක්තෝබර් 08 දින අනතුරකට පත්වීම හේතුවෙන් ඔහු මෙරටට ගෙන්වා ගැනීම සඳහා සහෝදරයා විසින්	2022 2023	ශ්‍රමිකයාගේ එරට බැංකු ගිණුම්හි තැන්පත් මුදල් භාවිතා කර තිබේද යන්න හා කම්කරු සුභසාධන අංශයේ නිලධාරියෙකුගේ පුද්ගලික ණය කාඩ්පත භාවිතා කර ගුවන්	කොරියානු තානාපති කාර්යාලය මඟින් යොමු කරන ලද ගිණුම් ලේඛනවලට අනුකූලව ශ්‍රමිකයා වෙනුවෙන් ඔහුගේ ඥාතීන් විසින් කාර්යාංශයේ	කාර්යාංශයේ තැන්පත් කර තිබූ මුදලින් රු.98,786 ක් පමණක් ගෙවා තිබුණි.

	රු.1,564,546ක් කාර්යාංශයේ තැන්පත් කර තිබියදී, මොහු ශ්‍රී ලංකාවට නැවත එවීමට හා රෝහල් බිල පියවීම සඳහා කම්කරු සුභසාධන අංශයේ නිලධාරියෙකු විසින් ඔහුගේ එරට බැංකු ගිණුම්හි තැන්පත් මුදල් භාවිතා කර තිබුණි. තවද, කම්කරු සුභසාධන අංශයේ නිලධාරියෙකුගේ ණය කාඩ්පත භාවිතා කර ගුවන් ටිකට්පත මිලදී ගෙන තිබුණි. එම දරන ලද වියදම පිළිබඳව පරීක්ෂා කිරීමකින් තොරව සහෝදරයා විසින් තැන්පත් කර තිබූ මුදලින් ඉතිරිව තිබූ රු.98,786ක් පමණක් 2023 අගෝස්තු මාසයේදී ඔහු වෙත ගෙවා තිබුණි.		ටිකට්පත මිලදී ගැනීම පිළිබඳව පරීක්ෂණයක් මඟින් තහවුරු කළ යුතුය.	තැන්පත් කර තිබූ මුදලින් නැවත ඔහු වෙත ගෙවිය යුතු මුදල රු.98,786 ක් ලෙස තහවුරු කර ගැනීමෙන් අනතුරුව මෙම ගෙවීම සිදු කර ඇති බව.	
09	2013 ජනවාරි 24 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ පරිදි ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය සමඟ ඒකාබද්ධව රටවිරුවෝ නිවාස ණය වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සඳහා වසර 05 කට අවබෝධතා ගිවිසුමක් අත්සන් කර කාර්යාංශය විසින් 2013 මාර්තු 08 දින	2022 2023	අවබෝධතා ගිවිසුම අනුව මෙම මුදල් ව්‍යාපෘතිය සඳහා යොදවා තිබේද යන්න තහවුරු කර ගත යුතු අතර, අදාළ තැන්පත් මුදල නැවත ලබා ගැනීමට කටයුතු කළ යුතුය.	සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තු වෙන් මෙම මුදල අයකර ගැනීම සඳහා කැබිනට් පත්‍රිකාවක් සකස් කර කැබිනට් මණ්ඩලය වෙත යොමු කර ඇති බව.	මෙම මුදල අයකර ගැනීම සඳහා කැබිනට් පත්‍රිකාවක් යොමු කර තිබුණි.

රු.100,000,000 ක මුදලක් සමෘද්ධි අධිකාරිය නමින් ස්ථාවර තැන්පතුවක තැන්පත් කර තිබුණි. අවබෝධතා ගිවිසුමේ කාලය 2018 මාර්තු 07 දිනෙන් අවසන් වී ඇතත්, එම මුදල් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.163 ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	අතිරික්තය (ඌනතාවය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	1,371,207,666	66,623,913	1,304,583,753	181,807,729	තත්ත්වාගණනය කළ
2022	1,635,084,577	101,150,311	1,533,934,266	105,543,329	තත්ත්වාගණනය කළ
2023	2,511,044,875	398,052,811	2,112,992,064	88,078,983	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	2007-2009 වර්ෂවල විදුලි වාහන ආකෘති 3 ක් නිෂ්පාදනය සඳහා අධිකාරිය විසින් පුද්ගලික සමාගමක් වෙත රු.මිලියන 7.8 ක මුදලක් ලබා දී තිබුණි. 2012 දෙසැම්බර් 07 දින පැවති පොදු ව්‍යාපාර කාරක සභාවේ නියෝගය ප්‍රකාරව 2013 ජනවාරි 4 දින විගණකාධිපතිගේ ප්‍රධානත්වයෙන් රැස් වී තිබුණු කමිටුවේදී මෙම කාර්යයට සම්බන්ධ නිලධාරීන්ට විරුද්ධව විනය ක්‍රියාමාර්ග ගැනීමටත්, මේ සම්බන්ධ සත්‍ය තත්ත්වය ප්‍රධාන ගණන්දීමේ නිලධාරි මඟින් පොදු ව්‍යාපාර කාරක සභාව වෙත දැනුම් දීමටත් තීරණය	2021 2022 2023	කමිටු නියෝග ප්‍රකාරව කටයුතු කළ යුතු අතර රජයට පාඩු නොවන පරිදි අදාල කටයුතු ඉටු කරවා ගත යුතුය.	එක් වාහන ආකෘතියක් ලබාගෙන මෙම ගැටළුව විසඳාගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2022.11.21 දින තීරණය කර තිබුණු අතර මේ සම්බන්ධව අභ්‍යන්තර විමර්ශනයක් සිදු කර වගකිව යුතු නිලධාරීන්ට අවශ්‍ය ක්‍රියාමාර්ග ගතයුතු බවට 2024.07.02 අමාත්‍යාංශ විගණන හා කළමනාකරණ කමිටුවේදී තීරණය කළ බව	එකඟ වූ පරිදි එක් වාහන ආකෘතිය හෝ ලබාගෙන නැත.වගකිව යුතු නිළධාරීන්ට විරුද්ධව කිසිදු විනය ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

	කර තිබුණි. කෙසේ නමුත්, මීට සම්බන්ධ නිලධාරීන්ට විරුද්ධව කිසිදු විනය ක්‍රියාමාර්ගයක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ගෙන නොතිබුණි. තවද අධිකාරිය විසින් අදාල පෞද්ගලික සමාගමට විරුද්ධව අධිකරණ ක්‍රියාමාර්ග ගැනීම වෙනුවට කල් ඉකුත් වී තිබූ ගිවිසුමේ 19 කොන්දේසිය ප්‍රකාරව බේරුම්කරණ ක්‍රියාවලියකට පිවිස තිබුණි. එහිදී විදුලි වාහන ආකෘති 3 වෙනුවට එක් ආකෘතියක් පමණක් ලබාගැනීමට තීරණය කර බේරුම්කරණ ක්‍රියාවලිය අවසන් කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විට එක් විදුලි වාහන ආකෘතියක් හෝ අධිකාරිය වෙත ලබාගෙන නොතිබුණි.				
2	පනතේ 19 (1) වගන්තිය ප්‍රකාරව නිකුත් කරන ලද බලපත්‍රය ක්‍රියාත්මකව පවතින්නේ කවර කාලයක් තුලදීද එම කාලය තුලදී ව්‍යාපෘතිය සඳහා භාවිතා කරනු ලබන පුනර්ජනනීය බලශක්ති සම්පත් වෙනුවෙන් මුදල්	2021 2023	පනතේ විධි විධාන ප්‍රකාරව රාජ්‍ය භාගය අයකිරීම සඳහා වන ක්‍රියාමාර්ග කඩිනමින් ඉටු කළ යුතුය.	2007 වර්ෂයේ සිට පත් වූ සෑම අමාත්‍යවරයකු සමගම මෙම රාජ්‍ය භාගය අයකර ගැනීම පිළිබඳව අධිකාරිය සාකච්ජා කොට ඇත. අවස්ථා ගණනාවකදී මෙම අයකිරීම් සඳහා	පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති වලින් රාජ්‍ය භාගය අය කිරීමට කටයුතු කර නොතිබුණි.

	විෂයභාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන යම් ගාස්තුවක් රාජ්‍ය භාගය ලෙස වාර්ෂිකව අධිකාරියට ගෙවීමට සංවර්ධනකරුවන් බැඳී සිටිය යුතුය. නමුත් ඊට අදාල රාජ්‍ය භාගය අයකිරීමට අදාල ක්‍රමවේදය මේ දක්වා තීරණය කර නොතිබීම හේතුවෙන් අදාල රාජ්‍ය භාගය අයකිරීමට අධිකාරියට නොහැකි වී තිබුණි.			අවශ්‍ය මුදල් අමාත්‍යවරයාගේ එකඟතාව ලබාගැනීමටද අධිකාරිය උත්සාහ දරා ඇත.අවශ්‍ය කැබිනට් අනුමැතිය ලබාගැනීමට කැබිනට් පත්‍රිකාද පිළියෙළ කොට අමාත්‍යාංශය වෙත යොමු කොට ඇත.	
3	පනතේ 45(1) වගන්තිය ප්‍රකාරව මුදල් විෂයභාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පල කරනු ලබන නියමයක් මඟින් කලින් කල තීරණය කරනු ලැබිය හැකි අනුප්‍රමාණ අනුව ගණන් බලනු ලබන සෙස් බද්දක් ආනයනය කරනු ලබන සියළුම පාශානිභූත ඉන්ධන නිෂ්පාදන මත පැනවීම, අයකිරීම සහ ගෙවීම කරනු ලැබිය යුතු වුවද ඒ සඳහා ක්‍රමවේද සකස් නොකිරීම හේතුවෙන් අදාල ගාස්තු අයකිරීමට නොහැකි වී තිබුණි.	2021 2023	පනතේ විධි විධාන ප්‍රකාරව සෙස් බද්ධ අයකිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ඉටු කළ යුතුය.	2007 වර්ෂයේ සිට පත් වූ සෑම අමාත්‍යවරයකු සමගම මෙම රාජ්‍ය භාගය අයකර ගැනීම පිළිබඳව අධිකාරිය සාකච්ජා කොට ඇත. අවස්ථා ගණනාවකදී මෙම අයකිරීම් සඳහා අවශ්‍ය මුදල් අමාත්‍යවරයාගේ එකඟතාව ලබාගැනීමටද අධිකාරිය උත්සාහ දරා ඇත.අවශ්‍ය කැබිනට් අනුමැතිය ලබාගැනීමට කැබිනට් පත්‍රිකාද පිළියෙළ කොට අමාත්‍යාංශය වෙත යොමු කොට ඇත.	පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව පාශානභූත ඉන්ධන නිෂ්පාදන ආනයනය මත සෙස් බදු අයකර නොතිබුණි.

	ලංකා විදුලි බල මණ්ඩලයේ මධ්‍යම ජාලයේ පවතින ධාරිතාවය (Available Grid Capacity) ප්‍රමාණවත් නොවීමේ ගැටළුවට විසඳුම් ලෙස අධිකාරිය පනතේ 5 (ඇ) වගන්තිය ප්‍රකාරව මධ්‍යම ජාලයෙන් බැහැර වූ (off grid) පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති දිරිමත් කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සිදුකල යුතු වුවත් අධිකාරිය විසින් ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. මේ හේතුවෙන් පනතේ 25 (අ) වගන්තිය ප්‍රකාරව 2024 ජූලි වන විටත් මධ්‍යම ජාලයෙන් බැහැර කිසිදු පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘතියක් සඳහා බලශක්ති බලපත්‍ර නිකුත් කර නොතිබුණි.	2021 2023	පනතේ විධි විධාන ප්‍රකාරව මධ්‍යම ජාලයෙන් බැහැර පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති දිරිමත් සහ ප්‍රවර්ධනය කළ යුතුය.	2021 වන විට ජාතික විදුලිබල පද්ධතියට දිගු කළ ප්‍රතිශතය සියයට 98 දක්වා වර්ධනය වී ඇති බැවින් ජාතික පද්ධතියෙන් බැහැරව විදුලිය ලබාදිය නොහැකි සියයට 2 ප්‍රතිශතයක් සඳහා විදුලිය ලබාදීමට අවශ්‍ය පියවර භූමිය පිහිටීම හා තත්ත්වය අනුව ගැනීමට බලශක්ති අධිකාරිය පියවර ගෙන ඇත.	මධ්‍යම ජාලයෙන් බැහැර ව්‍යාපෘති සඳහා මෙතෙක් බලශක්ති බලපත්‍ර නිකුත් කර නොතිබුණි.
4	2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනතේ 67 වගන්තිය ප්‍රකාරව විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා විසින් සාදනු ලැබ තිබුණු 2011 මැයි 10 දිනැති අංක 1705/22 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශිත නියෝග අනුව මෙගාවොට් 700 ක ව්‍යාපෘතියක් සඳහා රු මිලියන 35 ක	2021	අනුමත නියෝග ප්‍රකාරව ගාස්තු අයකල යුතුය	එවකට සිටි රාජ්‍ය අමාත්‍යවරයාගේ අත්සනින් 2022.03.22 දිනැති ලිපියෙන් ඉතිරි මුදල් පසුව අයකිරීමේ පදනමින් මෙලෙස තාවකාලික අනුමැතිය ලබා දී ඇත.	විෂයභාර අමාත්‍යවරයාගේ ගැසට් නියෝගය ප්‍රකාරව නියමිත පරිදි ලියාපදිංචි ගාස්තු අයකර නොතිබුණි.

	ලියාපදිංචි ගාස්තුවක් අයකල යුතු වුවත් ඊට පටහැනිව රු. මිලියන 5 ක ගාස්තුවක් අයකරමින් ඉතිරි මුදල් පසුව අයකිරීමේ පදනමින් තාවකාලික අනුමැතිය ලබා දී තිබුණි.				
5	අධිකාරිය විසින් ප්‍රධාන කාර්යාලය සඳහා බලශක්ති කාර්යක්ෂමතාවය සහිත ගොඩනැගිල්ලක් ඉදිකිරීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 4.3 ප්‍රකාරව මුළු පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කර ඒ සඳහා වන අධිකාරී බලය සහිත ප්‍රසම්පාදන කමිටුවක අනුමැතිය ලබාගෙන නොතිබුණි. ගොඩනැගිල්ලේ නිර්මාණ සැලසුම් වෙනුවෙන් 2020 වර්ෂය දක්වා රු.මිලියන 23.3 ක් වැයකර තිබුණි.තවද මෙම ගොඩනැගිල්ලේ ඉදිකිරීම් සඳහා 2023 ජනවාරි දක්වා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී නොතිබුණු අතර ඒ හේතුවෙන් ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට නොහැකි වී තිබුණි. ඒ අනුව උක්ත වියදම අනාර්ථික වියදමක් බවට පත් වී තිබුණි. මේ	2021 2022	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව විධිමත් අනුමැතියක් රහිතව ප්‍රසම්පාදන කටයුතු ආරම්භ නොකල යුතු අතර අනාර්ථික වියදම් දැරීම සම්බන්ධයෙන් වගකිව යුත්තන් හඳුනාගත යුතුය.බඳු ගිවිසුමේ කොන්දේසි අධිකාරියට අවාසි නොවන අයුරින් සංශෝධනය කිරීමට කටයුතු කළ යුතුය	කොවිඩ් වසංගතය සහ ආර්ථික අර්බුදය හේතුවෙන් අමාත්‍යාංශ ලේකම්ගේ උපදෙස් මත ව්‍යාපෘතිය කල්දමා ඇත.බදු කොන්දේසි සංශෝධනයට අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කිරීමට පියවර ගෙන ඇත.	අවිධිමත් ලෙස ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීම හා අනාර්ථික වියදම් දැරීම සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු අතර නාගරික සංවර්ධන අධිකාරිය සමග පවතින බදු ගිවිසුම අවශ්‍ය පරිදි සංශෝධනය කරගෙන නොතිබුණි.

	සඳහා රු මිලියන 41 ක් වැයකර 2015 වර්ෂයේදී නාගරික සංවර්ධන අධිකාරියෙන් 30 අවුරුදු බදු පදනමට බත්තරමුල්ල ප්‍රදේශයෙන් ඉඩමක් ලබාගෙන තිබුණි.අදාල බදු ගිවිසුමේ කොන්දේසි අංක 1.8 ප්‍රකාරව ගිවිසුම්ගත දිනයේ සිට මාස 3 ක් ඇතුලත ඉදිකිරීම් ආරම්භකර වර්ෂ 2 ක් තුල ඉදිකිරීම් අවසන් කිරීමට අපොහොසත් වීම හේතුවෙන් බදු දේපලේ සන්තකය නැවත නාගරික සංවර්ධන අධිකාරිය වෙත පැවරෙනු ඇති බවට නිරීක්ෂණය විය.				
6	2021-2025 සංයුක්ත සැලැස්මට අනුව විදුලි වාහන බැටරි ආරෝපණ මධ්‍යස්ථාන 90 ක් සංවර්ධනය කල යුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසාන වන විට කිසිදු මධ්‍යස්ථානයක් ඉදිකර නොතිබුණි. තවද සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ ඇතුලත් පුනර්ජනනනීය බලශක්ති ව්‍යාපෘති සංවර්ධනයට අදාළ කාර්යයන් 3 ක කිසිදු කටයුත්තක් සිදුකර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේ	2023	සංයුක්ත සැලැස්මට අනුව සැලසුම් කල කාර්යයන් කඩිනමින් ඉටු කල යුතුය.	ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වේ.	විදුලි වාහන බැටරි ආරෝපණ මධ්‍යස්ථාන සම්බන්ධ මාර්ගෝපදේශය ක් සකස් කිරීමට අවශ්‍ය මූලික කටයුතු ආරම්භකර තිබුණි.වෙනත් කිසිදු කටයුත්තක් සිදුකර නැත.

	වෙනත් ව්‍යාපෘති කාර්යයන් 24 ක ප්‍රගතිය සියයට 10 සිට සියයට 54 ක වැනි අවම අගයක් වී තිබුණි.				
7	මන්නාරම සහ පූනරින්හි මෙගාවොට් 500 ක ධාරිතාවයෙන් යුත් පුනර්ජනනීය බලශක්ති බලාගාර ඉදිකිරීම විදේශීය පෞද්ගලික ආයෝජකයෙකු වෙත පිරිනැමීම සඳහා 2022 මාර්තු 15 දිනැති අංක අමප/22/0380/301/008 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමැතිය ලබා දී තිබුණි. ඒ වන විට අධිකාරිය උක්ත ව්‍යාපෘතිවල සිදුකර තිබුණු මූලික සංවර්ධන කාර්යයන් වෙනුවෙන් දරා තිබුණු එ.ජ.ඩො. 747,733 ට සමාන රු.මිලියන 261.7 ක් ව්‍යාපෘති සංවර්ධකගෙන් 2022 නොවැම්බර් 08 දිනැති අංක රහිත ලිපිය මඟින් ඉල්ලුම් කර තිබුණි. නමුත් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල ව්‍යාපෘති සංවර්ධකගෙන් ලැබිය යුතු එ.ජ.ඩො 425,381 ට සමාන රු. මිලියන 112.5 ක් ලෙස එ.ජ.ඩො 322,352 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල	2023	වටිනාකම් අඩුකර ගැනීමට අදාල එකඟතාවයන් පිළිබඳ විස්තර නොපමාව විගණනය වෙත ඉදිරිපත් කළ යුතුය	එ ජ ඩො 425,381 සකස් වී ඇති ආකාරය දක්වමින් ලියවිල්ලක් විගණනයට ඉදිරිපත් කර තිබුණි.	ගාස්තු අඩුකිරීම සඳහා ව්‍යාපෘති සංවර්ධනකරු සමඟ ඇතිකරගත් එකගතාවයන් 2024 නොවැම්බර් වන විටත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

	සටහන් මඟින් හෙලිදරව් කර තිබුණි. එම වට්නාකම් අඩුකිරීම් සඳහා ව්‍යාපෘති සංවර්ධක සමඟ ඇතිකරගත් එකඟතාවයන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි				
8	පනතේ 30 වගන්තිය ප්‍රකාරව අධිකාරිය විසින් කුඩා ජල විදුලි ව්‍යාපෘති 15 ක් සඳහා 1979 අංක 08 දරන රජයේ ඉඩම් අත්කරගැනීමේ පනත යටතේ හෙක්ටයාර් 14.13 ක් අත්පත්කර ගැනීමේ කටයුතු ආරම්භකර තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම ඉඩම් විධිමත්ව අත්පත්කරගෙන නොතිබුණි. එම නිසා පනතේ 32 වගන්තිය ප්‍රකාරව එම ඉඩම් බදු දීම හෝ භුක්තිය භාර දීම කර වාර්ෂිකව බදු මුදල් අයකිරීමට අධිකාරිය අපොහොසත් වී තිබුණි. තවද බදු දුන් වෙනත් ඉඩමක් වෙනුවෙන් 2021 සිට 2024 මාර්තු දක්වා අය විය යුතු රු. මිලියන 1.3 ක බදු සහ ප්‍රමාද ගාස්තු අයකර නොතිබුණි.	2022 2023	ඉඩම් අත්පත් කරගැනීම් කටයුතු කඩිනමින් අවසන් කර ඉඩම් බදු දී බදු මුදල් අය කල යුතුය.	අධිකාරිය විසින් භුක්තිය භාර ගන්නා ලද ඉඩම් කැබලි 45 න් ඉඩම් කැබලි 16 ක් නිවැරදිව බදු දී ඇති අතර ඉතිරි ඉඩම් කැබලි 29 පනතේ 9 වැනි වගන්තිය යටතේ හිමිකම් පරීක්ෂණ අවසන් කිරීමෙන් පසුව රෙජිස්ටාර් කාර්යාලයේ ලියාපදිංචි කිරීමෙන් පසු හිඟ බදු මුදල්ද සමඟ නියමිත බදු මුදල් අය කිරීමට කටුයුතු කරනු ඇත.හිඟ බදු මුදල් ගෙවන ලෙසට අධිකාරිය අදාල ව්‍යාපෘති යෝජක දැනුවත් කර ඇත.	ඉඩම් අත්පත් කරගැනීම් අවසන් කර කිසිදු ඉඩමක් බදු දී නොතිබුණි.හිඟ බදු මුදල් අයකර නොතිබුණි.

9	පනතේ 47(1) සහ 67 වගන්ති ප්‍රකාරව බලශක්ති කාර්යක්ෂමතාවය සඳහා වන ව්‍යාපෘති සඳහා ණය ඉල්ලුම්කරන ආයෝජකයින් සඳහා අවශ්‍ය ඇප ලබාදීමේ අරමුණින් පිහිටුවා තිබුණු සුනිත්‍ය බලශක්ති ඇප අරමුදලේ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යවරයා විසින් සකස් කල යුතු රෙගුලාසි සකස් කර පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.	2023	පනතේ විධි විධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.	රෙගුලාසියේ කෙටුම්පතක් පමණක් සකස් කර ඇත	නීති කෙටුම්පත් සහ අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන පාර්ලිමේන්තු අනුමැතිය සඳහා ඉදිරිපත් කර නැත.

3.164 ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	අතිරික්තය (ඌනතාවය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	2,790,735,560	158,414,233	2,632,321,327	129,499,010	තත්ත්වාගණනය කළ
2022	2,692,952,693	166,909,006	2,526,043,688	(19,477,555)	තත්ත්වාගණනය කළ
2023	2,844,689,177	164,937,145	2,679,752,032	74,589,846	-

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	නිර්විනාශක පරීක්ෂණ ජාතික මධ්‍යස්ථානයේ ඒකකයන් කිහිපයක් විසින් (NCBNDT, Training Unit and Inspection Body) නිර්විනාශක පරීක්ෂණ සම්බන්ධ පාඨමාලා පැවැත්වීම හා සම්බන්ධ කටයුතු සහ බාහිර පාර්ශව වෙත පරීක්ෂණ සේවා සැපයීම ආදී කාර්යයන් සිදුකරමින් පැවතුණද එම කටයුතු සම්බන්ධයෙන් භාවිතා කරන අන්තර්ජාතික ප්‍රමිත ශ්‍රී ලංකාව තුල නීති ගත කිරීමට අවශ්‍ය නෛතික ප්‍රතිපාදන කෙටුම්පත් කර නොතිබුණි.	2021	නිර්විනාශක පරීක්ෂණ සම්බන්ධ කාර්යයන් නියාමනය සඳහා ස්වාධීන ආයතනයක පිහිටුවිය යුතු අතර අන්තර්ජාතික ප්‍රමිතිවල වලංගුභාවය සඳහා අවශ්‍ය නෛතික ප්‍රතිපාදන සම්පාදනය කළ යුතුය.	නියාමනය කිරීම සඳහා මෙතෙක් ප්‍රායෝගික ක්‍රමයක් නොමැති අතර ලබාදෙන වාර්තාවල වලංගුභාවය අදාල පරීක්ෂණ නිළධාරීන්ගේ සුදුසුකම් මත රඳාපවතී.	නියාමනය සඳහා ස්වාධීන ආයතනයක් පිහිටුවා නොතිබුණු අතර අන්තර්ජාතික ප්‍රමිතිවලට අනුකූලව ලංකාව තුල ප්‍රමිත සකස් කර නොතිබුණි.
2	2014 වර්ෂයේදී වැඩ නිමකරන ලද	2021	කොන්ත්‍රාත් විචලනයන්	කොන්ත්‍රාත් විචලනයන්	අදාල අනුමැතියන් ලබා

	නිර්විනාශක පරීක්ෂණ ජාතික මධ්‍යස්ථාන ගොඩනැගිල්ලේ අනුමත කොන්ත්‍රාත් වටිනාකම රු. 308.6 ක් වුවත් රු. මිලියන 120.9 ක් හෙවත් සියයට 39 ක කොන්ත්‍රාත් විචලනයක් සහිතව ඉදිකිරීම් සිදුකර තිබුණද, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 8.13.4 සහ 2012 අගෝස්තු 07 දිනැති අංක 02/2012 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කොන්ත්‍රාත් විචලනය සඳහා අවශ්‍ය අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2022 ඔක්තෝබර් 28 දින දක්වා ලබාගෙන නොතිබුණි.ඉඩම මිලදීගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණු රු. මිලියන 84 ඉක්මවා ඉඩමේ තක්සේරුව වූ රු. මිලියන 85ක් ඇතුළුව ඉඩම සඳහා රු. මිලියන 90.8 ක් වැයකර තිබුණි.		අවමකිරීමට කටයුතු කළ යුතු අතර අදාල අනුමැතිය ලබා ගත යුතුය	සඳහා අනුමැතිය ලබාගැනීමට ඉල්ලා ඇති අතර අමාත්‍යාංශය මඟින් සමාලෝචනයක් සිදුකරමින් පවතී.	ගෙන නොතිබුණි.
3	2014 අංක 40 දරන ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනතේ 4 (එ) වගන්තිය ප්‍රකාරව මණ්ඩලය විසින් ශ්‍රී ලංකාව ඇතුලත පිහිටි විකිරණශීලී ඛණිජ සම්පත්වල පැවැත්ම	2022	පනතේ විධිවිධාන ප්‍රකාරව විකිරණශීලී ඛනිජ ද්‍රව්‍ය සඳහා අගය එකතු කිරීම මඟින් ඒවා ජාතික ආර්ථිකයට උපරිම වාසියක් ගෙනදෙන අයුරින් භාවිතා කළ	භූ විද්‍යා හා පතල් කැනීම් කාර්යාංශය හා එක්ව ස්වාභාවික විකිරණශීලී ප්‍රභව සම්බන්ධ අධ්‍යයනයක්	විකිරණශීලී ඛනිජ ද්‍රව්‍ය ඵලදායීව යොදාගත හැකි පරිදි ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.

	ගවේශණය කිරීම සිදුකල යුතු අතර 4 (අ) වගන්තිය ප්‍රකාරව ජාතික සංවර්ධනය සඳහා අදාල විකිරණශීලී ඛනිජ ද්‍රව්‍ය උපයෝගී කරගත යුතු වුවත් මණ්ඩලය විසින් විකිරණශීලී ඛනිජ ද්‍රව්‍ය ජාතික සංවර්ධනය සඳහා යොදාගත හැකි ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.		හැකි ක්‍රමවේදයන් සකස්කිරීම සඳහා අවශ්‍ය පර්යේෂණ සිදුකළ යුතුය.	සිදුකර ඇත.	
4	මණ්ඩලය විසින් නාගරික සංවර්ධන අධිකාරියෙන් බදු පදනමට ලබාගෙන තිබුණු ප්‍රධාන කාර්යාලය පිහිටි ඔරුගොඩවත්ත පිහිටි ඉඩම නව කැළණි පාලම ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා පවරාගෙන තිබුණි. පසුව ශ්‍රී ලංකා ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරියට අයත් ඊට ආසන්න වෙනත් ඉඩමක ව්‍යාපෘතිය හරහා නව ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකරවා ගෙන තිබුණු අතර 2023 ජූනි වන විටත් අදාළ ඉඩම නීත්‍යානුකූලව මණ්ඩලය වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.	2021 2022	අදාළ ඉඩම කඩිනමින් මණ්ඩලය වෙත පවරා ගැනීමට කටයුතු කලයුතුය.	ඉඩමේ අයිතිය පවරාගැනීම සඳහා ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් සකස් කර තිබුණි	අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන විධිමත්ව ඉඩම පවරාගෙන නොතිබුණි.

5	ගැමා මධ්‍යස්ථානයේ මෙහෙයුම් සඳහා අවශ්‍ය කොබෝල්ට් 60 මූලද්‍රව්‍ය වර්ෂ 4 කට වරක් ප්‍රතිසම්පාදනය කළ යුතු අතර, ඒ සඳහා 2013 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා රු.මිලියන 358 ක පමණ රජයේ ප්‍රදාන ලබා දී තිබුණි. මහා භාණ්ඩාගාරයට වැය බරක් නොවන පරිදි ගැමා මධ්‍යස්ථානයේ ස්වකීය ආදායම් උපයෝගී කරගෙන ක්ෂය වන මූලද්‍රව්‍ය ප්‍රතිසම්පාදනය කරගත හැකි පරිදි ආයෝජනයක් සහිත අරමුදල් කළමනාකරණ වැඩසටහනක් ක්‍රියාත්මක නොවීමෙන් අනාගතයේදී අරමුදල් සපයාගැනීම දුෂ්කර විය හැකි බව නිරීක්ෂණය විය.	2022	භාණ්ඩාගාර ප්‍රදාන ලබාගැනීමකින් තොරව ස්වකීය ආදායම් මත මූලද්‍රව්‍ය ප්‍රතිසම්පාදනය කරගැනීම සඳහා වන ක්‍රියාමර්ග ගත යුතුය	ක්‍රියාමාර්ග ගෙන නැත.	මූලද්‍රව්‍ය සපයාගැනීම සඳහා අරමුදල් ලබාගැනීමේ දැඩි දුෂ්කරතා වලට මුහුණ දීමට සිදුව ඇත.
6	මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය ඉදිකිරීම සඳහා තෝරා ගත් මාලඹේ ඉඩම සඳහා මුදල් ගෙවීමේදී, 2014 පෙබරවාරි 24 දිනැති අංක 14/0277/526/002 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව මණ්ඩලය	2021 2022	1.අමාත්‍ය මණ්ඩල තීරණ ප්‍රකාරව කටයුතු කළ යුතු අතර රජයේ තක්සේරුව අනුව පමණක් ගෙවීම් සිදුකල යුතුය. 2.මණ්ඩලයට අයවිය යුතු මුදල් අයකරගැනීමට කටයුතු කළ යුතුය.	අදාල පාර්ශව සමඟ සාකච්ඡා කිහිපයක් පවත්වා ඇත	වැඩි පුර ගෙවා ඇති මුදල් අයකර ගෙන නොතිබුණි.

පවත්වාගෙන ගිය පැරණි ගොඩනැගිල්ල පිහිටි ඔරුගොඩවත්ත ඉඩම වෙනුවෙන් නාගරික සංවර්ධන අධිකාරියට ඉදිරියට ගෙවා තිබූ බදු කුලිය වූ රු. මිලියන 7.66 ක් අඩු කර ගෙවිය යුතු වුවත්, එසේ අඩුකර ගෙවීම් සිදුකර නොතිබුණි. එසේම මාලඹේ ඉඩමේ වෙළඳ පොළ වටිනාකම රු.මිලියන 116 ක්ද, අවුරුදු 30 ක් සඳහා බදු වටිනාකම රු. මිලියන 75.5 ක්ද වූ රජයේ තක්සේරුව නොසලකා නාගරික සංවර්ධන අධිකාරියට මාළඹේ ඉඩම වෙනුවෙන් 2015 වර්ෂයේදී රු.මිලියන 181 ක් ගෙවා තිබුණි.

3.165 ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	අතිරික්තය (ඌනතාවය) රු.	මතය
2021	84,056,739	32,528,954	51,527,785	9,412,059	තත්ත්වාගණනය කළ
2022	119,391,565	32,606,417	86,785,147	8,912,531	තත්ත්වාගණනය කළ
2023	162,017,060	33,734,037	128,283,023	29,673,881	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	2014 අංක 40 දරන ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනතේ 18 වගන්තිය ප්‍රකාරව වගන්තිය ප්‍රකාරව පරමාණුක බලශක්ති මණ්ඩලයද ඇතුළුව සියළු තැනැත්තන්විසින් සිදුකරන අයනීකාරක විකිරණ සම්බන්ධිත සැමක්‍රියා පිළිවෙතක්ම (Practices) බලපත්‍ර ලබා දී නියාමනය කිරීමේ වගකීම සභාව සතුය. ඒ අනුව මණ්ඩලය විසින් සපයන විකිරණශීලීතා මට්ටම් මිනුම් කිරීම, විකිරණ මිනුම් උපකරණ ක්‍රමාංකන සේවය, මාත්‍රාමිතික සේවය සහ වැඩබිම් අධීක්ෂණ සේවා වැනි සේවාවන් අධීක්ෂණය සහ නියාමනය කිරීම සඳහා පනතේ 12(ඕ)	2021 2022 2023	පනතේ වගන්ති ප්‍රකාරව අයනීකාරක විකිරණ සම්බන්ධිත සියළු ක්‍රියාපිළිවෙත් නියාමනය කල හැකි පරිදි අවශ්‍ය යාන්ත්‍රණයක් කඩිනමින් සකස් කළ යුතුය.	අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත කාර්යපටිපාටි සහ යාන්ත්‍රණයක් කෙටුම්පත් කරමින් සිටින බව	කාර්ය පටිපාටි සහ යාන්ත්‍රණය සකස් කර නැත.

	වගන්තියේ බලතල ප්‍රකාරව සභාව විසින් කාර්ය පටිපාටි සහ යාන්ත්‍රණයක් සකස්කළ යුතු වුවත් සභාව විසින් එවැනි කාර්ය පටිපාටි සහ යාන්ත්‍රණයක් කෙටුම්පත් කර නොතිබුණි.				
2	2014 අංක 40 දරන ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනතේ 46 වගන්තිය ප්‍රකාරව හිමිකම් නොමැති විකිරණශීලී ප්‍රභවයන් පිළිබඳ පාලනය නොපමාව ලබාගැනීම හෝ නැවත ලබාගැනීම සඳහා ජාතික ක්‍රමෝපායක් සකස් කළ යුතු වුවත් එවැනි ජාතික ක්‍රමෝපායක් සකස් කර නොතිබුණි.	2022 2023	පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.	අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත මෙම ක්‍රමෝපාය සකස් කරමින් පවතින බව	ජාතික ක්‍රමෝපායක් සකස් කර නැත
3	උක්ත පනතේ 12(ග) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද සහ මෙරටදී ලබා ගත හැකි යම් භාණ්ඩ හෝ වෙළෙඳ ද්‍රව්‍ය පරීක්ෂා කිරීම විකිරණශිලීතාවය පිරික්සීම සඳහා සාම්පල් ලබා ගැනීම සහ සභාව අවශ්‍යයැයි හෝ යෝග්‍යයැයි සලකන අවස්ථාවක ඒ පිරික්සුමේ ප්‍රතිඵල මහජනයාගේ සහ අදාල සියලු නිලධාරීන්ගේ දැන ගැනීම පිණිස පළකිරීම සිදුකල යුතු	2022 2023	මිනිස් පරිභෝජනයට නුසුදුසු අහිතකර විකිරණශීලී ද්‍රව්‍ය සහිත ආහාර ද්‍රව්‍ය හඳුනාගැනීම සඳහා පනත ප්‍රකාරව සභාවේ වගකීම් ඉටුකිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය.	මේ සම්බන්ධයෙන් පරමාණුක බලශක්ති මණ්ඩලයද අහඹු ලෙස පරීක්ෂණ සිදුකර ඇත.එහි ප්‍රතිඵලයක් වශයෙන් විකිරණ මට්ටම් ඉක්මවා යන ද්‍රව්‍ය මෙතෙක් හඳුනාගෙන නැත.මහජන පැමිණිලිද ලැබී නැත.	කිරිපිටි වල සාම්පල් පරීක්ෂාවන් පමණක් සිදුකරයි.

	වුවත් සභාව විසින් විකිරණශීලී ද්‍රව්‍ය පැවතිය හැකි ආනයනික පාරිභෝගික ද්‍රව්‍ය හඳුනා ගැනීම සඳහා වන අහඹු පරීක්ෂාවන් සිදු කර නොතිබුණි.				
4	උක්ත පනතේ 48 (2) (අ) වගන්තිය ප්‍රකාරව විකිරණශීලී ප්‍රභවයන් ආනයනය කිරීම හෝ අපනයනය කිරීමට සභාවේ අනුමැතිය දීම සඳහා යොදාගත යුතු අවශ්‍යතා සහ කාර්යපටිපාටිය ජාත්‍යන්තරව පිළිගත් මාර්ගෝපදේශ පදනම් කර ගනිමින් සාදන ලද රීති මත පදනම් විය යුතු වුවත් සභාව විසින් අන්තර් ජාතික මාර්ගෝපදේශ සුදුසු පරිදි යොදාගෙන රීති සකස් කර පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. මේ හේතුවෙන් සභාව විසින් සිය අභිමතය පරිදි ආනයන සහ අපනයන සඳහා සිය අනුමැතියන් ලබා දෙන බව නිරීක්ෂණය විය.	2022 2023	පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.	පනතේ 48 (2) (අ) යටතේ සමාලෝචනයක් කිරීමට නියමිතය.ආනයන අපනයන සම්බන්ධ ක්‍රමවේදයක කෙටුම්පත් සකසා එය අධ්‍යයනයට ලක් කර ඇත.ඉදිරියේදී නීති නිළධාරීගේ සහාය ඇතිව ඉදිරි කටයුතු කරනු ලැබේ.	රීති කෙටුම්පත පමණක් සකස් කර ඇති අතර පාර්ලිමේන්තු අනුමැතියට අවශ්‍ය කටයුතු සිදු කර නැත.
5	උක්ත පනතේ 69 (1) වගන්තිය ප්‍රකාරව අයනීකාරක ද්‍රව්‍ය උපද්දන කැණීම් සහ පිරිසැකසුම් මෙහෙයුම්වලට අදාළ ක්‍රියාකාරකම් පවත්වන	2022 2023	පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.	නියෝජ්‍ය අධ්‍යක්ෂවරු දෙදෙනෙකුගෙන් සමන්විත කමිටුවක් පත්කර මූලික කෙටුම්පත	මූලික කෙටුම්පත හෝ සකස් කර අවසන් නැත.

	සියලු පුද්ගලයන් විසින් අනුකූලතාවය දැක්විය යුතු කම්කරුවන්, මහජනයා සහ පරිසරය ආරක්ෂා කිරීම සඳහා වූ අවශ්‍යතා සභාව විසින් තත්කාර්ය සඳහා සාදනු ලබන රීති මඟින් පැනවිය යුතු වුවත් එවැනි රීති කිසිවක් කෙටුම්පත් කර හෝ නොතිබුණි.			සකස් කිරීම ආරම්භකර ඇත.අය අවසන් වූ පසු භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කැනීම් කාර්යාංශයේද අදහස් හා යෝජනා ලබාගෙන රීතිය අවසන් කර බලාත්මක කිරීමට බලාපොරොත්තු වන බව	
6	1999 අංක 1 දරන පරමාණුක ශක්ති ආරක්ෂණ රෙගුලාසිවල අයනීකරණ විකිරණ ආරක්ෂණය පිළිබඳ 4(1) රෙගුලාසිය ප්‍රකාරව විකිරණශීලී නිධි කැනීම, ඇඹරීම සහ පිරිසැකසුම සඳහා සභාව විසින් බලපත්‍ර ලබා දිය යුතු වුවත්, එම කටයුතු සිදුකරන රාජ්‍ය සමාගමක් සහ පුද්ගලික සමාගමක් වෙත බලපත්‍ර ලබා දී නියාමනය කර නොතිබුණි. තවද 2015 ජූලි 21 දිනැති අංක 1924/27 දරන ගැසට් පත්‍රය ප්‍රකාරව මුළු සක්‍රීයතාවය හෝ සක්‍රීයතා සාන්ද්‍රණය අදාල නිදහස් කිරීමේ මට්ටම් නොඉක්මවිය යුතු වුවත් මුළු සක්‍රියතාවය (total activity) (Th 232/U	2022	රෙගුලාසිවලට අනුකූල වන ලෙස බලපත්‍ර ලබා දිය යුතු අතර ගැසට් නිවේදනය ප්‍රකාරව සක්‍රියතා සාන්ද්‍රණය හෝ මුළු සක්‍රීයතාවය යන අවශ්‍යතා දෙකෙන් එකක් හෝ අදාල නිදහස් කිරීමේ මට්ටම ඉක්මවන ක්‍රියාපිළිවෙත් සඳහා බලපත්‍ර නිකුත් කර නියාමනයට යටත් කළ යුතුය.	පරීක්ෂා කර නිර්දේශ ලබා දුන් සියලුම ඛනිජ වැලි වල විකිරණශීලී සමස්ථානිකව ල සක්‍රීයතා සාන්ද්‍රණය අදාල අගයන්ට අඩු බැවින් සභවේ නිර්දේශ අවශ්‍ය නොවේ.නමුත් අනුමැතිය ලබාදුන් ඛනිජවැලි සාම්පල් අඩංගු වැලි බහාලුම්වල (තොගයේ) මුළු සක්‍රීයතාවය ඉක්මවන බව ඉතා පැහැදිලිය.	අදාල සමාගම් විසින් සිදුකරන කටයුතු සඳහා මෙතෙක් බලපත්‍ර ලබාදීම සිදුකර නොතිබුණි.

	238 - බෙකරල් 10,000) අදාල නිදහස්කිරීමේ මට්ටම ඉක්මවා තිබියදී සභාව විසින් පරමාණුක බලශක්ති පනතේ 19 වගන්තියේ බලතල ප්‍රකාරවඋක්ත සමාගම් විසින් සිදුකරන විකිරණශිලී ඛනිජ වැලි අපනයනයන් සභාවේ නියාමන පාලනයෙන් නිදහස් කර තිබුණි.				
7	2021 අප්‍රේල් 20 දින සභාවේ බලපත්‍රයක් නොමැතිව අධිබලැති විකිරණශීලී ද්‍රව්‍ය රැගත් නෞකාවක් හම්බන්තොට වරායට ඇතුළු වී 2014 අංක 40 දරන ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනතේ 18 සහ 48 (1) වගන්ති යටතේ වරදවල් සිදුකර තිබුණද සභාව විසින් අදාල දේශීය නැව් නියෝජිත සමාගමට විරුද්ධව අධිකරණ ක්‍රියාමාර්ග වලට එළඹ නොතිබුණි.	2022	පනතේ 18 වගන්තිය උල්ලංඝනය කිරීම රු.මිලියන 3 ට නොවැඩි දඩයකට හෝ වසර හතකට නොවැඩි කාලයක් සඳහා වන බන්ධනාගාර ගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ යටත් විය යුතු වරදක් බැවින් එවැනි වැරදි සම්බන්ධයෙන් අධිකරණ ක්‍රියාමාර්ග ගත යුතුව පැවතුණි.	තොරතුරු ලද විගස සභාව විසින් අදාල නෞකාව වරායෙන් පිටතට යැවීමට උපදෙස් ලබා දිය.සභාවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ සභාපතිත්වයෙන් යුතු කමිටුවක් විසින් සිදුවීම විමර්ෂනය කරන ලදී.නැව් සමාගමේ දේශීය නියෝජිතයා වෙත ලංකාවේ වරායවල් හරහා විකිරණශීලී ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම තහනම් කරමින් බලපත්‍ර ලබාදීම අත්හිටුවන ලදී.	නැව් සමාගමට විරුද්ධව අධිකරණයේ නඩු පවරා නොතිබුණි.

8	පිළිකා ප්‍රතිකාරක රජයේ රෝහල් වල භාවිත කර අවසන් ඉහළ ක්‍රියාකාරී ප්‍රභවයක් (කාණ්ඩ 1) වන කොබෝල්ට් 60 විකිරණශීලී ද්‍රව්‍යයේ ක්‍රියාකාරීත්වය අඩු වන තෙක් (කාණ්ඩ 3 දක්වා) යම් කාලයක් පරමාණුක බලශකත්ති මණ්ඩලය සතු මධ්‍යගත විකිරණශීලී අපද්‍රව්‍ය ගබඩාවේ තාවකාලිකවගබඩා කර එම සියළු විකරණශීලී අපද්‍රව්‍ය එක් අවස්ථාවකදී අදාල නිෂ්පාදන රට වෙත යැවීම මඟින් වරින් වර අපනයනය කිරීමේදී රජයට දැරීමට වන අධික වියදම් අඩුකර ගත හැකි අතර එම මූලද්‍රව්‍ය වෙනත් විකල්ප විකිරණ සේවා සඳහා භාවිතා කිරීම මඟින් රජයට ප්‍රති අපනයනය සඳහා වියදම් දැරීමට සිදු නොවන අතර අමතර ආදායමක් ලබා ගත හැකිය.ඉහත පරිදි කටයුතු නොකිරීම හේතුවෙන් එම විකිරණශීලී අපද්‍රව්‍ය අනාරක්ෂිතව රෝහල් පරිශ්‍රවලපැවතුණි.	2022	පරමාණුක බලශක්ති මණ්ඩලය විසින් ඉහළ ක්‍රියාකාරී(කාණ්ඩ 1) විකිරණශීලී මූලද්‍රව්‍ය සඳහා තාවකාලික ගබඩා පහසුකම් සපයන අතර ඒ සඳහා අවශ්‍ය භෞතික ආරක්ෂණ පද්ධතියක්ද සභාව මැදිහත් වී සපයා තිබුණි.තවද අබාවිත ඉහළ ක්‍රියාකාරී විකිරණශීලී ප්‍රභවයන් ප්‍රතිචක්‍රීකරණය සඳහා වන ක්‍රමෝපායන් සම්බන්ධයෙන් අවධානය යොමු කළ යුතුය.	කාණ්ඩ 1 වර්ගයේ විකිරණශීලී ප්‍රභව ගබඩා කිරීමට සුදුසු ආරක්ෂිත ගබඩාවක් නොමැති අතර අභාවිත ප්‍රභව අවස්ථා කිහිපයකදී හෝ එකවර අදාල විදේශීය නිෂ්පාදකයා වෙත යැවීමේදී පිරිවැයේ විශාල වෙනසක් සිදු නොවේ.විකල් ප විකිරණ සේවා සඳහා අභාවිත විකිරණ ප්‍රභව යොදාගැනීමට කිසිවෙකු ඉල්ලීම් කර නැත.	තවදුරටත් අභාවිත කොබෝල්ට් මූලද්‍රව්‍ය රෝහල් පරිශ්‍රවල පවතී.
9	1999 අංක 1 දරණ පරමාණුක ශක්ති ආරක්ෂණ රෙගුලාසිවල අයනීකරණ විකිරණ ආරක්ෂණය පිළිබඳ 4(1) (අ) රෙගුලාසිය ප්‍රකාරව විකිරණශීලී ද්‍රව්‍ය	2023	බලපත්‍ර ලිපිගොනු වසා දමා ඇති එක්ස් කිරණ උපකරණ බැහැර කිරීම සඳහා ආරක්ෂිත	ඇසුරුම් තුල හෝ ගබඩා කර ඇති එක්ස් කිරණ උපකරණ සඳහා සභාව විසින් බලපත්‍ර	එක්ස් කිරණ උපකරණ බැහැර කිරීම සඳහා ආරක්ෂිත හා විධිමත් ක්‍රමවේදයක් සකස් කර

සන්තකයේ තබාගැනීම (possession) සඳහා සභාව විසින් බලපත්‍ර ලබාදිය යුතු වුවත් පොලිස් මූලස්ථානය විසින් 2019 වර්ෂයේදී ශ්‍රී ලංකාවට ආනයනය කර තිබුණු එක්ස් රේ උපකරණ 50 කට අදාලව උපකරණ 50ක් සඳහා 2020 දෙසැම්බර් 31දක්වාත් උපකරණ 35කට 2023 - 2021 වර්ෂ දක්වාත් උපකරණ 34කට 2026 - 2024 වර්ෂ දක්වාත් සහ පෞද්ගලික ආයතනයක් විසින් 2019 වර්ෂයේදී ආනයනය කර තිබුණු එක්ස් රේ උපකරණ 16 කට 2019-2021 වර්ෂ දක්වාත් සන්තකයේ තබාගැනීම සඳහා අවශ්‍ය බලපත්‍ර ලබා දී නොතිබුණි.මේ හේතුවෙන් බලපත්‍ර ගාස්තු ලෙස අයකල යුතු රු .මිලියන 1.38ක් අයකර නොතිබුණි.තවද රෙගුලාසිය ප්‍රකාරව විකිරණ උපකරණවල ක්‍රියාත්මකභාවය අත්හිටුවීම සහ බැහැර කිරීම සඳහා සභාව විසින් අවසර ලබාදිය යුතු බැවින් කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්කවල බලපත්‍ර ලිපි ගොනු වසා දමා තිබුණු එක්ස් කිරණ උපකරණ 27 ක් සම්බන්ධයෙන් බැහැර කිරීම සඳහා අයදුම්කරන තෙක් සන්තකයේ	හා විධිමත් ක්‍රමවේදයක් සකස් කළ යුතුය.	ලබා නොදෙන අතර යන්ත්‍රය සවිකල පසුව විකිරණ පරීක්ෂාවක් සිදුකර විකිරණ ආරක්ෂාව තහවුරු කරගත් පසු බලපත්‍ර ලබා දෙනු ලැබේ.බලපත්‍ර ලිපිගොනු වසා දමා ඇති යන්ත්‍ර සම්බන්ධයෙන් පසුවිපරමක් සිදුකිරීම ක්‍රමවේදයක් ඉදිරියේදී හඳුන්වාදෙනු ලැබේ.	නොතිබුණි.

	තබාගැනීම සඳහා බලපත්‍ර ලබා දී නොතිබුණි.				
10	2014 අංක 14 දරන පරමාණුක බලශක්ති පනතේ 12(ඉ), 59(2) හා 60 වගන්ති ප්‍රකාරව ශ්‍රී ලංකාව අත්සන් කර ඇති න්‍යෂ්ටික ආයුධ පැතිරීම වැළැක්වීම පිලිබඳ සම්මුතිය යටතේ වන අතිරේක චර්යා ගිවිසුම (additional protocol) විධිමත් ලෙස බලාත්මක කිරීම සඳහා ඊට අදාල ශ්‍රී ලාංකීය ව්‍යවස්ථාපිත කාරණා ඉටුකරගන්නා තුරු ආකෘති අතිරේක චර්යා ගිවිසුම ශ්‍රී ලංකාව තුල කොන්දේසිවලට යටත්ව ක්‍රියාත්මක කිරීමට 2018 අප්‍රේල් 03 දිනැති අංක 18/0522/727/013 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමැතිය ලබා දී තිබුණද ඊට අවශ්‍ය ව්‍යවස්ථාපිත අවශ්‍යතා සමාලෝචිත වර්ෂය අවසානය දක්වා සම්පූර්ණ කර නොතිබුණි. එසේම උක්ත සම්මුතියේ 39 ව්‍යවස්ථාව අනුව ගිවිසුමේ වගකීම් කාර්යක්ෂමව සහ ඵලදායීව ඉටුකිරීම සඳහා අවශ්‍ය ප්‍රමාණයට අනුබද්ධ විධිවිධානයන් සවිස්තරාත්මකව ශ්‍රී	2023	ශ්‍රී ලංකාව අත්සන් තබා ඇති අන්තර්ජාතික ගිවිසුම්වල වගකීම් කාර්යක්ෂමව සහ ඵලදායීව ඉටුකිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය.	පනතට අවශ්‍ය සංශෝධන සිදුකිරීමට කටයුතු ආරම්භකර තිබේ	නව පනතක් කෙටුම්පත් කරමින් පවතී

	ලංකාව විසින් සකස් කළ යුතු වුවත් 2019 වර්ෂයෙන් පසු ඒ සඳහා සභාව විසින් මැදිහත් වීම් කර නොතිබුණි.				
11	පනතේ 86 (2) වගන්තිය ප්‍රකාරව ප්‍රවිකිරණ කාර්මික අනු ආයතන අක්‍රීය කිරීම සඳහා සහ විකිරණ සේවකයින් අහිතකර අයනීකාරක විකිරණයට නිරාවරණය වීම හේතුවෙන් සිදුවන රෝග හෝ අලාභ වෙනුවෙන් එම සේවකයින්ට වන්දි ගෙවීම සඳහා වන්දි යෝජනා ක්‍රමයක් සකස් කිරීම සඳහා නියෝග සකස්කර නොතිබුණි.	2023	පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.	ප්‍රවිකිරණ කාර්මික අනු ආයතන අක්‍රීය කිරීමට අදාල නියෝගය දැනටමත් කෙටුම්පත් කර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇත.අදාල පාර්ශවයන්ගේ අදහස් හා යෝජනා ලබාගත් පසු නියමිත ක්‍රමවේදය අනුව බලාත්මක කරනු ලැබේ.	ප්‍රවිකිරණ කාර්මික අනු ආයතන අක්‍රීය කිරීමට අදාල කෙටුම්පත් පමණක් සකස් කර ඇත.විකිරණ සේවකයින්ට වන්දි ගෙවීම් සඳහා වන වන්දි යෝජනා ක්‍රමයක් සකස් කර නැත.

3.166 තල් සංවර්ධන මණ්ඩලය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	239,388,465	76,338,541	163,049,924	(33,538,883)	ව්‍යාවනය
2022	247,743,085	96,348,976	151,394,109	(24,786,100)	තත්ත්වාගණනය කළ
2023	262,412,451	94,471,689	167,940,762	(11,954,969)	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශය ක්‍රියාත්මක තත්ත්වය
1	2017 නොවැම්බර් 24 දින රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර තිබුණු මණ්ඩලයට අයත් කරෙයිනගර් ප්‍රදේශයේ ඉඩමක් තක්සේරු කර ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ජංගම නොවන වත්කම්වල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දක්වා තිබුණි.	2021	අධිකාරියට අයත් සියලුම වත්කම් තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය.	තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තක්සේරු ලබාගෙන 2022 වර්ෂයේදී ගිණුම්ගත කෙරේ.	2024 නොවැම්බර් තෙක් ඉඩම තක්සේරු කර නොතිබුණි.
2	මණ්ඩලයට අයත් සහ 2017 නොවැම්බර් 24 වන දින රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර ඇති ඉඩමක් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශන තුළ ඉදිරිපත් කර නොතිබීම හේතුවෙන් ජංගම නොවන වත්කම්වල වටිනාකම මූල්‍ය	2022	මණ්ඩලයට අයත් සියලු වත්කම් අගයකර ගිණුම්ගත කළ යුතුය.	අදාළ දිස්ත්‍රික් සම්බන්ධීකාරකවරුන් හරහා කටයුතු සිදුකරමින් පවතී.	ඉඩම තක්සේරු කිරීම සිදු කර නොතිබූ අතර 2024 නොවැම්බර් දක්වා ඉඩමේ අයිතිය පවරා දී නොමැත.

	ප්‍රකාශනවල අඩුවෙන් දක්වා තිබුණතවද දීර්ඝ . කාලීනව භාවිත වන ඉඩම් 8 ක අයිතිය පැවරීමට මණ්ඩලය කටයුතු කර නොතිබුණි.				
3	2023 දෙසැම්බර් 31 දිනට වසර 06කට වැඩි කාලයක් හිඟව පවතින වෙළෙඳ ලැබිය යුතු මුදල් යටතේ ඇතුළත් කර ඇති එකතු වටිනාකම රුපියල් 4,338,434 ක විවිධ ණයගැති ශේෂ 08 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	2023	නියමිත වේලාවට අයවිය යුතු මුදල් අයකර ගැනීමට අවශ්‍ය පිළියම් යෙදිය යුතුය.	මෙම කරුණ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඔවුන්ගේ යෝජනා මත අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ.	මුදල අයකර ගැනීමට කඩිනම් පියවර ගෙන නොතිබුණි.
4	2023 දෙසැම්බර් 31 දිනට වසර 2ත් 5ත් අතර කාලයක් හිඟව පවතින රුපියල් 306,875ක් වූ වෙළෙඳ ණයහිමි ශේෂ 05ක් සහ රුපියල් 2,967,592ක් වූ විවිධ ණයහිමි ශේෂයන් 08ක් පියවීමට කටයුතු කර නොතිබුණි.	2023	ණයහිමි ශේෂයන් නියමිත වේලාවට පියවීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය.	මුල්‍ය ප්‍රතිපාදන නොමැතිකම හේතුවෙන් ඉතිරි පියවීම් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව කොටස් වශයෙන් නුදුරු අනාගතයේදී සිදුකිරීමට නියමිතය.	මුදල පියවීමට කඩිනම් පියවර ගෙන නොතිබුණි.
5	2018 ට පෙර මිලදී ගත් රුපියල් 805,000 ක් වටිනා පැස්වරයිසර් උපකරණයක් සහ ඔටෝ ක්ලේව් උපකරණයක් වසර පහක් පුරා නිෂ්ක්‍රීයව පවතින බව නිරීක්ෂණය විය.	2023	වත්කම් ඵලදායී ලෙස භාවිතා කිරීමට කටයුතු කළ යුතුය.	පැස්වරයිසර් උපකරණය සහ ඔටෝක්ලේව් දැනටමත් නිවැරදි කර ඇති අතර ඒවා නිෂ්පාදන ක්‍රියාවලියට යොදා ගැනීමට කළමනාකාරිත්වය අවශ්‍ය පියවර ගෙන ඇත.	වත්කම්උපයෝජනය කර නොතිබුණි.

3.167 ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය

	මුළු වත්කම් (රු.)	මුළු වගකීම් (රු.)	ස්කන්ධය (රු.)	බදු පෙර ලාභය (රු.)	විගණන මතය
2021	120,689,222,000	41,292,025,000	79,397,197,000	667,166,000	තත්ත්වාගණනය කළ
2022	117,579,210,000	41,229,259,000	76,349,951,000	(1,494,044,000)	අහිතකර
2023	404,007,295,000	1,850,206,000	402,157,089,000	(6,201,567,000)	තත්ත්වාගණනය කළ

	විගණන වාර්තාවට ඇතුළත් කර ඇති ප්‍රධාන අඩුපාඩු	විගණන වාර්තා වේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ පියවර (කෙටුම්පත් වාර්තාවලට ලබාදී ඇති පිළිතුරු අනුව	වර්තමාන තත්ත්වය
01.	මහවැලි බී කලාපයේ කෘෂිකර්ම සංවර්ධන වැඩසටහන යටතේ කෘෂි බෝග නිෂ්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අක්කර 540 ක පමණ භූමි ප්‍රමාණයක් මුතුවැල්ල වැලිකන්ද ප්‍රදේශයෙන් ලබාදීමට 2020 වර්ෂයේ සැලසුම් කර තිබුණි. මෙම ආයෝජන ව්‍යාපෘතිවල පාරිසරික බලපෑම් ඇගයීම සඳහා රු.2,619,000 ක කොන්ත්‍රාත්තුව කොළඹ විශ්ව විද්‍යාලය වෙත ප්‍රදානය කර ඉන් රු.2,093,200 ක් විගණිත දින වනවිට ගෙවා තිබුණි. සැලසුම් කළ වර්ෂයේ සිට විගණිත දින වූ 2024 මැයි 10 දින වනවිට වර්ෂ 03 මාස 05 ක කාලයක්	2022 2023	ශක්‍යතා අධ්‍යයනය මගින් අනාර්ථික වියදම් වළක්වා ව්‍යාපෘතිය නොපමාව නිම කර අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගතයුතුය.	මුතුවැල්ල ව්‍යාපෘතියේ පරිසර අධ්‍යන කටයුතුවල ක්ෂේත්‍ර වැඩසටහන් ආරම්භ කිරීම සමඟ කොරෝනා වෛරසය ව්‍යාප්තිය, අනවසර පදිංචිකරුවන්ගේ ගැටලු, ජල මූලාශ්‍ර පිළිබඳ අධ්‍යයනය සහ යටිතල පහසුකම් සංවර්ධනය පිළිබඳ සැලසුම් සකස් කිරීම සඳහා කල්ගතවීම හේතුවෙන් සැලසුම් කල කාලයට වඩා අධ්‍යයන කටයුතු ප්‍රමාද වීමට බලපාන ලදි.	ආයෝජන ව්‍යාපෘති සඳහා ඉඩම් බැහැර කර නොමැත.

	ගතවී තිබුණද, කිසිදු ආයෝජන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර නොතිබුණි.				
02.	අධිකාරියේ සම්පත් යොදා ආරම්භ කරන ලද මහවැලි පශු සම්පත් හා කෘෂි ව්‍යාපාරික (පුද්) සමාගම තෝරාගත් බාහිර ආයෝජකයකු සමඟ රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපාරයක් ලෙස ප්‍රතිසංවිධානය කිරීම සඳහා 2018 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදී තිබුණි. ප්‍රතිසංවිධානය කිරීම සඳහා ඉදිරියට සිදුකිරීමට අපේක්ෂිත කාර්යයන්හි කාලරාමුව අනුව 2024 අප්‍රේල් 22 දින වනවිට ආයෝජකයින්ගේ ව්‍යාපෘති වාර්තා පරීක්ෂා කොට සුදුසු ව්‍යාපෘති තෝරා ගතයුතු වුවත්, මේ දක්වා එම කාර්යයන් ඉටු කර නොතිබුණි.	2021 2022 2023	අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපාරයක් ආරම්භ කළයුතුය.	ව්‍යාපෘති කමිටුව විසින් තාක්ෂණික ව්‍යාපෘති වාර්තා ඇගයීමට ලක් කර එම ව්‍යාපෘති කමිටු වාර්තාව 2024.05.06 දින පැවති අමාත්‍ය මණ්ඩලය පත් කල සාකච්ඡා සම්මුති කමිටුව (CANC) වෙත ඉදිරිපත් කරන ලදී.එහිදී මූල්‍ය ව්‍යාපෘති ඇගයීම සඳහා අනුමැතිය හිමි විය. 2024.08.13 දින වන විට රැස්වී ඇගයීම් කටයුතු සම්පූර්ණයෙන් අවසන් කර ඇත.ඒ අනුව සකස් කළ වාර්තාව තාක්ෂණික ඇගයීම් කමිටු නිලධාරින්ගේ නිර්දේශ ලබා ගැනීමට උත්සාහ කළ ද මැතිවරණ කටයුතු හේතුවෙන් නිලධාරින්ගේ කාර්ය බහුලත්වය මත එම කටයුතු මෙතෙක් සම්පූර්ණ කර ගැනීමට නොහැකි වී ඇත.	රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපාරයක් ලෙස ප්‍රතිසංවිධානය වී නොමැත.
03.	අධිකාරියට අයත් දෙමටගොඩ, බේස්ලයින් පාරේ පිහිටි හෙක්ටයාර 0.2139 ක ඉඩම හා ගොඩනැගිලි පරිශ්‍රය මේ වනවිට අතහැර දමා විනාශ වෙමින් පවතින අතර, භෞතිකව පරීක්ෂා කිරීමේදී ඉඩම තුළ පිහිටි	2022 2023	විනාශවූ හා අස්ථානගතවූ දේපල සම්බන්ධව මු.රෙ.ප්‍රකාරව කටයුතු කළයුතුය.	මෙම ඉඩම් ගොඩනැගිලි හා ගෘහභාණ්ඩ හා උපකරණ ආරක්ෂා කිරීමට මහවැලි ආරක්ෂක අංශය වෙත පවරා ඇත.තවද, 2023.08.04 වන දින 352 වන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මගින්	ගොඩනැගිලි නැවත භාවිතා කල හැකි අයුරින් ක්‍රියාමාර්ග ගෙන නොමැත.

	ගොඩනැගිලි නැවත භාවිතා කළ නොහැකි අයුරින් සම්පූර්ණයෙන්ම පාහේ කැඩී බිඳී විනාශවී ගොස් ඇති බවත් මේ සම්බන්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණු බවත් නිරීක්ෂණය විය.			දෙමටගොඩ, බේස්ලයින් පාරේ පිහිටි හෙක්ටයාර 0.2139 ක ඉඩම හා ගොඩනැගිල්ල ගබඩාවක් සහ වාහන අංගනයක් සඳහා ඉදිකිරීම සඳහා අභිලාෂයන් කැඳවීම සඳහා අනුමැතිය ලබා දී ඇත.	
04.	ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ ගොඩ, වාරි සහ වර්ෂාපෝෂිත ලෙස 2023 දෙසැම්බර් 31 දින වන විට ඉඩම් හෙක්ටයාර් 157,843ක් කට්ටි 315,529 ක් වශයෙන් බැහැර කර තිබූ නමුත්, කට්ටි 110,902 ට ප්‍රදාන පත්‍ර ලබාදීමට අපොහොසත්වී තිබූ අතර, එය සියයට 35 ක ප්‍රතිශතයක් ගෙන තිබුණි.එසේම රජයේ ඉඩම් ආඥා පනත යටතේ වාණිජ, නිවාස, ආයෝජන ව්‍යාපෘති, විහාරස්ථාන සහ රාජ්‍ය ආයතනවලට අදාළව 2023 දෙසැම්බර් 31 දින වනවිට ඉඩම් හෙක්ටයාර 18,766 ක් කට්ටි 24,735ක් වශයෙන් බැහැර කර තිබූ නමුත් ඉන් කට්ටි 19,657 ක් සඳහා දීර්ඝකාලීන දීමනා පත්‍ර, නිදහස් දීමනා පත්‍ර ලබාදීමට මහවැලි අධිකාරිය අපොහොසත්වී තිබුණි. එය ප්‍රතිශතාත්මකව සියයට 79 ක ප්‍රතිශතයක් ගෙන	2023	දීමනා පත්‍ර ලබාදීමට කටයුතු කළයුතුය.	ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ බැහැර කරන ලද ඉඩම් සඳහා ප්‍රදානපත්‍ර ලබාදීමට ප්‍රතිශතයක් වශයෙන් සියයට 35 ක ප්‍රමාණයක් සඳහන්ව ඇත. විවිධ ගැටළු තත්ත්වයන් නිසා ප්‍රදානපත්‍ර ලබාදීමට නොහැකිව ඉතිරි වී ඇත. අවිධිමත් ලෙස අන්සතු කිරීම, සංවර්ධනය කර නොතිබීම, නීතිමය ගැටළු, පවුල් ආරවුල්, ඉඩම් අයිතියේ ගැටළු මේ සඳහා හේතුවී ඇත. දීමනා පත්‍රයක් ලබාදීම සඳහා 2023 වර්ෂයේ අවසන් කාර්තුවේ සිට ක්‍රියාකරමින් ඇත.ඒ අනුව සියළුම මහවැලි ඉඩම් කොටස් සඳහා එකී දීමනාපත්‍ර ලබාදිය යුතුව ඇත.රජයේ ඉඩම් ආඥාපනත යටතේ දීර්ඝකාලීන බදුකර ලබාදීම සඳහා බදු කරුවන් විසින් භියකින් තොරව බදු ගෙවා තිබීම,අදාල ඉඩම් කොටස් මැන මායිම්	ඉඩම් ලබාදීමේ යාන්ත්‍රණය කාර්යක්ෂම කිරීම සඳහා කටයුතු කර නොමැත.

	තිබුණි.			ගල් දමා පිඹුරුපත් පිළියෙල කර මිනින්දෝරු දෙපාර්තමේන්තුව මඟින් රේඛා චිත්‍ර ලබා ගැනීමෙන් අනතුරුව හා තක්සේරු දෙපාර්තමේන්තුව වෙතින් තක්සේරු වටිනාකම් ලබා ගෙන බදුකර ලබාදීම සිදු කරනු ලබයි .මෙම කාර්යයේදී ඒ සඳහා සැලකිය යුතු කාලයක් ගත වේ.	
05.	ඒකාබද්ධ මුල්‍ය ප්‍රකාශන අනුව ආයෝජන ව්‍යාපෘතිවලින් 2023 දෙසැම්බර් 31 දිනට අයකරගත යුතු වූ බදු මුදල රු.165,524,701ක්වූ අතර ඉන් රු.22,993,596 ක් වසර 05කට අධික කාලයක සිට අයකර ගැනීමට නොහැකිව තිබුණි.	2023	හිඟ බදු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.	මේ පිළිබඳ විශ්ලේෂණයක් සිදුකර ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරමි.	හිඟ බදු මුදල් අයකර නොමැත.
06.	මහවැලි සී කලාපයේ වැව් රක්ෂිත ආශ්‍රිතව අක්කර 137.175 ක පුද්ගලයින් 219 ක් උපරිම වසර 40 දක්වා කාලයක් තිස්සේ ද, වික්ටෝරියා කලාපයේ ජලාශ රක්ෂිත ආශ්‍රිත අක්කර 23 ක පුද්ගලයින් 237 ක් උපරිම වසර 30 දක්වා කාලයක් තිස්සේ ද, වලව කලාපයේ වැව් හා ජලාශ රක්ෂිත ආශ්‍රිතව අක්කර 645 ක පුද්ගලයින් 1,042 ක් උපරිම වසර 45 දක්වා	2022 2023	අධිකාරිය සතු සංවේදී ප්‍රදේශ ආරක්ෂා කළයුතුය.	ප්‍රධාන වේලි හා ජලාශ මෙහෙයුම් අංශය ජලාශ රක්ෂතවල අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීමේ කටයුතු වලට අදාලව නෛතිකව ක්‍රියාමාර්ග ගනිමින් සිටින අතර, 2024 මැයි 20 දින සිට මේ දක්වා අනවසර පදිංචිකරුවන් 13 ක් ඉවත් කිරීම සඳහා නඩු කටයුතු වලට එළඹ ඇති බව සඳහන් කරමි.	අනවසර පදිංචිවීම් හා පදිංචිවී සිටින පිරිස ඉවත් කිරීමට ප්‍රමාණවත් උත්සාහයක් ගෙන නොමැත.

	කාලයක් තිස්සේද අනවසරයෙන් ස්ථිර බෝග හා බෝග වගා කරමින්, ස්ථිර ගොඩනැගිලි ඉදිකරමින් භුක්ති විඳිමින් පැවතුණ මෙම අනවසර භාවිතකරුවන් ඉවත් කිරීමේ ක්‍රියාවලිය අධිකාරිය තුළ මන්දගාමී ස්වරූපයකින් ක්‍රියාත්මකව තිබුණි.				
07.	මහනුවර දිස්ත්‍රික්කයේ කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් ගැටඹේ ග්‍රාම නිලධාරී වසම තුළ මහවැලි ගඟට මැදිවන ලෙස පිහිටා ඇති දූපත තුළ අක්කර 01 යි රූඩ් 01 පර්චස් 36 ක් පමණ භූමි ප්‍රදේශයක පුද්ගලික පාර්ශවයක් විසින් අවන්හලක් පවත්වාගෙන යනු ලබයි. මෙම දූපත පිහිටි ප්‍රදේශය වරාතැන්න හක්කිඳ පාරිසරික ආරක්ෂණ කලාපය තුළ පිහිටි පුද්ගලික අවන්හල විගණිත දින වන 2024 මාර්තු 22 දක්වා එම රක්ෂිතයෙන් ඉවත් කර නොතිබුණි.	2023	අධිකාරිය සතු සංවේදී කලාප හා ප්‍රදේශ ආරක්ෂා කළයුතුය.	මධ්‍යම පරිසර අධිකාරිය මෙම අවන්හල පාරිසරික ආරක්ෂණ ප්‍රදේශය ප්‍රකාශයට පත් කිරීමට පෙර සිට පවත්වාගෙන ආ ව්‍යාපාරික ස්ථානයක් බැවින්, අවන්හල පවත්වාගෙන යාම සඳහා ඉඩම් බදු දීමට කමිටු අනුමැතියක් නොමැතිව මහවැලි අධිකාරියේ නෛතික ප්‍රතිපාදන මත අවන්හල පවත්වාගෙන යාම සඳහා තාක්ෂණික නිර්දේශ හා කොන්දේසි පැනවීම මගින් අවන්හල බදු පදනම මත ලබාදීමට අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාදී ඇත.	පාරිසරික ආරක්ෂණ කලාපය තුළ පිහිටි පුද්ගලික අවන්හල ඉවත් කර නොමැත.
08.	වලව කලාපයේ මයුරපුර කොට්ඨාශයේ හෙක්ටයාර 20.2343 ක ප්‍රමාණයක් පස් කැපීමේ ව්‍යාපෘතියක් සඳහා පුද්ගලික සමාගමක් වෙත 2016 වර්ෂයේදී බැහැර	2023 – 3.2 (ජ) (i)	හිඟ ඉඩම් පරිහරණ ගාස්තු අයකර ගැනීම සඳහා නීති ප්‍රකාරව කටයුතු කළයුතුය.	නේවාසික ව්‍යාපාර කළමාණාකාර (වලව) අදාළ ආයතනය වෙත හිඟ ඉඩම් පරිහරන ගාස්තු ගෙවීම් කරන ලෙස දන්වා යවා ඇත. නමුත් මෙතෙක් එම	හිඟ භූමි පරිහරණ ගාස්තු අයකර නොමැත.

	කර තිබුණි. මෙම ආයතනය 2016 දෙසැම්බර් 20 දින සිට 2017 දෙසැම්බර් 19 දක්වා කාල වකවානුව තුළ පස් කියුබ් 66,012 ක් කැනීම වෙනුවෙන් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය වෙත රාජ්‍යභාග ගෙවා තිබුණද, අධිකාරියට ගෙවිය යුතු ඉඩම් පරිහරණ ගාස්තු රු.51,533,440 ක් විගණිත දින වන 2024 මාර්තු 19 දක්වා අයකර කර ගෙන නොතිබුණි.තවද, එකඟවූ පරිදි අදාළ භූමිය පුනරුත්ථාපන කටයුතු සිදුකර ද නොතිබුණි.			මුදල් ගෙවීම පැහැර හැර ඇති බැවින් ඊට අදාළ නෛතික කටයුතු සිදු කරනු ලබයි.	
09.	කැනීම් බලපත්‍ර දීර්ඝ කරනු ලබන අවස්ථාවන්හීදී පෙර වර්ෂයේ හිඟ ගාස්තු ගණනය කර එය අයකර ගැනීමෙන් පසු නව බලපත්‍රයක් නිකුත් කිරීමේ විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබීම හා වගකිවයුතු නිලධාරීන් අදාළ හිඟ ඉඩම් පරිහරණ ගාස්තු යාවත්කාලීනව අයකර ගැනීම නොසලකා හැරීම මත 2019 වර්ෂය අවසන් වන විට අධිකාරියට අය වියයුතු හිඟ ඉඩම් පරිහරණ ගාස්තු රු.1,898,907,760 ක් වී තිබුණි.	2022 2023	වගකීම් පැහැර හරින ලද නිලධාරීන්ට විනය ක්‍රියාමාර්ග ගෙන රජයට වූ අලාභය අයකර ගත යුතුය.	පිළිතුර නොගැලපේ.	හිඟ ගාස්තු අයකර නව බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රමවේදයක් හෝ විනය ක්‍රියාමාර්ග ගෙන නොමැත.

10.	2020 දෙසැම්බර් 14 දිනැති අංක අමප/20/1852/317/012 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් කළුගල් ව්‍යාපාරිකයින්ගෙන් අයවිය යුතු හිඟ ඉඩම් පරිහරණ ගාස්තු මුදලින් සියයට 75 ක් කපා හැරීමටත්, ඉතිරිය වාරික 36 කින් අයකර ගැනීමටත් ඉඩකඩ සලසාදී තිබුණි. ඒ අනුව සී, එච්, එල් හා වලව කලාපවලින් කපා හරින ලද රු.1,424,180,320ක මුදල අධිකාරියට අයකර ගත හැකිව තිබූ ආදායමක් බවත්, අධිකාරියේ ආදායම් එකතු කිරීමේ නිලධාරීන්ගේ හා අධීක්ෂණ නිලධාරීන්ගේ දුර්වල හා අකාර්යක්ෂම රාජකාරී ඉටුකිරිම හේතුවෙන් මෙම මුදල් අධිකාරියට අහිමිව තිබූ බවත් වැඩිදුරටත් නිරීක්ෂණය විය.	2022 2023	වගකීම් පැහැර හරින ලද නිලධාරීන්ට විරුද්ධව විනය ක්‍රියාමාර්ග ගතයුතු අතර, රජයට වූ අලාභ අයකර ගැනීමට කටයුතු කළයුතුය.	කර්මාන්තකරුවන්ගේ හිඟ මුදලින් සියයට 25 ක් වසර 03 ක් තුල මාසික වාරික 36 කින් අය කිරීමට ලබාදුන් අමාත්‍ය මණ්ඩලය අනුමැතිය හේතුවෙන් විමසුමේ දක්වා ඇති හිඟ ඉඩම් පරිහරණ ගාස්තු අයකර ගත නොහැකි විය. ආමාත්‍ය මණ්ඩල තීරනය ප්‍රකාරව සියයට 25 ලෙස ගණනය කරන ලද හිඟ ඉඩම් පරිහරණ ගාස්තු අයකර ගනිමින් පවතී.	විනය ක්‍රියාමාර්ග ගෙන නොමැත.
11.	හිඟ මුදල් ගෙවීමට කැනීම්කරුවන්ට ලබා දුන් සහන කාලසීමාව 2023 දෙසැම්බර් 31 දින වනවිට අවසන්ව තිබුණු නමුත්, කැනීම්කරුවන් 65 කගෙන් රු.298,362,829 ක මුදලක් 2024 මැයි 20 දින වනවිටත් අයකර ගෙන නොතිබුණි. මේ පිළිබඳ වැඩිදුර පරීක්ෂාවේදී කැනීම්කරුවන් 27 කගෙන් අයකර ගතයුතු	2022 2023	කැනීම්කරුවන්ට විරුද්ධව නීති ප්‍රකාර කටයුතු කර ගාස්තු හා ඊට අදාළ නෛතික පොළියද අයකර ගත යුතුය.	ඉඩම් පරිහරණ ගාස්තු ගෙවන ලෙස ලිඛිතව ආයෝජකයින් දැනුවත් කිරීම කලාප මට්ටමින් සිදු කර ඇති අතර, නීතිමය ක්‍රියාමාර්ග සඳහා එළඹීම සඳහා එන්තරවාසි යොමුකිරීමද සිදු කර ඇත. එසේ යොමුකළ ද ගාස්තු ගෙවීමට යොමු නොවූ ආයෝජකයින්ට ඉදිරි පියවර ගැනීම 1982 අංක 12 දරණ පොදු	හිඟ මුදල් අයකර නොමැත.

රු.69,423,300 ක මුදලින් කිසිදු මුදලක් අයකර ගෙන නොතිබුණු අතර, ඉහත ලබාදුන් සහනය අවභාවිතා කරමින් කැනීම්කරුවන් 38 දෙනෙකු ගෙවීමට ඇති මුදලින් ඉතා සුළු මුදලක් පමණක් ගෙවීම් කර නැවත කැනීම් ආරම්භ කර තිබුණි. එම කැනීම්කරුවන් ගෙවිය යුතුවූ රු.373,612,647 ක මුදලින් විගණිත දින වන විට රු.228,939,529 ක මුදලක් අයකර ගතයුතුව තිබුණි.එය ඔවුන්ගෙන් අයවීමට ඇති මුදලින් සියයට 61 ක් වී තිබුණි.ඉහත අමාත්‍ය මණ්ඩල තීරණය තුළින් රජයට ලැබිය යුතු ඉඩම් පරිහරණ ගාස්තු මුදලින් සියයට 75 ක් අත්හැරීමටත් ඉතිරිය වාරික 36 කින් ගෙවීමටත්, එම හිඟ මුදල සඳහා කිසිදු පොලියක් අය නොකිරීමටත් වැනි සහන ලබාදීමෙන් පසුත් එම හිඟ මුදල් නොගෙවන ව්‍යාපාරිකයින්ගෙන් එම හිඟ මුදල් අයකර ගැනීම සඳහා විගණිත දින වනවිටත් නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. 2023 අගෝස්තු 10 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී නිසි පරිදි ගෙවීම් නොකරන ආයෝජකයින්ට එරෙහිව දේපළ විෂයෙහිලා සිදු කරනු ලබන වැරදි පිළිබඳව පනත යටතේ නඩුපැවරීමට අදාළ පැමිණිලි ඒ ඒ ගල්වල පිහිටි ප්‍රදේශයේ පොලිස් ස්ථානයේ පැමිණිලි යොමු කිරීමට කටයුතු කර ඇත.

	කඩිනමින් පොදු දේපල පනත යටතේ නඩු පවරන ලෙස උපදෙස් දෙනු ලැබූවත් ඒ අනුව නඩු පැවරීමට කටයුතු කර ද නොතිබුණි.				
12.	2019 පෙබරවාරි 21 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේදී වැලි කැනීම්වල පරිසර හානි අවම කිරීමට මහවැලි ගඟ දෙපස මීටර 60 ක රක්ෂිත මායිම් සලකුණු කිරීමට එකඟවී තිබූ අතර, ඒ සඳහා 2018 වර්ෂයේ රු.1,000,000 ක් 2019 වර්ෂයේ රු.612,300 ක් ද ලෙස එකතුව රු.1,612,300 ක මුදලක් ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවට ගෙවා තිබූ නමුත්, විගණිත දින වූ 2024 මැයි 10 දක්වා මැනීම් කටයුතු හෝ රක්ෂිත මායිම් සලකුණු කිරීම සිදුකර නොතිබුණි.	2022 2023	රක්ෂිත මායිම් සළකුණු කිරීමේ කාර්යය කඩිනමින් නිම කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගතයුතුය.	මහවැලි ගඟ දෙපස මීටර් 60 රක්ෂිත ප්‍රදේශය මූලික මැණුම් කටයුතු මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් 2019 වර්ෂයේදී ආරම්භ කළද ඉන්පසු වර්ෂවල කොවිඩ් වසංගත තත්වය,ප්‍රවාහන අපහසුතා හා වන අලින් බහුල ප්‍රදේශයක් වීම හා එම කාලයේදී ප්‍රදේශය තුළ සිදුවූ ජීවිත හානි හේතුවෙන් මැණුම් කටයුතු අවසන් කිරීමට නොහැකිවී ඇත.ඒ පිළිබඳව කරන ලද නිරන්තර ඉල්ලීම් අනුව මැණුම් කටයුතු 2024.06.24 දින නැවත ආරම්භ කර ඇත.	රක්ෂිත මායිම් සළකුණු කිරීම අවසන් කර නොමැත.
13.	අධිකාරිය විසින් කුඩා පරිමාණ ජලවිදුලි බලාගාර ඉදිකිරීමට ආයෝජකයින් තෝරා ගැනීම සහ ඊට සුදුසු ස්ථාන 20 ක් හඳුනා ගැනීමට 2011 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා රු.1,297,533 ක් වැයකර තිබුණද, ඉන් ව්‍යාපෘති 10 ක් විගණිත දින එනම් 2024 අප්‍රේල් 28 දින දක්වා අවසන් කිරීමට	2022 2023	ව්‍යාපෘති ශක්‍යතා අධ්‍යයන කර ආයෝජකයින් හා සුදුසු ස්ථාන හඳුනාගෙන ක්‍රියාත්මක කළ යුතුය.	2011 වර්ෂයේ තෝරාගන්නා ලද ස්ථාන 20 අතරින් 2024.09.30 දිනට ප්‍රගතිය දක්වා ඇත.	ව්‍යාපෘති නිමකර නොමැත.

	නොහැකිවී තිබුණි.				
14.	උක්ත විදුලි බලාගාරවලට අමතරව අධිකාරිය විසින් නියාමනය නොකරන නමුත්, මහවැලි විශේෂ බලප්‍රදේශ තුළ විදුලි ජනනයේ යෙදී සිටින කුඩා පරිමාණයේ ජල විදුලි බලාගාර 65 කින් ජල පෝෂක ප්‍රදේශ කළමනාකරණ ගාස්තුව අයකර ගැනීම සඳහා විධිමත් ගිවිසුම්වලට එළඹ නොතිබුණි.	2022 2023	ජල විදුලි බලාගාරවල ජල පෝෂක ප්‍රදේශ කළමනාකරණ ගාස්තු අයකර ගැනීමට සුදුසු ක්‍රමවේදයන් හඳුන්වා දිය යුතුය.	මෙම කුඩා පරිමාණ ජල විදුලි බලාගාර ඉදිකර ඇති ප්‍රදේශ මහවැලි ගැසට් බල ප්‍රදේශ තුල පිහිටා තිබුණද එම ප්‍රදේශ පරිපාලනය කරනු ලබනුයේ අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන් හෝ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව යටතේය .ඒ අනුව, ව්‍යාපෘති ආරම්භ කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමේදීද එකී කාර්යාලවෙතින් අනුමැතිය ලබාගෙන ඇත.මෙම බලාගාර සඳහා වසර 15 ක කාලයක් වලංගු වන පරිදි පරිසර ආරක්‍ෂණ බලපත්‍රය නිකුත් කර ඇති අතර එකී බලපත්‍රය යාවත්කාලීන කිරීමේදී මහවැලි අධිකාරියට මෙම ව්‍යාපෘති සඳහා නැවත මැදිහත් වීමට හැකියාව ලැබෙන බැවින් ඉදිරියේදී මේ පිළිබඳව කටයුතු කිරීමට සහ සුදුසු පරිදි ගිවිසුම්ගත වීමට බලාපොරොත්තු වේ.	ජල පෝෂක ප්‍රදේශ කළමනාකරණ ගාස්තු අයකර විධිමත් ගිවිසුම්වලට එළඹ නොතිබුණි.
15.	භූමිය මත පිහිටි හා පාවෙන සූර්ය විදුලි බලාගාර ඉදිකිරීම සඳහා සුදුසු ස්ථාන හඳුනාගෙන සූර්යය බලශක්ති ආයෝජන ව්‍යාපෘති ස්ථාපනය කිරීම	2023	ඉඩම් ලබාදීමේ පරමාර්ථ,සංවර්ධනය පසු විපරම හා සංවර්ධනය නොකරන	මෙම ව්‍යාපෘති සඳහා නිසි බලධාරියා ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය වේ. සූර්ය බලශක්ති ව්‍යාපෘතියක් ඇරඹීමේදී මුලින්ම ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති	එකඟවූ පරිදි සංවර්ධන කටයුතු ඉටුකර නොමැති ඉඩම් නැවත පවරා ගෙන නොතිබුණි.

	වෙනුවෙන් අධිකාරිය විසින් හෙක්. 692.6 ක භූමි ප්‍රදේශයක් විගණිත දින වූ 2024 අප්‍රේල් 28 වනවිට ආයෝජකයින් 33 දෙනෙකු වෙත බදුදීම සඳහා වෙන්කර දී තිබුණි. එසේ වුවද විගණිත දින වූ 2024 අප්‍රේල් 28 වනවිට ඉන් විදුලි ජනනයේ යෙදී සිටියේ ආයෝජකයින් 08 දෙනෙකු පමණි. ව්‍යාපෘති ආරම්භ නොකළ ඉඩම් වෙනත් ආයෝජකයින් වෙත ලබාදීමට ද කටයුතු කර නොතිබුණි.		ඉඩම් නැවත පවරා ගෙන සුදුසු කාර්යයන් සඳහා භාවිතා කළයුතුය.	අධිකාරිය වෙතින් මූලික එකඟතාව ගෙන අනතුරුව අදාල පරිසර අනුමැතිය ලබාගැනීම අනිවාර්ය වේ. තවද, නිපදවනු ලබන විදුලිය මිලදී ගැනීම සඳහා ලංකා විදුලිබල මංඩලය එකඟ විය යුතු අතර ඒ අනුව විදුලිය මිලදී ගැනීම සඳහා ගිවිසුම් අත්සන් කල යුතුවේ.කොවිඩ් වසංගතය සහ අනතුරුව එළඹි ආර්ථික පසුබැස්ම හමුවේ ආයෝජකයින් ඉදිරිපත් නොවීම මත මෙම කාර්යය සඳහා කල් ගතවූ නමුත් මේ වන විට සැලකිය යුතු ප්‍රගතියක් අත් කරගෙන ඇත.	
16.	සී කලාපයේ ආයෝජන ව්‍යාපෘති සඳහා බැහැර කරන ලද ඉඩම් හෙක්ටයාර 85.42 ක් අවිධිමත්ව අන්සතු කර තිබුණි.	2023	අවිධිමත් ආයෝජන ව්‍යාපෘති රජයේ ඉඩම් ආඥා පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව අවලංගු කිරිමට කටයුතු කළයුතුය.	මහවැලි අධිකාරියේ අනුදැනුමකින් තොරව අවිධිමත්ව අන්සතු කර ඇති ආයෝජන ව්‍යාපෘති රජයේ ඉඩම් ආඥා පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව අවලංගු කිරීමේ කටයුතු ක්‍රියාත්මක කරමින් පවතී.	ඉඩම් අවලංගු කිරීම කර නොමැත.
17.	වලව කලාපයේ ආයෝජන ව්‍යාපෘති වෙනුවෙන් බැහැර කර තිබූ ඉඩම් අක්කර 206 ක් විගණිත දින වූ 2024 මැයි 10 වනවිට බැහැර කර වසර 02 ත් 11 ත් අතර කාලයක් ගතවී තිබුණද	2022 2023	පූර්ණ අසංවර්ධිත ව්‍යාපෘති අවලංගු කර ඒ සඳහා එම ඉඩම් ආපසු ලබාගැනීම කළයුතුය.	ආයෝජකයින්ගේ බදු අනුමැතිය අවලංගු කර ඌන උපයෝගී ඉඩම් මහවැලි අධිකාරිය සතුකර ගැනීමට කටයුතු කරමින් පවතී. මීට අමතරව චන්ද්‍රිකාවැව කොට්ඨාසයේ 2022	අසංවර්ධිත ව්‍යාපෘති ඉඩම් අවලංගු කර නොමැත.

	කිසිදු සංවර්ධනයක් කර නොතිබූ අතර බදු ගිවිසුම් අවලංගු කිරිමටද කටයුතු කර නොතිබුණි.			වර්ෂයේදී ලබා දී ඇති නව ආයෝජන ඉඩම් බෙදා දීමක් සිදු කළද ඉඩම් භාරගත් ආයෝජකයින් විසින් එම ඉඩම්වල සංවර්ධන කටයුතු සිදු කර නොමැති බැවින් බදු මුදල් ගෙවා සංවර්ධන කටයුතු සිදුකරන ලෙස ලිඛිතව දැනුම් දී ඇති අතර ඉදිරියේදී මෙම අයගේ බදු අනුමැතිය අවලංගු කිරීමට අදාළ කටයුතු සිදු කරනු ලැබේ.	
18.	පේර වගාව සඳහා ලබාදුන් අක්කර 10 ක පමණ භූමි ප්‍රමාණය බදුකරු විසින් වගා නොකර පසුව පුද්ගලික සමාගමක් වෙත රු.ලක්ෂ 30 කට අනීතිකව විකුණා එම අක්කර 10 ට අමතරව තවත් යාබදව පවතින අක්කර 8 ක පමණ ප්‍රමාණයක් එම සමාගම සිය වගා කටයුතු සඳහා යොදා ගෙන තිබුණි.	2023	ආයෝජකයින් ගේ බදු අයිතිය අවලංගු කර හිඟ බදු මුදල් අයකර ගත යුතුය	පේර වගාව සඳහා ලබා දුන් අක්කර 10 ක පමණ භූමි ප්‍රමාණයට අමතරව තවත් අක්කර 08 ක පමණ ප්‍රමාණයක් අනවසරයෙන් වැඩිපුර වගා කටයුතු සඳහා යොදවා ගෙන මෙම අය විසින් ඉඩම මහවැලි අධිකාරිය වෙත භාර දි එයින් ඉවත් නොවීම හේතුවෙන් සන්තකය ආපසු ලබා ගැනිමේ පනත යටතේ ඉදිරි නෛතික කටයුතු සිදුකරගෙන යනු ලැබේ.	බදු අයිතිය අවලංගු කර හිඟ බදු මුදල් අයකර ගැනීම කර නොතිබුණි.
19.	මෙම රක්ෂිතයේ නැගෙනහිර මායිමේ අක්කර දෙක/තුනක ප්‍රමාණයක් යම් පුද්ගලයෙකු විසින් අනවසරයෙන් භුක්ති විඳින අතර, එහි අඹ පොල් වැනි දීර්ඝකාලින වගාවන් සිදුකර තිබුණි.	2023	අධිකාරිය සතු සංවේදී ප්‍රදේශ හා කලාප ආරක්ෂා කළයුතුය.	මෙම රක්ෂිතයේ නැගෙනහිර මායිමේ අක්කර දෙකක, තුනක ප්‍රමාණයක් යම් පුද්ගලයෙකු විසින් අනවසරයෙන් භුක්ති විඳින අතර, එහි අඹ, පොල් වැනි දිර්ඝකාලින වගාවක් සිදු කර ඇති	අධිකාරිය සතු සංවේදී ප්‍රදේශ ආරක්ෂා කිරීම කර නොමැත.

	තඹුත්තේගම කොට්ඨාශ කළමනාකරු විසින් මේ සම්බන්ධයෙන් නේවාසික ව්‍යාපාර කළමනාකරු දැනුවත් කර තිබූ නමුත්, විගණිත දින වන 2024 මාර්තු 25 දක්වා එම අනවසර වගාකරු ඉවත් කිරීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි.			අතර එම අනවසරකරු ඉවත් කිරීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීමට කටයුතු කරමි.	
20.	1995 ජූලි 17 වෙනි දින එක් පුද්ගලික සමාගම වෙත බැහැර කර තිබූ මු.පි.මහ 4971 ඉඩමේ කැබලි අංක 03 හා 05 දරන ඉඩම් කොටස් එම සමාගම විසින් බිස්කට් සමාගමක් වෙත අවිධිමත්ව අන්සතු කර තිබුණු අතර, බදු මුදල් ගෙවීමද පැහැර හැර තිබුණි. මේ හේතුවෙන් 2019 නොවැම්බර් 06 දින අධ්‍යක්ෂ ජනරාල් විසින් එකී තේරීම්ලාභීත්වය අවලංගු කර තිබුණි. එම සමාගම 2023 දෙසැම්බර් 31 දින වනවිට ඉඩම සියයට 75 කට වැඩි එනම් පූර්ණ සංවර්ධිත තත්ත්වයකට සංවර්ධනය කර ආදායම් උපයා තිබුණද, ඉඩමේ තක්සේරුව ලබාගෙන බදු අයකිරීමට කටයුතු නොකිරීම නිසා අධිකාරියට ලැබිය යුතු ආදායම් අහිමිව තිබුණි.	2023	නව බදු ගිවිසුම්වලට එළඹීටත්, ඉඩම තක්සේරු කර හිඟ බදු අයකර ගැනීම කළයුතුය.	අවිධිමත් ලෙස භුක්ති විඳින වර්තමාන භුක්ති කරු නමින් එය විධිමත් කිරීම සඳහා පරීක්ෂණයක් පැවැත්වීමට නේවාසික ව්‍යාපාර කළමනාකරු අනුමැතිය ඉල්ලා එහෙත් ජනාධිපති ලේකම්ගේ 2022.11.11 දිනැති ලිපිය මගින් නව ඉඩම බැහැර කිරීමේ කටයුතු අත්හිටුවා ඇති බැවින් වර්තමාන භුක්තිකරු නමින් බදු අයිතිය විධිමත් කිරීම සඳහා පරීක්ෂණයක් පැවැත්වීමට අනුමැතිය ලබා දී නොමැත. ජනාධිපති කාර්යාලය මගින් ඉහත ලිපිය මගින් පනවා ඇති වාරණය ඉවත් කල පසු වර්තමාන භුක්තිකරු නමින් බදු අයිතිය විධිමත් කිරීම සඳහා ඉදිරි කටයුතු කල හැකි බව වාර්තා කරමි.	නව බදු ගිවිසුම්වලට එළඹී හිඟ බදු අයකර ගැනීමටත් කටයුතු කර නොතිබුණි.

21.	වැනිලා, ගම්මිරිස්, කුරුඳු හා ඉඟුරු ආශ්‍රිත නිෂ්පාදන සැකසුම් මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම සඳහා කොත්මලේ කඩදොර ජනාවාසයේ හෙක්ටයාර 0.226 යුත් ඉඩමක් පුද්ගලික සමාගමක් වෙත 2021 ජනවාරි 05 දින භාරදී තිබුණි. එසේ වූවද ඉඩම හෝ ගොඩනැගිලි සඳහා තක්සේරුවක් ලබාගෙන අධිකාරියට අය වියයුතු ආදායම් අයකර ගෙන නොතිබුණි.	2023	බදු ගිවිසුම්වලට එළඹීමටත්, ඉඩම තක්සේරු කර හිඟ බදු අයකර ගැනීමටත් කටයුතු කළයුතුය.	මෙම ආයෝජකයා වෙත අපනයන බෝග සැකසුම් කිරීමේ කර්මාන්තශාලාවක් ස්ථාපනය කිරීමට හැකිවන පරිදි ඉඩමේ භුක්තිය භාරදී ඇත. නමුත් බදු අයකිරීමට විධිමත් රජයේ තක්සේරුවක් හෝ විධිමත් අනුමැතියක් ද ලැබී නොමැත. නමුත් මේ අය ඉඩම භුක්ති විදින බැවින් හා රජයට ගාස්තු අය නොවන බැවින් දළ තක්සේරුව ලබා ගැනීමට කමිටුවක් පත් කර ඉදිරි කටයුතු සිදුකරමින් පවතී.	බදු ගිවිසුම්වලට එළඹ නොමැත.
22.	අධිකාරියට අයත්ව තිබූ දිගන විලේජ් රිසෝට් 1993 ජුනි 01 දින පුද්ගලික සමාගමකට අවබෝධතා ගිවිසුමකින් අක්කර 07 ක ඉඩම සහ සියලු ගෘහ භාණ්ඩ හා උපකරණ ඇතුළත් ප්‍රධාන ශාලා ගොඩනැගිල්ල, පිහිනුම් තටාකය, ක්‍රීඩා කාමර, නවාතැන් කාමර සහිත පරිශ්‍රය පවරාදී තිබුණි. ආයෝජක පාර්ශවය නීත්‍යානුකූලව ලබාදුන් ප්‍රමාණයට අ මතරව තවත් අක්කර 03 ක පමණ ප්‍රදේශයක්ද භුක්ති විදීමට කටයුතු කර තිබුණි.2005 වර්ෂයේදී සමාගම වැඩිපුර භුක්ති විදින ඉඩම් කොටස් බෙදා වෙන් කිරීමට අධිකාරිය	2023	මෙම පරිශ්‍රය නැවත පවරාගෙන නැවත බදුදීම් කළයුතුය. මෙම පරිශ්‍රයේ ප්‍රමාණවත් ආරක්ෂාවක් යෙදවීමටත්,අ ලාභය සඳහා වගකිවයුතු පාර්ශව හඳුනා ගැනීම කළයුතුය. හිඟ කුලී මුදල් අයකර ගතයුතුය.	මහවැලි අධිකාරියේ මූලික විරෝධතාව පිළිගනිමින් පැමිණිලිකරුගේ නඩුව නිෂ්ප්‍රභා කර ඇත. එම තීන්දුව අනුව මෙම පරිශ්‍රයේ භුක්තිය ලබා ගැනීමට නොහැකි බැවින් පරිශ්‍රයේ අනවසරකරුවන් නිල නිවාසය ඒ වන විට අතහැර දමන ලද නිල නිවාස වල සන්තකය අධිකාරිය වෙත භාරගැනීමට කටයුතු කරන ලදී. එලෙස භාර නොදුන් නිල නිවාස සහ නිවාඩු නිකේතන සඳහා 2023.01.28 දින රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබා ගැනීමේ) පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව තෙල්දෙණිය	ආරක්ෂාව හා අලාභහානි හඳුනාගෙන නොමැත.

කටයුතු කිරීමේදී ඉහත සමාගම විසින් නීතිමය ක්‍රියාමාර්ග ගෙන තිබුණු අතර, 2022 නොවැම්බර් 21 දිනැති නඩු තීන්දුව අනුව 2023 පෙබරවාරි 26 දින හෝ එදිනට පෙර නියමිත පරිදි පරිශ්‍රය අධිකාරිය වෙත භාරදිය යුතු වුවත්, විධිමත්ව දේපල නැවත භාරදීමකින් තොරව පරිශ්‍රයෙන් ඉවත්වී ගොස් තිබුණි.විගණිත දින වූ 2024 මාර්තු 22 වන විට අදාළ පරිශ්‍රයේ මෙහෙයුම් කටයුතු නතරවී වසරක් ගතවී ඇති අතර, පරිශ්‍රය තුළට ඇතුළුවීමට නොහැකි තරමට කැලෑ වැවී වල්බිහිවී ඇති අතර පරිශ්‍රය ඇතුළු අනිකුත් දේපල ආරක්ෂාව සඳහා ප්‍රමාණවත් වැඩපිළිවෙලක් යොදා නොතිබුණි.

ආයෝජනයෙන් එකඟ වූ ප්‍රතිලාභ ලැබී නොතිබුණු අතර, ආයෝජිත පාර්ශවය 1993 වර්ෂයේ සිට වසර 20 ක කාලයක් මෙම පරිශ්‍රය බාහිර පුද්ගලයන් හා ආයතන වෙත විවිධ උත්සව කටයුතු සහ නේවාසික පහසුකම් සඳහා ලබාදී ආදායම් උපයා තිබුනද, අධිකාරිය වෙත කිසිදු මුදලක් නොගෙවා ලැබිය යුතු ලෙස ගණනය කර ඇති හිඟ කුලී මුදල රු.4,500,000 ක් විය.

මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරා නඩු 03 කට අදාළ සන්තකය මේ වන විට අප අධිකාරිය වෙත පවරා ගෙන ඇති අතර 78086 සහ 78087 දරණ නඩුවල නියෝග 2024.10.18 දින ලබා දීමට නියමිතව ඇත.

මෙම පරිශ්‍රයේ චිත්‍රාගාරයක් පිහිටුවීමට යෝජනාවක් ඉදිරිපත් වී ඇති බැවින් ජනධිපති කාර්යාලයේ පූර්ව අනුමැතියකින් තොරව බැහැර නොකරන ලෙස දන්වා 2023.11.03 දිනැතිව නැවත අනවසරකරුගෙන් සමාගම වෙත අවුරුදු 30 කට බදු දීම සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කරන ලෙස දැනුම් දී ඇතත් අධිකාරිය වෙත විධිමත්ව පවරා ගැනීමට කටයුතු කරමින් පවති.

මෙම පරිශ්‍රය අධිකාරියට විධිමත්ව භාරදී නොමැති හෙයින් මෙම පරිශ්‍රයට නීත්‍යානුකූලව ඇතුළුවීමට නොහැකි බැවින් සිදුවී ඇති අලාභ හානිය තක්සේරු කිරීමට නොහැකිව ඇත. තවද මෙම ස්ථානයේ ආරක්ෂාව සඳහා මහවැලි ආරක්ෂක බලකාය යොදවා ඇත. මේ වන විට ආරක්ෂාව සපයා ඇත.

23.	කොත්මලේ ප්‍රදේශයේ පිහිටි අධිකාරියේ නිල නිවසක්, කොත්මලේ කඳවුරු භූමියේ ඇති ගොඩනැගිල්ලක් හා දොරගල වතු බංගලාව ඇතුළු ගොඩනැගිලි සහිත හෙක්ටයාර 1.311 ක පමණ වන ඉඩම අවස්ථා කිහිපයකදී ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව වෙත ලබාදී ඇතත් විධිමත් බදු ගිවිසුමක් ගොඩනැගිලි වෙනුවෙන් රජයේ තක්සේරුව ලබාගෙන නොතිබුණි. ගොඩනැගිලි භාරදීමේදී ඒවායේ ඇති භාණ්ඩ සම්බන්ධ භාණ්ඩ වට්ටෝරු ලේඛන කිසිවක් යාවත්කාලීන කර ගොනුවට ඇතුළත් කර නොතිබුණි. මෙම ගොඩනැගිලි සියල්ල අතුරින් 57 බී දරන නිල නිවසින් පමණක් මාසිකව රු.3,000 ක කුලී මුදලක් අයවන අතර, අනිකුත් කිසිදු ගොඩනැගිල්ලකින් අධිකාරියට කිසිදු කුලී මුදලක් විගණිත දින වන 2024 මාර්තු 22 දක්වා අයවී නොතිබුණි. මෙම දේපල මූල්‍ය ප්‍රකාශනවල ආයෝජන දේපල ලෙසද ලැබිය යුතු කුලී මුදල් හිඟ ආදායම් ලෙසද හඳුනා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි.	2023	කුලී ගිවිසුමකට එළඹී රජයේ තක්සේරු මත එම ගොඩනැගිලි කුලියට ලබාදී භාණ්ඩ වට්ටෝරු ලේඛන පිළියෙල කර හිඟ කුලී මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් කළයුතුය.	විධිමත් බදු ගිවිසුමක් නොමැතිව නේවාසික ව්‍යාපාර කළමණාකාරවරයකුගේ අත්සනින් කොන්දේසි සහිතව ඉඩම් භාර දීම ඇත. මෙම ගොඩනැගිලි භාර දීමේ දී ගොඩනැගිලි විස්තර ලබා ගෙන ඇතත් භාණ්ඩ වට්ටෝරු ලේඛණයක් නොමැත. ඉදිරියේදී මෙම ගොඩනැගිලි තුල පවතින භාණ්ඩ වට්ටෝරුගත කිරීමට කටයුතු කරමි. අංක 57 බී දරණ නිල නිවාසය සඳහා මසකට රු.3,000 ක් බැගින් ද පැරණි වතු බංගලාව සඳහා මසකට රු.10,000 බැගින් ද අය කිරීමට ගිවිසුම් සකස් කර ඇත.	ගොඩනැගිලි කුලියට දීමේදි බදු ගිවිසුම්වලට එළඹ නොතිබුණි.
24.	බකමූණ බස් නැවතුම්පොල ඉදිකිරීම කොන්ත්‍රාත් ගිවිසුම අනුව	2022 2023	සැලසුම් කළ කාර්ය නිම කිරීමට	ඉදිකිරීම් අමුද්‍රව්‍ය මිල ගණන් වල සිදු වූ සීඝ්‍ර වර්ධනය හා රට තුල	ඉදිකිරීම් ආරම්භ කර නොතිබුණි.

	2022 අප්‍රේල් 04 දින නිම කළයුතු වූවත්, 2024 අප්‍රේල් 28 දින දක්වා එහි ඉදිකිරීම් අවසන් කර නොතිබුණු අතර, ඉදිකිරීම් අත්හැර දමා තිබුණි.		කටයුතු කළයුතුය.	ඇති වූ ආර්ථික අර්බුදය හමුවේ මුදල් ප්‍රතිපාදන නොමැති වීමෙන් දෙපාර්ශවයේ එකඟතාවය මත 2023.05.12 දින අවලංගු කර ඇත. ඉදිරි වැඩ කටයුතු සඳහා අදාල ඇස්තමේන්තුව සකස් කරමින් පවතින අතර, මුදල් ප්‍රතිපාදන 2025 වර්ෂයේ දී ලබාගැනීමට හැකියාව පැවතියහොත් ඉදිරි වැඩ කටයුතු නිමා කිරීමට බලාපොරොත්තු වේ.	
25.	ගල්වල යාය ප්‍රදේශයේ මහවැලි ගම්මානයේ මාර්ග සකස් කිරිම හා කුඹුරු ඉඩම් රළු මට්ටම් කිරීම සඳහා රඹකැන්ඔය නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යලය විසින් අම්පාර වාරිමාර්ග අධ්‍යක්ෂ වෙත 2013-2014 කාලපරිච්ඡේදය තුළ අවස්ථා 05 කදී රු.මිලියන 11 ක අත්තිකාරම් ලබාදී ඇතත් එම අත්තිකාරම් මුදලින් රු.මිලියන 2.88 ක් 2024 අප්‍රේල් 28 දින වනවිටත් පියවා නොතිබුණි.	2022 2023	අත්තිකාරම් මුදල් කඩිනමින් පියවීමට කටයුතු කළයුතුය	අත්තිකාරම් නොපියවිම පිළිබඳව විටින් විට ලිඛිතව වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත දැනුවත් කර එම කාලවකවානුව තුල රළු මට්ටම් සිදුකල යාය 01 මහ යාය 05 හි තොරතුරු ලබාගත් පසු පියවීම් සිදුකල හැකි බව දන්වමි.	අත්තිකාරම් මුදල් පියවා නොමැත.

26.	එල් කලාපයේ විදුලි වැටවල් 2 ක් ඉදිකිරීම සඳහා ගෙවා තිබූ රු.මිලියන 20.8 කට අධික මුදලක් වසර 08 කට අධික කාලයක් තිස්සේ නොපියවූ ශේෂයක් ලෙස ගිණුම්වල පැවතුණි.වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ රු.11,074,476 ක මුදලක් ඉතිරිව පවතින බවට දන්වා එවා තිබූ නමුත්, එම මුදල අයකර ගැනීමට හෝ අත්තිකාරම් පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි.	2022 2023	අත්තිකාරම් පියවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකළයුතුය.	කොන්ත්‍රාත්කරු සියලුම සුදුසුකම් (ශක්‍යතාව) සපුරා ඇත. ඔහුව තෝරාගැනීමේදී ප්‍රසම්පාදන සංග්‍රහයට අනුව සිදුකර ඇත.කොන්ත්‍රාත්කරු විසින් මෙම කොන්ත්‍රාත් දෙක සඳහාම කොන්ත්‍රාත් කළමනාකරු ලෙස පොදු පුද්ගලයෙකු නම්කර තිබූ අතර අදාල කොන්ත්‍රාත් කළමනාකරු ක්ෂේත්‍රයේ සිටිය යුතු පුද්ගලයෙකු නොවන නිසා තාක්ෂණ ඇගයීම් කමිටුව සහා ප්‍රසම්පාදන කමිටුව මගින් එම යෝජනාව පිළිගන්නා ලද අතර කොන්ත්‍රාත්කරුගේ එකඟතාවය මත කොන්ත්‍රාත් කළමනාකරණ සේවාව සඳහා ගෙවිය යුතු මුදලින් සියයට 30 ක් අඩුකර කොන්ත්‍රාත්තු ප්‍රදානය සිදුකරන ලදි.	අත්තිකාරම් මුදල් පියවා නොමැත.
27.	වැලිඔය ගජබාපුර සිට නැදුන්කර්නි හන්දිය දක්වා වූ මාර්ගය ඉදිකිරීම වෙනුවෙන් රු.390,085,714 ක් 2018 වර්ෂයේදී ගෙවා තිබූ අතර, අදාළ ඉදිකිරීම් නිමකර ගෙවීම් නිරවුල් කිරීමේදී රු.43,363,909 ක වැඩිපුර ගෙවීම මාර්ග සංවර්ධන අධිකාරියෙන් අයකර ගැනීමට විගණිත දින වූ 2024 අප්‍රේල් 18	2022 2023	අත්තිකාරම් පියවා ගත යුතුය.	වැලිඔය ගජබාපුර සිට නැදුන්කර්නි හන්දිය දක්වා වූ මාර්ගය නවීකරණ කටයුතු සඳහා වැය වූ මුදල රු.346,721,805 ක් වන අතර ඉතිරි මුදල වන රු. 43,363,909 ක මුදල සඳහා වැලිඔය සම්පත්නුවර සිට ගජබාපුර දක්වා මාර්ගයේ 1.95 km ක දුරක් කාපට් අතුරා	අත්තිකාරම් මුදල් පියවා නොමැත.

	දක්වා කටයුතු කර නොතිබුණි.			සංවර්ධනය කිරීමට ආරම්භ කලද එය අතරමග නැවතී ඇත. මහවැලි අධිකාරිය වෙත ගෙවිය යුතු ඉතිරි මුදල මේ වන තෙක් ලැබී නොමැත.	
28.	කන්තලේ සූරියපුර මහවැලි ගඟේ ආරක්ෂණ වේල්ලට තර්ජනයක් වන පරිදි තැන්පත් වී ඇති වැලි නිධිය හේතුවෙන් ගංවතුර ආරක්ෂණ වේල්ල බාදනයට ලක්වී තිබුණි.වේල්ලට ප්‍රතිවිරුද්ධ ඉවුරේ තැන්පත්වී ඇති වැලි නිධිය කැනීම් කර අලෙවි කර උපයා ගන්නා ලාභයෙන් ගංවතුර ආරක්ෂණ වේල්ල ප්‍රතිසංස්කරණය කිරීමට ව්‍යාපෘතිය 2019 අගෝස්තු 06 දින ආරම්භ කර තිබුණි. ගිවිසුම අනුව තැන්පත්වී ඇති වැලි කියුබ් 103,128 ක් ඉවත් කිරීම හා ඊට සමගාමීව ගංවතුර ආරක්ෂණ බැම්ම ප්‍රතිසංස්කරණය මාස 06 ක් තුළ නිම කිරීමට එකඟවී අනතුරුව 2022 ජූලි 19 දින දක්වා අවස්ථා කිහිපයකදී මෙම ගිවිසුම දීර්ඝ කර තිබුණි.ප්‍රමුඛ කාර්යයක් ලෙස 2019 වර්ෂයේ ආරම්භ කළ මෙම ව්‍යාපෘතිය වසර 4 කුත් මාස 7 ක් ගතවී ඇතත් විගණිත දින වන 2024 මැයි 07 දක්වා නිම කිරීමට කටයුතු කර	2023	ගිවිසුම් පරිදි අදාළ කාර්යයන් නිම කිරීමට අවශ්‍ය පියවර ගතයුතුය. සංඛ්‍යාත්මක පරස්පරතාවය සඳහා වාර්තාව ලබා ගත යුතුය.	ගිවිසුම පරිදි මාස 06 ක කාල සීමාවක් තුල වැලි කියුබ් 103,128 ක ප්‍රමාණයක් ඉවත් කිරීමට හා වේලි ආරක්ෂණ බැම් 3 ඉදිකිරීමට එකඟව ඇත.එසේ නමුත් 2022 ජූලි 19 ව දින වන විට අවස්ථා කිහිපයකදී ගිවිසුම් කාල සීමාව දීර්ඝ කර ඇත. 2020, 2021 වසර වල ඇතිවූ කොරෝනා වසංගතය හා ඉන්ධන අර්බුදය අපේක්ෂිත ඉලක්ක කරා ළඟා වීමට අපොහොසත් වූ බව උක්ත සමාගම විසින් දැනුම් දී ඇත.	ඉදිකිරීම් නිමකර නොමැත.

නොතිබුණි.

29.	මහවැලි කලාප තුළ වන අලි හා මිනිස් ගැටුම් අවම කිරීම සඳහා එල්ලෙන ලෙස විදුලිවැට ඉදිකිරීමට මහවැලි අධිකාරිය හා ශ්‍රී ලංකා නව නිපයුම්කරුවන්ගේ කොමිසම එක්ව ආරම්භයේදී බී කලාපයේ අරලගංවිල, කන්දකාඩු, සිංහපුර අතර හා සී කලාපයේ මහවැලි පුහුණු මධ්‍යස්ථානය වටා ඉදිකර තිබුණි. මේ සඳහා පිළිවෙලින් රු.4,844,272 ක්, රු.9,234,319 ක් හා රු.8,000,000 ක් වශයෙන් අත්තිකාරම් ලබාදී තිබූ අතර, මෙලෙස එක් ආයතනයකට කොන්ත්‍රාත් පැවරීම හා ගෙවීම් සිදුකිරීමට අමාත්‍ය මණ්ඩල තීරණයකින් අනුමැතියක් ලබාගෙන නොතිබුණි.ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලින් බැහැරව ඉහත පරිදි කොන්ත්‍රාත් පිරිනැමීම හා වැඩ නිම කිරීමට පෙර අත්තිකාරම් ලෙස ගෙවීම් කිරීම සිදුකර තිබුණි. මෙම අලි වැටවල් නිසි පරිදි ඉදිකිරීම් කර ඇති බවට අධිකාරියේ තාක්ෂණ අංශය හෝ වෙනත් පාර්ශවයක් විසින් තහවුරු කර නොතිබීම හා නිසි පරිදි බිල්පත් ඉදිරිපත් නොකිරීම මත අත්තිකාරම් නිරවුල්	2022 2023	අවබෝධතා ගිවිසුම අනුව ඒ අධීක්ෂණ කටයුතු සිදුකර එම ඉදිකිරීම් නිමකර ගතයුතුය.	ගොවිපලවල් වටා විදුලි අලි වැට ඉදිකිරීම සඳහා රාජ්‍ය ආයතනයක් වූ “ශ්‍රී ලංකා නව නිපැයුම් කරුවන්ගේ කොමිසම” වෙත මහවැලි අධිකාරියේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශන සංග්‍රහයේ සෘජු කොන්ත්‍රාත් ක්‍රමවේදය (Direact Contracting) යටතේ ඇති 3.7.1 වගන්ති ප්‍රකාරව එම කොමිසම වෙත මෙම ඉදිකිරීම සඳහා අංක 2021/04 , 2021/04-16 හා 2021.04.23 දිනැති අනුමැතිය යටතේ ප්‍රදානය කර අදාල අත්තිකාරම් මුදල් ලබා දීම සිදු කර ඇත.	ඉදිකිරීම් නිමකර නොමැත.

	කිරීමට නොහැකිවී තිබුණි. තවද, විගණනය විසින් භෞතිකව පරීක්ෂා කළ ස්ථානවලදී මෙම අලිවැට විනාශවී ගොස් ඇති බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.				
30.	මහවැලි අධිකාරියට අයත් වලව නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලයට අනුයුක්ත කර තිබුණු අංක WP-JF 3105 දරන වාහනය 2004-2005 කාලය තුළ අනුමැතියකින් තොරව බාහිර පාර්ශවයක් වෙත ලබාදී ඇති බව ඉකුත් වර්ෂවල විගණන වාර්තා මඟින් දක්වා තිබූ නමුත්, ඒ සඳහා 2024 අප්‍රේල් 28 දින දක්වා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.	2022 2023	බාහිර පාර්ශවයන් වෙත වාහන බැහැර කිරීමේදී නිසි අනුමැතියක් සහිතව කටයුතු කළයුතුය.	මෙම කැබ් රථය අස්ථානගත විම සම්බන්ධව අමාත්‍යාංශ ලේකම් විසින් ඒ සම්බන්ධව මුදල් රෙගුලාසි 104 පරීක්ෂණ කටයුතු සඳහා කමිටුවක් පත් කර අදාල පරීක්ෂණ කටයුතු කරනු ලැබේ. මුලික විමර්ශන වාර්තාව අනුව මහවැලි සහ ගංගාධාර සංවර්ධන හා රජරට සංවර්ධන අමාත්‍යතුමාගේ පෞද්ගලික ලේකම් වන ඇස්.බී.විජේකොන් මහතා විසින් අධ්‍යක්ෂ ජනරාල් වෙත සිදුකල ඉල්ලීමකට අමාත්‍ය කාර්යය මණ්ඩලය වෙත ලබා දි ඇත. එවකට වලව කලාපයේ ප්‍රවාහන නිලධාරි ලෙස රාජකාරි සිදුකල කේ.ජී.සුගතදාස මහතා විසින් 2005.05.11 දිනැතිව නියෝජ්‍ය නේවාසික ව්‍යාපාර කළමණාකාර (තාක්ෂණ සේවා) වෙත ලිපියක් ඉදිරිපත් කර එවකට නේවාසික ව්‍යාපාර කළමණාකාරගේ	වාහනය අධිකාරිය වෙත ලබාගෙන නොමැත.

				වාචික උපදෙස් අනුව කැබ් රථය ඒ මහතා විසින් ගෙන ගොස් ගරු ඇමතිතුමාගේ පෞද්ගලික ලේකම්ගේ උපදෙස් අනුව අධ්‍යක්ෂ (ප්‍රවාහන හා නඩත්තු) ගේ තිරණය මත ආරක්ෂක නියාමක ඩබ්.පි.එදිරිවිර ජයවර්ණ මහතා වෙත විධිමත්ව භාර දි ඇත. නේවාසික ව්‍යාපාර කළමනාකාර (වලව) විසින් ප්‍රධාන ප්‍රවාහන නිලධාරි වෙත යොමු කල 2011.03.08 දිනැති ලිපිය අනුව කැබ් රථය ගරු මෛත්‍රිපාල සිරිසේන අමාත්‍යතුමාගේ කාර්යය මණ්ඩලය වෙත ලබා දි ඇති බව සදහන් කර ඇත.	
31.	2014 වර්ෂයේ සිට අක්‍රියව පැවති කොත්මලේ වේල්ලෙහි නඩත්තු කටයුතු සඳහා භාවිතා කරන ලද දොඹකර යන්ත්‍රය 2017 දෙසැම්බර් 29 දින අලුත්වැඩියා කර රු.මිලියන 9.8 ක මුදලක් අදාළ අලුත්වැඩියාව සිදුකළ ආයතනයට ගෙවා තිබුණි. කෙසේ වෙතත් මෙම අලුත්වැඩියාවෙන් පසු යන්ත්‍රයේ හයිඩ්‍රොලික් හෝස් පද්ධතියේ බට පිපිරීම නිසා යන්ත්‍රයෙන් අපේක්ෂිත කාර්යයන් ඉටුකර ගැනීමට	2023	යන්ත්‍ර අලුත්වැඩියා කටයුතු සිදුකර ප්‍රයෝජනයට ගත යුතුය.	කොත්මලේ වැඩබිමට 1985 දොඹකරය ගෙන්වා ඇති අතර එහි එන්ජිමේ ප්‍රධාන අළුත්වැඩියා කටයුත්තක් 2017 දෙසැම්බර් 29 රු. මි. 9.8 ක මුදලක් වියදම්කර අළුත්වැඩියා කටයුත්තක් සිදුකර එම අළුත්වැඩියාවෙන් පසු යන්ත්‍රය ක්‍රියාත්මක කිරීමේදි එහි **Hydraulic** පද්ධතියේද අළුත්වැඩියාවක් සිදුකිරීමට අවශ්‍ය විය. මීට හේතු වනුයේ යන්ත්‍රය වසර 32කට වඩා පැරණි බැවිණි. මේ වන විට එම යන්ත්‍රෙය්	අළුත්වැඩියා කර නොතිබුණි.

නොහැකිව වසර 10 කට වැඩි කාලයක් නිශ්කාර්යව තබා තිබුණි.

Hydraulic පද්ධතිය මෙන්ම සියළුම ටයර් ද දැඩි ලෙස ආපදා වී ඇති බව නිරීක්ෂණය වන බැවින් මෙම ආපදා පිළිසකර කරගැනීම සඳහාද ආසන්න වශයෙන් රු.මි. 10 ක් පමණ වැයකිරීමට සිදුවන බව කාර්යභාර ඉංජිනේරු 2024.10.11 දිනැති ලිපිය මගින් සඳහන් කර ඇත, එම අළුත්වැඩියා කටයුතු සිදුකර ගත්තද යන්ත්‍රයේ පැරණි භාවය නිසා යන්ත්‍රය ක්‍රියා කිරීමේදී නැවත මතුවන අළුත්වැඩියා සහ අවශ්‍ය උපාංගද වෙළඳපලේ සොයාගැනීමට අපහසු බැවින් මෙම යන්ත්‍රය අළුත්වැඩියා කිරීම ඵලදායි නොවේ.

3.168 ලංකා විදුලිබල මණ්ඩලය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	අතිරික්තය (ඌනතාවය)	මතය
	රු.(000)	රු.(000)	රු.(000)	රු.(000)	
2021	1,005,382,478	740,579,579	264,802,901	(21,450,369)	තත්ත්වාගණනය කළ
2022	1,062,343,693	707,916,871	354,426,825	(261,868,690)	තත්ත්වාගණනය කළ
2023	1,204,373,803	706,075,933	498,297,870	61,235,680	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපතිගේ නිර්දේශය	විගණිත ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ පියවර	නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ වත්මන් තත්ත්වය
(අ)	පුත්තලම ගල් අඟුරු බලාගාර ව්‍යාපෘතිය (අදියර ii) සඳහා මිලදී ගත් රු. මිලියන 124.30 ක් වටිනා වාහන හයක් 2014 වර්ෂයේදී ව්‍යාපෘතිය නිම කිරීමෙන් පසුවද ප්‍රාග්ධනිත කර නොතිබුණු අතර ඒ වෙනුවට එම මුදල කෙරීගෙන යන වැඩ ගිණුමේ ඇතුළත් කර තිබුණි. තවද, මෙම වාහනවල පිරිවැය ඒ වන විටත් අදාළ ව්‍යාපෘතියේ පිරිවැයට ඇතුළත් කර තිබුණද මෙම වාහන හය සහ පුත්තලම ගල් අඟුරු බලාගාර ව්‍යාපෘතියේ (අදියර i) තවත් වාහන 11 ක් මණ්ඩලයට පවරා ගැනීමට සහ	2021 -1.5.2 (ඌ) 2022-1.5.2.(ඊ) 2023-1.5.2 (ඊ)	මෙම වාහන පවරාගෙන භාරකාරත්වය තබා ගැනීමට සහ ඒවා ප්‍රාග්ධනිත කිරීමට වහාම කටයුතු කළ යුතුය.	දැනට ලංවිම නඩු පැවරීමේ ක්‍රියාවලියක යෙදී සිටී. මෙම කාරණය සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කිරීම සඳහා අවශ්‍ය ලියකියවිලි ප්‍රධාන නීති නිලධාරියා විසින් 2024 ඔක්තෝබර් 03 වන දින නීතිපති දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇති අතර නීතිපති දෙපාර්තමේන්තුවෙන් වැඩිදුර මඟ පෙන්වීමක් බලාපොරොත්තුවෙන් සිටී.	නීතිපති දෙපාර්තමේන්තු වෙන් වැඩිදුර උපදෙස් ලබා ගැනීම සඳහා ප්‍රධාන නීති නිලධාරියා විසින් අඛණ්ඩ පසු විපරම් ක්‍රියාමාර්ග ගනු ලැබේ.

	භාරකාරත්වය තබා ගැනීමට නිසි ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.				
(ආ)	රු. මිලියන 34,386.77 ක් වටිනා වේලි වැඩ මහවැලි සංකීර්ණයේ දේපල පිරියත හා උපකරණවල සිවිල් වැඩ යටතේ පෙන්වා තිබුණි. කෙසේ වෙතත්, එම මුදලේ නිරවද්‍යතාවය සහ අදාළ වත්කම් සම්බන්ධව මණ්ඩලයට ඇති හිමිකම පිළිබඳව විගණනයේ දී තහවුරු කර ගැනීමට නොහැකි විය.	2021-3.2 (එ) 2022- 1.5.2 (ච) 2023-1.5.2 (ඒ)	මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල වේලි වැඩවල වටිනාකම සහ අයිතිය පිළිබඳ නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමට කටයුතු කළ යුතුය.	මෙම කරුණ සාකච්ඡා කිරීම සඳහා අප විසින් 2024.06.24 දින ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ නිලධාරීන් සමඟ රැස්වීමක් පැවැත්වූ අතර, 2023 වර්ෂයේදී වේලිවල පිරිවැය ඔවුන්ගේ ගිණුමට ගෙන ඇති බව එහිදී අනාවරණය විය. එබැවින්, සංවිධාන දෙකෙහිම ඉහළ කළමනාකාරිත්වයේ අනුමැතියට යටත්ව සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කමිටුව තීරණය කර ඇත.	2024.10.14 දින පැවති රැස්වීමේදී වත්කම් නඩත්තු කරන ලද්දේ කවුරුන්ද යන්න මත පදනම්ව මහවැලි අධිකාරිය සහ ලංවිම අතර වේලි සහ ඒ ආශ්‍රිත වත්කම් සංරචක වෙන් කිරීම අවසන් කර ඇත. 2025 පෙබරවාරි දෙවන සතිය තුළ ලංවිම අධ්‍යක්ෂ මණ්ඩලයට සහ මහවැලි අධිකාරියට ඉදිරිපත් කිරීම සඳහා ඒකාබද්ධ ප්‍රකාශයක් සකස් කිරීමට නිගමනය කර ඇත.

(ඇ)	“ලංකා විදුලිබල මණ්ඩලයේ සේවකයින්ට දීමනා ගෙවීම”යන මාතෘකාව යටතේ විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද 2007 ඔක්තෝබර් 31 දිනැති අංක 07/1955/332/045 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය, 2008 මාර්තු 31 දිනැති ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභා වාර්තාව සමඟ 2008 අප්‍රේල් 09 දින රැස් වූ අමාත්‍ය මණ්ඩලය විසින් සලකා බලා තිබුණු අතර අමාත්‍ය මණ්ඩලය විසින් ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව විසින් 2008 මාර්තු 31 දිනැති වාර්තාවේ දක්වා ඇති කොන්දේසිවලට යටත්ව මේ සම්බන්ධයෙන් පත් කරන ලද කමිටුවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලබා දී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.	2021–1.5.4 (අ) 2022 – 1.6 (අ) 2023-1.6 (අ) (i),(ii),(iii),(iv)			
	(i) වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමෙන්		කාර්ය මණ්ඩලයට දීමනා ගෙවීමේදී අමාත්‍ය මණ්ඩල තීරණයට සහ ජාතික වැටුප් හා සේවක	මේ සම්බන්ධයෙන් කමිටුවක් පත් කරන ලද අතර, ඔවුන්ගේ වාර්තාව සුදුසු ක්‍රියාමාර්ග සඳහා අමාත්‍යාංශයට යොමු කර ඇත.	කමිටු වාර්තාව සුදුසු ක්‍රියාමාර්ග සඳහා අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. අමාත්‍යාංශයෙන් උපදෙස් ලබා ගැනීම සඳහා පසු

	තොරව 2008 අප්‍රේල් 09 දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද දීමනා ලැයිස්තුවට ඇතුළත් කර නොතිබූ දීමනා වර්ග 11 ක් සඳහා සමාලෝචිත වර්ෂයේ මුල් මාස 09 තුළදී රු.මිලියන 507.47 ක් ගෙවා තිබුණි.		සභා කොමිෂන් සභාවේ නිර්දේශවලට අනුකූල විය යුතුය.		විපරම් ක්‍රියාමාර්ග ගනු ලැබේ.
(ii)	වෘත්තීය දීමනාවට හිමිකම් කියන නිලධාරීන්ට රඳවා ගැනීමේ දීමනාව නොගෙවිය යුතුය. කෙසේ වෙතත්, ඊට පටහැනිව, සමාලෝචිත වර්ෂයේ මුල් මාස 10 තුළදී නිලධාරීන් 517 දෙනෙකුට රඳවා ගැනීමේ දීමනාව ලෙස රු. මිලියන 99.85 ක් ගෙවා තිබුණි.		කාර්ය මණ්ඩලයට දීමනා ගෙවීමේදී අමාත්‍ය මණ්ඩල තීරණයට සහ ජාතික වැටුප් හා සේවක සභා කොමිෂන් සභාවේ නිර්දේශවලට අනුකූල විය යුතුය.	මේ සම්බන්ධයෙන් කමිටුවක් පත් කරන ලද අතර ඔවුන්ගේ වාර්තාව සුදුසු ක්‍රියාමාර්ග සඳහා අමාත්‍යාංශයට යොමු කර ඇත.	අමාත්‍යාංශයෙන් උපදෙස් ලබා ගැනීම සඳහා පසු විපරම් කටයුතු සිදු කරනු ලැබේ.
(iii)	සිදු කරන ලද අහඹු පරීක්ෂණයට අනුව, තනතුරකට පත්		කාර්ය මණ්ඩලයට දීමනා ගෙවීමේදී අමාත්‍ය	පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා කමිටුවේ (COPE) උපදෙස් පරිදි 2008 වර්ෂයෙන් පසුව	මේ දක්වා අනුමැතිය ලබාගෙන නොතිබුණි.

		කරන ලද නිලධාරීන්ට එම තනතුරේ රාජකාරි ඉටු කිරීම සඳහා දීමනා ද ගෙවනු ලබන බව නිරීක්ෂණය විය.		මණ්ඩල තීරණයට සහ ජාතික වැටුප් හා සේවක සභා කොමිෂන් සභාවේ නිර්දේශවලට අනුකූල විය යුතුය.	ලංවිම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද දීමනා සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගන්නා ලෙස සාමාන්‍යාධිකාරී විසින් 2024.06.24 දිනැති ඔහුගේ ලිපිය මගින් විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන් ඉල්ලා ඇත.	
	(iv)	එකී අමාත්‍ය මණ්ඩල තීරණයට පටහැනිව, 2008 අප්‍රේල් 01 දිනෙන් පසුව බඳවා ගන්නා ලද සේවකයින් සඳහා කාර්ය සාධනය පදනම් කරගත් දිරි දීමනා ක්‍රමයක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් හඳුන්වා දී නොතිබුණි.		කාර්ය සාධනය පදනම් කරගත් දිරි දීමනා ක්‍රමයක් හඳුන්වාදීම සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල තීරණයට අනුකූල විය යුතුය.	වාර්ෂිකව පවත්වනු ලබන පුළුල් කාර්ය සාධන ඇගයීම් ක්‍රියාවලියක් මත පදනම්ව, නිශ්චිත දිනට පසුව බඳවා ගන්නා ලද සේවකයින් ඇතුළුව සියලුම සේවකයින්ට වැටුප් වර්ධක නිර්දේශ කරයි.	එවැනි දිරි දීමනා ක්‍රමයක් මේ දක්වා හඳුන්වා දී නොතිබුණි.
(ඇ)	මහා භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව, සහනාධාර නිවාස ණය යෝජනා ක්‍රමය යටතේ සේවකයින් විසින් ලබාගෙන ඇති දේපල ණය සඳහා අය කරන		2023-1.6 (ආ)	සහනාධාර නිවාස ණය යෝජනා ක්‍රමය සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගත යුතුය.	1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනතේ අංක 12 (k), (m) සහ (n) වගන්ති යටතේ අධ්‍යක්ෂ මණ්ඩලයට පවරා ඇති බලතල යටතේ, 1983	මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලෙස බලශක්ති

	ලද පොලියෙන් 2/3 ක් මණ්ඩලය විසින් ප්‍රතිපූරණය කර තිබුණි. 2013 සිට 2023 දක්වා ප්‍රතිපූරණය කරන ලද පොලී මුදල රු. මිලියන 16,789.5 ක් විය.			වර්ෂයේදී නිවාස ණය ලබා ගත් ලංවිම සේවකයින්ට සහන ප්‍රදානය කිරීමේ යෝජනා ක්‍රමයක් ආරම්භ කර ඇත. සංවිධානයේ සහ රටේ අභිවෘද්ධිය සඳහා වැඩ කිරීමට ඔවුන් පෙළඹවීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය මේ දක්වා සේවකයින්ට මෙම ප්‍රතිලාභය අඛණ්ඩව පවත්වාගෙන ගොස් ඇත.	අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන් ඉල්ලා සිටීමට කටයුතු කරනු ලැබේ.
(ඉ)	2023 දෙසැම්බර් 31 දිනට වෙළඳ ණයගැති ශේෂය රු. මිලියන 70,019.1 ක් විය. ඒ අතරින්, 2023 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 6,181 ක් මාස 06 කට වැඩි කාලයක් තිස්සේ අයවිය යුතුව පැවතුණි. මෙම මුළු ණයගැති ශේෂය අතරින්, දීර්ඝ කාලයක් තිස්සේ හිඟ මුදල් අයකර නොගැනීම හේතුවෙන් රු. මිලියන 2,773.3 ක් අවසන් කරන ලද ණයගැති ශේෂයක් (අක්‍රීය ණය ගැතියන්) ලෙස වර්ගීකරණය කර මාරු කර තිබූ අතර එයින් රු. මිලියන 1,106.6 ක් බෙදාහැරීමේ අංශය 01ට අදාළ විය.	2021-1.6.1(අ) 2022-1.7.1(අ) 2023-1.7 (අ)	ණය ගැතියන්ගෙන් ලැබිය යුතු මුදල ප්‍රමාදයකින් තොරව අයකර ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය.	**බෙදාහැරීමේ අංශය** 01 අවසන් කරන ලද ණයගැතියන්ගෙන් හිඟ මුදල් අයකර ගැනීම සඳහා අඛණ්ඩව අයකර ගැනීමේ ක්‍රියාමාර්ග ගනිමින් සිටින අතර, නිශ්චිත ගනුදෙනුකරුවන් වෙත එන්තර වාසි යවා ක්‍රියා පටිපාටියට අනුව පසු විපරම් කිරීමට පියවර ගෙන ඇත. **බෙදාහැරීමේ අංශය** 02 2024 වර්ෂයෙන් අවසන් වූ මාස 05 ක කාලය තුළදී, අවසන් කරන ලද මුළු ණයගැතියන්ගෙන් රු. මිලියන 940 කට ආසන්න මුදලක් අයකර ගෙන ඇත. **බෙදාහැරීමේ අංශය** 03 අවසන් කරන ලද ණයගැති ශේෂයන් නිරවුල් කිරීම සඳහා අවසන් කරන ලද	**<u>බෙදාහැරීමේ අංශය 01</u>** හිඟ මුදල් අයකර ගැනීම සඳහා අඛණ්ඩව අයකර ගැනීමේ ක්‍රියාමාර්ග ගනිමින් පවතී. **<u>බෙදාහැරීමේ අංශය 02</u>** 2024.12.31 දිනට වසර 05 කට වැඩි තොග සැපයුම් ණයගැති ශේෂය රු. මිලියන 241 ක් විය. ඉහත සඳහන් හිඟ ශේෂයේ ප්‍රධාන හිඟ මුදල් "වාලච්චේන කඩදාසි සංස්ථාව" සහ "කන්තලේ සීනි සංස්ථාව" වෙතින් වන අතර

				ගිණුම්වල ශේෂයන් ආරක්ෂක තැන්පතුවලින් අයකර ගැනීම, සිහි කැඳවීම් යැවීම, පැහැර හරින ලද අවසන් කරන ලද පාරිභෝගික ගිණුම්වල ශේෂයන් සක්‍රීය ගිණුම් වෙත මාරු කිරීම වැනි ක්‍රියාමාර්ග ගෙන ඇත. **බෙදාහැරීමේ අංශය 04** චක්‍රලේඛ උපදෙස්වලට අනුව අයකර ගැනීමේ ක්‍රියාමාර්ග ගනු ලැබේ.	ඒවා පිළිවෙලින් රු. මිලියන 115 ක් සහ රු. මිලියන 76 ක් විය. කන්තලේ සීනි සංස්ථාවෙන් රු. මිලියන 31.5 ක් අයකර ගැනීමෙන් පසු රු. මිලියන 44.80 ක් කපා හැරීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී ඇත. <u>**බෙදාහැරීමේ අංශය 03**</u> අයකර ගැනීමේ ක්‍රියාමාර්ග ගනිමින් පවතී. <u>**බෙදාහැරීමේ අංශය 04**</u> පවතින චක්‍රලේඛවලට අනුව තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා අඛණ්ඩ උත්සාහයන් ක්‍රියාත්මක කරයි.
(ඊ)	2023 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ වත්කම් කළමනාකරණ අංශය විසින් සෝපාන, වායුසමීකරණ යන්ත්‍ර සහ විදුලි ජනක යන්ත්‍ර සැපයීම වෙනුවෙන් රාජ්‍ය ආයතන 98 කින් රු. මිලියන 435.52 ක් අයවිය යුතුව පැවතුණි. එයින් රු. මිලියන	2021-1.6.1 (ආ) 2022-1.7.1.(ආ) (ii) 2023-1.7 (ආ) (iv)	රජයේ ආයතනවලින් අයවිය යුතු හිඟ මුදල් අයකර ගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීමට කටයුතු කළ යුතුය.	විදුලි සෝපාන, වායු සමීකරණ සහ විදුලි ජනක යන්ත්‍ර සැපයීම වෙනුවෙන් රජයේ ආයතනවලින් අයවිය යුතු හිඟ මුදල අයකර ගැනීම සඳහා පසු විපරම් ක්‍රියාමාර්ග ගෙන ඇත.	හිඟ මුදල් කඩිනම් කර අයකර ගැනීම සඳහා පසු විපරම් ක්‍රියාමාර්ග ගෙන ඇත. අඛණ්ඩ අයකර ගැනීමේ උත්සාහයන්හි ප්‍රතිඵලයක් ලෙස, 2024 වර්ෂය තුළදී, අග්‍රාමාත්‍ය

	153.03 ක් සහ රු. මිලියන 83.41 ක් අයකර ගැනීමෙන් තොරව පිළිවෙලින් වසරකට සහ වසර පහකට වැඩි කාලයක් තිස්සේ හිඟව පැවතුණි. තවද, සමාලෝචිත වර්ෂය අවසානයේදී හානිකරණ ප්‍රතිපාදන ලෙස රු. මිලියන 110.5 ක් පමණක් වෙන් කර තිබුණි.				කාර්යාලයෙන් අතීත හිඟ මුදල් සඳහා රු. 26,703,537.63 ක් අයකර ගෙන ඇත. තවද, මෙම වර්ෂය සහ පසුගිය වසර සඳහා ඉන්වොයිස් කළ වටිනාකම්වලින් වැඩි කොටසක් එකතු කර ගනිමින් ණය අයකර ගැනීමේ උත්සාහයන් සාර්ථක වී ඇත.
(උ)	සංශෝධිත 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 7 (1) සහ 43(1) වගන්තියට පටහැනිව, නියාමකගෙන් බලය ලබා නොගෙන, උත්පාදන බලපත්‍රය කල් ඉකුත් වී ඇති ස්වාධීන බලශක්ති නිෂ්පාදකයින් දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු. මිලියන 2,957.3 ක් වූ ගිගාවෝට් 27.31 ක බලශක්ති මිලදී ගෙන තිබුණි.	2021 - 1.7.(අ) 2022-1.8(අ) (i) 2023-1.8 (අ)	ශ්‍රී ලංකා විදුලිබල පනතේ විධිවිධානවලට අනුකූල විය යුතුය.	වාරිමාර්ග අවශ්‍යතා සඳහා සමනලවැව ජලාශයෙන් ජලය මුදා හැරීම හේතුවෙන්, 2023 අගෝස්තු 15 වන දින වන විට දකුණු කලාපයේ පවතින විදුලි බලාගාරවලින් අවශ්‍ය අතිරේක විදුලිය මිලදී ගැනීමෙන් දිවයින පුරා අඛණ්ඩ විදුලි සැපයුමක් සඳහා 2023 අගෝස්තු 07 වන දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, මාස 06 ක කාලයක් සඳහා අවම සහතික කළ බලශක්ති ප්‍රමාණය (MGEA) කිලෝවොට් පැය 94,500,000 ක් සඳහා ඒස් පවර ජෙනරේෂන් මාතර (පුද්.) සමාගම	මෙම විශ්‍රාමික ස්වාධීන බලශක්ති නිෂ්පාදකයින්ගේ උත්පාදන බලපත්‍ර PUCSL විසින් අලුත් කර නොතිබුණි.

				සමඟ සහ MGEA කිලෝවොට් පැය 325,872,000 ක් සඳහා ඒස් පවර් ඇඹිලිපිටිය (පුද්.) සමාගම සමඟ ලංවිම විසින් විදුලිය මිළදී ගැනීමේ ගිවිසුම්වලට එළඹුණි. ඉහත බලාගාර දෙකෙහිම ඵලදායී ධාරිතාව මෙගාවොට් 97.31 ක් විය. රට තුළ ප්‍රකාශිත හදිසි අවස්ථාවකදී දිවයින පුරා අඛණ්ඩ විදුලි සැපයුමක් සඳහා වන අමාත්‍ය මණ්ඩල තීරණවලට අනුකූල වීම සඳහා සම්පූර්ණ ප්‍රසම්පාදනය ටෙන්ඩරයක් ලෙස සිදු කර ඇත.	
(ඌ)	2021 නොවැම්බර් 17 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද රජය සතු ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතේ 3.5 වගන්තියට පටහැනිව, විදුලිබල මණ්ඩලය රේඛීය අමාත්‍යාංශයට සේවකයින් 29 දෙනෙකු නිදහස් කර තිබුණි. එබැවින්, 2020 සිට 2023 දක්වා රේඛීය අමාත්‍යාංශයට මුදා හරින ලද සේවකයින් වෙනුවෙන් විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය විසින් රු. මිලියන 288.66 ක් මණ්ඩලයට	2021 - 1.7.(ඇ) 2022 –1.8 (ඇ) (i) 2023-1.8 (ආ) (i)	රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශ දැඩි ලෙස අනුකූල වීම සහතික කිරීම.	අමාත්‍යාංශයට මුදාහරින ලද සේවකයින්ගේ වැටුප් සහ අනෙකුත් ප්‍රතිලාභ සම්බන්ධයෙන් ලංවිම විසින් දරන ලද වියදම් ප්‍රතිපූරණය කරන ලෙස ඉල්ලමින් ලංවිම සාමාන්‍යාධිකාරීවරයා විසින් විදුලිබල අමාත්‍යාංශයට ලිපියක් යවා ඇත. ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්) සමාගමේ සාමාන්‍යාධිකාරීවරයා ගේ වැටුප සඳහා ප්‍රතිපූරණය එම සමාගම විසින්	අමාත්‍යාංශය විසින් සේවකයින් 10 දෙනෙකු නැවත ලංවිම වෙත මුදා හැර ඇත. ඒ අනුව, මේ වන විට බලශක්ති අමාත්‍යාංශයේ සේවකයින් 18 දෙනෙකු සේවය කරයි. එම සේවකයින්ගෙන් 14 දෙනෙකු අමාත්‍යාංශ කාර්යාලයට ආරක්ෂක සේවා සපයයි. ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්ගලික)

	ප්‍රතිපූරණය කළ යුතුය. ඊට අමතරව, 2014 සිට 2023 දක්වා මණ්ඩලයෙන් නිදහස් කරන ලද ශ්‍රී ලංකා එනර්ජීස් (ප්‍රයිවට්) ලිමිටඩ් හි සාමාන්‍යාධිකාරී ලෙස රාජකාරි කරන නිලධාරියෙකුගේ වැටුප් හා දීමනා ලෙස මණ්ඩලය විසින් රු. මිලියන 24 ක මුදලක් දරා තිබුණි.			පියවයි.	සමාගම සියයට 100 ක අයිතිය ලංවිම සතු පරිපාලිත ආයතනයක් වන අතර, ලංවිම සේවකයෙකු වන එහි සාමාන්‍යාධිකාරීවරයා වැටුප ලංවිම විසින් ගෙවනු ලබන අතර එය ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්ගලික) සමාගම විසින් ප්‍රතිපූරණය කරයි.
(එ)	2021 නොවැම්බර් 17 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද රජය සතු ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතේ 7.7 වගන්තියට පටහැනිව, අවම වශයෙන් කාර්තුමය වශයෙන් පරිපාලිත ආයතනවල කාර්ය සාධනය පිළිබඳව සාකච්ඡා කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයට භාරකාර රාජකාරියක් තිබුණද, 2024 අප්‍රේල් මාසය අවසන් වන විටත් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පරිපාලිත ආයතන සමාලෝචන කිරීමේ ප්‍රතිපත්තියක් ස්ථාපිත කර නොතිබුණි.	2022-1.8(ඈ) (iii) 2023-1.8 (ආ) (ii)	රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශ සමඟ දැඩි ලෙස අනුකූල වීම සහතික කිරීම.	යෝජිත ප්‍රතිසංස්කරණ සාක්ෂාත් කර ගැනීමෙන් පසු විදුලිබල ක්ෂේත්‍රයේ සියලු අංශ සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා නව විදුලි පනතක් සම්පාදනය වනු ඇත. එබැවින්, සාකච්ඡාවෙන් පසුව, ලංවිම ආයතනික පරිවර්තනයක ක්‍රියාවලියක යෙදී සිටින බැවින් ඉහත සඳහන් පරිදි පරිපාලිත ප්‍රතිපත්තියක් සැකසීම මෙම අවස්ථාවේදී අවශ්‍ය නොවන බව අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර ඇත.	පරිපාලිත ආයතන සමාලෝචනය කිරීමේ ප්‍රතිපත්තියක් ස්ථාපිත කර නොතිබුණි.
(ඒ)	යෝජිත මූලස්ථාන ගොඩනැගිලි සංකීර්ණයේ කැණීම් වැඩ සඳහා වන	2021- 3.1 2022- 3.2 (i)	ගොඩනැගිල්ල ආර්ථික වශයෙන් භාවිතා කළ	ඉදිකිරීම් කටයුතු සිදුකරමින් පවතින අතරතුර, කොවිඩ්-19 වසංගතයේ බලපෑම,	කොන්ත්‍රාත්කරු සියලු නිවැරදි කිරීම් සම්පූර්ණ කර නොතිබූ

කොන්ත්‍රාත්තුව මුලින් 2012 ඔක්තෝබර් 22 වන දින රු. මිලියන 304.6 ක කොන්ත්‍රාත් මුදලකට ප්‍රදානය කර ඇත. එහි ඉදිකිරීම් සහ ඉදිකිරීම් දෝෂ නිවැරදි කිරීම සඳහා වන කොන්ත්‍රාත්තුව 2021 අගෝස්තු 02 වන දින රු. මිලියන 4,774.6 ක (වැට් බද්ද හැර) කොන්ත්‍රාත් මුදලකට නැවත ප්‍රදානය කරන ලද අතර ආරම්භක දිනය 2021 අගෝස්තු 16 විය. කෙසේ වෙතත්, 2023 පෙබරවාරි 14 වන දින, විදුලිබල අමාත්‍යවරයාගේ උපදෙස් මත කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට මණ්ඩලය තීරණය කර තිබුණි. 2023 අගෝස්තු මාසයේදී කොන්ත්‍රාත්කරු වැඩ අත්හිටුවා තිබුණද , 2024 ජූලි 31 වන දින වන විට කොන්ත්‍රාත්තුව අවසන් කර නොතිබුණි. 2023 ඔක්තෝබර් 16 වන දින අඩු කරන ලද වැඩ විෂය පථයක් සඳහා ප්‍රමාණවත් නිම කිරීමේ සහතිකයක් නිකුත් කරන ලද අතර, ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 13.2 ක් පමණක් විය. එහි ප්‍රතිඵලයක් ලෙස, ව්‍යාපෘතිය සඳහා වැය	2023-3.2 (i)	හැකි වන පරිදි ඉදිකිරීම් කටයුතු නැවත ආරම්භ කර අවසන් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව නිසි තීරණයක් ගැනීමට කටයුතු කළ යුතුය.	ශ්‍රම හා ද්‍රව්‍ය හිඟය, දේශීය හා ආනයනික ඉදිකිරීම් ද්‍රව්‍යවල මිල ඉහළ යාම, ඉන්ධන හිඟය යනාදිය හේතුවෙන් කොන්ත්‍රාත්කරු දුෂ්කරතා රැසකට මුහුණ දී ඇත. ඒ අනුව, කොන්ත්‍රාත්කරු ඔහුගේම තීරණය අනුව වැඩවල ප්‍රගති අනුපාතය අඩු කර ඇත. මේ අතර, අභියෝගාත්මක කාල පරිච්ඡේදය තුළ රාජ්‍ය වියදම් පාලනය කිරීම සඳහා ගොඩනැගිල්ලේ සිදුකරමින් පවතින ඉදිකිරීම් කටයුතු සුදුසු පරිදි නැවැත්වීමට 2022 දෙසැම්බර් 07 වන දින ගරු විදුලිබල අමාත්‍යතුමා සමඟ පැවති රැස්වීමකදී උපදෙස් ලබා දී ඇත. එම අවස්ථාවේදී, බිම් මහලේ සහ පළමු මහලේ වැඩවල ප්‍රගතිය පිළිවෙලින් සියයට 80 ක් සහ 25 ක් විය. 2023 පෙබරවාරි 14 වන දින පැවති අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීමේදී අවශ්‍ය ආරක්ෂක කටයුතු අවසන් කිරීමෙන් පසු ඉදිකිරීම් කටයුතු නතර කිරීමට සහ ව්‍යාපෘතිය අවසන් කිරීම සඳහා	අතර ඉතිරි කොටස සම්පූර්ණ කිරීම සඳහා නව කොන්ත්‍රාත්තුවක් තවමත් ප්‍රදානය කර නොතිබුණි.

කරන ලද රු. මිලියන 1,484.9 ක් නිෂ්ක්‍රීය වී තිබුණි.

කොන්ත්‍රාත් ක්‍රියා පටිපාටිය අනුගමනය කිරීමට තීරණය කර ඇත. ඒ අනුව, සේවායෝජකයාගේ තීරණය පිළිබඳව කොන්ත්‍රාත්කරුට දැනුම් දී ඇත. ව්‍යාපෘති උපදේශක විසින් අඩු කරන ලද විෂය පථය නිකුත් කරන ලද අතර, එය කොන්ත්‍රාත්කරු විසින් 2023 අගෝස්තු 15 වන විට සම්පූර්ණ කිරීමට නියමිතව තිබුණි. මුල් විෂය පථයට අනුව ප්‍රගතිය සියයට 13.2 ක් පමණ විය. නිවැරදි කිරීමේ ක්‍රම කිහිපයක් අනුගමනය කළද, උපදේශකයා සෑහීමකට පත්වන පරිදි ඉදිකිරීම් දෝෂ සාර්ථකව නිම කිරීමට කොන්ත්‍රාත්කරු මෙතෙක් අපොහොසත් වී ඇත. නිවැරදි කිරීමේ කටයුතු ප්‍රමාද වීම හේතුවෙන් ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව අවසන් කිරීම ප්‍රමාද විය. කෙසේ වෙතත්, 2025 පෙබරවාරි 08 දින වන විට සියළුම නිවැරදි කිරීම් සම්පූර්ණ කර ව්‍යාපෘතිය භාර දෙන ලෙස කොන්ත්‍රාත්කරුට උපදෙස් දී ඇත.

(ඕ)	සංශෝධිත 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 24 (1) (ඇ) වගන්තිය අනුව විදුලි බලය සඳහා සාධාරණ ලෙස කලින් සිතා ගත් ඉල්ලුම සපුරාලීමට උත්පාදනය කිරීමේ පිරියතෙන් ලබා ගත හැකි ප්‍රමාණවත් ධාරිතාවක් ඇති බවට සහතික වීමට මණ්ඩලයට හැකි විය යුතුය. 2018 - 2037 දීර්ඝකාලීන විදුලි ජනන පුළුල් කිරීමේ සැලැස්මට අනුව, 2018 සිට 2021 යන වර්ෂයන් තුළදී මෙගාවොට් 2,032 ක ධාරිතාවයකින් යුත් නව විදුලි ජනන බලාගාර ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, මෙගාවොට් 661.6 ක ධාරිතාවයකින් යුත් විදුලි බලාගාර පමණක් එම කාලපරිච්ඡේදය තුළදී ක්‍රියාත්මක කර තිබුණි. 2022 - 2041 අවම පිරිවැය දීර්ඝකාලීන විදුලි ජනන පුළුල් කිරීමේ සැලැස්මේ 2022 වර්ෂයේදී මෙගාවොට් 544 ක පුනර්ජනනීය බලශක්ති ධාරිතාවක් එකතු කිරීම ඇතුළත් කර තිබුණු නමුත් මෙගාවොට් 211 ක ධාරිතාවයකින් යුත් නව පුනර්ජනනීය බලශක්ති බලාගාර පමණක් එම කාලපරිච්ඡේදය තුළදී	2021 - 3.2 (අ) 2022- 3.4 (අ) 2023-3.4 (අ)	දීර්ඝකාලීන විදුලි ජනන පුළුල් කිරීමේ සැලැස්ම සැලසුම් කළ පරිදි ක්‍රියාත්මක කළ යුතුය.	අමාත්‍ය මණ්ඩල තීරණ මත පදනම් වූ ප්‍රසම්පාදනය අවසන් කිරීම (මෙගාවොට් 320 ක දැවි තෙල් බලාගාර), උමා ඔය ජල විදුලි බලාගාරයට බලපෑ ඇමරිකා එක්සත් ජනපදය විසින් ඉරානයට පනවා ඇති සම්බාධක, රටේ සහ ලංවිමෙහි දැඩි මූල්‍ය තත්ත්වය, නැවත ටෙන්ඩර් කිරීමේ ක්‍රියාවලිය, නීතිමය ආරවුල්, මහජන විරෝධතා, මූල්‍යයන් තහවුරු කර ගැනීමේ දුෂ්කරතා, කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දීමේ ප්‍රමාදයන් වැනි හේතු අවම පිරිවැය දීර්ඝකාලීන විදුලි ජනන පුළුල් කිරීමේ සැලැස්මේ මන්දගාමී ප්‍රගතිය සඳහා හේතු වී තිබුණි.	නව ජනන සැලසුම් ක්‍රියාත්මක කිරීම ඉලක්කයට වඩා සැලකිය යුතු ලෙස අඩු වූ අතර, අවම පිරිවැයකින් යුත් විදුලි සැපයුමක් සැපයීමේ අරමුණ සපුරා ගැනීමට නොහැකි විය.

ක්‍රියාත්මක කර තිබුණි. මීට අමතරව, 2023–2042 සඳහා අනුමත කරන ලද අවම පිරිවැය දීර්ඝකාලීන විදුලි ජනන පුළුල් කිරීමේ සැලැස්මේ 2023 දී මෙගාවොට් 607 ක මුළු ධාරිතාවකින් යුත් බලාගාර ක්‍රියාත්මක කිරීමට අරමුණු කර ගෙන තිබුණි. කෙසේ වෙතත්, 2023 දෙසැම්බර් 31 වන විට මෙගාවොට් 185.6 ක බලාගාර පමණක් ක්‍රියාත්මක කර තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, නව උත්පාදනය බලාගාර ක්‍රියාත්මක කිරීම ඉලක්කයට වඩා සැලකිය යුතු ලෙස අඩු වී තිබූ අතර අඩු පිරිවැයකින් යුත් විදුලි බලය සැපයීමේ අරමුණ ඉටු කර ගැනීමට නොහැකි වී තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සමාලෝචිත වර්ෂය තුළදී ඒකකයක සාමාන්‍ය පිරිවැය රු. 108.29 ක් වූ රු. මිලියන 2,957.3 ක් වටිනා ගිගාවොට් පැය 27.31 ක් අතිරේක විදුලිබලයක් ලෙස මිලදී ගැනීමට සිදු වී තිබුණි. සාපේක්ෂව, ඒකකයක සමස්ථ සාමාන්‍ය පිරිවැය සහ වෙස්ට් කෝස්ට් බලාගාරයෙන් මිලදී ගත් විදුලිය සඳහා සාමාන්‍ය පිරිවැය පිළිවෙලින් රු.

	40.92 ක් සහ රු. 68.29 ක් විය				
(ඕ)	මණ්ඩලයේ ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ වාර්තාවට අනුව, 2022 වර්ෂයේදී ගත් වෘත්තීය සමිති ක්‍රියාමාර්ගය හේතුවෙන් විදුලිය ජනනය නොකර රන්දෙණිගල සහ රන්ටැඹේ ජලාශවල ජලය මුදා හැරීම හේතුවෙන් අතිරේක පෞද්ගලික විදුලිය මිලදී ගැනීම සඳහා මණ්ඩලයට ආසන්න වශයෙන් රු. මිලියන 262.6 ක පාඩුවක් දැරීමට සිදු වූ බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් වගකිවයුතු නිලධාරීන්ගෙන් පාඩුව අයකර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. තවද, 2022 ජූලි 25 වන දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කමිටුවක් පත් කර ඇති බවත්, වාර්තාව 2022 නොවැම්බර් 16 සහ 2022 දෙසැම්බර් 08 දින ඉදිරිපත් කර ඇති බවත් නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, අධ්‍යක්ෂ මණ්ඩලය එම වාර්තාව ප්‍රතික්ෂේප කර 2023 පෙබරවාරි 22 දින නව කමිටුවක් පත් කර තිබුණි. කමිටුව 2023	2022- 3.4 (ඔ) 2023-3.4 (ඈ)	කමිටුවේ නිර්දේශ සුදුසු පරිදි ක්‍රියාත්මක කිරීමට සහ වගකිවයුතු නිලධාරීන්ගෙන් අලාභ අයකර ගැනීමට වහාම කටයුතු කළ යුතුය.	කමිටුවේ නිර්දේශ සුදුසු පරිදි ක්‍රියාත්මක කරන ලෙස සාමාන්‍යාධිකාරීවරයා විසින් සියලුම අංශ ප්‍රධානීන් , ප්‍රධාන නීති නිලධාරී සහ ප්‍රධාන අභ්‍යන්තර විගණක වෙත දැනුම් දී ඇත.	ස්වාධීන කමිටුවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සහ ඒ පිළිබඳ ප්‍රගතිය යාවත්කාලීන කරන ලෙස ඉල්ලා 2025 ජනවාරි මාසයේදී ලංවිම සාමාන්‍යාධිකාරීවරයා විසින් සිහි කැඳවීමක් යවා ඇත.

	නොවැම්බර් 22 දින අධ්‍යක්ෂ මණ්ඩලයට තම වාර්තාව ඉදිරිපත් කර තිබුණද, කමිටුව විසින් කරන ලද නිර්දේශ 2024 මැයි මස අවසන් වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි. ඉහත කමිටු දෙකෙහි සාමාජිකයින් සඳහා මණ්ඩලය විසින් රු. මිලියන 1.23 ක මුදලක් ගෙවා තිබුණි.				
(ක)	2000 වර්ෂයේ සිට ව්‍යාපෘති කටයුතු, ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාල, පාරිභෝගික සේවා මධ්‍යස්ථාන සහ ග්‍රිඩ් උපපොළ ඉදිකිරීම සඳහා රු. මිලියන 188.38 ක පිරිවැයට ඉඩම් 18 ක් මිලදී ගෙන තිබුණි. 2023 වර්ෂය අවසන් වන විටත් අපේක්ෂිත අරමුණු සඳහා මෙම ඉඩම් යොදා ගෙන නොතිබුණි. එම ඉඩම් අතරින් රු. මිලියන 36.48 ක් වටිනා ඉඩම් 4 ක් බෙදාහැරීමේ අංශවල ස්ථාවර වත්කම් ලේඛනවලට ඇතුළත් කර නොතිබුණි. තවද, නියදි විගණන පරීක්ෂණයට අනුව, අදාළ ගැසට් නිවේදන ප්‍රකාශයට පත් කර වර්ෂ 6 ක් ඉක්මවී තිබුණද, විවිධ ඉදිකිරීම් කටයුතු සඳහා අත්පත් කරගත් ඉඩම් දහයක් පවරා	2022- 3.7 2023-3.6 (අ)	ඉඩම් පරිහරණය පිළිබඳ කරුණු සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් නිසි තීරණයක් ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කළ යුතු අතර, පසුව නිෂ්ක්‍රීය ඉඩම් අපේක්ෂිත අරමුණු සඳහා යොදා ගැනීමට සහ ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීමට පියවර ගත යුතුය.	පහත සඳහන් හේතූන් මත මෙම ඉඩම් අපේක්ෂිත අරමුණු සඳහා ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. • ප්‍රවේශ මාර්ග සම්බන්ධ ගැටළු විසඳීමට නොහැකි වීම. • SLLDC වෙතින් විරෝධතා • රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 04/2022 මගින් ඉදිකිරීම් අත්හිටුවීම • දීර්ඝ කාලීන සම්ප්‍රේෂණ සංවර්ධන සැලැස්මට කරන ලද වෙනස්කම් ආදිය	2022.08.08 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 04/2022 හරහා සියලුම ඉදිකිරීම් අත්හිටුවීමත් සමඟ ඉදිකිරීම් කටයුතු කරගෙන යාමට නොහැකි විය.

	ගැනීමේ කටයුතු සම්පූර්ණ කිරීමට මණ්ඩලය අපොහොසත් වී තිබූ බව නිරීක්ෂණය විය.				
(ග)	හදිසි විදුලිය ප්‍රසම්පාදනය කිරීම සඳහා මහජන උපයෝගිතා කොමිසම වෙතින් අනුමැතිය ඉල්ලා සිටින විට, දකුණු පළාතේ විදුලිබල පද්ධතියේ පවතින විදුලිබල ජනනයේ සීමාවන් සහ සම්ප්‍රේෂණ ජාලයේ සීමාවන් මණ්ඩලය විසින් 2016 වසරේ සිට ඉස්මතු කර තිබුණි. කෙසේ වෙතත්, වසර 02 ක සහ මාස 07 ක ප්‍රමාදයක් සහිතව දකුණු පළාතේ විදුලිබල පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා යෝජිත පොල්පිටිය - හම්බන්තොට කි.වෝ 220 ක ධාරිතාවක් සහිත කි.මී 150 ක සම්ප්‍රේෂණ මාර්ගය 2023 අගෝස්තු 22 වන දින ජාතික විදුලිබල පද්ධතියට සම්බන්ධ කර තිබුණි. එමෙන්ම, දකුණු පළාතේ විදුලිබල පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා යෝජිත 2022 අප්‍රේල් 20 දින නිම කිරීමට අපේක්ෂා කර තිබූ හොරණ - පාදුක්ක කි.වෝ 132 ක ධාරිතාවක් සහිත කිලෝමීටර් 25 ක	2022- 3.4 (ක) 2023 – 3.7 (අ)	දක්ෂිණ විදුලිබල පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා යෝජනා කරන ලද සම්ප්‍රේෂණ මාර්ග ඉදිකිරීමේ කටයුතු කඩිනම් කිරීමට කටයුතු කළ යුතුය.	**පොල්පිටිය - හම්බන්තොට කි.වෝ 220 ක ධාරිතාවක් සහිත කි.මී 150 ක සම්ප්‍රේෂණ මාර්ගය ඉදි කිරීම** සිරිපාගම කාර්නි වතුයායේ ඉඩම් ගැටළුව PUCSL විසින් විසඳන තෙක් එනම් 2023 අගෝස්තු 11 වන දින දක්වා නොවිසඳවී තිබුණි. තවද, පාස්කු බෝම්බ ප්‍රහාරය, කොවිඩ් 19 වසංගතය සහ එම කාලය තුළදී රටේ පැවති සෘණ ආර්ථික තත්ත්වය ව්‍යාපෘතියේ ප්‍රගතියට බරපතල ලෙස බලපා තිබුණි. **හොරණ - පාදුක්ක කි.වෝ 132 ක ධාරිතාවක් සහිත කිලෝමීටර් 25 ක සම්ප්‍රේෂණ මාර්ගය ඉදි කිරීම** පාස්කු බෝම්බ ප්‍රහාරය, COVID-19 වසංගතය සහ මෙම කාලය තුළ රටේ පැවති සෘණ ආර්ථික තත්ත්වය ව්‍යාපෘතියේ ප්‍රගතියට බරපතල ලෙස බලපා තිබුණි. නව විෂය පථය	**පොල්පිටිය - හම්බන්තොට කි.වෝ 220 ක ධාරිතාවක් සහිත කි.මී 150 ක සම්ප්‍රේෂණ මාර්ගය ඉදි කිරීම** දක්ෂිණ විදුලිබල පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා යෝජනා කරන ලද සම්ප්‍රේෂණ මාර්ගය 2023 අගෝස්තු 22 වන දින බලගන්වන ලදී. **හොරණ - පාදුක්ක කි.වෝ 132 ක ධාරිතාවක් සහිත කිලෝමීටර් 25 ක සම්ප්‍රේෂණ මාර්ගය ඉදි කිරීම** නව විෂය පථය යටතේ, ව්‍යාපෘතිය 2024 ජනවාරි 19 වන දින වන විට නිම කර ඇත. ව්‍යාපෘතියේ ඉතිරි කටයුතු ලංවිම විසින් සිදු කරනු ලැබේ. **කි.වෝ 220 ක**

	සම්ප්‍රේෂණ මාර්ගය සහ 2021 අප්‍රේල් 01 දින නිම කිරීමට අපේක්ෂා කර තිබූ කි.වෝ 220 ක ධාරිතාවක් සහිත කොත්මලේ - නව පොල්පිටිය සම්ප්‍රේෂණ මාර්ගය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිම කර නොතිබුණි. 2023 දෙසැම්බර් 31 දිනට මෙම ව්‍යාපෘතිවල භෞතික ප්‍රගතිය පිළිවෙළින් සියයට 51.15 ක් සහ සියයට 59 ක් විය. තවද, කොත්මලේ - නව පොල්පිටිය ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්තුව අවසන් කර තිබුණි.				යටතේ, ව්‍යාපෘතිය 2024 ජනවාරි 19 වන දින වන විට නිම කර ඇත. ව්‍යාපෘතියේ ඉතිරි කටයුතු ලංවිම විසින් සිදු කරනු ඇත. **කි.වෝ 220 ක ධාරිතාවක් සහිත කොත්මලේ - නව පොල්පිටිය සම්ප්‍රේෂණ මාර්ගය** රටේ ඇති වූ පැහැර හැරීමේ තත්ත්වය හේතුවෙන් 2022 අප්‍රේල් මාසයේ සිට ජාතික සම්ප්‍රේෂණ සහ බෙදාහැරීමේ ජාල සංවර්ධන සහ කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියට JICA විසින් අරමුදල් ලබා දීම අත්හිටුවා ඇත. එබැවින්, කොන්ත්‍රාත්තුවේ සාමාන්‍ය කොන්දේසිවල 16.2(c) උප වගන්තියට අනුව, කොන්ත්‍රාත්කරු 2023 පෙබරවාරි 02 දිනැති ඔහුගේ අංක KKJV/NTDND&EIP/HO/W0353/895 දරන ලිපිය මගින් කොන්ත්‍රාත්තුව අවසන් කිරීම සඳහා කටයුතු කර ඇත.	**ධාරිතාවක් සහිත කොත්මලේ - නව පොල්පිටිය සම්ප්‍රේෂණ මාර්ගය** කොන්ත්‍රාත්කරු කොන්ත්‍රාත්තුව අවසන් කිරීම සඳහා කටයුතු කර ඇත.
(ච)	සංශෝධිත 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතට අනුව, 2013 අගෝස්තු 06 න්	2021-(ඇ) 2022	3.4 -3.9	2021 දෙසැම්බර් 31 දක්වා ආරම්භ කර තිබූ, නිම	සාමාන්‍යයෙන්, ඉහත සඳහන් සියලු ව්‍යාපෘතිවල ප්‍රගතිය කොවිඩ් -19 සංචාරක	2020 අගෝස්තු 25 වන දින මෙගාවොට් 190 ක මුළු ධාරිතාවය

පසුව සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති (NCRE) ව්‍යාපෘති සඳහා ප්‍රසම්පාදන පටිපාටි අනුගමනය කළ යුතුය. කෙසේ වෙතත්, ප්‍රසම්පාදන පටිපාටි අනුගමනය කරමින් NCRE ව්‍යාපෘති සඳහා එකතුව මෙගාවොට් 390 ක ධාරිතාවයකින් යුත් ප්‍රසම්පාදන 7 ක් පමණක් 2021 දෙසැම්බර් 31 දින දක්වා ආරම්භ කර තිබුණු අතර මෙම ධාරිතාවය අතරින් 2023 දෙසැම්බර් 31 දිනට එකතුව මෙගාවොට් 102 ක ධාරිතාවයකින් යුත් විදුලි බලාගාර පමණක් ක්‍රියාත්මක කර තිබුණි.	(ආ) 2023-3.9 (අ)	නොකළ NCRE ව්‍යාපෘතිවල ප්‍රගතිය කඩිනම් කිරීමට කටයුතු කළ යුතුය.	සීමාවන් සහ 2022 වර්ෂයේ සිට රට තුළ පැවති මූල්‍ය අර්බුදය හේතුවෙන් අඩාල විය. එබැවින්, මෙම ටෙන්ඩර්වල ලංසු තැබීමේ අදියරේදී ඉදිරිපත් කරන ලද ගාස්තු අනුපාත මත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ව්‍යාපෘති සමාගම් දුෂ්කරතාවන්ට මුහුණ දුන් අතර විසඳුමක් ඉල්ලා ඇත. මෙම කාරණය අමාත්‍ය මණ්ඩලය විසින් සලකා බලන ලද අතර, අමාත්‍ය මණ්ඩල තීරණ සහ විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම්වල නියමයන් සහ කොන්දේසි සැලකිල්ලට ගනිමින්, ව්‍යාපෘති අවලංගු කිරීමට සහ දීර්ඝ කිරීමට ලංවිම පියවර ගෙන ඇත.	සඳහා ලංසු ආරම්භ කිරීමට (ව්‍යාපෘති කමිටුව සහ අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද සාකච්ඡා කමිටුව පත් කිරීමෙන්) ලංවිම විසින් විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ අනුමැතිය ඉල්ලා සිටියද, 2021.12.31 දක්වා ලංසු ආරම්භ කිරීමට අනුමැතිය ලබා දී නොතිබුණි. මෙම කාරණය අමාත්‍ය මණ්ඩලය විසින් සලකා බලන ලද අතර, අමාත්‍ය මණ්ඩල තීරණ සහ විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම්වල නියමයන් සහ කොන්දේසි සැලකිල්ලට ගනිමින්, ව්‍යාපෘති අවලංගු කිරීමට සහ දීර්ඝ කිරීමට ලංවිම කටයුතු කර ඇත.

3.169 ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	අතිරික්තය (ඌනතාවය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	2,789,031,648	332,353,864	2,456,677,784	(25,569,761)	තත්ත්වාගණනය කළ
2022	2,499,731,629	244,383,227	,2,255,348402	(7,058,382)	තත්ත්වාගණනය නොකළ
2023	3,631,145,934	270,640,187	3,360,505,747	5,008,330	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපතිගේ නිර්දේශය	විගණිත ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ පියවර	නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ වත්මන් තත්ත්වය
1	ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ වාහන අළුත්වැඩියා අංශයේ වැඩ බිම සැකසීම සඳහා ආයතනයේ ඉංජිනේරු විසින් පිළියෙළ කළ ඇස්තමේන්තුව ඉක්මවා රු. 1,218,922 ක් පෞද්ගලික ආයතනයට ගෙවීම් කර තිබුණු අතර, එම කොන්ත්‍රාත්තුවට අදාල අවම මිල ඉදිරිපත් කර තිබූ ආයතනය ප්‍රතික්ෂේප කිරීමට හේතුවූ සාධක තහවුරු කර ගැනීමට අදාල ලිපි ලේඛන ලිපිගොනුව තුළ අන්තර්ගත නොකර දෙවන අවම මිල ඉදිරිපත් කරන ලද ආයතනයට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබීම හේතුවෙන් ආයතනයට රු.	**2021**	ආයතනයට සිදුවූ පාඩුව වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.	අවම මිල ඉදිරිපත් කළ කොන්ත්‍රාත්කරු අදාළ කාර්යය සඳහා නොගැළපෙන අමුද්‍රව්‍යන් ලංසු ලේඛනයේ ඉදිරිපත් කර තිබීම යන කරුණ මත එකී ලංසුව තාක්ෂණික ඇගයීම් කමිටුව නිර්දේශ කර නොතිබුණි.	නිර්දේශ අනුව කටයුතු කර නොතිබුණි.

	1,196,022 ක පාඩුවක් සිදුවී ඇති බව නිරීක්ෂණය විය.				
2	2008 පෙබරවාරි 6 දිනැති අංක 05/2008 චක්‍රලේඛය අනුව මහජන අවශ්‍යතාවය කඩිනම්වගුණාත්මකව , හා අඛණ්ඩව ඉටුකරන බවට බැඳීමක් ඇති කිරීම සඳහා ආයතනය විසින් චක්‍රලේඛය ප්‍රකාර පුරවැසි ප්‍රඥප්තියක් සකස් කිරීමට කටයුතු කර නොතිබුණි.	2022	චක්‍රලේඛයට අනුගත විය යුතුය	කෙටුම්පත සම්බන්ධව තවදුරටත් සාකච්ඡා කෙරෙමින් පවතින අතර කඩිනමින් අවසන් කිරීමට කටයුතු කරමින් පවතී.	**නිර්දේශ අනුව කටයුතු කරමින් පවතී.**
3	අත්තිඩිය ශිෂ්‍ය නේවාසිකාගාරයට ගෘහ උපකරණ මිලදී ගැනීම හදිසි මිලදී ගැනීමක් ලෙස සලකා තරඟකාරී මිල ගණන් කැඳවීමකින් තොරව අමාත්‍ය මණ්ඩලය අනුමත කල රු.මිලියන 50 ක සීමාව ඉක්මවා රු. මිලියන 65 ක ප්‍රතිපාදන සලසා ප්‍රසම්පාදන දෙකක් යටතේ රු. මිලියන 64 ක්වූ බදු සහිත පිරිවැයකට රාජ්‍ය ආයතනයකින් භාණ්ඩ මිලදී ගැනීම සඳහා 2021 දෙසැම්බර් 24 දින භාණ්ඩ ඇණවුම් කර තිබුණි. 2022 දෙසැම්බර් 16 දින එනම් වසරක ප්‍රමාදයකින් පසු ආයතනය වෙත භාණ්ඩ ලැබී තිබුණි.	**2022**	චක්‍රලේඛවලට අනුගත වීම හා මනා අභ්‍යන්තර පාලනයක් පැවතිය යුතුය.	සැපයුම්කරුවන් විසින් කොටස් වශයෙන් භාණ්ඩ භාරදී ඇති හෙයින් මෙසේ සිදුවී ඇති බව දන්වා සිටිමි.	**නිර්දේශ අනුව කටයුතු කර නොතිබුණි**

4	2020 වර්ෂයේ ආරම්භ කර 2021 අගෝස්තු 31 දින වන විට අවසන් කිරීමට සැලසුම් කර තිබූ ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ ශිෂ්‍යයන් සඳහා ඉදිකරන ලද මහල් 03 කින් යුත් කිලිනොච්චියේ පිහිටා ඇති ශ්‍රී ලංකා ජර්මානු පුහුණු ආයතනයේ (SLGTI) නේවාසිකාගාරයේ ඉදිකිරීම් කටයුතු අවසන් කර නොතිබූ අතර, එම ගොඩනැගිලි වල අයිතියද ආයතනයට ලබාගෙන නොතිබුණි.	**2022**	අපේක්ෂිත අරමුණු ඉටුවන අකාරයෙන් ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතුය.	මෙම ආයතනයේ සිසුන් සඳහා ඉදිකරන ලද නේවාසිකාගාරයේ වැඩ මේ වන විට අවසන් කර ඇති අතර, ගොඩනැගිල්ල පවරා ගැනීම කර නොතිබූ බව දන්වමි.	**නිර්දේශ අනුව කටයුතු කරමින් පවතී.**
5	ආයතනයේ පුරප්පාඩු වී ඇති ප්‍රධාන තනතුරු පහට අදාළව අධ්‍යාපන සුදුසුකම් වලට සම වැටුප්තල සකස් කර ඒ පිළිබඳව භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කර එම පුරප්පාඩු පිරවීමට කටයුතු කිරීමට හා සේවක තනතුරු ප්‍රති ව්‍යුහගත කිරීමේදී වැටුප් වර්ධක සම්බන්ධයෙන් ඇති වූ ගැටලු සහගත තත්ත්වයන් භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කර නිවැරදි කර ගැනීමට 2019 මැයි 23 දින පැවැති පොදු ව්‍යාපාර පිළිබඳ ගිණුම් කාරක සභා රැස්වීමේදී ගෙන තිබූ තීරණයන් ක්‍රියාත්මක කර නොතිබුණි. තවද, 2013	**2022**	පොදු ව්‍යාපාර පිළිබඳ ගිණුම් කාරක සභා රැස්වීමේදී ගෙන තිබූ තීරණයන් ක්‍රියාත්මක කල යුතු වීම.	රේඛිය අමාත්‍යාංශය යටතේ ඇති කාර්මික පුහුණු ආයතන වල අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පවතින වැටුප් ගැටළු නිරාකරණය කිරීම සඳහා අමාත්‍යාංශයේ මූලිකත්වයෙන් පත් කරන ලද කමිටුව සහභාගී වී පවත්නා ගැටළු සම්බන්ධව සාකච්ඡා කර ඇත.	**නිර්දේශ අනුව කටයුතු කර නොතිබුණි**

	වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා එම තනතුරු පුරප්පාඩුව පැවතුණි.				
6	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුරෙ. 396 අනුව නිකුත් කල නමුත් ගෙවීමට ඉදිරිපත් නොකළ මාස 06 ඉක්මවූ රු.5,757,024ක් වටිනා චෙක්පත් 07ක් සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	**2023**	මුදල් රෙගුලාසි වලට අනුගත විය යුතුය.	අධිකරණ තීන්දුවක් ලැබෙන තෙක් චෙක්පත් මගින් ගෙවීම් නතර කර ඇති බව	නිර්දේශ අනුව කටයුතු කර නොතිබුණි
7	2018 ජූලි 18 දිනැති අංක 03/2018 දරන කළමණාකරන සේවා චක්‍රලේඛය ප්‍රකාරව අනුමැතියක් ලබා නොගෙන ආයතනය විසින් පැමිණීමේ දීමනා, නිෂ්පාදන දිරිදීමනා, අතිරේක දීමනා, දිරි දීමනා, දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා දීමනා වශයෙන් රු.17,558,037 ක් ගෙවා තිබුණි. තවද, නිෂ්පාදන දිරිදීමනා ගෙවීමේදී කාර්යසාධනය මැනීමේ ක්‍රමයක් තීරණය කිරීමකින් තොරව ගෙවීම් සිදුකර තිබුණි.	**2022** **2023**	චක්‍රලේඛ විධිවාධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.	නිෂ්පාදන දිරි දීමනා සඳහා අමාත්‍යාංශය මඟින් අනුමැතිය ලබා ගැනීම සඳහා මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කර ඇත.	**නිර්දේශ අනුව කටයුතු කරමින් පවතී.**
8	2017 අංක 15දරන ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතන පනතේ 16වන වගන්තිය අනුව අධ්‍යක්ෂ මණ්ඩලය	2022 **2023**	පනතේ දක්වා ඇති කාර්යයන් ඉටු කිරීමට කළමනාකරණය කටයුතු කළ	උපදේශක සභාවක් පිහිටුවීමට කටයුතු කිරීම සඳහා අමාත්‍යාංශ ලේකම්වරයා දැනුවත් කරන බව	නිර්දේශ අනුව කටයුතු කර නොතිබුණි

	විමසා අදාල අමාත්‍යවරයා විසින් 06 දෙනෙකුගෙන් සමන්විත ආයතනයේ උපදේශන සභාවක් පත්කල යුතු අතර ,එම උපදේශන සභාව විසින් පනතේ 04 වන වගන්තියේ සඳහන් කර ඇති කර්තව්‍යයන් ඉටු කිරීම සම්බන්ධ සියළු කාරණා පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයට සහ අදාල අමාත්‍යවරයාට නිර්දේශ ලබාදිය යුතු බව දක්වා තිබුණද, සමාලෝචිත වර්ෂය දක්වා එවැනි උපදේශක ආයතනයක් පත්කර නොතිබුණි. එබැවින් ආයතනයේ කර්තව්‍යයන් නිසි ලෙස ප්‍රවීන උපදේශක ආයතනයක උපදෙස් මත ක්‍රියාත්මක කර නොතිබුණි		යුතුයි.		
9	2017 අංක 15 දරන ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතන පනතේ 4 වගන්තියේ (ඇ) (ඌ) හා (ඔ) යටතේ ආයතනයේ කර්තව්‍යයන් ලෙස වෘත්තීය පුහුණුව පිළිබඳ පර්යේෂණ කරගෙන යාම, කලාපීය මධ්‍යස්ථාන පිහිටුවීම හා වෘත්තීය සහ තාක්ෂණික පුහුණු කිරීම් පිළිබඳව සඟරා සහ වාර ප්‍රකාශන පළ කිරීම දක්වා තිබුණද, එම කර්තව්‍යයන්	**2023**	පනතේ දක්වා ඇති කාර්යයන් ඉටු කිරීමට කළමනාකරණය කටයුතු කළ යුතුයි.	මේ සඳහා පර්යේෂණ, සංවර්ධන හා නව නිපැයුම් අංශයක් (Research & Development and Innovation) ස්ථාපිත කර ඇති අතර එම අංශයට අවශ්‍ය කාර්යය මණ්ඩල ඇස්තමේන්තුව අනුමැතිය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත.	**නිර්දේශ අනුව කටයුතු කරමින් පවතී.**

	සමාලෝචිත වර්ෂය දක්වා ඉටුකර නොතිබුණි.				
10	ආයතනය භුක්ති විඳින එකතුව අක්කර 29 ක් හා හෙක්ටයාර 0.35 වූ ඉඩම් 05 ක් ලංකා ගමනාගමන මණ්ඩලයට හා ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සතු බව දැක්වුවද, ඒවායේ නීත්‍යානුකූල හිමිකාරීත්වය හඳුනාගෙන පවරාගැනීමට කටයුතු කර නොතිබුණි.	**2021** **2022** **2023**	මෙම ඉඩම්වල නීත්‍යානුකූල අයිතිකාරීත්වය ක් හඳනාගෙන පවරා ගැනීම් සිදුකළ යුතුය.	මෙම ඉඩම් වල අයිතිය විධිමත් පරිදි පවරා දීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස අමාත්‍යාංශ අතිරේක ලේකම් (වෘත්තීය පුහුණු) විසින් ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයයේ ලේකම් වෙත 2024.01.24 දින ලිපියක් යොමු කර ඇත.	**නිර්දේශ අනුව කටයුතු කර නොතිබුණි**
11	සිසුන් ලියාපදිංචි අවස්ථාවේ සිට පුහුණු කාලය අවසන් වූ පසු රැකියාගත කිරීම තෙක් (පසුවිපරම් කිරීම) තොරතුරු පවත්වා ගැනීම කලයුතු වුවද ආයතනය විසින් ඒ සඳහා නිවැරදි තොරතුරු පද්ධතියක් පවත්වාගෙන ගොස් නොතිබීම හේතුවෙන් ආයතනයේ සමස්ථ කාර්යසාධනය මැනීමට නොහැකි විය.	**2023**	සිසුන්ගේ නිවැරදි තොරතුරු පද්ධතියක් පවත්වාගෙන යා යුතුය.	වර්තමානයේදී දත්ත පද්ධතයක් ක්‍රියාත්මක කිරීමට ආරම්භ කර ඇති බව දන්වා සිටිමි.	**නිර්දේශ ක්‍රියාත්මක කරමින් පවතී**
12	ආයතනය සතු අධ්‍යක්ෂ/ විදුහල්පති නිල නිවස 2020 වර්ෂයේ මුල සිට කිසිදු නිලධාරියෙකුගේ භාවිතයට හෝ කිසිදු ප්‍රයෝජනයකට නොගෙන පවතින බව නිරීක්ෂණය වූ නමුත් මෙම නිල නිවසේ ආරක්ෂක ගාස්තු ලෙස	**2021** **2022** **2023**	නිෂ්කාර්ය වත්කම් කඩිනමින් ගිණුම්වලට ගලපා අදාළ පරිදි ඉදිරියට කටයුතු කළ යුතුය.	එය අළුත්වැඩියා කර වත්මන් අධ්‍යක්ෂ විදුහල්පතිගේ භාවිතයට ගැනීමට නියමිතය.	**නිර්දේශ අනුව කටයුතු කර නොතිබුණි**

	2020 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා රු.3,180,610 ක් නිෂ්කාර්ය ලෙස නිෂ්ඵල වියදම් කර තිබුණි				
13	ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ මානව සම්පත් සංවර්ධන හා පුහුණු ප්‍රතිපත්තිවලට පටහැනිව ශ්‍රී ලංකා තාක්ෂණ විශ්ව විද්‍යාලයේ පාඨමාලාවක් හැදෑරීම සඳහා නිලධාරියෙකු විසින් නිවාඩු අනුමත නොකර පාඨමාලා සඳහා සහභාගි වී තිබුණි. එසේම පුහුණු/අධ්‍යන පාඨමාලා හැදෑරීම සඳහා ලබාදෙන වැටුප් සහිත නිවාඩු කාලය වසර 03ක උපරිමයකට යටත් වුවද, අධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිලධාරියෙකුට වර්ෂ 05ක වැටුප් සහිත නිවාඩු අනුමත කර තිබුණි.තවද අධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිලධාරීන් විසින් වැටුප් සහිත දේශීය අධ්‍යයන නිවාඩු ලබා ගැනීමේදී ගිවිසුමකට හා බැඳුම්කරයකට එළඹිය යුතු වුවද, නිලධාරීන් තිදෙනෙකු සඳහා එළඹිය යුතු රු.5,293,317 ක් වටිනා බැඳුම්කර අත්සන් කර නොතිබුණි.	**2023**	මානව සම්පත් සංවර්ධන හා පුහුණු ප්‍රතිපත්තිවලට අනුකූලව කටයුතු කළ යුතුය.	මේ වනවිට දේශීය අධ්‍යයන නිවාඩු ලබා සිටින නිලධාරීන්ගේ පැමිණීමේ සටහන් අදාල දින සිට මේ දක්වා පුහුණුව ලබන ආයතනයෙන් ලබා ගෙන ඇති අතර ඉදිරියේදී නියමිත දිනට පැමිණීමේ සටහන් ගෙන්වා ගැනීමෙන් අනතුරුව වැටුප් ගෙවීමට කටයුතු කරනු ලැබේ.	**නිර්දේශ අනුව කටයුතු කරමින් පවතී.**